අට්ඨකථාචාර්ය බුද්ධඝෝෂ ස්ථවිරපාදයන් විසින් විරචිත

## සම්මෝහ විනෝදනී නම් වූ

# විභංගට්ඨ කථා

## (සිංහල පරිවර්තනය)



ප්‍රකාශනය

බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය

පාලි අට්ඨකථා සිංහල පරිවර්තන - 13

අර්ථකථාචාර්ය බුද්ධඝෝෂ ස්ථවිර පාදයන් විසින් විරචිත

# සම්මෝහ විනෝදනී නම් වූ

# විභංගට්ඨ කථා

## අභිධර්ම පිටකය
## (සිංහල පරිවර්තනය)

සිංහල පරිවර්තනය

**රාජකීය පණ්ඩිත - නීතිඥ**

**බී.එම්.පී. බාලසූරිය**

අධීක්ෂණය

**අභිධර්මාචාර්ය විද්‍යාවේදී-ශාස්ත්‍රවේදී**

**බුද්ධික විජේසිංහ**

*ප්‍රකාශනය*

බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය
125, ඇන්ඩර්සන් පාර, නැදිමාල, දෙහිවල.

අර්ථකථාචාර්ය බුද්ධඝෝෂ ස්ථවිර පාදයන් විසින් විරචිත

සම්මෝහ විනෝදනී නම් වූ

# විභංගට්ඨ කථා

(සිංහල පරිවර්තනය)

ප්‍රථම මුද්‍රණය 2007

I.S.B.N 978-955-1604-31-8

*පරිගණක අකුරුකරණය*

උපමාලි කුලසේකර - කටුගස්තොට.

*පිටකවරය*

සුසිල් ජයශාන්ත පෙරේරා - මහරගම.

*මුද්‍රණය*

අජිත් ප්‍රින්ටර්ස්

නො. 342, පරණ කැස්බෑව පාර, රත්තනපිටිය, බොරලැස්ගමුව.

*ප්‍රකාශනය*

බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය

125, ඇන්ඩර්සන් පාර, නැදිමාල, දෙහිවල.

දුරකථනः 2734256, 2728468, 2726234 ෆැක්ස්ः 2736737

විද්‍යුත් තැපැලः bcc456@sltnet.lk

www.buddhistcc.com

# ප්‍රස්තාවනා (අට්ඨකථා)

පාළි භාෂාව මධ්‍යතන ඉන්දු ආර්ය පූර්ව අවධියට අයත් ප්‍රාකෘත විශේෂයක් බවත්, එම ප්‍රාකෘතය වූ කලී එකල උත්තර භාරතයේ ඒ ඒ ප්‍රදේශවල පැවති පොදු ජනයාගේ කථා ව්‍යවහාරය බවත්, පිළිගත් විද්වත් මතයයි. ප්‍රාකෘත ව්‍යවහාරය පොදු ජනතාවගේ හා ශ්‍රමණ සම්ප්‍රදාය ගරු කළ චින්තකයන්ගේද භාෂා මාධ්‍යය විය. එය උත්තර භාරතයේ පැතිරී ගිය ඉන්දු යුරෝපීය භාෂා ව්‍යවහාරයෙන් ජනිත වූවක් සේ සැලකිය යුතුය. මෙම ප්‍රාකෘත ව්‍යවහාරයේ ලිඛිත සාධක අනුව මූල අවස්ථාවක් සේ පෙනෙන පාළි භාෂාව උත්තර භාරතයේ කිසියම් විශේෂ ප්‍රදේශයක කථා ව්‍යවහාරයේ මාධ්‍යයක් විය.

1. පාළි භාෂාව ක්‍රි.පූ. 6 වැනි 7 වැනි සියවස්වල කොසොල් රට පැවති කථා ව්‍යවහාරය පදනම් කොට ඇති වූවෙකැයි ද එය නොයෙක් ජනපදවල ජනයාගේ පොදු භාෂා මාධ්‍යය වී යැයි ද මහාචාර්ය රීස් ඩේවිඩ්ස් තුමා පවසයි.

2. පාළිය උජ්ජයිනී ප්‍රදේශයේ භාෂාව යැයි වෙස්ටර් ගාඩ් සහ ඊ කුන් සහ ඔටෝ ෆ්‍රොන්කේ වැනි විචාරකයෝ පවසති.

3. පාළිය මගධයේ කථා ව්‍යවහාරයයි යන බුද්ධඝෝෂ හිමියන්ගේ මතය මහාචාර්ය ගෛගර් තුමා අනුමත කරයි.

4. බුදුරජාණන් වහන්සේ මුලදී කොසොල් රට බසින් දහම් දෙසන්නට ඇතැයි සළකන වින්ටර්නීට්ස් පාළි ත්‍රිපිටකයේ භාෂාව පැරණි මගධ ව්‍යවහාරය බව පදනම් කොට වෙනත් ප්‍රදේශ ව්‍යවහාරයන්ගේ සම්මිශ්‍රනයද ඇතිව ගොඩනැගුණු බෞද්ධයන්ගේ සාහිත්‍යයික භාෂාවකැයි පවසයි.

5. බුදුන් වහන්සේ ධර්ම ප්‍රචාරයේ යෙදුනු පන්සාළිස් වසින් වැඩි කොටසක් කොසොල් මගධ ප්‍රදේශවල සැරිසැරූ බව බෞද්ධ සාහිත්‍යයේ පෙනෙන බැවින් පාළි භාෂාව කොසොල් මගධ දෙරට

කථා ව්‍යවහාරය පදනම් කොටගෙන බිහි වූවාක් සේ සැලකීමට පුළුවන් බව ඊ කුන් නම් විචාරකයා පෙන්වා දෙයි.

මෙම විග්‍රහයන් ශාස්ත්‍රීය වශයෙන් වැදගත් වන අතර විශේෂයෙන් සැලකිය යුත්තේ බුදුන් වහන්සේගේ මතයයි. බුදුරජාණන් වහන්සේ දක්වා වදාළ ආකල්ප විග්‍රහ වන්නේ මජ්ඣිම නිකායේ අරණ විභංග සූත්‍රයෙනි. මෙම සූත්‍රයෙන් පෙන්වන්නේ උන්වහන්සේ භාෂා මාධ්‍යයෙහි අනවශ්‍ය ලෙස දැඩිව එල්බ ගත් ශාස්තෘවරයෙකු නොවන බවයි. එකම දෙය විවිධ ජනපදවල නාම කීපයකින් හඳුන්වනු ලබන කල ඒ එක නාමයක් දැඩිව අල්වා නොගෙන ඒ ඒ ලෙසට ව්‍යවහාර කල යුතු බවත් ලෝක ව්‍යවහාරය නොඉක්මවිය යුතු බවත් අරණ විභංග සූත්‍රයෙහි උගැන්වෙයි.

බුද්ධ පරිනිර්වාණයෙන් පසුව ත්‍රිපිටකය සංගීත වූ භාෂාව වන පාළි භාෂාව ථේරවාදීන්ගේ ආගමික භාෂාව විය. එය සමස්ත ත්‍රිපිටකය පුරා රැඳී ගියේය. ථේරවාදීන්ගෙන් බිඳී ගිය මහායානිකයෝ බුද්ධ ධර්මය සංස්කෘතයට පෙරලා ගත්හ. ඔවුන්ගේ සංස්කෘත සාහිත්‍යය දියුණුවීමත් මුස්ලිම් ආක්‍රමණ වැනි ආක්‍රමණත් මහායානික දර්ශනය විශ්ව විද්‍යාල මගින් රට මුළුල්ලෙහි බෙදා හැරීමත්, මහායානිකයන් ආමිස පූජා යන්ත්‍ර, මන්ත්‍ර ආදියෙන් පෘථග්ජන ජනතා ප්‍රසාදය දිනාගැනීමත්, භික්ෂු විනය නීති ලිහිල් ලෙස මහායානිකයන් විසින් සකස් කිරීමත් ආදිය නිසා බුද්ධ ධර්මයත් පාළි භාෂාවත් බුද්ධජන්මභූමියෙන් අතුරුදහන් විය. එය ශ්‍රී ලංකාද්වීපයේ තහවුරු විය.

හෙළඅටුවා

සම්බුද්ධ පරිනිර්වාණයෙන් දෙසිය පන්තිස් වැන්නෙහි අශෝක අධිරාජයාගේ දායකත්වයෙන් පැලලුප් නුවරදී තුන්වන සංගායනාව පැවැත්වීය. මොග්ගලීපුත්තතිස්ස මහා රහතන් වහන්සේගේ ප්‍රධානත්වයෙන් රහතන් වහන්සේලා දාහක් සම්බන්ධ වෙමින් මෙම සංගායනාව පවත්වා ඇත. සාහස්සිකා නමින් හඳුන්වන මෙම සංගායනාව නව මසකින් සම්පූර්ණ විය.

තෘතිය සංගායනාවසානයේ දඹදිව ථේරවාදාචරිය පරම්පරාවේ අවසන් පුරුෂයා වූ මොග්ගලීපුත්තතිස්ස මහ රහතන් වහන්සේගේ ශිෂ්‍ය

මිහිඳු මහ රහතන් වහන්සේ විසින් තෘතීය සංගායනාවේදී තෝරා බේරා ගෙන සංග්‍රහ කළ, ථේරවාදී ත්‍රිපිටකය ශ්‍රී ලංකාවට ගෙන එන ලදි. මිහිඳු හිමියන් විසින් ලක්දිවට ගෙන එන ලද පාළි ත්‍රිපිටකය මහා අරිට්ඨ රහතන් වහන්සේ ප්‍රමුඛ කොට ඇති සිංහල භික්ෂූන් වහන්සේලා උගත්හ. පාළියෙන් තිබූ ත්‍රිපිටකයේ ගැටලු තැන් සිංහල ජනතාවට පැහැදිළි කර දීම අවශ්‍ය විය. බුද්ධ කාලයේ සිට වාචනා මාර්ගයෙන්, ආචාර්ය පරම්පරා වලින් පැවත ආ අර්ථ විවරණ ක්‍රම මිහිඳු හිමියන්ගෙන් සිංහල භික්ෂූන් වහන්සේලා උගෙන සිංහල භික්ෂූන් විසින් පාළි ත්‍රිපිටකයේ ගැටලු තැන් හෙළ බසින් අරුත් විවරණය කළහ. හෙළටුවා නමින් මේවා හඳුන්වයි.

අටුවා වනාහි ත්‍රිපිටකයට අයත් පොත් වලට ලියා ඇති ව්‍යාඛ්‍යාන සංග්‍රහ සමූහයයි. අටුවාවල පරමාර්ථය පෙළෙහි ඇති දුරවබෝධ වචන සහ ධර්මයේ ගැඹුරු තැන් විස්තර කිරීමත් අවශ්‍ය තැන්වලදී විස්තරාර්ථ සැපයීමත්ය. මෙම පරමාර්ථයෙන් ලියන ලද හෙළටුවා නම්,

මහා අට්ඨකථා
කුරුන්දි අට්ඨකථා
පච්චරිය අට්ඨකථා නම් වේ.

හෙළ අටුවා අතුරින් ප්‍රමුඛ ස්ථානය දැරුවේ මහා අට්ඨකථාව හෙවත් මූල අට්ඨ කථාවයි. බුද්ධඝෝෂ හිමියන්ගේ අට්ඨ කථා සියල්ලටම පාහේ ශරීරය කරගෙන ඇත්තේ මෙම අටුවාවයි. තුන් පිටකයටම අයත් අට්ඨ කථාවන්හි මහා අට්ඨකථාව ගැන සඳහන් වන බැවින් එය තුන්පිටකයම අළලා සකස් වුනු හෙළටුවාවක් වශයෙන් සැලකිය හැකිය. වස්තු විෂය අතින් සෙසු හෙළටුවාවන්ට වඩා පරිපූර්ණ වී තිබුණ මහා අට්ඨකථාවේ ලක්දිව සිදුවූ දේ පිළිබඳව බොහෝ වෘතාන්ත ද සඳහන්ව තිබුණ බව සිතා ගත හැකිය.

මහා පච්චරිය අට්ඨකථාවට එම නම ලැබුනේ පච්චරියක් හෙවත් පහුරක් උඩදී එය ලියන ලද බැවිනි. කුරුන්දිවේලු විහාරයේදී ලියන ලද හෙයින් කුරුන්දි අටුවා නම් විය.

මෙම ප්‍රධාන හෙළටුවාවන්ට අමතරව තවත් අටුවා කීපයක් දක්නට ඇත. අන්ධ අට්ඨකථාව එයින් එකකි. දකුණු ඉන්දියාවේ කාඤ්චිපුර

(කොන්ජිවරම්) යෙහි පැවති අටුවාවයි. එය ආන්ධ්‍රා භාෂාවෙන් ලියා ඇතැයි සැලකේ.

## බුද්ධඝෝෂ හිමි

දඹදිව බෝමැඩට නුදුරු ඝෝෂ නම් ග්‍රාමයේ බමුණු කුලයක උපත ලද බුද්ධඝෝෂ වාදයෙහි දක්‍ෂ වූ රේවත නම් මහා තෙරපාණන් වෙත පැවිදි වූ බව ප්‍රචලිත මතයයි. බුද්ධඝෝෂ මහාබෝධි මණ්ඩපයට දකුණුදිග බමුණුගම උපන් බව සද්ධම්මසංගහ නම් පොතෙහි සඳහන් වේ. බෝමැඩට නුදුරෙහි ඝෝෂ නම් වූ ගමේ උපන් බව බුද්ධඝෝසුප්පත්ති නම් කථාවේ ද සඳහන් වේ. මෙවැනි විවිධ කරුණු විමංශනයෙන් පසුව බුද්ධඝෝෂ ජන්ම භූමිය මොරණ්ඩඛේටක නම් ගම බව පිළිගෙන ඇත. ආන්ධ්‍ර දේශයේ ගුන්ටූර් දිස්ත්‍රික්කයේ පාල්නාඩ් තලුත් පෙදෙසේ "කෝටනේමලී පුරිගුන්ඩලු පල්ලි" යන ලඟ පිහිටි ගම් දෙක මොරන්ඩඛේටක යැයි පැවසේ. උන්වහන්සේ උපන් පෙදෙස මොරන්ඩඛේටක යැයි විසුද්ධ මග්ගයෙන් පෙනේ. මජ්ඣිමනිකායට්ඨ කථාවේ කර්තෘ සංදර්ශක ගාථාවක මයූර සුත්ත පට්ඨන හෝ මයූර රූප පට්ඨන සඳහන් වන බැවින් එතුමා එහි විසූ බව ද සිතිය හැකිය.

ව්‍යාකරණ විෂයෙහි ද දර්ශන ශාස්ත්‍රයෙහි ද වෛදික ග්‍රන්ථ විෂයෙහි ද ඉතිහාස පුරාවිද්‍යා විෂයෙහිද කාය ව්‍යවච්ඡේද විද්‍යාවන් හීද ලක්‍ෂණ ශාස්ත්‍රයෙහිද පැතිරී ගිය බුද්ධි ප්‍රභාවයක් එතුමා කෙරෙහි පැවති බව පැහැදිලිය. බුද්ධඝෝෂ හිමියන් ලංකාවට පැමිණීමට පෙර ඤාණෝදය නම් ධර්ම ප්‍රකරණයත් අත්ථසාලිනී අටුවාවත් දඹදිව දී කළ බවද සඳහන්ය. බුද්ධෝඝෝෂ හිමියන් කලින් සර්වාස්ති වාදියෙකුව සිට පසුව ථේරවාදී වූ බව ඇතැම් විචාරකයන්ගේ පිළිගැනීමයි.

බුද්ධඝෝෂ හිමියන් ලක්දිවට පැමිණියේ අනුරාධපුරය රාජධානිය කරගත් මහානාම රජ දවසය. බුද්ධවර්ෂ 953-975 අතර කාලයේය. උන්වහන්සේ ලංකාවට වඩින විට අට්ඨකථා සංහිතා කීපයක්ම මේ දිවයිනේ පැවති බවත් ඒවා හෙළ බසින්ම උගත් බවත් මෙයින් සමහරක් ග්‍රන්ථ ස්වරූපයෙන්ද සමහරක් පූර්වාචාරීන්ගේ මතවාද ඇතුලත් වුන සාහිත්‍යය වශයෙන්ද පැවති බවත් ආචාර්ය අදිකාරම් මහතා පවසයි.

මිහිඳු හිමියන් දවසම ආරම්භ වූ සිංහල අටුවා කථා වසර 700ක පමණ කාලයක් සිංහල ත්‍රිපිටකය හෙළි පෙහෙළි කරමින් පැවතියහ. ත්‍රිපිටක පාළියට සිංහල අටුවා ලියා ඇති බව දඹදිව විසූ රේවත හිමියන්ද දැන ගැනීමෙන් සිංහල අටුවා පාළියට පරිවර්තනය කිරීම, බුදුදහම චිරස්ථායී වීමට හේතුවක් යැයි උන්වහන්සේ ද සලකා හෙළටුවා පාළියට පරිවර්තනය කිරීම සඳහා බුද්ධඝෝෂ හිමියන් ලක්දිවට එවන්න ඇතැයි සැලකිය හැකිය.

බුද්ධඝෝෂ හිමියන් මෙහි පැමිණ බුදුන් වදාල දෙලක්ෂ පන්සැත්තෑ දහස් දෙසියපනස් ග්‍රන්ථ සංඛ්‍යාවක් ඇති ආගමයට තුන්ලක්ෂ එක්සැටදහස් සත්සියපනස් ග්‍රන්ථ සංඛ්‍යාවක් පමණ අටුවා කථා ලියා ආගමයෙහි පහන් නැගූ සේකැයි දත යුතු යැයි පූජාවලියේ සඳහන්ව තිබේ.

සංස්කාරකයෙකු හා අනුවාදයකු වශයෙන් බුද්ධඝෝෂ හිමියන්ගේ කාර්යය වූයේ තමන් ඉදිරියෙහි වූ හෙළටුවාවන්හි අන්තර්ගත වූ විවරණ වෙනස් කිරීම නොව, ඒවා සකස් කිරීම සහ අවශ්‍ය ස්ථාන පිඩු කරමින්, අවශ්‍ය ස්ථාන විස්තරාර්ථ දක්වමින්, විධිමත්ව සුගමව පාළි භාෂාවට නැගීමයි. බුද්ධඝෝෂ හිමියන්ට අට්ඨකථා සකස් කරන්නට මහාවිහාරයෙන් ඉඩ ලැබී ඇත්තේ මහාවිහාර වාචනා 'මාර්ගයට විරුද්ධ මත ඒවායේ ඇතුලත් නොවිය යුතුය' යන කොන්දේසිය ද සහිතවය.

"මහා අට්ඨකථාව ශරීරය කොටගෙන මහාපච්චරිය කුරුන්දි ආදී විශ්‍රැතඅර්ථ කථාවන්හි යම් විනිශ්චයක් වේද එහි යුක්තාර්ත සහ ඇතුලත් වන්නා වූ ස්ථවිර වාදයද අත්නොහරිමින් සංවර්ධනය හොඳින් ආරම්භ කරන්නෙමු."

තව ද එම අර්ථ කථාවලින් භාෂාන්තරය පමණක් අත්හැර විස්තර තැන් පිඩුකොට සියලුම විනිශ්චයන් ඇතුලත් කොට කිසිම තන්හි යුත් අත් නොඉක්මවා සංවර්ණනය කරන්නෙමු යි බුදුගොස් හිමියෝ පවසති.

බුද්ධඝෝෂ හිමියන් විසින් කරන ලද අට්ඨකථා සියල්ලම මිහිඳු මාහිමියන් විසින් ලක්දිවට ගෙන එන ලදුව මහා විහාරිකයන් විසින් ආරක්ෂා කරනු ලැබූ හෙළටුවාවන්හි පාළි අනුවාද බවත් මහා අට්ඨකථාවේ සාරය ගෙන පාළි අට්ඨකථා රචිත බවත් මෙම අට්ඨකථාවල සඳහන් වේ.

මේ අනුව බුදුගොස් හිමියන්ගේ කාර්යය වූයේ බුදුසමය පිළිබඳව අමුතුවෙන් පොත් ලිවීම නොව එතෙක් හෙළටුවාවන්හි ආ කරුණු විධිමත්ව හා සුගමව පාළි භාෂාවට නැගීම වෙයි. පාළි අටුවා පොත්වලින් අඩකටත් වඩා සපයා ඇත්තේ බුදුගොස් හිමියන් විසිනි. බෞද්ධ අට්ඨකථාචාරීන් අතුරෙන් එතුමා ශ්‍රේෂ්ඨතමයායි. එතුමාගේ ජීවන චරිතය වටා විවිධ ජනප්‍රවාද ගෙතී ඇත්තේ ඒ නිසාමය. එතුමා මෙලොව පහළ වූයේ බුදුන්ගේ පර්යාප්ති ශාසනය දීර්ඝ කාලයක් නිර්මලව පවත්වාගෙන යාම සඳහා පාළි අට්ඨකථා ලිවීමටමය යන ජන ජනප්‍රවාදයක් ද ඇත.

## විනය පිටකය

| | පෙළ | | අටුවාව | කර්තෘ | කාලය |
|---|---|---|---|---|---|
| උභය විභංග | 1 පාරාජිකා පාළි | 1 ආණා දෙසනා | සමන්තපාසාදිකා | බුද්ධඝෝෂ හිමි | 5වන ශ.ව. |
| | 2 පාචිත්තිය පාළි | 2 යථාපරාධ ශාසන | විනය අට්ඨකථා | | |
| ඛන්ධක | 3 චුල්ල වග්ග පාළි | 3 සංවරාසංවර කථා | | | |
| | 4 මහාවග්ග පාළි | | | | |
| පරිවාර | 5 පරිවාර පාළි | | | | |
| | භික්ඛුපාතිමොක්ඛ | | කඞ්ඛා විතරණී | බුද්ධඝෝෂ හිමි | 5වන ශ.ව. |
| | භික්ඛුණී පාතිමොක්ඛ | | (මාතිකට්ඨ කථා) | | |

## අභිධර්ම පිටකය

| | | | | |
|---|---|---|---|---|
| 1 ධම්මසංගණිප්පකරණ | 1 පරමත්ථ දේසනා | අත්ථසාලිනී | බුද්ධඝෝෂ හිමි | 5වන ශ.ව. |
| 2 විභංගප්පකරණ | 2 යථාධම්ම සාසන | සම්මෝහ විනෝදනී | බුද්ධඝෝෂ හිමි | 5වන ශ.ව. |
| | 3 නාමරූප පරිච්ඡේද කථා | | | |
| 3 කථාවත්ථුප්පකරණ | | | බුද්ධඝෝෂ හිමි | 5වන ශ.ව. |
| 4 පුද්ගලපඤ්ඤත්තිප්පකරණ | | | | |
| 5 ධාතුකථාප්පකරණ | | පරමත්ථදීපනී | | |
| 6 යමකප්පකරණ | | පඤ්චප්පකරණට්ඨකථා | | |
| 7 පට්ඨානප්පකරණ | | | | |

## සූත්‍ර පිටකය

| | | | |
|---|---|---|---|
| 1 දීඝනිකාය | 1 වොහාරා දේශනා | සුමංගල විලාසිනී | බුද්ධඝෝෂ හිමි 5වන ශ.ව. |
| 2 මජ්ඣිමනිකාය | 2 යථානුලෝමසාසන | පපඤ්ච සූදනී | බුද්ධඝෝෂ හිමි 5වන ශ.ව. |
| 3 සංයුක්තනිකාය | 3 දිට්ඨි විනිවෙඨන කථා | සාරත්ථප්පකාසිනී | බුද්ධඝෝෂ හිමි 5වන ශ.ව. |
| 4 අංගුත්තරනිකාය | | මනෝරථපූරණී | බුද්ධඝෝෂ හිමි 5වන ශ.ව. |
| 5 ඛුද්දක නිකාය | | | |
| 1 ඛුද්දකපාඨ | පරමත්ථ ජෝතිකා | | බුද්ධඝෝෂ හිමි 5වන ශ.ව. |
| 2 ධම්මපද | ධම්මපදට්ඨ කථා | | බුද්ධඝෝෂ හිමි 5වන ශ.ව. |
| 3 උදාන | පරමත්ථ දීපනී | | ධම්මපාල ආචාර්ය 5වන ශ.ව. |
| 4 ඉතිවුත්තක | පරමත්ථ දීපනී | | ධම්මපාල ආචාර්ය 5වන ශ.ව. |
| 5 සුත්තනිපාත | පරමත්ථ ජෝතිකා | | බුද්ධඝෝෂ හිමි 5වන ශ.ව. |
| 6 විමානවත්ථු | පරමත්ථ දීපනී | | ධම්මපාල ආචාර්ය 5වන ශ.ව. |
| 7 පේත වත්ථු | පරමත්ථ දීපනී | | ධම්මපාල ආචාර්ය 5වන ශ.ව. |
| 8 ථේර ගාථා | පරමත්ථ දීපනී | | ධම්මපාල ආචාර්ය 5වන ශ.ව. |
| 9 ථේරී ගාථා | පරමත්ථ දීපනී | | ධම්මපාල ආචාර්ය 5වන ශ.ව. |
| 10 ජාතක | ජාතකට්ඨකථා | | බුද්ධඝෝෂ හිමි 5වන ශ.ව. |
| 11 නිද්දේස (චූල්ල-මහා) | | සද්ධම්ම ජෝතිකා | උපසේන ආචාර්ය 6වන ශ.ව. |
| 12 අපදාන (ථේර-ථේරී) | | විසුද්ධ ජන විලාසනී | මහානාම ආචාර්ය 7වන ශ.ව. |
| 13 පටිසම්භිදා මග්ග | | සද්ධම්මප්පකාසිනී | ධම්මපාල ආචාර්ය 5වන ශ.ව. |
| 14 බුද්ධවංස | | මදුරත්ථප්පකාසිනි | බුද්ධදත්ත හිමි 5වන ශ.ව. |
| 15 චරියාපිටක | | පරමත්ථ දීපනී | ධම්මපාල ආචාර්ය 5වන ශ.ව. |
| | | විසුද්ධි මග්ග | බුද්ධඝෝෂ හිමි 5වන ශ.ව. |
| නෙත්තිප්පකරණ | නෙත්ති අට්ඨකථා | | ධර්මපාල ආචාර්ය 5වන ශ.ව. |
| චතුභාණවාරපාළි | චතුභාණවාර අට්ඨකථා | | ආනන්ද වනරතන 8වන ශ.ව. |

බුද්ධඝෝෂ හිමියන් විසින් පාළියට නොනගන ලද අට්ඨ කථා පාලියට නගන ලද්දේ බුද්ධදත්ත ධම්මපාල උපසේන සහ මහානාම තෙරවරුන් විසින්ය.

### බුද්ධදත්ත හිමි

බුද්ධඝෝෂ හිමියන්ගේ සමකාලීනයෙකි. මධුරත්ථ විලාසිනී නම් බුද්ධවංශ අටුවාව උන්වහන්සේ ලියා ඇත.

### උපසේන හිමි

සද්ධම්මජෝතිකා නම් නිද්දේශ අට්ඨකථාව මහාපරිවේනවාසී උපසේන හිමියන් විසින් කරන ලදි.

### මහානාම හිමි

පටිසම්භිදා මග්ග අට්ඨකථාව වන සද්ධම්මප්පකාසනීය මුන්වහන්සේ විසින් ලියා ඇත.

### ධම්මපාල හිමි

පරමත්ථදීපනී අට්ඨකථා - උදාන - ඉතිවුත්තක - විමානවත්තු - ප්‍රේතවත්තු - ථෙර ථෙරී ගාථා අට්ඨකථා මුන්වහන්සේ ලියා ඇත.

මෙම අට්ඨකථාවන් උගෙන ඒවා ආරක්ෂා කළ අය අට්ඨකථිකා නමින් හඳුන්වා ඇත. අට්ඨකථා චරියා යනු අට්ඨකථා සම්පාදනය කළ ආචාර්යවරයෝය. ආචරිය වාද, ආචරිය මත, ආචරියා වාද යන නම්වලින් කියවෙන්නේ අට්ඨකථාවන් මැයි.

අට්ඨකථාවන් පිළිබඳ විවිධ විවේචන හා මතවාද උගතුන් අතර පවතී. මෑතකාලීන වියතුන් අතුරින් අග්ගමහා පණ්ඩිත පොල්වත්තේ බුද්ධදත්ත හිමියෝ එවැනි විවේචකයෙකි. උන්වහන්සේගේ අටුවා පරීක්ෂණ නම් පොතෙන් එවැනි විවේචන ඉදිරිපත් කර ඇත. අටුවාකථා බුදුන් වහන්සේගේ දේශනා නොවන බව කවුරුත් පිළිගනිති. අටුවාචාරීන් වහන්සේලා අතරද විවිධ මතභේද තිබූ බව දක්නට ඇත. වසර හත්අට සියයක් ගෙන ආ ලිඛිතව නොතිබූ අර්ථ කථා සාහිත්‍යයට එවැනි දේ ඇතුලත් වන්නට පහසුකම් තිබේ. මිහිඳු හිමියන් විසින් ගෙන එන ලද පාළි විවරණ මහාවිහාරික භික්ෂූන් විසින් සිංහලට පරිවර්තනය කොට එම හෙළටුවා පස්වන සියවසේ බුද්ධඝෝෂ හිමියන් විසින් නැවත පාළි භාෂාවට පරිවර්තනය කළ බව පිළිගත් සම්ප්‍රදායයි. මේ තැන්වලදී එම මතිමතාන්තර ඇතුලත් වන්නට ඇති බව සිතිය යුතුය.

මහාවිහාරීය සම්ප්‍රදාය එකකි. අභයගිරි ජේතවන පරම්පරා හිද එවැනි සම්ප්‍රදායන් පැවතුන බවට සැකයක් නැත. ස්වකීය පාරම්පරික මතවලට පටහැනි සූත්‍ර ධර්මයන් පෙළෙහි ඇති බව දූන දූනත් සිය මතය

තහවුරු කරනු සඳහා ඒවා මදකිනිදු වෙනස් නොකර, ඉවත් නොකර, සංගායනාවලදී පැවති තත්ත්වයෙන්ම ත්‍රිපිටකය රැකගෙන ඒම ගැන මහාවිහාරීය පරම්පරාවට බෞද්ධයාගේ ප්‍රණාම පූර්වක ගෞරවය හිමිවිය යුතුය.

මේ අන්දමින් පැවතගෙන ආ අට්ඨකථා අපේ හාමුදුරුවරු තවත් වර්ෂ සිය ගණනක් තම ආරාමවල පොත්ගුල්වල තබා පුස්තකාලවල තැන්පත්කොට උදේ සවස සුවඳ දුම් අල්ලා ධර්ම ගෞරවයෙන් ධර්ම රත්නය රැකගෙන ආහ. අනගාරික ධර්මපාලතුමාගේ ජාතික ආගමික වැඩපිළිවෙල ආරම්භ වීමෙන් පසුව එතුමාගේම පවුලේ නෑයන් විසින් අට්ඨකථා මුද්‍රණය කිරීමේ වැඩපිළිවෙල ආරම්භ කර ඇත. ඒ ධර්මපාලතුමා විසින් ඇතිකරන ලද ආගමික ප්‍රබෝධයේ එක් ආභාෂයකි. 1916 ජූලි 05 දින ත්‍රිපිටක මුද්‍රණසභා නම් ආයතනයක් සයිමන් ඇලෙක්සැන්ඩර් හේවාවිතාරණ මහතුන්ගේ මැදහත්වීමෙන් කොල්ලුපිටියේ ප්ලාම්ස් හවුස්හි පිහිටුවා ඇත. 1929 ජුනි 29 දින මෙම ත්‍රිපිටක සභාවේ රැස්වීමක් කොළඹ ඩික්මන් පාරේ තක්සලාහිදී පවත්වා තිබේ. මෙම රැස්වීමට අති පූජ්‍ය හික්කඩුවේ ශ්‍රී සුමංගල මහා නාහිමියන්ද, රත්මලානේ ශ්‍රී ධම්මානන්ද ධර්මාලෝක නායක හිමියන්ද ප්‍රධාන පණ්ඩිත ධර්මධර භික්ෂූන් වහන්සේලා 25 නමක් සහභාගී වූ බව සඳහන් වේ. අනගාරික ධර්මපාලතුමා ප්‍රධාන සාසනමාමක පිරිස්ද මෙම රැස්වීමට සහභාගී වී ඇත. මෙම නායක පණ්ඩිත ස්වාමීන් වහන්සේලා එක් එක් අටුවා ග්‍රන්ථ සංස්කරණය භාරගත් බවද සඳහන් වේ.

සයිමන් හේවාවිතාරණ මහතාගේ අභාවයෙන් පසුව සෝමලතා හේවාවිතාරණ ළමාතැනී විසින් ත්‍රිපිටක මුද්‍රණය සඳහා අරමුදල පිහිටුවීය. එම අරමුදල මගින් හේවාවිතාරණ අට්ඨකථා ග්‍රන්ථ සමූහය මුද්‍රණය කර ඇත. ආගම ධර්මය, ඉතිහාසය, පුරාවිද්‍යාව, සාහිත්‍යය ආදී ශ්‍රී ලංකා සංස්කරණ විවිධ ක්ෂේත්‍රයන් පර්යේෂණාත්මක අධ්‍යයනවලට යොමු කරමින් ශාස්ත්‍රීය පොතපත සපයා සංස්කෘතිය පිළිබඳව අවබෝධයක් ජනතාවට ලබාදීමේ අරමුණින් 1845 දී ආරම්භ කළ ශ්‍රී ලංකා රාජකීය ආසියාතික සමිතියේ සිංහල අට්ඨකථා සිංහලට පරිවර්තනය කිරීමේ ව්‍යාපෘතිය මගින් පොත් දහයක් මුද්‍රණය කිරීමේ මහඟු කාර්යයකි.

අභාවයට යන පැරණි බෞද්ධ පොත්පත් හා අලුතින් ලියැවෙන බෞද්ධ පොත්පත් මුද්‍රණය කරවීමත් ඉංග්‍රීසි බෞද්ධ පොත්පත් සිංහලට

පරිවර්තනය කර මුද්‍රණය කිරීමත් පරපුරෙන් පරපුරට බුද්ධ ධර්මය ගෙන යාමත් බෞද්ධ සංස්කෘතියේ ආරක්ෂාවත් සඳහා පිහිටුවා ඇති අප ආයතනය වන බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය මගින් බුද්ධ ජයන්ති ත්‍රිපිටකයේ පුනර්මුද්‍රණය නිමවීමෙන් පසු අට්ඨකථා සිංහලට පරිවර්තනය කොට මුද්‍රණය කිරීමට ප්‍රතිපත්ති සකස් කළහ. සිංහලෙන් මුද්‍රණය අවසන් කොට අටුවා කථා ඉංග්‍රීසියට පරිවර්තනය කර මුද්‍රණය කිරීම අපේ අදහසයි.

"කථා පවත්තිනී" නම් පාඨයක් ත්‍රිපිටකයේ අංගුත්තර නිකායේ සඳහන් වෙයි. ධර්මදේශකයා පෙළත් අටුවාවත් දනී නම් දහම් අසන්නා පෙළත් අටුවාවත් දනී නම් දහම් දෙසන්නාත් අසන්නාත් දෙදෙනාම පෙළත් අටුවාවත් දනීනම් එම ධර්ම දේශනාව සාර්ථක දේශනාවක් වන බව මෙහි සාමාන්‍ය අදහසයි. තථාගත ධර්මය වඩාත් ප්‍රකට වීම විවෘත වීම එහි පැවැත්මට හා උත්තරීතර භාවයට හේතුවන බව සඳහන්ය. මෙම කරුණු පිළිබඳ විමසිලිමත් වනවිට අට්ඨකථා පරිවර්තනයේ හා මුද්‍රණයේ අවශ්‍යතාවය වඩාත් පැහැදිලි වන්නේය. එයට අමතරව විශ්ව විද්‍යාලවල පාළි හා බෞද්ධ අධ්‍යයනාංශවල උසස් අධ්‍යාපනය ලබන ශිෂ්‍යයන්ට විෂය නිර්දේශානුකුල අට්ඨකථාවල සිංහල පරිවර්තන නොමැතිකමේ බාධාවද, එම ගුරු ශිෂ්‍ය දෙපිරිසටම මේ මගින් දුරු කිරීමද අපේ පරමාර්ථයකි.

අපගේ ඉල්ලීමද පූජ්‍ය රාජකීය පණ්ඩිත වැළමිටියාවේ කුසලධම්ම නාහිමියන්ගේ අනුශාසනාවද අනුව අටුවා කථා සිංහලට පරිවර්තනය කර මුද්‍රණය කරවීමේ භාරදූර කර්තව්‍යය ශ්‍රී ලංකා ජනරජයේ වර්තමාන ආගමික අමාත්‍යාංශය මගින් ඉතාම කෙටි කාලයක් තුළ අවසන් කිරීම සඳහා අපට පවරන ලදි. බුද්ධ ජයන්ති ත්‍රිපිටක පුනර් මුද්‍රණය මගින් අප දක්වූ ආදර්ශයත් ගොඩනැගූ විශ්වාසයත් මෙයට හේතු වූ බව නිසැකය. මෙම කාර්යය අපට පැවරීම පිළිබඳව ශ්‍රී ලංකා ජනරජයේ ගරු ජනාධිපතිතුමන්ට, ගරු අගමැතිතුමන්ට, ගරු බුද්ධශාසන නියෝජ්‍ය ඇමතිතුමන්ට, ආගමික අමාත්‍යාංශයේ ලේකම් මහතාට සහ අමරහේවා මද්දුම මහතාට ද අපේ කෘතඥතාවය, පුණ්‍යානුමෝදනාපූර්වකව පළකරමු.

අටුවා පරිවර්තනයේදී ආමිෂ ලාභයම නොව ශාසනික සේවයම සලකා එක් එක් පොත භාරගෙන මැනවින් සිංහලට පරිවර්තනය කරදුන් පණ්ඩිත ස්වාමීන් වහන්සේලාට ද, උගත් ගිහි මහතුන්ට ද අපගේ

කෘතඥතාවය හිමිවේ. සිංහල අටුවා පරිවර්තන සමීක්ෂණය කළ උගත් ගිහි පැවිදි දෙපිරිසටම අපගේ කෘතඥතාව හිමිවේ.

අටුවා කථා පරිවර්තන කාර්යය සම්බන්ධීකරණය කරමින් කටයුතු කළේ විජිතනන්ද සරත්චන්ද්‍ර මහතාය. එම ග්‍රන්ථාවලිය මුද්‍රණය කරවීමේ කාර්යය භාරවූයේ අප ආයතනයේ මුද්‍රණ කටයුතු අධ්‍යක්ෂ පාලිත ලියනගේ මහතාටය. මෙම මහත්වරු දෙපලම ඉතා උනන්දුවෙන් මෙම කටයුතුවල නියැලීම පිළිබඳව එම මහත්වරුන්ටද මාගේ කෘතඥතාවය පළවේ. මෙයට අමතරව මෙම කාර්යයට හොඳහිතින් අවංකව සහාය දුන් සියලු දෙනාටම පින් පුරවමින් ආසිරි පතම්හ.

මෙයට,

ශාසනස්ථිතිකාමී,

කිරම විමලජෝති ස්ථවිර,
අධ්‍යක්ෂක, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය,
නැදිමාල, දෙහිවල.

# බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානයේ
# අට්ඨකථා පරිවර්තක මණ්ඩලය

පූජ්‍ය රාජකීය පණ්ඩිත අම්බලන්ගොඩ ශ්‍රී සුමංගල නායක මාහිමිපාණන් වහන්සේ

පූජ්‍ය රාජකීය පණ්ඩිත යටගම ධම්මපාල අනුනායක මාහිමිපාණන් වහන්සේ

පූජ්‍ය රාජකීය පණ්ඩිත ආදාවල දේවසිරි නායක මාහිමිපාණන් වහන්සේ

පූජ්‍ය රාජකීය පණ්ඩිත යාලේගම චන්දකිත්ති හිමිපාණන් වහන්සේ

පූජ්‍ය රාජකීය පණ්ඩිත මැදඋයන්ගොඩ විජයකිත්ති හිමිපාණන් වහන්සේ

පූජ්‍ය රාජකීය පණ්ඩිත වටගෙදර විමලබුද්ධි හිමිපාණන් වහන්සේ

පූජ්‍ය රාජකීය පණ්ඩිත බලංගොඩ සෝභිත හිමිපාණන් වහන්සේ

පූජ්‍ය රාජකීය පණ්ඩිත විදුරුපොල ආනන්ද හිමිපාණන් වහන්සේ

පූජ්‍ය රාජකීය පණ්ඩිත මැස්ටියේ උපනන්ද හිමිපාණන් වහන්සේ

පූජ්‍ය රාජකීය පණ්ඩිත හත්තොටුවේ ඉන්දරතන හිමිපාණන් වහන්සේ

පූජ්‍ය රාජකීය පණ්ඩිත පල්ලේගම සමිත හිමිපාණන් වහන්සේ

පූජ්‍ය රාජකීය පණ්ඩිත මාවනානේ සෝමින්ද හිමිපාණන් වහන්සේ

පූජ්‍ය රාජකීය පණ්ඩිත පඬිවෙල සෝරත හිමිපාණන් වහන්සේ

පූජ්‍ය රාජකීය පණ්ඩිත බලපිටියේ සිරිසීවලී හිමිපාණන් වහන්සේ

පූජ්‍ය රාජකීය පණ්ඩිත පැපිලියානේ සුමිත්ත හිමිපාණන් වහන්සේ

පූජ්‍ය රාජකීය පණ්ඩිත බමුණුගම ධම්මවංස හිමිපාණන් වහන්සේ

පූජ්‍ය රාජකීය පණ්ඩිත මැදගම්පිටියේ විජිතධම්ම හිමිපාණන් වහන්සේ

පූජ්‍ය රාජකීය පණ්ඩිත අම්පාරේ ධම්මෝදය හිමිපාණන් වහන්සේ

| | |
|---|---|
| රාජකීය පණ්ඩිත | කීර්ති නාරම්පනාව මහතා |
| ශාස්ත්‍රවේදී | ඇන්.එච්. පෙරේරා මහතා |
| පණ්ඩිත | ජේ.පී. නිමල්ලාල් රංජිත් මහතා |
| පණ්ඩිත | ටී.ජී. ජයතිලක මහතා |
| පණ්ඩිත | ඒ.ඇම්.ඩී.වයි. සරත්චන්ද්‍ර අමරතුංග මහතා |
| පණ්ඩිත | එච්.පී.ඇස්. නිශ්ශංක මහතා |
| පණ්ඩිත | බී.ඇම්.පී. බාලසූරිය මහතා |

| | |
|---|---|
| පණ්ඩිත | සෝමරත්න ගම්ලත් වෙලගෙදර මහතා |
| පණ්ඩිත | දයා ගුණසේකර මහතා |
| පණ්ඩිත | ඒ. නිශාන්ත පීරිස් මහතා |
| පණ්ඩිත | ඩබ්ලිව්. ඇල්.පී. ධර්මදාස මහතා |
| පණ්ඩිත | ජිනදාස ගොඩකන්ද මහතා |
| පණ්ඩිත | පී.ඇල්.කේ. පෙරේරා මහතා |

**සම්බන්ධීකරණය:-** විජිතනන්ද සරත්චන්ද්‍ර මහතා

# බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානයේ අට්ඨකථා පරිවර්තක සමීක්ෂණ මණ්ඩලය

1. පූජ්‍ය මැදගම්පිටියේ විජිතධම්ම හිමිපාණන් වහන්සේ (පේරාදෙණිය ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලයේ කථිකාචාර්ය)
2. පූජ්‍ය කොටියාගල උපරතන හිමිපාණන් වහන්සේ (කැලණිය විශ්වවිද්‍යාලයේ කථිකාචාර්ය)
3. පූජ්‍ය මැදඋයන්ගොඩ විජයකිත්ති හිමිපාණන් වහන්සේ. (ශාස්ත්‍රපති)
4. පූජ්‍ය ඇස්වත්තේ රේවත හිමිපාණන් වහන්සේ. (ශාස්ත්‍රපති)
5. පූජ්‍ය අම්පාරේ ධම්මෝදය හිමිපාණන් වහන්සේ. (දර්ශනපති)
6. හේමචන්ද්‍ර දිසානායක මහතා. (ශාස්ත්‍රවේදී)
7. පණ්ඩිත දයා ගුණසේකර මහතා (සිංහල ශබ්දකෝෂය)
8. පණ්ඩිත ඒ ලසිත් නලන්ත මහතා (සිංහල ශබ්දකෝෂය)
9. පණ්ඩිත සිරිමෙවන් සේනක මහතා (ශාස්ත්‍රවේදී)
10. අභිධර්මාචාර්ය බුද්ධික විජේසිංහ මහතා (ශාස්ත්‍රවේදී-විද්‍යාවේදී)

# පටුන


| | | පිටු අංකය |
|---|---|---|
| ප්‍රස්ථාවනාව | | iii - xvii |
| සංඥාපනය | | xviii - xxix |

**ඛන්ධකය**

| | | | |
|---|---|---|---|
| 1. | ඛන්ධ විභංගය | 1 - 35 | |
| | i. | රූපස්කන්ධ නිර්දේශය | 2 |
| | ii. | වේදනාස්කන්ධ නිර්දේශය | 11 |
| | iii. | සංඥාස්කන්ධ නිර්දේශය | 15 |
| | iv. | සංඛාරස්කන්ධ නිර්දේශය | 17 |
| | v. | විඥානස්කන්ධ නිර්දේශය | 17 |
| | vi. | සූත්‍රාන්ත භාජනිය | 17 |
| | vii. | අභිධර්ම භාජනිය | 29 |
| 2. | ආයතන විභංගය | 36 - 44 | |
| | i. | සූත්‍රාන්ත භාජනිය | 37 |
| | ii. | අභිධර්ම භාජනිය | 41 |
| 3. | ධාතු විභංගය | 45 - 65 | |
| | i. | සූත්‍රාන්ත භාජනිය | 55 |
| | ii. | අභිධර්ම භාජනිය | 65 |
| 4. | සච්ච විභංගය | 66 - 99 | |
| | i. | දුක්ඛ සච්ච නිද්දේසය | 67 |
| | ii. | සමුදය සච්ච නිද්දේසය | 88 |
| | iii. | නිරෝධ සච්ච නිද්දේසය | 90 |
| | iv. | මග්ග සච්ච නිද්දේසය | 91 |
| | v. | සූත්‍රාන්ත භාජනිය | 91 |
| | vi. | අභිධම්ම භාජනිය | 98 |

| | | | |
|---|---|---|---|
| 5. | ඉන්ද්‍රිය විභංගය | 100 | - 103 |
| | අභිධම්ම | 101 | |
| 6. | පටිච්ච සමුප්පාද විභංගය | 104 | - 177 |
| i. | අවිජ්ජා පච්චයා සංඛාර | 106 | |
| ii. | සංඛාර පච්චයා විඤ්ඤාණං | 114 | |
| iii. | විඤ්ඤාණ පච්චයා නාමරූපං | 137 | |
| iv. | නාමරූප පච්චයා සළායතනං | 140 | |
| v. | සළායතන පච්චයා ඵස්සො | 144 | |
| vi. | ඵස්ස පච්චයා වෙදනා | 146 | |
| vii. | වෙදනා පච්චයා තණ්හා | 147 | |
| viii. | තණ්හා පච්චයා උපාදානං | 148 | |
| ix. | උපාදාන පච්චයා භවො | 150 | |
| x. | භව පච්චයා ජාති ආදි නිද්දේසය | 153 | |
| xi. | සුත්තන්ත භාජනිය | 154 | |
| xii. | අභිධම්ම භාජනිය | 165 | |
| 7. | සතිපට්ඨාන විභංගය | 178 | - 238 |
| i. | කායානුපස්සනා නිද්දේසය | 181 | |
| ii. | වෙදනානුපස්සනා නිද්දේසය | 217 | |
| iii. | චිත්තානුපස්සනා නිද්දේසය | 221 | |
| iv. | ධම්මානුපස්සනා නිද්දේසය | 222 | |
| v. | සුත්තන්ත භාජනිය | 237 | |
| vi. | අභිධම්ම භාජනිය | 237 | |
| 8. | සම්මප්පධාන විභංගය | 238 | - 249 |
| i. | සුත්තන්ත භාජනිය | 240 | |
| ii. | අභිධම්ම භාජනිය | 248 | |
| 9. | ඉද්ධිපාද විභංගය | 250 | - 254 |
| i. | සුත්තන්ත භාජනිය | 251 | |
| ii. | අභිධම්ම භාජනිය | 254 | |

| | | | | |
|---|---|---|---|---|
| 10. | බොජ්ඣංග විභංගය | 255 | - | 261 |
| i. | පඨම නය | 256 | | |
| ii. | දුතිය නය | 258 | | |
| iii. | සුත්තන්ත භාජනිය | 259 | | |
| iv. | අභිධම්ම භාජනිය | 261 | | |
| 11. | මග්ග විභංගය | 262 | - | 266 |
| i. | අභිධම්ම භාජනිය | 263 | | |
| 12. | ඣාන විභංගය | 266 | - | 311 |
| i. | සුත්තන්ත භාජනිය | 268 | | |
| ii. | අභිධම්ම භාජනිය | 307 | | |
| 13. | අප්පමඤ්ඤා විභංගය | 311 | - | 314 |
| i. | සුත්තන්ත භාජනිය | 312 | | |
| ii. | අභිධම්ම භාජනිය | 314 | | |
| 14. | සික්ඛාපද විභංගය | 315 | - | 318 |
| i. | අභිධම්ම භාජනිය | 315 | | |
| 15. | පටිසම්භිදා විභංගය | 319 | - | 327 |
| i. | සුත්තන්ත භාජනිය | 322 | | |
| ii. | අභිධම්ම භාජනිය | 323 | | |
| 16. | ඤාණ විභංගය | 327 | - | 387 |
| i. | එකකය | 333 | | |
| ii. | දුකය | 338 | | |
| iii. | තිකය | 339 | | |
| iv. | චතුක්කය | 343 | | |
| v. | පංචකය | 347 | | |
| vi. | ඡක්කය | 348 | | |
| vii. | සත්තකය | 349 | | |
| viii. | අට්ඨකය | 350 | | |

| | | | |
|---|---|---|---|
| | ix. නවකය | 350 | |
| | x. දසකය | 350 | |
| | xi. පඨම බල නිද්දේසය | 351 | |
| | xii. දුතිය බල නිද්දේසය | 364 | |
| | xiii. තතිය බල නිද්දේසය | 377 | |
| | xiv. චතුත්ථ බල නිද්දේසය | 379 | |
| | xv. පංච බල නිද්දේසය | 380 | |
| | xvi. ඡට්ඨ බල නිද්දේසය | 381 | |
| | xvii. සත්ත බල නිද්දේසය | 385 | |
| | xix. අට්ඨ නව දස බල නිද්දේසය | 386 | |
| 17. | ඛුද්දක වත්ථු විභංගය | 387 | 434 |
| | i. එකක නිද්දේසය | 388 | |
| | ii. දුක නිද්දේසය | 411 | |
| | iii. තික නිද්දේසය | 414 | |
| | iv. චතුක්ක නිද්දේසය | 419 | |
| | v. පංචක නිද්දේසය | 422 | |
| | vi. ඡක්ක නිද්දේසය | 425 | |
| | vii. සත්තක නිද්දේසය | 427 | |
| | viii. අට්ඨක නිද්දේසය | 428 | |
| | ix. නවක දසක නිද්දේසය | 430 | |
| | x. තෘෂණා නිද්දේසය | 431 | |
| 18. | ධම්මහදය විභංගය | 435 | - 440 |
| | නිගමන ගී | 440 | - 441 |

# සංඥාපනය

අභිධර්ම පිටකයේ සප්තප්‍රකරණයට ඇතුළත් විභංග ප්‍රකරණය සඳහා ලියන ලද විස්තර වර්ණනාව "සම්මොහ විනෝදනී" අට්ඨකථාව නමින් හැඳින් වේ. එකී ප්‍රකරණය පරිශීලනයේදී ඇතිවිය හැකි වැරදි වැටහීම් මුළාවීම් දුරුකිරීම යන තේරුම එම දෙපදයෙහි ඇත. විභංග ප්‍රකරණ දේශනා කිරීමට අරමුණු කරගත් ඛන්ධාදී අටළොස් මාතෘකා පිළිබඳව සංක්ෂේප දීර්ඝ අතිදීර්ඝ වශයෙන් කරනු ලබන විස්තර, ධර්මය සම්බන්ධයෙන් මෙන්ම සමකාලීන සමාජයේ විවිධ අංශ පිළිබඳව පූර්ණ අවබෝධයක් - දැනීමක් ලබාගැනීමට ඉවහල් වේ.

මෙම විස්තර පාලි භාෂාවට නැගීමේදී සම්පූර්ණයෙන්ම පාහේ ඇසුරුකොට තිබෙන්නේ පුරාණ සිංහල අටුවා ග්‍රන්ථයෝය. ඒවා මහා මහේන්ද්‍ර මහරහතන් වහන්සේ විසින් හෙළදිවට ගෙනෙන ලදුව සිංහල භාෂාවෙන් තබන ලද අටුවා යයි පාරම්පරික මතයයි. පුරාණ අටුවා ඇසුරු කළබව ග්‍රන්ථාරම්භයේදීම "**කරිස්සාමි විගාහෙත්වා පොරාණට්ඨ කථා නයං**" පැහැදිලි කරයි. අටුවා ආචාර්යවරුන්ගේ අදහස් උපුටා දක්වමින් ඒ ඒ ධර්ම කරුණු නිශ්චය කර තිබෙනු ද දක්නා ලැබේ. "**බුජ්ඣනකස්ස පුග්ගලස්ස අංගාති වා බොජ්ඣංගා**" ඒ බොජ්ඣංග විභංගයේ බොජ්ඣංග පදය පිළිබඳ නිර්වචනයක් අටුවා ඇදුරෝ දක්වති. අටුවා සහ අටුවා ආචාර්යවරුන්ට අතිරේකව "**පුරාණ**" ආචාර්ය සම්ප්‍රදායයේ මත ගෞරවයෙන් සලකා තිබේ. සම්මප්පධාන විභංගයෙහි කෙලෙසුන්ගේ අනුසය අවස්ථාව "**තාසු භූමිසු අසමුග්ඝාටිතා කිලෙසා භූමිලද්ධුප්පන්නාති සංඛං ගච්ඡන්ති**" සහ ඇත්කුල දහය හඳුන්වන ගාථාවද පුරාණ මතයකි. සමකාලීන සංඝ සමාජයේ ධර්ම විනයධර මහතෙරවරුන්ගේ අදහස් ඉතාමත් ගෞරවයෙන් පිළිගෙන ඇත්තේය. මෙහිදී මහාසුම්ම මහතෙරුන් සහ උන්වහන්සේගේ ශිෂ්‍යයින් දෙදෙනා සම්බන්ධයෙන් විශේෂයෙන් සඳහන් වේ. තිපිටක චූලනාග සහ තිපිටක චූලාභය යන දෙනම ධර්ම විනය සම්බන්ධයෙන් අවසාන තීරකවරුන් ලෙස පිළිගෙන තිබේ. ඉටු අනිටු පදනම "**ඉට්ඨානිට්ඨං නාම විපාක වසෙනෙව පරිච්ඡින්නං**" යයි තිපිටක චූලනාග මතය අවසාන තීරණය

විය. ඖලාරික සුඛුම භේදය පිළිබඳව චූලනාග චූලාභය දෙනමගේම අදහස් ගෞරවයෙන් උපුටා දක්වයි. පුරාණ සිංහල අටුවා, අටුවා ආචාර්යවරු, සම්භාවනීය මහතෙරවරු සහ පුරාණ ආචාර්ය සම්ප්‍රදාය ගෞරවයෙන් සලකන අතර වාද, විතණ්ඩවාද මත සාකච්ඡා කරමින් බැහැර කරන ආකාරය පෙනේ.

ඉහත සඳහන් මූලාශ්‍රවලට අමතරව මෙම අටුවා කරණයේදී විසුද්ධිමග්ග, අත්ථසාලිනී - ධම්සඟුණු අටුවාව, දීඝනිකාය - මහා නිදාන, මහා සතිපට්ඨාන සූත්‍ර ආදිය, මජ්ඣිම නිකාය - සතිපට්ඨාන, චූලතණ්හා සංඛය, මහා තණ්හා සංඛය, චූළළ වෙදලල, මහා වෙදලල, රට්ඨපාල සහ මාගන්ඩිය සූත්‍ර ආදිය, සංයුත්ත නිකායේ චූල නිදාන රුකෙඛාපම පරිවීමංසන යනාදි සූත්‍ර ආදි සූත්‍ර පිටකයේ බොහෝ තැන් උපුටා දක්වයි.

කරුණු විස්තර කිරීමේදී ඊට කලින් ලියැවුණු විසුද්ධිමග්ග ආදි ග්‍රන්ථවල ඒ ඒ පරිච්ඡේද හෝ මාතෘකා සඳහන් කරමින් ඒ ඒ ස්ථානවලින් විස්තර ලබාගැනීමට උපදෙස් දෙයි. විශේෂයක් ඇති අවස්ථාවල මෙහිම විස්තර දක්වයි. කරුණු විස්තර කිරීමේ ක්‍රමය හැඳින්වීමට බහුල වශයෙන් යොදාගනු ලබන්නේ 'නය' යන වචනයයි. ඊට අමතරව කම, ආකාර, නීහාර, වචන යොදාගෙන ඇත. සාමාන්‍යයෙන් ක්‍රමය, පිළිවෙළ, විධිය, ආකාරය යන අර්ථවල 'නය' යෙදී ඇත. සිංහල පරිවර්තනයේ බොහෝ සේ එම වචනයම යොදාගතිමි.

සමෙමාහ විනොදනී නම් අර්ථකථා වර්ණනාව කිරීමට ආරාධනා කර ඇත්තේ අදන්ධ ගති ඇති ශ්‍රේෂ්ඨ බුද්ධිමතෙක් වූ බුද්ධඝෝෂ ස්ථවිරයන් වහන්සේ කෙනෙකුන් යයි මෙම අට්ඨකථාව සම්මෝහවිනෝදනී යයිද නිගමන ගාථාවල දැක්වේ. නිගමන ගාථාවලින් පසුව එන පාලි ගද්‍ය ඡේදය හා පද්‍ය දෙක පසුකාලීනව එකතුකර බුද්ධඝෝෂ මහා ස්වාමීන් හඳුන්වා දෙන්නට උත්සාහයක් දරා ඇතැයි සිතමි. මගේ ඒ සිතිවිල්ල සනාථ කිරීමට කරුණු ඉදිරිපත් කරනවාට වඩා සමකාලීන සහ පසුකාලීන සමාජයේ බුද්ධඝෝෂ ආචාර්යවරයන් පිළිබඳව කෙතරම් නම් පිළිගැනීමක් ගෞරවයක් පැවතියේදැයි සිතීම ඉතා වැදගත් යයි කල්පනා කරමි. සිවුපිළිසිඹියා සහිත මාර්ගඵලාවබෝධය ලැබූ රහතන් වහන්සේ කෙනෙකු ලෙස ගෞරවාන්විත පිළිගැනීමක් තිබුණු අතර මහාවිහාර වංශය අලංකාර කළ මහා බුද්ධිමතකු ලෙස ද සලකා ඇත්තේය. පාලි ත්‍රිපිටකයෙහි අටුවා

ග්‍රන්ථ කීපයක් හැර හෙළටුවා සියල්ලම පාලි භාෂාවට නැගූ ආචාර්යවරයා ලෙස උන්වහන්සේ ථෙරවාදී බෞද්ධ ලෝකයේ ඉතාමත් ප්‍රකටය.

බුදුකැලි අටුවා හෙළයට නගා පවත්වාගෙන ආ හෙළටුවාවල ස්වභාවය පිළිබඳව තොරතුරු මෙම අටුවාවෙන්ද ලබාගත හැකිය. බුද්ධ ධර්මයෙහි හරය ලෙස සැලකෙන ත්‍රිවිධ ශික්‍ෂා ප්‍රගුණ කර චතුස්සත්‍යාවබෝධය ලැබීම විස්තර කිරීමට - පැහැදිලි කිරීමට සමකාලීන සමාජයේ චරිත රාශියක් උදාහරණ ලෙස ඉදිරිපත් කිරීම හෙළටුවාවල විශේෂ ලක්‍ෂණයක්ව පැවතියේය. සිව්වනක් පිරිසෙන්ම චරිත උදුරා ඇතත් භික්‍ෂු චරිතවලට ප්‍රමුඛස්ථානයක් ලබාදී ඇත්තේය. සීලය වේවා සමාධිය වේවා ප්‍රඥාව වේවා ප්‍රාගුණ්‍යයෙහි අප්‍රතිහත ධෛර්යය වීර්ය මතු නොව අපිස් සතොස් සලෙ පැවතුම් ධ්‍යාන අභිඥා සමාපත්ති මාර්ගඵල පිළිබඳ ගම්භීර ඥාණය එම චරිතවලින් ධ්වනිත වන්නේය. එම චරිත සම්බන්ධයෙන් පුළුල් තොරතුරු හෙළටුවාවල සඳහන් වන්නට ඇතිබවට කිසිදු සැකයක් නැත. පරිවර්තන කාර්යයේදී ඒ දීර්ඝ විස්තර අතහැර දැමීමට සිදුවී ඇත්තේය.

බුද්ධ ධර්මය සප්‍රාණව සජීවීව පැවති ඒ උදාර චරිත සංක්‍ෂේප වීම හා අතහැරී යෑම ධර්ම සංවේගය දනවයි. සමකාලීන සමාජයේ ආදර්ශ තලය වූයේ එම චරිත කථාය. ධර්මය ඇසීම දැරීම පිළිපැදීම වෙන වෙනවූ ක්‍රියාකලාප නොව ඒකාබද්ධව එකම අරමුණක් ඔස්සේ ගමන්කොට පල නෙලාගත් විශිෂ්ටාදර්ශයන් වූ එම විරාගත චරිත කථාවල වැදගත්කම ප්‍රමාණ කළහැකි වියතකු ඇතැයි නොසිතමි. ඉදිරිපත් වී ඇති චරිත කීපය ශ්‍රද්ධාවෙන් කියවා ධර්මාශ්වාදය විඳිනු මැනවි.

හෙළටුවා පාලි භාෂාවට නැගීමෙන් හෙළටුවා අභාවයට ගියේය යනු පිළිගැනීමකි. එහි සත්‍යයක් ඇති බවට වාදයක් නැත. එසේ වුවද එම හෙළටුවා අද පැවතියේ නම් අද වනවිට සිංහල භාෂාව පරිණාමය වී ඇති ආකාරය අනුව "රහදො වදානකි, රසස නැමි, වෙරියෙක් විද මැරි" වැනි වැකිවල අරුත් බිඳගැනීමට අරුත් වියකන් කීයක් ඇවසිවේදැයි සිතා බැලීම වටී. භාෂා සාහිත්‍යට වඩා ප්‍රමුඛත්වයක් ලබාදී ඇත්තේ ධර්මයේ ආරක්ෂාවට බව පැහැදිලි කරගැනීම අපහසු නොවේ. පාලි බස උගතෙකුට එදා අද යයි වෙනසක් නැතිව වටහා ගැනීමේ පහසුව ඇතිබව සිතීම වටී.

මෙම ග්‍රන්ථයට ඇතුළත් ඛන්ධ විභංගාදි අටළොස් විභංගයන් පිළිබඳව හැඳින්වීමක් විභංග ප්‍රකරණයේ පෙළ සිංහලයට නගා මුද්‍රණය කර ඇති විභංග ප්‍රකරණයේ 1 වන කොටසෙහි ඇතුළත් වේ. මේවා සියල්ලම ත්‍රිවිධ ශික්‍ෂාවට ඇතුළත් වේ. මේ එකිනෙකෙහි විස්තරවී ඇති ධර්මය නිවැරදිව ආසේවන භාවිත බහුලීකරණයෙන් බුද්ධ ධර්මය පිළිබඳව පූර්ණ දැනීමක් ලැබෙනවා මතු නොව ධර්මඥානය පාදක වීමෙන් කැමති කෙනෙකුට ධ්‍යාන අභිඥා සමාපත්ති උපදවා ගැනීමටත් ඉදිරියට යනු කැමැත්තාට කර්මාදි ආවරණ නොමැති නම් විපස්සනා භාවනා මාර්ගය නියම ලෙස අනුගමනය කිරීමෙන් මාර්ගඵලාවබෝධය සාක්‍ෂාත් කරගැනීමටද නොහැකි නොවේ. සමථ විපස්සනා භාවනා මාර්ගවලට වෙන වෙනම අරමුණු නියමවී ඇතත් විපස්සනා භාවනාවෙන්ද සමථය වඩා පරිකර්ම උද්ග්‍රහ පටිභාග නිමිති උපදවා අර්පණා නගා ධ්‍යාන උපදවා ධ්‍යාන පාදකකොට අභිඥාවන් සහ මාර්ගඵලාවබෝධය ලැබිය හැකියයි මෙහි පෙන්වාදී ඇත.

අපේ රටේ භාවනාව සම්බන්ධයෙන් විශාල පෙළඹීමක් ඇති බව දක්නට ලැබේ. භාවනාව සඳහා සිත් පහළවීම වුවද ඉතාමත් අගය කළයුතු ප්‍රවනතාවකි. භාවනා මධ්‍යස්ථාන ද බොහෝ තිබේ. භක්තිය පාදක වූ භාවනා වැඩීම් ද ඇති අපේ රටේ විවිධ පූජා (ආමිස) දෙස බැලීමේදී අපේ බෞද්ධයන් ගමන්කර ඇති ස්ථානය සම්බන්ධයෙන් කොහෙත්ම සතුටුවිය නොහැකිය. පිරිසිදු මනසට නිගාදෙන ලෙස භාවිතවන පිං වචන අරුත් සුන්බවට පත්වී ඇත. එක් නිදසුනක් නම් සමාධි යයි. මේ වචනයේ නියම බෞද්ධ අර්ථය වන්නේ ධ්‍යාන හෝ මාර්ගඵල ලැබීමට පාදක වූ සිතේ එකඟකමය. මළවුන් වළ දැමූ ස්ථානත් සමාධි නමින් හඳුන්වන්නේ වරදවා වටහා ගැනීමෙනැයි සිතමි. සමහර ආගමික විශ්වාස අනුව මළවුන් සමාදානයේ සැතපෙනවා යයි භාවිත වේ. සමාදානය හා සමාධිය වචන දෙකට එක තේරුමක් නැත. පංචේන්ද්‍රියන් පිනවන කාමච්ඡන්දාදී කෙලෙසිලි සිත් ඇති කරන කලාව නමින් කරන සාහිත්‍ය කලාංගවල මේ වචනය කිසිම හිරියක් බියක් නැතිව යොදාගන්නේ සම්මෝහය නිසාම යයි සිතමි. නො එසේවුව දැන දැනම එහි අර්ථය හැල්ලුකර ධර්මයට පහරගැසීම සඳහාය. විවිධ පූජාවල නායකත්වය දරණ අපේ ස්වාමීන් වහන්සේලා ඒවායේ හරය ගැන සිතාබැලීමට කාලය පැමිණ ඇතැයි විශ්වාස කරමි. බෞද්ධයාට භක්තියක් කෙසේවත් අවශ්‍ය නොවේ. එය දැනවීමට යොදන සියළුම

ක්‍රියාවන් ධර්ම විරෝධී වේ. තෙරුවන, මහබෝ, මහසෑ පිළිබඳව ලෞකික අපේක්ෂාවෙන් තොරව සිතේ ප්‍රසන්නතාව ඇතිකර ගැනීම සහ කුසලක්‍රියා කෙරෙහි නොපසුබට වීම නම් අත්‍යවශ්‍ය වේ. අන්ධ භක්තියෙන් බෞද්ධයාට කිසිවක් නොලැබේ. එකම පලය වන්නේ මුළාවී අඳුරේ අතපත ගෑමත් කාලය හා මුදල් කාබාසිනියා කර ගැනීමත් පමණි.

භාවනාවේ නිසි ප්‍රයෝජන ලබාගැනීමේ නිවැරදි මාර්ගය මෙම ග්‍රන්ථයේ මනාව පැහැදිලි කරයි. භාවනාවට පෙර කායික මානසික පේවීමක් අවශ්‍ය වේ. ශාරීරික ආබාධ ඇත්නම් ඒවාට ප්‍රතිකාර ලබාගෙන කය ද මනසේ ඇලීම් ගැටීම් (රාග ද්වේෂ) වල දැඩි ප්‍රවනතා යම් ප්‍රමාණයකට සමනය කරගෙන මනස ද නිරෝගව තබාගත යුතු වේ. ඊළඟ පියවර කායික වාචසික සංවරය ඇතිකරන සීලයක් සමාදන් වීමය. පන්සිල් නිත්‍ය සීලය නිසා ඊට වැඩි ආජීවාෂ්ටමක, අෂ්ටාංග උපෝෂථය යෝග්‍ය වේ. මේ පූර්ව කෘත්‍යය සම්පූර්ණ නොකර හිටිගමන් භාවනා මධ්‍යස්ථාන කරා යෑමෙන් පලක් ප්‍රයෝජනයක් ඇති නොවේ.

පෙර සූදානම ඇති යෝගාවචරයා (භාවනා කරනු කැමති අය) සුදුසු ගුරුවරයෙකු ඇත්නම් ඔහුගේ උපදෙස් අනුව තම චරිතයට ගැලපෙන කමටහනක් ලබාගත යුතුය. ශ්‍රද්ධා බුද්ධි චරිත නම් දස අනුස්සතිවලින් කමටහන ලබාගත හැකිය. රාග චරිතය නම් කායගතා සතිය ද ද්වේෂ නම් වර්ණ කසිණයක් ද මෝහ විතක්ක චරිත නම් ආනාපාන සතිය ද ඕනෑම චරිතයකට පඨවි කසිණය ද කමටහන් අරමුණු ලෙස දළ වශයෙන් ගැලපේ. විපස්සනා භාවනාව අනිච්ච ලක්ෂණය වඩා පහසුවෙන් අනුගමනය කළහැකි වේ. මේ සඳහා සතර සතිපට්ඨානවල කායානුපස්සනාවේ දීර්ඝ විස්තරයක් සතිපට්ඨාන විභංගයේ දක්වා ඇත. එහි තච පංචකය අනුලෝම පටිලෝම වශයෙන් වාචෝද්ගත කිරීමට පමණක් අඩමසක් ගතවේ. කායානුපස්සනාවේ කොටස් තිස්දෙක සජ්ඣායනාවට පමණක් මාස හයක් අවශ්‍ය වේ. පටික්කුල බව මෙනෙහි කිරීමෙන් ද අර්පණා උපදවා ගතහැකිය. පඨවි ආදි කසිණ භාවනාවේදී පඨවි සංඥාව මෙනෙහි කරන ආරම්භක අවස්ථාව පරිකර්ම භාවනාව වේ. එය ඉදිරියට කරගෙන යෑමේදී උද්ග්‍රහ නිමිත්ත පහළ කරගත හැකිය. කසිණ මණ්ඩලයට සමාන මණ්ඩලයක් සිතට නගා ගැනීමේ අවස්ථාවකි ඒ. බාහිර මණ්ඩලය නැතිව සිතේ පවත්වාගෙන යන මේ උද්ග්‍රහ නිමිත්ත නැවත නැවත මෙනෙහිකර පිරිසිදුවීමෙන් වලාගැබින් නිකුත් පුන්සඳක් සේ පැහැදිලිව ප්‍රභාස්වරව පටිභාග නිමිත්ත පහළ වේ.

මානසික සුවය සඳහා මෙය ඕනෑම ප්‍රමාණයකින් විශාල කරගත හැකිය. එහි වසීභාවයට පැමිණීමෙන් පසිඳුරන්ට ගොදුරුවන වෙනත් සියළුම අරමුණුවලින් නිදහස්වී අප්‍රමාණ මානසික සවයක් එයින් ලැබේ. එය පාදක කරගෙන අර්පණා උපදවා ධ්‍යාන ලබාගැනීමේ පසුබිම සකස්කර ගතහැකිය. විතක්කාදි අංග පසින් යුත් පළමුවන ධ්‍යානය විතක්ක විචාර හැර දෙවන ධ්‍යානය ප්‍රීතිය ද හැර තෙවන ධ්‍යානය සුඛය ද හැර උපේක්ඛා ඒකග්ගතාවෙන් යුත් සතරවන ධ්‍යානය ද ලබාගෙන ඒවා පදනම් කරගෙන විශේෂ නුවණ - දිබ්බචක්ඛු ආදි අභිඥා උපදවාගෙන පියවි ඇසින් නොපෙනෙන රූප පියවි කනින් නොඇසෙන ශබ්ද ආදිය දැකීමට ඇසීමට සමත් ඤාණය ලබාගත හැකිය. එහෙත් ඒවා ලෞකිකය. වෙනස් වියහැකිය. ඉදිරියට යනු කැමැත්තා සච්ච විභංගයේ ඇති උපදෙස් අනුව ගමන්කොට සත්‍යාවබෝධය කරයි.

සම්මප්පධාන විභංගයේ නිදසුනකින් පෙන්වන්නේ, සමකාලීන භික්ෂු සමාජයේ සාමණේර භික්ෂූන් වහන්සේ නමක් පවා ලෞකික ධ්‍යාන පදනම් කරගත් ඉද්ධිවිධාදි අභිඥා උපදවාගෙන සිටීමය. මාර්ගඵල ලාභී මහතෙර නමකගේ ගෝලයකු මහාසෑය වැඳීමට ගුරුවරයාට පෙරහන්කඩෙන් මල් ලබාදුන් පුවත සහ දෙඅතින් ඉරහඳ මුවාකළ හැකි මහා ඍද්ධියක් තිබුණු කැලණිය අසල ගමක විසූ උපාසකතුමාගේ කතාපුවත ප්‍රමාදයෙහි ආදීනව දැක්වීමට නිදර්ශන වශයෙන් දක්වා ඇත.

පරමාදර්ශී භික්ෂු ජීවිත ඣාන විභංග නිද්දේසයේ එයි. එක්විසි අනේසනයෙන් වැලකී සතර සංවර සීලයෙන් යුක්තවූයේ මතුද කාමච්ඡන්දාදි නීවරණයන් දුරුකිරීමෙන් සමාහිත ඣානලාභී භික්ෂූන් වහන්සේ නමක් දැකගත හැකිය. සමකාලීන සමාජයේ සාමණේර භික්ෂූන් වහන්සේ පවා අවම වශයෙන් සැලකෙන මේ මානසික තලයේවත් රැඳී සිටියහ. ඉන් ඉදිරියට වැඩිය මහතෙරවරුන් පිළිබඳ බොහෝ නිදර්ශන ලබාගත හැකිය.

සමකාලීන සමාජයේ භික්ෂු ශාසනය ඉතා විශිෂ්ට විය. බොහෝ භික්ෂූන් වහන්සේ පිඬුසිඟා වඩිමින් ආධ්‍යාත්මික ගුණ වැඩූහ. උන්වහන්සේලා අතර පැවති ඉතාමත් ගෞරවයට පාත්‍රවූ වතාවතක් ලෙස සඳහන් වන්නේ "ගතපච්චාගත වත"ය. එහි වචනාර්ථය යනලද සහ එනලද යන්නය. පිඬුසිඟා වැඩීම සහ ආපසු වැඩීම දක්වාම සිත කමටහන් අරමුණකින් තොර නොවීම මෙහි වතාවතයි. උදේම අවදිව

මළුපෙත්මං හැමද ත්‍රිවිධ චෛත්‍ය වන්දනා කොට ඇදුරු උවදෑ වත් දක්වා උදේම පිඬුසිඟා යන්නේ කමටහන් අරමුණක් සිතේ තබාගෙනය. උදේ පිණ්ඩපාතයට කැඳ පිළිගෙන එකල ගම්වල පැවති ආසන සාලාවකට ගොස් කැඳ වළඳා දහවල පිඬුසිඟා වළඳා විහාරයට වඩින විට ද කමටහන සිතෙන් බැහැර නොකරයි. මෙය ගතපච්චාගත වතයි. සමූහයක් සමග වෙසෙන භික්ෂූන් වහන්සේ ද කුමන ඉරියව්වකදී හෝ කෙලෙස් සිතිවිලි ඇති වුවහොත් ඒ ඉරියව්වේදීම ඒවා දුරුකිරීමට සබ්‍රහ්මචාරීන් සමග කතිකා කරගනිති. පිණ්ඩපාතේ වඩිනවිට යම් යම් දුරප්‍රමාණ අනුව ගස් ගල් ආදි ලකුණුවල සංඥාවෙන් කමටහන මෙනෙහි කරමින් උපදින කෙලෙස් සිතිවිලිවලට නිග්‍රහ කරමින් ඒවා දුරුකරමින් වඩිති. කෙලෙස් සිතිවිලි මැඩීමට නොහැකි වුවහොත් ගමන නවතා සිටිති. පිටුපසින් වඩින ස්වාමීන් වහන්සේ ද නැවතී සිටිති. තමාගේ විතර්ක සිතිවිල්ල පිටිපසින් පැමිණි ස්වාමීන් වහන්සේද දැනගන්නා ලදැයි තමාට චෝදනා කර විදර්ශනා වඩා ආර්ය භූමියට පැමිණෙති. එසේ නොහැකි වුවහොත් එතැන හිඳගනිති. එසේත් කොට නොහැකි වුවහොත් විෂ්කම්භන වශයෙන් කෙලෙස් සිතිවිලි යටපත් කොට කමටහන මෙනෙහි කරමින් වඩිති. කමටහනින් තොරව පියවර එසවුවහොත් ආපසු තබා පෙර ස්ථානයටම එති. මෙසේ නැවති නැවතී ආපසු යමින් කමටහන රකිති. මේ වතාවත ආරක්ෂා කළ ආලින්දකවාසී මහා ඵුස්සදේව මහතෙරුන්ගේ කතාව සිත් ඇදගනී.

උන්වහන්සේ අවුරුදු දහනවයක් ගතපච්චාගත වත පුරමින් විසූහ. උන්වහන්සේ පිඬුසිඟා වඩිනවිට අතරමග කුඹුරු සාමින් වපුරමින් කොල මඩිමින් සිටි මිනිස්සු උන්වහන්සේ යමින් හිඳගනිමින් ආපසු යමින් සිටිනවා දැක හාමුදුරුවන්ට පාර වැරදිලා නැතහොත් සිහිමුළා වෙලා යයි කතාවෙති. උන්වහන්සේ ඒවා ගණන් නොගෙන කමටහන යුත් සිතින්ම මහණදම් පුරමින් විසිවන වස ඇතුළත රහත්බවට පැමිණියහ. කළුවැල් මණ්ඩපවාසී මහානාග තෙරුන් වහන්සේද එකී වත පුරමින් පිඬුසිඟා වඩිනවිට දිය උගුරක් තබාගෙන වඩිති. කමටහනට බාධාවෙතියි වචනයක්වත් පිට නොකිරීම සඳහා ඒ උපාය යොදාගනිති. ගලම්බුතිත්ථ විහාරයෙහි ඇසළ පුණු පොහෝදා වස් එළඹී පනස්නමක් භික්ෂූන් වහන්සේ අපූරු සම්මුතියකට එළඹුණහ. රහත් වනතුරු ඔවුනොවුන් අතර කතා නොකර සිටීම එම සම්මතයයි. පිඬුසිඟා වඩිනවිට ද දියඋගුරක් තබාගෙන යති. මිනිසුන් සමග හෝ ඔවුනොවුන් අතර ද කතාබතාවක් නොමැතිවීම

මිනිසුන්ට මෙය විමතියකි. විවාදයක් නිසා කලහයක් වන්නට ඇතැයි විහාරයට ගොස් බලද්දී භික්ෂූන් දෙනමක් එකට සිටිනවා නොදුටහ. නුවණැති පුරුෂයෙක් මෙසේ කීය. මෙතන කලහකාරීන් සිටින තැනක් නොවේ. බෝමළු ආදිය හොඳට ඇමදලා. පානීය පරිභෝජනීය ජලය පිළිවෙළට තබලා. ඒ නිසා ඔව්හු තවදුරටත් භික්ෂූන් ගැන නොසොයා ගියහ. ඒ භික්ෂූන් වහන්සේලා පනස්නම වස්කාලය තුළ රහත්ව මහා විසුද්ධ පවාරණයෙන් වස් පවාරණය කළහ.

අප්පමඤ්ඤා විභංගය සර්වකාලීන සනාතන ධර්මයකි. මානව සමාජය ආලෝක කරයි. සියළුම සතුන් අරබයා සිතේ පහළ කරගන්නා මෛත්‍රී සහගත චේතනා, දුක්විඳින සතුන් අරමුණුකර හදවත කරුණාවෙන් ඉතිරීම, සැප විඳින සතුන් අරමුණුකර සිතේ ඇතිවන සතුට, මනාප අමනාප දෙකින් තොර උපේක්ෂාව යන මේ චර්යාවන් ක්‍රියාත්මක වනවිට ද්වේෂය, වෛරය, ක්‍රෝධය, ඊර්ෂ්‍යාව, උද්ධච්චය යනාදී සිත දූෂ්‍ය කරන ආවේග සිතින් බැහැර කෙරේ. ද්වේෂය හා සමාන පිළිලක් සමාජයට තවත් නැත. සාමාන්‍ය ලෝකයා තමාට ගැහැටක් වන මිනිසුන්ට පමණක් නොව සතුන් හා ගස් ගල් ආදී අවිඤ්ඤාණක වස්තු කෙරෙහිද කිපී එකට එක කිරීමට - පලිගැනීමට පසුබට නොවේ. අද මෙය තමාගේ සිතැඟි ඉටුකර ගැනීමට මුළු සමාජයම පෙළන තත්වයට පත්වී තිබේ. මෙහි ඇති දර්ශනය වන්නේ පුරාණ හමුරාබි රජුගේ කාලයේ සිට එන "ඇසට ඇසක් දතට දතක්" වේ. වෛදික දර්ශනය ද එය අනුමත කරයි. භගවත් ගීතාව නිදර්ශන සපයයි. මහා භාරතය රාමායනය පුරා ඇත්තේද එයයි. අපේ රටේ බොහෝදෙනා දෙවියන් අදහා පොල් ගසා විවිධ පුදපූජා පවත්වා පිටකරන්නේ මේ ද්වේෂය නොවේදැයි කල්පනා කිරීම වටී. බෞද්ධ දර්ශනය ඊට හාත්පසින්ම වෙනස්ය. ද්වේෂය කර්මන්‍ය කිරීම නොව අකර්මන්‍ය කොට පලවාහැරීම එහි මූලික හා ප්‍රධාන ලක්ෂණයයි. මෙය මෙම ග්‍රන්ථයේ පැහැදිලිව ඉදිරිපත් කරයි. ද්වේෂය පදනම් වුවහොත් කිසිම ගුණයක් නොරඳයි. තමා විසින් වපුරාගත් අස්වැන්නක් කපාගන්නා ලෙස සමහරු ද්වේෂය උපතින්ම ගෙනඑති. ඔවුනට වුවද පිළිසරණක් මෙහි පෙන්වයි. තමාට අන්‍යාගෙන් පලප්‍රයෝජන ලබාගත හැක්කේ ද්වේෂ කිරීමෙන් නොවේ. බෞද්ධයා භාවනාවක් වශයෙන් පුරුදුකරන මෛත්‍රීය හා සමාන බලයක් මිහිපිට නැතිවග සම්මා සම්බුදුන් සිය චරිතාපදානයෙන් ඔප්පුකර ඇත. තමන් වහන්සේ විනාශ කිරීමට රා පොවා පිස්සු වට්ටවා එවූ ඇතාගේ වෛරී හිඳී සිහි එලවා බුදුරදුන්

ඉදිරියේ දනගැසුවේ ඇයි? බුදුරදුන්ගේ මෙත ඇතාගේ සිත තුළද ක්‍රියාත්මක වූ නිසාය. මේ ප්‍රායෝගික සත්‍යය අප අත්හදා බලනවාද? අපේ සතුරන් නිසා අපට සිදුවන සියළුම ගැහැට කරදර විනාශ නවතා දැමීමට ඔවුන් විනාශ කිරීම පිළියමක් නොවේ. ඔවුන් මිතුරන් කරගැනීම හැර වෙන පිළියමක් නැත.

පටිසම්භිදා විභංගයෙහි අත්ථ ධම්ම පැහැදිලිකර නිරුත්ති පටිසම්භිදාව උදාහරණ කතාවස්තු සමග විස්තර කරයි. සිව්පිළිසිඹියා සහිතව රහත්වීමෙන් සියළු භාෂාත් අන් සියළු දේත් වැටහෙතැයි විශ්වාසයක් පවතී. ඊට මුල් නැතිවග මෙහි එන විස්තර පහදයි. නිරුක්තිය ශබ්දය අරමුණුකර ඇතිවන දැනීමකි. අද වර්ණයද එකතුකළ යුතුය. සිය බස සභාව නිරුත්තියයි. ස්වකීය භාෂා ව්‍යවහාරය පිළිබඳ දැනීම නිරුත්ති පටිසම්භිදාව වශයෙන් විස්තර වෙයි. සමහර කෙනෙක් භාෂා කීපයක් ඉගෙන ගනිති. තිස්සදත්ත හාමුදුරුවෝ එවැනි උගතෙක් වූහ. සමකාලීනව පැවති භාෂා දහඅටක් උන්වහන්සේ දැන සිටියහ. පටිභානය පැහැදැලිවීමට කරුණු පහක් පෙන්වයි. අධිගම, පරියත්ති, සවණ, පරිපුච්ඡා, පුබ්බයෝග ඒ පහයි. පුනර්වසු කෙළෙඹිපුත් තිස්ස ස්වාමීන් වහන්සේ භාරතයට වැඩමකොට යෝනක ධම්මරක්ඛිත මහතෙරුන් සමීපයෙහි ධර්මය උගත් අධිගම ලාභියෙකි. තිස්සදත්ත නාගසේන හිමිවරු පරියත්තිය පැහැදිලිව වටහාගත්තෝ වෙති. ධර්ම ශ්‍රවණ පටිසම්භිදාව පැහැදිලි කරගත් කෙනෙකි සුධම්ම සාමණේර ස්වාමීන් වහන්සේ.

ඤාණ විංගයෙහි චක්ඛු ආදි පංච විඤ්ඤාණ, මනෝ විඤ්ඤාණ, මනෝ විඤ්ඤාණ ධාතු මේවායෙහි කාර්ය පැහැදිලි කරන අතර පංචද්වාරික මනෝද්වාරික ප්‍රභේද විස්තර කරයි. ඒ අනුව කුසලාකුසල තත්වයන් දැනගැනීමේ බලය පංචවිඤ්ඤාණාදියට නැත. සාමාන්‍ය පිළිගැනීම ඇස රූපය හා එක්වීමේදී උපදින චක්ඛු විඤ්ඤාණයට රූපය සම්බන්ධයෙන් දැනීමක් ලැබෙනවා යන්නය. මෙහි එය බැහැර කර ඒවායේ කාර්ය වශයෙන් "චක්ඛු විඤ්ඤාණං පනෙත්ථ දස්සනමත්තමේව හෝති" චක්ඛු විඤ්ඤාණයට කළහැක්කේ දැකීම පමණකි. සෝත සවණමත්තං ඝාන සායනමත්තං ජිව්හා සායනමත්තං කාය ඵුසනමත්තං යයි දක්වා ඇත. පංචවිඤ්ඤාණ මනෝවිඤ්ඤාණ මනෝවිඤ්ඤාණ ධාතුවලට කුසලාකුසල ධර්ම දැනගැනීමේ ශක්තියක් නැත. එය තිබෙන්නේ මනෝද්වාරික ජවනයට පමණය. කාමාවචර මහග්ගත නිබ්බාණ සියළුම භේදයන් පහළවන්නේ මනෝද්වාරික ජවනයෙහිය.

නිදීම අවදිවීම සිහින පෙනීම පංචද්වාරික සිතින් නොව මනෝද්වාරිකයෙන්ම යයි ඒත්තු ගන්වයි. භවාංග සිත කැඩී චිත්ත වීථියක් ගමන් කරන ආකාරය සහ පංචද්වාරාවජ්ජන මනෝද්වාරාවජ්ජන ක්‍රියා කරන ආකාරය සාම්ප්‍රදායිකව විස්තර වේ. සිහිනෙන් කරන කියන සිතන කර්මවල කුසලාකුසල විභාගය දක්වා තිබීම විශේෂයකි. ප්‍රතිසන්ධිය ලබාදීමට බලවත් නැතත් කුසල අකුසල අව්‍යාකෘත සිදුවන අයුරු පහදයි. ආනන්තරිය කර්ම විභාගය මේ කොටසේ විශේෂයක් ලෙස සඳහන් කළ හැකිය. සංඝ භේදයේ නියම ස්වරූපය පහදා එහි විපාකය කල්පයක් පවතින අයුරුත් පෙන්වා දෙයි.

ගති උපධි කාල ප්‍රයෝග සම්පත් විපත් සෝදාහරණව බ්‍රාහ්මණ තිස්ස භය කාලය ආශ්‍රයෙන් පැහැදිලි කරයි. මිනිසුන් මුහුණපෑ තත්වයත්, භික්ෂූන් වහන්සේ ජීවිත ගෙවූ ආකාරය හද කම්පාකරවන අයුරින් ඉදිරිපත් වී ඇත්තේය. මේ කාලයේ වැඩසිටින මහා සෝණ ස්වාමීන් වහන්සේගේ චරිතය ඉතා ගෞරවයෙන් සඳහන් කරයි. ගිරිගාමකණ්ණවාසී චූල සුධම්ම තෙරුන්ට කූටකණ්ණතිස්ස රජතුමා කළ උපස්ථානය සිත් කාවදින සේ කියයි.

මෙම ග්‍රන්ථයේ ඛන්ධාදි අටළොස් විභංගයන්ගේ අර්ථ වර්ණනා ඉදිරිපත් කිරීමේදී නිදසුන් වශයෙන් සමකාලීන සමාජයේ බොහෝ තොරතුරු ඇතුළත් වී තිබේ. කුතුහලය විශ්මය මෙන්ම ශ්‍රද්ධාව ගෞරවය දනවන එබඳු තොරතුරු ඉතා සංක්ෂේපයෙන් හෝ සඳහන් කිරීම පාඨක රුචිය වඩතැයි සිතමි. සමකාලීන සමාජයේ (මහින්දාගමනයේ සිට හෙළටුවා පාලියට නගන කාලය දක්වා) සංඝ සමාජය උත්තරීතර තත්වයක පැවතිණ. බෞද්ධ සිව්වනක් පිරිසම සිටිය මෙම යුගයේ භික්ෂු භික්ෂුණී සාසන සිල්වත් ගුණවත් බව ඉක්මවා ගිය ධ්‍යාන අභිඥා සමාපත්ති මාර්ගඵල පසක් කළ අවස්ථාවලින් පිරිපුන් විය. සිංහල ද්වීපයේ එක් කලෙක මාර්ගඵල නොලත් එකම භික්ෂූන් වහන්සේ නමක්වත් නොසිටිබව සඳහන් වීම අද අපට විශ්මයට කරුණක් නොවන්නේද? ධ්‍යාන අභිඥා සමාපත්ති ලාභීන් ගැන කවර කථාද. මෑතදී බුද්ධශාසනය බැබළවූ රේරුකානේ චන්දවිමල මාහිමි, බලන්ගොඩ ආනන්ද මෛත්‍රී මාහිමි චරිත දෙස ශ්‍රද්ධාවෙන් බලන්නෙකුට එතරම් පුදුම වියයුත්තක්ද නොවේ. වළගම්බා රාජ සමයේදී අප්‍රතිහත ධෛර්යයෙන් ධර්මය ආරක්ෂා කළ මහතෙරුන් අධිගම ලාභීහු වෙති. ඤාණ විභංගයෙහි සඳහන් චූලසීව ඉසිදත්ත මහා සෝණ හිමිවරු කාලීන සංඝ සමාජයේ ප්‍රමුඛයෝ වූහ.

සිතුල්පව්වේ සහ තිස්සමහාරාමයේ රහතන් වහන්සේලා විසිහතර දහසක් වැඩසිටියහ. භික්ෂූන් වහන්සේලා බොහෝසෙයින්ම පිණ්ඩපාතයෙන් යැපුණහ. හීල දවාල දෙකම එසේ විය. උදේ දානයට බොහෝසෙයින් පෝෂ්‍යදායි කොලකැඳක් විය. දවල්ට ගිතෙල් සකුරු පලාවර්ග ලුනුමාළු සහිත දානය විය. දානය වැළඳීමට සෑම ගමකම පාහේ දාන සාලාවක් විය. ගම්වල පැවති ආසන සාලාවල වැඩහිඳ රහත් නොවූ එකම ආසනයක්වත් නොවීය. කුළුපග ගෙවල්වලට වැඩ දානය වැළඳීමේ පුරුද්දක්ද විය. මෙය බුද්ධ කාලයේදී ද පැවතිණ. භික්ෂුණී සාසනය නිසා සමකාලීන සමාජයේ කාන්තාවන්ට විශාල සෙතක් සැලසුන වග භික්ෂුණී ආරාමවලින් පෙනී යයි. සාමණේර සාමණේරීන් එකට සහභාගි වී ඉගෙනගත් පන්තියක් මහසෑමළුවේ පැවතිණ. එහිදී ඉදිරිපසින් සාමණේරයෝද පිටුපසින් සාමණේරියෝද හිඳගෙන ඇත්තාහ.

බොහෝ රජවරු තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාවෙන් යුක්ත වූහ. සංඝෝපස්ථානය අව්‍යාජවම කළහ. අසනීප වූ අවස්ථාවල සියතින්ම උපස්ථාන කළහ. තිස්ස රජතුමා සෑගිරිවාසී භික්ෂූන් වහන්සේට (2000කට පමණ) දිනපතා දන් දුන්නේය. ඇමතිවරුන්ගේ ගෙවල්වල ද දානය සඳහා ආසන පනවා තිබිණ. චිත්ත ඇමතිතුමාගේ ගෙදර හෝරා ස්ථම්භයක් විය. ඒ ඔරලෝසු කනුව නිසා පහසුවෙන් වෙලාව බලාගැනීමට හැකිවීයයි සඳහන් වේ. රජු සහ ඇමතිවරුන් රට පාලනය කළේ ජනතාවගේ කැමැත්ත අනුවය. ජනමතය ධාර්මිකව සකසන ලද්දේ භික්ෂූන් වහන්සේ විසිනි. සම්මත සදාචාරයට පටහැනිව රට පාලනය කරනවිට ජනතා විරෝධය නිසා යථා පාලනය ඇතිවිය. ඇමතිධූර අතර සබ්බකම්මික නම් ඇමති ධූරයක් විය. එය අපේ පාර්ලිමේන්තුවේ පැවති කාර්ය නියමයක් නැති ඇමති ධූරයට සමාන වන්නට ඇත. අපරාධවලට දඬුවම් පැමිණවීය. හිරේ දැමීමට බන්ධනාගාර විය. තරාතිරම නොබලා දඬුවම් දී තිබේ. ඊට ඇමතිවරු කියා විශේෂයක් නොවීය. නගර නිර්මාණය වාස්තු විද්‍යාව උසස් මට්ටමේ පැවතිණ. ආයුර්වේද වෛද්‍ය ක්‍රමය දියුණුව පැවතිණ. ශල්‍යකර්ම නිසිපරිදි විය. සැත්කටු භාවිතය ශාලක්‍ය ක්‍රම සහ නාගමණ්ඩලික පිරිත සර්පයන් දමනය කරන මන්ත්‍ර හා සෙත්ශාන්ති ආදිය භාවිත විය. කර්මාන්ත ආයතන ශිල්පායතන පැවතිණ. බටපොතු වේවැල් මැටි සම් කර්මාන්ත හා රෙදි විවීම දියුණු තත්වයෙන් විය. ප්‍රධාන ජීවනෝපාය වූ කෘෂි කර්මාන්තය හා නගුල් ආදි කෘෂි උපකරණ පිළිබඳ සඳහන් වන අතර නැව් කර්මාන්තය හා කරත්ත භාවිත විය.

කරත්ත මගින් ජලය සපයා ඇත. මේවා පිළිබඳව විස්තර ඤාණ විභංගයෙහි විජ්ජාට්ඨානං පදයට සපයා ඇති විස්තරවලින් දැනගත හැකිය.

පන්සිල් නිත්‍ය සීලය වශයෙන් ඉතා උතුම් ලෙස රැකීම ද ඊට ඉහළ අටසිල් ආදිය වාරිකව රැකීම ද සාමාන්‍ය ලක්‍ෂණය විය. ගවමස් කෑම නීතියෙන් දඬුවම් ලැබිය හැකි වරදකි.

මේ යුගයේ ඉතාමත් සියුම් මිනුම් ක්‍රම භාවිත විය. රෝමුවත් ගසක් ශරීරයට කාවැදී ඇති කොටසේ දිග ලික්ඛාවක් යයි සඳහන් වේ. එය මිලිමීටරයෙන් එකසිය තිස්හතෙන් (1/137) කොටසකි. ඊට වඩා ක්‍රමයෙන් සියුම්වන රථරේණු, තජ්ජාරි, අණු, පරමාණුවලින් ද මිනුම් කටයුතු සිදුකර ඇත. එකල භාවිත වූ දිග මැනීමේ චක්‍රය මෙසේ විය.

| | | | |
|---|---|---|---|
| පරමාණු | 36 | අණු | 1 යි |
| අණු | 36 | තජ්ජාරි | 1 |
| තජ්ජාරි | 36 | රථරේණු | 1 |
| රථරේණු | 36 | ලික්ඛා | 1 |
| ලික්ඛා | 7 | ඌකා | 1 |
| ඌකා | 7 | ධඤ්ඤමාය | 1 |
| ධඤ්ඤමාය | 7 | අඟල් | 1 |
| අඟල් | 12 | වියත් | 1 |
| වියත් | 2 | රියන් | 1 |
| රියන් | 7 | යෂ්ටි | 1 |
| යෂ්ටි | 20 | උසභ | 1 |
| උසභ | 80 | ගවු | 1 |
| ගවු | 4 | යොදුන් | 1 |

යොදුනට කි. මී. 20 ක් පමණ වේ. සැතපුම් 12 1/2 ක් පමණය.

පැරණි වාරි කර්මාන්තය සඳහා සියුම් මැනුම් ක්‍රම භාවිත විය.

**බී.එම්.පී. බාලසූරිය**

**14, කුලියාපිටිය පාර,**
**හෙට්ටිපොල.**
**දු.ක. 037-2291175**

## සම්මෝහ විනෝදනී නම් වූ

# විභංග අට්ඨකථාව

### නමෝ තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස

**ඒ භාග්‍යවත් වූ අරහත් වූ සම්මා සම්බුදුරජාණන් වහන්සේට නමස්කාරය වේවා !**

**සිව්සස් දුටු මුනිඳු - දම්සඟුණු සිව් අයුරෙන්**
**දෙසා සම්බුදු රජ - අනතුරුව එම දෙසුමෙන්**

**බුදුදහමෙ ඇතුළත් - අටළොස් ගණන් අතරෙහි**
**කඳු ඈහි අටළොස් - සපිරුණු බෙදුම් විසිනා**

**විභංගය දෙසූ බුදුහු - එහි වැනුම් පිළිවෙළ මෙහි**
**පැමිණැති හෙයින් දැන් - එයරුත් වැනුම සතුටින්**

**කරමි දැන හැඳිනම - පොරණ අටුවා නය'යුරු**
**සදහමට ගරුකොට - එයසතු සන්සුන් සිතින්**

## 1.
## ඛන්ධ විභංගය

පඤ්චක්ඛන්ධා; රූපක්ඛන්ධො.......... විඤ්ඤාණක්ඛන්ධො මෙය විභංග ප්‍රකරණයේ ආරම්භ වූ ස්කන්ධ විභාගයෙහි සූත්‍රාන්ත භාජනිය නම් වේ. පඤ්ච යනු ගණනය. ඊට වඩා අඩු හෝ වැඩි නැති බව එයින් දක්වයි.

ඛන්ධ යනු වෙන්කළ ධර්ම කොටසයි. ඛන්ධ ශබ්දය බොහෝ අර්ථවල වැටේ. රාසිගුණයෙහි පැනවීම ආරෝපනය කරති. මහණෙනි, මහා සමුද්‍රයෙහි ජලය ප්‍රමාණ කිරීම පහසු නොවන්නා සේ ජලය ලාස් මෙපමණ යයි කියා හෝ ජලය ලාස් සියයකැයි කියා හෝ ජලය ලාස් දහසකැයි කියා හෝ ජලය ලාස් දසදහසකැයි කියා හෝ මහා ජලස්කන්ධය නොගිණිය හැකි අප්‍රමාණ බවට පැමිණේ. ජලය ස්වල්පයක් උදක ස්වල්පයක් ජලස්ඛන්ධය නොවේ. එසේම දූවිලි ස්වල්පයක් රජස්ඛන්ධ නොවේ. ගවයන් ටික දෙනෙක් ගවස්ඛන්ධ නොවේ. පින් ස්වල්පයක් පුන්‍යස්කන්ධ නොවේ. සෙබළුන් ටිකදෙනෙක් බලස්කන්ධ නොවේ. බොහෝ දූවිලි රජස්කන්ධ නොවේ. බොහෝ ගවාදීහු ගවස්කන්ධ වේ. බොහෝ පින් පුන්‍යස්කන්ධ වේ. බොහෝ සෙබළුන් බලස්කන්ධ වේ. සීලක්ඛන්ධ, සමාධික්ඛන්ධ ආදියෙහි ගුණ වශයෙන් ස්කන්ධ නම් වේ. "මහා දාරුස්කන්ධයක් ගංගා නදියෙහි සැඩපහරට පාවී යනවා බුදුන්වහන්සේ දුටු සේක." මෙහි පැණවීමෙන් ස්කන්ධ නම් වේ. යං චිත්තං මනො මානසං.... විඤ්ඤාණං විඤ්ඤාණක්ඛන්ධො ආදියෙහි රූඪී වශයෙන් ස්කන්ධ නම් වේ. මෙහිදී රාසි වශයෙන් යයි අදහස් වේ. මෙය වනාහි ස්කන්ධ (අර්ථය), සමූහ, රැස්කිරීම රාසි යන අර්ථවල යෙදේ. එහෙයින් රාසි ලක්ෂණය ඛන්ධ යයි දතයුතු. කොටස යන අර්ථය කීමද වටියි. ලෝකයා ණය ගෙන චෝදනා කරන කල්හි ඛන්ධ දෙකකින් තුනකින් දෙන්නේ යයි කියයි. මෙසේ කොටස ඛන්ධ යයි කීම වටී.

මෙහි රූපස්කන්ධය යනු රූප රාසියයි. රූප කොටසයි. වේදනාක්ඛන්ධය වේදනා රාසියයි. වේදනා කොටසයි. සංඛාරාදීන්ගේ අර්ථය ද මේ ක්‍රමයෙන් දතයුතුයි. මෙපමණකින් සම්මා සම්බුදුරජාණන් වහන්සේ සතරමහා භූතයෝද සතර මහාභූත නිසා පවත්නා රූපද අතීත අනාගත සහ පවත්නා කාලයෙහි එකළොස් වැදෑරුම් බෙදන ලද පස්විසි රූප කොටස් ද සයානුරූප කොටස් ද මෙසේ ප්‍රභේද වූ රූප රාසිය යන ඒ සියල්ලම පිඬුකොට රූපස්කන්ධ යයි දැක්වූහ. සැප වේදනාව දුක් වේදනාව අදුක්ඛමසුඛ වේදනාව යන එකොළොස් වැදෑරුම්ව කාලය අනුව බෙදන ලද චතුභූමක වේදනා රාසිය පිඬුකොට වේදනාස්කන්ධයයි දැක්වූහ. එකළොස් වැදෑරුම්ව අවකාශයෙහි බෙදන ලද චතුභූමක සඤ්ඤා රාසිය පිඬුකොට සංඥා ස්කන්ධ යයි දැක්වූහ. එකළොස් වැදෑරුම් අවකාශයෙහි බෙදන ලද චතුභූමක සංඛාර රාසිය පිඬුකොට සංස්කාර ස්කන්ධ යයි දැක්වූහ. එකොළොස් වැදෑරුම් කාලයෙහි බෙදන ලද චිත්ත

රාසිය පිඬුකොට විඥානස්කන්ධ යයි දැක්වූහ. චතුභූමක රූපය රූපස්කන්ධ යයිද තවද මෙහි චතුභූමක කාමාවචර කුසල සිත්අට ආදි වශයෙන් අසූ නවයක් සිත් සමග එකට උපදින වේදනාව වේදනාස්කන්ධයයි ද සඤ්ඤාව සඤ්ඤාස්ඛන්ධ යයිද ඵස්සාදි චෛතසිකයන් සංස්කාරාස්කන්ධ යයිද අසූනවයක් වූ සිත් විඥානස්කන්ධ යයිද මෙසේ ස්කන්ධ පසෙහි ධර්ම කොටස් දතයුතුය.

දැන් ඒ රූපස්කන්ධාදිය විභාගකොට දැක්වීම සඳහා **තත්ථ කතමො රූපක්ඛන්ධො** ආදිය කීහ. එහි **තත්ථ** යනු පඤ්ච ස්කන්ධයන් අතරින් කවරක්දැයි කියනු කැමතිව නැගූ ප්‍රශ්නයයි. **රූපක්ඛන්ධ** යනු ඇසූ ප්‍රශ්නයට ධර්ම පිළිතුරයි. දැන් එය විභාග කරන්නේ **යං කිංචි රූපං** යනාදිය කීහ. එහි **යං කිංචි** නිරවශේෂයෙන් ගැනීමයි. **රූපංති** දැඩිකොට යෙදීමේ නියමයයි. මෙසේ පද දෙකෙන්ම රූපයේ නිරවශේෂ ගැනීම කළා වේ. එහි කුමන අර්ථයකින් රූප වේද? වෙනස්වීම් අර්ථයෙන් රූප වේ. භාග්‍යවතුන් වහන්සේ විසින් එහෙයින් කියන ලදී. "මහණෙනි, කුමකට රූපය කියයිද මහණෙනි, වෙනස්වීමටය. එහෙයින් රූපය යයි කියනු ලැබේ. කුමකින් වෙනස් වේද? සීතලෙන් වෙනස් වෙයි. උෂ්ණයෙන් වෙනස් වේ. සාගින්නෙන් වෙනස් වේ. පිපාසයෙන් වෙනස් වේ. මැසිමදුරු වාතය, අව්ව විසකුරු සතුන් ස්පර්ශ වීමෙන්ද වෙනස් වේ. මහණෙනි, ඒ නිසා වෙනස්වීම රූපයයි කියයි. එහි **කිං** යනු කරුණු විමසීමයි. කුමන කරුණකින් රූපයයි කියයිද? කුමන කරුණකින් එය රූපය නම් වේද යන අරුතය. **රුප්පතීති** යන මෙහි **ඉති** යනු හේතුව දැක්වීමයි. යම් හෙයකින් වෙනස්වේද එහෙයින් රූප යයි කියයි යන අර්ථයයි. රුප්පත යනු කිපේ, ගැටේ, පෙළයි, බිඳෙයි යන අර්ථයි. මෙසේ මෙපමණකින් වෙනස්වීම් අර්ථයෙන් රූපය කියන ලදී. වෙනස්වන ලක්‍ෂණයෙන් ද රූපයයි කීම වටී. එසේම වෙනස්වන ලක්‍ෂණය යන මෙය **සීතෙන'පි රුප්පති** යනාදියෙහි සීතලෙන් වෙනස්වීම පළමුකොට ලෝකාන්තරික නරකයෙහි ප්‍රකටය. සක්වලවල් තුනෙන් තුනට ලෝකාන්තරික නරකයක් වේ. එහි යට පොළොවක් නැත. උඩ සඳ හිරු පහන් මැණික් ආලෝක නැත. නිරන්තර අඳුරය. එහි ඉපදුන සත්වයින්ගේ තුන්ගව් පමණ ශරීර වේ. ඔවුහු වව්ලන් මෙන් දික්වූද, පළල් වූද නියවලින් කඳු බෑවුම අල්වා හිස පහතට එල්බගෙන සිටිති. යම්කලක ඔවුනොවුන් අත් පසයට ගියවිට කෑමට දෙයක් ලැබුනේ යයි සිතමින් කැරකී ලොව දරණ ජලයෙහි වැටෙති. සීතල වායු පහරින් පැසුණු මීගඩි මෙන් පැලී ජලයෙහි

වැටෙති. වැටුණු කෙනෙහි අතිශයෙන් සීත වූ ලුනු වතුරෙන් ඉරුණු සමින් නහර මස් ඇට බිඳෙන කල්හි තෙලෙහි වැටුණු පිටි පිඩක් මෙන් පට පට නදින් විනාශ වෙති. මෙසේ සීතලෙන් වෙනස්වීම ලෝකාන්තරික නිරයෙහි ප්‍රකටය. මහිංසක රටවල් ආදියෙහි හිම වැටෙන ප්‍රදේශවල මෙය ඉතා ප්‍රකටය. එහි සත්වයෝ සීතලෙන් සිඳුණු බිඳුණු ශරීර ඇත්තෝ මරණයට ද පත්වෙති.

උෂ්ණයෙන් වෙනස්වීම අවීචිමහා නිරයෙහි ප්‍රකටය. එහි රත්වූ ලෝහ පොළොවෙහි හොවවා පස් ආකාර වූ බැඳීම් කරන කල්හි සත්වයෝ මහත්වූ දුකක් විඳිති. සාගින්නෙන් වෙනස්වීම ප්‍රේත ලෝකයෙහි සහ දුර්භික්‍ෂ කාලයෙහි ප්‍රකටය. ප්‍රේත ලෝකයෙහි වනාහි බුද්ධාන්තර දෙකතුනකින්වත් කිසිම ආහාරයක් අතින් ගෙන කටෙහි දමා ගැනීමක් ඇති සත්වයෝ නොවෙති. බඩ ඇතුළත ගිනි ඇවිළගත් සිදුරු සහිත ගසක් මෙන් වෙයි. දුර්භික්‍ෂ කාලයෙහි කැඳ පමණකුදු නොලබා මරණයට පත්වන්නන්ගේ ප්‍රමාණයක් නැත. පිපාසයෙන් වෙනස්වීම කාලකඤ්ජිකාදියෙහි ප්‍රකටය. එහි සත්වයෝ බුද්ධාන්තර දෙකතුනක්වත් හෘදය තෙමෙන පමණකුදු, දිව තෙමෙන පමණකුදු දියබිඳක් ලබන්නට නොහැකි වෙති. ජලය පාන කරන්නෙමු යයි ගංගාවලට ගියවුන්ටද ගං හෝ සිඳී වැලි මතු වෙයි. මහා සමුද්‍රට පැනගත්තවුන්ට ද මහා සාගරය සමතලා ගල්තලාවක් වෙයි. ඔවුහු වියළෙමින් මහත් වූ දුකෙන් පෙළෙමින් හැසිරෙති. එක් කාලකඤ්ජික අසුරයෙක් පිපාසය ඉවසීමට නොහැකිව යොදුනක් ගැඹුරු සහ පළල ඇති මහා ගංගාවකට බැස්සේය. ඔහු ගිය ගිය තැන ජලය සිඳී දුම් මතුවෙයි. ගල් තලාවක සක්මන් කරන කලක් මෙන් වෙයි. ජලහඬ අසා ඔබිනොබ හැසිරෙමින් රාත්‍රිය ගෙවීය. ඉක්බිති උදෑසනම පිඬුසිඟා වඩින භික්ෂූන් වහන්සේ තිස්නමක් ඔහු දැක, සත් පුරුෂය ඔබ කවරෙක්දැයි විචාළහ. ස්වාමීනි, ප්‍රේතයෙක්මි. කුමක් සොයන්නේද? ස්වාමීනි, බීමට ජලයයි. මේ ගඟ පිරිලා පේන්නෙ නැද්ද? ස්වාමීනි, ලඟට නොපැමිණේ. එසේනම් ගං වෙරලේ දිගාවෙන්න. මුවට පැන් ඉසිමු යයි කීහ. හේ වැලිතලාවේ උඩුකුරුව හොත්තේය. භික්ෂූහු පාත්‍ර තිහකින් ජලය ගෙන ඔහුගේ මුවට වත් කරමින් සිටියහ. එසේ කරන භික්ෂූන් වහන්සේට පිඬු සිඟන වේලාව සමීප විය. සත් පුරුෂය, අපට පිඬු සිඟා යන වේලාව පැමිණ ඇත. කෙසේද? ඔබ ආශ්වාද මාත්‍රයක්වත් ලැබුවේදැයි ඇසූහ. හේ අල්ලක් පමණ ජලය උගුරට ගියායයි කීය. ප්‍රේත ආත්මභාවයෙන් මිදීමක් නැතැයි කීය. මෙසේ පිපාසයෙන්

වෙනස්වීම ප්‍රේත විෂයෙහි ප්‍රකටය. මැසි ආදීන්ගේ ස්පර්ශයෙන් ඇතිවන වෙනස්වීම මැසි මදුරුවන් බහුල ප්‍රදේශවල ප්‍රකටය. මෙහි **ඩංසා** යන පිඟුවන් මැස්සෝය. **මකසා** යනු මදුරුවෝය. **වාතා** යනු කුසේ වාත පිටේ වාත ආදි වශයෙන් දතයුතුය. ශරීරයෙහි වාතරෝග ඉපදී අත් පා පිට ආදිය බිඳී කණ කරයි. කුදු කරයි. අත් පා කොර කරයි. **ආතපා** යනු හිරු තාපයයි. මෙයින් වෙනස්වීම වැලිකතර ආදියෙහි ප්‍රකටය. එක් ස්ත්‍රියක් සමූහයා සමග රාත්‍රියෙහි වැලිකතරේ නොගොස් දිවා කාලයේ හිරු උදාවන කල්හි වැලිවලින් තැවී පාතැබීමට නොහැකිව හිසින් පැසගෙන තබා පා තැබුවාය. ක්‍රමයෙන් පැස රත්වී සිටීමට නොහැකිව ඒ මතුවෙහි සාටකය තබා පා තැබුවාය. එයද රත්වන විට ඇකයෙන් ගත් පුතා මුනින් හොවා අඬමින් මැඩ ඔහු සමග උෂ්ණයෙන් තැවී මරණයට පත්වූවාය. **සිරිංසප** යනු දිගු දෑ සත්තු වෙසෙසක් වෙති. ඔවුන්ගේ ස්පර්ශයෙන් වෙනස්වීම විෂකුරු සතුන් දෂ්ට කිරීම ආදියෙන් දත යුතුය.

දැන් **යං කිංචි රූපං** පදයෙන් සංගෘහිත වූ පස්විසි කොටසෙහි සයානු කොටස් ප්‍රභේදයෙන් සියළු රූප අතීතාදි කොටස්වල බහා දැක්වීමට **අතීතානාගත පච්චුප්පන්න** යනාදිය කීහ. ඊට පසුව එය අධ්‍යාත්ම දුකබාදී සතර දුකෙහි බහා දැක්වීමට **අජ්ඣත්තං වා බහිද්ධා** යනාදිය කියන ලදී. ඉන්පසුව මේ සියල්ල එකොළොස් ප්‍රදේශයෙහි හාත්පසින් ගෙන දක්වන ලද රූපය එකක් වශයෙන් පිඬුකොට දැක්වීමට **තදෙකජ්ඣං** යනාදිය කියන ලදී. එහි තදෙකජ්ඣ යනු එය එකතුවී යනුයි. අභිසඤ්ඤූහිත්වා යනු එක්තැන් කොට. **අභිසංඛිපිත්වා** යනු සංක්ෂෙප කොට, මෙය කියන ලදී. සියළු ආකාරයෙන් කියන ලද මේ රූපය වෙනස්වන ලක්ෂණයෙන් ඒකවිධභාවයට පමුණුවා රූපස්කන්ධයයි කියනු ලැබේ. රූපයෙන් අනිකක් රූපස්කන්ධය නම් නොවේ. වේදනාව ද රූපය මෙනි. වේදයිත ලක්ෂණයෙහි රාසි භාවයට පැමිණ වේදනාස්කන්ධ යයි කියනු ලැබේ. වේදනාදියෙන් අනිකක් වේදනාස්ඛන්ධය නොවේ. දැන් එක් එක් කාලයෙහි බහා තබන රූපය වෙන වෙනම විභාගකොට දක්වමින් **තත්ථ කතමං රූපං අතීතං** යනාදිය කීහ. එහි **තත්ථ** යනු එකොළොස් වැදෑරුම් කාලයෙහි බහා තබන ලද මාතෘකා භූමියයි. මෙය කියන ලද්දේ වෙයි. අතීත අනාගත වර්තමාන ආදීනයින් තබන ලද මාතෘකාවෙන් අතීත රූපයක් දක්වන ලදද එය කවර දෙයක්ද යනුයි. මෙම උපාය මගින් සියළු විමසීම්වල අර්ථය දත යුතුය. **අතීතං නිරුද්ධං** ආදී පද බහා තැබූ කොටසෙහි කියන ලදී. **චත්තාරො මහා භූතා** මෙය අතීතයයි කියන ලද රූපයේ ස්වභාව

නිදර්ශනයයි. සියළු තන්හි මෙසේමය. අතීත රූපද මහාභූතද, භූත දැඩි සේ ගෙන පවත්නා රූපයෙන් අන්‍ය රූපයක් නොමැත. වෙනත් න්‍යායක්, අතීතංසෙන සංගහිතං යනු අතීත කොටසින්ම සංග්‍රහ කරන ලදි. මෙහිම රූපය කුමක්දැයි ගණන ඇතුළත්ය. සතර මහාභූත සහ සතර මහාභූත දැඩි සේ ගත් රූප කුමක්දැයි සියළු තන්හි අර්ථ මෙසේ දතයුතුයි. අනාගත, වර්තමාන නිදර්ශන පදද යට කියන ලද්දේය. අතීත, අනාගත වර්තමාන යන මෙය සූත්‍රාන්ත අභිධර්ම යයි දෙයාකාර වෙයි. සූත්‍රාන්ත පරියායෙන් භවයෙන් වෙන්කරන ලදී. ප්‍රතිසන්ධියෙහි සිට අතීත භවවල උපන්රූප අනන්තර භවයෙහි හෝ කප්කෙළ සියදහස් ගණන් මත්තෙහි හෝ උපන් සියළු රූප අතීත නම් වේ. චුති පටිසන්ධි අතරෙහි උපදින රූප හෝ අනන්තර භවයෙහි හෝ කප්කෙළ සියදහස් ගණන් මතුවෙහි පහළවන රූප සියල්ල අනාගත නම් වේ. අභිධර්ම පරියායෙහි වනාහි ක්ෂණයෙකින් රූපය දක්වන ලදී. රූපයේ ඉපදීම, පැවතීම, බිඳීයෑම යයි ක්ෂණ තුනකි. මේ ක්ෂණ තුනට පැමිණ නිරුද්ධ වූ රූපය සමීපයෙහි හෝ අතීත කප් කෙළ සියදහස් ගණන් මතුයෙහි හෝ නිරුද්ධ වන්නේ ද ඒ සියල්ලම අතීත නම් වේ. ක්ෂණ තුනට නොපැමිණි එක් චිත්තක්ෂණයක් මතුවෙහි හෝ අනාගතයෙහි කප්කෙළ සියදහස් ගණන් මතුවෙහි හෝ නොපැමිණි රූප සියල්ල අනාගත නම් වේ. මෙම ක්ෂණ තුනට පැමිණි රූප වනාහි වර්තමාන වේ. එහි මේ කිසිවක් සූත්‍රාන්ත භාජනීය වේ. එසේ වුවත් අතීත අනාගත වර්තමාන රූප අභිධර්ම නිර්දේශයෙන් ම දක්වන ලදැයි දතයුතුය.

තවත් න්‍යායක්, අද්ධාන සනතති සමය ඛණ වශයෙන් සිව් ආකාර වූ මේ රූපය අතීත නම් වේ. අනාගත සහ වර්තමානයද එසේය. කෙනෙකුගේ එක් භවයක ප්‍රතිසන්ධියෙන් පෙර ඒතාක් මාර්ග වශයෙන් අතීතය. චුතියෙන් පසු අනාගතයයි. ඒ දෙක අතර වර්තමානයයි. පරම්පරා වශයෙන් ඍතුවෙන් හටගත් එක් රූපයක්ද ආහාරයෙන් හටගත් එක් රූපයක්ද පූර්ව අපර වශයෙන් සමානව පැවතීම වර්තමානයයි. එයින් පෙර විසමව පැවති ඍතු ආහාර රූප අතීතයයි. එයින් පසුව පැවතියේ අනාගත යයි. චිත්තජ වූ එක් චිත්ත වීථියක එක් ජවන් සිතක එක් සමාධියක හටගත් රූපය වර්තමානයයි. එයින් පෙර අතීත යයි. එයින් පසු අනාගත යයි. කර්මයෙන් හටගත් වෙන් වෙන්වූ රූපයේ අතීතාදි භේද නැත. ඒවායෙහි ඍතු, ආහාර, චිත්ත හටගත් රූපයන්ගේ උපස්ථම්භ වශයෙන් අතීතාදි භේද දැනගත යුතුය. කාලය වශයෙන් එක් මොහොත,

පෙරවරු, පස්වරු, රාත්‍රිය, දවාල යන කාලවල චිත්ත පරම්පරා වශයෙන් පවත්නා ඒ ඒ කාල වර්තමානය නම් වේ. එයින් පෙර අතීතයයි. එයින් පසු අනාගතයයි. ක්ෂණ වශයෙන් උප්පාද ආදි ක්ෂණ තුන ඇතුළත් වූයේ වර්තමාන යයි. එයින් පෙර අතීතයයි. එයින් පසු අනාගතයයි. තවද, ඉකුත් වූ හේතුඵල කෘත්‍යය අතීතයයි. නොනිමි හේතුඵල කෘත්‍යය වර්තමානයයි. නොපැමිණි හේතුඵල කෘත්‍යය අනාගතයයි. තමා අයත් ක්ෂණය හෝ වර්තමානයයි. ඉන් පෙර අතීතයයි. ඉන්පසු අනාගතයයි. මේ ක්ෂණය ආදී කතා නිෂ්පරියායයය. (වෙනස්කළ නොහැකි) සෙස්ස පරියායයි. ඒවා අතරින් නිෂ්පරියාය කථා මෙහි අදහස් කෙරේ. අජ්ඣත්ත (සත්තානං පරසත්තානං) දෙකේ නිර්දේශ පදයට අජ්ඣත්තික නිර්දේශයෙහි කියන ලද අර්ථය වෙයි. ඕලාරිකාදි රූප කොටස වර්ණයයි කියන ලද අර්ථය වේ. හීන, දුක නිර්දේශයෙහි තෙසං තෙසං සත්ත නිකායෙ බොහෝ සත්වයන් අතරෙහි ෂට්ඨී වචනයයි. අපරස්සාපි අපරස්සාපිති හි කියන කල්හි දවසද කල්ප ලක්ෂයද කියමින් මෙපමණක් කියන්නේය. මෙසේ ශාස්තෘන් වහන්සේ පද දෙකකින් සෙසු සියළු සතුන් ගන්නේ තෙසං තෙසං සත්තානං යයි කීහ. මෙපමණකින්ම අන්‍ය සියල්ලන්ම දැක්වීම සිදුවීය. උඤ්ඤාතං යනු අවමන් කිරීමය. අවඤ්ඤාතං යනු පහත්කොට දැකීමයි. රූපං යනු දන්නා ලදී. හීළිතං යනු නොගතයුතුය යන අර්ථයෙන් ඉවත දැමූ විසිකළ පිළිකුල් කළ යනුද කියති. පරිභූතං මෙය කුමක්දැයි වචනයෙන් පරිභව කිරීමය. අචිත්තීකතං යනු ගරු නොකිරීමයි. හීනමතං හීන යයි හැඟීම ලාමකකොට දැනීම. හීනං ලාමකය. හීන සම්මතං ලෝකයෙහි හීනයයි සම්මත දේ. හීනයන් විසින් හෝ සම්මත දේ. ගූථ භක්ෂකයන් විසින් ගූථ මෙනි. අනිට්ඨං ප්‍රිය නොවූ ලබාගැනීම සඳහා නොයැවීම. යමෙක් සොයානම් සෙවීමේ අරමුණ මෙම නමින් කියයි. අකං නොකැමති නිසරු හෝ අමනාපං සිතේ අර්පණය නොවන එබඳු අරමුණු සිතට අරෝපණය නොවේ. මනාපං සිතට මනසට අර්පණය වේ.

තවද අන්‍ය න්‍යායකි. අනිට්ඨං සම්පත් නොමැතිවීමය. එය කර්ම හටගැනීම් අතරින් ඒකාන්තයෙන් අකුසල කර්ම නිපැත්මකි. අකන්තං සැපයේ අහේතුකභාවයයි. අමනාපය දුකෙහි හේතු භාවයයි. රූප, ශබ්ද යන මෙය එහි ස්වභාවය පෙන්වීමයි. මේ පදයෙහි අකුසල කර්මයෙන් ඉපදීම් වශයෙන් අනිෂ්ට වූ පස්කම් ගුණයෙහි බෙදන ලදී. අකුසල කර්මයෙන් ඉපදීමෙන් ඉෂ්ට වූ දෙයක් නම් නැත. සියල්ලම අනිෂ්ටය. ප්‍රණීත පද නිර්දේශයෙහි කියන ලද්ද ප්‍රතිපක්ෂ වශයෙන් දතයුතුය. මේ

පදයෙහි කුශල කර්මයෙන් ඉපදීම් වශයෙන් ඉෂ්ට වූ පස්කම් ගුණයෙහි බෙදන ලදී. කුසල කර්මයෙන් ඉපදීම්වල අනිෂ්ටයක් නම් නැත. සියල්ලම ඉෂ්ටමය. ඍතුවලින් හටගැනීමෙහිද කර්මයෙහි මෙන් ඉටු අනිටු ඇත. මෙසේ මේ දෙකෙහි ඉටු අනිටු අරමුණු බෙදන ලදැයි දතයුතුය. මෙය ආචාර්යවරයන්ගේ සමාන අර්ථ කථාය. විතණ්ඩවාදීහු මෙසේ කීහ. ඉටු අනිටු නම් වෙන් වෙන්ව බෙදීමක් නැත. ඔවුනොවුන්ගේ රුචි වශයෙන් කියන ලදී. "මහරජ, පංචකාම ගුණයන් මනාපය කෙළවරකොට ඇතැයි මම කියමි. මහරජ, ඒ රූපයෝ සමහරුනට මනාප වෙති. සමහරුනට අමනාප වෙති. මහරජ, ඒ ශබ්ද ගන්ධ රස ස්පර්ශයෝ සමහරුනට මනාප වෙති. සමහරුනට අමනාප වෙති." එහෙයින් ඒ රූපාදියම කෙනෙක් ආශ්වාද කෙරෙති, සතුටු වෙති, එහි ලෝභය උපදවති. කෙනෙක් කිපෙති, ගැටෙති, එහි තරහ උපදවති. ඇතැමෙකුට ඉෂ්ට ප්‍රියමනාප වෙති. ඇතැමෙකුට අනිෂ්ට අමනාප වෙති. කෙනෙක් ඉෂ්ටප්‍රිය මනාපයයි දකුණතින් ගනිති. කෙනෙක් අනිෂ්ට අප්‍රිය අමනාප යයි වමතින් ගනිති. එනිසා ඉටු අනිටු නම් වෙන් වෙන්ව බෙදීමක් නැත. ප්‍රත්‍යන්තවාසීන්ට ගැඩවිලාද ඉෂ්ට ප්‍රියමනාප වෙයි. මධ්‍යදේශවාසීහු ඊට අතිශයින් පිළිකුල් කරති. ඔවුන්ට මොණරමස් ආදිය ඉෂ්ටප්‍රිය වෙයි. අන් අයට ඒවා ඉතා පිළිකුල් වේ. ඔබ ඉටුනිටු අරමුණු වෙන් වෙන් වශයෙන් බෙදීමක් නැතැයි කියන්නේද? ඔව්. නැතැයි කීහ. නැවත තුන්වන වාරය දක්වා එසේම ප්‍රශ්නය අසා පිහිටුවා ගතයුතුය. නිවන ඉෂ්ටද? නැතහොත් අනිෂ්ටද? දන්නා තැනැත්තා ඉෂ්ට යයි කියයි. ඉදින් නොකියන්නේ නම් නොකියව. නිවන ඒකාන්තයෙන් ඉෂ්ටය. කෙනෙක් නිවන වර්ණනා මුඛයෙන් කියන කල්හි ඔබ කිපී නිවන වර්ණනා කෙරේද? නොකෙරේද? කිම, එහි ආහාරපාන මල් ගඳ විලවුන් සයන ඇඳුම් සමෘද්ධ පස්කම් ගුණ තිබේදැයි ඇසූවිට නැතැයි කී කල්හි ඔබේ නිවනෙන් කමක් නැත. නිවණ වණන විට කිපී දෙකොනම පියයි-වසයි යන අර්ථයයි. මේ ආදි වශයෙන් ඔබේ වාදයෙහි නිවන අනිෂ්ට නම් වේ. මෙය මෙසේ නොගත යුතුය. මේ තෙමේ විපරීත සංඥාවෙන් කියයි. සංඥා විපර්යාස වශයෙන් කෙනෙකුට ඉෂ්ට වේ. කෙනෙකුට අනිෂ්ට වේ. ඉටුනිටු අරමුණු වනාහි වෙන වෙනම බෙදිය යුතුව ඇත. කවරෙකුගේ වශයෙන් බෙදා ඇත්තේද මධ්‍යම අයෙකුගේ වශයෙනි. ඉතා ඉසුරුමත් මහා සම්මත මහා සුදස්සන ධර්මාශෝක ආදීන්ගේ වශයෙන් මෙය නොබෙදන ලදී. ඔවුන්ට දිව්‍ය සමාන අරමුණුද අමනාපව වැටහෙන දුලබ අහරපැන් නැති දුක්ඛිත වූවන්ගේ වශයෙන්ද නොබෙදෙන ලදී. ඔවුන්ට වනාහි සුං සහල් බත්

තුළද කුණු මස් රසයද ඉතා මිහිරි අමෘතය හා සමාන වෙයි. ගණක අමාත්‍ය සිටුවරු කෙළෙඹියන් වෙළෙන්දන් ආදි මධ්‍යමිකයන්ගේ වශයෙන් ඉටු අනිටු බෙදන ලදී. ඔවුන්ට වනාහි කාලයකට ඉෂ්ටද කාලයකට අනිෂ්ටද වේ. මේ ආකාරයෙන් ඉෂ්ට අනිෂ්ට වශයෙන් වෙන් කිරීමට හැකි වේ. තිපිටක චූලනාග තෙරුන් වහන්සේ මෙසේ කීහ. "ඉෂ්ට අනිෂ්ට නම් විපාක වශයෙන් වෙන් කරන ලදී. ජවන වශයෙන් නොවේ. ජවනය වනාහි සංඥා විපර්යාස වශයෙන් ඉෂ්ට අරමුණෙහිම ඇලෙයි. ඉෂ්ට අරමුණෙහිම කිපෙයි. අනිෂ්ට අරමුණෙහි ඇලෙයි. අනිෂ්ට අරමුණෙහි කිපෙයි. විපාක වශයෙන් මෙය ඒකාන්තයෙන් වෙන් කරයි. විපාක සිතට වංචාකළ නොහැකිය. අරමුණ ඉෂ්ට වේනම් කුසල විපාක උපදියි. අරමුණ අනිෂ්ට වේනම් අකුසල විපාක උපදියි. කිසියම් මිත්‍යාදෘෂ්ටිකයෙක් බුදුන් සඟුන් මහසෑ ආදී උතුම් අරමුණු දැක ඇස්පියා ගනිති. දොම්නසට පැමිණෙති. දහම් හඬ අසා කන් වසා ගනිති. ඔවුන්ගේ චක්ඛු විඤ්ඤාණ ශෝත්‍ර විඤ්ඤාණ වනාහි කුසල විපාකම වෙති. කිසියම් ගූථ සූකරාදීහු ගූථ ගන්ධය ආඝ්‍රාණයකොට කෑමට ලැබෙන්නේ යයි සොම්නස් වූවෝ වෙති. ගූථ දර්ශනයෙහි ඔවුන්ගේ චක්ඛුවිඤ්ඤාණයද ඒ ගඳ ආඝ්‍රාණයේදී ඝාණ විඤ්ඤාණයද රස ආශ්වාදනයෙහි ජිව්හා විඤ්ඤාණයේද අකුසල විපාකද වෙයි. බැඳ හොඳ ඇඳක තිදිකරවූ ඌරාද කිසියම් හඬක් නගයි. සංඥා විපර්යාසයෙන් ඌගේ ජවනයෙහිම දොම්නසක් උපදී. කාය විඤ්ඤාණය කුසල විපාකම වෙයි. කුමක් හෙයින්ද? අරමුණෙහි ඉෂ්ට බැවිනි. තවද, ද්වාර වශයෙන් ඉටුනිටු දතයුතුය. සැප ස්පර්ශ ඇති ගූථ කලලය චක්ඛු ද්වාර ඝාන ද්වාර ආදියෙහි අනිෂ්ට වේ. කාය ද්වාරයෙහි ඉෂ්ට වේ. සක්විති රජුගේ මිණිරුවනින් තලනු ලබන්නහුටද රන් උලෙහි උල තැබූ ඔහුටද මිණිරුවන රන් උල චක්ඛු ද්වාරයෙහි ඉෂ්ට වේ. කාය ද්වාරයෙහි අනිෂ්ට වේ. කුමක් හෙයින්ද මහ දුකක් උපදවන හෙයිනි. මෙසේ ඉටු අනිටු වශයෙන් විපාකයෙහි ඒකාන්තයෙන් වෙන්කරනු ලැබේ යයි දතයුතුය.

**තං තං වා පන** යනු මෙහි යට දක්වන ලද න්‍යාය නොබැලිය යුතුය. භාග්‍යවතුන් වහන්සේ සම්මුති මනාප නොබිඳිති. පුද්ගල මනාප බිඳිති. එහෙයින් ඒ ඒ ආකාරයෙන් පිළිවෙළින් ගෙන හීන පණීත බව කිවයුතුය. නිරයවාසීන්ගේ රූපය කෙළවරට පැමිණි හීන නම් වේ. ඒ අල්වාගෙන තිරිසනුන් අතරෙහි නාගගුරුළු ආදීන්ගේ රූපය ප්‍රණීත නම් වේ. එය දැඩිසේ ගෙන ඔවුන්ගේ රූපය හීනය. ප්‍රේතයින්ගේ රූපය

ප්‍රණීතය. එය ගෙන ඔවුන්ගේ රූපය හීනය. ජානපදිකයන්ගේ රූපය ප්‍රණීතය. එය ගෙන ඔවුන්ගේ රූපය හීනය. ගම්මුළාදෑනීන්ගේ රූපය ප්‍රණීතය. එය ගෙන ඔවුන්ගේ රූපය හීනය. ජනපද හිමියන්ගේ රූපය ප්‍රණීතය. එය ගෙන ඔවුන්ගේ රූපය හීනය. ප්‍රදේශ රජුන්ගේ රූපය ප්‍රණීතය. එය ගෙන ඔවුන්ගේ රූපය හීනය. චක්කවත්ති රජවරුන්ගේ රූපය ප්‍රණීතය. එය ගෙන ඔවුන්ගේ රූපය හීනය. භූමාටු දෙවියන්ගේ රූපය ප්‍රණීතය. එය හීනය. එය ගෙන චාතුර්මහාරාජික දෙවියන්ගේ රූපය ප්‍රණීතය. එය හීනය. තාවතිංස දෙවියන්ගේ රූපය ප්‍රණීතය. අකනිට්ඨ දෙවියන්ගේ රූපය ඉහළම ප්‍රණීත රූපය වෙයි.

දූර සන්තික දෙක නිර්දේශයෙහි ඉත්ථි ඉන්ද්‍රියාදිය යට බෙදා දක්වන ලදී. මේ දෙකෙහි අල්වා ගැනීමට අපහසු යන අර්ථයෙන් හා ලක්‍ෂණ දැනගැනීමට අපහසු හෙයින් සුඛුම රූපය දූරෙ යයි කියන ලදී. අල්වා ගැනීමට පහසුය යන අර්ථය හා ලක්‍ෂණ පහසුවෙන් දැනගත හැකි හෙයින් ඕළාරික රූපය සන්තික යයි කියන ලදී. කබලිංකාර ආහාර අවසානයෙහි පැමිණවිය යුතු යන අර්ථයෙන් මේ රූපය දූරයයිද එය නොපමුණුවයි. කුමක් හෙයින්ද දූරනම් ලක්‍ෂණ වශයෙන් සහ අවකාශ වශයෙන් දෙවැදෑරුම්ය. ලක්‍ෂණ වශයෙන් දූර නොකියන ලදී. අවකාශ වශයෙන් කිවයුතුය. ඒ ඕළාරික රූප අවකාශ වශයෙන් දැක්වීමට නොපැමිණවීමම **යංවාපනඤ්ඤම්පි** යනාදිය කීහ. සන්තික පද නිර්දේශයෙහිද මේ නියමයම වේ. එහි **අනාසනති** යනු සමීපයෙහි නොවේ. **අනුපකට්ඨ** යනු හරනා ලද්දේය. **දූරෙති** ඇතයි. **අසන්තිකෙ** සමීපයෙහි නොවේ. **ඉදං වුච්චති රූපං දූරං** මේ පසළොස් ආකාර වූ සුඛුම රූප ලක්‍ෂණ වශයෙන් දූරය. දසවිධ වූ ඕළාරික රූප අනිත් ධර්මයන්ගේ වශයෙන් අවකාශයෙන් දූර යයි කියයි. සමීප පද නිර්දේශයේ අර්ථ ප්‍රකටය. **ඉදං වුච්චති රූපං සනතිකෙ** මෙය දසවිධය. ඕළාරික රූප ලක්‍ෂණ වශයෙන් සමීපය. පසළොස් ආකාර සුඛුම රූප අනිත් ධර්මයන්ගේ වශයෙන් අවකාශයෙන් සමීපයයි කියයි. රූපය අවකාශ වශයෙන් කොපමණක සිට සමීප වේද? කොපමණක සිට දූර වේද? ප්‍රකෘති කථාවෙන් කියන්නේ දොළොස් රියනකින් ශ්‍රවන උපචාරය වේ. එයින් මෙපිට රූප සමීපය. එයින් එපිට රූප දූරය. එහි සුඛුම රූප දූර වූයේ නම් ලක්‍ෂණ වශයෙන්ද අවකාශ වශයෙන්ද දූර වෙයි. සමීප වූයේ නම් අවකාශ වශයෙන් සමීප වෙයි. ලක්‍ෂණ වශයෙන් නොවේ. ඕළාරික රූප සමීප වූයේ ලක්‍ෂණ වශයෙන්ද අවකාශ වශයෙන්ද සමීප වෙයි. දූර වූයේ නම්

අවකාශ වශයෙන් දුර වෙයි. ලක්ෂණ වශයෙන් නොවේ. තං තං වා පන මෙහි පහළම නියාය නොබැලිය යුතුය. මෙහි ලක්ෂණ වශයෙන් දුර රූප නොබිදෙයි. අවකාශ වශයෙන් දුර රූප බිදෙයි. දුර සමීප දෙකම ගෙන මෙහි දක්වන ලදී. තමන්ගේ රූප සමීප වෙයි. අනුන්ගේ කුස තුළ රූප දුරය. තමාගේ කුස තුළ රූප සමීපය. පිටත සිටියවුන්ගේ රූප දුරය. එක ඇඳේ නිදා සිටියහුගේ රූපය සමීපය. පිටත නිදා ගත්තහුගේ රූප දුරය. තම කාමරය තුළ සමීපය. පිටත දුරය. සංඝාරාමය තුළ රූපය සමීපය. පිට සංඝාරාමවල රූප දුරය. සීමාව තුළ සමීපය. සීමාවෙන් පිටත දුරය. ගම තුළ සමීපය. ඉන් පිට දුරය. ජනපදය තුළ සමීපය. පිටත දුරය. රාජ්‍යය සීමාව තුළ සමීපය. පිටත දුරය. මූද තුළ සමීපය. සාගරයෙන් පිටත දුරය. ඇතුළු සක්වල සමීපය. පිට සක්වල දුරය.

## මේ රූපස්කන්ධ නිර්දේශයයි.

වේදනාස්කන්ධ නිර්දේශාදියෙහි යට කියන ලද සමාන ඒවා හැර පෙර නොකියන ලද ඒවා පමණක් වර්ණනා කරමි. යාකාචි වෙදනා චතුභූමක වේදනා ගනු ලැබේ. සැප වේදනා ආදිය අතීතාදි වශයෙන් විස්තර කළ වේදනාව ස්වභාව වශයෙන් දැක්වීමට කියන ලදී. එහි සැප වේදනාව කායික චෛතසික වශයෙන් නැත. දුක් වේදනාවද එසේය. අදුක්ඛමසුඛ වේදනාව චක්ෂු ආදී ප්‍රසාද කාය නිසා කායිකව සහ චෛතසිකව ඇත. එහි සියළු කායික වේදනා කාමාවචරය. චෛතසික දුක්වේදනාද එසේය. චෛතසික සැප වේදනා වනාහි ත්‍රෛභූමිකය. (කාම, රූප, අරූප) අදුක්ඛමසුඛ වේදනාව චතුභූමිකය. එහි සියළු ආකාර පරම්පරා වශයෙන් ක්ෂණ ආදී වශයෙන් අතීතාදිභාවය දතයුතුය. එහි පරම්පරා වශයෙන් එක් චිත්ත වීථියක එක් ජවනයක එක් සමාධියක ඇතුළත් එක් විෂයක යෙදුනේ වර්තමානය. එයින් පෙර අතීතය. එයින් පසු අනාගතය. ක්ෂණාදී වශයෙන් ක්ෂණත්‍රයට ඇතුළත් පෙර අපර මැදට ගිය කෘත්‍යයක නියැළි වේදනාව වර්තමානය. ඉන් පෙර අතීතය. එයින් පසු අනාගතය.

ඕලාරික සුඛුම විවරණයෙහි අකුසලා වේදනා ආදිය ජාති වශයෙන් ඕලාරික බව දැක්වීමට කියන ලදී. දුකඛා වේදනා ඔළාරිකා ආදිය ස්වභාව

වශයෙනි. **අසමාපන්නස්ස** වෙදනා ආදිය පුද්ගල වශයෙන් දැක්වීමට කියන ලදී. **සාසවා** ආදිය ලෞකික ලෝකෝත්තර වශයෙන් ඕලාරික සුඛුම බව දැක්වීමට කියන ලදී. එහි අකුසල සිත් තැවුල් අර්ථයෙන්ද දුක් විපාක අර්ථයෙන්ද ඕලාරික වෙයි. කුසල සිත් තැවුල් නැති අර්ථයෙන්ද සැප විපාක අර්ථයෙන්ද සුඛුම වෙයි. අව්‍යාකෘත සිත් නිරුත්සාහ අර්ථයෙන්ද අවිපාක අර්ථයෙන්ද සුඛුම වේ. කුසල අකුසල උත්සාහ සහිත හා විපාක සහිත අර්ථයෙන් ඕලාරික වේ. අව්‍යාකෘත කලින් කී නයින් සුඛුමය. දුක් අමිහිරි සහ දුක් යන අර්ථයෙන් ඕලාරිකය. සැප මිහිරි සහ සැප යන අර්ථයෙන් සුඛුමය. අදුක්ඛම සුඛ ශාන්ත සහ ප්‍රණීත අර්ථයෙන් සුඛුමය. සැප දුක් කැළඹීම් සහ පැතිරීම් අර්ථයෙන් ඕලාරිකය. සැප වේදනාවද කැළඹෙයි. පැතිරෙයි. දුක් වේදනාවද එසේය. සැප උපදින විට සියළු සිරුර කළඹමින්, අළලමින් මත් කරමින් සඟවමින් සිහිල් දියැති කලයකින් දිය ඉසින්නාක් මෙන් උපදියි. දුක් උපදින විට රත්වූ තලියක් ඇතුළට පිවිසවන්නාක් මෙන් ගිනි හුළකින් බාහිර ශරීරය දමන්නාක් මෙන් උපදියි. අදුක්ඛමසුඛ කී ආකාරයෙන් සුඛුමය. අසමාහිත වේදනා නොයෙක් අරමුණුවල වික්ෂිප්ත භාවයෙන් ඕලාරිකය. සමාහිත වේදනා එක් අරමුණක හැසිරෙන නිසා සුඛුම වේ.

ආශ්‍රව සහිත රූප ආශ්‍රව උත්පත්ති හේතුවෙන් ඕලාරික වේ. ආශ්‍රව හැසිරීම ඒකාන්තයෙන් ඕලාරිකය. අනාශ්‍රව කියන ලද ආකාරයට වෙනස් නිසා සුඛුම වේ. එහි කෙනෙක් කුසලත්‍රිකයෙහි දක්‍ෂ නොවේ. වේදනාත්‍රිකයෙහිද දක්‍ෂ නොවේ. හේ කුසලත්‍රිකය රකිමියි වේදනාත්‍රිකය බිඳියි. වේදනාත්‍රිකය රකිමියි කුසලත්‍රිකය බිඳියි. කෙනෙක් ත්‍රිකය රකිමින් භූමි අන්තරය බිඳී. කෙනෙක් නොබිඳිති. කෙසේද? සැප දුක් වේදනා ඕලාරිකය. අදුක්ඛමසුඛ වේදනා සුඛුම යයි වේදනාත්‍රිකයෙහි කියන ලදී. සියළු අදුක්ඛමසුඛ සුඛුම නොවේයයි කෙනෙක් එය ප්‍රතික්ෂේප කරති. එහි කුසල්ද අකුසල්ද අව්‍යාකෘතද ඇත. එහි කුසල අකුසල ඕලාරිකය. අව්‍යාකෘත සුඛුමය. කුමක් හෙයින්ද? කුසලත්‍රික පෙළෙහි ආ බැවිනි. මෙසේ කුසලත්‍රිකය රැක්කේ වෙයි. වේදනාත්‍රිකය බිඳී ගියේය. කුසල අකුසල වේදනා ඕලාරිකය. අව්‍යාකෘත වේදනා සුඛුමයයි කුසලත්‍රිකයෙහි කියන ලද්ද අව්‍යාකෘත සියල්ල සුඛුම නොවේයයි එකෙක් ඒ ප්‍රතික්ෂේප කරයි. එහි සැපද දුක්ද අදුක්ඛම සුඛද ඇත. එහි සැප දුක් ඕලාරිකය. අදුක්ඛමසුඛ සුඛුමය. කුමක් හෙයින්ද? වේදනාත්‍රික පෙළෙහි ආ බැවිනි. මෙසේ වේදනාත්‍රිකය රැක්කේය. කුසල ත්‍රිකය බින්දේය. කුසලත්‍රිකය

පැමිණි තැන වේදනාත්‍රිකය නොබලා වේදනාත්‍රිකය පැමිණි තැන කුසලත්‍රිකය නොබලා කුසලාදීන්ගේ කුසලත්‍රික ලක්‍ෂණයෙන් සැප ආදියෙහි වේදනාත්‍රික ලක්‍ෂණයෙන් ඕලාරික සුඛුම බව කියන්නේ නම් නොබිඳේ. කුසල අකුසල වේදනා ඕලාරිකය. අව්‍යාකෘත වේදනා සුඛුමයයි කුසලත්‍රිකයෙහි කියන ලද නිසා කුසල ලෝකෝත්තර වේදනා ද ඕලාරිකය. යටත් පිරිසෙයින් දෙපස් විඤ්ඤාණ සහජාත විපාකයෝද සුඛුම වේයයි කෙනෙක් කියති. හේ මෙබඳු වූ ශාන්ත ප්‍රණීත ලෝකෝත්තර වේදනාව ඕලාරික කරමින් දෙපස් විඤ්ඤාණයෙන් යුක්ත වූ අහේතුක හීන ජඩ වූ වේදනාව සුඛුම යයි කරමින් ත්‍රිකය රැක්කෙමියි අන්තර් භූමි බිඳියි. ඒ ඒ භූමිවල කුසලය ඒ ඒ භූමි විපාකයන්හි යොදා කියන්නේ නම් නොබිඳින්නේ වෙයි.

මේ එහි නයයි. කාමාවචර කුසල ඕලාරිකය. කාමාවචර විපාක සුඛුමය. රූපාවචර, අරූපාවචර ලෝකෝත්තරික කුසල ඕලාරිකය. රූපාවචර අරූපාවචර, ලෝකෝත්තර විපාක සුඛුම යයි මේ ආකාරයට කියන්නේ නම් නොබිඳී. ත්‍රිපිටක චූලනාග තෙරුන් වහන්සේ මෙසේ කීහ. අකුසලයෙහි ඕලාරික සුඛුම බව නොකිව යුතුය. එය ඒකාන්ත ඕලාරිකය. ලෝකෝත්තරයෙහිද ඕලාරික සුඛුම බව නොඑසවිය යුතුය. ඒ ඒකාන්ත සුඛුම වේ. මේ කථාව ගෙනහැර දක්වා ත්‍රිපිටක චූලාභය තෙරුන් වහන්සේ මෙසේ කීහ. සම්මා සම්බුදුරජාණන් වහන්සේ විසින් අභිධර්මයට පැමිණ න්‍යාය දියයුතු සෑම පදයකටම න්‍යායක් දෙන ලද්දේමය. මෙහි එක් ආචාර්යවරයෙක් මම දන්නවා යයි හැසිරෙමින් අකුසලයෙහි ඕලාරික සුඛුම බව පෙන්වයි. සම්මා සම්බුදුන් ලෝකෝතරයෙහිද ඕලාරික සුඛුම බව පෙන්වූහයි සැක කරයි. එසේ කියා මේ සූත්‍රය දැක්වූහ. "ස්වාමීනි, එහි යම් ප්‍රතිපදාවක් දුක්ද පමාවී දැනගනියිද ස්වාමීනි, මේ සම්පදා දෙකම දුක් බැවින් පමා බැවින් හීනයයි කියයි. මෙහි සතර පටිපදා ලෞකික ලෝකෝත්තර මිශ්‍රව කියන ලදී. තං තං වා පන මෙහිදී යටකියන ලද න්‍යාය නොබැලිය යුතුය. ඒ ඒ ආකාරයෙන් කිවයුතුය. ලෝභ සහගත සහ දෝෂ සහගත යයි අකුසලය දෙආකාරය. එහි දෝස සහගත වූයේ ඕලාරිකය. ලෝභ සහගත වූයේ සුඛුමය. නියත අනියත වශයෙන් දෝස සහගතයද දෙ ආකාරය. එහි නියත වූයේ ඕලාරිකය. අනියත සුඛුමය. කල්පයක් සිටින්නේ ඕලාරිකය. කල්පයක් නොසිටින්නේ සුඛුමය. කල්පයක් සිටින අසංඛාරිකය ඕලාරිකය. සසංඛාරිකය සුඛුමය. ලෝභ සහගතය. දිට්ඨි සම්පයුක්ත හා දිට්ඨි

විප්පයුත්තයයි දෙයාකාරය. දිට්ඨි සමපයුක්ත වූයේ ඕලාරිකය. දිට්ඨි විප්පයුක්ත වූයේ සුඛුමය. දිට්ඨි සම්පයුක්තයේ නියතය ඕලාරිකය. අනියත සුඛුමය. එහිද අසංඛාරිකය ඕලාරිකය. සසංඛාරිකය සුඛුමය. සංක්‍ෂේපයෙන් අකුසලයට පැමිණ යම් විපාකයක් බොහෝකොට දේද එය ඕලාරිකය. යම් විපාකයක අඩුවෙන් දේද එය සුඛුමය. කුසලයට පැමිණි අල්ප විපාකය ඕලාරිකය. බහු විපාකය සුඛුමය. සතරවැදෑරුම් කුසලයෙහි කාමාවචර කුසලය ඕලාරිකය. රූපාවචර කුසලය සුඛුමය. එය ඕලාරිකය. අරූපාවචරය සුඛුමය. එය ඕලාරිකය. ලෝකෝත්තර සුඛුමය. මෙය භූමිවල අභේද නයයි. බේද වශයෙන් කාමාවචර කුසලය දාන ශීල භාවනා වශයෙන් ත්‍රිවිධය. එහි දානමය කුසලය ඕලාරිකය. ශීලමය කුසලය සුඛුමය. එයද ඕලාරිකය. භාවනාමය කුසල සුඛුමය. කුසලයද ද්විහේතුක ත්‍රිහේතුක යයි ද්විධය. ද්විහේතුකය ඕලාරිකය. ත්‍රිහේතුකය සුඛුමය. ත්‍රිහේතුකයද සසංඛාරික අසංඛාරික වශයෙන් ද්විධය. සසංඛාරික ඕලාරිකය. අසංඛාරික සුඛුමය. රූපාවචරයෙහි ප්‍රථමධ්‍යාන කුසල වේදනාව ඕලාරිකය. ද්විතීය ධ්‍යාන කුසල වේදනාව සුඛුමය. එයද ඕලාරිකය. තෘතීය ධ්‍යාන කුසල වේදනාව සුඛුමය. එයද ඕලාරිකය. චතුර්ථධ්‍යාන කුසල වේදනාව සුඛුමය. එය ඕලාරිකය. ආකාසානඤ්චායතනය සුඛුමය. එය ඕලාරිකය. විඤ්ඤාණඤ්චායතන ආකිඤ්චඤ්ඤායතන නේවසඤ්ඤා නාසඤ්ඤා-යතන වේදනා සුඛුමය. ඒවාද ඕලාරිකය. විපස්සනා සහජාත කුසලය සුඛුමය. එයද ඕලාරිකය. සෝවාන් මග හා උපන් කුසලය සුඛුමය. එයද ඕලාරිකය. සකෘදාගාමී කුසලය සුඛුමය. එයද ඕලාරිකය. අනාගාමී කුසලය සුඛුමය. එයද ඕලාරිකය. අරහන්ත මග්ග කුසලය සුඛුමය. සතර වැදෑරුම් විපාකයෙහි කාමාවචර විපාක වේදනාව ඕලාරිකය. රූපාවචර වේදනාව සුඛුමය. එයද ඕලාරිකය. අරූපවචර විපාක වේදනාව සුඛුමය. එයද ඕලාරිකය. ලෝකෝත්තර විපාක වේදනාව සුඛුමය. මෙසේ තවම අභේද වශයෙනි.

බේද වශයෙන් කාමාවචර විපාක අහේතුක සහේතුක වශයෙන් ඇත. සහේතුකද ද්විහේතුක ත්‍රිහේතුක වශයෙන් ඇත. එහි අහේතුකය ඕලාරිකය. සහේතුකය සුඛුමය. එහිද ද්විහේතුක ඕලාරිකය. ත්‍රිහේතුක සුඛුමය. එහිද සසංඛාරික ඕලාරිකය. අසංඛාරික සුඛුමය. ප්‍රථමධ්‍යාන විපාක ඕලාරිකය. ද්විතීයධ්‍යාන සුඛුමය. එයද ඕලාරිකය. තෘතීය........ චතුර්ථ ධ්‍යාන විපාක සුඛුමය. එයද ඕලාරිකය. ආකාසානඤ්චායතනකිරිය වෙදනා සුඛුමය. එයද ඕලාරිකය. විඤ්ඤාණඤ්චායතන ආකිඤ්චඤ්ඤා-යතන නෙවසඤ්ඤානාසඤ්ඤායතන කිරියවෙදනා සුඛුමය. යමක්

ඕලාරික ද එය හීනය. යමක් සුඛුමද එය ප්‍රණීතය. දූර දූක නිර්දේශයෙහි අකුසල වේදනාව විසභාග අර්ථයෙන්ද වෙන්වූ අර්ථයෙන්ද කුසල අව්‍යාකෘතවලින් දූරය. මේ ක්‍රමයෙන් සියළු පදවල දූර දතයුතුය. අකුසලාදී වේදනාවලින් සහ දුක්ඛාදී වේදනාවලින් යුක්තව තුන් තුන්දෙනා එක ඇඳක සිටියෝ වෙති. ඔවුන්ගේ ඒ වේදනා විෂභාග අර්ථයෙන් හා වෙන්වූ අර්ථයෙන් දූර නම් වන්නේය. පැමිණි වේදනාදියෙන් යුක්ත වූවෙහි ද මෙම නයමයි. අකුසල් වනාහි අකුසල්වලින් සමාන වූ යන අර්ථයෙන් ද ගැලපෙන අර්ථයෙන්ද සමීප නම් වේ. සියළු පදවල සමීප බව මෙනයින් දතයුතුය. අකුසලාදි වේදනාවෙන් යුක්ත වූ තුන්දෙනා අතරින් එක් කෙනෙක් කාම භවයෙහි ද එක්කෙනෙක් රූප භවයෙහිද එක් කෙනෙක් අරූපභවයෙහි ද වේ. ඔවුන්ගේ ඒ වේදනා සහගත අර්ථයෙන් සහ සමාන අර්ථයෙන් සමීප වන්නේය. කුසලාදියෙන් යුක්ත වූ වේදනාවන් ද මේ නයමය. **තං තං වා** පන යන මෙහි යට නය නොබලා ඒ ඒ ආකාරයෙන් කිව යුතුය. දූරින් සමීපය නොකිව යුතුය. සමීපයෙන් දූර කිව යුතුය. ලෝභ සහගත දෝස සහගත වශයෙන් අකුසල් දෙයාකාරය. එහි ලෝභ සහගත අකුසල් ලෝභ සහගත අකුසල්වලින් සමීපය. දෝස සහගත අකුසල්වලින් දූර වේ. දෝස සහගත අකුසල් දෝස සහගත අකුසල්වලින් සමීප වේ. ලෝභ සහගත අකුසල් දූර වේ. දෝස සහගත නියත අකුසල් නියත අකුසල්වලින් සමීපය. අනියතද මෙසේය. කල්පස්ථායි සහ කල්පස්ථායි නොවූ අසංඛාරික සසංඛාරික භේදයද ලෝභ සහගත ආදියෙහි දිට්ඨි සම්පයුක්ත ආදි භේදයද ඕලාරික දූක නිර්දේශයෙහි විස්තර කළ ආකාරයෙන් අනුගමනය කොට එක් එක් කොට්ඨාශ වේදනා ඒ ඒ කොට්ඨාශවේදනාවලින් සමීපය. සෙසු වේදනා සෙසු වේදනාවලින් දූරය.

**මේ වේදනාස්කන්ධ නිර්දේශයයි.**

සංඥා ස්කන්ධ නිර්දේශයෙහි **යා කාචි සඤ්ඤා** චතුභූමක සඤ්ඤා ගනු ලැබේ. **චක්ඛු සම්ඵස්සජා සඤ්ඤා** යනාදියෙහි අතීතාදි වශයෙන් දක්වන ලද සංඥා ස්වභාව වශයෙන් දැක්වීමට කියන ලදී. එහි චක්ෂු ස්පර්ශයෙන් හෝ චක්ෂු ස්පර්ශයෙහි හටගන්නේ චක්ඛු සම්පස්සජා නම් වේ. සෙස්සෙහිද මෙම නයයි. මෙහි මුලින් පස චක්ෂු ප්‍රසාදාදි වස්තුය. මනෝසම්ඵස්ස සංඥාව හෘදය වස්තුව ඇතිව හෝ නැතිව උපදියි. සියළු

චතුභූමක සංඥා ඕලාරික දුක නිර්දේශයෙහි පටිඝසම්ඵස්ස සංඥා පටිඝ සහිත චක්‍ෂු ප්‍රසාද වස්තුකොට රූපාදිය අරමුණුකොට උපන්නාහු ස්පර්ශය පටිඝ ස්පර්ශ නම් වේ. එයින් උපන්නේ හෝ එහි උපන්නේ පටිඝ සම්ඵස්සජා නම් වේ. චක්ඛු සම්ඵස්ස සංඥාව සහ කාය සම්ඵස්ස සංඥා එම වස්තුවලින් ඇති වේ. රූප සංඥා-පොට්ඨබ්බ සංඥා ද එම අරමුණුවලින්ම නම් වේ. මේ වනාහි වස්තු අරමුණුවලින් නම් වේ. පටිඝ සහිත වස්තූන් නිසා පටිඝ සහිත අරමුණු අරබයා උපන් හෙයින් මෙය පටිඝ සම්ඵස්සජා සංඥා යයි කියන ලදී. මනෝ සම්ඵස්සජා ද එයින් හටගත් ස්පර්ශය මනෝ සම්ඵස්ස නම් වේ. ඒ මනෝ ස්පර්ශයෙහි වූ ඒ ස්පර්ශයෙන් උපන්නේ මනෝ සම්ඵස්සජා නම් වේ. එසේම සෝත, ඝාන, ජිව්හා, කාය, විඤ්ඤාණ, මනෝ නම් වේ. ඒවායින් එක්ව උපන් ස්පර්ශය මනෝ සම්ඵස්ස නම් වේ. ඒ මනෝ ස්පර්ශයෙහි හෝ ඒ මනෝ ස්පර්ශයෙන් උපන්නේ මනෝ සම්ඵස්සජාය. අධිවචන සම්ඵස්සජා සංඥාවද පර්යාය වශයෙන් මෙයටම නමකි. අරූපි ස්කන්ධ තුන තමා පිට තමා වැටී සමග ඉපදුනු සංඥාවෙන් අධිවචන සම්ඵස්සජා සංඥායයි නමක් කරයි. නිෂ්පර්යාය වශයෙන් පටිඝ සම්ඵස්සජ ද සංඥා නම් පඤ්චද්වාරික සංඥා වේ. අධිවචන සම්ඵස්සජා සංඥා නම් මනෝද්වාරික සංඥාය. එහි පඤ්චද්වාරික සංඥා බලා දැනගැනීමට හැකි ඕලාරිකය. සිත අළවා නැවත සිහිකරන්නේ නැවත සිහිකරන්නේ යයිද කිපී නැවත සිහිකරන්නේ යයි දැකම දැනගනියි. එයට නිදසුන් කථාවකි. ගැහැණු දෙදෙනෙක් හිඳගෙන නූල් කටිති. තරුණ භික්‍ෂු දෙනමක් ගමේ හැසිරෙන්නේ ඉදිරියෙන් යන්නා එක් ස්ත්‍රියක දෙස බැලුවේය. අනික් තැනැත්තා කුමක් හෙයින් ඇය බැලීදැයි විචාළේය. මම ඇය ගැහැණියක යන සිතින් නොබැලුයෙමි. කණිටු සොයුරියක යන සංඥාවෙන් බැලුවෙමි. ඔවුහුද ගමේ හැසිර අවුත් ආසන ශාලාවේ හිඳගත්විට අනික් භික්‍ෂුව ඒ භික්‍ෂුවගෙන් ඇසීය. ඔබ විසින් ඒ ස්ත්‍රිය බලනු ලැබීද? ඔව් මවිසින් බලන ලදී. කුමක් හෙයින්ද? මගේ නැගණිය සමානකොට ඇය බැලීමි යයි කීය. මෙසේ පඤ්චද්වාරික සංඥාවෙන් බලනවිට දැන ගැනීමට හැකිය. එය වනාහි ප්‍රසාද වස්තු වේ. ඇතමෙක් ජවනයෙහි පවත්නේයයි විස්තර කරති. මනෝද්වාරික සංඥා වනාහි එක ඇඳක හෝ එක පුටුවක හුන්නේද අනිකක් සිතන්නේ ඔහු සිතුවේ කුමක්දැයි විතර්ක කොට කුමක් සිතුවේදැයි අසා ඔහුගේ වචනයෙන්ම දැනගත යුතු සේ සියුම්ය. සෙස්ස වේදනාස්කන්ධය හා සමානය.

**මේ සංඥා ස්කන්ධ නිර්දේශයයි.**

සංස්කාරාස්කන්ධ නිර්දේශයෙහි යෙ කෙචි සංඛාරා යන චතුභූමක සංස්කාරයෙහි ගනු ලැබේ. චක්ඛු සම්ඵස්සජා චේතනා යනාදිය අතීතාදි වශයෙන් නිර්දිෂ්ට සංස්කාරයෙහි ස්වභාවය දැක්වීමට කියන ලදි. චේතනා යටත් පිරිසෙයින් ප්‍රධාන සංස්කාර වශයෙන් කියන ලදී. යටත් පිරිසෙයින් චක්‍ෂු විඥානය සමග පෙළෙහි පැමිණි අඩු වශයෙන් සංස්කාරයෝ සතර දෙනෙක් උපදිති. ඒවා අතර චේතනාව ප්‍රධානය. රැස්කිරීම් අර්ථයෙන් ප්‍රකටය. ඒ නිසා මෙයම ගන්නා ලදී. එය හා සම්ප්‍රයුක්ත සංස්කාරයන් එය ගැනීමෙන් ගන්නා ලද්දේ වේ. මෙහිද පෙරපස චක්‍ෂු ප්‍රසාදාදි වස්තුමය. මනෝ සම්ඵස්සජය හෘදය වස්තුව ඇතුවද, නැතුවද උපදියි. සියල්ල චතුභූමක චේතනාය.

මේ සංස්කාරාස්කන්ධ නිර්දේශයයි.

විඥානස්කන්ධ නිර්දේශයෙහි යංකිඤ්චි විඤ්ඤාණං චතුභූමක විඥ්ඥාණය ගනු ලැබේ. විඥ්ඥාණ ආදිය අතීතාදි වශයෙන් දක්වන ලද විඥ්ඥාණය ස්වභාව වශයෙන් දැක්වීමට කියන ලදී. එහි චක්ඛු විඥ්ඥාණාදි පස චක්‍ෂු ප්‍රසාද වස්තුමය. මනෝ විඥ්ඥාණය හෘදය වස්තුව ඇතිවද නැතිවද මේ සියල්ල චතුභූමක විඥ්ඥාණය වේ.

මේ විඥානස්කන්ධ නිර්දේශයයි.

දැන් පඤ්චස්කන්ධයෙහි ප්‍රභවය වශයෙන් පෙරපර වශයෙන් මාර්ගය පිරිසිඳීමෙන් එකට ඉපදී නොයෙක් නිරුද්ධවීම් වශයෙන් නොයෙක් ඉපදීම් එකට නිරුද්ධවීම් වශයෙන් එකට ඉපදී එකට නිරුද්ධවීම් වශයෙන් වෙනම ඉපදී වෙනම නිරුද්ධවීම් වශයෙන් අතීත අනාගත වර්තමාන වශයෙන් අධ්‍යාත්ම බාහිර වශයෙන් ඕලාරික සුඛුම වශයෙන් හීන ප්‍රණීත වශයෙන් දුර සමීප වශයෙන් ප්‍රත්‍ය හටගැනීම් වශයෙන් ඉපදීම් වශයෙන් සංඛත වශයෙන් දහසය ආකාරය වශයෙන් ප්‍රකීර්ණකය දතයුතුය. එහි පහළවීම් දෙයාකාරය. මව්කුසින් හා ඕපපාතික වශයෙනි. එහි මව්ගැබින් ඉපදීම මෙසේ දතයුතුය. මව්කුසින් බිහිවන සත්වයින්ගේ පිළිසිඳගත් ක්‍ෂණයෙහි පෙරපසු නොවී පඤ්චස්කන්ධය එකට පහළ වේ. ඒ ක්‍ෂණයෙහි පහළ වූ කලල සංඛ්‍යාත රූප පරම්පරාව ඉතා සියුම් ඉදිකටුවක් තෙලෙහි බහා ඔසවනවිට වැගිරීඅග රැඳුනු බිංදුව පමණයයි කියන ලදී. එයද

අත්හැර කෙස්ගසක් තෙලෙහි බහා ඔසවා වැගිරි අග පිහිටි බිංදු මාත්‍රයයි කියන ලදී. එයද හැර මේ ජනපදයේ මිනිසුන්ගේ කෙස්ගසක් අටට පළා එයින් එක් කොටසක් පමණක් උතුරුකුරු දිවයින් වැසියන්ගේ කෙස්ගසක් පමණ වේ. එය ප්‍රසන්න තෙලෙහි බහා එසවූ විට අග රැඳුණු බිංදු මාත්‍රායයි කියන ලදී. එයද හැරදමා සියළු රෝමයෙන් අංශුවක් තලතෙලෙහි බහා ඔසවා වැගරී අග රැඳුණු බිංදු මාත්‍රයයි කියන ලදී. එය ඉතා පිරිසිදුය. ප්‍රසන්නය. නොකැළඹුනේය. පිරිසිදු ප්‍රසන්න තළතෙල් බිඳුවල වර්ණයට සමානයයි කියන ලද්දේය.

තල තෙලෙහි බිඳු ලෙස - ගිතෙල් පිඬුවෙන් පිරිසිදු
පාට මෙයයුරු වන - කලල යයි කියැවෙන්නේ

මෙසේ ඉතා අල්ප වූ රූප පරම්පරාවේ වස්තු දසකය කාය දසකය ස්ත්‍රියගේ ස්ත්‍රීඉන්‍ද්‍රිය පුරුෂයාගේ පුරුෂ ඉන්‍ද්‍රිය වශයෙන් භාව දසකයයි පරම්පරා ශීර්ෂ තුනක් වේ. එහි වස්තු රූපය එය ඇසුරුකරන මහාභූත සතර එය ඇසුරු කරන වර්ණ ගන්ධ රස ඕජා ජීවිතේන්‍ද්‍රිය යයි යන දසය වස්තු දසක වේ. කාය ප්‍රසාදය එය ඇසුරුකරන මහාභූත සතර එය ඇසුරු කරන වර්ණ ගන්ධ රස ඕජා ජීවිතේන්‍ද්‍රිය යන දහය කාය දසක වේ. ස්ත්‍රියගේ ස්ත්‍රීභාව ඉන්‍ද්‍රිය පුරුෂයාගේ පුරුෂභාව ඉන්‍ද්‍රිය එය ඇසුරු කරන මහාභූත සතර ඒවා ඇසුරු කරන වර්ණ ගන්ධ රස ඕජා ජීවිතේන්‍ද්‍රිය යන දහය භාවදසක නම් වේ. මෙසේ මව්කුසින් උපදින්නවුන්ගේ ප්‍රතිසන්‍ධියෙහි උත්කෘෂ්ඨ වශයෙන් සමතිස් කර්මජ රූපයන් රූපස්කන්‍ධ නම් වේ. ප්‍රතිසන්‍ධි සිත සමග එකට උපන් වේදනාව වේදනාස්කන්‍ධ නම් වේ. සංඥාව සංඥාස්කන්‍ධ නම් වේ. සංස්කාරය සංස්කාරස්කන්‍ධ නම් වේ. විඥානය විඤ්ඤාණස්කන්‍ධය නම් වේ. මෙසේ මව්කුසින් බිහිවන්නවුන්ගේ ප්‍රතිසන්‍ධි ක්‍ෂණයෙහි පඤ්චස්කන්‍ධය සම්පූර්ණ වෙයි. නපුංසක ප්‍රතිසන්‍ධියක් වේනම් භාවදසකය පිරිහේ. දසක දෙකක් වශයෙන් සමවිසි කර්මජරූප රූපස්කන්‍ධය නම් වේ. වේදනාදිය කියන ලද ආකාරයෙන්මය. මෙසේ මව්කුසින් බිහිවන්නහුගේ ප්‍රතිසන්‍ධි ක්‍ෂණයෙහි පඤ්චස්කන්‍ධය සම්පූර්ණ වේ. මේ ස්ථානයේ සුදුසු සේ සම්බන්ධ ඇති ගැලපීම් තුන්ආකාර හටගැන්ම කිවයුතු වන්නේය. එය නොකියා ඕපපාතික හටගැන්ම දක්වන ලදී. පිරිපුන් ආයතන ඇතිව ඕපපාතිකව උපදින්නවුන්ගේ යටකියන ලද දසක තුන සහ චක්ඛු ශෝත්‍ර ඝ්‍රාන ජිව්හා දසකද සමග රූප පරම්පරා හතක් පහළ වේ. එහි චක්‍ෂු දශක ආදිය කාය

දශකය හා සමානය. නපුංසකයින්ට භාවදසකය නැත. මෙසේ පිරිපුන් ආයතන ඇති ඕපපාතිකයන්ට හැත්තෑවක් හෝ හැටක් වූ කර්මජරූප රූපස්කන්ධය නම් වේ. වේදනාස්කන්ධය ආදිය කියන ලද ආකාරයෙනි. ඕපපාතිකයන්ගේ ප්‍රතිසන්ධි ක්ෂණයෙහි පඤ්චස්කන්ධය සම්පූර්ණ වේ. මේ ඕපපාතික පහළවීම නම් වේ. මෙසේ මෙපමණකින් පඤ්චස්කන්ධ පහළවීම දතයුතුය.

පුබ්බාපරතො මෙසේ මව්කුසින් බිහිවන අයගේ පෙරපසු නොවී පඤ්චස්කන්ධය පහළවන කල්හි කුමන රූපයක් පළමුවන රූපය වශයෙන් හටගනීද නැතහොත් අරූපවේද? රූපය රූපයෙන්ම හටගනියි. අරූප නොවේ. කුමක් හෙයින්ද? පටිසන්ධි සිතට රූප ඉපදවිය නොහැක. සියළු සතුන්ගේ ප්‍රතිසන්ධි සිත, ක්ෂීණාශ්‍රවයාගේ චුති සිත, දෙපස් විඤ්ඤාණය, සතර ආරූප්‍ය විපාක සොළොස් සිත් රූප නූපදවයි. එහි පටිසන්ධි සිත එපමණකින් වස්තුවල දුර්වල බැවින් නොපිහිටි බැවින් ප්‍රත්‍ය අඩු බැවින්ද ආගන්තුක බැවින්ද රූප නූපදවයි. එහි සහජාත වස්තු උපදින ක්ෂණයෙහි දුබල වේයයි වස්තුවල දුබල බැවින් රූප නූපදවයි. පර්වතයෙන් වැටෙන මිනිසෙකුට වෙන කෙනෙකුට පිහිටවීමට නොහැකි වන්නා සේ මෙයද කර්මජ වේගයෙන් දවන ලද බැවින් පර්වතයෙන් වැටෙන්නාක් මෙන් පිහිටක් නැත. මෙසේ කර්මවේගයෙන් දවන ලද බැවින් පිහිටක් නැති නිසා රූප නූපදවයි. පටිසන්ධි සිතද වස්තුව සමග පෙරපසු නොවී ඉපදී ඒ වස්තුවට පෙර ඉපදී ප්‍රත්‍යවීමට හැකි නොවේ. එසේ හැකිවන්නේ නම් රූප උපදවන්නේය. යම්සේ වස්තු පෙර ඉපදී ප්‍රත්‍යවීමට හැකිනම් එවිට ප්‍රවේණිය හා ගැටෙයි. එහිද සිත අංග වශයෙන් නොපිරිහීම රූප උපදවයි. සිත ස්ථිති ක්ෂණයෙහි හෝ භංග ක්ෂණයෙහි රූප උපදවන්නේ නම් පටිසන්ධි සිතද රූප උපදවන්නේය. සිත ඒ ක්ෂණ දෙකෙහි රූප උපදවන්නේ නැත. යම් සේ නයි හතු මොට්ටුව පොළොවෙන් නැගෙන්නේ පස් ටිකක් ගෙන නැගෙයි. මෙසේ සිත පෙර හටගත් වස්තු නිසා උත්පාද ක්ෂණයෙහි අටරූපයක් ගෙන නැගෙයි. පටිසන්ධි චිත්ත ක්ෂණයෙහිම වස්තු පෙර ඇතිවී ප්‍රත්‍ය වීමට නොහැකි වේ. ප්‍රත්‍ය අඩු බැවින් පටිසන්ධි සිත රූප නූපදවයි. ආගන්තුක පුරුෂයෙක් නොගිය දිසාවකට ගොස් අන්‍යයන්ට තොපගේ ඇතුළු ගමේ ආහාරපාන මල්ගඳ ආදිය දක්වන්නෙමි යයි කියන්නට නොහැකි වේද? තමාගේ විෂයය නොවන නිසා පළපුරුදු නොවන නිසා එසේ වෙයි. පටිසන්ධි සිතද එසේ ආගන්තුක නිසා තමාගේ ආගන්තුක බැවින් රූප නූපදවයි. තවද සමතිස් කර්මජ රූප චිත්ත

සමුට්ඨාන රූපයන්ගේ තැනගෙන සිටීයයි පටිසන්ධි සිත රූප නූපදවයි. ක්ෂීණාශ්‍රවයාගේ චුති සිත සසර හේතු නැති කළ නිසා රූප නූපදවයි. උන්වහන්සේ වනාහි සියළු භවවල සසර මුල් ව්‍යපසමනය කළ නිසා ඉපදීමට භව්‍ය නොවන බැවින් පුනර්භවයෙහි ප්‍රවේණියක් නැත. සෝවාන් පුද්ගලයාගේ භව සතක් හැර අටවන භවයෙහි සසර මුල් සංසිඳේ. ඒ නිසා ඔහුගේ චුතිසිත භව හතක රූප උපදවයි. සකෘදාගාමී පුද්ගලයාගේ භව දෙකකි. අනාගාමී පුද්ගලයාගේ එක භවයකි. රහතන් වහන්සේගේ සියළු භවවල සසරමුල් සංසිඳී ඇති නිසා චුති සිත රූප නොඋපදවයි. දෙපස් විඥානයෙහි ධ්‍යානාංග නැත. මාර්ගාංග නැත. හේතු නැත. සිතේ අංග නැතැයි දුබල වන නිසා රූප නොඋපදවයි. අරූප විපාක සතර ඒ භවයෙහි රූප නැති බැවින් රූප නූපදවයි. එපමණක් නොව ඒ භවයෙහි වෙනත් කාමාවචර කුසල් අට අකුසල දහය කිරිය සිත් නවය අරූප කුසල් හතර අරූප කිරිය සිත් හතර මාර්ග සිත් තුන ඵල සිත් හතර යන දෙසාලිස් සිත් උපදියිද, එහි රූප නැති බැවින් ඒවාද රූප නූපදවයි. පටිසන්ධි සිත මෙසේ රූප නූපදවයි. ඍතුව වනාහි පළමුවන රූපය උපදවයි. ඍතු යනු කුමක්ද? ප්‍රතිසන්ධි ක්ෂණයෙහි උපන් සමතිස් කර්මජ රූප අභ්‍යන්තරයේ තේජෝ ධාතුවයි. එය එතනට පැමිණ රූප උපදවයි. උතු නම් මෙය පමාවී නිරුද්ධ වෙයි. සිත වහා නිරුද්ධ වේ. ඍතු රූපය පවතින විටම සොළොස් සිත් ඉපිද නිරුදධ වේ. ඒවා අතර පටිසන්ධියට අනතුරුව පළමුවන භවංග සිත උපදින කෙනෙහි රූප අට උපදවයි. ශබ්දයේ උත්පත්ති කාලයේදීම උතුසිත් ශබ්ද නවකය උපදවන්නේය. කබලින්කාර ආහාරය ද ස්ථානගතව රූප අට උපදවයි. මේ කියන ලදී.

මව වළඳන දෙයක් - අහරක් පැනක් බොදුනක්
එයින් ඔහු යැපෙතැයි - මව්කුස වන් ගඳඹයා

මෙසේ කුසට ගිය දරුවා මව විසින් ගිලින ලද ආහාරපාන ඕජාවෙන් යැපේ. එයද ස්ථානයට පැමිණ රූප අට උපදවයි. එම ඕජාව කර්කශ නොවේද වස්තු සියුම්ද එහි කෙසේ පිහිටයිද පළමුව ඒතාක් නොපිහිටයි. පළමු දෙවන හෝ සත්වන දවසක කාලයේදී පිහිටයි. එයින් පෙර හෝ පසුව හෝ පිහිටයි. යම් වේලාවක මව ගිලින ලද ආහාරපාන ඕජාව දරුවාගේ ශරීරයෙහි පිහිටයිද ඒ වේලාවේ රූප අට උපදියි. ඕපපාතිකයන් ප්‍රකෘතියෙන් පිළියෙල කළ කැම බීම් ඇති තැනක උපදින නිසා ඒවා ගෙන ගිලීමෙන් ස්ථානයට පැමිණි ඕජා රූපය රූප උපදවයි. යමෙක්

ආහාරපාන නැති කාලයක උපදියිද මහා බඩගිනිකාරයෙක් වේ. තමාගේ දිවෙන් කෙල පෙරලා ගිලියි. එහිද ස්ථානගත ඕජාව රූප උපදවයි. මෙසේ පස්විසි කොට්ඨාසවල රූප රූප උපදවයි. තේජෝ ධාතුවද කබලිංකාරාහාරයද අරූපයෙහිද සිත සහ චේතනා යන ධර්ම දෙකින් රූප උපදවයි. එහි උත්පාද භංග ක්‍ෂණවල රූප දුබලය. ස්ථිති ක්‍ෂණයෙහි බලවත් වේ. ස්ථිති ක්‍ෂණයෙහි රූප උපදවයි. කර්ම චේතනා නිරුද්ධ වීමෙන්ද ප්‍රත්‍ය වේ. අතීතයෙහි කල්පකෝටි ලක්‍ෂයක් එහා රැස්කරන ලද කර්ම දැන් ප්‍රත්‍ය වේ. දැන් රැස්කරන කර්ම අනාගතයෙහි කල්පකෝටි ලක්‍ෂයක් අවසානයේද ප්‍රත්‍ය වේ. පුබ්බඅපර වශයෙන් මෙසේ දත යුතුයි.

කාලය පිරිසිඳීමෙහි රූපය කොපමණ වේලාවක් තිබේද? අරූපය කොපමණද? ගරු පරිණාම වූ රූපය සෙමින් නිරුද්ධ වේ. අරූපය වහා පරිණාම වේ. රූපය පවතිනවිටම සොළොස් සිත් ඉපිද නැතිවෙයි. රූපය දහහත්වෙනි සිතත් සමග නිරුද්ධ වේ. මිනිසෙක් ගෙඩි කඩා කන්නෙමියි පොල්ලකින් ගසක අත්තකට ගසයිද ගෙඩි සහ කොළ එකවිට නැට්ටෙන් මිදී ගෙඩි බර නිසා පළමුව පොළවට වැටේ. මෙසේ පොලු පහරින් ගෙඩිද කොළද එකවර නැට්ටෙන් මිදෙන සේ ප්‍රතිසන්ධි ක්‍ෂණයෙහි රූපාරූප ධර්ම එකවර පහළ වේ. ගෙඩි බර බැවින් පළමුව පොළවට වැටෙන්නාක් මෙන් රූපය පවතිනවිටම සොළොස් සිත් ඉපිද නැතිවෙයි. කොළවල ලුහුබව නිසා පසුව පොළවට වැටෙන්නාක් මෙන් රූපය දාහත්වෙනි සිත සමග නිරුද්ධ වේ. එහි කිසියම් රූපයක් පමාවී නිරුද්ධ වේ. ගරු පරිණාම වේ. සිත ලුහු පරිණාම නිසා වහා නිරුද්ධ වේ. රූපය වනාහි අරූපය, අරූපය රූපය හැරදමා පවතින්නට නොහැකි වේ. දෙකම එක පමණට පවතී. මේ එහි උපමාවයි. එක් පුරුෂයෙක් කෙටි පා ඇත්තෙකි. තව පුරුෂයෙක් දිගු පා ඇත්තෙකි. ඔවුන් එකතුව මග යනවිට දිගු පා ඇත්තා එක් පියවරක් තබනවිට කෙටි පා ඇත්තා සොළොස් පියවරක් තබයි. කෙටි පා ඇත්තා සොළොස් පියවරක් තබනවිට දිගු පා ඇත්තා එක් පියවරක් තබයි. මෙසේ එකෙක් අනිකා ඉක්මවන්නට නොහැකි වේ. දෙදෙනාගේම ගමන එක ප්‍රමාණ වේ. මෙය මෙසේ දතයුතුය. අරූපය කෙටි පා ඇත්තා මෙනි. රූපය දිගු පා ඇත්තා මෙනි. දිගු පා ඇත්තා එක පියවරක් තබනවිට කෙටි පා ඇත්තා සොළොස් පියවරක් තබනවා මෙන් රූපය පවතිනවිට අරූපය වූ සිත සොළොස් සිත් උපදවා නිරුද්ධ වේ. කෙටි පා ඇත්තාගේ සොළොස් පියවරට දිගු පා ඇත්තා එක පියවරක් තබනවා මෙන් දාහත්වන සිත සමග රූපය නිරුද්ධ වේ.

පුරුෂයන් දෙදෙනා ඔවුනොවුන් නොඉක්මවා එකපමණට ගමන් කරනවා මෙන් අරූපය රූපයද රූපය අරූපයද හැර නොදමා එක පමණට පවතී. මෙසේ ඇතිවන පිරිසිඳීම දතයුතුය.

එකුප්පාද නානා නිරොධ යන මෙය පැසුළු කර්මජ රූපය හැර දැක්විය යුතුය. පළමුව ප්‍රතිසන්ධි සිත දෙවනුව භවාංග සිත තෙවනුව භවාංග සිත........... සොළොස්වෙනුව භවාංග සිත. ඒවායේ එකළුකෙහි උප්පාද ඨිති භංග වශයෙන් ක්‍ෂණ තුනකි. එක එක සිතක තුන් තුන් ක්‍ෂණවල තිහ තිහ කර්මජ රූප උපදී. ප්‍රතිසන්ධි සිත උපන් කෙණෙහි උපදින කර්මජ රූප දාහත්වන භවාංග සිත ඉපදුනු කෙණෙහි නිරුද්ධ වේ. ඨිති ක්‍ෂණයෙහි උපන් රූප ඨිති ක්‍ෂණයෙහිද භංග ක්‍ෂණයෙහි උපන් කර්මජරූප භංග ක්‍ෂණයෙහිද නිරුද්ධ වේ. මෙසේ දෙවන භවාංග සිත මුල්කොට තම තමාගේ දාහත්වන සිත සමග යොදා නය පැමිණවිය යුතුය. මෙසේ සොළොසේ සිට හතලිස් අටක් වේ. මෙහි කර්මජ රූප හතලිස් අට ප්‍රවේණි නම් වේ. ඒවා වනාහි රාත්‍රියේද දහවලද කනවිටද බොනවිටද නිදනවිටද පමාවනවිටද ගංගා ජලයක් මෙන් ඒකාන්තයෙන් පවතී. මෙසේ එකුප්පාද නිරෝධය දතයුතුය. නානා උප්පාද ඒකනිරෝධ පැසුළු කර්මජ රූපයෙන් දැක්විය යුතුය. එහි ආයුසංස්කාර අවසානයෙහි සොළොස් සිත්වල වාරය ඇතිකල්හි යට සොළොසද මතු සොළොසද එකට යෙදිය යුතුය. යට සොළොසෙහි පළමු සිත ඉපදුණු කෙණෙහි හටගත් සමතිස් කර්මජ රූප මතු සොළොසෙහි පළමු සිත උපන් කෙණෙහිම නිරුද්ධ වේ. එහි ඨිති ක්‍ෂණයෙහි උපන් කර්මජ රූප ඨිති ක්‍ෂණයෙහිද භංග ක්‍ෂණයෙහි උපන් කර්මජ රූප භංග ක්‍ෂණයෙහිද නිරුද්ධ වේ. යට සොළොසෙහි දෙවන සිතේ සිට සොළොස්වන සිත උපන් කෙණෙහි ඉපදුණු සමතිස් කර්මජ රූප චුති සිත උපන් කෙණෙහි නිරුද්ධ වේ. එහි චුති සිතේ ඨිති ක්‍ෂණයෙහි උපන් කර්මජ රූප ඨිති ක්‍ෂණයෙහිද, භංග ක්‍ෂණයේ උපන් රූප භංග ක්‍ෂණයේද නිරුද්ධ වේ. එතැන් පටන් කර්මජ රූප පරම්පරාව නොපවතී. පවතින්නේ නම් සත්වයෝ ව්‍යය නොවන අජර අමර වන්නාහුය. මෙහි දාහත්වන භවාංග සිතේ උත්පාද ක්‍ෂණයෙහි නිරුද්ධ වේයයි ආදි නයින් එක් සිතක උප්පාද ක්‍ෂණයෙහි උපන් රූප අනිත් සිතක උප්පාද ක්‍ෂණයෙහි නිරුද්ධ වේයයි අර්ථ කථාවෙහි ආ බැවින් කියන ලදී. එය යමෙකුගේ කාය සංස්කාර නිරුද්ධ වේද ඔහුගේ චිත්ත සංස්කාර නිරුද්ධ වේ. යන පෙළට විරුද්ධ වේ. කෙසේද? කාය සංස්කාර යනු සිතෙන් හටගත් ආශ්වාස ප්‍රශ්වාස

වාතයයි. සිතින් හටගත් රූපද සිත ඉපදෙන කෙණෙහි ඉපදී අනිත් සොළොස් සිත් උපදිනතුරු සිටී. ඒ සොළොස් සිත්වල අවසාන සිත සමග නිරුද්ධ වේ. මෙසේ යම් සිතක් සමග උපදීද එතැන් පටන් සිට දාහත්වැනි සිත සමග නිරුද්ධ වේ. කිසියම් සිතක උප්පාද ඨිති ක්‍ෂණවල නිරුද්ධ නොවේ. ඨිති හෝ භංග හෝ ක්‍ෂණවල නූපදී. මෙය සිතින් හටගත් රූපවල ධර්මතාව යන නියමයෙන් චිත්ත සංස්කාර සමග ඒකක්‍ෂණයෙහි නිරුද්ධවීමෙන් එසේ යයි කියන ලදී. සිතින් හටගත් රූපවල ක්‍ෂණ නියමයයි යමක් කියන ලදද කර්මාදියෙන් හටගත් රූපවල ක්‍ෂණ නියමයද එසේය. එනිසා ප්‍රතිසන්ධි සිත සමග උපන් කර්මජ රූප එතැන් පටන් දාහත්වන සිත සමග නිරුද්ධ වේ. ප්‍රතිසන්ධි සිතේ ඨිති ක්‍ෂණයෙහි උපන් රූප දහඅටවන සිතේ උප්පාද ක්‍ෂණයෙහි නිරුද්ධ වේ. ප්‍රතිසන්ධි සිතේ භංග ක්‍ෂණයෙහි උපන් රූප දහඅටවන සිතේ ඨිති ක්‍ෂණයෙහි නිරුද්ධ වේ. යන මේ නය මෙහි යෙදිය යුතුවය. ඉන්පසුව ඍතුවෙන් හටගත් රූප පරම්පරාව පවතී. බැහැර කොට පුළුස්සනුයි කිවයුතු වේ. මෙසේ නා නා උප්පාද ඒක නිරෝධය දතයුතුය.

ඒකුප්පාද ඒක නිරෝධ රූපය වනාහි රූපය සමග එකට ඉපදී එකට නිරුද්ධ වේ. අරූපය අරූපය සමග එකට ඉපදී එකට නිරුද්ධ වේ. එකට ඉපදී එකට නිරුද්ධ වීම මෙසේ දතයුතුය. නානා උප්පාද නානා නිරෝධ වනාහි සන්තති රූප සතරෙන් දැක්විය යුතුය. මෙහි පාදයෙන් උඩ කේස මස්තකයෙන් යට සම කෙළවර කොට ඇති ශරීරයේ ඒ ඒ තැන චතු සන්තති රූප සනව පිඬුවීමෙන් පවතී. මෙසේ පැවතුනත් එකට ඉපදුනේ යයි නොසැලකිය යුතුය. වේ පාරක් හෝ කුඹි පාරක් බලනවිට ඒකාබද්ධව පෙනේ. නමුත් ඒකාබද්ධ නැත. අනිකකුගේ හිස ලඟ අනිකකුගේ හිස බඩ පා ඇත. මෙසේම චතු සන්තති රූපවල අනිකකුගේ උප්පාද ක්‍ෂණයෙහි අනිකකුගේ ඉපදීම ඨිතිය හා භංගය ද වේ. මෙසේ මෙහි නානුප්පාද නා නා නිරෝධ දතයුතුය. අතීතාදි දූරදුක අවසාන පෙලෙහි ආවේය. ප්‍රත්‍ය හටගැනීම ද කර්මජ කර්මප්‍රත්‍ය ඍතු ප්‍රත්‍ය හටගැනීම් ආදි නයින් යට කියන ලදී. ස්කන්ධ පහ පරිනිෂ්පන්න වේ. අපරිනිෂ්පන්න නොවේ. සංඛත වේ. අසංඛත නොවේ. තවද නිෂ්පන්නද වේ. ස්වභාව ධර්මවල නිවණ අපරිනිෂ්පන්නද අනිෂ්පන්නද වේ. නිරෝධ සමාපත්තිය වනාහි ප්‍රඥප්තියකි. කෙසේද? නිරෝධ සමාපත්තිය ලෞකික ලෝකෝත්තර හෝ සංඛත අසංඛත හෝ පරිනිෂ්පන්න අපරිනිෂ්පන්න හෝ නොකිව යුතුය. සමාපත්ති අන්තයෙහි

නිෂ්පන්න වේ. සමාපත්තියෙන් නොවේ. ප්‍රඥප්තියද එසේය. එය ලෞකිකාදි භෙද නොලබයි. නිෂ්පන්න වේ. අනිෂ්පන්න නොවේ, නම් ගැනීම ගන්නාම ගනියි. මෙසේ ප්‍රකීර්ණ වශයෙන් ස්කන්ධ දැන,

නැණ බේදරුත් කඳු - පිළිවෙළ වෙසෙස් ලෙසිනේ
අඩු වැඩි නොවීමෙන් - උපමා විසින් එලෙසම

දකිමින් අරුත් සිඳු - වනයුරු දෙපරිදි මෙසේ
විනිස නය මැනවින් - දතයුතු පඬිවරු විසින්

එහි කමතො යන මෙහි උත්පත්ති ක්‍රම, ප්‍රහාන ක්‍රම, ප්‍රතිපත්ති ක්‍රම, භූමි ක්‍රම, දේශනා ක්‍රම යන ක්‍රම බොහෝ ආකාරය. "**පඨමං කලලං හොති කලලං හොති අබ්බුදං**" මේ ආදිය උත්පත්ති ක්‍රම වේ. දැකීමෙන් කෙලෙස් දහම් ප්‍රහාන කළයුතුය. භාවනාවෙන් කෙලෙස් ප්‍රහාන කළයුතුය. මේ ආදිය ප්‍රහාන ක්‍රම වේ. සීල විසුද්ධි චිත්ත විසුද්ධි ආදිය ප්‍රතිපත්ති ක්‍රම වේ. කාමාවචර රූපාවචර ආදිය භූමි ක්‍රම වේ. සතර සතිපට්ඨාන සතර සම්මප්පධාන හෝ දාන සීල කතාදිය දේශනා ක්‍රම වේ. ඒවා අතර මෙහි උත්පත්ති ක්‍රමය නොයෙදේ. කලලාදිය මෙන් ස්කන්ධයන්ගේ පෙර අපර වෙන් කිරීමෙන් නොඉපදවීම් වශයෙන්ද කුසල අව්‍යාකෘත ප්‍රහාන නොකිරීම් වශයෙන් ප්‍රහාන ක්‍රමය නොයෙදේ. අකුසල හා පිළිපැදීම් වශයෙන් ප්‍රතිපත්ති ක්‍රමය නොයෙදේ. වේදනාදියේ චතුභූමක ඇතුළත් හෙයින් භූමි ක්‍රමය නොයෙදේ. දේශනා ක්‍රමය වනාහි යෙදේ. පංච ස්කන්ධයෙහි අභේදයෙන් ආත්ම යයි ගැනීම කළ විනේය ජනයන් ඝන සමූහය වෙන්කිරීම දැකීමෙන් ආත්ම ග්‍රහණයෙන් මුදවනු කැමති භාග්‍යවතුන් වහන්සේ හිතකාමීව ඒ ජනයින්ට සුවසේ ගැනීම පිණිස චක්ෂු ආදියට විෂය වූ ඕලාරික වූ රූප ස්කන්ධය පළමුව දේශනා කළ සේක. ඉක්බිතිව ඉටු අනිටු රූප සංවේදී වූ වේදනාවද යමක් විඳගනීද එය දැනගනී යන මෙසේ වේදනා විෂයේ ආකාර ගන්නා සංඥාවද සංඥාව විසින් අභිසංස්කාර වූ සංස්කාරයද ඒ වේදනාදියට නිශ්‍රය වූ අධිපති වූ විඤ්ඤාණය ද දේශනා කළහ. මෙසේ ක්‍රම වශයෙන් විනිස දතයුතුය.

ස්කන්ධද උපාදානස්කන්ධද විශේෂ වේ. ඒවායේ විශේෂය කුමක්ද? මෙතෙක් ස්කන්ධ අවිශේෂයෙන් කියන ලදී. උපාදානස්කන්ධය ආශ්‍රව සහිතව ගැනීමේ හේතුවෙන් වෙසෙසා කීහ. "මහණෙනි, මේ පංච උපාදාන

ස්කන්ධයෙහි ස්කන්ධ පහ දේශනා කරමි. එය අසන්න. මහණෙනි, පංචස්කන්ධය කවරේද? මහණෙනි, අතීත අනාගත වර්තමාන......... සමීප හෝ යම් රූපයක් වේද මහණෙනි, මෙය රූපස්කන්ධ යයි කියනු ලැබේ. යම්කිසි වේදනාවක් වේද......... යම්කිසි සංඥාවක් වේද.......යම්කිසි සංස්කාරයක් වේද........යම්කිසි විඤ්ඤාණයක් වේද. මෙය විඤ්ඤාණ ස්කන්ධ යයි කියනු ලැබේ. මහණෙනි, මෙය පංචස්කන්ධ යයි කියනු ලැබේ. මහණෙනි, පංච උපාදානස්කන්ධය කවරේද? මහණෙනි, යම්කිසි රූපයක්.......සමීප වූ හෝ ආසව සහිතව දැඩිව ගනීද මහණෙනි, මෙය රූපඋපාදානස්කන්ධයයි. යම්කිසි වේදනාවක්........යම්කිසි සමීප වූ හෝ විඤ්ඤාණයක් ආසව සහිතව දැඩිව ගනීද මහණෙනි, මෙය විඤ්ඤාණ උපාදානස්කන්ධයයි. මහණෙනි, මෙය පංචඋපාදානස්කන්ධයයි. මෙහි වේදනාදියෙහි අනාශ්‍රවද ආශ්‍රවද ඇත. මෙසේ රූපය නොවේ. රාශි අර්ථයෙන් ස්කන්ධභාවය යෙදේද? එහෙයින් ස්කන්ධවල කියන ලදී. රාශි අර්ථයෙන් ආශ්‍රව අර්ථයෙන් උපාදානස්කන්ධභාවය යෙදේද? එහෙයින් උපාදානස්කන්ධවල කියන ලදී. වේදනාදිය අනාශ්‍රවම ස්කන්ධවල කියන ලදී. උපාදානස්කන්ධවල ආශ්‍රව සහිතව කියන ලදී. උපාදානස්කන්ධ යන මෙහි දැඩිව ගැනීමට ගොදුරුවන ස්කන්ධ උපාදානස්කන්ධ යයි දතයුතුය. මෙහි සියල්ල එක්තැනක කොට ඛන්ධයයි අදහස් කෙරේ.

අනූනාධිකතො නොඅඩුව නොවැඩිව ස්කන්ධ පසක්ම භාග්‍යවතුන් වහන්සේ විසින් කුමක් හෙයින් දේශනා කරන ලදද? සියළු ස්වභාවය එක් සංග්‍රහයක් වශයෙන් තම තමාට අයත් කරගත් වස්තු අවසන් කොට ඇති හෙයින් අන්‍යන්ට ද එය අවහිරවීමෙන් නොයෙක් ප්‍රභේද වූ සංඛත ධර්මවල සමාන පැවතුම් ඇති ඒවා සංග්‍රහ කරනු ලබන කල්හි රූපය, රූප සමාන පැවතුම් ඇති සංග්‍රහය වශයෙන් එක් ස්කන්ධයක් වේ. වේදනාව සමාන පැවතුම් ඇති සංග්‍රහය වශයෙන් එක් ස්කන්ධයක් වේ. සංඥාදියද මෙම නයයි. එහෙයින් සමාන පැවතුම් ඇති සියළු සංඛත ධර්මවල සංග්‍රහය වශයෙන් පහක්ම කියන ලදී. "මහණෙනි, රූපය ඇතිකල්හි රූපයට පිවිස (අභිනිවේශව) මෙවැනි දෘෂ්ටියක් ඇතිවේ. මෙය මමය. මෙය මම වෙමි. මෙය මගේ ආත්මයයි යනුවෙනි. වේදනා-සඤ්ඤා-සංඛාර-විඤ්ඤාණ ඇතිකල්හිද විඤ්ඤාණය දැඩිව ගෙන විඤ්ඤාණයට පිවිස මෙවැනි දෘෂ්ටියක් උපදී. මෙය මමය. මෙය මම වෙමි. මෙය මගේ ආත්මයයි. මෙසේ තමා තමාට අයත්කොට ගන්නා වස්තු අවසන්කොට ඇත්තේ පහක්ම යයි කියන ලදී යයි මෙසේ අනූනාධික විනිස දතයුතුය.

උපමා වශයෙන් මෙහි ගිලන්හලක් උපමාකොට ඇත. ගිලාන සාලාව රූපස්කන්ධයට උපමා වේ. ගිලනා විඤ්ඤාණක්ඛන්ධයටද ගිලන්බව වේදනාස්කන්ධයටද ආබාධය සංඥාස්කන්ධයටද අසප්පාය සේවනාදිය සංස්කාරාස්කන්ධයටද ගිලන්බවට නිදානය වේදනාව වේ. වේදනාව වේදනාව පිණිසම අභිසංස්කරණය කරන ලදැයි කියන ලදී. එසේම අකුසල කර්ම කළබැවින් රැස්කළ බැවින් විපාක කාය විඤ්ඤාණය උපන්නේය. මෙසේ උපමා වශයෙන් විනිස නය දතයුතුය. සංක්ෂේප විස්තර වශයෙන් දෙයාකාරයකින් විනිස දැනගත යුතුය. පංචස්කන්ධය සංක්ෂේපයෙන් ආසිවිසෝපම සූත්‍රයේ කී අයුරින් හැරදමන ලද නාගයා සතුරකු කරන ලදී. භාර සූත්‍රයේ බරක් වශයෙනි. කෑයුතු දේ ඇතුළත් නිසා කන්නෙකු වශයෙන්ද යමක සූත්‍රයට අනුව අනිත්‍ය දුක්ඛ අනාත්ම සංඛ්‍යාත වධකයකු වශයෙන්ද දැකිය යුතුය. විස්තර වශයෙන් රූපය පෙනපිඬක් මෙන් වේදනාව දිය බුබුලක් මෙන් සඤ්ඤාව මිරිඟුවක් මෙන් සංඛාර කෙසෙල්කඳක් මෙන් විඤ්ඤාණය මායාමක් මෙන් දැකිය යුතුය. මෙය කියනලදී :-

පෙණ පිඬකි රූපය - විඳුම දියබුබුලක් වේ
සන් මිරිඟු උවමයි - සකර රඹකඳ උපමා
මායාවකි විනැණ - දෙසූ බුදුහිමි විසිනා

එහි රූපාදිය පෙණපිඬු ආදිය සමග සමානවන අයුරු මෙසේ දතයුතුය. පෙණපිඬ නිසරුමය. රූපයද නිත්‍ය ස්ථිර ආත්මවලින් බැහැරවන නිසා නිසරුමය. පාත්‍රයක් හෝ තැටියක් හෝ සඳහා ගැනීමට නොහැකිය. ගත්තම එම ප්‍රයෝජනය නොලබයි. එය බිඳෙයි. මෙසේ රූපය නිත්‍ය යයි හෝ ස්ථිරයයි හෝ මම යයි හෝ මගේ යයි හෝ ගැනීමට නොහැක. ගත්තේ වීනමුත් එසේ නොසිටී. අනිත්‍ය දුක්ඛ අනාත්ම අසුභම වේ. මෙසේ පෙණපිඬට සමාන වේමය. පෙණපිඬ සිදුරු කුඩා සිදුරුවලින් යුත් නොයෙක් සන්ධිවලින් ගැටුණු බොහෝ ජල සර්පාදීන්ට නිවාසයකි. රූපයද එසේ සිදුරු කුඩා සිදුරුවලින් යුත් නොයෙක් සන්ධිවලින් ගැටුණු කුල වශයෙන් මෙහි අසූ පණුකුල වෙසෙති. එසේම ඒවා තිඹිරි ගෙයක්ද වැසිකිළියක්ද ගිලන්හලක්ද සොහොනක්ද වේ. ඔව්හු අන්තැනක නොගොස් දරුවන් බිහිකිරීම් ආදිය කරති. මෙසේද පෙණපිඬකට සමානය. පෙණපිඬ මුලින් මසන් ගෙඩියක් පමණ වී අනුපිළිවෙලින් පර්වත ශිඛරයක් පමණ වේ. රූපයද මුලින් කලලය පමණක්වී අනුපිළිවෙලින් බඹයක් පමණ ද ගව මහිස ඇත් ආදීන්ගේ වශයෙන් පර්වත ශිඛර පමණ ද වේ.

මස් කැසුබු ආදීන්ගේ වශයෙන් නොයෙක් යොදුන් සියගණන් වේ. මෙසේද පෙණපිඬට සමානය. පෙණපිඬ නැගි සැනින් බිඳේ. ටික දුරක් ගොස් හෝ මුහුදට වැටී හෝ අවශ්‍යයෙන්ම බිඳේ. රූපය ද මෙසේම කලල අවස්ථාවේ ද බිඳේ. අර්බුද අවස්ථාවේද බිඳේ. අතරතුර නොබිඳුණොත් සියක් අවුරුදු ආයු ඇත්තාට අවුරුදු සියයට පැමිණ හෝ අවශ්‍යයෙන්ම බිඳේ. මරණ මුඛයෙහි සුණු විසුණු වේ. මෙසේද පෙණපිඬට සමානය. දියබුබුල අසාර මෙන් වේදනාවද අසාරය. එය දුර්වලය. ගැනීමට නොහැක. නිත්‍ය හෝ සදාකාලික යයි ගත නොහැක. ගත්තද නොසිටී. ඒ ඒ දියබුබුළුවලින් බුබුළු ඉපදී නිරුද්ධ වේ. ස්ථිර පැවතීමක් නැත. එක් අසුරු සැණයක කෝටි ලක්ෂ සංඛ්‍යාත ඉපදී නිරුද්ධ වේ. දියබුබුල දියතලය දියබිඳුව දියජල්ලිය ඇදගෙන ගොටුවක් කරන වාතය යන කරුණු සතරින් උපදී. මෙසේ වේදනාව වස්තුව අරමුණ කෙලෙස්දැල ස්පර්ශ-ගැටුම යන කරුණු සතරක් නිසා උපදී. සඤ්ඤාව අසාර අර්ථයෙන් මිරිඟුව හා සමානය. ගත නොහැකි යන අර්ථයෙන් ද එය ගෙන බීමට නෑමට හා භාජන පුරවා ගැනීමට නොහැකිය. මිරිඟුව සැලෙන නිසා හටගත් රැළි වේගයක් සේ හැඟේ. නීල සඤ්ඤාදි භේදද මෙසේය. නීලාදි සඤ්ඤා අනුභවන අර්ථයෙන් සැලේ. මිරිඟුව පිරුණු වැවක් පිරුණු නදියක් මෙන් මහජනයා රවටයි. මෙසේ සඤ්ඤාව ද මෙය නිල්ය සුබය නිත්‍යය යයි කියවයි. කහවර්ණ ආදියෙහිද මෙසේය.

සංස්කාරයද අසාර අර්ථයෙන් කෙසෙල්කඳක් හා සමානය. කෙසෙල් කඳින් කිසිවක් ගෙන ගොනැස් ආදී ප්‍රයෝජනයට ගතහැකි නොවේ. ගත්තත් එසේ කළහැකි නොවේ. එසේම සංස්කාරාදිය නිත්‍ය වශයෙන් ගැනීමට නොහැකිය. ගත්තද එසේ නොවේ. කෙසෙල්කඳ බොහෝ පතුරුවලින් යුක්තය. එසේම සංස්කාර ස්කන්ධය බොහෝ ධර්මවලින් යුක්තය. කෙසෙල් නොයෙක් ලක්ෂණවලින් යුක්තය. බාහිර වර්ණය අභ්‍යන්තර වර්ණයෙන් වෙනස් වේ. එසේම සංස්කාර ස්කන්ධය ද ස්පර්ශ ලක්ෂණය අනිකකි. වේදනාදිය අනිකකි. සමූහ වශයෙන් එකතුකර සංස්කාර ස්කන්ධයයි කියනු ලැබේ. විඤ්ඤාණය අසාරය යන අර්ථයෙන් මායාවකට සමානය. ගතනොහැකි අර්ථයෙන්ද එසේය. මායාව ස්වල්ප සුළු වැටහීමකි. විඤ්ඤාණයද එසේය. එය එයින්ද ස්වල්පතම ලුහුතර වැටහීමකි. ඒ සිතින්ම මිනිසෙක් ආවා මෙන් ගියා මෙන් සිටියා මෙන් හිඳගත්තා මෙන් වේ. අනිත් කෙනෙකු පැමිණෙන කල සිත අන් ගමන කාලාදියෙහි වේ. මායාවද මහජනයා වංචා කරයි. යම් කිසිවක්ම මෙය රත්රන්ය,

මෙය රිදීය මෙය මුතුය කියා පෙන්වයි. විඤ්ඤාණයද මහජනයා රවටයි. ඒ සිතින්ම එනවා මෙන් යනවා මෙන් සිටිනවා මෙන් හිඳිනවා මෙන් පෙන්වයි. සුභ අරමුණද ඕලාරික වූ අජ්ඣත්තික රූපය අසුභ යයි දතයුතුය. වේදනාව තුන් දුකින් නොමිදුනේය. සඤ්ඤා සංඛාර අකීකරු බැවින් ආත්ම නොවේ. විඤ්ඤාණය උදය ව්‍යය වශයෙන් අනිත්‍ය යයි දතයුතුය. මෙසේ බලන්නහුට අර්ථ සිද්ධිය වේ. මෙසේ සංක්ෂේප විස්තර වශයෙන් බැලීමෙන් ප්‍රයෝජනයක් වන නිසා විනිස දතයුතුය. කෙසේද? සංක්ෂේපයෙන් පංචඋපාදානස්කන්ධය හැරදැමූ නයා සතුරකු සේ දකින්නා ස්කන්ධවලින් නොවෙහෙසේ. විස්තර වශයෙන් රූපාදිය පෙණපිඬට සමානයයි දකින්නා අසාරයෙහි සරුසේ නොදකියි. අධ්‍යාත්මික රූප අසුභ වශයෙන් බලන්නේ කබලිංකාර ආහාරය විශේෂයෙන් දැනගනී. අසුභයෙහි සුභය යන විපර්යාසය දුරුකරයි. කාම සැඩපහරින් එතෙර වෙයි. කාමයෝගයෙන් වෙන්වෙයි. කාමාශ්‍රවයන්ගෙන් මිදේ. දැඩි ලෝභ කායික ගැටගැසීම බිඳියි. කාම උපාදානය නොගනී. වේදනාව දුක් වශයෙන් බලන්නේ ස්පර්ශ ආහාරය විශේෂයෙන් දැනගනී. අනාත්මයෙහි ආත්ම වශයෙන් හා දුකෙහි සැප වශයෙන් දැකීම දුරුකරයි. භව සැඩපහරින් එතෙර වේ. භව යෝගය වෙන්කරයි. භවආශ්‍රවයන් නැතිකරයි. ව්‍යාපාද කාය ග්‍රන්ථය බිඳියි. සීල ව්‍රත උපාදානය නොගනියි. සඤ්ඤාව හා සංඛාරය අනාත්ම වශයෙන් දකින්නා මනෝසංචේතනා ආහාරය විශේෂයෙන් දකියි. අනාත්මයෙහි ආත්ම දෘෂ්ටිය අත්හරියි. දෘෂ්ටි ඕඝය තරණය කරයි. දෘෂ්ටි යෝගයෙන් වෙන් වේ. දෘෂ්ටි ආශ්‍රවය දුරුකරයි. මෙය සත්‍යයයි යන කාය ග්‍රන්ථය අත්හරියි. ආත්මවාද උපාදානයෙන් බැහැර වේ. විඤ්ඤාණය අනිත්‍ය වශයෙන් බලන්නා විඤ්ඤාණ ආහාරය විශේෂයෙන් දැනගනී. අනිත්‍යයෙහි නිත්‍ය යන විපර්යාශය දුරුකරයි. අවිද්‍යා ඕඝයෙන් එතෙර වේ. අවිද්‍යා යෝගයෙන් වෙන් වේ. අවිද්‍යා ආශ්‍රවයෙන් අනාශ්‍රව වේ. සීලව්‍රත කාය ග්‍රන්ථ අත්හරියි. දෘෂ්ටි උපාදානයෙන් බැහැර වේ.

මහ අනුසස්ම වේ - බැලියැකි වදක විලසින්
කඳු වදකයන් සේ - නුවණැතියා දකින්නේ

සූත්‍රාන්ත භාජනියයි.

දැන් අභිධර්ම භාජනීය වේ. එහි රූප ස්කන්ධ නිර්දේශය යට රූප කාණ්ඩයෙහි විස්තර කළ ආකාරයෙන් දතයුතුය. වේදනා ස්කන්ධ නිර්දේශයෙහි එකවිධෙන එක් ආකාරයකින් ඵස්ස සම්පයුත්තොති ස්පර්ශයෙන් යුක්ත වූ සියළු චතුභූමක වේදනා සහේතුක දුකයෙහි සහේතුක චතුභූමක වේදනා අහේතුක කාමාවචර කුසලාදියෙන් කියන ලද වේදනා මේ උපායෙන් දතයුතුය. තවද මේ වේදනා ස්කන්ධය එක් ආකාරයකින් ස්පර්ශය හා යුක්තවූයේ යයි දක්වන ලදී. සහේතුක අහේතුක වශයෙන් දෙයාකාරයකින් ජාති වශයෙන් තුන් ආකාරයකින් අන්තර්භූමි වශයෙන් සතරාකාරයකින් ඉන්‍ද්‍රිය වශයෙන් පස් ආකාරයකින් වේ. එහි සුඛ දුක්ඛ ඉන්‍ද්‍රිය කාය ප්‍රසාද වස්තු කාමාවචරය. සෝමනස් ඉන්‍ද්‍රිය සවැනි වූ වස්තුව හෝ අවස්තුව හෝ ත්‍රෛභූමිකය. දෝමනස් ඉන්‍ද්‍රිය සවැනි වස්තුව හා අවස්තුවද සිව්භූමකය. වස්තු වශයෙන් සයාකාරකින් දක්වන ලදී. එහි පෙර පංච වේදනා පංච ප්‍රසාද වස්තු කාමාවචරය. එහි මනෝ සම්ඵස්සජ භේදයෙන් සත් ආකාරයකින් දක්වන ලදී. කාය සම්ඵස්සජ භේදයෙන් අට ආකාරයකින් දක්වන ලදී. සත්තවිධ භේදයෙහි මනෝ විඤ්ඤාණධාතු සම්ඵස්සජ භේදයෙන් නව ආකාරයකින් දක්වන ලදී. අටවිධි භේදයෙහි මනෝ විඤ්ඤාණධාතු භේදයෙන් දස ආකාරයකින් දක්වන ලදී. මේ සප්තවිධ භේදයෙහි මනෝ සම්ඵස්සජා, මනෝධාතු සම්ඵස්සජා, මනෝ විඤ්ඤාණධාතු සම්ඵස්සජා යයි තුන් ආකාරයකින් බිඳුනේය. අෂ්ටවිධ භේදයෙහි ඒවා සමග කාය සම්ඵස්සජයද සැප දුක් වශයෙන් දෙයාකාරයකට බිඳුනේය. නවවිධ හා සප්තවිධ භේදයෙහි කියනලද මනෝ විඤ්ඤාණධාතු ස්පර්ශයෙන් උපන් වේදනාව කුසලාදි වශයෙන් තුන් ආකාරයකට බිඳුනේය. දසවිධ අටවිධ භේදවල කියනලද මනෝ විඤ්ඤාණධාතු ස්පර්ශයෙන් උපන් වේදනාව කුසලාදී වශයෙන්ම තුන් ආකාරයකට බිඳුනේය. මෙහි කුසලත්‍රිකය පූර්ණ අර්ථයෙන්ම කියන ලදී. හත අට නවය ආකාර භේදවල න්‍යාය දීමට සුදුසු තැන්වල න්‍යාය දෙන ලදී. අභිධර්මයට පැමිණි තථාගතයන් වහන්සේ න්‍යාය දියයුතු තැන්වල න්‍යාය නුදුන්නේ නොවෙති. මෙය දුක මූලයෙහි ඒකවාරයයි. මේ අභිධර්ම භාජනීයෙහි වේදනා ස්කන්ධය බෙදන බුදුහු ත්‍රිකය ගෙන දුකයෙහි තැබූහ. දුකය ගෙන ත්‍රිකයෙහි බැහූහ. ත්‍රිකයෙහිද දුකයෙහිද දෙකම වැඩෙන ආකාරයෙන් ගෙනහැර දැක්වූහ. සත් ආකාරයකින් සූවිසි ආකාරයකින් තිස් ආකාරයකින් බොහෝ ආකාරයකින් යයි සියළුම ආකාරවලින් වේදනා ස්කන්ධය දෙසූහ. කුමක් හෙයින්ද? පුද්ගල අදහසින් හා දේශනා විලාසය වශයෙනි.

ධර්මශ්‍රවණය කළ දෙව්පිරිසෙහි ඇතැම් දෙව්පුත් කෙනෙක් ත්‍රිකය ගෙන දුකයෙහි බහා කියන්නේ අවබෝධ කිරීමට හැකිවෙති. ඔවුන්ගේ සත්පාය වශයෙන් එසේ දෙසූහ. යමෙක් අනිත් ආකාරයෙන් කියනු ලබන්නේ අවබෝධ කිරීමට හැකිවෙති. ඔවුන්ට තුන් ආකාරයකින් දේශනා කළහ. මෙය මෙහි පුද්ගල අධ්‍යාශයෙනි. බුදුන් වහන්සේගේ මහා විෂයපථය නිසා ත්‍රිකය දුකෙහි බහා දුකය ත්‍රිකයෙහි බහා දෙකම වැඩීමෙන් හෝ සප්තවිධ නයින් හෝ යම්සේ කැමති වේද එසේ දේශනා කිරීමට හැකිවෙති. ඒ නිසා මේ ආකාරයෙන් දේශනා කරති. මෙය දේශනා විලාසයයි. එහි ත්‍රිකය ගෙන දුකයෙහි බහා කළ දේසනාවාරය තිකමූලක නම් වේ. දුකය ගෙන තිකයෙහි බහා කළ දේසනාවාරය දුකමූලක නම් වේ. දුකයද තිකයද දෙකම වඩා කළ දේසනාවාරය උභතෝවර්ධිත නම් වේ. සප්තවිධාදිවාර බහුවිධවාර නම් වේ. මේ එතෙක් සතර මහා වාරයයි. එහි දුක මූලකයෙහි දුකයෙහි ලැබෙමින් එකිනෙක දුකය සමග තිකයෙහි නොලැබෙන වේදනා තික පීති තික සනිදස්සන තික ඉවත්කොට එකුන්විසි තිකයෙහි යොදා දෙවැනි දුක පළමුවැනි තික යෝජනා වාරාදිය නවසිය පනස්වාරයක් වේ. ඒ සියල්ල පෙලෙහි සංක්ෂේප කොට ඒ ඒ දැක්විය යුත්ත දක්වා කියන ලදී. මුළා නොවන්නහු විසින් විස්තර වශයෙන් දතයුතුය. තිකමූලකයෙහිද තිකයෙහි ලැබෙන එක එක තිකය සමග දුකයෙහි ලැබෙන පළමු දුකාදි දුක හැර සෙසු ලැබෙන සහේතුක දුකාදිය පනස් දුකයෙහි යොදා පළමු තික දෙවන දුක යෝජනා වාරාදිය වාර නවසිය පනහක් වේ. ඒ සියල්ල පෙලෙහි සංක්ෂේප කොට ඒ ඒ දැක්විය යුත්තෙහි දක්වා කියන ලදී. මුළා නොවන්නහු විසින් විස්තර වශයෙන් දතයුතුය. උභය වර්ධනයෙහි ද්විධ භේදයෙහි දෙවන දුකයද ත්‍රිවිධ භේදයෙහි ද පළමු තික ආදිකොට ලැබෙන එකුන්විසි දුකින් ලැබෙන එකුන්විසි තිකයෙහි යොදා දුතිය දුක පඨම තික යෝජනාවාරාදිය එකුන්විසි වාරය කියන ලදී. මේ දුක තික වශයෙන් උභය වශයෙන් වර්ධනය කළ බැවින් උභය වර්ධිත නම් තුන්වන මහා වාරයයි. බහුවිධ වාරයේ සප්තාකාර නිර්දේශයෙහි මුලපටන් ලැබෙන එකුන්විසි තිකයෙහි එක එක සමග සතර භූමියක් යොදා එකුන්විසි සප්තාකාර වාර කියන ලදී. සිව්විසිවන නිර්දේසයෙහිද ඒ තික වශයෙන්ම එකුන්විසි වාර කියන ලදී. බහුවිධ වාරයෙහිද එසේය. තිස් ආකාර වාරය එකමයයි සියල්ල අටපනස් වාරයක් වේ. මෙය මෙහි වාර වෙන්කිරීම් වශයෙන් පෙල වර්ණනාවයි.

දැන් අර්ථ වර්ණනා වේ. එහි සප්තවිධ නිද්දේසය සරලය. සූවිසිවිධ නිද්දේසයෙහි චක්ඛුසම්ඵස්ස ප්‍රත්‍යයෙන් වේදනා ස්කන්ධය - අත්ථි

**කුසලොති** කාමාවචර කුසල් සිත් අට වශයෙන් දතයුතුය. **අත්ථි අකුසලො** අකුසල් සිත් දොලොස වශයෙන් දතයුතුය. **අත්ථි අව්‍යාකතො** මනෝධාතු තුන අහේතුක මනෝ විඤ්ඤාණධාතු තුන මහා විපාක සිත් අට කාමාවචර කිරිය සිත් දහය යයි සූවිසි සිත් වශයෙන් දතයුතුය. එහි කුසල් අට අකුසල් දොලහ ද ජවන වශයෙන් ලැබේ. කිරිය මනෝධාතු ආවර්ජන වශයෙන් ලැබේ. මනෝධාතු විපාක දෙක පිළිගැනීම් වශයෙන් ලැබේ. මනෝ විඤ්ඤාණධාතු විපාක තුන සන්තීරණ තදාරම්මණ වශයෙන් ලැබේ. අහේතුක කිරිය මනෝ විඤ්ඤාණධාතු වොත්ථපන වශයෙන් ලැබේ. මහා විපාක සිත් අට තදාරම්මණ වශයෙන් ලැබේ. කිරිය සිත් නවය ජවන වශයෙන් ලැබේ. සෝත ඝාණ ජිව්හා කාය ද්වාරවලද මෙම නයමයි. මනෝ ද්වාරයෙහි වනාහි **අත්ථි කුසලො** චතුභූමක කුසල් වශයෙන් කියන ලදී. **අත්ථි අකුසලො** අකුසල් සිත් දොලහ වශයෙන් **අත්ථි අව්‍යාකතො** කාමාවචර විපාක සිත් එකොලහ කිරිය සිත් දහය රූපාවචර අරූපාවචර කිරිය සිත් නවය සාමඤ්ඤඵල සතර යයි සූතිස් චිත්තුප්පාද වශයෙන් කියන ලදී.

එහි චතුභූමක කුසලද අකුසලද ජවන වශයෙන් ලැබේ. කිරියවලින් අහේතුක මනෝවිඤ්ඤාණධාතු ආවර්ජන වශයෙන් විපාක සිත් එකොලහ තදාරම්මණ වශයෙන් ත්‍රෛභූමක කිරියද සාමඤ්ඤඵලද (සෝවාන් ආදී) ජවන වශයෙන් ලැබේ. ඒ සප්තාකාරාදියෙහි යම්කිසි තැනක සිට කීමට වටී. තිස් ආකාරයෙහි සිට විස්තර කරන්නේ සුවසේ දැක්වීම වේයයි තිස් ආකාරයෙහි සිටම දැක්වූහ. මේ සියළුම සිත් චක්ෂුද්වාරයෙහි උපනිශ්‍රය කෙළවරින් සමතික්‍රම වශයෙන් භාවනා වශයෙන් තුන් ආකාරයකින් ලැබේ. සෝතද්වාර මනෝද්වාරයෙහිද එසේය. ඝාන ජිව්හා කාය ද්වාරවල සමතික්‍රමණ භාවනා වශයෙන් දෙආකාරයකින් ලැබේයයි දතයුතුය. මෙහි භික්ෂුව විහාර චාරිකාවේ යෙදෙන්නේ කසිණ මණ්ඩලය දැක මෙය කුමක්දැයි අසා කසිණ මණ්ඩලයයි කීකල්හි මෙයින් කුමක් කෙරේදැයි අසයි. ඉක්බිති ඔහුට මෙසේ කියයි. මෙය වඩා ධ්‍යාන උපදවා සමාපත්ති පදනම් කරගෙන විදර්ශනා වඩා රහත්බවට පැමිණිය හැකිය. ඊට අදහස් ඇති කුලපුත්‍රයා මෙය බැරෑරුම් කොට නොසලකා මා විසින්ද මෙබඳු ගුණ උපදවන්නට වටීයයි වැදහෙව නිදාගන්නාට මෙය නොහැකියයි මුලින් වීර්ය කරන්නේ සීලය පිරිසිඳු කරන්නට වටී යයි සිතා සීලය පිරිසිඳු කොට සීලයෙහි පිහිටා පළිබෝධ දහය අත්හැර තුන් සිවුරෙන් පමණක් සන්තෝෂයෙන් සතුටුව ආචාර්ය උපාධ්‍යායන්ගේ වත්පිළිවෙත් කොට

කමටහන් උගෙන කසිණ පරිකර්මකොට සමාපත්ති උපදවා සමාපත්ති පදනම්කර විදර්ශනා වඩා රහත්බවට පැමිණේ. එහි සියළු පරිකර්ම වේදනා කාමාවචරය. අෂ්ට සමාපත්ති වේදනා රූපාවචර සහ අරූපාවචරය. මාර්ගඵල වේදනා ලෝකෝත්තරය. මෙසේ චක්ඛු විඤ්ඤාණය චතුභූමක වේදනා ඉපදවීමෙන් බලවත් ප්‍රත්‍ය උපනිශ්‍රය වශයෙන් ලැබේ. චක්ඛු ද්වාරයට රූපය පැමිණි කල්හි ඉෂ්ට අරමුණෙහි රාගයද අනිෂ්ට අරමුණෙහි ද්වේෂයද විසමව බැලීමෙන් මෝහයද බැඳීමෙන් මානයද උපදී. සිතින් දැඩිසේ ගැනීමෙන් දෘෂ්ටියද වික්ෂේපයට පැමිණීමෙන් උද්ධච්චයද තීරණය නොකිරීමෙන් විචිකිච්චාවද වීර්යගතියේ අනුශයද උපදී. විමසීමේ සිටි කුලපුත්‍රයා තමාගේ කෙලෙස් උපන්බව දැන මගේ මේ කෙලෙසුන් වැඩෙන්නේ ව්‍යසනය පිණිස පවතින්නේය. එසේ නම් ඔවුන්ට නිග්‍රහ කරමි. වැතිරී නිදාගෙන කෙලෙසුන්ට නිග්‍රහ කළ නොහැකි යයි සිතා මුලින්ම වීර්ය කිරීම වටීයයි සීලය පිරිසිදු කළයුතුය යනාදී යට කී ආකාරයෙන් පිළිපැද රහත්බවට පැමිණේ.

එහි සියළු පරිකර්ම වේදනා කාමාවචරය. අෂ්ට සමාපත්ති වේදනා රූපාවචර හා අරූපාවචරය. මාර්ගඵල වේදනා ලෝකෝත්තර යයි මෙසේ රූපරම්මණයෙහි උපන් කෙලෙස් සමතික්‍රමණය කොට ගිය චතුභූමක වේදනා චක්ඛුසම්ඵස්ස ප්‍රත්‍ය නම් වේ. මෙසේ සමතික්‍රමණය වශයෙන් ලැබේ. චක්ෂුද්වාරයෙහි රූපය ආපාථගත වූ විට කෙනෙක් මෙසේ විමසීම පිහිටුවති. මේ රූපය කුමක් නිශ්‍රය කෙරේද? ඉක්බිති එය භූත නිශ්‍රිත යයි දැන සතරමහා භූත දැඩි සේ ගත් රූපයද රූපය යයි පරීක්ෂා කරයි. තදාරම්මණ ධර්මයෙහි අරූපයයි පරීක්ෂා කරයි. ඉක්බිති රූපය ප්‍රත්‍ය සහිතයයි පරීක්ෂා කොට ත්‍රිලක්ෂණ නගා විදර්ශනා පිළිවෙළින් සංස්කාරයන් විමසා බලා රහත්බවට පැමිණේ. එහි සියළු පරිකර්ම වේදනා කාමාවචරය. අෂ්ට සමාපත්ති වේදනා රූපාවචර අරූපාවචරය. මාර්ගඵල වේදනා ලෝකෝත්තර යයි මෙසේ රූප අරමුණ විමසා නිපන්නේය යන මේ වේදනාව චක්ඛුසම්ඵස්ස ප්‍රත්‍ය නම් වේ. මෙසේ භාවනා වශයෙන් ලැබේ. කසිණ පරිකර්ම කොට සමාපත්ති උපදවා සමවත් පදනමේ විදසුන් වඩා රහත්බවට පැමිණියේ යයි වෙනත් භික්ෂු නමක් අසයි. ඊට අදහස් ඇති කුලපුත්‍රයෙක් මෙය බැරෑරුම් යයි නොසලකා අප විසින්ද මෙබඳු ගුණ ඉපදවීම වටී යයි පෙරකී ක්‍රමයෙන් පිළිපැද රහත්බවට පැමිණේ. එහි සියළු පරිකර්ම වේදනා කාමාවචරය. අෂ්ට සමාපත්ති වේදනා රූපාවචර අරූපාවචරය. මාර්ගඵල ලෝකෝත්තර යයි මෙසේ සෝත විඤ්ඤාණය

චතුභූමක වේදනා නිපදවීමට බලවත් ප්‍රත්‍ය වේයයි චතුභූමික වේදනා සෝතසම්ඵස්ස ප්‍රත්‍ය නම් වේ. මෙසේ සමතික්‍රමණ වශයෙන් ලැබේ. සෝතද්වාරයට ශබ්දය පැමිණි කල්හි කෙනෙක් මෙසේ විමසා බලති. මේ ශබ්දය කුමක් නිශ්‍රිතද? සියල්ල චක්‍ෂුද්වාරයේ කීලෙසින් දතයුතුය. මෙසේ ශබ්ද අරමුණ විමසා උපන් මෙම වේදනාව සෝතසම්ඵස්ස ප්‍රත්‍ය නම් විය. මෙසේ භාවනා වශයෙන් ලැබේ.

සාණ ජිව්හා කාය ද්වාරවල ගන්ධාරම්මණාදිය පැමිණි කල්හි මට ඉෂ්ට වූ අරමුණෙහි රාගය උපන්නේ යයි සියල්ල චක්‍ෂුද්වාරයෙහි කීනයින් දතයුතුය. මෙසේ ගන්ධාරම්මණ ආදියෙහි උපන් කෙලෙස් සමතික්‍රමණය කොට ගියේ යයි චතුභූමික වේදනාව සාණ ජිව්හා කාය සම්ඵස්ස ප්‍රත්‍ය නම් වේ. මෙය ද්වාරයෙහි සමතික්‍රමණ වශයෙන් ලැබේ. සාණ ද්වාරාදියෙහි ගන්ධාදිය පැමිණි කල්හි කෙනෙක් මෙසේ විමසා බලති. මේ ගන්ධය රසය ස්පර්ශය කුමක් නිශ්‍රිතද? සියල්ල චක්‍ෂුද්වාරයෙහි කීනයින් දතයුතුය. මෙසේ ගන්ධාදි අරමුණු විමසා නිපදුණු වේදනාව සාණ ජිව්හා කාය සම්ඵස්ස ප්‍රත්‍ය නම් වේ. මෙසේ භාවනා වශයෙන් ලැබේ. මනෝද්වාරයෙහි වනාහි තුන් ආකාරයෙන්ම ලැබේ. ඇතමෙක් ජාතිය (ඉපදීම) බිය වශයෙන් දකිති. ජරාව ව්‍යාධිය මරණය බිය වශයෙන් දකිති. බිය වශයෙන් දැක ජාති ජරා ව්‍යාධි මරණවලින් මිදීම වටී යයි සිතා වැතිරී නිදාගෙන ජාති ආදියෙන් මිදීමට නොහැකි යයි මුලින් වීර්‍ය කොට සීලය පිරිසිදු කිරීම වටී යයි සිතා චක්‍ෂුද්වාරයෙහි කීනයින් පිළිපැද රහත්බවට පැමිණේ. එහි සියළු පරිකර්ම වේදනා කාමාවචරය. අෂ්ට සමාපත්ති වේදනා රූපාවචර අරූපාවචරය. මාර්ගඵල වේදනා ලෝකෝත්තරය. මෙසේ ජාති ජරා ව්‍යාධි මරණ චතුභූමික වේදනා නිපදවීමට බලවත් ප්‍රත්‍ය වේයයි චතුභූමික වේදනා මනෝසම්ඵස්ස ප්‍රත්‍ය නම් වේ. මෙසේ උපනිශ්‍රය වශයෙන් ලැබේ. මනෝද්වාරයෙහි ධම්මාරම්මණය පැමිණිකල්හි සියල්ල චක්‍ෂුද්වාරයෙහි කීනයින් දතයුතුය. මෙසේ ධම්මාරම්මණයෙහි උපන් කෙලෙස් සමතික්‍රමණය කොට ගිය චතුභූමික වේදනා මනෝසම්ඵස්ස ප්‍රත්‍ය නම් වේ. මෙසේ සමතික්‍රමණ වශයෙන් ලැබේ. මනෝද්වාරයෙහි ධම්මාරම්මණය පැමිණි කල්හි කෙනෙක් මෙසේ විමසති. මේ ධම්මරම්මණය කුමක් නිශ්‍රිතද? වස්තු නිශ්‍රිතය. වස්තු කුමක් නිශ්‍රිතද? මහාභූත නිශ්‍රිත යයි සතරමහා භූත උපාදාය රූපයද රූපය යයි පරීක්‍ෂා කරති. තදාරම්මණ ධර්මයන් අරූපයයි පරීක්‍ෂා කරති. ඉක්බිතිව ප්‍රත්‍ය සහිත නාමරූප පරීක්‍ෂා කොට ත්‍රිලක්‍ෂණයට නගා

විදසුන් පිළිවෙළින් සංස්කාරයන් විමසා බලා රහත්බවට පැමිණේ. එහි සියළු පරිකර්ම වේදනා කාමාවචරය. අෂ්ට සමාපත්ති වේදනා රූපාවචර අරූපාවචරය. මාර්ගඵල වේදනා ලෝකෝත්තරය. මෙසේ ධම්මාරම්මණ විමසා තිපන් මෙම වේදනාව මනෝසම්ඵස්ස ප්‍රත්‍ය නම් වේ. මෙසේ භාවනා වශයෙන් ලැබේ. මේ සියල්ල සූවිසි අයුරු වූ වාර අවසානයෙහි චක්ඛුසම්ඵස්සජ වේදනා මනෝසම්ඵස්සජ වේදනා යයි වේදනා සය සය කියන ලදී. ඒවා සම්ප්‍රයුක්ත ප්‍රත්‍ය වශයෙන් කියන ලදී.

## වේදනා ස්කන්ධ නිර්දේශය

සංඥා ස්කන්ධ ආදියද මෙම උපායෙන් දතයුතුය. සංඥාස්කන්ධ නිද්දේසයේ ත්‍රිකයෙහි වේදනා ත්‍රික ප්‍රීති ත්‍රික ද ලැබේ. දුකයෙහි සුඛ සහගත වූ දුක ආදියද සංඛාර ඛන්ධ නිද්දේසයේ ඵස්සයද සංඛාර ස්කන්ධයට ඇතුළත් බැවින් ඵස්ස සම්ප්‍රයුක්ත යයි නොකියා චිත්ත සම්ප්‍රයුක්තයයි කියන ලදී. මෙහි දුකයෙහිද හේතු දුක ආදිය ලැබේ. ත්‍රිකය සංඥා ස්කන්ධය හා සමානය. විඥාන ස්කන්ධ නිර්දේශයෙහි චක්ඛු සම්ඵස්සජාදිභාවය නොකියා චක්ඛුවිඤ්ඤාණ ආදිය කියන ලදී. විඤ්ඤාණය මනෝසම්ඵස්සජ යයි නිර්දේශ කිරීමට නොහැකිය. මෙහි සෙස්ස සංඥා ස්කන්ධයෙහි කියන ලද්ද හා සමාන වේමය. මේ ස්කන්ධ තුනේ නිද්දේසයෙහිම වේදනා ස්කන්ධ නිද්දේසයෙහි අතිරේක වූ තික දුක ලැබුනේය. ඔවුන්ගේ වශයෙන් වාර ප්‍රභේදය දතයුතුය.

දැන් ප්‍රශ්න විචාරීම වේ. පංචස්කන්ධයන්ගේ කුසල් කීයද? අකුසල් කීයද? අව්‍යාකෘත කීයද? ආදී නයින් යමක් ලැබේද යමක් නොලැබේද ඒ සියල්ල විචාරා විසඳීමෙහි රූපස්කන්ධය අව්‍යාකෘත යයි යමක් ලැබේද එයම ඉදිරූහයි (දැක්වීයයි) දතයුතුය. යම් යම් ස්ථානවල එක් ස්කන්ධයකැයි හෝ ස්කන්ධ දෙකකැයි හෝ වෙන් නොකොට උපන්නේ වන්නේය. නූපන්නේ වන්නේය ආදි නයින් පෙලෙහි තබන ලදී. ඒ ඒ තැන පංචස්කන්ධ ගැනීම දතයුතුය. සෙසු ඒ ඒ ස්කන්ධයන්ගේ කුසලාදි විභාගය ධම්මසංගහ අටුවාවේ කියන ලද්දේමය. අරමුණු ත්‍රිකයෙහි වනාහි ස්කන්ධ පස්පනස් කාමාවචර ධර්මයන් අරබයා ඇලෙන්නාට ගැටෙන්නාට මුළාවන්නාට සංවර වන්නාට විමසන්නාට ප්‍රත්‍යවේක්ෂා කරන්නාට අල්ප අරමුණක් වේ. සත්විසි රූපාවචර අරූපාවචර ධර්මයන් අරබයා ඇලෙන්නාට

ගැටෙන්නාට මුළාවන්නාට සංවර වන්නාට විමසීම පිහිටුවන්නාට මහග්ගත අරමුණු මාර්ගඵල නිවන් ප්‍රත්‍යවේක්‍ෂා කරන්නාට අප්‍රමාණ අරමුණකි. ප්‍රඥප්තිය ප්‍රත්‍යවේක්‍ෂා කරන කාලයෙහි නොකිවහැකි අරමුණකි. එයම සෙඛඅසෙඛයින්ට මාර්ගය ප්‍රත්‍යවේක්‍ෂා කරන කාලයෙහි මාර්ග අරමුණු වේ. මාර්ග කාලයෙහි සහජාත හේතුවෙන් මාර්ග හේතුක වේ. මාර්ගය ගරුකොට ප්‍රත්‍යවේක්‍ෂා කාලයෙහි ආරම්මණ අධිපති මාර්ග අධිපති වේ. සඳදෙටු වනාහි සිත්දෙටු වඩන්නාට නොකිවයුතු අරමුණක් වේ. අතීත වූ ස්කන්ධ ධාතු ආයතන අරබයා ඇලෙන්නාට ගැටෙන්නාට මුළාවන්නාට සංවර වන්නාට විමසන්නාට අතීත අරමුණු වේ. අනාගතය අරබයා අනාගත අරමුණු වේ. වර්තමානය අරබයා වර්තමාන අරමුණු වේ. ප්‍රඥප්තිය හෝ නිවණ හෝ ප්‍රත්‍යවෙක්‍ෂා කරන්නාට නොකිවහැකි අරමුණු වේ. එසේම තමාගේ ස්කන්ධ ධාතු ආයතන අරබයා ඇලෙන්නා ගැටෙන්නාට මුළාවන්නාට සංවර වන්නාට විමසීම පිහිටුවන්නාට අධ්‍යාත්ම අරමුණක් වේ. අනුන්ගේ ස්කන්ධ ධාතු අරබයා මෙසේ පවත්වන්නාට බාහිර අරමුණක් වේ. ප්‍රඥප්ති නිර්වාණ ප්‍රත්‍යවේක්‍ෂා කාලයෙහිද බාහිර අරමුණක්ම වේ. කලෙක අධ්‍යාත්ම කලෙක බාහිර ධර්ම කෙරෙහි මෙසේ පවත්වන්නහුට අධ්‍යාත්ම බාහිර අරමුණක් වේ. ආකිඤ්චඤ්ඤායතන කාලයෙහි නොකිවහැකි අරමුණකැයි දතයුතුය. මෙසේ භාග්‍යවතුන් වහන්සේ මේ ඛන්ධ විභාගය සූත්‍රාන්ත භාජනීය වශයෙන් තිපරි වෘත්තයෙහි ගෙනහැර දක්වා බෙදා දැක්වූහ. තිපරි වෘත්තයෙහි එකම වෙන්කිරීමකි. රූපස්කන්ධය සියළු තන්හි කාමාවචරය. චතුභූමික වූ ස්කන්ධ සතර ලෞකික ලෝකෝත්තර මිශ්‍රව කියන ලදී.

**සම්මෝහ විනෝදනී නම් විභංග අර්ථ වර්ණනාවේ**
**පළමුවන ඛන්ධ විභංග නිද්දේසයයි.**

# 2
# ආයතන විභංගය

ඉන් අනතුරුව ආයතන විභංග නිද්දේසයෙහි **සූත්‍රාන්ත භාජනීය** දක්වන්නේ ද්වාදසායතනානි **චක්ඛායතනං රූපායතනං** ආදිය කීහ. එහි පාලි මුක්තකයෙහි නය විසින්:-

**අරුත් ලකුණු විසින් - සැකවින් විතර විසිනා**
**දැකගත යුතු එලෙස - විනිස දතයුතු මෙලෙසේ**

එහි විශේෂයෙන් **චක්ඛතීති** චක්ඛු රූපය ආශ්වාද කරයි ප්‍රකාශ කරයි යන අර්ථයයි. රූපයතීති රූපං වර්ණ විකාරයට පැමිණෙමින් හදවතට ගියබව ප්‍රකාශ කරතියි යන අර්ථයි. **සුණාතීති** සොතං ඇසීම සෝතයයි. **සප්පතීති** ගමන් කෙරේනුයි ශබ්ද වේ. ප්‍රකාශ කරයි යන අර්ථයයි ආඝ්‍රාණය කෙරේනුයි **ඝාණං**. ගඳ සුවඳ ගෙන දේ යනු **ගන්ධො**. තමාගේ වස්තු ප්‍රකාශ කරයි යන අර්ථයයි. ජීවිතය කැඳවයි යනු ජිව්හා ය. රස යනු එය තෘප්ත කිරීමයි. ආශ්වාද කෙරේ යන අර්ථයයි. පිළිකුල් වූ ආශ්‍රව ධර්මයන්ගේ පැමිණීම කාය වේ. ආය යනු ඉපදෙන පෙදෙසයි. ස්පර්ශ කෙරේනුයි ඵොට්ඨබ්බ. සිතානුයි මනො. තමාගේ ලක්‍ෂණ දරානුයි ධම්ම. අවිශේෂයෙන් ආයතනයෙන් ඉපදීම ඇතිකරන නිසා ඇතුළට පමුණුවන නිසා ආයතනයයි දතයුතුය. චක්‍ෂු රූපාදියෙහි ඒ ඒ ද්වාර අරමුණු වූ චිත්ත චෛතසික ධර්ම අනුභව කිරීම් ආදි කෘත්‍යයෙන් ආයතනයයි උපදී ගැටේ වෙහෙසේ යයි කියන ලද්දේ වෙයි. එය වනාහි එකතු වූ ධර්ම මෙයින් කෙරේනුයි විස්තර කෙරේනුයි කියන ලදී. මෙයද කෙළවරක් නැති සසරෙහි පවතින ඉතා පළල් වූ සසර දුක නවත්වන තුරු පමුණුවයි පවත්වයි කියන ලදී.

මේ සියළු දහම් ආයතනයෙන් ඉපදීම් ලබන හෙයින් ආයතනයට පමුණුවන හෙයින් ආයතන ආයතනයයි කියනු ලැබේ. තවද නිවාස ආකර එක්තැන් කිරීම හටගැනීම දේසය හේතුව යන අර්ථවලින්ද ආයතන දතයුතුය. එසේම ලෝකයෙහි ඊශ්වරායතනය වාසුදේවායතනය යන ආදියෙහි නිවාස ස්ථාන ආයතනයයි කියනු ලැබේ. සුවණ්ණායතන රත්නායතන ආදියෙහි ආකරයයි. සාසනයෙහි මනොරමෙ ආයතනෙ

සෙවන්ති නං විහංගමා ආදියෙහි ඒකරාශි වීම්ද දක්ඛිණාපථො ගුනනං ආයතනං ආදියෙහි ඉපදීමේ දේශයද තත්‍ර තත්‍රෙව සඤ්ඤී භබ්බතං පාපුණාති සති සති ආයතනෙ ආදියෙහි හේතුවද චක්‍ෂු ආදියෙහි ඒ ඒ ධර්ම වෙසෙයි ඒවාට අයත් වෘත්තියෙහි යෙදෙන නිසා චක්‍ෂු ආදිය ඒවායේ නිවාස ස්ථාන වේ. චක්‍ෂු ආදියෙහි ඒ ධර්ම ගැවසීගත් බැවින් නිශ්‍රය හා අරමුණු වූ බැවින් චක්‍ෂු ආදිය ඒවායේ ආකර වේ. චක්‍ෂු ආදිය ඒවායේ එකතුවන තැන එහි වස්තු අරමුණු වශයෙන් එකතුවීමෙන් චක්‍ෂු ආදිය ඒවායේ ඉපදෙන දේශයයි. එය නිශ්‍රය අරමුණු බැවින් එහිම ඉපදීමෙන් ද චක්‍ෂු ආදිය ඒවායේ හේතුව වේ. ඒවායේ අභාවයෙන් අභාවයට පත්වේයයි මෙසේ නිවාස ස්ථාන ආකර එක්කාසුවීම ඉපදීම් දේශය හේතුව යන අර්ථවලින් මේ ධර්මායතන ආයතනයයි කියනු ලැබේ. එසේ හෙයින් කියන ලද අර්ථයෙන් ඇස ද ඒ ආයතන ද චක්කායතන වේ. ධර්මය ද ඒ ආයතනය ද ධම්මායතන වේ. මෙසේ අර්ථ වශයෙන් විනිස දතයුතුය.

ලක්‍ෂණ වශයෙන්ද චක්‍ෂු ආදීන්ගේ මෙහි ලක්‍ෂණ දතයුතු වේ. ඒවායෙහි ලක්‍ෂණ යට රූප කාණ්ඩ නිද්දේසයෙහි කියන ලද නයින් දතයුතුය. තාවත්වතො යනු ඒ තාක් වීම් වශයෙන් මෙය කියන ලද්දේ වෙයි. චක්‍ෂු ආදියද ධර්මයෝමය. මෙසේ ඇතිකල්හි ධර්මායතනයයි නොකියා කවර හෙයින් ද්වාදසායතනයයි කියන ලදද? විඤ්ඤාණ කාය සය උප්පත්ති ද්වාර අරමුණු වෙන් කිරීම් වශයෙනි. මෙහි විඤ්ඤාණ කාය සයේ ද්වාර ආරම්මණ භාවයෙන් වෙන් කිරීම් වශයෙන් මෙන්ම බෙදීම් දොළහක් වේයයි කියන ලදී. චක්ඛු විඤ්ඤාණ වීථියට ඇතුළත් චක්ඛු ආයතනයම චක්ඛු උත්පත්ති ද්වාරයයි. රූපායතනයම ද්වාර අරමුණයි. සෙසු ඒවාද එසේය. සවැන්නේ භවාංග මනස සංඛ්‍යාත මනෝ ආයතනයෙහි ඒක දේසයක්ම උත්පත්ති ද්වාරය වේ. ධර්මායතන අරමුණු අසාධාරණ වේ. මෙසේ විඤ්ඤාණ ආයතන සය උත්පත්ති ද්වාර අරමුණු වෙන්වීමෙන් දොළහක් යයි කියන ලදී. කමතො යන මෙහිද පෙර කියන ලද උත්පත්ති ක්‍රමාදියෙහි දේශනා ක්‍රමයම යෙදේ. ආධ්‍යාත්ම ආයතනවල නිදර්ශන සහිත ගැටීම් සහිත විෂය බැවින් චක්ඛු ආයතනය ප්‍රකටයයි පළමුව දේශනා කරන ලදී. ඉක්බිතිව පෙන්විය නොහැකි ගැටීම් සහිත සෝතාදිය දේශනා කරන ලදී. නොහොත් දැකීමේ ඇසීමේ සෙටබව මුල්වීම හේතුකොටගෙන බොහෝ උපකාර වනබැවින් අජ්ඣත්ත චක්ඛු සොත ආයතන පළමුව දේශනා කරන ලදී. පසුව ඝාණ ආදී ආයතන තුන දේශනා කරන ලදී. ගෝචර විසය පහේ කෙළවර මනායතනයද

චක්ඛු ආදීන්ගේ ගොදුරු බැවින් ඒ ඒ අතර රූපාදි ආයතනද දේශනා කරන ලදී. තවද විඤ්ඤාණය උත්පත්ති හේතු නියමයෙන්ද එසේ දේශනා කරන ලදී. මෙය ඒවායෙහි ක්‍රමයයි දතයුතුයයි කියන ලදී. ඇසද රූපයද නිසා චක්ඛු විඤ්ඤාණය උපදී. මනසද දහමද නිසා මනෝ විඤ්ඤාණය උපදීයයි මෙසේ ක්‍රම වශයෙන් මෙහි විනිස දතයුතුය.

සංක්‍ෂෙපයෙන් මනායතනයද ධම්මායතනයෙන් එක් කොටසක්ද නාමයෙන් හා සෙසු ආයතන රූපයෙන් යුක්ත බැවින් දොලොස් ආයතන ද නාමරූප පමණක් වේ. විස්තර වශයෙන් අධ්‍යාත්මික චක්ඛු ආයතනය ජාති වශයෙන් චක්‍ෂු ප්‍රසාද මාත්‍රයම වේ. ප්‍රත්‍යය ගති නිකාය පුද්ගල බෙදීම් වශයෙන් අනන්ත ප්‍රභේද ඇත. සෝත ආයතනාදි සතරෙහිද එසේය. මනායතනය ත්‍රෛභූමක කුසල අකුසල විපාක කිරිය විඤ්ඤාණ වශයෙන් අසූඑකක් භේද ඇත. වස්තු ප්‍රතිපදාදි අනන්ත භේද වේ. රූප ගන්ධ රස ආයතන හටගැනීමේ භේද සතරක් වේ. සද්දායතනය භේද දෙකකි. සභාග විසභාග භේදයෙන් සියල්ල අනන්ත භේද වේ. ඵොට්ඨබ්බ ආයතනය පඨවි තේජෝ වායෝ ධාතු වශයෙන් බෙදීම් තුනක් වේ. හටගැනීම් වශයෙන් බෙදීම් සතරක් වේ. සභාග විසභාග වශයෙන් බෙදීම් අනන්ත වේ. ධම්මායතනය ත්‍රෛභූමක ධර්ම අරමුණු වශයෙන් නොයෙක් බෙදීම් වේ. මෙසේ සංක්‍ෂේප විස්තර විනිස දතයුතුය. දට්ඨබ්බතො යන මෙහි නොයෑමෙන් ද නොඒමෙන් ද දතයුතුය. ඒවා පෙර කොහෙන් පහළවී පැමිණියේද නොවේ. නිරුද්ධ වී කොහේ යනවාද නොවේ. ඒවා ඇතිවී කොහෙන් ආවාද නැතිවී කොහේ යනවාද නොවේ. පෙර පහළවී නොලැබූ ස්වභාවය ක්‍ෂයව බිඳුනු ස්වභාවය පෙරඅපර මැද ප්‍රත්‍යයේ පැවතීමේ ස්වභාවය අවසානයට පැමිණේ. එහෙයින් නොයෑම නොඒම වශයෙන් දතයුතුය. අකම්ප්‍ය හා අව්‍යාපාර වශයෙන්ද එසේය. චක්ඛු රූපාදිය එසේ නොවේ. අපගේ සමගියෙන් විඤ්ඤාණය නම් උපදින්නේය. විඤ්ඤාණයේ ඉපදීම පිණිස ඒවා වස්තු ද්වාර ආරම්මණභාවයෙන් විතර්ක නොකෙරේ. ව්‍යාපාරවලට නොපැමිණේ. චක්ඛු රූපාදියේ සමගියෙන් විඤ්ඤාණාදියෙහි පහළවීම ධර්මතාවකි. ඒ නිසා නිරුත්සාහ වශයෙන් හා අව්‍යාපාර වශයෙන් දතයුතුය. තවද අජ්ඣාතිකාදිය ස්ථිර සැප ආත්ම විරහිත හෙයින් ශූන්‍ය ගමක් මෙන් දැක්ක යුතුය. අජ්ඣත්තිකයන්ගේ ඝාතනයක් නැතිබැවින් බාහිර රූපාදිය ගාම ඝාතක සොරෙකු මෙනි. මෙය කියන ලදී, "මහණෙනි, මනාප අමනාප රූපවලින් ඇස නසයි." තවද අජ්ඣත්ත චක්ඛු ආදිය ප්‍රාණීන් සදෙනෙකු මෙන් දැකිය යුතුය.

බාහිර රූපාදිය ඔවුන්ගේ ගොදුරු මෙනි. මෙසේ මෙහි දැකීමෙන් විනිස දතයුතුය.

දැන් ඔවුන් දැකිය යුතු ආකාරය දැක්වීමට චක්ඛුං අනිච්චං ආදිය ඇරඹූහ. එහි ඇස පැවත අභාවයට යන අර්ථයෙන් අනිත්‍යයයි දතයුතුය. තවත් කරුණු සතරකින් අනිත්‍ය වේ. ඉපදීම, නැතිවීම, වෙනස්වීම, තාවකාලිකවීම, නිතර ප්‍රතික්ෂේප කිරීම යනුවෙනි. එයම පෙළීම් අර්ථයෙන් දුක් වේ. එය ඉපිද පැවතීම ජරාවෙන් පෙළයි. ජරාවට අවශ්‍යයෙන් බිඳේ. එනිසා නිතර පීඩනයෙන් දුකෙන් දුක් වස්තුවෙන් සැප අත්හැරවීමෙන් යන මේ කරුණු සතරින්ද දුක් වේ. වසඟ නොවී පවතින අර්ථයෙන් අනාත්ම වේ. මෙය ඉපදී ඨිතියට නොපැමිණේවයි ඨිතියට පැමිණ නොදිරාවයි ජරාවට පැමිණ නොබිඳේවයි තමා කැමති සේ පැවතීමක් නැත. ඒ වසඟව නොපවත්නා ආකාරයෙන් ශුන්‍ය වේ. එනිසා ශුන්‍යයෙන් අස්වාමික භාවයෙන් නොකැමැති දේ කිරීමෙන් තමා ප්‍රතික්ෂෙප කිරීමෙන් යන මේ කරුණු සතරින් අනාත්ම වේ. භව විනාශයෙන් පෙරඅපර වශයෙන් භව සංක්‍රමණ ගමන වශයෙන් ප්‍රකෘතිභාවය අත්හැරීමෙන් වෙනස්වන ස්වභාවය ඇති මෙය අනිත්‍යයට පර්යාය වචනයකි. රූපය අනිත්‍යය ආදියෙහිද මෙය නියමයමයි. ඇස හැර ත්‍රෛභූමක ධර්ම අනිත්‍ය වේ. ඇස නොවේ. ඇස වනාහි ඇසම අනිත්‍ය වේ. එසේම සෙසු ධර්ම දුක් වේ. ඇස නොවේ. ඇස වනාහි ඇසම දුක් වේ. සෙසු ධර්ම අනාත්ම වේ. ඇස නොවේ. ඇස වනාහි ඇසම අනාත්ම වේ. රූපාදියෙහිද මෙම නයයි. මේ සූත්‍රාන්ත භාජනියෙහි තථාගතයන් වහන්සේ කුමක් දක්වන සේක්ද? දොළොස් ආයතනයන්ගේ අනිත්‍ය ලක්‍ෂණයයි. සම්මා සම්බුදුන් වහන්සේ අනාත්ම ලක්‍ෂණය දක්වන්නේ අනිත්‍යයෙන් හෝ දක්වති. දුක්ඛයෙන් හෝ දක්වති. අනිත්‍ය හා දුක්ඛයෙන් හෝ දක්වති. එහි "මහණෙනි, ඇස ආත්මයයි යමෙක් කියයිද එය එසේ නොවේ. ඇසේ ඉපදීම හා අභාවයද පෙනේ. යමක ඉපදීමද අභාවයද පෙනේ නම් මගේ ආත්මය උපදීද නැද්දැයි හේ විපිලිසර බවට පත්වේ. එනිසා ආත්මය නූපදී." මේ සූත්‍රයෙන් අනිත්‍යයෙන් අනාත්මය දැක්වූහ. "මහණෙනි, මේ රූපය අනාත්ම වේ. මහණෙනි, මේ රූපය ආත්ම වන්නේ නම් ආබාධ පිණිස නොපවත්නේය. මේ රූපය මෙසේ වේ. මේ රූපය මෙසේ යයි ලැබෙන්නේද? නැත. මහණෙනි, රූපය අනාත්ම වේ. ඒ නිසා ආබාධ පිණිස පවතී. "මේ සූත්‍රයෙන් දුකෙන් ආත්ම ලක්‍ෂණ දැක්වූහ. "මහණෙනි, රූපය අනිත්‍ය වේ. යමක් අනිත්‍ය නම් එය දුක් වේ. යමක් දුක් නම් එය

අනාත්ම වේ. යමක් අනාත්ම නම් එය මගේ එය මම නොවෙමි. එය මගේ ආත්මය නොවේ.” ආදියෙහි අනිත්‍ය හා දුක්ඛයෙන් අනාත්ම ලක්‍ෂණය දැක්වූහ. කුමක් හෙයින්ද? අනිත්‍ය දුක්ඛ ප්‍රකට බැවිනි. තැටියක් හෝ කෝප්පයක් හෝ කිසිදෙයක් අතින් ගිලිහී වැටුණුවිට අහෝ අනිත්‍යයයි කියති. මෙසේ අනිත්‍ය ප්‍රකටය. ශරීරයෙහි ගඩු බිබිලි නැගුණුවිට කනු කටු ඇනුණුවිට අහෝ දුකයයි කියති. මෙසේ දුක ප්‍රකටය. අනාත්ම ලක්‍ෂණය වනාහි අප්‍රකටය. අඳුරුය. අවිභූතය. දැනගැනීමට අපහසුය. දැක්වීමට අපහසුය. පැණවීමට අපහසුය. බුදුවරුන් නැත්නම් අනාත්ම ලක්‍ෂණය නොපෙනේ. බුද්ධෝත්පාදයෙහිම පෙනේ. මහත් ඍද්ධි ඇති මහත් ආනුභාව ඇති තාපස පරිබ්‍රාජකයෝද සරභංග ස්ථවිර ආදීහුද අනිත්‍ය දුක්ඛ දෙසීමට සමත් වෙති. අනාත්මය දෙසීමට අසමත් වෙති. පැමිණි පිරිසට අනාත්මය දේශනා කිරීමට ඔවුන්ට හැකි වේනම් පැමිණි පිරිසට මාර්ගඵල අවබෝධ වන්නේය. අනාත්ම ලක්‍ෂණය පැවසීම අන් කිසිවෙකුට විෂය නොවේ. සර්වඥ බුදුවරයන්ටම විෂය වේ. මෙසේ මේ අනාත්ම ලක්‍ෂණය අප්‍රකටය. ඒ නිසා ශාස්තෘන් වහන්සේ අනාත්ම ලක්‍ෂණය දක්වන්නේ අනිත්‍යයෙන් හෝ දුක්ඛයෙන් හෝ අනිත්‍ය හා දුක්ඛයෙන් හෝ දක්වතියි දැනගත යුතුය.

මේ ලක්‍ෂණයෝ කුමක් මෙනෙහි නොකිරීමෙන් කුමක් ප්‍රතිවේධ නොකිරීමෙන් කුමකින් වැසී ඇති නිසා නොවැටහේද? අනිත්‍ය ලක්‍ෂණය උදය ව්‍යය මෙනෙහි නොකිරීමෙන් අනවබෝධයෙන් පරම්පරාවෙන් වැසීඇති බැවින් නොවැටහේ. දුක්ඛ ලක්‍ෂණය නිතර පෙළීමෙන් මෙනෙහි නොකිරීමෙන් අනවබෝධයෙන් ඉරියව්වලින් වැසී ඇති බැවින් නොවැටහේ. උදය ව්‍යය විමසා පැවතීම කඩාබිඳ දැමීමෙන් අනිත්‍ය ලක්‍ෂණය යථාවකාශයෙන් වැටහේ. නිතර පීඩනය මෙනෙහි කිරීමෙන් ඉරියව් මාරු නොකරන කල්හි දුක්ඛ ලක්‍ෂණය යථාවකාශයෙන් වැටහේ. අනාත්ම ලක්‍ෂණය නොයෙක් ධාතු වෙන්වීමෙන් මෙනෙහි නොකිරීමෙන් අනවබෝධයෙන් සමූහයෙන් වැසී ඇති බැවින් නොවැටහේ. නොයෙක් ධාතු වෙන්කොට සමූහය වෙන්කළ කල්හි අනාත්ම ලක්‍ෂණය යථාවකාශයෙන් වැටහේ. අනිත්‍යය අනිත්‍ය ලක්‍ෂණය දුක දුක්ඛ ලක්‍ෂණය අනාත්මය අනත්ත ලක්‍ෂණය යන මෙම විභාගය දතයුතුය. එහි අනිත්‍ය යනු ස්කන්ධ පංචකයයි. කුමක් හෙයින්ද? ඉපද ව්‍යයයට අනන තත්වයට පත්ව අභාවයට යෑමෙන් හෝ ආකාරය වෙනස්වීමෙන් හෝ යමක් අනිත්‍ය නම් එය දුක් යන වචනයෙන් ඒ ස්කන්ධ පංචකයම දුක් වේ.

කුමක් හෙයින්ද? නිතර පෙළීමෙන් නිතර පෙළෙන ආකාරය දුක්ඛ ලක්‍ෂණයයි. යමක් දුක නම් එය අනාත්මය වේ යන වචනයෙන් ඒ පංචස්කන්ධයම අනාත්ම වේ. කවර හෙයින්ද? අවසඟ බැවින් අවසඟ වන ආකාරය අනාත්ම ලක්‍ෂණය වේ යන අනිකක්ම අනිත්‍ය දුක්ඛ අනාත්ම වේ. අනිකක්ම අනිත්‍ය දුක්ඛ අනාත්ම ලක්‍ෂණ වේ. පංචස්කන්ධය, දොළොස් ආයතන, අටලොස් ධාතු යන මේ සියල්ල අනිත්‍ය දුක්ඛ අනාත්ම වේ. කියන ලද ආකාරය වෙනස්වීමෙන් අනිත්‍ය දුක්ඛ අනාත්ම ලක්‍ෂණ වේ.

## සූත්‍රාන්ත භාජනීයයි.

මෙහි සංක්‍ෂෙපයෙන් ආයතන දහයක් කාමාවචරය. දෙකක් ත්‍රෛභූමකය. විමසා බලන සියළු වාර කියන ලදැයි දතයුතුය. අභිධර්ම භාජනියෙහි යට කියන ලද සේ විදර්ශනා වඩන්නවුනට උපකාර පිණිස චක්ඛායතන රූපායතන යුගල වශයෙන් ආයතනයයි කියන ලදී. එසේ නොකියා අජ්ඣතීතික බාහිර සියළු ආකාරයෙන් ස්වභාවය දැක්වීම සඳහා චක්ඛායතන සෝතායතනයයි මෙසේ අජ්ඣත්තික බාහිර විභාග කිරීමේ නයින් කියන ලදී. ඔවුන්ගේ නිර්දේශ වාරයෙහි එහි චක්ඛායතනය කවරේදැයි ආදිය යට කියන ලද ක්‍රමයෙන් දතයුතුය. මේ ධම්මායතන නිද්දේසයෙහි එහි අසංඛත ධාතු කවරේද? රාග ක්‍ෂයය ද්වේෂය ක්‍ෂයය මෝහ ක්‍ෂයය යයි කියන ලදී. එහි අර්ථය මෙසේය. අසංඛත ධාතු යනු අසංඛත ස්වභාව වූ නිවනය. රාගාදිය මෙයට පැමිණ ක්‍ෂය වේ. එහෙයින් රාගක්‍ෂය ද්වේෂක්‍ෂය මෝහක්‍ෂය යයි කියන ලදී. මෙය ආචාර්යවරුන්ගේ සමානාර්ථ වූ කථාවය. විතණ්ඩවාදීහු මෙසේ කීහ. වෙන් වෙන්වූ නිවනක් නැත. කෙලෙසුන් ක්‍ෂය කිරීමම නිවනයි. සූත්‍ර දක්වවයි කීකල්හි ඇවැත්නි, සාරිපුත්ත, නිවන නිවනයයි කියයි. ඇවැත්නි, නිවන කවරේද? ඇවැත්නි, යමෙක් රාගක්‍ෂය දෝෂක්‍ෂය මෝහක්‍ෂය කෙරේද එය නිවනයි. මේ ජම්බුඛාදක සූත්‍රය ගෙනහැර දක්වා වෙන වෙන නිවනක් නැත. කෙලෙසුන් ක්‍ෂය කිරීමම නිවනයි කීය. කිම මේ සූත්‍රයේ යථා අර්ථයදැයි ඇසිය යුතුය. ඒකාන්තයෙන් එසේ යයි ද සූත්‍රය හැර අර්ථයක් නැතැයිද කියයි. ඉක්බිතිව මේ ඒ සූත්‍රයයි. ඊළඟ සූත්‍රය දක්වවයි කිවයුතුය. ඊළඟ සූත්‍රය නම් ඇවැත්නි, සාරිපුත්ත, රහත් රහත් යයි කියයි. ඇවැත්නි, රහත් නම් කවරේද? ඇවැත්නි, යමෙක් රාගක්‍ෂය, දෝසක්‍ෂය, මෝහක්‍ෂය කෙරේද එය රහත් යයි කියයි. මෙය ඊට අනතුරුව හැර දැක්වූ සූත්‍රයයි. මේ

සූත්‍රයෙහි නිවන නම් ධම්මායතනයට ඇතුළත් ධර්මයයි. රහත් නම් සතර ස්කන්ධ යයි කීහ. නිවන සාක්ෂාත් කොට වෙසෙන ධම්මසේනාපති නිවන ඇසූවිටද රහත්වීම ඇසූවිටද කෙලෙසුන් ක්ෂය කිරීමයයි කීහ. කිම නිවනද රහත්වීමද එකමද? නැතහොත් වෙනස්ද? එකම හෝ වෙනස් හෝ වේවා. ඔබ විසින් බොහෝ සෙයින් සුණුකරන අර්ථය මෙහි කොහෙද? ඔබ එකම හෝ වෙනස්බව නොදනී. දැනගැනීම හොඳ නොවේදැයි නැවත නැවත ඇසූවිට වංචා කිරීමට නොහැකිව කීය. රාගාදිය ක්ෂීණ වූ කල්හි උපන් හෙයින් රහත්වීම රාගක්ෂය, දෝසක්ෂය, මෝහක්ෂය යයි කියනු ලැබේ. ඉක්බිති ඔබ විසින් මහා කර්මයක් කරන ලදී. අල්ලසක් දුන්නත් මෙයම කියන්නේ යයි ඔහුට කිවයුතුය. මෙය යථා පරිදි බෙදා ඔබ විසින් කියන ලදී. මෙසේ මෙයද සලකන්න. නිවනට පැමිණ රාගාදිය ක්ෂීණ වේයයි නිවන රාගක්ඛය, දෝසක්ඛය, මෝහක්ඛය යයි කියන ලදී. මේ වචන තුනම නිවනට සමාන වචන වේ. මෙසේ කීකල්හි අවබෝධ වේ නම් යෙහෙකි. එසේ නොවුවහොත් බහු නිවන්බව කරවිය යුතුය. කෙසේද? පළමුව මෙසේ ඇසිය යුතුය. රාගක්ඛය රාගයේ ක්ෂයවීමක්ද? නැතහොත් දෝස මෝහවල ක්ෂයවීමක්ද? දෝසක්ඛය දෝසයේ ක්ෂය වීමක්ද? නැතහොත් රාග මෝහවල ක්ෂය වීමක්ද? මෝහක්ඛය මෝහයේ ක්ෂය වීමක්ද? නැතහොත් රාග දෝෂවල ක්ෂය වීමක්ද? ඒකාන්තයෙන් කියයි. රාගක්ඛය රාගයේම ක්ෂයවීමයි. දෝසක්ඛය දෝසයේම ක්ෂයවීමයි. මෝහක්ඛය මෝහයේම ක්ෂයවීමයි. ඉක්බිතිව කිවයුතුයි. ඔබේ වාදයෙහි රාගක්ඛය එක නිවනක් දෝසක්ඛය එක නිවනක් මෝහක්ඛය එකක්දැයි අකුසල මුල් තුන ක්ෂයවීමෙන් නිවන් තුනක් වේ. සතර උපාදාන ක්ෂය වීමෙන් සතරක්ද පංච නීවරණ ක්ෂයවීමෙන් පහක්ද සවැදෑරුම් තෘෂ්ණා කය ක්ෂයවීමෙන් සයක්ද අනුසය සත ක්ෂයවීමෙන් සතක්ද මිථ්‍යා අට ක්ෂයවීමෙන් අටක්ද තෘෂ්ණාමුල් නවය ක්ෂයවීමෙන් නවයක්ද සංයෝජන දහය ක්ෂයවීමෙන් දහයක්ද කෙලෙසුන් එකදහස් පන්සියය ක්ෂයවීමෙන් වෙන් වෙන්වූ නිවන්දැයි බොහෝ නිවන් වේ. ඒ නිවන්වල ප්‍රමාණයක් නැත. මෙසේ නොගෙන නිවනට පැමිණ රාගාදිය ක්ෂීණ වේයයි එකම නිවන රාගක්ඛය දෝසක්ඛය මෝහක්ඛය යයි කියනු ලැබේ. මේ තුනම නිවනට සමාන වචන යයි ගන්න.

මෙසේ කියන කල්හිද නොසලකා නම් ඕලාරික බව කරවිය යුතුය. කෙසේද? අඳබාලයෝ වලස්මුව වඳුරු ආදීහු කෙලෙස් නැගිවිට කාම වස්තු සේවනය කරති. සේවනය අවසානයේ කෙලෙසුන් සන්සිඳේ. ඔබේ

වාදයෙහි වලස් දිවි මුව වඳුරු ආදීහු නිවනට පැමිණියෝ නම් වෙති. ඔබේ නිවන ඕලාරිකය. මහත්වූ නිසා කනේ පැළඳිය නොහැක. මෙසේ නොගෙන නිවනට පැමිණ රාගාදිය ක්ෂීණ වේයයි ද එකම නිවනට රාගක්ඛය දෝසක්ඛය මෝහක්ඛ යයි කියනු ලැබේ. මේ තුනම නිවනේ සමාන වචනයයි ගන්න. මෙසේ කීවිටත් නොසලකා නම් ගෝත්‍රභුවෙන් කරවිය යුතුය. කෙසේද? මුලින් මෙසේ ඇසිය යුතුය. ගොත්‍රභූ ඇතැයි ඔබ කියයිද? ඔව් කියමි. ගොත්‍රභූ ක්ෂණයෙහි කෙලෙස් ක්ෂය වීද ක්ෂය වේද ක්ෂය වන්නේද? ක්ෂීණ වූයේ නොවේ ක්ෂීණ වෙයිද නොවේ. එසේ වුවත් ක්ෂීණ වන්නේය. ගොත්‍රභූ කුමක් අරමුණු කෙරේද? නිවන. ඔබේ ගොත්‍රභූ ක්ෂණයෙහි කෙලෙස් ක්ෂීණ වූයේ නොවේ. ක්ෂීණ වෙයිද නොවේ. ඉක්බිති ක්ෂය වන්නේය. ඔබ කෙලෙස් ක්ෂීණ නොවූ කල්හිම නිවන පනවයි. අනුසය ප්‍රහීන නොවූ කල්හි නිවන පනවයි. එය එයින් සමනය නොවේ. මෙසේ නොගෙන නිවනට පැමිණ රාගාදිය ක්ෂීණ වේයයිද එකම නිවන රාගක්ඛය දෝසක්ඛය මෝහක්ඛයයි කියනු ලැබේ. මේ තුනම නිවනට සමාන වචනයයි ගන්න. මෙසේ කීකල්හිත් නොසලකා නම් මාර්ගයෙන් කරවිය යුතුය. කෙසේද? පළමුව මෙසේ ඇසිය යුතුය. ඔබ මාර්ගය කියනවාද? ඔව් කියමි. මාර්ගක්ෂණයෙහි කෙලෙස් ක්ෂීණවීද ක්ෂීණ වෙයිද ක්ෂීණ වන්නේද? දන්නේ නම් කියයි. ක්ෂීණ වීයයි හෝ ක්ෂීණ වන්නේ යයි කීමට නොවටී. ක්ෂීණ වෙයි යනු කීමට වටී. මෙසේ මාර්ගයේ කෙලෙස් ක්ෂයවීම, නිවන කවරේද? මාර්ගයෙන් ක්ෂයවන කෙලෙස් කවරේද? මාර්ගය කවර කෙලෙස් ක්ෂයව නිවන අරමුණුකර කවර කෙලෙස් ක්ෂය කෙරේද? එනිසා මෙසේ නොගන්න. නිවනට පැමිණ රාගාදිය ක්ෂය වෙයි. එකම නිවනට රාගක්ඛය, දෝසක්ඛය, මෝහක්ඛයයි කියනු ලැබේ. මේ හේතු තුන නිවනෙහි පර්යාය වචන වේ. මෙසේ කීකල්හි මෙසේ කීය. ඔබ පැමිණ පැමිණේයයි කියයිද? එසේය කියමි. ආගම්ම නාමය ඔබට කොහෙන් ලැබුනේද? සූත්‍රයෙන් ලැබුනෙමි. සූත්‍රය දක්වන්න. මෙසේ අවිද්‍යාවට තෘෂ්ණාවට ඔහු පැමිණ එහි ක්ෂීණව එහි බිඳී කිසිදිනක කිසිවක් නොවීය. මෙසේ කීකල්හි පරවාදියා නිශ්ශබ්දභාවයට පැමිණේ.

## අභිධම්ම භාජනියයි.

මෙහිද ආයතන දහයක් කාමාවචරය. දෙකක් චතුභූමකය. ලෞකික ලෝකෝත්තර මිශ්‍ර යයි දතයුතුය. මෙහිද ප්‍රශ්න විචාරකයෙහි යමක්

ලබයිද යමක් නොලබයිද ඒ සියල්ල විචාරා ලැබෙන ලෙසින්ම විසඳුම කියන ලදී. මෙහි පමණක් නොව සියළු ප්‍රශ්න විචාරීම්වල මෙම නයයි. මෙහි ආයතන දහය වනාහි රූප අභාවයෙන් අව්‍යාකෘත යයි දැනගත යුතුය. ආයතන දෙකේ (චක්ඛු රූප) ස්කන්ධ විභංගයෙහි ස්කන්ධ සතර මෙන් කුසලාදි බව දතයුතුය. හුදු ස්කන්ධ සතර ප්‍රත්‍ය සහිතද සංඛතද වේ. ධම්මායතනය ප්‍රත්‍ය රහිතද අසංඛතයට පැමිණියේද වන්නේය. ආරම්මණ ත්‍රිකයෙහි ද ආරම්මණ රහිත වූ සුඛුම රූපයයි කියන ලද ධම්මායතනය නොකිවයුතු කොටස බජනය කරයි. එයද අනාරම්මණ බැවින් අල්පාදි බැවින් ධම්මාරම්මණ බැවින් නොකිවයුතු වේ. මෙය මෙහි විශේෂයයි. සෙස්ස එලෙසමය. ස්කන්ධ සතර මෙන් මෙහිද දොලොස් ආයතන පස් පනස් කාමාවචර ධර්ම අරබයා ඇලෙන්නට ගැටෙන්නට මුළාවන්නට හික්මෙන්නට විමසන්නට පස් විකන්නාටද අල්පවූ අරමුණයයි සියල්ල ස්කන්ධවල කියන ලද සේය.

සම්මෝහ විනෝදනී නම් විභංග අර්ථ වර්ණනාවේ
දෙවන ආයතන විභංග නිද්දේසයයි.

# 3.
# ධාතු විභංගය

ධාතු විභංගයෙහි සියළු ධාතු, ධාතු සය සය හකුළුවා ඡක්ක ත්‍රිකයක් සූත්‍රාන්ත භාජනියෙහි දක්වන්නේ ඡ ධාතුයො ආදිය කීහ. ඡ යනු ගණන දැක්වීමය. ධාතුයො සීමිත ගණන අයත් ධර්ම දැක්වීමය. පඨවි ධාතු ආදියෙහි ධාතු අර්ථය ස්වභාව අර්ථයි. ස්වභාව අර්ථය නම් ශුන්‍ය අර්ථයයි. ශුන්‍ය අර්ථය නම් ආත්මයක් නැත යන අර්ථයයි. මෙසේ ස්වභාව ශුන්‍ය අනාත්ම අර්ථයෙන් පෘථිවි ධාතුව පඨවි ධාතු වේ. ආපෝ ධාතු ආදියෙහි ද මෙම නයයි. මෙසේ මෙහි පද සමාසය දැන මෙසේ අර්ථ දතයුතුය. පඨවි ධාතු යනු පෘථිවියට ආධාර වන ධාතු වේ. ආපෝ ධාතු සම්බන්ධය ඇතිකරන ධාතු වේ. තේජෝ ධාතු මේරීමට සලස්වන ධාතු වේ. වායෝ ධාතු පුම්බවන ධාතු වේ. ආකාස ධාතු ස්පර්ශ නොකළ ධාතු වේ. විඤ්ඤාණ ධාතු දැනගන්නා ධාතු වේ. පඨවි ධාතු ද්වයං මේ පඨවි ධාතු දෙකය. මේ පඨවි ධාතු නම් එකක් නොව අජ්ඣත්තික බාහිර භේදයෙන් දෙකක් වේ යන අර්ථයි. එහෙයින් කීහ:- "අත්ථි අජ්ඣත්තිකා අත්ථි බාහිරා"ති. එහි අජ්ඣත්තික යනු සත්ව සන්තානය ඇතුළත් ස්වකීය අධ්‍යාත්මය වේ. බාහිරා යනු සංස්කාර සන්තානය ඇතුළත් ඉන්ද්‍රියබද්ධ නොවූ. අජ්ඣත්ත පච්චත්තං මේ දෙකම ස්වකීය අජ්ඣත්තයට පර්යාය වචනයි. දැන් එය ස්වභාව ආකාරයෙන් දැක්වීමට කක්ඛලං ආදිය කියන ලදී. එහි කක්ඛළං යනු තදබවයි. ඛරිගතං යනු රළුය. කක්ඛළත්තං රළු බවේ ස්වභාවය. කක්ඛළභාවො රළු ස්වභාවය. අජ්ඣත්තං උපාදින්නං යනු ස්වකීය අජ්ඣත්තයයි කියන ලද උපාදින්නය. උපදින්න නම් ශරීරයෙහි පිහිටි, කර්මයෙන් හටගත් හෝ නැති ශරීරයෙහි පිහිටි. ඒ නිසා උපාදින්න ඇත. අනුපාදින්නද ඇත. සිතින් දැඩිව ගන්නා ලද වශයෙන් දැක්වීමට මේ සියල්ල උපාදින්නයයි දැක්වීමට අජ්ඣත්තං උපාදින්න යයි කීහ.

දැන් එම පඨවි ධාතුව වස්තු වශයෙන් දැක්වීමට සෙය්‍යථීදං කෙසා ලොමා යනාදිය කියන ලදී. එහි සෙය්‍යථීදං යනු නිපාතයකි. යම් ඒ අජ්ඣත්තික පඨවි ධාතු ඒ කවරේද? යම් ඒ අධ්‍යාත්ම වෙන්වූ කැකුළු වූ ඒ කවරේද? කෙසා ලොමා ආදිය ඒ අජ්ඣත්තික පඨවි ධාතුවේ වස්තු වශයෙන් මේ ප්‍රභේද දැකීම කියන ලදී. කෙස් නම් තමාගේ යයි සිතාගත්

ශරීරයේ පිහිටි කැකුළු බව ඇති ලක්‍ෂණ වේ. එය මේ ශරීරයේ වෙන්වූ කොටසකි. ලොම් නම්.......... මල නම්. මෙහි නොකියන ලද පටිසම්භිදා මාර්ගයෙහි පෙලට නගනලද හිස්මොලය අධ්‍යාත්මිකයයි ගන්නා ලද ශරීරයේ පිහිටි කැකුළු ලක්‍ෂණ ඇති මේ ශරීරයෙහි වෙන්ව පිහිටි කොටසකි. පසුව වූ ආපෝ ධාතු ආදි නිද්දේසයෙහි පිත්තාදියද මෙම නයයි. මෙයින් කුමක් දක්වන ලදද? ධාතු මෙනෙහි කිරීමයි. මේ ධාතු මෙනෙහි කිරීමේ යෙදී විදර්ශනාව පිහිටුවා උත්තම වූ අරහත්භායට පැමිණෙනු කැමැත්තා විසින් කුමක් කළයුතුද? සිව්පිරිසිදු සිල් පිරිසිදු කළයුතුය. සිල්වත් වීමෙන් කමටහන් භාවනා සාර්ථක වේ. පිරිසිදුවන පිළිවෙළ විසුද්ධි මාර්ගයෙහි කියන ලද ක්‍රමය අනුව දැනගත යුතුය. විසුද්ධ ශීලයෙන් සීලයෙහි පිහිටා පූර්ව පළිබෝධ දහය සිඳදැමිය යුතුය. ඒවා සිඳදමන ක්‍රමය විසුද්ධි මාර්ගයෙහි කීනයින් දතයුතුය. සිඳින ලද පළිබෝධ ඇත්තා ධාතු මෙනෙහි කිරීමේ කර්මස්ථානය උගත යුතුය. ආචාර්යයන් වහන්සේ විසින්ද ධාතු මෙනෙහි කිරීමේ කර්මස්ථානය උගන්වන්නේ සප්තවිධ උද්ග්‍රහ දක්‍ෂතා දසාකාර මෙනෙහි කිරීමේ දක්‍ෂතා දැක්විය යුතුය. අන්තේවාසිකයාද ආචාර්යයන් වහන්සේ සමීපයෙහි බොහෝ වාරයක් සජ්ඣායනා කොට කර්මස්ථානය අවුල් රහිතව ප්‍රගුණ කළ යුතුය. ජරා මරණයෙන් මිදෙනු කැමති ආදිකම්මික භික්‍ෂුව සත් ආකාරයකින් ඉගෙනීමේ දක්‍ෂතා කැමතිවිය යුතුය. එහි වචනයෙන් මනසින් වර්ණයෙන් සටහනින් දිසාවෙන් අවකාශයෙන් වෙන්කිරීමෙන් යන මේ සත් ආකාරයෙන් මෙම ධාතු මනසිකාරයෙහි කුසලතා ඇතිකර ගතයුතුය. අනුපිළිවෙළින් ඉක්මන් නොවීමෙන් පමා නොවීමෙන් නොකැළඹීමෙන් පැනවීම් ඉක්මවීමෙන් අනුපූර්ව මිදීමෙන් ලක්‍ෂණයෙන් තුන් සූත්‍රාන්තයෙන් යන දස ආකාරයෙන් මෙනෙහි කිරීමේ කුසලතා ලබාගත යුතුය. ඒ දෙකම සතිපට්ඨාන විභංගයෙහි පසුව එන්නේය. මෙසේ කර්මස්ථානය ඉගෙනීමෙන් විසුද්ධි මාර්ගයෙහි කියනලද අටළොස් සේනාසන දොස් හැර අංග පහකින් යුත් සෙනසුනේ වෙසෙමින් තමාගේ පස්ආකාර වීර්යයෙන් යුක්තව පිඩුසිඟා වැළඳීමෙන් පසුව, විවේකව සෙනසුනට ගොස් කමටහන මෙනෙහි කළ යුතුය. මෙනෙහි කරන්නේ වර්ණ සටහන් දිසා අවකාශ පරිච්ඡේද වශයෙන් නොව කේසාදියෙහි එක එක කොටස් මෙනෙහි කොට අවසානයෙහි මෙනෙහි කිරීම පවත්වා ගතයුතුය.

මෙම කෙස් නම් ඔලුකටුව වෙළන සමෙහි හටගත්තේය. හුඹස් මුදුනේ හටගත් කුන්ඨ තණකොල, තමා මත ඒවා හටගත්තේ යයි හුඹස්

මුදුන නොදනී. හුඹස් මුදුනේ හටගත්තෙමු යයි තණකොල නොදනී. එසේම හිස්කටුව වෙළන සම මා කෙරෙහි කෙස් හටගත්තේ යයි නොදනී. අපි ඔලුකටුව වෙළන සමෙහි හටගත්තෙමු යයි කෙස් නොදනී. මේ ධර්ම ඔවුනොවුන් පරිහරණය කරන දේ පිළිබඳ ප්‍රත්‍යවෙක්ෂා රහිතය. කෙස් නම් මේ ශරීරයෙහි වෙන්වූ කොටසකි. චේතනා රහිතය. අව්‍යාකෘතය. ශූන්‍යය. අනාත්මය. තදවූ පඨවි ධාතුව වේ. ලොම් ශරීරය වෙළන සමෙහි හටගත්තේය. එහි ජනශූන්‍ය ගමක හටගත් දබ්බතණ, අපි ජනශූන්‍ය ගමක හටගත්තෙමු යයි නොදනී. එසේම ශරීරය වෙළන සම මා කෙරෙහි ලොම් හටගත්තේ යයි නොදනී. මේ ධර්ම ඔවුනොවුන් පරිහරණය කරන දේ පිළිබඳ ප්‍රත්‍යවෙක්ෂා රහිතය. ලොම් නම් මේ ශරීරයෙහි වෙන්වූ කොටසකි. චේතනා රහිතය. අව්‍යාකෘතය. ශූන්‍යය. අනාත්මය. තදවූ පඨවි ධාතුවය. නිය ඇඟිලි අග හටගත්තේය. ළමයි දඬුවලින් මීඇට විද සෙල්ලම් කරති. අප කෙරෙහි මීඇට තිබුනේ යයි දඬු නොදනී. අපි දඬු මත තබන ලද්දෙමු යයි මීඇට නොදනී. එසේම අපේ අග නිය හටගත්තේ යයි ඇඟිලි නොදනී. අපි ඇඟිලි අග හටගත්තෙමුයි නිය නොදනී. මේ ධර්මයෝ ඔවුනොවුන් ආභෝග ප්‍රත්‍යවෙක්ෂා රහිතයහ. නිය නම් මේ ශරීරයේ වෙන්වූ කොටසකි. චේතනා රහිතය. අව්‍යාකෘතය, ශූන්‍යය, අනාත්මය. තදවූ පඨවි ධාතුවකි. දත් හකුඇටවල හටගත්තේය. වඩුවන් විසින් ගල්වංගෙඩි ටැඹක බැඳ තබන ලදී. අපි ටැඹෙහි සිටිමුයි වංගෙඩි නොදනී. මම වංගෙඩි සහ සිටිමියි ටැඹ නොදනී. එමෙන්ම අපගෙන් දත් හටගත්තේ යයි හකුඇට නොදනී. අපි හකුඇටවලින් හටගත්තෙමුයි දත් නොදනී. මේ ධර්ම ඔවුනොවුන් ආබෝග රහිතය. දත් නම් මේ ශරීරයේ වෙන්වූ කොටසකි. අචේතනය, අව්‍යාකෘතය, ශූන්‍යය, අනාත්මය, තදවූ පඨවි ධාතුවය. සම ශරීරය හාත්පස වසා සිටියේය. එහි යම් සේ නොවියලි ගව සමින් වසනලද වීණාවක් වේ. මම නොවියලි ගවසමින් වසන ලදිමියි වීණාව නොදනී. මවිසින් වීණාව වසන ලදැයි ගවසම නොදනී. එසේම මම සමින් වසන ලදිමියි ශරීරය නොදනී. මවිසින් ශරීරය වසන ලදැයි සම නොදනී. මේ ධර්මයෝ ඔවුනොවුන් ආබෝග ප්‍රත්‍යවෙක්ෂා රහිතයහ. සම නම් මේ ශරීරයේ වෙන්වූ කොටසකි. චේතනා රහිතය, අව්‍යාකෘතය, ශූන්‍යය, අනාත්මය, තදවූ පඨවි ධාතුව වේ. මාංස ඇටකුඩුව ආලේප කොට සිටී. මැටිවලින් ආලේප කළ බිත්තියක් වේ. මැටිවලින් ආලේප කරනු ලදිමියි බිත්තිය නොදනී. මවිසින් බිත්තිය ආලේප කරන ලදැයි මැටි නොදනී. එසේම මාංසයෙන් ආලේප කරන ලදිමියි අස්ථි පංජරය නොදනී. මවිසින් අස්ථි

පංජරය ආලේප කරන ලදැයි මාංස නොදනී. මේ ධර්ම ප්‍රත්‍යවෙක්‍ෂා රහිතය. මාංස නම් මේ සිරුරේ වෙන්වූ කොටසකි. අචේතනය, අව්‍යාකෘතය, ශුන්‍යය, අනාත්මය, තදවූ පඨවි ධාතුව වේ.

නහර ශරීරය තුළ ඇට බඳිමින් සිටී. වැල්වලින් බිත්ති දැව වෙළුකල්හි වැල්වලින් වෙළන ලදිමියි වරිච්චිය නොදනී. වරිච්චිය වෙලන ලදැයි වැල් නොදනී. නහරවලින් බඳින ලදිමියි ඇට නොදනී. ඇට බඳින ලදැයි නහර නොදනී. මේ ධර්ම ප්‍රත්‍යවෙක්‍ෂා රහිතය. නහර නම් මේ සිරුරේ වෙන්වූ කොටසකි. අචේතනය, ශුන්‍යය, අනාත්මය, තදවූ පඨවි ධාතුව වේ.

ඇටවල පතුලේ ඇට ගොප් ඇට ඔසවා සිටී. ගොප්ඇට කෙණ්ඩා ඇට ඔසවා සිටී. කෙණ්ඩා ඇට කලවා ඇටද කලවා ඇට තුනටිය ඇටද තුනටිය ඇට කොඳුඇටද කොඳුඇට බෙල්ලේ ඇටද බෙල්ලේ ඇට හිසේ ඇටද ඔසවා සිටී. හිසේ ඇට බෙල්ලේ ඇට මත පිහිටියේය. බෙල්ලේ ඇට කොඳුඇට මතද කොඳුඇට තුනටියේ ඇට මතද තුනටියේ ඇට කලවා ඇට මතද කලවා ඇට කෙණ්ඩා ඇට මතද කෙණ්ඩා ඇට ගොප් ඇට මතද ගොප් ඇට පතුලේ ඇට මතද පිහිටියේය. උළු ගඩොල් දැව ගොම ආදිය රැස්කිරීමේදී උඩ උඩ ඒවා ඔසවා සිටිමුයි යට යට ඒවා නොදනී. යට යට ඒවා මත සිටිමුයි උඩ උඩ ඒවා නොදනී. ගොප් ඇට ඔසවා සිටිතියි පතුලේ ඇට නොදනී. කෙණ්ඩා ඇට ඔසවා සිටිතියි ගොප් ඇට නොදනී. කලවා ඇට ඔසවා සිටිතියි කෙණ්ඩා ඇට නොදනී. තුනටි ඇට ඔසවා සිටිතියි කලවා ඇට නොදනී. කොඳු ඇට ඔසවා සිටිතියි තුනටිය ඇට නොදනී. බෙල්ලේ ඇට ඔසවා සිටිතියි කොඳුඇට නොදනී. හිසේ ඇට ඔසවා සිටිතියි තුනටිය ඇට නොදනී. බෙල්ලේ ඇට ඔසවා සිටිතියි කොඳුඇට නොදනී. කොඳුඇට මත පිහිටියෙමියි බෙල්ලේ ඇට නොදනී. තුනටිය ඇට මත පිහිටියෙමියි කොඳුඇට නොදනී. කලවා ඇට මත පිහිටියෙමියි තුනටිය ඇට නොදනී. කෙණ්ඩා ඇට මත පිහිටියෙමියි කලවා ඇට නොදනී. ගොප් ඇට මත පිහිටියෙමියි කෙණ්ඩා ඇට නොදනී. පතුලේ ඇට මත පිහිටියෙමියි ගොප් ඇට නොදනී. මේ ධර්මයෝ ඔවුනොවුන් ප්‍රත්‍යවෙක්‍ෂා රහිතයහ. ඇට නම් මේ ශරීරයේ වෙන්වූ කොටසකි. අචේතනය, අව්‍යාකෘතය, ශුන්‍යය, අනාත්මය, තදවූ පඨවි ධාතු වේ. ඇටමිදුළු ඒ ඒ ඇටවල අභ්‍යන්තරයේ පිහිටියේය. හුණ පර්ව ඇතුළත බහාලන ලද වේවැල් කරටි ආදිය ඇතිකල්හි අප ඇතුළේ වේවැල් කරටි ඇතැයි හුණ පර්ව නොදනී. හුණ පර්ව ඇතුළේ බහාලන

ලද බව වේවැල් කරටි නොදනී. ඇතුළේ ඇටමිදුළු ඇතැයි ඇට නොදනී. ඇට ඇතුළේ සිටිමියි ඇටමිදුළු නොදනී. මේ ධර්ම ප්‍රත්‍යවෙක්‍ෂා රහිතය. ඇටමිදුළු නම් මේ ශරීරයේ වෙන්වූ කොටසකි. අචේතනය, අව්‍යාකෘතය, ශූන්‍යය, අනාත්මය, තදවූ පඨවි ධාතුවේ. වකුගඩුව ගලවළුවෙන් නික්මී එක් මුලකින් ටිකක් ගොස් දෙකට බෙදී ලොකු නහරයෙන් බැඳී හෘදය මාංසය වටකොට සිටියේය. එක නැට්ටෙන් බැඳුණු අඹගෙඩි දෙකක් අඹගෙඩි බඳින ලදැයි නැට්ට නොදනී. නැට්ටෙන් බඳින ලදැයි අඹ නොදනී. වකුගඩුව බඳින ලදැයි මහනහරය නොදනී. මහනහරයෙන් බඳින ලදැයි වකුගඩුව නොදනී. මේ ධර්ම ප්‍රත්‍යවෙක්‍ෂා රහිතය. වකුගඩුව නම් ශරීරයේ වෙන්වූ කොටසකි. අචේතනය, අව්‍යාකෘතය, ශූන්‍යය, අනාත්මය, තදගති ඇති පඨවි ධාතුව වේ.

හෘදය සිරුර ඇතුළේ උරකුහරය මැද ඇසුරුකර සිටියේය. රිය තට්ටුව තුළ තබනලද මස්වැදැල්ල රිය තට්ටුව තුළ ඇතැයි නොදනී. රිය තට්ටුවේ ඇතැයි රිය තට්ටුව නොදනී. එසේම උරකුහරය ඇසුරුකර ඇතැයි පපුමස නොදනී. හෘදය තමා තුළ ඇතැයි උරකුහරය නොදනී. මේ ධර්ම ප්‍රත්‍යවෙක්‍ෂා රහිතය. හෘදය මේ ශරීරයේ වෙන්වූ කොටසකි. අචේතනය, අව්‍යාකෘතය, ශූන්‍යය, අනාත්මය, තදවූ පඨවි ධාතු වේ. අක්මාව ශරීරය තුළ තනදෙක ඇතුළත දකුණුපස ඇසුරු කර සිටී. ගැලිකබල පසෙහි ඇළුණු මස්පිඬු දෙක ඇතැයි හැලිකබල නොදනී. හැලිකබලේ ඇළුණේ යයි මස්පිඬු නොදනී. එසේම තම ඇතුළත අක්මාව ඇතැයි තන නොදනී. තන තුළ පිහිටියේයයි අක්මාව නොදනී. මේ ධර්ම ප්‍රත්‍යවෙක්‍ෂා රහිතය. අක්මාව මේ ශරීරයේ වෙන්වූ කොටසකි. අචේතනය, අව්‍යාකෘතය, ශූන්‍යය, අනාත්මය, තදවූ පඨවි ධාතු වේ. වැසුණු දලබුව හෘදය වස්තුව සහ වකුගඩුව පිරිවරා සිටී. නොවැසුණු දලබුව සියළු ශරීරයෙහි සමින් යට මස වෙළාගෙන සිටී. රෙදිකැබැල්ලෙන් මස් වෙළුවිට රෙදි කැබැල්ලෙන් වෙළන ලදැයි මස් නොදනී. මස් වෙළන ලදැයි රෙදි කැබැල්ල නොදනී. වකුගඩුව හා හෘදය තමා වසන ලදැයි දලබුව නොදනී. දලබුවෙන් වැසුනේ යයි වකුගඩුව හා හෘදය නොදනී. මේ ධර්ම ප්‍රත්‍යවෙක්‍ෂා රහිතය. දලබුව මේ ශරීරයේ වෙන්වූ කොටසකි. අචේතනය, අව්‍යාකෘතය, ශූන්‍යය, අනාත්මය, තදවූ පඨවි ධාතුව වේ.

බඩදිව හෘදයේ වම්පස උදරපටලය මත පසෙක සිටී. කොටුව මත පසෙක ගොමපිඩ තිබේ. ගොමපිඩ තමා මත ඇතැයි කොටුව නොදනී.

කොටුව මත තමා සිටී යයි ගොමපිඩ නොදනී. බඩදිව මා නිසා සිටියේ යයි බඩදිව නොදනී. බඩදිව සිටියේ යයි උදර පටලය නොදනී. මේ ධර්ම ප්‍රත්‍යවෙක්ෂා රහිතය. බඩදිව මේ ශරීරයේ කොටසකි. අචේතනය, අව්‍යාකෘතය, ශූන්‍යය, අනාත්මය, තද පඨවි ධාතු වේ.

පපුව සිරුර තුළ තන දෙක අතර හෘදය වස්තුව සහ අක්මාව මත්තෙහි එල්බෙමින් පවතී. එහි දිරූ කොටුවක පක්ෂි කුඩුවක් එල්ලෙමින් ඇත. පක්ෂි කුඩුව ඇතැයි කොටුව නොදනී. කොටුවේ එල්ලෙමින් ඇතැයි කුඩුව නොදනී. පපුව එල්බෙමින් ඇතැයි සිරුර නොදනී. සිරුර තුළ එල්බෙමින් ඇතැයි පපුව නොදනී. මේ ධර්ම ප්‍රත්‍යක්ෂවෙක්ෂා රහිතය. පපුව මේ ශරීරයේ වෙන්වූ කොටසකි. අචේතනය, අව්‍යාකෘතය, ශූන්‍යය, අනාත්මය, තද පඨවි ධාතු වේ.

බඩවැල ගලවළුවේ සිට මලමාර්ගය අවසන්කොට සිරුර තුළ ඇත. එහි ඔරුවක තැබූ සිඳුණු හිස්නහර කලේබරයක් ඇත නහරය ඇතැයි ලේ ඔරුව නොදනී. ඔරුවේ ඇතැයි නහරය නොදනී. බඩවැල තමා කෙරෙහි ඇතැයි සිරුර නොදනී. සිරුරේ ඇතැයි බඩවැල නොදනී. මේවා ප්‍රත්‍යවෙක්ෂා රහිතය. බඩවැල සිරුරේ කොටසකි. අචේතනය, අව්‍යාකෘතය, ශූන්‍යය, අනාත්මය, තද පඨවි ධාතුව වේ.

කුඩා බඩවැල එක්විසි අතුණුබහන් බැඳ අතරෙහි සිටී. පාපිස්න ලණුවලින් වසා ඇත. ලණුවලින් වසා ඇතැයි පාපිස්න නොදනී. පාපිස්න වසන ලදැයි ලණු නොදනී. බැඳ ඇතැයි කුඩා බඩවැල නොදනී. බැඳී ඇතැයි බඩවැල නොදනී. මේවා ප්‍රත්‍යවෙක්ෂා රහිතය. කුඩා බඩවැල ශරීරයේ වෙන්වූ කොටසකි. අචේතනය, ශූන්‍යය, අනාත්මය, තදවූ පඨවි ධාතුව වේ.

නොපැසුණ අහර කා බී රස බැළු ආහාර උදරයෙහි ඇත. බලු ඔරුවක ඇති වමනය බලු වමනය ඇතැයි බලු ඔරුව නොදනී. බලු වමනය ඔරුවේ ඇතැයි වමනය නොදනී. මම උදරයෙහි සිටිමියි නොපැසුණ ආහාර නොදනී. නොපැසුණ ආහාර උදරයෙහි ඇතැයි උදරය නොදනී. මේ ධර්ම ඔවුනොවුන් ප්‍රත්‍යවෙක්ෂා රහිතය. නොපැසුණ ආහාර මේ ශරීරයේ වෙන්වූ කොටසකි. අචේතනය, අව්‍යාකෘතය, ශූන්‍යය, අනාත්මය, තදවූ පඨවි ධාතුව වේ.

මල ඇලදිව යයි කියන ලද අටඟුල් උණපුරුක් හා සමාන බඩවැල අවසානයෙහි සිටී. එහි උණ පුරුක් මිරිකා බහාලන ලද සිනිඳු පඬුපැහැ මැටි ඇත. මා කෙරෙහි සිනිඳු පඬුපැහැ මැටි ඇතැයි උණුපුරුක නොදනී. මම උණපුරුකෙහි සිටිමියි මැටි නොදනී. මා කෙරෙහි මල ඇතැයි පක්වාසය නොදනී. පක්වාසයෙහි ඇතැයි මල නොදනී. මේ ධර්ම ඔවුනොවුන් ප්‍රත්‍යවෙක්ෂා රහිතය. මල මේ ශරීරයේ වෙන්වූ කොටසකි. අචේතනය, අව්‍යාකෘතය, ශූන්‍යය, අනාත්මය, තදවූ පඨවි ධාතු වේ.

හිස්මොලය හිස්කබල ඇතුළේ තිබේ. එහි පැරණි ලබු කබලක බහාලන ලද පිටිපිඬු ඇත. මා කෙරෙහි පිටිපිඬු ඇතැයි ලබුකබල නොදනී. තමා ලබුකබල තුළ ඇතැයි පිටිපිඬු නොදනී. මම හිස්කබල තුළ සිටිමියි හිස්මොලය නොදනී. මා තුළ හිස් මොලය ඇතැයි හිස්කබල නොදනී. මේ ධර්ම ඔවුනොවුන් ප්‍රත්‍යවෙක්ෂා රහිතය. හිස්මොලය මේ ශරීරයේ වෙන්වූ කොටසකි. අචේතනය, අව්‍යාකෘතය. ශූන්‍යය, අනාත්මය, තදවූ පඨවි ධාතුව වේ.

**යංවා පනඤ්ඤම්පි** මේ ආපෝ කොටස් තුනෙහි අනුගත පඨවි ධාතු ලක්ෂණ වශයෙන් සෙසු ධර්ම පඨවි ලෙස දැක්වීය. බාහිර පඨවි ධාතු නිද්දේසයෙහි **අයො** යනු කලු ලොහයයි. **ලොහං** යනු ජාති, විජාත, කිත්තිම, පිසාච යයි සතරාකාරය. යකඩ, රිදී, රන්, ඊයම්, සුදු, කළු ඊයම්, තඹ වේකන්ත යන සත ජාති ලෝහයයි. නයි නසන ලෝහය විජාති ලෝහයයි. රන් වට පිත්තල තුණ කිත්තිම ලෝහ වේ. මොරක්ඛක, පුථුක, මලිනක, චපලක, සෙලක, ආටක, තල්ලක, දූසි යන අට පිසාච ලෝහ නම් වේ. ඒවා අතර ජාති ලෝහ පහ පෙලෙහි වෙන්කොට දක්වා ඇත. තඹ වෙන්තක ජාති ලෝහ සමග මෙහි සියල්ල ලෝහ යයි දතයුතුය. **තිපු** යනු සුදු ඊයම්ය. **සීස** යනු කළු ඊයම්ය. **සජ්ඣ** යනු රිදීය. **මුත්තා** මුහුදු මුතු වේ. **මණි** පෙලෙහි ආ වෙළුරියාදිය හැර සෙසු ජෝති ගිනිගල් රසාදි සියල්ල මණි වේ. **වෙළුරිය** යනු වෙරළුම්ණිය (උණ ගස් වර්ණයෙන් යුත් නිසා) වේ. **සංඛ** මුහුදු හක්. **සිලා** කළු පඬු සුදු ආදී බේදවලින් යුත් සියළුම ගල් අයත් වේ. **පවාල** ප්‍රවාලම වේ. **රජතං** කහවණු වේ. **ජාතරූපං** ස්වර්ණ වේ. **ලොහිතංක** රතුමැණික් වේ. **මසාරගල්ලං** මිශ්‍ර වර්ණ යුත් මැණික් **තෘණාදියෙහි** පිටත කොවුල ඇති යටත් පිරිසෙයින් පොල් ආදියද තෘණ වේ. ඇතුළත කොවුල් දර කැල්ලක්ද කාෂ්ට නම් වේ. **සක්ඛර** මුංඇට ප්‍රමාණයේ සිට මිටින් ගතහැකි පමණවූ බොරළුකැට වේ. **මුග්ග මත්තයෙන්** යතු යට වැලි යයි කියන ලදී. **කඨලං** යනු කිසියම් කපාල

වේ. භූමි-පඨවි ද වේ. **පාසාණො** මිටතුළ නොපිහිටන ප්‍රමාණයේ සිට ඇතුන් පමණ වූයේ අසම්පත්ත පාසාණ වේ. ඇතුන් ප්‍රමාණයේ සිට පර්වත දක්වාද පාසාණ වේ. **යං වා පන** මෙයින් තල්ඇට පොල්ගෙඩි භේදයෙන් සෙසු පඨවි ගනියි. අජ්ඣත්තික බාහිර පඨවි ධාතු දෙක කර්කශ අර්ථයෙන් හා ලක්‍ෂණයෙන් එකම පඨවි ධාතු යයි දක්වයි. ආපෝ ධාතු නිද්දේසාදියද යට කියන ලද නයින්ම දතයුතුය. **ආපො ආපොගතං** ආදියෙහි බැඳීම් වශයෙන් ආපෝ වේ. එයම ආපෝ ස්වභාවයට ගියබැවින් **සෙනගගාවගතං** වේ. **බන්ධනත්තං රූපස්ස** වෙන්නොවූ රූපයේ බැඳීම් බවය. පිත්තංසෙමහං ආදිය වර්ණය පිහිටීම දිසාව අවකාශය පිරිසිඳීම වශයෙන් විමසා ධාතු වශයෙන් මෙනෙහි කළයුතුය. මේ එහි පිළිවෙළයි. පිත්වල නොබැඳි පිත ජීවිතේන්ද්‍රිය හා බැඳී මුළු සිරුරෙහි පැතිර සිටී. බැඳුණු පිත පිත්කෝෂයෙහි සිටී. එහි තෙල කැවුමෙහි පැතිර තිබෙනවිට තෙල මා මුළුල්ලෙහි පැතිර ඇතැයි කැවුම නොදනී. කැවුමෙහි පැතිරී ඇතැයි තෙල නොදනී. එසේම නොබැඳි පිත මා මුළුල්ලෙහි පැතිරී ඇතැයි සිරුර නොදනී. සිරුර මුළුල්ලෙහි පැතිරී සිටිමියි පිත නොදනී. වැසිදියෙන් පිරුණු වැටකොලු කොපුව මෙන් වැසිදියෙන් පිරී ඇතැයි නොදනී. වැටකොලු කොපුව තුළ පිරී ඇතැයි වැසිදිය නොදනී. එසේම මා කෙරෙහි බැඳුණු පිත ඇතැයි පිත් කෝෂය නොදනී. පිත් කෝෂයෙහි ඇතැයි පිත නොදනී. මේ ධර්ම ප්‍රත්‍යවේක්‍ෂා රහිතය. පිත නම් මේ සිරුරේ වෙන්වූ කොටසකි. අචේතනය, අව්‍යාකෘතය, ශූන්‍යය, අනාත්මය, යූෂයෙන් යුත් බැඳීම් ආකාර ඇති ආපෝ ධාතු වේ. සෙම පාත්‍රයක් පුරවන පමණ උදරපටලයෙහි ඇත. ගවරවලක හටගත් පෙණ පටලයක් ගවරවලේ ඇතැයි නොදනී. පෙණ පටලයක් ඇතැයි ගවරවල නොදනී. තමා කෙරෙහි සෙම ඇතැයි උදරපටලය නොදනී. උදර පටලයෙහි ඇතැයි සෙම නොදනී. මේ ධර්ම ප්‍රත්‍යවෙක්‍ෂා රහිතය. සෙම මේ ශරීරයෙහි වෙන්වූ කොටසකි. අචේතනය, අව්‍යාකෘතය, ශූන්‍යය, අනාත්මය, යූෂ සහිත වූ බැඳීම් ආකාර ආපෝ ධාතුව වේ.

˙සැරව නොබැඳුණු අවකාසයයි. කණු කටු පැහැරීමෙන් හා ගිනිදළු වැදීමෙන් ශරීරයේ යම් යම් තැන්වල ලේ පිහිටා පැසේ. ගඬු පිලකාදිය ඇතිවේ. ඒ ඒ තැන පිහිටයි. එහි මැලියම් ඇති ගසක් පොරෝ පහර වැදුණු තැන මැලියම් ඇතැයි නොදනී. තමා ගසේ ඇතැයි මැලියම් නොදනී. කණු කටු ආදිය ඇනුණු තැන සැරව ඇතැයි ශරීරය නොදනී. තමා ශරීරයෙහි ඇතැයි සැරව නොදනී. මේ ධර්ම ඔවුනොවුන් ප්‍රත්‍යවෙක්‍ෂා රහිතය. සැරව මේ ශරීරයේ වෙන්වූ කොටසකි. අචේතනය,

අව්‍යාකෘතය, ශූන්‍යය, අනාත්මය, යුෂයෙන් යුත් බැඳීම් ඇති ආපෝ ධාතු වේ.

ලෝහිතං අබද්ධ පිත මෙන් ලෙය සියළු ශරීරයෙහි පැතිරී ඇත. රැස්වුණු ලෙය අක්මාව යටපැත්ත පුරවා වකුගඩුව, හෘදය, අක්මාව, පපුව තෙමමින් පවතී. එහි සංසරණය වන ලෙයෙහි නොබැඳූ පිතෙහි මෙන්, දැරූ කබලක් දියයට මැටිකැට ආදිය තෙමමින් සිටී. ජලයෙන් තෙමෙමින් සිටී යයි මැටිකැට නොදනී. මැටිකැට තෙමනවා යයි ජලය නොදනී. එසේම වකුගඩුව අක්මාව ආදිය ලෙය ඇතැයි නොදනී. ඒවා තෙමමින් සිටිනවා යයි රුධිරය නොදනී. මේ ධර්ම ඔවුනොවුන් ප්‍රත්‍යවෙක්ෂා රහිතය. රුධිරය මේ ශරීරයේ වෙන්වූ කොටසකි. අචේතනය, අව්‍යාකෘතය, ශූන්‍යය, අනාත්මය, යුෂ සහිත බැඳීම් ඇති ආපෝ ධාතුව වේ.

සෙදො දහඩිය ගින්නෙන් රත්වීම් ආදිය ඇතිවිට කෙස්, රෝමකූප, විවර පුරවා සිටීමද වැගිරීමද වේ. ජලයෙන් උදුරන ලද නෙළුම්අල දඬුවලින් ජලය වැගිරේ. ජලය වැගිරෙන බව නෙළුම්අල දඬු නොදනී. නෙළුම් දඬු අලවලින් වැගිරේ යයි ජලය නොදනී. එසේම දහඩිය වැගිරේ යයි කෙස් ලොම් විවර නොදනී. කෙස් ලොම් විවරවලින් වැගිරේ යයි දහඩිය නොදනී. මේ ධර්ම ඔවුනොවුන් ප්‍රත්‍යවෙක්ෂා රහිතය. දහඩිය මේ ශරීරයේ වෙන්වූ කොටසකි. අචේතනය, අව්‍යාකෘතය, ශූන්‍යය, අනාත්මය, යුෂ සහිත බැඳීම් ඇති ආපෝ ධාතු වේ.

මෙදො තෙල ස්ථූල වූ සියළු සිරුරෙහි පැතිරී කෘශ වූ කෙණ්ඩා මාංශ ආදිය ඇසුරුකර ඇත. කහරෙදි කැබැල්ලකින් වැසූ මස්පිඩ කහරෙදි කැබැල්ලකින් වැසුවේ යයි නොදනී. මස්පිඩ වැසුවේ යයි කහරෙදි කැබැල්ල නොදනී. එසේම ශරීරය පුරා මේදය ඇතැයි ජංගාදිය නොදනී. සිරුර පුරා ඇතැයි මේදය නොදනී. මේ ධර්ම ඔවුනොවුන් ප්‍රත්‍යවෙක්ෂා නොකරයි. මේදය සිරුරේ වෙන්වූ කොටසකි. අචේතනය, අව්‍යාකෘතය, ශූන්‍යය, අනාත්මය, යුෂ ඇති බැඳීම් සහිත ආපෝ ධාතුව වේ.

අස්සු කඳුළු හටගත්විට ඇස් පුරවා හෝ වැගිරෙමින් ඇත. තල් කුරුම්බැට්ටිවල ඇති ජලය පිරුණුවිට ජලය පිරී ඇතැයි කුරුම්බැට්ටි නොදනී. තමා කුරුම්බැට්ටිවල ඇතැයි ජලය නොදනී. එසේම කඳුළු ඇතැයි ඇස්වල නොදනී. ඇස් වලේ සිටිනවා යයි කඳුළු නොදනී. මේ ධර්ම ප්‍රත්‍යවෙක්ෂා රහිතය. කඳුළු මේ ශරීරයේ වෙන්වූ කොටසකි.

අචේතනය, අව්‍යාකෘතය, ශූන්‍යය, අනාත්මය, යූෂ සහිත බැඳීම් ඇති ආපෝ ධාතුවය.

වසා චුරුණු තෙලය. ගිනි ආදියෙන් තැවෙනවිට අතුල්පතුල් නාස් සිදුරු නලල උරහිස්වල තිබෙන දියාරු තෙලකි. පැසුණු තෙලෙහි උතුරන තෙල උඩට නැගෙන බව නොදනී. තෙල උතුරනවා යයි පැසුණු තෙල නොදනී. එසේම චුරුණු තෙල තමා වසා ඇතැයි අතුල්පතුල් ආදිය නොදනී. අතුල්පතුල් ආදිය වසා සිටිනවා යයි චුරුණු තෙල නොදනී. මේ ධර්ම ඔවුනොවුන් ප්‍රත්‍යවෙක්‍ෂා රහිතය. චුරුණු තෙල වෙන්වූ ශරීරයේ කොටසකි. අචේතනය, අව්‍යාකෘතය, ශූන්‍යය, යූෂ ඇති බැඳීම් ආකාර ආපෝ ධාතුව වේ.

බෙලො කෙල ඉපදීමට හේතු ඇතිකල්හි දෙකොපලින් පහතට බැස දිවෙහි පවතී. ගංඉවුරේ වලක ජලයෙන් යුක්තයයි නොදනී. ඒ වලේ ඇතැයි එහි ජලය නොදනී. එසේම මා කෙරෙහි කෙල ඇතැයි දිව නොදනී. මම දිවේ සිටිමියි කෙල නොදනී. මේ ධර්ම ඔවුනොවුන් ප්‍රත්‍යවෙක්‍ෂා රහිතය. කෙල මේ ශරීරයේ වෙන්වූ කොටසකි. අචේතනය, අව්‍යාකෘතය, ශූන්‍යය, අනාත්මය, යුසැති බැඳීම් සහිත ආපෝ ධාතු වේ.

සිංඝානිකා මුකුණුය (සොටු) හටගන්නාවිට නාස්පුඩු පුරවා සිටී. හෝ වැගිරේ. කුණු දීකිරිවලින් පිරුණු බෙල්ලා තමා කෙරෙහි කුණු දීකිරි ඇතැයි නොදනී. බෙල්ලාගේ සිටිමි යයි කුණු දීකිරි නොදනී. නාස් පුඩුවල සිටිමියි මුකුණු නොදනී. මුකුණු ඇතැයි නාස්පුඩු නොදනී. මේ ධර්ම ප්‍රත්‍යවෙක්‍ෂා රහිතය. මුකුණු ශරීරයේ වෙන්වූ කොටසකි. අචේතනය, අව්‍යාකෘතය, ශූන්‍යය, අනාත්මය, යූෂ සහ බැඳීම් ඇති ආපෝ ධාතු වේ.

ලසිකා සඳමිදුළු ඇට සන්ධිවල ගැල්වීම් කිස සිදුකරමින් අටදහසක් පමණ සන්ධිවල පවතී. ගැල්වූ අකුරෙහි (අක්‍ෂය) තෙල්ගල්වා ඇතැයි අලවංගුව නොදනී. අකුරෙහි තෙල් ගැල්වූයෙමියි තෙල් නොදනී. එසේම තෙල් ගල්වන ලදැයි අට දහසක් සන්ධි නොදනී. අටදහසක් සන්ධිවල ගැල්වීමියි සඳමිදුළු නොදනී. මේ ධර්ම ඔවුනොවුන් ප්‍රත්‍යවෙක්‍ෂා රහිතය. සඳමිදුළු මේ ශරීරයේ වෙන්වූ කොටසකි. අචේතනය, අව්‍යාකෘතය, ශූන්‍යය, අනාත්මය, යූෂභූත වූ බැඳීම් ඇති ආපෝ ධාතු වේ.

මුත්තං මුත්‍ර, වස්ති ඇතුළත පවතී. ගවරවලෙහි දැමූ රවන්කට්ට මුනින් අතට වැටේ. ගවරවල ජලයෙහි සිටීවා යයි රවන්ට්ට නොදනී.

රවන්කට්ට ඇතිබව ගවරවල නොදනී. එසේම වස්තිය තුළ ඇතැයි මුත්‍ර නොදනී. තමා තුළ මුත්‍ර ඇතැයි වස්තිය නොදන. මේ ධර්ම ඔවුනොවුන් ප්‍රත්‍යවෙක්ෂා රහිතය. මුත්‍ර මේ ශරීරයෙන් වෙන්වූ කොටසකි. අචේතනය, අව්‍යාකෘතය, ශූන්‍යය, අනාත්මය, යූෂ සහිත වූ ආපෝ ධාතුව වේ.

**යං වා පන** ඉතිරි කොටස් තුනේ ආපෝ ධාතු සඳහා කියන ලදී. බාහිර ආපෝ ධාතු නිද්දේසයෙහි මූලය නිසා උපන් රසය මූලරසො වේ. **ඛන්ධරසාදිය** මෙම නයමයි. ඛීර ප්‍රකටය. භෙසජ්ජ සික්ඛාපදයෙහි මෙබඳු නියමයක් නැත. යම්කිසි කිරක් කිරීමය. සෙස්සද මෙසේය. **අන්තලික්ඛානි** පොළොවට නොපත් වැසි දියයි. භුම්මානි වලවල් ආදියෙහි පවතින ජලයයි. **යං වා පන** හිම ජලය, කල්ප විනාශ ජලය, පොළොව දරා සිටින ජලය මෙහි පර්යාය අර්ථයෙන් ගිණිය යුතුය. තේජෝ ධාතු නිද්දේසයෙහි තැවීම් වශයෙන් තේජෝ වේ. තේජෝම තේජෝභාවයට ගියේය. තේජෝ ගතං **උසමා** යනු උණුසුම් ආකාරයයි. උණුසුමම උස්මභායට ගියේය. **උස්මාගතං** උසුමං සැඩ උෂ්ණය. එයම උස්මභාවයට ගියබැවින් උසුමගතං විය. යෙන වා යනු යමකින් උණුසුම්වී කිපුණු. **සන්තප්පති** යනු මෙය කය තවයි. එක්දිනක් පවත්නා ජරාදිබැවින් උෂ්ණ වේ. යෙන ච ජීරීයති යනු යමකින් මේ සිරුර දිරාපත් කරයි. ඉන්ද්‍රිය විකලබව ශක්තිය පිරිහීම ඇඟ රැළිවැටීම හිසකෙස් පැසීම ආදි බවට පමුණුවයි. **යෙන ච පරිඩය්හති** යනු යමක් කිපීමෙන් මේ සිරුර දැවේ. ඒ පුද්ගලයාද දැවෙමි දැවෙමියි අඬමින් සියක්වර පිරිසිදු කළ ගිතෙල් රත්හඳුන් ආදි ආලේපද තල්වැට පවන් ද බලාපොරොත්තු වේ. **යෙන ච අසිත පීත ඛායිත සායිතං සම්මා පරිණාමං ගච්ඡති** යමකින් මෙය බත් ආදි කන ලද හෝ පැන් ආදි බොනලද හෝ පිටි කැවුම් ආදි කඩාකන ලද හෝ අඹපැන් මීපැණි ආදි ලේහය කරන ලද හෝ මනාව දිරවීමට යයි. රසාදි විවේකයට යයි යන අර්ථයයි. මෙහි මුල් තුන තේජෝ ධාතු උපදවයි. අවසාන එක කර්මයෙන් හටගත්තේය. මේ එහි පද වර්ණනාවයි. මෙය වනාහි මෙනෙහි කිරීමේ විධානයයි. මෙහි භික්ෂුව යමකින් තැවේද එය මේ ශරීරයෙන් වෙන්වූ දෙයකි. අචේතනය, අව්‍යාකෘතය, ශූන්‍යය, අනාත්මය, මේරීමට යන තේජෝ ධාතුවයි. මෙනෙහි කරයි. යමකින් දිරාද යමකින් තැවේද යමකින් කෑ බී දේ මනාව පරිණාමයට යයිද මෙය මේ ශරීරයෙන් වෙන්වූ කොටසකි. අචේතනිකය, අව්‍යාකෘතය, ශූන්‍යය, අනාත්මය, මේරීමට යන තේජෝ ධාතුව යයි මෙනෙහි කරයි. **යං වා පන** යනු මේ ශරීරයෙහි ප්‍රකෘතික වූ එක් සෘතුවක් ඇත. එය පර්යාය අර්ථයට පැමිණියේය. බාහිර

තේජෝ ධාතු නිද්දේසයෙහි ගිනිකාෂ්ට නිසා ගිනි ඇවිලී කාෂ්ටද අල්වාගෙන නැගෙන ගින්න **කට්ඨග්ගි** නම්. **සකලිකග්ගි** ආදියෙහිද මෙම නයයි. **සංකාරග්ගි** යනු කසල එකතුකර දල්වන ලද ගින්නයි. **ඉන්දග්ගි** අකුණු ගිනිය. **අග්ගිසන්තාපො** ගිනිදැල්වලින් හෝ ගිනිඅඟුරුවලින් හෝ තැවීමය. **සුරියසන්තාපො** හිරුගේ තැවීම. **කට්ඨසන්නිචය සන්තාපො** කාෂ්ට සමූහය ඇති තාපය. සෙස්සෙහිද මෙම නයයි. **යං වා පන** ප්‍රේත ගිනි කල්ප විනාශ ගිනි නිරය ගිනි ආදිය මෙහි පර්යාය වශයෙන් පිවිසී ඇත.

වායෝ ධාතු නිද්දේසයෙහි හැමීම් වශයෙන් **වායො** වේ. වායුවම වායෝ භාවයට ගිය බැවින් **වායොගතං** වේ. **ථම්භිතත්තං** රූපස්ස වෙන් නොවූ රූපයෙන් එකට බැඳුණු බව. **උද්ධංගමා** වාතා රාමසැර ඉක්කා උඩට නගන වාතය. **අධොගමා වාතා** මල බැහැර කරවන යටට හරවන වාතය. **කුච්ඡිසයා** වාතා ඇතුළත වාතය. **කොට්ඨසයා වාතා** පිටත වාතය. **අංගමංගානුසාරිනො** වාතා නහරවැල් දැල ඇසුරෙන් මුළු සිරුරෙහි අංගයක් පාසා විසුරුවන හකුලන දිගහැරීම් කරන වායුව. **සත්ථක** වාතා හන්දි බැඳුම් කතුරකින් කපන්නාක් මෙන් පවතින වායුව. **ඛුරක** වාතා කරයෙන් මෙන් හෘදය පෙළන වායුව. **උප්පලක වාතා** හදමස උපුටන වායුව. **අස්සාසො** ඇතුළට පිවිසන නාසික වායුව. **පස්සාසො** පිටත නික්මෙන නාසික වායුව. මුලින් කී සියල්ල වායුවෙන් හටගත්තේය. ආශ්වාස ප්‍රශ්වාස සිතෙන් හටගත්තේය. මෙය මෙහි පද වර්ණනාවයි.

මෙය වනාහි මෙනෙහි කිරීමේ විධානයයි. මෙහි භික්ෂුව උද්ධංගමාදි බෙදීම් ඇති වායුව උද්ධංගමාදි වශයෙන් විමසා උද්ධංගම වායුව මේ ශරීරයෙහි වෙන්වූ කොටසකි. අචේතනය, අව්‍යාකෘත්‍ය, ශූන්‍යය, අනාත්මය, පුම්බවන ආකාර ඇති වායෝ ධාතුවයයි මෙනෙහි කරයි. සේසද මෙම නයයි. යං වා පන සෙසු වායු කොටසෙහි ඇතුළත් වායුව මෙහි පිවිසේ. බාහිර වායෝ ධාතු නිද්දේසයෙහි **පුරත්ථිමා වාතා** පෙරදිග දෙසින් එන වායුව. බටහිර උතුර දකුණද එසේය. **සරජා** වාතා දූවිලි සමග හමන වායුව. **අරජා** වාතා රජස් විරහිත පිරිසිදු වායුව. **සීතා** සීත ඍතුවෙන් හටගත් සීතල වලාකුළු අතර හටගත් වායුව. **උණ්හා** උණුසුම් ඍතුවෙන් හටගත් උණුසුම් වලාකුල් අතර හටගත් වායුව. **පරිත්ත** මඳමරු **අධිමත්** බලවත් වායුව. කාළා කළුවලා අතර හටගත් වායුව. **වෙරම්භ** වාතා යොදුනක් උඩින් හමන වායුව. **පක්ඛ වාතා** අඩු වශයෙන් මැස්සන්ගේද පියාපත් සැලීමෙන් වන වායුව. **සුපණ්ණ** වාතා ගුරුළු පියාපතින් මෙයද පක්ඛවාතයයි කැමති වේ. උස්සන්න වශයෙන් වෙනම

ගන්නා ලදී. **තාලවණ්ට** වාතා තල්වැටින් හෝ මෙවැනි වටකුරු දෙයකින් හටගන්වන වායුව. **විධූපන වාතා** විජිනිපතින් හටගන්වන වායුව මේ තලවැට විජිනපත්වලින් හටගැන්වූ වායුව මේ තල්වැට විජිනිපත් නැතිවද උපදී. **යං වා පන** පෙලෙහි ආ දෙය හැර සෙසු වායු පර්යාය අර්ථයෙන් පිවිසියේය. ආකාස ධාතු නිද්දේසයෙහි ප්‍රතිගැටුමකින් නොඅදීයයි ආකාස වේ. ආකාසයම ආකාසබවට ගියබැවින් **ආකාසගතං** වේ. අඝං අගසම අඝය, අඝභාවයට ගිය බැවින් අඝගතං වේ. **විවරො** අතරය එයම විවරබවට ගිය බැවින් විවරගතං වේ. **අසමඵුට්ඨං මංසලොහිතෙහි** යනු මස් ලේවලින් ඉවත් කළ, කන්සිදුරු ආදිය එහිම ප්‍රභේද දැක්වීමයි. එහි **කණ්ණච්ඡිද්දං** යනු කනෙහි සිදුරු විවර මස් ලේවලින් ස්පර්ශ නොකළ ආකාසය සෙස්සෙහිද මෙම නයයි. යෙන යම් විවරයකින්, මේ සියල්ල නොපැසූ කසට බවට පැමිණ නික්මෙයි. ඒ උදරපටලයට යාව වියතයි සතරඟුලක් වූ මල මගින් මස් ලේවලින් නොවැකි සිදුරක් ආකාස ධාතුව යයි දතයුතුය. **යෙන** යම් විවරයකින් මෙය කෑම ආදී බේදයෙහිය. ගිලිය යුතු දේ ගිලියි. ඇතුළත පිවිසවයි. **යත්ථ** යම් කෙළවරක උදරපටල සංඛ්‍යාත අවකාසයෙහි මෙහි සතරාකාර ගිලීමක් තිබේ. යං වා පන මෙහි සම් මස් නහර ඇට ලොම් අතර යන මේවා සියල්ල පර්යාය වශයෙන් පිහිටා ඇත. බාහිර වූ ආකාස ධාතු නිද්දේසයෙහි අසමඵුට්ඨං චතුහි මහා භූතෙහි සතර මහභූතවලින් ඉවත් කළ බිත්ති සිදුරු කවුළු සිදුරු ආදිය දතයුතුය. මෙයින් යම් අහසක පරිකර්ම භාවනා කරන්නහුට සතරවන පස්වන ධ්‍යාන උපදීයයි කියන ලදී.

විඤ්ඤාණ ධාතු නිද්දේසයෙහි චක්ඛු විඤ්ඤාණ සංඛ්‍යාත ධාතු **චක්ඛු විඤ්ඤාණ ධාතු** වේ. සෙස්සද මෙසේය. මේ ධාතු හයෙහි ඇතුළත් වූ ධාතු ගත්විට අටළොස් ධාතුම ගත්තා වේ. කෙසේද? පඨවි, තේජෝ, වායෝ ධාතු ගැනීමෙන් ඵොට්ඨබ්බ ධාතුවද ගත්තේ වෙයි. ආපෝ ආකාස ධාතු ගැනීමෙන් ධම්ම ධාතුද විඤ්ඤාණ ධාතු ගැනීමෙන් ඊට පෙර හා පසු වූ බැවින් මනෝ ධාතුද ගත්තා වෙයි. චක්ඛු විඤ්ඤාණ ධාතු ආදිය සූත්‍රයෙහි ආවේමය. සෙසු නවය ගෙනහැර දැක්විය යුතුය. **චක්ඛු විඤ්ඤාණ** ධාතු ගැනීමෙන් එහි නිශ්‍රය වූ චක්ඛු ධාතු අරමුණ වන රූප ධාතුද ගත්තා වෙයි. මෙසේ සෝත විඤ්ඤාණ ධාතු ආදිය ගැනීමෙන් සෝත ධාතු ආදිය යන අටළොස් ධාතුම ගත්තා වෙයි. ඒවා අතර ධාතු දහයකින් රූපය ගන්නා ලදැයි කියන ලදී. ධාතු සතරක් අරූප පරිග්‍රහ වේ. ධම්ම ධාතුව රූපඅරූප දෙකම ගන්නේය. මෙසේ දහයමාරක් රූප පරිග්‍රහණය කර ඇතැයි කියන ලද්දේ වෙයි. ධාතු සතරක් අරූප පරිග්‍රහය.

ධාතු අටහමාරක් අරූප පරිග්‍රහය. රූපාරූප පරිග්‍රහය කියන ලදී. රූපාරූප පංචස්කන්ධය එය දුක්ඛ සත්‍යය වේ. එය හටගන්වන ලද මුල් තෘෂ්ණාව සමුදය සත්‍ය වේ. දෙකම නොපැවැත්ම නිරෝධ සත්‍ය වේ. එය දැනගන්නා මග මාර්ග සත්‍ය වේ. මේ චතුරාර්ය සත්‍ය කර්මස්ථානයයි. අටළොස් ධාතු වශයෙන් පිවිස ගත් භික්ෂූන් වහන්සේට රහත්බව මුදුන් පමුණුවා නික්මයෑම කියන ලදැයි දතයුතුය.

දැන් දෙවන සය දක්වන්නේ **අපරාපි ඡ ධාතුයො** යනාදිය කීහ. එහි **සුඛධාතු දුක්ඛධාතු** යයි කායප්‍රසාද වස්තු සැප දුක් හා ඊට ප්‍රතිපක්ෂ වශයෙන් යුගලයකින් දක්වන ලදී. සැප දුකට ප්‍රතිපක්ෂ වේ. දුක සැපයට ප්‍රතිපක්ෂ වේ. යම් පමණ සැප පැතිරී තිබේ නම් එපමණම දුක පැතිරේ. යම් පමණ දුක පැතිරේ නම් එපමණ සැප පැතිරේ. **සොමනස්ස ධාතු දොමනස්ස ධාතු** යයි මෙයද එවැනි යුගලයක් කරන ලදී. සොම්නසට දොම්නස ප්‍රතිපක්ෂය. දොම්නසට සොම්නස ප්‍රතිපක්ෂය. යම් පමණ සොම්නස පැතිරේ නම් එපමණ දොම්නස පැතිරේ. යම් පමණ දොම්නස පැතිරේ නම් එපමණ සොම්නස පැතිරේ. **උපෙක්ඛා ධාතු අවිජ්ජා ධාතු** මේ දෙකද සමාන වශයෙන් යුගලයක් කරන ලදී. දෙකම අප්‍රකට බැවින් සමානය. එහි සැපදුක් ධාතු ගැනීමෙන් ඒ හා යෙදුණු කාය විඤ්ඤාණ ධාතුවට වස්තුවූ කාය ධාතුද අරමුණු වූ ඵොට්ඨබ්බ ධාතුද ගන්නා ලද්දේ වේ. සොම්නස් දොම්නස් ධාතු ගැනීමෙන් ඒ හා යෙදුණු මනෝ විඤ්ඤාණ ධාතු ගත්තා වේ. අවිජ්ජා ධාතු ගැනීමෙන් ධම්මධාතු ගත්තා වේ. උපෙක්ඛා ධාතු ගැනීමෙන් චක්ඛු සෝත ඝාණ ජිව්හා කාය විඤ්ඤාණ ධාතු මනෝධාතු ගත්තා වේ. කයම වස්තු අරමුණු වූ චක්ඛු ධාතු රූපධාතු ආදිය ගන්නා ලදැයි මෙසේ අටළොස් ධාතුම ගත්තා වේ. දැන් ඒවායෙහි දසධාතු විසින් රූප පරිග්‍රහ අදිය සියල්ල යට කියන ලද නයින් දතයුතුය. මෙසේ එක් භික්ෂුවකගේ රහත්බව මුදුන් පමුණුවා නික්මයෑම කියන ලදැයි දතයුතුය.

**තත්ථ කතමා සුඛධාතු යං කායිකං සාතං** ආදිය යට කියන ලද නයින්මය. තුන්වන සයේ, කාමො වස්තු කාම ක්ලේස කාම යයි කාම වස්තු දෙකකි. එහි ක්ලේශ කාමය අරබයා කාම සම්බන්ධ වූ ධාතු **කාමධාතු** වේ. මෙය කාම සිතිවිල්ලට නමකි. වස්තු කාමය සඳහා කාමය වූ ධාතුව කාමධාතු වේ. මෙය කාමාවචර ධර්මයන්ට නමකි. ව්‍යාපාදය සඳහා වූ ධාතු **ව්‍යාපාද ධාතු** වේ. ව්‍යාපාද සිතිවිලිවලට නමකි. ව්‍යාපාදයම ධාතු ව්‍යාපාද ධාතු වේ. දස ආඝාත වස්තුවල ගැටීමට මෙය නමකි.

හිංසාවෙන් යුක්ත ධාතු විහිංසා ධාතු වේ. හිංසා සිතිවිල්ලට නමකි. විහිංසාම ධාතු **විහිංසාධාතු** වේ. අන්‍ය සතුන්ට හිංසා කිරීමට මෙය නමකි. මෙය අතීත, අනාගත වශයෙන් අර්ථ විභාගය දතයුතුය. සතුන්ට හිංසා කරන්නේ මෙයින්ය. සතුන්ගේ හිංසනය මෙයය හෝ විහිංසා වේ. හිංසා කිරීම එහි ලක්‍ෂණයයි. කරුණාවට ප්‍රතිපක්‍ෂ ලක්‍ෂණය හෝ වේ. අනුන්ගේ සිතෙහි උද්වේගකර හැඟීම් ඇතිකිරීම එහි කෘත්‍යයයි. තම සිතෙහි කරුණාව විනාශ කිරීම හෝ රසයයි. දුක් පැමිණවීම වැටහෙන ආකාරයයි. ගැටීම පදස්ථානය හෝ පදනමයි. ලෝභයෙන් නික්මුණු අලෝභය නෙක්ඛම්ම යයි කියනු ලැබේ. නීවරණයන්ගෙන් නික්මීම ප්‍රථම ධ්‍යානයයි. සියළු අකුසලවලින් නික්මීම සියළු කුසල් වේ. නික්මීමේ සිතිවිලිවලින් යුක්තවීම නෙක්ඛම්ම ධාතු වේ. නික්මීමේ සිතිවිල්ලට නමකි. නික්මීම ධාතු වූයේ **නෙක්ඛම්මධාතු** වේ. සියළුම කුසල්වලට මෙය නමකි. අව්‍යාපාදයෙන් යුක්ත ධාතු අව්‍යාපාද ධාතු වේ. අව්‍යාපාද සිතිවිල්ලට නමකි. අව්‍යාපාදයම ධාතු වූයේ **අව්‍යාපාද ධාතු** වේ. මෙය මෛත්‍රියට නමකි. අවිහිංසාවෙන් යුක්ත වූ ධාතු අවිහිංසා ධාතු වේ. අවිහිංසා සිතිවිල්ලට නමකි මෙය. අවිහිංසාවම ධාතුවූයේ **අවිහිංසාධාතු** වේ. මෙය කරුණාවට නමකි. දැන් එම අර්ථයම දැක්වීමට තත්ථ කතමා කාමධාතු යයි පද විභාගය ඇරඹීය. එහි **පටිසංයුත්තො** යනු එකට යෙදීම් වශයෙන් සම්බන්ධ වීමය. තක්කො විතක්කො ආදිය කියනලද ආකාරයෙන්මය. විහෙඨෙති යනු බාධා කරයි. දුකට පමුණුවයි. හෙඨනා යනු අතින් ගැසීම් ආදියෙන් බාධා කිරීම, දුක් ඉපදවීම. බලවත් වූ හෙඨනය **විහෙඨනා** වේ. මෙයින් හිංසා කෙරේ යනු හිංසනා වේ. බලවත් හිංසාව **විහිංසනා** වේ. ගැටීම රොසනා වේ. බලවත් ගැටීම විරොසනා වේ. වි උපසර්ගය සියළු තැන පදයේ අර්ථය දියුණු කරයි. නැසීම මෙයින් කෙරේ යනු උපඝාතයයි. අනුන් නැසීම පරූපඝාතො වේ. මෙයින් මෛත්‍රිය කෙරෙත්නුයි මෙත්ති වේ. මෛත්‍රී කරන ආකාරය මෙත්තායනා වේ. මෛත්‍රියෙන් යුක්තවූයේ මෛත්‍රිය සමග වූ බව **මෙත්තායිතත්තං** වේ. ව්‍යාපාදයෙන් වෙන්වුණු සිතේ විමුක්තිය **චෙතොවිමුත්ති** වේ. මෙහිද මුලින්කී තුනෙන්ද උපචාර අර්පණාවලට පැමිණියේ මෛත්‍රිය කියන ලදී. පසුව කියන්නේ අර්පණාවලට පැමිණි අයටය. මෙයින් කරුණාව කෙරේ යනු කරුණා වේ. කරුණාව කරන මාර්ගය **කරුණායනා** වේ. කරුණාවෙන් යුක්තවූ බව **කරුණායිතත්තං** වේ. විහිංසාවෙන් වෙන්වූ සිතේ මිදීම චෙතොවිමුත්ති වේ. මෙහිද පෙර පරිදිම උපචාර අර්පණා භේදය දතයුතුය. දෙතැනම අවසාන පදයෙහි මෙත්තා කරුණා යන චෙතො විමුත්තිය

විසේසන කිරීම සඳහා කියන ලදී. මෙහිද සත්වයන් කෙරෙහිද සංස්කාරයන් කෙරෙහිද කාම සිතිවිලි උපදී. දෙතැනම උපන් සිතිවිලි කර්මපථයට පැමිණේ. ව්‍යාපාදය වනාහි සත්වයන් කෙරෙහි උපදිනවිට පමණක් කර්මපථ වේ. අනිකෙහි නොවේ. මෙහි නය විහිංසාවමය. මෙහිද අදහස් දෙකකි. සර්වසංග්‍රාහික සහ අසම්භන්න වශයෙනි. කාමධාතු ගැනීමෙන් ව්‍යාපාද විහිංසා ධාතුද ගන්නා ලදී. කාමධාතුවෙන් බැහැරකොට මේ දෙකම දක්වන ලදී. මෙය මෙහි සර්වසංග්‍රාහික අදහසය. ව්‍යාපාද විහිංසාධාතු හැර සෙසු සියල්ල කාමධාතුවමය යනු අසම්භින්න අදහසය. නෙක්ඛම්ම ධාතු ගැනීමෙන් අව්‍යාපාද අවිහිංසා ධාතු ගන්නා ලද්දේමය. කාමධාතුව බැහැරකොට මේ දෙකම දක්වන ලදී. මෙහිද මෙය සර්වසංග්‍රාහික මතයයි. අව්‍යාපාද අවිහිංසා ධාතු හැර සෙසු සියල්ල නෙක්ඛම්ම ධාතු යනු අසම්භින්න මතයයි. මේ ධාතු සය ගැනීමෙන් අටළොස් ධාතුම ගත්තා වේ. සයේ තුනක් වශයෙන් දහඅටක් වේ. මෙසේ නොගෙන එක එක සයෙහි කීනයින් දහඅට දහඅට කොට සියල්ල දහඅටකට එකට කැටිකොට දහඅටක්ම වේයයි දතයුතුය. මෙසේ මේ සූත්‍රාන්ත භාජනියෙහි ධාතු දහසයක් කාමාවචරය. දෙකක් ත්‍රෛභූමිකයයි මෙසේ මෙහි සම්මර්ශන වාර කියනලදැයි දතයුතුය.

අභිධර්ම භාජනියෙහි ස්වරූපයෙන්ම සියළු ධාතු දක්වන්නාහු අටළොස් ධාතුවල චක්ඛුධාතු රූපධාතු යනාදිය කීහ. එහි උද්දේස වාරයෙහි එතෙක්:-

**අරුත් ලකුණු විසින් - පිළිවෙළ ගණන ලෙසිනා**
**දැකිය යුතු පසයෙහි - විනිස දතයුතු වේමැයි**

එහි අර්ථ වශයෙන් බලන්නේ චක්ඛු වේ. වෙනස් වන්නේ රූප වේ. ඇසේ දැකීම චක්ඛු විඤ්ඤාණය වේ. මේ ආදි නයින් චක්ඛු ආදියේ වෙසෙස් අරුත් විනිස දැනගත යුතුය. අවිශේෂයෙන් වනාහි නියම කරයි. දරනු ලැබේ. විධානය මෙයින් කරනු ලැබේ. හෝ මෙහි දරයි යනු ධාතු වේ. ලෞකික වශයෙන් හේතුබවින් නියමකොට රන්රිදීධාතු මෙන් රන් රිදී ආදිය සසර දුක් නියම කරයි. භාරහාරවල භාරයක් මෙන් සත්වයන් විසින් නියම කරනු ලැබේ. දරනු ලැබේ යන අර්ථ වේ. වසඟව නොපවත්නා හෙයින් මේවා දුක් නියම කිරීමක් පමණය. මෙය සසර දුක පිළියෙල කරනු ලැබේය එම දුක් දරනු ලැබේය තබනු ලැබේය යන අර්ථයි. මෙය චක්ෂු ආදී එක් එක් ධර්මයෙහි හටගත් අයුරු පෙන්වයි.

දරනු ලැබේ ආදි අර්ථ වශයෙන් ධාතු යයි කියනු ලැබේ. තවද තීර්ථකයන්ගේ ආත්මය නම් කිසිවක් නැත. එය එසේ නොවේ. ඒවා වනාහි තමාගේ ස්වභාවය දරන නිසා ධාතුයයි කියනු ලැබේ. ලෝකයෙහි රන්සිරියල් රත්සිරියල් ආදිය ගල් අවයව නිසා ධාතු යයි කියනු ලැබේ. එසේ ඒවාද ධාතු මෙන් ධාතුය. නුවණින් දතයුතු අවයව නිසා ඒවා විචිත්‍රය. ශරීරය නම්වූ සමූහයේ රසලේ ආදියෙහි ඔවුනොවුන් විසභාග ලක්ෂණවලින් වෙන්කිරීම ධාතුයයි දතයුතුය. එසේම මේ පංචස්කන්ධ නම්වූ ආත්මභාවයේ අවයවවල ධාතු සංඥාව දතයුතුය. අන්‍යොන්‍ය විෂභාග ලක්ෂණවලින් චක්‍ෂු ආදිය වෙන්කර ඇතත් ධාතු යනු ජීවියෙක් නොවේ යන්නට පර්යාය වචනයකි. එසේම භාග්‍යවතුන් වහන්සේ "ඡ ධාතුකො අයං භික්ඛු පුරිසො" යනාදියෙහි ජීව සංඥාව ඉවත් කිරීමට ධාතු යන දේශනාව කළ සේක. එසේ හෙයින් කියන ලද අර්ථයෙන් ඇසද ඒ ධාතුවදැයි චක්ඛධාතු............මනෝවිඤ්ඤාණයද ඒ ධාතුවදැයි මනෝවිඤ්ඤාණධාතු යයි මෙහි අර්ථ වශයෙන් විනිස දතයුතුය.

ලක්ෂණාදි වශයෙන් චක්‍ෂු ආදීන්ගේ ලක්ෂණ වශයෙන්ද මෙහි විනිස දතයුතු ඒවායේ ලක්ෂණාදිය යට කියනලද පරිදි දතයුතුය. කම යන මෙහි පෙර කියනලද උත්පත්ති ක්‍රම සහ දේශනා ක්‍රමද යෙදේ. හෙද වනාහි හේතුඵල අනුපූර්ව විභාග කිරීම් වශයෙන් කියන ලදී. චක්ඛුධාතු රූපධාතු යන මේ දෙක හේතුවය. චක්ඛු විඤ්ඤාණධාතු යනු ඵලයයි. මෙසේ පියවි තන්හි ක්‍රම වශයෙන් දතයුතුය. තාවත්වතො යනු ඒතාක් ස්වභාව වශයෙන් ඒ ඒ සූත්‍ර අභිධර්ම පදවල මෙය කියන ලද්දේ වේ. ආලෝක ධාතු සුභධාතු ආකාසානඤ්චායතන, විඤ්ඤාණඤ්චායතන, අකිඤ්චඤ්ඤායතන, නෙවසඤ්ඤානාසඤ්ඤායතන, සඤ්ඤාවෙදයිත නිරොධ, කාම, ව්‍යාපාද, විහිංස, නෙක්ඛම්ම, අව්‍යාපාද, අවිහිංසා, සුඛ, දුක්ඛ, සෝමනස්ස, දෝමනස්ස, උපෙක්ඛා, අවිජ්ජා, ආරම්භ, නික්ඛම, පරක්කම, හීන, මජ්ඣිම, පණීත, පඨවි, ආපෝ, තේජෝ, වායෝ, ආකාස, විඤ්ඤාණ, අසංඛත, අනේක, නානාධාතු ලෝකය යයි මේ ආදි තවත් ධාතු පෙනේ. මෙසේ ඇතිකල්හි සියල්ල වශයෙන් සීමා නොකොට කුමක් හෙයින් අටළොස් යයි මෙයම සීමා කෙළේද? ස්වභාව වශයෙන් විද්‍යමාන සියළු ධාතු එහි අන්තර්ගත බැවින් එසේ සීමා කරන ලදී. ආභා සුභ ධාතු රූපධාතු හා සම්බන්ධය කුමක්ද? සුභ නිමිත්තෙහි සුභධාතු ඇත. එය රූපාදියෙන් වෙන්ව නොපවතී. කුසල විපාක අරමුණු හෝ රූපාදියම වේ. ආකාසානඤ්චායතනාදියෙහි සිත මනෝවිඤ්ඤාණධාතු

වේ. සෙසු ධාතු ධම්මධාතු වේ. සඤ්ඤාවෙදයිතනිරොධධාතු ස්වභාවයෙන් නැත. එය වනාහි ධාතු දෙකක නිරෝධය පමණය. කාමධාතු ධම්මධාතු මාත්‍රයක් පමණක් හෝ වේ. එහි කාමධාතු කවරේද කාමයෙන් යුත් තර්කය.........වැරදි සංකල්පයකි. අටළොස්ධාතු හෝ යම්සේ කීවේද "අවීචි නිරය අවසන්කොට උඩින් පරනිර්මිත වසවර්ති කෙළවර කොට මේ අතරෙහි මෙහි අවසන්කොට ස්කන්ධ, ධාතු, ආයතන, රූප වේදනා, සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණ යන මෙය කාමධාතු යයි කියනු ලැබේ. නෙක්ඛම්මධාතු ධම්මධාතුමය. සියළු කුසලකර්ම නෙක්ඛම්මධාතු හෝ යන වචනයෙන් එහි මනෝවිඤ්ඤාණධාතුද ඇත.

ව්‍යාපාද විහිංසා අව්‍යාපාද අවිහිංසා සුඛ දුක්ඛ සෝමනස්ස දෝමනස්ස උපෙක්ඛා, අවිජ්ජා, ආරම්භ, නික්ඛම, පරක්කම ධාතු ධම්ම ධාතුමය. හීන මජ්ඣිම පණීත ධාතු අටලොස් ධාතු මාත්‍රයකි. හීනවූ චක්ඛු ආදිය හීනධාතු වේ. මජ්ඣිම පණීත චක්ඛු ආදිය මජ්ඣිම පණීත ධාතු වේ. නිෂ්පර්යාය වශයෙන් අකුසල ධම්මධාතු මනෝවිඤ්ඤාණධාතු හීනධාතු වේ. ලෞකික කුසල අව්‍යාකෘත දෙකද චක්ඛුධාතු ආදියද මජ්ඣිම ධාතු වේ. ලෝකෝත්තර ධම්මධාතු මනෝවිඤ්ඤාණධාතු ප්‍රණීත ධාතු වේ. පඨවි, ආපෝ, තේජෝ, වායෝ ධාතුද ඵොට්ඨබ්බ ආකාස ධාතුද ධම්මධාතුම වේ. විඤ්ඤාණධාතු චක්ඛුවිඤ්ඤාණාදි සත් විඤ්ඤාණ ධාතු සංක්‍ෂෙපයෙන්ම, ධාතු දාහත, ධම්මධාතුවේ ඒකදේසයක් වූ සංඛත ධාතු, ධම්මධාතුවේ ඒකදේසයක් වූ අසංඛත ධාතු, අනේධාතු, නානාධාතු ලෝකය අටළොස්ධාතු මාත්‍රයක්ම යයි ස්වභාවයෙන් ඇති සියළු ධාතු ඊට ඇතුළත් නිසා ධාතු දහඅටක් යයි කියන ලදී. තවද විශේෂ දැනීම් ස්වභාව විඤ්ඤාණයෙහි ජීව සංඥා ඇත්තන්ගේ ජීවසංඥාව උදුරා දැමීම සඳහාද ධාතු දහඅටක් කියන ලදී. දැනගැනීම් ස්වභාව විඤ්ඤාණයෙහි ජීවසංඥා සත්ත්වයෝ වෙති. ඔවුන්ගේ චක්ඛු, සෝත, ඝාණ, ජිව්හා, කාය විඤ්ඤාණ, මනෝ විඤ්ඤාණධාතු භේදයෙන් එහි නොයෙක් චක්‍ෂුරාදි ප්‍රත්‍යයට අයත් පැවැත්ම හෙයින් අනිත්‍ය බවද ප්‍රකාශකොට දීර්ඝ කාලයක් නිදාසිටි ජීව සංඥාව ඉවත්කරනු කැමති භාග්‍යවතුන් වහන්සේ අටළොස් ධාතු ප්‍රකාශ කළහ.

කෙටි විතර නයනුව - දහම් පවසන ලද්දේ
විනෙදන හද අඳුර - සෙද වියැකේ මිලින වී

මෙසේ මෙහි තාවත් වශයෙන් විනිස දතයුතුය. සංඛත වශයෙන් චක්ඛුධාතුව ජාති වශයෙන් චක්‍ෂුප්‍රසාද වශයෙන් එක ධර්ම කොටසකට වැටේ. සෝතපසාදාදි වශයෙන් සෝත ඝාණ ජිව්හා කාය රූප සද්ද ගන්ධ රස ධාතුද එසේය. ඵොට්ඨබ්බධාතු පඨවි තේජෝ වායෝ වශයෙන් ධර්ම තුනක සංඛ්‍යාවට වැටේ. චක්ඛු විඤ්ඤාණධාතු කුසලාකුසල විපාක වශයෙන් ධර්ම දෙකක සංඛ්‍යාවට වැටේ. සෝත ඝාණ ජිව්හා කාය විඤ්ඤාණධාතු ද එසේය. මනෝධාතු පඤ්චද්වාරාවජ්ජන කුසලාකුසල විපාක සම්පටිච්ඡන වශයෙන් ධර්ම තුනක සංඛ්‍යාවකි. ධම්මධාතුව අරූපස්කන්ධ තුන සුඛුමරූප දහසය අසංඛත ධාතුව වශයෙන් ධර්ම විස්සක සංඛ්‍යාවක් වේ. මනෝවිඤ්ඤාණධාතු සෙසු කුසලාකුසල අව්‍යාකෘත විඤ්ඤාණ වශයෙන් ධර්ම හැත්තෑ හයක සංඛ්‍යාවකි. මෙසේ මෙහි සංඛ්‍යා වශයෙන් විනිස දතයුතුය.

ප්‍රත්‍ය යන චක්ඛු ධාතු ආදීන්ගේ චක්ඛු විඤ්ඤාණධාතු ආදියෙහි විනිස දතයුතුය. මේවායේ ප්‍රත්‍යභාවය නිද්දේස වාරයෙහි එන්නේය. දට්ඨබ්බ යන දට්ඨබ්බ වශයෙන් විනිස දතයුතුය. මේ සියළු සංඛත ධාතුවල පෙරපර වශයෙන් වෙන්වූ ස්ථිර සැප ආත්ම වශයෙන් ශුන්‍ය වූ ප්‍රත්‍යයට අයත් ස්වභාව යයි දතයුතුය. මෙහි විශේෂයෙක් නම් චක්ඛු ධාතුව බෙර ඇසක් මෙන් දැක්කයුතුය. රූපධාතුව ඊට තට්ටුකරන දණ්ඩක් මෙන්. චක්ඛුවිඤ්ඤාණ ධාතුව ඉන් නැගෙන ශබ්දය මෙනි. එසේම චක්ඛුධාතුව කණ්ණාඩියක් මෙනි. රූපධාතුව මුහුණ මෙනි. චක්ඛුවිඤ්ඤාණ ධාතුව මුහුණ නිමිත්ත මෙනි. චක්ඛුධාතුව උක් තල මෙනි. රූපධාතුව යන්ත්‍ර චක්‍රයේ යෂ්ටිය මෙනි. චක්ඛුවිඤ්ඤාණධාතුව උක්පැණි හා තෙල් මෙනි. එසේම චක්ඛුධාතුව යට අරණිය මෙනි. රූපධාතු උඩ අරණිය මෙනි. චක්ඛුවිඤ්ඤාණ ධාතුව ආදියේ පෙර පසු හැසිරීම මෙන් දතයුතුය. ධම්මධාතුවේ වේදනා ස්කන්ධය ඊය මෙන් උල මෙන් දතයුතුය. සඤ්ඤා සංඛාර ස්කන්ධ ඊය උල ඇනුණු ආතුරයා මෙන්ද සඤ්ඤාව ආසා දුක් ඉපදවීමෙන් හිස් මිටක් මෙන්ද අයථාකාර නිමිති ගැනීමෙන් වන මුවකු මෙන්ද සංස්කාරය පටිසන්ධි ඇතිකරන බැවින් ගිනිඅඟුරු වලක බහාලන පුරුෂයකු මෙන්ද දුකින් අනුබඳනා හෙයින් රාජපුරුෂයින් ලුහුබඳින සොරකු මෙන් සියළු අනර්ථ ගෙනදෙන ස්කන්ධ සන්තාන හේතුවෙන් විෂවෘක්‍ෂ බීජයන් මෙන්ද රූපය විවිධ උපද්‍රවවල නිමිති හෙයින් ක්‍ෂුර චක්‍රයක් මෙන් දැක්කයුතුය. අසංඛතධාතු අමෘතය මෙන් ශාන්තිය මෙන් අභය ස්ථානයක් මෙන්ද දතයුතුය. කුමක් නිසාද? සියළු අනර්ථවලට ප්‍රතිපක්‍ෂ බැවිනි. මනෝවිඤ්ඤාණ ධාතුව ගත් අරමුණ හැර වෙනකක් ගෙන

පවත්වන බැවින් වන වඳුරකු මෙන්ද දුර්දමනය වූ වල් අසකු මෙන්ද අහසට දැමූ දණ්ඩක් කැමති සේ පතිත වන්නාක් මෙන් ලෝභ දෝසාදි නා නා ප්‍රකාර කෙලෙස් බැඳීම්වලින් නටන නළුවකු මෙන් දතයුතුය.

නිද්දේස වාරයෙහි **චක්ඛුඤ්ච පටිච්ච රූපෙච** මෙයද දෙකක් නිසා අතිකක්ද කිරිය මනෝ ධාතුවද ස්කන්ධ තුනද යන අර්ථයෙනි. චක්ඛු විඤ්ඤාණ ධාතුවේ ඇස නිශ්‍රය ප්‍රත්‍ය වේ. රූපය ආරම්මණ ප්‍රත්‍ය වේ. කිරිය මනෝධාතුව විගත ප්‍රත්‍ය වේ. අරූප ස්කන්ධ තුන සහජාත ප්‍රත්‍ය වේ. එනිසා මේ චක්ඛුවිඤ්ඤාණ ධාතුව මේ ප්‍රත්‍ය සතර නිසා උපදී. **සොතඤ්ච පටිච්චාති** ආදියෙහිද මෙම නයයි. **නිරුද්ධ සමනන්තරාති** පැවැත්ම නැවතුණු පසු. **තජ්ජාමනොධාතු** ඒ අරමුණෙහි ඇතිවූ කුසලා කුසල විපාක වශයෙන් දෙයාකාර මනෝධාතු සම්පටිච්ඡන කෘත්‍යය. **සබ්බධම්මෙසු වා පන පඨම සමන්නාහාරො** මේ චක්ඛුවිඤ්ඤාණාදි සියළු ධර්ම උපදින කාලයෙහි පළමු එකඟ කිරීමයි. චක්ඛුවිඤ්ඤාණ ධාතු ආදීන්ගේ හෝ අරමුණු සංඛ්‍යාත සියළු ධර්මවල පළමුවන යොමු කිරීමය යන මේ අර්ථය ගතයුතුය. මේවායින් පංචද්වාරාවජ්ජන කෘත්‍ය කිරියමනෝධාතු ගන්නාලදැයි දතයුතුය. **මනෝධාතුයාපි උප්පජ්ජිත්වා නිරුද්ධසමනන්තරාති** මෙහි 'පි' කාරය සම්පිණ්ඩනාර්ථයයි. එහෙයින් මනෝධාතුවද මනෝවිඤ්ඤාණධාතුව යයි මෙහි අර්ථයයි දතයුතුය. එහෙයින් විපාක මනෝධාතුව ඉපදී නිරුද්ධ වූ පසු සන්තීරණ කෘත්‍ය කරන විපාක මනෝවිඤ්ඤාණ ධාතු උපදී. එය නිරුද්ධ වීමෙන් සමනන්තරව වොත්ථපන කෘත්‍ය සිදුකරන කිරියමනෝවිඤ්ඤාණ ධාතුවද ඉපදී නිරුද්ධ වීමෙන් සමනන්තරව ජවන කෘත්‍ය සිදුකරන මනෝ විඤ්ඤාණ ධාතුවද ඉපදී නිරුද්ධ වේ යයි ඒ සියල්ල කියනලදැයි දතයුතුය. මනඤ්ච පටිච්ච භවාංග මනසයි. ධම්මෙ යනු චතුභූමික ධම්මාරම්මණයයි. **උප්පජ්ජති මනෝවිඤ්ඤාණං** යනු ආවර්ජනය සමග ජවනය ඉපදීමය. මේ ස්ථානයෙහි අතගෙනකී ප්‍රශ්නයක් විය. මහා ධම්මරක්ඛිත තෙරුන් වහන්සේ දීඝභානක අභය තෙරුන්ගේ අත ගෙන මෙසේ කීහ. පටිච්ච යයි ආ තැන ආවර්ජනය වෙන් නොකළ යුතුය. භවාංග නිශ්‍රිතයම කළයුතුය. එහෙයින් මෙහි මනස යනු ආවර්ජනා සහිත භවාංග යයි. මනෝවිඤ්ඤාණ යනු ජවන මනෝවිඤ්ඤාණ යයි. මේ අභිධර්ම භාජනියෙහි සෝළසධාතු කාමාවචරය. දෙකක් ලෞකික ලෝකෝත්තර මිශ්‍රව කියන ලදී.

**අභිධර්ම භාජනීයයි.**

අටළොස් ධාතූන්ගේ ප්‍රශ්න විචාරයෙහි යට කියන ලද නය අනුසාරයෙන් කුසලාදි බව දතයුතුය. ආරම්මණ ත්‍රිකයෙහි ධාතු සය සුළු අරමුණු යයි මෙය වනාහි චක්ඛු විඤ්ඤාණාදි පභේද මනෝධාතුවේද රූපාදි අරමුණු පහේ පැවැත්ම සඳහා කියන ලදී. ධාතු දෙක යයි කියන ලද ධම්මධාතු මනෝවිඤ්ඤාණ ධාතූන්ගේ මනායතන ධම්මායතනවල කියන ලද නයින්ම සුළු අරමුණු බව දතයුතුයි. මේ ප්‍රශ්න විචාරයෙහිද සෝළසධාතු කාමාවචරය. චතුභූමික වූ ධාතු දෙකක් ලෞකික ලෝකෝත්තර මිශ්‍රව කියන ලදී. මෙසේ මේ ධාතුවිභංගයද තිපරිවෘත්තය ගෙනහැර බෙදා දේශනා කරන ලදී.

**සම්මෝහ විනෝදනී නම් විභංග අර්ථ වර්ණනාවේ**
**තුන්වන ධාතුවිභංග නිද්දේසයයි.**

# 4.
# සච්ච විභංගය

අනතුරුව සත්‍ය විභංගයෙහි චත්තාරි ගණන වෙන්කිරීමය. අරිය සච්චානි සීමා කරගත් දහම් කොටසය. දුක්ඛං අරිය සච්චං ආදියේ උද්දේස වාරයෙහිː-

ලකුණු ඈ බෙදුමෙන් - නිරුවචන පිරියෙසුමෙන්
අරුත් ඉදිරීමෙන් - අඩු වැඩි නැතිව එලෙසේ

සිව්සස් පිළිවෙළින් - නැණ එහි වන කිස ලෙසින්
බෙදුම් ඇතුළත් වන - උවමින් සතර වගුවෙන්

එක්විදි හිස්බැවින් - ඈ සම විසම විලසින්
දතයුතු විනිස මෙහි - වියතුන් සසුන් නයෙහි

එහි විභාග වශයෙන් දුක්ඛාදියෙහි සතර සතර වූ අර්ථ බෙදන ලදී. දුක්ඛාදිය අවබෝධ කරගන්නන් විසින් තථ අවිතථ අනඤ්ඤථ වශයෙන් අවබෝධ කළයුතුය. මෙසේ කීහː- දුකෙහි පෙළීම් සංස්කරණය කිරීම් තැවීම් වෙනස්වීම් සතර අර්ථය සත්‍ය වේ. අසත්‍ය නොවේ. අන් පරිද්දකින් නොවේ. සමුදයෙහි රැස්කිරීම්, නිධාන, සංයෝග, පළිබෝධ අර්ථ, නිරෝධයෙහි නිදහස, විවේකය, අසංස්කරණය, අමෘතය, අර්ථ මාර්ගයෙහි පැමිණවීම, හේතු, දර්ශන අර්ථ තථ අවිතථ අනඤ්ඤථ වශයෙන් අවබෝධ කළයුතුය. මේ සතර මාර්ගයෙහි මාර්ගස්ථ වූ සත්‍ය වූ අසත්‍ය නොවූ අන් ලෙස නොවූ යයි එසේම දුකෙහි පෙළීම් ආදිය සමුදයෙහි රැස්කිරීම් ආදිය නිරෝධයෙහි නිදහස ආදිය මාර්ගයෙහි පැමිණවීම් ආදිය යයි මේ ආදිය මෙසේ බෙදනලද සතර සතර අරුත් විසින් දතයුතුය. මෙසේ විභාග වශයෙන් දතයුතුය. නිර්වචන ලක්ෂණ ප්‍රභේද වශයෙන් මෙහි පළමුවː- දු යන මේ ශබ්දය නින්දිත යන්නෙහි, 'ඛ' ශබ්දය හිස්බවෙහි අහස මෙන් හිසබව මෙහි පළමු සත්‍ය නින්දිත නොයෙක් උපද්‍රව සහිත හිස් මෝඩ මිනිසුන් හිතන ස්ථිර සැප ආත්ම රහිත බැවින්, නින්දිතබව

හිස්බවද දුකයයි කියනු ලැබේ. 'සං' මේ ශබ්දය සමාගමෙහි, සමෙතං ආදියෙහි සංයෝගය දක්වයි. 'උ' ශබ්දය උදිතං ආදියෙහි ඉපදීම දක්වයි. 'අය' ශබ්දය හේතුව පෙන්වයි. මේ දෙවන සත්‍යය සෙසු ප්‍රත්‍ය සමායෝගය ඇතිවූ කල්හි දුක් ඉපදීමට හේතුවේ. මෙසේ දුක් සංයෝගවීමට හේතුවන බැවින් දුක්ඛ සමුදය යයි කියනු ලැබේ. තුන්වන සත්‍යයෙහි 'නි' ශබ්දය අභාවයෙහිද 'රොධ' ශබ්දය හසුරුවන අර්ථය දක්වයි. එහෙයින් මෙහි සසර හැසිරවීම් සංඛ්‍යාත දුක්ඛ රෝධයේ අභාවය වේ. සියළු ගති ශුන්‍යභාවයෙන් හෝ සංසිඳීමෙන් හෝ ඒනිසා සසර හසුරුවන දුක්රෝධයේ අභාවය වේ. ඊට ප්‍රතිපක්ෂභායෙන් දුක්ඛ නිරෝධ යයි කියනු ලැබේ. දුකේ නොඉපදීම නිරෝධයට ප්‍රත්‍ය වන බැවින් දුක්ඛ නිරෝධ වේ. සතරවන සත්‍යය, යමකින් මේ දුක්ඛ නිරෝධයට යයිද අරමුණු වශයෙන් ඊට අභිමුඛ බැවින් දුක්ඛ නිරෝධයට පැමිණීමේ ප්‍රතිපදාවද වේ. එහෙයින් දුක්ඛ නිරෝධගාමිනී ප්‍රතිපදාවයයි කියනු ලැබේ. එහෙයින් කීහ:- චත්තාරිමානි භික්ඛවෙ අරියසච්චානි කතමානි....... ඉමානි ඛො භික්ඛවෙ චත්තාරි අරිය සච්චානි, අරියා ඉමානි සච්චානි පටිවජ්ජන්ති, තස්මා අරිය සච්චානීති වුච්චන්ති! මහණෙනි, මේ ආර්ය සත්‍යයෝ සතර දෙනෙක් වෙති. කවරේද?......මහණෙනි, මේ ආර්ය සත්‍යයෝ සතරදෙනා වෙති. ආර්යයෝ මේවා අවබෝධ කරති. එහෙයින් ආර්ය සත්‍යයයි කියනු ලැබේ. තවද ආර්යයන්ගේ සත්‍යයයි ආර්ය සත්‍ය වේ. යම්සේ කීහ:- "සදෙවකෙ භික්ඛවෙ ලොකෙ....... මනුස්සාය තථාගතො අරියො තස්මා අරියසච්චානීති වුච්චන්ති" මහණෙනි, දෙවියන් සහිත ලෝකයෙහි...... මිනිසාට තථාගතයන් වහන්සේ ආර්ය වන සේක. එහෙයින් ආර්ය සත්‍යයයි කියනු ලැබේ. එසේ නැතහොත් මේවා අවබෝධ කළබැවින් ආර්යභාවය සිද්ධවූ බැවින් ආර්ය සත්‍ය වේ. යම්සේ කීහ:- "මහණෙනි, මේ චතුරාර්ය සත්‍ය ඇතිසැටියේ අවබෝධ කළබැවින් තථාගතයන් වහන්සේ අර්හත් සම්මා සම්බුද්ධ ආර්යයෝ යයි කියනු ලැබේ. තවද ආර්ය වූ සත්‍ය නිසා ආර්ය සත්‍ය යයි කියනු ලැබේ. අරිය යනු සත්‍ය වූ වෙනස් නොවන්නා වූ අසත්‍ය නොවේ යන අර්ථයයි. එහෙයින් කීහ. මහණෙනි, මේ ආර්ය සත්‍ය සත්‍ය වේ. අසත්‍ය නොවේ වෙනස් නොවේ. එනිසා ආර්ය සත්‍යයයි කියනු ලැබේ. මෙසේ මෙහි නිර්වචන විනිස දැනගත යුතුය.

ලක්ෂණාදි ප්‍රභේද වශයෙන් කෙසේද? මෙහි දුක්ඛ සත්‍යයේ ලක්ෂණය පෙළීමය, එහි කෘත්‍යය තැවීමය, වැටහෙන ආකරය පැවතීමය. සමුදය

සත්‍යයෙහි ලක්‍ෂණය ප්‍රභව යයි, කෘත්‍යය සඳදැමීම් කරණයයි. වැටහෙන ආකාරය පළිබෝධය. නිරෝධ සත්‍යයේ ලක්‍ෂණය සාන්ත බවය, කෘත්‍යය චුතිය නැතිකිරීමය, වැටහෙන ආකාරය නිමිති නැතිකමය. මාර්ග සත්‍යයේ ලක්‍ෂණය පැමිණවීමය, රසය කෙලෙස් නැතිකිරීමය, වැටහෙන ආකාරය ක්‍රියාත්මක වීමය. තවද පැවැත්ම පවත්වන්නා නැවැත්ම නවත්වන්නා පිළිවෙළින් ලක්‍ෂණ වශයෙන්ද සංඛත තෘෂ්ණාව අසංඛත නිවන ලක්‍ෂණ වශයෙන්දැයි මෙසේ මෙහි ලක්‍ෂණාදි ප්‍රභේද වශයෙන් විනිස දතයුතුය. අර්ථ උද්ධරා දැක්වීම් වශයෙන් පළමුව අර්ථ වශයෙන්:- සත්‍යාර්ථය කවරේද? යමෙක් නුවණැසින් පරීක්‍ෂා කරන්නේ මායාව මෙන් මිරිඟුව මෙන් වෙනස්වන, තීර්ථකයින්ගේ ආත්මය මෙන් මුළාකරන නොලැබෙන තත්වයක්ද නොවේ. බාධාකිරීම් ප්‍රභව ශාන්තිය පමුණුවන වෙනස් නොවූ ආකාරයෙන් සත්‍ය වූ ආර්ය ඥාණයට ගෝචර වේ. මෙය ගිනි ලක්‍ෂණය මෙන් ලෝක ප්‍රකෘතිය මෙන්ද විපරීත නොවන නිසා සත්‍ය වූ සත්‍යාර්ථය දැනගත යුතුය. කීහ:- මහණෙනි, මෙය දුකය, මෙය සත්‍යය, මෙය අසත්‍යය නොවේ, මෙය වෙනස් නොවේ. තවද:-

බාදක නැත දුකට - පරහට දුකෙන් එලෙසම
නියාමය බාදක - එයින් සස් යයි දන්නේ

එය හැර නොවේ දුක් - නැත කිසිවක් නැතිව එය
දුක් හේතුව එයයි - මෙසේ සමුදය නම් වේ

හැර නිවන සෙත් නැත - නැත සෙත් එයින් අනිකක්
සෙත්බව් නියාමය - මෙසස් නිවනයි දන්නේ

යවන අන් මග නැත - එය නොයවන්නෙද නොවේ
සස් යැවෙන බවකින් - සස් සම්මුතිය වන්නේ

මෙසස් නොවෙනස් වන - ඇතිවේමය සතරෙහිද
දුක් ඇහි නො වෙසෙස් - කීහ පඬිවරු සසරුත

මෙසේ අරුත් වශයෙන් විනිස දතයුතුය. අරුත් ඉදිරීම් වශයෙන් කෙසේද? මෙහි මේ සච්ච ශබ්දය නොයෙක් අර්ථවල දක්නා ලැබේ. කෙසේද යත්? සත්‍ය කියන්න, නොකිපෙන්න ආදියෙහි වාක් සත්‍යයෙහිද මහණ බමුණෝ සත්‍යයෙහි සිටියහ. ආදියෙහි වෙන්වීමෙහිද නොයෙක්

සත්‍ය කුමට කියත්ද? කුසල් සිරිතම කියන්න. ආදියෙහි දෘෂ්ටයෙහිද සත්‍යය එකක්මය, දෙකක් නැත. ආදියෙහි පරම සත්‍ය වූ නිවනෙහි මෙන්ම මාර්ගයෙහිද සිව් අරිය සස්වල කුසල් කෙතෙක්ද? ආදියෙහි ආර්ය සත්‍යයෙහිද එයද මෙහි ආර්ය සත්‍යයෙහි වැටේ යයි මෙසේ මෙහි අරුත් ඉදිරීමෙහි විනිස දතයුතුය. අඩුවැඩි නොවීම් වශයෙන් ආර්ය සත්‍ය සතරක්ම කියන ලද්දේ කුමක් නිසාද? අනිකකින් සම්භව නොවන නිසාත් අනිකකට ඉවත් නොකළහැකි නිසාත් මේවායින් අධික එකක් හෝ මේවායේ එකක්වත් අඩුවැඩි වශයෙන් වෙනස් නොකළ හැකි නිසාත් වේ. එයින් කීහ:- මහණෙනි, මෙහි ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් එන්නේය, ශ්‍රමණ භවත් ගෞතමයන් දෙසනලද මෙය දුක්ඛාර්ය සත්‍ය නොවේ, දුක්ඛාර්ය සත්‍ය අනිකකි, මේ දුක්ඛාර්ය සත්‍ය හැර වෙනත් දුක්ඛාර්ය සත්‍යයක් මම පණවම්යි කියා නම් එය සිදුනොවේ. මෙයද ශ්‍රමණ ගෞතමයන් දෙසූ ප්‍රථම දුක්ඛාර්ය සත්‍ය මෙය නොවේ, මේ දුක්ඛාර්ය සත්‍ය ඉවත්කොට වෙනත් දුක්ඛාර්ය සත්‍යයක් මම පනවම්යි ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් කියන්නේද එය සිදු නොවේ. තවද භාග්‍යවතුන් වහන්සේ පැවැත්ම සහේතුකවම කීහ. උපාය සහිතව නැවැත්මද කීහ. මෙසේ පැවැත්ම නැවැත්ම ඒ දෙකෙහි හේතු මේවා පරම යයි සතරක්ම කියන ලදී. එසේම දැනගත යුතු ප්‍රහානය කළයුතු අවබෝධ කළයුතු වැඩිය යුතු, තෘෂ්ණාවස්තු තෘෂ්ණාව තෘෂ්ණා නිරෝධය තෘෂ්ණා නිරෝධ උපාය, ඇලීම ඇලීමෙහි ගැලෙන බව ඇලීමෙහි විනාශය ඇලීම විනාශ කරන උපාය වශයෙන්ද සතරක්ම කියන ලදී. මෙසේ මෙහි අඩුවැඩි නොවීම් වශයෙන් විනිස දතයුතුය. පිළිවෙළ වශයෙන් මෙයද දේශනා ක්‍රමයකි. මෙහිද ඕලාරික බව සියළු සතුන්ට සාධාරණ බව පහසුවෙන් දැනගත හැකියයි දුක්ඛ සත්‍යය පළමුවෙන් කියන ලදී. එහිම හේතු දැක්වීම පිණිස ඊට අනතුරුව සමුදය සත්‍යයද හේතු නිරෝධයෙන් ඵල නිරෝධය වේයයි දැනවීම සඳහා නිරෝධ සත්‍යයද එය අවබෝධ කරගැනීමේ මාර්ගය දැක්වීම සඳහා අවසානයේ මාර්ග සත්‍යයද බව සැපයෙහි ඇලුනු සත්වයින්ට සංවේග දැනවීම සඳහා පළමුව දුක්ඛ සත්‍ය කීහ. නොකළ දෙයින් එය නොපැමිණේ. ඊශ්වර නිර්මාණ ආදියක් නොවේ. මෙයින් සිදුවීයයි දැනවීම සඳහා ඉන් අනතුරුව සමුදය ද ඉන්පසු සහේතුකව දුකින් මැඩගත් නිසා කලකිරුණු සිත් ඇති දුකින් ඉවත්වම ගවේෂණය කරන්නාට ගැලවීම දැකීමෙන් ආශ්වාදනය ඇතිකිරීම සඳහා නිරෝධයද ඉක්බිති නිරෝධ අධිගමනය කරන මාර්ගයද දක්වන ලදී. මෙය මෙහි ක්‍රම වශයෙන් විනිස දතයුතුය.

ආර්ය සත්‍යවල යම් ඥාණයක් වේද එහි කිස යයිද සත්‍ය ඥාණයේ කිසදැයි විනිස දැනගත යුතුය. අනුබෝධ ඥාණය පටිවේධ ඥාණය යයි ඥාණය දෙයාකාරය. එහි අනුබෝධ ඥාණය ලෞකික ඇසීම් වශයෙන් මාර්ගයෙහිද නිරෝධයෙහිද වේ. පටිවේධ ඥාණය ලෝකෝත්තරය. නිරෝධය අරමුණුකොට කෘත්‍ය වශයෙන් සත්‍ය සතර අවබෝධ කරයි. යම්සේ කීහ:- මහණෙනි, යමෙක් දුක දකීද දුක්ඛ සමුදයද හේ දකී. දුක්ඛ නිරෝධයද දකී. දුක්ඛනිරෝධගාමිනී ප්‍රතිපදාවද දකීයයි සියල්ල කිවයුතුය. යමක් වනාහි ලෞකිකද එහි දුක්ඛ ඥාණය නැගී සිටීම් ප්‍රවේශවීම් වශයෙන් පවතින සක්කාය දිට්ඨිය නවත්වයි. සමුදය ඥාණය උච්ඡේද දෘෂ්ටියද නිරෝධ ඥාණය සාස්වත දෘෂ්ටියද මාර්ග ඥාණය අකිරිය දෘෂ්ටියද නවත්වයි. දුක්ඛ ඥාණය නිත්‍ය සැප ආත්ම විරහිත ස්කන්ධවල නිත්‍ය සැප ආත්ම සංඥාව සංඛ්‍යාත ඵලයෙහි වැරදි ප්‍රතිපත්තියද සමුදය ඥාණය ඊශ්වර ප්‍රධාන කාලස්වභාව ආදියෙන් ලෝකය පවත්නේය යන අහේතුවෙහි හේතුව යන මානය පවතින වැරදි ප්‍රතිපත්තියද නිරෝධ ඥාණය අරූප ලෝක මුදුන්වල මිදීම යන නිරෝධයෙහි වැරදි ප්‍රතිපත්තියද මාර්ග ඥාණය කාමසුඛල්ලික අත්තකිලමථ යෝගයෙහි අපිරිසිදු මාර්ගයෙහි පිරිසිදු මාර්ගයයි ගැනීම් වශයෙන් පවතින උපායෙහි වැරදි ප්‍රතිපත්තියද නවත්වයි. එයින් කියන ලදී:-

ලොව ලොව පබව ලෝ - නැතිවන සුව එහි උපා
මුළාවන තුරු ඔහු - නො දකිත් සස් එතෙක් කල්

මෙසේ මෙහි ඥාණ කෘත්‍ය වශයෙන් විනිශ්චය දතයුතුය. ඇතුළත් ප්‍රභේද වශයෙන් දුක්ඛ සත්‍යයෙහි තෘෂ්ණාවද අනාශ්‍රව ධර්මයන්ද හැර සෙසු සියළු ධර්ම ඇතුළත් වේ. සමුදය සත්‍යයෙහි සතිසක් වූ තෘෂ්ණාව හැසිරේ. නිරෝධ සත්‍යය අසම්මිශ්‍රය. මාර්ග සත්‍යයෙහි සම්‍යක් දෘෂ්ටි මුඛයෙන් විමංසා ඉද්ධිපාදය පඤ්ඤා ඉන්‍ද්‍රිය පඤ්ඤා බලය ධම්මවිචය සම්බොජ්ඣංගය සම්මා සංකප්පයේ නෙක්ඛම්මාදි කල්පනා තුන සම්මා වාචාහි වචී සුචරිත සතර සම්මා කම්මන්තවල කාය සුචරිත තුන සම්මා ආජීවයෙන් අපිස් සතොස් බවද ඒවා ඇතුළත් ආර්ය සීලයද සද්ධින්‍ද්‍රිය සද්ධාබල ඡන්දිද්ධිපාද සම්මා වායාම වශයෙන් සම්මප්පධාන වීර්යද විරියින්‍ද්‍රිය විරියබල විරිය සම්බොජ්ඣංගයද සම්මා සතිවලින් සතර සතිපට්ඨාන සතින්‍ද්‍රිය සතිබල සතිසම්බොජ්ඣංගයද සම්මා සමාධියෙන් විතක්ක විචාරාදි සමාධි තුන චිත්ත සමාධිය සමාධින්‍ද්‍රිය සමාධිබල පීති

පස්සද්ධි සමාධි උපෙක්ඛා සම්බොජ්ඣංගද ඇතුළත් වේ. මෙසේ මෙහි ඇතුළත් ප්‍රභේද දතයුතුය. උපමා වශයෙන් දුක්ඛ සත්‍යය බරක් මෙන් දැක්ක යුතුය. සමුදය සත්‍යය බර දෙන්නා ලෙසද නිරෝධ සත්‍යය බර බහාතැබීම මෙන්ද මාර්ග සත්‍යය බර බහාතබන උපාය මෙන්ද දුක්ඛ සත්‍යය රෝගයක් මෙන්ද සමුදය සත්‍යය රෝග නිදානය මෙන්ද නිරෝධ සත්‍යය රෝග ව්‍යපසමනය මෙන්ද මාර්ග සත්‍යය බෙහෙත් මෙන්ද දුක්ඛ සත්‍යය දුර්භික්ෂයක් මෙන්ද සමුදය සත්‍යය නියඟය මෙන්ද නිරෝධ සත්‍යය සුභික්ෂය මෙන්ද මාර්ග සත්‍යය වර්ෂාව මෙන්ද තවද වෛරය වෛරයට මුල වෛරය නැසීම වෛරය නසන උපාය වශයෙන්ද විස ගස විසගසට හේතුව විසගස මුලින් සිඳීම සිඳීමේ උපාය වශයෙන්ද බිය බියට මුල නිර්භය නිර්භයට උපාය වශයෙන්ද මෙතෙර මහ ජනප්‍රවාහයද එතෙරට පැමිණීමේ උත්සාහයද වශයෙන් යොදා මේවා උපමා වශයෙන් විනිස දතයුතුය. චතුක්ක වශයෙන් මෙහි දුක ඇත. ආර්ය සත්‍ය නැත. ආර්ය සත්‍ය ඇත දුක නැත. දුක ද ආර්ය සත්‍යය ද ඇත. දුකද ආර්ය සත්‍යය ද නැත. සමුදයාදියෙහිද මෙම නයයි. එහි මාර්ග සම්ප්‍රයුක්ත ධර්ම සාමඤ්ඤ (පැවිදි) පල වේ. 'යමක් අනිත්‍ය නම් එය දුක් වේ' වචනයෙන් සංස්කාර දුකින් දුක් වේ. ආර්ය සත්‍ය නොවේ. නිරෝධය ආර්ය සත්‍යයකි. දුක් නොවේ. ඉතිරි ආර්ය සත්‍ය දෙක අනිත්‍ය බැවින් දුක් වේ. යමක් දැනගැනීම සඳහා භාග්‍යවතුන් වහන්සේ බඹසරෙහි නොවෙසෙති. එබඳු බැවින් උපදනා ස්කන්ධ පහ තෘෂ්ණාව හැර සියළු ආකාරයෙන් දුක්ද ආර්ය සත්‍යයද වේ. මාර්ග සම්ප්‍රයුක්ත ධර්ම සාමඤ්ඤ ඵල වේ. යමක් දැනගැනීම සඳහා භාග්‍යවතුන් වහන්සේ බඹසර විසීද එබඳු බැවින් දුක් නොවේ ආර්ය සත්‍ය නොවේ. මෙසේ සමුදයාදියෙහිද සුදුසු පරිදි යොදා මෙහි චතුක්ක වශයෙන් විනිශ්චය දතයුතුය. ඒකවිධාදි ශූන්‍යතාව යන මෙහි ශූන්‍යතා වශයෙන් සියළු සත්‍යයන් පරමාර්ථයෙන් දක්වන ලදී. විඳින කාරක නිවෙන ගමික අභාවයෙන් ශූන්‍යයයි දැනගත යුතුය. එසේ හෙයින් කියන ලදී.

දුක්ම වේය නැත දුක් විඳින්නෙකු
නැත්මැ කත්‍රැ කිරියාව ඇත්තෙමැයි
සන්සිඳීම ඇත නැත නිවෙන්නෙකු
පාර නම් ඇතත් යන්නෙකු නොමැත්

නැතහොත් - ඒ ශූන්‍යතා අතරින් නිත්‍ය සුබ

ආත්ම ශුන්‍ය වේ.
නිති සුබ සුව සතුව - නැත ආත්මයත් පවතින
නිවන පෙර දෙක හා - වෙන්වේමය ආත්මයෙන්
නිති සුව ආත්මය - විරහිත වේ මගෙහි නම්

නිරෝධය හෝ නිත්‍ය සුභ සුඛ ආත්ම හෝ ශුන්‍ය වේ. නිරෝධය හෝ සෙසු මාර්ග තුන ශුන්‍ය වේ. නිරෝධයද සෙසු මාර්ග තුන ශුන්‍ය වීමෙන් ඵලය හෝ ශුන්‍ය වේ. මෙහි හේතු ඇතිවිට දුකේ අභාවයෙන් ප්‍රකෘතිවාදීන්ගේ ප්‍රකෘතිය මෙන් නිරෝධයේ මාර්ගය ගර්භ නොවේ. (ඵලය හේතුවෙහි ගැබ්නොවේ යයි කී සේය) හේතු ශුන්‍යයෙන් ඵලයද ශුන්‍ය වේ. දුක්ඛ සමුදයන්ගේ හා නිරෝධ මාර්ගයන්ගේ අසමවායයෙන් (එක්තැන් නොවීමෙන්) සමයවාදීන්ගේ ද්වි අනුකය මෙන් හේතු සමවායෙන් හේතුඵල සමවාය නොවේ. එයින් කියන ලදීඃ-

මෙතුනින් නිවන් සහ - නිවුමද වන්නෙ හිස්බව
හිස්බව පලෙන් හේ - ඵපලද හෙයින් ඵලෙසම

මෙසේ ශුන්‍යතා වශයෙන් විනිස දතයුතුය. (ශුන්‍යතා වාදීන් විසින් පුද්ගල නෛරාත්මය මෙන්ම ධර්ම නෛරාත්මය ද පිළිගන්නා ලදී. ඵලය හේතුව තුළ ගර්භව ඇති නිසා හේතුව නැතිවීමෙන් ඵලයද නැතිවේ. මේ ඔවුන්ගේ න්‍යායයි. ප්‍රකෘතිවාදය කපිලගේ සාංඛ්‍ය දර්ශනයෙන් ඉදිරිපත් කරන ලදී. ප්‍රකෘතිය නිත්‍ය පැවැත්මකි. ඵලය විකෘතියකි. ඵලය ප්‍රකෘතියට පැමිණීමෙන් මෝක්ෂය වේ. විකෘතිය ප්‍රකෘතියෙහි ගැබ්ව ඇතැයි යනු ඔවුන්ගේ ඉගැන්වීමයි. සමයවාදීන්ගේ ද්වි අනුකයද ඊට සමානය පරමාත්ම පෘථගාත්මද එම සංකල්පයම වේ. බුදුගොස් හිමියන් මෙහිදී පෙන්වා දෙන්නේ චතුරාර්ය සත්‍යයෙහි ඵලය හේතුව තුළ ගැබ් නොවන බවය. හේතු සමවාය සහ ඵල සමවාය වෙන වෙනම ඇතිමුත් හේතු සමවාය තුළ ඵල සමවාය නැතැයි පෙන්වීමට දුක්ඛ සමුදය (හේතු) සහ නිරෝධ මාර්ග (ඵල) අතර සමවායක් නැතැයි කියන ලදී. - පරිවර්තක)

ඒකවිධාදි වශයෙන් සියළු දුක් පැවතීම් වශයෙන් ඒකවිධය. නාමරූප වශයෙන් ද්විධය. කාම රූප අරූප උප්පත්ති භේද වශයෙන් ත්‍රිවිධය. ආහාර භේදයෙන් චතුර්විධය. ස්කන්ධ භේදයෙන් පංචවිධය. සමුදයද පැවතීම් වශයෙන් ඒකවිධය. දිට්ඨි සම්පයුත්ත විප්පයුත්ත වශයෙන් ද්විධය.

කාම භව විභව වශයෙන් ත්‍රිවිධය. සිව්මගින් ප්‍රහාන වශයෙන් චතුර්විධය. රූප අභිනන්දනාදි බේදයෙන් පංචවිධය. තෘෂ්ණා කාය බේදයෙන් ෂඩ්විධය. නිරෝධය අසංඛත ධාතු භේදයෙන් ඒකවිධය. සඋපාදිසේස අනුපාදිසේස බේදයෙන් ද්වධය භවත්‍රය සංසිඳීම් වශයෙන් ත්‍රිවිධය. සිව්මගින් අවබෝධ කිරීම් භේදයෙන් චතුර්විධය. පංච අභිනන්දන උපසමයෙන් පංචවිධය. සවැදෑරුම් තෘෂ්ණාකය ක්‍ෂයකිරීම් වශයෙන් ෂඩ්විධය. මාර්ගයද වැඩීම් වශයෙන් ඒකවිධය. සමථ විපස්සනා බේදයෙන් ද්වධය. ස්කන්ධ බේදයෙන් ත්‍රිවිධය. ප්‍රදේශ සහිත ඇළම කරන නගරයක් මෙන් ප්‍රදේශ රහිත ස්කන්ධ තුනින් සංග්‍රහ කරන ලදී. යම්සේ කීහ:-

ඇවැත්නි, විසාඛ ආර්ය අෂ්ටාංගික මාර්ගයෙන් ස්කන්ධ තුන සංග්‍රහ කරන ලද්දේ නොවේ. විසාඛ තුන් කඳුවලින් ආර්ය අෂ්ටාංගික මාර්ගය සංග්‍රහ කරන ලදී. සම්මා වාචා කම්මන්ත ආජීව සීලස්කන්ධයෙන් සංග්‍රහ කරන ලදී. සම්මා වායාම සති සමාධි සමාධි ස්කන්ධයේ සංග්‍රහ කරන ලදී. සම්මා දිට්ඨි සංකප්ප පඤ්ඤා ස්කන්ධයේ සංග්‍රහ කරන ලදී. මෙහි සම්මා වාචා ආදී තුන සීලමය වේ. එනිසා ස්වජාති වශයෙන් සීලස්කන්ධයේ සංග්‍රහ කරන ලදී. කෙසේ වුවද පෙලෙහි සීලස්කන්ධ යයි ආධාර විභක්තියෙන් නිර්දේශ කරන ලදී. අර්ථය කරන විභක්ති වශයෙන් දතයුතු. සම්මා වායාමාදි තුන සමාධියට තමාගේ ධර්මතා බැවින් අරමුණෙහි එකඟ බැවින්ද පැමිණවීමට නොහැකිය. වීර්යයෙහි උදව් කිරීමේ කෘත්‍ය සිදුකරන කල්හි සිහියෙන් පානොවන කිස සිදුකරයි. උපකාර ලැබීමෙන් එය කළහැකි වේ. මෙය ඊට උපමාවකි:- නැකත් කෙළියට උයනට ගිය යහළුවෝ තිදෙනෙක් පුෂ්පිත සපුගසක් දැක එතැනට පැමිණියහ. අත් එසවීමෙන් මල් කඩාගැනීමට නොහැකි විය. එකෙක් පිට නැමීය. අනිකෙක් පිටට නැගුනත් කැළඹීම නිසා මල් කැඩීමට නොහැකි විය. අනිකා තම උරහිස දුන්නේය. හේ පිටේ සිට උරහිසේ එල්බී කැමති සේ මල්නෙලා නැකත් කෙළි කළහ. සමානබව මෙසේ දතයුතුය. උයනට ගිය යහළුවෝ තිදෙනා මෙනි. එකට උපන් සම්මා වායාමාදි තුන අරමුණු පිපුණු සල්ගස මෙනි. අරමුණෙහි එකඟබවට පැමිණීමට නොහැකිවීම අත ඔසවා මල් කැඩීමට නොහැකි වූවා මෙනි. වායාම පිටනමා ඉඩදීම මෙනි. සිහිය උරහිස දුන් යහළුවා මෙනි. එකෙක් පිටේ සිට උරහිසේ එල්බී මල් නෙලීමට හැකිවූවා සේ වීරියෙන් උපකාරයද සිහියෙන් පානොවීමද ඉටුකිරීමෙන් අරමුණේ එකඟවීමට සමාධියට හැකිවේ. එනිසා මෙහි සමාධියේ ස්වජාති බැවින් සමාධි ස්කන්ධයෙහි

සංග්‍රහවිය. සම්මා දිට්ඨි සංකප්පවල ප්‍රඥාව තමාගේ ධර්මතාවෙන් අනිත්‍යාදි ත්‍රිලක්ෂණය නිශ්චය කිරීමට නොහැකි වේ. විතර්කයෙහි හැප්පීමෙන් හැකිවේ. කෙසේද? රන්කරුවෙක් කහවණුවක් අතේ තබා එහි සියළු කොටස් බලනු කැමතිව අත්ලෙන් එය පෙරළීමට නොහැක්කේ ඇඟිලිවලින් එය පෙරල පෙරලා බැලීමට හැකිවේ. එසේම ප්‍රඥාව ස්වකීය ධර්මතා බැවින් අනිච්චාදි වශයෙන් අරමුණ නිශ්චය කිරීමට නොහැකි වේ. සිතට අරමුණු කරන ලක්ෂණයෙන් හැප්පෙන නැවත හැප්පෙන කෘත්‍යයෙන් විතර්කයෙන් තට්ටු කරන්නාක් මෙන් පෙරලීමෙන් ගෙන දෙනලද දෙයම නිශ්චය කිරීමට හැකි වේ. එනිසා මෙහිද සම්මා දිට්ඨි දිට්ඨි ස්වජාති හෙයින් ප්‍රඥා ස්කන්ධයෙහි සංග්‍රහ කරන ලදී. සම්මා සංකප්පය කිරිය වශයෙන් සංග්‍රහ කරන ලද්දේ වේ.

මෙසේ මේ කඳු තුනෙන් මාර්ගය සංග්‍රහ වේ. එයින් කියන ලදීඃ- බෙදීම් වශයෙන් ස්කන්ධ ත්‍රය ත්‍රිවිධ වේ. සෝවාන් මාර්ගාදිය වශයෙන් චතුර්විධය. තවද වෙනස් නොවන ලක්ෂණයෙන් හෝ අවබෝධ කරගැනීමේ ලක්ෂණයෙන් ඒකවිධ වේ. ලෞකික ලෝකෝත්තර හා සංඛත අසංඛත වශයෙන් ද්විධය දස්සන භාවනා ප්‍රහාන, වශයෙන් ත්‍රිවිධය. ප්‍රහානය කළයුතු ප්‍රහානය නොකළයුතු ප්‍රහානය කළයුතුද නොකළයුතුද වශයෙන් ත්‍රිවිධය. දැනගත යුතු ආදි බේදයෙන් චතුර්විධය. මෙසේ මෙහි ඒකවිධාදි විනිස දතයුතුය. සභාග විසභාග වශයෙන් අවිතථ ආත්ම ශූන්‍ය වශයෙන් දුෂ්කර ප්‍රතිවේධ වශයෙන් සියළුම සත්‍ය සමාන වේ. එහෙයින් කීහඃ- 'ආනන්දයෙනි, ඔබ කුමක් සිතන්නේද? ඔබ වඩා දුෂ්කර ලෙස හෝ සිදුකිරීමට නොහැකි ලෙස හෝ සලකන්නේ කුමක්ද? යමෙක් යතුරු සිදුරකින් නිවැරදිව පිළිවෙලට ඊයක් විදීමද? යමෙක් සියයට පැලූ කෙස්ගසක අග කෙළවරට ඊයක් විදීමද? ස්වාමීනි, සියයට පැලූ කෙස් ගසක අග කෙළවරට ඊයක් විදීම අතිදුෂ්කර වේ. ආනන්දය, අවබෝධ කරගැනීම ඊටත් වඩා දුෂ්කර වන්නේය. යමෙක් මේ දුක යයි ඇති සැටියෙන් අවබෝධ කරත්ද......... මෙය දුක්ඛ නිරෝධගාමිනී ප්‍රතිපදාව යයි ඇති සැටියෙන් අවබෝධ කරත්ද එය අතිදුෂ්කර වේ. විසභාගවල ස්වලක්ෂණ විභාග කිරීම් වශයෙන් පෙර දෙක ගැනීමට දුෂ්කර බැවින් ගැඹුරු බැවින් ලෞකික බැවින් ආශ්‍රව සහිත බැවින් ද සභාග වේ. එල හේතු වශයෙන් අවබෝධ කළයුතු ප්‍රහාන කළයුතු වශයෙන් විසභාග වේ. අවසාන දෙක ගැඹුරු අර්ථ බැවින් ගැනීමට දුෂ්කර බැවින් ලෝකෝත්තර බැවින් ආශ්‍රව රහිත බැවින් සභාග වේ. විෂය විෂයී

භේදයෙන් සාක්‍ෂාත් කළයුතු වැඩිය යුතු බැවින් විසභාග වේ. පල අපදේස වශයෙන් පළමු තුන්වන දෙක සභාග වේ. සංඛත අසංඛත වශයෙන් විසභාග වේ. හේතු කාරණයෙන් දෙවන සතරවන දෙක සභාග වේ. කුසල් අකුසල් වශයෙන් විසභාග වේ. සංඛත වශයෙන් පළමුවන සතරවන දෙක සභාග වේ. ලෞකික ලෝකෝත්තර වශයෙන් විසභාග වේ. දෙවන තුන්වන දෙක සේක නොවන අසේක නොවන බැවින් සභාග වේ. අරමුණු සහිත හා අරමුණු රහිත බැවින් විසභාග වේ.

මෙසේ මෙම අයුරෙන් - නයෙහි ද සමත් වූවෙක්
දන්නේ අරිය සස් - සම විසම ගිය තැන්හිද

දැන් සංක්‍ෂෙපප වශයෙන් දක්වන ලද දුක්ඛාදිය බෙදා දැක්වීමට **තත්‍ථ කතමං දුක්ඛං අරිය සච්චං ජාතිපි දුක්ඛා** යයි මේ නිද්දේස වාරය අරඹන ලද්දේය. එහි ජාතිය දතයුතුය. ජාතියෙන් දුක්ඛාර්ථය දතයුතුය. ජරා මරණ සෝක පරිදේව දුක් දොම්නස් සිත් තැවුල් අප්‍රියයන් සමග එක්වීම් ප්‍රියයන්ගෙන් වෙන්වීම දතයුතුය. අප්‍රිය සම්ප්‍රයෝගයේ සහ ප්‍රිය විප්‍රයෝගයේ දුක්ඛාර්ථය දතයුතුය. ආශාව දතයුතුය. ආශාවේ දුක්ඛාර්ථය දතයුතුය. ස්කන්ධ දතයුතුය. ස්කන්ධයන්ගේ දුක්ඛාර්ථය දතයුතුය. දුක්ඛාර්ය සත්‍යය කීම සඳහා මේ මාතෘකා වේ. මේ දුක නම් අනේකය. නානාප්‍රකාරය. කෙසේද? දුක්ඛ දුක් වෙනස්වීමේ දුක සංඛාර දුක වැසුණු දුක නොවැසුණු දුක පර්යාය දුක නිෂ්පර්යාය දුක එහි කායික චෛතසික දුක් වේදනා ස්වභාවයෙන්ද නාමයෙන්ද දුක් බව දුක්ඛ දුක නම් වේ. සැප වේදනාව වෙනස්වීමෙන් විපරිණාම දුක වේ. උපේක්‍ෂා වේදනාව සෙසු ත්‍රෛභූමික සංස්කාර උදයව්‍ය වශයෙන් පෙළන බැවින් සංඛාර දුක් නම් වේ. පීළනය වනාහි මාර්ග ඵලස්ථයනටද ඇත. එනිසා මේ ධර්ම දුක්ඛ සත්‍යයට ඇතුළත් බැවින් සංස්කාර දුක් යයි දැනගත යුතුය. කන් කැක්කුම දත් කැක්කුම රාගයෙන් උපදින දැවිල්ල දෝසයෙන් උපදින දැවිල්ල ආදී කායික චෛතසික ආබාධ විචාරා දැනගත යුතු හෙයින් උපක්‍රමයේද අප්‍රකට බැවින් පටිච්ඡන්න දුක් වේ. අප්‍රකට දුක් යයි කියනු ලැබේ. දෙතිස්වද කාරණාදිය නිසා උපදින ආබාධ නොවිචාරාම දැනගත හැකි බැවින් සහ උපක්‍රමයද ප්‍රකට බැවින් අපටිච්ඡන්න දුක් වේ. ප්‍රකට දුක් යයිද කියනු ලැබේ. දුක්ඛ දුක්ඛය හැර සෙසු ඒවා දුක්ඛ සච්ච විභංගයෙහි ආ ජාති ආදි සියළු ඒ ඒ දුක්වල වස්තු භාවයෙන් පරියාය දුක් වේ. එහි පරියාය දුක් නිප්පරියාය දුක් යන මේ පද දෙකේ සිට දුක්ඛාර්ය සත්‍ය

කථාකළ යුතුය. පෙලෙහි අරියසච්ච යයි සංක්ෂේපයෙන්ද විස්තරයෙන්ද එයි. සංක්ෂේපයෙන් ආ තැන සංක්ෂේපයෙන්ද විස්තරයෙන්ද කීමට වටී. විස්තරයෙන් ආ තැන විස්තරයෙන් කීමට වටී. සංක්ෂේපයෙන් නොවටී. මේ ස්ථානයෙහි විස්තරයෙන් ආ බැවින් විස්තරයෙන්ම කිවයුතුය. එහෙයින් විස්තර කරන වාරයෙහි "එහි දුක්ඛාර්ය සත්‍යය කවරේද?" ජාතිපි දුක්ඛා ආදිය යයි ආදි පද ගෙන ජාතිය දතයුතුය. ජාතියේ දුක්ඛාර්ථය දතයුතුයි ආදිය කියන ලදී. එහි ජාති ආදිය පළමුවඃ- එහි ජාතිය නම් කවරේද? එය ඒ ඒ සතුන්ගේ ඒ ඒ සත්ව කොටස්වල ඉපදීම පහළවීම යන මේ පද භාජනිය වශයෙන් දතයුතුය. එහි මේ අර්ථ වර්ණනාවය. **තෙසං තෙසං සත්තානං** මෙය සංක්ෂේපයෙන් නොයෙක් සතුන්ගේ සාධාරණ විස්තරයකි. දේවදත්තගේ ඉපදීම සෝමදත්ගේ ඉපදීම යයි කියන කල්හි සම්පූර්ණ සතුන්ගේ ගැනීමක් නොවේ. සියල්ල පසුව සිදුවේ. මේ පද දෙකෙන් කිසි සතෙක් නොගෙන නැත. පසුව කිසි දැන්වීමක් නොවන්නේ නොවේ. එහෙයින් කියන ලදී. ඒ ඒ සතුන්ගේ තමහි තමහී උපන් ගති වශයෙන් නොයෙක් සත්ව කොටස්වල සාධාරණ විස්තරයයි.

**සත්ත නිකායෙ** යනු සත්වයින්ගේ කොටසෙහි සත්ව සමූහයෙහි යන අර්ථයයි. **ජාති** මේ ජාති ශබ්දය නොයෙක් අර්ථ ඇත. එක් ජාතියක ජාති දෙකක මෙය භවයෙහි එයි. 'විසාඛ, නිගණ්ඨ නම් ශ්‍රමණ ජාතියක් ඇත.' මෙය කොටසෙහිය. 'තිරි නම් තෘණ විශේෂයකි. නැබින් නැගී අහසෙහි ගැටී පැවති සේය.' මෙහි පැනවීමෙහි. ජාති ස්කන්ධ දෙකක සංගෘහිතය මෙය සංඛත ලක්‍ෂණයෙහි. මහණෙනි, මව්කුස පළමුව උපන් සිතක් පළමු විඤ්ඤාණය පහළවීමයි. එය ගෙන ඔහුගේ ජාති වේ. මෙහි ප්‍රතිසන්ධියයි. ආනන්ද, දැන් බෝධිසත්වයෝ ජාතය, මෙහි ප්‍රසූතයෙහි. ජාතිවාදයෙන්, මෙහි කුලයෙහි. යම් හෙයකින් මම නැගනියෙනි, ආර්ය ජාතියෙහි, මෙහි ආර්ය සීලයෙහි එහෙයින් ජායමානවසෙන මෙහි වෙන්වූ ස්වභාවයෙහි. මනාව ඉපදීම් වශයෙන් සඤ්ජාති උපසර්ගය පදාර්ථය වඩන ලදී. බැසගැනීම් වශයෙන් **ඔක්කන්ති**. සංජායන අර්ථයෙන් **සඤ්ජාති**. එය සම්පූර්ණ ආයතන වශයෙන් කියන ලදී. ඔක්කමන අර්ථයෙන් ඔක්කන්ති, එය අණ්ඩජ ජලාබුජ වශයෙන් කියන ලදී. ඔව්හු බිත්තරයෙන්ද වැදෑමසින්ද බැස ගනිති. බැසගන්නවුන්ද පිවිසෙන්නාක් මෙන් ප්‍රතිසන්ධිය ගනු ලැබේ. අභිනිබ්බත්තන අර්ථයෙන් **අභිනිබ්බත්ති**, එය සංසේදජ ඕපපාතික වශයෙන් යුක්ත වේ.

දැන් පරමාර්ථ කතා වේ. පරමාර්ථ වශයෙන් ස්කන්ධම පහළ වේ. සත්වයෝ නොවෙති. එහි ඒකවෝකාර භවයක එක් ස්කන්ධයක්ද චතුවෝකාර භවයක ස්කන්ධ සතරක්ද පංචවෝකාර භවයෙහි ස්කන්ධ පහක්ද යන ගණන දැනගත යුතුය. පාතුභාවො උපත, ආයතනං යන මෙහි ඒ ඒ උපදින ආයතන වශයෙන් සංග්‍රහය දතයුතුය. පටිලාභො පරම්පරාව පහළවීමය. පහළවන්නේ ඒවා ලබාගන්නෝ නොවෙති. අයං වුච්චති ජාති මෙය ජාති යයි කියනු ලැබේ. එය වනාහි ඒ ඒ භවයෙහි පළමු ඉපදීම ලක්‍ෂණ කොට ඇත්තේය. අතීත භවයෙන් මෙහි වැටහෙන ආකාරයයි. දැන් ජාතියේ දුක්ඛ අර්ථය දැනගත යුතුය. මේ ජාතිය තමාම දුක් නොවේ. දුක්ඛ උත්පත්තිය වනාහි වස්තුභාවයෙන් දුක් වේයයි කියන ලදී. දුකෙහි වස්තු කවරේද? එය භාග්‍යවතුන් වහන්සේ විසින් උපමා වශයෙන් බාල පණ්ඩිත සූත්‍රාදියෙහි දේශනා කරන ලදී. අපායිකයන්ට දුක් වේ. සුගතියෙහිද මිනිස්ලොව ගැබ්බැස ගන්නා මූලාකාදි දුක් උපදී. එහි සියළු වස්තු මෙසේය. මෙය ගබ්භොක්කන්ති මූලක භේද දුකය. මේ සත්වයා මව්කුස උපදින්නේ උපුල් පියුම් හෙලපියුම් ආදියේ නූපදියි. ආමාසයට යට ඇලදිව මත පිටකටුව මැද උදරපටලයෙහි (ගර්භාසය) පරම සම්බාධක වූ දැඩි අඳුරෙහි නොයෙක් කුණපගඳින් වැඩුණු අසූචියෙන් පරම දුර්ගන්ධ වායුව ඇති ඉතා පිළිකුල් වූ කුසේ පෙදෙසක කුණුමාළු කුණුකොමුපිඩු ඇති ගවර වලක පණුවෙකු මෙන් උපදී. හේ එහි ඉපිද දසමසක් මව්කුසෙහි හටගැනෙමින් මුල්බැඳ උෂ්ණයෙන් තැම්බුවාක් මෙන් පැසෙමින් පිටිගුලියක් මෙන් තැම්බෙමින් හකුලන දිගහැරීම් නැතිව අධිකවූ දුකක් අනුභව කරයි. මේ ගබ්භාවක්‍රාන්ති දුක්ඛයයි.

ඒ මව වහා පය හැපීම් ගමන්කිරීම් හිඳීම් නැගිටීම් ඉරියව්වලදී සුරා ධූර්තයකු අතට පත් එළුවකු මෙන්ද අහිකුණ්ඩිකයකු අතටපත් සර්ප පැටවකු මෙන්ද ඇදීම් එහාමෙහා ඇදීම් සෙලවීම් ගසාදැමීම් ආදි උපක්‍රමයෙන් අධික දුක් විඳී. මව සිහිල්පැන් පානය කරනවිට සීත නරකයෙහි උපන්නකු මෙන්ද, උණුසුම් කැඳබත් ආදිය අනුභව කරනවිට ගිනිඅඟුරු වැස්සකින් ආකීර්ණ වූවාක් මෙන්ද ලුණුඇඹුල් කනවිට බාර කර්මාදියට පත්වූවකු මෙන්ද ශරීරය අතුල් පතුල් පලා ලුණුඇඹුල් ගැල්වීම් වධයෙන් ඉතා දැඩිදුක් විඳියි. මෙය ගබ්භපරිහරණ දුකයි. මූඪගර්භ වූ (දරු ගැබ විපතට පත්) මවගේ මිතුරු සුහදයින් දැකීම නුසුදුසු කාලයෙහි දුක් ඇතිකල්හි සිඳීම් පැලීම් ආදියෙහි දුක් උපදී. මෙය ගබ්භවිපත්ති

මූලක දුකයි. මව වදන කාලයේ කර්මජ වාතයෙන් කැරකී නරක ප්‍රපාතයට මෙන් ඉතා බිහිසුණු යෝනි මාර්ගයට වැටෙන්නේ ඉතාමත් සම්බාධ සහිත වූ යෝනි මුඛයෙන් යතුරු කපොල්ලකින් අදින්නාක් මෙන් ද මහා නරකයෙහි සතකු මෙන්ද සංඝාට පර්වතවලින් කුඩුකරනු ලබන්නේ මහත් දුක් උපදී. මෙය විජායන මූලක දුකයි. උපන්නහුගේ වනාහි ශරීරය අලුත් තුවාලයක් මෙන් අතට ගන්න නාවන සෝදන රෙදිවලින් පිසින පිරිමදින කාලයෙහි ඉදිකටු මූනත දැලිපිහි මුවත්වලින් විදින පලන සමාන දුක් උපදී. මෙය මව්කුසින් බිහිවන මූලික දුකයි. ඉන්පසුව පැවතීමේදී තමා තමාටම වධ පමුණුවා ගන්නේ අචේලක ව්‍රත වශයෙන් තැවීම් රත්කිරීම් යෝගයන්හි යෙදීමෙන් ක්‍රෝධ වශයෙන් ආහාර නොගැනීමෙන් එල්ලී නැහෙන්නේ දුක් ඇති වෙයි. මෙය අත්තූපක්කම මූලක දුකයි. අනුන්ගේ වධබන්දකවලට භාජනය වීමෙන් දුක් උපදී. මෙය පරූපක්කම මූලදුකයි. මේ සියළු දුක්වලට ජාතිය (උපත)ම වස්තු වේ. එහෙයින් මෙය කියනු ලැබේ:-

නිරය සත්වග මහ - දුක් ලබති ගිනි තැවුලෙන්
නැත දැය දුක් කොයින් - මුනි කී ජාතිය දුකයි

කස කෙවිටි දඬුවෙන් - ලබත් තිරිසන් මහදුක්
දැය හැර නැත දුකක් - එනිසා දැය දුක්ම වේ

පේත විසයෙහි වන - සා පවස අව් සුළඟින්
දැය නැත නැතැයි දුක් - මුනි යු ජාතිය දුකයි

ලොව අතුරු'සුර දුක් - දැඩි'දුර අසහන සිහිල්
දැය නැත නොමැත දුක් - එයින් දැය වේ මහදුක්

වැස'විත් සත පිටත - මව්ගබ'සුචි නිරය මෙන්
පැමිණෙත් දරුණු දුක් - නැත දුක් දැය නොමැති නම්

කියනු කිම බෝ සේ - වෙද කිසිකල කිසි දුකක්
දැය නැත නැත මුනිඳු - යු දැය හැම දුකට මුල්

ජරා නිද්දේසයෙහි ජරා යනු ස්වභාව පැවැත්මයි. ජීරණතා යනු ආකාරය විස්තර කිරීමයි. ඛණ්ඩිච්චං ආදිය කාලාතික්‍රමණයෙන් වන

කෘත්‍ය විස්තරයයි. පසු දෙක ප්‍රකෘති විස්තරයයි. අයං ජරා යන මේ පදයෙන් ස්වභාවය දක්වන ලදී. එයින් එහි මේ ස්වභාව පැවැත්මයි. ජීරණතා යන මෙයින් ආකාර වශයෙන්. එහෙයින් මෙය ආකාර විස්තරයයි. ඛණ්ඩිච්චං යන මෙහි කල් ඉක්මයෑමෙන් දත්, නිය, ආදිය කඩා බිඳ දමන බවට පත්කරයි. වලිත්තචතා යන මෙයින් මස් වියලවා සම රැලිබවට පත්කිරීම දක්වන ලදී. පාලිච්චං කෙස් ලොම්වල පැසුණුබව ඇතිකිරීම. මේ ඛණ්ඩිච්චං ආදි තුන කල් ඉකුත්වීමෙන් කෘත්‍ය විස්තරයයි. ඒවායේ දැකීම් වශයෙන් මේ වෙනස්වීම් ප්‍රකට නිසා ප්‍රකට ජරාව දක්වන ලදී. ජලයේ හෝ වාතයේ හෝ ගින්නේ හෝ තෘණ රුක් සමග එක්වීමෙන් ඒවා කඩාබිඳ දමා හෝ දැවීමෙන් හෝ ගිය මග ප්‍රකටය. ඒ ගියමග ඒවා සමග ජලය ආදිය නොවේ. එසේම ජරාවෙන් දත් ආදිය කඩාබිඳ දැමීමෙන් ගියමග ප්‍රකටය. ඇසහැර බලාගනී. කැඩීම් ආදියද ජරාවද එසේ බලගත නොහැකිය. ජරාව චක්ඛු විඤ්ඤාණයෙන් දැකගත නොහැක. ආයුනො සංහානි ඉන්ද්‍රියානං පරිපාකො යන මේ පදවලින් කාලය ඉකුත්වීමේ ස්වභාවය ආයුෂය ක්‍ෂයවීම චක්ඛු ආදි ඉන්ද්‍රියවල මේරීම් සංඛ්‍යාත ප්‍රකෘතිය දක්වන ලදී. ඒවායින් අවසන් දෙක ප්‍රකෘති විස්තර යයි දතයුතුය. එහි ජරාවට පත්වන්නාගේ ආයු පිරිහේ. එනිසා ජරාව ආයු විනාශ කෙරේ යයි ඵලූපචාර වශයෙන් කියන ලදී. තරුණ කාලයෙහි ප්‍රසන්නය. තමාට අවශ්‍ය සියුම් දේද ගැනීමට සමත් වේ. චක්ඛු ආදි ඉන්ද්‍රිය පරිපාකයට පැමිණ ජරාවෙන් අලලා අපැහැදිලි වූ විට තමාට අවශ්‍ය ඕලාරික දෙයක්ද ගැනීමට අසමත් වේ. එහෙයින් ඉන්ද්‍රියන්ගේ පරිපාකය ඵලූපචාරයෙන් කියන ලදී. එසේ දක්වන ලද සියළුම ජරාව ප්‍රකට අප්‍රකට යයි දෙපරිදිය. එහි දත් ආදිය බිඳුණු බව දැකීමෙන් රූප ධර්මවල ජරාව ප්‍රකට ජරා වේ. අරූපාදියෙහි ජරාව එබඳු වෙනස්වීම් නොපෙනෙන හෙයින් අප්‍රකට ජරා වේ.

එහි දත් ආදියේ පැහැදිලි වර්ණය නිසා එය බිඳුණු බව පෙනේ. එය ඇසින් දැක මනසින් සිතා මේ දත් ජරාවෙන් පහර දෙනලදැයි ජරාව දනියි. ජලය ඇතිතැන බැඳුණු ගෝසිංගාදිය (ඊතණාදි පඳුරු) බලා යට ජලය ඇති බව දැනගන්නාක් මෙනි. අවීචි සවීචි යයි ජරාව මෙසේද දෙපරිදිය. එහි මැණික් රන් ප්‍රවාල සඳ හිරු ආදියේ සහ අඩු දසක ආදියෙහි සතුන් මෙන්ද මල් ගෙඩි කොල ආදියෙහි අප්‍රාණීන් මෙන්ද අතරතුර වර්ණ විශේෂාදිය දැනගැනීමට අපහසු වූ බැවින් එම ජරාව අවීචි ජරා වේ. නිරන්තර ජරා යන අර්ථයයි. සවීචි ජරාව උපාදින්න

අනුපාදින්න වශයෙන් මෙසේ දැක්විය යුතුය. බාල දරුවන්ගේ පළමුවෙන් කිරිදත් නැගේ. ඒවා ස්ථිර නොවේ. ඒවා වැටුණු පසු නැවත දත් හටගනී. ඒවා පළමුව සුදුය. ජරා වාතයෙන් පහර දුන්විට කලු වේ. කෙස් පළමුවෙන් තඹ කලු හෝ සුදු වේ. සම ලේ පැහැ වේ. වැඩෙනවිට සුදුපාට සහ පසුව කළුපාට වේ. ජරාවෙන් මැඩුණු කල රැලි ඇතිවේ. සියළුම සස්‍ය වපුරන කල සුදුපාට වේ. පසුව නිල්වේ. ජරාවෙන් මැඩුණු කල පඬුපැහැ වේ. අඹ අංකුරයද දැක්වීම වටී. අයං වුච්චති ජරා මේ ජරා යයි කියනු ලැබේ. එය වනාහි ස්කන්ධයන්ගේ පරිපාක ලක්‍ෂණයයි. මරණය කරා පැමිණවීම එහි කෘත්‍යයයි. තරුණබව විනාශය එහි වැටහෙන ආකාර යයි. ජරාවේ දුක්ඛර්ථය දැනගත යුතුය යන මෙහි මේ ජරාව තමාම දුක් නොවේ. දුකට වස්තුවන බැවින් දුක් යයි කියන ලදී. කවර දුකකටද? කායික දුක සහ දොම්නස් දුකයි. දිරූ ශරීරය දිරූ කරත්තයක් දුබල වේ. සිටගැනීමට ඇවිදීමට හිඳගැනීමට උත්සාහ කරන්නාට බලවත් කායික දුක් උපදී. මෙසේ මේ දෙකේම දුක් වස්තුභාවයෙන් දුක් යයි දතයුතු. තවද:-

අඟපසඟ අවසඟ - ඉඳුරන් විකල් වීමෙන්
යොවුන්බව වැනසී - බලයද යයි පිරිහිලා

සියසුතනඹුවගෙන් - වෙන්වේය සිය ගණන්වර
නින්දාද ලබමින් - පැමිණෙයි මෝඩකම්වල

යම් දුකක් වේවිද - කායික මානසික වූ
ජරාවෙන් මෙසියල් - එනිසා ජරා දුකමය

මරණය පිළිබඳ විස්තරයෙහි වෙන්වී යෑම් වශයෙන් චුති එක, සතර ස්කන්ධවල චුතියට සමාන වචනයකි. මෙය චවනතා භාව වචනයෙන් ලක්‍ෂණ දැක්වීමය. භෙදො ස්කන්ධවල බිඳීම වෙන්වීම දැක්වීමය. අන්තරධානං තලයක් බිඳුනාක් මෙන් ස්කන්ධවල බිඳීම අභාවය දැක්වීමය. මච්චුමරණං මච්චු සංඛ්‍යාත මරණය, කාලය නම් අන්තකය, ඔහුගේ ක්‍රියාව කාලකිරියා වේ. මෙපමණකින් දක්වන ලද්දේ සම්මුති මරණයයි. දැන් පරමාර්ථ වශයෙන් දැක්වීමට ඛන්ධානං භෙදො යනාදිය කීහ. පරමාර්ථ වශයෙන් ස්කන්ධම බිඳේ. සතෙක් නම් කිසිවකු නොමරයි. ස්කන්ධ බිඳෙන කල්හි සතා මැරේ. බිඳුණු කල්හි මැරුණේ යයි ව්‍යවහාර වේ. මෙහිද චතු පංචවෝකාර වශයෙනි. ඛන්ධානං භෙදො ඒක වෝකාර

වශයෙනි. **කළෙබරස්ස නික්ඛෙපො** චතු වෝකාර වශයෙන් හෝ ස්කන්ධයන්ගේ බිඳීම, සෙසු දෙක වශයෙන් කළේබරස්ස නික්ඛෙපෝ දතයුතුය. කුමක් හෙයින්ද? භව දෙකේම රූපකාය සංඛ්‍යාත කළේබරයේ හටගැනීම නිසාය. චාතුම්මහාරාජිකාදියෙහි ස්කන්ධ බිඳෙන්නේය. කිසිවක් හැර නොදමයි. එහෙයින් ඔවුන්ගේ වශයෙන් ස්කන්ධයන්ගේ බිඳීම වේ. මිනිස් ආදීන් කෙරෙහි කළේබරය හැරදැමීම වේ. මෙහිද කළේබරයේ හැරදැමීම කරන හෙයින් කළේබරස්ස නික්ඛෙපො යයි කියන ලදී. **ජීවිතින්‍ද්‍රියස්ස උපච්ඡෙදො** යන මෙයින් මරණය නම් ඉන්‍ද්‍රිය බද්ධම වේ. අනින්‍ද්‍රිය බද්ධ මරණයක් නම් නැතැයි දක්වයි. සස්‍ය මැරුණේය. ගස මළේය යන මේවා වනාහි ව්‍යවහාර මාත්‍රයකි. මේ වචනවල අර්ථ වශයෙන් ක්‍ෂය ව්‍යය දෙක දක්වයි. **ඉදං වුච්චති මරණං** මෙහි සියළු මරණම කියන ලදී. එසේ වුවද මෙහි ක්‍ෂණික මරණ සම්මුති මරණ සමුච්ඡේද මරණ යන මේවායේ භේදයද දතයුතුය. එහි ඛණික මරණ නම් පැවතෙන රූපාරූප ධර්මයන්ගේ බිඳීමය. තිස්ස මළා, ඵුස්ස මළා යනු සම්මුති මරණය වේ. ක්‍ෂීණාශ්‍රයන් වහන්සේගේ ප්‍රතිසන්ධි රහිත වූ කාලක්‍රියාව සමුච්ඡේද මරණ නම් වේ. මෙහි වනාහි සම්මුති මරණය අදහස් කරයි. ජාතික්ඛය මරණය, උපක්‍රම මරණය, සරස (සියදිවි හානිය) මරණය, ආයුක්ඛය මරණය, පුඤ්ඤක්ඛය මරණය ඊටම නම් වේ. මෙහි ලක්‍ෂණය චුතියයි. කෘත්‍යය වෙන්කිරීමයි. වැටහෙන ආකාරය වෙන්ව විසීමය. මරණයේ දුක්ඛාර්ථය දැනගත යුතුය. මෙහිද මරණය තමාම දුක් නොවේ. වස්තුභාවයෙන් දුක්යයි කියන ලදී. මරණ යයි කායික වේදනා යටි සුළඟට ඇල්ලූ ගිනිහුලක් මෙන් ශරීරය දවයි. නරක නිමිති අරමුණු වනවිට බලවත් දොම්නසක් උපදී. මෙසේ මේ දුක් දෙකම වස්තුවෙන් දුක් යයි දතයුතුය. තවද:-

**පව්කම් පව්කමේ - නිමිති අනුදැක්මෙහි දී**
**සොඳුරු පිය වත්වල - වෙන්වුම නො මැඩලන්නා**

**මියන කල යම් දුක් - මනසට වෙසෙස් නො වෙමින්**
**සියළු එක්වීමෙහි - බැඳුම් සිඳුමෙන් ආදී**

**මරු තැන් විදීමෙන් - දුක් වෙයි සිරුරෙහි උපන්**
**නැත පිළියම් සහන - මෙදුකට යම් ලෙසින් වන**
**එය මරණ වත් නම් - දුක්ම යයි යෙති එහෙයින්**

තවද මේ ජරා මරණ නම් සතුන්ගේ වධක පසමිතුරකු මෙන් සිදුරු සොයමින් හැසිරේ. යම්සේ පුරුෂයකුගේ සිදුරු සොයමින් හැසිරෙන පසමිතුරන් තිදෙනාගෙන් එකෙක් මෙසේ කියයි. මම අසවල් වනය වර්ණනා කර මොහු රැගෙන එහි යමි. මෙය මට දුෂ්කර නැත. දෙවැන්නා මෙසේ කියන්නේය. මොහු රැගෙන ගියකල මම තලා දුර්වල කරමි. එය මට දුෂ්කර නැත. තෙවැන්නා මෙසේ කියන්නේය. ඔබ විසින් තළා මොහු දුර්වල කළපසු තියුණු කඩුවකින් හිස සිඳීම මට බාර වේවා. ඔව්හු මෙසේ කියා එසේ කරන්නාහුය. එහි පළමු පසමිතුරා වනයෙහි වර්ණනාව කියා ඔහු රැගෙන ගිය කාලය මෙන් සුහද ඥාති සමූහයෙන් ඈද යම්කිසි තැනක ඉපදවීම ජාතියේ ක්‍රියාවයි. දෙවැන්නා තළා දුර්වල කරනවා මෙන් උපන් ස්කන්ධයන් වැටී පරාධීනව ඇඳට ඇදදැමීම ජරාවේ ක්‍රියාවයි. තෙවැන්නා සියුම් අවියෙන් හිස සිඳිනවා මෙන් ජීවිතක්‍ෂයට පැමිණවීම මරණයේ කාර්යයි. එසේ දතයුතුය. තවද මෙහි ජාති දුක ආදීනව සහිත මහා කාන්තාරයකට ඇතුළු වූවා මෙනැයි දතයුතුය. මරණ දුක දුර්වලයාගේ ඉරියව් පැවැත්වීම නොහැකිවනු පිණිස නපුරු සතුන් විසින් නොයෙක් ව්‍යසන පැමිණවීම මෙනැයි දතයුතුය. සෝක විස්තරයෙහි ව්‍යසතීති ව්‍යසනං යනු හිතේ සුවය ඉවත් කරයි. නසයි යන අර්ථ වේ. නෑයින්ගේ ව්‍යසනය ඥාති ව්‍යසන වේ. සොර රෝබිය ආදියෙන් නෑයින් විනාශවීම යන අර්ථයයි. එහෙයින් ඥාතිව්‍යසනෙන ඵුට්ඨස්ස වේ. වසා පැතිරගත් වෙළාගත් යුක්ත වූ යන අර්ථ වේ. සෙස්සෙහිද මෙම නයයි. මෙය විශේෂයකි. භෝගවල ව්‍යසනය භෝග ව්‍යසනයයි. රජ සොර ආදී වශයෙන් භෝග ක්‍ෂය, භෝග විනාශය යන අර්ථ වේ. රෝගයම රෝග ව්‍යසන යයි. රෝගො යනු ආරෝග්‍ය විනාශ කිරීමය. සීලයේ ව්‍යසනය සීල ව්‍යසනයයි. දුස්සීල බව මෙය නමකි. සම්‍යක් දෘෂ්ටිය විනාශ කරමින් උපන් දෘෂ්ටියම දිට්ඨි ව්‍යසනයයි. මෙහි පෙර දෙක අනිෂ්පන්න වේ. පසු තුන නිෂ්පන්න වේ. තිලකුණු මඩින ලදී. පෙර තුන කුසල් අකුසල් නොවේ. සීල දිට්ඨි දෙක අකුසල් වේ. **අඤ්ඤතරඤ්ඤතරෙන** යනු මිතුරුව ව්‍යසනයකද යම්කිසි කෙනෙක් නොගැනීමෙන් හෝ යම්කිසි කෙනෙක් ගැනීමෙන් හෝ **සමන්නාගතස්ස** සමාන බැඳීමේ, අත් නොහැරීමේ. **අඤ්ඤතරඤ්ඤතරෙන දුක්ඛධම්මෙන** යනු යම්කිසි සෝක දුක් ඉපදීමේ හේතුවෙන්. **සොකො** සෝකවීම් වශයෙන් සෝකය. මෙය එයින් උපන් සෝකයේ ස්වභාව පැවැත්මය. **සොචනා** සෝකවන ආකාරය. **සොචිතත්ත** සෝකවන බව. **අනෙතා සොකො** අභ්‍යන්තර සෝකය, දෙවන පදය උපසර්ග වශයෙන් වඩන ලදී. එය අභ්‍යන්තරය වියලන්නාක් උපදින

හෙයින් අන්තෝ සෝක අන්තෝ පරිසෝක යයි කියනු ලැබේ. චෙතසො පරිජ්ඣායන්ති සිතේ දැවෙන ආකාරයයි. සෝකය ඉපදුණු විට ගින්න මෙන් සිත දවයි. මොනවට දවයි. මගේ සිත දැවෙයි. මට කිසිදෙයක් නොවැටහෙයයි, යයි කියවයි. දුකින් මනස දුම්මන වන නිසා දෝමනස්ස නම් වේ. ළඟට නොපැමිණි යන අර්ථයෙන් සෝකයටම උලයයි සොක සල්ලං වේ. අයං වුච්චති සොකො මෙය සෝක යයි කියනු ලැබේ. එය වනාහි කිසියම් අර්ථයකින් දොම්නස් වේදනාවම වේ. මෙසේ ඇතිකල්හි ඇතුළත දැවීම් ලක්‍ෂණයයි. නැවත නැවත ඇතිවන පසුතැවිල්ල කෘත්‍යයයි. අනුව සෝකවීම වැටහෙන ආකාරයයි. සෝකයේ දුක්බාර්ථය දතයුතුය. මෙහි මෙය ස්වභාව දුක් බැවින්ද දුකට වස්තුවන බැවින්ද දුක යයි කියන ලදී. කවර දුකකටද? කායික දුකටද ජවන ක්‍ෂණයෙහි දොම්නස් දුකටද වස්තු වේ. සෝක වේගයෙන් හෘදයෙහි මහා ගඩුවක් ඇති වේ. එය නැගී පැසී බිඳෙයි. මුවින් කළු ලේ හෝ නික්මෙයි. බලවත් කායික දුකක් උපදී. මගේ ඤාතීහු මෙපමණක් මියගියහ. මගේ භෝග මෙපමණක් නැතිවිය. මෙසේ සිතන්නාට බලවත් දොම්නසක් උපදී. මේ දුක් දෙකම වස්තු භාවයෙන්ද දුක් යයි දතයුතුය. තවදා:-

හදය සතුනගෙ සොව - උලකින් විදින මෙන් වේ
ගිනියම් යකඩ ලෙස - දවයි නැවතත් බෝ සේ

ගෙනදෙයි ලෙඩරෝග - ජර මර බිඳුම් ඇත්තේ
ඇති හෙයින් නෙක දුක් - දුක් යයි මෙය කියනුයේ

පරිදේව විස්තරයෙහි මගේ දුව මගේ පුතා පෙන්වමින් මෙයින් අඬයි දොඩයි යනු ආදෙව නම් වේ. ඒ ඒ ගුණ කියා ඇඬීම පරිදේව නම් වේ. එයින් පර දෙපදයෙන් පෙර දෙපදයේම ආකාරය ස්වභාවය විස්තර කිරීම් වශයෙන් කියන ලදී. වාචා වචනය. පලාප යනු හිස් නිරර්ථක වචනය. කොටසක් කීම, වෙනින් දෙයක් කීම වශයෙනි. විරූපී පලාපය විප්පලාප වේ. ලාලප්ප යනු නැවත නැවත කීමය. කියන ආකාරය ලලප්පනා වේ. ලාලප්පනයෙහි භාවය ලාලප්පිතත්තං වේ. අයං වුච්චති පරිදෙවො මෙය පරිදේව යයි කියනු ලැබේ. නැවත නැවත කීම එහි ලක්‍ෂණයයි. ගුණදොස් කීම කෘත්‍යයයි. කැරකීම වැටහෙන ආකාරයයි. පරිදේවයේ දුක්බාර්ථය දතයුතුය. මෙය ද තමාම දුක් නොවේ. කායික දොම්නස්වලට වස්තුවන බැවින් දුක් යයි කියන ලදී. වැලපෙන්නා තමාගේ

සිරුර අත්වලින් පෙළයි. දැතින් පපුවට ගසා ගනී. උරච්චි කරයි. බිත්තියේ හිස ගසා ගනී. එයින් ඔහුට බලවත් කායික දුක් ඇතිවේ. මෙපමණ මගේ නෑයෝ මළහයි සිතයි. එයින් ඔහුට බලවත් දොම්නස උපදී. මේ දුක් දෙකම වස්තුභාවයෙන් දුක් යයි දතයුතුය. තවද:-

යම් සෝ සුලක් හද ඇනී වැලපෙන්නවුන්ගේ
තල්ලත් තොලුත් ගෙල ගලත් වියලී අසානෙන්
ඒසා මහත් දුකකටය් සිත ගොස් වැටෙන්නේ
ඒ හන්දමය් එපරිදේව දුකක් කියන්නේ

දුක් දොම්නස් විස්තරය ධම්මසංගහ අටුවාවෙහි යට වර්ණනා කළ බැවින් ප්‍රකටය. ඒවායේ ලක්ෂණාදිය එහි කියන ලද්දේමය. දුක් දුක්ඛාර්ථය දතයුතුය. දොම්නස් දුක්ඛාර්ථයද දතයුතුය. මෙහි මේ දෙකම තෙමේද දුක් බැවින් වස්තුභාවයෙන් දුක් යයි කියන ලදී. අත් පා කන් නාසා සිඳීමෙන් දුකට පැමිණ අනාථ සාලාවක ඉඳුල් කබලක් පෙරටුකොට නිදාගත්විට වණමුඛයෙන් පණුවන් පිටවනවිට බලවත් දුකක් උපදී. නොයෙක් පාට රතුවත්වලින් අලංකාර කරන ලද නැකත් කෙලියේ මිනිසුන් දැක බලවත් දොම්නස් උපදී. මෙසේ දුක් දෙකේම දුක්වල වස්තුභාවය දතයුතුය. තවද:-

පෙළයි කය දුක් මෙය - මනසද දුකින් බෝවේ
උපදවයි දුක්රස - දුකකැයි කියති එනිසා

දුකින් යුත් සිත කෙස් විසුරුවයි. හෘදය පොඩිකරයි. එහාට මෙහාට පෙරලයි. සිඳුනු ප්‍රපාතවලට පෙරලයි. ආයුධ ගෙනඑයි. විස ගිලියි. රැහැණින් එල්ලෙයි. ගින්නට පනියි. ඒ ඒ වෙනස් වස්තු ඒ ඒ ලෙස විපිලිසරව දැවෙන සිතැත්තෝ සිතති. මෙසේ දොම්නස දෙපරිදිම දුක්බව දතයුතුය. තවද:-

සිත පෙළයි යමකින් - කයේ පෙළුම ද ගෙන දේ
දොම්නස දුකක්මය - එ දොම්නස තෙ පරිදි වේ.

උපායාස විස්තරයෙහි ආයාසය යන අර්ථයෙන් ආයාස වේ. පසුබැසීම් ආකාරයෙන් පවතින සිතේ ක්ලාන්ත ගතියට මෙය නමකි.

සිතේ බලවත් පසුතැවිලි බව උපායාසිතත්ත වේ. අයං වුච්චති උපායාසො මෙය උපායාස යයි කියනු ලැබේ. එහි ලක්‍ෂණය ඇලීමය, කෘත්‍යය කෙඳිරිගෑමය, වැටහෙන ආකාරය සිත්තැවුලය. උපායාසයේ දුක්ඛාර්ථය දතයුතුය. මෙහිද තමාම දුක් නොවේ. දුක් දෙකම වස්තුභාවය නිසා දුක් යයි කියන ලදී. කෝපවූ රජතුමා ඓශ්වර්ය සිඳ නසන ලද වධයට බියෙන් පුතුන්ගෙන් එකෙක් වනයට පිවිස සැඟවී මහා පසුතැවිල්ලට පත්වේ. මෙයින් දුකට පත්ව මහත් දුකක් උපදී. මෙපමණ නෑයින් හා ධනය විනාශවී යයි සිතන්නාට බලවත් දොම්නසක් උපදී. මෙසේ දුක් දෙකම වස්තුභාවයෙන් සිදුවූ බව දතයුතුය. තවදඃ-

දැවීම ද සිතෙහි වන - පසුතැවුම් කය වැඩුමෙන්
උපායාසය දුක් - දනවයි එයින් දුක් වේ

මෙහි භාජනය තුළ තෙල් ආදියෙන් පැසෙන දෙයක් මෙන් සෝකයද දැඩි ගින්නෙන් පැසෙනවිට භාජනයෙන් පිටතට නික්මෙන්නාක් මෙන් පරිදේවයද පිටතට නික්මීමට නොහැකිව භාජනය තුළම පැසී ක්‍ෂයවී යන දෙයක් ලෙස උපායාසයද දතයුතුය. අප්‍රිය සම්පයෝග විස්තරයෙහි යස්ස යමෙක්, ඔහුගේ අනිට්ඨා යනු නොසෙවීමය. සෙවීම හෝ නොසෙවීම හෝ වේ. මෙය අමනාප අරමුණට නමකි. සිතට මනාප නැති, නොපිවිසියේය යනු අකන්ත වේ. සිතට ප්‍රිය නැති මනස නොවැඩෙන්නේ අමනාප වේ. රූප ආදියේ ස්වභාවය පෙන්වීමය. අනර්ථය කැමති වෙයි. බලාපොරොත්තු වෙයි යන අර්ථයෙන් අනත්‍ථකාමා වේ. අහිත දේ කැමති වේ. බලාපොරොත්තු වේ යන අර්ථයෙන් අහිතකාමා වේ. පහසු නොවූ දුක් විහරණ කැමති වේ බලාපොරොත්තු වේ යන අර්ථයෙන් අඵාසුකාමා වේ. සිව් යෝගයෙන් බිය නැති නිවන කැමති නොවී බිය සහිත වූ සසරම කැමති වේ යන අරුතින් අයෝගක්ඛෙම කාමා වේ. සංගති යනු ගොස් එකතුවීමය. සමාගමො යනු පැමිණ එකතුවීමය. සමොධානං යනු සිටීම් හිඳීම් ආදියෙන් සහභාගී වීමය. මිස්සීභාවො යනු සියළු කිසවල එකතුකිරීමය. මෙය සත්වයන් වශයෙන් කරනු ලබන යෝජනාවයි. සංස්කාර වශයෙන් යමක් ලැබේ නම් එය ගතයුතුය. අයං වුච්චති මෙය අප්‍රිය සම්ප්‍රයෝගයයි කියනු ලැබේ. එය අනිට්ඨ සමෝධාන ලක්‍ෂණය වේ. සිත විනාශ කිරීම කෘත්‍යය යයි. අනර්ථභාවය වැටහෙන ආකාරයයි. එය අර්ථ වශයෙන් එක් ධර්මයක් නැත. හුදෙක් අප්‍රිය සම්ප්‍රයුක්ත වූ දෙයාකාර දුකට වස්තුවන හෙයින් දුක

යයි කියන ලදී. අනිට්ඨාවද වස්තුවල ඇතුළත් වූ විඳින සිඳින පලන ආදියෙන් කායික දුක්ද උපදවයි. උද්වේග ඇතිකිරීමෙන් මානසික දුක්ද උපදවයි. එනිසා මෙය කියන ලදී :-

**දුටුමතින් අපියන් - සිතෙහි පළමුව ඇතිවේ**
**උවකම් සමග වී - පසුව කයෙහි ද ඇති වේ**

**ඉන් දුක් දෙකම වත් - නිසා වනබව මහරිසි**
**දෙසූබව දතයුතුය - අපියන් සමාගමයේ**

ප්‍රිය විප්‍රයෝග දුක්ඛය කියන ලද්දෙහි ප්‍රතිපක්‍ෂ ක්‍රමයෙන් දතයුතුය. මාතා වා යන මෙහි දියුණුව කැමති ස්වරූපයෙන් දැක්වීමට කියන ලදී. එහි මමායනය මාතා වේ. පිය කෙරේ යනු පිතා වේ. ඇසුරු කෙරේ යයි භාතා වේ. භගිනියද එසේය. මෛත්‍රිය කෙරේ යයි මිත්තා. මතී යයි හෝ මිත්තා වේ සැඟවුණු සියළු ඇතුළත එලියට දමයි යන අර්ථයයි. කළයුතු කාර්යවල සහභාගි වන අර්ථයෙන් යහපත් වන්නේ යයි අමච්ච වේ. මේ තෙමේ අපගේ ආධ්‍යාත්මයයි. මෙසේ දනියි. හැඳින ගනියි හෝ ඤාති වේ. ලෙයින් සම්බන්ධ වූයේ සාලොහිතා වේ. මෙසේ මේ පදවල අර්ථ දතයුතුය. අයං වුච්චති මෙය ප්‍රියයන්ගෙන් වෙන්වීම යයි කියනු ලැබේ. එය ඉෂ්ට වස්තුවල වෙන්වීම ලක්‍ෂණය වේ. සෝකය ඉපදීම කෘත්‍යයයි. ව්‍යසන වැටහෙන ආකාර යයි. එහි අර්ථ වශයෙන් එක් ධර්මයක් නැත. කේවලවූ ප්‍රිය විප්‍රයෝගය දුක් දෙකම වස්තුභාවයෙන් දුක් යයි කියන ලදී. ඉෂ්ට වූ වස්තු වෙන්වනවිට ශරීරයේ විලීම් මැලවීම් ආදියෙන් කායික දුක් උපදවයි. අපට යමක් තිබී නැතිවෙයි. එයට සෝක කිරීමෙන් මානසිකවද දුක් ඇතිවේ. එහෙයින් මෙය කියනු ලැබේ:-

**නෑ දන වියෝගය - විදියි ඊ සර සෝ නම්**
**මැරුණු පිය වියොවින් - දුකින් තැවෙති බාලයෝ**

කැමති විස්තරයෙහි ජාතිධම්මානං යනු ජාති ස්වභාවයන්ගේ ජාති ප්‍රත්‍යයන්ගේ **ඉච්ඡා උප්පජ්ජති** යනු තෘෂ්ණාව උපදී. අහොවත යනු ප්‍රාර්ථනාවය. **න ඛො පනෙතං ඉච්ඡා පත්තබ්බා** යනු යම් දෙයකින් අපි ඉපදීම් ධර්මයට නොපැමිණේම යයි පැතීම, අප ඉපදීමට නොපැමිණේවායි මෙසේ සමුදය ප්‍රහානයෙන් සාධූන් කෙරෙහි විද්‍යමාන නොඉපදීම් ධර්ම

වූ පරිනිර්වාණයෙහි විද්‍යමාන ඉපදීමේ නොපැමිණීම කැමතිවන ලදී. මාර්ග භාවනාවෙන් තොරව නොපැමිණිය හැකි බැවින් නොකැමති වන්නාටද භාවනාවෙන් පැමිණිය යුතු බැවින් කැමතිවීමෙන් පැමිණීම නම් දෙයක් නැත. (කැමතිවීමෙන් හෝ ප්‍රාර්ථනා කිරීමෙන් ඉපදීම නැතිකළ නොහැකිබව කී සේය) **ඉදම්පි** මෙයද, මත්තෙහි සෙස්ස 'පි' කාරයෙන් ගනී. **යම්පිච්ඡං** යම් ධර්මයකින් නොලැබිය හැකි වස්තු කැමතිවන්නා නොලබයි. නොලැබිය හැකි වස්තු කැමතිවීම දුක් යයි දතයුතුය. **ජරාධම්මානං** ආදියෙහිද මෙම නයයි. මෙසේ මෙහි නොලැබිය හැකි වස්තු කෙරෙහි කැමැත්තම යමක් නොලබයිද එය දුක්යයි කියන ලදී. එහි නොලැබිය හැකි වස්තු කැමතිවීම ලක්‍ෂණ යයි. ඒ ගැන සෙවීම කෘත්‍යයයි. ඒවායේ නොපැමිණීම වැටහෙන ආකාරයයි. දුක් දෙකම වස්තු භාවයෙන් දුක් යයි කියන ලදී. එකෙක් රජවන්නේ යයි බුහුමන් ලබයි. හේ සිඳී බිඳී ගිය සමූහයා පිරිවරනු ලැබ විසම කඳුකරයට හෝ වනයට පිවිසෙයි. ඉක්බිති රජ ඒ පුවත දැන බලකා යවයි. රාජපුරුෂයන් විසින් නසන ලද පිරිවර ඇති හේ තමාද ලද පහර ඇත්තේ ගස් හෝ ගල් අතරට පිවිසේ. මේ වේලාවේ මහවැස්සක් ඇති වේ. ඝණ අඳුරු කළුවලා නැගෙයි. ඉක්බිති ඔහු කළුකුඹි (කළුකඩි) පිරිවරා ගනිති. එයින් ඔහුට බලවත් දුක් උපදී. එකම මා නිසා මෙපමණ නැයින් මෙපමණ ධනය විනාශ වී යයි. බලවත් දොම්නස උපදී. මේ ආශාව මේ දුක් දෙකටම වස්තුවන බැවින් දුක් යයි දතයුතු. තවදඃ-

**ඒ ඒ දෙය පතන - අයහට වන අලාභය**
**සතුන්හට මෙහි යම් - විනාසය දුක් උපදියි**

**නොලැබිය හැකි වතුන් - පැතුමයි එයට හේතුව**
**කැමති දෙය නොලැබෙනු - දුක් යයි මුනිසඳහු යු**

උපාදාන ස්කන්ධ විස්තරයෙහි සංඛිත්තෙන දේශනාව සඳහා කියන ලදී. දුක් නම් දුක් සියයක් පමණ යයි හෝ දහසක් පමණ යයි හෝ ලක්‍ෂයක් පමණ යයි හෝ ගණන් කිරීමට නොහැක. දේශනා කිරීමට හැකිය. එසේ හෙයින් දුක් නම් අන් කිසිවක් නොව කෙටියෙන් පංච උපාදානස්කන්ධ දුක් යයි දේශනය හකුළුවමින් මෙසේ කීහ. සෙය්‍යථිදං නිපාතයකි. ඒවා කවරේදැයි යන අර්ථයයි. රූප උපාදාන යන ස්කන්ධයන්ගේ අර්ථ ස්කන්ධ විභංගයෙහි වර්ණනා කරන ලද්දේය. ස්කන්ධයන්ගේ දුක්ඛාර්ථය දැනගත යුතුය. මෙය වනාහිඃ-

ඉපදීම මුල්කොට - දුක් යයි කියන ලද මෙහි
නොකිත ලද සියල් - ඇති නොවේ මෙය නොමැතිව

එනිසාම කෙටියෙන් - උපාදාන කඳු මෙහි
දුක් යයි වදහළේ - මහරිසි වෙයි දුක් නැසූ

යම්සේ ගින්න ඉන්ධන මෙන් පහරට ඉලක්කය මෙන් ඩංස මකසයන්ට ගවරූපය මෙන් කපන්නන්ට (ගොයම්) කෙතක් මෙන් ජාති ආදියට උපාදාන ස්කන්ධ පංචකය මෙන් නොයෙක් ආකාරයේ බාධා කරනු ලබන තෘණ ලතාදියට බිමක් මෙන් ගස්වල මල් ගෙඩි කොළ ආදිය මෙන් උපාදානය ස්කන්ධවලම උපදී. උපාදාන ස්කන්ධවල මුල්ම දුක ඉපදීමය. මැද දුක ජරාවය. අවසාන දුක මරණයයි. මාරාන්තික දුක්වලින් පහර දෙනලද දවනු ලබන දුක සෝකයයි. එය නොඉවසන්නේ වැලපෙන දුක පරිදේවයයි. එයින් ධාතු කැළඹීම් වශයෙන් ඇතිවූ ශරීරයේ ආබාධ ඇතිකරන්නේ දුක්ඛ දුක වේ. එයින් බාධා පමුණුවන පෘථග්ජනයින් එහි තරහ ඉපදවීම් වශයෙන් ඇතිවන සිත පෙළන දුක දෝමනස්සයයි. සෝකාදිය වර්ධනය වීමෙන් ඇතිවන කලකිරීම ඇතිකරන දුක උපායාසයයි. බලාපොරොත්තු ඉටු නොවී ඉච්ඡා භංගයට පත් දුක කැමති දේ නොලැබීමයි. මෙසේ නොයෙක් ආකාරයෙන් පරීක්ෂා කරනු ලබන උපාදාන ස්කන්ධයම දුක් යයි එක එක දක්වා කියන කල නොයෙක් කල්පවලිනුත් සම්පූර්ණයෙන් කියා නිමකළ හැකි නොවේ. ඒ සියළු දුක් එක ජල බින්දුවක සියළු මුහුදෙහි ජල රසය මෙන් මේ පංචස්කන්ධයෙහි හකුළුවා දැක්වීමට **සංඛිත්තෙන පංචූපාදානක්ඛන්ධා දුක්ඛා** යයි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක.

## දුක්ඛ සච්ච නිද්දේසයයි

සමුදය සත්‍යය නිද්දේසයෙහි **යායං තණ්හා** යනු යම් මේ තෘෂ්ණාවක්. **පොනොභවිකා** යනු නැවත භවය ඇතිකරන, පුනර්භවය මෙහි ස්වභාවය වේ යයි යන අර්ථයෙන් පොනොභවික වේ. තවද පුනර්භවය දෙයි. පුනර්භවය පිණිස පවතියි. නැවත නැවත භවයෙහි උපදවයි යනුවෙන්ද පොනොභවික වේ. එය වනාහි පුනර්භවයට දායකද අදායකද වේ. මෙය පුනර්භවය පිණිස පැවතීමද නොපැවතීමද වේ. දෙනලද ප්‍රතිසන්ධියෙන් ස්කන්ධ විපාක නියමයද එය පුනර්භවය දේද නොදේද පුනර්භවය පිණිස පවතීද නොපවතීද දෙනලද ප්‍රතිසන්ධියෙහි විපාක ප්‍රමාණයද පොනොභවික නම ලබයි. සතුටුවීම් සංඛ්‍යාත නන්දි රාගයෙන් යුක්ත නිසා **නන්දිරාග සහගතා** වේ. නන්දිරාගය සමග යන

අර්ථයෙන් ඒකාන්තයෙන්ම ගියා යයි කියන ලදී. **තත්‍ර තත්‍රාභිනන්දිනී** යනු ආත්මභාව තිබෙන තැන්වල ඇලෙන, සතුටුවන. රූපාදියෙහි හෝ අරමුණුවල ඇලෙන, සතුටුවන. රූපයෙහි සතුටුව ඇලෙන, ශබ්ද ගන්ධ රස ඵොට්ඨබ්බ ධම්ම යන මේවායේ සතුටුව ඇලීම යන අර්ථ වේ. **සෙය්‍යථීදං?** නිපාතයකි. එහි කවරේද? යන තේරුම වේ. **කාම තණ්හා** කාමයෙහි තෘෂ්ණාවය. පංචකාම ගුණයෙන් යුත් රාගයට පර්යාය වචනයකි. භවයෙහි තෘෂ්ණාව **භව තණ්හා** වේ. භවය ප්‍රාර්ථනා කිරීම් වශයෙන් උපන් ශාස්වත දෘෂ්ටි සහගත රූපාරූප රාගයෙහිද ධ්‍යාන ආශාවටද මෙය සමාන වචනයකි. විභවයෙහි තෘෂ්ණාව විභව තණ්හා වේ. උච්ඡේද දෘෂ්ටි සහගත රාගයට සමාන වචනයකි.

තෘෂ්ණා වස්තු විස්තර වශයෙන් දැක්වීමට **සා බො පනෙසා** යනාදිය කීහ. එහි **උප්පජ්ජති** උපදී. නිවිසති නැවත නැවත පැවතීම් වශයෙන් පිහිටුවීමය. **යං ලොකෙ පියරූපං සාතරූපං** ලෝකයෙහි ප්‍රියවූද, මිහිරි වූද යමක්. **චක්ඛුං ලොකෙ** ලෝකයෙහි චක්ඛු ආදිය කෙරෙහි මමත්වයට සත්වයා සම්පත්තියෙහි පිහිටා තමාගේ ඇස කැඩපත් ආදියෙහි නිමිති අනුසාරයෙන් ගෙන ප්‍රසන්න වූ පංච ප්‍රසාදය රන්විමනක අරින ලද මැණික් සීමැදුරු කවුළුවක් මෙන් හඟියි. කන රිදී කුප්පියක් මෙන් හවඩි නූලක් මෙන්ද සිතයි. උස නාසය යයි ව්‍යවහාර වන ඝාණය ගුලිකොට තැබූ රන්සිරියල් ගුලියකැයි හඟියි. දිව රත් කම්බිලි පටලයක් මෙන් මෘදු සිනිඳු මිහිරි රස දේ යයි හඟියි. කය සල්ගසක් මෙන් රන් තොරණක් මෙන්ද හඟියි. මනස අන්‍යයන්ගේ මනසට අසමාන සේ උදාර සේ සිතයි. රූපය රන් කිණිහිරි මල් වර්ණ මෙන්, ශබ්දය මත් කුරවි කොවුලන් මද නදැති මිණි වෙණින් නිකුත් නදක් මෙන්, තමා ලද චතු සමුට්ඨානික සුවඳ අරමුණු ආදිය ගැන මේවාගේ තිබෙන්නේ කාටදැයි සිතයි. මෙසේ සිතන්නාට ඒ චක්ඛු ආදිය ප්‍රිය රූපද මිහිරි රූපද වේ. ඉක්බිති ඔවුන්ට එහි නූපන් තෘෂ්ණාව උපදී. උපන් තෘෂ්ණාව නැවත නැවත පැවතීම් වශයෙන් පිහිටුවයි. එහෙයින් භාග්‍යවතුන් වහන්සේ **චක්ඛුං ලොකෙ පිය රූපං සාතං රූපං, එතෙථ සා තණ්හා උප්පජ්ජමානා උප්පජ්ජති** ආදිය වදාළහ. එහි උප්පජ්ජමානා යනු යම්කලක උපදී නම් එකල මෙහි උපදී යන අර්ථයි. සියළු තැන මෙම නයයි.

## සමුදය සත්‍ය නිර්දේශය

නිරෝධ සත්‍යය නිද්දේසයෙහි **යො තස්සායෙව තණ්හාය** යන මෙහි යමෙක් එම දුකෙහිම යයි කිවයුත්තෙහි සමුදය නිරෝධයෙන්ම දුක්ඛ නිරෝධය වේ. වෙනත් ආකාරයකින් නොවේ. එනිසා කීවේද:-

යම්සේ ගසේ මුල් උදුරා නොදැම්මොත්
කැපූ ගසක් මුත් නැවතත් වැඩේමැය්
ඒ සේම ආසා'නුසයන් නො නැස්මෙහී
මේ දුක්හි උත්පත්ති වේමැය් යළිත් යළිත්

එහෙයින් දුක්ඛ නිරෝධය දක්වන්නේ, සමුදය නිරෝධයෙන් දැක්වීමට මෙසේ කීහ. තථාගතයන් වහන්සේ සිංහයෙකුට සමාන පැවතුම් ඇත්තාහ. දුක් නැතිකරන්නේ දුක්ඛ නිරෝධයද දක්වන්නේ ඔවුහු පලයෙහි නොව හේතුවෙහි පිළිපදිති. අන්‍ය තීර්ථකයෝ සුවාන (බලු) ව්‍රතය පිළිපදිති. ඔවුහු දුක් නැති කරන්නේ දුක්ඛ නිරෝධය දක්වන්නේ අත්තකිලමතානු යෝගයෙන්ද ඒ දේසනාවෙන්ද පලයෙහි පිළිපදිති. හේතුවෙහි නොපිළිපදිති. හේතුව ඉවත් නොකර පලය ඉවත් කිරීමට උත්සාහ කරති. සිංහ සමාන පැවතුම් ඇති ශාස්තෘන් වහන්සේ හේතුවෙහි පිළිපදින්නේ **යො තස්සායෙව** යනාදිය කීහ. එහි **තස්සායෙව** යන යම් ඒ උපත් ගැනීම් වශයෙන් යට කියන ලදී. අසෙසවිරාගනිරොධො යනාදි සියල්ල නිර්වාණයෙහි පර්යාය වචන වේ. නිවනට පැමිණ තෘෂ්ණාව නිරවශේෂයෙන් නිරුද්ධ වේ. එනිසා එය **අසෙස විරාග නිරෝධා** යයි කියනු ලැබේ. නිවනට පැමිණ තෘෂ්ණාව අත්හරී. බැහැර කරයි. මිදෙයි. නො ඇලෙයි. එනිසා නිවන **වාගො පටිනිස්සග්ගො මුත්ති අනාලයො** යයි කියනු ලැබේ. නිවන එකක්මය. සියළු සංඛත නාමයන්ගේ ප්‍රතිපක්ෂ වශයෙන් නිර්වාණයට නොයෙක් පර්යාය නම් තිබේ. කෙසේද? අසෙස විරාග නිරොධො, වාගො, මුත්ති, අනාලයො, රාගක්ඛයො, දොසක්ඛයො, මෝහක්ඛයො, තණ්හක්ඛයො, අනුප්පාදො, අප්පවත්තං, අනිමිත්තං, අප්පණිහිතං, අනායුහනං, අසංකිලිට්ඨං ආදිය වශයෙනි. මාර්ගයෙන් සිඳී නිවනට පැමිණ දැන් නො පැවැත්මට පැමිණියද තෘෂ්ණාව යම් වස්තුවල උපත දක්වන ලදී. එහිම අභාවය දැක්වීමට **සා ඛො පනෙසා** ආදිය කීහ. එහි යම් මිනිසෙක් කෙතෙහි හටගත් තිත්ත ලබුවැලක් දැක අග සිට මුල සොයා සිඳියි. එය කෙමෙන් මැලවී නො පැවැත්ම පත්වන්නේය. එයින් ඒ කෙතෙහි වූ ලබුවැල නිරුද්ධ විය. ප්‍රහීන වී යයි කියන්නේය. ඒ කෙතෙහි ලබුවැල මෙන් චක්ෂු ආදියෙහි තෘෂ්ණාව දතයුතුය. එය ආර්ය

මාර්ගයෙන් මුලින් සිඳිනු ලැබ නිවනට පැමිණ නො පැවැත්මට පත්වන්නේය. එසේ පත්වූ විට කෙතේ ලබුවැල මෙන් නොපෙනේ. වනයෙහි ත්‍රස්තයන් අල්ලා ගෙනවුත් නගරයේ දකුණු දොරටුවේදී ඝාතනය කරති. එයින් ත්‍රස්තයින් මැරුවේ යයි කියති. චක්ඛු ආදියෙහි තෘෂ්ණාව වනයෙහි ත්‍රස්තයින් මෙනි. එය දකුණු දොර ත්‍රස්තයින් මෙන් නිවනට පැමිණ නිරුද්ධ විය. එසේ වීමෙන් වනයෙහි ත්‍රස්තයින් මෙන් නොපෙනේ. එහෙයින් එය එහිම නිරෝධය දක්වන්නේ, **චක්ඛුං ලොකෙ පියරූපං සාතරූපං එතෙථ සා තණ්හා පහීයමානා පහීයති නිරුජ්ඣමානා නිරුජ්ඣති** යනාදිය කීහ. සෙස්ස මෙහි කියන ලද පරිදි වේ.

## නිරෝධ සත්‍යය නිර්දේශය

මාර්ග සත්‍යය නිද්දේසයෙහි අයමෙව යනු අන්‍ය මාර්ග ප්‍රතික්ෂේප කිරීමේ නියමයයි. **අරියො** යනු ඒ ඒ මාර්ගයෙන් නසන ලද කෙලෙසුන්ගෙන් ඈත්වූ බැවින්ද ආර්යභාවය සිදුකරන බැවින්ද ආර්ය ඵල ප්‍රතිලාභය කරන බැවින්ද අරිය නම් වේ. අංග අටක් ඇති නිසා **අට්ඨංගිකො** වේ. එය චතුරංග සේනාව මෙන් පංචාංගික තුරිය මෙන් අංගය පමණක් වේ. අංගවලින් වෙන්වීමක් නැත. නිර්වාණය කැමැත්තන් ගමන් කෙරෙතියි නිවන හෝ පෙන්වයි. කෙලෙසුන් හෝ නසමින් යන්නේ යයි **මග්ගො** වේ. **සෙය්‍යථීදං?** එය කවරේද? අංගය පමණක් මාර්ගය වේ. අංගය නැතිව මාර්ගය නොවේ යයි දක්වන්නේ **සම්මා දිට්ඨි.......සම්මා සමාධි** යයි කීහ. මනාව දක්නා ලක්ෂණය **සම්මා දිට්ඨි** වේ. සිත මනාව අරමුණට යොමුකිරීමේ ලක්ෂණය **සම්මා සංකප්ප** වේ. මනාව ගැනීමේ ලක්ෂණය **සම්මා වාචා** වේ. මනාව තැබීමේ ලක්ෂණය **සම්මා කම්මන්ත** වේ. මනාව පිරිසිදු වීමේ ලක්ෂණය **සම්මා ආජීව** වේ. මනාව ආධාර කිරීමේ ලක්ෂණය **සම්මා වායාම** වේ. මනාව වැටහීමේ ලක්ෂණය **සම්මා සති** වේ. මනාව එකඟ කිරීමේ ලක්ෂණය **සම්මා සමාධි** වේ. ඒවායේ එකිනෙකේ කෘත්‍යය තුන තුන පවතී. කෙසේද? සම්මා දිට්ඨිය තමාගේ අනිත් කෙලෙස් සතුරන් සමග මිථ්‍යා දෘෂ්ටිය දුරුකරයි. නිවන අරමුණු කරයි. එකට යෙදෙන ධර්මද බලයි. සම්මා සංකප්පාදියද එසේම මිථ්‍යා සංකප්පාදිය දුරුකරයි. නිවන අරමුණු කරයි. මෙහි විශේෂය නම් සම්මා සංකප්පය සහජාත ධර්මයන් අරමුණට යොමුකරයි. මේ සම්මා දිට්ඨිය මුලදී නානා ක්ෂණ නානා අරමුණු වේ. මාර්ග කාලයෙහි ඒකක්ෂණ ඒකාරම්මණ වේ. කෘත්‍ය වශයෙන් දුක්ඛෙ ඤාණං ආදි නම් සතර ලබයි.

සම්මා සංකප්ප ආදියද මාර්ගයට පෙර නානා ක්‍ෂණ නානා අරමුණු වේ. මාර්ග අවස්ථාවේ ඒකක්‍ෂණ එක අරමුණය. සම්මා සංකප්පය කෘත්‍ය වශයෙන් නෙක්ඛම්මාදි නම් තුනක් ලබයි. සම්මා වාචාදි තුනේ පූර්ව භාගයේදී නානා ක්‍ෂණ නානා අරමුණු වේ. මාර්ග ක්‍ෂණයෙහි විරතිය පමණකි. චේතනාවද විරතිය පමණකි. සම්මා වායාම සති යන මේ දෙක සම්‍යක් ප්‍රධාන සතිපට්ඨාන වශයෙන් නම් සතරක් ලබයි. සම්මා සමාධිය පෙරද මාර්ග ක්‍ෂණයෙහිද සම්මා සමාධියම වේ. නිවන් ලැබීම පිණිස පිළිපන් යෝගීන්ට බොහෝ උපකාර වන හෙයින් පළමුව සම්මා දිට්ඨිය දේසනා කරන ලදී. මෙය ප්‍රඥා ප්‍රදීප පඤ්ඤා ආවුධ යයි කියන ලදී. මෙහි මුලදී විපස්සනා ඤාණ සහිත සම්මා දිට්ඨිය අවිද්‍ය අඳුර බිඳ කෙලෙස් සොරුන් නසමින් ආරක්‍ෂාව දෙමින් යෝගාවචරයා නිවනට පමුණුවයි. බොහෝ උපකාර බැවින් සම්මා සංකප්පය ඊලඟට කියන ලදී.

රන්කරුවෙක් අතට ගත් කහවණුව පෙරළ පෙරළා බලන්නේ හොර එකක්ද ඇත්ත එකක්ද කියා දැනගැනීමටය. යෝගාවචරයාද පූර්ව භාගයෙහි විචාරයෙන් විචාර විචාරා විදර්ශනා ප්‍රඥාවෙන් බලන්නේ මේ ධර්මයෝ කාමාවචරය, මේ ධර්මයෝ රූපාවචරයයි දැනගැනීමටය. යම්කිසි පුරුෂයෙක් කෙළවරක් ගෙන පෙරළ පෙරළා දෙනලද මහගස වඩුවෙක් වෑයෙන් සැස කාර්යෙහි යොදවයි. එසේ විතර්කයෙන් විචාරා දෙන ලද ධර්මයෙහි යෝගාවචරයා මේ ධර්මයෝ කාමාවචර වේ මේ ධර්මයෝ රූපාවචර ආදියයි දැන කාර්යයෙහි යොදවයි. සම්මා සංකප්පය සම්මා දිට්ඨියට මෙන්ම සම්මා වාචාවටද උපකාර වේ. එනිසා ඊලඟට සම්මා වාචා කියන ලදී. පළමුව වචනයෙන් සංවිධානය කර ලෝකයේ කර්මාන්ත ආදිය යොදවනු ලැබේ. එනිසා අනතුරුව සම්මා කම්මන්ත කියන ලදී. වචී දුෂ්චරිතය සතරාකාරය. කාය දුෂ්චරිතය තුන් ආකාරය. මේ දෙකම දුරුකොට සුචරිතය පුරන්නා සමහරවිට ආජීවාෂ්ටමක සීලය පුරයි. එහෙයින් අනතුරුව සම්මා ආජීවය කියන ලදී. මෙසේ සුද්ධ වූ ආජීවයෙන් මගේ ජීවිතය පිරිසිදු යයි මෙපමණකින් සන්තෝෂ කොට සියළු ඉරියව්වල වීර්ය ආරම්භ කළයුතු යයි දැක්වීමට අනතුරුව සම්මා වායාම කියන ලදී. එයින් ආරම්භ කරන ලද වීර්යයෙහිද කායාදි සතර වස්තුවෙහි සිහිය හොඳින් පිහිටවිය යුතුයයි දැක්වීමට ඉන් අනතුරුව සම්මා සතිය කියන ලදී. මෙසේ පිහිටුවන ලද සිහිය සමාධියට උපකාර වන හෙයින් අනතුරුව සම්මා සමාධිය කියන ලදී. සම්මා දිට්ඨී නිද්දේසයෙහි දුක්ඛෙ ඤාණං ආදියෙන් චතුරාර්ය සත්‍ය කර්මස්ථාන

දක්වන ලදී. එහි පෙර සත්‍ය දෙක ලෞකිකය. අවසන් දෙක ලෝකෝත්තරය. භික්ෂුව ඒවායින් ලෞකිකයෙහි කර්මස්ථාන පිහිටුවයි. ලෝකෝත්තරයෙහි එසේ කර්මස්ථාන අරමුණු කිරීමක් නැත. පළමු දෙක පංචස්කන්ධය දුක්ය, තෘෂ්ණාවෙන් පහළවේ යයි මෙසේ සංක්ෂේපයෙන් ද පංචස්කන්ධ කවරේද රූපස්කන්ධාදි විස්තර නයින්ද ආචාර්යවරයා සමීපයෙහි ඉගෙන වචනයෙන් නැවත නැවතත් කියමින් යෝගාවචරයා භාවනා කරයි. ඉතිරි සත්‍ය දෙකෙහි නිරෝධ සත්‍යය ඉෂ්ටය, කාන්තය, මනාපය. මාර්ග සත්‍යය ඉෂ්ටය, මනාපයයි මෙසේ කනෙන්ම අසා පුරුදු කළයුතුය. මෙසේ පුරුදුකර චතුරාර්ය සත්‍ය ප්‍රතිවේධයෙන්ම අවබෝධ කරගනී. ඒකාභිසමයෙන් අවබෝධ කරයි. දුක දැනගත යුතුය යන ප්‍රතිවේධයෙන් අවබෝධ කරගනී. සමුදය ප්‍රහාන ප්‍රතිවේධයෙන්ද මාර්ගය භාවනා ප්‍රතිවේධයෙන්ද නිර්වාණය සාක්ෂාත් ප්‍රතිවේධයෙන්ද අවබෝධ කරගනී. දුක දැනගත යුතුය යන අවබෝධයෙන්... මාර්ගය භාවනා අවබෝධයෙන් දැනගනී. මෙසේ ඔහුට පූර්වභාගයෙහි සත්‍ය දෙක ඉගෙනීම, විචාරීම, ඇසීම, ධාරණය කිරීම, විමසීම වශයෙන් ප්‍රතිවේධය වෙයි. නිරෝධයෙහි ආරම්මණ ප්‍රතිවේධයයි. එහි සියළු ප්‍රතිවේධ ඥාණය ලෝකෝත්තරය. අසන දරණ විමසන නුවන ලෞකිකය. කාමාවචරය. ප්‍රත්‍යවෙක්ෂාව පැමිණි සත්‍ය අනුව වේ. මේ තෙමේද ආදිකර්මිකය. එනිසා මෙහි නොකියන ලදී. මේ භික්ෂුවගේ පෙර අල්ලාගත් දුක දනිමි. සමුදය දුරුකරමි. මාර්ගය වඩමි යන සිතාබැලීම එකඟ කිරීම මෙනෙහි කිරීම ප්‍රත්‍යවේක්ෂා කිරීම් නැත. අල්ලා ගැනීමේ සිට ආරම්භ කරයි. පසුව දුක දැනගන්නා ලද්දේමය. මාර්ගය වඩන ලද්දේ වේ.

එහි සත්‍ය දෙක දැකීමට අපහසු බැවින් ගැඹුරුය. ඒ දෙක ගැඹුරුබැවින් දැකීමට අපහසුය. දුක්ඛ සත්‍යයෙහි උපත ප්‍රකටය. කණුකටු පහරවලදී අහෝ දුක යයි කියයි. සමුදය සත්‍යයද කනු කැමතිබව බුදිනු කැමතිබව ආදී වශයෙන් ප්‍රකටය. ලක්ෂණ අවබෝධ කරගැනීම් වශයෙන් දෙකම ගැඹුරුය. දැකීම අපහසුය. ඉතිරි දෙක දැකීම පිණිස ප්‍රයෝගය භවාග්‍රය අල්ලා ගැනීමට අත දිගහරින්නාක් මෙන් අතරක් නැති තැන ස්පර්ශ කිරීමට පය දිගුකරනවා මෙන් සියයකට බෙදූ ලෝමයේ කොනකින් කොනක් සැපයීමක් මෙන් වෙයි. මෙසේ ඒවා ගැඹුරු බැවින් දැකීමට අපහසුය. මෙසේ ගැඹුරෙහි දුර්දෘෂ්‍ය වේ. චතුරාර්ය සත්‍යයෙහි ඉගෙනීම් වශයෙන් පූර්වභාග ඥාණය සඳහා දුකෙඛ ඥාණං ආදිය කියන ලදී.

සම්මා සංකප්ප නිද්දේසයෙහි **කාමතො නිස්සටො** යනු නෙක්ඛම්ම සංකප්පයයි. **ව්‍යාපාදතො නිස්සටො** යනු අව්‍යාපාද සංකප්පයයි. **විහිංසාය නිස්සටො** යනු අවිහිංසා සංකප්පයයි. එහි නෙක්ඛම්ම විතර්කය කාම විතර්කයේ අරමුණ නසමින් වෙන්කරමින් උපදී. අව්‍යාපාද විතර්කය ව්‍යාපාද විතර්කයේද අවිහිංසා විතර්කය විහිංසා විතර්කයේද පිහිටි තැන් නසා වෙන් කරමින් උපදී. නෙක්ඛම්ම විතක්කය කාම විතක්කයට පසමිතුරුව උපදී. අව්‍යාපාද විතක්කය ව්‍යාපාද විතක්කයටද අවිහිංසා විතක්කය විහිංසා විතක්කයට ද පසමිතුරුව උපදී. එහි යෝගාවචරයා කාම විතක්කයේ අරමුණ වෙනස් කිරීම සඳහා කාම විතක්කය හෝ වෙනත් සංස්කාරයක් හෝ විමසයි. ඉක්බිතිව ඔහුට විදර්ශනා ක්ෂණයෙහි විදර්ශනා සම්ප්‍රයුක්ත සංකප්පය කාම විතක්කයේ අරමුණ නසමින් වෙන් කරමින් තදංග වශයෙන් උපදී. විදර්ශනාව උත්සාහවත් කරවා මාර්ගයට පමුණුවයි. ඉක්බිති ඔහුට මාර්ග ක්ෂණයෙහි මාර්ගය හා යෙදුණු සංකප්පය කාම විතක්කයේ අරමුණ සමුච්ඡේද වශයෙන් නසමින් වෙන් කරමින් උපදී. ව්‍යාපාද විතක්ක විහිංසා විතක්ක පෙර පරිදිම යොදාගත යුතුය.

කාම විතක්කාදි තුනටද පෙලෙහි බෙදන ලද අටතිස් අරමුණුවලින් එක් කමටහනක්වත් විරුද්ධ නොවූයේ නොවේ. අසුභවල කාම විතර්කයට ප්‍රථම ධ්‍යානයම ඒකාන්තයෙන් සතුරු වේ. ව්‍යාපාද විතර්කයට මෛත්‍රියද තුන්වන සතරවන ධ්‍යානද විහිංසා විතර්කයට කරුණාවද තුන්වන සතරවන ධ්‍යානද සතුරු වේ. එහෙයින් අසුභයෙහි පරිකර්මකොට ධ්‍යාන සම්පන්න වූවහුට සමාපත්ති ක්ෂණයෙහි ධ්‍යාන සම්ප්‍රයුක්ත සංකප්පය විෂ්කම්භන වශයෙන් කාම විතර්කයට සතුරුව උපදී. ධ්‍යාන පාදක කරගෙන විපස්සනාව පිහිටුවන්නාට විපස්සනා ක්ෂණයෙහි විපස්සනා සම්ප්‍රයුක්ත සංකප්පය තදංග වශයෙන් කාම විතර්කයට සතුරුව උපදී. විපස්සනාව බලවත්කොට මාර්ගයට පමුණුවන්නාට මාර්ග ක්ෂණයෙහි මාර්ග සම්ප්‍රයුක්ත සංකප්පය සමුච්ඡේද වශයෙන් කාම විතර්කයට සතුරුව උපදී. මෙසේ උපන්නේ නෙක්ඛම්ම සංකප්ප යයි දතයුතුය. මෙත්තා කරුණාවලින් පරිකර්මකොට ධ්‍යානයට සමවදී යන සියල්ල පෙර ක්‍රමයෙන්ම යෙදිය යුතුය. එසේ උපන්නේ අව්‍යාපාද සංකප්ප යයි. අවිහිංසා සංකප්පයයි කියනු ලැබේයයි දතයුතුය. මේ නෙක්ඛම්ම සංකප්පාදිය විපස්සනා ධ්‍යාන වශයෙන් උපත්වල පූර්වභාගය නානාවිධය. මාර්ග ක්ෂණයෙහි මේ තුන්තැන උපන් අකුසල සංකල්පයට පදච්ඡේද වශයෙන් නොඉපදීම් වශයෙන් සාධන වශයෙන් මාර්ගාංග සම්පූර්ණ කරමින් හුදෙකලාව කුසල සංකප්පය උපදී. මෙය සම්මා සංකප්ප නම් වේ.

සම්මා වාචා නිද්දේසයෙහිද යම්හෙයකින් අනිත් සිතකින් මුසාවාදයෙන් වෙන් වේ. අනිත් අනිත් සිත්වලින් පිසුනාදියෙන් වෙන් වේ. එහෙයින් සතරාකාර වූ මේ විරමනය පූර්වභාගයෙහි විවිධය. මාර්ග ක්‍ෂණයෙහි මිථ්‍යා වාචා සංඛ්‍යාත සතරාකාර අකුසල දුසිල් චේතනාව වෙන්කිරීම් වශයෙන් නොඉපදවීම් සාධන වශයෙන් මාර්ගාංගය සම්පූර්ණ කරමින් හුදකලාව සම්මා වාචා සංඛ්‍යාත කුසල වේරමණිය උපදී. මෙය සම්මා වාචා නම් වේ.

සම්මා කම්මන්ත නිද්දේසයෙහිද අනිත් සිතක් පාණාතිපාතාවෙන් වෙන් වේ. අනිත් සිතකින් අදින්නාදානා අනිත් සිතකින් කාමේසුමිච්ඡාචාරා වෙන්වීම වේ. එනිසා පූර්වභාගයෙහි විවිධය. මාර්ග ක්‍ෂණයෙහි මිථ්‍යා කර්මාන්ත සංඛ්‍යාත ත්‍රිවිධ අකුසල දුස්සීල චේතනා නැසීමෙන් අනුත්පත්ති සාධන වශයෙන් මාර්ගාංග සම්පූර්ණ කරමින් එකලාව සම්මා කම්මන්ත සංඛ්‍යාත කුසල වේරමණිය උපදී. මෙය සම්මා කම්මන්ත නම් වේ.

සම්මා ආජීව නිද්දේසයෙහි ඉධාති යනු මේ සාසනයෙහි අරිය සාවකො ආර්යවූ බුදුන්ගේ ශ්‍රාවකයා මිච්ඡා ආජීවං පහාය පව්වු දිවි පැවැත්ම දුරුකර සම්මා ආජීවෙන බුදුන් වර්ණනා කළ කුසල ආජීවයෙන් ජීවිකං කප්පෙති දිවි පවත්වයි. මෙහිද යම්හෙයකින් අනිත් සිතකින් කාය ද්වාර ව්‍යතික්‍රමණයෙන් වෙන් වෙයි. අනිත් සිතකින් වචී ව්‍යතික්‍රමණයෙන් එනිසා පූර්වභාගය විවිධය. මාර්ග ක්‍ෂණයෙහි දොරවල් දෙකේ සත්කර්ම පථ වශයෙන් උපන්නා වූ මිථ්‍යා ආජීව දුස්සීල චේතනාවේ පදච්ඡේද වශයෙන් මාර්ගාංගය සම්පූර්ණ කරමින් එකලාව සම්මා ආජීව සංඛ්‍යාත කුසල වේරමණිය උපදී. මෙය සම්මා ආජීව නම් වේ.

සම්මා වායාම නිද්දේසය සම්මප්පධාන විභංගයෙහි අනුපද වර්ණනා වශයෙන් එන්නේය. මෙය වනාහි පූර්වභාගයෙහි විවිධ සිත්වල ලැබේ. අනිත් සිතකින්ම නූපන් පව්වු අකුසල දහම් නොඉපදවීම සඳහා උත්සාහ කරයි. අනිත් සිතකින් උපන් අකුසල් ප්‍රහානය පිණිස උත්සාහ කරයි. අනිත් සිතකින් නූපන් කුසල් උපදවාගැනීම සඳහා උත්සාහ කරයි. අනිත් සිතකින් උපන් කුසල් වැඩිදියුණු කරගැනීම සඳහා උත්සාහ කරයි. මාර්ග ක්‍ෂණයෙහි එකම සිතකින් ලබයි. එකක්ම වූ මාර්ග සම්ප්‍රයුක්ත වීර්යකෘත්‍ය සතරක් සිද්ධකරන අර්ථයෙන් නම් සතරක් ලබයි.

සම්මා සති නිද්දේසයද සතිපට්ඨාන විභංගයෙහි අනුපද වර්ණනා වශයෙන් එන්නේය. මෙයද පූර්වභාගයෙහි නොයෙක් සිත්වල ලැබේ. අනිත් සිතකින් කය පිළිගනී. අනිත් සිත්වලින් වේදනාදිය පිළිගනී. මාර්ග ක්‍ෂණයෙහි එකම සිතකින් ලබයි. මාර්ග සම්ප්‍රයුක්ත සිහිය එකක්ම වුවද කෘත්‍ය සතරක් සිදුකරන අර්ථයෙන් නම් සතරක් ලබයි.

සම්මා සමාධි නිද්දේසයෙහි සතර ධ්‍යාන පූර්වභාගයෙහිද මාර්ග ක්‍ෂණයෙහිද නානාවිධය. පූර්වභාගයෙහි සමාපත්ති වශයෙන් විවිධය. මාර්ග ක්‍ෂණයෙහි නානා මාර්ග වශයෙන් විවිධය. ප්‍රථම මාර්ගය එකකි. ප්‍රථම ධ්‍යානයද වෙයි. දෙවන මාර්ග ආදියෙහිද ප්‍රථමධ්‍යානය වෙයි. දෙවන මාර්ග ආදියේ වෙනත් ධ්‍යානයක් හෝ වෙයි. ප්‍රථම මාර්ගය එකක් වෙයි. දෙවන මාර්ගාදියේ වෙනත් ධ්‍යානයක් හෝ වෙයි. දෙවන මාර්ගාදියේ දෙවන ධ්‍යාන ආදි වෙනත් ධ්‍යානයක් හෝ ප්‍රථම ධ්‍යානය හෝ වෙයි. මෙසේ සතර මාර්ගයෙහි ධ්‍යාන වශයෙන් සමාන හෝ අසමාන හෝ ඇතැම්විට සමාන හෝ වේ. පාදක ධ්‍යාන වශයෙන් මෙහි විශේෂයක් වේ. ප්‍රථම ධ්‍යානලාභියා ප්‍රථම ධයානයෙන් නැගිට විපස්සනාවෙන් උපන් මාර්ගය ප්‍රථම ධ්‍යානික වේ. මෙහි බොජ්ඣංග මාර්ගාංග සතක් වේ. තුන්වන ධ්‍යානයෙන් නැගිට විපස්සනා වඩන්නාට උපන් මාර්ගය තෘතීය ධ්‍යානික වේ. මෙහි බොජ්ඣංග සහ මාර්ගාංග හයක් වේ. සතරවන ධ්‍යානයේ සිට නේවසඤ්ඤානාසඤ්ඤායතනය දක්වා මෙම ක්‍රමය වේ. ආරුප්පයෙහි සතරවන පස්වන ධ්‍යාන උපදී. ලෝකෝත්තරය ලෞකික නැතැයි කියන ලදී. මෙහි කෙසේද? මෙහිද ප්‍රථමධ්‍යානාදියෙන් නැගිට සෝවාන් මාර්ගය ලබා අරූප සමාපත්ති වඩා අරූපයෙහි උපදී. විදර්ශනාවට අරමුණුවී ස්කන්ධ නියාමයෙන් වේ යයි ඇතැම් තෙර කෙනෙක් කියති. ඇතමෙක් පුද්ගලාධ්‍යාසය නියමයෙන් යයි කියති. ඔවුන්ගේ වාද විනිශ්චය යට චිත්තුප්පාද කාණ්ඩයෙහි ලෝකුත්තර පද භාජනය වර්ණනාවෙහි කී ආකාරයෙන් දැනගත යුතුය. මෙය සම්මා සමාධි යයි කියනු ලැබේ. මේ සතර ධ්‍යානයෙහි ඒකග්ගතාව පූර්වභාගයෙහි ලෞකිකය. අපරභාගයෙහි ලෝකෝත්තර සම්මා සමාධි වේ.

භාග්‍යවතුන් වහන්සේ මෙසේ ලෞකික ලෝකෝත්තර වශයෙන් මාර්ග සත්‍යය දේශනා කළහ. එහි ලෞකික මාර්ගයෙහි සියළු මාර්ගාංග අරමුණු හයේ අනුරූප අරමුණක් ඇති වේ. ලෝකෝත්තර මාර්ගයෙහි

චතුරාර්ය සත්‍ය ප්‍රතිවේදය සඳහා පිළිපන් ආර්යාට අවිද්‍යා අනුසය විනාශ කරන සම්මා දිට්ඨියට නිවන අරමුණු වේ. අවිද්‍යා අනුසය විනාශ කරන ප්‍රඥා චක්ෂුවූ සම්මා දිට්ඨිය, සම්මා දිට්ඨියෙන් යුත් ත්‍රිවිධ මිථ්‍යා කල්පනා විනාශ කරන නිවනට පිවිසවන සම්මා සංකප්පය, ඊට සම්ප්‍රයුක්ත වූ සතරාකාර වචී දුෂ්චරිත නැතිකරන මිච්ඡා විරතිය වූ සම්මා වාචා, ත්‍රිවිධ කාය දුෂ්චරිත විනාශ කරන සම්මා කම්මන්ත, ඒ සම්මා කම්මන්තය පිරිසිදු කරන ඒ හා යෙදුණු කොහොන් වත් විනාශ කරන මිච්ඡා ආජීව විරතිය වූ සම්මා ආජීව, මේ සම්මා වාචා කම්මන්ත ආජීව සංඛ්‍යාත සීලයෙහි පිහිටි ඊට අනුරූප වූ එය හා බැඳුණු කුසීතබව විනාශ කරන නොඉපදුණු උපන් අකුසල් කුසල් නොඉපදවීම ප්‍රහානය ඉපදවීම දියුණු කිරීම් සාධක වූ විරියාරම්භය වූ සම්මා වායාම, මෙසේ උත්සාහ කරන එය හා බැඳුණු මිච්ඡා සතිය දුරුකරන කායාදියෙහි කායානුපස්සනාවට සාධක වූ නුමුළා සිහි ඇති සම්මා සති, මෙසේ අනුත්තර වූ සිහියෙන් මනාව යෙදුණු සිතේ ආරක්ෂාව එය සමග වූ මිච්ඡා සමාධිය විනාශ කරන සිතේ එකඟබව වූ සම්මා සමාධි, මෙය ලොවුතුරා අරිය අටඟි මගයි. එය ලෞකික මාර්ගයෙන් දුක්ඛ නිරෝධ ගාමිනී ප්‍රතිපදාව යයි හැඳින්වේ. ඒ මාර්ගය සම්මා දිට්ඨි සංකප්ප දෙක විජ්ජාවද සෙසු ඒවා චරණද යයි විජ්ජාචරණ ද ඒ දෙක විපස්සනා යානයෙන්ද ඉතිරි ඒවා සමථ යානයෙන්ද සංග්‍රහ කළ බැවින් සමථ විපස්සනා ද දිට්ඨි සංකප්ප දෙක ප්‍රඥා ස්කන්ධයද අනතුරු තුන සීල ස්කන්ධයද ඉතිරි ඒවා සමාධි ස්කන්ධයද අධිපඤ්ඤා අධි සීල අධි චිත්ත ශික්ෂාවල සංග්‍රහකළ බැවින් ස්කන්ධ තුනක් ද ශික්ෂා තුනක් ද වේ. එයින් සමන්වාගත ආර්ය ශ්‍රාවකයා දැකීමට සමත්වූ ඇස්වලින් සහ ගමනට සමත්වූ පාවලින්ද යුත් මගියකු මෙන් විජ්ජාචරණ සම්පන්නව විපස්සනා යානයෙන් කාමසුඛල්ලිකානු යෝගයද සමථ යානයෙන් අත්තකිලමථානුයෝගය ද යන අන්ත දෙක දුරුකොට මධ්‍යම ප්‍රතිපදාවට පැමිණ ප්‍රඥා ස්කන්ධයෙන් මෝහ ස්කන්ධය ද සීල ස්කන්ධයෙන් දෝස ස්කන්ධය ද සමාධි ස්කන්ධයෙන් ලෝභ ස්කන්ධය ද විදාරණය කරමින් අධිපඤ්ඤා අධි සීල අධිචිත්ත සංඛ්‍යාත ශික්ෂාවලින් ප්‍රඥා සම්පත්ති සීල සම්පත්ති සමාධි සම්පත්ති යන සම්පත් තුනට පැමිණ අමෘත මහා නිර්වාණය සාක්ෂාත් කරයි. මුල මැද අග කලණ වූ සත්තිස් බෝධිපාක්ෂික ධර්මරත්නයෙන් විචිත්‍ර වූ නිවැරදිව නියාම සංඛ්‍යාත ආර්යභූමියට බැසගත්තේ වේ.

## සූත්‍රාන්ත භාජනිය වර්ණනාව

දැන් අභිධර්ම භාජනීය වේ. මෙහි ආර්ය සත්‍යයයි නොකියා සියල්ල ඇතුළත් හෙයින් ප්‍රත්‍ය සංඛ්‍යාත සමුදය දැක්වීමට චත්තාරි සච්චානි යයි කියන ලදී. අරිය සච්චානි යයි කීකල්හි අවසේස කෙලෙස්, අවසේස අකුසල දහම්, කුසල් මුල් තුනද අවසේස ආශ්‍රව, අවසේස කුසල දහම්ද සංග්‍රහ නොවේ. මේ අවසේස කෙලෙස් ආදියද දුක් උපදවයි. කේවලවූ තෘෂ්ණාවම දුක්ඛ සමුදය නොවේ. මෙසේ මේ ප්‍රත්‍යයෙන්ද දුක් ඇතිවේමයයි සියල්ල ඇතුළත් හෙයින් ප්‍රත්‍ය සංඛ්‍යාත සමුදය දැක්වීමට අරිය සච්චානි යයි නොකියා චත්තාරි සච්චානි යයි කියන ලදී. විස්තර කිරීමේදී ඒවායේ ප්‍රථම දුක්ඛය විස්තර නොකොට ඒ දුකේ සැප විස්තර කිරීම සඳහා දුක්ඛ සමුදය විස්තර කරන ලදී. එහිද විස්තර කරන ලද අවසෙසා කිලෙසා ආදි නයින් දුක්ඛ සත්‍ය සුඛ නිර්දේශයක් වේ. මෙහි නිරෝධ සත්‍යයද තෘෂ්ණා ප්‍රත්‍යයද තෘෂ්ණාවේ සෙසු කෙලෙසුන් හෝ ප්‍රත්‍යදැයි මෙසේ කියන සමුදයේ ප්‍රහානය වශයෙන් පස් ආකාරයකින් විස්තර කරන ලදී. මෙහි මාර්ග සත්‍යය වනාහි ප්‍රථම ධ්‍යානික සෝවාන් මාර්ග වශයෙන් ධම්මසංගණියෙහි බෙදනලද දේසනා නයේ මුඛමාත්‍ර වශයෙන් දක්වමින් දේසනා කරන ලදී. එහි නය භේදය දතයුතුය. එය මතුයෙහි ප්‍රකාශ කරමි.

අෂ්ටාංගික මාර්ගය ප්‍රතිපදාවයි. මෙහි මුලින්ම කාය කර්ම වචීකර්ම ආජීව පිරිසිදු වේ. යන වචනයෙන් පුද්ගල අදහස් වශයෙන් අංග පසකින් වූ ද මාර්ගය ප්‍රතිපදාවමයි. එය දැක්වීමට පංචංගික වාරයද දක්වන ලදී. අට්ඨංගික පංචංගික මාර්ගයම ප්‍රතිපදාව නොවේ. සම්ප්‍රයුක්ත වූ පනස් ධර්මයෝම (චෛතසික) ප්‍රතිපදාවයි. එනිසා ඒ නය දැක්වීමට තුන්වනුව සබ්බසංගාහික වාරයද දක්වන ලදී. එහි අවසේස ධර්ම දුක්ඛ නිරෝධගාමිනී ප්‍රතිපදාවේ ඇතුළත් වේ යයි මෙය අත්හරියි. සෙසු සියළු තන්හි සමානය. එහි අට්ඨංගික වාරයෙහි තෘෂ්ණාවද අවසේස කෙලෙසුන්ගේ ප්‍රහාන යයි ආදියෙහි කොටස් පහ අතුරෙන් පළමු කොටසෙහි සෝවාන් මාර්ගයේ ධ්‍යාන අභිනිවේසයෙහි සුද්ධික පටිපදා, සුද්ධික සුඤ්ඤතා, සුඤ්ඤත පටිපදා, සුද්ධික අප්පණිහිතං, අප්පණිහිත පටිපදා යන මේ පස් වාරයෙහි දෙක දෙක චතුක්කපංචක නය වශයෙන් නය දහයක් වේ. මෙසේ සෙස්සෙහිද විසති අභිනිවේසවල නය දෙසීයක් ද ඒවා සතර අධිපතීන්ගේ වශයෙන් සතරින් ගුණකොට අටසීයක්ද මෙසේ සුද්ධික දෙක අධිපති අට යයි සියල්ල නය දහසක් වේ. සෝවාන් මාර්ගයේ මෙන් සෙසු මාර්ගවලද නය හාරදහසක් වේ. පළමු කොටසෙහි සතරක්ද මෙසේ සෙසු කොටස්වලද

අට්ඨංගික වාරයේ කොටස් පහේ නය විසිදහසක් වේ. එසේම පංචංගික වාරයෙහිද සබ්බසංගාහික වාරයෙහිද යන සියල්ල නය හැටදහසක් ශාස්තෲන් විසින් බෙදන ලදී. පෙලෙහි සංක්ෂේපයෙන් ආවේය. මෙසේ මෙය ත්‍රිවිධ මහා වාර පසලොස් කොටස් සැටදහසක් නය ප්‍රතිමණ්ඩිත වූ අභිධම්ම භාජනියෙහි විස්තර කරන ලදැයි දතයුතුය.

## අභිධම්ම භාජනිය වර්ණනාව

ප්‍රශ්න විචාරයෙහි චතුස්සත්‍යද ස්කන්ධ විභාගයෙහි කියන ලද ආකාරයෙන්ම කුසලාදිභාවය දතයුතුය. ආරම්මණ ත්‍රිකයෙහි වනාහි සමුදය සත්‍යය කාමාවචර ධර්මයෙහි ආශ්වාදනය කරන්නාට කුඩා අරමුණක් වේ. මාර්ග ධර්මයෙහි ආශ්වාදනය කරන්නාට මහග්ගත අරමුණක් වේ. ප්‍රඥප්තිය ආශ්වාදනය කරන්නාට අරමුණ කිවහැකි නොවේ. දුක්ඛ සත්‍යය කාමාවචර ධර්ම අරමුණු කරගෙන උපන්නේ සුළු අරමුණක් වේ. රූපාරූප ධර්මයන් අරමුණුකැර උපන්නේ මහග්ගත අරමුණකි. නව ලෝකෝත්තර ධර්මයන් ප්‍රත්‍යවේක්ෂා කරන කාලයේ අප්‍රමාණ අරමුණකි. ප්‍රඥප්තිය ප්‍රත්‍යවේක්ෂා කරන කාලයෙහි අරමුණ කිවහැකි නොවේ. මාර්ග සත්‍යය සහජාත හේතු වශයෙන් හැමකාලයේම මාර්ග හේතුක වේ. විරිය හෝ විමංසය හෝ ප්‍රධානකොට මාර්ග භාවනා කාලයෙහි මාර්ගාධිපති වේ. ඡන්ද චිත්තවල වෙනත් අධිපතියකු ඇති කාලයෙහි කිවහැකි නොවේ. දුක්ඛ සත්‍ය ආර්යන් ප්‍රත්‍යවේක්ෂා කරන කාලයෙහි මාර්ගාරම්මණය වේ. ගරුකොට ප්‍රත්‍යවේක්ෂා කරන කාලයෙහි මාර්ගාධිපති වේ. සෙසු ධර්ම ප්‍රත්‍යවේක්ෂා කරන කාලයෙහි කිවහැකි නොවේ. ද්වෙ සච්චානි දුක්ඛ සමුදය සත්‍ය, මේවා අතීත ධර්ම අරබයා උපදින කල අතීත අරමුණු වේ. සමුදය සත්‍යය අධ්‍යාත්ම ධර්ම ආශ්වාදනය කරනවිට අධ්‍යාත්ම අරමුණු වේ. දුක්ඛ සත්‍යය ආකිඤ්චඤ්ඤායතන කාලයෙහි අරමුණ කිව නොහැකි යයි දතයුතුය. මෙසේ මේ ප්‍රශ්න විචාරයෙහි සත්‍ය දෙකක් ලෞකික වේ. සත්‍ය දෙකක් ලෝකෝත්තර වේ. මෙහි මෙසේ පෙර දෙකෙහි සම්බුදුන් විසින් සූත්‍රාන්ත භාජනියාදි තුනෙහිද ලෞකික ලෝකෝත්තර නයෙන් සත්‍ය කියන ලදී.

**සම්මෝහ විනෝදනී නම් විභංග අර්ථ වර්ණනාවේ**
**සතරවන සච්ච විභංග නිද්දේසයයි.**

# 5.
# ඉන්ද්‍රිය විභංගය

ඊට අනතුරුව දැන් ඉන්ද්‍රිය විභංගයෙහි **බාවීසති** යනු ගණන පිරිසිඳීමයි. ඉන්ද්‍රියානි යනු වෙන්කරන ලද ධර්මය දැක්වීමයි. දැන් ඒවා ස්වරූප වශයෙන් දැක්වෙන්නේ **චක්ඛු ඉන්ද්‍රියං** ආදිය කීහ. එහි චක්‍ෂු ද්වාරයෙහි ප්‍රධානත්වය දරනුයේ චක්ඛු ඉන්ද්‍රිය වේ. සෝත, ඝාණ, ජිව්හා, කාය ද්වාරවල ඉන්ද්‍රියාර්ථය කෙරේනුයි සෝතාදි ඉන්ද්‍රිය දැනගැනීමේ ලක්‍ෂණයෙහි ප්‍රධානත්වය ඇති නිසා මනින්ද්‍රිය වේ. ස්ත්‍රීභාවයෙහි ප්‍රධානත්වය නිසා ඉත්ථින්ද්‍රිය වේ. පුරුෂභාවයෙහි ප්‍රධානත්වය නිසා පුරුෂින්ද්‍රිය වේ. අනුපාලන ලක්‍ෂණයෙහි ප්‍රධානත්වය නිසා ජීවිතේන්ද්‍රිය වේ. සැප ලක්‍ෂණයෙහි ප්‍රධානත්වය නිසා සුඛින්ද්‍රිය වේ. දුක්ඛ, සෝමනස්ස, දෝමනස්ස, උපේක්ඛා ලක්‍ෂණවල ඉන්ද්‍රියාර්ථය නිසා දුක්ඛින්ද්‍රිය ආදි වශයෙන් වේ. නිශ්චය ලක්‍ෂණය නිසා සද්ධින්ද්‍රිය වේ. උදව්දීමේ ප්‍රධානත්වය නිසා විරියින්ද්‍රිය වේ. වැටහෙන ලක්‍ෂණයෙහි ප්‍රධානත්වය නිසා සතින්ද්‍රිය වේ. අවික්ෂේප ලක්‍ෂණයෙහි ප්‍රධානත්වය නිසා සමාධින්ද්‍රිය වේ. දර්ශන ලක්‍ෂණයෙහි ප්‍රධානත්වය නිසා පඤ්ඤින්ද්‍රිය වේ. අනඤ්ඤාතං-පවතින දැගන්නා ලක්‍ෂණයෙහි ප්‍රධානත්වය දරණ නිසා අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රිය වේ. දැනගන්නා ධර්මවල මනාසේ දැනගැනීමේ කෘත්‍යයෙහි ප්‍රධානත්වය නිසා අඤ්ඤින්ද්‍රිය වේ. සම්පූර්ණයෙන්ම දැනගැනීමේ ප්‍රධානත්වය නිසා අඤ්ඤාතාවින්ද්‍රිය වේ. මෙහි සූත්‍රාන්ත භාජනීයෙහි නොගන්නා ලද්දේ කුමක් නිසාද? සූත්‍රාන්තයෙහි මේ පිළිවෙළේ ඉන්ද්‍රිය විසිදෙකක් නොආ බැවිනි. සූත්‍රාන්තයෙහි කිසිතැනක ඉන්ද්‍රිය දෙකක් කියන ලදී. කිසිතැනක තුනක්, කිසිතැනක පහක්, මෙසේ නිතර විසිදෙකක් ආවේ නැත. මෙය අටුවා නයයි. මෙය වනාහි වෙනත් නයකි.

**අරුත් ලකුණුද ඈ - පිළිවෙළින් එය දන්නේ**
**බේද අබේද කිස - බූමි විසින් විනිස වේ**

එහි චක්ඛාදි නම් පළමුකොට බලානුයි ඇස ආදි නයින් අර්ථය පවසන ලදී. පසුව ප්‍රකාශකළ තුනෙහි පළමුවැන්න පූර්ව භාගයෙහි නොදන්නා අමුර්ථ පදය වූ චතුරාර්ය ධර්මය හෝ දන්නෙමැයි මෙසේ පිළිපදින්නාට උපදින බැවින් ප්‍රධානත්වය පහළවන බැවින් ද අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රි යයි කියන ලදී. දෙවැන්න නොදන්නා බැවින් ප්‍රධානත්වය පහළවන බැවින් ද අඤ්ඤින්ද්‍රිය වේ. තුන්වැන්න

සම්පූර්ණයෙන් දැනගන්නා චතුස්සත්‍යයෙහි අවසාන ඤාණකෘත්‍යය රහතන් වහන්සේට උපදින බැවින් ප්‍රධානත්වය පහළවන බැවින්ද අඤ්ඤාතාවින්ද්‍රිය වේ. ඉන්ද්‍රියට්ඨ යනු කුමක්ද? ඉන්‍දලිංගට්ඨො ප්‍රධානත්වය සහ අර්ථයෙන් ඉන්ද්‍රියට්ඨ වේ. ප්‍රධානත්වය දේසිත හෙයින් ඉඳුරන් විසින් දක්නා ලද හෙයින් ඉන්ද්‍රියට්ඨ වේ. ඉන්‍දසිට්ඨො ඉන්‍දජුට්ඨො ප්‍රධාන ආඥාව ප්‍රධාන සංඥාව යන අර්ථවලින් ද ඉන්ද්‍රියට්ඨ වේ. ඒ සියල්ල මෙහි සුදුසු පරිදි යෙදේ. භාග්‍යවත් සම්මාසම්බුද්ධයන් වහන්සේ පරම ඓශ්වර්ය බැවින් ඉන්‍ද නම් වේ. කුසලාකුසලවලද කර්මය කර්මවලද කිසිවකුගේ ඓශ්වර්ය භාවයෙන් එයින්ම මෙහි කර්මය දැනගන්නා ඉන්ද්‍රිය කුසලාකුසල කර්මය ඉක්මවා යයි. එයින් ආඥා කෙරේය යන අර්ථයෙන් ඉන්ද්‍රියාර්ථ වේ. මේ සියල්ල භාග්‍යවතුන් වහන්සේ යථා පරිදි දෙසූහ යන ඉන්දදේසිනාර්ථයෙන් ඉන්‍දදේසිතට්ඨෙන ඉන්‍දවෙට්ඨන වා ඉන්ද්‍රියානි. එහෙයින්ම භාග්‍යවතුන් වහන්සේ කිසිවකුට ගෝචර අසේවනයෙහිද කිසිවකුට භාවනා අසේවනයෙහිද ඇසුරු කරන ලදැයි ඉන්ද්‍රියයි දෙසන ලදී. ලක්ඛණාදීහි යනු ලක්ඛණ රස පච්චුපට්ඨාන පදට්ඨාන වශයෙන් චක්ඛු ආදියේ විනිස දැනගනී යන අර්ථයි. එහි ලක්ෂණාදිය යට කියන ලදී. පඤ්ඤින්ද්‍රියාදියෙහි සතර අර්ථ අතුරින් අමෝහයමය. සෙස්ස එහි ස්වරූපයෙන්ම පැමිණියේය.

කමතො යන මෙයද දේශනා ක්‍රමයකි. එහි අජ්ඣත්ත ධර්මය දැන ආර්යභූමි ප්‍රතිලාභය වන්නේ යයි ආත්ම භාවයට ඇතුළත් වූ චක්ඛුන්ද්‍රියාදිය පළමුව දෙසන ලදී. ඒ ආත්මභාවය වනාහි යම් ධර්මයක් නිසා ස්ත්‍රියයි පුරුෂයයි ගණන් ගැනීම ඇතිවේ. එය මෙයයයි දැක්වීමට ඉත්ථින්ද්‍රිය පුරිසින්ද්‍රිය වේ. ජීවිතේන්ද්‍රිය රූප දෙකකි. රූප ජීවිතේන්ද්‍රිය සහ නාම ජීවිතේන්ද්‍රිය වශයෙනි. විඳිනු ලබන සියල්ල සැප දුක් වශයෙන් දැක්වීම සුඛින්ද්‍රිය, සැපඉන්ද්‍රිය වශයෙන් පෙන්වා ඇත. දැකීම නිවැරදි කිරීමට මේ ධර්මයන් වැඩිය යුතුයයි දැක්වීම සඳහා එයින් පසු සද්ධාදි ඉන්ද්‍රියද වෙයි. පිළිවෙලින් මේ ධර්ම තමා කෙරෙහි පළමුව හටගත්තේය. ප්‍රතිපත්තියේ නොසිස්බව දැක්වීම සඳහා ඉන්පසු අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රියද වේ. ඉන්පසු භාවනාවෙන් මෙය අධිගමනය කළේයයි මේ අධිගමය වේ. මේ අධිගත කල්හි ඊට පසු කිරීමට දෙයක් නැතැයි දැක්වීම සඳහා අවසානයේ පරම වින්දනය වූ අඤ්ඤාතාඉන්ද්‍රිය දෙසන ලදී. මෙහි ක්‍රමය මෙසේ වන්නේය.

භේද අභේද යනු මෙහි භේදය ජීවිතේන්ද්‍රිය මය. එය රූප අරූපයයි

දෙපරිදි වේ. සෙසු ඒවා අභේද වේ. මෙසේ මෙහි භේද අභේද වශයෙන් විනිශ්චය දතයුතුය.

කිච්ච යනු කිම ඉන්‍ද්‍රියන්ගේ කෘත්‍යයද චක්ඛුන්‍ද්‍රියේ චක්ඛායතනය චක්ඛු විඤ්ඤාණ ධාතුවෙන් හා ඊට ඇතුළත් ධර්මයන්ගේ ඉන්‍ද්‍රිය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍ය වේයැයි වචනයෙන් ඉන්‍ද්‍රිය ප්‍රත්‍යභාවයෙන් යමක් සැදිය යුතුය. තමාගේ තීක්‍ෂණ මන්දභාවයෙන් චක්ඛු විඤ්ඤාදි ධර්මයන්ගේ තීක්‍ෂණ මන්ද සංඛ්‍යාත තමාගේ ආකාරය අනුව වේ. මෙම කෘත්‍යය මෙසේ සෝත, ඝාණ, ජිව්හා, කාය ඉන්‍ද්‍රියවලද වේ. මනින්‍ද්‍රිය චතාහි සහජාත ධර්මයන් තමාගේ වසගයට පැමිණීම වේ. ජීවිතේන්‍ද්‍රිය සහජාත ධර්මයන්ගේ අනුපාලනය වේ. ස්ත්‍රීන්‍ද්‍රිය පුරිසින්‍ද්‍රිය ස්ත්‍රී පුරුෂ ලක්‍ෂණ වශයෙන් ප්‍රධාන වේ. සුඛ, දුක්ඛ, සෝමනස්ස, දෝමනස්ස ඉන්‍ද්‍රිය සහජාත ධර්මයන් අභිබවනය නොකොට තමාමෙන් ඕලාරික ඕලාරික නොවන ආකාරයන් අනුව පැමිණීමයි. උපෙක්ඛා ඉන්‍ද්‍රිය ශාන්ත ප්‍රණීත මධ්‍යස්ථ ආකාරයන් අනුව පැමිණීමය. සද්ධාදිය ප්‍රතිපක්‍ෂයෙන් අභිබවනය කර සම්ප්‍රයුක්ත ධර්මයන් ප්‍රසන්නාකාර භාවයට පැමිණීමයි. අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්‍ද්‍රිය මුල් සංයෝජන තුන ප්‍රහානය කිරීමෙන්ම වේ. සම්ප්‍රයුක්ත ධර්මයන්ද එය ප්‍රහානය කිරීමට අභිමුඛ කිරීමට වේ. අඤ්ඤින්‍ද්‍රිය කාමරාග ව්‍යාපාදාදිය තුනීකරන ප්‍රහානයද සහජාත ධර්මයන් තමාගේ වසගයට පත්කර ගැනීම අඤ්ඤාතාවිතින්‍ද්‍රියේ සියළු කෘත්‍යවල ඉක්මන් ප්‍රහානයද නිවන අභිමුඛයට පත්කිරීමද වේ.

භූමිතො යනු චක්ඛු, සෝත, ඝාන, ජිව්හා, කාය, ඉත්ථිපුරිස, සුඛ, දුක්ඛ, සෝමනස්ස, ඉන්‍ද්‍රිය මෙහි කාමාවචර වේ. මනින්‍ද්‍රිය ජීවිතේන්‍ද්‍රිය උපේක්ඛා ඉන්‍ද්‍රිය සද්ධා විරිය, සති, සමාධි, පඤ්ඤා, ඉන්‍ද්‍රිය චතු භූමියට ඇතුළත් වේ. සෝමනස්ස ඉන්‍ද්‍රිය කාම, රූප, ලෝකෝත්තර වශයෙන් භූමි තුනකට ඇතුළත් වේ. අවසාන තුන ලෝකෝත්තර වෙයි. මෙසේ භූමි වශයෙන් විනිස දතයුතුය.

සංවේග බහුලව - සිටි බිකු ඉඳුරන් දමා
දැන සියළු ඉඳුරන් - දුක් කෙළවර කරන්නේ

විස්තර කිරීම් වාරයෙහි "යං චක්ඛු චතුන්නං මහා භූතානං" ආදි සියල්ල ධම්මසංගනියේ පද භාජනියෙහි කී ආකාරයෙන් දැනගත යුතුය. විරිඉන්‍ද්‍රිය, සමාධින්‍ද්‍රිය විස්තර ආදියෙහිද සම්මා වායාම සම්මා සමාධි මිච්ඡා සමාධි ආදිය නොකියන ලදී. කුමක් හෙයින්ද? සියල්ල සංග්‍රහ කරන ලද බැවිනි. සබ්බාසංගාහකයෙහි මෙහි ඉන්‍ද්‍රිය කියන ලදී. එහි

මෙසේ ඇත. ඉන්ද්‍රිය දාහත කාමාවචරය තුනක් ලෝකෝත්තරය. නවයක් ලෞකික ලෝකෝත්තර මිශ්‍රය.

## අභිධම්මභාජනීය

ප්‍රශ්න විචාරයෙහි සියළුම ඉන්ද්‍රියන්ගේ කුසලාදි විභාගය පෙලෙහි නයානුසාරයෙන්ම දැනගත යුතුය. ආරම්මණ ත්‍රිකයෙහි **සත්තින්ද්‍රියානි ආරම්මාණතා** යනු චක්ඛු සෝත ඝාණ ජිව්හා කාය ඉත්ථි පුරිස ඉන්ද්‍රිය අරබයා කියන ලදී. ජීවිතින්ද්‍රිය අරූප මිශ්‍ර බැවින් මෙහි නොගන්නා ලදී. **ද්වින්ද්‍රියා** ඉන්ද්‍රිය දෙකක්. සුඛ දුක්ඛ සඳහා කියන ලදී. එහි ඒකාන්ත සුළු අරමුණකි. **දොමනස්සින්ද්‍රියං සියා පරිත්තාරමණං සියා මහග්ගතාරම්මණං** කාමාවචර දහම් අරභයා පවතින කාලයෙහි සුළු අරමුණක් වේ. රූපාවචර අරූපාවචර අරභයා පවතින කාලයෙහි අරමුණ කිව නොහැක. **නවින්ද්‍රියා සියා පරිත්තාරම්මණං** යන්න මන ජීවිත සෝමනස්ස උපෙක්ඛාද ශ්‍රද්ධාදි පහද යන ඉන්ද්‍රියන් සඳහා කියන ලදී. ජීවිතේන්ද්‍රියෙහි රූප මිශ්‍ර බැවින් අණාරම්මණ වූ රූප ධර්මයන්හි සංග්‍රහ වූයේද අරූප කොටසේ එක් පක්‍ෂයක සංග්‍රහ විය. **චත්තාරි ඉන්ද්‍රියානි** යනු සුඛ දුක්ඛ දෝමනස්ස අඤ්ඤාතාඉන්ද්‍රිය යන සතරය. ඒවා මාර්ගාරම්මණ ත්‍රිකයේ නොපවතී. **මග්ගහෙතුකං** යන සහජාත හේතු සඳහා කියන ලදී. විරිය වීමංසා ජ්‍යෙෂ්ඨ කාලයෙහි මාර්ගාධිපති වේ. ඡන්ද චිත්ත ජ්‍යෙෂ්ඨ කාලයෙහි කිවහැකි නොවේ. **දසින්ද්‍රියා සියා උප්පණ්ණා සියා උප්පාදිනො** රූප ඉන්ද්‍රිය සත සහ විපාක ඉන්ද්‍රිය තුන සඳහා කියන ලදී. දසින්ද්‍රිය දෝමනස්සය සමග යට කියන ලදී. එහි දොම්නස් පැණවීම සමග පවතින කාලයෙහි අරමුණ කිව නොහැක. සෙස්ස නිවන ප්‍රත්‍යවේක්‍ෂා කරන කාලයෙහි අරමුණක් නැත. **තීණි ඉන්ද්‍රියානි බහිද්ධාරම්මණානි තීණි ලෝකුත්තර ඉන්ද්‍රියානි** චත්තාරි යනු සුඛ දුක්ඛ සෝමනස්ස දෝමනස්ස යන සතරය. ඒවා අජ්ඣත්ත මෙන්ම බහිද්ධා ධර්ම අරබයා පවතී. **අට්ඨින්ද්‍රියානි** යනු මන ජීවිත උපෙක්ඛා සහ ශ්‍රද්ධාදි පඤ්චඉන්ද්‍රියෝය. එහි ආකිඤ්චඤ්ඤා යතන කාලයෙහි අරමුණ කිවහැකි නොවේ. මෙසේ මේ ප්‍රශ්න විචාරකයෙහි ඉන්ද්‍රිය දහයක් කාමාවචරය. තුනක් ලෝකෝත්තරය. නවයක් ලෞකික ලෝකෝත්තර මිශ්‍රව කියන ලදී. මේ අභිධර්ම භාජනයෙහිද එක් පරිච්ඡේදයක් වේ. මේ ඉන්ද්‍රිය විභංගය ද්විවෘත්තකය ගෙනහැර බෙදා දක්වන ලදී.

**සම්මෝහ විනෝදනී නම් විභංග අර්ථ වර්ණනාවේ**
**පස්වන ඉන්ද්‍රිය විභංග නිර්දේශයයි.**

# 6.
# පටිච්ච සමුප්පාද විභංගය

ඊට අනතුරුව දැන් පටිච්ච සමුප්පාද විභංගයෙහි අයං අවිජ්ජා පච්චයා සංඛාරා යන ආදි නයෙන් පාලිය හැර එහි අර්ථ සංවර්ණනාව කරන්නේ විභජ්ජවාදී මණ්ඩලයට බැස ආචාර්යවරයන් නොඉක්මවා සව සමය නොඉක්මවමින් පරසමය රැස් නොකරමින් සූත්‍ර ප්‍රතිබාහය නොකරමින් විනයට විරුද්ධ නොවෙමින් මහාපදේස විමසා බලමින් ධර්මය විස්තර කරමින් අර්ථය සංග්‍රහ කරමින් එම අර්ථයම නැවත පරිවර්තනය කොට අන්‍ය වූ සමාන වූ නිදර්ශනවල සසඳමින් යම්සේ අර්ථ වර්ණනාව කළයුතු වෙයි. ප්‍රකෘතියෙන් මද දුෂ්කර වූ පටිච්ච සමුප්පාදයේ අර්ථ සංවර්ණනාව පැරන්නෝ යම්සේ (පොරාණයෝ) කීවාහුද.

සස් සත් පිළිසිඳුම්- පස අයුරු යන මේවා
දුදිස් සතර දහම් - දෙසීමද දුස්කර වේ

එහෙයින් ආගමාධිගමයට පත්වූවකු හැර ඉතා අපහසු වූ පටිච්ච සමුප්පාදයේ අර්ථ වර්ණනාව කිරා බලා,

කියැටිවනු අද මම - පස අයුරු වන වැනුමෙක්
සයුරැ ගිලුනකු සේ - සිටිමි පිහිටක් නොලබා

මෙ සසුනද නෙක නෙක - දෙසුම් නිය ලකරින් යුත්
පෙරැදුරුවරුන් මග - නො සිඳී පවතිනු (පෙනේ)

එ කරුණු දෙක ඇසුරු - කරමින් අරුත් විවරණ
අරඹමි අසනු එය - සිත් එකඟකර (සැදැහෙන්)

යම් ඒ කෙනෙක් මේ සිහි කල්පනාවෙන්
අසාද හේ ඉන් ලබමින් විසේසත්
ලබා විසේසත් පෙර සේ පසුත් යම්
නොදැක්මටය් දැන් මරුගේ යැවෙන්නේ

අවිජ්ජා පච්චයා සංඛරා ආදියෙහි මුලින්ම,

දෙසුම් බේද අරුත් - ලකුණින් ද එක් විදි යේ
අඟ හා නියමයන් - දැනගත යුතුය විනිසේ

එහි දෙසනා භෙදතො යන භාග්‍යවතුන් වහන්සේගේ දේශනා ක්‍රමයයි. වැල් ගෙනයන පුරුෂයන් සතරදෙනාගේ වැල් ඇදීම මෙන් මුලින් මැදින් හෝ අවසානය දක්වා එසේ අග මැද සිට හෝ මුල දක්වා යයි පටිච්ච සමුප්පාද දේශනා සතරාකාරය.

යම් සේ වැල්ගෙන යන මිනිසුන් සතරදෙනාගෙන් එක්කෙනෙක් වැලේ මුල පළමුව දකියි. හේ එහි මුල් සිඳ සම්පූර්ණ වැල ඇද කර්මාන්තයේ යොදයි. එසේම භාග්‍යවතුන් වහන්සේ ඉති ඛො භික්ඛවේ අවිජ්ජා පච්චයා සංඛාරා............ජාති පච්චයා ජරා මරණංති මුලපටන් අවසානය දක්වා පටිච්ච සමුප්පාදය දේශනා කරති. යම්සේ වනාහි ඒ පුරුෂයන්ගෙන් එකෙක් වැලේ මැද පළමුව දකී. හේ මැදින් කපා උපරිභාගයම ඇද කර්මාන්තයේ යොදයි. එසේම භාග්‍යවතුන් වහන්සේ "තස්ස තං වෙදනං අභිනන්දතො අභිවදතො අජ්ඣොසාය තිට්ඨතො උප්පජ්ජති තන්‍හි, යා වේදනාසු තන්‍හි තදුපාදානං තස්සුපාදාන පටිච්චයා භවො, භව පච්චයා ජාති" යන මැදින් පටන්ගෙන අවසානය දක්වා දේශනා කරති. යම්සේ ඒ පුරුෂයන්ගෙන් එකෙක් වැලේ අග පළමුව දකියි. හේ අග ගෙන අග අනුසාරයෙන් මුල දක්වා හෝ කපා කර්මාන්තයේ යොදයි. එසේම භාග්‍යවතුන් වහන්සේ "ජාති පච්චයා ජරාමරණංති ඉතිඛො පනෙතං වුත්තං ජාතිපච්චයා නු ඛො භික්ඛවෙ ජරා මරණං නොවා කථං වා එත්‍ථ හොතීති? ජාති පච්චයා භනෙත ජරාමරණං, එවං නො එත්‍ථ හොති ජාති පචචයා ජරාමරණනති භව පච්චයා ජාති..... අවිජ්ජා පච්චයා සංඛාරාති ඉති ඛො පනෙතං වුත්තං, අවිජ්ජා පච්චයා නු ඛො භික්ඛවෙ සංඛාරා නො වා කථං වා එත්‍ථ හොති! අවිජ්ජා පච්චයා භන්තෙ සංඛාරා එවං නො එත්‍ථ හොති! අවිජ්ජා පච්චයා සංඛාරාති පරියොසානතො පටිච්ච යාව ආදිතොපි පටිච්ච සමුප්පාදං දෙසෙති. යම්සේ ඒ පුරුෂයන්ගෙන් එකෙක් වැලේ මැදම පළමුව දකියි. හේ වැල මැදින් කපා යට සිට බලන්නේ මුලට විත් කපා කර්මාන්තයේ යොදවයි. එසේම භාග්‍යවතුන් වහන්සේ ඉමේව භික්ඛවෙ චත්තාරො ආහාරා කිං නිදානා? කිං සමුදයා? කිං ජාතිකා? කිං පභවා? ඉමෙ චත්තාරො ආහාරා තණ්හා නිදානා

තණ්හා සමුදයා තණ්හා ජාතිකා තණ්හා විඵභවා තණ්හා කිං නිදානා? වෙදනා ඵස්සා සළායතනං නාමරූපං විඤ්ඤාණං සංඛාරා කිං නිදානා? සංඛාරා අවිජ්ජා නිදානං අවිජ්ජා පභවාති මජ්ඣතො පට්ඨාය යාව මුල දක්වා දේශනා කරති.

කුමක් හෙයින් මෙසේ දේශනා කරන සේක්ද? පටිච්ච සමුප්පාදයේ හාත්පසින් සොඳුරු බව නිසා සහ තමන්වහන්සේගේ දේශනා විලාශය නිසාද පටිච්ච සමුප්පාදය හාත්පසින්ම සුන්දර නිසා ඒ ඒ පැත්තෙන් අවබෝධය පිණිස පවතී. දේශනා විලාශයට පැමිණි භාග්‍යවතුන් වහන්සේ සිව්වෙසරද පිළිසිඹු යෝගයෙන් සිව්වැදෑරුම් ගැඹුරුබවට පැමිණි නිසාද ඒ දේශනා විලාශයට පැමිණ අනේක නය ක්‍රමවලින් ධර්මය දේශනා කරති. මෙහි විශේෂය නම් මුලපටන් කරන අනුලෝම දේශනාවය. එය පවතින කරුණෙහි විනය පිළිබඳ මුළාවූ විනේය ජනයන් බලමින් යම්සේ ස්වකීය කරුණුවලින් ප්‍රවෘත්තිය දැක්වීම සඳහාත් උපත් ක්‍රම දැක්වීම සඳහාත් පවතින බව දතයුතුය. අවසානයෙහි සිට මුල දක්වා වූ යම් පටිලෝම දේශනාවක් වෙයිද එය අපහසුවෙන් මෙලොවට පැමිණියේය. උපදී. දිරයි මැරෙයි යනාදි නයින් දුකසේ පැමිණි ලෝකය අනුව බලන්නේ පූර්වභාග ප්‍රතිවේදය අනුසාරයෙන් ඒ ඒ ජරාමරණ ආදි දුකට තමාට මුල්වන කරුණු දැක්වීම් සඳහාද, මැද පටන් මුල දක්වා කරන දේශනා එය ආහාර නිදාන නියමයන් අනුසාරයෙන් අතීත මාර්ගය හැර දක්වා නැවත අතීත මාර්ගයේ සිට හේතුඵල පිළිවෙළ දැක්වීම සඳහාද මැද සිට අවසානය දක්වා පවත්නා දේශනා වර්තමාන මාර්ගයේ අනාගත හේතු හටගැන්ම පටන් අනාගත මාර්ගය දැක්වීම සඳහාද අනුලෝම දේශනාව එහි බැහැර කළබවද දැනගත යුතුය.

කුමක් හෙයින් අවිජ්ජාව මුලින් කියන ලදද? ප්‍රකෘති වාදීන්ගේ ප්‍රකෘතිය මෙන් අවිද්‍යාවද ලෝකයේ අකාරණ වූ මූලකාරණයද අකාරණ නොවේ. ආසව සමුදයා අවිජ්ජා සමුදයොති අවිජ්ජාවට කාරණය කියන ලදී. යම් මූල කරුණක් වන්නේ නම් ඊට පර්යාය වන්නේය. එය කුමක්ද? සසර කතාවට ශීර්ෂ වශයෙනි. භාග්‍යවතුන් වහන්සේ සංසාර කථාව කියන්නේ ධර්ම දෙකක් ශීර්ෂ කොට දේශනා කළහ. අවිද්‍යාව සහ භව තෘෂ්ණාව වශයෙනි. යම්සේ කීහ මහණෙනි, අවිද්‍යාවේ මුල් කොන නොපෙනේ. මෙයින් පෙර අවිද්‍යාව නොවීය. ඉක්බිති පසුව පහළවීය. මෙය මෙසේ කියනු ලැබේ. මීට හේතුව අවිද්‍යාවයයි ඉන්පසු පෙනී යයි.

මහණෙනි, භව තෘෂ්ණාවේ මෙයින් පෙර තෘෂ්ණාව නොවීය. ඉන්පසු ඇතිවී යයි ආදි කෙළවර නොපෙනේ. මීට හේතුව භව තෘෂ්ණාවයයි පෙනේ. මේ ධර්ම දෙක ශීර්ෂ කෙළේ ඇයි? සුගති දුගති ගාමීන්ගේ කර්මයේ විශේෂ හේතුව වන නිසාය. දුගතිගාමීන්ගේ කර්මයේ විශේෂ හේතුව අවිජ්ජාය. කුමක් හෙයින්ද? යම්හෙයකින් අවිජ්ජාවෙන් පුහුදුන් තෙමේ ගින්නෙන් තැවීමෙන් පොලුපහර ලැබීමෙන් උත්සාහයෙන් මැඩපවත්වන ලද්දේ වැදු දෙනක් ඒ උත්සාහයෙන් ආශ්වාද රහිතව හිතට අනර්ථයක් ගෙන දෙන්නේද උණුදිය පානය කිරීමක් මෙන් කෙලෙස් සන්තාපයෙන් ආශ්වාදරහිත වූ දුගතියට වැටෙන්නා වූද තමාට අනර්ථය ගෙනදෙන්නා වූද ප්‍රාණඝාතාදි අනෙකප්‍රකාර වූ දූර්ගතිගාමී කර්මවල යෙදෙයි. සුගතිගාමීන්ගේ කර්මයේ විශේෂ හේතුව භව තෘෂ්ණාවය. කුමක් හෙයින්ද? යම් හෙයකින් භව තෘෂ්ණාවෙන් යුත් පෘථග්ජනයා කියන ලද ආකාරයෙන් දෙන සිසිල් ජලයට ආශාවෙන් එය ආශ්වාදනය කරන්නේ තමාගේ දුක දුරුකිරීමට සිහිල් ජලය පානය කරන්නාක් මෙන් කෙලෙස් සන්තාප නැතිව ආශ්වාද සහිතව සුගතියට පැමිණෙන තමාගේ දූර්ගති දුක දුරුකිරීමට සතුන් මැරීමෙන් වැළකීම ආදී අනෙකප්‍රකාර සුගතිගාමී කර්මවල යෙදෙයි. මේ සංසාර කථාවට ශීර්ෂභූත වූ ධර්ම අතරෙන් කිසිවිට භාග්‍යවත්හු එක් ධර්මයක් මූලික කොටද දේශනා කරති. කෙසේද? ඉති ඛො භික්ඛවෙ අවිජ්ජූපනිසා සංඛාරා සංඛාර නිසා විඤ්ඤාණං" ආදිය. එසේම මහණෙනි, උපාදාන ධර්මවල ආශ්වාද වශයෙන් බලන්නාට තෘෂ්ණාව වැඩේ. තෘෂ්ණා ප්‍රත්‍යයෙන් උපාදාන වේ යන ආදි කිසිතැනක උභයමූලිකවද කෙසේද? අවිජ්ජා නීවරණය නිසා තෘෂ්ණාවේ යුක්ත බාලයාට මෙසේ මේ ශරීරය හටගත්තේය යන මේ කයද බාහිර නාමරූප යන මෙහි ඒ දෙක නිසා ස්පර්ශය සළායතන එය ස්පර්ශ කරන බාලයා සැපදුක් විඳියි යන ආදි ඒ ඒ දේශනාවල අවිජ්ජා පච්චයා සංඛාරාති වේ. මෙහි අවිජ්ජා වශයෙන් එක් ධර්මයක් මුල්කොට කළ දේශනා වේ යයි දතයුතුය. මෙහි දේශනා භේදයෙන් විතිස දතයුතුය.

අර්ථ වශයෙන් යනු අවිජ්ජාදි පදයන්ගේ අර්ථ වශයෙන් කෙසේද? පිරීමට නුසුදුසු තැන්වල කාය දුශ්චරිතාදිය අවිද්‍යා නම් වේ. නොලද යුතුය යන අර්ථයයි. ඒ නොලද යුතු දේ ලබත්ය යනු අවිජ්ජා නම් වේ. ඊට විපරීත වූ කාය සුචරිතාදිය විඥිය (ලැබිය යුතු දේ) නම් වේ. ඒ විඳිය යුතු දේ නොවිඳීනුයි අවිජ්ජා නම් වේ. ස්කන්ධයන්ගේ රාශිය අර්ථය, ආයතනවල ආයතන අර්ථය. ධාතුන්ගේ ශූන්‍යතා අර්ථය සත්‍යවල තථ්‍ය

අර්ථය, ඉන්‍ද්‍රියවල අධිපති අර්ථය නොදැන ගැනීම අවිජ්ජා වේ. දුක්ඛාදියේ පෙළීම් වශයෙන් කියන ලද සතරාකාර සතරාකාර අර්ථය නොදැනීම කෙරේනුයිද අවිජ්ජා වේ. කෙළවරක් නැති සංසාරයෙහි සියළු යෝනි ගති භව විඤ්ඤාණය ඇති සත්තාවාසවල සත්වයන් දුවවයි යනුද අවිජ්ජා වේ. පරමාර්ථ වශයෙන් අවිද්‍යමාන වූ ස්ත්‍රී පුරුෂයන් කෙරෙහි දුවයි විද්‍යමාන බන්ධ ආදිය කෙරෙහි නොදුවයි යනුද අවිජ්ජා වේ. තවද චක්ඛු විඤ්ඤාණාදියේ වස්තු අරමුණුවල හේතුඵල හේතුවකින් උපන් ධර්ම වසා තබන හෙයින්ද අවිජ්ජා වේ. යමක් නිසා ඵලයක් ඒද එය ප්‍රත්‍යය වේ. ප්‍රත්‍යය නැතිව එයින් නොවේ. එය ප්‍රත්‍යක්ෂ නොකළ යන අර්ථය වේ. එති යන ඉපදීම (හටගැනීම) ද පැවතීමද යන අර්ථය වේ. තවද උපකාරය යන අර්ථයෙන් ප්‍රත්‍යය යන අර්ථය වේ. අවිජ්ජාවද පච්චයද අවිජ්ජාපච්චය වේ. ඒ නිසා අවිජ්ජා පච්චයා සංඛත අභිසංස්කරණ කෙරෙනුයි සංඛාර වේ. තවද අවිජ්ජා පච්චයා සංඛාරා සංඛාර ශබ්දයෙන් ආගත සංඛාර යන දෙපරිදිය. එහි පුඤ්ඤ අපුඤ්ඤ ආනෙඤ්ජ අභිසංඛාර තුන කායවචී චිත්ත සංඛාර තුන යයි හයක් අවිජ්ජාපච්චයා සංඛාරා වේ. ඒ සියල්ල ලෞකික කුසල අකුසල චේතනා පමණ වේ. සංඛත සංඛාර, අභිසංඛත සංඛාර, අභිසංඛරණ සංඛාර, පයොගම්හි සංඛාර යයි මේ සතර වනාහි සංඛාර ශබ්දයෙන් ආගත සංඛාර නම් වේ. එහි අනිච්චා වත සංඛාරා යන ආදියෙහි කියන ලද සියළු සප්‍රත්‍ය ධර්මයන් සංඛත සංඛාර නම් වේ. කර්ම නිපදවන ත්‍රෛභූමික රූපාරූප ධර්ම අභිසංඛත සංඛාර යයි අටුවාවල කියන ලදී. ඒවා අනිච්චා වත සංඛාර යන මෙහිම ඇතුළත් වේ. වෙන්ව වනාහි ඒවා (පෙළෙහි) පැමිණි තැනක් නොපෙනේ, ත්‍රෛභූමික කුසල අකුසල චේතනා අභිසංඛරණ සංඛාර යයි කියනු ලැබේ. එය "අවිජ්ජාගතොයං භික්ඛවෙ පුරිස පුග්ගලො පුඤ්ඤඤ්චෙව අභිසංඛාරං අභිසංඛරොති" යන ආදියෙහි ආ තැන පෙනේ. කායික චෛතසික වීර්ය පයොගාභිසංඛාරයයි කියනු ලැබේ. එය "යාවතිකා අභිසංඛාරස්ස ගති තාවතිකා ගන්ත්වා අක්ඛාහතං මඤ්ඤෙ අට්ඨාසී"යන ආදියෙහි ආවේය. හුදකලා මෙය පමණක් නොව අන්‍ය වූද "සංඥා වෙදයිත නිරොධ" සමවැදුණු භික්ෂුවට පළමුව වචීසංඛාර නිරුද්ධ වේ. ඉක්බිතිව කාය සංඛාරද ඉක්බිතිව චිත්ත සංඛාරයද ආදි ක්‍රමයෙන් සංඛාර ශබ්දයෙන් ආ නොයෙක් සංඛාර වේ. ඒවා අතරෙන් සංඛත සංඛාරයෙහි සංග්‍රහයට නොගිය සංඛාරයක් නැත.

මෙයින් පසු සංඛාරපච්චයා විඤ්ඤාණං යන ආදියෙහි යමක් කියන ලදද එය කියන ලද ආකාරයෙන් දත යුතුය. නොකියන ලද්ද වනාහි

දැනගනීනුයි **විඤ්ඤාණං** වේ. නැමේනුයි **නාම** නම් වේ. වෙනස්වේනුයි **රූප** නම් වේ. අය පතුරුවයි. ආයතද පමණුවයි **ආයතන** වේ. ස්පර්ෂ කරයි. **ඵස්ස**. විඳීනුයි **වේදනා**. ආසාවෙහි අසීමිත වේනුයි **තණ්හා**. අල්වා ගනීනුයි **උපාදාන** වෙයි. **භවො** ඉපදවීම **ජාති**. දිරීම **ජරා**. මරණය මෙයින්ය **මරණං**. සෝක කිරීම **සොකො**. විලාප කීම **පරිදෙවො**. දුකට පත්කිරීම **දුක්ඛ**. උත්පාද ඨිති වශයෙන් හෝ දෙයාකාරයෙන් කරයිද දුක්ඛ වේ. **දුර්මනවීම දෝමනස්ස** බොහෝ කරදර **(ආයාස) උපායාස** වේ. **සම්භවන්ති** උපදී. තනිකර සෝක ආදිය නොවේ. සියළු පදවලට සම්භවන්ති ශබ්දය යෙදිය යුතු වේ. අවිජ්ජා පච්චයා සංඛාරා යයි කී කල්හි කුමක් කෙරේදැයි නො පෙන්වයි. සම්භවන්ති යෙදීමෙන් අවිජ්ජති සා පච්චයාති අවිජ්ජාපච්චයා එසේ හෙයින් "අවිජ්ජා පච්චයා සංඛාරා සම්භවන්ති" පච්චය පච්චුප්පන්න නියමය වෙයි. සියළු තන්හි මේ නයයි. එවං යනු දක්වන ලද ක්‍රම නිදර්ශනයයි. එහෙයින් අවිජ්ජාදී හේතුවෙන්ම. ඊශ්වර නිර්මාණාදියෙන් නොවේ යයි දක්වයි. **එතස්ස** යනු කියන ලද පරිදි. **කෙවලස්ස** සම්මිශ්‍ර නොවූ. සියල්ල හෝ **දුක්ඛක්ඛන්ධස්ස** දුක් සමූහය. සත්වයින්ට සැප සුබ වශයෙන් නොවේ. සමුදය - උපදියි. හටගනියි. හොති සිදුවේ. මෙසේ මෙහි අර්ථ වශයෙන් දතයුතුය.

ලක්ඛණාදි යනු අවිජ්ජාදි ලක්‍ෂණ වශයෙන් කෙසේද? අවිජ්ජාව නොදැනීම් ලක්‍ෂණය. මුළාකිරීම කෘත්‍යයයි. වැසීම වැටහෙන කාරණයයි. ආශ්‍රවය ආසන්න කාරණය සංඛාර අභිසංස්කරණය ලක්‍ෂණයයි. රැස්කිරීම කෘත්‍යයය. චේතනාව වැටහෙන කරුණය. අවිද්‍යාව ආසන්න කාරණය. විඤ්ඤාණය දැනගැනීමේ ලක්‍ෂණ වේ. ඉදිරියෙන් යෑම කෘත්‍යය ප්‍රතිසන්ධිය වැටහෙන ආකාරයය. සංස්කාර ආසන්න කරණය. වස්තු අරමුණු කිරීම හෝ ආසන්න කාරණය. නාමය නැමීම ලක්‍ෂණයය. සම්ප්‍රයෝගය කෘත්‍යය වෙන් නොවීම වැටහෙන කාරණය. විඤ්ඤාණය ආසන්න කරුණය. රූපය වෙනස්වීම ලක්‍ෂණය. විසිරීම කෘත්‍යය. ප්‍රකාශ නොකරන වැටහෙන කරුණය. විඤ්ඤාණය ආසන්න කරුණය. සළායතන රැස්වන ස්ථානය ලක්‍ෂණයයි. දස්සනාදිය කෘත්‍යය වේ. වස්තු ද්වාරභාවය වැටහෙන ආකාරයයි. නාමරූප ආසන්න කරුණය. ඵස්ස ස්පර්ෂ ලක්‍ෂණය යයි. ගැටුම කෘත්‍යයය. එක්වීම වැටහෙන ආකාරය සළායතන ආසන්න කරුණය. වේදනා අනුරූපවන (විඳීම) ලක්‍ෂණය විෂය රසය හා එක්වීම කෘත්‍යයය. සැප දුක් වැටහෙන ආකාරයය. ස්පර්ශය ආසන්න කාරණය. තණ්හා හේතු ලක්‍ෂණය සතුටුවීම කෘත්‍යය

තෘප්තිමත්භාවයට නොපැමිණීම වැටහෙන කාරණය වේදනා ආසන්න කරුණය. උපාදානය ග්‍රහණය කිරීම ලක්‍ෂණය. මුදා නොහැරීම කෘත්‍යයය. තෘෂ්ණා දෘඪ ආත්ම දෘෂ්ටිය වැටහෙන ආකාරය. තෘෂ්ණාව ආසන්න කාරණය. භවො කර්ම කර්මවල ලක්‍ෂණය (භව භවන) වීම කෘත්‍යයය කුසල අකුසල අව්‍යාකත වැටහෙන ආකාරය උපාදානය ආසන්න කරුණය. ජාති ආදියෙහි ලක්‍ෂණ සච්ච විභංගයෙහි කී ආකාරයෙන් දැනගන්න. මෙසේ මෙහි ලක්‍ෂණාදි වශයෙන් විනිස දතයුතුය. එකවිධාදිතො යන මෙහි අවිජ්ජාව - නොදැනීම නොපෙනීම මෝහය ආදි වශයෙන් ඒකවිධය. ප්‍රතිපත්තියක් නැති මිථ්‍යා ප්‍රතිපත්ති වශයෙන් හා සසංඛාර අසංඛාර වශයෙන් ද්විධය. වේදනා තුනෙන් යුත් නිසා ත්‍රිවිධය. චතුස්සත්‍ය අප්‍රතිවේද වශයෙන් චතුර්විධය. ගති පඤ්චකාදිය වසන බැවින් පංචවිධය. ද්වාර ආරම්මණ වශයෙන් සියළු අරූප ධර්මවල ෂඩ්විධ නය දතයුතුය. සංඛාරය - ආශ්‍රව සහිත විපාක ධර්මාදි භවයෙන් ඒකවිධය. කුසලාකුසල වශයෙන් ද්විධය. එසේම පරිත්ත මහග්ගත, හීන, මජ්ඣිම, මිච්ඡත්ත බොරු සම්මත්ත (නිවැරදිව) නියත අනියත වශයෙන් ද්විධය. පුඤ්ඤාදි සංස්කාර භාවයෙන් ත්‍රිවිධය. සතර යෝනි පැවතීම් වශයෙන් චතුර්විධය. පංචගතිගාමී හෙයින් පංචවිධය. විඤ්ඤාණය-ලෞකික විපාකාදි භාවයෙන් ඒකවිධය. සහේතුක අහේතුක භේදයෙන් ද්විධය. භවත්‍රය ඇතුළත් හෙයින් ද වේදනාත්‍රයෙහි යුක්ත හෙයින්ද අහේතුක ද්‍රිහේතුක ත්‍රිහේතුක වශයෙන් ත්‍රිවිධය. යෝනි ගති වශයෙන් චතුර්විධ ද පංචවිධ ද වේ. නාමරූපං විඤ්ඤාණය ඇසුරු කරන නිසාද කර්ම ප්‍රත්‍යයද නිසා ඒකවිධය. සාරම්මණ අනාරම්මණ වශයෙන් ද්විධය. අතීතාදී වශයෙන් ත්‍රිවිධය. යෝනි ගති වශයෙන් චතුර්විධ පංචවිධද වේ. සළායතනය හටගැනීම බැසීම් ආසන්න අර්ථයෙන් ඒකවිධය. භූතප්‍රසාද විඤ්ඤාණ වශයෙන් ද්විධය. සම්පන්න අසම්පන්න උභයගෝචර නොවීමෙන් ත්‍රිවිධය. යෝනි ගති ඇතුළත් හෙයින් චතුර්විධ පංචවිධ වේ. මේ ක්‍රමයෙන් එසසාදීන්ගේද ඒකවිධභාවය දැනගත යුතුය. මෙසේ මෙහි ඒකවිධාදි වශයෙන් විනිස දතයුතුය.

අංගඳ නියමයන්ද සෝකාදියද භවචක්‍රයේ නොකැඩීම දැක්වීම සඳහා කියන ලදී. ජරාමරණ කැඳවන බාලයාව ඒවා හටගනී. මෙසේ කීය. "මහණෙනි, අශ්‍රැතවත් පෘථග්ජනයා කායික දුක් වේදනාවෙන් ස්පර්ශ (පෙළුනේ) කරන ලද්දේ සෝක කරයි. ක්ලාන්ත වෙයි. වැලපෙයි. පපුවට ගසා ගනිමින් හඬයි. මුළාවට පැමිණෙයි. යම් තවත් ඒවා පවතී ද ඒතාක්

අවිද්‍යාව ඇතැයි නැවතද "අවිජ්ජා පච්චයා සංඛාරා" යයි භව චක්‍රය සම්බන්ධ වෙයි. එහෙයින් ඒවා ජරාමරණවලට සාපේක්ෂ කොට පටිච්ච සමුප්පාද අංග දොළහ යයි දතයුතුය. මෙසේ එහි අංග නියමය වශයෙන්ද විනිස දැනගත යුතුය. මෙය මෙහි උද්දේස වශයෙන් සාපේක්ෂ කථාවය.

දැන් නිද්දේස වශයෙන් විස්තර කථාව වෙයි. "අවිජ්ජා පච්චයා සංඛාරා" යයි කියන ලදී. එහි අවිද්‍යා ප්‍රත්‍යයෙන් සංඛාර දැක්විය යුතු කල්හි පුතා ගැන කිවයුතු කල්හි පියා ගැන යම්සේ කියයිද මෙසේ ඇතිකල්හි මිතුරාගේ පුතා දත්තගේ පුතා යයි පුතා ගැන පැහැදිලිව කිව්වා නම් වේ. එහෙයින් දේශනා දක්ෂ වූ ශාස්තෘන් වහන්සේ සංස්කාර ජනනය කළ අර්ථයෙන් පියා සමාන අවිජ්ජාව පළමුකොට දැක්වීමට "තත්ථ කතමා අවිජ්ජා? දුක්ඛෙ අඤ්ඤාණං" යයි වදාළහ. එහි යම්හෙයකින් මේ අවිද්‍යාව තත්වූ පරිදි ලක්ෂණ දැනගැනීමට බැලීමට අවබෝධ කරගැනීමට නොදෙයි. වසා හාත්පසින් වෙලා ගැටගසා සිටියි. ඒ නිසා දුක්ඛ අඤ්ඤාණ කියයි. එසේම දුක්ඛ සමුදයේ දුක්ඛ නිරෝධයේ දුක්ඛ නිරෝධගාමිනී ප්‍රතිපදාවේ තත්වූ පරිදි ලක්ෂණ දැනගැනීමට බැලීමට අවබෝධ කරගැනීමට නොදෙයි. වසා හාත්පසින් වෙලා ගැටගසා සිටියි. ඒ නිසා දුක්ඛ නිරෝධගාමිනී පටිපදාය අඤ්ඤාණං නයයි කියයි. මේ සතර ස්ථානයෙහිම අඤ්ඤාණය අවිජ්ජා යයි සූත්‍රාන්ත පරියායෙන් (ක්‍රමයෙන්) කියන ලදී. නික්ෂෙප කාණ්ඩයෙහි අභිධර්ම පරියායෙන් "පුබ්බන්තෙ අඤ්ඤාණ" නය අපරයෙහි සමාන සතරේ අඤ්ඤාණය ද ගන්න ලදී. එහි පුබ්බන්තෙ යනු අතීත මාර්ගයයි. අතීත ස්කන්ධ ධාතු ආයතනයෝය. අපරන්තෙ යනු අනාගත මාර්ගය. අනාගත ස්කන්ධ ධාතු ආයතනයෝය. පුබ්බන්තාපරන්තෙ ඒ දෙකමය. ඉදපටිච්චයතා යනු සංස්කාරාදියේ හේතුවන අවිජ්ජාදි අංගයෝය. පටිච්ච සමුප්පන්න ධම්මා යනු අවිජ්ජාදියෙන් නිපදවන ලද සංස්කාරාදි ධර්මයෝය. එහි මේ අවිජ්ජාව යම් හෙයකින් අතීත ස්කන්ධාදීන්ගේ තත්වූ පරිදි ලක්ෂණ දැනගැනීමට බැලීමට අවබෝධ කරගැනීමට නොදෙයි. වසා හාත්පසින් වෙලා ගැටගසා සිටියි. ඒ නිසා පුබ්බන්තෙ අඤ්ඤාණං යයි කියනු ලැබේ. එසේම අනාගත, අතීතානාගත ස්කන්ධාදීන්ගේ ඉදප්පච්චයතාවද පටිච්චසමුප්පන්න ධර්මද තත්වූ පරිදි ලක්ෂණ දැනගැනීමට බැලීමට අවබෝධ කරගැනීමට නොදෙයි. වසා හාත්පසින් වෙලා ගැටගසා සිටියි. එයින් ඉදප්පච්චයතා පටිච්චසමුප්පන්න ධම්මෙසු අඤ්ඤාණං යයි කියනු ලැබේ. මේ ස්ථාන අටේ අභිධර්ම පරියායෙන් අඤ්ඤාණය අවිජ්ජා යයි

කියන ලදී. මෙසේ කුමට කියන ලදද? කෘත්‍ය වශයෙන් හා ජාති වශයෙන් අවිජ්ජාව කියන ලදී. කෙසේද? මේ අවිජ්ජාව මේ අට ස්ථානයන් දැනගැනීමට බැලීමට අවබෝධ කරගැනීමට නොදෙයි යනු කෘත්‍ය වශයෙන් කියන ලදී. උප්පජ්ජමානාපි ඉමෙසු අට්ඨාසු ඨානෙසු උප්පජ්ජතීති යනු ඉපදීම් වශයෙන් කියන ලදී. මෙසේ කියා නැවත යං එවරූපං අඤ්ඤාණං දස්සනං ආදි පදවිසිපහකින් අවිද්‍යාවේ ලක්‍ෂණ දැක්වීමට ගනී. එහි මේ අවිද්‍යාව මේ අටපදයෙන් කියන ලදැයි නැවත පද විසිපහකින් ලක්‍ෂණ නොකියයි නම් එය හොඳින් කිව්වා නොවේ. ලක්‍ෂණ කිව්වොත් හොඳින් කිව්වා වේ. යම්සේ මිනිසෙක් නැතිවූ ගොනකු සොයන්නේ ඔහු, මිනිසුන් විචාරයි. ආර්යයෙනි, ඔබ සුදු ගොනෙකු දැක්කද රතු ගොනෙකු දැක්කදැයි ඔව්හු මෙසේ කියන්නාහුය. මේ රටේ සුදු රතු ගොන් කෙළවරක් නැත. ඔබේ ගොනාගේ ලක්‍ෂණ මොනවාද? ඉක්බිති ඔහු රවුමැති තගුලකැයි කීකල්හි ගොනා ගැන හොඳින් කිව්වා වෙයි. එසේම මේ අවිජ්ජාව පද අටකින් කීවේ මුත් නැවත පද විසිපහකින් නොකීවේ නම් හොඳින් කිව්වා නම් නොවේ. ලක්‍ෂණ කී කල්හි පමණක් හොඳින් කිව්වා වෙයි. එහෙයින් මෙහි ලක්‍ෂණ දැක්වීමට පද විසිපහක් කියන ලදී. ඒවා ඒ ආකාරයෙන් දතයුතුය. කෙසේද? ඤාණය නම් ප්‍රඥාවය. එය අත්‍යර්ථයෙන්ම චතුස්සත්‍ය ධර්ම වේ. හේතුකාරණා දැනගෙන ප්‍රකට කරයි. මේ අවිජ්ජාව ඇතිවී එය දැන ප්‍රකට කිරීමට නොදෙයි යන ඤාණයට විරුද්ධ වූ හෙයින් අඤ්ඤාණ වේ.

දස්සනං යනුද ප්‍රඥාවය. එයද එහි ආකාරය දකියි. අවිජ්ජාව වනාහි ඉපිද එය බැලීමට නොදෙයි යන අදස්සනය වේ. අභිසමය යනුද ප්‍රඥාවය. එය එහි ආකාරය අවබෝධ කරයි. අවිජ්ජාව ඉපදී එය අවබෝධ කිරීමට නොදෙයි යනු අනභිසමය යි. අනුබෝධ සම්බෝධ පටිවේද යනුද ප්‍රඥාවය. එය එහි ආකාරය අනුබෝධ කරයි. අවබෝධ කරයි. ප්‍රතිවේද කරයි. අවිජ්ජා එය අනුබෝධ කරන්නට අවබෝධ කරවන ප්‍රතිවේධ කරන්නට ඉඩ නොදෙයි යනු අනනුබෝධ අසම්බෝධ අප්පටිවේද යනු වේ. සධගාහණා යනුද ප්‍රඥාවය. එය එහි ආකාරය ගෙන පරීක්‍ෂා කොට ගනියි. අවිජ්ජාව ඉපිද එය ගෙන පරීක්‍ෂා කොට ගැනීමට නොදෙයි යනු අසංගාහණා වේ. පරියොගහණ යනුද ප්‍රඥාවය. එය එහි ආකාරයට බැසගෙන ඇතුළට පිවිස ගනියි. අවිජ්ජාව ඉපිද ඊට බැස පිවිස ගැනීමට නොදෙති යයි අපරියෝගාහණා වේ. සමවෙක්ඛණා යනුද ප්‍රඥාවය. එහ එහි ආකාරය සමව මනාව දකියි. අවිජ්ජාව ඉපිද එය සමව මනාව

දැකීමට නොදෙයි යනු අසම්පෙක්ඛණා වේ. පච්චවෙක්ඛණා යනුද ප්‍රඥාවය. එය එහි ආකාරය ප්‍රත්‍යාකාරය. අවිජ්ජාව ඉපිද එය ප්‍රත්‍යක්‍ෂ කිරීමට නොදෙයි යනු අපච්චවෙක්ඛණා වේ. මොවුහු කිසි පච්චක්ක (ප්‍රත්‍යක්‍ෂ) කර්මයක් නැත. තෙමේ ප්‍රත්‍යවේක්‍ෂා නොකර කරන ලද කර්මය අපච්චක්ක කම්ම වේ. නුවණ නැතිකම දුම්මෙජ්ඣං වේ. මෝඩකම බාල්‍යං වේ. සම්පජඤ්ඤං යනු ද ප්‍රඥාවය. එය අර්ථය හේතුව සහිත චතුස්සත්‍ය මනාව දන්නේය. අවිජ්ජාව ඉපදී එහි ආකාර දැකීමට ඉඩ නොදෙයි යන්න අසම්පජඤ්ඤ වේ. මුළා කිරීම වශයෙන් මෝහ වේ. වඩා මුළාකිරීම පමොහ වේ. සිහිනැති වශයෙන් සම්මෝහ වේ. නොවිදිය යුත්තක් විඳීනුයි අවිජ්ජා වේ. සංසාරයෙහි වෙන්වෙයි ගිල්වයි යනු අවිජ්ජොඝො වේ. සංසාරයෙහි යොදයි යනු අවිජ්ජායොගො වේ. අප්‍රහීන වශයෙන් නැවත නැවත ඉපදවීමෙන් අවිජ්ජානුසය වේ. මාර්ගයෙහි නැඟී සිටි සොරෙක් මගියකු අල්ලා ගන්නා සේ කුසල් සිත නැගිට පැහැරගනියි යන අවිජ්ජා පරියුට්ඨානං වේ. යම්සේ නගරද්වාරයෙහි දොරටු වසා පලිස ලඩසිය නම් (දොරවල් හරහා දමනා විසඳ දැව කඳ කෘත්‍රිම වැටුණු පසු ඇතුළු නගර වාසීන්ට පිටට ඒමටත් පිටතවාසීන්ට නගරය තුළට යෑමත් සිදී යයි. එසේම යමෙකුගේ සක්කාය නගරද්වාරයෙහි මෙය (අවිජ්ජා) වැටුණුවිට නිවනට පමුණුවන ඔහුගේ ඤාණ ගමන සිදී යයි යන අවිජ්ජාලංඝී නම් වේ. අකුසලයද මුල්ද එයමනුයි හෝ අකුසලයන්ගේ මුල අකුසල මූල වේ. එය අන් කිසිවක් නොවේ. මෙහි අදහස් කළ මෝහය යන මොහො අකුසල මූලං වේ. අයං වුච්චති අවිජ්ජාති මෙය මේ ලක්‍ෂණවලින් අවිජ්ජා යයි කියනු ලැබේ. මෙසේ පද විසිපහෙන් අවිජ්ජා ලක්‍ෂණ දැනගත යුතුය. මෙබඳු ලක්‍ෂණවලින් යුත් අවිජ්ජාව දුක්ඛාදියෙහි අඤ්ඤාණ යයි කියන ලද්දේ මුත් දුක්ඛ සත්‍යය එක් දේශයක් පමණි. සහජාත වෙයි. එය අරමුණු කරයි. වසයි. සමුදය සත්‍යයේ ඒක දේශයක් නොවේ. සහජාත වෙයි. එය අරමුණු කරයි. වසයි. නිරෝධ සත්‍යයේ ඒකදේශයක් නොවේ. සහජාත නොවේ. එය අරමුණු නො කෙරේ. එම අරමුණ (නිවන) තනිව වසයි. මාර්ග සත්‍යයේද කොටසක් නොවේ. සහජාත නොවේ. එය අරමුණු නොකෙරේ. තනිව වසයි.

දුක් අරමුණුවලින් අවිජ්ජා උපදී. එය වසයි. සමුදය අරමුණුවලින් අවිජ්ජා උපදී. එය වසයි. නිරෝධ අරමුණුවලින් අවිජ්ජාව නූපදියි. එය වසයි. මාර්ග අරමුණුවලින් අවිජ්ජාව නූපදී. එය වසයි. සත්‍ය දෙක දැකීමට අපහසු බැවින් ගැඹුරුය. සත්‍ය දෙක ගැඹුරු බැවින් දැකීමට

අපහසුය. තවද නිරෝධ සත්‍යය ගැඹුරුද දැකීමට අපහසුද වේ. එහි දුක ප්‍රකටය. ලක්‍ෂණය වනාහි ගැඹුරු බැවින් දැකීමට අපහසුය. සමුදයෙහිද මෙම නයමය. මහා සමුද්‍ර කළඹා ඕජස බැහැර ගැනීම අමාරුය. මහාමේරුව පාදයෙහි වැලි ඉවත්කිරීම අමාරුය. ජීවිතය පීඩනයට පත්කර රසය බැහැර කිරීම අමාරුය. එසේම සත්‍ය දෙක ගැඹුරු බැවින්ම දැකීම අපහසුය. නිරෝධ සත්‍යය අති ගැඹුරුද අති දුර්දසද වේ. මෙසේ දැකීමට අපහසු ගැඹුරෙනුත් ගැඹුරු බැවින් දැකීමට අපහසු වූ චතුරාර්ය සත්‍යය වසන මොහො අඳුර මේ අවිජ්ජාව යයි කියනු ලැබේ.

සංස්කාර පදයෙහි යට කියන ලද සංස්කාරවල සංස්කාර ශබ්දයෙන් ආ සංස්කාරයන් ස්පර්ශ නොකොට (සම්බන්ධ) අවිජ්ජාපච්චයා සංඛාරයම දක්වන්නේ **තත්‍ථ කතමෙ අවිජ්ජා පච්චයා සංඛාරා? පුඤ්ඤාභි සංඛාරො** යන ආදිය කීහ. එහි නැවත තමාගේ අදහස හා ක්‍රියාව සම්පූර්ණ කරමින් පින ද සිදුකරන්නේ උපදවන්නේ පුඤ්ඤ නම් වේ. විපාකය අභිසංස්කරණය කරයි කරන ලදැයි යනු අභිසංඛාර වේ. පුඤ්ඤ ද අභිසංඛාරය ද පුඤ්ඤාභිසංඛාර වේ. පුඤ්ඤ ප්‍රතිපක්‍ෂ බැවින් අපුඤ්ඤාභි සංඛාර වේ. කැමති නොවේ යනු ආනෙඤ්ජ වේ. ආනෙඤ්ජයව අභිසංඛාර වූයේ ආනෙඤ්ජ භවය අභිසංස්කරණය කරයි යන ආනෙඤ්ජාභිසංඛාර වේ. කයින් පවත්වන කයින් පැවතුන හෝ සංඛාර යයි කාය සංඛාර වේ. වචී සංඛාර චිත්ත සංඛාරවල ද මෙම නයයි. එහි ප්‍රථම ත්‍රිකය පරිවිමංස සූත්‍ර වශයෙන් ගන්නා ලදී. එහි පුඤ්ඤ සංඛාරය **අභිසංඛරණය** කරයි. විඤ්ඤාණය පින එලවන ලද්දේ වෙයි. **අපුඤ්ඤ සංඛාර අභිසංස්කරණ** කරයි. විඤ්ඤාණය අපඤ්ඤූපගමො ආනෙඤ්ජ සංඛාර සංස්කරණය කරයි. විඤ්ඤාණය ආනෙඤ්ජූපග වේ යයි කියන ලදී. ඊළඟ දෙවැනි ත්‍රිකය විභංග සූත්‍රයේ ආකාරයේ ගන්නා ලදී. සම්මා දිට්ඨි සූත්‍ර පරියායෙන් ගන්නා ලදැයි කීම වටීමය. එහි "තයො මෙ භික්ඛවෙ සංඛාරා කතමෙ තයො? කාය සංඛාර වචී සංඛාර චිත්ත සංඛාර යයි කියන ලදී. මේවා සූත්‍ර වශයෙන් ගන්නා ලද්දේ කුමක් හෙයින්ද? මෙය අභිධර්ම නය දැන් නොකියයි. බාහිර ඍෂිවරුන් හෝ ශ්‍රාවකයන් හෝ දෙවියන් හෝ නොකියන ලද්දේය. සර්වඥ වූ ජින භාෂිතයකි මෙය. අභිධර්මයෙහි ද සූත්‍රයෙහි ද එක සමානව පවතී. මේ අර්ථය දැක්වීම සඳහා නිදර්ශිතය. දැන් ඒ සංඛාරයෙහි ප්‍රභේද දැක්වීමට "**තත්‍ථ කතමා පුඤ්ඤාභිසංඛාරා**" යන ආදිය කීහ. එහි **කුසල චේතනා** නියමයක් නොමැති බැවින් චතුභූමක චේතනාද කියන ලදී. කාමාවචර රූපාවචර නියම බැවින් කාමාවචර

කුසල චේතනා අට රූපාවචර කුසල චේතනා පස යන චේතනා දහතුන පුඤ්ඤාභිසංඛාර නම් වේ. දානමය ආදියෙන් ඒ චේතනාවල පුඤ්ඤකිරිය වස්තු වශයෙන් පවතියයි දක්වන ලදී.

එහි කාමාවචර අට ද දාන සීලමය වෙයි. දහතුන භාවනාමය වේ. ප්‍රගුණ වූ ධර්මය සජ්ඣායනය කරන්නා ගැලපීම එකක් දෙකක් වෙනස් වූ බව නොදනී. පසුව ආවර්ජනා කරනවිට දැනගනී. එසේම කසින මූලික භාවනාව කරන්නාට ද ප්‍රගුණ වූ ධ්‍යානය ප්‍රත්‍යවෙක්‍ෂා කරන්නාව ද මෙනෙහි කරන්නාට ද ඤාණවිප්‍රයුක්ත වූ භාවනාවක් වෙයි. භාවනාමය වශයෙන් කුසල් සිත් දහතුනේම යෙදෙනවාක් කීවේ ඒ නිසාය. එය දානමය ආදියෙහි "දානය අරබයා අධික දාන ක්‍රියාවක් උපදින චේතනාව. සංචේතනාව චිත්තබව යන ලක්‍ෂණ ඇති මෙය භාවනාමය පුඤ්ඤාභි සංඛාරයයි කියනු ලැබේ. මෙය සංක්‍ෂෙප දේශනාවය. චීවරාදී සතර පසයෙහිද රූපාදි අරමුණු සයෙහිද ආහරාදි දස දාන වස්තුවලින්ද යම් යම් දෙයක් දෙන්නාට ඒ අවස්ථාවේ ඉපදීමේ සිට පරිත්‍යාග කාලයේ පෙර භාගයෙහිද පසුව සොම්නස් සිතින් සිහිකරන කාලයෙහිද යන තුන් කාලයෙහි පවත්නා චේතනා දානමය නම් වේ. සීලය සම්පූර්ණ කිරීමට පැවිදි වන්නෙමුයි විහාරයට යන්නාට පැවිදිවන අදහස මුදුන්පමුණුවා පැවිදි වූයේ එය ඉතා යහපතියි ආවර්ජනා කරන්නාට පාමොක් සංවරණය වන්නාට චීවරාදි ප්‍රත්‍ය ප්‍රත්‍යවේක්‍ෂා කරන්නාට චක්‍ෂුද්වාර ආදියෙහි රූපාදිය ගැටෙනවිට සංවර වන්නාට ආජීවය පිරිසිදු කරන්නාට පවත්වන චේතනා සීලමය නම් වේ. පටිසම්භිදාවෙහි කියන ලද ආකාරයෙන් විපස්සනා මාර්ගයෙන් ඇස අනිත්‍ය දුක්ඛ අනාත්ම වශයෙන් වඩන්නාට රූපයේ.......ධර්මයේ, චක්ඛු විඤ්ඤාණ....මනෝ විඤ්ඤාණ, චක්ඛු සම්ඵස්ස.... මනෝ සම්ඵස්ස, චක්ඛු සම්ඵස්සජ වේදනා........මනෝ සම්ඵස්සජ වේදනා, රූප සඤ්ඤං.....ධම්ම සුඤ්ඤං, ජරා මරණ අනිත්‍ය දුක්ඛ අනාත්ම වශයෙන් වඩන්නාව පවත්නා චේතනාව භාවනාවමය නම් වේ. මේ විස්තර කථාවයි. අපුඤ්ඤාභි සංඛාර විස්තරයෙහි අකුසලා චේතනා යනු දොලොස් අකුසල සිත් සම්ප්‍රයුක්ත වූ චේතනාවය. කාමාවචරා යනු එහි කිසියම් දෙයක් හැර දොම්නස් චේතනා දෙක සෙසු රූප අරූප භවවල ද උපදී. එහි ප්‍රතිසන්ධිය නොදේ. කාමාවචරයෙහිම ප්‍රතිසන්ධි වශයෙන් විපාකය හැසිරේය යනුවෙන් කාමාවචරයයි කියනු ලැබේ. ආනෙඤ්ජාභි සංඛාර නිර්දේශයෙහි කුසල චේතනා අරූපා යයි අරූපාවචර කුසල චේතනා සතරය. මේ සතර සිදුනොවන අර්ථයෙන්

නොසිදුවීම සංස්කරණය යන අර්ථයෙන් ආනෙඤ්ජාභිසංඛාරයයි කියනු ලැබේ.

රූපාවචර චතුර්ථ ධ්‍යානයෙන් කුසල විපාක කිරිය තුන ද අරූපාවචර දොලොසද යන චේතනා පහලොව නිශ්චල අර්ථයෙන් සහ ස්පන්දනය නොවන අර්ථයෙන් අනෙඤ්ජ නම් වේ. එහි රූපාවචර කුසල චේතනා නොසිදුවීමට සමානව තමා විසින් සමාන වූද අසමාන වූද සිදුවනද නොසිදුවනද රූප සහ අරූප උපදවනු ලැබේ යන්න ආනෙඤ්ජාභි සංඛාර නම් නොවේ. විපාක කිරිය චේතනා වනාහි අවිපාක බැවින් විපාක සංස්කරණය නොකරයි. එසේම අරූපාවචර විපාක කිරිය චේතනා වන එකොලහක් වූ ද මේ චේතනා ආනෙඤ්ජද වේ, සංස්කරණය නොවේ. සතරාකාර වූ අරූපාවචර කුසල චේතනා යම්සේ ඇත් අස් ආදීන් මෙන් ඡායාව වේද තමා සමාන නිශ්චල අරූපම උපදවයි යනු ආනෙඤ්ජාභි සංඛාරයයි කියනු ලැබේ. මෙසේ පුඤ්ඤාභිසංඛාර වශයෙන් දහතුනද අපුඤ්ඤාභිසංඛාර වශයෙන් දොලහද ආනෙඤ්ජාභිසංඛාර වශයෙන් සතරද යන සියල්ල පිඩු කිරීමෙන් එකුන්තිස් චේතනා වෙයි. මෙසේ භාග්‍යවත්හු අප්‍රමාණ සක්වල අප්‍රමාණ සත්වයන් උපදවන කුසල අකුසල චේතනා මහා තරාදියකින් කිරන ලද මෙන් නැළියකට දමා මනිනවා මෙන් සර්වඥ ඥාණයෙන් පිරිසිඳ තිස් එකක්ම දැක්වූහ. දැන් අප්‍රමාණ සක්වල අප්‍රමාණ සත්වයන් කුසලාකුසල කර්ම රැස් කරන්නෝ දොරවල්වලින්ම රැස්කරති. ඒ කර්ම ද්වාර තුන දක්වන්නේ **කතමෝ කතමා කාය සංඛාරො! කාය සංචේතනා** යයි කීහ. එහි කාය සංචේතනා යනු කාය විඥප්තිය උපදවා කාය ද්වාරයෙන් පවත්වන කාමාවචර කුසල චේතනා අට අකුසල චේතනා දොලහ යන චේතනා විස්ස වේ. කාය ද්වාරයෙහි ගෙන අල්ලා සොලවා පමුණුවමින් උපදින කුසලාකුසල චේතනා විස්ස යයි කීමද වටී. වචී සංචේතනා යනු වචී විඥප්තිය උපදවා වචී ද්වාරයෙහි පවතින ඒ වචී ද්වාරයෙහි හනු සොලවමින් වචන බවට පමුණුවමින් උපදින චේතනා විස්ස යයි කීමද වටී.

අභිඤ්ඤා චේතනා වනාහි මෙහි අනුන්ගෙන් විඤ්ඤාණයට ප්‍රත්‍ය නොවේ යයි නොගන්නා ලදී. අභිඤ්ඤා චේතනාව මෙන් උද්ධච්ච චේතනාවද නොවේ. ඒ නිසා එයද විඤ්ඤාණයේ ප්‍රත්‍යභාවයෙන් ඉවත්කළ යුතුය. අවිජ්ජා පච්චයාහි මේ සියල්ලද වේ. **මනෝ සංචේතනා** යනු විඤ්ඤත්ති දෙකම නොඋපදවා මනෝද්වාරයෙහි උපන් සියළු එකුන් තිස් චේතනාය. මෙසේ භගවත්හු අප්‍රමාණ සක්වල අප්‍රමාණ සත්වයන්

කුසලාකුසල කර්ම රැස්කරන්නේ මේ දොරවල් තුනෙන් රැස්කරන්නේ යයි රැස්කරන දොරද දැක්වූහ. මේ ත්‍රික දෙකේ ද අන්‍යොන්‍යව සමග යෙදීමද දතයුතුය. කෙසේද? කාය දුෂ්චරිතයෙන් වෙන්වන්නාව කාය සංඛාරය ඇතිවන්නේය. වචී දුෂ්චරිතයෙන් වෙන්වන්නාව වචී සංඛාරය ඇතිවන්නේය. මෙසේ කාමාවචර අට කුසල් චේතනා පුඤ්ඤාභි සංඛාර ද කාය සංඛාර ද වචී සංඛාර ද වේ. මනෝද්වාරයෙහි උපන් චේතනා දහතුන පුඤ්ඤාභිසංඛාරද චිත්ත සංඛාරද වේ. අපුඤ්ඤාභිසංඛාරයද කාය දුෂ්චරිත වශයෙන් කාය සංඛාරය වන්නේය. වචී දුෂ්චරිත වශයෙන් වචී සංඛාරය වන්නේය. දොරවල් දෙක මුදා මනෝද්වාරයෙහි චිත්ත සංඛාරය වන්නේය යයි මෙසේ අපුඤ්ඤාභි සංඛාර කාය වචී චිත්ත සංඛාර වන්නේය. කාය සංඛාරය පුඤ්ඤාභිසංඛාර අපුඤ්ඤාභිසංඛාර වේ. අනෙඤ්ජාභි සංඛාර නොවේ. වචී සංඛාරයද එසේය. චිත්ත සංඛාරය වනාහි පුඤ්ඤ අපුඤ්ඤ ආනෙඤ්ජ සංඛාර තුනම වන්නේය. මෙය අවිජ්ජා පච්චයා සංඛාර නම් වේ.

මේ සංස්කාර අවිද්‍යා ප්‍රත්‍යයෙන් වේ යයි කෙසේ දැනගත හැකිද? අවිද්‍යාවෙහි සිට වඩන්නා වූ යමෙකුට දුක්ඛාදියෙහි අවිද්‍යා සංඛ්‍යාත අඥ්ඥාණය ප්‍රහීන නොවේ. පුබ්බන්තාදි දුකෙහි අඥ්ඥාණයෙන් සසර දුක් සැප සංඥාවෙන් ගෙන ඊට හේතුවූ ත්‍රිවිධ සංස්කාරයන් සිදුකරයි. සමුදයෙහි නොදැනීමෙන් දුකට හේතුවූ තෘෂ්ණා පිරිවර වූ සංස්කාර සැපයට හේතුවන්නේ යයි හඟිමින් සිදුකරයි. නිරෝධයෙහි ද මාර්ගයෙහිද නොදැනීමෙන් අනිරෝධය හේතුවූ දුකේ ගති විශේෂයෙහි දුක්ඛ නිරෝධ යයි සංඥා ඇතිව අමාර්ගය වූ යඥ්ඥාමරතපා ආදියෙහි නිරෝධ මාර්ග සඥ්ඥා ඇතිව දුක්ඛ නිරෝධය ප්‍රාර්ථනා කරමින් යඥ්ඥාමරතපා ආදි මුඛයෙන් ත්‍රිවිධ සංවර සිදුකරයි. තවද හේ ඒ චතුස්සත්‍යයෙහි අප්‍රහීන වූ අවිජ්ජා විසේසයෝ ජාති ජරා රෝග මරණාදි අනේක ආදීනව ආකීර්ණ වූ පුඤ්ඤඵල සංඛ්‍යාත දුක දුකයයි නොදන්නේ එහි අවිශේෂ (අවබෝධය) සඳහා කාය වචී, චිත්ත සංඛාර භේද වූ පුඤ්ඤාභිසංඛාර සිදුකරති. දෙවඟනන් කැමැත්තෙන් වැලිකතරට වැටෙන්නේ මෙන් සැපය සම්මත වුවත් ඒ පිනේ කෙළවර මහා පීඩාදායක විපරිණාම දුක්ඛාදි ආශ්වාදරහිත වද නොදක්නේද ඒ සඳහා කියන ලද ආකාරයෙන්ම පුඤ්ඤාභිසංඛාර සිදුකරයි. පහන් දැල්ලට වැටෙන පලගැටියකු මෙන් මීබිඳුයෙහි ගිජුව මී තැවරූ සැත් මුවහත ලොවින්නාක් මෙන් කාමසේවනාදියෙහි ද විපාක සහිත ආදීනව නොදක්නේ සුව සංඥාවෙන් මෙන්ම කාම කෙලෙස්වලින්

යුක්ත බැවින්ද ද්වාරත්‍රයෙහි පවත්නා වූද අපුඤ්ඤාභි සංඛාර සිදුකරයි. අසූචි කෙළියෙහි යෙදුණු ළදරුවකු මෙන් මැරෙනු කැමති විස කන්නකු මෙන් අරූප විපාකවලද සංඛාර විපරිණාමය දුක්ඛවද අවබෝධ නැත්තේ සාස්වතාදි විපර්යාසයෙන් චිත්ත සංඛාර ආනෙඤ්ජාභිසංඛාර සිදුකරයි. (පටන් ගනියි) මංමුළා වූවෙක් ප්‍රේත නගරයට යන ගමනක් මෙන් මෙසේ අවිජ්ජා හවයෙන් සංඛාර හවය වේ. මේ සංඛාර අවිජ්ජා ප්‍රත්‍යයේ වේයයි. එනිසා දතයුතුය. කියන ලදී. "අවිදවා භික්ඛවෙ අවිජ්ජාගතො පුඤ්ඤාභි සංඛාරමපි කරොති"........මහණෙනි, නොදැන අවිජ්ජාව පැමිණියේ පුඤ්ඤාභිසංඛාර ද කරයි.

පස වේය පින්වල - යෙදේ දෙපරිදි නේ විදි
එය පැසුළු අන්හට - එක්විදි පසයි වන්නේ

එහි පින් දෙවිදි යයි යනු ආරම්මණ උපනිසය ප්‍රත්‍ය වශයෙනි. එය අවිජ්ජාව ක්‍ෂය ව්‍යය වශයෙන් විමසනවිට කාමාවචර පුඤ්ඤාභිසංඛාර ආරම්මණ ප්‍රත්‍යයෙන් ප්‍රත්‍ය වේ. අභිඤ්ඤා සිතින් මුළා සිත් දැනගන්නාවිට රූපාවචර පුඤ්ඤාභිසංඛාර ආරම්මණ ප්‍රත්‍යයෙන් ප්‍රත්‍ය වේ. අවිජ්ජාව ඉක්මවීමට දානාදි කාමාවචර පින්කිරිය වත් පුරන්නාට සහ රූපාවචර ධ්‍යාන උපදවන්නාට යන දෙදෙනාටම උපනිශ්‍රය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍ය වේ. එසේම අවිජ්ජාවෙන් මුළා වී කාම භව රූපභව සම්පත් ප්‍රාර්ථනා කොට එම පින්කම් කරන්නාට ද එසේය. අන්‍ය වූ අනේකවිධ අපුඤ්ඤාභි සංඛාරවලට නොයෙක් ආකාර ප්‍රත්‍ය වේ. කෙසේද? අපුඤ්ඤාභිසංඛාරද කරයි. අනෙඤ්ජාභි සංඛාරද කරයි. මහණෙනි, යම්හෙයකින් භික්ෂුවගේ අවිජ්ජා ප්‍රහීන වී විද්‍යාව උපන්නේද හේ අවිජ්ජා විරාගයෙන් විජ්ජාව උපදවා ගැනීමෙන් පුඤ්ඤාභි සංඛාර රැස් නොකෙරේමය. මෙහි කීහ. අවිජ්ජා සංඛාරයන්ගේ මේ ප්‍රත්‍යයයි ගන්නේ නම් මෙය කිවයුතුය. මේ සංඛාරයන්ගේ ප්‍රත්‍ය වන්නේ කෙසේද? මේ අවිජ්ජාව අරබයා රාගාදිය උපදිනවිට 'ආරම්මණ ප්‍රත්‍ය වශයෙන්ද ගරුකොට ආශ්වාදය කරනවිට ආරම්මණාධිපති ආරම්මණ උපනිශ්‍රය ප්‍රත්‍යයෙහි ද අවිජ්ජාවෙන් මුළාවී ආදීනව තුන දකිමින් ප්‍රාණඝාතාදී කරන්නාට උපනිශ්‍රය ප්‍රත්‍යයෙහිද දෙවන ජවනාදියට අනන්තර සමන්තර අනන්තර උපනිශ්‍රය ආසේවන නැතිව විගත ප්‍රත්‍යවලින්ද යම්කිසි අකුසලයක් කරන්නාට හේතු සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය සම්ප්‍රයුක්ත අත්ථි අවිගත ප්‍රත්‍යවලින්දැයි අනේකාකාර ප්‍රත්‍ය වෙයි. පැසුළුවූවන්ට එය එකාකාරයකින් ප්‍රත්‍ය වේයයි

කියන්නේ ආනෙඤ්ජාභි සංස්කාරවලට උපනිශ්‍රය ප්‍රත්‍යයෙන්ම නිසා එකාකාර ප්‍රත්‍ය වේ'යයි දතයුතුය. ඒ උපනිශ්‍රයභාවය පුඤ්ඤාභිසංඛාරයෙහි කීනයින් දතයුතුය. මෙහි කීහ. කිම එකම අවිජ්ජාව සංඛාරවලට ප්‍රත්‍යවේද? නැතහොත් අන්‍ය වූ ප්‍රත්‍ය තිබේද? එකම ප්‍රත්‍යය වුවහොත් ඒකහේතුවාදයට පැමිණේ. සංඛාරවලට තවත් ප්‍රත්‍ය තිබේ යයි කිවහොත් අවිජ්ජා පච්චයා සංඛාරා යයි කී ඒක හේතු නිර්දේශය නොවේද? නොවේ. කුමක් හෙයින්ද? යම් හෙයකින්-

එකකින් එකක් මෙන් - නේකින් නේකද නොවේ
නැත එක් පලයක් ද - ඇත හේ පල අරුත එක

මෙහි එක් හේතුවකින් කිසියම් එක් ඵලයක් නැත. අනේක ඵලද නැත. අනේක හේතුවලින් එක් ඵලයක් නැත. අනේක හේතුවලින් අනේක ඵල ඇතිවේ. එසේම අනේක ඍතු පස බීජ ජලය සංඛ්‍යාත හේතුවලින් අනේකවූ රූප ගන්ධ රසාදි වූ අංකුර සංඛ්‍යාත ඵල උපදවනු පෙනේ. යම් හෙයකින් මෙය අවිජ්ජාපච්චයා සංඛාර සංඛාර පච්චයා විඤ්ඤාණං යයි එක එක හේතුඵල දැක්වීමක් කෙළේ නම් එහි අර්ථයක් නැත. ප්‍රයෝජනයක් ඇත. භාග්‍යවතුන් වහන්සේ වනාහි කිසිවක ප්‍රධාන බවද කිසිවක ප්‍රකට බවද කිසිවක අසාධාරණ බවද දේසනා විලාසයද විනේය ජනයන්ට අනුරූප වශයෙන් වූ එකම හේතුව හෝ ඵලයක් හෝ පෙන්වති. ඵස්ස පච්චයා වේදනා යන මෙහි එක් හේතුවක් හා ඵලයක් කීහ. වේදනාවෙහි ප්‍රධාන හේතුව ස්පර්ශයයි. වේදනා නියමය නිසා වේදනාව ස්පර්ශයේ ප්‍රධාන ඵලයයි. යම්සේ වේදනාව ඵස්ස නියමයෙන් වන නිසා සෙමහ සමුට්ඨානා ආබාධාති ප්‍රකට බැවින් එක් හේතුවක් කීහ. මෙහි සෙම ප්‍රකටය. කර්මාදිය ප්‍රකට නොවේ. මහණෙනි, යම්කිසි අකුසල ධර්මයක් වේනම් ඒ සියල්ල අයෝනිසෝමනසිකාරමූල වේ යයි අසාධාරණ බැවින් එක් හේතුවක් දැක්වූහ. අයෝනිසෝ මනසිකාරය අසාධාරණ වන අතර දෝස වස්තු ආරම්මණ ආදිය අකුසල්වලට සාධාරණය. එහෙයින් මෙහි මේ අවිජ්ජාව ඇතිකල්හි සෙසු වස්තු ආරම්මණ සහජාත ධර්මාදියෙහි සංඛාර හේතුඵල ආශ්වාද වශයෙන් බලන්නේ තෘෂ්ණාව වැඩේ යයිද අවිජ්ජාව ඇතිවීමෙන් ආශ්‍රව ඇති වේ යයි යන වචනයෙන් අඤ්ඤසම්පි තණ්හානං සංඛාරා හේතුනං හේතුති පධානත්තා මහණෙනි, නොදැන අවිජ්ජාවට පැමිණ පුඤ්ඤාභි සංඛාර උපදවයි යන්න ප්‍රකට වීද අසාධාරණ බැවින් අසාධාරණ බැවින්ද සංඛාරයන්ගේ හේතුභාව පෙන්වන ලදැයි

දතයුතුය. එකහේතුඵල විස්තර කරන මේ වචනයෙන්ම සියළු ස්ථානවල ඒකහේතුඵල ප්‍රයෝජන දැනගත යුතුය. මෙහි කීහ. මෙසේ ඇතිකල්හි ඒකාන්ත අනිෂ්ට ඵල වූ සාවද්‍ය අවිද්‍යාවෙන් පුඤ්ඤ අනෙඤ්ජ අභිසංඛාර ප්‍රත්‍යභාවයෙන් යුක්තවේද? කොසඹ බීජයකින් උක් නූපදී යයි කෙසේ නොයෙදේද? ලෝකයෙහි

**විරුදු අවිරුදුව ද - එලෙස සම අසමාහි ද**
**සිදුවේ දමේ පස - එ විවා නම් නොවේමැය්**

ධර්මවල ස්ථාන සවභාව කෘත්‍ය ආදිය විරුද්ධවද අවිරුද්ධවද ප්‍රත්‍යවීම ලෝකයෙහි සිදුවේ. පෙර සිත පසු සිතේ ස්ථාන විරුද්ධ ප්‍රත්‍ය වේ. පෙර ශිල්පාදිය හැදෑරීම පසුව පවතින ශිල්ප ක්‍රියාවලට ප්‍රත්‍යය වේ. කර්මය රූපයට ස්වභාව විරුද්ධ ප්‍රත්‍යය වේ. කිරි ආදියේ දී ආදියද එසේය. ආලෝකය චක්ඛු විඤ්ඤාණයට කෘත්‍ය විරුද්ධය. චක්ඛු රූපාදිය චක්ඛු විඤ්ඤාණාදියට ස්ථාන විරුද්ධ ප්‍රත්‍ය වේ. පෙර ජවන පසු ජවනවලට ස්වභාව විරුද්ධද කෘත්‍ය විරුද්ධද වේ. විරුද්ධාවිරුද්ධ ප්‍රත්‍ය සිදුවීම මෙන් සමාන අසමාන ද සිදුවේ. සෘතු ආහාර රූපයට සමානව ප්‍රත්‍ය වේ. හැල් වී බීජ හැල්වී ඵල ආදියට ද එසේය. රූපය අරූපයට අසමානව ප්‍රත්‍ය වේ. අරූපය රූපයටද එසේය. ගවලොම් අං දී තලපිටි ආදියද ඊතණ සුවඳ තණ (සැවැන්දරා වැනි සුවඳ තෘණ) ආදියට අසමානව ප්‍රත්‍ය වේ. යම් විරුද්ධ අවිරුද්ධ සමාන අසමාන ධර්මයකට ප්‍රත්‍ය වේද ඒ ධර්ම ඒ ධර්මයන්ගේ විපාක නොවේ. මෙසේ මේ අවිජ්ජාව ඒකාන්ත අනිෂ්ට ඵල ස්වභාව වශයෙන්ද දෝස සහිත වූද මේ සියළු පුඤ්ඤාභි සංඛාරාදියට අනුරූප පරිදි ස්ථාන කෘත්‍ය ස්වභාව විරුද්ධ අවිරුද්ධ ප්‍රත්‍ය වශයෙන් ද සමාන අසමාන ප්‍රත්‍ය වශයෙන්ද ප්‍රත්‍ය වේයයි දතයුතුය. යමෙකුගේ දුක්ඛාදියෙහි අවිජ්ජා සංඛ්‍යාත නොදැනීම දුරු නොවී පවතීනම් හෙතෙම පුබ්බනතාදිය නොදැනීමෙන් සසර දුක සැප සංඥාවෙන් ගෙන ඊට හේතුවන ත්‍රිවිධ සංඛාර සිදුකරයි යන ආදි නයින් කියන ලදමය. තවද මෙහි වෙනත් ක්‍රමයක් අනුව,

**මිය ඉපදෙන සසර - සකර ලකුණු ද කෙරෙහී**
**යමෙක් පිළිසුමු වන - දහමෙහි මුළා වනුයෙ ද**

**සිදුකරයි හෙ සකර - තුන් විදි ලෙසින් දන්නා**
**මෙ අවිදු පස වේය - තුනටම සකර නම් වන**

මේවායෙහි ඔහු කෙසේ මුළා වන්නහුද? හේ මේ ත්‍රිවිධ සංඛාර කෙරේද? චුතියෙහිදී මුළාවී සියළු තැන ස්කන්ධයන්ගේ බිඳීම මරණයයි. චුතියෙහි නොගෙන සත්වයා මැරෙයි. සත්වයාගේ දෙහාන්තර සංක්‍රමණය ආදිය විකල්පනය කරයි. උත්පත්තියෙහි මුළාවී සියළු තැන ස්කන්ධයන්ගේ පහළවීම ජාති යයි උපත නොගෙන සත්වයා උපදියි. සත්වයාගේ අළුත ශරීරය පහළවීම ආදිය විකල්පනය කරයි. සසරෙහි මුළා වූ යමෙක්

**කඳ පිළිවෙළ ආදි - දාතු ආයතන ද යන**
**නොසිඳි පවතින මෙය - සසරයයි යෙති පඬුවෝ**

මෙසේ විවරණය කරන ලද සසර එසේ නොගන්නේ මෙලොවින් පරලොවට යයි. පරලොවින් මෙලොවට එයි යනාදිය විකල්පනය කරයි. සංස්කාර ලක්‍ෂණයෙහි මුළාවී සංස්කාරයන්ගේ සම්භව ලක්‍ෂණ සහ පල ලක්‍ෂණ නොගන්නේ සංස්කාරය ආත්ම වශයෙන්ද තමා කෙරෙහි ආත්මය ඇතැයිද ස්ථිර වශයෙන් සුභ වශයෙන් සැප වශයෙන්ද විකල්පනය කරයි. පටිච්ච සමුප්පන්න ධර්මයන්හි මුළාවී අවිජ්ජාදියෙන් සංඛාරාදිය පවතින්නේ යැයි නොගෙන ආත්මය දනී හෝ නොදනී හෝ හේ තෙමේම කරයි කරවයිද හෙතෙමේ පිළිසිඳ උපදීයයි සිතයි. ප්‍රධාන කලලාදි භාවයෙන් ශරීරය පිහිටුවා ඉන්ද්‍රියයන් සම්පාදනය කරයි. හෙතෙම ඉන්ද්‍රිය සම්පන්න වූයේ ස්පර්ශ කරයි. විඳියි. ආශා කරයි. අල්ලා ගනියි. ගැටෙයි. හෙතෙම නැවත භවයෙහි වන්නේයයි හෝ සියළු සතුන් නියත සංගති භවයෙන් පරිණාම වන්නේ යයිද කල්පනා කරයි. හෙතෙම මෙසේ අවිද්‍යාවෙන් අන්ධ කරන ලද්දේ මෙසේ කල්පනා කරන්නේ යම්සේ අහසෙහි පොළොවෙහි හැසිරෙන්නේ මගද නොමගද ගොඩද වලද සමතලා බිමද විසම බිමද නොදැන එළඹෙයිද එසේම පුඤ්ඤද අපුඤ්ඤද ආනෙඤ්ජ සංඛාර කරයි. එහෙයින් කියන ලදී.

**යම් හෙයින් දෑ අඳ - මිනිසෙක් මග නොදක්නේ**
**මගින් යයි දවසක් - දවසක් යයි නොමගිනුත්**

**සසරෙහි සැරිසරන - එසේ හොත් මෝඩයා**
**පින් මෙන්ම පව්කම් - කරයි එක් එක් දිනෙහි**

**දහම් දැන යම් දින - හේ සස් අවබෝදයෙන්**
**අවිදු උපසමයෙන් - හැසිරෙයි උපසාන්තව**

මෙය අවිජ්ජා පච්චයා සංඛාරො යන පදයෙහි විස්තර කථාවයි. සංඛාර පච්චයා විඤ්ඤාණ පද නිර්දේශයෙහි චක්ඛුවිඤ්ඤාණං ආදියෙහි චක්ඛු විඤ්ඤාණය කුසල විපාකය අකුසල විපාකය යයි දෙපරිදි වේ. සෝත ඝාණ ජිව්හා කාය විඤ්ඤාණද එසේය. මනෝ විඤ්ඤාණය වනාහි කුසලාකුසල විපාක මනෝධාතු දෙක අහේතුක මනෝ විඤ්ඤාණ ධාතු තුන සහේතුක කාමාවචර සිත් අට රූපාවචර පහ අරූපාවචර සතර යයි දෙවිසි වැදෑරුම් වේ. මෙසේ මේ විඤ්ඤාණ සයෙහි සියළු ලෞකික විපාක විඤ්ඤාණ ලෙස දෙතිස සංග්‍රහ වේ. ලෝකෝත්තර වනාහි සසර කතාවට නොගැලපේයයි නොගන්නා ලදී. එහි මෙය කෙසේ දන්නේද? කියන ලද මේ විඤ්ඤාණ සංඛාර ප්‍රත්‍ය වේ. රැස්කරන ලද කර්මයක් නැතිකල්හි විපාකයක් නැති බැවින්ය. රැස්කරන ලද කර්මයක් නැති බැවින් විපාකයද නූපදී. යම්හෙයකින් උපදින්නේ නම් සියල්ලන්ගේ සියළු විපාකයෝ උපදින්නාහුය. නොඋපදීයයි මෙසේ දතයුතුය. සංඛාර ප්‍රත්‍යයෙන් මේ විඤ්ඤාණය වේ.

කවර නම් සංඛාර ප්‍රත්‍යයෙන් කවර නම් විඤ්ඤාණයක් වේද? කාමාවචර පුඤ්ඤාභිසංඛාර ප්‍රත්‍යයෙන් චක්ඛු විඤ්ඤාණාදි කුසල විපාක පසද මනෝ විඤ්ඤාණයෙහි මනෝධාතු එකද මනෝවිඤ්ඤාණ ධාතු දෙකද කාමාවචර විපාක අටද යන දහසයයි. යම්සේ කීහ. කාමාවචර කුසල කර්මය කළ බැවින් රැස්කළ බැවින් විපාකය වූ චක්ඛු විඤ්ඤාණය උපන්නේ වෙයි. එසේම සෝත ඝාණ ජිව්හා කාය විඤ්ඤාණ උපන්නේ වෙයි. විපාක මනෝධාතුවද උපන්නේ වෙයි. මනෝවිඤ්ඤාණ ධාතුවද උපන්නේ වෙයි. සොම්නස් සහගත මනෝවිඤ්ඤාණ ධාතු උපන්නේ වෙයි. උපේක්ඛා සහගත මනෝවිඤ්ඤාණ ධාතු උපන්නේ වෙයි. සොම්නස් සහගත ඤාණ සම්ප්‍රයුක්ත, සොම්නස් සහගත ඤාණ සම්ප්‍රයුක්ත අසංඛාරික, සොම්නස් සහගත ඤාණ විප්පයුත්ත, සොම්නස් සහගත ඤාණවිප්පයුත්ත සසංඛාරික උපේක්ඛා සහගත ඤාණ විප්පයුත්ත සසංඛාර යයි. රූපාවචර සංස්කාර ප්‍රත්‍යයෝ රූපාවචර විපාක පහද කීහ. රූපාවචර කුසල කර්මය කළ බැවින් රැස්කළ බැවින් කර්මයෙන් වෙන්ව පඨම ඣාන දුතිය තතිය චතුර්ථ පංචම ඣානං උපසම්පජ්ජ විහරති. මෙසේ පුඤ්ඤාභිසංඛාර ප්‍රත්‍යයෙන් විඤ්ඤාණ විසිඑකක් උපදී. අපුඤ්ඤාභිසංඛාර ප්‍රත්‍යයෝ චක්ඛු විඤ්ඤාණාදි අකුසල විපාක පහ මනෝ ධාතු එක මනෝවිඤ්ඤාණ ධාතු එක යයි මෙසේ සත්ආකාර විඤ්ඤාණය වේ. කීහ. අකුසල කර්ම කළ බැව් රැස්කළ බැවින් චක්ඛු

විඤ්ඤාණය හා විපාකය ඉපිදනේ වෙයි. එසේම සෝත ඝාන ජිව්හා කාය විඤ්ඤාණද වේ. මනෝධාතු විපාකය හා මනෝවිඤ්ඤාණ ධාතු විපාකය ඉපදුනේය. ආනෙඤ්ජාභිසංඛාර ප්‍රත්‍යයෙන් සතර අරූප විපාක වශයෙන් විඤ්ඤාණය සතරාකාරය. යථාහ. ඒ අරූපාවචර කුසල කර්මය කළ බැවින් රැස්කළ බැවින් සියළු ආකාරයේ රූප සංඥාව ඉක්මවූ විපාකය ආකාසානඤ්චායතන සංඥාවෙන් යුක්ත, විඤ්ඤාණ...........නේවසඤ්ඤා නාසඤ්ඤායතන සංඥාවෙන් සුඛ විපාක............චතුත්ථජ්ඣානං උපසම්පජ්ජ විහරති මෙසේ සංඛාර ප්‍රත්‍යය යම් විඤ්ඤාණයෙක් වේද එය දැන එහි පැවැත්ම දැනගත යුතුය.

එහි සියල්ලේම පැවැත්ම පටිසන්ධි වශයෙන් දෙයාකාරයකින් පවතී. එහි පඤ්ච විඤ්ඤාණ දෙක (දෙපස් විඤ්ඤාණය) සෝමනස්ස සහගත අහේතුක යන මනෝධාතු දෙක මනෝ විඤ්ඤාණ ධාතුවය යන දහතුන පංචවෝකාර (ස්කන්ධ පහක්) භවයේ පැවතීම් වශයෙන් පවතී. සෙසු එකුන්විසි විඤ්ඤාණ භවත්‍රයෙහි සුදුසු පරිදි පවතින්නේ ප්‍රතිසන්ධිය සඳහාද පවතී. කෙසේද? කුසලවිපාක වූ චක්ඛු විඤ්ඤාණාදි පස කුසල විපාකයෙන් හෝ අකුසල විපාකයෙන් හෝ උපන්නාට, ක්‍රමයෙන් ඉන්ද්‍රියන් පරිපාකයට පැමිණි පසු චක්ඛු ආදීන්ට ආපාතගත වස්තු (අරමුණු වූ) ඉෂ්ට හෝ ඉෂ්ට මධ්‍යස්ථ වූ හෝ රූපාදි අරමුණු අරබයා චක්‍ෂු ආදීන්ගේ ප්‍රත්‍යයන්ද රූපය නිසා දැකීම ඇසීම ගඳ සුවඳ දැනීම රස දැනීම ස්පර්ශය කෘත්‍ය සිදුකරමින් පවතී. අකුසල විපාක පහ කේවලවූ ඒවායේ අනිෂ්ට හෝ අනිෂ්ට මධ්‍යම වූ හෝ රූපාදි අරමුණුද වේ. මෙහි විශේෂය නම් මේ චේතනා දහය නියත ද්වාර ආරම්මණ වස්තු ඨාන ඇතිව නියත වූ කෘත්‍ය සිදුකරමින් පැවතීමය. එයින් කුසල විපාක චක්ඛු විඤ්ඤාණාදියට අනතුරුව විපාක මනෝධාතුව ඒ අරමුණු අරබයා හෘදයවස්තුව නිසා (ඇසුරුකර) සම්පටිච්ඡන කෘත්‍යය සිදුකරමින් පවතී. අකුසල විපාක චක්ඛු විඤ්ඤාණාදියට අනතුරුවද එසේමය. මේ දෙක අනියත ද්වාර ආරම්මණ සහ නියත වස්තු ඨාන කෘත්‍ය වේ. සෝමනස්ස සහගත අහේතුක මනෝවිඤ්ඤාණ ධාතුව කුසල විපාක මනෝධාතුවද අනතුරුව ඒ අරමුණුම අරබයා හෘදය වස්තුවම ඇසුරුකර සන්තීරණ කෘත්‍යය සිදුකරමින් ද්වාර හයෙහි බලවත් අරමුණෙහි කාමාවචර සත්‍වයන්ගේ බොහෝ සෙයින් ලෝභ යුක්ත ජවන අවසානයෙහි භංගවීථියට යයි ද ජවනය ගත් අරමුණෙහි තදාරම්මණ වශයෙන් වරක් හෝ දෙවරක් පවතී. සිත් පැවැත්ම ගණනයෙහි සියළු ද්වාරවල තදාරම්මණයෙහි චිත්තවාර

දෙකක්ම පැමිණියේය. මේ සිත වනාහි තදාරම්මණ යයිද පිට්ඨිභවංගයයිද නම් දෙකක් ලබයි. අනියත ද්වාර ආරම්මණ නියත වස්තු අනියත ඨාන කෘත්‍ය වේයයි මෙසේ පංචවෝකාර භවයෙහි දහතුන පවතීයයි දතයුතුය. සෙසු එකුන්විසි සිත්වල තමාට අනුරූප නොවූ කිසි ප්‍රතිසන්ධියක් නොපවතී. කුසලාකුසල විපාකවල පළමුව පැවතීම - අහේතුක මනෝවිඤ්ඤාණ ධාතු දෙක පස්දොරෙහි කුසලාකුසල විපාක මනෝ විඤ්ඤාණ ධාතුවට අනතුරුව සන්තීරණ කෘත්‍යයද දොරවල් සයෙහි පෙර කී නය ලෙසින්ම තදාරම්මණ කෘත්‍යයද තමා දෙන ලද ප්‍රතිසන්ධියෙන් මතුයෙහි භවංගය කැඩීමත් ඇති චිත්තුප්පාදයෙහි භවංග කෘත්‍යයද අතීතයෙහි චුති කෘත්‍යද කෘත්‍ය සතරක් සිදුකරමින් නියත වස්තු සහ අනියත ද්වාර ආරම්මණ ඨාන කෘත්‍යව පවතී. සහේතුක කාමාවචර සිත් අට පැවතීමෙහි කියන ලද නය අනුවම දොරවල් සයේ තදාරම්මණ කෘත්‍යයද තමා දෙන ලද ප්‍රතිසන්ධියෙහි මතුයෙහි භවංගය කැඩෙන චිත්තුප්පාදයෙහි භවංග කෘත්‍යයද අතීතයෙහි චුති කෘත්‍යයද යන කෘත්‍ය තුනක් සිදුකරමින් නියත වස්තුවල අනියත ද්වාර ආරම්මණ ඨාන කෘත්‍යව පවතී. රූපාවචර පහ අරූපාවචර සතර තමා දෙන ලද පටිසන්ධියෙන් මතුයෙහි භවංගය කැඩෙන චිත්තුප්පාදය නොමැති කල්හි භවංග කෘත්‍යයද අන්තයෙහි චුති කෘත්‍යද කෘත්‍ය දෙකක් සිදුකරමින් පවතී. ඒ අතරෙන් රූපාවචර නියත වත්‍ථු ආරම්මණ සහ අනියත ඨාන කෘත්‍ය වේ. ඉතිරි ඒවා අවස්තුව නියත අරමුණුව අනියත ඨාන කෘත්‍යව පවතී. මෙසේ තිස්දෙවැදෑරුම් විඤ්ඤාණය පැවතීමෙහි සංඛාර ප්‍රත්‍ය පවතී.

ඒ ඒ සංඛාරයෝ කර්ම ප්‍රත්‍යයෙන් ද උපනිශ්‍රය ප්‍රත්‍යයෙන්ද ප්‍රත්‍ය වෙයි. එහි යම් එකොලොස් තදාරම්මණ සිත් කියන ලද්දේද ඒවායින් එකක්වත් රූපාරූප භවවල තදාරම්මණව නොපවතී. කුමක් හෙයින්ද? බීජ අභාවයයි. එහි වනාහි කාමාවචර විපාක සංඛාරා ප්‍රතිසන්ධි බීජ නැත. යම් රූපාදි අරමුණුවල පැවතීමෙහි එය උපදින්නේය. රූප භවයෙහි චක්ඛු විඤ්ඤාණාදියද අභාවයට පැමිණියේද නැත. ඉන්ද්‍රිය පැවතීමේ බලයෙන් ද්වාර වීථි භේදයෙහි චිත්ත නියාමය නිසා ඒ තදාරම්මණ රූපාරූප භවයෙහි ඒකාන්තයෙන් නොපවතී. එසේම සියළු අකාමාවචර ධර්මවල ලුහු නොබඳී. කුමක් නිසාද? නූපදවන ලද බැවින්ද ඉපිදවූවකුගේ අසදෘශ බැවින්ද වේ. යම් සේ ගෙයින් නික්මී බැහැරට යන ළදරුවෙක් තමාගේ පියා හෝ අන්‍ය වූ පියා සමාන නෑයෙකුගේ ඇඟිලිවලින් අල්ලාගෙන (ලුහුබඳියි.) අනුව යයි. වෙනත් රාජ පුරුෂාදි කෙනෙකුගේ

නොවේ. එසේම මෙයද භවංග අරමුණකින් පිටතට යනු කැමැත්තේ සභාවට පැමිණි තමාගේ ජනිත පියා හෝ පියා සමාන හෝ කාමාවචර ජවන් අනුව යයි. අනිත් මාර්ගයක හෝ අනුත්තර හෝ නොවේ. යම්සේ එය මහග්ගත හෝ ලෝකෝත්තර ධර්ම අනුව නොයයි. යම්සේ මේ කාමාවචර ධර්මද මහග්ගත අරමුණු වී පවතීද, එකල ඒවාද අනුව නොයයි. කුමක් නිසාද? නුපුරුදු දේශයක් බැවින්ද අතිශයින් සියලු අරමුණු බැවින් වේ. එහි යම්සේ පියා හෝ පියා හා සමාන ඥාතියකු අනුව යන ළමයා ගෙය දොරටුව ඇතුළු වීදිය සතරමංසන්ධිය ආදී පුරුදු ප්‍රදේශවලට අනුව යයි. කැලයට හෝ යුදබිමට හෝ නොයයි. මෙසේ කාමාවචර ධර්මයන් අනුගමනය කරන අමහග්ගත වූ පුරුදු ප්‍රදේශයේම පවතින ධර්ම අනුව යයි. මහග්ගත ලෝකෝත්තර ධර්ම පවතින ප්‍රදේශයෙහි නොවේ. සියළු කාමාවචර විපාක සෝමනස්ස සහගත වූ යන මේ ධර්මයෝ පරිත්තාරම්මණ වේ. එනිසා අච්චන්ත පරිත්තාරම්මණ යයි කියන ලදී. ඒ නිසා මේ මහග්ගත ලෝකුත්තර අරමුණු වූ කාමාවචර ධර්මද අනුව නොයන බව දතයුතුය. මෙහි යුක්ති කථාව කුමක්ද? අට්ඨ කථාවල ඒකාන්තයෙන්ම කියන ලදී. තදාරම්මණ සිත් එකොලහ නම්ගොත් අරබයා ජවනයන් දුවනවිට තදාරම්මණ නොගනියි. පැණවීම් අරබයා ජවන් යනවිට තදාරම්මණ නොලබයි. තිලකුණු අරමුණු කරගත් විදර්ශනාවෙන් තදාරම්මණ නොලබයි. උට්ඨානගාමිනී බලවත් විදර්ශනාවෙන් තදාරම්මණ නො ලබති. රූපාරූප ධර්ම අරබයා ජවන යනවිට තදාරම්මණ නොලබයි. මිථ්‍යා නියත ධර්මවල තදාරම්මණ නොලබයි. නිවැරදි නියත ධර්මවල තදාරම්මණ නොලබයි. ලෝකෝත්තර ධර්ම අරබයා ජවන යනවිට තදාරම්මණ නොලබයි. අභිඥාන ධර්මයන් අරබයා ජවන් දුවනවිට තදාරම්මණ නොලබයි. පටිසම්භිදා ඤාණය අරබයා ජවන දුවනවිට තදාරම්මණ නොලබයි. කාමාවචර දුර්වල අරමුණෙහි තදාරම්මණ නොලබයි. ද්වාර සයේ බලවත් අරමුණෙහි ආපාතගත කල්හිම ලබයි. ලබන්නේද කාමාවචරයෙහි පමණය. රූපාරූප භවයෙහි තදාරම්මණ නැතැයි යමක් කියන ලදද සෙසු එකුන්විසි සිත්වල තමාගේ කිසිම අනුරූප ප්‍රතිසන්ධියක් නොපවතී යයි එය අතිසංක්ෂේප බැවින් දැනගැනීම අපහසුය.

එහෙයින් එහි විස්තර ක්‍රමය දැක්වීම සඳහා කියනු ලැබේ. ප්‍රතිසන්ධි කීයද? ප්‍රතිසන්ධි සිත් කීයද? කුමකින් කොහි ප්‍රතිසන්ධි වේද? ප්‍රතිසන්ධියේ අරමුණු මොනවාද? අසංඥ ප්‍රතිසන්ධිය සමග ප්‍රතිසන්ධි විස්සෙක් වේ. කියන ලද ආකාරයෙන්ම ප්‍රතිසන්ධි සිත් එකුන් විස්සකි. එහි අකුසල

විපාකයෙන් අහේතුක මනෝවිඤ්ඤාණ ධාතුවෙන් අපායවලද ප්‍රතිසන්ධිය වේ. කුසල විපාකයෙන් මනුෂ්‍ය ලෝකයෙහි ජාතිඅන්ධ ජාතිබිහිරි ජාති උම්මන්තක (කියන්ට අසන්ට නොහැක) ඒලමූග නපුංශකාදීන්ටද ප්‍රතිසන්ධිය වේ. රූපාවචර විපාක සිත් පහෙන් රූපී බ්‍රහ්ම ලෝකයෙහිද අරූපාවචර විපාක සිත් සතරින් අරූප ලෝකයෙහිද ප්‍රතිසන්ධිය වේ. එයම එහි අනුරූප පටිසන්ධි නම් වේ. සංක්‍ෂෙපයෙන් ප්‍රතිසන්ධියෙහි කර්ම කර්ම නිමිති ගති නිමිති යයි අරමුණු තුනෙක් වේ. එහි කර්ම නම් රැස්කරන ලද කුසලාකුසල චේතනාය. කම්ම නිමිත්ත නම් යම් වස්තුවක් අරමුණුකර කර්ම රැස්කිරීම වේ. එහි අතීත කල්ප කෝටි ලක්‍ෂයක් එහාද කරන ලද කර්මයෙන් ඒ ක්‍ෂණයෙහි කර්මය හෝ කර්ම නිමිත්ත පැමිණ වැටහේ. එහි මෙය කර්ම නිමිත්ත වැටහීමේ වස්තුවයි. ගොපක සීවලී තල්පිටි වෙහෙර චෛත්‍යයක් කරවයි. ඔහුගේ මරණ මංචකයෙහිදී චෛත්‍යය වැටහුණේය. හේ ඒ නිමිත්තම ගෙන කළුරිය කොට දෙව්ලොව උපන්නේය. අන්‍ය ඒවා මුළාව කළුරිය නම් වේ. පිටිපා යනවිට පිටුපසින් තියුණු කඩුවකින් හිස සිඳියි. වැදහෙව නිදන්නහුගේ ද තියුණු කඩුවෙන් හිස සිඳියි. දියෙහි ගිල්වා මරයි. මෙබඳු කාලයෙහිද එක්තරා කර්මයක් හෝ කර්ම නිමිත්තක් වැටහේ. අන්‍ය වූ ලහුක (වහා) මරණ ඇත. තියත් මිටේ සැඟවුණු මැස්සා මුගුරකින් පහරදී කුඩු කරයි. මෙඳු කාලයෙහිද කර්මය හෝ කර්ම නිමිත්ත වැටහේ. මෙසේ කුඩුකරන ලද මැස්සාගේ පළමුව කායද්වාරාවජ්ජන භවංගය නොවැටේ. මනෝද්වාරාවජ්ජනයටම වැටේ. ඉක්බිති ජවන දුව භවංගයට බැස ගනී. දෙවෙනිවර කාය ද්වාරාවජ්ජන භවංගය වැටේ. ඉන්පසු කාය විඤ්ඤාණය සම්පටිච්ඡන සන්තීරණ වොත්ථපන යයි වීථි සිත් පවතී. ජවන දුව භවංගයට වැටේ. තුන්වන වර මනෝද්වාරාවජ්ජන භවංගය ඇතිවේ. පසුව ජවන ඇතිවී භවංග පතනය මේ මේ ස්ථානයෙහි කලුරිය කරයි. මෙය කුමක් සඳහා ගෙනෙන ලදද? අරූප ධර්ම විෂයෙහි නම් මෙසේ ඉක්මන් බව විස්තර කිරීම සඳහාය.

ගති නිමිත්ත නම් උපදින ස්ථානයෙහි එක් වර්ණයක් වැටහේ. එහි නිරයේ නම් ලෝහ හැලි මෙන් වැටහේ. මිනිස්ලොවේ නම් මව්කුස කම්බිලි යාන සමාන වස්තු වැටහේ. දෙව්ලොව නම් කල්ප වෘක්‍ෂ විමාන යහන් ආදිය වැටහේ. මෙසේ කර්මය කර්ම නිමිත්ත ගති නිමිත්ත යයි සංක්‍ෂේපයෙන් ප්‍රතිසන්ධියේ අරමුණු තුනක් වේ. තවත් නය ක්‍රමයක් ප්‍රතිසන්ධියේ අරමුණු තුනක් වේ. අතීත වර්තමාන නොකිවහැකි යයි

අරමුණු තුන වේ. අසංඥ ප්‍රතිසන්ධිය ආරම්මණයයිද එහි විඤ්ඤාණඤ්චායතන නේවසඤ්ඤානාසඤ්ඤායතන ප්‍රතිසන්ධිවල අතීත අරමුණු වේ. දස කාමාවචර අතීත හෝ වර්තමාන අරමුණු වේ. සෙසු ඒවායේ නොකිය හැකිය. මෙසේ මේ අරමුණු තුනෙහි පවතින ප්‍රතිසන්ධිය අතීත හෝ නොකිව හැකි හෝ අරමුණේ චුති සිතට අනතුරුවම ඇති වේ. වර්තමාන අරමුණට චුති සිතක් නැත. මේ අරමුණුවල එක්තරා අරමුණක චුති සිතට අනතුරුවද තුන් අරමුණුවල එක්තරා අරමුණක ප්‍රතිසන්ධියෙන් සුගති දුගති වශයෙන් පවත්නාකාරය දැනගත යුතුය. කෙසේද? කාමාවචර සුගතියෙහි සිටි පව්වු පුද්ගලයෙකුට "එසමයෙහි ඔහුට ඒවාද එල්බේ" ආදි වචනයෙන් මරණ මංචකයෙහි හොත් තැනැත්තාට රැස්කළ පරිදි පාප කර්මයක් හෝ කර්ම නිමිත්තක් හෝ මනෝද්වාරයෙහි අපාගත වේ. (ඉදිරියට පැමිණ විෂය වේ) එය අරබයා උපන් තදාරම්මණ අවසානයෙහි සුද්ධ වූ ජවන වීථියට අනතුරුව භවංග විසය අරමුණුකර චුති සිත උපදී. එය නිරුද්ධ වූ පසු එම අරමුණුම ආපාථගතව කර්මය හෝ කර්ම නිමිත්ත හෝ අරබයා නොසිඳින ලද කෙලෙස් බලයෙන් තැවුණු දුගතියට ඇතුළත් ප්‍රතිසන්ධි සිත උපදී. මෙය අතීත අරමුණෙන් චුතියට අනතුරුව අතීත අරමුණු ප්‍රතිසන්ධියයි. අනෙකෙකුට මැරෙනවිට කියන ලද ආකාරයේ කර්ම වශයෙන් නරකාදියෙහි ගිනිදැල් වර්ණනාව දුගති නිමිත්ත මනෝද්වාරයෙහි ආපාථගත වේ. ඔහුට දෙවරක් භවංගය ඉපදී නිරුද්ධ වූවිට ඒ අරමුණ අරබයා එක් ආවර්ජනයක් මරණයට ආසන්න වීමෙන් වේගය මඳ බැවින් පස් ජවනයක් තදාරම්මණ දෙකක් යයි වීථී සිත් තුනක් උපදී. (උදාඃ- කී ජ ජ ජ ජ ජ ත ත චු) ඉන්පසු භවංග විසය අරමුණුකර එක් චුති සිතක් වේ. මෙපමණකින් එකොලොස් චිත්තක්ෂණ අතීත වේ. ඉක්බිති අවසේස චිත්තක්ෂණ පහේ ආයුකාලයේ ඒ අරමුණෙහිම ප්‍රතිසන්ධි සිත උපදී. මේ අතීත අරමුණේ චුතියට අනතුරුව වර්තමාන අරමුණු ප්‍රතිසන්ධියයි. තවකෙකුට මැරෙනවිට පස්දොරෙන් එකකට රාගාදි හේතුවෙන් හීන අරමුණක් අපාථගත වේ. ඔහුට පිළිවෙළින් උපන් ඔත්‍ථපනය අවසානයේ මරණයට ආසන්න බැවින් මදවේග ඇති පස් ජවන තදාරම්මණ දෙකක් උපදී. ඉක්බිති භවංග විෂයේ අරමුණක් කර එක් චුති සිතක් ඇතිවේ. මෙපමණකින් භවංග දෙකක් ආවර්ජනය දර්ශනය සම්පටිච්ඡන සන්තීරණය වොත්‍ථපන පස් ජවන තදාරම්මණ දෙක චුති සිත් එක යයි චිත්තක්ෂණ පහළොවක් අතීතය. ඉක්බිති අවසේස එක් චිත්තක්ෂණ ආයු කාලයෙහි එම අරමුණෙහිම ප්‍රතිසන්ධි සිත උපදී. මෙය අතීත අරමුණින් චුතියට අනතුරුව වර්තමාන අරමුණු ප්‍රතිසන්ධියයි.

එය අතීතාරම්මණ හෝ සුගති චුතියට අනතුරුව අතීත වර්තමාන අරමුණක් දුගති ප්‍රතිසන්ධියේ පවතින ආකාරයයි.

දුගතියෙහි සිටියහුට රැස්කරන ලද අනවද්‍ය කර්මයේ කියන ලද කර්මයෙන් ඒ අනවද්‍ය කර්මය හෝ කර්ම නිමිත්ත හෝ මනෝද්වාරයට ආපාථගත වේ. කෘෂ්ණ පක්‍ෂයෙහි ශුකල පක්‍ෂය හැර සියල්ල පෙර නයින්ම දතයුතුය. මෙය අතීත අරමුණින් දුගති චුතියෙන් අනතුරුව අතීත වර්තමාන අරමුණේ සුගති ප්‍රතිසන්ධිය පවතින ආකාරයයි. සුගතියෙහි සිටියහුට රැස්කරන ලද අනවද්‍ය කර්මයේ "කපනිවතස්ස තස්මිං සංස් ඕලම්බන්ති" ආදි වචනයෙන් මර ඇඳෙහි නිපන්නහුට රැස්කරන ලද පරිදි අනවද්‍ය කර්මය හෝ කර්ම නිමිත්ත හෝ මනෝද්වාරයෙහි ඉදිරියට පැමිණේ. එයද රැස්කරන ලද කාමාවචර අනුවද්‍ය කර්මයම වේ. රැ ස්කරන ලද මහග්ගත කර්මය වනාහි කර්ම නිමිත්තම ඉදිරියට පැමිණේ. එය අරබයා උපන් තදාරම්මණ අවසානයේ සුද්ධ වූ හෝ ජවන වීථියට අනතුරුව භවංග විසය අරමුණුකර චුති සිත උපදී. එය නිරුද්ධ වූ විට එම අරමුණම ඉදිරියට පැමිණ කර්මය හෝ කර්ම නිමිත්ත අරබයා නොසිඳන ලද කෙලෙස් බලයෙන් නැමුණු සුගතියට ඇතුළත් ප්‍රතිසන්ධි සිත උපදී. මෙය අතීත අරමුණේ චුතියෙන් අනතුරුව අතීතාරම්මණ වූ නොකිවහැකි අරමුණේ හෝ ප්‍රතිසන්ධියයි. තවකෙකුට මැරුණවිට කාමාවචර අනවද්‍ය කර්ම වශයෙන් මිනිස්ලොව මව්කුස වර්ණ සංඛ්‍යාත හෝ දෙව්ලොව උයන කල්ප වෘක්‍ෂය ආදි වර්ණ සංඛ්‍යාත හෝ සුගති නිමිත්තක් මනෝද්වාරයේ ඉදිරියට එයි. ඒ දුගති නිමිතියෙහි දැක්වූ අනුක්‍රමයෙන්ම චුති සිතට අනතුරුව ප්‍රතිසන්ධි සිත උපදී. මෙය අතීත අරමුණේ චුතියට අනතුරුව වර්තමාන අරමුණු ප්‍රතිසන්ධියයි. තවකෙකු මැරෙනවිට තාත්තේ, මේ ඔබ සඳහා බුද්ධපූජාව කරනු ලැබේ. සිත පහදවා ගන්නැයි කියා මල්දම් කොඩි පතාක වශයෙන් රූප අරමුණක් හෝ ධර්ම ශ්‍රවණ තූර්ය පූජා වශයෙන් ශබ්දාරම්මණයක් හෝ දුම් සුවඳ වශයෙන් ගන්ධ අරමුණක් හෝ තාත්තේ මෙය රස අහරයක්. ඔබ සඳහා දියහැකි දෙය ධර්මයක් යයි මීපැණි ආදි වශයෙන් රස අරමුණක් ඉන් තාත්තේ මේක ස්පර්ශ වස්තුවක්. ඔබ සඳහා දිය යුතු දෙය ධර්මයක් යයි චීන සෝමාර පටාදි වශයෙන් ඵොට්ඨබ්බ අරමුණෙක් හෝ පංචද්වාරයේ එළඹෙයි. ඔහුව ඒ අවස්ථාවේ ඉදිරියෙන් පැමිණි රූපාදි අරමුණෙහි පිළිවෙළින් උපන් නෙක්ඛම්ම අවසානයේ මරණයට ආසන්න බැවින් මඳවේග හෙයින් පස් ජවනයන් තදාරම්මණ දෙකක්ද උපදී. ඉන්පසු

භවංග විෂය අරමුණුකොට එක් චුති සිතක් එය අවසානයෙහි එහි එක් චිත්තක්ෂණයක් සිටි අරමුණෙහි ප්‍රතිසන්ධි සිත උපදී. මෙයද අතීත අරමුණෙහිම චුතියෙන් අනතුරුව වර්තමාන අරමුණු ප්‍රතිසන්ධියයි. අනකෙකුට වනාහි පඨවි කසින ධ්‍යාන වශයෙන් ලැබූ මහග්ගත සුගතිය ඇත්තාට මැරෙන වේලාවේ කාමාවචර කුසල කම්ම කම්ම නිමිත්ත ගති නිමිත්තවලින් එකක් වූ පඨවි කසිනාදියක් හෝ මහග්ගත නිමිති සිතක් හෝ මනෝද්වාරය ඉදිරියට එයි. චක්ඛු සෝතාදිය හෝ කුසල ඉපදීමට හේතුවූ වෙනත් ප්‍රණීත අරමුණක් ඉදිරියේ එයි. එය පිළිවෙළින් උපන් වොත්පන අවසානයෙහි මරණය ආසන්න බැවින් වේගය මදහෙයින් ජවන පහක් උපදියි. මහග්ගත ගතිකයන්ට තදාරම්මණ නැත. කවර හෙයින්ද? ජවනයට අනතුරුව භවංග විසය අරමුණුකර එක් චුති සිතක් උපදී. එය අවසානයෙහි කාමාවචර මහග්ගත සුගති අතරෙන් එක් සුගතියක් ඇතුළත් පැමිණි අරමුණුවලින් එකක් අරමුණුකර ප්‍රතිසන්ධි සිත උපදී. මෙය නොකිවහැකි අරමුණක සුගති චුතියෙන් අනතුරුව අතීත වර්තමාන නොකිවහැකි අරමුණක ප්‍රතිසන්ධියයි. මේ අනුසාරයෙන් අරූපාවචර චුතියේද අනතුරු ප්‍රතිසන්ධි දතයුතුය. මෙය අතීත නොකිවහැකි අරමුණේ සුගති චුතියෙන් අනතුරුව අතීත නොකිවහැකි වර්තමාන අරමුණෙන් ප්‍රතිසන්ධිය පවතින ආකාරයයි. දුගතියෙහි පව් කරන්නාට කියන ලද තමන්ම එය කර්මය කර්ම නිමිත්ත ගති නිමිත්ත හෝ මනෝ ද්වාරයේ ඉදිරියේ පැමිණීමෙන් සිදුවේ. පංච ද්වාරයෙහි අකුසල උපතට හේතු වූ අරමුණු ඉදිරියට එයි. ඉක්බිති ඔහුට පිළිවෙළින් චුති සිත අවසානයෙහි දුගතිය අයත් ඒ අරමුණු අතරෙන් එකක ප්‍රතිසන්ධි සිත උපදී. මෙය අතීත අරමුණේ දුගති චුති හෝ අනතුරුව අතීත වර්තමාන අරමුණේ ප්‍රතිසන්ධිය පවතින ආකාරයයි. එකුන්විසි වූ විඤ්ඤාණයේ ප්‍රතිසන්ධි වශයෙන් පැවැත්ම දක්වන ලදී. ඒ සියල්ල මෙසේ:-

**පවතින පිළිසිඳුම් - කර්මයෙන් දෙපරිදි වේ**
**මුසු ඈ බේදයෙන් - බෙදුමෙහි දෙවිදි ඈ වේ**

මෙය වනාහි එක්විසි විදි වූ ප්‍රතිසන්ධියෙහි පවතින විපාක විඤ්ඤාණය කර්මයෙන් දෙපරිදිව පවතී. ස්වකීය ජනක කර්මයට මෙයම නානා ක්ෂණික ප්‍රත්‍යයෙන්ද උපනිශ්‍රය ප්‍රත්‍යයෙන් ද ප්‍රත්‍ය වේ. මෙය කියන ලදී. "කුසලා කුසල කර්මය විපාකයට උපනිශ්‍රය ආශ්‍රයෙන් ප්‍රත්‍ය වේ" මෙසේ පවතින මෙහි මිශ්‍රාදි භේදයෙන් අවිඤ්ඤාණික භේදයද දතයුතුය. කෙසේද? මෙය ප්‍රතිසන්ධි වශයෙන් ඒකාකාරව පවතින රූපය

සමාන මිශ්‍ර අමිශ්‍ර භේද වශයෙන් දෙපරිදි වේ. කාම රූප අරූප භේදයෙන් තෙපරිදිය. අණ්ඩජ ජලාබුජ සංසේදජ ඕපපාතික උපත් වශයෙන් සිව්වැදෑරුම්ය. ගති වශයෙන් පස්වැදෑරුම්ය. විඤ්ඤාණට්ඨිති වශයෙන් සත් වැදෑරුම්ය. සත්තාවාස වශයෙන් අටවැදෑරුම් වේ. එහිː-

**මුසු දෙවිදි බව බේ - එහි සබා දෙපරිදි වේ**
**අඩු විසින් දසකය - දෙ තුන් විදි හෝ වන්නේ**

භාව භේදයෙන් මිශ්‍රය. ද්විධය. මෙහි අරූප භවයෙන් වෙනත් තැන්වල යම් ප්‍රතිසන්ධි විඤ්ඤාණයක් උපදී. එය රූප භවයෙහි උපතින් ස්ත්‍රී පුරුෂ භාවයන් හැරද කාම භවයෙහි ජාති පණ්ඩකභාවය හැර උපතින් ස්වභාවය අභාව යයි දෙපරිදි වේ. එහි ස්වභාවයද දෙපරිදි වේ. එහිද යම් ස්වභාවයක් එය ස්ත්‍රී පුරුෂ භාව එකක් යයි උපතින් ද්විධ වේ. යනු අඩු විසින් දසකය දෙතුන් විදි හෝ වන්නේ යනු එහි යම් මිශ්‍ර අමිශ්‍ර දෙකෙහි ආදිය වූ රූපමිශ්‍ර පටිසන්ධි විඤ්ඤාණය සමග වස්තු දසක කාය දසකයෝ දෙපරිදි හෝ වස්තු දසක කාය දසකයෝ භාව දසකයෝ යැයි තෙපරිදි හෝ යටත් පිරිසෙයින් උපදින්නෝය. මෙයින් පසුව රූප පරිහානියක් නැතැයි යනු එය වනාහි මෙසේ අණ්ඩජ ජලාබුජ නම් යෝනි දෙකේ උපදින්නේ සිහින් රෝමයෙන් එක් අංශුවක් වූ කැලඹුණු ගිතෙල් බිඳක් ප්‍රමාණ වූ කලලයයි ලැබූ නමින් උපදී. එහි යෝනියේ ගති වශයෙන් භේදය දැනගත යුතුය.

**දෙව් නිරය බිම් නැති - ඕපපාතික පේතය**
**පේත තිරිසන් මිනිස් - තුන්ගති සිව් යෝනි වේ**

එහි දේවෙසු චාති, ච ශබ්ද හෝ නිරයෙහිද බිම්නැති දෙවියන් කෙරෙහි මෙසේ නිජ්ඣාමතණ්හික පේතයන්ටද මුලින් කී සිව් යෝනිවලින් මුල් යෝනි තුන නැත. ඔවුන්ට ඇත්තේ ඕපපාතික වේ. සෙසු තිරිසන් ප්‍රේත මිනිස් ගති තුනට සහ පෙර අත්හල භූමි දෙවියන්ටද යෝනි සතර වේ. එහි

**රූ බවැ තිස නවය-උපරිම සැත්තෑ වේ එහි**
**සංසේදජ ඕප-පාතික තිසකි අවමය**

රූප බ්‍රහ්මයන් කෙරෙහි ඕපපාතික යෝනිවල චක්ඛු සෝත වස්තු දසකවල ජීවිත නවකයදැයි සතර කලාප වශයෙන් තිසක්ද නවයක්ද ප්‍රතිසන්ධි විඤ්ඤාණය සමාන රූප උපදී. රූපී බ්‍රහ්මයන් හැර අන්‍ය වූ

සංසේදජ ඕපපාතිකයන් කෙරෙහි උපරිම වශයෙන් චක්ඛු සෝත ජිව්හා කාය භාව වත්‍ථු දසක වශයෙන් හැත්තෑවක්ද ඔවුන් කෙරෙහි නිත්‍ය දෙවියන් කෙරෙහිද එහි වර්ණ ගන්ධ රස ඕජා රස සතරද චක්ඛු පසාද ජීවිතින්ද්‍රිය මේ දස රූප පරිමාණයෙන් යුත් රූප පිණ්ඩය චක්ඛු දසක නම් වේ. සෙසු සෝතාදි දසක ද මෙසේ දතයුතුය. ජාති අන්ධ බිහිරි ගඳ සුවඳ දත නොහැකි (අඝානක) නපුංසකයන්ට ජිව්හා කාය වත්‍ථු දසක වශයෙන් අවම වශයෙන් රූප තිසක් ද උපදී. උපරිම අවම අතරෙහි විකල්ප වශයෙන් අනුරූප දතයුතුය. මෙසේ දැන නැවතඃ-

**කඳ අලඹ ගති හේ - විඳි හස විතක් විචරා**
**චුති පිළිසිඳුම්වල - බේද අබේද දන්නේ**

මිශ්‍ර අමිශ්‍ර වශයෙන් ප්‍රතිසන්ධිය ද්විධය. අතීත අනන්තර චුතිය යන ඒවා මේ ඛන්‍ධාදි භේද විශේෂයෙන් දතයුතුය යන අර්ථයයි. කෙසේද? කලක ස්කන්ධ සතරේ අරූප චුතියෙන් අනතුරුව ස්කන්ධ සතරේ අරමුණුවලින් නොබිඳී ප්‍රතිසන්ධිය වේ. කලෙක අමහග්ගත වූ බාහිර අපේක්ෂාවකින් මහග්ගත අභ්‍යන්තර අරමුණක් වේ. මෙය අරූප භූමිවල ක්‍රම වේදයයි. කලෙක ස්කන්ධ සතරේ අරූප චුතියෙන් අනතුරුව ස්කන්ධ පහේ කාමාවචර ප්‍රතිසන්ධිය වේ. කලෙක ස්කන්ධ පහේ කාමාවචර චුතියෙන් හෝ රූපාවචර චුතියෙන් හෝ අනතුරුව ස්කන්ධ සතරේ අරූප ප්‍රතිසන්ධියක් වේ. මෙසේ අතීතාරම්මණ චුතියෙන් අතීත නොකිවහැකි වර්තමාන අරමුණු ප්‍රතිසන්ධිය වේ. ඇතැම් සුගති චුතියෙන් දුගති ප්‍රතිසන්ධි වේ. අහේතුක චුතියෙන් සහේතුක ප්‍රතිසන්ධි වේ. ද්‍විහේතුක චුතියෙන් ත්‍රිහේතුක ප්‍රතිසන්ධි වේ. උපේක්ඛා සහගත චුතියෙන් සෝමනස්ස සහගත ප්‍රතිසන්ධි වේ. අප්පීතික චුතියෙන් සප්පීතික ප්‍රතිසන්ධි වේ. අවිතක්ක චුතියෙන් සවිත්තකත ප්‍රතිසන්ධි වේ. අවිචාර චුතියෙන් සවිචාර ප්‍රතිසන්ධි වේ. ඒ ඒ වෙනස්කම් සුදුසු පරිදි යෙදිය යුතුය.

**ලද පසය දම්මත් - මෙය යයි අතුරු බවයට**
**නැත ඉන් සංකරම - නො ඒ ඉන් හේ නොමැතිව**

මෙසේ මෙය ප්‍රත්‍ය ලැබ රූපාරූප ධර්මමාත්‍රය උපදිමින් අන්තර භවයට පැමිණේයයි කියනු ලැබේ. සත්වයෙක් ජීවියෙක් අතීත භවයෙන් එහි සංක්‍රමණය වීමක් නැත. එයින් හේතුවක් නැතිව මෙහි පහළවීමක්ද නැත. මනුස්ස චුති පටිසන්ධි ක්‍රමය ප්‍රකට වශයෙන් ප්‍රකාශ කරන්නෙමු.

අතීත භවයෙහි ස්වකීය උපක්‍රමයෙන් හෝ ආසන්න මරණය නොඉවසීමෙන් සියළු අඟපසඟ සන්ධි බැඳුම් සිඳින්නාගේ මාරාන්තික වේදනා ආයුධ එකතුව තැවෙන්නහුගේ අව්වට දවන ලද තණපතක් මෙන් ක්‍රමයෙන් වියලන ශරීරයේ චක්ඛු ආදී ඉන්ද්‍රියයන් නිරුද්ධ වූ කල්හි එකෙණෙහි හෘදය වස්තු ආශ්‍රයෙන් ඇති විඤ්ඤාණය ගරුවූ හෝ පුරුදු කරන ලද්දක් හෝ පෙර කරන ලද ආසන්නව ලැබූ සංඛාර ප්‍රත්‍ය සංඛ්‍යාත එළඹසිටි කර්මයක් හෝ කර්ම නිමිති ගති නිමිති සංඛ්‍යාත විෂය අරබයා පවතී. තෘෂ්ණා අවිද්‍යා ප්‍රහීන නොකරන ලද නිසා ඒ අරමුණෙහිම පවතී. අවිද්‍යාව සඟවන ලද බැවින් එහි ආදීනව වශයෙන් ඒ විෂයෙහි තෘෂ්ණාව පැමිණේ. සහජාත සංස්කාරය බහාලයි. එය සන්තති වශයෙන් තණ්හා නමින් නම්කරන සංඛාර විසින් දමමින් සිටින එගොඩ ගසක බඳනා ලද වැලක එල්ලී මෙගොඩ සිටි මිනිසෙක් ඇලකින් එගොඩට යන්නා සේ පෙර නිශ්‍රයන් අත්හරියි. අපරයෙහි කර්මය විසින් උපදවන ලද නිශ්‍රය ප්‍රත්‍යය ආශ්වාදනය කරමින් හෝ ආශ්වාදනය නොකරමින් ආරම්මණාදී ප්‍රත්‍ය විසින් පවත්වයි. මෙහිද පෙර වචන ලෙසින් චුතිය පසුව අන්තර භව ප්‍රතිසන්ධි වශයෙන් ප්‍රතිසන්ධිය යයි කියනු ලැබේ. ඒ එය පෙර භවයෙන් මෙහි නොඑන ලදය. පෙර භවයේ කර්ම සංඛාරවලින් නැමුණු විෂයාදි හේතු නොමැතිව පහළ නොවූ බවද දතයුතුය.

නිදසුන් විය මෙහී - පිළිරැව් ඈ (විසින් යුත්)
දිගට යනෙකෙක් නැත - නැත අනිකෙක් ද වන්නේ

මෙහි පෙර භවයෙන් ඒ විඤ්ඤාණය නොඑන අතීත භවයට ඇතුළත් හේතු උපදින පිළිරැව් පාන මුදු පිළිබිඹු වන අයුරු දහම් නිදසුන්ද විය. යම්සේ ප්‍රතිරාව පහන් ඡායාව ශබ්දාදි හේතුවක් නැතිව නොපැමිණියේ වෙයි. එසේම මේ සිත මෙහි ඒකාබද්ධ වූ සන්තානයක් (පරම්පරාවක් පමණක්) නැත. අන්‍ය වූ සන්තාන පරම්පරාවක්ද නොවේ. යම් හෙයකින් සන්තාන බැඳුණු කල්හි ඒකන්ත ඒකත්වයක් වන්නේය. කිරිවලින් දී හට නොගන්නේය. එසේ වුවත් ඒකාන්ත නානත්‍වය වන්නේය. දී කිරිවලින් අධීන නොවේ. හේතුවලින් හටගත් සියළු දේ කෙරෙහි - මෙම න්‍යාය බලපාන්නේය. මෙසේ ඇතිකල්හි සියළු ලෝක ව්‍යවහාරය නැති වන්නේය. එයද අනිස්ථිරය. ඒ නිසා මෙහි ඒකාන්ත හෝ නානත්ත හෝ එළඹේද? මෙහි කීහ. අසංක්‍රමණික පහළවීමක් ඇතිකල්හි මේ මනුෂ්‍යාත්ම භවයෙහි ස්කන්ධ නොවේද? ඒවා නිරුද්ධ වූ කල්හි ඵලප්‍රත්‍ය වූ කර්මයේද එහි නොවන බැවින් අතිකකුගේ අන්‍ය වූ ඵලයක් ද එය. පරිභොග කරන්නෙක්

නැතිකල්හි ඒ ඵලය කාගේ වන්නේද? එහෙයින් මේ නියමය සුන්දර නොවේ. එහි මෙය කියනු ලැබේ.

පරපුර පලය අනිකකුගේ නොවේ නො වෙනත්
මෙහි බීජ සැකසුම - අරුත සැඳුනැයි දන්නේ

එක් සිත් පරම්පරාවක ඵලය උපදවමින් එහි ඒකාන්තයෙන් එක් බවකින් නොයෙක් එකින් නැවත සිදුවීම අනිකෙකුගේ හෝ අනිකකුගෙන් හෝ නොවේ. මෙහි අර්ථය සිදුකිරීමට බීජවල සංස්කරණය සාධක වෙයි. අඹ ඇට සකස් කළවිට ඒ බීජ පරපුරේ ලැබූ ප්‍රත්‍ය නිසා කලකින් පල උපදවන්නේ වෙනත් බීජයකින් නොවේ. අනිත් එකුත් සංස්කාර ප්‍රත්‍යයෙන් නූපදී. එම බීජයම ඒ අභිසංස්කරණයෙන් ඵල ස්ථානයට නොපැමිණේ. මෙසේ සිදුවීම දතයුතුය. විද්‍යාව ශිල්ප ඖෂධ බාල කාලයේ ශරීරයේ උපයුක්ත කිරීමෙන් කාලයකින් වැඩුණු ශරීරයේ පල දේ යයි මේ අර්ථය දතයුතුය. උපභෝගිකයෙක් නැතැයි යමක් කියන ලදද එවිට ඒ පලය ඇතිවන්නේ කාටද එහිඃ-

පල උපත සිදුවේ - විඳින්නා සම්මතයකි
පල උපදින ගසේ - පල දරයි යනු සම්මුති

යම් සේ රුක් නම් දහමේ පල දැරීම එහි එක් කොටසකි. ගස පල දරයි හෝ ගස පලයෙන් යුක්ත වේ යනුවෙන් එය කියනු ලැබේ. එසේම දෙවි මිනිසුන් සංඛ්‍යාත ස්කන්ධයන්ගේ උපභෝග වූ සැප දුක් පල ඇතිවීම ඒවායේ එක් කොටසකි. දෙවියා හෝ මිනිසා අනුභව කරයි හෝ සැප ලබයි හෝ දුක් ලබයි හෝ කියනු ලැබේ. එහෙයින් මෙහි අනුභව කරන අනිකකු ඇතැයි යන කිසි අර්ථයක් නැත. මෙසේ ඇතිකල්හි යමෙක් කියන්නේ නම් මේ සංඛාරයෝ විද්‍යමාන වූ අවිද්‍යමාන වූද පලයට ප්‍රත්‍ය වෙතියි කියා විද්‍යමානව පවතින කෙනෙහිම ඒවායේ විපාකයෙන් විය යුතුය. ඉක්බිති අවිද්‍යමානව පැවතීමෙන් පෙරද පසුවද නිත්‍ය පල ඇති කරන්නේය. හෙතෙම මෙසේ කිවයුතුය.

කළ හෙයින් පස මේ - නැත නිතර පල ගෙනදෙන
ඇප ආදියක් එහි - නිදසුන් ලෙසින් දන්නේ

කරන ලද හෙයින්ම සංඛාර තමාගේ පලයට ප්‍රත්‍ය වේ. විද්‍යමාන බැවින් හෝ අවිද්‍යමාන බැවින් හෝ නොවේ. කියන ලදී" "කාමාවචර

කුසල කර්මය කරන ලද බැවින් රැස්කරන ලද බැවින් විපාකය වූ චක්ඛු විඤ්ඤාණය උපන්නේ වේ." ආදිය සුදුසු සේ තමාගේ ඵලයට ප්‍රත්‍ය වී නැවත ඵල ගෙන දීමක් නැත. විපාක බැවින් විපාක දුන් මෙහි අර්ථය පැහැදිලි කරගැනීමට පාටිභොගාදි නිදසුන් දතයුතුය. යම්සේ ලෝකයෙහි යම් ධනයක් පවරාදීමේ ඇපයක් වෙයි. භාණ්ඩයක් මිලට ගැනීමේදී එය යොදා ගනී. එය ක්‍රියා. මාත්‍රයක් වේ. එහි ප්‍රයෝජන අර්ථය පවරාදීමේ ප්‍රතිෂ්ඨාව වීමයි. (ප්‍රත්‍යවීම) ක්‍රියාවක් විද්‍යමාන හෝ අවිද්‍යමාන වීම නොවේ. පවරාදීමෙන් පසු එහි දැරීමක් නැත. කවරහෙයින්ද? පවරාදීම් ආදිය කළ බැවිනි. එසේම කරන ලද බැවින්ම සංඛාර තමාගේ පලයට ප්‍රත්‍ය වේ. සුදුසුසේ පලදීමෙන් පසුව නැවත පල ගෙනදීමක් නැත. මෙපමණකින් මිශ්‍ර අමිශ්‍ර දෙපරිද්දකින් පවත්නා වූ ප්‍රතිසන්ධි විඤ්ඤාණයේ සංඛාර ප්‍රත්‍ය පැවතීම දක්වන ලද්දේ වේ. දැන් සියළු පිරිසිදු දෙපස් විඤ්ඤාණවල මුළාව නැසීමට

මේ බව ආදියෙහි - පවතින පිළිසිඳුම් ලෙස
එහි පස සකර දම් - දැනගත යුතුය නිසි සේ

එහි භව තුනකි. යෝනි සතරකි. ගති පසකි. විඤ්ඤාණ ඨිති සතකි. සත්තාවාස නවයකි. මේවා භව නම් වේ. මේ භවවල ප්‍රතිසන්ධිය පැවතීම ද ඔවුන්ගේ විපාක විඤ්ඤාණයන් ගේ ප්‍රත්‍යද ප්‍රත්‍යවන ආකාරයද එසේ දතයුතුය යන අර්ථයයි. එහි පුඤ්ඤාභිසංඛාරයෙහි කාමාවචර චේතනා භේද අට පුඤ්ඤාභිසංඛාරයයි. අවිශේෂයෙන් කාමභව සුගතියෙහි නව විපාක විඤ්ඤාණයක් වූ ප්‍රතිසන්ධියත් නා නා ක්ෂණික කර්ම ප්‍රත්‍යයෙන්ද උපනිශ්‍රය ප්‍රත්‍යයෙන්දැයි ප්‍රත්‍ය දෙකක් වේ. රූපාවචර කුසල චේතනා පහකින් යුත් පුඤ්ඤාභිසංඛාරය රූප භවයෙහි ප්‍රතිසන්ධි පහක්ම වේ. කියන ලද ප්‍රභේද ඇති කාමාවචරය වනාහි කාම සුගතියෙහි උපෙක්ඛා අහේතුක මනෝවිඤ්ඤාණ ධාතු හැර සතක් වූ පරිත්ත විපාක විඤ්ඤාණවල කියන ලද නයින් ප්‍රත්‍ය දෙකක් පවතී. ප්‍රතිසන්ධියක් නැත. රූප භවයෙහි පහක් වූ විපාක විඤ්ඤාණ එසේම ප්‍රත්‍ය පවතී. ප්‍රතිසන්ධියක් නැත. මහමුගලන් තෙරුන් නිරයෙහි කළ චාරිකාවල එහි ඉෂ්ට අරමුණු සමායෝගයෙන් ප්‍රත්‍ය වේ. තිරිසන් භවවල නාග ගුරුළු ප්‍රේත මහත් ඍද්ධි ඇතියවුන් කෙරෙහිද ඉෂ්ටාරම්මණ ලැබේමය. ඒ කාමභව සුගතියෙහි සොලසක් වූ කුසල විපාක විඤ්ඤාණවල එසේම ප්‍රත්‍ය පවතී. ප්‍රතිසන්ධියක්ද පවතී. අවිශේෂයෙන් රූප භවයෙහි පුඤ්ඤාභිසංඛාරය දසයක් වූ කුසල

විපාක විඤ්ඤාණවල එසේම ප්‍රත්‍යද ප්‍රතිසන්ධියද පවතී. දොලොස් අකුසල චේතනා ප්‍රභේද අපුඤ්ඤාභිසංඛාරය කාමභව දුගතියෙහි එක විඤ්ඤාණයක ප්‍රතිසන්ධියක්ද ප්‍රත්‍යද පවතී. නොපවත්වනවිට හයක් පවතී. ප්‍රතිසන්ධිය නැත. සත්ආකාර වූ අකුසල විපාක විඤ්ඤාණයේ ප්‍රතිසන්ධිය පවතී. කාම භව සුගතියෙහි ඒ සතේම එසේම ප්‍රත්‍ය පවතී. ප්‍රතිසන්ධියක් නැත. රූප භවයෙහි සතරාකාර විඤ්ඤාණවල එසේම ප්‍රත්‍ය පවතී. ප්‍රතිසන්ධිය නැත. එයම කාමාවචරයෙහි අනිෂ්ට රූප දැකීම ශබ්ද ශ්‍රවණය වශයෙන් පවතී. බ්‍රහ්ම ලෝකයෙහි වනාහි අනිෂ්ට රූපාදියක් නැත. කාමාවචර දේව ලෝකයෙහිද එසේය.

ආනෙඤ්ජාභි සංඛාරය අරූප භවයෙහි සතරාකාර විපාක විඤ්ඤාණවල එසේම ප්‍රත්‍යයද ප්‍රතිසන්ධියද පවතී. කාමාවචර කුසල් අකුසල් වශයෙන් සර්ව සංගාහික නයෙන් චේතනා භේද විස්සක් වූ කාය සංඛාරය කාම භවයෙහි දහසක් වූ විපාක විඤ්ඤාණවල ප්‍රතිසන්ධිය නානා ගුණික කර්ම ප්‍රත්‍යයෙන් ද උපනිශ්‍රය ප්‍රත්‍යයෙන් ද යන ප්‍රත්‍ය දෙකෙන් සිදුවේ. කාම භවයෙහි දහතුනක් ද රූප භවයෙහි නවයක්ද විපාක විඤ්ඤාණ එසේම ප්‍රත්‍ය පවතී. ප්‍රතිසන්ධිය නැත. එම කාම භවයෙහි විසිතුනක් වූ විපාක විඤ්ඤාණවල එසේම ප්‍රත්‍ය ද ප්‍රතිසන්ධියද පවතී. වචී සංඛාරයෙහිද මෙම නයයි. අටවිසි එකුන්තිස් චේතනා භේද වූ චිත්ත සංඛාරය තුන් භවයෙහි එකුන්විසි විපාක විඤ්ඤාණවල එසේම ප්‍රත්‍යයද ප්‍රතිසන්ධියද පවතී. නොපවතී. එම භව දෙකෙහි යට කියන ලද දහතුනද නවයද යන විසිදෙකක් වූ විපාක විඤ්ඤාණවල එසේම ප්‍රත්‍ය පවතී. ප්‍රතිසන්ධිය නැත. භව තුනෙහි තිස් දෙකක් වූ විපාක විඤ්ඤාණවල එසේම ප්‍රත්‍යයද පවතී. ප්‍රතිසන්ධියද පවතී. මෙසේ භවවල ප්‍රතිසන්ධීන්ගේ පැවතීම් වශයෙන් ත්‍රිවිධ සංකප්ප යම් ප්‍රත්‍යයක්ද වේ නම් යථා පරිදි ඒ ප්‍රත්‍ය වේ. එසේ දතයුතුය. යෝනි ආදියෙහිද මේ නයින්ම දැනගත යුතුය.

මෙය මුල පටන් ප්‍රධාන කරුණු පමණක් ප්‍රකාශ කිරීමකි. මේ සංඛාර අතරෙන් පුඤ්ඤාභිසංඛාර භව දෙකක ප්‍රතිසන්ධිය දී තමාගේ සියළු විපාක උපදවයි. එසේම අණ්ඩජාදි සිව් යෝනිවල දෙව් මිනිස් සංඛ්‍යාත ගති දෙකෙහි නානත්තකාය නානත්තසඤ්ඤී නානත්තකාය එකත්තසඤ්ඤී එකත්තකාය නානත්ත සඤ්ඤී එකත්තකාය එකත්තසඤ්ඤී සංඛ්‍යාත වූ මිනිසුන්ගේද පඨම දුතිය තතිය ධ්‍යාන භූමි වශයෙන් සතර විඤ්ඤාණ සිත්වලද අසඤ්ඤ සත්තාවාසයෙහි රූප මාත්‍රයම අභිසංඛාර යයි සතර සත්තාවාසයෙහි ප්‍රතිසන්ධිය දී තමාගේ සියළු විපාක උපදවයි.

එහෙයින් මේ භව දෙකෙහි යෝනි සතරෙහි ගති දෙකෙහි විඥ්ඥාණ ඨිති සතරෙහි සත්තාවාස සතරෙහි එක්විසි විඥ්ඥාණවල කියන ලද නයින්ම ප්‍රත්‍ය වේ. සුදුසු පරිදි ප්‍රතිසන්ධිය හටගැන්මද පවතී. අපුඤ්ඤාභි සංඛාරය වනාහි එකම කාම භවයෙහි සිව් යෝනියෙහි අවසේස වූ තුන් ගතියෙහි නානත්තකාය එකත්ත සඤ්ඤී සංඛ්‍යාත එකම විඥ්ඥාණ ඨිතියෙහි එබදු වූ එකම සත්තාවාසයෙහි පටිසන්ධි වශයෙන් පැසේ. එහෙයින් මෙය එකම භවයෙහි යෝනි සතරෙහි ගති තුනෙහි එකම විඥ්ඥාණ ඨිතියෙහි එකම සත්තාවාසයෙහි සත්ආකාර වූ විපාක විඥ්ඥාණවල කියන ආකාරයෙන් ප්‍රත්‍යයද ප්‍රතිසන්ධියද පවතී. ආනෙඤ්ජාභි සංඛාරය වනාහි එකම අරූප භවයෙහි එකම ඕපපාතික යෝනියෙහි එකම දේව ගතියෙහි ආකාසානඤ්චායතනාදී විඥ්ඥාණ ඨිති තුනෙහි ආකාසානඤ්චායතන ආදි සත්තාවාස සතරෙහි සතරාකාර විඥ්ඥාණවල කියන ලද ආකාරයෙන් ප්‍රත්‍ය වේ. ප්‍රතිසන්ධියද පවතී. කාය සංඛාරයද එකම කාම භවයෙහි යෝනි සතරෙහි ගති පහේ විඥ්ඥාණ ඨිති දෙකේ සත්තාවාස දෙකේ ප්‍රතිසන්ධිය දී තමාගේ සියළු විපාක උපදවයි. එහෙයින් මේ එකම භවයෙහි සිව් යෝනියෙහි ගති පහේ විඥ්ඥාණ ඨිති දෙකේ සත්තාවාස දෙකේ විසිතුනක් වූ විපාක විඥ්ඥාණවල එසේම ප්‍රත්‍යය ප්‍රතිසන්ධි පවතී. වචී සංඛාරයෙහිද මෙම නයයි. චිත්ත සංඛාරය වනාහි එක සත්තාවාසයක් හැර වෙන කිසිවක නොපැසේ. ඒ නිසා මේ තුන් භවයෙහි සිව් යෝනියෙහි පස් ගතියෙහි සත් විඥ්ඥාණවල සත්තාවාස අටෙහි යෝග්‍ය ලෙස තිස්දෙකක් වූ විපාක විඥ්ඥාණවල එසේම ප්‍රත්‍ය ප්‍රතිසන්ධිය පවතී. අවිඥ්ඥාණික වූ සත්තාවාසයෙහි

> සංඛාර පච්චයා විඥ්ඥාණයක් නැත. තවද පුඤ්ඤාභි
> සංඛාරය අසඤ්ඤ සත්තයෙහි කරන ලද රූපයෙන්
> නානා ක්ෂණික ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යවේය මෙසේ:-
>
> පිළිසිඳුම් පැවතුම් - වසයෙන් තුන් බවයෙහි
> සතරද ඔවුන් පස - තිසි සේ දැනගනු යෙහේ

**සංඛාර පච්චයා විඥ්ඥාණ විස්තර වර්ණනාවයි.**

විඤ්ඤාණ පච්චයා නාමරූපං නිර්දේශයෙහි

**දෙසුම් බේයෙන් හැම - බව ආදියෙහි පවතින**
**සඟහා පසද නය - දැනගත යුතුය විනිසය**

දේශනා භේදයෙන් නය "එහි රූපය කවරේද? මහාභූත හතරද මහා භූතවල උපාදාය රූපයයි" මෙසේ සූත්‍රාන්තයෙහි ද මෙහිද රූප පදයාගේ අභේද වශයෙන් එකසමාන දේශනා කරන ලදී. නාමපද වනාහි වෙනස්ව සූත්‍රාන්තයෙහි "එහි නාමය කවරේද? වේදනා, සඤ්ඤා, චේතනා, ස්පර්ශ මනසිකාරය කියන ලදී. මෙහි "වේදනා ස්කන්ධය, සංඥා ස්කන්ධය, සංඛාර ස්කන්ධය"යයි එහි යම් චක්ඛු විඤ්ඤාණ ප්‍රත්‍යයාගේ නාමය උපදී. ඉපදුනා වූද සිතේ ඨිතිය අරූපී ධර්මයන්ගේ ආයුෂයයි මෙසේ අන්‍ය ධර්ම සන්නිශ්‍රයේ නොගන්නා ලද බැවින් ප්‍රකටය. එය දක්වන්නේ චේතනා ඵස්ස මනසිකාර වශයෙන් සංඛාර ඛන්ධය තුනට බෙදා ස්කන්ධ දෙකක් සමග දේශනා කෙලේය. මෙහි වනාහි එහි කියන ලදද නොකියන ලදද සියල්ල නාමයට සංග්‍රහ කරන්නේ වේදනා ස්කන්ධ සඤ්ඤා ඛන්ධ සංඛාර ඛන්ධ යයි ස්කන්ධ තුනක් කීහ. මේ ස්කන්ධ තුනටම නාම කියන්නේ කුමක් නිසාද? විඤ්ඤාණය යන නම නොවේද? නොවන්නේ නොවේ. එහි විඤ්ඤාණය ගත්කල නාම විඤ්ඤාණයටද ප්‍රත්‍ය විඤ්ඤාණයටද යන විඤ්ඤාණයන් දෙකම එකම සභාව භවයට පැමිණේ. එනිසා විඤ්ඤාණයෙන් ප්‍රත්‍යයන් නොහඳුන්වා ප්‍රත්‍ය නිපදවීම නම් කිරීමට දැක්වීමට ප්‍රත්‍යයන ස්ථානයෙහි තබා ප්‍රත්‍ය නිපදවන ලද බව දැක්වීමට ස්කන්ධ තුන කියන ලදී. මෙසේ දේශනා භේදයෙන් විනිස දතයුතුය.

සියළු භවයන්හි පවතී යයි යන මෙහි නාමය එක සත්තාවාසයක් හැර සියළු භව යෝනි ගති විඤ්ඤාණඨිති සෙසු සත්තාවාසවල පවතී. රූපය භව දෙකක යෝනි සතරෙහි ගති පහේ විඤ්ඤාණ ඨිති පෙර සතරෙහි සත්තාවාස පහක පවතී. මෙසේ පවතින ඒ නාමරූපයෙහි යමකින් හිස්වූ ගැබට එන්නන්ගේ බිජුවටින් උපදින්නන්ගේද ප්‍රතිසන්ධි ක්ෂණයෙහි වස්තු කාය වශයෙන් රූප දෙකකින් පරම්පරා වශයෙන් අරූප ස්කන්ධ තුනකින්ද පහළවීම සිදුවේ. එහෙයින් ඒවායේ විස්තර වශයෙන් රූප අරූප වශයෙන් විස්සක් ද අරූප ස්කන්ධ තුන ද යන මේ විසිතුන විඤ්ඤාණ ප්‍රත්‍යයෙන් නාමරූප යයි දතයුතුය. අගහිතගහණ

නය ක්‍රමයෙන් එක සන්තති ශීර්ෂයකින් රූප ධර්ම නවයක් හැර දාහතරක් වේ. ස්වභාවකයන්ගේ භාව දසකයද වහා තිස්තුනක්ද ඔවුන්ගේද අගහිත ගහණයෙන් සන්තති ශීර්ෂ දෙකින් රූප ධර්ම දහඅටක් හැර පහලොවක්ද බ්‍රහ්මකායකාදි ඕපපාතික සතුන්ගේ ප්‍රතිසන්ධි ක්‍ෂණයෙහි චක්ඛු සෝත වත්ථු දසක සහ ජීවිතේන්ද්‍රිය නවකය ද වශයෙන් රූප අරූප වශයෙන් සන්තති ශීර්ෂ සතරකින් අරූපී ස්කන්ධ තුනකින් පහළ වේ. එහෙයින් ඔවුන්ගේ විස්තර වශයෙන් රූපාරූපවලින් තිස්නවයක්ද අරූපී ස්කන්ධ තුනද මේ සතලිස් දෙවැදෑරුම් ධර්ම විඥ්ඤාණ ප්‍රත්‍යයේ නාමරූප වේයයි දතයුතුය. අගහිත ගහණයෙන් සන්තති ශීර්ෂ තුනකින් විසිහතක් අත්හැර පහලොවක්ද වේ. කාමභවයෙහි සෙසු ඕපපාතිකයන්ගේ හෝ සංසේදජයන්ගේ හෝ සභාවක (භාව) පරිපූර්ණව ප්‍රතිසන්ධි ක්‍ෂණයෙහි රූපාරූපවලින් සන්තති ශීර්ෂ සතද අරූප ස්කන්ධ තුනද පහළ වේ. එනිසා ඔවුන්ගේ විස්තර වශයෙන් රූපාරූපවලින් හැත්තෑව ද අරූපී ඛන්ධ තුනද යන මේ සැත්තෑ තුන විඥ්ඤාණ ප්‍රත්‍යයෙන් නාමරූප යයි දතයුතුය. අගහිත ගහණයෙන් සන්තති ශීර්ෂ හයකින් පනස් හතරක් හැර දහනවයක් වේ. මේ උපරිම වශයෙනි. අවම වශයෙන් ඒ ඒ රූප සන්තති ශීර්ෂ විකල වූවන්ගේ ඒ ඒ හැටියට අඩුකර සංක්‍ෂෙප වශයෙන්ද විස්තර වශයෙන්ද ප්‍රතිසන්ධි විඥ්ඤාණ ප්‍රත්‍යයෙන් නාමරූප සංඛ්‍යාතය දතයුතුය. අරූපීන්ට වනාහි අරූපී ස්කන්ධ තුන ද අසඤ්ඤීන්ට රූපවලින් ජීවිත නවක රූපය දැන මේ ප්‍රතිසන්ධි ක්‍රමයයි. පැවතීම වනාහි රූප පවතින සියළු ස්ථානවල ප්‍රතිසන්ධි සිත පිහිටි ක්‍ෂණයෙහි ප්‍රතිසන්ධි සිත සමග පවතින ඍතුවෙන් ඍතු සමුට්ඨානා සුද්ධාෂ්මකය පහළ වේ. ප්‍රතිසන්ධි සිත රූප නො උපදවයි. යම්සේ එය වැටුණු කල්හි වැටුණු පුරුෂයා අනුන්ගේ ප්‍රත්‍යය වන්නට නොහැකි වේ. මෙසේ වස්තු දුර්වල තායෙන් දුර්වල බැවින් රූප ඉපදවීමට නොහැකි වේ. ප්‍රතිසන්ධි සිතෙන් මත්තෙහි ප්‍රථම භවංග සේ පටන් සිතින් උපදවන ශුද්ධාෂ්ඨකය වේ. ශබ්දය පහළවන ප්‍රතිසන්ධි ක්‍ෂණයෙන් මත්තෙහි පවතින ඍතුවෙන් හා සිතින්ද ශබ්ද නවක රූප කලාපය වේ. යම් කබලිංකාර ආහාර රූප ජීවි ගැබ් පිළිසිඳ ගන්න සත්වයෝ ඔවුන්ගේ -

**බුදින මව ඔහුගේ - අහර පැන් යම් බොදුනක්**
**එයින් හේ එහි යැපේ - මව්කුසට වන් පුගුලා**

යන වචනයෙන් මව විසින් ගත් ආහාරය ශරීරානුගතව, ඕපපාතිකයන්ගේ පළමුවෙන් තමාගේ කටට ආ කෙල ගන්නා කාලයෙහි

ආහාරය උපදවන ශුද්ධාෂ්ඨකය මේ ආහාර උපදවන ශුද්ධාෂ්ඨකයට සෘතු චිත්ත ආහාර ඉපදවීමද උපරිම වශයෙන් නවක දෙකකින් වශයෙන් විසිහය විධ වූ සිත්වලට පෙර එක් එක් චිත්තක්‍ෂණයෙහි තුන්වරක් ඉපිදෙමින් කියන ලද කර්ම සමුට්ඨානය සැත්තෑවිධ අනුභයාකාර වූ රූපයද අරූපී ස්කන්ධ තුනද කෙටියෙන් අනූනමයක් වූ ධර්මයෝ වෙති. වා ශබ්දය අනිතය. ඇතැම්කලක පහළ වේ. එනිසා ඒ දෙකම අත්හැර මේ අනූහත් ධර්ම සුදුසු ලෙස සියළු සත්වයින්ගේ විඤ්ඤාණ ප්‍රත්‍යයෙන් නාමරූපයි දතයුතුය. නිදන හැසිරෙන කන බොන දිවා රෑ හැම අවස්ථාවකම ඔවුන්ගේ විඤ්ඤාණය ප්‍රත්‍ය පවතී. ඔවුන්ගේ ඒ විඤ්ඤාණය ප්‍රත්‍යභාවය පසුව විස්තර කරමි. මේ අවස්ථාවේ කර්මජ රූප ගැන විස්තර කරමි. එය භව යෝනි ගති විඤ්ඤාණ ඨිති සත්තාවාසවල සියල්ලටම මුලින් පිහිටි ත්‍රි සමුට්ඨානික රූපයෙන් ඉතා දැඩිවූ නිසා සිටීමට නොහැකි විය. එයින් දැඩි වූ ත්‍රි සමුට්ඨානිකවලට නොහැකිය. වාතයෙන් පහරන ලද සතර දිසාවට නැමෙන බට පඳුරක් මෙන් රළ වේගයෙන් පහරන ලද මුහුදේ ප්‍රතිෂ්ඨාව ලැබූ වාතයක් මෙන්ද මේවා ඔවුනොවුන්ගෙන්ම දැඩි විය. නොවැටෙන ලෙස සංග්‍රහ කොට එක් වර්ෂයක් වර්ෂ දෙකක් වර්ෂ සියයක්ද ඒ සතුන්ගේ ආයුක්‍ෂය හෝ පුඤ්ඤක්ඛය දක්වා පවත්වයි. මෙසේ සියළු භවවල පවත්වන්නේ යයි විනිස දැනගත යුතුය. සංගානිකා යනු මෙහි අරූපයෙහි පවතින ප්‍රතිසන්ධිවල පංචවෝකාර භවයෙහි ද පවතින විඤ්ඤාණ ප්‍රත්‍යයේ නාමයම වේ. අසඤ්ඤ සත්වයෙහි ද ඇත්තේ සියළු පංචවෝකාර නාමවල පවත්නා විඤ්ඤාණ ප්‍රත්‍යයෙන් වූ රූපයම වේ. සියළු පංචවෝකාර භවයෙහි විඤ්ඤාණ පච්චයා නාමරූපං වේ. ඒ සියල්ල නාමඤ්ච රූපඤ්ච නාමරූපඤ්ච නාමරූපං යයි එක් ආකාරයක සමාන දේ ඒකසේස නයින් සංග්‍රහකොට විඤ්ඤාණ පච්චයා නාමරූපං යයි දතයුතුය. අසඤ්ඤයෙහි විඤ්ඤාණයක් නොමැතිවීම අයුත්තක් වේද? අයුත්තක් නොවේ. මෙයඃ-

නම්රූවල හේතු - විනැණය එය භගින්නේ
දෙකෙන් විවා'විවා - යුතුවෙයි යමකින්ද මෙය

නාමරූපවල හේතුව විඤ්ඤාණය වේ. එය විපාක අවිපාක භේදයෙන් දෙයාකාර වේයයි හඟී. මෙයද අසඤ්ඤ සත්තවල පංචවෝකාර භවයෙහි පවතින අභිසංඛාර විඤ්ඤාණය ප්‍රත්‍ය වූ රූපය මෙන් එසේම පංචවෝකාර භවයෙහි පවතින යම් කුසල චිත්තක්‍ෂණයක කර්මයෙන්

උපදින රූප නිසාත් මෙහි විඤ්ඤාණයක් නොමැතිවීම අයුක්තක් නොවේ. මෙසේ සංග්‍රහ කරන ලද මෙහි විනිස දතයුතුය. පච්චය නය යයි මෙහි:-

**නාම විවා විනැණ - පස වේ නව අයුරකින්**
**වත් රූ නව'යුරු - සෙසු රූ වේ අට'යුරු**

**අධිසකර විනැණට - වේ රූ එක් අයුරකින්**
**සෙසු විනැණ සඳහා - සුදුසු පරිදිම සිදුවේ.**

මෙය ප්‍රතිසන්ධියේ පැවතීම හෝ විපාක සංඛ්‍යාත නාමය වේ. එහි රූප මිශ්‍රව හෝ අමිශ්‍රව හෝ ප්‍රතිසන්ධියක් හෝ අන්‍ය වූ හෝ විපාක විඤ්ඤාණයට සහජාත, අඤ්ඤමඤ්ඤ, නිස්සය, සම්පයුක්ත, විපාක, ආහාර, ඉන්‍ද්‍රිය, අත්ථි අවිගත ප්‍රත්‍යවලින් නව ආකාරයකින් ප්‍රත්‍ය වේ. වස්තු රූපයේ ප්‍රතිසන්ධියට සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය විපාක ආහාර ඉන්‍ද්‍රිය විප්පයුත්ත අත්ථි අවිගත ප්‍රත්‍යවලින් නව ආකාරයකින් ප්‍රත්‍ය වේ. වස්තු රූපය හැර සෙසු රූපවලට අඤ්ඤමඤ්ඤ ප්‍රත්‍යය බැහැර කර සෙසු ප්‍රත්‍ය අටෙන් ප්‍රත්‍ය වේ. අභිසංඛාර විඤ්ඤාණය වනාහි අසඤ්ඤසත්ත රූපය හෝ පංච වෝකරයෙහි හෝ කර්මජයට සූත්‍රාන්ත ක්‍රමයෙන් උපනිශ්‍රය වශයෙන් එක් ආකාරයකින්ම ප්‍රත්‍ය වේ. අවසේස පළමු භවංගයේ සිට අවසේස සියළු විඤ්ඤාණවලට ඒ ඒ නාමරූපවලට සුදුසු පරිදි ප්‍රත්‍ය වේ යයි දතයුතුය. විස්තර වශයෙන් ඒ ප්‍රත්‍ය නයෙහි දැක්විය යුතු සියල්ල පට්ඨාන කථාවේ විස්තර කළ බැවින් එය නො අරඹමු.

එහි ප්‍රතිසන්ධි නාමරූපය විඤ්ඤාණ ප්‍රත්‍යයෙන් සිදුවේ යයි කෙසේ දැනගත හැකි වන්නේද? සූත්‍රවලින් සහ යුක්ති වශයෙන් දැනගත හැකිය. සූත්‍රවලින් චිත්තානු පරිවත්තිනො ධම්මාති ආදි නයින් බොහෝ වේදනාදීන්ගේ විඤ්ඤාණ ප්‍රත්‍යතාව සිදුවී ඇත. යුක්ති වශයෙන්

**සිදුවේ සිතින් රූ - මෙහි දුටු දෙයින් නුදුටුව**
**පිළිසඳ රූපයට - විනැණ පස යයි දන්නේ**

සිතෙහි ප්‍රසන්න අප්‍රසන්න හෝ තදානුරූපව උපදින රූපයෙන් දුටු දෙයින් නොදුටු දේ අනුමාන වේ" යන මෙයින් මෙහි දකින ලද චිත්තජ රූපවලින් නොදක්නා ලද ප්‍රතිසන්ධි රූපයට විඤ්ඤාණය ප්‍රත්‍ය

වේය යන මෙය දැනගත යුතුය. කර්මජ රූපයන්ට මෙන්ම චිත්තජ රූපයන්ටද විඤ්ඤාණය ප්‍රත්‍යතාව පට්ඨානයෙහි ආවේ යයි මෙසේ පච්චය නය වශයෙන් ද මෙහි විනිස දතයුතුය. මෙහිද විඤ්ඤාණ පච්චයා නාමරූපං යයි කියන භාග්‍යවතුන් වහන්සේ පරීක්ෂා කරන්නා වූ පණ්ඩිතයන්ගේ පරමාර්ථ වශයෙන් නාමරූප මාත්‍රය පමණක් පවතින්නේ යයි දකිනු ලැබේ. සත්වයෙක් නැත. පුරුෂයෙක් නැත. එනිසා නොපවතින සමණ බ්‍රාහ්මණ දේව මාර බ්‍රහ්ම කෙනෙකු - ලෝකයෙහි අනුත්තර වූ ධම්ම චක්කයම පැවතීය.

**විඤ්ඤාණ පච්චයා නාමරූප නිර්දේශය.**

නාමරූප පච්චයා සළායතන නිර්දේශයෙහි

**නාමය කඳ තුනය - රූපය බූ වන් ඈ**
**එක්සෙස්ව කළ එය - එයට පස වේ දන්නේ**

මේ සළායතනය ප්‍රත්‍ය වන්නේ නාමරූපයයි. එහි නාමය යනු වේදනාදි ස්කන්ධ තුනයි. රූපය වනාහි ස්වකීය සන්තතියට ඇතුළත් නියමයෙන් භූත සතර වස්තු සය ජීවිතේන්ද්‍රියදැයි මෙසේ භූත වස්තු යයි දතයුතුය. එය නාමඤ්ච රූපඤ්ච නාමරූපඤ්ච නාමරූපං මෙන් ඡට්ඨායතනඤ්ච සළායතනඤ්ච සළායතනය (ඒකසේස කළ නිසාද සමාහාර ද්වන්ද සමාසය) සළායතනයට ප්‍රත්‍ය වේයයි දතයුතුය. කුමක් හෙයින්ද? යම් හෙයකින් ආරුප්පයෙහි නාමයම ප්‍රත්‍ය වේ. එහිද ඡට්ඨායතනම වේ. අනිකක් නොවේ. නාම ප්‍රත්‍යය ඡට්ඨායතනවල අව්‍යාකත වාරයෙහි කියනු ලැබේ. මෙහි සංග්‍රහ කිරීමකි. එහි බෙදා දැක්වීමකි නය දතයුතුය. එය එහි කෙසේ වන්නේදැයි දැනගත හැකිද? නාමරූප සළායතනයට ප්‍රත්‍ය වේයයි නාමරූප භවයක් පවතින හෙයින් ඒ ඒ නාමයද රූපයද පවතිනවිට ඒ ඒ ආයතන වේ. වෙනත් ආකාරයකින් නොවේ. ඒ වනාහි එහි තබ්භාව භාවිභාවතා (ඒ භවයම වැඩීමෙන් අන්තිම භවය) ප්‍රත්‍ය නයෙහිම එන්නේය. එහෙයින් :-

**පිළිසිඳුම් ඇතිවිට - යමක් යමකට පස වේ**
**පසවන ලෙසට එහි - පැමිණවිය යුතු විදුවන්**

මෙය එහි අර්ථය දැක්විය.

**නාමයම අරූසේ - පිළිසිඳුම් ලෙස පවතී.**
**අවමයෙන් එය සත් - සය වෙයි පස (නියමයෙන්)**

කෙසේද? අවම වශයෙන් ප්‍රතිසන්ධිය සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය සම්පයුත්ත විපාක අත්‍ථි අවිගත ප්‍රත්‍යවලින් සත් ආකාරයකින් නාමය ෂට්ඨායතනයට ප්‍රත්‍ය වේ. කිසිවිට මෙහි හේතු ප්‍රත්‍යයෙන් ද කිසිවිට ආහාර ප්‍රත්‍යයෙන්දැයි මෙසේ අන්‍ය ආකාරයකින් ප්‍රත්‍ය වේ. ඒ අයුරින් උපරිම අවම වශයෙන් දැනගත යුතුය. පවතින විපාකද කියන ලද නයින්ම ප්‍රත්‍ය වේ. අවම වශයෙන් ඉතිරි එකේ කියන ලද ආකාර ප්‍රත්‍යවල විපාක ප්‍රත්‍යය හැර ප්‍රත්‍ය සයක් වේ. මෙහි කිසිවිට හේතු ප්‍රත්‍යයෙන්ද කිසිවිට ආහාර ප්‍රත්‍යයෙන්දැයි අන් ආකාරයකින් ද ප්‍රත්‍ය වේ. ඒ අයුරින් උපරිම අවම වශයෙන් දතයුතුය.

**අන් බවයෙහි නාම - එමලෙසමය පිළිසිඳුම්**
**ඉතිරි මෙ සවැනියට - සය අයුරකින් පස වේ**

ආරුප්පයෙන් අන්‍ය වූ පංචවෝකාර භවයෙහි ඒ විපාක නාමය හෘදය වස්තුවට සහාය වී සවැනි මනායතනයට ආරුප්පයෙහි කියන ලද ආකාරයෙන් වේ. එසේම අවම වශයෙන් සත් ආකාරයකින් ප්‍රත්‍ය වේ. ඉතිරි ඒ චක්ඛු ආදි පසට සතර මහා භූත සහායව සහජාත නිස්සය විපාක විප්පයුත්ත අත්‍ථි අවිගත වශයෙන් සය ආකාරයකින් ප්‍රත්‍ය වේ. කිසිවිට හේතු ප්‍රත්‍යයෙන් ද කිසිවිට ආහාර ප්‍රත්‍යයෙන්දැයි අන් ආකාරයකින් ප්‍රත්‍ය වේ. ඒ අයුරින් උපරිම අවම වශයෙන් දැනගත යුතුය.

**පවතින එසේ මෙය - විවා විවයට පස වේ**
**අවිවා අවිවාට - සයට සය'යුරු පස වේ**

පවත්නා පංචවෝකාර භවයෙහි ප්‍රතිසන්ධිය යම්සේද විපාකයට විපාක නාමයද එසේය. ෂට්ඨායතනයට අවම වශයෙන් සත් ආකාරයකින් ප්‍රත්‍ය වේ. අවිපාකය වනාහි අවිපාක ෂට්ඨායතනයට විපාක ප්‍රත්‍ය අත්හැර අවම වශයෙන් සයාකාරයකින් ප්‍රත්‍ය වේ. කියන ලද නයින්ම උපරිම අවම දැනගත යුතුය.

**එහිම සෙසු පහට ද - විපාකයටද සිව් ලෙස**
**පස වේ එලෙසින්ම - අවිවායටද වන්නේ**

එහිම පවතින සෙසු චක්ඛු ආදි පහද චක්ඛුප්පසාදාදි වස්තුද විපාක නමින් වූ ඉතිරියද පච්ඡාජාත, විප්පයුත්ත, අත්‍ථි, අවිගත ප්‍රත්‍යවලින් සිව් ආකාරයකින් ප්‍රත්‍ය වේ. විපාක සේ අවිපාකද එසේම ප්‍රකාශිතය. එහෙයින් කුසලාදි භේදද ඔවුන්ගේ සිව්ආකාර ප්‍රත්‍ය වේ. මෙසේ නාම පටිසන්ධිය යමකට පවතීනම් ඒ ඒ ආයතනවලට ප්‍රත්‍ය වේ. යම් සේ වෙයිද එසේ දතයුතුය.

**මෙහි රූපය අරූ - බවයෙහි නම් වෙය පස**
**නැත එක් ආයතන - ඉදින් පස්කඳ වේ නම්**

**රූපයෙන් පිළිසිඳුම් - වත්රූ මතට සවිදිව**
**පස වේ සිව් බූ ද - පහට අවිසෙස් සිව්'යුරූ**

රූපයෙන් වන ප්‍රතිසන්ධිය වස්තුරූප සවැනි මනායතනයට සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය විප්පයුත්ත අත්‍ථි අවිගත ප්‍රත්‍යවලින් සයාකාරයකින් ප්‍රත්‍ය වේ. ප්‍රතිසන්ධිය පවතින යම් යම් ආයතනවල සතරමහ භූත අවිශේෂයෙන් උපදියි. ඒ ඒ හැටියට චක්ඛු ආදි ආයතන පහම සහජාත නිස්සය අත්‍ථි අවිගත ප්‍රත්‍යවලින් සිව් ආකාරයකින් ප්‍රත්‍ය වේ.

**පවතින මොවුනගේ - ජීවිත අහර සඳහා**
**තෙපරිදිව පස වේ - සයට සවිදි පහට සිව්**

චක්ඛු ආදි මොවුන්ගේ ප්‍රතිසන්ධිය පවතින කල්හි අත්‍ථි අවිගත ඉන්‍ද්‍රිය වශයෙන් රූප ජීවිතේන්‍ද්‍රියට තුන් ආකාරයකින් ප්‍රත්‍ය වේ. ආහාරයටද ආහාර අත්‍ථි අවිගත වශයෙන් තුන් ආකාරයකින් ප්‍රත්‍ය වේ. යම් සත්වයෙක් ආහාර රූප ජීවියෙක් නම් ඔහුගේ ආහාර අනුගත ශරීරයම පවතී. ප්‍රතිසන්ධියක් නැත. චක්ඛු ආයතනාදී පහ සහ චක්ඛු විඤ්ඤාණාදි ආයතන හයට නිස්සය, පුරෙජාත, ඉන්‍ද්‍රිය, විප්පයුත්ත, අත්‍ථි අවිගත වශයෙන් සයාකාරයකින් ප්‍රත්‍ය පවතී නම්, ප්‍රතිසන්ධිය නැත. පඤ්චවිඤ්ඤාණ හැර එහිම අවසේස වූ මනායතනයට වස්තුරූපය නිසා පුරෙජාත, විප්පයුත්ත, අත්‍ථි අවිගත වශයෙන් පස් ආකාරයකින් ප්‍රත්‍ය පවතී නම්,

ප්‍රතිසන්ධිය නැත. මෙසේ රූපයම ප්‍රතිසන්ධියව පවතින හෝ ඒ ඒ ආයතනවලට ප්‍රත්‍ය වේ. යම්සේ වේද එසේ දන්නේය.

**යම් නම් රූ දෙකම - යමකට පසය වන්නේ**
**සැම තැනම සුදුසුම - යොදා පඬුවන් දන්නේ**

කෙසේද යත් ? පංච වෝකාර භවයෙහි ප්‍රතිසන්ධිය පවතිනවිට ස්කන්ධ තුන වස්තුරූප සංඛ්‍යාත නාමරූපය ෂට්ඨායතනයට සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය විපාක සම්පයුත්ත විප්පයුත්ත අත්ථි අවිගත ප්‍රත්‍යාදියෙන් ප්‍රත්‍ය වේ. මෙය මෙහි මාතෘකාව පමණය. කියන ලද නය අනුසාරයෙන් සියල්ල යොදා ගැනීමට හැකි වේ. මෙහි විස්තර නොදැක්විය.

නාමරූප පච්චයා සළායතන නිර්දේශයයි.

සළායතන පච්චයා ඵස්ස නිර්දේශයෙහි :-

**ස වෙ පහස් කෙටියෙන් - අක් පහස් ඈ ලෙසිනේ**
**දෙතිස් විනැණ වැතිව - විතර විසින් වේ දනු**

පාලියෙහි සංක්ෂෙපයෙන් **චක්ඛු සම්ඵසසති** යන ආදි ස්පර්ශ සයක්ම ආවේය. විස්තර වශයෙන් වනාහි චක්ඛු සම්ඵස්සාදි කුසල විපාක පහද අකුසල විපාක පහද යන දහයද සෙසු ලෞකික විපාක විඤ්ඤාණ සම්ප්‍රයුක්ත වූ විසිදෙක දැයි යන මේ සියල්ල සංඛාර ප්‍රත්‍යයෙන් යුත් කියන ලද විඤ්ඤාණය මෙන් තිස්දෙකක් වේ. යම් ඒ මේ තිස්දෙවැදෑරුම් වූ ස්පර්ශයට සළායතන ප්‍රත්‍ය වේ. එහි

**සක් ආදි අබතුර - බාහිර ද සයෙකින් වන**
**සළායතන වේ යයි - කැමතිවෙති මෙහි විදුවෝ**

එහි යමෙක් තමාගේ යයි සිතා පැවැත්ම කථා වේ යයි එක් පරම්පරාවකට අයත් ප්‍රත්‍ය හා ප්‍රත්‍යුත්පන්න පලද දැක්වේ. ඒවා **ෂට්ඨායතන පච්චයා ඵසෙසා** යන පෙල ඇසුරෙන් ආරූප්පයෙහි ෂට්ඨායතන ද අන් තන්හි සර්ව සංග්‍රහ වශයෙන් සළායතනද ස්පර්ශයෙහි ප්‍රත්‍යයයි එක් ආකාරයකින් සමාන වූ දේ එකක් වශයෙන් ගෙන ෂට්ඨය

සමග ආධ්‍යාත්ම වූ ශරීරයෙන් සහ චක්ඛු ආදිය සළායතනයයි කැමති වෙති. එය ඡට්ඨායතනද සළායතනද සළායතන ලෙස ගණන් ගැනේ. යමෙක් ප්‍රත්‍යුත්පන්නයම එක් සන්තතියකට ඇතුළත් කොට දක්වති. බිඳුණු සන්තතියකද ප්‍රත්‍යය වෙයි. යම් යම් ආයතන ස්පර්ශයට ප්‍රත්‍ය වේ. ඒ සියල්ලම දක්වන්නේ බාහිරයද අල්වාගෙන එයම ඡට්ඨය සමග අජ්ඣත්තය බාහිර වූ රූපායතනාදිය සමග සළායතනයයි කැමතිවෙති. එයද ඡට්ඨායතනඤ්ච සළායතනඤ්ච සළායතනය යන මේවා ඒක සේසයක් කළ කල්හි සළායතන යන සංඛ්‍යාව යයි මෙහි කීහ. සියළු ආයතනයන් එක් ස්පර්ශයක් සම්භෝග නොකෙරේ. (හටගන්වනු ලැබේ.) එක් ආයතනයකින් සියළු ස්පර්ශ ඇති නොවේ. මෙයද,
**සළායතන පච්චයා ඵස්සො** යයි එකක්ම කියන ලදී. ඒ කුමක් නිසාද? එහි විසඳුම මෙයයි. මෙය සත්‍යයයි. සියල්ල විසින් එකක් හෝ එකකින් සියල්ලම හෝ නොහටගනී. අනේකයෙන් එකක් හට ගනී. යම්සේ චක්ඛු සම්ඵස්සො චක්ඛායතනා රූපායතනා චක්ඛු විඤ්ඤාණ සංඛාතා මනායතනා අවසේස සම්පයුත්ත ධම්මායතන යයි මෙසේ සියළු තන්හි සුදුසු පරිදි යෙදිය යුතුයි. එහෙයින්ම :-

**එකක් එක් ආයත-නයකින් ඇතිවෙතැයි කී**
**පහස එක් වදනින් - මෙහි නිදසනුයෙ එනිසා**

ඒක වචන නිර්දේශයෙන් යන සළායතන පච්චයා ඵස්සො යන මෙහි ඒකවචන නිර්දේශයෙන් නොයෙක් ආයතනවලින් එක ස්පර්ශයෙක් වේ යයි එයින් දැක්වීය යන අර්ථයයි. ආයතන වනාහි :-

**පහට සය අයුරින් - එකට නව විදි බිහියට**
**සය විදි වෙතැයි පස- දැක්විය යුතු නිපන් සේ**

මේ එහි විස්තරයයි. චක්ඛු ආදි ආයතන පහ චක්ඛු සම්ඵස්ස ආදි පංචවිධ භේදයෙන් ස්පර්ශයට නිස්සය පුරෙජාත ඉන්ද්‍රිය විප්පයුත්ත අත්ථි අවිගත වශයෙන් සයාකාරයකින් ප්‍රත්‍ය වේ. ඉන්පසුව එකක් වූ විපාක මනායතනය නොයෙක් භේදයන් ඇති විපාක මනෝ ස්පර්ශයට සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය විපාක ආහාර ඉන්ද්‍රිය සම්පයුත්ත අත්ථි අවිගත වශයෙන් නවාකාරයකින් ප්‍රත්‍ය වේ. බාහිර ආයතන අතුරෙන් රූපායතන චක්ඛු සම්ඵස්සයට ආරම්මණ පුරෙජාත අත්ථි අවිගත වශයෙන් සිව් ආකාරයකින් ප්‍රත්‍ය වේ. සද්දායතනාදි සොතසම්ඵස්සාදියට ද එසේය.

මනෝ සම්ඵස්සයේ වනාහි ඒවාද ධම්මායතනයද එසේම ආරම්මණ පච්චය පමණකින් යයි ද මෙසේ බාහිර හය මේවායේ සම්භවය අනුව ප්‍රත්‍ය බව දැක්විය යුතු වන්නේය.

**සළායතන පච්චයා ඵස්ස නිර්දේශයයි.**

ඵස්ස පච්චයා වේදනා නිර්දේශයෙහි:-

**කීයැ විඳුම් දොරෙන් - සක් පහසින් නිපන් ඈ**
**සයෙක් තෙල බෙදුමෙන් - එකුන් අනූ වේ දනූ**

චක්ඛු සම්ඵස්සජා වේදනා යන ආදි නයින් පෙලෙහි මෙය චක්ඛු සම්ඵස්සජාදිකය සදොරින්ම වේදනාව ඇතිවේ යයි කියන ලදී. එය ප්‍රභේද වශයෙන් එකුන් අනූ සිත්වලින් සම්ප්‍රයුක්ත වී අසූනවය යයි දන්නා ලදී.

**විඳුම් අතරින් මෙහි - දෙතිසක් වූ වේදනා**
**විපාක සිත් සමග - අදහස් කළැයි පැවසේ**

**අට'යුරු එහි පහට - පස් දොරෙහි පස වන්නේ**
**සෙසු පහස එකයුරු - මන දොරෙහි පෙර අට'යුරු**

එහි පඤ්ච ද්වාරයෙහි චක්ඛු පසාදාදි වස්තු පසේ වේදනාවන්ගේ චක්ඛු සම්ඵස්සාදික වූ ස්පර්ශයට සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය විපාක ආහාර සම්පයුත්ත අත්‍ථි අවිගත වශයෙන් අට ආකාරයකින් ප්‍රත්‍ය වේ. සෙසු එක එක දොරවල්වල සම්පටිච්ඡනා සන්තීරණ තදාරම්මණ වශයෙන් පවතින කාමාවචර විපාක වේදනාවන්ගේ චක්ඛු සම්ඵස්සාදි ස්පර්ශය උපනිස්සය වශයෙන් එක් අයුරකින් ප්‍රත්‍ය වේ. මනෝද්වාරයෙහි ද තදාරම්මණ වශයෙන් පවතින කාමාවචර විපාක වේදනාවන්ගේ ඒ සහජාත මනෝ සම්ඵස්ස සංඛ්‍යාත ස්පර්ශය පෙර මෙන් අට ආකාරයකින් ප්‍රත්‍ය වේ. ප්‍රතිසන්ධි භවංග චුති වශයෙන් පවත්නා ත්‍රෛභූමික විපාක වේදනාවන්ගේද මනෝ ද්වාරයෙහි යම් ඒ තදාරම්මණ වශයෙන් පවතින කාමාවචර වේදනා ඒවා මනෝද්වාරයෙහි ආවර්ජන සම්ප්‍රයුක්ත වූ මනෝ සම්ඵස්සය උපනිස්සය වශයෙන් එක් අයුරකින් ප්‍රත්‍ය වේ.

**ඵස්සපච්චයා වේදනා නිර්දේශයයි.**

වේදනා පච්චයා තණ්හා නිර්දේශයෙහි :-

**රූ තණ ඈ බෙයින් - ඇත මෙහි සයක් දක්වා**
**එකක තුනකින් යුත් - පවතින අයුරු දන්නේ**

මෙහි වේදනා පච්චයා තණ්හා නිර්දේශයෙහි සිටු පුතා බමුණු පුතා යන පියාගේ නමින් පුතා මෙන් මේ රූප තණ්හා....... ධම්ම තණ්හා යන අරමුණුවලින් නම් වශයෙන් තෘෂ්ණා සයක් දක්වන ලදැයි ප්‍රකාශ කරන ලදැයි කියන ලදැයි යන අර්ථයද එහි රූපයෙහි තෘෂ්ණාව රූප තණ්හායයි මේ නයින් පද අර්ථය දතයුතුය. ඒ තෘෂ්ණා අතරින් එක එකේ තණ්හාව පවතින ආකාරය කාම තණ්හා භව තණ්හා විභව තණ්හා යන තුන් ආකාරයෙන් දන්නා ලදී. යම්විට රූප තණ්හාවම ඇසට පැමිණි රූප අරමුණ කාමාශ්වාද වශයෙන් අරමුණු කරමින් පවතී. එවිට එය කාම තණ්හාව වේ. යම්විට ඒ අරමුණම ස්ථිරව සදාකාලිකව පවතී යයි සාස්වත දෘෂ්ටිය සමග පවතී. එවිට එය භව තණ්හාව වේ. සාස්වත දෘෂ්ටි සහගත රාගය භව තෘෂ්ණාවයි කියනු ලැබේ. යම්කලෙක ඒ අරමුණම සිඳදමනු ලබයි. විනාශ වන්නේ යයි උච්ඡේද දෘෂ්ටිය සමග පවතී. එවිට එය විභව තණ්හා නම් වෙයි. උච්ඡේද දෘෂ්ටි සහගත රාගය විභව තණ්හාවයයි කියනු ලැබේ. ශබ්ද තෘෂ්ණාදිය ද මේ නයින්මය. මේවා තෘෂ්ණා දහඅටක් වේ. ඒවා අජ්ඣත්ත දහඅට බාහිර දහඅට යයි තිස්හයක් වේ. මෙසේ අතීත තිස්හය අනාගත තිස්හය වර්තමාන තිස්හය යයි එකසිය අටක් තෘෂ්ණා වේ. ඒවා වනාහි සංක්‍ෂෙප කරමින් රූපාදි අරමුණු වශයෙන් සය, කාම තණ්හාදි වශයෙන් තණ්හා තුනක් වේ යයි දතයුතුය.

යම්හෙයකින් වනාහි මේ සත්වයෝ පුතා සනසා පුතා කෙරෙහි මමත්වයෙන් කිරිමවක මෙන් රූපාදි අරමුණු වශයෙන් ඉපදෙන වේදනාව ආශ්වාදනය කොට වේදනාවෙහි මමත්වයෙන් රූපාදි අරමුණු දෙන්නන්ගේ චිත්‍ර ශිල්පියා නළුවා සුවඳ වෙළෙන්දා අරක්කැමියා පේෂකාරයා රසායන බෙහෙත් සාදන වෛද්‍යවරුන් ආදීන්ට මහත් සත්කාර කරති. ඒ නිසා මේ සියල්ල වේදනා පච්චයා තණ්හා හොතීති දතයුතුය.

**දුගියා සුව පතයි - සුගියා තව තව පතා**
**මැදහතින් තැවුනෝ - එය සැපමයයි කියතී**

තණෙත් පසවීමෙන් - වෙයි මේ තුන් වේදනා
වෙයින් තණ වේයයි - කී මහ ඉසිවර මෙසේ

අනුසයක් නොමැතිව - වෙයින් පස නොවේමය
එය නොමැති වේනම් - බමුණෙකි විසුවෙකි දනු

වේදනා පච්ච තණ්හා නිර්දේශයයි.

තණ්හා පච්චයා උපාදාන නිර්දේශයෙහිඃ-

උවාදන් සතරකි - බෙදුමෙන් අරුත් ඒවා
දම් සැකෙවින් විතර - පිළිවෙළ ලෙසින් දක්වනු

පෙලෙහි උපාදාන යනු කාම උපාදාන දිට්ඨි උපාදාන සීලබ්බත උපාදාන අත්තවාද උපාදාන යයි යන මේ සතර එයි. මේ ඒවායේ අර්ථ විභාගයයි. වස්තු සංඛ්‍යාත කාමය අල්ලාගනු ලැබේනුයි කාම උපාදාන වේ. කාමයද උපාදානයද කාමූපාදාන වේ. උපාදාන යනු දැඩි ග්‍රහණයයි. මෙහි උප භේදය උපායාස උපක්කට්ඨ ආදියෙහි මෙනි. එසේම දිට්ඨියද උපාදානයද දිට්ඨි උපාදාන වේ. දෘෂ්ටිය ගනු ලැබේනුයි හෝ දිට්ඨි උපාදාන වේ. ආත්මයද ලෝකයද ශාස්වතය ආදියෙහි පුරිම දෘෂ්ටියද උත්තර දෘෂ්ටියද අල්ලා ගනී. එසේම සීල වත්ත අල්ලා ගනිනුයි සීලබ්බත උපාදාන වේ. සීලබ්බතය ද උපාදානය ද සීලබ්බතුපාදාන වේ. ගව සීල ගව වත්ත ආදිය මෙසේ පිරිසිදු වේ යයි සිතාගෙන වැළඳගෙන තමාම අල්ලාගෙන එසේ කියයි. මෙයින් වාද වේ. මෙයින් අල්ලා ගනුනුයි උපාදාන වේ. කුමක් කියයිද? කුමක් අල්ලා ගනීද? යන මෙය උපාදානය වේ. තම තමාගේ වාදය උපාදානය කිරීම අත්තවාදූපාදානය වේ. අත්තවාදය පමණක් හෝ තමා යයි අල්ලා ගත්තේ මෙයින්ය යනු අත්තමවාදූපාදන වේ. මෙය ඒවායේ අර්ථ විභාගයයි. ධම්මසංඛෙප විස්ථාරය වනාහි කාමූපාදානය මුලින්ම එහි කාම උපාදානය කුමක්ද? යමෙක් කාමයන්හි කාමයන් කැමැත්තෙක් වේද? ඇල්මක් වේද බැඳීමක් වේද සෙනහසක් වේද දැවීමක් වේද මූර්ඡාවීමක් වේද බලවත් ඇල්මක් වේද එය කාම උපාදානය කියනු ලැබේ.

සංක්ෂේපයෙන් ආ බැවින් තණ්හාව ගොරෝසු ලෙස කියන ලදී.

ගොරෝසු තණ්හාව නම් පුරිම තණ්හාව උපනිශ්‍රය ප්‍රත්‍යයෙන් දැඩිව හටගත් උත්තර තණ්හාවම වේ. කිසිවෙක් මෙසේ කීහ. නොපැමිණි විෂය පැතීම තණ්හාව වේ. අඳුරෙහි සොරාගේ අත දිගු කරන්නාක් මෙන් පැමිණි විෂය ගැනීම උපාදාන වේ. එහිම භාණ්ඩයක් ගැනීම මෙනි. අපිස් සතොස් බවට ඒ ධර්ම ප්‍රතිපක්ෂ වේ. එසේම ඒවා සෙවීම ආරක්ෂා කිරීම දුකට මුලකි. සෙසු උපාදාන තුන සැකෙවින් දෘෂ්ටි මාත්‍රයකි. විස්තර වශයෙන් පෙර රූපාදියෙහි කියන ලද එක්සිය අටක් ප්‍රභේද වූ තෘෂ්ණාවේ දැඩි බව කාමූපාදනා වේ. දස වස්තුක මිථ්‍යා දෘෂ්ටිය දිට්ඨි උපාදාන වේ. යම්සේ කීහ. තත්‍ථ කතමං දිට්ඨූපාදානං යි දෙන ලද දෙයක් පලක් නැත. යාගයෙන් පලක් නැත..... සාක්‍ෂාත් කර ප්‍රකාශ කරති. මේ පිළිබඳ යම් බඳු දෘෂ්ටියක්........විපර්යාසයෙන් ගැනීමකි. දිට්ඨි උපාදානය මෙය යයි කියනු ලැබේ. සීල ව්‍රතවලින් ශුද්ධිය පරාමර්ශනය කිරීම සීලබ්බත උපාදානයයි. යම්සේ කීහ:- තත්‍ථ කතමං සීලබ්බතුපාදානං? සීලයෙන් ශුද්ධිය ව්‍රතයෙන් ශුද්ධිය සීලබ්බතයෙන් ශුද්ධිය යයි මෙබඳු වූ යම් දෘෂ්ටියක්.........විපර්යාශාව ගැනීමකි. සීලබ්බතු පාදානය මෙය යයි කියනු ලැබේ. වීසති වස්තු සක්කාය දිට්ඨි අත්තවාදූපාදානය. යථාහ.......තත්‍ථ කතුමං අත්තවාදූපාදානං? මෙහි අශ්‍රැතවත් පෘථග්ජනයා...........සත්පුරුෂ ධර්මයෙහි අවිනීතව රූපය තමාගෙන් යයි දකියි. විපර්යාසව ගැනීමකි. මෙය අත්තවාදූපාදානයයි කියනු ලැබේ. මෙහි මෙය ධර්ම සංක්‍ෂෙප විස්තරයයි.

කමතො යන මෙහි ක්‍රම තුනකි. උත්පත්ති ක්‍රමය ප්‍රහාන ක්‍රමය දේශනා ක්‍රමයද වශයෙන්. එහි මුලක් නැති සසරෙහි මෙය පළමුවන උපත යයි නැතිහෙයින් කෙලෙසුන්ගේ වෙනස් නොකළ හැකි බැවින් උත්පත්ති ක්‍රමය නො කියනු ලැබේ. වෙනස් කළ හැකි බැවින් බොහෝසෙයින් එක් භවයක ආත්මය තැනීම පෙරටුව ශාස්වත උච්ඡේද එළඹ එයින් මේ ආත්මය ශාස්වතයි ගැනීමෙන් ආත්ම විසුද්ධාර්ථ සීලබ්තුපාදා යයි මේ ආත්මය මෙයින් මතු නැතැයි ගැනීමෙන් පරලෝකය ගැන අපේක්‍ෂා නැති නිසා කාම උපාදානයයි. මෙසේ පළමුව අත්තවාද උපාදානයද එයින් පසු දිට්ඨි සීල කාම උපාදාන හෝ යයි මෙය ඔවුන්ගේ එක් භවයක උත්පත්ති ක්‍රමයයි. දිට්ඨි උපාදානාදිය මෙහි පළමුව ප්‍රහීන වන්නේ සෝතාපත්ති මාර්ගයෙන් අවසන් වීමෙනි. අරහත්ත මාර්ගයෙන් වධයට පැමිණෙන බැවින් කාමූපාදානය පසුව ප්‍රහීන වේ. මෙය මේවායේ ප්‍රහාන ක්‍රමයයි.

මහා විසය බැවින්ද ප්‍රකට නිසා ද මේවා අතුරෙන් කාමූපාදානය පළමුව දේශනා කරන ලදි. ඒ මහා විසය නම් අට සිත් එකතුවයි. සතර සිත් එකතුව ඉතිරි අල්ප විසයයි. ආලයෙන් වෙළුණු ප්‍රජාවගේ කාමූපාදපනය බොහෝසෙයින් ප්‍රකටය. ඉතිරිවා එසේ නැත. කාමූපාදානය හෝ වස්තු කාමයන්ගේ දැනගැනීමට (ලබාගැනීමට) කුතුහල මංගල බොහෝ වේ. සාස්වත දෘෂ්ටි යයි. ඊට අනතුරුව දිට්ඨි උපාදානය. එය බෙදමින් සීලබ්බත අත්තවාද උපාදාන වශයෙන් දෙයාකාර වේ. ඒ දෙකෙහි ගව ක්‍රියාවක් හෝ සුනඛ ක්‍රියාවක් හෝ දැක දැනගන්නට ඖදාරික නිසා සීලබ්බත උපාදානය පළමුව දේශනා කරන ලදි. සියුම් නිසා අවසානයෙහි අත්තවාද උපාදානය දේශනා කරන ලදි. මේ මෙහි දේශනා ක්‍රමයයි.

මුලට ඇති කම් තණ - එක අයුරකින් පස වේ
සෙසු තුනට සත හෝ - අට හෝ ලෙසින් පස වේ

මෙසේ දේශනා කරන ලද මෙහි උපාදාන චතුෂ්කයෙහි පළමු කාමූපාදාන තෘෂ්ණාව උපනිශ්‍රය වශයෙන් එක් අයුරකින් ප්‍රත්‍යය වේ. තෘෂ්ණාවෙන් සතුටු විෂය කෙරෙන් උපන් හෙයින් සෙසු තුනට සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය සම්පයුත්ත අත්ථි අවිගත හේතු වශයෙන් සත් ආකාරයකින් හෝ උපනිශ්‍රය ප්‍රත්‍යය සමග අට ආකාරයකින් හෝ ප්‍රත්‍ය වේ. උපනිශ්‍රය ප්‍රත්‍ය වන අවස්ථාවල සහජාත ප්‍රත්‍යය ඉවත් වේ.

තණ්හා පච්චයා උපාදාන නිර්දේශයයි.

උපාදාන පච්චයා භව නිර්දේශයෙහි :-

අරුතින් ද දහමින් - බෙදුම් වන ලෙස තේරුම්
දතයුතු විනිස මෙහි - යමකට පස වන ලෙස ද

එහි වේතුයි භව දුවිධෙන දෙයාකාරයකින් පවත්නේය යන අර්ථයයි. නොයෙක් දුවිධෙන යනු ප්‍රථමාමෙහි කරණ වචනයයි. දෙක යයි කියන ලදි. අත්ථි යන ඇත. කර්මයම භව කම්මභව වේ. උත්පත්තියම භවය වූයේ උපපත්තිභාවො වේ. මෙහිද උපත වේ යනු භවයයි. යම් සුඛ කරුණක් බැවින් සුඛො බුද්ධානං උප්පාදො බුදුවරුන්ගේ ඉපදීම සුවයයි කියන ලදි. මෙසේ බව හේතුවෙන් පල ව්‍යවහාරයෙන් භව යයි දතයුතුය.

තත්‍ථ කතමො කම්ම භවො ච යන ඒ භව දෙක අතුරෙන් කර්මභවය කුමක්ද? යන්නය. පුඤ්ඤාභි සංඛාරාදිය කියන ලද අරුත් ඇත්තේමය. සබ්බං යනු සියල්ල. භවයට යයි, යවනු ලබයි භවගාමි. මෙයින් නිවන ප්‍රතික්ෂේප කරයි. මේ සසර කථාවයි. එයද විවට්ට නිශ්‍රිතය. කරනු ලැබේනුයි කර්ම. කාම සංඛ්‍යාත කාම භවයන්හි භවය කාමභව වේ. රූපරූප භවවලද මෙම නයයි. සංඥාවෙන් ඇතිවූ භවය හෝ සංඥාව මෙහි ඇතැයි යන අර්ථයෙන් හෝ සඤ්ඤාභව වේ. ඊට අසමාන වූයේ අසඤ්ඤා භව වේ. ඕලාරික සංඥාව නැති සියුම්ව ඇති සඤ්ඤා නැති අසඤ්ඤා නැති මේ භවයෙහිය යන නේවසඤ්ඤා නාසඤ්ඤා වේ. එක රූපස්කන්ධයකින් යුත් භවය එකවොකාර භව වේ. එක වෝකාරයක් මේ භවයෙ වේ යයි ද එකවෝකාර භව වේ. චතුවෝකාර පඤ්චවෝකාර භවවලද මෙම නයමය. අය වුච්චති උප්පත්ති භවො මෙය නව විධව උත්පත්ති භවය කියනු ලැබේ. මෙසේ අර්ථ වශයෙන් විනිස දතයුතුය.

ධම්මතො වනාහි පුඤ්ඤාභිසංඛාර ධර්ම වශයෙන් චේතනා දහතුනය. අපුඤ්ඤාභි සංඛාර චේතනා දොළහය. අනෙඤ්ජාභිසංඛාර සතරය. සියල්ල භවගාමී කර්ම නිසා මේ සියළු ධර්මයෝ චේතනා සම්පයුක්තව හෝ කර්ම සංඛ්‍යාත වූ රැස්කරමින් යන ධර්ම සංග්‍රහ කරන ලදී. කාමභවය උපාදින්න (තමාගේ යයි අල්ලාගත් ස්කන්ධ පහය, රූප භවයද එසේය. අරූප භවයෙහි සතරය. සඤ්ඤා භවය සතරක, පහකි. අසඤ්ඤාභවයේ ඒක උපාදාන ස්කන්ධයකි. නේවසඤ්ඤා නාසඤ්ඤා සතරය සතරකි. ඒකවෝකාර භවාදියෙහි එක සතර පහ වශයෙන් උපාදිනන ස්කන්ධවලින් යුක්ත වේ. මෙසේ මෙහි ධර්මතා වශයෙන් ද විනිස දතයුතුය.

සාත්‍ථතො යන්න භව විස්තරයෙහි කියූ පරිදිය. කාමයද සංඛාර විස්තරයෙහි පුඤ්ඤාභි සංඛාරාදියම කියන ලදී. ඒ මෙසේ ඇතිකල්හි අතීත කර්ම වශයෙන් මෙහි ප්‍රතිසන්ධියට ප්‍රත්‍ය වූ බව පෙර කියන ලදී. වර්තමාන කර්ම වශයෙන් අනාගතයෙහි ප්‍රතිසන්ධියට ප්‍රත්‍යවත් වන බව නැවත වචනය සාත්‍ථක නම්ද වේ. පෙර හෝ එහි පුඤ්ඤාභිසංඛාර කවරේද? "කාමාවචර කුසල චේතනා" යයි මේ ආදි වශයෙන් වේ. එනම් සංඛාරවන බව කියන ලදී. මෙහි වනාහි සියල්ල භවගාමි කර්මය යන වචනයෙන් චේතනා සම්ප්‍රයුක්ත වූද විඤ්ඤාණ ප්‍රත්‍යය වූ කර්මයම සංඛාර නය කියන ලදී. අනිත් භවවල උපදවන කර්ම කිම බොහෝ

වේද? අවිජ්ජා පච්චයා සංඛාරා යන එහි පුඤ්ඤාභිසංඛාරාදිය කුසලාකුසල ධර්මය යයි කියන ලදී. උපාදාන පච්චයා භගවා යන මෙහි උත්පත්ති භවයද සංග්‍රහ කළයුතු හෙයින් කුසලාකුසල අබ්‍යාකත ධර්ම කියන ලදී. එහෙයින් සියළු තැන මෙය සාර්ථක නැවත වචනය. මෙසේ මෙහි සත්‍ථතො යන්නෙහි විනිස දතයුතුය.

භෙද සංගහාති උපාදාන ප්‍රත්‍යයෙන් භවයේ ප්‍රභේද මෙන්ම සංග්‍රහයද වේ. කාම උපාදාන ප්‍රත්‍යයෙන් කාම භවයෙහි උපදවන කර්මය කරනු ලැබීද එය කර්ම භවයයි. එහි උපන් ස්කන්ධ උත්පත්ති භාවයයි. රූපාරූප භවාදියෙහි ද මෙම නයමයි. මෙසේ කාමූපාදාන ප්‍රත්‍යයෙන් කාම භව දෙකෙක් වේ. සඤ්ඤා භව පංචවෝකාර භවද ඊට අන්තර්ගතය. රූප භව දෙකකි. සඤ්ඤා භව අසඤ්ඤා භව එකවොකාර භව පංචවෝකාර භව ඊට ඇතුළත්ය. අරූප භව දෙකකි. සඤ්ඤා භව නේවසඤ්ඤා නාසඤ්ඤා භව චතුවෝකාර භවයක් සමග භව සයක් ඇතුළත් වේ. කාමූපාදාන ප්‍රත්‍යය සමග භව සයක් ඇතුළත් වන්නා සේ සෙසු උපාදාන ප්‍රත්‍යයන් සමගද සය බැගින් ඇතුළත් වේ. මෙසේ උපාදාන ප්‍රත්‍ය භේදයෙන් භව විසිහතරක් වේ. කම්ම භව උත්පත්ති භව එකක් කොට කාම උපාදාන ප්‍රත්‍යය සමග එක් කාම භවයක් සංග්‍රහකර ඇත. රූපාරූපාදි තුන් භවයෙහිද එසේය. සෙසු උපාදාන ප්‍රත්‍යවලද එසේය. මෙසේ උපාදාන ප්‍රත්‍ය සංග්‍රහ කිරීමෙන් භව දොලසක් ඇතුළත් වේ. තවද අවිශේෂයෙන් උපාදාන ප්‍රත්‍යයෙන් කාම භවයට පැමිණි කර්මය කාම භව වේ. එය ඇසුරුකොට උපන් ස්කන්ධ උත්පත්ති භව වේ. රූපාරූප භවවලද එසේය. මෙසේ උපාදාන ප්‍රත්‍යය සමග ඇතුළත් කාමභව දෙකකි. රූප භව දෙකකි. අරූප භව දෙකකැයි තවත් පරියායකින් සංග්‍රහ කිරීමෙන් භව සයක් වේ. කම්ම භව උත්පත්ති භේදය අනුව පැමිණි ඇතුළත් වූ කාමාදි වශයෙන් භව තුනක් වේ. කාම භවාදි භේදය අනුව කම්ම භව උත්පත්ති භව වශයෙන් භව දෙකක් වේ. කම්ම උප්පත්ති භේදය අනුව උපාදාන පච්චයා භවො යයි භව වශයෙන් එක් භවයක් වේයයි මෙසේ මෙහි උපාදාන ප්‍රත්‍ය භාවයේ භෙද සංග්‍රහයේ ද විනිස දතයුතුය.

යං යස්ස පච්චයො ච එව යන මෙහි යම් උපාදානයක් යමකට ප්‍රත්‍ය වේද? එයින් ද විනිශ්චයේ අර්ථය දතයුතුය. යමකට යම්කිසි ප්‍රත්‍යයක් වේමය. පුහුදුන් තැනැත්තා උමතු වූවකු මෙන් මෙය යුතුයයි මෙය අයුතුයයි නොවිමසා යම්කිසි උපාදානයක් වශයෙන් යම්කිසි භවයක්

පතා යම්කිසි කර්මයක් කරන්නේමය. එහෙයින් ඇතැමෙක් සීලබ්බත උපාදානයෙන් රූපාරූප භව නැතැයි කියති. එය නොගත යුතුය. සියල්ලෙන් සියල්ල වන්නේ යයි ගතයුතුය. කෙසේද යත්? මෙහි ඇතමෙක් අනුසසව වශයෙන් හෝ දෘෂ්ටි අනුසාරයෙන් හෝ කාමය නම් මේ මනුෂ්‍ය ලෝකයේ ක්‍ෂත්‍රිය මහාසාර කුලවල මෙන්ම කාමාවචර දිව්‍යලෝක සයේද සම්පූර්ණ යයි සිතා ඒවා ලබාගැනීම සඳහා අසද්ධර්මය ශ්‍රවණය කිරීමෙන් නොමග ගොස් (වඤ්චිතො) මේ ක්‍රියාවෙන් කර්මයන් සිදුකර ගත හැකියයි සිතන්නේ කාම උපාදාන වශයෙන් කාය දුෂ්චරිතාදිය කරති. හේ දුසිරිත් පුරා අපායෙහි උපදියි. සාන්දෘෂ්ටික වශයෙන් කාමය ප්‍රාර්ථනා කරමින් එය ලැබුණු පසු ආරක්ෂා කිරීමට කාම උපාදාන වශයෙන් කාය දුෂ්චරිතාදිය කරයි. හේ දුසිරිත් පිරීමෙන් අපායේ උපදී. එහි ඔහුගේ උත්පත්තියට හේතුව කර්මය කම්ම භව වේ. කර්මයෙන් උපන් ස්කන්ධ උත්පත්ති භව වේ. සඤ්ඤා භව පංචවෝකාර භව ඊට ඇතුළත් වේමය. තවකෙක් වනාහි සද්ධර්ම ශ්‍රවණාදියෙන් වඩන ලද නුවණ ඇත්තේ මේ ක්‍රියාවෙන් (කර්මයෙන්) කාමයන් ලැබෙතැයි සිතන්නේ කාම උපාදාන වශයෙන් කාය සුචරිතාදිය කරයි. හේ සුචරිතය පුරා දෙව්ලොව හෝ මිනිස් ලොව උපදියි. එහි ඔහුට උත්පත්තියට හේතුව කර්මය කම්ම භවයයි. කර්මයෙන් උපන් ස්කන්ධ උප්පත්ති භවයයි. සඤ්ඤාභව පඤ්චවෝකාර භව වනාහි ඊට අන්තර්ගත වේමය. මෙසේ කාම උපාදානය ප්‍රභේද වූ ඇතුළත් වූ කාම භවයට ප්‍රත්‍යය වේ.

තව කෙනෙක් රූපාරූප භවවල ඊට වඩා කාම සම්පත් ඇතැයි අසා හෝ සිතා හෝ කාම උපාදාන වශයෙන් රූපාරූප සමාපත්ති උපදවා සමාපත්ති බලයෙන් රූපාරූප බ්‍රහ්ම ලෝකයෙහි උපදිති. එහි ඔහුට උපතට හේතු වූ කර්මය කම්ම භවයයි. කර්මයෙන් උපදවන ලද ස්කන්ධ උප්පත්ති භවයයි. සඤ්ඤා අසඤ්ඤා නේවසඤ්ඤා නාසඤ්ඤා ඒකවෝකාර චතුවෝකාර පංචවෝකාර භව ඊට ඇතුළත් වේ. මෙසේ කාම උපාදානය බෙදීම් සහිත වූ ඇතුළත් වූ රූපාරූප භවවලටද ප්‍රත්‍යය වේ. තව කෙනෙක් මේ ආත්මය නම් කාමාවචර සම්පත්ති භවයෙහි හෝ රූපාරූප භවවල හෝ වෙනත් තැනක හෝ සිඳින ලද්දේ මොනවට සිඳින ලද්දේ වෙයි. උච්ඡේද දෘෂ්ටිය ගෙන ඊට අනුව කර්ම කරති. ඔහුගේ ඒ කර්මය කම්ම භවයයි. කර්මයෙන් නිපන් ස්කන්ධ උප්පත්ති භවයයි. සඤ්ඤා භවාදිය ඊට ඇතුළත් වේ. මෙසේ දිට්ඨි උපාදානය භේද සහිත ඇතුළත් කාමරූපාරූප භව තුනටම ප්‍රත්‍යය වේ. යම් කෙනෙක්

මේ ආත්මය නම් කාමාවචර සම්පත්ති භවයෙහි හෝ රූපාරූප භවවල හෝ අන් ස්ථානයක හෝ සැපවත් වේයයි ගන්නා ලද වැරදි අදහස් ඇත්තේ අත්තවාද උපාදානයට පැමිණ කර්ම කරති. ඒ ඒ කර්ම ඔහුගේ කර්ම භවයයි. එයින් නිපන් ස්කන්ධ උප්පත්ති භවයයි. සඤ්ඤා භවාදිය ඊට ඇතුළත වේ. මෙසේ අත්තවාද උපාදානය බෙදීම් සහිතව සාන්තර්ගතව භව තුනට ප්‍රත්‍යය වේ. තව කෙනෙක් මේ සීලව්‍රත කාමාවචර සම්පත්ති භවයෙහි හෝ රූපාරූප භවවල හෝ වෙන තැනක හෝ සම්පූර්ණ කරනවිට සැප සම්පූර්ණ වේයයි සීලබ්බත උපාදාන වශයෙන් ඒ අනුව කර්ම කරති. ඔහුගේ ඒ කර්මය කම්ම භවයයි. එයින් උපදවන ස්කන්ධ උප්පත්ති භවයයි. සඤ්ඤා භවාදිය ඊට ඇතුළත් වේ. මෙසේ සීලබ්බත උපාදානයද බෙදීම් සහිත වූ සාන්තර්ගත වූ භව තුනට ප්‍රත්‍ය වේයයි මෙසේ මෙහි යං යස්ස පච්චයො හොති යන්නෙන් විනිස දතයුතුය. කුමන භවයකට කෙසේ ප්‍රත්‍ය වන්නේද?

රූඅරූ බවවල - උපනිස පසයි උවදන්
සහදෑ ආදියෙන් - එ කම් බවයයි දන්නේ -

රූපාරූප භව කාම භවයෙහි ඇතුළත් හෙයින් කාම භවයෙන් කුසල කර්මයක්ව උප්පත්ති භවය ද මේ සතරද උපනිසසය ප්‍රත්‍යයෙන් ඒකවිධව ප්‍රත්‍ය වේ. කාම භවයෙහි තමා හා සත්වයන් අකුසල කර්ම භවයට සහජාත අඤ්ඤමඤ්ඤ නිසසය සම්පයුත්ත අත්‍ථි අවිගත හේතු ප්‍රත්‍ය භේදයෙන් සහජාතාදි ප්‍රත්‍ය වේ. විප්පයුතතය උපනිසසය ප්‍රත්‍යයෝ ප්‍රත්‍ය වේ.

## උපාදාන පච්චයා භව නිර්දේශයයි.

භව පච්චයා ජාති නිද්දේසාදියෙහි :-

ජාති ආදියෙහි විනිස සච්ච විභංගයෙහි කී නයින් දැනගත යුතුය. භවො යන මෙහි කම්මභව අදහස් කරයි. එය ජාතියට ප්‍රත්‍යය වේ. උප්පත්ති භවය නොවේ. එයම කම්ම පච්චය උපනිස්සය පච්චය වශයෙන් දෙයාකාරයකින් ප්‍රත්‍ය වේ. එහි මෙය කෙසේ දැනගත හැකිද? භවය ජාතියට ප්‍රතයය වනවා කියා බාහිර ප්‍රත්‍ය පමණකින් හීන ප්‍රණීතාදී විශේෂ දැකීමකින් ද දැනගත හැකි වේ. බාහිරයෙහි පියා මව ශුක්‍ර ශ්‍රෝණිත ආකාරාදියෙන් සමාන වූ සත්වයන් දෙදෙනෙකු අතර ද සිය

ගණන් හීන ප්‍රණීත විශේෂයෙන් දක්නා ලැබේ. එය අහේතුකව නොවේ. හැමදාම හැමදෙනාටම නොවේ. කම්ම භවයෙන් අන් හේතුවකින් නොවේ. එයින් උපදවන සත්වයන්ගේ අජ්ඣත්ත සන්තානයෙහි අතිත් කරුණක් නොමැතිවීමද කම්මභව හේතුවෙන්මය. සත්වයන්ගේ හීන ප්‍රණීතාදි විශේෂ හේතු කර්මයයි. එයින් කීහ. සත්වයා හීන ප්‍රණීත වශයෙන් දෙන්නේ කර්මයයි. එනිසා භවය ජාතියට ප්‍රත්‍යය වේයයි දතයුතුය. යම්කිසි විදියකින් ජාතිය නොමැති නම් ජරා මරණ නොවේ. සෝකාදි ධර්මයෝද නොවෙති. ජාතිය පවතිනවිට ජරා මරණද ජරාමරණ සංඛ්‍යාත දුක්ඛ ධර්මයන්ගෙන් පෙළෙන මෝඩයන්ගේ ජරාමරණ සම්බන්ධව හෝ එයින් ඒ ඒ දුක් ධර්මයන්ගෙන් පෙළන සම්බන්ධයක් නැතිව හෝ සෝකාදි ධර්ම වේ. ඒ නිසා මෙය ජාති ජරා මරණාදියට මෙන්ම සෝකාදියටද ප්‍රත්‍ය වේයයි දතයුතුය. එය වනාහි උපනිස්සය කෙළවරින් එක් අයුරකින්ම ප්‍රත්‍ය වේ.

### භව පච්චයා ජාති ආදි නිර්දේශයයි.

**එවමෙතස්සාති** ආදියේ අර්ථය උද්දේස වාරයෙහි කියූ නයින් දැනගත යුතුය. **සංගති** ආදිය සමුදයෙහි සමාන වචන වේ. මෙහි සෝකාදිය අවසානයෙහි කියන ලදී. එහෙයින් යම් අවිද්‍යාවෙක් අවිජ්ජා පච්චයා සංඛාරා යන මෙසේ භව චක්‍රයේ මුලින්ම කියන ලදී. එය සෝකාදියෙන් අවිද්‍යාව සිද්ධය. නොදන්නා ලද මෙම භව චක්‍රය කාරකයක කරන්නකු වේදකයකු විඳින්නකු රහිතව දොළොස් ආකාර වූ සුඤ්ඤත වූද අසුඤ්ඤ වූද නිතර සංසිඳවමින් හෝ පවතී යයි දතයුතුය. සෝකාදියෙන් අවිජ්ජා සිදුවූයේ කෙසේද? මේ භව චක්‍රය කෙසේ නම් අවිදිතද? නොදතහැකිද? කාරක වේදක රහිත වන්නේ කෙසේද? ද්වාදසවිධ සුඤ්ඤතාසුඤ්ඤ වන්නේ කෙසේද?

මෙහි සෝක දුක්ඛ දෝමනස්ස උපායාස අවිජ්ජාවෙන් වෙන් නොවී ඇත. පරිදේවය ඒවා අතරින් මුළාවක් වන්නේ යයි සිද්ධ වූ පසු ඒවාද අවිජ්ජාවෙන් සිද්ධය, තවද ආසව සමුදයා ආසව සමුදයෙන් අවිජ්ජාව ඇතිවේ. අවිජ්ජා සමුදයො යයි කියන ලදී. ආසව සමුදයෙන් මේ සෝකාදිය සිදුවේ. කෙසේද? වස්තුකාම වෙන්වීමෙහි සෝකය ඇතිවේ. එසේම කාමාසව හටගැනීම ඇතිවේ. කීහ.

කම් යාගෙහි කැමති - පුගුලා එම කාමයන්
පිරිහෙන විට කිපේ - සර පහර ලදුවකු මෙන්

යම්සේ කීහ. "කාමතො ජායතී සොකො" යන මේ සියල්ල දිට්ඨාශව සමුදය වේ. කීහ. ඒ මම මගේ රූපය යයි නැගිටීමෙන් රූප විපරිණාමයේ අන්‍යථා භවයට පැමිණ සෝක පරිදේව දුක්ඛ දෝමනස්ස උපදී. දිට්ඨාශව සමුදය මෙන් භවාශව සමුදයද වේ. කීහ:- යම් ඒ දේවතාවෝ දීර්ඝායුෂව වර්ණ වන්නට සැප බහුලව උසස් විමානවල බොහෝ කලක් සිටිති. ඔව්හුද තථාගත ධර්ම දේශනා අසා භය වී සන්ත්‍රාසයට සංවේගයට පැමිණෙති. පස් පෙරනිමිති දැක මරබියෙන් සන්තාපයට පත් දෙවියන් මෙන් යම් භවාශව සමුදයෙන් මෙසේ අවිජ්ජා සමුදය වේ. කීහ:- මහණෙනි, ඒ මෝඩයා මෙම ජීවිතයේම ත්‍රිවිධ වූ දුක් දොම්නස් විඳී. යන මෙහි ආසව සමුදයෝ මේවා වෙති. එහෙයින් අවිජ්ජාව හේතුවීමෙන් ආශව ඇතිවේ. ආසව ඇතිවූ විට අවිජ්ජාවද සිද්ධ වේ යයි දතයුතුය.

යම්හෙයකින් මෙසේ ප්‍රත්‍යභාවය ලබමින් අවිජ්ජාවෙන් සිදුවී නැවත අවිජ්ජා පච්චයා සංඛාරා සංඛාර පච්චයා විඤ්ඤාණං යයි මෙසේ හේතුඵල පරම්පරාවේ අවසානයක් නැත. කුමක් හෙයින්ද? හේතුඵල සම්බන්ධ වශයෙන් පවතින ද්වාදසාංග භවචක්‍රය අවබෝධ නොකළ හෙයින් සිදු වේ. මෙසේ ඇතිකල්හි අවිජ්ජා පච්චයා සංඛාරා යයි මෙය ආදි අර්ථ කථනය විරුද්ධ වන්නේද? ආදි අර්ථකථනය නොවේ. මෙහි ප්‍රධාන ධර්ම කථනය වනාහි තුන් වෘත්තයන්ගේ අවිජ්ජාව ප්‍රධානය. අවිජ්ජා ග්‍රහණයෙන් අවශේෂ කෙලෙස් වෘත්තද කර්මාදියද බාලයන් වෙලයි. සර්පයාගේ හිස අල්ලා ගැනීමෙන් සෙසු ශරීරයද අල්ලාගත්තා මෙනි. අවිජ්ජාව සමුච්ඡේද කළ කල්හි ඒවායින් විමෝක්ෂය වේ. සර්ප හිස කැපූ විට වෙළාගත් බාහුවෙන් මිදෙනවා මෙනි. කීහ:- අවිජ්ජාවේම සියළු වෙන්වීමේ නිරෝධය සංඛාර නිරෝධය වේ ආදි වශයෙනි. මෙසේ යමක් ගැනීමෙන් බැඳීමෙන් මිදීමක් මෝක්ෂය වේ. ඒ ප්‍රධාන ධර්ම මේ අර්ථකථනයයි. ආදිමාත්‍ර කථනයක් නොවේ. මෙසේ මේ භවචක්‍රය අවිදිතදියයි දතයුතුය. අවිජ්ජාදි හේතු නිසා සංඛාරාදිය පවතී. එහෙයින් එයින් අනිකකු විසින් බ්‍රහ්මනම් මහාබ්‍රහ්ම සෙට්ඨො සජ්ජිතා යයි මෙසේ කල්පනා කරන බ්‍රහ්මාදීන් හෝ සසර කරන්නා විසින් ඒ මගේ ආත්මය කියන්නාය.. විඳින්නා යයි මෙසේ පරිකල්පනය කරන තමා විසින් හෝ සැපදුක් විඳින්නෙක් නොවේ. මෙසේ කාරක වේදක රහිත යයි දතයුතුය.

මෙහි අවිද්‍යාව ස්ථිර භවයක් නැති උදයව්‍ය ධර්ම ස්වභාවයෙන් යුක්තය. සුභ භවයක් නැති කිලිටි හා කෙලෙස්වලින් යුක්තය. සුවබවක් නැති උදයව්‍යය වශයෙන් පෙළෙන ස්වභාවයෙන් යුක්තය. ප්‍රත්‍යයට අයත් පැවතුම් ඇති බැවින් තමාගේ වසඟයට පත්නොවන නිසාද ආත්ම භාවයෙන් ද ශූන්‍ය වේ. සංඛාරාදි සෙසු අංගයෝද මෙසේම වන්නාහ. අවිජ්ජාව ආත්මය නොවේ. තමා නොවේ. තමා කෙරෙහි නොවේ. අත්තවතී ද නොවේ. සංඛාරාදියද එසේය. ඒ නිසා ද්වාදසවිධ වූ මේ භවචක්‍රය ශූන්‍යයන් අතුරෙන් ද ශූන්‍ය වේ යයි දතයුතුය. මෙසේ දැන නැවත

ඒ අවිදු තණ මුල-තීත ඈ තුන් කල් වේ
දෙක අට දෙකම එහි - අඟ වේ දනු සරූපෙන්

ඒ බව සකේ අවිජ්ජා තණ්හා යයි ධර්ම දෙක මූලයයි දතයුතුය. එය එහි මුල අග දැක්වීමෙන් අවිජ්ජාව මුලයි. වේදනාව අවසානයයි. අපරාන්ත පරපුරින් තණ්හාව මුලයි. ජරාමරණ අවසානයයි ද්විධ වේ. එහි මුල් කොටස දෘෂ්ටි චරිත වශයෙන් කියන ලදී. අග කොටස තෘෂ්ණා චරිත වශයෙන් කියන ලදී. දෘෂ්ටි චරිතයන්ගේ අවිජ්ජාවද තෘෂ්ණා චරිතයන්ගේ තණ්හාවද සංසාරයේ නායිකාවෝය. උච්ඡේද දෘෂ්ටිය නැසීම සඳහා හෝ ප්‍රථම ඵලයේ හේතු සිඳදැමීම ප්‍රකාශයේ ශාස්වත දෘෂ්ටිය නැසීම් සඳහා දෙවන. උපන් ජරාමරණ ප්‍රකාශ කිරීමෙන් ගබ්භසෙය්‍යක වශයෙන් හෝ පෙර ප්‍රකාශ කිරීමෙන් ඕපපාතික වශයෙන් පැසුළු සහ උපත දැක්වීමෙන් අතීත වර්තමාන අනාගත තුන් කාලය පෙලෙහි ආ ස්වරූපයෙන් අවිජ්ජා සංඛාර අංග දෙක අතීත කාලයයි. විඤ්ඤාණය ආදිකොට භවය අවසන් කොට ඇති අට වර්තමානයයි. ජාති ජරාමරණ දෙක අනාගතයයි දතයුතුය.

හේ පල හේ පෙරටු - තෙ සඳ සිව් වේ සඟරා
විසි අයුරු තෙවටින් - (නිතර) කැරකේ නොසිටා

මෙසේද දතයුතුය. එහි සංඛාර පටිසන්ධි විඤ්ඤාණ අතර එක් හේතුඵල සන්ධියකි. වේදනා තණ්හා අතර එක් හේතුඵල සන්ධියකි. භව ජාති අතර එක් හේතුඵල සන්ධියකි. මෙසේ මෙය හේතුඵල හේතුපූර්වක තුන් සන්ධියයි දතයුතුය. සන්ධිවල ආදි අවසාන නියමයන් සතරකට සංග්‍රහ

වේ. කෙසේද? අවිජ්ජා සංඛාර මුල එකකි. විඤ්ඤාණ නාමරූප සළායතන ඵස්ස වේදනා දෙවැන්නය. තණ්හා උපාදාන භව තෙවැන්නය. ජාති ජරා මරණ සිව්වැන්නය. මෙසේ මෙය සිව්ඛේද ඇතැයි දතයුතුය.

අයූහි හේ පසින් - දැන් පල පහ වන්නේ
දැන් හේ පහෙන් මතු - පල පහක් වනු දන්නේ

මේ විසිආකාර අරවලින් ගරාදි විසි ආකාරයයි කියා දතයුතුය. එහි අතීත හේතු පස සහ අවිජ්ජා සංඛාර යන දෙක කියන ලද දේමය. නොදැන බිය වේ. බිය වන්නා අල්ලා ගනී. ඒ උපාදාන ප්‍රත්‍යයේ භාවය වේ. එයින් කීහ. පෙර කර්ම භවයෙහි මෝහය අවිජ්ජා ආයූහන සංඛාරය. නිකන්තනය කරන තණ්හාව උපගමන වූ උපාදානය, චේතනා කම්මභව වන මේ පංච ධර්ම මෙහි ප්‍රතිසන්ධිය දීමට පෙර භවයෙහි හේතු වේ. එහි පෙර භවය යනු පෙර කර්ම භවයෙහි. අතීත ජාති කර්ම භවයෙහි කරන ලදැයි යන අර්ථයය. මුළාව අවිජ්ජාවය. යමෙක් දුක්ඛාදියෙහි මුලාවෙන් යම්කිසි මුළා වී කර්මයක් කරයි. ඒ අවිජ්ජාවය. රැස්කිරීම සංඛාරයයි. ඒ කර්මය කරන්නාගේ පෙර චේතනාවයි. දානයක් දෙමියි සිත උපදවා මාසයක්ද වසරක්ද දාන උපකරණ සපයා ගන්නා විට උපදින චේතනා පුරිම චේතනා වේ. ප්‍රතිග්‍රාහකයන් ගේ අතේ දාන වස්තුව තබනවිට පහළවන චේතනා භවයයි කියනු ලැබේ. එක ජවනයක හෝ ජවන හයක චේතනා සංඛාර නම් වේ. සත්වන ජවනය චේතනා භව යයි. යම් චේතනා භවයක් වේ නම් ඒ හා සම්ප්‍රයුක්ත වූ රැස්කිරීම සංඛාර නම් වේ. බලවත් ආශාව තෘෂ්ණාවයි. ක්‍රියාවක් කරන්නා එහි ඵලය ගැන ඇතිවන බලවත් ආශාව ප්‍රාර්ථනා එය තණ්හා නම් වේ. එළඹීම උපාදානය භවයට හේතුව යම් කර්මයක් කොට අසවල් ස්ථානයෙහි කාමයන් සේවනය කරමියි උච්ඡිජ්ජිස්සාමි ආදි නයින් පවතින උපගමනය උපාදානයයි. චේතනා භවනම් ආයූහනාවසානයේ කියන ලද චේතනා භවයයි මෙසේ අර්ථය දතයුතුය. දැන් පල පස යයි විඤ්ඤාණාදිය වේදනා අවසන්කොට අති පෙලෙහි ආවේය යථාහ:- මෙහි ප්‍රතිසන්ධි විඤ්ඤාණ වේ. පිහිටීම නාමරූපයයි. ප්‍රසාදය ආයතනයි. පහස ස්පර්ශයයි. විඳින දෙය වේදනාවය. මේ පස්දහම් මෙම උප්පත්ති භවයෙහි පෙර කරන ලද කර්මයේ හේතුවෙන් එහි ප්‍රතිසන්ධි විඤ්ඤාණය භව අතර ගැලපීම වශයෙන් උපන් බැවින් පටිසන්ධි යයි කියනු ලැබේ. ඒ විඤ්ඤාණය පටිසන්ධි විඤ්ඤාණයයි. ඔක්කන්ති නාමරූපයයි යම්

තැනෙක රූපාරූප ධර්ම (බැසගනියි) පිහිටයි. පැමිණ පිවිසීමක් මෙන්ය. මේ නාමරූප ආයතන ප්‍රසාදයන් චක්ඛු ආදි ආයතන පහ වශයෙන් කියන ලදී.

පහස ස්පර්ශයයි. යමක් අරමුණ ස්පර්ශ කරන ලද්දේ ස්පර්ශ උපන්නේ මේ ස්පර්ශයෙනි. විඳීම වේදනා යයි. ප්‍රතිසන්ධි විඥ්ඤාණය සමග හෝ සළායතන සමග හෝ ස්පර්ශය සමග උපන් යම් විපාක විඳීමක් වේද එය වේදනාව යයි අර්ථ දතයුතුය. ඉදානි හේතුවො පංච යයි පෙලෙහි ආ තණ්හා උපාදාන භව. භව ගැනීමෙන් එහි පෙර භාගය වූ එය සමග වූ හෝ සංඛාරද ගත්තා වේ. තණ්හූපාදාන ගැනීමෙන් එය සමග වූ හෝ යමකින් මුළාවී කර්ම කරයිද ඒ අවිජ්ජාව සමග වේ. මෙසේ පහකි. එනම් තණ්හා උපාදාන භව සංඛාර අවිජ්ජා යනුයි එයින් කීහ. මෙහි පරිපාකයට ගිය බැවින් ආයතන යයි. පරිපාක ආයතනයෙහි කර්ම කරන ලෙස මුළාව දක්වන ලදී. සෙස්ස කියන ලදී. ආයතිං ඵලං පංචකං යනු විඥ්ඤාණාදි පසය. ඒවා ජාති ගැනීමෙන් කියන ලදී. ජරාමරණ ඒවායේම ජරාමරණ වේ. එයින් කීහ. ආයතිං පටිසන්ධි විඥ්ඤාණං, ඔක්කන්ති නාමරූපං, පසාදො ආයතනං, ඵුට්ඨො ඵස්සො, වෙදයිතං වේදනා. මෙසේ මේ පස් ධර්ම අනාගත උප්පත්ති භවයෙහි මෙහි කරන ලද කර්මයේ හේතුවයි. මෙසේ මෙය විසිආකාර වේ. එහි පෙර භවයෙහි පහ කම්ම සම්භාරයෙන් දැන් විපාක පහකි. දැන් කම්ම සම්භාරයෙන් අනාගතයෙහි විපාක ධර්ම පහයයි දසධර්ම කර්ම වේ. දස විපාකය ස්ථාන දෙකක කම්මං කම්මං නාම වේ. ස්ථාන දෙකක විපාකො විපාකො නාම වේ. සියල්ල භව වෘත්තය.. ප්‍රත්‍යයාකාර වෘත්තය. කර්මයද කර්ම විපාකයද වේ. එසේම දෙපලක කර්මය කර්ම සංක්ෂේපයකි. දෙපලක විපාකය විපාක සංක්ෂේපයයි. මේ සියල්ල කම්ම සංඛෙප හා විපාක සංඛෙප වේ. දෙපලක කර්මය කම්ම වට්ටය. දෙපලක විපාකය විපාක වට්ටය. මේ සියල්ල කම්ම වට්ටද විපාක වට්ටද වේ. එසේම දෙපලක කර්මය කර්ම භවයද දෙපලක විපාකය විපාක භවයද මේ සියල්ල කම්ම භව හා විපාක භව වේ. දෙපලක කර්මයද කර්ම පවත්තනයද දෙපලක විපාකයද විපාක පවත්තනයද මේ සියල්ල කම්ම පවත්තන විපාක පවත්තනද වේ. එසේම දෙපලක කම්ම කම්ම සන්තති දෙපලක විපාක විපාක සන්තති වේ. සියල්ල කම්ම සන්තති ද විපාක සන්තති ද වේ. දෙපලක කම්ම කිරියා නම්. දෙපලක විපාකය කිරියා පල නමැයි මේ සියල්ල කිරියාවද පලයද වේ.

මේවා උපන්නේ ද සහේතුවෙන්ම වේ
දුක්ඛා අනිත්මය් නැත නිත් බවක් ද යම්
හේතු නියාමය් මෙ දහම් ද වන්නෙ නම්
නැත්තේ තමාවත් වෙන යම් අයෙක් ද හෝ

හේතු රස පස වී - දහමින් දහම් උපදී
නැවතුම පිණිස හේ - දෙසිණි දහම් බුදුරදුන්
හේතු නැවතුණු පසු - බිඳි සසර යළි නොවැටේ
බඹසර ඇත මෙහී - දුක් කෙළවර කිරීමට
සතුන් නොලැබේ උස් - සෙද සස්සත ද නැත එහි

ත්‍රිවෘත්තය නොනැවතී කැරකේය යන මෙහි සංඛාර භවය කර්ම වෘත්තත වේ. අවිජ්ජා තණ්හා උපාදාන ක්ලේශ වෘත්ත වේ. විඤ්ඤාණ නාමරූප සළායතන ඵස්ස වේදනා විපාක වෘත්ත වේ. මේ වෘත්ත තුනෙන් මේ භව චක්‍රය තිපරිවෘත්ත වේ. ක්ලේශ වෘත්තය නිවෙනතුරු නොසිඳේ. හේතු තිබෙන තාක් නොසිඳී නොනැවතී භ්‍රමණය වේයයි දතයුතුය.

එය මෙසේ භ්‍රමණය වෙමින් :-

කිස සස්වලින් එයි - වරණ උවමින් ගැඹරින්
නය බෙදුම් මෙහි එන - සුදුසු ලෙස දැනගන්නේ

එහි කුසලාකුසල කර්ම අවිශේෂයෙන් සමුදය සත්‍ය යයි සච්ච විභංගයෙහි කියන ලදී. එහෙයින් අවිජ්ජා පච්චයා සංඛාරා යන අවිද්‍යාවෙන් සංඛාරයේ දෙවන සත්‍යය ප්‍රභව කොට ඇති දෙවන සත්‍යයයි. සංඛාරයන්ගෙන් විඤ්ඤාණය දෙවන සත්‍යය ප්‍රභව කොට ඇති පළමුවන සත්‍යයයි. විඤ්ඤාණාදියෙන් නාමරූපාදිය විපාක වේදනා අවසන්කොට ඇති ප්‍රථම සත්‍යය ප්‍රභව කොට ඇති ප්‍රථම සත්‍යයයි. වේදනාවෙන් තණ්හාව ප්‍රථම සත්‍යය ප්‍රභව කොට ඇති දෙවන සත්‍යයයි. තණ්හාවෙන් උපාදාන දෙවන සත්‍යය ප්‍රභවකොට ඇති දෙවන සත්‍යයයි. උපාදානයෙන් භවය දෙවන සත්‍යය ප්‍රභවකොට ඇති පළමුවන දෙවන සත්‍ය දෙකයි. භවයෙන් ජාති දෙවන සත්‍යය ප්‍රභවකොට ඇති පළමුවන සත්‍යයයි. ජාතියෙන් ජරාමරණ ප්‍රථම සත්‍යය ප්‍රභවකොට ඇති ප්‍රථම සත්‍යයයි. මෙසේ සත්‍ය ප්‍රභවයන් සුදුසු පරිදි දතයුතුය. මෙහි අවිජ්ජා වස්තු පවතින

විට මුළාවෙයි. සංඛාරයන්ගේ පහළවීමට ප්‍රත්‍ය ද වේ. එසේම සංඛාර සංඛත ධර්ම අභිසංස්කරණය කරයි. විඤ්ඤාණයට ප්‍රත්‍යද වේ. විඤ්ඤාණයද වස්තු දැන ගනී. නාමරූපයට ප්‍රත්‍යය ද වේ. නාමරූප ඔවුනොවුන්ට උපස්ථම්භ වේ. සළායතනයට ප්‍රත්‍ය ද වේ. සළායතන සව විෂයෙහි පවතී. ස්පර්ශයට ප්‍රත්‍ය ද වේ. ඵස්ස අරමුණු ස්පර්ශ කරයි. වේදනාවට ප්‍රත්‍යය ද වේ. වේදනාව අරමුණු රසය අනුභව කරයි. තණ්හාවට ප්‍රත්‍ය ද වේ. තණ්හාව ද ඇලිය යුතු දහමෙහි ඇලේ. උපාදානයට ප්‍රත්‍ය ද වේ. උපාදානය ද අල්වාගත යුතු ධර්ම අල්ලා ගනී. භවයට ප්‍රත්‍ය ද වේ. භවයද නානා ගති විසුරුවයි. ජාතියට ප්‍රත්‍ය ද වේ. ජාතිය ද ස්කන්ධයන් උපදවයි. ඔවුන්ගේ ඉපදීම් භවයෙන් පවතින ප්‍රත්‍ය ද ජරාමරණවලට වේ. ජරාමරණද ස්කන්ධවල විපාක භේද භවය ද පිහිටුවයි. භවාන්තර සෝකාදිය පහළවීමට ප්‍රත්‍ය ද වේ. එහෙයින් නාම පදයකම දෙවිධියකින් පවතින කෘත්‍යයන්ද සුදුසු පරිදි දතයුතුය.

මෙහි "අවිජ්ජා පච්චයා සංඛාරා" යන මෙය කාරකයකු දැක්වීම වැළැක්විය. විඤ්ඤාණය යනු ආත්ම සංක්‍රමණ දැකීම වැළැක්වීම සඳහාය. විඤ්ඤාණ පච්චයා නාමරූපං යනු ආත්මය යයි පරිකල්පනය කරන වස්තුවල බිඳීම දැක්වීම් වශයෙනි. නාමරූප පච්චයා සළායතනං ආදියෙහි ආත්මය දකී. දැනගනියි. ස්පර්ශ කරයි. විඳියි. ආශා කරයි. දැඩිසේ ගනියි. වෙයි. උපදියි. දිරයි. මැරෙයි යන මේ ආදි දැකීම නීවරණයටයි. එනිසා මිථ්‍යා දැකීම් වැලකීමෙන් ද මේ භවචක්‍රය සුදුසු ලෙස දැනගත යුතුය.

යම් හෙයකින් මෙහි ස්වලක්ෂණ (බාහිර) සාමඤ්ඤ ලක්ෂණ (අනාගාමී) වශයෙන් ධර්මයන් (ස්වභාවය) නොදැකීමෙන් අවිජ්ජාව අන්ධයකු මෙනි. අන්ධයාගේ බාහිර ලක්ෂණ මෙනි. අවිජ්ජා පච්චයා සංඛාරා. හැපී වැටීමක් මෙහි සංඛාර පච්චයා විඤ්ඤාණං. විඤ්ඤාණ පච්චයා නාමරූපං යනු වැටී පොලක් (ගඩුවක්) පහළවූවා මෙනි. නාමරූපං පච්චයා සළායතනං යනු ගඩුව බිඳී පිළාවන් (බිබිලි) මෙනි. සළායතන පච්චයා ඵස්ස බිබිලි ගැටීමක් මෙනි. ඵස්ස පච්චයා වේදනාව ගැටීම් දුකක් මෙනි. වේදනා පච්චයා තණ්හා දුකට ප්‍රතිකාරයක් මෙනි. තණ්හා පච්චයා උපාදානං ප්‍රතිකාරය සඳහා අපත්‍ය ආලේපනයක් මෙනි. උපාදාන පච්චයා භව අපත්‍ය ලේපනයෙන් ගඩුවේ විකාර මතුවූවා මෙනි. භව පච්චයා ජාති ගඩුව බිඳීමක් මෙනි. ජාති පච්චයා ජරාමරණං.

අවිජ්ජාව අප්‍රතිපත්ති මිථ්‍යා ප්‍රතිපත්ති සත්වයන් අභිභවනය කරයි. ඇසෙහි පටලයක් මෙනි. එයින් යුතුව මෝඩයින් පුනර්භව සංඛාරවලින් ආත්මය වෙළයි. කෝෂාකාර පණුවකු මෙනි. සංඛාරයෙන් යුක්ත විඥ්ඥාණය ගතිවල ප්‍රතිෂ්ඨාව ලබයි. රජ කුමරෙක් රාජ්‍යයෙහි පරිනායක රත්නයෙන් යුක්ත වූවා මෙනි. උත්පත්ති නිමිත්ත පරිකල්පනය කරන විඥ්ඥාණය ප්‍රතිසන්ධියෙහි අනෙකප්‍රකාර නාමරූප නිපදවන්නේ විජ්ජාකාරයෙකු කරන මායාව මෙනි. නාමරූපයෙහි පිහිටි සළායතන වෘද්ධිය විසාල බවට විපුල බවට පැමිණේ. සශ්‍රීක බිමක පිහිටි වන ගොමුවක් මෙනි. ආයතන ගැටුමෙන් ස්පර්ශයට ඇතිවන්නේ අරණී (ගිහිගානා දඬු) වලින් ගින්න මෙනි. ස්පර්ශයෙන් ස්පර්ශ වූවහුට වේදනාව ඇති වීමෙන් ගින්නෙන් ඇතිවන දැවිල්ල මෙනි. විඳින්නාට තෘෂ්ණාව ඇතිවන්නේ ලුණුවතුර බොන්නාට පිපාසය ඇතිවන්නා සේය. තැවෙන්නාහු භවයෙහි අභිලාශා ඇති කරවමින් ජලයෙහි පිපාස වූවන් මෙනි. උපාදානයෙන් භවය ඇතිවන්නේ ආමිස ලෝභයෙන් මසකු බිලියෙහි මෙනි. භවය ඇතිවිට ජාතිය වේ. බීජය ඇතිවිට අංකුරය මෙනි. උපන්නාහුට මරණය හටගත් ගසක් වැටෙන්නා සේය. එහෙයින් උපමාවලින් සුදුසු ලෙස භවචක්‍රය දැනගත යුතුය.

භාග්‍යවතුන් වහන්සේ අර්ථ ධර්ම දේශනා ප්‍රතිවේද වශයෙන් ගැඹුරු බව උදෙසා "ආනන්දය, මේ පටිච්ච සමුප්පාදය ගැඹුරුය. ගැඹුරු බවින් අවභාසය" (බබළයි) කීහ. එහෙයින් ගැඹුරු බවින් ද මේ භව චක්‍රය දැනගත යුතුය. එහි ජාති නොමැති නම් ජරාමරණ නැත. ජාතිය හැර අනිකක් නොවේ. මෙසේද ජාතියෙන් හටගනී යයි යන ජාති ප්‍රත්‍යයෙන් හටගත්තහුට දුරවබෝධනීය බැවින් ජරාමරණයේ ජාති ප්‍රත්‍යයෙන් හටගත්තේ ගැඹුරුය. එසේම ජාතියෙන් භව ප්‍රත්‍යයෙන් සංඛාරයන්ගේ අවිජ්ජා ප්‍රත්‍ය හෝ හටගත්තේ ගැඹුරුය. එනිසා මේ භව චක්‍රය අර්ථ ගම්භීරය.

මේ එහි අර්ථ ගම්භීරතාව හේතුඵලයෙහි අර්ථයයි කියනු ලැබේ. යථාහ:- "හේතුඵලෙ ඤාණං අත්‍ථපටිසම්භිදා" හේතුඵලයෙහි ඤාණය අර්ථ ප්‍රතිසම්භිදාවය යම් හෙයකින් යම් ආකාරයකින් යාවත් වූ අවිජ්ජාව ඒ ඒ සංඛාරයන්ට ප්‍රත්‍ය වේද? එහි දුරවබෝධ හෙයින් අවිජ්ජාවෙන් සංඛාරවලට ප්‍රත්‍යවීම ගැඹුරුය. එසේම සංඛාරවලට........ ජාතියෙන් ජරාමරණවලට ප්‍රත්‍යවීම ගැඹුරුය. එනිසා මේ භවචක්‍රය ගැඹුරුය. මෙය මෙහි ධර්ම ගම්භීරතාවය. හේතු ධර්මයේ නමකි. කීහ. "හේතුම්හි ඤාණං

ධම්මපටිසම්භිදා" යන හේතුවෙහි ඤාණය ධර්ම පටිසම්භිදාවය. ඒ ඒ හේතුවෙන් ඒ ඒ පැවතිය යුතු නිසා දේශනාවද ගැඹුරුය. එහි සර්වඥ ඤාණය හැර වෙන ඤාණයක් ප්‍රතිෂ්ඨාව නොලබයි. එසේම කිසියම් සූත්‍රයක අනුලෝම වශයෙනි. කිසියම් සූත්‍රයක ප්‍රතිලෝම වශයෙනි. කිසිවක අනුලෝම පටිලෝම වශයෙනි. කිසිවක මැද සිට අනුලෝම වශයෙන් හෝ පටිලෝම වශයෙනි. කිසිවක ත්‍රිසන්ධිය සතර සංක්ෂේපය. කිසිවක ත්‍රිසන්ධි ත්‍රිසංඛෙපය. කිසිවක ඒකසන්ධි ද්විසංඛෙපය. ඒ නිසා මේ භව චක්‍රය දේශනා ගම්භීරය. මෙය දේශනා ගම්භීරතාවයි.

අවිජ්ජාදීන්ගේ ස්වභාවය යමකින් අවබෝධ කළේ නම් අවිජ්ජාදී ධර්ම ස්වලක්ෂණ වශයෙන් අවබෝධ කළා වේ. එය අවබෝධ කිරීමට දුෂ්කර හෙයින් ගැඹුරුය. එනිසා මෙය භවචක්‍රයේ ප්‍රතිවේධ ගැඹුරයි. එසේම අවිජ්ජාවේ අඤ්ඤාණයට නොපෙනෙන සත්‍ය අවබෝධ නොවන අර්ථයෙන් ගැඹුරුය. සංඛාරයන්ගේ අභිසංඛරනය ආයුහනය සරාග විරාගාර්ථයෙන් ගැඹුරුය. විඤ්ඤාණයේ ශුන්‍යභාවය අව්‍යාපාර අසංඛන්ති ප්‍රතිසන්ධිය පහළවීම් අර්ථයෙන් ගැඹුරුය. නාමරූපවල එකට ඉපදීම වෙන්වීම එකතුවීම නැමෙන වෙනස්වන අර්ථයෙන් ගැඹුරුය. සළායතනයේ අධිපති ලෝක ද්වාර ඛෙත්ත විෂය විෂයීභාව අර්ථයෙන් ගැඹුරුය. ස්පර්ශයේ ඵුසන සංඝට්ටන සංඝති සන්නිපාත අර්ථයෙන් ගැඹුරුය. වේදනාවෝ රස අනුභවන සුඛ දුක්ඛ මජ්ඣත්තභාව නිජ්ජීව විඳීම් අර්ථයෙන් ගැඹුරුය. තණ්හාවේ අභිනන්දිත අජ්ඣෝසාන, සරිතලතා නදී තණ්හා සමුද්ද පිරවීමට දුෂ්කරය යන අර්ථයෙන් ගැඹුරුය. උපාදානයේ ගැනීම, ග්‍රහණය අභිනිවෙසය, පරාමර්ෂණය, අතික්‍රමණයව දුෂ්කර යන අර්ථයෙන් ගැඹුරුය. භවයේ ආයුහන අභිසංඛරණ යෝනි ගති ඨිති නිවාස බිජන අර්ථයෙන්ද ජාතින් (ඉපදීමේ) සංජාති ඔක්කන්ති නිබ්බත්ති පහළවීම් අර්ථයේද ජරාමරණයේ ඛය වය භෙද විපරිණාම නාම අර්ථයෙන්ද ගැඹුරුය. මෙය මෙහි ප්‍රතිවේධ ගැඹුරුය. ඒකාන්ත නය නානත්ත නය අබ්‍යාපාර නය මෙසේ ධම්ම නය යයි අර්ථ නය සතරක් වේ. එනිසා නය භේද වශයෙන් මේ භවචක්‍රය සුදුසු පරිදි විනිස දතයුතුය.

එහි අවිජ්ජා පච්චයා සංඛාරා, සංඛාර පච්චයා විඤ්ඤාණං යන මෙසේ බීජයේ අංකුරාදි භාවයෙන් ගස බවට පැමිණීම මෙන් සන්තානය (පරපුර) නොසිඳීම ඒකත්ත නය වේ. යමක් මනාව දකින්නේ හේතුඵල ස්කන්ධයෙන් පවතින සන්තානයේ නොකැඩුණු බව අවබෝධයන් උච්ඡේද

දෘෂ්ටිය දුරුවෙයි. වැරදි දකින හේතුඵල සම්බන්ධයෙන් පවතිනා සන්තානයේ කැඩීම ඒකත්ත වශයෙන් ගැනීමෙන් සාස්වත දෘෂ්ටිය ගනියි. අවිජ්ජාදියෙහි සියළු ස්වභාව ලක්‍ෂණ නියමය නානත්ත නය නම් වේ. යමක් මනාව දකින්නේ අළුත් ඉපදීම් දැකීමෙන් සාස්වත දෘෂ්ටිය දුරුකරයි. වැරදියට දකින්නේ එක් සන්තානයක් වැටුණු පසු බිඳුණු සන්තානයේම නානත්ත නය ගැනීමෙන් උච්ඡේද දෘෂ්ටිය අල්ලා ගනියි. අවිද්‍යාවෙන් සංඛාර මා විසින් ඉපිදවිය යුතුය. අප විසින් සංඛාර හෝ විඤ්ඤාණ ඉපිදවිය යුතුය යන ව්‍යවහාර බවෙන් අබ්‍යාපාර නය නම් වේ. යමක් මනාව දකින්නේ කාරකයකුගේ අභාවය අවබෝධයෙන් ආත්ම දෘෂ්ටිය දුරුකරයි. වැරදියට දකින්නේ යමෙක් නැති ව්‍යාපාරයෙහි අවිජ්ජාදියේ ස්වභාව නියම සිද්ධිය හේතු අභාවයන් වේ. එය නොගැනීමෙන් අකිරිය දෘෂ්ටිය ගනු ලැබේ. අවිජ්ජාදි හේතුවෙන් සංඛාරාදිය ඇතිවේ. කිරි ආදියෙන් දධි මෙනි. වෙනත් අයුරකින් නොවේ. මෙය මෙසේ ධර්මායතන නම් වේ. යමක් මනාව දකින්නේ ප්‍රත්‍ය අනුරූපයේ ඵල අවබෝධයෙන් අහේතුක දෘෂ්ටියද අකිරිය දෘෂ්ටියද අත්හරියි. වැරදියට දකින්නේ පච්චයානුරූපය පල පවතින අයුරු නොගෙන කොහෙන් හෝ සම්භවය නොගැනීමෙන් අහේතුක දෘෂ්ටියද නියතවාදයද ගනු ලැබේ. මෙබඳු භව චක්‍රය

**කිස සස්වලින් එය - වරණ උවමින් ගැඹරින්**
**නය බෙදුම් මෙහි එන - සුදුසු සේ දැන ගන්නේ**

මෙහි ගැඹුරු නිසා අගාධය. නා නා නය ගහණ බැවින් දුෂ්කර අභියානයකි. නුවණ අභිමතෙන් සමාධි නමැති උතුම් ගලෙහි පණපොවා බවසක බිඳ අසනියෙන් වෙන්කළ සක මෙන් නිතර කළඹන සසරබිය ඉක්මවූ කිසිවෙක් සිහිනවලද නැත. භගවත්හු මෙසේ කීහ. "ආනන්දය, පටිච්ච සමුප්පාදය ගැඹුරුය. ගැඹුරු අවභාෂයද ලබා ඇත." ආනන්ද, මේ ධර්මයේ නොදැනුම අනවබෝධය අවබෝධ නොකිරීම මෙසේය. මෙය ප්‍රජාවගේ තනතා කුලක ජාතා ගුණා ගුණාධික ජාතා මුඤ්ජ බබ්බජ භූතා අපායං දුග්ගතිං විනිපාතං සංසාරං නාතිවත්තති. එහෙයින් තමාගේ හෝ අනුන්ගේ හෝ දියුණුව පිණිස සැප පිණිස පිළිපන්නේ සෙසු කටයුතු අත්හැර,

**පස අයුරු ගැඹුරුව - මෙහි බේද පණ්ඩිතයා**
**ගැඹුර සේ ලබන්නේ - යොදනු සිහියෙන් සැම දා**

**සුත්තන්ත භාජනියයි.**

මෙසේ මහා පෘථිවිය පැතිරෙන්නා සේ ආකාශය දිගහැරී යන්නා සේද සියළු ධර්මයන් කෙරෙහි අප්‍රතිහත ඥාණයක් ඇති ශාස්තෘන් වහන්සේ සූත්‍රාන්ත භාජනියෙහි ගැට නැතිව අවුල් නැතිව ප්‍රත්‍යයාකාරය නා නා චිත්ත වශයෙන් දක්වා දැන් යම්හෙයකින් මේ ප්‍රත්‍යයාකාරය කේවල වූයේද නා නා සිත්වල වූයේද වෙයි. එක් සිතකම වූයේද වෙයි. එහෙයින් අභිධම්ම භාජනිය වශයෙන් එක චිත්ත ක්‍ෂණික වූ පච්චයාකාරය නානාප්පකාරයෙන් දැක්වීමට "අවිජ්ජා පච්චයා සංඛාරොති" ආදි නයින් මාතෘකාව තැබූහ. මෙසේ තබන ලද මාතෘකාවෙහි :-

අවිදු ඈ මුල්හී - නව මුල්පද නවය වේ
නය එහි සතරෙකී - වාර බේදද දැක්වේ

මේ එහි විස්තරයයි. මෙහි අවිජ්ජා සංඛාර විඤ්ඤාණ නාම ෂඩායතන ඵස්ස වේදනා තණ්හා උපාදාන භේදයෙන් අවිජ්ජාදි නව මූල පදයෙහි අවිජ්ජාදිකො..........උපාදානාදිකො යයි මේ මූලපද නවය නය නවයක් වේ. ඒවා අතරෙන් පළමුකොට මේ අවිජ්ජාදික නය වේ. එහි පච්චය චතුක්කය හේතු චතුක්කය සම්පයුත්ත චතුක්කය අඤ්ඤමඤ්ඤ චතුක්කය යයි චතුක්ක සතරක් වේ. මෙහි යම් සේද එසේ සෙසු ඒවායෙහිද එක එකේ නය සතර සතර චතුක්ක වශයෙන් චතුක්ක තිස්හයක් වේ.

එහි එක එක චතුක්කයෙන් වාර සතර සතර සංග්‍රහ කළ බැවින් සතර චතුක්කයන්ගේ වශයෙන් එක එකේ නයෙහි සොළොස් සොළොස් වාර සය හතලිස් හතරක් අධික කොට ඇති වාර සියයක් වේ යයි දතයුතුය. එහි සියල්ලටම පළමු අවිජ්ජා මූලක නයෙහි පච්චය චතුක්කය. එහි පළමු නාමරූප ස්ථානයෙහි නාමයම සළායතන ස්ථානයෙහිද කිසිවක් නොකී බැවින් අසම්පූර්ණ ඒකාංගයෙන් යුක්ත වූයේ ඒකාදසංගික වාර නම් වේ. තුන්වන සළායතන ස්ථානයෙහි ෂඩායතනයට කියන ලද බැවින් සම්පූර්ණ එකංගයෙන් යුක්ත වූයේ ද්වාදසංගික වාර නම් වේ. සතරවැන්න සම්පූර්ණ ද්වාදසංගිකම වාර නම් වේ. එහි ෂඩායතන පච්චය ඵස්ස යයි කියන ලද බැවින් මෙයද අසම්පූර්ණ අංග යුක්ත වන්නේද නැත. එය අනංග බැවිනි. එහි අංගය වන්නේ ඵස්සමය. ෂඩායතන නොවේ. එහෙයින් එය අනංග බැවින් අසම්පූර්ණ අංග යුක්ත නොවේ. අට්ඨ කථාවෙහි කියන ලදී. පළමුව සර්ව සංගාහික අර්ථයෙන්. දෙවනුව ප්‍රත්‍යය විශේෂාර්ථයෙන්. තුන්වනුව ගබ්භසෙය්‍යක සත්වයන්ගේ වශයෙන්. සතරවනුව ඕපපාතික සත්වයන්ගේ වශයෙන්

ගන්නා ලදී. එසේම පළමුව සර්වසංග්‍රාහික අර්ථයෙන්, දෙවනුව ප්‍රත්‍යය විශේෂාර්ථයෙන්. තෙවනුව අසම්පූර්ණ ආයතන වශයෙන්. සිව්වනුව සම්පූර්ණ ආයතන වශයෙන් ගන්නා ලදී. එසේම පළමුව සර්වසංග්‍රාහිකාර්ථයෙන්, දෙවනුව මහානිදාන සූත්‍රය වශයෙන් තෙවනුව රූප භව වශයෙන් සිව්වනුව කාමභව වශයෙන් ගන්නා ලදැයි එහි පළමු දුතියාදියෙහි තුන්වාරයෙහි කිසිවෙක් නොපිවිසේ යයි සර්ව සංග්‍රාහිකයයි කියන ලදී. සෙසු ඒවායේ විශේෂ පසුව එන්නේය. එය දැක්වීම සඳහා -

අන’යුරු කියූ යම් - යම් තැන නොකියූ යමක්
පස වන සෙ යමකට - වෙන්කොට එ සව් දක්වනු

මේ ඒ නයයි. සූත්‍රාන්ත භාජනියෙහි මෙන් අවිශේෂයෙන් මේ සතරෙහි සංඛාරා යයි නොකියා සංඛාරො යයි කියන ලදී. ඒ කුමක් නිසාද? ඒක චිත්තක්ෂණික බැවිනි. එහි නා නා චිත්තක්ෂණික ප්‍රත්‍යාකාරය බෙදන ලදී. මෙහි ඒක චිත්තක්ෂණිකය අරඹන ලදී. ඒක චිත්තක්ෂණයෙහි බොහෝ චේතනා නොවේ යයි සංඛාරා යයි නොකියා සංඛාරො යයි කියන ලදී. මෙහි පළමුවන වාරයෙහි වනාහි ඒක චිත්තක්ෂණය ඇතුළත් ධර්ම සංග්‍රහණය බැවින් සියළු ස්ථානයෙහි සාධාරණ වූද රූප හැර විඤ්ඤාණ ප්‍රත්‍යයෙන් නාමයම කියන ලදී. එහි ඒක චිත්තක්ෂණයට ඇතුළත් සියළු ස්ථාන සාධාරණද විඤ්ඤාණය පවතින කිසිතැනක නොපවතී. ඒක චිත්තක්ෂණ පරියාපන්න මෙහි එකද ස්පර්ශය වේ. එහෙයින් ඊට අනුරූප ප්‍රත්‍ය වූ ආයතන ගන්නේ සළායතන ස්ථානයෙහි නාම ප්‍රත්‍යයෙන් ඡට්ඨායතනං යයි එකම මනායතනයම කීය. එහි එක් අකුසල ස්පර්ශයකට අනුරූපව ප්‍රත්‍යය විය. මේ කැමැත්ත සංඛාරපච්චයා විඤ්ඤාණං යන මෙහිද කියන ලදී. හේතුඵල විශේෂ දැක්වීම් සඳහා අංග පරිපූර්ණ වූයේද නැවත මෙහි ගන්නා ලදී. එහි මේ විශේෂයෙන් සංඛාරය හේතු වේ. අවිශේෂයෙන් නාමය ඵලය වේ. මෙහි වනාහි අවිශේෂයෙන් නාමය හේතු වේ. විශේෂයෙන් ස්පර්ශය ඵලය වේ. සෝකාදි සියල්ල ඒක චිත්තක්ෂණයෙහි නොහට ගනී. සියළු සිත් පවත්නා ස්ථානයෙහිද සිතෙහිද නොපවතී. එනිසා නොගන්නා ලදී. ජාති ජරා මරණාදිය අචිත්තක්ෂණ මාත්‍රයට සමාන වූ චිත්තක්ෂණයෙහි ඇතුළත් බැවින් අංග සම්පූර්ණ කිරීමට ගන්නා ලදී. මෙසේ මෙහි යමක් අන්‍යාකාරයකින් කියන ලදද යමක් නොකියන ලදද එය දතයුතුය. මෙහි යමක් මෙයින් පසු වාරයන්හි කියන ලදද? එහි අර්ථය කියන ලද නයින්ම දතයුතුය. යම් යම් වාරවල යම් යම් විශේෂයක් ආවේ නම් ඒවා ඒ ඒ තැන ප්‍රකාශ කරන්නෙමි.

යං යථා පච්චයො යස්ස යන යම්සේ යමකට යම් ප්‍රත්‍යයක් වේද? මෙහි වනාහි සංඛාරයට අවිජ්ජා සම්ප්‍රයුක්ත ධර්ම සාධාරණයෙන් සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය සම්පයුත්ත අත්‍ථි අවිගත ප්‍රත්‍යවලින් හේතුප්‍රත්‍ය සයකින්ද යයි සත් ආකාරයකින් ප්‍රත්‍ය වේ. එහි යමකින් පසුව හේතු චතුක්කාදි චතුක්ක තුන අවිගත සම්පයුත්ත අඤ්ඤමඤ්ඤ ප්‍රත්‍ය වශයෙන් කියන ලදී. එහෙයින් මෙහි ඒවා බැහැර කර අවශේෂ වශයෙන් අවිජ්ජාව සංඛාරයට සිව් ආකාරයකින් ප්‍රත්‍යවේදැයි දතයුතුය. සංඛාරය විඤ්ඤාණයට සාධාරණයෙන් කම්ම ආහාර ප්‍රත්‍ය සයෙන්ද අට ආකාරයකින් ප්‍රත්‍ය වේ. මෙහි ඒ තුනම බැහැර කර පස් ආකාරයකින්ද විඤ්ඤාණය නාමයට ඉන්ද්‍රිය ආහාර අධිපති සාධාරණ වූ හය ආකාරයකින් දැයි නව ආකාරයකින්ද මෙහි ඒ තුන හැර සයාකාරයකින්ද නාමය ෂට්ඨායතනයට සාධාරණ වූ හයෙන්ද මෙහි සමහරවිට අධිපති ප්‍රත්‍යයෙන්ද සමහරවිට ආහාර ප්‍රත්‍යයෙන්දැයි නොයෙක් ආකාර වේ. මෙහි ඒ තුන හැර තුන් ආකාර සතරාකාර පස්ආකාර හෝ වේ. ෂට්ඨායතනය ස්පර්ශයට විඤ්ඤාණය නාමයට මෙසේ ස්පර්ශය වේදනාවට සාධාරණ වූ සයෙන් ආහාර ප්‍රත්‍යයෙන් යයි සත් ආකාරයකින්ද මෙහි ඒ තුන හැර සතරාකාරයකින් වේදනා තණ්හාවලට සාධාරණ වූ සයෙන් ඣාන ඉන්ද්‍රිය ප්‍රත්‍යවලින්දැයි අට ආකාරයකින්ද මෙහි ඒ තුනම අත්හැර පස් ආකාරයකින්ද තණ්හා උපාදානයට අවිජ්ජා සංඛාරයට මෙනි. මෙසේ උපාදානය භවයට සාධාරණ සයෙන් සහ මග්ග ප්‍රත්‍යයෙන් දැයි සත් ආකාරයකින්ද මෙහි ඒ තුන හැර සතරාකාරයකින්, භවය ජාතියට මෙහි ජාතිය යයි සංඛත ලක්ෂණය අදහස් කරයි. ඒ නිසා පරියායේ උපනිශ්‍රය ප්‍රත්‍යයේම ප්‍රත්‍ය වේ. ජාතිය ජරාමරණවලට ද එසේය. යමෙක් මෙසේ කියති. "මේ චතුෂ්කයෙහි සියළු සංඛාරාදියේ අවිජ්ජා ආදිය සහජාත ප්‍රත්‍යයෙන් ප්‍රත්‍ය වේ. සහජාත ප්‍රත්‍යය වශයෙන්ම පළමු වාරය අරඹන ලදී." ඒවා භවාදියේ එසේ අභාවයද සෙසු ප්‍රත්‍යයන්ගේ සම්භවයද දක්වා ප්‍රතික්ෂේප කළයුතුය. භවය ජාතිය සමග සහජාත ප්‍රත්‍යයෙන් ප්‍රත්‍ය නොවේ. ජාති ජරා මරණ සමග ද නොවේ. ඒ සංඛාරාදීන්ගේ අවශේෂ ප්‍රත්‍ය කියන ලදද ඒවා ද හටගන්නේ යම්තැනක අන්‍යාකාරයකින් කියන ලදද නොකියන ලද යමක් යම් මේ නයමය. මෙය විශේෂයකි. දෙවන වාරයෙහි නාමප්‍රත්‍ය ඵස්ස යයි ප්‍රත්‍යය විශේෂය දැක්වීමට ද මහානිදාන දේශනාව සංග්‍රහ කිරීමට ද වේ.

ස්පර්ශයට කේවල වූ ෂට්ඨායතනය පමණක් ප්‍රත්‍ය නොවේ. වේදනක්ඛන්ධාදි ස්කන්ධ තුනම ප්‍රත්‍ය වේ. මහා නිදාන සූත්‍රාන්තයෙහිද

ඊට අත්ථි ඉදප්පච්චයා (මෙය ප්‍රත්‍යය කොට ඇති බැවින්) ඵස්ස වේ. මෙසේ ස්පර්ශයෙන් සත් ආනන්ද ඇතැයි මෙහි වචනීය වේ. කුමන ප්‍රත්‍යයක් ස්පර්ශ වේද මෙසේ කිපෙන්නේය. නාම ප්‍රත්‍යයෙන් ඵස්ස වේ යනු වචනීය වේ. මෙසේ සළායතන හැර ඒකාදසංගික පටිච්ච සමුප්පාදය කියන ලදී. එනිසා මේ ප්‍රත්‍යය විශේෂයේ දැක්වීම සඳහා වේ. මහා නිදාන සූත්‍රාන්ත දේශනාවෙන් ගන්නා ලද දෙවන වාරයෙහි නාම ප්‍රත්‍යයෙන් ඵස්ස වේ යයි කියා සළායතන ස්ථානයෙහි කිසිවක් නොකියන ලදී.

දෙවන වාරයෙහි මෙය විශේෂයකි. තුන්වන වාරයෙහි වනාහි විඤ්ඤාණ පච්චයා නාමරූපං යන සූත්‍රාන්ත භාජනියෙහි ආ පරිදිමය. සතරවන අංගය කියන ලදී. එය එක චිත්තක්ෂණික බැවින් පච්චයාකාරයට මෙය අයුත්තක් වේද? එය අයුත්තක් නොවේ. කුමක් හෙයින්ද? ස්වකීය ක්‍ෂණයෙහි ප්‍රත්‍යවන බැවිනි. ඉදින් එහි රූපය චිත්තක්‍ෂණයට ඉහළින් සිටීද? එසේ වුවද ඒ විඤ්ඤාණය ස්වකීය ක්‍ෂණයෙහි ප්‍රත්‍ය වේ. කෙසේද? පුනර්ජාත චිත්ත සමුට්ඨානයට හෝ අතික්කම හෝ පච්ඡා ජාත පච්චයේ ප්‍රත්‍ය හෝ මෙය කියන ලදී. පසුව උපන් චිත්ත චෛතසික ධර්මයෝ පෙර උපන් මේ කය පච්ඡාජාත ප්‍රත්‍යයෝ ප්‍රත්‍ය වෙති. සහජාත චිත්ත සමුට්ඨානයට නිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍ය වේ. යමක් කීහ. "චිත්ත චෛතසික ධර්මයෝ චිත්ත සමුට්ඨාන රූපවලට නිස්සය පච්චයෙන් ප්‍රත්‍ය වෙති." එසේ නම් පුරිම වාරවල කුමක් හෙයින් මෙසේ නොකියන ලදද? රූපය පවතින ප්‍රදේශය උදෙසා දේශනා කරන ලද බැවිනි. මේ පච්චයාකාරය රූපය පවතින කාම භවයෙහි ගැබ් පිළිසිඳ ගත්තන්ටම උපරි පුණ්‍යායතන-වල ඕපපාතිකයන්ටද රූපාවචර දෙවියන්ටද වශයෙන් දේශනා කරන ලදී. එහෙයින්ම මෙහි නාමරූප පච්චයා සළායතනං නොකියා ඡට්ඨායතනය යයි කියන ලදී. එහි නාමය යට කියන ලද නය මෙනි. රූපය වනාහි හදය රූපය දතයුතුය. එය වනාහි මේ ඡට්ඨායතනවලට නිස්සය ප්‍රත්‍යයෙන් මෙන්ම පුරේජාත පච්චයෙන් යයි දෙයාකාරයකින් ප්‍රත්‍ය වේ. මෙය තුන්වන වාරයෙහි විශේෂයයි. සතරවන වාරය වනාහි යෝනි වශයෙන් ඕපපාතිකයන්ට ආයතන වශයෙන් සම්පූර්ණ ආයතන භව වශයෙන් කාමාවචර සත්වයින් ගේ වශයෙන් කියන ලදී. එහෙයින්ම මෙහි නාමරූප පච්චයා සළායතනං යයි කියන ලදී. එහි නාමය ඡට්ඨායතනයට සහජාතාදියෙන්ද චක්ඛායතනාදියට පච්ඡාජාත ප්‍රත්‍යයෙන්ද ප්‍රත්‍ය වේ. රූපයෙහි හදයරූපය ඡට්ඨායතනය නිස්සය පච්චය පුරෙජාත ප්‍රත්‍යවලින් ප්‍රත්‍ය වේ. සතර මහාභූත චක්ඛායතනාදියට

සහජාත නිස්සය අත්ථි අවිගත ප්‍රත්‍යවලින් ප්‍රත්‍ය වේ. යම්හෙයකින් මෙය එකචිත්තක්ෂණික පච්චයාකාරයක් නම් එහෙයින් මෙහි සළායතන පච්චයා යයි නොකියා ඡට්ඨායතන පච්චයා ඵස්ස යයි කියන ලදී. මෙය සතරවන වාරයෙහි විශේෂයයි. මෙසේ මේවායේ නා නා කරනය දැන නැවත ඒ සියල්ලේම විශේෂයෙන් පළමුවන වාර දෙක අරූප භවයෙහි පච්චයාකාරය දැක්වීම සඳහා කියන ලදැයි දතයුතුය. අරූප භවයෙහි රූපයෙන් අසම්මිශ්‍ර වූ පටිච්ච සමුප්පාද අංග පවතී. තුන්වන රූප භවයෙහි පච්චයාකාරය දැක්වීම සඳහා කියන ලදී. රූප භවය ඇතිකල්හිද රූප මිශ්‍ර භවයේ සළායතන නොපවතී. සතරවන කාම භවයෙහි පච්චයාකරය දැක්වීමට කියන ලදී. කාම භවයෙහි සියළු සළායතන පවතී. තුන්වන හෝ රූප භවයෙහිද කාම භවයෙහිද අසම්පූර්ණ ආයතනවල අකුසල පවතින ක්ෂණය සඳහා කියන ලදී. සතරවන හෝ කාම භවයෙහි සම්පූර්ණ ආයතනවල පළමු හෝ සියළු තැන යන්නවුන් උදෙසා කියන ලදී. එය කිසිවකු චිත්තපවත්ති දේශයේ නොපවතී. දෙවන පච්චය විශේෂය උදෙසා කියන ලදී. මෙහි ඒකාදසංගික බව ස්පර්ශයට නාම ප්‍රත්‍ය බව ප්‍රත්‍යය විශේෂයයි. තුන්වන පළමු යෝනි දෙක උදෙසා කියන ලදී. පළමු යෝනි දෙකෙහි එය උපදී. එහි සැමදා සළායතනයකින් නොපහළවීම සතරවන අවසාන යෝනි දෙක උදෙසා කියන ලදී. එය අවසන් යෝනි දෙකෙහි හටගනී. එහි සැමදා සළායතන පහළ වේ. මෙතෙකින් වාර සතරෙහි යමක් කියන ලදී.

> අනයුරු කියූ යම් - යම්තැන නොකියූ යමක්
> පස වන සෙ යමකට - වෙන්කොට එ සව් දක්වනු යයි

ගීයේ අර්ථ වර්ණනාව කරන ලදී.

> මෙම අනුසරෙන් මෙහි - ඒ සියළු මෙ නයේ මින්
> වෙසෙසින් යමෙක් එය - පසු චතුකවල දන්නේ

එහි යමෙක් මෙහි කියන ලද නය එය හැමතැනම ප්‍රකටය. විසේසය මෙසේ දතයුතුය. හේතු චතුක්කයෙහි අවිජ්ජාව එහි ඇති නිසා අවිජ්ජා හේතුක වේ. අවිජ්ජා මෙයම ස්වභාව පවතින බැවින් භංගය දක්වා පවතින්න ගම්කා යයි කියන ලද්දේ වෙයි. අවිජ්ජා පච්චය මෙපමණකින් සහජාතාදි පච්චය වශයෙන් සාධාරණ බැවින් සංඛාරයට අවිජ්ජා ප්‍රත්‍යය

යයි දක්වා නැවත අවිජ්ජා හේතුක යයි මෙයින්ම විශේෂයේ අවිගත ප්‍රත්‍යය දක්වන ලදී. සංඛාර පච්චයා විඤ්ඤාණං සංඛාර හේතුක යන ආදියෙහිද මෙම නයයි. කුමක් හෙයින් භවාදියෙහි හේතුගැනීම නොකරන ලදද අවිගත ප්‍රත්‍යයේ නියමයක් නොවීමෙනි. අවිගත ප්‍රත්‍යය අභාවයෙන් එහි උපාදාන ප්‍රත්‍යයෙන් භවය වන්නේ කෙසේද? උපාදානය හැර වේදනා සංඥා සංඛාර විඤ්ඤාණ යන මේ උපාදාන ප්‍රත්‍යය භවය වේ යන වචන බැවින් උපාදාන ප්‍රත්‍යයන් සතර ස්කන්ධ මෙහි භවය නම් වේ. සංඛාර ඛන්ධයෙහිම "ජාති ද්වීහි ඛන්ධෙහි සංගහිතා"ති ආදි වචනයෙන් ජාති ජරා මරණ ඇතුළත් වේ. එහි උපාදානය පවතිනතුරු ජාති ජරා මරණවල ලැබීම පවතින බැවින් උපාදානය. භවයේ නියමයක් නැති අවිගත පච්චය වේ. "යා තෙසං තෙසං ධම්මානං ජාති" යන ආදි වචනයෙන් සංඛත ලක්‍ෂණවල ජාතියෙන් ජරාමරණ සංඛ්‍යාත භවයට ජාතික්‍ෂණ මාත්‍රයෙහි අභාවයෙන් අවිගත පච්චයභාවය නොඋපදී.

එසේම ජාතියෙන් ජරාමරණ ක්‍ෂණයේ අභාවයෙන් උපනිස්සය ප්‍රත්‍යයෙන්ම ජාතියෙන් භවය වේ. ජාති මරණයට ප්‍රත්‍යයයි සියළු ආකාරයෙන්ම අවිගත පච්චය නියමය අභාවයෙන් අභාවයෙන්ද අවිගත ප්‍රත්‍යයට ප්‍රත්‍ය වේ. භවාදියෙහි හේතු ගැනීම නොකළේ යයි දතයුතුය. කිසිවෙක් කීහ:- භවය දෙයාකාර යයි වචනයෙන් උත්පත්ති මිශ්‍ර භවය උත්පත්ති භවයට උපාදානය අවිගත නොවේ. "උපාදාන පච්චයා භවො උපාදාන හේතුකො" යයි නොකියා උපාදාන පච්චයා භවො යයි කියන ලදී. මෙහි සිඳදමන ලද බැවින් පරතො න වුත්තනති. එය මෙහි උත්පත්ති මිශ්‍රවූ භවය අදහස් නොකළ බැවින් අයුතුය. අරූප ස්කන්ධ මෙහි භවයයි ආවේය. භව ප්‍රත්‍යයෙන් ජාති යයි මෙහිද හැර ජාති ජරාමරණාදි අවසේස භවය ජාතියෙන් ප්‍රත්‍ය වේයයි දතයුතුය. කුමක් හෙයින්ද? ජාති ආදියට ජාතියෙන් ප්‍රත්‍ය නොවන බැවිනි. මෙසේ හැර ජාති ජරා මරණ භවය ජාතියෙන් ප්‍රත්‍ය වේ යයි කිවයුතුද? එසේය, කිව යුතුය. කිවයුතු ප්‍රදේශයක් නැති හෙයින් නොකියන ලදී. දසමංග නිද්දේසයෙහි උපාදාන ප්‍රත්‍යයෙන් හටගත් භවය කිවයුතුය. ඒකාදස අංග නිද්දේශයෙහි ජාතිය කිවයුතුය. යම්හෙයකින් ජාතියෙන් ප්‍රත්‍ය වේ. එහි කිවයුතු ප්‍රදේශයක් නැතැයි කිවයුතු ප්‍රදේශයක් නැති බැවින් නොකියන ලදී. නොකියන ලද්ද යුත්ති වශයෙන් ගතයුතුය. විඤ්ඤාණ පච්චයා නාමරූපං යන ආදියෙහි විඤ්ඤාණාදීන්ගේ අවිගත පච්චය භවයෙන් උපන් හෙයින් විඤ්ඤාණ හේතුකාදි වචන කියන ලදී. මෙය හේතු චතුක්කයෙහි විශේෂයයි.

සම්පයුත්ත චතුක්කයේද අවිජ්ජා පච්චයා යන මෙපමණකින් සහජාතාදි ප්‍රත්‍යය වශයෙන් සංඛාරයේ අවිජ්ජා පච්චය බව දක්වා නැවත අවිජ්ජා සම්පයුත්ත යයි සම්පයුත්ත පච්චය බව දක්වන ලදී. සෙසු පදවලද මෙම නයයි. අරූපී ධර්මවල රූප ධර්මවලින් සම්බන්ධයක් නැත. එහෙයින් විඤ්ඤාණ පච්චයා නාමරූපං ආදියෙහි තුන්වන සතරවන වාර පදවල විඤ්ඤාණ සම්පයුත්ත නාමං ආදි නයින් යමක් ලැබේද එයම ගන්නා ලදී. මෙය සම්පයුත්ත චතුක්කයෙහි විශේෂයයි. අඤ්ඤමඤ්ඤ චතුක්කයෙහිද අවිජ්ජා පච්චයා යන සහජාතාදි පච්චය වශයෙන් සංඛාරයට අවිජ්ජා පච්චය බව දක්වා සංඛාර පච්චයද අවිජ්ජා යයි අඤ්ඤමඤ්ඤ පච්චය බව දක්වන ලදී. සෙසු පදවලද මෙම නයයි.

යම් හෙයකින් භවය නිප්පදේශද උපාදානය සප්පදේශද වේ. සප්පදේශ ධර්මද නිප්පදේශ ධර්මයට ප්‍රත්‍ය වේ. නිප්පදේශ ධර්ම සප්පදේශ ධර්මවලට ප්‍රත්‍ය නොවේ. එහෙයින් මෙහි භව පච්චය ද උපාදානය යයි නොකියන ලදී. යට කී දේශනාව සිඳින බැවින් නොකියන ලදී. යම්සේ නාමරූප ප්‍රත්‍යයෙන් සළායතන ඇත. සළායතන ප්‍රත්‍යයෙන් ඒකචිත්ත ක්ෂණයෙහි නාමරූප නැත. යමකට සළායතන අඤ්ඤමඤ්ඤ ප්‍රත්‍ය වන්නේද එහෙයින් සතරවන වාරයෙහි ඡට්ඨායතන පච්චයා නාමරූපං යයි යමක් ලබයිද එයම ගන්නා ලදී. මෙය අඤ්ඤමඤ්ඤ චතුක්කයෙහි විශේෂයයි.

## අවිජ්ජා මූලක නය මාතිකවය.

දැන් සංඛාර පච්චයා අවිජ්ජා යයි සංඛාර මූලක නය අරඹන ලදී. එහිද අවිජ්ජා මූලකයෙහි මෙනි. මෙසේ චතුක්ක සතරද වාර දහසයද දතයුතුය. පළමු චතුක්කයෙහි පළමුවන වාරය දක්වා දේශනාව සංක්ෂෙප කරන ලදී. මෙහි මෙන් විඤ්ඤාණ මූලකාදියෙහිද එසේය. එහි සියළුම ඒ සංඛාර මූලකාදි නය අටෙහි සංඛාර පච්චයා අවිජ්ජා යන ආදි නයින් සහජාතාදි පච්චය වශයෙන් අවිජ්ජාවෙහි සංඛාරාදි ප්‍රත්‍යභාවය දක්වා නැවත අවිජ්ජා පච්චයා සංඛාර යන ආදි නයින් ඒක චිත්තක්ෂණයෙහි ද පච්චයාකාර චක්‍රයාගේ පැවැත්ම දක්වන ලදී. භවමූලක හෝ ජාති ජරා මරණ මූලක හෝ නය කුමක් හෙයින් නොකියන ලදද? කිම භව ප්‍රත්‍යයෙන් අවිජ්ජා නොවේද? නොවන්නේ නොවේ. සංඛාර පච්චයා අවිජ්ජා යන මේ ආදිය කියන කල්හි භවයට ඇතුළත් කිසිම ධර්මයක් අවිජ්ජාවෙන්

ප්‍රත්‍යය වේයයි නොකියන ලදී. එනිසා පෙර නොවූ අන්‍ය වූ අවිජ්ජා ප්‍රත්‍යයෙන් කිවයුතු වූවකගේ අභාවයෙන් භවමූලක නය නොකියන ලදී. භවය ගැනීමෙන් අවිජ්ජාවද සංග්‍රහ වේ. එහෙයින් භව පච්චයා අවිජ්ජා යයි කියන කල්හි අවිජ්ජා පච්චයා අවිජ්ජාවද කියන ලද වන්නේය. ඒක චිත්තක්ෂණයෙහි අවිජ්ජාව අවිජ්ජාවෙන් පච්චය නම් නොවේ. එහි සිදින ලද බැවින් ජාති ජරා මරණ මූලක නයද නොගන්නා ලදී. තවද භවයෙහි ජාති ජරා මරණ ඇතුළත්ය. මේවා ඒක චිත්ත ක්ෂණයෙහි අවිජ්ජාවෙන් පච්ච නොවේ යයි භව මූලක ජාති ජරා මරණ මූලක හෝ නය නොකියන ලදී.

## මාතිකා කථාවය.

දැන් යට චිත්තුප්පාද කාණ්ඩයෙහි කුසලත්‍රිකය ආදි කොට තබන ලද මාතෘකාවේ පිළිවෙළින් පළමුව කුසලය බෙදන ලදී. එසේ මෙහි මාතෘකාව නොතබන ලද බැවින් පළමුව කුසලය අනාමර්ශනය කොට අවිජ්ජා පච්චයා සංඛාරෝ යයි අකුසල ධර්ම වශයෙන් මාතෘකාව තබන ලද බැවින් බහා තැබූ පිළිවෙළින්ම අවිජ්ජාදි පටිච්ච සමුප්පාද අංග බෙදා දැක්වීමට **කතමෙ ධම්මා කුසලා?** යන ආදිය කීහ. එහි අර්ථය යට චිත්තුප්පාද කාණ්ඩයෙහි කියන ලද නයින්ම දතයුතුය. යම්සේ ඒක චිත්තක්ෂණයෙහි තණ්හාවද කාම උපාදානයද හටගැනීමක් නැත. එහෙයින් මෙහි යමක් තණ්හා පච්චයා උපාදානය ලබයිද එයම දැක්වීමට **දිට්ඨි දිට්ඨිගතං** යන ආදිය කියන ලදී. භව නිද්දේශයෙහිද උපාදානය සංඛාර ස්කන්ධයෙහි සංග්‍රහ වේ. එහෙයින් **ඨපෙත්වා උපාදානං වේදනාක්ඛන්ධො සඤ්ඤාක්ඛන්ධො සංඛාරක්ඛන්ධො විඤ්ඤාණක්ඛන්ධො** යයි කියන ලදී. මෙසේ කියන කල්හි උපාදානයට උපාදාන පච්චයා බව පැමිණේ. එයම ඊට ප්‍රත්‍ය නොවේ. ජාති ආදි නිද්දේශයෙහි මේ ජාති ආදියෙහි අරූප ධර්මයන්ගේ ජාති ආදියයි. එහෙයින් ඛණ්ඩිච්චං පාලිච්චං වලිත්තචතා චුති චවනතා යයි කියන ලදී.

මෙසේ පළමු වාරය නිමවා නැවත දෙවන වාරයෙහි ප්‍රථම වාරයෙහි පච්චයාකාරය දැක්වූ කාලයෙහිම වෙනත් ක්‍රමයකින් පච්චයාකාරය දැක්වීමට වෙනත් කාල නියමයකින් වාරය නොකියා **තස්මිං සමයෙ අවිජ්ජා පච්චයා සංඛාරෝ** යනාදි නයින් දේශනා කරන ලදී.

එහි **ඨපෙත්වා ඵස්සං** යන යම් ස්පර්ශයකින් නම ඇතුළත් වූයේ නම් ඒ ස්පර්ශයේ නම බැහැර කිරීම සඳහා කියන ලදී. තුන්වන වාරයෙහි යම් චිත්ත සමුට්ඨාන රූපයකට විඤ්ඤාණය ප්‍රත්‍ය වීනම් එය පවතින කාලයෙහි එයින් උපස්ථම්භක වූ චක්ඛායතනාදියේ රැස්කළ බව පෙනී යයි. එහෙයින් **චක්ඛායතනස්ස උපචයො** යනාදිය කියන ලදී. කම්මජ රූපයටද ඒ අවස්ථා පවතින විඤ්ඤාණයේ පච්චාජාත පච්චයෙන් ප්‍රත්‍ය වේද? එහෙයින්ද මෙසේ කියන ලදී.

එහි කිසි කර්මජ සහ චිත්ත සමුට්ඨාන යයි සන්තති දෙකක් ගන්නා ලදී. ඉතිරි සන්තති දෙකද ගතයුතුය. ඒවායෙහිද විඤ්ඤාණය ප්‍රත්‍ය වේමය. සතරවන වාරයෙහි එක චිත්තක්ෂණයෙහිද මහාභූත රූප පච්චයෙන්ද චක්ඛායතනාදිය හදය රූප පච්චයෙන්ද ඡට්ඨායතන නාම පච්චයෙන් ද පච්ඡාජාත සහජාතාදි වශයෙන් යථානුරූපව සියල්ලම පවතී. එහෙයින් **කතං කතමං නාමරූප පචචයා සළායතනං චකඛායතනං** ආදිය කියන ලදී.

### පඨම චතුක්ක නිද්දේසයයි.

දෙවන චතුක්කයෙහි සියල්ල කියන ලද්දේමය. තුන්වන චතුක්ක-යෙහි සම්පයුත්ත පච්චයභාවය යමකට නැත. යමකට ඇත. එය වෙන්කොට දැක්වීමට **ඉදං වුචචති විඤ්ඤාණ පච්චයා නාම රූපං විඤ්ඤාණ සමපයුතතං නාමං** යනාදිය කීහ.

### තෘතීය චතුක්ක නිද්දේසයයි.

සතරවන චතුක්කයෙහි ඵස්ස පච්චය නාම නිද්දේසයෙහි කිසිවක් හැර ස්පර්ශය වේදනා ස්කන්ධය - විඤ්ඤාණ ස්කන්ධය යයි මෙය කියන ලදී. ස්පර්ශ ප්‍රත්‍යයෙන් නාමය යයි නොකියන ලදී. එසේ වුවද අනන්තර අතීත පද නිද්දේසයෙහි **ඨපෙත්වා ඵස්සං වේදනාක්ඛන්ධො.... විඤ්ඤාණක්ඛන්ධො** යයි කියන ලද බැවින් නොකියන ලද්දද කියන ලද්දේම වෙයි. මෙසේ නාමය ස්පර්ශයට ප්‍රත්‍ය වේ. ස්පර්ශය ද නාමයට ප්‍රත්‍ය වේ.

### චතුත්ථ චතුක්ක නිද්දේසයයි.

මේ චතුක්කය සොළොස් වාරයකින් ප්‍රභේද වූ අවිජ්ජා මූලක ප්‍රථම නය මේ පළමු අකුසල සිතේ ප්‍රකාශිතය. මෙසේ සංඛාර මූලකාදි නය අටද දතයුතුය. පෙළෙහි වනාහි සංක්ෂේප කරන ලදී. එසේම ඒ පළමුවන අකුසල් සිතෙහිම නය නවයද චතුක්ක තිස් හයද වාර එකසිය හතලිස් හතරද වේ යයි දතයුතුය. දැන් මේ නයින්ම සෙසු අකුසල සිත්වල ද පච්චයාකාරය දැක්වීමට **කතමෙ ධම්මා අකුසලා** යනාදිය අරඹන ලදී. එහි යම් දිට්ඨි විප්පයුත්තවලද තණ්හා ප්‍රත්‍යයෙන් උපාදාන නැත. එනිසා උපාදාන ස්ථානයේ උපාදානය මෙන් දැඩි සේ වැටුණු අධිමොක්ඛයෙන් පදය පුරවන ලදී. දෝමනස්ස සහගතවල ද වේදනා ප්‍රත්‍යයෙන් තණ්හාව ද නැත. එනිසා තණ්හා ස්ථානයේ තණ්හාවෙන් බලවත් ක්ලේශ පටිඝයෙන් පදය පුරවන ලදී. උපාදාන ස්ථානයෙහි අධිමොක්ඛයෙන් ද විචිකිච්ඡා සම්පයුත්තයෙහි වනාහි යම් සනිටුහන් බවකින් අධිමොක්ඛයයි නැත. එනිසා තණ්හා ස්ථානයෙහි බලවත් කෙලෙස් වූ විචිකිච්ඡාවෙන් පදය පුරවන ලදී. උපාදාන ස්ථානය පිරිහුනේමය. උද්ධච්ච සම්පයුත්තය වනාහි යම් අධිමොක්ඛයක් ඇත. එනිසා තණ්හා ස්ථානයෙහි බලවත් කෙලෙස් වූ උද්ධච්චයෙන් පදය පුරවන ලදී. උපාදාන ස්ථානයෙහි අධිමොක්ඛයෙන් පදය පුරවන ලදී. සියළු තන්හිම විශේෂතා පමණක් දක්වා පෙලෙහි සංක්ෂේප කරන ලදී. යම්තැනක විශේෂයක් දක්වන ලද නම් එහි කේවල වූ අධිමොක්ඛ නිද්දේසයයි. අධි මිදීම් වශයෙන් **අධිමොක්ඛො** ඒ අරමුණෙන් සිත අධික සේ මිදේ. නිර්විචිකිච්ඡාවේ තීරණයට යයි යනු **අධිමොක්ඛ** යයි අධිකව මිදෙන ආකාරය අධිමුච්චනා ය. ඒ සිතේ ඒ අරමුණෙහි හෝ මිදුණු බව **තදධිමුත්තා** වේ. සියළු සිත්වලද පළමුවන සිතෙහි කියන ලද නයින්ම නය චතුක්ක වාර ප්‍රභේදය දතයුතුය. කේවල වූ විචිකිච්ඡා සම්පයුත්තයෙහි උපාදාන මූල වූ නයක් අභාවයෙන් අට නය දෙතිස් චතුක්ක ද වාර එක්සිය විසිඅටක් ද වේ.

### අකුසල නිද්දේසයයි.

දැන් මෙම නයින්ම කුසල චිත්තාදියෙහි ද පච්චයාකරය දැක්වීමට **කතමෙ ධම්මා කුසලා** යනාදිය අරඹන ලදී. අකුසලයෙහි පළමුවන මාතෘකාව හැර පච්ඡා නිද්දේසය කරන ලදී. මෙහි එසේ නොවේ. කුමක් නිසාද? අප්පණා වාරයෙහි නානත්ත සම්භවය නිසාය. ලෞකික

කුසලාදියෙහි ඒ ධර්මයන්ගේ දුක්ඛ සත්‍ය කෙළවරකොට ඇති බැවිනි. **එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස** යයි අර්පණා වෙයි. ලෝකෝත්තර කුසලාදියෙහි ඒ ධර්මවල එසේමය. එහෙයින් මෙහි සාධාරණව (දෙකටම) මාතෘකා තැබීමට නොහැකි යයි වෙන වෙනම ඒ ඒ කුසලාදීන්ට මාතෘකා උදෙසාම නිර්දේශ කරන ලදී. එහි ඒක චිත්ත ක්‍ෂණයෙහි කුසල සංඛාර සමග අවිජ්ජාව නැත. එනිසා එය නොකියා අකුසලවල අවිජ්ජාව මෙන් කුසලයන්ගේ මූල වශයෙන් **කුසල මූලං** විය. තණ්හා උපාදාන අභාවයෙන් තණ්හා ස්ථානයේ තණ්හාව මෙන් අරමුණෙහි දැඩිසේ බැසගත් ප්‍රසාදය **පසදො** ද උපාදාන ස්ථානයෙහි දැඩිසේ වැටෙන අධිමොක්ඛො අධිමොක්ඛයද කියන ලදී. සෙස්ස යට කියන ලද නයින්ම දතයුතුය.

## කුසල නිද්දේසයයි.

අව්‍යාකෘතය යට චිත්තුප්පාද කාණ්ඩයෙහි ආ පිළිවෙළින්ම බෙදන ලදී. සියළු වාරවලද අවිජ්ජාමූලක නය පරිහීනය. කුමක් නිසාද? අවිජ්ජා ස්ථානයෙහි තැබිය යුත්තක් නොමැති වීමෙනි. කුසල සිත්වල අවිජ්ජා ස්ථානයෙහි තැබිය යුතු කුසලමූල ඇත. චක්ඛු විඤ්ඤාණාදිවල නැත. සහේතුකවල කිසිවක් ඇත. මෙසේ පවතින කල්හිද මෙහි සිඳ ඇති බැවින් නොගන්නා ලදී. පඤ්ච විඤ්ඤාණ ස්‍රෝතයෙහි සෝතයට පතිතව දේශනා කළේයයි දතයුතුය. මෙහි ඇති විශේෂය නම් චක්ඛු විඤ්ඤාණාදි-යෙහි තණ්හා ස්ථානයද උපාදාන ස්ථානයද පිරිහීමය. කුමක් හෙයින්ද? තණ්හා ස්ථානයට බලවත් ධර්මයක්හුගේ අභාවය නිසාද අධිමොක්ඛ රහිතභාවය නිසාද වේ. සෙසු අහේතුකවල තණ්හා ස්ථානයම පරිහානිය වේ. සහේතුකවල පසාදය පහළවීමෙන් තණ්හා ස්ථානයෙහි පදය පසාදයෙන් පුරවන ලදී. මෙහි කුසලාකුසල විපාකවල චක්ඛු විඤ්ඤාණාදි-යෙහි සංඛාර විඤ්ඤාණ නම් ඡට්ඨායතනය ඵස්ස වෙදනා මූලකය සය සය වේ. සෙසු අහේතුකවල අධිමොක්ඛ මූලකය සමග සත සත වේ. සහේතුකවල පසාදය සමග නය අට අට දතයුතුය. එහි චක්ඛු විඤ්ඤාණාදියෙහි සතරවැනි වූ චතුක්කවල මුල්වාරය පමණක් කියන ලදී. දෙවන වාරය පච්චය විශේෂාර්ථයෙන් ලබන්නේද නොකියන ලදී. තුන්වන සතරවන වාර නොහටගන්නේමය. රූප මිස්සකයෙහි චක්ඛු විඤ්ඤාණාදි රූප නූපදවයි. පළමු චතුක්කයෙහි වාර දෙක ලබන්නේ යම්සේද සෙසු චතුක්කවලද එසේය. එහෙයින් පළමු චතුක්කයෙහි වාර

දෙකකි. සෙසු චතුක්කවලද වාර දෙක දෙක වේ. නොකියන ලද්ද කියන ලද්ද මෙනි. සෙසු අහේතුක අව්‍යාකෘතවල සියළු චතුක්කවල සියළුම වාර ලැබේ. මෙහි සිඳින ලද බැවින් පසුව නොගන්නා ලදී. සෝතය වැටුනා මෙන්ම දේශනා කරන ලද්දේය. අරූපාවචර විපාකවල මෙම ක්‍රමයයි. රූපාවචර විපාකය හැර අරූපාවචර විපාකයෙහිද වාර දෙකක්ම ලැබේ.

## අබ්‍යාකත නිද්දේසයයි.

දැන් වෙනත් පරියායකින් එක චිත්තක්ෂණයෙහි පච්චයාකරය දැක්වීමට නැවත කතමෙ ධම්මා කුසලා? යනාදිය අරඹන ලදී. එහි අවිජ්ජා පච්චයා යන උපනිස්සය ප්‍රත්‍යය උදෙසා කියන ලදී. ඒ නිද්දේස වාරයෙන්ම එහි කතමාති අවිජ්ජා යයි නොබෙදා තත්‍ථ කතමා අවිජ්ජා පච්චයා සංඛාරෝ යයි බෙදන ලදී. කුසල චේතනා සංඛ්‍යාත බැවින් සංඛාරයම ඒ වේලාවෙහි සිත සමග සහජාත වෙයි. අවිජ්ජා සමග නොවේ. එහි ලෞකික කුසලය යට සූත්‍රාන්ත භාජනයෙහි කී පරිදිමය. අවිජ්ජා පච්චයා වෙයි. යම් අප්‍රහීන අවිජ්ජාවක් අවිජ්ජාවෙන් ප්‍රහානය කිරීමට ලෝකෝත්තරය වඩති. එහෙයින් එයද සමතික්‍රමණය වශයෙන් ප්‍රත්‍ය වේ. අවිජ්ජාව හෙයින්ම කුසලායූහනය වේ. වෙන විදියකින් නොවේ. එහි ත්‍රෛභූමික කුසලයෙහි මූලාව වශයෙන්ද සමතික්‍රමණ භාවනා වශයෙන්ද ආයූහනය ලබයි. ලෝකෝත්තරයෙහි සමුච්ඡේද භාවනා වශයෙනි. සෙස්ස කියන ලද නයෙනි. මෙය විශේෂයකි. යට එක එක කුසලයෙහි සතරවන චතුක්ක වශයෙන් නව සොලස් ලැබීය. එසේම මෙහි නොලබයි. කුමක් හෙයින්ද? අවිජ්ජාවෙන් සම්පයුත්ත අඤ්ඤමඤ්ඤ පච්චය අභාවයෙනි. උපනිස්සය වශයෙන් මෙහි පළමු චතුෂ්කයම ලබයි. එය පළමු වාරයම දක්වා සංක්ෂේප කරන ලදී. අත්හැර දැක්විය යුතුය.

## අවිජ්ජාමූලක කුසල නිද්දේසයයි.

දැන් අව්‍යාකෘතවලට වෙනත් නයකින් පච්චයාකරය දැක්වීමට කතමෙ ධම්මා අබ්‍යාකතා? යනාදිය ආරම්භ කරන ලදී. එහි කුසලමූල පච්චයා යන මෙයද උපනිස්සය පච්චය බව උදෙසා කියන ලදී. කුසල

විපාකයේ කුසල මූලයටද අකුසල විපාකයේ අකුසල මූලයටද උපනිස්සය පච්චය වේ. නානා ක්‍ෂණික කර්ම ප්‍රත්‍යයෙහි වනාහි කිවයුත්තක් නැත. එහෙයින් මේ උපනිස්සය පච්චයෙන්ද නානා ක්‍ෂණික කර්ම ප්‍රත්‍යයෙන්ද ප්‍රත්‍යය වේ. ඒ නිද්දේස වාරයෙහිම තත්‍ථ කතමං කුසලමූලං යයි නොබෙදා තත්‍ථ කතමො කුසලමූල පච්චයා සංඛාරො යයි බෙදන ලදී. අකුසල විපාකයෙහිද මෙම නයයි. අවිජ්ජාමූල කුසල නිද්දේසයෙහි මෙන්ද මෙම විපාක නිද්දේසයෙහි පළමුව පච්චය චතුක්කයම ලබයි. එයද පළමු වාරය දක්වා සංක්‍ෂේප කරන ලදී. එනිසා එක එක විපාක සිතෙහි එක එක චතුක්ක වශයෙන් කුසල මූලකයෙහි අකුසල මූලකයෙහිද නයෙහි වාරප්‍රභේද දතයුතුය. කිරිය ධර්මවල අවිජ්ජාවද කුසල අකුසල මූලද උපනිස්සය පච්චයභාවය නොලබයි. එනිසා කිරියා වශයෙන් පච්චයා කාරය නොකියන ලදී. මෙයමඃ-

කුසල'කුසල අවිය - කත දම්හි කී නෙක බේ
කුසල'කුසල විවා - යෙහි උවනිසය වසයෙන්

යළි එක අයුරු කී - බුදුහිමි පස අයුරුවන
දහම් පස බේයෙහි - නැණ බේද දනවනු වස්

දහම් අසන සිතන - වත් පිළිවෙත් වැරුවනට
නැණ බේද මෙහි එන - කිසිදිනක ද නොවේමයැ

දහම් අසන සිතන - පිළිවෙතින් සරු දිරිමත්
එය කරනු නැත අන් - කරණී එයින් බැහැරා

මෙම පච්චයාකාරය වනාහි සුත්තන්ත අභිධම්ම භාජනිය වශයෙන් දෙපරිවෘත්තයම ගෙනහැර දක්වා බෙදා දක්වන ලද්දේ වේ.

**සම්මෝහ විනෝදනී නම් විභංග අර්ථ වර්ණනාවේ සවැනි පටිච්ච සමුප්පාද විභංග නිර්දේශයයි.**

# 7.
# සතිපට්ඨාන විභංගය

ඊට අනතුරුව දැන් සතිපට්ඨාන විභංගයෙහි **චත්තාරො** යනු ගණන වෙන් කිරීමයි. එයින් අඩු හෝ වැඩි හෝ නැතැයි සතිපට්ඨාන ප්‍රමාණය දක්වයි. **සතිපට්ඨාන** යනු සතිපට්ඨාන තුනක් සිහියට ගෝචරය. සාවකයන් අතර තුන් ආකාරයකින් පිළිපන් සාධකයන් කෙරෙහි ගැටීම් ඇලීම් ඉකුත් වූ කල්හි. මහණෙනි, සතර සතිපට්ඨානවල පහළවීමද නොපෙනී යාම ද දේසනා කරමි. එය හොඳින් අසා සිතේ දරාගන්න. මහණෙනි, කයෙහි පහළවීම කුමක්ද? ආහාරය ඇතිවීමෙන් කය ඇතිවේ යයි යන ආදියේ සිහියට ගෝචර වූ සතිපට්ඨාන යයි කියනු ලැබේ. එසේම "කය වැටහීම, සිහි නැති, සිහි එළඹීම සිහිය"යි යන ආදියෙහි ඒ අර්ථය පිහිටියේ මෙහි යයි. කුමක් පිහිටියේද? සිහියයි. සිහියේ පිහිටීම සතිපට්ඨානයයි. සතිපට්ඨාන තුන ආර්යයෝ සේවනය කරති. ආර්යයන් සේවනය කරන ලද එය ශාස්තෲන් වහන්සේ සමූහයයි අනුශාසනා කිරීම සුදුසුය. යන මෙහි තුන් ආකාරයකින් පිළිපන් ශ්‍රාවකයන් කෙරෙහි ගැටීම් ඇලීම් ඉක්මවූ බව සතිපට්ඨානය කියන ලදී. ඒ අර්ථය සඳහා පිහිටුවීම පට්ඨානයයි. පැවැත්විය යුතුය යන අර්ථයයි. කුමකින් පිහිටවිය යුතුද? සිහියෙන්, සිහියෙන් පිහිටුවීම සතිපට්ඨානයයි. සතර සතිපට්ඨානය වඩන්නේ පුළුල් කරන්නේ සත්ත බොජ්ඣංග සම්පූර්ණ කරයි ආදියෙහි සිහියට සතිපට්ඨාන යයි කියනු ලැබේ. එම අර්ථය පිහිටියේනුයි පට්ඨාන, වැටහේ, දුව පැන පවත්වයි යන අර්ථයයි. සිහියම පිහිටුවීම් අර්ථයෙන් සතිපට්ඨාන වේ. නැතහොත් සිහිකිරීමේ අර්ථයෙහි සති වේ. වැටහීම් අර්ථයෙන් පට්ඨාන වේ. මෙසේ සතියද එය වැටහීම්ද සතිපට්ඨාන වේ. මෙය මෙහි අදහස් කරයි. කුමක් හෙයින් සතිපට්ඨාන යයි බහු වචන කෙළේද? සිහියේ බහුල බව, අරමුණුවල බේදයෙන් සිහිය බොහෝ වේ.

භාග්‍යවතුන් වහන්සේ විසින් අඩුවැඩි නොවී සතිපට්ඨාන සතරක්ම දේශනා කරන ලද්දේ ඇයි? අවබෝධ වන්නවුන්ගේ හිත පිණිසය. තණ්හා චරිත දිට්ඨි චරිත සමථයානික විපස්සනා යානිකයන් අතර මන්ද තියුණු වශයෙන් දෙපරිදි ලක්‍ෂණ තිබේ. මන්ද තණ්හා චරිතයට ඕලාරික වූ කායානුපස්සනා සතිපට්ඨානයද විසුද්ධිය පිණිස මාර්ගය වේ. සියුම් තණ්හා චරිතයාට සියුම් වූ වේදනානුපස්සනා සතිපට්ඨානයද මන්ද වූ දිට්ඨි චරිතයාව අතිප්‍රභේද නැති චිත්තානුපස්සනා සතිපට්ඨානය ද සියුම්

දිට්ඨි චරිතයාට සියුම් වූ අතිප්‍රභේද වූ ධම්මානුපස්සනා සතිපට්ඨානයද විසුද්ධිය පිණිස මාර්ගය වේ. මන්ද වූ සමථයානිකයාට පහසුවෙන් අවබෝධ කළයුතු පළමුවන සතිපට්ඨානයද තියුණු වූ සමථයානිකයාව ඕලාරික අරමුණෙහි පිහිටිය නොහැකි නිසා දෙවන සතිපට්ඨානයද මන්ද වූ විපස්සනායානිකයාට අතිප්‍රභේද රහිත වූ අරමුණ වන තුන්වන සතිපට්ඨානයද තියුණු වූ විපස්සනායානිකයාව අතිප්‍රභේද සහිත අරමුණ වන සතරවන සතිපට්ඨානයද විසුද්ධිය පිණිස මාර්ගය වේ. මෙසේ අඩු වැඩි නැතිව සතරක්ම කියන ලදී. සුබ සුව නිත්‍ය යයි ගන්නා ආත්ම විපර්යාසය දුරුකිරීම සඳහා හෝ කය අසුභය, එහි සුභ වශයෙන් ගන්නා විපර්යාසයෙන් සත්වයෝ යුක්තයහ. ඔවුන්ට එහි අසුභ භාවය දැක්වීමෙන් ඒ විපර්යාසය දුරුකිරීම පිණිස පළමුවන සතිපට්ඨානය දේශනා කරන ලදී. සුබය නිත්‍යය ආත්ම යයි ගත්තවුන්ගේද වේදනාව දුකය සිත අනිත්‍යය ධර්ම අනාත්මය. මේවා සුබ නිත්‍ය ආත්ම වශයෙන් ගත්තවුන්ගේද ඒ විපර්යාස ග්‍රහණය දුරුකිරීම සඳහා සෙසු වේදනාදි සතිපට්ඨාන තුන දේශනා කරන ලදී. මෙසේ සුබ සුව ආත්ම විපර්යාසය දුරුකිරීම සඳහා අඩු වැඩි නොවන සේ සතිපට්ඨාන සතරක් දේශනා කරන ලදැයි දතයුතුය. හුදෙක් ඒ විපර්යාශයම ප්‍රහානය කිරීම පිණිස පමණක් නොව කාමාදි ඕඝ සතර, යෝග සතර, ආසව, ග්‍රන්ථ, උපාදාන, අගති ප්‍රහාණය කිරීම පිණිසද චතුර්විධ ආහාර දැනගැනීම පිණිසද සතරක්ම කියන ලදැයි දතයුතුය. මෙය ප්‍රකරණ නයයි.

අටුවාවල වනාහි සිහිකිරීම් වශයෙන් ද ඒකාර්ථයකට රැස්කිරීම් වශයෙන් ද එකම සතිපට්ඨානය අරමුණු වශයෙන් සතරක් යයි මෙයම කියන ලදී. යම්සේ වාසල් දොරටු සතරක් ඇති නගරයෙහි නැගෙනහිර දොරටුවෙන් නගරයට පිවිසෙති. එසේම දකුණු බටහිර උතුරු දෙසින් එන්නෝ ද ඒ ඒ දිසාවේ දොරටුවලින් නගරයට පිවිසෙති. නිවන නගරය මෙනි. අට්ඨංගික මාර්ගය නගර දොරටු මෙනි. කායාදි අනුපස්සනා නැගෙනහිර ආදී දිසා මෙනි. නැගෙනහිර දෙසින් එන අය නැගෙනහිර උපදවන භාණ්ඩ රැගෙන නැගෙනහිර දොරටුවෙන් නගරයට පිවිසෙනවා මෙන් කායානුපස්සනාව වඩන්නෝ තුදුස්වැදෑරුම් කායානුපස්සනාව වඩා කායානුපස්සනා භාවනානුභාවයෙන් නිපන් ආර්ය මාර්ගයෙන් එකම නිවනට බැසගනිති. දකුණු දෙසින් පැමිණෙන්නන් දකුණු දෙස උපදවන භාණ්ඩ රැගෙන දකුණු දොරටුවෙන් නගරයට පිවිසෙන්නාක් මෙන් වේදනානුපස්සනා අරමුණින් එන්නෝ නවවිධ වූ වේදනානුපස්සනාව වඩා වේදනානුපස්සයා භාවනා ආනුභාවයෙන් නිපන් ආර්ය මාර්ගයෙන්

එකම නිවනට පැමිණෙති. බටහිර දිසාවෙහි පැමිණෙන්නෝ බටහිර දිසාවේ හටගන්නා භාණ්ඩ රැගෙන බටහිර දොරටුවෙන් නගරයට පිවිසෙන්නාක් මෙන් චිත්තානුපස්සනා මුඛයෙන් පැමිණෙන්නෝ සොළොස් ආකාර වූ චිත්තානුපස්සනාව වඩා චිත්තානුපස්සනා භාවනා ආනුභාවයෙන් නිවන් ආර්ය මාර්ගයෙන් එකම නිවනට පැමිණෙති. උතුරු දෙසින් එන්නෝ උතුරුදෙස උපදවන භාණ්ඩ රැගෙන උතුරු දොරටුවෙන් නගරයට පිවිසෙන්නා මෙන් ධම්මානුපස්සනා මුඛයෙන් පැමිණෙන්නෝ පස් ආකාර වූ ධම්මානුපස්සනා භාවනාව වඩා ධම්මානුපස්සනා භාවනා ආනුභාවයෙන් නිපන් ආර්ය මාර්ගයෙන් එකම නිවනට පැමිණෙති. මෙසේ සිහිකිරීම් වශයෙන් ද ඒකාර්ථ වූ රැස්වීම් වශයෙන් එකම වූ සතිපට්ඨානය අරමුණු වශයෙන් සතරක් දේශනා කරන ලදැයි දතයුතුය.

ඉධ භික්ඛු යන මෙහි භාග්‍යවතුන් වහන්සේ විසින් දෙව්ලොව හිඳ මේ සතිපට්ඨාන විභංගය දේශනා කරන ලදී. එකම භික්ෂූන් වහන්සේ නමක්වත් එහි භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි සිටියේ නැත. එසේ ඇතිකල්හි මේ සතර සතිපට්ඨානයෙහි භික්ඛු වෙති. මේවා භික්ෂූන් වහන්සේට ගෝචර බැවින් ඉධ භික්ඛූ යයි ආමන්ත්‍රණය කර ඇත. මෙම සතිපට්ඨානවල භික්ෂූන් වහන්සේ පිරිසක්ම සිහිපත් කළේ ඇයි? භික්ෂුණීන් ආදීන් සිහිපත් නොකළේ ඇයි? භික්ෂුණී ආදීහුද සිහිපත් කරති. භික්ෂූහු අග්‍ර පිරිස වෙති. අග්‍ර පිරිස නිසා මෙහි භික්ඛූ යන ආමන්ත්‍රණය කරයි. ප්‍රතිපත්ති වශයෙන් භික්ෂුභාවය දක්වමින් මෙසේ කීහ. යමෙක් මේ පිළිවෙත්හි පිළිපදිත්ද? ඒ භික්ෂු නම් වේ යයි පිළිපන් අය දෙවියා හෝ මනුෂ්‍යයෙක් හෝ භික්ෂූන්ගේ සංඛ්‍යාවට යයි යම්සේ කීහ :-

විබූසනෙන් මුත් හැසිරෙන්නෙනම්'තුම්
සන් සුන් වූ සිත් නිය මෙන් දම් විහාරී
ඒ සව් සතුන් වෙත් මෙතපා අහිංසා
වෙන් යුත් බඹාපුත් සමණාද බික් වේ

අජ්ඣත්තං යනු තමාගේ අජ්ඣත්තය අදහස් කරයි. එනිසා අජ්ඣත්තං කායෙ යනු තමාගේ ශරීරය යන අර්ථ වේ. එහි කායෙ යනු රූප කයයි. රූප කයෙහි මෙහි කේසාදී අඟපසඟවල සමූහාර්ථයෙන් ඇත්කය අස්කය රථකය ආදිය මෙන් කය යයි අදහස් කරයි. සමූහ අර්ථයෙන් මෙසේ පිළිකුල් වූ කේසාදීන්ගේ එකතුවීම අර්ථයෙන් පිළිකුල් බවද අතිශයින් පිළිකුල් කටයුතු දේ එක්වීමද කය වේ. කය අනුව බලනවා

කාය යයි කියාත් නැවත කායානුපස්සී යයි දෙවනුවත් ගැනීම අසම්මිශ්‍ර වශයෙන් නියම ඝන වෙන්වීම් ආදිය දැක්වීම සඳහා කරන ලදැයි දතයුතුය. එයින් කයෙහිම යන තේරුම මිස වේදනා චිත්ත ධම්ම අනුපස්සනාවල නොවේ.

ඉක්බිතිව කායෙ කායානුපස්සී යෙව යයි කාය සංඛ්‍යාත කායානුපස්සනාව කිරීම දැක්වීමෙන් අසම්මිශ්‍ර වශයෙන් නියමය දක්වන ලදී. එසේ කයෙහි අඟපසඟ වෙන්වූ එක් කොටසක් නොවේ. කෙස් ලොම් ආදිය වෙන්වූ ස්ත්‍රී පුරුෂයන් දැකීමක් නොවේ. මෙහි කෙස් ලොම් ආදි භූත උපාදාය රූප සමූහයෙන් කාය වේ. එහිද භූත උපාදාය රූප සමූහයෙන් වෙන්වූ එක් කොටසක් බැලීම නොවේ. නැවත රථයක උපකරණ රාශිය දකින්නාක් මෙන් අඟපසඟ සමූහය දැකීමය. නගරයක අවයව දකින්නෙකු මෙන් කෙස් ලොම් සමූහය දැකීමය. කෙසෙල් කඳක අතු පතුරු වෙන් කරන්නෙකු මෙන් හිස්වූ මිට දිගහැර පෙන්වන්නකු මෙන්ද භූත උපාදාය රූප සමූහය දැකීමම යයි නොයෙක් අයුරින් සමූහ වශයෙන් වූ ශරීර සංඛ්‍යාත වස්තුව දැකීමෙන් ඝනය වෙන්වීම දකින ලද්දේ වේ. මෙහි කියන ලද සමූහයෙන් වෙන්වූ කයක් හෝ ස්ත්‍රියක් හෝ පුරුෂයෙක් හෝ වෙනත් අයෙක් හෝ නොමැති වේ. කියන ලද ධර්ම සමූහ මාත්‍රයෙහිම ඒ ඒ සත්වයෝ වැරදි ලෙස දකිති. එය පුරාණ ඇදුරෝ කීහ.

පෙනෙන දේ නොදකී - දකින දේ නොපෙනේමය
මුළාවී බැඳෙනා - නොමිදේය බැඳුමෙන් මේ

ඝන වූ එකට බැඳුණු දේ යනාදිය දැකීම සඳහා යයි කියන ලදී. මේ ආදි ශබ්දයෙන් මේ අර්ථයද දතයුතුය. මෙය මේ කයෙහි කායානුපස්සනාවමය. අනිත් ධම්මානුපස්සී නොවේ යයි කුමක් කියන ලදද? යම්සේ ජලය නැතිවුවද මිරිඟුවෙහි ජලය දකින්නේ වේ. මෙසේ අනිත්‍ය දුක්ඛ අනාත්ම අසුභ වූ මේ ශරීරයෙහි නිත්‍ය සුඛ ආත්ම සුභ බවක් නොපෙනේ යයි කියන ලද්දේ වේ. තවද මේ මහා සතිපට්ඨානයෙහි "මහණෙනි, මෙහි භික්ෂූන් වහන්සේ නමක් ආරණ්‍යයට ගියේ........හෙතෙම සිහියෙන්ම ආශ්වාස කෙරේ" ආදි නයින් ආශ්වාස ප්‍රශ්වාසාදි අණුවලින් හටගෙන ඇටවලින් අවසාන වන කය කියන ලදී. යමෙක් මේ පොළොව නැමති කය අනිත්‍ය වශයෙන් බලයි. එසේම ආපෝ කය තේජෝ කය වායෝ කය කේස කය ලෝම ඡවි මංස රුහිර නහරු අට්ඨි අට්ඨි මිඤ්ජ

කායයන් පටිසම්භිදාවෙහි කාය යයි කියන ලදී. ඒ සියල්ල මෙම කායයෙහි අනුපස්සනා වශයෙන කයෙහි කායානුපස්සී හැර මෙසේ ද අර්ථය දතයුතුය. එසේ නැතහොත් කයෙහි මමය මාගේ යයි අනුපස්සනා රහිතව ගත් කිසිවෙකුට හෝ ඒ ඒ කේස ලෝමාදි ධර්ම සමූහය අනුපස්සනා වශයෙන් කයෙහි කේසාදි ධර්ම සමූහ සංඛ්‍යාතය කායානුපස්සී යයි මෙසේ අර්ථය දතයුතුය. තවද මේ කයෙහි නිත්‍ය වශයෙන් නොව අනිත්‍ය වශයෙන් අනුපස්සනා කෙරෙයි යන ආදි අනුක්‍රමයෙන් පටිසම්භිදායෙහි නයේ සියළු අනිත්‍ය ලක්‍ෂණාදි ආකාර සමූහ සංඛ්‍යාත කයෙහි කායානුපස්සනා වශයෙන් ද කායෙ කායානුපස්සී යයි මෙසේද අර්ථය දතයුතුය. එසේ මේ කයෙහි කායානුපස්සනා ප්‍රතිපදාවට පිළිපන් යෝගාවචරයා (භික්ඛු) මෙම කය අනිච්ච අනුපස්සනාදීන් හෝ සත් අනුපස්සනා වශයෙන් නිත්‍ය වශයෙන් නොව අනිත්‍ය වශයෙන් බලන්නේය. සුඛ වශයෙන් නොව දුක් වශයෙන් බලන්නේය. ආත්ම වශයෙන් නොව අනාත්ම වශයෙන් බලන්නේය. සතුටුවීම් වශයෙන් නොව කලකිරීම් වශයෙන් බලන්නේය. ඇලීම් වශයෙන් නොව නොඇලීම් වශයෙන් බලන්නේය. සමුදය වශයෙන් නොව නිරෝධ වශයෙන් බලන්නේය. ගැනීම් වශයෙන් නොව හැරදැමීම් වශයෙන් බලන්නේය. හෙතෙම එය අනිත්‍ය වශයෙන් බලන්නේ නිත්‍ය සංඥාව දුරුකරයි. දුක් වශයෙන් බලන්නේ සුඛ සංඥාව දුරුකරයි. අනාත්ම වශයෙන් බලන්නේ ආත්ම සංඥාව දුරුකරයි. කළකිරෙන්නේ තෘෂ්ණාව දුරුකරයි. විරාග වන්නේ රාගය දුරුකරයි. නිරෝධ වන්නේ සමුදය දුරුකරයි. අත්හරින්නේ ගැනීම දුරුකරයි යයි දතයුතුය.

**විහරති** යනු සතර ඉරියව්වලින් එක්තරා ඉරියව්වකින් යුක්ත වූයේ යයි මෙය දක්වයි. ඉරියාපථ බාධනය වෙනත් ඉරියව්වක් සිඳ වැටෙන ශරීරය ගනියි පවත්වයි යන අර්ථයයි. **බහිද්ධ කායෙ** යනු අන්‍යයාගේ කයෙහි **අජ්ඣත්ත බහිද්ධකායෙ** යනු කලක තමාගේ කයෙහි කලක අනුන්ගේ කයෙහි. පළමු නයෙහි තමාගේ කයෙහි කය විමසීම කියන ලදී. දෙවන නයෙන් අනුන්ගේ කයෙහි පරීක්‍ෂා කිරීම කියන ලදී. තුන්වන නයෙන් කලක තමාගේ කයෙහි කලක අනුන්ගේ කයෙහි කාය පිරික්සීම කියන ලදී. අජ්ඣත්ත බහිද්ධා වනාහි ගැටුණු අරමුණක් නැත. කර්මස්ථානය ප්‍රගුණ වූවහුට එහා මෙහා සක්මන් කරන කාලය මෙහි කියන් ලදී. **ආතාපී** යනු කය පිරිසක්සන වීර්යයෙන් යුක්ත යයි මෙය දක්වයි. හේ ඒ කාලයෙහි ඒ මේ වීර්යයෙන් භවත්‍රයෙහි කෙලෙසුන්ගේ තැවීම් වශයෙන් ආතාප යයි කියනු ලැබේ. එයින් යුක්ත වූයේ ආතාපී

යයි කියනු ලැබේ. **සම්පජ්ජතා** යනු කය පිරික්සන මනා දැනීම් සහිත ඤාණයෙන් යුක්ත වූයේ යන තේරුමය. **සතිමා** යනු කය පිරික්සන සිහියෙන් යුක්ත වූයේ මේ සිහියෙන් අරමුණු පිරික්සා ප්‍රඥාවෙන් විමසා බලයි. සිහියෙන් තොර අනුපස්සනයක් නැත. එහෙයින් කීහ. මහණෙනි, සිහිය වනාහි සියල්ලම ඇත්තෙකෙයි කියමි" එහෙයින් මෙහි **කායෙ කායානුපස්සී විහරති** යන මෙපමණකින් කායානුපස්සනා සතිපට්ඨාන කර්මස්ථානය කියන ලද්දේ වේ. එසේ වවත් කෙලෙස් තවන වීර්යයෙන් යුක්ත නොවූ යෝගාවචරයාගේ සංක්ෂේප වූ කෙළවර අනතුරු ඇති කරයි. උපාය පිරික්සීමෙහි උපාය පිරික්සීම දුරුකරන, නොදැනීම් ඇති යෝගාවචරයා මුළාවෙයි. උපාය අත්හැරීමෙහි සිහිමුළාවද උපාය පිරික්සීමෙහි අසමර්ථ වෙයි. එහෙයින් ඔහුට මෙම කර්මස්ථානය සිදු නොවේ. එය දැක්වීම සඳහා ආතාපී සම්පජානො සතිමා යන මෙය කියන ලදැයි දතයුතුය. මෙසේ කායානුපස්සනා සතිපට්ඨාන සංයෝගයද පෙන්වා ඇත. පහකළයුතු අංග දැක්වීම **විනෙය්‍ය ලොකෙ අභිජ්ඣා දොමනස්සං** යයි කියන ලදී. එහි විනෙය්‍ය යනු තදංග විනයෙන් හෝ විෂ්කම්භන විනයෙන් හෝ හික්මවා ලොකෙ යනු මෙහි ඒ අජ්ඣත්ත භේද කයම ගන්නා ලදී. ඉධ ලොකෙ නම් ඒ ලෝකයෙහි. අභිද්‍යා දොම්නස් විනෝදනය කොට (දුරුකොට) යන අර්ථයයි. මෙහි වනාහි අභිජ්ඣා ගැනීමෙන් කාමච්ඡන්දය ද දෝමනස්ස ගැනීමෙන් ව්‍යාපාදය ද සංග්‍රහ කෙරේ. එහෙයින් නීවරණයට ඇතුළත් බලවත් දහම් දෙක දැක්වීමෙන් නීවරණ ප්‍රහානය කියන ලද්දේ යයි දතයුතුය. මෙහි විශේෂයෙන් අභිද්‍යා විනෝදනයෙන් කය සම්පත් මූලික එකඟකමද දොම්නස් විනෝදනයෙන් කය විපත් මූලික විරෝධයද අභිද්‍යා විනෝදනයන් කය ඇල්මද දොම්නස් විනෝදනයෙන් කාය භාවනාවෙහි නොඇල්මද අභිද්‍යා විනෝදනයෙන් කයේ නැති සුබ සුව ආදියේ ප්‍රතික්ෂෙපයද දොම්නස් විනෝදනයෙන් කයෙහි ඇති අසුබ අසුව ආදියේ අත්හැරීමේ ප්‍රහානයද කියන ලදී. එයින් යෝගාවචරයාගේ යෝගානුභවයද යෝග සාමර්ථ්‍යද දක්වන ලදී. යෝගානුභවයෙහි මෙය එකඟවීම් විරෝධයෙන් මිදෙන්නේ නොඇල්මෙහි ඇලී නොවීම් හැර වීම් අත්හැරීම් විරහිතද වේ. එකඟවීම් විරෝධ වෙන්වීම්ද මෙය අරතිරති සහො වේ. නොවීම නොදමා, වීමද ඉවත් නොකරමින් යෝග සමර්ථය වේ. තව නයක්, **කායෙ කායානුපස්සී** යන මෙහි නුවණින් බැලීම සඳහා කර්මස්ථාන කියන ලදී. **විහරති** යන මෙහි කියන ලද විහරණයෙන් කමටහන් ගත් යෝගාවචරයාගේ කයේ පරිහරණයයි. **ආතාපී** යනාදියෙහි තැවීමේ ප්‍රධන්

වීර්යය, සිහි කල්පනාවෙන් කමටහනින් හැමතැනම. කමටහන පරිහරණය කරන උපාය හෝ සිහියෙන් හෝ කායානුපස්සනා වශයෙන් පිළිලැබූ සමථය දැකීම විදර්ශනාව අභිජ්ඣා දෝමනස්ස විනයෙන් (හික්මීමෙන්) භාවනාවේ ප්‍රතිඵල කියන ලදැයි දතයුතුය.

**මෙය කායානුපස්සනා සතිපට්ඨානාවෙහි අනුද්දේස වර්ණනාවයි.**

වේදනානුපස්සනා සතිපට්ඨාන උද්දේසාදියෙහිද අජ්ඣත්තාදිය කියන ලද නයින්ම දතයුතුය. මේවායෙහි ද තමාගේ වේදනාදියෙහි අනුන්ගේ වේදනාදියෙහි කලක තමා කලක අනුන්ගේ වේදනාදියෙහි යයි තුන් ආකාර විමසීම කියන ලදී. වේදනාසු **වේදනානුපස්සී** යනාදියෙහිද වේදනාදියේ නැවත වචනයෙහි ප්‍රයෝජන කායානුපස්සනවේ කී නයින් දතයුතුය. **වේදනාසු වේදනානුපස්සී චිත්තෙ චිත්තානුපස්සී ධම්මෙසු ධම්මානුපස්සී** යන මෙහි වෙදනා යනු තුන් වේදනාය. එයද ලෞකිකය. සිතද ලෞකිකය. ධර්මයද එසේය. ඒවායෙහි විභාගය නිද්දේස වාරයෙහි ප්‍රකට වන්නේය. මෙහි හුදෙක් වේදනාව යම්සේ විමසිය යුතුද එසේ විමසන්නේ වේදනාසු වේදනානුපස්සී යයි දතයුතුය. චිත්ත ධර්ම කෙරෙහිද මෙම නයයි. වේදනාව විමසිය යුත්තේ කෙසේද යන සැපය වේදනාවන්නේ දුකකිනි. දුකක් වන්නේ උලකිනි. අනිත්‍යයෙන් අදුක්ඛමසුඛ වේ. යම්සේ කීහ.

**සැප දුක සේ දකින - දුක දකින්නා උල සේ**
**අනිසයි අදුක්සුව - නැණසින් දකින එය නම්**
**ඇති හරි දැකුම බිකු - හැසිරෙයි උපසාන්තව**

සියළු චේතනා දුකයයි විමසිය යුතුය. මෙය කියන ලදී. "විඳින යම්කිසිවක් වේනම් ඒ සියල්ල දුක් යයි කියමි." යන සැප දුක් වශයෙන් විමසිය යුතුය. යම්සේ කීහ. "සැපවේදනා පවතිනවිට සැපය. වෙනස් වනවිට දුකය" සියල්ල විස්තර කළ යුතුය. තවද අනිත්‍යාදි සත අනුපසසනා වශයෙන් විමසිය යුතුය. සෙස්ස නිද්දේස වාරයෙහි ප්‍රකට වන්නේය. චිත්ත ධම්ම දෙකෙහිද සිත ආරම්මණ අධිපති සහජාත භූමි කම්ම විපාක කිරිය ආදි නොයෙක් බේද අනිච්චාදි අනුපස්සනාවන්ගේ නිද්දේස වාරයෙහි එනසරාග ආදි බේද වශයෙන් විමසිය යුතුය. ධම්ම ස්වලක්‍ෂණ සාමඤ්ඤ ලක්‍ෂණ (ප්‍රතිඵල) වල ශූන්‍යතාව ධර්මයේ අනිත්‍යාදි සත්

අනුපස්සනා නිද්දේස වාරයෙහි එන සාන්ත අසාන්ත ආදි භේද වශයෙන් විමසිය යුතුය. සෙස්ස කියන ලද නය අනුවය. මෙහි කාමයද යමෙකුගේ කාය සංඛ්‍යාත ලෝකයෙහි අභිද්‍යා දොම්නස් ප්‍රහීනද ඔහුගේ වේදනාදි ලෝකයෙහිද එය ප්‍රහීනම වේ. එයින්ම එහි ප්‍රහාන දැක්වීම් අර්ථයද මෙසේ කියන ලදැයි දතයුතුය.

උද්දේශවාර කථාව අවසානය.

දැන් යම්සේ දක්ෂ කුළුපොත්තෙක් (උණ පතුරු ආදියෙන් බඩු සදන්නකු) මහත් කලාල මෘදු කලාල කුඩා පෙට්ටි පෙට්ටි ගොටු ආදි උපකරණ සෑදීමට කැමතිව එක් මහා උණගසක් ලැබ හතරට කපා ඒවායින් එක් එක් උණ කැබලි ගෙන පලා ඒ ඒ උපකරණ කරන්නේය. යම්සේ වනාහි දක්ෂ රන්කරුවෙක් නොයෙක් ආකාර වූ පැළඳීම් කරනු කැමතිව ඉතා පිරිසිදු රන් ගුලියක් ලැබ හතරට බිඳ ඒවායින් එක් එක් කොටස ගෙන ඒ ඒ පැළඳීම් කරන්නේය. එසේම භාග්‍යවතුන් වහන්සේ සතිපට්ඨාන දේශනාවෙන් සත්වයින්ට නොයෙක් ආකාර වූ විශේෂ අධිගමය ලබාදෙනු කැමැත්තේ එකක්ම වූ සම්මා සතිය සතර සතිපට්ඨානය, "මෙහි භික්ෂුව තමාගේ කයෙහි කය අනුව විමසන්නේ වාසය කරයි" ආදි නයින් අරමුණු වශයෙන් සතරකට බෙදා එක් එක් සතිපට්ඨානය ගෙන බෙදන්නේ - **කථඤ්ච භික්ඛු අජ්ඣත්තං කායෙ** යනාදි නයින් නිද්දේස වාරය කීමට ආරම්භ කරන ලදහ. එහි **කථඤ්ච** ආදිය විස්තර කිරීමට කැමතිව අසන ලදී. මෙය එහි සංක්ෂෙපාර්ථය වේ. කුමන ආකාරයකින් කුමන ප්‍රකාරයකින් භික්ෂුව තමාගේ කයෙහි කය අනුව විමසමින් වාසය කෙරේද සෙසු ප්‍රශ්න වාරයෙහිද මෙම නයයි. **ඉධ භික්ඛු** යනු මෙම ශාසනයෙහි භික්ෂුව. මෙහි ඉධ ශබ්දය අජ්ඣත්තාදි වශයෙන් සියළු ආකාර කායානුපස්සනාවෙහි යෙදෙන පුද්ගලයාට ඊට නිශ්‍රය වන ශාසනය දැක්වීම අන්‍ය ශාසනවල එසේ නොමැතිවීම නිසා අත්හැරීමය. මෙය කියන ලදී "ඉධෙව භික්ඛවෙ සමණො...... සුඤ්ඤා පරප්පවාදා සමණෙහි අඤ්ඤෙ" මහණෙනි, මෙහිම ශ්‍රමණ........අන්‍ය වාදවල (සාසනවල) ශ්‍රමණයන්ගෙන් ශූන්‍ය වේ. එනිසා මෙම සසුනෙහි භික්ෂූන් යයි කියන ලදී. **අජ්ඣත්තං කායං** යනු තමාගේ කයයි. **උද්ධං පාදතලා** යනු පාදතලයෙන් උඩ. **අධො කෙසමත්ථකා** යනු කෙස් අග සිට යටට. **තච පරියන්තං** යනු හරහට සම අවසන් කොට. **පූරං නානප්පකාරස්ස අසුචිනො පච්චවෙක්ඛති** යනු නානාප්‍රකාර කෙස් ආදි

අසූචියෙන් බර වූ මෙම ශරීරයයි බලයි. කෙසේද? **අත්‍ථි ඉමස්මිං කායෙ කෙසා........ මුත්තං** එහි **අත්‍ථි** යනු විද්‍යමාන වේ. **ඉමස්මිං** යනු එය පාදාන්තයේ සිට ඉහළට කේසාන්තයේ සිට පහළට සම කෙළවර කොට හරහට නානාප්‍රකාර අසූචිවලින් පිරුණේ යයි කියනු ලැබේ. **කායෙ** ශරීරයෙහි. ශරීරය වනාහි අසූචි රැස්වීමෙන් පිළිකුල් වූ කෙස් ආදියද චක්ඛු රෝගාදි රෝග සිය ගණනක් එකතු වූ නිසා කාය කාය යයි කියනු ලැබේ. **කෙසා ලොමා** යන මේ කෙස් ආදිය දෙතිස් ආකාරය. එහි මේ ශරීරයෙහි කෙස් ඇත. මේ ශරීරයෙහි ලොම් ඇත යයි සම්බන්ධය දතයුතුයි. මෙහි පාවලින් උඩ කෙස්වලින් යට සම්බන්ධව හරහට මෙපමණ වූ බඹයක් පමණ කලේබරයෙහි (සිරුරෙහි) සියළු ආකාරයෙන් සියළු ආකාරයෙන්ම සොයන්නේ කිසියම් මුතුවක් හෝ මැණිකක් හෝ වෛදූරයක් හෝ අගිල් හෝ කොකුම් හෝ කපුරු හෝ සුවඳ සුණු ආදියක් හෝ කිසිවෙක් නොදකිති. අනුමාත්‍ර පිරිසිදු බවක්වත් නොදකිති. දැඩි දුර්ගන්ධය පිළිකුල් සහගත බව නොයෙක් ආකාර අප්‍රිය දර්ශන වූ කෙස් ලොම් ආදියෙන් යුත් අසූචිම බලයි. එයින් කියන ලදී. අත්‍ථි ඉමස්මිං කායෙ කෙස් ලොමා.. මුත්තංති මෙය පද සම්බන්ධ වර්ණනාවය.

මෙම කර්මස්ථානය වඩා රහත්භාවයට පැමිණීමට කැමතිවන කුලපුත්‍රයා විසින් මුලින්ම චතුර්විධ වූ සීලය පිරිසිදු කොට සුපිරිසිදු සීලයෙහි පිහිටා දස පලිබෝධවලින් බාධක තිබේ නම් ඒවා දුරුකොට පිළිකුල් මෙනෙහි කරන කමටහන් භාවනාවෙන් පළමුවන ධ්‍යානය උපදවා ධ්‍යානය පාදක කරගෙන විපස්සනාව පටන්ගෙන, අරහත්ත අනාගාමි ඵලාදියට හෝ අන්‍ය පලයකට පැමිණීම හෝ යටත් පිරිසෙයින් අටුවා සහිත පෙළ පුරුදු පුහුණු කළ පාලි ආචාර්ය කල්‍යාණ මිත්‍රයකු සමීපයෙහි උගතයුතුය. විසුද්ධ වූ එබඳුරූප වූ කල්‍යාණ මිත්‍රයකු තමා වසන ස්ථානයේ නොලැබෙනවා නම් එබඳු උත්තමයකු වසන ස්ථානයට ගොස් ඉගෙනගත යුතුය චතුර්විධ සීල විසෝධනයද පළිබෝධ ද පළිබෝධ උපච්ඡේදයද ආචාර්යවරයකු ලඟට එළඹෙන විධානයද යන සියල්ල විසුද්ධි මාර්ගයෙහි (එනම් ග්‍රන්ථය) විස්තර වශයෙන් කියන ලදී. එනිසා එහි කියන ලද නයින්ම දතයුතුය. කර්මස්ථාන කියන ආචාර්යවරයා විසින් තුන් ආකාරයකින් කර්මස්ථාන කිවයුතුය. සමහර භික්ෂු කෙනෙකුන් ප්‍රකෘතියෙන්ම ඉගෙන ගන්නා ලද කර්මස්ථාන ඇත. ඔහුට වරක් දෙවරක් හිඳගෙන සිටිනවිට සජ්ඣායනය කරවා කිවයුතුය. සමහර කෙනෙකුන් ආචාර්යවරයා ලඟ වාසයකොට ඉගෙනගනු කැමති වේ. ඔහුට වැඩි

විස්තරත් නැති සංක්ෂේපත් නැතිව අවුල්හැර ගැට හැර කර්මස්ථානය කිවයුතුය කියන්නහු විසින් කුමක් කිවයුතු වන්නේද? සත්ආකාර වූ ග්‍රහණය කරගැනීමේ දක්ෂතාද දසආකාර වූ මෙනෙහි කිරීමේ දක්ෂතාද කිවයුතුය. එහි වචනයෙන්, මනසින්, වර්ණයෙන්, සටසණින්, දිසාවෙන්, අවකාශයෙන්, පරිච්ඡේදයෙන් යයි මෙසේ සත්ආකාර ග්‍රහණ දක්ෂතා කිවයුතුය. මෙම පිළිකුල් කර්මස්ථානයෙහි යමෙක් ත්‍රිපිටකවේද ඔහු විසින්ද මෙනෙහි කරන කාලයෙහි පළමුව වචනයෙන් සජ්ඣායනය කළයුතුය. සමහර කෙනෙකුට සජ්ඣායනය කරනවිට කර්මස්ථානය (වැටහේ) ප්‍රකට වේ. කඳුරටවාසී මහාදේව මහතෙරුන් වහන්සේගේ සමීපයෙහි කමටහන් උගත් ස්ථවිරයන් වහන්සේලා දෙනම මෙන්, කර්මස්ථාන ඉල්ලා සිටි උන්වහන්සේලාට ආචාර්යවරයා මාස හතරක් මෙම කර්මස්ථානය කරන්න යයි දෙතිස්ආකාර වූ මෙම කර්මස්ථානයේ පෙළ දුන්නේය. උන්වහන්සේලාට සූත්‍රපිටකයෙන් නිකාය ග්‍රන්ථ දෙක තුනක් ප්‍රගුණය (පාඩම් ඇත) ගරුකටයුතු ආචාර්යවරයකුගෙන් ගත් බැවින් හාරමාසයක් තුළ ද්වත්තිංසාකරය (කර්මස්ථානය) සජ්ඣායනා කරද්දීම සෝතාපන්න භාවයට පත්වූහ. එනිසා කමටහන් දෙන ආචාර්යවරයා විසින් පළමුව වචනයෙන් සජ්ඣායනය කරන්න යයි අන්තේවාසිකයාට කිවයුතුය. සජ්ඣායනා කරන්නා විසින්ද තච පංචකාදිය සීමා කරගෙන අනුලෝම ප්‍රතිලෝම වශයෙන් සජ්ඣායනා කළයුතුය.

කෙසා, ලොමා, නඛා, දන්තා, තචො කියා නැවත ප්‍රතිලෝම වශයෙන් තචො, දන්තා, නඛා, ලොමා, කෙසා යයි කිවයුතුය. ඉන් අනතුරුව වක්ක පංචකයෙහි මංසං, නහාරු, අට්ඨී, අට්ඨිමිඤ්ජං, වක්කං යයි කියා නැවත වක්කං, අට්ඨිමිඤ්ජං, අට්ඨී, නහාරු, මංසං, තචො, දන්තා, නඛා, ලොමා, කෙසා යයි කිවයුතුය. එයින් පසු පප්ඵාස පංචකයෙහි හදය, යකනං, කිලොමකං, පිහකං, පප්ඵාසං යයි කියා නැවත පටිලෝම වශයෙන් පප්ඵාසං, පිහකං, කිලොමකං, යකනං, හදයං, වක්කං, අට්ඨිමිඤ්ජං, අට්ඨී, නහාරු, මංසං, තචො, දන්තා, නඛා, ලෝමා, කෙසා යයි කිවයුතුය. ඉන්පසු මෙම පාලිය නොනගා පටිසම්භිදා මාර්ගයෙහි ආවා වූ මත්ථලුංගං කරීසාවසානයේ පාලියට නගා මෙම මත්ථලුංග පංචකයෙහි අන්තං, අන්තගුණං, උදරියං, කරීසං, මත්ථලුංගං යයි කියා නැවත පටිලෝම වශයෙන් මත්ථලුංගං, කරීසං, උදරියං, අන්තගුණං, අන්තං, පප්ඵාසං, පිහකං, කිලොමකං, යකනං, හදයං, වක්කං, අට්ඨිමිඤ්ජං, අට්ඨී, නහරු, මංසං, තචො, දන්තා, නඛා, ලොමා, කෙසා යයි කිවයුතුය.

ඉන්පසු මෙද ඡක්කයෙහි පිත්තං, සෙම්හං, පුබ්බො, ලොහිතං, සෙදො, මෙදො යයි කියා නැවත පටිලෝම වශයෙන් මෙදො, සෙදො, ලොහිතං, පුබ්බො, සෙම්හං, පිත්තං, මත්‍ථුලුංගං, කරීසං, උදරියං, අන්තගුණං, අන්තං, පප්ඵාසං, පිහකං, කිලොමකං, යකනං, හදයං, වක්කං, අට්ඨිමිඤ්ජං, අට්ඨී, නහරූ, හදයං, මංසං, තචො, දන්තා, නඛා, ලෝමා, කෙසා යයි කිවයුතුය. ඉන්පසු මුත්ත ඡක්කයෙහි අස්සුවසා, ඛෙලො, සිංඝානිකා, ලසිකා, මුත්තං කියා නැවත පිළිලොම් වශයෙන් මුත්තං, ලසිකා, සිංඝානිකා, ඛෙලො, වසා, අස්සු, මෙදො, සෙදො, ලොහිතං, පුබ්බො, සෙම්හං, පිත්තං, මත්‍ථුලුංගං, කරීසං, උදරියං, අන්තගුණං, අන්තං, පප්ඵාසං, පිහකං, කිලොමකං, යකනං, හදයං, වක්ඛං, අට්ඨිමිඤ්ජං, අට්ඨී, නහාරූ, මංසං, තචො, දන්තා, නඛා, ලොමා, කෙසා යයි මෙසේ කාල සියයක්ද කාල දහසක්ද කාල සියදහසක්ද වචනයෙන් සජ්ඣායනය කළයුතුය. වචනයෙන් සජ්ඣායනය කිරීමෙන් කර්මස්ථාන පාලිය ප්‍රගුණ වෙයි. සිත එහා මෙහා නොදුවයි. කොටස් වශයෙන් (වෙන වෙනම) ප්‍රකට වෙයි. අතට ගත් සකක් මෙන් හැගේ. (අතැඟිලක් සේ) වැටමුල් පෙලක් මෙන්ද හැගේ. වචනයෙන් මෙන් සිතෙන් ද සජ්ඣායනා කළයුතුය. වචනයෙන් සජ්ඣායනය කිරීම සිතෙන් සජ්ඣායනා කිරීමට ප්‍රත්‍ය වේ. ලක්‍ෂණ දැනගැනීම මාර්ගඵල අවබෝධයට ප්‍රත්‍ය වේ. වර්ණ වශයෙන් යනු කෙස් ආදියෙහි වර්ණය වෙන් කරගත යුතුය. සණ්ඨාන වශයෙන් යනු ඒවායෙහිම සටහන් වෙන්කර ගතයුතුය. දිසා වශයෙන් යනු මෙම ශරීරයෙහි නාභියෙන් උඩ උපරිම දිසාවය. නාභියෙන් යට යට දිසාවයි. එහෙයින් මෙම කොටස මෙම දිසාවට අයත් යයි දිසා වෙන්කර ගතයුතුය. අවකාශය යනු මෙම කොටස මෙනම් අවකාශයෙහි පිහිටියේ යයි මෙසේ ඒ ඒ අවකාශ වෙන්කර ගතයුතුය. පරිච්ඡේදය සභාග විසභාග යයි දෙපරිදිය. එහි මෙම කොටස යටද උඩද හරහටද යන මෙයින් වෙන්කිරීම සභාග පරිච්ඡේදයයි දතයුතුය. කෙස්, ලොම් නොවේ. ලොම්, කෙස් නොවේ යයි මෙසේ අමිශ්‍ර වශයෙන් විසභාග පරිච්ඡේදය දතයුතුය.

මෙසේ සත් ආකාරයකින් උද්ග්‍රහණ දක්‍ෂතා කියන ආචාර්යවරයා මෙම කමටහන අසවල් සූත්‍රයෙහි පිළිකුල් වශයෙන් කියන ලදී. අසවල් සූත්‍රයෙහි ධාතු වශයෙන් කියන ලදී යයි දැන කිවයුතුය. මේ මහා සතිපට්ඨානය මහා හත්ථිපදොපම සූත්‍රයෙහි පිළිකුල් වශයෙන්ද මහාරාහුලෝවාද සූත්‍රයෙහි ධාතු වශයෙන්ද කියන ලදී. කායගතාසති සූත්‍රයෙහි වර්ණ වශයෙන් වැටහේ. එය උදෙසා සතර ධ්‍යාන බෙදන ලදී. එහි මෙය ධාතු වශයෙන් කියන ලද විපස්සනා කර්මස්ථානයක් වේ.

පිළිකුල් වශයෙන් කියන ලද සමථ කර්මස්ථානයක් ඇත. මෙම සමථ කර්මස්ථානයේ සර්ව සාධාරණ වශයෙන් අවිශේෂයෙන් කියන ලදැයි කියන්නේමය. මෙසේ සත්ආකාර වූ උද්ග්‍රහණ දක්‍ෂතා කියා අනුපිළිවෙළින් වේගයෙන් නැතිව සෙමින් නැතිව වික්‍ෂේප ඉවත්කරමින් පණ්ණත්තිය සමතික්‍රමණයෙන් පිළිවෙළින් මිදීමෙන් කිවයුතුය. එහි අනුපුබ්බ නම් මෙය සජ්ඣායනය කිරීමේ සිට අනුපිළිවෙළින් සිහිකළ යුතුය. එකක් හැර එකක් නොව පිළිවෙළින් සිහිකළ යුතුය. එකක් හැර එකක් සිහිකරන අදක්‍ෂ පුද්ගලයෙක් පොලු දෙතිසක් තිබෙන ඉණිමගක එකක් හැර එකකට නගින්නේ ශරීරය ක්ලාන්තවී ඇද වැටේ. නැගීම සම්පූර්ණ නොවේ. එසේම භාවනා සම්පත් වශයෙන් පැමිණිය යුතුවූ ආශ්වාදයට නොපැමිණ ක්ලාන්ත වූ සිත් ඇතිව වැටෙයි. භාවනාව සම්පාදනය නොවේ. පිළිවෙළින් මෙනෙහි කරන්නා ද ඉක්මන් නැතිව මෙනෙහි කළයුතුය. ඉතා ඉක්මණින් සිහිකරන්නාට යම්සේ යොදුන් තුනක් වූ මාර්ගයට බැස පිවිසීම් විසඳීම් නොසලකා සීඝ්‍ර ධාවනයෙන් සත්වරකුදු ගමනාගමනය කරන පුද්ගලයාට කිසියම් මාර්ගයක් කෙළවර පැමිණේ. ඉන්පසු අසාම යායුතු වෙයි. එසේම හුදෙක් කමටහන අවසානයට පැමිණේ. ප්‍රකට නොවේ. කිසි විශේෂයක් නොවෙයි. එනිසා ඉක්මන් නොවී මෙනෙහි කළ යුතුය. ඉක්මන් නොවීම මෙන්ම ඉතා සෙමින්ද නොවිය යුතුය. ඉතා සෙමින් මෙනෙහි කරන්නාට එම මාර්ගයේම තුන්ගව්වක් යෑමට කැමති පුද්ගලයාව අතරමග රුක් පව් ගහණවල පමාවෙමින් මාර්ගය අවසන් නොවෙයි. දෙතුන් දවසකින් අවසන් කළයුතු වන්නේය. එසේම කමටහන කෙළවරට නොයන්නේය. විශේෂාධිගමයකට හේතු නොවේ. වික්ඛෙප පටිභාහනය නම් කමටහන අත්හැර බාහිර අරමුණෙහි සිතින් වික්ෂේපය බහාතැබිය යුතුය. බහා නොතැබීම යනු එක් පුද්ගලයෙකුට යාහැකි ප්‍රපාත මාර්ගයකට පිවිසෙන්නෙකුට පියවර ගැන නොසලකා එහෙමෙහෙ බලමින් යන්නේ පියවර වරදී. එයින් මිනිසුන් හතක් පමණ වූ ප්‍රපාතයෙහි වැටෙන්නේය. එසේම බාහිර වික්ෂේප ඇතිකල්හි කමටහන පිරිහේ. විනාශ වේ. එහෙයින් වික්ෂේපය බහාතැබීමට මෙනෙහි කළයුතුය. පණ්ණත්ති සමතික්කමණතො යයි යනු යම් මේ කෙස් ලොම් ආදිය පණ්ණත්තිය. එය ඉක්මවා පිළිකුල් යයි සිත තැබිය යුතුය. යම්සේ දිය දුර්ලභ කාලයෙහි මිනිස්සු වනයෙහි ජලපානය දැක එහි තල්පත් ආදියෙන් ලකුණක් කර ඒ ලකුණින් පැමිණ ස්නානය කරති. පානය කරති. යම් කලක නිතර සංචාරයෙන් ආගිය අයගේ පියවරින් ප්‍රකට වේ. එකල ලකුණින් වැඩක් නැත. කැමති කැමතිවිට ගොස් ස්නානය කරති. පානය කරති.

එසේම පූර්ව භාගයෙහි කෙසා ලොමා යන පණ්ණත්ති වශයෙන් මෙනෙහි කරන්නාට පිළිකුල් බව ප්‍රකට වෙයි. ඉක්බිතිව ප්‍රඥප්තිය ඉක්මවා පිළිකුල් බවෙහි සිත තැබිය යුතුය අනුපුබ්බ මුඤ්චනතො යනු යමක් නොවැටහේද එය මුදා අනුපුබ්බ මුඤ්චනයෙන් මෙනෙහි කළයුතුය. ආදි කර්මිකයාට කෙස් යයි මෙනෙහි කරන්නේ මෙනෙහි කිරීම ගොස් මුත්තං යන මේ අවසාන කොටසෙහි හැපී සිටියි. ඉක්බිතිව සිහිකරනවිට කිසියම් කොටසක් වැටහේ. කිසියම් කොටසක් නොවැටහේ. එයින් වැටහෙන කොටස් අනුව කමටහන වැඩිය යුතුය. දෙකක් වැටහෙනවිට ඒනයින් එකක් හොඳින් වැටහේ. මෙසේ වැටහෙන කොටස නැවත නැවත මෙනෙහි කිරීමෙන් අර්පණා ඉපිදවිය යුතුය. මේ එහි උපමාවයි.

තල්ගස් තිස් දෙකක් ඇති තල්වනයක වාසය කරන වඳුරකු අල්ලා ගැනීමට සිතූ වැද්දෙක් වඳුරා මුලින්ම සිටි තල්ගසේ අතුවලට ඊයෙන් විද ශබ්ද කෙළේය. ඉක්බිති ඒ වඳුරා පිළිවෙලින් ඒ ඒ තල්ගසට පැන අවසාන තල්ගසටම යන්නේය. එහිද ගිය වැද්දා පෙරසේ කළ කල්හි වඳුරා නැවත පිළිවෙලින් පළමු සිටි තල්ගසටම එන්නේය. වඳුරා නැවත නැවත පිළිවෙලින් යන්නේ ශබ්ද නැගූ ස්ථානවල සිට නැවත අනුක්‍රමයෙන් එක් තල්ගසකට පැන ඒ ගසේ මුදුනේ මැද කරඬුවෙහි පිරිසිදු තල් අතු දැඩිව ගෙන විදින කල්හිත් නොනැගිටින්නේය. සම්බන්ධය මෙසේ දතයුතුය. උපමා සංසන්දනය - තල්වනේ තල්ගස් තිස්දෙක මෙන්ය. මේ ශරීරයෙහි කොටස් තිස්දෙක සිත වඳුරා මෙනි. යෝගාවචරයා වැද්දා මෙනි. වඳුරාට තල්ගස් තිස්දෙකෙන් යුත් තල්වනය නිවාස වූවා සේ යෝගී සිතට කොටස් තිස්දෙකෙන් යුත් ශරීරයේ අරමුණ වශයෙන් අනුසංචරණය මුලින්ම සිටි තල්ගසේ අතුවලට වැද්දා විසින් ඊය විදීමෙන් ශබ්ද කළවිට වඳුරා ඒ ඒ තල්ගසට පැන අවසාන තල්ගසට ගියා මෙන් යෝගියා කෙස් යයි මෙනෙහි කිරීමට ආරම්භ කර පිළිවෙළින් ගොස් අවසාන කොටසෙහිම සිත පිහිටයි. නැවත ආපසු ගමනද මෙසේමය. නැවත නැවත පිළිවෙළින් යන වඳුරාට ශබ්ද ඇසුණු අවස්ථාවල නැගී සිටිනවා මෙන් නැවත නැවත මෙනෙහි කරන්නේ එළඹ සිටි ඒවා අතරෙන් නොවැටහෙන ඒවා අත්හැර පරිකර්ම කිරීම. අනුක්‍රමයෙන් එක් තල්ගසකට පැන එහි මැද කරඬුවෙහි අතු දැඩිසේ අල්ලාගෙන විදින කල්හිත් නොනැගිටිනවා මෙන් අවසානයෙහි දෙකක් එළඹුණු විට වහා වැටහෙන එකම ගෙන නැවත නැවත මෙනෙහිකර අර්පණා ඉපදවීම.

තවත් උපමාවක් - පිණ්ඩපාතික භික්ෂූන් වහන්සේ නමක් පවුල් තිස්දෙකක් ඇති ගමක් ඇසුරුකර වාසය කරන්නේ පළමු ගෙදරින් භික්ෂා දෙකක් ලැබ එකක් අනිත් කෙනෙකුට දෙන්නේය. ඊළඟ දවසේ තුනක් ලැබ අනිකෙකුට දෙකක් දෙන්නේය. තුන්වන දිනයෙහි මුලින්ම පාත්තරය පිරෙන්ට ලැබ ආසන ශාලාවට ගොස් වළඳන්නේය. මෙසේ සම්බන්ධය දතයුතුය. කුල තිස්දෙකක් ඇති ගම මෙන් ද්වත්තිංසාකාය. පිණ්ඩපාතිකයා මෙනි යෝගාවචරයා. ඔහු එයම ඇසුරුකොට වාසය කරනවා මෙන් යෝගියා දෙතිස් කොටස් අරමුණු කර පරිකර්ම භාවනා කිරීම. පළමු ගෙදරින් දෙකක් ලැබ එකක් හැරදමනවා මෙනි දෙවන දිනයෙහි තුනක් ලැබ දෙකක් අත්හරිනවා මෙන් මෙනෙහි කරනවිට නොවැටහෙන ඒවා අත්හැර එළඹ වැටහෙන කොටස් දෙකේ පරිකර්ම කිරීම. තුන්වන දිනයෙහි මුලින්ම පාත්‍රය පුරා ලැබ ආසන ශාලාවේ හිඳ පරිභෝගය මෙන් දෙකෙන් වහා වැටහෙන කොටස ගෙන නැවත නැවත මෙනෙහි කර අර්පනා ඉපදවීම පැමිණවීම අර්පණාව වේ යයි දතයුතුය යනු මෙහි අදහසයි. කොට්ඨාසතො කෙස් ආදි එක් එක් කොටස්වල අර්පණාව වේ යයි දතයුතුය යනු මෙහි අදහසයි. තයොච සුත්තන්තාති. අධිචිත්ත, සීතිභාව, බොජ්ඣංග කොසල්ලං යන මේ සූත්‍රාන්ත තුන විරිය සමාධි ඉදිරිපත් කිරීම සඳහා යයි දතයුතුය යනු මෙහි අදහසයි. එහි, මහණෙනි, සමාධියෙන් යුත් භික්ෂුව එයින් නිමිති තුනක් කලින් කල මෙනෙහි කළයුතුය. කලින් කල සමාධි නිමිත්ත මෙනෙහි කළයුතුය. කලින් කල පග්ගහ (විරිය) නිමිත්ත මෙනෙහි කළ යුතුය. කලින් කල උපේක්ඛා නිමිත්ත මෙනෙහි කළ යුතුය. මහණෙනි, ඉදින් එකඟ සිතින් යුත් භික්ෂුව සමාධි නිමිත්ත පමණක් මෙනෙහි කරන්නේ නම් එය සිත කුසීත බවට හේතුවන්නේය. පග්ගහ නිමිත්ත පමණක් සිහිකරන්නේ නම් සිත විසිරයෑමට එය හේතුවන්නේය. උපේක්ඛා නිමිත්ත පමණක් මෙනෙහි කරන්නේ නම් සිත මනාව සමාධිගත නොවේ. ආශ්‍රවයන් ක්‍ෂය කිරීමට, මහණෙනි, ඉදින් ඒ භික්ෂුව කලින් කල සමාධි නිමිත්ත, විග්ගහ නිමිත්ත, උපේක්ඛා නිමිත්ත මෙනෙහි කරයිද එය සිත මෘදුවීමට, කර්මන්‍ය වීමට ප්‍රභාස්වරවීමට හේතු වේ. බිඳෙනසුළු නොවේ. ආශ්‍රවයන් ක්‍ෂය කිරීමට මනාව සමාධිගත වේ.

මහණෙනි, යම්සේ රන්කරුවෙක් හෝ රන්කරු අතවැසියෙක් හෝ ගිනිඋදුන බඳියි. උඳුන බැඳ උඳුන් මුඛය ආලේප කරයි. උඳුන් මුඛය ආලේපකොට අඬුවෙන් රත්රන් ගෙන උඳුන් මුඛයෙහි බහා කලින් කල නැවත නැවත පිඹියි. කලින් කලින් දිය ඉසියි. කලින් කල මධ්‍යස්ථ වේ.

මහණෙනි, ඉදින් රන්කරුවා හෝ රන්කරු අතවැසියා හෝ ඒ රත්රන් ජලය පමණක් ඉසින්නේ නම් රත්රන් නිවීමට එය හේතුවේ. මහණෙනි ඉදින් රන්කරුවා හෝ රන්කරු අතවැසියා හෝ ඒ රත්රන්වලට ගිනි නොපිඹ දිය නොඉස මධ්‍යස්ථ වේනම් ඒ රන් මනාව රත්නොවීමට හේතු වේ. මහණෙනි යම් හෙයකින් රන්කරුවා හෝ රන්කරු අතවැසියා හෝ ඒ රත්රන් කලින් කල පිඹිසි කලින් කල දිය ඉසියි. කලින් කල මධ්‍යස්ථ වේ. ඒ රත්රන් මෘදුවීමද වැඩකිරීමට යෝග්‍ය වීමද ප්‍රභාස්වර ද වේ. නොබිඳෙනසුළු වේ. කර්මාන්තයට මනාව සුදුසු වේ. යම් යම් පැළඳීම් වර්ග කැමති වෙනවා පටි සඳහා කුණ්ඩලාභරණ සඳහා ග්‍රීවා භරණ රන්මාලා ඒ අර්ථය ඉටුවේ. මහණෙනි, එසේම අධි චිත්තයෙන් අනුයුක්ත වූ ආශ්‍රවක්‍ෂය සඳහා මනාව සමාධිගත වෙයි. යම් යම් අභිඥා සාක්‍ෂාත් කිරීම සඳහා සිත යොමු කෙරේද ඒ ඒ තත්ව ප්‍රතික්‍ෂේප කිරීම සුදුසු බව පැමිණේ. මෙම සූත්‍රය අධිචිත්ත යයි දතයුතුය. මහණෙනි, කරුණු සයකින් සමන්නාගත භික්‍ෂුව අනුත්තර වූ සංසිඳීම සාක්‍ෂාත් කිරීමට සුදුසු වේ. කවර නම් සයක්ද? මහණෙනි, මෙහි මෙම සාසනයෙහි භික්‍ෂුව යම් අවස්ථාවක සිත නිග්‍රහ කළයුතු නම් ඒ අවස්ථාවේ සිත නිග්‍රහ කරයි. යම් අවස්ථාවක සිත උනන්දු කරවිය යුතු නම් ඒ අවස්ථාවේදී සිත උනන්දු කරයි. යම් අවස්ථාවක සිත සතුටු කළයුතු නම් ඒ අවස්ථාවේදී සිත සතුටු කරයි. යම් අවස්ථාවක සිත මධ්‍යස්ථ කළයුතු නම් ඒ අවස්ථාවේදී සිත මධ්‍යස්ථ කරයි. අධිමුක්තියද නිවන කෙරෙහි ඇල්මද ඇතිවේ. මහණෙනි, මේ ධර්ම සයෙන් යුක්ත භික්‍ෂුව අනුත්තර වූ සන්හිඳියාව සාක්‍ෂාත් කිරීමට සුදුසු වේ. මෙම සූත්‍රය සීතභාව සූත්‍රය වේයයි දතයුතුය.

බොජ්ඣංග කොසල්ලය වනාහි එසේම මහණෙනි, යම් සමයක සිත (සැඟවූයේද) අප්‍රකට වූයේද ඒ සමයෙහි පස්සද්ධි සම්බොජ්ඣංග භාවනාවට සුදුසු කාලය නොවේයයි සංයුත්ත මහා වර්ගයෙහි බොජ්ඣංග සංයුත්තයේ ආවේය. මෙසේ සප්තවිධ වූ උග්ගහ දක්‍ෂතාව මනාව ගෙන මෙම දසවිධ වූ මෙනෙහි කිරීම් දක්‍ෂතාව හොඳින් දියුණුකර එයින් යෝගියා උභය දක්‍ෂතා වශයෙන් කමටහන මනාකොට උගත යුතුය. ආචාර්යවරයා සමග එකම විහාරයේ පහසුකම් තිබේනම් මෙසේ විස්තර වශයෙන් කථා නොකර කර්මස්ථානයෙහි යෙදුණු යෝගියාගේ විශේෂත්වයක් ලැබුණුවිට මතුමත්තෙහි කථා කළයුතු වේ. අන්තැනක විසීමට කැමති නම් කියන ලද නියමයෙන් විස්තර වශයෙන් කථාකොට නැවත නැවත පෙරළා සියළු ගැටළු නිරාකරණය කොට කමටහන්

භාවනාවට නොගැලපෙන ස්ථාන හැර මහාවාසතාදී අටලොස් දෝස දුරුකොට අනුරූප වූ විහාරයක වාසය කරමින් සුළු බාධාද මැඩපවත්වා තවම රාග චරිත නම් රාගය පහකළයුතු පටික්කූල මනසිකාරයෙහි පරිකර්ම කළයුතුය. කරන්නා පළමුව කෙස්වල පමණක් නිමිති ගතයුතුය. කෙසේද? එකක් හෝ දෙකක් කෙස්ගස් කඩාගෙන අල්ලේ තබාගෙන පළමුව වර්ණය වෙන්කර ගතයුතුය. කෙස් කැඩුණු තැනද බැලීම වටී. ජල පාත්‍රයේ හෝ කැඳ පාත්‍රයෙහි හෝ බැලීමටද වටී. කලු කාලයෙහි දැක කළුයයි මෙනෙහි කළයුතුය. සුදු කාලයෙහි සුදු යයි මෙනෙහි කළයුතුය. මිශ්‍ර කාලයෙහි වැඩිය ඇති කොටස මෙනෙහි කළයුතුය. කෙස්වල මෙන් සියළු තච පංචකයෙහිද දැකම නිමිති ගතයුතුය.

මෙසේ නිමිති ගෙන සියළු කොටස්වල වර්ණය සටහන දිසාව අවකාශය පරිච්ඡේදය වශයෙන් වෙන්කොට වර්ණ සණ්ඨාන ගන්ධ ආසය ඕකාශ වශයෙන් පස් ආකාරයකින් පිළිකුල් වශයෙන් බැලිය යුතුය. සියළු කොටස්වල පිළිවෙළ කථාව මෙසේය :-

**කෙසා** - ප්‍රකෘති වර්ණයෙන් කළුය. අද්දාරිට්ඨක වර්ණය. සටහන් වශයෙන් දිගටි වටකුරුය. තුලාදඬුවක සටහන් ඇත්තේය. දිසා වශයෙන් ඉහළ උඩ දිසාවේ හටගත්තේය. අවකාශ වශයෙන් දෙපස කන්පෙතිවලින් ඉහළ. ඉදිරියෙන් නළල කෙළවර දක්වා පසුපසින් ගෙල දක්වා හිස්කබල වෙළුමේ තෙත් සම කෙස්වලට අවකාශය වේ. පරිච්ඡේද වශයෙන් කෙස් හිස් වෙළුම් සමෙහි වී අගක් පමණ ඇතුළට පිවිස පිහිටියේය. අගින් ඉහළ අහසෙහි එකිනෙකට සම්බන්ධ වී ඇත. කෙස් ගස් දෙකක් එක ආකාරයකින් නැතිවීම සභාග පරිච්ඡේදයයි. කෙස් ලොම් නොවේ. ලොම් කෙස් නොවේ නම් මෙසේ සෙසු කොටස් තිස්එකේද අමිශ්‍රබව දතයුතුය. කෙස් නම් වෙන්වූ වෙනම කොටසකියි සැලකීම විසභාග පරිච්ඡේදයයි. මෙය කෙස්වල වර්ණාදි වශයෙන් වවත්ථා පනයයි. මෙය ඒවායේ වර්ණාදි වශයෙන් පස්ආකාර පිළිකුල් වශයෙන් වවත්ථාපනය. කෙස් යන මේවායේ වර්ණයද පිළිකුල්ය. සටහනද ආසස අවකාශය වශයෙන්ද පිළිකුල්ය. සිත් අලවන්නේ නමුත් කැඳපතේ හෝ බත්පතේ හෝ කෙස් වර්ණ යමක් දැක මෙය කෙස් මිශ්‍රය එය අහක දමව යයි පිළිකුල් කරති. මෙසේ කෙස් වර්ණයෙන් පිළිකුල්ය. වරා කෙඳි හෝ නියද කෙඳි කෙස් සටහන් ස්පර්ශ කොට රැයෙහි බුදින්නෝද පිළිකුල් කරති. මෙසේ සටහන් වශයෙන් පිළිකුල්ය. තෙල් ගැල්වීම් මල් දුම් ආදි සංස්කාරයන් රහිත කෙස්වල ගඳ

අතිශයින් පිළිකුල් වේ. ළදරුවකුගේ අසූචි වර්ණ වශයෙන් කහපාටය. සටහන් වශයෙන් ද කහ පඬු සටහන්ය. කසල ගොඩෙහි දමන ලද ඉදිමුණු කලු බලුකුණ ද වර්ණ වශයෙන් ඉදුණු තල්ගෙඩියක පාටය. සටහන් වශයෙන් පෙරලා අත්හරින ලද මිහිඟු බෙරයකට සමානය. ඔහුගේ දත් සමන්මල් කැකුළකට සමානය. දෙදෙනාගේ වර්ණ සටහන් වශයෙන් පිළිකුල් නැත. ගඳින් පිළිකුල්මය. අපිරිසිදු ස්ථානයක ගමක ගලායන දොලක හටගත් පලාකොළ නාගරිකයන්ට පිළිකුල් වේ. පරිභෝග නොකෙරේ. මෙසේ කෙස්ද වර්ණ සටහන් වශයෙන් පිළිකුල් නොවේ. ගඳින් පිළිකුල් වේ. මෙසේ කෙස්ද - සැරව ලේමූත්‍ර අසූචි පිත් සෙම් ආදිය ගලා යමින් හැදුණු නිසා අතිශයින් පිළිකුල්ය. මෙය ආශ්‍රය වශයෙන් පිළිකුල්ය. මේ කෙස් සම් ගුථ රාශියක හැගුණු කර්ණිකාවක් මෙන් එක්තිස් කොටස්වල ඉපදුනේය. ඒවා සොහොන කසලගොඩ ආදි ස්ථානවල හටගත් සාක මෙන් අගල්වල හටගත් නෙලුම් මානෙල් ආදි මල් මෙන්ද අපිරිසිදු ස්ථානයෙහි හටගත් බැවින් අතිශයින් පිළිකුල්ය. මෙය ඔවුන්ගේ අවකාශ වශයෙන් පිළිකුල්ය. කෙස්වල මෙන් සියළු කොටස්වල වර්ණය සටහන ගඳ ආශ්‍රය ආකාශ වශයෙන් පස් ආකාරයකින් පිළිකුල් බව සැලකිය යුතුය. වර්ණ සටහන් දිසා අවකාශ පරිච්ඡේද වශයෙන් සියල්ලම වෙන් වෙන්ව සැලකිය යුතුය.

එහි ලෝමා ප්‍රකෘති වර්ණයෙන් කෙස් මෙන් නොව අසම්භින්න කාල සටහන්ය. කලු පිගුවන් වේ. සටහන් වශයෙන් අගින් නැමුණ සටහන්ය. දිසා වශයෙන් දෙකක හටගත්තේය. අවකාශය වශයෙන් කෙස් හැර අත්ල පහල හැර සෙසු ප්‍රදේශවල බොහෝසෙයින් ශරීරය වෙලන සමෙහි හටගත්තේය. පරිච්ඡේද වශයෙන් ශරීරය වෙලන සමෙහි ලික්ෂාවක් පමණ පිවිස පිහිටි අග එහි මුල් කාලයේ ඉහළ අවකාශයෙහි හරහට එකිනෙකින් වෙන්ව ඇත. ලොම් ගස් දෙකක් එකසමාන නැත. මෙය ඒවායෙහි සභාග පරිච්ඡේදයයි. විසභාග පරිච්ඡේදය වනාහි කෙස් සමානය. නඛා යනු නියපොතු විස්ස වේ. ඒ සියල්ල වර්ණයෙන් සුදුය. සටහණ වශයෙන් මත්ස්‍ය කොරල මෙනි. දිසා වශයෙන් පා නිය යට දිසාවෙහිද අත් නිය උඩ දිසාවෙහිද දිසා දෙකෙහි හටගත්තේය. අවකාශ වශයෙන් ඇඟිලි අග පිටපැත්තේ පිහිටියේය. පරිච්ඡේද වශයෙන් දිසා දෙකේම ඇඟිලි කෙළවර මසෙහි ඇතුළත ඇඟිලි පිටිමසෙහි කෙළවර අගද එන්නේය. අවකාශයේ හරහට එකිනෙක වෙන්වී ඇත. නිය දෙකක් එක හා සමාන නැත. මෙය සභාග ලක්ෂණයයි. විසභාගය කෙස් හා

සමානය. දන්තා යනු පරිපූර්ණ දත් ඇත්තෙකුගේ දත් ඇට තිස්දෙකය. ඒවාද වර්ණයෙන් සුදුය. සටහන් වශයෙන් විවිධය. ඒවායෙහි යටිඇන්දේ වැළ මැටිපසක පිළිවෙලින් තැබූ ලබුඇට මෙන් දත් සතරක් ඇත. ඇඳි දෙකෙහිම ඒ ඒ එකක එකක් ඒකමූලක කෙළවරයක් ඇති ඒවාය. දෑසමන් පොහොට්ටුවකට සමාන සමගති ඇත්තේය. එයින් එහා ඒවා එක එකක් ද්විමූලකය. දෙකෙළවරක් ඇත. කරුවක සටහන් ඇත. එයින් එහා දෙක දෙක මුල් තුනක් හා කෙළවරවල් තුනක් ඇත. එයින් එහා දෙක දෙක සිව්මුල් හා සිව් අගින් යුතුය. උඩුඇන්දේද මෙම ක්‍රමයෙන්මය. දිසා වශයෙන් උඩ දිසාවෙහිය. අවකාශ වශයෙන් හනුඇට දෙක අතරෙහි පිහිටියේය. දත් දෙකක් එකහා සමාන නැත. මෙය සභාග පරිච්ඡේදයයි. විසභාග පරිච්ඡේදය කෙස් හා සමානය.

**තචො** යනු සියළු සිරුර වෙලාසිටි සමයි. එහි උඩ කළු රත්වන් කහ ආදි වර්ණ වේ. සිවි නම් මෙය සියළු සිරුරින් ඇදගනු ලැබුවහොත් ඩෙබර ඇටයක් පමණ වේ. සම වර්ණ වශයෙන් සුදුය. ඒ සේතභාවය ගිනි ජාලාවකින් ගසනු ලැබුවත් සිවිය ප්‍රකට වේ. සටහන වශයෙන් ශරීර සටහන වේ. ඒ එහි සංක්ෂේපයයි. විස්තර වශයෙන් - පා ඇඟිලි සම කෝසකාරකයෙකුගේ කෝස සටහණ මෙනි. පිටසම මුල්බැඳි පාවහනක සටහනය. දන සම බත්මුලක තල්පත් සටහනය. කලවා සම සහල් පිරවූ පසුම්බියක සටහන ඇත. තට්ටම්වල සම දිය පුරවන ලද පට පෙරහනක සටහණය. පිටෙහි සම පලකයක (ලෑල්ල) නමන ලද සමක සටහනය. කුසයෙහි සම වීණාවේ තත් තිබෙන කොටස මෙන් සටහනය. උරයෙහි සම බොහෝසෙයින් සිව්රැස් සටහනය. දෙබාහුවේ සම හියවුර වෙලන සමවැනි සටහනය. පිටි අත්සම දැලිපිහි කොපු මෙන් සටහනය. පෙණ සිවියකට සමාන හෝ වේ. අතැඟිලි සම යතුරු කොපුවක මෙනි. බෙල්ලෙහි සම ගෙල කඤ්චුකයකට සමානය. මුහුණේ සම සිදුරු කුඩා සිදුරුවලින් යුත් කුඩා සතුන්ගේ කුඩුවක් මෙනි. හිසේ සම පාත්‍ර පසුම්බියකට සමානය. සම විමසන යෝගාවචරයා උතුරේ සිට උඩ දෙසට ඤාණය විහිදුවා පළමුව මුහුණ වෙලාසිටි සම සිහිකළ යුතුය. ඉක්බිති නළලේ පිහිටි සම ඊළඟ පාත්‍රය හා ථවිකාව අතර අතක් මෙන් හක් ඇටය හා හිස් සමට අතරෙන් ඤාණය යවා ඇටය සමග හම වෙන්කරන හිසේ සම සිහිකළ යුතුය. ඉක්බිති කඳේ සම ඉක්බිති. අනුලෝම පටිලෝම වශයෙන් දකුණු අතේ හම එම නයින්ම වම් අතේ හම පිටේ හම සිහිකර අනුලෝම පටිලෝම වශයෙන් දකුණු පාදයේ සම එලෙසින්ම වම් පාදයේ

සම අනුක්‍රමයෙන් වස්ති උදර හෘදය ග්‍රීවා සම් සිහිකළ යුතුය. ග්‍රීවා සමට අනතුරුව යටි හක්කේ සම සිහිකර තොල් (යටි උඩු) අවසානය පමුණුවා අවසන් කළයුතුය. මෙසේ ඖලාරිකව විමසන්නාට සියුම් දේද ප්‍රකට වේ. දිසා වශයෙන් දිසා දෙකක හටගත්තේය. අවකාශ වශයෙන් මුළු සිරුර වෙළා සිටියේය. පරිච්ඡේද වශයෙන් යට පාතලයේ සිට උඩ ආකාසයේ සීමාවය. මේ සභාග පරිච්ඡේදයයි. විසභාග පරිච්ඡේදය කෙස් හා සමානය. මංස යනු මාංශපේශි නවසියයකි. ඒ සියල්ල වර්ණ වශයෙන් රතුය. එරබදු මල්වලට සමානය. සටහන් වශයෙන් දඟ පිඬුමස තල්කොල බත්මුලකට සමානය. කලවා මාංශ අත්ගලකට සමානය. තට්ටම් මාංශ උදුන් කෙළවරට සමානය. පිටිමස තලගුලි වැස්මක සමානය. ඉලඇට දෙක බෝනික්කකුට සමානය. කයෙහි මස මැටිපිඩකට සමානය. අත්දෙකේ මාංශ දෙගුණකොට මහා මීයෙකුට සමානය. මීයෙකුට මෙන් ඖලාරික වශයෙන් බලනවිට සියුම්ව ඒවා වැටහේ. දිසා වශයෙන් දෙකකි. අවකාශ වශයෙන් තුන්සියයකට අධික ඇට නොතැවරී සිටී. පරිච්ඡේද වශයෙන් යට ඇට සමූහයේ පිහිටි තලයෙන් උඩ සමෙහි හරහ එකිනෙකින් වෙන්වී ඇත. මෙය සභාග පරිච්ඡේද යයි. විසභාගය කෙස් හා සමානය. නහාරූ යනු නහරවැල් නවසියයකි. වර්ණ වශයෙන් සියළුම නහර සුදුය. සටහන් වශයෙන් විවිධය. ඒවා අතර බෙල්ලේ උඩසිට පස් මහා නහරයක් සිරුර ඔතමින් හෘදයේ ඉදිරිපසින් බැසගන්නා ලදී. පහක් පසුපසින් පහක් දකුණුපසින් පහක් වම්පසින් පහක් දකුණු අත වෙලාගෙන අතේ ඉදිරියෙන් පසක් ද පසුපසින් පහක්ද එසේම වම් අත දකුණු පය වෙලාගත් පහක්ද පසුපසින් පහක්ද වම් පාදයද එසේය. මෙසේ ශරීරයේ දරණ හැටමහා නහරයක් මෙසේ බැව් කියන ලදී. ඒවා මහ නහරයයි කියනු ලැබේ. ඒ සියල්ලම කදල මල් පොහොට්ටුවක සටහන්ය. එයින් සියුම් වූ අනිත් ඒවා වීණා තත් සටහනය. අනිත් ඒවා මහත් නූලකට සමානය. අත් පා පිටිවල නහර පක්ෂි පා සටහන බඳුය. හිසේ නහර දරුවන්ගේ හිසේ පළඳින දැලකට සමානය. පිටේ නහර අව්වේ දිගහරින ලද තෙත දැලක් මෙන් සටහන්ය. අවශේෂ ඒවා ඒ ඒ අඟපසඟ අනුගත නහර ඇඳගත් දැල් සැට්ටයකට සමාන සටහනය. දිසා වශයෙන් දෙකකි. අවකාශ වශයෙන් සියළු ශරීරයෙහි ඇට බැඳ සිටියේය. පරිච්ඡේද වශයෙන් යටින් තුන්සියයක් උඩ පිහිටි තලයෙහි උඩ මසේ සමට වැදී එහි පෙදෙසෙහි හරහට එකිනෙකින් වෙන්කර ඇත. මෙය ඒවායේ සභාග පරිච්ඡේදයකි. විසභාගය කෙස් මෙනි. අට්ඨී යනු දත් තිස්දෙක හැර, අත් ඇට හැටහතර අල්ලේ ඇටදෙක එක් එක් පාදයෙහි ගොප් ඇට දෙක ජංගා ඇට දෙක

දණ ඇට දෙක කලවා ඇට දෙක කටී ඇට දෙක පිටකටු ඇට දහ අට බෙල්ලේ ඇට හත ඉල ඇට විසිහතර උරඇට දාහතර හෘදය ඇට එක අකුඇට දෙක කොට්ඨ ඇට දෙක බාහු ඇට දෙක අග්‍රබාහු ඇට දෙක හකු ඇට දෙක නාස්ඇට එක ඇස් ඇට දෙක කන්ඇට දෙක නළල් ඇට එක මුදුන් ඇට එක හිස්කපාල ඇට නවය මෙසේ ඇට තුන්සියයක් පමණ. ඒ සියල්ල වර්ණයේ සුදුය. සටහන් වශයෙන් විවිධය. එහි අග පා ඇඟිලි ඇට ඉඟිනි ඇට සමානය. ඉන් අනතුරු මැද කොටසේ ඇට කොස් ඇට සමානය මූල පර්වයේ ඇට පණබෙර සමානය. පිම්පාද ඇට කිඩාරම් අල සමූහයක් මෙනි. අල්ලේ ඇට එක් ඇටයක් ඇති තල්පල බීජයක් මෙනි. ගොප්ඇට පන්දු ගුලියක් මෙනි. දඟඇට ගොප් ඇටවල පාසි ඉවත් නොකළ ගොබයක සටහන්ය. කුඩා දඟඇට දුනු දඬුවක් මෙනි. දතිස් ඇට එක පැත්තකින් පිරිහුණු තයි පෙනයක් මෙනි.

එහි දඟ ඇටයේ පිහිටි තැන ඉතා සියුම් අග ඇති ගව අඟක් මෙනි. කලවා ඇට වෑ පොරෝ මිටක් මෙනි. කටිය පිහිටි තැන රවුම් කුක්ෂ්ඤයක් මෙනි. කටියේ අග පිහිටි තැන දොඹඇට මෙනි. කටීඇට දෙකක් එකතුව කුඹල්කරුවකුගේ උදුන මෙනි. වෙතම ............ කෙළවර පිහිටි තට්ටම් ඇට යටිකුරු කළ නාපෙණයක් මෙනි. ස්ථාන සතක ඡිද්දාවඡිද්දය. පිටඇට එකපිට එක තබා ඇති හිස් වෙළුම් පටක වූවක් මෙනි. බාහිර වශයෙන් නවගුණවැලක් මෙනි. ඒවායේ අතරතුර කියත් දැති මෙනි. ඉලඇට විසිහතරේ අසම්පූර්ණ කඩු මෙනි. සහ පරිපූර්ණ කඩුවෙනි. සියල්ල සුදුකුකුළෙකුගේ දිගහරින ලද පියාපත් මෙනි. උරඇට දාහතර සිඳින ලද රිය මැදිරියක් මෙනි. හෘදය ඇට හැඳි පෙණයක් මෙනි. අකුඇට කුඩා ලෝහ වෑයක මිටක් මෙනි. යටිබඩ ඇටය එක පැත්තකින් ගෙවුණු සිංහල උදැල්ලක් මෙනි. බාහු ඇට ආදාස දණ්ඩක් මෙනි. අග්‍රබාහු ඇට තල් කඳන් මෙනි. මැණික්කටුවේ ඇට එක පැත්තකින් ඇලවූ හිස් වෙළුම් පටක් මෙනි. පිටිඅතේ ඇට තලන ලද කිඩාරම් රාශියක් මෙනි. අතේ ඇඟිලි මුල් පුරුක් ඇට පණාබෙර මෙනි. මැද පුරුක් අසම්පූර්ණ කොස්ඇට මෙනි. අග පුරුක් ඉඟිනි ඇට මෙනි. බෙල්ලේ ඇට සත දැව දණ්ඩක් විද පිළිවෙළින් තබන ලද උණගොබ වැහැරියක් මෙනි. යට හනු කර්මාන්තකරුවන්ගේ කුළුගෙඩි යොතක් මෙනි. උඩ හනු සූරා දැමූ ආයුධයක් මෙනි. ඇස්කුප නාස්කුප ඇට මද අරන් දැමූ තල්කුරුම්බැට්ටි මෙනි. නළල් ඇටය යටිකුරු කර තැබූ හක්ගෙඩි පලුවක් මෙනි. කන්සිළු ඇට කරණවෑම්යෙකුගේ දැලිපිහි

කෝසයක් මෙනි. නලල කන්සිළු මතුවෙහි පටබඳින අවකාශයෙහි ඇට ගිතෙලහි බැහූ පුළුන් පටියක් මෙනි. මුදුන්ඇට මුව සිඳින ලද ඇඳ පොල්ගෙඩියක් මෙනි. හියෙහි ඇට මස තබා ඇති ලබු කබල් මෙනි. දිසා වශයෙන් දෙකකි. අවකාස වශයෙන් අවිශේෂයෙන් සියළු සිරුරෙහි සිටියේය. විශේෂයෙන් වනාහී හිසඇට බෙල්ලේ ඇට මතද පිටේ ඇට මතද ඒවා කටියෙහි ඇට මතද ඒවා කලවා ඇට මතද ඒවා දඟ ඇටමතද ඒවා ගොප්ඇට මතද ඒවා පාදයේ ඇට මතද පිහිටා ඇත. පරිච්ඡේද වශයෙන් ඇටමිදුළු කෙළවර කොට ඇටමිදුලුවලින් උඩ මාංසවලින් අග මුලද එකිනෙකින් වෙන්වී ඇත. මේ ඒවායේ සභාග පරිච්ඡේදය. විසභාග පරිච්ඡේදය කෙස් හා සමානය.

අට්ඨිමිඤ්ජ යනු ඒ ඒ ඇට ඇතුලේ තිබෙන මිදුලු. ඒවා වර්ණයෙන් සුදුය. සටහන් වශයෙන් මහත් ඇට ඇතුළත උණ ලී ඇතුලේ දමන ලද තැම්බූ වේවැල් මෙනි. කුඩා අනුකුඩා ඇට තුළ උණපුරුක් තුළ බැහූ තැම්බූ තුනී කළ වේවැලක් මෙනි. දිසා වශයෙන් දෙකකි. අවසානයේ ඇට ඇතුළෙහි පිහිටියේය. පරිච්ඡේදයෙන් ඇටවල අභ්‍යන්තර තලයෙහි පිහිටියේය. මෙය සභාග පරිච්ඡේදයයි. විසභාග කෙස් හා සමානය. වක්ක යනු එකට බැඳුණු මස්පිඬු දෙකකි. වර්ණයෙන් මද රතුය. සටහනින් දරුවන්ගේ ක්‍රීඩා ගුලි දෙකක් මෙනි. එක නැට්ටේ ඇති අඹගෙඩි දෙකක් මෙනි. දිසාවෙන් උඩදිසාවය. අවකාශයෙන් - ගලවළුවේ (බෙල්ලේවල) සිට එන එක මුලකින් ටිකක් ගොස් දෙකට බෙදී මහත් නහර ඇතුළට කාවැදී හෘදය මාංශය වටකොට සිටියේය. පරිච්ඡේදයෙන් වක්ක භාගයකින් පිරිසිඳියේය. මෙය සභාග පරිච්ඡේදය විසභාගය කෙස් මෙනි. හදය හෘදය මාංශය. වර්ණයෙන් එය රත්පියුම් පතක පිට මෙනි. සටහනින් බාහිර පත්‍ර ඉවත්කොට යටිකුරු කර තබන ලද පියුම් පොහොට්ටුවක් මෙනි. බාහිර මටසිලුටුය. ඇතුළත් වැටකොලු ගෙඩියක ඇතුළත මෙනි. ප්‍රඥාවන්තයන්ගේ මදක් විකසනය වී ඇත. මඳ නුවණැත්තන්ගේ හැකිලීම ඇත. ඇතුළත දොඹ ඇටයක් බහාලිය හැකි වළකි. එහි අඩ පතක් පමණ ලේ ඇත. එය නිසා මනෝධාතු මනෝවිඤ්ඤාණ ධාතු පවතී. එය රාග චරිතයාව රතුය. දෝස චරිත නම් කලුය. මෝහ චරිතයාට මස් දෙවූ දිය මෙනි. විතක්ක චරිතයාට කොල්ලු යුස වර්ණය. සද්ධා චරිතයට කිණිහිරි මල් වර්ණය. පඤ්ඤා චරිතයට අතිශයින් පිරිසිදු වූ නොකැලඹුණු සුදු පිරිසිදු පිරිසිදු කළ මැණිකක් මෙන් බබළා යයි හැඟේ. දිසාවෙන් උඩය. අවකාශයෙන් සිරුර ඇතුළත තන දෙක අතරය. පරිච්ඡේදයන් හෘදය

භාගයක පිරිසිඳියේය. මෙම සභාග පරිච්ඡේදය. විසභාග කෙස් සමානය. **යකනං** යනු මාංශ පටල දෙක වර්ණයෙන් රතුපඬු පැහැය. වැඩි රතු නැති නෙළුම් පත්‍රයක් මෙනි. සටහන් වශයෙන් මුල එකකි. අග දෙකකි. කොබෝලීල කොලයක් වැනිය. එයද මද නුවණැත්තන් මහත එකක්මය. නැණවතුන්ට කුඩා කුඩා දෙකක් හෝ තුනක් වේ. දිසාවෙන් උඩය. අවකාශයෙන් දෙතන ඇතුළත දකුණුපස පිහිටියේය. පරිච්ඡේද වශයෙන් යකන භාගයේ පිරිසිඳිය. මෙය සභාග පරිච්ඡේදය විසභාගය කෙස් හා සමානය. **කිලොමක** වැසුණු නොවැසුණු වශයෙන් ද්විධය. ඒ දෙකම වර්ණයෙන් සුදුය. වර්ණයෙන් දුහුල් රෙදි කැබැල්ලක් මෙනි. සටහනින් තමාගේ අවකාශ සටහනය. දිසායෙන් වැසුණු කිලෝමකය උඩදිසාවෙහිය. අනික දිසා දෙකේම අවකාශයෙන් වැසුණු කිලෝමකය හෘදය සහ අක්මාව වසා සිටී. නොවැසුණු දලබුව සියළු ශරීරයේ යට සිට මාංශ හා වෙළී සිටියේය. පරිච්ඡේද වශයෙන් යට මාංශ උඩ මෙන් හරහට දලබුව කොටසකින් අවසන් වේ. මෙය සභාගය. විසභාගය කෙස් මෙනි.

**පිහක** යනු ඇලදිව මාංශයයි. එය වර්ණයෙන් නිල්ය. නිකමලේ වර්ණයට සමානය. සටහන වශයෙන් අඟල් හතක් පමණය. සම්බන්ධ නැත. කළු වස්සකුගේ දිවේ සටහනය. දිසාවෙන් උඩය. අවකාශයෙන් හෘදය වම්පස උදර පටලය මතුපස ඇසුරුකොට සිටියේය. පහරදීමෙන් පිටතට පැමිණිවිට ජීවිතක්‍ෂයට පත්වේ. පරිච්ඡේදයෙන් ඇලදිවේ සයකින් වෙන්විය. මෙය සභාගයයි විසභාග කෙස් මෙනි. **පප්ඵාස** පපුමස මස්කැබලි තිස්දෙකකින් යුක්ත වේ. එය වර්ණයෙන් රතුය. නොපැසුණු දිවුල්ගෙඩි වර්ණය. සටහනින් විසම හෝ බිඳුණු කැවුම් කැබලිවලට සමානය. අභ්‍යන්තරයෙහි ආහාරපාන නැතිවිට නැගුනා වූ කර්මජ තේජෝ උෂ්ණයෙන් පහරදෙනු ලැබ මනා සේ විකා කන ලද පිදුරු පිඩක් මෙන් නීරසය. ඕජා රහිතය. දිසාවෙහි උඩය වටකුරු වූ සිරුර ඇතුළත තන දෙක අතරය. හෘදයද යකනයද වසා එල්ලෙමින් සිටියේය. පරිච්ඡේදයේ පපුමස භාගයකින් වෙන්වේ. මෙය සභාගය. විසභාගය කෙස් මෙනි. **අන්තං** - පුරුෂයෙකුගේ දෙතිස් රියනකි. ස්ත්‍රියකගේ අටවිසි රියනකි. ස්ථාන විසිඑකක නැමුණු අන්තර වෘද්ධියයි. වර්ණයෙන් සුදුය. සුදු උක්හකුරු පාටය. සටහනින් ලේ ඔරුවක ඔබා තැබූ හිස සිඳුණු සර්පයකු මෙනි. දිසායෙන් දිසා දෙකම. අවකාශයෙන් උඩ ගලවලුව යටින් අසූචි මග සම්බන්ධ වී ඇත. ගල්වලුව අසූචි මග කෙළවර සිරුර ඇතුළත පිහිටියේය. පරිච්ඡේද වශයෙන් අන්ත භාගයේ පිරිසිඳියේය. මෙය සභාග පරිච්ඡේදය.

විසභාග කෙස් මෙනි. අන්තගුණ අන්තයෙහි භෝග ස්ථානයේ බැඳුනේය. වර්ණය සුදුසුය. නිල් උපුල් වර්ණය. සටහනද එසේය. දිසායෙන් දිසා දෙකටම අයත්ය. අවකාශයේ උදළු පොරෝ කර්මාදිය කරන්නන්ගේ යන්ත්‍රය අඳිනවිට යන්ත්‍රයේ ලණුව මෙන් ද යන්ත්‍ර පෝරුවෙහි ඇතුළත කෙළවරක බැඳි පාපිස්නේ ලණු මණ්ඩලය ඇතුළත වියා තනවන ලණු පොටක් මෙන් ස්ථාන විසිඑකකින් ඇතුළත නැමී සිටී. පරිච්ඡේද වශයෙන් අතුනුබහනින් පිරිසිඳියේය. මෙය සභාගයයි. විසභාගය කෙස් මෙනි.

උදරියං උදරයෙහි වූ කන බොන කන ලද බොන ලද වර්ණයේ ඇතුළට ගත් ආහාර වර්ණය. සටහනින් පෙරහනෙහි බුරුල් කඳ සහල් මෙනි. දිසාවෙන් උඩ. අවකාශයෙන් උදරයෙහි සිටී. උදරය නමා දෙපැත්තෙන් මිරිකනවිට තෙත රෙද්දක නැගෙන ගඩුවක් වැනිය. ඇතුළු පටලය. පිටතින් මටසිලිටුය. ඇතුළත කුණුමස් එතු කිලිටි වස්ත්‍රයක් මෙනි. කුණු වූ කොස්ගෙඩියක කට්ට මෙන් ඇතුළත සමානයයි කීමද වටී. තකෙකාටක ගඩු දෙක තැලීහිරෙක සුචිමුඛ පට තනතු සුතතක යනාදි කුල තිස්දෙකකට අයත් පණුවෝ ආකුල ව්‍යාකුලව රංචු රංචු ගැසී වසති. ආහාරපාන නැතිවිට නැගී සිට කෑගසමින් හෘදය මාංශයට හානි කරති. ආහාරපාන ගන්නා විට උඩුමුඛව පළමුගත් දෙතුන්කට වහ වහා කඩා කති. එය එම පණුවන්ගේ සූතිඝරය (වදන ගෙය) වැසිකිළිය, ආරෝග්‍ය ශාලාව, සොහොනද වේ. යම්සේ චනාහි සැඩොල් ගම්දොර ගවරවලෙහි නියං කාලයෙහි මහත් වැසිබින්දු සහිත මහා වර්ෂාවක් ඇතිවන විට මළමූ සම් නහර ඇටකැබලි කෙල සොටු ලේ ආදිය හටගත් විවිධ කුණපයන් වැටි දියෙහි පාවෙමින් මඩවතුරෙන් කැළඹී දෙතුන් දවසකින් හටගත් පණුකැලන් හිරුරැසින් කුණු වූ මත්තෙහි පෙණ බුබුළු දමමින් තද නිල්වන් වූ අතිශයින් දුගඳ පිළිකුල් වූ ලඟට යෑමට හෝ දැකීමට නුසුදුසු තත්වයක පවතී. එසේම විවිධ ආහාරපාන භෝජන දත් මොහොල්වලින් කුඩුකර දිව නැමති අතින් පෙරලා කෙලවලින් අනා හිරිහැර වූ එකෙණෙහි වර්ණ රහිත වූ ගත් රසාදි යුක්ත වියන්නාගේ කිලිටි, බලු වමනයක් හා සමවූ පිත් සෙම් වැසුමෙන් වෙළී උදරයේ ජඨරාග්නියෙන් කුණු වූ පණුකැල මතු මත්තෙහි පෙණ බුබුළු නංවන අතිශයින් කුණුව දුගඳ පිළිකුල් බවට පැමිණේ. නුවණැසින් බලා එහි පතිත ආහාරපාන කොටස් පහකට විභාග කෙරේ. එක් කොටසක් පණුවෝ කති. එක් කොටසක් ජඨරාග්නියෙන් දැවේ. එක් කොටසක් මුත්‍ර මගින් පිටවේ. එක් කොටසක් මළ මගින් පිටවේ. එක් කොටස් රසභාවයට

පැමිණ ලේ මස් ආදිය වඩයි. පරිච්ඡේද වශයෙන් උදර පටලයෙන් සහ උදරයෙන් පිරිසිඳියේය. මෙය සභාගය. විසභාගය කෙස් මෙනි.

**කරීසං** වර්චසයයි. එය වර්නයෙන් බොහෝසෙයින් ගිලින ලද ආහාර වර්ණයම වේ. සටහනින් අවකාස සටහනය. දිසායෙන් යට දිසාවය. අවකාශයෙන් පක්වාසයෙහි සිටී. පක්වාසය නම් යට නැබ පිටකටුවේ මුල අතර අතුනු අවසානයේ උසින් අටඟුලක් පමණ උණ බෝතලයක් මෙනි. වැසිජලය උඩ භූමියෙහි වැටී පහතට යට බිම සිටී. එසේම ආමාශයෙහි වැටුණු ආහාරපාන භෝජනාදිය උදර අග්නියෙන් පැසී පෙණ දමමින් ඇඹරුම් ගලෙන් ඇඹරුවා සේ සියුම් බවට පැමිණ ඇතුළත බිලයෙන් ගලාගොස් මැඩී උණ පුරුකක බහාලන ලද මැටි මෙන් එකතුවී සිටී. පරිච්ඡේද වශයෙන් පක්වාසය පටලයෙන්ද කරීසවලින්ද පිරිසිඳි අවසන් වෙයි. මෙය සභාගයයි. විසභාගය කෙස් මෙනි. **මත්ථලුංගං** යනු හිස්කබල ඇතුළේ සිහින් මිදුලුය. වර්ණයෙන් සුදුය. බිම්මලක වර්ණයෙන් යුක්තය. දී බවට නොපැමිණි කිරි වර්ණය කීමද වටී. සටහනින් අවකාශ සටහනය. දිසාවෙන් උඩය. අවකාශයෙන් හිස්කබල තුළ මැහුම්පාර හතරක් නිසා එක්කොට තබන ලද පිටිගුලි හතරක් මෙන් එකතුවී සිටී. පරිච්ඡේදයෙන් හිස්කටුව තුළ තලයෙහි මෙන්ම හිස්කබල පසින්ද අවසන් වේ. මෙය සභාගය. විසභාගය කෙස් මෙනි.

**පිත්තං** බද්ධ අබද්ධ වශයෙන් පිත් දෙකකි. බද්ධ පිත ගණ මීතෙල් වර්ණයෙන් යුක්තය. අබද්ධ පිත මැලවුණු අවුල් වූ මලක වර්ණයෙන් යුක්තය. සටහනින් දෙකම අවකාශ සටහන්ය. දිසාවෙන් බැඳුණු සිත උඩය. නොබැඳුණු සිත දෙදිසාවටම අයත්ය. අවසානයේ අබද්ධ පිත කෙස් ලොම් දත් නිය මාංශ නැති ස්ථාන ද තද වියලි සමද හැර අවසේස ශරීරයෙහි ජලය මෙන් තෙල්බිඳු පැතිර සිටී. එය කිපුණු විට ඇස් කහපැහැ වේ. භ්‍රමණය වන ගත සැලේ. කසයි. බද්ධ පිත හෘදය පපුව අතර යකෘත් මාංශය ඇසුරුකර පිහිටියේ මහා වැටකොලු කරලක කෝෂය මෙන් පිත් කෝසයෙහි සිටී. යම්සේ කිපුණුවිට සත්හු උමතු වෙති. විපර්යාස සිතින් හිරිඔතප් හැර නොකටයුතු දේ කරති. නොකිය යුතු දේ කියති. නොසිතිය යුතු දේ සිතති. පරිච්ඡේදයේ පිතේ කොටසකින් අවසන් වේ. මෙය සභාගය, විසභාගය කෙස් මෙනි.

**සෙම්හං** ශරීරය තුළ පාත්‍රයක් පුරවන ප්‍රමාණයේ සෙමය. වර්ණයෙන් සුදුය. කැලිය පත්‍රයක වර්ණය. සටහනින් අවකාශය. දිසාවෙන්

උඩ දිසාවේය. අවකාශයෙන් උදර පටලයෙහි පිහිටියේය. යම් ආහාර පානාදිය අනුභව කරනවිට දියෙහි දියසෙවෙල් කාෂ්ටයක හෝ කබලක වැටී බිඳී එය පුරා වසාගෙන සිටී. එසේම ආහාරපාන වැටෙනවිට බිඳී වසාගෙන සිටී. යම්සේ මදක් පැසුණු ගෙඩියක් මෙන් කුණු බිත්තරයක් මෙන්ද උදරය අතිශයින් පිළිකුල් කුණුකඳ වේ. එයින් උද්ගත ගඳින් රාම හැරද මුඛයද කුණුවූ කුණපයක් මෙන් දුගඳය. ඒ පුරුෂයා යයිද අයින් වෙන්න දුගඳ හමා යයි කීමට පැමිණේ. එයද වැඩී ගණබවට පැමිණ වැසිකිළියක පියන මෙන් උදරපටලයෙහි ඇතුළතම කුණප ගඳ නොපෙනී සිටී. පරිච්ඡේද වශයෙන් සෙම් කොටසින් අවසන්ය. මෙය සභාගය. විසභාගය කෙස් මෙනි. පුබ්බො කුණු වූ ලේ. වර්ණයෙන් පඬුකොළ පාටය. මළ සිරුරෙහි ගණවූ කැඳවතුර වර්ණය. සටහනින් ඕකාසය. දිසාවෙන් උඩයට දෙකම. අවකාශයෙන් සැරව ස්ථිරව නැත. යම්කලෙක කණු කටු පහරින් හා ගිනිදැල් ආදියෙන් පිළිස්සුණුවිට ශරීරයේ ලේ නැගී පසුව සැරව වේ. ගඩු පිළි ආදියද හටගනී. ඒ ඒ තැන සිටී. පරිච්ඡේදයෙන් පුබ්බවලින් අවසන්වේ. මෙය සභාගය. විසභාගය කෙස් මෙනි.

ලෝහිතං රැස්වන සහ සංසරණ වශයෙන් ලේ දෙවගෙකි. රැස්වන ලේ වර්ණයෙන් ලා රසය, සංසරණ ලේ පිරිසිදු ලා රසය. සටහනින් ඕකාශමය. දිසාවෙන් රැස්වූ ලේ උඩු දිසාවේය. අනික දිසා දෙකය. අවකාශයෙන් සංසරණ ලේ කෙස්ලොම් දණ හිස මාංශ නැති තැනද කඳ ගොරෝසු සමඳ හැර ධමනි ජාලය අනුසාරයෙන් සියළු සිරුර පුරා රැස්වුණු ලේ කායාතනයෙහි යට කොටස පුරවා එක්පතක් පමණ හෘදය වත්තය පපුව බොහෝසේ උඩ ටික ටික වැගිරෙන වෘක්කය හෘදය පපුව තෙමමින් සිටී. එහි වෘක්තය හෘදය යකනය නොතෙමන කල්හි සත්වයෝ පිපාසිත වෙති. පරිච්ඡේදයේ ලේ කොටසින් අවසන් වේ. මෙය සභාගය. විසභාග කෙස් මෙනි. සෙදො ලෝමකූපාදියෙන් වැගිරෙන ආපෝ ධාතුවය. වර්ණයෙන් තලතෙල් මෙනි. සටහනින් ඕකාසය. දිසාවෙන් දෙදිසාවේමය. අවකාසයෙන් ඩහදියට නිතර අවකාශයක් නැත. ලේ මෙන් හැමදා සිටී. ගිනි රස්නය අව් රස්නය සත්ත විපර්යාසාදියෙන් ශරීරය තවාද එකල දියෙන් නැගුණු විසබව සිඳුණු නෙලුම් අල නෙළුම් දඬු මෙන් සියළු කෙස් ලොම් කූපවලින් වැගිරේ. එනිසා එහි සටහනද කෙස්ලොම් කූප විවර මෙනි. ඩහදිය විමසන යෝගියා කෙස් ලොම් කූප විවරවල පිරී සිටි වශයෙන් මෙනෙහි කළ යුතුය. සේද කොටසින් අවසන් විය. මෙය සභාගයයි. විසභාගය කෙස් මෙනි. මෙදො ඝන වූ තෙල. වර්ණයෙන්

පැලූ කහ මෙනි. සටහනින් ස්ථූල ශරීරයෙහි මාංශ හා සම අතර තබන ලද කහපාට දුහුල් රෙදිකැබැල්ලක් මෙනි. මාංශ ශරීරයෙහි දඟ හා කලවා මාංශ පිටකටුව නිශ්‍රිත වූ පිටමසෙහි උදරවාටි මාංශ යන මේවා ඇසුරුකර දෙතුන් ගුණයක් කෙස් තවන ලද කහ වර්ණයෙන් යුත් දුහුල් රෙදිකැබලි මෙනි. දිසාවෙන් උඩයට දෙකය. ඕකාසයෙන් තර සිරුරේ පැතිරී කෙට්ටු සිරුරේ ජංගා මාංශ නිසා සිටී. තෙල් යයි කීවත් අතිශයින් පිළිකුල්ය. හිසේ ගානා නාසයෙන් උරවන තෙල් මෙන් නොවේ. පිරිසිඳීමෙන් යටමසින් හා උඩසමින් හරහට මේදයෙන් අවසන්ය. මෙය සභාගය. විසභාග කෙස් මෙනි. අස්සු යනු ඇසින් වැගිරෙන ආපෝ ධාතුවය. එය වර්ණයෙන් ප්‍රසන්න වූ තලතෙල් පාටය. සටහනින් ඕකාස සටහන්ය. දිසාවෙන් උඩය. අවකාශයෙන් ඇස් කූපයෙහි පිහිටියේය. මෙය පිත් කෝෂයෙහි පිත මෙන් නොව ඇස් කූපවල එක්වී හැමදා සිටී. යම්විට සොම්නසින් අට්ට සිනාවෙන් ද දොම්නස් වූ විට ඇඬීම් වැලපීමෙන්ද එබඳු වූ විසභාග ආහාර ගැනීමෙන්ද ඇසට දුම් දූවිලි පස් ආදිය වැදීමෙන්ද එවිට ඇස් කූප පුරා සිටී හෝ වැගිරේ. කඳුළු විමසන යෝගියා විසින් ඇස් කූපයෙහි පුරවා සිටීම් වශයෙන් විමසිය යුතුය. කඳුළු කොටසින් පිරිසිඳිනේය. මේවා සභාගය. විසභාගය කෙස් මෙනි. වසා යනු දියාරු තෙලයි. වර්ණයෙන් පොල්තෙල් වැනිය. කැඳවතුරෙහි ඉසින ලද තෙල් වැනියයි කීමද වටී. සටහනින් නානාවිධ පැහැදිලි ජලය මත වැටෙන තෙල්බිඳු වැනිය. දිසාවෙන් උඩ යට දෙකමය. ඕකාසයෙන් බොහෝ සෙයින් අල්ල පිටිතල පාතල පිට නාස්පුට නළල උරහිස්වල පිහිටා ඇත. ඕකාසයෙහි සැමදා දියාරුව නොසිටී. ගිනිරස්න හිරු රස්න ඍතු විපර්යාස ධාතු විපර්යාසවලදී ඒ ප්‍රදේශ උෂ්ණ වේද? එහි තබන කැළඹී පැහැදිලි ජල මතුයෙහි විසිරුණු දියබිංදු සේ එහා මෙහා සංසරණය වේ. පරිච්ඡේදයේ වසා කොටසින් අවසන්ය. මෙය සභාගයි. විසභාග කෙස් මෙනි.

ඛෙලො යනු ඇතුළු මුවෙහි පෙණ මිශ්‍ර ආපෝ ධාතුවය. වර්ණයෙන් සුදුය. සටහනින් ඕකාසය. පෙණ සටහන යයි කීමද වටී. දිසාවෙන් උඩය. අවකාශයෙන් දෙකොපලින් බැස දිවෙහි සිටී. මෙය මෙහි එක්වී හැමවිටම නොසිටී. අහරක් දැකීමෙන් හෝ සිහි කිරීමෙන් හෝ උෂ්ණ, තිත්ත, කුළු, ලුනු, ඇඹුල් හෝ කිසිවක් මුවෙහි තබනවිටද හෘදය වෙහෙස වුවද පිළිකුල් දෙයක් දැක්වේද දෙකොපළින් බැස දිවේ සිටී. සටහනින් දිව අග සිහින් වේ. දිවමුල බහුලය. මුඛයෙහි තබන හබලපෙති හෝ බත් මෙන් වෙනත් ආහාරයක් ගංතීර වැල්ලෙහි හාරන ලද ලිඳක් මෙන් අඩුවීමක්

නැතිව තෙමීමට සමත් වේ. කෙළවලින් කෙළවරවීම පරිච්ඡේදයයි. මෙය සභාගය. විසභාගය කෙස් මෙනි.

සිංඝානිකා මත්ථලුංගයෙන් මොළයෙන් වැගිරෙන අසූචි වේ. වර්ණයෙන් ළපටි තල් කුරුම්බා ලොඳ මෙනි. සන්ධානයෙන් ඕකාසය. දිසාවෙන් උඩය. අවකාශයෙන් නාස්පුඩුවෙහි පිරී ඇත. නමුත් එහි හැමවිටම එක්වී නැත. මිනිසෙක් නෙලුම් කොළයක දීකිරි බැඳ යටට කටුවකින් විදින්නේනම් එම සිදුරෙන් දීකිරි ගලා පිටතට වැගිරෙන්නේය. ඒ වාගේ යම්විට අඬයිද හෝ විසභාග ආහාර ඍතු වශයෙන් හෝ හටගත් ධාතු කැළතීම ඇතිවේ. එවිට ඇතුළු හිසේ කුණුවූ සෙම්බවට පැමිණ මොළයෙන් වැගිරී තල්ලේ සිදුරෙන් බැස නාස්පුඩු පුරවා සිටී හෝ වැගිරේ. සොටු විමසන යෝගියා විසින් නාස්පුඩුවෙහි පිරී තිබෙන සේ විමසිය යුතුය. සොටුවලින් පිරිසිඳ ඇත. මෙය සභාගය. විසභාග කෙස් මෙනි. **ලසිකා** ශරීර සන්ධිවල ඇතුළේ ඇලෙන කුණපයකි. වර්ණයෙන් කිණිහිරි ලාටු මෙනි. සටහනින් ඕකාසය. දිසාවෙන් දෙදිසාවමය. අවකාශයෙන් ඇට සන්ධිවල අභ්‍යන්තර කෘත්‍ය සාදමින් අටදහසක් සන්ධි ඇතුළත සිටියේය. යමෙකුගේ අඩු වේනම් ඔහු නැගිටින හිඳගන්නා ඉදිරියේ යනවිට පස්සට යනවිට හකුලන දිගහරිනවිට ඇට කටු හම යන ශබ්ද පවත්වයි. අසුරු ශබ්ද මෙන් වේ. එක් යොදුන් දෙයොදුන් පමණ මාර්ගයේ ගියවිට වායෝ ධාතුව කිපේ. ශරීර දුකට පැමිණේ. යමෙකුට වෙනත් ප්‍රමාණයක් ඔහුගේ නැගිටින හිඳගන්නා විට ඇට කටකට ගායි. දිග මාර්ගයක යනවිට වායෝ ධාතු නොකිපේ. ශරීරය දුකට නොපැමිණේ. ලසිකාවලින් පිරිසිඳින්නේය. මෙය සමභාගය. විසභාගය කෙස් මෙනි.

මුත්තං වර්ණයෙන් උඳු සේදූ ලුණුවතුර මෙනි. සටහනින් යටිකුරු කර නැමූ කලයක ජලය මෙනි. දිසාවෙන් යටය. අවකාශයෙන් වස්තිය ඇතුළත පිහිටියේය. යම්සේ කටක් නැති යොන් කලයක් ගවරවලට දැමූවිට එහි රසය කලයට පිවිසේ. පිවිසෙන මාර්ගය නොපෙනේ. එසේම ශරීරයෙන් මුත්‍ර ඇතුළු වෙයි. පිවිසෙන මාර්ගය නොපෙනේ. නික්මවන මාර්ගය ප්‍රකටය. මුත්‍ර බරවූ විට මළපහ කරමියි උත්සාහයක් ඇතිවේ. වස්තිය ඇතුළත හා මුත්‍ර භාගයකින් පිරිසිඳියි. මෙය සභාගය. විසභාගය කෙස් මෙනි.

මෙසේ කේසාදි කොට්ඨාශ වණ්ණ සණ්ඨාන දිසා ඔකාශ පරිච්ඡේද වශයෙන් සිහි කටයුතුය. අනුපූර්ව වශයෙන් ඉක්මන් නොවී ආදී නයින්

වර්ණ සණ්ඨාන ගතයුතුය. ආශය ඕකාස වශයෙන් පස් ආකාරයකින් පිළිකුල් පිළිකුල් යයි මෙනෙහි කරන්නාට ප්‍රඥප්ති ඉක්මවීම් වශයෙන් යම්සේ ඇස් ඇති පුද්ගලයෙකුට දෙතිස් වර්ණයෙන් යුත් මල් එක නූලකින් අමුණා මල්මාලාව බලනවිට සියළු මල් පෙරපසු නොවී ප්‍රකට වේ. එසේම "අත්‍ථි ඉමස්මිං කායෙ" කෙස් යයි මෙනෙහි කරන්නට මෙනෙහි කිරීම අවසාන කොටස වූ මූත්‍ර දක්වා ගමන් කරයි. බාහිර දේද මනසට වැටහේ. මෙසේ සියළු කොටස්වල ප්‍රකටව ගමන් කරන්නේ මිනිස් තිරිසන් ආදි සත්වාකාරය පහවී ගොස් රාශි වශයෙන් වැටහේ. අනුභව කරන ආහාර පානාදිය මෙන් වැටහේ. ඉන්පසු අනුපූර්ව මිදීම් වශයෙන් පිළිකුල් පිළිකුල් යයි මෙනෙහි කරන්නාට අනුක්‍රමයෙන් අර්පනාව පහළ වේ.

එහි කෙස් ආදියේ වර්ණ සටහන දිසා අවකාශ පරිච්ඡේද වශයෙන් වැටහීම උද්ග්‍රහ නිමිත්තයි. සියළු ආකාරයෙන් පිළිකුල් වශයෙන් වැටහීම පටිභාග නිමිත්තය. එය නැවත නැවත මෙනෙහි කරන්නාට ආවර්ජනය කර තර්ක විතර්ක කරන්නාට ස්කන්ධ හතර (විඤ්ඤාණය හැර) පටික්කුල අරමුණ වේ. ප්‍රථමධ්‍යාන වශයෙන් අර්පණාව පවතී. එහි පූර්ව භාගය පරිකර්ම උපචාර සිත් සවිතක්ක සවිචාර සප්පීතික සෝමනස්ස සහගත පටික්කුල නිමිති අරමුණය. අර්පණාවල විතක්ක සහිත විචාර සහිත පීතිය සහිත සොම්නස් සහගත වේ. භූමි අතර මහග්ගත රූපාවචර වේ. පිළිකුලෙහි ද මේ අරමුණෙහි ආනිසංස දැකීමෙන් සොම්නස් උපදී. එක අරමුණු බලයෙන් හෝ එය උපදී. මෙහි ද්‍රුතිය ඣානාදිය නොඋපදී. කවර හෙයින්ද? ඕලාරික බැවිනි. මේ අරමුණ වනාහි ඕලාරිකය. මෙහි විතක්ක වශයෙන්ම සිතේ එකඟතාව ඇතිවේ. විතක්කය ඉක්මවීමෙන් එකඟතාව ඇති නොවේ.

## මේ සමථ වශයෙන් කර්මස්ථාන කථාවය.

අවිශේෂයෙන් වනාහි සාධාරණව මෙසේ දතයුතුය. කමටහන් භාවනාව වඩන්නා විසින් කමටහන ඉගෙන සජ්ඣායනය කරන කාලයේම කේසාදියේ වර්ණ නිමිත්ත, සටහන් නිමිත්ත, දිසා නිමිත්ත, අවකාශ නිමිත්ත, පරිච්ඡේද නිමිත්ත යන නිමිති වචනයෙන් තළ තළා එක එක කොටසෙහි මෙය මීට සමානයයි තුන් ආකාරයකින් හඬනගා කියවිය යුතුය. කෙසේද? පළමුව තච පංචකය යට කියන ලද නයින්ම අනුලෝම වශයෙන් පස් දවසක් පටිලෝම වශයෙන් පස් දවසක් අනුලෝම පටිලෝම

වශයෙන් පස් දවසක්දැයි අඩමසක් සජ්ඣායනය කළයුතුය. ඉන්පසු ආචාර්යවරයා ලඟට ගොස් වක්ක පංචකය ඉගෙන එසේම අඩමසක් සජ්ඣායනය කළයුතුය. ඉන්පසු ඒ කොටස් දහයට එකතුව අඩමසක් නැවත පප්ඵාස පංචකාදියෙහිද එක එක උගෙන අඩමසක්. ඉන්පසු ඒ කොටස් පහළොවම අඩමසක්. මත්ථලුංග පංචකය අඩමසක්. ඉන්පසු ඒ කොටස් විස්ස අඩමසක්. මේද හය (ඡක්ක) අඩමසක්, ඉන්පසු ඒ කොටස විසිහය එකට ගෙන අඩමසක්. මුත්ත ඡක්කය අඩමසක්, ඉන්පසු සියළු කොටස් තිස්දෙක එකට ගෙන අඩමසක්දැයි මාස හයක් සජ්ඣායනය කළ යුතුය.

එහි උපනිශ්‍රය සම්පන්නව ප්‍රඥාවන්ත භික්‍ෂූන් වහන්සේම කමටහන ඉගෙන ගනිද්දීම කයේ කොටස් වැටහේ. සමහර කෙනෙකුට නොවැටහේද නොවැටහෙන්නත් වීර්ය අත් නොහැරිය යුතුය. වැටහෙන කොටස් පමණක් ගෙන සජ්ඣායනා කළ යුතුය. මෙසේ කමටහන් දෙන ආචාර්යවරයා ප්‍රඥාවන්ත හා මන්ද යන පුද්ගලයන් සඳහා නොව ඒ අතර තත්වයන් සලකා කමටහන් දිය යුතුය. මධ්‍යම ප්‍රඥාවන්තයකු ලෙස සලකා කමටහන් දිය යුතුය. මධ්‍යම ප්‍රඥාවන්තයකු ලෙස සලකා ආචාර්යවරු මාස හයක් පිරිසිඳ (අවසන්කොට) පාලිය තැබූහ. යමෙකුට වනාහි මෙපමණකිනුත් නොවැටහේ නම් ඉන්පසුවත් සජ්ඣායනය කළ යුතුය. මාස හයෙන් හයටම කොටස්කර සජ්ඣායනා කළයුතුය. සජ්ඣායනා කරන්නා වර්ණය මෙනෙහි නොකළ යුතුය. ලක්‍ෂණ මෙනෙහි නොකළ යුතුය. කොටස් වශයෙන්ම සජ්ඣායනා කළයුතුය. ආචාර්යවරයා විසින්ද වර්ණ වශයෙන් සජ්ඣායනය කරන්නැයි නියමකොට නොකිව යුතුය. නියමකොට කීමෙහි දෝෂය කුමක්ද? සම්පත්තියද විපත්ය යන හැඳිනීම ඇතිවේ. ආචාර්යවරයා විසින් වර්ණ වශයෙන් සජ්ඣායනා කරවයි කී කල්හි ඒ අනුව කරන්නාට කර්මස්ථානය වර්ණ වශයෙන් නොවැටහේ. පිළිකුල් වශයෙන් හෝ ධාතු වශයෙන් හෝ වැටහේ. ඉක්බිති හේ මේ කමටහන නොසරුප්ය යන සංඥාව ඇති වේ. ආචාර්යවරයා කියූ පරිදිම කැපකොට ගනී. පිළිකුල් වශයෙන් මෙනෙහි කරවයි කී කල්හිද එසේ කරන්නාට පිළිකුල් වශයෙන් නොවැටහේ. වර්ණ වශයෙන් හෝ ධාතු වශයෙන් හෝ වැටහේ. ඉක්බිති ඔහුට මේ කමටහන නො සරුප් යයි හැඟේ. ඇදුරා විසින් කියන ලද පරිදිම කැපකොට ගනී. ධාතු වශයෙන් එය සජ්ඣායනා කරවයි කී කල්හිද එසේ කරන්නාට ධාතු වශයෙන් නොවැටහේ. වර්ණ වශයෙන් හෝ පිළිකුල් වශයෙන් වැටහේ.

ඉක්බිතිව ඔහුට මෙම කමටහන සුදුසු නොවේ යන සංඥාව ඇතිවේ. ඇදුරා විසින් කියූ පරිදිම කැපකොට ගනී. මෙය ආචාර්යවරයා නියමකොට කීමේ දෝෂයයි. කෙසේ නම් කිවයුතු වන්නේද? කොටස් වශයෙන් සජ්ඣායනා කරවයි කිවයුතුය. කෙසේද? කෙස් කොටස ලොම් කොටස සජ්ඣායනා කරවයි කිවයුතුය. මෙසේ කොටස් වශයෙන් සජ්ඣායනා කරන්නාට වර්ණ වශයෙන් වැටහේ. ඉක්බිති ඔහු මම දෙතිස්ආකාර කොටස් වශයෙන් සජ්ඣායනා කරමි. මට ඒවා වර්ණ වශයෙන් වැටහේ යයි අවවාද දෙන ආචාර්යවරයාට කිවයුතුය. ආචාර්යවරයා විසින් නුසුදුසු කර්මස්ථාන නොවන්න කර්මස්ථානය මෙන් වැටහේ යයි විසංවාද නොකටයුතුය. හොඳයි සත්පුරුෂය, පෙර ඔබ වර්ණ කසින පරිකර්ම භාවනාව කරන ලද්දේ වන්නේ යයි කිවයුතුය. එසේ හෙයින් වර්ණ වශයෙන් සජ්ඣායනා කළයුතුය. හෙතෙමේ එසේ කරන්නේ තමා කෙරෙහි නීල, පීත, ලෝහිත, ඕදාත (නිල් කහ රතු සුදු) යයි වර්ණ කසිණ සතර ලබයි. කෙසේද? ඔහුට කෙස් ලොම් පිත්වල ද ඇස්වල ද කළු ස්ථානවල වර්ණනය නිල් නිල් යයි මෙනෙහි කරනවිට සතරවැනි පස්වැනි ධ්‍යාන උපදී. ධ්‍යාන පදනම් කරගෙන විදර්ශනා පිහිටුවා (පටන්ගෙන) රහත් බව පැමිණේ. මේදයෙහි හා ඇස්වලද කහපාට ස්ථානයේ වර්ණය කහ කහ යයි මෙනෙහි කරන්නාට සතරවැනි පස්වැනි ධ්‍යාන උපදී. ධ්‍යාන පාදකකොට විදර්ශනාව පිහිටුවා රහත් බවට පැමිණේ. මස් ලේවල සහ ඇස්වල රතු තැන්වල වර්ණය ලේපාට යයි මෙනෙහි කරන්නාට සතරවැනි පස්වැනි ධ්‍යාන උපදී. ධ්‍යාන පාදක කරගෙන විදර්ශනා වඩා රහත් බවට පැමිණේ. නිය දත් සම් ඇටවල සහ ඇස්වලද පණ්ඩර වර්ණය. සුදු සුදු යයි මෙනෙහි කරන්නා සතරවැනි පස්වැනි ධ්‍යාන උපදවා ධ්‍යාන පාදකකොට විපස්සනා වඩා රහත්බවට පැමිණේ. මෙය වර්ණ වශයෙන් ප්‍රවේශ වූ භික්ෂූන් වහන්සේට රහත්බව දක්වා නිර්දේශයයි. තවකෙනෙකුට කොටස් වශයෙන් සජ්ඣායනා කරනවිට පිළිකුල් වශයෙන් වැටහේ. එය ඔහු විසින් ආචාර්යවරයාට කිවයුතුය. මෙය කමටහනක් වගේ පෙනෙන කර්මස්ථානයක් නොවන්නකියි ආචාර්යවරයා විසින් විසංවාද නොකළ යුතුය. යහපත්ය පින්වත, පෙර ඔබ පිළිකුල් මෙනෙහි කිරීමෙන් භාවනා කරන ලද වන්නේ යයි කියා මේ කමටහනට ඔබට සහාය වන්නේ නම් එනිසා පිළිකුල් වශයෙන් සජ්ඣායනා කරවයි කිවයුතුය. ඔහුට කෙස් නම් අපිරිසිදු වූ දුර්ගන්ධය අතිශයින් පිළිකුල්ය යයි ඔහු විසින්ද පිළිකුල් වශයෙන් සජ්ඣායනා කළයුතුය. මෙසේ පිළිකුල් වශයෙන් සජ්ඣායනා කරන්නා පිළිකුල් අරමුණෙහිම පළමුවන ධ්‍යානය

උපදවා ගනී. හේ ධ්‍යාන පාදක කරගෙන විදර්ශනා වඩා රහත් බවට පැමිණේ. මෙය පිළිකුල් වශයෙන් ප්‍රවේශ වූ භික්‍ෂුවට අරහත් බව දක්වා නිර්දේශනයයි. කෙනෙකුට කොටස් වශයෙන් සජ්ඣායනා කරනවිට ධාතු වශයෙන් වැටහේ. ධාතු වශයෙන් වැටහෙන්නේ කුමන ආකාරයකින් වැටහේද?

පළමුකොට කෙස් හුඹසක් මත්තෙහි හටගත් කුණු වූ තෘණ මෙන් වැටහේ. ලොම්-පැරණි ගමක වැටුණු දබ්බ තෘණ මෙන් නිය-දඬුවක තබන ලද මීඇටවල පොතු මෙන් දත්-මැටි පිඩක ප්‍රවේශ කරවා තැබූ ලබුඇට මෙන්, සම-වීණා කදවෙළු තෙත් ගව සමක් වැනි, මාංශ-බිත්තියක ආලේප කළ මැටි මෙන්, නහර-දැව සමූහයක් බැඳ ඇති වැල් මෙන්, ඇට-බිත්තියක් ඔසවා තබන දැවදඬු රාශියක් මෙන්, අට්ඨිමිංජ-මගා උණ ගසෙහි බහාලන ලද තැම්බූ වේවැලක් හෝ වක්කං හදයං යකනං කිලොමකං පිහකං මේ කොටස් හය බලු ගෙයක් සේ ද වැටහේ. දෙතිස් රියන් බඩවැල-ලේ ඔරුවක ඔතා තබන ලද සෝර සර්පයෙකු මෙන් අන්තගුහණය පාපිස්නේ වියන ලද ලනුව මෙන්, උදරියං - පෙරහනක ලිහිල්ව බඳින ලද සහල් මෙන් කරීස - උණ පුරුකක බහන ලද පඬුපැහැ මැටි මෙන්, මත්ථලුංග මැඩ තබන ලද සහල්පිටි පිඬු සතරක් මෙන්, දොළොස් වැදෑරුම් ආපෝධාතු පිළිවෙළින් තබන ලද දිය සරා දොලක පිරවූ ජලය මෙන් වැටහේ. ඉක්බිති අවවාද දෙන ආචාර්යවරයාට කිවයුතුය.

ආචාර්යවරයා විසින් කමටහණක් මෙන් තිබෙන කමටහනක් නොවන්නකැයි විසංවාද නොකටයුතුය. යහපත්ය. පිංවත, ඔබ පෙර ධාතු මනසිකාරයෙහි භාවනා කරන ලද වන්නේය. එම කමටහනින්ම ඔබට සප්පාය වේ. (ගෝචර වේ.) ධාතු වශයෙන්ම සජ්ඣායනා කරන්නැයි කිවයුතුය. ඔහු විසින්ද ධාතු වශයෙන් සජ්ඣායනා කළයුතුය. මනසිකාර වශයෙන්ම සජ්ඣායනා විධානය. කෙස් හිස වෙලා සිටි සමෙහි හටගත්තේය. හිස වෙලා සිටි සම ද මා කෙරෙහි කෙස් හටගත්තේ යයි නොදනී. කෙස්ද හිස වෙලාසිටි සමෙහි හටගත්තේයයි නොදනී. මේවා අචේතනය, අව්‍යාකෘතය, ශුන්‍යය, තදය. මෙය රළු පඨවි යයි මෙනෙහි කරයි. ලොම් ශරීරය වසා සිටි සමෙහි හටගත්තේය. ශරීරය වසා සිටි සමෙහි හටගත්තේයයි ඒවා නොදනී. ශරීරය වසා සිටි සමද ඒවා තමා කෙරෙහි හටගත් බව නොදනී. ඒවාද අචේතනය. නිය ඇඟිලි අග

හටගත්තේය. ඇඟිලි අග හටගත් බව ඒවා නොදනී. ඒවා ඇඟිලි අග හටගත්තේ යයි ඇඟිලි අගද නොදනී. ඒවාද අචේතනය. දත් හනුවල හටගත්තේය. හනු ඇටයේ හටගත් බව දත් නොදනී. දත් හකු ඇටයේ හටගත් බව හකුඇටය නොදනී. ඒවා අචේතනය. සම ශරීරය වෙලාසිටින බව නොදනී. ශරීරයද සම තමා වෙළා ඇතැයි නොදනී. මෙයද අචේතනය. ශරීරය ද සම තමා වෙළා ඇතැයි නොදනී. මෙයද අචේතනය. ශරීරය ආලේප කර ඇතැයි මාංශය නොදනී. ශරීරයද.........නොදනී. මෙයද අචේතනය. ඇට රැස බැඳ ඇතැයි නහර නොදනී. ඇට රාශියද නොදනී. මෙයද අචේතනය. හිසේ ඇට බෙල්ලේ ඇට මත සිටීයයි නොදනී. බෙල්ලේ ඇටද තමා මත හිසේ ඇට සිටී යයි නොදනී. බෙල්ලේ ඇට තමන් පිටකටුවේ ඇට මත සිටී යයි නොදනී. කලවා ඇට ජංගා ඇට ගොප් ඇට නොදනී. තමා පතුලේ ඇට මත සිටි බව පතුලේ ඇට තමා ගොප් ඇට ඔසවා සිටී යයි නොදනී. ඇට පිළිවෙලින් සිටින බව මෙනෙහි කළ යුතුය. නහරවලින් නොයෙක් සන්ධි වල ඇත. මේවා අචේතනය. වියලි දර කැබලි වේය. අට්ඨිමිංජං වක්කං.... මත්ථලුංගං අචේතනය. අබ්‍යාකතය. ශුන්‍යය. තදය. රළු පඨවි ධාතුවයයි මෙනෙහි කරයි. පිත් සෙම් මූ අචේතනය. අව්‍යාකතනය. ශුන්‍යය. යූෂ ඇති ආපෝ ධාතුව යයි මෙනෙහි කරයි. මේ මහාභූත දෙක මෙනෙහි කරමින් විමසන්නාට උදරයෙහි බහුල වූ තේජෝ ධාතුව ප්‍රකට වේ. නාසයෙහි වායෝ ධාතුව ප්‍රකට වේ. මේ මහාභූත සතර විමසනවිට උපාදාය රූප ප්‍රකට වේ. මහාභූත උපාදාය රූපවලින් අවසන් වේ. උපාදාය රූප මහාභූත රූපවලින් අවසන් වේ. ඡායාව අව්වෙන් අවසන් වේ. අව්ව ඡායාවෙන් අවසන් වේ. මහාභූත උපාදාය රූපද එසේය.

ඉක්බිති ඔහුට සතරමහා භූත රූප උපාදාය රූප විසිතුන යයි යනු රූපස්කන්ධයද රූපස්කන්ධ විමසනවිට ආයතන ද්වාර වශයෙන් අරූපී ස්කන්ධ ප්‍රකට වේ. මෙසේ රූප අරූප පරිග්‍රහ පංචස්කන්ධය වේ. පංචස්කන්ධයේ දොලොස් ආයතන වේ. දොලොස් ආයතනවල අට්ඨාරස ධාතු වේ. ස්කන්ධ ධාතු ආයතන වශයෙන් යමක තල්කඳක් පලන්නා සේ කොටස් දෙකක් කොට නාමරූප මෙනෙහි කරයි. හේ මේ නාමරූප අහේතු අප්‍රත්‍යයව නොහටගත්තේය. හේතුසහිතව ප්‍රත්‍ය සහිතව හට ගත්තේය. එහි හේතු මොනවාද? එහි ප්‍රත්‍ය කවරේද?යි පරීක්ෂා කරන්නේ අවිජ්ජා පච්චයා තණ්හා පච්චය කම්ම පච්චය ආහාර පච්චයයි පච්චය මෙනෙහි කර අතීතයෙහි ප්‍රත්‍යයද ප්‍රත්‍ය සමුත්පන්න ධර්මද අනාගතයෙහිද

දැන්ද ප්‍රත්‍යයද ප්‍රත්‍ය සමුප්පන්න ධර්මද ඒවායින් එහා සත්වයෙක් හෝ පුද්ගලයෙක් හෝ නැත. පිරිසුදු සංස්කාර පුංජයක්මය. මෙසේ අද්ධා තුනේ සැක දුරුකරති. මෙය වනාහි විදර්ශනා වශයෙන් සංස්කාර සිතා බලන ඤාණ පරිඥ්ඤා නම් වේ.

මෙසේ සංස්කාර සිතා බලා සිටින භික්ෂූන් වහන්සේ බුද්ධරදුන්ගේ ශාසනයෙහි මුලට බැසගැනීම නම් වේ. ප්‍රතිෂ්ඨාව ලැබුවේ නම් වේ. උන්වහන්සේ චූල සෝතාපන්න නම් වේ. නියත ගති ඇත්තෙක් වේ. එබඳු වූ භික්ෂුව සත්ත සප්පාය පුග්ගල සප්පාය භෝජන සප්පාය ධම්ම සවණ සප්පාය ලැබ එකම ආසනයෙහි එක් ආකාරයකින් හටගෙන තිලකුණු නගා විදසුන් පිළිවෙළින් සංඛාර විමසා බලන්නේ රහත්බව ලබා ගනී. මෙය ධාතු වශයෙන් පිවිසි භික්ෂුවට රහත් බව දක්වා ඇති නිගමනයයි. විනිසයි.

යමෙකුට වනාහි වර්ණ වශයෙන් පිළිකුල් වශයෙන් ශූන්‍ය වශයෙන් නොවැටහෙනවිට මට නොවැටහේ යයි කමටහන අත්හැර නොසිටිය යුතුයි. කොටස් මෙනෙහි කරමින්ම භාවනා කළයුතුය. පුරාණ ස්ථවිරයන් වහන්සේලා කොටස් මෙනෙහි කිරීමම ප්‍රමාණවත් වේයයි කීහ. මෙසේ නැවත නැවත කොටස් වශයෙන් සජ්ඣායනා කරන යෝගියාට කොටස් ප්‍රගුණ වේ. ප්‍රගුණ වන්නේ කවදාද? යම්කලෙක කෙස් යයි ආවර්ජනා කළ පමණවත් මෙනෙහි කිරීම අන්තිම කොටස වූ මස්ලුංගය දක්වා ගමන් කරයි. එහි පිහිටයි. මස්ලුංගයේ ආවර්ජනා කළ පමණක් මෙනෙහි කිරීම පැමිණ මුල්කොටස වූ කෙස්වල පිහිටයි. ඇස් ඇති පුරුෂයෙකුට එකවැලක ඇමුණූ වර්ණ තිස්දෙකක් ඇති මල්මාලාවක් දකිනවිට පිළිවෙළින් හෝ ඉවත්වී බලන්නාට පිළිවෙළින්ම දෙතිස් වර්ණ මල්වැල හෝ ප්‍රකට වේ. ඒවාගේ කොටස් තිස්දෙක වැටහේ. විමසන්නා තිරිසන් සතෙක්ද මිනිස් සතෙක්දැයි නොවැටහේ. කොටස්ම වැටහේ. කන බොන දේ කොටස් අතර තබනවා මෙනි. කොටස ප්‍රගුණ වූ කාලයේ සිට තුන් මුඛයෙන් එකකින් මිදෙන්නේය. කමටහන් වර්ණ වශයෙන් හෝ පිළිකුල් වශයෙන් හෝ ශූන්‍ය වශයෙන් හෝ වැටහේ. කැවුම් පිසනු කැමති ස්ත්‍රිය අනා තබන තබන ලද පිටිවලින් යමක් කැමති වේනම් එය පිසයි. තබන ලද කලය යම්සේ සිදුරු කෙරේද එසේ ජලය හික්මෙයි. එසේම කොටස් ප්‍රගුණ වූ කල තුන් මුඛයේ එකකින් මිදෙන්නේය. කැමති වර්ණයෙන් පිළිකුලෙන්, ශූන්‍යයෙන් කමටහන් වැටහෙන්නේය.

මෙතෙකින් මෙය උග්ගහ සන්ධි නම් වේ. මේ උග්ගහ සන්ධියෙහි සිය රහත්බවට පැමිණියෝ ගණන් සීමා ඉක්මවා සිටිති. උග්ගහ සන්ධියෙහිද යමෙකුට කමටහන නොවැටහේ නම් ඔහු කමටහන උගෙන විසූ ස්ථානය සප්පාය නොවේ. සුදුසු ගෝචර ස්ථානයක විසිය යුතුය. එතනද දහඅටක් වූ විහාර පළිබෝධ දුරුකර පංචාංගයෙන් සමන්විත සේනාසනයක විසිය යුතුය. තවද පංචාංගයෙන් යුක්ත විය යුතුය. එසේ වීමෙන් පසු පිඬුසිඟා පසු බතින් පසු රෑ ස්ථානයකට හෝ දිවා ස්ථානයකට හෝ පිවිස කමටහන් මෙනෙහි කළයුතුය. කෙසේද? යට කියන ලද ක්‍රමයෙන් මුල පටන් පිළිවෙළින් සිහිකළ යුතුය. එකක් හැර එකක් නොවේ. පාද තිස්දෙකක් ඇති ඉණිමගක පාද පිළිවෙළින් පා තැබීමෙන් ප්‍රාසාදයට නැගී එහි ප්‍රයෝජන ලබාගන්නා පුරුෂයකු මෙන් කෙසා ලොමා යන පිළිවෙළින් කමටහන මෙනෙහි කරන්නාට කමටහනද නොපිරිහේ. ප්‍රාසාදයේ ප්‍රයෝජන මෙන් නව ලොව්තුරු දහමද අවබෝධ වේ. පිළිවෙළින් සිහිකිරීමද ඉතා ඉක්මණින් හෝ ඉතා සෙමින් හෝ නොකළ යුතුය. ඉතා ඉක්මණින් මෙනෙහි කරන්නාට කිසියම් කමටහනක් ප්‍රගුණ වුවත් එය ප්‍රකටව නොවැටහේ. එහි උපමාව යට කියන ලද්දේය. ඉතා සෙමින් සිහිකරන්නාට කමටහන අවසානයට නොපැමිණේ. අතරමැද කඩා වැටේ. යම්සේ පුරුෂයෙක් කච්චිය තරව ගෙන (සුරක්ෂිතව හැඳපැළඳගෙන) තුන්යොදුන් මගට පිළිපත්තේ පටන්ගත් තැන සිට සිහිල් සෙවන දැක විසුම් ගනී. රමණීය වැලිතලා දැක පිට දිගහරියි. (වැදහොවයි.) වන පොකුණු දැක පැන් පානය කරයි. ස්නානය කරයි. පර්වත දැක ඒවාට නැගී පර්වතවල සිරිය දකියි. අතරමග සිටි නයෙක් හෝ ව්‍යාඝ්‍රයෙක් හෝ දිවියෙක් හෝ ඔහු විනාශ කරයි. සොරු ඔහුගේ වස්තුව පැහැරගෙන ඔහු මරා දමති. එසේම ඉතා සෙමින් සිහිකරන්නාට කමටහන අවසානයට නොපැමිණේ. අතරමග බිඳවැටේ. (පසුබසී.) ඒ නිසා ඉතා ඉක්මණින් හෝ ඉතා සෙමින් හෝ නැතිව එක් දිනකට තිස්වාරයක් මෙනෙහි කළයුතුය. පාන්දර දසවරක් දවල් දසවරක් රාත්‍රියේ දසවරක් සජ්ඣායනා කළයුතුය. කුමක් කරන්ට නොවටීද? පාන්දර නැගිට මුව දෙවීම නොවටීද? කන බොන දේ කෑමට බීමට නොවටීද? ඒවා වටී. නමුත් එයම කිරීම නොවටී. කරන්නා මහත් ප්‍රයෝජන ගෙන නොසිටී. යම්සේ එක් පුරුෂයෙකුට කුඹුරු තුනක් ඇත. එකක් අට කුඹුරැකි. එකක් සොලොස් කුඹුරකි. අනික දෙතිස් කුඹුරකි. කුඹුරු තුනම වැඩකිරීම නොහැකි පුරුෂයා මින් දෙකක් අත්හැර දෙතිස්කුඹ ඇති කුඹුර වැඩ කළයුතුය. එහි හැකි වැපිරීම කැපීම් ආදිය කළයුතුය. එවිට ඔහුට ඉතිරි දෙකද කළා සේ

ප්‍රයෝජන ලැබේ. එසේම සෙසු මුව සෝදන කටයුතු හැරදමා වුවද මේ කටයුත්ත කළයුතුය. නොකර සිටීම නොවටී. කරන්නා මහත් අර්ථයක් ගෙන සිටී. මෙපමණකින් මධ්‍යම ප්‍රතිපදාව කියන ලදී.

මෙසේ පිළිපත් යෝගියා නොසන්සුන් ගතිය වළක්වා ගතයුතුය. කමටහන අත්හැර බාහිර දෙයින් නොසන්සුන් වන්නේ නම් කමටහන පිරිහේ. එයින් බිය ඉක්මවීමට නොහැකි වේ. යම්සේ එක් පුරුෂයෙක් දහසක් ණය දී පොළිය ලැබ මාර්ගයට බැස්සේ අතරමග කිඹුල් මුවර දියරකුස් ආදීන්ගෙන් ගැවසී ගත් ගැඹුරු ගිරිකඳුරයක් (ඔයක්) මත ඇතිරූ එක් අයෙකුට යා හැකි ඒදණ්ඩට නැගී යන්නේ එහෙ මෙහෙ බලමින් තබන පියවර ගැන නොසලකා එයින් ඇද වැටී කිඹුල් ආදීන්ට ගොදුරු වේ. බත් වේ. එසේම මේ අයද කමටහන අත්හැර බාහිර දෙයින් කැළඹී යනවිට කමටහනින් පිරිහේ. සසරබිය දුරුකිරීමට නොහැකි වේ. මෙය උපමා සංසන්දනයයි. පුරුෂයා දහසක් ණය දී පොළී ලැබූ කාලය මෙන් මේ භික්ෂුවගේ ගුරුවරයා සමීපයෙහි කමටහන උගත් කාලය අතරමග ගැඹුරු ගිරිකඳුරු මෙන් සසර - සසර මගදුක කිඹුල් ආදීන් සපාකෑම මෙනි. මේ භික්ෂුවගේ සජ්ඣායනා වීර්‍ය ඒකපළික සේතුව මෙනි. මේ භික්ෂුව කමටහන අත්හැර බාහිර දෙයින් කැළඹී කමටහනින් පිරිහී සසර බයින් මිදීමට නොහැකිවීම ඒක පදිකදණ්ඩ සේතුවට නැගුණු මිනිසා එහෙ මෙහෙ බලා පය පැකිලී ඇදවැටී කිඹුල්නට බත් වූවා මෙනි. එනිසා කෙස් මෙනෙහි කළ යුතුය. කෙස් මෙනෙහිකර සිත බාහිර අරමුණුවලින් වලකා පිරිසිදු සිතින් ලොම් තිය දත් සම් මෙනෙහි කළයුතුය. මෙසේ මෙනෙහි කරන්නාට කමටහන් නොපිරිහේ. සසරබිය දුරුකරයි. උපමාව එසේම පෙරළා දතයුතුය. දහසක් ණය දී පොළිය ලත් දක්ෂ පුරුෂයෙකුගේ ඒදණ්ඩට නැගී සකසා හැඳපෙරව ශරීරය කෙලින් තබාගෙන සුවසේ පරතීරයට යෑම මෙන් දක්ෂ භික්ෂුව කෙස් මෙනෙහිකර සිත විපිලිසර බවට පමුණුවන බාහිර කරුණු දුරුකර පිරිසිදු සිතින් ලොම් තිය දත් සම් සිහිකරමින් කමටහනින් නොපිරිහී සසර බය ඉක්මවීම දතයුතුය. මෙසේ බාහිර විශේෂ දුරුකරන්නා විසින් යට කියනලද නය අනුවම ප්‍රඥප්ති ඉක්මවීමද මෙනෙහි කළයුතුය. කෙස් ලොම් යන පැණවීම් අත්හැර පිළිකුල් පිළිකුල් යයි සිහිය තබා පළමුවම වනාහි පිළිකුල් වශයෙන් නොවැටහේ. වැටහෙනතුරු පැණවීම අත්නොහැරිය යුතුය. වැටහෙනවිට පැණවීම අත්හැර පිළිකුලම මෙනෙහි කළයුතුය. මෙනෙහි කරන්නාද යට කියනලද ආකාරයෙන්ම පස් ආකාරයකින් පිළිකුල මෙනෙහි කළ යුතුය.

තච පංචකයෙහි වර්ණ සණ්ඨානයෙන්ම ආසය අවකාශය වශයෙන්ම පස්විධ වූ පිළිකුල් බව ලැබේ. සෙස්සෙහිද ලැබෙන ලැබෙන ආකාරයෙන් මෙනෙහි කිරීම පවත්වාගෙන යා යුතුය. එහි කෙස් ආදි කොටස් පහ සුභ නිමිති රාගයට හේතුවූ අරමුණු වේ. ඇලෙන අය මෙම කොටස් පහෙහිම ඇලෙති. මේ භික්ෂුව වනාහි මහජනයා ඇලෙන තැන පිළිකුල් යයි අර්පණාව පමුණුවයි. එහි අර්පණාවට පැමිණි තැන් විටත් අනිත් සියල්ලම අර්පණාව පමුණුවයි. ඊට මේ උපමාවකි. දක්ෂ වූ දුනුවායෙක් රජු සතුටුකොට ලක්ෂයක් උපදනා ගම්වරයක් ලැබ පංචායුධයෙන් සන්නද්ධව එහි යන්නේ, අතරමග සොරුන් තිස්දෙදෙනකු දැක ඔවුන්ගෙන් සොර නායකයන් පස්දෙනෙකු විනාශ කරන්නේය. ඔවුන් විනාශවීමේ සිට ඔවුන්ගෙන් දෙදෙනෙකු එකමඟට පිවිසියේ නම් නැත. මීට ස්වභාව දතයුතුය. රජු සතුටුකර ගම්වරය ලැබූ කාලය මෙනි. මේ භික්ෂුව ගුරුවරයා සමීපයෙහි කමටහන ඉගෙන සිටි කාලය. කොටස් තිස්දෙක දෙතිස් සොරුන් මෙනි. කෙස් ආදි පහ නායක සොරු පස්දෙනා මෙනි. මේ භික්ෂුව සියළු සතුන් ඇලෙන තච පංචකයෙහි පිළිකුල් ඉපදවීම සොර නායකයන් පස්දෙනා ඝාතනය කිරීම. සෙසු සොරුන් අතර පහර ලැබ පලායන කාලය මෙන් සෙසු කොටස් සියල්ල අර්පනාවට නැංවීම දතයුතුය. මෙසේ ප්‍රඥප්ති සමතික්‍රමණය මෙන් අනුපූර්ව මුඤ්චන මෙනෙහි කිරීම.

කෙස් මෙනෙහි කරන්නා විසින් කෙස් මෙනෙහි කරමින්ම කෙස්වලට සාපේක්ෂව ලොම් කෙරෙහි සිහිය යැවිය යුතුය. ලොම් වැටහෙනතුරු කෙස් කෙස් යයි සිහිකළ යුතුය. ලොම් වැටහෙනවිට කෙස් කෙරෙහි සිහිය අත්හැර ලොම් කෙරෙහි සිහිය පිහිටවිය යුතුය. නිය ආදිය කෙරෙහිද මෙසේ පැවැත්විය යුතුය. මේ ඊට උපමාවකි. කුඩැල්ලා යනවිට ඉදිරියේ ප්‍රතිෂ්ඨාවක් නැත්නම් නඟුටෙන් ගත් ස්ථානය අත් නොහරියි. ඉදිරියේ ප්‍රතිෂ්ඨාවක් ලැබූවිට නඟුට ඔසවා මුඛයෙන් ගත් තැන තබයි. එසේම කෙස් මෙනෙහි කරන්නා විසින් කෙස්වලට සාපේක්ෂව ලොම් කෙරෙහි සිහිය යැවිය යුතුය. ලොම් වැටහෙනතුරු කෙස් යයි සිහිකළ යුතුය. ලොම් වැටහෙනවිට කෙස් අත්හැර ලොම් කෙරෙහි සිහිය පිහිටවිය යුතුය. නිය ආදියෙහිද මෙසේ පැවැත්විය යුතුය. මෙසේ පවත්වන්නා විසින් අර්පණා වේයයි කියන ලද සිහිකිරීමේ කෞශල්‍යය සම්පාදනය කළයුතුය කෙසේද?

මේ අර්පණා කර්මස්ථානය මෙනෙහි කරන්නාට අර්පණාව පැමිණේ. පළමුව තවම නොවැටහේ. මුලක් නැති සසරෙහි විවිධ අරමුණු වඩන ලද සිත කෙස් යයි ආවර්ජනය කළ පමණකින් සජ්ඣායනය සෝත අනුසාරයෙන් ගොස් මොළයෙහි පිහිටයි. මත්ථලුංගය ආවර්ජනා කළ පමණකින් සජ්ඣායනය සෝත අනුසාරයෙන් පැමිණ කෙස්වල පිහිටයි. මෙනෙහි කරන්නාට ඒ ඒ කොටස් වැටහේ. සිහිය එකඟය. මෙහිද සිමින් පවතී. එයින් යම් යම් කොටස් අධිකව වැටහේ නම් ඒ ඒ කොටස් ද්විගුණව භාවනා කර අර්පණා පැමිණවිය යුතුය. මෙසේ අර්පණාව පැමිණි කාලයෙහි පටන් සෙසු කොටස්වල සම්පූර්ණයෙන් අර්පණාව පැමිණවිය යුතුය. එහි තල්වනයෙහි වඳුරාගේ උපමාවය. තවද මෙහි මෙසේ යෝජනාවද දතයුතුය. ගස් තිස්දෙකක් ඇති තල්වනයෙහි වඳුරා වසයි. ඌ ගනු කැමති වැද්දා මුලින් සිටි තල්ගස මුලසිට ශබ්ද කළේය. මාන්නයක් ඇති වඳුරා ඒ ඒ තල්ගස්වලට පැන අවසාන තල්ගසේ සිටියේය. වැද්දා එහිද ගොස් ශබ්ද කළේය. වඳුරා පෙර සේම පැනගෙන මුල් තල් ගසේ සිටියේය. වඳුරා නැවත නැවත ලුහුබඳිනු ලැබූ නිසා ක්ලාන්ත වෙමින් ඒ ඒ තල්ගසේ මුල සිට ශබ්ද පවත්වනවිට නැගිට යයි. තද ක්ලාන්තය නිසා එක් තල්ගසක මුදුනේ කරඬුව තදින්ගෙන සිටීම දුන්නෙන් විද්දත් පලා නොයයි. එහි තල්ගස් කොටස් තිස්දෙක මෙනි. සිත වඳුරා මෙනි. යෝගාවචරයා වැද්දා මෙනි. තල්ගස මුලසිට වැද්දා විසින් කැගසනු ලැබූවිට මානඅධික වඳුරා පලාගොස් අවසාන තල්ගසේ සිටි කාලය මෙන් මුලක් නැති සසරෙහි නොයෙක් අරමුණුවල වඩන ලද සිත කෙස් යයි ආවර්ජනා කළ පමණකින් ශබ්දය සෝත අනුසාරයෙන් ගොස් මොලයෙහි පිහිටීම. අවසාන ගස ලඟ සිට ශබ්ද කළවිට මුල් තල්ගසට පැමිණීම මෙන් මොලය ආවර්ජනා කළ පමණින් ශබ්දය සෝත අනුසාරයෙන් ගොස් කෙස්වල පිහිටීම. නැවත නැවත ලුහුබඳිනවිට ක්ලාන්ත වී ශබ්ද කරන ස්ථානවල නැගිට බලනවා මෙන් මෙනෙහි කරනවිට ඒ ඒ කොට්ඨාශ වැටහී සිහිය පිහිටුවා යෑම දුන්නෙන් විද ගැනීමට තැත්කරනවිට පලා නොයනවා මෙන් කොටසක් අධිකව වැටහී ද්විගුණය මෙනෙහි කර අර්පණා පැමිණවීම. එහි අර්පණා පැමිණි කාලයේ පිටින් සෙසු කොටස්වලද අපහසුවක් නැතිව අර්පණා පැමිණෙන්නේය. ඒ නිසා පිළිකුල් පිළිකුල්යයි නැවත නැවත ආවර්ජනා කළයුතුය. සිත අරමුණුකර පිහිටවිය යුතුය. තර්ක විතර්ක කළයුතුය. මෙසේ කරන්නාට ස්කන්ධ සතර පිළිකුල් අරමුණු වේ. අර්පණය පැමිණේය. පූර්වභාග සිත පරිකර්ම උපචාර සංඛ්‍යාත විතක්ක විචාර සියල්ල යට කී පරිදිය. එක්

කොටසක් සිහිකරන්නාට ප්‍රථම ධ්‍යානය උපදී. වෙන වෙනම මෙනෙහි කරනවිට දෙතිසේම ප්‍රථම ධ්‍යානය උපදින්නේය. **සො තං නිමිත්තං** - ඒ භික්ෂුව ඒ කර්මස්ථාන නිමිත්ත. **අසෙවති** - සේවනය කරයි. ඇසුරු කරයි. **භාවෙති** - වඩයි. **බහුලීකරොති**-නැවත නැවත කරයි. **ස්වාවත්ථිකං වවත්ථපෙති** - හොඳින් සිතේ තබාගනී. බහිද්ධා කාය චිත්තං උපසංහරති. මෙසේ කොට බාහිර කෙනෙකුගේ සිරුරෙහි තමාගේ සිත එලවයි. තබයි. යවයි. **අත්ථිස්ස කායෙ** - ඔහුගේ කයෙහි ඇත. **අජ්ඣත්ත බහිද්ධා කායේ චිත්තං උපසංහරති** කලින් කලට තමාගේ හා අනිකකුගේ සිරුරෙහි සිත යවා තබයි. **අත්ථි කායෙ** මෙය ඒකාන්තයෙන්ම තමාගේ කය හෝ අනුන්ගේ කය යයි අදහස් නොකරයි. එනිසා කියන ලදී. මෙහි වනාහි තමාගේ ජීවමාන ශරීරයෙහි පිළිකුල සම්බන්ධව පරිකර්ම භාවනාව කරන්නාට අර්පණාවද උපචාරයද උපදී. අනුන්ගේ ජීවමාන ශරීරයේ පිළිකුල පිළිබඳ පරිකර්ම භාවනාව කරන්නාව අර්පණාවද නූපදී. උපචාරයද නූපදී. දස අසුභය පිළිබඳව පරිකර්ම භාවනාව කරන්නාව මේ අවස්ථා (අර්පණා, උපචාර) දෙක නූපදීද? උපදී. ඒවා අනුපාදින්නක (තෘෂ්ණා වශයෙන් නොගන්නා ලද) පක්ෂයෙහි පවතින බැවිනි. ඒ නිසා එහි අර්පණාද උපචාරයද උපදී. මෙය වනාහි තෘෂ්ණා වශයෙන් ගන්නා ලද (උපාදින්නක) පක්ෂයෙහි සිටී. ඒ නිසා මෙහි මේ කොටස් දෙක නූපදී. අසුභානු පස්සනාව විපස්සනා භාවනාව වේයයි දතයුතුය. මේ සියල්ලෙහි කුමක් කියන ලදද? සමථය හා විපස්සනාව කියන ලදී. දැන් මෙහි එසේ සියල්ල මෙනෙහි කිරීමට සාධාරණ වූ ප්‍රකීර්ණක යයි දතයුතුය. මේවායෙහි:-

**නිමිති කුණු දාතු - හිස් කඳුවලින් යුත්වන**
**කෙස් ආදි විනිසය - දැනගනු යෙහේ මැනවින්**

එහි කොටස් තිස්දෙකේ නිමිති එකසිය හැටක් වේ. යෝගාවචරයා ඒවා අනුව ද්වත්තිංසාකාරය කොටස් වශයෙන් විමසයි.කෙසේද? කෙස්වල වර්ණ නිමිත්ත සටහන් නිමිත්ත, දිසා නිමිත්ත, අවකාශ නිමිත්ත, පරිච්ඡේද නිමිත්ත යයි පස් නිමිති වේ. ලෝම ආදියෙහිද මෙම නයමැයි. කොටස් තිස්දෙකේ ලකුණු වශයෙන් එකසිය විසිඅටක් වේ. යෝගාවචරයා ද්වත්තිංසාකාරය ලකුණු වශයෙන් මෙනෙහි කරයි කෙසේද? කෙස්වල දැඩි වූ ලක්ෂණය, බැඳුණු ලක්ෂණ උෂ්ණ ලක්ෂණය, පිම්බවීම් ලකුණ යයි ලකුණු සතරෙක් වේ. ලෝමාදියෙහිද එසේය. ද්වත්තිංසාකාරය ධාතු

වශයෙන් එකසිය විසිඅටක් වේ. ඒවා අනුව යෝගාවචරයා ද්වත්තිංසාකාරය ධාතු වශයෙන් විමසයි. කෙසේද? කර්කශ බව පඨවි ධාතුය. බැඳීම් බව ආපෝ ධාතුය. උෂ්ණභාවය තේජෝ ධාතුය. පිම්බීම් ලක්‍ෂණය වායෝ ධාතුයයි ධාතු සතරෙක් වේ. ලෝමාදියෙහි ද මෙම නයයි. කොටස් තිස්දෙකේ ශූන්‍යතා අනුහයක් වේ. ඒවා අනුව යෝගාවචරයා ශූන්‍යතාව විදර්ශනය කරයි. (දකියි යූ සේයි) කෙසේද? තමා විසින් හෝ තමා කෙරෙහි හෝ නිත්‍ය වශයෙන් හෝ ස්ථිර වශයෙන් හෝ ශාස්වත වශයෙන් හෝ වෙනස් නොවන ධර්මයක් වශයෙන් හෝ යයි කෙස් ශූන්‍ය වේ. කෙස්වල ආත්ම ශූන්‍යතාව, ආත්මය කෙරෙහි ශූන්‍යතාව නිත්‍යභාව ශූන්‍යතාව යයි ශූන්‍යතා තුනක් වේ. ලොම් ආදියෙහිද මෙම නයයි. කෙස් ආදි කොටස් තිස්දෙක ස්කන්ධ වශයෙන් විමසනවිට කෙස් ස්කන්ධ කීයක් වේද? ආයතන කීයද? ධාතු කීයද? සත්‍ය කීයද? සතිපට්ඨාන කීයදැයි ආදි නයින් ස්කන්ධවලද විනිස දතයුතුය. මෙසේ අජ්ඣත්ත ආදි බෙදීම් වශයෙන් තුන් ආකාරයෙන් කායානුපස්සනාව විස්තර වශයෙන් දක්වා, දැන් **කායානුපස්සී විහරති ආතාපී සම්පජානො** යන ආදි පද බෙදා දැක්වීමට **අනුපස්සී** ආදිය ආරම්භ කළහ. එහි යම් අනුපස්සනාවකින් කය දැකීම වේ. එය දැක්වීමට **තත්‍ථ කතම අනුපස්සනා යා පඤ්ඤා පජානාති** යන ආදිය යට චිත්තුප්පාද කාණ්ඩ වර්ණනාවෙහි කියන ලද නයින්ම දතයුතුය. **උපෙතො** යන සියල්ල අඤ්ඤමඤ්ඤ සමානාර්ථ වචන වේ. තවද ආසේවන වශයෙන් **උපෙත** වේ. භාවනා වශයෙන් වහා පැමිණේ යයි **සමුපෙතා** වේ. **උපාගතො, සමූපාගතො, සම්පන්නො, උපපන්නො** යන මේවායෙහි ද දුක දෙකෙහිද මෙම නයමැයි. බහුල වශයෙන් වනාහි **සමන්නාගතො** යන මෙසේ මෙහි යෙදීම දතයුතුය. **ඉමිනා ආතාපෙන උපෙතො** යන ආදියෙහි ද මෙම නයයි. **විහරති** යන පදයෙහි එහි කවර විහරණයක්දැයි ප්‍රශ්න නොකොට පුද්ගල අධිෂ්ඨාන දේශනාවෙන් දේශනා කරන්නේ **ඉරියති** යන ආදිය කීහ.

එහි අර්ථය සතර ඉරියව්වේ එක් ඉරියව්වකින් යුක්ත වීම් වශයෙන් **ඉරියති** වේ. ඒ ඉරියව් සතරින් කාය ස්කන්ධය පෙරලෙමින් **වත්තති** පවතී. එක් ඉරියව්වක දුක වෙනත් ඉරියව්වකින් චිරයානික යයි බාධාකොට ශරීර ආරක්ෂා කිරීම් වශයෙන් **පාලෙති** පාලනය කරයි. එක් ඉරියව්වක නොපිහිටා සියළු ඉරියව් පැවැත්වීමෙන් **යාපෙති** යැපෙයි. ඒ ඒ ඉරියව්වෙන් කය ජීවත් කරවීම් වශයෙන් **යාපෙති** යැපෙයි. දිගුකලක් පැවැත්වීමට **චරති** ගමන් කරයි. ඉරියව්වෙන් ඉරියව්ව සිඳදමා ජීවිතය ගෙනයැම්

වශයෙන් විහරති වාසය කරයි. සෙවච කායො ලොකො යන යම් කයක කායානුපස්සීව වාසය කරයිද? එම කයම බිඳීයෑම විනාශවීම් අර්ථයෙන් ලෝකය වේ. මේ කයෙහි යමකින් ප්‍රහීන වේනම් අභිද්‍යා දෝමනස්ස වේදනාදියෙහි ද ප්‍රහීන වේමය. එහෙයින් පඤ්චපි උපාදානක්ඛන්ධා ලොකො උපාදානක්ඛන්ධ පස ලෝකයයි කියන ලදී. සන්තා යනු නිරෝධ වශයෙන් සාන්තබවය. භාවනාවෙන් සමනය වූ නිසා සමිතා වේ. වස්තු පරිඥාවෙන් (වස්තු පිළිබඳ දැනගැනීමෙන්) වෙන්වීම් වශයෙන් වූපසන්ත වේ. නිරෝධ සංඛ්‍යාත අස්තයට ගියේ යයි අත්‍ථංගතා වේ. විශේෂයෙන් විනාශ කරන ලද්දේය. අතිශයින්ම නොපැවතීම තැබුවේය යන අර්ථයයි. යම්සේ නැවත නොවැගිරෙයි. මෙසේ වියලුණු බැවින් සොසිතා නම් වේ. වහා වියළුණේය යන විසෝසිතා ය. වියලුනේය යන අර්ථයයි. කෙළවර දුරුකරන ලද යන කතාව ව්‍යන්තිකතා වේ. මෙහිද කර්මස්ථාන විහරණයෙන් කර්මස්ථාන ගත්තහුගේ ශරීර පරිහරණයයි. වීර්යයෙන් සම්‍යක් ප්‍රධාන වීර්යයයි. සිහිකල්පනාවෙන් කර්මස්ථානය පරිහරණය කරන උපායයි සිහියෙන් හෝ කායානුපස්සනා වශයෙන් ලැබූ සමථයයි. විමසන නුවණින් විදර්ශනාවෙන් අභිද්‍යා දෝමනස්ස (ඇලීම් ගැටීම්) විනෝදනයෙන් (දුරු කිරීමෙන්) භාවනා ප්‍රයෝජන කියන ලදැයි දතයුතුය.

කායානුපස්සනා නිර්දේශයයි.

වේදනානුපස්සනා නිද්දේසයෙහි ද යට කියන ලද්දට සමානව කිය ලද නයින්ම දතයුතුය. සුඛං වෙදනං වෙදයමානො යනාදියෙහි වනාහි සුඛං වෙදනං යනු කායික හෝ මානසික හෝ සැප වේදනාවක් විඳින්නේ මම සැප වේදනාවක් විඳිමි යයි දනී යන අර්ථයයි. එහි උඩුකුරුව හොවනා දරුවෝද කිරිබොන ආදි කාලයෙහි සැප විඳින්නේ සැප වේදනාවක් විඳිමුයි දනිති. මෙය එබඳු දැනීමක් උදෙසා නොකියන ලදී. එබඳු දැනීමක් සිතා යයි යන අවබෝධය දුරු නොකරයි. සත්ව සංඥාව උදුරා නොදමයි. කර්මස්ථානය හෝ සතිපට්ඨාන භාවනාව හෝ නොවේ. මේ භික්ෂුවගේ දැනීම සත්ව අවබෝධය දුරුකරයි. සත්ව සංඥාවද උදුරා දමයි. කර්මස්ථානය සතිපට්ඨාන භාවනාවද වේ. මෙහි කවරෙක් විඳීද? වේදනාව කවරෙකුටද? වේදනාව කුමන කරුණක්ද? යන මෙහි දැන විඳීම සඳහා කියන ලදී. එහි කවරෙක් විඳීද? යන්නෙහි කිසි පුද්ගලයෙක් හෝ සතෙක් නොවිඳී. කාටද වේදනාව? කිසි සතෙකුට හෝ පුද්ගලයෙකුට වේදනාව නැත. වේදනවා කුමන කරුණකටද යන වස්තු හා

අරමුණුවලටය මේ වේදනාව. ඒ නිසා එය මෙසේ දතයුතුය. ඒ වේදනා පැවැත්ම ගෙන මං විඳිමියි යන ව්‍යවහාර මාත්‍රය වේයයි මෙසේ සලකමින් මේ තෙමේ සැපවේදනා විඳිමි යයි දනීයයි දතයුතුය. සිතුල්පව්වෙහි එක්තරා තෙරනමක් මෙනි. ස්ථවිරයන් වහන්සේ වනාහි බලවත් වේදනාවෙන් උත්සාහ ගන්නේ එහේ මෙහේ පෙරළෙති. එහි වැසි එක් දහර භික්ෂු නමක් ස්වාමීන් වහන්ස, රිදෙන්නේ කොතැනදැයි ඇසීය. ඇවැත්නි, වෙන වෙනම රිදෙන තැනක් නම් නැත. වස්තුව අරමුණු කොට වේදනාව විඳීයයි කීහ. මෙසේ දැනගත් කාලයේ සිට ඉවසීම වටිනවා නේද ස්වාමීන් වහන්ස යයි දහරා කීය. ඇවැත්නි, ඉවසමි. ස්වාමීන් වහන්ස, ඉවසීම යෙහෙකි. ස්ථවිරයන් වහන්සේ ඉවසූහ. වාතය හෘදය දක්වා ගොස් එය පැලීය. ඇඳෙහි අතුනුබහන් විසිරුණි. ස්ථවිරයන් වහන්සේ මෙපමණ ඉවසීම ඇවැත්නි වටීදැයි කුඩා භික්ෂුවට පෙන්වීය. කුඩා භික්ෂුව නිශ්ශබ්ද විය. ස්ථවිරයන් වහන්සේ විරිය සමාධිය යොදාගෙන සිව්පිළිසිඹියා සහිතව රහත්බවට පත්ව සිහියෙන් යුක්තව පිරිනිවන් පෑහ. යම්සේ සැපද එසේම දුකය. නිරාමිස වූ අදුක්ඛමසුඛ වේදනාව විඳින්නේ අදුක්ඛමසුඛ වේදනාව විඳිමියි දනී. මෙසේ භාග්‍යවතුන් වහන්සේ රූප කර්මස්ථානය වදාරා අරූප කර්මස්ථානය වදාරන්නේ, වේදනා වශයෙන් වදාළහ. රූප කර්මස්ථානය අරූප කර්මස්ථානය යයි කර්මස්ථානය දෙවැදෑරුම් වේ. රූප පරිග්ගහ අරූප පරිග්ගහ යයි මෙයම කියනු ලැබේ. භාග්‍යවතුන් වහන්සේ එහිදී රූප කර්මස්ථානය වදාරන්නේ සංක්‍ෂේප මෙනෙහි කිරීම් වශයෙන් හෝ විස්තර මෙනෙහි කිරීම් වශයෙන් හෝ චතුධාතු සිහිකිරීම වදාරති. ඒ දෙකම විසුද්ධි මාර්ගයෙහි සියළු ආකාරයෙන් දක්වන ලද්දේමය. අරූප කර්මස්ථානය වේදනා වශයෙන් බොහෝසෙයින් වදාරති.

ඵස්ස වේදනා චිත්ත වශයෙන් අරූප කර්මස්ථානයට පිවිසීම තුන්ආකාර වේ. කෙසේද? සමහර කෙනෙකුට සංක්‍ෂේපයෙන් හෝ විස්තර වශයෙන් අරූප කර්මස්ථානය පරීක්‍ෂා කරනවිට ඒ අරමුණෙහි වූ චිත්ත චෛතසිකයන්ගේ පළමුවන (අභිනිපාතයෙන්) පිවිසීමෙන් එම අරමුණ ස්පර්ශ කරමින් උපදින ස්පර්ශය ප්‍රකට වේ. සමහර කෙනෙකුට ඒ අරමුණු විඳින වේදනාව උපදී. ඒ අරමුණ හැඳිනගන්නා සංඥාවද සිතන්නා වූ චේතනාවද දැනගන්නවා විඤ්ඤාණයද උපදී. ස්පර්ශ පංචකයෙහිම විමසීම කරයි. යමෙකුට වේදනාව ප්‍රකට වේද? එයද වේදනාව පමණක් නූපදී. එය සමග ඒ අරමුණ ස්පර්ශ කරන ස්පර්ශයද උපදී. හැඳිනගන්නා

වූ සංඥාවද සිතන්නා වූ චේතනාවද දැනගන්නා වූ විඥ්ඥාණයද උපදීයයි ස්පර්ශ පංචකය විමසයි. යමෙකුට විඥ්ඥාණය ප්‍රකට වේද? එයද තනිව විඥ්ඥාණය පමණක් නූපදී. එය සමග ඒ අරමුණ ස්පර්ශය කරන ස්පර්ශයද විඳින වේදනාවද හැඳිනගන්නා සංඥාවද සිතන්නා වූ චේතනාවද උපදීයයි ස්පර්ශය පස්වැනි කොටම විමසයි. ඒ ඵස්ස පස්වැනි ධර්මයෝ කුමක් ඇසුරු කරත්දැයි පරීක්ෂා කරන්නේ වස්තු ආශ්‍රිත යයි දැනගනී. වස්තුනම් කරජ (මව්පියන් නිසා හටගත් ශරීරය) කියයි. යමක් උදෙසා කියන ලදද, මගේ මේ විඥ්ඥාණය මෙහි ආශ්‍රිතය. මෙහි බැඳුණේයයි හේ අර්ථ වශයෙන් හේතුවෙන් ම උපාදාය රූපයෝද, මෙසේ මෙහි ස්පර්ශය පස්වැනි කොට ඇති වස්තු රූපය නාමය යයි නාමරූපය දකී. මෙහි රූපය රූප ස්කන්ධයයි. නාමය සතර අරූප ස්කන්ධයයි. පංචස්කන්ධයෙන් මාත්‍රය වේ. පංචස්කන්ධය නාමරූප විනිර්මුක්තය. පංචස්කන්ධය පංචස්කන්ධයෙන් විනිර්මුක්ත නාමරූප නැත. මේ පංචස්කන්ධ කුමන හේතුවකින් පවතීද? පරීක්ෂා කරන්නේ අවිද්‍යාදි හේතුක යයි දකී. එයින් ප්‍රත්‍යය සහ ප්‍රත්‍යුත්පන්නද හැර අන්‍ය සත්වයෙක් හෝ පුද්ගලයෙක් හෝ නැත. පිරිසිදු සංස්කාර රාශිය යයි ප්‍රත්‍ය සහිත නාමරූප වශයෙන් ත්‍රිලක්ෂණය නගා විදර්ශනා පිළිවෙළින් අනිත්‍ය දුක්ඛ අනාත්මය විමර්ශනය කරන්නේ හැසිරේ. හේ අද අද යයි ප්‍රතිවේදය බලාපොරොත්තු වන්නේ එබඳු දවසෙහි සෘතු පුද්ගල භෝජන ධම්ම සවණ සප්පාය (සාත්තුව) ලබා එක් ආසනයක හුන්නේම විපස්සනාව මුදුන් පමුණුවා රහත්බවෙහි පිහිටයි.

මෙසේ මේ තුන්දෙනාගේම රහත්බව දක්වා කමටහන් කියන ලදී. මෙහිදී භාග්‍යවතුන් වහන්සේ විසින් අරූප කර්මස්ථානය වේදනා වශයෙන් දේශනා කරන ලදී. ස්පර්ශ වශයෙන් හෝ විඥ්ඥාණ වශයෙන් හෝ දේශනා කරනවිට ප්‍රකට නොවේ. අන්ධකාරය මෙන් හැඟේ. වේදනා වශයෙන් ප්‍රකට වේ. කවරහෙයින්ද? වේදනා හටගැනීම ප්‍රකටවන බැවිනි. සැප දුක් වේදනා පහළවීම ප්‍රකටය. සැප ඉපදෙන කාලයේ සියළු ශරීරය කැළඹෙමින් මැඩෙමින් පැතිරෙමින් ගලායමින් සියක්වර පිරිසිදු කළ ගිතෙල් කවන කලක් මෙන්ද සියක්වර පිසූ තෙල ගල්වන්නාක් මෙන්ද දියකල දහසකින් දාහය නිවන්නාක් මෙන්ද අහෝ සැපයි අහෝ සැපයයි වචන පිටකරන්නාක් මෙන්ද උපදී. යම්කලක දුක් උපදීද? සකල ශරීරය කැළඹෙත් මැඩෙමින් පැතිරෙමින් ගලායමින් රත්වූ ආයුධයක් පිවිසෙන්නාක් මෙන් දියකළ තඹ ලොහොදියෙන් ඉසින්නාක් මෙන්

වියළි තෘණ වනස්පති ඇති කැලය ගිනිහුලකින් දවන්නක් මෙන් අහෝ දුක් අහෝ දුකය විලාප ගසන්නාක් මෙන්ම උපදී. මෙහි සැප දුක් වේදනාවල ඉපදීම ප්‍රකටය. අදුක්ඛම සුඛ වේදනාව දැක්වීමට අපහසුය. අඳුරුය. අප්‍රකටය. එය සැප දුක් නැතිවිට සැපදුක් ප්‍රතික්ෂේප වශයෙන් මධ්‍යස්ථ ආකාර වූ අදුක්ඛමසුඛ වේදනා යයි නය වශයෙන් ගන්නහුට ප්‍රකට වේ. කුමක් වැනිද? යම්සේ අතරමග ගලපිට නැගී දුවන මුවාගේ අඩිපාරේ යන වැද්දා ගලේ එපිටද මෙපිටද අඩි දැක මැද නොදැක්කත් මෙයින් නැගී මෙයින් බැස මැද ගලේ මේ පැත්තෙන් ගියා වන්නේ යයි නයින් දැනගනී. මෙසේ නැගි තැන අඩි ලකුණ වේ. සැප වේදනා වේ පහළවීම ප්‍රකටය. මෙතන නැග මෙතැනින් බැස මැදින් මෙසේ ගියේ යයි නය (ක්‍රමය) ගැනීම මෙන් සැපදුක් නැතිකල්හි දුක්සැප ප්‍රතික්ෂේප වශයෙන් මධ්‍යස්ථ ආකර වූයේ අදුක්ඛමසුඛ වේදනාව යයි නය වශයෙන් ගන්නාට ප්‍රකට වේ. මෙසේ භාග්‍යවතුන් වහන්සේ පළමුව රූප කමටහන් කියා පසුව අරූප කමටහන් කියන්නේ වේදනා වශයෙන් පෙරළා දැක්වූහ. මෙහිම එය හුදෙකලාව නොදැක්වූහ. දීඝනිකායෙහි මහා නිදානය, සක්ක පඤ්හය, මහා සතිපට්ඨාන, මජ්ඣිම නිකායෙහි සතිපට්ඨාන, චූලතණ්හා සංඛය, මහාතණ්හා සංඛය, චූලවේදල්ල, මහාවේදල්ල, රට්ඨපාල, මාගන්දිය සූත්‍රවලද ධාතු විභංගයේ ආනෙඤ්ජ සප්පායෙහිද සංයුත්ත නිකායේ චූලනිදාන සූත්‍රය, රුක්ඛොපම, පරිවීමංසන සූත්‍රය, සකල වේදනා සංයුත්ත යයි නොයෙක් සූත්‍රවල පළමුව රූප කම්මට්ඨානය කියා පසුව අරූප කම්මට්ඨානය වේදනා වශයෙන් පෙරළා දැක්වූහ.

ඒ ඒවායෙ සේම මෙහිද සතිපට්ඨාන විභංගයෙහි පළමුව රූප කම්මට්ඨානය කියා පසුව අරූප කර්මස්ථානය වේදනා වශයෙන් වෙනස්කොට දැක්වූහ. එහි සැප වේදනා ආදියෙහි වේ. තවද දැනගැනීමේ පරියායකි. (ක්‍රමයකි.) **සුඛං වෙදනං වෙදයාමීති පජානාති** මෙසේ සැප වේදනා කෙරෙහි දුක්වේදනා අභාවයෙන් සැප වේදනා විඳින්නේ සැප වේදනාව විඳිමියි දැනගනී. එයින් එහි පෙර පැවති දුක් වේදනා නම් අනිත්‍ය අස්ථිර වෙනස්වන සුළු ධර්මයයි මෙසේ මෙහි දැනගැනීම වේ. මෙය භගවත්හු විසින් කියන ලදී. ගිනිවෙස්නා, යම් සමයක සැප වේදනා විඳියි. එසමයෙහි දුක්වේදනා නොවිඳියි. අදුක්ඛමසුඛ වේදනාවද නොවිඳී. එසමයෙහි සැපවේදනාවම විඳියි. ගිනිවෙස්න යම් සමයක දුක්වේදනාව විඳියිද එසමයෙහි සැපවේදනාව නොවිඳියි. එසමයෙහි දුක්වේදනාවම විඳියි. ගිනිවෙස්න යම් සමයක අදුක්ඛමසුඛ වේදනාව විඳියිද එසමයේ

සුඛ දුක්ඛ වේදනා නොවිඳියි. එසමයෙහි අදුක්ඛමසුඛ වේදනාවම විඳියි. ගිනිවෙස්න, සැප වේදනාද අනිත්‍යය. සංඛතය. පටිච්ච සමුප්පන්නය. ක්‍ෂය වන ධර්මයකි. ව්‍යය වන ධර්මයකි. විරාග ධර්මයකි. නිරෝධ ධර්මයකි. දුක් වේදනාද අදුක්ඛම සුඛ වේදනාද අනිත්‍යය. සංඛතය. පටිච්ච සමුප්පාදය, ක්‍ෂය ධර්මයකි. ව්‍යය ධර්මයකි. විරාග ධර්මයකි. නිරෝධ ධර්මයකි. ගිනිවෙස්න, මෙසේ බලන බහුශ්‍රුත ආර්ය ශ්‍රාවකයා සැප වේදනාවේද කලකිරේ. දුක් වේදනාවේද කලකිරේ. අදුක්ඛමසුඛ වේදනාවේද කලකිරේ. කලකිරීමෙන් නොඇලේ. විරාගය මිදීම ඇතිකරයි. මිදීමෙහි මිදුනෙමිය යන ඥාණය ඇතිවේ. ඉපදීම ක්‍ෂීණ විය. බඹසර වැස නිමියේය. කළයුතු දේ කරන ලදී. මින්පසු කරන්ට දෙයක් නැතැයි යන්න දැනගනී. **සාමිසං වා සුඛං** යනාදියෙහි ආමිස සැපයකි. පස්කම් ගුණ මිශ්‍ර ඇලෙන සෝතාදි වේදනා හය සාමිස දුක්ඛ නම්. නික්මීම් නිශ්‍රිත නොඇලෙන දොම්නස් වේදනා හයයි. සාමිස අදුක්ඛම සුඛ නම් ගෙහසිත උපේක්ඛා වේදනා හයය. නිරාමිස අදුක්ඛමසුඛ නම් නෙක්ඛම්ම නිශ්‍රිත උපෙක්ඛා වේදනා හයයි. ඒවායේ විභාගය උපරි පණ්ණාසයෙන් පාලියේ ආවේමය. **සො තං නිමිත්තං** යනු හේ එම වේදනා අරමුණය. **බහිද්ධා වේදනාසු** අන්‍ය පුද්ගලයන්ගේ වේදනාවල. **සුඛං වෙදනං වෙදයමානං** යනු අන්‍ය පුද්ගලයන් සැප වේදනාව විඳින **අජ්ඣත්ත බහිද්ධා** යනු කාලෙක තමාගේ කාලෙක අන්‍යයාගේ වේදනාවල සිත එක්තැන් කරයි. මේ වාරයෙහි තමා හෝ අන්‍යයා හෝ නියමිත නොවේ. එහෙයින් වේදනා විමසීම පමණක් දැක්වීමට **ඉධ භික්ඛු සුඛං වෙදනං සුඛා වෙදනා** ආදිය දෙසන ලදී. මෙහි සෙස්ස කියන ලදී. මෙම කොටසෙහි වනාහි පිරිසිදු වූ විදර්ශනාවම කියන ලදී.

**වේදනානුපස්සනා නිද්දේසයයි.**

**චිත්තානුපස්සනා** නිද්දේසයෙහි ද යට කියන ලද නයින්ම දතයුතුය. **සරාගං වා චිත්තං** ආදියෙහි **සරාගං** යනු අටවිධ ලෝභසහගත සිත්ය. **වීතරාගං** යනු ලෞකික කුසල අව්‍යාකෘත සිත්ය. මේවා සම්මර්ශනයෙන් ධර්මයේ එකඟබවක් ඇති නොවේ. ඒ නිසා මෙහි එක පදයකවත් නිවන නොලබයි. යම්හෙයකින් ප්‍රහාන ඒකාර්ථ වශයෙන් රාගාදිය සමග පවතී, සහ ප්‍රහීන වේ. එහෙයින් පද දෙකෙහි වෙනසක් නැතිව නොලැබේ යයි නොගන්නා ලදී. සෙසු අකුසල සිත් සතර පෙර පද හා සෙසු පසු පද භජනය නොකරයි. **සදොසං** යනු ද්විධය. දොම්නස් සහගතය. **වීතදෝසං**

යනු ලෞකික කුසල හා අව්‍යාකෘතය. සෙසු දස අකුසල සිත් පෙර පදය හා පසුපදය භජනය නොකරයි. **සමොහං** යනු විචිකිච්ඡා සහගත හා උද්ධච්ච සහගත යයි දෙපරිදිය. යම්හෙයකින් මෝහය සියළු අකුසල්වල උපදීද? එහෙයින් සෙස්ස ද මෙහි වටීමය. මේ දුකයෙහි දොලොස් අකුසල් සිත් සියල්ල ගන්නා ලදී. **වීත මෝහං** යනු ලෞකික කුසල හා අව්‍යාකෘතය. **සංඛිත්තං** යනු ථීන මිද්ධ (සිතේ හා කයේ මැලිගතිය ඇති) යුත් සිත්. මේවා හැකිළුණු සිත් වේ. **වික්ඛිත්තං** යනු උද්ධච්ච සහගත සිත්. මේවා විසිරුණු සිත් නම්. **මහග්ගතං** යනු රූපාවචර අරූපාවචර සිත්. **අමහගත්තං** යනු කාමාවචර සිත් **සඋත්තරං** යනු කාමාවචර සිත් **අනුත්තරං** යනු රූපාවචර අරූපාවචර. එහිද ස උත්තර - රූපාවචර සිත්ය. අනුත්තර අරූපාවචර සිත්ය. **සමාහිතං** යනු යමෙකුට අර්පණා සමාධි උපචාර සමාධි හෝ ඇතිබවය. **අසමාහිතං** යනු උභය සමාධි විරහිත (අර්පණා උපචාර) බවය.

**විමුත්තං** යනු තදංග වික්ඛම්භණ විමුක්ති වශයෙන් මිදීමය. **අවිමුත්තං** යනු උභය විමුක්තිය විරහිත බවය. සමුච්ඡේද පටිප්පස්සද්ධි නිස්සරණ විමුක්තිවලට මෙහි අවකාශයක් නැත. **සරාගමස්ස චිත්තං** මොහුගේ සිත රාග සහිතය යනුය. සෙස්ස යට කියනලද නයින් පැහැදිලිය. මේ කොටසෙහි පිරිසිදු විපස්සනාව කියන ලදී.

## චිත්තානුපස්සනා නිද්දේසය

මෙපමණකින් කායානුපස්සනාවේ රූපස්කන්ධ විමසීමද වේදනානුපස්සනාවේ වේදනාස්කන්ධය විමසීමද චිත්තානුපස්සනාවේ විඥ්ඥාණ ස්කන්ධ විමසීමද කියන ලදී. එහෙයින් දැන් සම්ප්‍රයුක්ත ධර්ම ශීර්ෂයෙන් සඤ්ඤා සංඛාර ස්කන්ධ විමර්ශනයද කීමට ධම්මානුපස්සනය දක්වන්නේ **කථඤ්ච භික්ඛු** ආදිය කීහ. එහි **සන්ත** යනු නිතර හැසිරීම් වශයෙන් විද්‍යමාන වූ. **අසන්තං** යනු නොහැසිරීම් වශයෙන් ප්‍රහීන වූ හෝ අවිද්‍යමාන වූ. **යථා චාති** යම් කරුණකින් කාමච්ඡන්දය ඉපදුනේ වේ. **තඤ්ච පජානාති** යනු ඒ කරුණ දනීයයි යනුයි. මෙම නයින් සියළු පදවල අර්ථ දතයුතුය. එහි සුභ නිමිත්තෙහි නුනුවණින් මෙනෙහි කිරීමෙන් කාමච්ඡන්දය ඉපදුනේ වේ. සුභ නිමිත්ත නම් සුභ දේද සුභ අරමුණද සුභ නිමිත්තය. නුනුවණින් මෙනෙහි කිරීම නම් උපාය රහිත සිහිකිරීමය. අමාර්ගයෙන් සිහිකිරීමය. අනිත්‍යයෙහි නිත්‍යයයි හෝ දුකෙහි සැපයයි

හෝ අනාත්මයෙහි ආත්ම යයි හෝ අසුභයෙහි සුභයයි හෝ මෙනෙහි කිරීමය. එය එහි බහුල වශයෙන් පවතිනවිට කාමච්ඡන්දය උපදී. එහෙයින් භගවත්හු කීහ. "මහණෙනි, සුභ නිමිත්තක් ඇත. එහි නුනුවණින් මෙනෙහි කිරීම බහුල වූයේ නූපන් කාමච්ඡන්දයේ ඉපදීම සඳහාද උපන් කාමච්ඡන්දයේ අධික වීම මහත්වීම සඳහා එයම හේතුවේ." අසුභ නිමිත්තෙහි නුවණින් මෙනෙහි කරන්නාට කාමච්ඡන්දය ප්‍රහීන වෙයි. අසුභ නිමිත්ත නම් අසුභ දේද අසුභ අරමුණද වේ. නුවණින් මෙනෙහි කිරීම නම් උපායෙන් හා මාර්ගයෙන් කරන මෙනෙහි කිරීමය. අනිත්‍යයෙහි අනිත්‍ය යයි හෝ දුකෙහි දුකයයි හෝ අනාත්මයෙහි අනාත්මයයි හෝ අසුභයෙහි අසුභය හෝ මෙනෙහි කිරීමය. එය එහි බහුල වශයෙන් පවතිනවිට කාමච්ඡන්දය ප්‍රහීන වේ. එයින් භගවත්හු කීහ. "මහණෙනි, අසුභ නිමිත්තක් ඇත. එහි නුවණින් මෙනෙහි කිරීම බහුල වූයේ නූපන් කාමච්ඡන්දයේ නොඉපදීම් සඳහා උපන් කාමච්ඡන්දයේ ප්‍රහානය සඳහා අධික නොවීම් සඳහා මහත් නොවීම සඳහා එයම හේතුවේ." තවද කරුණු සයක් කාමච්ඡන්දයේ ප්‍රහානය පිණිස පවතී. අසුභ නිමිත්ත ඉගෙනීම, අසුභ භාවනාවෙහි යෙදීම, ඉන්ද්‍රියයන් සංවර කරගැනීම, භෝජනයෙහි පමණ දැනීම, කලණ මිතුරන් ඇති බව, සප්පාය කථා යන සයයි. දස ආකාරයකින් අසුභ නිමිත්ත ඉගෙන ගන්නාට ද කාමච්ඡන්දය ප්‍රහීන වේ. අසුභ භාවනාව වඩන්නාටද ඉඳුරන් හෝ දොරවල් වැසූ තැනැත්තාටද ප්‍රහීන වේ. සතර පස් පිඩක් කෑමට ඉඩ තබා පැන් පානය කොට යැපෙන පමණක් ආහාරයෙහි පමණ දැනීමද එයින් කියන ලදී.

> සතර පස් කටකට - ඉඩ තබා පැන්බීමෙන්
> විහරණය පහසුය - දුරුකළ මුනිපුත් තමා

අසුභකම්මික තිස්ස තෙරුන් සමාන වූ කල්‍යාණ මිත්‍රයකු ආශ්‍රය කරන්නාට ද කාමච්ඡන්දය ප්‍රහීන වේ. සිටින ස්ථානවලද දස අසුභ ආශ්‍රිත සත්පාය කථාවලින්ද ප්‍රහීන වේ. එයින් කියන ලදී. "ඡ ධම්මා කාමච්ඡන්දස්ස පහාණාය සංවත්තන්ති" මේ කරුණු සයෙන් ප්‍රහීන වූ කාමච්ඡන්දය අර්හත් මගින් ඉදිරියේ. නොඉපදීම වේයයි දැනගනී.

පටිඝ නිමිත්තෙහි නුනුවණින් මෙනෙහි කිරීමෙන් ව්‍යාපාදය උපදී. එහි ගැටීමම පටිඝ නිමිත්තය. පටිඝ අරමුණ ද පටිඝ නිමිත්තය. නුනුවණින් මෙනෙහි කිරීම සියළු තන්හි එකම ලක්ෂණය වේ. එය එම නිමිත්තෙහි බහුලව පවත්වනවිට ව්‍යාපාදය උපදී. එයින් භගවත්හු කීහ. "මහණෙනි,

පටිඝ නිමිත්තක් ඇත. එහි නුනුවණින් මෙනෙහි කිරීම බහුල වූයේ නූපන් ව්‍යාපාදය ඉපදීමට උපන් ව්‍යාපාදය අධික වීම මහත් වීමට එයම හේතු වේ." චේතෝ විමුක්තියට මෛත්‍රිය හේතු වේ. නුවණින් මෙනෙහි කිරීමෙන් ව්‍යාපාදය ප්‍රහීන වේ. එහි මෙත්තා යයි කී කල අර්පණාවද උපචාරයද වටී. චේතෝ විමුක්ති යයි යන අර්පණාව නුවණින් මෙනෙහි කිරීමෙහි කියන ලද ලක්‍ෂණ එහි බහුලව පැවැත්වීමෙන් ව්‍යාපාදය ප්‍රහීන වේ. එයින් භගවත්හු කීහ. "මහණෙනි, මෙත්තා චෙතො විමුක්තියක් ඇත. එහි නුවණින් මෙනෙහි කිරීම බහුල වූයේ නූපන් ව්‍යාපාදයේ නොඉපදීම සඳහා උපන් ව්‍යාපාදයේ ප්‍රහාණය සඳහා" අධික නොවීමට මහත් නොවීමට එයම හේතු වේ. තවද කරුණු සයක් ව්‍යාපාද ප්‍රහාණය පිණිස පවතී. මෛත්‍රී නිමිත්ත ඉගෙනීම, මෛත්‍රී භාවනාවෙහි යෙදීම, කරනු ලබන ක්‍රියාව ප්‍රත්‍යවේක්‍ෂා කිරීම, නැවත ප්‍රත්‍යවේක්‍ෂා කිරීම බහුලවීම, කල්‍යාණ මිත්‍රභාවය, ඊට ගැලපෙන කථා යන සයය. නියමය පරිදි හෝ අනියමින් දිසා පැතිරවීමෙහි එක්තරා ආකාරයකින් මෛත්‍රිය ඉගෙන ගන්නාටද ව්‍යාපාදය දුරුවෙයි. සීමාකොට පැතිරවීම සීමාරහිත පැතිරවීම දිසා වශයෙන් පැතිරවීම වශයෙන් මෛත්‍රිය වඩන්නාට ව්‍යාපාදය දුරුවෙයි. ඔබ මෙයට කිපී කුමක් කරන්නේද? කිම ඔහුගේ සීලාදිය විනාශ කිරීමට හැකිවන්නෙහිද? ඔබ තමාගේ කර්මයෙන් ඇවිත් තමාගේ කර්මයෙන් නොයන්නෙහිද? පරහට කිපීම නම් ගිනිදැල් සහ ගිනිඅඟුරු රත්වූ යකඩකුරු අසූචි ආදිය ගෙන අනුන් පහරදෙනු කැමැත්තට සමාන වේ. මේ තැනැත්තේ ඔබට කිපීමෙන් කුමක් කරන්නේද? කිම ඔබගේ සීලාදිය විනාශ කිරීමට හැකි වන්නේද? මේ තෙමේ තමාගේ කර්මයෙන් පැමිණ තමාගේ කර්මයෙන්ම යන්නේය. නොපිළිගත් පඬුරක් මෙන් උඩු සුළඟට දමන ලද දූවිලි මිටක් මෙන්ද ඔහු මතම ඒ ක්‍රෝධය වැටෙන්නේය. මෙසේ තමාගේද අනුන්ගේද කරනු ලබන ක්‍රියාව ප්‍රත්‍යවේක්‍ෂා කරන්නාටද උභය කම්මසස්කතය ප්‍රත්‍යවේක්‍ෂා කොට නැවත නැවත ප්‍රත්‍යවේක්‍ෂා කිරීමෙහි සිටියහුට ව්‍යාපාදය පහවෙයි. අස්සගුත්ත තෙරුන් සමාන මෙත්තා භාවනාවෙහි ඇළුණු කල්‍යාණ මිත්‍රයකු ආශ්‍රය කරන්නාටද ව්‍යාපාදය ප්‍රහීන වේ. සිටින හිඳින තැන්වලද සත්පාය කථා ඇත්තාටද ව්‍යාපාදය දුරුවේ. එයින් කියන ලදී. කරුණු සයක් ව්‍යාපාද ප්‍රහානය පිණිස පවතී. මේ කරුණු සයෙන් ප්‍රහීන වූ ව්‍යාපාදය අනාගාමි මාර්ගයෙන් ඉදිරියෙහි ඉපදීම් නොවේ යයි දැනගනී.

අරති ආදියෙහි නුනුවණින් මෙනෙහි කිරීමෙන් ථීනමිද්ධ ඇතිවේ. අරති නම් කලකිරුණු බවයි. තන්දි නම් කයෙහි අලසබවයි. විජ්ජම්භිකා

නම් කය හැකිලීමයි. භත්ත සම්මද නම් බතින් මූර්ජා වීමය. බතේ දැවිල්ලය. චේතසො ලීනබව නම් සිතේ මැලිබවයි. මෙම අරති ආදියෙහි නුනුවණින් මෙනෙහි කිරීම බහුලව පැවැත්වීමෙන් ථීනමිද්ධ උපදී. එයින් භගවත්හු කීහ. "මහණෙනි, අරති, තෙන්දි විජ්ජම්භිකා භත්ත සම්පදො චෙතසො ලීනත්තං ඇත. එහි නුනුවණින් මෙනෙහි කිරීම බහුලාකාර වූයේ, නූපන් ථීනමිද්ධ ඉපදීම සඳහා උපන් ථීනමිද්ධ අධිකවීමට මහත්වීමට එය හේතු වේ. ආරම්භ ධාතු ආදියෙහි නුවණින් මෙනෙහි කිරීමෙන් ප්‍රහීන වේ. ආරම්භ ධාතු නම් ප්‍රථමයෙන් ආරම්භ කරන වීර්යයි. නික්කම ධාතු තමා කුසීතබවින් නික්මී ඇති හෙයින් ඊට වඩා බලවත් වේ. පරක්කම ධාතු නම් වෙනත් වෙනත් තැන් ආක්‍රමණය කරන නිසා ඊට වඩා බලවත් වේ. මේ තැන් ප්‍රභේද වූ වීර්යයෙන් නුවණින් මෙනෙහි කිරීම බහුලව පැවැත්වීමෙන් ථීනමිද්ධ ප්‍රහීන වේ. එයින් භගවත්හු කීහ. "මහණෙනි, ආරම්භ ධාතු නික්කම ධාතු පරක්කම ධාතු ඇත. එහි නුවණින් මෙනෙහි කිරීමෙන් නූපන් ථීන මිද්ධ නොඉපදීම සඳහා උපන් ථීනමිද්ධ ප්‍රහාණයට අධික නොවීමට මහත් බවට නොයෑමට එයම හේතුවේ. තවද ථීනමිද්ධ ප්‍රහාණය සඳහා කරුණු 6ක් පවතී. අති භෝජනයෙහි නිමිති ගැනීම, ඉරියව් මාරුකිරීම ආලෝක සංඥා මෙනෙහි කිරීම අභ්‍යවකාශයෙහි වාසය කිරීම, කළණමිතුරු බව, සත්පාය කථා යයි. ආහාර හත්ථක (නැගිටීමට බැරිතරම් ආහාරගැනීම අතිකකුගේ උදව්වෙන් නැගීම) භුත්ත වමිතක (කන ලද්ද වමනය යන) තත්‍රවට්ටක (කෑ තැනම පෙරලෙන) අලංසාටක (කයේ ඇඳුමක් තබාගන්ට බැරිතරම් කෑම) කාකමාසන (කවුඩන් විත් කටින් අහර ඇද කන තරම් ආහාර ගැනීම) වනතරම් ආහාර ගෙන රෑ දිවා ස්ථානවල සිට මහණදම් පුරනවිට ථීනමිද්ධ මහා ඇතකු මෙන් මැඩගෙන එයි. සතර පස් පිඩකට ඉඩ තබා පැන්බී යැපෙනසුළු භික්ෂුවට එය නොවේයයි අධික භෝජනයෙහි නිමිති ගන්නාට ථීනමිද්ධ ප්‍රහීන වේ. යම් ඉරියව්වකදී ථීනමිද්ධ පැමිණෙන්නේ නම් ඉරියව් වෙනස් කිරීමෙන්, රාත්‍රියේ සඳ පහන් හුළු එළි ද දිව හිරු එළියද මෙනෙහි කරන්නාටද, අභ්‍යවකාශයෙහි වසන්නාටද, මහකසුප් මහතෙරුන් සමාන ථීනමිද්ධ ප්‍රහීණ වූ කලණ මිතුරන් ඇසුරු කරන්නාටද ථීනමිද්ධ ප්‍රහීණ වේ. සිටින හිඳින තැන්වල ධූතංග ආශ්‍රිත වූ සප්පාය කථාවලින් ප්‍රහීන වේ. එයින් කියන ලදී. 'ඡ ධම්මා ථීනමිද්ධස්ස පහාණාය සංවත්තන්ති' මෙම කරුණුවලින් ප්‍රහීණ වූ ථීනමිද්ධය අරහත් මාර්ගයෙන් ඉදිරියේ නොඉපදීම වේයයි දැනගනී.

සිතේ සංසිඳීමක් නැති නුනුවණින් මෙනෙහි කිරීමෙන් උද්ධච්ච කුක්කුච්චයේ ඉපදීම වේ. අවූපසම නම් නොසංසිඳීමයි. උද්ධච්ච කුක්කුච්චයම එහි අර්ථයයි. එහි අයොනිසො නුනුවණින් මෙනෙහි කිරීම බහුලව පවත්වන්නාට උද්ධච්චකුක්කුච්ච උපදී. එයින් භගවත්හු කීහ. "මහණෙනි, සිතෙහි නොසංසිඳීමක් ඇත. නුනුවණින් මෙනෙහි කිරීම බහුල වූයේ නූපන් උද්ධච්ච කුක්කුච්චයේ ඉපදීම සඳහා උපන්නා වූ එහි අධික බවට මහත් බවට එයම හේතුවේ." සමාධි සංඛ්‍යාත වූ සිතේ සංසිඳීම නුවණින් මෙනෙහි කරන්නාට එය ප්‍රහීණ වේ. එහෙයින් භගවත්හු කීහ. "මහණෙනි, සිතේ සංසිඳීමක් ඇත. එහි නුවණින් මෙනෙහි කිරීම බහුල වූයේ නූපන් උද්ධච්ච කුක්කුච්ච නොඉපදීම් සඳහා උපන් එහි ප්‍රහීණවීම සඳහා අධික නොවීම සඳහා මහත් නොවීම සඳහා එයම හේතුවේ." තවද කරුණු සයක් උද්ධච්ච කුක්කුච්චයේ ප්‍රහාණය පිණිස පවතී. බොහෝ ඇසූපිරූ තැන් ඇති බව, (උගත්කම) විමසීම් ප්‍රශ්න කිරීම, විනයෙහි පුරුදුකළ නුවණ ඇති බව, වැඩිහිටියන් ඇසුරු කිරීම, කලණ මිතුරන් ඇසුර, සප්පාය කථා යන මේවාය. බහුශ්‍රැතයා විසින් එකක් හෝ දෙකක් හෝ තුනක් හෝ සතරක් හෝ පහක් හෝ නිකාය ග්‍රන්ථවල පෙල වශයෙන් ද අර්ථ වශයෙන් ද ඉගෙන ගන්නාට උද්ධච්ච කුක්කුච්ච දුරුවෙයි. කැප අකැප දේ ගැන බහුලව ප්‍රශ්න කරන්නාටද විනය ශික්ෂා පදවල නිතර ප්‍රගුණ කිරීමෙන් වසී භවය පත්වූ විනයේ පුරුදු කළ නුවණ ඇත්තාටද වැඩිහිටි මහළු තෙරවරුන් කරා පැමිණෙන්නාටද උපාලි මහරහතුන් සමග කලණ මිතුරන් ඇසුරු කරන්නාටද උද්ධච්ච කුක්කුච්චය ප්‍රහීණ වේ. හිඳින සිටින තැන්වල කැප අකැප දේ සම්බන්ධ සප්පාය කථා නිසාද දුරුවේ. කරුණු සයක් උද්ධච්ච කුක්කුච්චයේ ප්‍රහාණය පිණිස පවතී යයි එයින් කියන ලදී. මේ කරුණු සයෙන් ප්‍රහීණ වූ උද්ධච්ච කුක්කුච්චයේ උද්ධච්ච බව රහත් මගින්ද කුක්කුච්චය අනාගාමි මගින්ද ඉදිරියේ නොඉපදීම වේ යයි දැන ගනී.

සැක ඇති ධර්මයේ කරුණුවල නුනුවණින් මෙනෙහි කිරීමෙන් විචිකිච්ඡා උපදී. සැක ඇති දහම් සම්බන්ධයෙන් නැවත නැවත සැක ඇති කිරීම විචිකිච්ඡාවයි. එහි නුනුවණින් මෙනෙහි කිරීම බහුලව පැවැත්වීමෙන් විචිකිච්ඡාව උපදී. එයින් භගවත්හු කීහ. "මහණෙනි, සැක ඇති දහම් කරුණු තිබේ. එහි නුනුවණින් මෙනෙහි කිරීම බහුල වූයේ නූපන් විචිකිච්චාව ඉපදීම් සඳහා උපන් විචිකිච්ඡාව අධික වීම, මහත්බවට පත්වීම සඳහා එයම හේතුවේ" කුසලාදි ධර්ම නුවණින් මෙනෙහි කිරීමෙන් විචිකිච්ඡාව දුරු වේ. එයින් භගවත්හු කීහ. "මහණෙනි, කුසල් අකුසල්

දහම් සාවජ්ජ අනවජ්ජ දහම් සේවනය කළයුතු නොකළ යුතු දහම් හීන ප්‍රණීත දහම් කළු සුදු දහම් ඊට සමාන දහම් ඇත. ඒවායෙහි නුවණින් මෙනෙහි කිරීම බහුල වූයේ නූපන් විචිකිච්ඡාව නොඉපදවීම සඳහා උපන් විචිකිච්ඡාව ප්‍රහාණය සඳහා අධික නොවීමට මහත් නොවීමට එයම හේතුවේ." තවද කරුණු සයක් විචිකිච්ඡාව ප්‍රහාණය පිණිස පවතී. උගත්කම, ප්‍රශ්න කිරීම, විනය නය නුවණ, සිතේ ස්ථිරත්වය, කළණ මිතුරන් ඇති බව, සප්පායකථා ඒ හය, නිකාය ග්‍රන්ථ 1-5 දක්වා පෙළ හා අර්ථ සිහියෙන් ඉගෙනීම තෙරුවන් අරබයා ප්‍රශ්න කිරීම විනයෙහි වසී භාවයට පත්වීම. තෙරුවන් විශ්වාස කළයුතු ශ්‍රද්ධාව සංඛ්‍යාත සිතේ ස්ථිරත්වය ශ්‍රද්ධා සම්පන්න වක්කලි තෙරුන් සමාන කළණ මිතුරන් ඇසුරු යන මේවා නිසා විචිකිච්ඡාව ප්‍රහීණ වේ. සිටින හිඳින තැන්වල තුණුරුවන් ගුණ ආශ්‍රිත සප්පාය කථා නිසාද විචිකිච්ඡාව දුරුවේ. එනිසා කරුණු සයක් විචිකිච්ඡා ප්‍රහාණය පිනිස පවතීයයි කියන ලදී. මේ කරුණු සයෙන් ප්‍රහීණවන විචිකිච්ඡාව සෝවාන් මාර්ගයෙන් ඉදිරියෙන් නොඉපදීම වේ යයි දැන ගනී.

## නීවරණ පබ්බය.

බොජ්ඣංග පබ්බයෙහි **සන්තං** යනු ලැබීම් වශයෙන් විද්‍යමාන. **අසන්තං** නොලැබීම් වශයෙන් අවිද්‍යමාන. යථාච අනුපපනනාසා යනාදියෙහි වනාහි පළමුව සති සම්බොජ්ඣංගයේ "මහණෙනි, සතිසම්බොජ්ඣංගයට හේතුවූ ධර්ම ඇත. එහි නුවනින් මෙනෙහි කිරීම් බහුල වූයේ නූපන් සතිසම්බොජ්ඣංගයේ ඉපදීම් සඳහා උපන් සති සම්බොජ්ඣංගයේ අධික බව මහත් බවට එයම භාවනාවෙන් සම්පූර්ණවීම පවතී. මෙසේ ඉපදීම වේ. එහි සිහියට සතිසම්බොජ්ඣංග ඨානීය ධර්ම වේ. යෝනිසෝමනසිකාර කියන ලද ලක්ෂණවලින් යුක්ත වේයයි. එහි බහුලව යෙදෙනවිට සතිසම්බොජ්ඣංගය උපදී. තවද කරුණු සතරක් සතිසම්බොජ්ඣංගය ඉපදීම පිණිස පවතී. සිහිය පිළිබඳ දැනීම, සිහිමුලා පුද්ගලයන් ඇසුරු නොකිරීම, එළඹසිටි සිහි ඇති පුද්ගලයින් ඇසුර, එයින් මිදීම යන සතරය. ඉදිරියට යෑම ආදි ස්ථාන සතෙහි සිහියෙන් යුක්ත බව දැනීමෙන් ආහාර තැබූ අය මෙන් සිහි මුළා වූ පුද්ගලයන් වර්ජනය කිරීමෙන් තිස්සදත්ත තෙරුන් අභය තෙරුන් සමාන එළඹසිටි සිහි ඇති පුද්ගලයන් ඇසුරෙන් සිටින හිඳින තැන්වල සිහිය පිහිටුවා ගැනීමට ගැඹුරට බරවූ පර්වත කුහරයක් මෙන් සතිසම්බොජ්ඣංගය

උපදී. මෙසේ කරුණු සතරින් උපන් එය අර්හත් මාර්ගයෙන් භාවනාව සම්පූර්ණ වේයයි දැන ගනී.

ධම්මවිචය සම්බොජ්ඣංගයේ "මහණෙනි, කුසල අකුසල ධර්ම, කළු සුදු ප්‍රතිභාග ධර්ම ඇත. ඒවා නුවණින් මෙනෙහි කිරීම බහුල වූයේ නූපන් ධර්මවිචය සම්බොජ්ඣංගය ඉපදීම් සඳහා උපන් එහි අධික භාවයට මත්බවට භාවනාව සම්පූර්ණවීමට එයම හේතුවේ. තවද කරුණු හතක් ධම්මවිචය සමබොජ්ඣංගය ඉපදීම පිණිස පවතී. ප්‍රශ්න විමසීම්, වස්තු පිරිසිදු කරගැනීම, ඉන්ද්‍රිය සමභාවකරණය, ධර්මඥානය නැති පුද්ගලයන් දුරුකිරීම, ප්‍රඥාවන්තයන් ඇසුරකිරීම, ගැඹුරු නුවණැසින් ප්‍රභේද ප්‍රත්‍යවේක්ෂා කිරීම, තදධිමුත්තො යන සතය. එහි පරිපුච්ඡකතා යනු ඛන්ධ, ධාතු, ආයතන, ඉන්ද්‍රිය බල, බොජ්ඣංග, මග්ගංග, ඣාන, සමථ, විපස්සනාවන්ගේ අර්ථ ආශ්‍රිත විමසීම් බහුලවීම වත්‍ථු විසද කිරියා යනු අජ්ඣත්තික බාහිර වස්තුවල පිරිසිදු කිරීමයි. කෙස් නිය ලොම් දික්වේද ශරීරයේ තුන්දොස් උත්සන්න වේද දහඩිය මලවලින් වැසී ඇත්තේද එවිට අජ්ඣත්තික වස්තු අපිරිසිදු වේ. සිවුරු දිරාගොස් කිලිටි වී දුගඳ හමයිද සෙනසුන කුණු කසලින් ගහණවීද එවිට බාහිර වස්තු අපිරිසිදු වේ. එහෙයින් කෙස් නිය කපා උද්ධ ආධෝ විරේචණවලින් ශරීරය සැහැල්ලුකර ඇඟ උලා ස්නානයෙන් අජ්ඣත්තික වස්තු පිරිසිදු කළ යුතුය. ඉරුණු සිවුරු මසා සෝදා පඬු පොවා හා සෙනසුනේ ගොමගෑම් ආදියෙන් බාහිර වස්තු පිරිසිදු කළ යුතුය. මේ කරුණෙහි අජ්ඣත්තික බාහිර වස්තු අපිරිසිදු වනවිට උපදින චිත්ත චෛතසික ඤාණයද අපිරිසිදු වේ. අපිරිසිදු පහන්වැටි තෙල් අපිරිසිදු වීමෙන් ඇතිවන පහන්දැල්ල මෙනි. පිරිසිදුව අජ්ඣත්තික බාහිර වස්තු තබාගැනීමෙන් පිරිසිදු පහනකින් ලැබෙන දීප්තිමත් ආලෝකය මෙන් ඤාණයද පිරිසිදු වේ. ඒ නිසා වත්‍ථු විසද කිරියා ධම්මවිචය සම්බොජ්ඣංගයේ ඉපදීම පිණිස පවතී. ඉන්ද්‍රිය සමත්ත පටිපාදනය නම් සද්ධාදි ඉන්ද්‍රියයන්ගේ සමභාවි කරණයයි. ශ්‍රද්ධා ඉන්ද්‍රිය බලවත් වී සෙසු ඉන්ද්‍රිය දුබල වුවහොත් ඒ නිසා විරිය ඉන්ද්‍රිය විරිය ලබාදීමද සති ඉන්ද්‍රියේ සිහිය ලබාදීමද සමාධි ඉන්ද්‍රියයේ එකඟබව ලබාදීමද පඤ්ඤින්ද්‍රියේ දර්ශන කෘත්‍යයද කිරීමට නොහැකි වේ. ඒ නිසා ධර්ම ස්වභාවය ප්‍රත්‍යවේක්ෂා කිරීමෙන් හෝ යම් මෙනෙහි කිරීමක් බලවත් සේ තබා එය අඩුකළ යුතුය. වක්කලිථෙර වස්තුව ඊට නිදර්ශනය. විරියින්ද්‍රිය බලවත් වේනම් ශ්‍රද්ධ ඉන්ද්‍රියව ස්ථිරව පැවතීමට නොහැකි වේ. සෙසු ඒවාටද කෘත්‍ය කළහැකි නොවේ. ඒ නිසා එය පස්සද්ධි භාවනාවෙන්

අඩුකළ යුතුය. සෙසු ඒවායේද මෙසේය. විශේෂ වශයෙන් මෙහි සද්ධ පඤ්ඤා හා සමාධි විරියබල සමනාව ප්‍රශංසා කරති. ශ්‍රද්ධාව බහුල වී ප්‍රඥාව මද වුවහොත් මෝඩ පැහැදීමක් ඇති වේ. නොපැහැදිය යුතු තැන පහදී. ප්‍රඥාව බලවත් වී ශ්‍රද්ධාව මද වුවහොත් කෛරාටික වේ. බෙහෙතින් සුවකළ හැකි රෝගය අසාධ්‍ය බවට පැමිණේ. සිතිවිල්ලෙන් පමණක් පින් සිදුවේ යයි අතිධාවනය කොට දානාදි පින්කම් නොකරන්නේ නිරයේ උපදී. දෙකේම සමතාවෙන් පැහැදිය යුතු තැනම පහදී. සමාධිය බලවත් වී විරිය මද වුවහොත් සමාධි කම්මැලිකමින් යටපත් වේ. විරිය බලවත්වී සමාධිය මද වුවහොත් සිත විසිරීමෙන් උද්ධච්චයෙන් යටපත් වේ. සමාධිය විරියෙන් යුක්ත වනවිට කම්මැලිකම ඇති නොවේ. විරිය සමාධියෙන් යුක්ත වනවිට උද්ධච්චය ඇති නොවේ. ඒ නිසා ඒ දෙකම සමාන කළ යුතුය. දෙකම සමාන වූ විට අර්පණා ඇති වේ. එසේවුවද සමාධි කම්මිකයාට බලවත් ශ්‍රද්ධාව වටී. මෙසේ විශ්වාස කරන්නේ අර්පණාවට පැමිණෙන්නේය. සමාධි පඤ්ඤාවෙහි වනාහි සමාධි කම්මිකයාට ඒකග්ගතා බලවත්වීම වටී. මෙසේ හේ අර්පණාවට පැමිණේ. විපස්සනා කම්මිකයාට පඤ්ඤා බලවත්වීම වටී. මෙසේ ඔහු ලක්‍ෂණ ප්‍රතිවේදයට පැමිණේ. සතිය වනාහි සියළු තැන බලවත්වීම වටී. සතිය උද්ධච්ච පාක්‍ෂිකයන්ට ශ්‍රද්ධා ප්‍රඥා වශයෙන් උද්ධච්චය පහත හෙළීමට සහ කොසජ්ජ පාක්‍ෂිකයන්ට කම්මැලිකමින් සමාධිය රකී. සියළු ව්‍යඤ්ජනවලට ලුණු දමා රසවත් කරනවා මෙනි. සියළු රාජ කටයුතුවල සබ්බ කම්මික ඇමතිවරයා මෙනි. සියල්ලක්ම ඔහු බලාපොරොත්තු විය යුතුය. එයින් කීහ. "සති ච පන සබ්බත්ථිකා වුත්තා භගවතා කිං කාරණා, චිත්තංහි සති පටිසරණං ආරක්ඛ පච්චු පට්ඨානංච සති" සතිය නැතිව සිතේ පග්ගහ නිග්ගහ නැති වේ. දුප්පඤ්ඤ පුග්ගල පරිවජ්ජනය නම් ස්කන්ධ විභාගයෙහි බැස නොගත් මෝඩ පුග්ගලයන් දුරින්ම දුරුකළ යුතුය. පඤ්ඤාවන්ත පුද්ගල සේවනය සම්පන්න ලක්‍ෂණ විමසීමෙන් උදයබ්බය ප්‍රඥාවේ ස්කන්ධාදියෙහි ගැඹුරු නුවණ ගම්භීර ඤාණ විරිය පච්චවෙක්ඛන වේ. තදධිමුත්තො නම් සිටින හිඳින තැන්වල ධම්මවිචය සම්බොජ්ඣංගය පහළකර ගැනීම සඳහා ඒ දෙකට නැඹුරු වූ සිත් ඇතිවීමය. මෙය අරහත් මාර්ගයෙන් සම්පූර්ණ වේයයි දැනගනී.

විරිය සම්බොජ්ඣංගයේ "මහණෙනි, ආරම්භ ධාතු නික්කම ධාතු පරක්කම ධාතු ඇත. එහි නුවණින් මෙනෙහි කිරීම බහුල වූයේ, නූපන් විරිය සම්බොජ්ඣංගයේ ඉපදීම සඳහා උපන් විරිය සම්බොජ්ඣංගයේ

අධික බවට මහත් බවට භාවනාව පූර්ණවීමට එයම හේතුවේ. මෙසේ ඉපදීම වේ. තවද කරුණු එකොළහක් විරිය සම්බොජ්ඣංගයේ ඉපදීම සඳහා පවතී. අපාය භය ප්‍රත්‍යවේක්ෂා කිරීම, ආනිසංස දැකීම, චිත්තවීථි ප්‍රත්‍යවේක්ෂා කිරීම, පිණ්ඩපාත පචායනය, දායාද මහත් බව ප්‍රත්‍යවේක්ෂා කිරීම, ශාස්තෘන් වහන්සේ ගරුත්වය ප්‍රත්‍යවේක්ෂා කිරීම, ජාතිමහත්වය, සබ්‍රහ්මචාරි මහත්මය, කුසීත පුද්ගල පරිවර්ජණය, වීර්ය පද්ගලයන් සේවනය, තදධිමුත්තතා යන මේවාය. එහි නිරයවල පස්විධ බැඳුම් කරන කාලයේ සිට මහදුක් විඳින කාලයෙහිද තිරිසන් යෝනියෙහි දැල් කරක්ගෙඩි කෙමන් ආදියෙන් ගන්නා කාලයෙහිද කෙවිටි කටු සැමිටි පහරින් මඩින ලද කරත්ත අදින කාලයේද (විය උසුලන) ප්‍රේත විෂයෙහි නොයෙක් වර්ෂ ලක්ෂ ගණන් එක් බුද්ධාන්තරයක් ද සාපිපාසාවෙන් ආතුර වූ කාලයෙහිද කාලකඤ්ජක අසුර යෝනියෙහි හැට අසූරියන් ප්‍රමාණයෙන් ඇටසම් පමණක් වූ ආත්ම භවයෙන් අව් සුලං ආදී දුක්විඳින කාලයෙහිද විරිය සම්බොජ්ඣංගය ඉපදවීමට නොහැකිය. භික්ෂුව, ඔබට වීර්ය කිරීමට මේ කාලයයි අපාය භය සිහිකරන්නාටද විරිය සම්බොජ්ඣංගය උපදී. කම්මැලිකමින් නවලෝකෝත්තර ධර්මය ලැබියහැකි නොවේ. ආරම්භ කරන ලද වීර්යයෙන්ම හැකි වේ. වීර්යයේම මේ ආනිසංස යයි ආනිසංස දකින්නාට ද උපදී.

සියළු බුදු පසේබුදු මහා ශ්‍රාවකයන් විසින් ගමන් කළ මාර්ගයෙහි යායුතුයි. එහි කුසීතකමින් යා නොහැකිය. මෙසේ ගමන්වීථිය (මාර්ගය) සිහිකරන්නාටද උපදී. යමෙක් ඒ භික්ෂුවට පිණ්ඩපාත ආදියෙන් උපස්ථාන කරති. මේ මිනිස්සු ඔබේ නෑයෝ නොවෙති. දාස කම්කරුවෝද නොවෙති. ඔහු නිසා ජීවත්වෙමුයි ප්‍රණීත වූ පිණ්ඩපාතාදිය නොදෙති. තමන්ගේ ක්‍රියාවන්ගේ මහත්ඵල බලාපොරොත්තු වෙමින් දෙති. ශාස්තෘන් වහන්සේ විසින්ද මේ පුණ්‍ය අනුභවකොට කය බොහෝසෙයින් සුබෝපභෝගීව වාසය කරන්නේ යයි මෙසේ දකිමින් නැවත ප්‍රත්‍යය අනුදැන වදාරන ලද්දේ නොවෙයි. මේ තෙමේ එය වළඳන්නේ මහණ දම්කොට සසර දුකින් මිදෙන්නේ යයි ඒ ප්‍රත්‍යය අනුමත කරන ලදී. දැන් සිට කුසීතව වාසය කරන්නේ නම් ඒ පිණ්ඩපාතය පූජා නොකරන්නේය. ආරම්භ කරන ලද වීර්යවන්තයාටම පිණ්ඩපාත පිදීම වේයයි මෙසේ පිණ්ඩපාත අපචායනය සිහිකරන්නාටද උපදී. මහාමිත්ත තෙරුන් මෙන්, තෙරුන් වහන්සේ වනාහි කස්සප ලෙණෙහි වාසය කරති. ඒ ගොදුරු ගමෙහි එක් මහා උපාසිකාවක් තෙරුන් පුතෙකු කොට සලකා පෝෂණය කරති. ඒ

එක්දිනක් වනයට යන්නී දූවට කීහ. දරුව, අසවල්තැන පරණ හාල්, අසවල් තැන කිරි, අසවල් තැන ගිතෙල්, අසවල් තැන පැණි, ඔබේ සොයුරු ආර්ය මිත්ත පැමිණි කාලයේ බත් උයා කිරිපැණි සමග දෙන්න. ඔබත් ආහාර ගන්න. 'අම්මේ, ඔබ මොනවද කන්නෙ?'යයි දූව ඇසීය. මම ඊයේ උයපු පිරිවෙස් බතක් කැඳ සමග බීවෙමි. අම්මේ, දවල්ට මොනවද කන්නෙ? අතුකොල බහා සුනුසහල්වලින් ඇඹුල් කැඳක් පිස තබන්න දරුවයි කීහ. තෙරුන්වහන්සේ සිවුරු පොරවා පාත්‍රය බැහැර කරන්නේ ඒ ශබ්දය අසා තමාට අවවාද දුන්හ. මහ උවැසිය පිරිවෙස් බත කැඳ සමග අනුභව කළහ. දවල්ට සුණුසහල් කොළ ඇඹුල් කැඳක් බොන්නීය. ඔබේ ප්‍රයෝජනය සඳහා පරණ සහල් ආදිය කියයි. ඒ සඳහා කුඹුරු වස්තු බත් වස්ත්‍ර බලාපොරොත්තු නොවේ. තුන් සම්පත් ප්‍රාර්ථනා කරමින් දෙයි. ඔබ ඇයට ඒ සම්පත් දීමට හැකිවන්නෙහිද? නොහැකිවන්නෙහිද? මේ පිණ්ඩපාතය ඔබ විසින් රාග සහිතව දෝස සහිතව මුළා සහිතව වැළඳීමට නොහැකියයි පාත්‍රය පාත්‍ර පසුම්බියෙහි බහා ගැට මුදා නැවතී කස්සප ලෙණටම ගොස් පාත්‍රය ඇඳයට සිවුර සිවුරු වැලෙහි තබා රහත් නොවී නොනික්මෙමියි වීර්ය අධිෂ්ඨාන කොටගෙන හිඳගත්හ. දීර්ඝ කාලයක් අපමාදව වැසි භික්ෂුව විදර්ශනා වඩා පෙරබතෙහිම රහත්වී නෙලුම්මලක් පිබිදෙන්නාක් මෙන් මහා ක්ෂීණාශ්‍රව මඳ සිනාවෙන් හුන්හ. ලෙණදොර අධිගෘහිත දෙවියා

උසස් පැවතුම් ඇති - උතුම් පුරිස මගෙ වැඳුම
ඔබටය නිකෙලෙස් වූ - පින්වත දැකිණි'රහ වේ

උදත් අනා, ස්වාමීන් වහන්ස, පිඬු පිණිස පිවිසෙන ඔබවහන්සේ වැනි රහතුන්ට භික්ෂාව දී මහළු ස්ත්‍රීහු දුකින් මිදෙන්නෝ යයි කීවේය. තෙරහු නැගිට දොර ඇර වෙලාව බලන්නේ වේලාසනම යයි දැන පාසිවුරු ගෙන ගමට පිවිසියහ. දැරියද දානය සපයා දැන් මගේ සොහොයුරා පිණිස දොර ඇර බලමින් උන්නාය. තෙරුන් දොර ලඟට වැඩියවිට ඕතොමෝ පාත්‍රය ගෙන ගිතෙල් පැණි යෙදූ කිරි පිණ්ඩපාතය පුරවා අතේ තැබීය. තෙරහු සුවපත් වේවායි අනුමෝදනා කොට වැඩියහ. ඕතොමෝද උන්වහන්සේ බලමින් සිටියාය. තෙරුන් වහන්සේගේ ඡවි වර්ණය එදා අතිශයින් පිරිසිදු විය. ඉඳුරෝ ප්‍රසන්නයහ. මුහුණ බැම්මෙන් මිදුණු ඉදුණු තල්ගෙඩියක් මෙන් අතිශයින් බැබළුණේය. මහා උපාසිකාව වනයේ අවුත් කිම දරුව, ඔබේ සෝයුරා පැමිණියේ දැයි ඇසීය. ඕ සියළු පවත් දැන්වූවාය.

උපාසිකාව අද මගේ පුතාගේ පැවිදි කිස මුදුන් පැමිණියේ යයි දැන ඔබේ සෝයුරා බුදුසසුනේ නොකලකිරෙතැයි සතුටුවන්න දරුව යයි කීය. මේ ශෘස්තෘ දායාදය ඉතා මහත්ය. එනම් සප්ත ආර්ය ධනය වේ. එය කම්මැලිකමින් ගත නොහැකිය. යම්සේ වැරදියට පිළිපන් පුතකු මේ අපේ පුතා නොවේ යයි බැහැර කරන මව්පියන්ගේ ධනය ඔහුට නොලැබේ. එසේම කුසීතකමෙන් මේ ආර්ය ධන දායාදය නොලබයි. වීර්යවන්තයාටම ලැබේ යයි දායාද මහත්වය මෙනෙහි කරන්නාටද උපදී. ශාස්තෘන් වහන්සේ පිළිපැදිය යුතුය. ශාස්තෘන් මව්කුස පිළිසිඳ ගන්නා කාලයෙහි ද අභිනිෂ්ක්‍රමණ කරන විටද සම්බෝධිය පැමිණි කල්හිද දම්සක් පවත්වන විටද යමක ප්‍රාතිහාර්ය පානවිටද දෙවාරෝහණය ආයු සංස්කාරය අත්හරිනවිට පිරිනිවන් පාන කාලයේද දස සහශ්‍රී ලෝකධාතුව කම්පා විය. මෙබඳු වූ ශාස්තෘන් වහන්සේ කෙනෙකුන්ගේ ශාසනයෙහි පැවිදි වී කුසීතව සිටීම යුතු නොවේයයි මෙසේ ශාස්තෘ මහත්වය මෙනෙහි කරන්නාටද උපදී. ජාතියෙන් ඔබ දැන ලාමක ජාතිකයෙකි. අසම්භින්නව මහා සම්මත පරපුරෙන් පැමිණි ඔක්කාක රාජවංශයේ ඉපදුනේය. සිරිසුදොවුන් මහ රජුද මහාමායා දේවියගේද මුණුබුරාය. රාහුල භද්‍රයන්ගේ සෝයුරාය. ඔබ මෙබඳු ජින පුත්‍රයකු වී කුසීතව සිටීම යුතු නොවේය. මෙසේ ජාති මහත්වය සිහි කරන්නාටද උපදී. සැරියුත් මහමුගලන් මෙන්ම අසූ මහ ශ්‍රාවකයෝද වීර්යයෙන්ම ලෝකෝත්තර ධර්මය අවබෝධ කළහ. ඔබ ලවා සබ්‍රහ්මසරුන්ගේ මාර්ගය පිළිපදුව. පිළි නොපදින්නේ දැයි සබ්‍රම්සරුන්ගේ මහත්වය මෙනෙහි කරන්නාටද උපදී. කුස පුරවා පිඹුරකු සේ අත්හරින ලද කායික චේතනා විරිය ඇති කුසීත පුද්ගලයන් දුරුකරන්නාටද ආරද්ධ වීර්ය ඇති පුද්ගලයන් ආශ්‍රය කරන්නාටද සිටින හිඳින තැන්වල වීර්ය උත්පාදනය සඳහා නැඹුරු වූ සිත් ඇත්තාටද උපදී. මෙසේ උපන් විරිය සම්බොජ්ඣංගය අරහත් මගින් භාවනාව සම්පූර්ණ වේ යයි දැනගනී.

පීති සම්බොජ්ඣංගයේ "මහණෙනි, පීති සම්බොජ්ඣංගයට පදනම් වූ ධර්ම ඇත. එහි නුවණින් මෙනෙහි කිරීම් බහුල වූයේ නූපන් පීති සම්බොජ්ඣංගය ඉපදීම සඳහා උපන් එය අධිකවීමට මහත්වීමට භාවභාව සම්පූර්ණ වීම පිණිස එයම හේතුවී පවතී. එසේ ඉපදීම වේ. එහි ප්‍රීතියම පීති සම්බොජ්ඣංග පදනමින් ධර්ම නම් වේ. තවද කරුණු එකොළසක් පීති සම්බොජ්ඣංගය ඉපදීම පිණිස පවතී. බුද්ධානුස්සති, ධම්මානුස්සති, සංඝානුස්සති, සීල, චාග, දේවතානුස්සති, උපසමානුස්සති, ලූඛපුග්ගල පරිවජ්ජනතා සිනිද්ධ පුග්ගල සෙවනතා, පසාදනීය සුත්තන්ත

පච්චවෙක්ඛණතා, තදධිමුත්තතා යන එකොළස වේ. බුදුගුණ සිහි කරන්නාගේ ඒකන්තයෙන් උපචාර සමාධිය දක්වා සියළු ශරීරයේ පැතිරෙමින් පීති සම්බොජ්ඣංගය උපදී. ධම්ම සංඝ ගුණ සිහි කරන්නාටද දිගු කලක් නොකඩවා රක්‍ෂා කරන ලද සිව්පිරිසිදු සිල් ප්‍රත්‍යවෙක්‍ෂා කරන්නාටද ගිහියාගේ දස සීලය පන්සිල් ප්‍රත්‍යවේක්‍ෂා කරන්නාටද දුක් බිය ආදියෙහි ප්‍රණීත භෝජන සබ්‍රහ්මචාරීන්ට දී මෙසේ දුන්නෙමියි ත්‍යාගය ප්‍රත්‍යවේක්‍ෂා කරන්නාටද ගිහියාගේ මෙබඳු කාලයෙහි සීලවන්තයන්ට දුන් දානය ප්‍රත්‍යවේක්‍ෂා කරන්නාගේද යම් ගුණයකින් යුක්ත වූ දෙවියෝ දේවත්වයට පත්වූහයි එබඳු ගුණ තමා කෙරෙහි ඇතැයි ප්‍රත්‍යවේක්‍ෂා කරන්නාටද සමාපත්තියෙන් මැඩපැවැත්වූ කෙලෙස් හැටහැත්තෑ වසරකින් පහළ නොවේ යයි ප්‍රත්‍යවේක්‍ෂා කරන්නාටද දාගැබ් දසුන් බොධි දසුන් සංසාර දර්ශනවල අගෞරව සහිත ක්‍රියාවෙන් රැස්කරන ලද රළු බවේ බුද්ධාදීන් කෙරෙහි පැහැදුණු සොභාමත් නැති බැවින් කොටලුවාගේ පිටේ රජස් (දූවිලි) මෙන් රළු පුද්ගලයින් දුරු කරන්නාගේ ද බුද්ධාදීන් කෙරෙහි පැහැදීම් බහුල වූ මුදු සිතැති සිනිඳු පුද්ගලයන් සේවනය කරන්නාගේද රත්නත්‍රයෙහි ගුණ විස්තර කරන්නා වූ ප්‍රසාදනීය සූත්‍රාන්ත ප්‍රත්‍යවේක්‍ෂා කරන්නාගේද සිටින හිඳින තැන්වල ප්‍රීතිය ඉපිදවීම සඳහා නැමුණු ගැඹුරු සිත් ඇත්තාගේ ද පීති සම්බොජ්ඣංගය උපදී. මෙසේ උපන් පීති සම්බොජ්ඣංගය අරහත් මාර්ගයෙන් භාවනාව සම්පූර්ණ වේයයි දැනගනී.

පස්සද්ධි සම්බොජ්ඣංගයේ "මහණෙනි, කාය පස්සද්ධි චිත්ත පස්සද්ධි ඇත. එහි නුවණින් මෙනෙහි කිරීම් බහුල වූයේ නූපන් පස්සද්ධි සම්බොජ්ඣංගයේ ඉපදීම සඳහා උපන් එහි අධිකවීමට මහත්වීමට භාවනාව සම්පූර්ණ වීමට එය හේතුවී පවතී." මෙසේ ඉපදීම වේ. තවද කරුණු සතක් පස්සද්ධි සම්බොජ්ඣංගයේ ඉපදීම පිණිස පවතී. පණීත භෝජන සෙවනතා, උතුසුඛ සෙවනතා, ඉරියාපථ සුඛ සෙවනතා, මජ්ඣත්ත පයොගතා, සාරද්ධකාය පුග්ගල පරිවජ්ජනතා, පස්සද්ධිකාය පුග්ගල සෙවනතා, තදධිමුත්තතා යන සතයි. ප්‍රණීත වූ සිනිඳු වූ සප්පාය භෝජන වළඳන්නාටද ඍතුවල සීත උෂ්ණ ස්ථානවල ඉරියව්වල සප්පාය ඍතු ඉරියව් සේවනය කරන්නාටද පස්සද්ධිය උපදී. යම් මහා පුරුෂයෙකුට සියළු ඍතු ඉරියාපථ සමනය වේ. ඒ සඳහා මෙසේ නොකියන ලදී. යමෙකුට සභාග විසභාග ඇත්නම් එහි විසභාග ඍතු ඉරියව් අත්හැර සභාගය සේවනය කරන්නට උපදී. තමාටද අනුන්ටද කරන ලද ක්‍රියා ප්‍රත්‍යවේක්‍ෂා කිරීමට මජ්ඣත්ත පයොගයයි කියනු ලැබේ. මෙම මධ්‍යස්ථ

ප්‍රයෝගයෙන් උපදී. යමෙක් කැටදඬු ආදියේ අනුන් පෙළමින් හැසිරෙයි. එබඳු රූප වූ සාරද්ධකාය පුද්ගලයින් වර්ජනය කරන්නාටද දමනය වූ අත් පා ඇති පස්සද්ධකාය පුද්ගලයින් ඇසුරු කරන්නාටද සිටින හිඳින තැන්වල පස්සද්ධි ඉපිදවීම පිණිස ගැඹුරු නැමුණු සිත් ඇත්තාටද පස්සද්ධිය උපදී. මෙසේ ඉපදුණු පස්සද්ධිය අරහත් මගින් භාවනාව සම්පූර්ණ වේයයි දැනගනී.

සමාධි සම්බොජ්ඣංගයේ මහණෙනි, සමථ නිමිත්ත අව්‍යග්ග නිමිත්ත ඇත. එහි නුවණින් මෙනෙහි කිරීම බහුල වූයේ, නූපන් සමාධි සම්බොජ්ඣංගයේ ඉපදීම පිණිස උපන් එහි අධිකවීමට මහත්වීමට භාවනාව සම්පූර්ණවීම සඳහා හේතුවී පවතී. මෙසේ ඉපදීම වේ. එහි සමථයද සමථ නිමිත්තද වෙන් නොවීම් අර්ථයෙන්ද අබ්‍යග්ග නිමිත්ත වේ. තවද කරුණු එකොලහක් සමාධි සම්බොජ්ඣංගය ඉපදීම පිණිස පවතී. වත්‍ථු විසද කිරියතා ඉන්‍ද්‍රිය සමත්ත පටිපාදනතා, නිමිත්ත කුසලතා, සමයේ චිත්තස්ස පග්ගණ්හනතා, සමයේ චිත්තස්ස නිග්ගණ්හනතා, සමයෙ සම්පහංසනතා, සමයෙ අජ්ඣුපෙක්ඛණතා, අසමාහිත පුග්ගල පරිවජ්ජනතා, සමාහිත පුද්ගල සෙවනතා, ඣානවිමොක්ඛ පච්චවෙක්ඛණතා, තදධිමුත්තතා යන එකොලොස වේ. එහි වත්‍ථුවිසද කිරියතාව සහ ඉන්‍ද්‍රිය සමත්තපටිපාදනතාද කියන ලද නයින්ම දතයුතුය. නිමිත්ත කුසල නම් කසිණ නිමිත්ත ඉගෙන ගන්නා දක්‍ෂතාව වේ. සුදුසු කාලයෙහි සිත උනන්දු කිරීම නම් යම් වෙලාවක ඉතා ලිහිල් විරියෙන් හැකිලේ. ඒ අවස්ථාවේ ධම්ම විචය, විරිය පීති, සම්බොජ්ඣංග උපදවමින් එය උනන්දු කිරීම. යස්මිං සමධි මත්තං තිස්සන්ති යම් වෙලාවක අධික වීරියෙන් සිත විසිරේ. ඒ අවස්ථාවේ පස්සද්ධි සමාධි උපෙක්ඛා සම්බොජ්ඣංග උපදවා ගැනීමෙන් එය අඩු කිරීම වේ. සබ්බෙ සමුට්ඨාපනෙන යනු යම් අවස්ථාවක සිත ප්‍රඥා ප්‍රභේද අඩු බැවින් හෝ උපසම සැප නොලැබීමෙන් හෝ ආශ්වාද රහිත වේ. ඒ අවස්ථාවේ සංවේග වස්තු අට ප්‍රත්‍යවේක්ෂා කිරීමෙන් සංවේගයට පැමිණවීම. සංවේග වස්තු අටනම් ජාති ජරා ව්‍යාධි මරණ සතර අපා දුක අතීත සංසාර දුක අනාගත සංසාරයට හේතුවන දුක වර්තමානයේ ආහාර සෙවීමේ දුක යන මේවාය. රත්නත්‍රයෙහි ගුණ සිහිකිරීමෙන් පැහැදීම් ඇතිකරයි. සුදුසු කාලයෙහි උනන්දු කරවීම යනු මෙය වේ. සමයෙ අජ්ඣුපෙක්ඛතා නම් යම් අවස්ථාවක මනා පිළිවෙතට පැමිණ නොහැකිලී විසිරීමක් නැතිව දුරු නොකළ ආශ්වාද ඇති අරමුණෙහි සමව පැවති සමථ මාර්ගයට පිළිපන් සිත වේ.

ඒ අවස්ථාවේ පග්ගහ නිග්ගහ සම්පහංසනවලට නොපැමිණේ. රියැදුරා මෙන් සමව පැවතීම වේ. අසමාහිත පුග්ගල පරිවජ්ජනා නම් උපචාරවලට හෝ අර්පණාවලට නොපැමිණ වික්ෂිප්ත පුද්ගලයින් දුරින්ම දුරුකිරීම, සමාහිත පුද්ගල සෙවනතා නම් උපචාරයෙන් හෝ අර්පණාවෙන් හෝ සමාහිත සිත් ඇත්තන් සේවනය කිරීම, භජනය කිරීම, පයිරුපාසනය කිරීම වේ. තදධිමුත්තතා නම් සිටින හිඳින තැන්වල සමාධි ඉපිදවීම සඳහාම නැමුණු ගැඹුරු පබ්භාර සිතක් ඇති බවය. මෙසේ පිළිපදින්නාට සමාධිය උපදී. මෙසේ උපන් සමාධිය අර්හත් මාර්ගයෙන් සම්පූර්ණ වේයයි දැනගනී.

උපෙක්ඛා සම්බොජ්ඣංගයෙන් "මහණෙනි, උපේක්ඛා සම්බොජ්ඣංගය පදනම් වූ ධර්ම ඇත. එහි නුවණින් මෙනෙහි කිරීම බහුල වූයේ. නූපන් උපේක්ඛා සම්බොජ්ඣංගය ඉපදීම සඳහා උපන් එය අධිකවීමට මහත්වීමට භාවනාව සම්පූර්ණවීමට එයම හේතුවී පවතී." මෙසේ ඉපදීම වේ. එහි උපේක්ෂාවම උපේක්ඛාඨානීය ධම්ම නම් වේ. තවද කරුණු පහක් උපේක්ඛා සම්බොජ්ඣංගය ඉපදීම පිණිස පවතී. සත්ත මජ්ඣත්තතා, සංඛාර මජ්ඣත්ත සතත සංඛාර කෙලායන පුගගල පරිවජජනතා, සතත සංඛාර මජඣතත පුග්ගල සෙවනතා, තදධිමුත්තතා. එහි ආකාර දෙකකින් සත්ව මධ්‍යස්ථ භාවය උපදවයි. ඔබ තමාගේ කර්මයෙන් පැමිණ තමාගේ කර්මයෙන් යන්නේය. ඔබ කවරකු තමාගේ කියා යන්නෙහිද? මෙසේ කම්මස්ස තුන ප්‍රත්‍ය වේද පරමාර්ථ වශයෙන් සත්වයෙක් නැත. ඒ නිසා ඔබ කවරෙකු තමාගේ කියා පෙන්නන්නෙහිදැයි මෙසේ සත්වයෙක් නැත යන ප්‍රත්‍යවේක්ෂාවෙන්ද දෙයාකාරයකින් සංඛාර මධ්‍යස්ථභාවය උපදවයි. මේ සිවුර අනුක්‍රමයෙන් වර්ණය වෙනස්වීමද දිරුණු බවටද එළඹ පාපිස්න රෙදිකඩක්වා කෙවිටක අගින් ඉවත්කිරීම වන්නේය. ඉදින් මෙහි ස්වාමියා වෙනම් මෙසේ විනාශවීමට නොදෙන්නේය. මෙසේ අස්වාමිකව ප්‍රත්‍යවේක්ෂා කරමින්ද ස්ථිර නොවේයයි තාවකාලික නම් මෙසේ තාවකාලික බව ප්‍රත්‍යවේක්ෂා කිරීමෙන්ද සිවුරෙහි මෙන්ම පාත්‍ර ආදියෙහි ද මෙය යොදාගත යුතුය. සත්ත සංඛාර කෙලසන පුග්ගල පරිවජ්ජිනතා යනු මෙහි යම් පුද්ගලයෙක් ගිහිව හෝ තමාගේ දූපුතුන් කෙරෙහි පැවිදිව තමාගේ අන්තේවාසික සමාන උපජ්ඣායකයා කෙරෙහි මමායනය කරයි. සියතින්ම ඔවුන්ගේ කෙස්කැපීම, මැසීම, සිවුරු සේදීම්, පඬුපෙවීම්, පාත්‍ර පිසීම් (පාත්‍ර ගින්නෙන් දවා ඔපකිරීමක්) ආදිය කරයි. මොහොතක් හෝ නොදක්නේ අසවල් සාමණේරයා කොහිද

අසවල් දරුවා කොහිදැයි භ්‍රාන්ත වූ මුවකු මෙන් එහෙ මෙහෙ බලයි. අනෙකෙකුගේ කෙස් කැපීම් ආදිය සඳහා මොහොතකට අසවලා එවන්නැයි ඉල්ලන්නේද, අපිද ඔහු නොවේ වැඩ නොකරවමු. මින් ඔහු ගෙන ක්ලාන්ත කරවතියි නොදේ. මෙය සත්ත කෙලායන (සත්ව මමත්වය) නම් වේ. යමෙක් සිවුරු පාත්‍ර තැටිය, සැරයටි ආදියට මමායනය කෙරේ. අනිකෙකුට අල්ලන්නවත් නොදේ. තාවකාලිකව ඉල්ලුවත් අපිත් මෙය ඇල්ම නිසා පරිභෝග නොකරමු. තුඹට කෙසේ දෙන්නෙම්දැයි කියති. මෙය සංඛාර මමායනය වේ. යමෙක් ඒ වස්තු දෙකෙහිම මධ්‍යස්ථ වූයේ උදාසීන වේ. මෙය සත්ත සංඛාර මධ්‍යස්ථභාවයයි. මෙසේ මේ උපේක්ඛා සම්බොජ්ඣංගය මෙන් වූ සත්ත සංඛාර මමායන පුද්ගලයන් දුරින්ම දුරු කරන්නටද එය උපදවීම් සඳහා නැමුණු ගැඹුරු පබ්භාර සිතක් ඇත්තාටද උපේක්ඛා සම්බොජ්ඣංගය උපදී. එසේ උපන් එය අරහත් මගින් වැඩීම සම්පූර්ණ වෙයයි දැනගනී. සෙසු සියල්ල කියන ලද අර්ථ ඇතිය.

### බොජ්ඣංග සංඛාරයයි.

මෙම කොටස් දෙකෙහිම සුද්ධ විපස්සනාවම කියන ලදී. මෙසේ මෙම සතර සතිපට්ඨානය පූර්ව භාගයෙහි නොයෙක් සිත්වල ලැබේ. වෙනත් සිතකින් කය විමසයි. වෙනත් සිතින් වේදනාව විමසයි. වෙනත් සිතකින් සිත විමසයි. වෙනත් සිතකින් ධර්මය විමසයි. ලෝකෝත්තර මාර්ග ක්ෂණයෙහි එකම සිතක සතිපට්ඨාන සතරම ලැබේ. මුලින්ම කය පිළිබඳ සිහිකර විමසා පැමිණි තැනැත්තාට විදර්ශනා සම්පයුත්ත සිහිය කායානුපස්සනාවය. ඒ සිහියෙන් යුක්ත පුද්ගලයා කායානුපස්සී නම් වේ. විදර්ශනාව උත්සාහවත් කරවා ආර්ය මාර්ගයට පැමිණි තැනැත්තාට මාර්ග ක්ෂණයෙහි මාර්ගය සම්ප්‍රයුක්ත සිහිය කායානුපස්සනා නම් වේ. ඒ සිහියෙන් යුක්ත පුද්ගලයා කායානුපස්සී නම් වේ. වේදනාව මෙනෙහිකර විමසා සිත මෙනෙහිකර විමසා ධර්මය මෙනෙහිකර විමසා පැමිණි තැනැත්තා විපස්සනා සම්ප්‍රයුක්ත සිහිය ධම්මානුපස්සනා නම් වේ. ඒ සිහියෙන් යුක්ත පුද්ගලයා ධම්මානුපස්සී නම් වේ. විපස්සනාව උත්සාහවත් කරවා ආර්ය මාර්ගය පැමිණි තැනැත්තාට මාර්ග ක්ෂණයෙහි මාර්ගය සම්ප්‍රයුක්ත සිහිය ධම්මානුපස්සනා නම් වේ. ඒ සිහියෙන් යුක්ත පුද්ගලයා ධම්මානුපස්සී නම් වේ. මෙසේ දේශනාව පුද්ගලයන් ඇත. කයෙහි සුභ යයි යන වැරදි අදහස දුරුකරන කය විමසන සිහිය මාර්ගයෙන් සිද්ධවේය

යනු කායානුපස්සනා නම් වේ. වේදනාව සැපයයි යන විපර්යාසය ප්‍රහාණ වේදනාව විමසන සිහිය මාර්ගයේ සිද්ධ වේයයි වේදනානුපස්සනා වේ. සිතේ නිත්‍ය යයි යනු විපර්යාසය ප්‍රහාණය කරන සිත විමසන සිහිය මාර්ගයෙන් සිදුවේය යනු චිත්තානුපස්සනා වේ. ධර්මයෙහි ආත්මයය යන වැරදි විශ්වාසය දුරුකරන සිහිය මාර්ගයෙන් සම්පූර්ණ වේයයි යනු ධම්මානුපස්සනා නම් වේ. මෙසේ එකම මාර්ගය සම්ප්‍රයුක්ත සිහිය සතර කිසක් සාදන අර්ථයෙන් චත්තාරි නම ලබයි. එයින් කියන ලදී. "ලෝකුත්තර මග්ග කඛණෙ, පන එක චිත්තෙයෙව ලබ්භන්ති" යන ලෝකෝත්තර මාර්ග ක්‍ෂණයෙහි එකම සිතකම ලැබේ යයි.

## සූත්තන්ත භජනියයි.

අභිධර්ම භාජනයෙහි සතිපට්ඨානය ලෝකෝත්තර වශයෙන් අරඹන ලද බැවින් කායාදි අරමුණුවල ලෞකික සතිපට්ඨානයෙහි පෙල තබන ලදී. සියළුම කායානුපස්සනාදි සතිපට්ඨාන ධම්ම සංගනියේ බෙදන ලද්දේ මුඛමාත්‍ර වශයෙන් දක්වා කියන ලදී. එහි නය භේදය දතයුතුය. කෙසේද? පළමුවෙන් කායානුපස්සනාව සෝවාන් මාර්ගයේ ධ්‍යාන අභිනිවේෂයෙහි :- සුද්ධිකපටිපදා, සුද්ධික සුඤ්ඤතා, සුඤ්ඤත පටිපදා, සුද්ධික අප්පණිහිතං, අප්පණිහිත පටිපදා යයි මේ ස්ථාන පසේ දෙක දෙක චතුක්ක පංචක නය වශයෙන් නය දහයක් වේ. සෙසු ඒවායෙහි වීසති අභිනිවේසවල නය දෙසීයක්ද ඒවා සතර අධිපතීන්ගේ වශයෙන් සතරෙන් ගුණකර අටක්ද මෙසේ ශුද්ධික දෙකය. අධිපති සමග අටදැයි සියල්ල නය දහසක් වේ. වේදනානුපස්සනාදියෙහිද ශුද්ධික ස්ථානයේදැයි සෝවාන් මාර්ගයෙහි නය පන්දහසක් වෙයි. සෝවාන් මාර්ගයෙහි මෙන් මෙසේ සෙසු මාර්ගවලද කුසලයෙහි නය විසිදහසක්ද සුඤ්ඤත-අප්පණිහිත අනිමිත්ත භේදයෙන් තුනෙන් ගුණකර නය සැටදහසක්ද එසේම සකිච්චසාධක සංසිද්ධික කිච්ච (ක්‍රියාහේතුව, සිදුවීමක ක්‍රියාව) කුසල විපාක වශයෙන් දෙයාකාරය. කායානුපස්සනාදි වශයෙන් ද සුද්ධික වශයෙන් කුසලයෙහි පහක්ද, විපාකයෙහි පහක්දැයි විස්තර වාර දහයකින් දසප්‍රභේද වූ නය අසූදහසකින් ප්‍රතිමණ්ඩිත වූ.

## අභිධම්ම භාජනීය නිර්දේශයයි.

ප්‍රශ්න විචාරයෙහි සතිපට්ඨානවල කුසලාදි භාවය පෙල ඇසුරෙන්ම දතයුතුය. ආරම්මණ ත්‍රිකයෙහි සියල්ලම නිවන් අරමුණු කරන හෙයින් අප්පමාන අරමුණ වේ. මාර්ග අරමුණු නොවේ. සහජාත හේතු වශයෙන් මග්ගහේතුක වේ. විරිය හෝ වීමංසය හෝ ප්‍රධානව මාර්ග භාවනා කාලයෙහි මාර්ගාධිපති වේ. ඡන්ද, චිත්ත ප්‍රධානව මාර්ග භාවනා කාලයේ මාර්ගාධිපති යයි කිවහැකි නොවේ. ඵල කාලයද එසේය. අතීතාදියෙහිද එක් අරමුණක් ඇතැයි කිවහැකි නොවේ. නිවන බාහිර ධර්මයක් බැවින් බාහිර අරමුණක් වේ. මෙසේ ප්‍රශ්න විචාරයෙහි නිපදවන ලද ලෝකෝත්‍රයෙහිම සතිපට්ඨානයයි කියන ලදී. සම්මා සම්බුදුන් විසින් සූත්‍රාන්ත භාජනියෙහි ලෞකික ලෝකෝත්තර මිශ්‍රව සතිපට්ඨාන කියන ලදී. අභිධර්ම භාජනියෙහිද ප්‍රශ්න විචාරෙහිද ලෝකෝත්තර වශයෙන් සතිපට්ඨාන කියන ලදී. මෙසේ සතිපට්ඨාන විභංගයද තිපරිවෘතය ගෙනහැර දක්වා බෙදා දක්වන ලදී.

**සම්මෝහ විනෝදනී නම් විභංග අර්ථ වර්ණනාවේ**
**හත්වන සතිපට්ඨාන විභංග නිර්දේශයයි.**

# 8.
# සමමප්පධාන විභංගය

ඊට අනතුරු දැන් සමමප්පධාන විභංගයේ **චත්තාරො** යනු ගණන දැක්වීමය. එනිසා උඩ හෝ යට නොවන **සම්මප්පධාන සීමා** පෙන්වීමයි. **සම්මප්පධාන** යන කරුණු වශයෙන් ප්‍රධාන, උපාය වශයෙන් ප්‍රධාන, නුවණ වශයෙන් ප්‍රධාන බව දැක්වීමය. **ඉධ භික්ඛු** ශාසනයෙහි පිළිපන් භික්‍ෂුව. **අනුප්පන්නානං** නොඉපදුනා වූ **පාපකානං** ලාමක වූ **අකුසලානං ධම්මානං** අදක්‍ෂ බවින් යුත් දහම්. **අනුප්පාදනය** - නොඉපදීම සඳහා. **ඡන්දං ජනෙති** කරනු කැමති බව සංඛ්‍යාත කුසල කැමැත්ත උපදවයි. **වායන්ති,** ප්‍රයෝගය උත්සාකරයි. **චිත්තං පග්ගණ්හාති.** ඒ සමග උපදින වීර්යයෙන් සිත ඔසවා තබයි. **පදහති** ප්‍රධන්වීර්ය කරයි. **පිළිවෙළින්** ඒ පද

සතරම ඇසුරුකිරීම, වැඩීම, බහුලව යෙදීම, නිතර යෙදීම යනුවෙන් යෙදිය යුතුයි. **උප්පන්නං පාපකානං** නූපන්නේ යයි නොකිවයුතු පැමිණ පාප ධර්මයන්ගේ පහාණය දුරුකිරීම සඳහා. **අනුප්පන්නානං කුසලානං ධම්මානං** නොඉපදුණු කුසල සංඛ්‍යාත ධර්ම. උප්පාදානය - ඉපදීම සඳහා. උප්පන්නං - ඉපදවවූ ඨිතියා සිටීම සඳහා. අසම්මොසාය නුමුළාවීම සඳහා. **භීයොභාවාය** නැවත නැවත වැඩීම සඳහා. වෙපුල්ලාය - මහත් බව සඳහා. **භාවනාය** - වැඩීම. **පාරිපූරියා** - පරිපූර්ණ වීම. සතර සම්‍යක් ප්‍රධානවල උද්දෙසවාර වශයෙන් මෙය ඒකපදික වශයෙන් අර්ථ දැක්වීමයි. දැන් ඒ පද බෙදා දැක්වීමට **කථඤ්ච භික්ඛු අනුප්පන්නානං** ආදි නයින් නිද්දේසවාරය ආරම්භ කළහ. එහි යට ධර්ම සංග්‍රහය ආවා වූ ලෙස එහි වර්ණනාව කියන ලද නයින් දතයුතුය. එහි නොපැමිණි. නිද්දේසයෙහි **යො ඡන්දො** යමක් කැමත්ත වශයෙන්. ඡන්දය. **ඡන්දිකතා** රුචිය ඇති බව. කැමැත්ත ඇතිවන ආකාරය හෝ වේ. **කත්තුකම්‍යතා** කරනු කැමති බව. **කුසලො** - දක්ෂ. **ධම්මඡන්දො** ස්වභාව කැමැත්ත මේ කැමැත්ත නම් **තණ්හා ඡන්දො** දිට්ඨි ඡන්ද විරිය ඡන්ද ධම්ම ඡන්ද වශයෙන් විවිධය. නානාප්‍රකාරය. ඒවා අතරෙන් ධම්ම ඡන්දය යයි මෙතැන කුසල් කරනු කැමති බව අදහස් කරයි. **ඉමං ඡන්දං ජනෙති** කැමැත්තෙන් කරන්නේය යන්නය. **සඤ්ජනෙති** උපසර්ගයෙන් පදාර්ථය වැඩිදියුණු කරයි. **උට්ඨපෙති** කැමැත්ත කරයි. **සමුට්ඨපෙති** - උපසර්ගයෙන් අර්ථය වඩයි. **නිබ්බත්තෙති** කැමැත්ත කරන්නේම ඉපිදවීම නම් වේ. **අභිනිබ්බතෙතති** උපසර්ගයේ අර්ථය වඩයි.

තවද කැමැත්ත කරන්නේම **ඡන්දං ජනෙති** වේ. එය නිතර කරන්නේ **සංජනෙති** නම් වේ. කිසියම් අනතුරකට පැමිණ එයින් ඔසවන්නේ **උට්ඨපෙති** වේ. නොසිඳී පැවැත්මට පමුණුවන්නේ **සමුට්ඨපෙති** වේ. එය ප්‍රකට කරන්නේ **තිබ්බත්තෙති** නම්. නොපසුබැසීමෙන් නොසැඟවීමෙන් ඉදිරියට පැමිණවීමෙන් උපදවන්නේ **අභිනිබ්බත්තෙති** නම්. විරිය නිද්දේසයෙහි වීර්ය කරන්නේම **විරියං ආරභති** නම් වේ. **ආසෙවති භාවෙති** නැවත නැවත කරන්නේ. **බහුලීකරොති** මුලින්ම කරන්නේ. **ආරභති,** නැවත නැවත කරන්නේ. **සමාරභති** භාවනා වශයෙන් භජනය කරන්නේ **ආසේවති** වේ. වඩන්නේ **භාවෙති** වේ. සියළු කටයුතුවල එයම බහුලව කරන්නේ **බහුලී කරොති** යයි දතයුතුය. චිත්ත පග්ගහ නිර්දේශයෙහි වීර්යයෙන් උපකාර කරන්නේ. **චිත්තං පග්ගණ්හාති උක්ඛිපති** වේ. නැවත නැවත උත්සාහවත් කරන්නේ **සම්පග්ගණ්හාති** වේ. මෙසේ සම්පග්ගහිත

වීම නිසා නොවැටෙයි. එසේ ඊට වීර්ය උපස්ථම්භ වීමෙන් උපස්ථම්භ වන්නේ උපත්ථම්භ වේ. උපස්ථම්භ වී ස්ථිරවීමට නැවත නැවත උපස්ථම්භ වීම පච්චුපත්ථම්භ නම්. සියළු අසම්මොහාදියේ සිටි සමාන වචන දැක්වීමට යා ධීති සො අසම්මොසො ආදිය කියන ලදී.

මෙහි මෙය විනිශ්චය කථාවයි. ලෝකිය ලෝකුත්තර වශයෙන් සම්මප්පධාන කථා දෙයාකාරය. එහි ලෞකිකය සියල්ලට පළමු භාගයෙහි වේ. එය කස්සප සංයුත්තයෙහි ලෞකික මාර්ග ඥාණයෙන් දතයුතුය. කියන ලද්දේමය. එහි "ඇවැත්නි, සම්මප්පධාන සතරෙකි. කවර සතරක්ද? මෙහි ඇවැත්නි, භික්ෂුව නූපන්නා වූ මගේ පාප අකුසල දහම් ඉපදීමෙන් අනර්ථය පිණිස පවතී යයි නොඉපදීමට උත්සාහ කරයි. උපන් අකුසල් ප්‍රහීණ නොවීමෙන් අනර්ථය පිණිස පවතීයයි ප්‍රහීණ කිරීමට උත්සාහ කරයි. නූපන් කුසල දහම් නොඉදීමෙන් අනර්ථය පිණිස පවතීයයි ඉපිදවීමට උත්සාහ කරයි. උපන් කුසල් දහම් නිරුද්ධ වීමෙන් අනර්ථය පිණිස වේයයි රැකගැනීමට උත්සාහ කරයි. මෙහි මාගේ නූපන් කුසල දහම් නම් සමථ විපස්සනාද මාර්ගයද වේ. උපන් කුසල් නම් සමථය සහ විපස්සනාවය. මාර්ගය වනාහි වරක් ඉපිද නිරුද්ධවීමක් නැත. එය ඵලයට හේතුවී නිරුද්ධ වේ. පූර්වයෙහිද සමථ විපස්සනය ගතයුතුයයි කියන ලදී. එය වනාහි යුතු නොවේ. එහි උපන් සමථ විපස්සනා නිරුද්ධ වෙමින් අනර්ථය පිණිස පවතීය යන අර්ථය පැහැදිලි කිරීමට මේ කථාවස්තුව වේ.

එක් රහත් තෙර නමක් මහාසෑය ද මහා බෝධියද වඳින්නෙමි යයි සමාපත්තිලාභී පා සිවුරු ගෙනයන සාමණේර කෙනෙකු සමග වැඩසිටි ජනපදයෙන් මහා විහාරයට පැමිණ විහාර කාමරයට වැඩියහ. සවස් කාලයෙහි බොහෝ භික්ෂූන් වහන්සේ චෛතිය වඳින නිසා මහාසෑය වැඳීමට නොවැඩියහ. කුමක් හෙයින්ද? රහතන් වහන්සේලාට තෙරුවන් කෙරෙහි මහත් ගෞරවයක් ඇත. එනිසා භික්ෂූන් වහන්සේලා වැඳ අවසන් වූ පසු මිනිසුන්ගේ සවස බත් වේලාවෙහි සාමණේරයන්ටද නොදන්වා සෑය වඳිමියි තනිවම වැඩියහ. සාමණේරයන් වහන්සේද තෙරුන් වහන්සේ අවේලාවේ තනියම වඩින්නේ කුමක් නිසාදැයි දැනගනු කැමතිව උන්වහන්සේ පසුපසින් නික්මුණහ. තෙරුන් වහන්සේ ආවර්ජනා නොකිරීමෙන් සාමණේරයන් එන බව නොදැන දකුණු දොරටුවෙන් මහසෑ මලුවට පිවිසියහ. සාමණේරයෝද පැමිණියහ. මහතෙරුන් වහන්සේ

මහාසෑය බලා බුද්ධාලම්භන ප්‍රීතිය උපදවාගෙන සියළු සිත් සමනය කොට තුටු පහටුව සෑය වඳියි. සාමණේරයෝ තෙරුන් වහන්සේ පෙර වන්දනා කරන ආකාරය දැක මාගේ උපාධ්‍යායන් වහන්සේ අතිශයින්ම පහන් සිතින් වඳිති. මල් ලැබුණොත් පූජා කරන්නේ යයි සිතූහ. තෙරුන් වහන්සේ වැඳ නැගිට මුදුනෙහි ඇඳිලි බැඳ මහසෑය දෙස බලාගෙන සිටි කල්හි සාමණේරයන් උගුර පාදා තමා ආ බව දැන්වූහ. තෙරුන් වහන්සේ හැරී බලමින් කොයි වේලාවේ ආවේදැයි විචාළහ. ඔබවහන්සේ සෑය වඳින වේලාවේ. ස්වාමින් වහන්ස, අතිශයින් ප්‍රසන්නව සෑය වැන්දහ. මල් ලැබුණොත් පූජා කරනවාද? ඔව්, සාමණේරය. මෙම සෑයෙහි මෙන් වෙන තැනක මෙපමණ ධාතු නිදන්කර නැත. මෙබඳු වූ අසදෘශ මහා සෑයට මල් ලැබුණොත් කවුද පූජා නොකරන්නෙ? එසේනම් ස්වාමින් වහන්ස ඉවසනු මැනවි. ගෙන එන්නෙමි. එකෙණෙහිම ධ්‍යානයට සමවැදී ඍද්ධියෙන් හිමවතට ගොස් වර්ණ ගන්ධ සම්පන්න මල්ගෙන පෙරහන්කඩය පුරවා මහතෙරුන් වහන්සේ දකුණු දොරටුවෙන් බටහිර දොරටුවට ඒමට පෙරම පැමිණ මල් පෙරහන අතේ තබා ස්වාමීන් වහන්ස, පූජාකරනු මැනවි කීහ. තෙරුන්වහන්සේ සාමණේරය, මල් ඉතා මදය කීහ. වඩින්න ස්වාමීන් වහන්ස. භාග්‍යවතුන් වහන්සේගේ ගුණ සිහිකර පූජාකරනු මැනවි. තෙරුන් වහන්සේ බටහිර දොරටුව ආශ්‍රිත සෝපානයෙන් නැගී ගර්භ වේදිකා මලුවෙහි මල්පූජා කරන්නට ආරම්භ කළහ. වේදිකා භූමිය පිරී මල් වැටී දෙවන වේදිකාවේද දණක් පමණ සීමාව පිරවීය. එයින් බැස පාමුල පේලියේ පූජා කළහ. එයද පිරී ගියේය. පිරුණු බව දැන යට තලයෙහි විසිරවූහ. සියළු සෑමලුව පිරුණේය. එය පිරුණු පසු, සාමණේරය මල් ඉවර නොවේයයි කීහ. ස්වාමීන් වහන්ස, පෙරහන යටට නමන්න. යටිකුරු කර ගසා දැමූහ. එවිට මල් අවසන් විය.

තෙරුන් වහන්සේ පෙරහන සාමණේරයන් වහන්සේට දී හස්තිපාකාරය සමග, චෛතිය තුන්වරක් පැදකුණුකොට සතර තැනක නැවතී වැඳ කාමරයට වඩින්නේ සිතූහ. සාමණේරයන් වහන්සේ මහා ඍද්ධිවන්තයහ. මේ ඍද්ධිය ආරක්ෂා කිරීමට හැකිවේදැයි නොහැකි වේදැයි බලා නොහැකි වන්නේ යයි දැක සාමණේරයන්ට කීහ. සාමණේරය, දැන් ඔබ මහා ඍද්ධි ඇති කෙනෙකි. මෙබඳු රූප වූ ඍද්ධිය විනාශ කරගෙන පසුකාලයේදී කණ පෙහෙකාරියගේ අතින් මැඩුණු කැඳ බොන්නෙහියයි කීහ. තරුණකම නිසා ඔහුගේ දෝෂයයි. හෙතෙම උපාධ්‍යායන් වහන්සේගේ කථාවට සංවේග උපදවා ස්වාමින් වහන්ස,

මට කමටහන් දෙනු මැනවයි නො ඉල්වීය. අපගේ උපාධ්‍යායන් වහන්සේ මොනවා කියනවාදැයි එය නො ඇසුනක් මෙන් ගියේය. තෙරුන් වහන්සේ මහාසෑයද මහාබෝධිය ද වැඳ සාමණේරයන් ලවා පාසිවුරු ගෙන්වාගෙන පිළිවෙළින් කුටෙළිතිස්ස මහා විහාරයට වැඩියහ. සාමණේරයෝ උපාධ්‍යායන් වහන්සේගේ පාදානුපදිකව පිණ්ඩපාතයේ නොයති. ස්වාමීන් වහන්ස, කුමන ගමකට වඩින්නේදැයි විමසා දැන මගේ උපාධ්‍යායන් වහන්සේ ගම් සීමාවට පැමිණියේ වන්නේ යයි දැන තමාගේද උපාධ්‍යායන් වහන්සේද පාසිවුරු ගෙන ආකාශයෙන් පැමිණ තෙරුන් වහන්සේගේ පාසිවුරු දී පිඬු පිණිස වැඩියහ. තෙරුන් වහන්සේ සියළු කාලයෙහි අවවාද දෙති. "සාමණේරය මෙසේ නොකරන්න"යි. පෘථග්ජන සෘද්ධි නම් සසලය. අනිස්ථිරය. අසප්පාය රූපාදි අරමුණු ලැබ අප්‍රමාදවම බිඳ වැටේ. පැවති සමාපත්තියෙන් පිරිහී බඹසර වාසයෙහි ස්ථිර වූ සිටීමට නොහැකි වේ. සාමණේරයෝ මාගේ උපාධ්‍යායන් වහන්සේ කුමක් කියන්නේදැයි ඇසීමට කැමති නොවෙති. එසේම කරති. තෙරුන් වහන්සේ අනුපිළිවෙළින් චෛතිය වන්දනා කරමින් කම්පුජේලන්ද නම් විහාරයට වැඩියහ. උන්වහන්සේ එහි වැඩ සිටිනවිට සාමණේරයෝ එසේම කරති. ඉක්බිති දිනක තරුණ වයසෙහි සිටි ලස්සන පේෂකාර දුවක් කම්පු ජේලන්ද ගමින් නික්මී නෙළුම් විලක බැස ගී ගයමින් මල් නෙලයි. ඒ අවස්ථාවේ සාමණේරයෝ නෙළුම්විල ඉහළින් යන්නේ සකුරෙහි ඇළුණු කණාමැස්සකු මෙන් ඇගේ ගීහඬින් බැඳුණාහ. එකෙණෙහිම සෘද්ධිය අතුරුදහන් විය. පියාපත් සිඳුණු කවුඩකු මෙන් විය. පැවති සමාපත්ති බලයෙන් දියපිට නොවැටී හිඹුල් පුළුනක් මෙන් වැටෙන්නේ පිළිවෙළින් පියුම්විල් ඉවුරේ සිටියහ. හේ වේගයෙන් ගොස් උපාධ්‍යායන් වහන්සේට පාසිවුරු දී නැවතුනේය. මහතෙරුන් වහන්සේ මුලින්ම මා එය දැක්කේ යයි වලක්වන්නේ නමුත් නො නවතින්නේ යයි කිසිවක් නොකියා පිණ්ඩපාතයේ වැඩියහ. සාමණේරයෝ ගොස් ඇය පෙරළා එන්නේ යයි පියුම්විල් තෙර සිටියහ. ඕතොමෝද සාමණේරයන් අහසින් යන බවද නැවත අවුත් සිටි බවද දැක, ඒකාන්තයෙන් මොහු මා නිසා උකටලී වූයේ යයි දැන සාමණේරය ඉවත්වෙවයි කීවාය. හේ ඉවත් විය. ඇය විලින් නැඟී වස්ත්‍රය හැඳ ඔහු වෙතට ගොස් මොකද ස්වාමීන් වහන්ස යයි විචාළාය. හේ එපවත් දැන්වීය.

ඕතොමෝ බොහෝ කරුණුවලින් ගිහිගෙයි ආදීනව සහ බඹසර විසුමෙහි ආනිශංසයද දක්වා අවවාද දෙන්නී නමුත් ඔහුගේ කලකිරීම දුරුකිරීමට නොහැකි වූවාය. මේ තෙමේ මා නිසා මෙබඳු සෘද්ධියකින්

පිරිහුනේ දැන් ප්‍රතික්ෂේප කිරීම අසාධාරණ යයි සිතා, මෙහිම ඉන්න කියා ගෙට ගොස් මාපියන්ට එම පුවත සැලකර සිටියාය. ඔවුහුද පැමිණ නොයෙක් ආකාරයෙන් අවවාද දුන්නත් ඒවාට කන් නුදුන්විට මෙසේ කීහ. ඔබ අප උසස් කුලිකයෝ යයි නොසලකන්න. අපි පේෂකාරයෝ වෙමු. පෙහෙරකම් කිරීමට හැකිද? සාමණේර තැන කීය. උපාසකය, ගිහි වූයේ නම් පෙහෙරකම් හෝ බටපොතු කර්මාන්තය හෝ කරන්නේය. කිම මා ගැන සාටක මාත්‍රයෙහි ලෝභ කරවුද? පෙහෙකරුවා බඩබැඳි සලුව දී ගෙට පමුණුවා දියණිය දුන්නේය. හේ පෙහෙරකම් ඉගෙන පෙහෙකරුවන් සමග සාලාවක වැඩ කරයි. සෙසු ස්ත්‍රීහු කලින්ම බත් සපයා ගෙනාහ. ඔහුගේ බිරිය තවම නොපැමිණියාය. අන් අය වැඩ නවත්වා ආහාර අනුභව කරන කල්හි හේ නූල් ඔතන දණ්ඩ පන්නවා හුන්නේය. ඕ පසුව පැමිණියාය. ඉක්බිති හේ ඇයට බොහෝ පමාවී පැමිණියහ යයි තර්ජනය කළේය. මාගම්මු නම් සක්විති රජද තමා කෙරෙහි පිළිබඳ සිත් ඇතැයි දැන දාසයකුට මෙන් සලකති. ඒ නිසා ඕ මෙසේ කීවාය. "අනිත් ගෙවල්වල දර කොල ලුණු ආදිය රැස්කර ඇත. බැහැරින් ගෙනදෙන පෙහෙකරුවෝද ඇත. මමද එක්කෙනෙක. ඔබ මගේ ගෙයි මෙය ඇත. මෙය නැතැයි නොදන්නෙහිය. කැමති නම් කාපන්. කැමති නැත්නම් නොකා ඉඳින්." හේ දවල්වෙලා බත් ගෙනාවා මදිව තව කටගහණ්ඩත් එන්නේ යයි කිපී පහරදීමට අනිකක් නොදක්නේ ඒ නූල් ඔතන දණ්ඩ ගෙන දමා ගැසීය. ඕ එය එනවා දැක මදක් අයින් වූවාය. දඬු කෙළවර තියුණුය. අයින් වෙනවාත් සමගම ඇස් කෙළවර වැදී සිටියේය. ඕ දැතින් ඇස වසා ගත්තාය. ඇනුණු තැනින් ලේ ගැලීය. හේ එවිට උපාධ්‍යායන් වහන්සේගේ වචන සිහි කළේය. මේ නිසා මගේ උපාධ්‍යායන් වහන්සේ අනාගතයෙහි කණ පේසකාරියගේ අතින් මැඩුණු කැඳ බොන්නේ යයි කීහ. මෙය තෙරුන් වහන්සේ දකින ලදී. අහෝ දුර දක්නා ආර්යයන් වහන්සේ යයි මහ හඬින් අඬන්නට පටන් ගත්තේය. අනිත් අය ඔහුට ඕකෙන් කමක් නෑ. අඬන්න එපා. ඇසනම් බිඳුණා. ඇඬීමෙන් ප්‍රකෘතිමත් කරන්ට නොහැකියයි කීවාහුය. හේ ඒ නිසා නෙමේ මං අඬන්නෙ. මේ නිසා අඬමියි සියළු පුවත් පිළිවෙලින් කීවේය. මෙසේ උපන් සමථ විපස්සනා නිරුද්ධ වන්නේ අනර්ථය පිණිස පවතී.

තවත් කථා වස්තුවක්:-

භික්ෂූන් වහන්සේලා තිස්නමක් පමණ කැලණි මහා සෑය වැඳ කැලෑ මාර්ගයකින් මහා මාර්ගයට වඩින්නේ අතරමග දැවුණු කෙතක වැඩකොට එන එක් මිනිසෙකු දුටහ. ඔහුගේ සිරුර දැලි වැකුණේ වෙයි.

දැලිවැකුණු එක් කහ රෙදිකඩක් කැසපට කවා හැඳසිටි ඔහු දෙස බලනවිට දැලි කණුවක් මෙන් හැඟෙයි. හේ දවස මුළුල්ලේ වැඩකර බාගෙට දැවුණු දරමිටියක් ඔසවාගෙන පිටට කඩාහැළුණු කෙස්වැටියෙන් යුක්තව කුඩා පාරකින් අවුත් භික්ෂූන් වහන්සේ ඉදිරියෙහි සිටියේය. සාමණේරවරු ඔහු දැක ඔවුනොවුන් දෙස බලමින් ඇවැත්නි, ඔබේ පියා, ඔබේ මහප්පා, ඔබේ මාමා යයි සිනහසෙමින් කියා උපාසකතුමනි, ඔබේ නම කුමක්දැයි නම ඇසූහ. නම අසන ලද හේ විපිළිසරව දරමිටිය දමා වස්ත්‍රය සකසා හැඳ මහතෙරුන් වැඳ ස්වාමීන් වහන්ස ටිකකට නවතිනු මැනවැයි කීය. මහතෙරහු සිටියහ. තරුණ සාමණේරවරු පැමිණ මහතෙරුන් ඉදිරියෙහිද උපහාස කරති. උපාසක කීය. ස්වාමීනි, මා දැක පරිහාස කරවුද? මෙපමණින් මුදුනට පැමිණියෙමුයි සලකවුද මමද පෙර ඔබවහන්සේලා වගේ ශ්‍රමණයෙකු වීමි. තමුන්නාන්සේලා ගේ සිතේ එකඟකමක්වත් නැත. මම මේ සාසනයෙහි මනා ඍද්ධි ඇති මහානුභාව ඇත්තකු වීමි. අහස පොළොව ලඟට ගෙනෙමි. පොළොව අහස ලඟට ගෙනෙමි. දුර ලඟ කරමි. ලඟ දුර කරමි. සක්වල දහසක් ඇසිල්ලකින් විනිවිද යමි. මගේ අත බලන්න. දැන්නම් වඳුරු අතක් වගේ. මම මේ අත්වලින් මෙහි ඉඳගෙනම සඳහිරු අතගෑවෙමි. මේ පාවලින්ම සඳහිරු පා ලෑල්ලක් කොට හිඳ සිටියෙමි. මෙබඳු වූ මගේ ඍද්ධිය ප්‍රමාදයෙන් පිරිහුණේය. ඔබවහන්සේලා පමා නොවන්න. පමාවීමෙන් මෙබඳු වූ ව්‍යසනයට පැමිණෙති. අප්‍රමාදව වාසය කරන්නෝ ජාති ජරා මරණ අවසන් කරති. ඒ නිසා ඔබවහන්සේලා මාව අරමුණුකොට අප්‍රමාද වනු මැනවැයි තර්ජනය කොට අවවාද දුන්නේය. උන්වහන්සේලා ඔහු කියද්දීම සංවේගයට පැමිණ විදර්ශනා වඩන්නේ තිස්දෙනා වහන්සේම එහිම සිට රහත්බවට පැමිණියහ. මෙසේද උපන් සමථ විපස්සනාව නිරුද්ධ වන්නේ අනර්ථය පිණිස පවතීයයි දතයුතුය. මෙය ලෞකික සම්මප්පධාන කථා විනිසයි. ලෝකෝත්තර මාර්ග ක්ෂණයෙහි එකම වීර්ය කෘත්‍ය හතරක් නිසා සතරක් යන නම ලබයි. එහි අනුප්පන්නා යනු නොහැසිරීම වශයෙන් හෝ අරමුණු නොගැනීම් වශයෙන් හෝ නොඋපන්නා වූ යන තේරුමයි. වෙනත් අයුරකින් කියනවා නම් මුලක් නැති සසර නොඋපන් පාප අකුසල දහම් නම් නැත. අනුප්පන්නයෝ වනාහි උපදිනුයේ මේවා සමගම උපදිති. ප්‍රහීණ වන්නේද මේවා සමගය. සමහර කෙනෙකුට වත් වශයෙන් කෙලෙස් නොඋපදියි. සමහර කෙනෙකුට ග්‍රන්ථ ධූතංග සමාධි විපස්සනා නවකම්ම වීම් වශයෙන් එක්තරා ආකාරයකින් කෙසේද? සමහරෙක් වත් සම්පන්න වෙති. ඔහු දෙඅසූ කුඩුවත් තුදුස් මහවත් සැමලු

බෝමලු පැන් මාලක පොහොය ගේ ආගන්තුක ගමික වත් කරනවිට කෙලෙස් අවකාශ නොලබයි. පසුකලක වතාවත් අත්හැර බිඳුණු වත් ඇතිව හැසිරෙනවිට නුනුවණින් මෙනෙහි කිරීමද සිහිය නොමැතිවීමද නිසා කෙලෙස් උපදියි. මෙසේ වත්වල නොහැසිරීමේ නූපන් කෙලෙස් උපදියි. සමහරෙක් ග්‍රන්ථකරණයෙහි යෙදුනෝ වෙති. එක් නිකායක් ගනියි. දෙකක් තුනක් හතරක් පහක් ගනියි. එසේම ත්‍රිපිටක බුද්ධ වචනය අර්ථ වශයෙන් පෙල වශයෙන් අනුසන්ධි වශයෙන් පූර්ව අපර වශයෙන් ගන්නාට සජ්ඣායනය කරනවිට සිතන්නාට කියන්නාට දේශනා කරන්නාට ප්‍රකාශත කරන්නාට කෙලෙස් අවකාශ නොලබයි. පසුකාලයක ග්‍රන්ථකරණය හැර කම්මැලිව හැසිරීමෙන් නුනුවණින් මෙනෙහි කිරීමෙන් සිහිය අත්හැරීමෙන් කෙලෙස් උපදියි. මෙසේ අසමුදාචාරයෙන් අනුප්පන්න කෙලෙස් උපදියි.

සමහර කෙනෙක් ධුතංගධර වෙති. තෙලෙස් දුහඟ සමාදන්ව පවත්වති. ඔහුට ධුත ගුණ පරිහරණය නිසා කෙලෙස් අවකාශ නොලබයි. පසුව ධුතංග අත්හැර බොහෝ බවට පෙරළී හැසිරීමෙන් නුනුවණින් මෙනෙහි කිරීම සිහිය නැතිවීම නිසා උපදී. මෙසේ නොහැසිරීම නිසා නූපන් කෙලෙස් උපදී නම් වේ. සමහරෙක් අෂ්ට සමාපත්තිවල පුරුදු කරන ලද වසීබව ඇත්තෝ වෙති. ඔවුන්ට ප්‍රථමධ්‍යානාදියෙහි ආවර්ජන වසීතාව වශයෙන් වාසය කිරීම නිසා කෙලෙස් අවකාස නොලබයි. පසුව පිරිහුණු ධ්‍යාන ඇත්තාට හෝ ධ්‍යානය අත්හැර දැමූවහුට හෝ නිරර්ථක කථාවල යෙදී වාසය කිරීමෙන් නුනුවණින් මෙනෙහි කිරීම සිහිය නොමැතිවීම නිසා නූපන් කෙලෙස් උපදී. මෙසේ නොහැසිරීමෙන් නූපන් ක්ලේශ හෝ උපදියි නම් වේ. සමහර කෙනෙක් විදර්ශනා වඩති. අනුපස්සනා සතෙහි හෝ මහා විපස්සනා දහඅටෙහි හෝ යෙදී වාසය කරති. එසේ වාසය කරන ඔහුට කෙලෙස් අවකාශ නොලබයි. පසුව විපස්සනාව හැර කය දැඩිකොට ගැනීම් බහුලව විසීමෙන් නුනුවණින් මෙනෙහි කිරීම සිහිය නැතිවිට පැමිණ උපදී. මෙසේ නොහැසිරීමෙන් නූපන් කෙලෙස් උපදී. සමහරෙක් නව කර්මාන්ත කරන්නෝ වෙති. පොහොය ගෙවල් දාන ශාලා ආදිය කරති. ඔහු ඒ සඳහා උපකරණ ගැන සිතනවිට කෙලෙස්වලට අවකාශ නොලැබෙති. පසුකලෙක නව කර්මාන්ත අවසන්වූ පසු හෝ අත්හැර දැමූවිට හෝ නුනුවණින් මෙනෙහි කිරීම සිහිය අත්හැරීම නිසා පැමිණ උපදී. මෙසේ නොහැසිරීමෙන් නූපන් කෙලෙස් ඉපදීම වේ. සමහරෙක් බඹලොවින් ආ සුද්ධ සත්වයෝ වෙති. ඔහු සේවනය නොකිරීමෙන් කෙලෙස් අවකාශ නොලබයි. සේවනය ලැබීමෙන් නුනුවණින්

මෙනෙහි කිරීම සිහිය හැරීම නිසා උපදියි. මෙසේ නොහැසිරීමෙන් නූපන් කෙලෙස් උපදී. මෙය නොහැසිරීමෙන් අනුප්පනෙනා නූපන් යනුයි යයි දැනගත යුතුය.

අනනුභූතාරම්මණා වශයෙන් කෙසේද? මෙහි සමහරෙක් පෙර නොවිඳින ලද මනස ආදි අරමුණු ලබති. ඔහුට එහි නුනුවණින් මෙනෙහි කිරීම සිහිය අතහැරීම නිසා රාගාදී කෙලෙස් උපදියි. මෙසේ පෙර නොවිඳින ලද වශයෙන් අනුප්පන්නා උප්පජ්ජති නම් වේ. ලෝකෝත්තර මාර්ග ක්‍ෂණයෙහි වනාහි එකම වීර්ය වේ. නූපන්නා වූ ඉපදීද ඒවා නොඉපදීම සඳහා ඒවායේ නොඉපදීම් කෘත්‍යයද ඉපදුණවුන්ගේ ප්‍රහාණ කෘත්‍යයද සිදුකරයි. එහෙයින් **උප්පන්නානං පාපකානං** යයි මෙහි ඉපදීම සතරාකාරය. වර්තමාන ඉපදීම භූත්වා විගත ඉපදීම, අවකාශ ඉපදීම, භූමිලද්ධ ඉපදීම යනුවෙනි. එහි යට විද්‍යමාන වූ කෙලෙස් ඉපදීම සමග වූයේද එය වර්තමාන ඉපදීම වේ. ක්‍රියාව කිරීමේදී අරමුණු රස විඳ අවසන් වූ විපාකය භූත්වා විගත නම් වේ. කර්මය ඉපදී නිරුද්ධවීම භූත්වා විගත නම් වේ. දෙයාකාරයම භූත්වාවිගත නම් වේ. කර්මය ඉපදී නිරුද්ධවීම භූත්වාවිගත නම් වේ. දෙයාකාරයම භූත්වාවිගත උප්පන්න සංඛ්‍යාවට යයි. කුසලාකුසල කර්මය අනිත් කර්මයක විපාක වලකා තමාගේ විපාකයට ඉඩදීම අවකාශ ඉපදීම වේ. පංචස්කන්ධය විපස්සනාවට භූමි වේ. ඒවා අතීතාදි භේදයෙන් යුක්තය. ඒවා අතර අනුසය වශයෙන් නිදාගත් කෙලෙස් අතීත හෝ අනාගත හෝ වර්තමාන හෝ යයි නොකිව යුතුය. අතීත ස්කන්ධවල අනුව නිදා සිටියෝද ප්‍රහීණ නොවූවෝය. අනාගත වර්තමාන ස්කන්ධ අනුව නිදාසිටියෝද අප්‍රහීණය. මෙය භූමිලද්ධ ඉපදීම නම් වේ. එයින් කීහ පුරාණයෝ "ඒ ඒ භූමිවල නොඉදුරු කෙලෙස් භූමිලද්ධ උප්පන්න සංඛ්‍යාවට යයි" තවද සතරාකාර ඉපදීමක් සමුදාචාර උප්පන්න, ආරම්මණ අධිගගහිත උප්පන්න, අවික්ඛම්භිත උප්පන්න, අසමුග්ඝාටිත උප්පන්න යනුවෙනි. සමුදාචාර උප්පන්න නම් වර්තමානය වේ. සත්වරක් ඇස් දල්වා අරමුණෙහි නිමිති ගෙන සිහිකරන හැමවිටම කෙලෙස් නො උපදින්නේ යයි නොකිව යුතුය. කුමක් හෙයින්ද? අරමුණේ අධිගෘහිත බැවිනි. කුමක් වාගේද? කිරිගහ කෙටේරියෙන් කොටන හැමවිටම කිරි නික්මෙන්නේ නැතැයි නොකිව යුතුය. මෙසේ මෙය ආරම්මණ අධිගෘහිත සම්පන්න වේ. සමාපත්තියෙන් විෂ්කම්භනය නොකළ කෙලෙස් මෙම ස්ථානයෙහි නූපදින්නේ යයි නොකිව යුතුය. මෙය අවික්ඛම්භික උප්පන්න නම් වේ. මාර්ගයෙන් (පෙරාපර) උදුරා

නොදැමූ කෙලෙස් භවාග්‍රය දක්වා නූපදිතියි නොකිව යුතුය. මෙය අසමුග්ඝාටිත උප්පන්න නම් වේ. මෙම උපත් අතුරෙන් වත්තමාන, භුත්‍වාවිගත අවකාස, සමුදාචාර සතර මාර්ග නැතිකළ හැකි නොවේ. භූමිලද්ධ, ආරම්මණ, අවිගෘහිත, අවික්ඛම්භිත, අසමුග්ඝාටිත සතර මාර්ගයේ නැතිකළ යුතුය. මාර්ගය උපදිනවිට මේ කෙලෙස් දුරුකරයි. ඒ දුරුකරන කෙලෙස් අතීත අනාගත වර්තමානය යයි නොකිව යුතුය.

පුදුමය මෙය කියන ලද්දේ වෙයි. අතීතයෙහි කෙලෙස් පහකරයි. එනම් ක්ෂීණා වූවම ක්ෂීණ කරයි. නිරුද්ධ වූවම නිරුද්ධ කරයි. ඉවතවූවම ඉවත් කරයි. අසත්‍ය ගියදේම අසත්‍යයට යවයි. අතීතයේ යමක් නැද්ද එය පහකරයි. අනාගතයෙහි කෙලෙස් පහකරයි. නොඋපන් දේ පහකරයි. නොනිපන් දේ පහකරයි. නොඋපන් නොහටගත් දේ පහ කරයි. අනාගතයේ යමක් නැද්ද එය පහකරයි. වර්තමානයේ කෙලෙස් පහකරයි. එයින් රත්වූයේ රාගය පහකරයි. දූෂ්‍ය වූ ද්වේශය පහකරයි. මුළාවූ මෝහය පහකරයි. විනිබද්ධ වූ මානය පහකරයි. සිතින් දැඩිසේ ගත් දෘෂ්ටිය පහකරයි. වික්ෂිප්ත වූ උද්ධච්චය නිමාවට නොපැමිණ විචිකිච්ඡාව පහකරයි. බලවත් වූ අනුසය පහකරයි. කළු සුදු දහම් යුගනද්ධව පවතී. කිලුටට පමුණුවන මාර්ග භාවනා වේ. එය නැත්නම් මාර්ග භාවනා නැත. ඵල සාක්ෂාත් කිරීම නැත. කෙලෙස් ප්‍රහාණය නැත. ධර්මාභිසමය නැත. භාවනා ඇත. මග්ගභාවනා ඇත. ඵල සච්ඡිකිරියා ඇත. කෙලෙස් ප්‍රහානය ඇත. ධර්මාභිසමය ඇත. කුමක් වැනිද? ළපටි ගසක් නැති නිසාම පහ නොවේ. ගසේ පෙලෙහි නොහටගත් ඵල ඇති රුකක් පැමිණියේය. එහි ඵල මිනිස්සු අනුභව කරන්නාහු සෙසු ගෙඩි කඩා පැස් පුරවන්නාහු ඉක්බිති අනිත් පුරුෂයෙක් එය පොරොවෙන් කපන්නේය. එයින් එහි අතීත පල නැසුම් නොවේ. අනාගත ඵල වත්මන් පල නැසුම් නොවේ. අතීත ඵල මිනිසුන් වළඳන ලදී. අනාගත ඵල නොනිපන් නිසා නැසිය නොහැක. යම්කලෙක එය කපන ලද්දේ නම් එකල්හි පල නැතැයි අනාශ්‍රිතය. ගස නොකැපූයේ නම් එය පොළව ආපෝ රසගෙන ඵල උපදවන්නේය. ඒවා කඩන ලද්දේ වේ. ඒවා නොහටගත් නිසා හට නොගනී. නොනිපන් නිසා නූපදී. නොපහළ වූ නිසා පහළ නොවේ. එසේම මාර්ගය අතීතාදී භේදයෙන් කෙලෙස් පහ නොකරයි. දුරු නොකරයි. කෙලෙස් මාර්ගයෙන් ස්කන්ධ පරිඥ්ඥාත හෝ නිසා උපදී. ඉපදී මාර්ගයේ ස්කන්ධ දැනගන්නා ලද කල්හි කෙලෙස් නොඋපන්නේම නූපදී. නොපහළ වූ නිසා පහළ නොවේ. තරුණ පුතකු ඇති ස්ත්‍රිය

නැවත නොවැදීම සඳහා බාධිත වූ රෝග ව්‍යපසමනය සඳහා බීපු බෙත්වලින් ද මෙහි අර්ථය විස්තර කළ යුතුය.

මෙසේ මාර්ගය කෙලෙස් පහ කරයි. ඒවා අතීත හෝ අනාගත හෝ වර්තමානය නොකිව යුතුය. මාර්ගය කෙලෙස් දුරු නොකරන්නේ නොවේ. මාර්ගය කෙලෙස් දුරුකරයි. ඒ සඳහා උප්පන්නානං පාපකානං ආදිය කියන ලදී. මාර්ගය කේවලවූ කෙලෙස් පමණක් නැති නොකරයි. කෙලෙස් අප්‍රහීණ බැවින් උපදින්නේය. උපාදින්න ස්කන්ධ යන ඒවාද දුරු කරන්නේමය. මෙය කියන ලදී. සෝවාන් මග නුවණින් අභිසංඛාර විඤ්ඤාණ නිරෝධයෙන් භව හතක් හැර මුලක් නැති සසරෙහි උපන් නාමරූප මෙහි නිරුද්ධ වේ. විස්තර වශයෙන් මාර්ගය උපාදින්න අනුපාදින්න දෙකින්ම නැගී සිටී. භව වශයෙන් සෝවාන්මග අපාය භවයෙන් නැගී සිටී. සකෘදාගාමී මග්ගය සුගතභව ඒකදේශයකින් අනාගාමි මග්ග සුගතිකාම භවවලින් අරහන්ත මග්ගය රූපාරූප භවවලින් නැගී සිටී. සියළු භවවලින් නැගී සිටී යයිද කියති. ඉක්බිති, මාර්ග ක්‍ෂණයෙහි නූපන් ඒවායේ ඉපදීමට භාවනා වඩන්නේ කෙසේද? උපන් නමුත් සිටීම කෙසේද? මාර්ගයේ පැවතීමමය. මාර්ගය පැවතීමට පෙර අනුප්පන්න පූර්ව වූ බවට අනුප්පන්න නම් වේ. අනාගත පෙර ස්ථානයට ගොස් පෙර නොවූවිරූ අරමුණක් ගෙන කියනු ලබයි. අනාගත ස්ථානයට පැමිණියෙමු. නොවූවිරූ අරමුණක් වින්දෙමු. යමක් ඔහුගේ පවතීද මෙය ධීති නමැයි ධීති අභාවයෙන් කීම වටී. එසේම මේ භික්‍ෂුවට මේ ලෝකෝත්තර මාර්ග ක්‍ෂණයේ, විරිය නූපන් පාප අකුසල ධර්මයන්ගේ නො ඉපදීම යයි ආදි නම ලබයි. මෙය ලෝකෝත්තර මාර්ගක්‍ෂණයේ සම්මප්පධාන කථාවය. මෙසේ මෙහි ලෞකික ලෝකෝත්තර මිශ්‍රව සම්මප්පධාන දක්වන ලද්දේ වේ.

### සූත්‍රාන්ත භාජනියයි.

අභිධම්මභජනියෙහි සියළු සම්මප්පධාන ධම්ම සංගණියෙහි බෙදන ලද නයේ මාතෘකා පමණක් දැක්වීමෙන් විස්තර කරන ලදී. එහි නය භේදය දැනගත යුතුය. කෙසේද? පළමු ප්‍රථම සම්මප්පධානයෙහි සෝවාන් මාර්ගයේ ධ්‍යානාභිනිවේශයෙහි සුද්ධික පටිපදා, සුද්ධික සුඤ්ඤතා සුඤ්ඤත පටිපදා සුද්ධික අප්පණිහිතා අප්පණිහිත පටිපදා යන මේ ස්ථාන පහේ දෙක දෙක සතර සහ පස්වැනි නය වශයෙන් නය දහයක්

වේ. මෙසේ සෙසු ඒවායෙහිද විසි අභිනිවේශ නය දෙකක් යයි සියයකි. ඒව සතර අධිපතීන්ගේ සතර ගුණයෙන් අටකි. මෙසේ සුද්ධික වශයෙන් දෙකකි. අධිපති සමග අට යයි සියල්ල නය දහසක් වේ. දෙවන සම්මප්පධානවල සුද්ධික සම්මප්පධානයදැයි සෝවාන් මගෙහි නය පන්දහසක් වේ. සෝවාන් මගෙහි මෙන් සෙසු මාර්ගවල කුසල වශයෙන්ම නය විසිදහසක් වේ. නය දෙක අනුව හතලිහක අභිනිවේශ දෙකේ දහයකි. එවිට පනහකි. එය නය දෙකින් සියයකි. එය එදා අධිපති අට ගැන සුද්ධික දෙකෙන් දහකි. එවිට දාහකි. පක්‍ෂික නයෙන් සෝවාන් මගෙහි පන්දහසකි. සෙසු මාර්ගද ආව නය විපාකයෙහි (ඵලයෙහි) සම්මප්පධානවලින් කළයුතු දෙයක් නැත. ඒ නිසා විපාක වාර ගණන් නොගන්නා ලදී.

## අභිධම්ම භාජනියයි.

මෙහි සම්මප්පධාන නිපන් ලෝකෝත්තරවලින්ම කියන ලදැයි දතයුතුය. පඤ්හ පුච්ඡකයෙහි පෙල අනුසාරයෙන් සම්මප්පධානවල කුසලාදිභාවය දතයුතුය. ආරම්මණත්‍රිකයෙහි මේ සියල්ල අප්‍රමාණ වූ නිවන අරබයා පවතින බැවින් අප්පමාණ ආරම්මණමය. මග්ගාරමණ නොවේ. සහජාත හේතු වශයෙන් මාර්ග හේතු වේ. වීමංසය ප්‍රධානකොට මාර්ග භාවනා කාලයෙහි මාර්ග අධිපති වේ. ඡන්‍ද චිත්ත ප්‍රධානත්‍ය මාර්ග භාවනාවේ නොකිවයුතු අධිපති වේ. විරිය ප්‍රධානය අනිත් වීර්යයන් නැති නිසා නොකිවයුතු මාර්ග අධිපති හෝ මාර්ග අධිපති නොවන හෝ අතීතාදියෙහි එක් අරමුණක ඇති බව නොකිව යුතුය. නිවනේ වනාහි බාහිර ධර්මතා බාහිර අරමුණු වේ. මෙසේ මෙහි ප්‍රශ්න විමසීමෙන් නිපන් ලෝකෝත්තරම සම්මප්පධානයයි කියන ලදී. සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ විසින් සූත්‍රාන්ත භාජනියෙහිම ලෞකික ලෝකොත්තර මිශ්‍රව දේශනා කරන ලදී. අභිධර්ම භාජනිය ප්‍රශ්න විමසීමෙහි ලෝකෝත්තර පමණක් දේශනා කරන ලදී. මෙසේ මේ සම්මප්පධාන විභංගයද තිපරිවෘත්තයව ගෙනහැර බෙදා දක්වන ලදී.

**සම්මෝහ විනෝදනී නම් විභංග අර්ථ වර්ණනාවේ**
**අටවන සම්මප්පධාන විභංග නිද්දේසයයි.**

# 9.
# ඉද්ධිපාද විභංගය

ඊට අනතුරුව දැන් ඉද්ධිපාද විභංගයෙහි **චත්තාරො** යනු ගණන සීමා කිරීමය. **ඉද්ධිපාදා** යනු මෙහි සමෘද්ධ වේ. සිදුවේ. ඉද්ධි වේ. සිදුවේ. නිපදවේ යයි යන අර්ථය වේ. සිදුවන්නේ මෙයින් සත්වයෝ ඉද්ධාවෘද්ධි වේ. උසස්බවට ගියේ වෙයි යනුද ඉද්ධි වේ. පළමු අර්ථයෙන්ම ඉද්ධියම ඉද්ධිපාද වේ. ඉද්ධි කොටස් යන අර්ථයි. දෙවන අර්ථයෙන් ඉද්ධියේ පාද යයි ඉද්ධිපාද වේ. පාදො යනු ප්‍රතිෂ්ඨාවය. අධිගමයට උපාය යන අර්ථයයි. එසේ හෙයින් යමකින් මතුමත්තෙහි විශේෂ සංඛ්‍යාත වූ ඉද්ධි පැමිණේ. එහෙයින් පාද යයි කියනු ලැබේ. මෙසේ ඉද්ධිපාද සතරකැයි දතයුතුය. දැන් ඒවා බෙදා දැක්වීමට **ඉධ භික්ඛු** යනාදිය ආරම්භ කරන ලදී. එහි **ඉධ භික්ඛු** යනු මේ ශාසනයෙහි භික්ෂූන් වහන්සේය. **ඡන්ද සමාධිපධාන සංඛාර සමන්නාගතං** යන මෙහි ඡන්දය හේතු වූ හෝ ඡන්දය අධික වූ සමාජය ඡන්ද සමාධි වේ. කරනු කැමති කැමැත්ත මුල්කොට ලබන ලද සමාධියට මෙය සම්‍යක් වචනයකි. ප්‍රධාන වූ සංඛාර ප්‍රධාන සංඛාර වේ. සිව්කිස සාදන සම්මප්පධාන වීර්යය මෙය සමාන වචනයකි. **සමන්නාගතං** ඡන්ද සමාධියෙන්ද ප්‍රධාන සංඛාරවලින්ද යුක්ත වූ **ඉද්ධිපාදං** යනු සමෘද්ධ වීමයි. මෙයින් සිදුවේය යන අර්ථයෙන් සත්වයෝ සම්පූර්ණ වෙති. උසස් බවට පැමිණෙති. මේ ආකාරයෙන් ඉද්ධි යන සංඛ්‍යාවට ඇතුළත් උපචාර ධ්‍යාන කුසල් සිත් යුක්ත වූ ඡන්ද සමාධි පධාන සංඛාරවල අධිෂ්ඨාන අර්ථයෙන් පාදවූ සෙසු සිත් රාශිය යන අර්ථයයි. යමකින් පසු ඉද්ධිපාද වූයේ නම් එබඳුවූ වේදනා සඤ්ඤා සංඛාර විඤ්ඤාණ ස්කන්ධ යයි කියන ලදී. එය මේ අර්ථයෙන් යෙදේ. සෙස්ස මේ නයින් දතයුතුය. යම්සේ ඡන්දය අධිපතිකොට ලැබූ සමාධිය ඡන්ද සමාධියි කියන ලදී. එසේම විරිය චිත්ත වීමංස අධිපතිකොට ලබන සමාධිය විරිය චිත්ත වීමංස යයි කියනු ලැබේ.

දැන් ඡන්ද සමාධි ආදි පද බෙදා දැක්වීමට **කථඤ්ච භික්ඛු** යනාදිය ආරම්භ කරන ලදී. එහි **ඡන්දඤ්චෙ භික්ඛු අධිපතිං කරිත්වා** යනු භික්ෂුව ඡන්දය අධිපති ඡන්ද ජෙෂ්ට ඡන්දධුර ඡන්ද පෙරටු කොට සමාධි ලබයි. උපදවයි. මෙසේ ඉපදවීමෙන් මේ සමාධිය ඡන්ද සමාධියයි කියනු ලැබේ යන අර්ථයයි. **විරියඤ්චෙති** ආදියෙහිද මෙම නයයි. **ඉමෙ වුච්චන්ති පධාන සංඛාර** යන මෙපමණකින් ඡන්ද ඉද්ධිපාදය වඩන භික්ෂුවගේ

ප්‍රධාන අභිසංස්කාර සංඛ්‍යාත සිව්කිස සිදුකරන වීර්ය කියන ලදී. **තදෙකජ්ඣං අභිසඤ්ඤූහිත්වා** යනු ඒ සියල්ලම එක්රැස් කොට යන අර්ථයි. **සංඛං ගච්ඡති** එක ව්‍යවහාරයකට යයි කියා දැනගත යුතුය යන අර්ථයි. දැන් ඡන්ද සමාධි ප්‍රධාන සංඛාර යන මේ පද සමූහයෙහි ඡන්දාදි ධර්ම බෙදා දැක්වීමට **තත්ථ කතමො ඡන්දො** යනාදිය ආරම්භ කරන ලදී. එය නොගැඹුරු අර්ථයම වේ. **උපෙතො හොති** ඉද්ධිපාද සංඛ්‍යාත ධර්ම රාශිය යුක්ත වේ. **තෙසං ධම්මානං** ඒවායේ යුක්ත වූ ඡන්දාදි ධර්මයන් ගේ. **ඉද්ධි සමිද්ධීති** ආදිය සියළු සමෘද්ධවීම් ස්ථාන වචන වේ. මෙසේ පවතින සමෘද්ධවීම් අර්ථයෙන් **ඉද්ධි** වේ. සම්පූර්ණ වූ ඉද්ධිය **සමිද්ධි** වේ. උපසර්ගයෙන් පදාර්ථය වැඩිදියුණු කෙරේ. සිදුවන ආකාරය **ඉජ්ඣනා** ය. **සමිජ්ඣනා** උපසර්ගයෙන් පදය වඩන ලදී. තමාගේ සන්තානයෙහි පහළවීම් වශයෙන් ලැබීම **ලාභො** වේ. පිරිහුනද වීර්ය ආරම්භ කිරීම් වශයෙන් නැවත ලැබීම **පටිලාභො** වේ. උපසර්ගයෙන් පදය වඩන ලදී. **පත්ති** අධිගමයයි. අපරිහානි වශයෙන් මනාව පැමිණීම **සම්පත්ති** වේ. **ඵුසනා** ප්‍රතිලාභ ස්පර්ශ කිරීම. **සච්ඡිකිරියා** ප්‍රතිලාභ සාක්ෂාත් කිරීම. **උපසම්පදා** නැවත ලැබීම් පැමිණීම යයි දතයුතුය. **තථාභූතස්ස** ඒ ආකාරයෙන් වූ. ඒ ඡන්දාදි ධර්ම නැවත ලැබ සිටින්නේය යන අර්ථය වේ. **වෙදනක්ඛන්ධො** යන ආදියෙන් ඡන්දාදිය ඇතුළත්කොට ස්කන්ධ සතරම කියන ලදී. **තෙ ධම්මෙ** යනු ඒ සතර අරූප ස්කන්ධයෙහි ඡන්දාදි තුන් ධර්ම යයි ද කියන ලදී. **ආසෙවති** යනු කියන ලද අර්ථම වේ. සෙසු ඉද්ධිපාද නිර්දේශවලද මෙනයින්ම අර්ථ දැනගත යුතුය. මෙපමණකින් කුමක් කියන ලදද? භික්ෂූන් සතර දෙනාගේ කමටහන් මුදුන්පත්වීම කියන ලදී. එක් භික්ෂුවක් ඡන්දය පිහිටකොට ගනී. කරනු කැමති කුසල ධර්ම ඡන්දයෙන් අර්ථ නිපදවීම ඇතිකල්හි මම ලෝකෝත්තර දහම් උපදවමි. මම මෙය ඉපදවීමේ බරක් නැතැයි ඡන්දය දෙමු. බර පෙරටුකොට සිත පිහිටකොට ගනියි. එක්කෙනෙක් ප්‍රඥාව පිහිට කොටගනී. ප්‍රඥාවෙන් අර්ථය නිපදවා ගත්කල්හි මම ලෝකෝත්තර දහම් උපදවමි. එය ඉපදවීමේ බරක් මට නැතැයි ප්‍රඥාව දෙටුකොට ධූරකොට පෙරටුකොට ලෝකෝත්තර දහම් නිපදවයි.

කෙසේද? ඇමති පුත්‍රයන් සතර දෙනෙක් ථානාන්තර පතා හැසිරෙන්නාහු එකෙක් උපස්ථානය පිහිටකොට ගත්තේය. එකෙක් සූරභවයද එකෙක් ජාතියද අනිකා මන්ත්‍රද පිහිටකොට ගත්හ. ඔවුනතුරෙන් පළමුවැන්නා මෙහෙ කිරීමෙහි **උපට්ඨානයෙහි** අප්‍රමාදව අර්ථය උපදවා ගත්කල්හි මේ තනතුර ලැබුවේ උපස්ථානයෙන් යයි එය පිහිටකොට

ගත්තේය. දෙවැන්නා මෙහෙ කිරීමෙහි අප්‍රමාද වූයේද එකෙක් සටනක් එළඹිවිට සිටීමට නොහැකි වෙයි. රජතුමාගේ පසල් දනව් අවශ්‍යයෙන්ම කිපෙන්නේය. එසේ කිපුණු කල්හි රථඇදුරු කර්මය කර රජු සතුටුකොට මේ තනතුර ගන්නෙමියි සූරභාවය පිහිටකොට ගත්තේය. තුන්වැන්නා සූරභවය පැවති නමුත් එකෙක් හීන ජාතිකයෙකි. ජාතිය පිරිසිදුකර තනතුරු දෙනවිට මට දෙන්නේ යයි ජාතියේ පිහිටකොට ගත්තේය. සතරවැන්නා ජාති සම්පන්න වුවත් එකෙක් මන්ත්‍ර නොදන්නේය. මන්ත්‍රයෙන් කළයුතු කාර්යයක් පැමිණි කල්හි මේ තනතුර ගන්නේමැයි මන්ත්‍ර පිහිටකොට ගත්තේය. ඒ සියල්ලෝම තම තමන් පිහිටකොට ගත් දෙයෙහි බලයෙන් තනතුරුවලට පැමිණියහ. එහි මෙහෙ කිරීමෙහි අප්‍රමාදව තනතුරට පැමිණියා මෙන් ඡන්දය පිහිටකොට කරනු කැමති කුසල් ඡන්දයෙන් අර්ථ නිෂ්පත්තිය වූ කල්හි මම ලොවුතුරා දහම් නිපදවම් එය නිපදවීමෙහි මට බරක් නැතැයි ඡන්දය දෙටුකොට බර කොට පෙරටුකොට ලොවුතුරු දහම් නිපදවූවහු දතයුතුය. රට්ඨපාල තෙරුන් මෙන් ඒ ආයුෂ්මත් වූ ඡන්දය ධුරකොට ලොවුතුරු දහම් ඉපදවිය. සූරභවයෙන් රජු සිත්ගෙන තනතුරට පත්වූවහු මෙන් විරිය දෙටුකොට ධුරකොට පෙරටුකොට ලොවුතුරු දහම් නිපදවූවහු දතයුතුය. සෝණ තෙරුන් මෙන් උන්වහන්සේ විරිය ධුරකොට ලොවුතුරු දහම් ඉපිදවූහ. ජාති සම්පත්තියෙන් තනතුරට පත් තැනැත්තා මෙන් සිත දෙටුකොට ධුරකොට පෙරටුකොට ලොවුතුරු දහම් ඉපදවූ භික්ෂුව දතයුතුය. සම්භූත තෙරුන් වහන්සේ මෙනි. උන්වහන්සේ සිත ප්‍රධානකොට ලොවුතුරු දහම් නිපදවූහ. මන්ත්‍ර පිහිටකර තනතුරු ලැබූ අය මෙන් වීමසංසනය ප්‍රධානකොට වීමංසනය දෙටුකොට වීමංසනය පෙරටුකොට ලොවුතුරු දහම් නිපදවූ භික්ෂුව දතයුතුය. මොඝරාජ තෙරුන් මෙනි. උන්වහන්සේ වීමංසය ප්‍රධානකර ලොවුතුරු දහම් ඉපිදවූහ. මෙහි වනාහි ඡන්ද සමාධි පධාන සංඛාර සංඛ්‍යාත ධර්ම තුන ඉද්ධියද වේ. ඉද්ධිපාදද වේ. සෙසු සම්පයුත්ත ස්කන්ධ සතර ඉද්ධිපාද වේ. විරිය චිත්ත වීමංසා සමාධි පධාන සංඛාර සංඛ්‍යාත වූ තුන් ධර්මයෝ ඉද්ධිද ඉද්ධිපාදද වේ. සෙසු සම්පයුක්ත ස්කන්ධ සතර ඉද්ධිපාදම වේ. මේ තවම අභේද කථාය.

බෙදීම් වශයෙන් වනාහි ඡන්දය ඉද්ධි නම් වේ. ඡන්දය ප්‍රධාන කර වඩන ලද සිත ස්කන්ධ ඉද්ධිපාද නම් වේ. සමාධි පධාන යන සංඛාර දෙක සංඛාර ස්කන්ධ වශයෙන් ඡන්ද ඉද්ධිපාදයට පිවිසේ. පාදයෙහි පිවිසියේ යයි කීමද වටීමය. එහිම සමාධි ඉද්ධි නම් වේ. සමාධි ප්‍රධානකොට වඩන ලද සතර ස්කන්ධ සමාධි ඉද්ධිපාද නම් වේ. ඡන්ද

පධාන සංඛාර දෙක සංඛාර ස්කන්ධ වශයෙන් සමාධි ඉද්ධිපාදයට පිවිසේ. පාදයෙහි පිහිටියේ යයි කීමද වටී. එහිම පධාන සංඛාරය ඉද්ධි නම් වේ. පධාන සංඛාරය වැඩීමෙන් සතර ස්කන්ධ පධාන සංඛාර ඉද්ධිපාද නම් වේ. ඡන්දය සමාධිය යන දෙක සංඛාර ස්කන්ධ වශයෙන් පධාන සංඛාර ඉද්ධිපාදයට පිවිසේ. පාදයට පිවිසියේ යයි කීමද වටී. එහිම විරිය ඉද්ධි නම් වේ. සිත ඉද්ධි නම් වේ. වීමංස ඉද්ධි නම් වේ. පෙ. වැරදි පවිට්ඨාතිපි වත්තුං විංසති. මෙය භේද වශයෙන් කථාවය.

මෙහි අලුත් දෙයක් නැත. ගන්නා ලද විභූත ධාතුක කරන ලදී. කෙසේද? ඡන්ද සමාධි පධාන සංඛාර යන මේ තුන ඉද්ධි වේ. ඉද්ධිපාද ද වේ. සෙස්ස සම්පයුක්ත සතර ස්කන්ධ ඉද්ධිපාද වේ. මේ තුන්ධර්ම සමෘද්ධ වෙමින් සම්ප්‍රයුක්ත වූ ස්කන්ධ සතර සමගම සමෘද්ධ වේ. එය නැතිව නොවේ. සම්ප්‍රයුක්ත සිතින් ස්කන්ධ සමෘද්ධ වීම අර්ථයෙන් ඉද්ධි නම් වේ. ප්‍රතිෂ්ඨා අර්ථයෙන් පාද වේ. ඉද්ධි හෝ ඉද්ධිපාද හෝ වෙනත් දෙයකට සමාන වචනයක් නොව සම්ප්‍රයුක්ත ස්කන්ධ සතරටම අධිවචනයකි. විරිය චිත්ත වීමංස සමාධි පධාන සංඛාර යන ධර්ම වෙන කිසිවකට යන වචන නොව ස්කන්ධ හතරටම අධි වචනයකි. තවද පූර්වභාගය ඉද්ධි නම් වේ. පටිලාභය ද ඉද්ධි නම් නය දතයුතුය. මේ අර්ථය උපචාරයෙන් හෝ විපස්සනාවෙන් විස්තර කළයුතුය. ප්‍රථම ධ්‍යාන පරිකර්ම ඉද්ධිපාද නම් වේ. ප්‍රථම ධ්‍යානය ඉද්ධි වේ. දෙවන තුන්වන සතරවන ආකාසනඤ්චායතන විඤ්ඤානඤ්චායතන ආකිඤ්චඤ්ඤායතන නේවසඤ්ඤානාසඤ්ඤායතනය ප්‍රකීර්ණ ඉද්ධිපාද නම් වේ. නේවසඤ්ඤානාසඤ්ඤායතනය ඉද්ධි වේ. සෝවාන් මාර්ගයේ විපස්සනා ඉද්ධිපාද වේ. සෝවාන් මාර්ගය ඉද්ධි වේ. සකෘදාගාමි අනාගාමි අරහත්ත මග්ග විපස්සනා ඉද්ධිපාද වේ. අරහත්ත මාර්ගය ඉද්ධි වේ. ප්‍රතිලාභයෙනුත් දැක්වීම වටී. ප්‍රථමධ්‍යානය ඉද්ධිපාද වේ. ද්විතීය ධ්‍යානය ඉද්ධි වේ. ද්විතීය ධ්‍යානය ඉද්ධිපාද වේ. තෘතීය ධ්‍යානය ඉද්ධි වේ. තෘතීය ධ්‍යානය ඉද්ධිපාද වේ. චතුර්ථ ධ්‍යානය ඉද්ධි වේ. අනාගාමි මග්ග ඉද්ධිපාද වේ. අරහත්ත මග්ග ඉද්ධි වේ. කුමන අර්ථයකින් ඉද්ධි වේද? කුමන අර්ථයකින් පාද වේද? සමෘද්ධවීම් අර්ථයෙන් ඉද්ධි වේ. ප්‍රතිෂ්ඨා අර්ථයෙන් පාද වේ. මෙබඳු වූ ඉද්ධි හෝ ඉද්ධිපාද හෝ වෙනත් කිසිවකට සමාන වචනයක් නොව සම්ප්‍රයුක්ත සතර ස්කන්ධවලට අධි වචනයකි. එසේ කීකල්හි එනම් එසේ කීහ. සතර ස්කන්ධයන්ගේ ම අධිවචනයක් වන්නේය. ශාස්තෘන් වහන්සේ අන් අයුරකින් උත්තර චූල්ල භාජනියෙහි ගෙනහැර දැක්වූහ. උත්තරචූල්ල භාජනයෙහි ඡන්දයම ඡන්ද ඉද්ධිපාද වේ. වීර්ය

සිතම වීමංසයම ඉද්ධිපාද යයි කියන ලදී. ඉද්ධි නම් අනිෂ්පන්නය ඉද්ධිපාද නිෂ්පන්නයයි කීහ. ඔවුන්ගේ වචන ප්‍රතික්ෂේප කොට ඉද්ධියද ඉද්ධිපාදයද නිෂ්පන්න යයි තිලකුණු මතාසේ නිශ්චය කොට තිබේ. මෙසේ මේ සූත්‍රාන්ත භාජනියෙහි ලෞකික ලෝකෝත්තර මිශ්‍රව ඉද්ධිපාද කියන ලදී.

## සුත්තන්ත භාජනියයි.

අභිධර්ම භාජනියෙහි නොගැඹුරු අර්ථමය. මෙහි නය ගිණිය යුතුය. **ඡන්‍ද සමාධි පධාන සංඛාර සමන්නාගතං ඉද්ධිපාදං භාවෙති** කියන ලද ස්ථානයෙහි ලෝකෝත්තරය නය හාරදහසකට බෙදන ලදී. විරිය සමාධි ආදියෙහි ද මෙම නයමයි. එසේම උත්තර චුල්ල භාජනියෙහි ඡන්‍ද ඉද්ධිපාදයෙහි නය හාරදහසක් බෙදන ලදී. විරිය චිත්ත වීමංස ඉද්ධිපාදයෙහි සතර සතර සියල්ල චතුක්ක අටක් වශයෙන් නය තිස් දෙදහසක් බෙදන ලදී. මෙසේ උපදවන ලද ලෝකෝත්තර ඉද්ධිපාද වශයෙන් නය දෙතිස් දහසකින් ප්‍රතිමණ්ඩිත අභිධර්ම භජනිය කියන ලදැයි දතයුතුය. පඤ්හ පුච්ඡකයෙහි - පෙළ අනුසාරයෙන් ඉද්ධිපාදවල කුසලාදිභාවය දතයුතුය. ආරම්මණ ත්‍රිකයෙහි වනාහි මේ සියල්ල අප්‍රමාණය. නිවන අරබයා පවතින අප්‍රමාණ අරමුණය. මාර්ග අරමුණු නොවේ. සහජාත හේතු වශයෙන් වනාහි මාර්ග හේතුය. මාර්ග අධිපති නොවේ. සතර අධිපතීහු ඔවුනොවුන් ගරු නොකරති. කුමක් හෙයින් තමා දෙටු බැවිනි. යම්සේ සමාන ජාතික සමාන වයස සමාන බලය සමාන ශිල්ප ඇති රාජපුත්‍රයෝ සතරදෙනෙක් තම තමාගේ ජ්‍යෙෂ්ඨ බැවින් ඔවුනොවුන්ට බුහුමුන් නොකරති. එසේම මේ අධිපති සතරදෙනා වෙන වෙනම ශ්‍රේෂ්ඨ බැවින් ඔවුනොවුන් ගරු නොකරයි. ඒකාන්තයෙන්ම මාර්ගාධිපතිහු ගරු නොකරති. අතීතාදියෙහි ඒකාරම්මණ භාවයෙහිද නොකිව යුතුය. නිර්වාණය වනාහි බාහිර ධර්මතාවක් හා බාහිර අරමුණක් නම් වේ යයි මෙසේ මෙහි ප්‍රශ්න විචාරකයෙහි උපන් ලෝකෝත්තරයම ඉද්ධිපාද කියන ලදී. අභිධර්ම භාජනිය ප්‍රශ්න විචාරකයෙහි ලෝකෝත්තරමය. එසේම මේ ඉද්ධිපාද විභංගයද තිපරිවෘත්තය ගෙනහැර බෙදා දක්වන ලදී.

**සම්මෝහ විනෝදනී නම් විභංග අර්ථ වර්ණනාවේ**
**නවවන ඉද්ධිපාද විභංග නිද්දේසයයි.**

# 10.
# බොජ්ඣංග විභංග නිද්දේසය

ඉන් අනතුරුව දැන් බොජ්ඣංග විභංගයෙහි සත්ත යනු ගණන වෙන් කිරීමය. බොජ්ඣංගා යනු බෝධියේ අංගය. මෙය කියන ලද්දේ වේ. මේ ධර්ම එකතුවීමෙන් ලෝකෝත්තර මාර්ග ක්‍ෂණයෙහි උපදින, සැඟවුණු උද්ධච්ච පිහිටීම රැස්කරන කම්සැප අත්තකිලමථානුයෝග උච්ඡේද සාස්වත අභිනිවේසාදි නොයෙක් උවදුරුවලට ප්‍රතිපක්‍ෂ වූ සිහිය ධර්මය විමසීම පිණිස පස්සද්ධිය සමාධිය උපේක්ඛා සංඛ්‍යාත වූ ධර්ම එකතුවීමෙන් ආර්ය ශ්‍රාවකයා අවබෝධ කිරීම බෝධියයි කියනු ලැබේ. සිතේ නිදාසිටි කෙලෙස් නැගිටීම අවබෝධ කරයි. සතර ආර්ය සත්‍යයන් අවබෝධ කරයි. නිවන හෝ සාක්‍ෂාත් කරයි යනු බෝධි වේ. ඒ ධර්ම සාමග්‍රි සංඛ්‍යාත බෝධියේ අංගද බොජ්ඣංග වේ. ඣානංග මග්ගංග ආදිය මෙනි. යමෙක් කියන ලද ආකාරයෙන් මේ ධර්ම සාමග්‍රියෙන් ආර්ය ශ්‍රාවකයා අවබෝධ කරයි යන අර්ථයෙන් බෝධිය යයි කියනු ලැබේ. ඒ බෝධියේ අංගද බොජ්ඣංග වේ. සෙනංග රථංග ආදිය මෙනි. එයින් කීහ, අටුවා ඇදුරෝ - අවබෝධ කරන පුද්ගලයාගේ අංග හෝ බොජ්ඣංග වේ" යයිද තවද කුමන අර්ථයකින් බොජ්ඣංග වේද? අවබෝධය පිණිස පවතීනුයි බොජ්ඣංග වේ. අවබෝධ කෙරේනුයි බොජ්ඣංග අනුව අවබෝධ කෙරේනුයි බොජ්ඣංගා. සම්පූර්ණයෙන් අවබෝධ කෙරේනුයි බොජ්ඣංගා" යයි මේ පටිසම්භිදා- නයින්ද බොජ්ඣංග අර්ථය දතයුතුයි. සති සම්බොජ්ඣංග ආදියෙහි ප්‍රශස්ත වූ සුන්දර වූ බොජ්ඣංගය සම්බොජ්ඣංග වේ. සිහියම සතිසම්බොජ්ඣංග වේ. එහි වැටහීම ලක්‍ෂණ කොට ඇත්තේ සතිසම්බොජ්ඣංග වේ. විශේෂයෙන් පරීක්‍ෂා කිරීම ලක්‍ෂණකොට ඇත්තේ ධම්මවිචය සම්බොජ්ඣංග වේ. උදව්දීම ලක්‍ෂණකොට ඇත්තේ විරිය සම්බොජ්ඣංග වේ. පැතිරීම ලක්‍ෂණකොට ඇත්තේ පීති සම්බොජ්ඣංග වේ. සංසිඳීම ලක්‍ෂණකොට ඇත්තේ පස්සද්ධි සම්බොජ්ඣංග වේ. එකඟබව ලක්‍ෂණ කොට ඇත්තේ උපේක්ඛා සම්බොජ්ඣංග වේ. ඒවා අතරෙන් "මහණෙනි, සිහිය වනාහි සියළු අර්ථය යයි මම කියමි" යන වචනයෙන් සියළු බොජ්ඣංගයන්ට උපකාර වන බැවින් සතිසම්බොජ්ඣංගය පළමුව දේශනා කරන ලදී. ඉන්පසුව එසේ සිහියෙන් වාසය කරන්නේ ප්‍රඥාවෙන් විශේෂයෙන් විමසයි යනාදි නයින් මෙසේ අනුක්‍රමයෙන් බහා තැබීමේ ප්‍රයෝජන පෙලෙහි ආවේමය.

කුමක් හෙයින් අඩුවැඩි නැතිව සතක්ම කියන ලද්දේද? සැඟවුණු උද්ධච්චයට ප්‍රතිපක්ෂ බැවින් හැමතැනටම ප්‍රයෝජනවත් බැවින්ද මෙහි බොජ්ඣංග තුනක් අප්‍රකටයව ප්‍රතිපක්ෂ වේ. යම්සේ කීහ. "මහණෙනි, යම් අවස්ථාවක සිත මැලිවූයේද සැඟවුනේ වේද ඒ අවස්ථාවේ ධම්මවිචය සම්බොජ්ඣංගය වැඩීමට කාලයයි. විරිය සම්බොජ්ඣංගය වැඩීමට කාලයයි. පීති සම්බොජ්ඣංගය වැඩීමට කාලයයි. උද්ධච්චයට තුනක් ප්‍රතිපක්ෂ වේ කීහ. මහණෙනි, යම්කලක සිත විසිරී ඇතිද ඒ කාලයෙහි පස්සද්ධි සම්බොජ්ඣංගය වැඩීමට සුදුසුය. සමාධි සම්බොජ්ඣංගය වැඩීමට, උපේක්ඛා සම්බොජ්ඣංගය වැඩීමට කාලයයි. එකක් වනාහි සියළු ව්‍යඤ්ජනවල ලුනු ධූපයක් මෙන් (ලොණ ධූප) සියළු රාජ කෘත්‍යවල සියළු කටයුතු කරන ඇමතිවරයකු මෙන් සියළු බොජ්ඣංගවල කැමතිවිය යුතු හෙයින් සබ්බත්‍ථික ස්ථානඃ- "මහණෙනි, සිහිය වනාහි සියල්ලටම කැමති වේ." පෙලෙහි සබ්බත්‍ථක යනුවෙන්ද ඇත. දෙදෙනාම (සබ්බත්‍ථ) කැමති වෙති යන අර්ථය වේ. සබ්බත්‍ථික වශයෙන්ද සතක්ම කියන ලදැයි දතයුතුය. දැන් මේවායේ එකම අරමුණේ තම තමාගේ කෘත්‍යය වශයෙන් නා නා කටයුතු දැක්වීමට **තත්‍ථ කතමො සති සම්බොජ්ඣංගො** යනාදිය ආරම්භ කළහ.

එහි ඉධ භික්ඛූ යනු මේ සාසනයෙහි භික්ෂුවය. **සතිමා හොති** පුග්ගල පඤ්ඤාවද යසසෙන් යසවාද ධනයෙන් ධනවාද මෙන් සිහියෙන් සතිමා වේ. සිහියෙන් යුක්තය යන අර්ථයයි. **පරමෙන** - උතුම් හෙයින්, එහි පරමාර්ථ සත්‍ය වූ නිවණ ද මාර්ගයද අනුලෝම වශයෙන් පරම නම් වේ. **සතිනෙපක්කෙන** මෙහි නෙපක්ක යනු ප්‍රඥාවය. උත්තම ශ්‍රේෂ්ඨ යන අර්ථයෙන්. සිහියද නුවණද යන අර්ථයයි. මෙම සිහිය බෙදා දක්වන අවස්ථාවෙහි පඤ්ඤා එකතු කෙළේ කුමක් හෙයින්ද? සිහියේ බලවත් බව දැක්වීම සඳහාය. සිහිය ප්‍රඥාව සමගද නැතිවද උපදී. ප්‍රඥාව සමග උපදිනවිට බලවත් වේ. නැතිව උපදිනවිට දුබලය. එහෙයින් බලවත් බව දැක්වීම සඳහා පඤ්ඤා සංග්‍රහ කරන ලදී. දිසා දෙකක රාජමහාමාත්‍යවරු සිටිනාහ. ඔවුනතුරෙන් එක්කෙනෙක් රාජපුත්‍රයා ගෙන සිටියි. තමාගේ තේජසින්ද රාජපුත්‍රයාගේ තේජසින්ද තේජවන්ත වේ. තමාගේ ස්වභාවයෙන් සිටියේ නම් එපමණ තේජසක් ඇති නොවේ. මෙසේ රාජපුත්‍රයා ගෙන සිටි මහාමාත්‍යයා මෙන් පඤ්ඤාව සමග උපන් සිහිය, තමාගේ ස්වභාවයෙන් සිටියා මෙනි. ප්‍රඥාව නැතිව උපන් සිහිය, එහි රාජපුත්‍රයා ගෙන සිටි තම තේජසින් හා රාජපුත්‍රයාත් තේජසින් තේජස් වන්නේද?

යම්සේ පඤ්ඤාව සමග උපන් සිහිය බලවත් වෙයි. තමාගේ ස්වභාවයෙන් සිටියේ ඒ හා ස්වභාවයෙන් නොවේද? මෙසේ පඤ්ඤාව නැතිව උපන් සිහිය දුබල වේ. බලවත් බව දැක්වීමට පඤ්ඤාව ගන්නා ලදී. **චිරකතම්පි** තමාගේ හෝ අනුන්ගේ හෝ කයින් වතාවත් හෝ කසිණ හෝ පරිකර්ම හෝ බොහෝ කලක් කරන ලද. **චිරභාසිතං** තමාගේ හෝ අනුන්ගේ හෝ වචනයෙන් වතාවත්වල සිට ධර්ම කථාවක් හෝ කමටහන් විනිසක් හෝ බොහෝ කලක් කියන ලදී. **සරිතා හොති** එය කාය විඤ්ඤත්ති වචී විඤ්ඤත්තියද උපදවා පවත්වන අරූප ධර්ම කොටසක් මෙසේ ඉපදී මෙසේ නිරුද්ධ වීයයි සිහි කිරීම වේ. **අනුස්සරිතා** නැවත නැවත සිහිකිරීම. **අයං වුච්චති සතිසම්බොජ්ඣංගා හොති** මෙය මෙසේ උපන්නා වූ සෙසු බොජ්ඣංග උපදවන විදර්ශනා සම්ප්‍රයුක්ත සිහිය සතිසම්බොජ්ඣංග යයි කියනු ලැබේ. **සො තථා සතො විහාරන්තො** ඒ භික්ෂුව ඒ ආකාරයෙන් උපන් සිහියෙන් යුතුව වාසය කරන්නේ. **තං ධම්මං** එය බොහෝ කල් කළ බොහෝ කල් කියන ලද යට කියන ලද ආකාරයේ ධර්ම. **පඤ්ඤාය පවිචිනති** අනිත්‍ය දුක්ඛ අනාත්ම වශයෙන් විමසීම. **පවිචරති** අනිත්‍ය දුක්ඛ අනාත්මයයි එහි ප්‍රඥාව හැසිරවන්නේ පවිචරති වේ. **පරිවීමංසං ආපජ්ජති** බැලීමට පිවිසීමට පැමිණෙයි. **අයං වුච්චති.** මේ කියන ලද ආකාර බොජ්ඣංග පහළවීම විපස්සනා. ඣාන ධම්මවිචය සම්බොජ්ඣංග නම් යයි කියනු ලැබේ. **තස්ස තං ධම්මං** ඒ භික්ෂුවට යට කියන ලද ආකාර ඒ ධර්මය. **ආරද්ධං හොති** - සම්පූර්ණ වේ. ගන්නා ලද. **අසල්ලීනං** ආරම්භ කළ බැවින්ම ගුප්ත නොවන. **අයං වුච්චතී** මේ බොජ්ඣංග පහළ කරවන විදර්ශනා සම්ප්‍රයුක්ත විරිය විරිය සම්බොජ්ඣංගයයි කියනු ලැබේ. **නිරාමිසා** කාම ආමිස ලෝක ආමිස සංසාර ආමිස අභාවයෙන් නිරාමිස වූ පිරිසිදු වූ. **අයං වුච්චති** මේ බොජ්ඣංග පහළ කරවන විපස්සනා සම්ප්‍රයුක්ත ප්‍රීති පීති සම්බොජ්ඣංගයයි කියනු ලැබේ. **පීතිමනස්ස** ප්‍රීතියෙන් යුක්ත සිතේ **කායොපිපස්සම්භති** ස්කන්ධ ත්‍රය සංඛ්‍යාත කය කෙලෙස් දාහය සංසිඳීමෙන් චිත්තමය - විඤ්ඤාණ ස්කන්ධය එසේම සංසිඳේ. **අයං වුච්චති** මේ බොජ්ඣංග පහළ කරවන විපස්සනා සම්ප්‍රයුක්ත සංසිඳීම පස්සද්ධි සම්බොජ්ඣංගයයි කියනු ලැබේ. **පස්සද්ධ කායස්ස සුඛිනො** සංසිඳීම කයෙන් උපන් සැපයෙන් සුඛිත වූ **සමාධියති** මනාව තබයි. නිසලව අරමුණෙහි තබයි. අර්පණාවට පත්වූවා මෙන් වේ. **අයං වුච්චති** මේ බොජ්ඣංග පහළ කරවන විපස්සනා සම්ප්‍රයුක්ත සිතේ එකඟකම සමාධි සම්බොජ්ඣංගයයි කියනු ලැබේ. **තථා සමාහිතං** අර්පණා පත්වූවකු මෙන් එයින් සමාධිගත කරන ලද

**සාධුකං අජ්ඣුපෙක්ඛිතා හොති** මනාව මධ්‍යස්ථ වේ. ඒ ධර්මයන්ගේ ප්‍රහාණය හා වර්ධනයෙහි ව්‍යාවෘතත නොවී මධ්‍යස්ථ වේ. **අයං වුච්චති** මේ බොජ්ඣංග හයේ පසුනොබැසීම නොනවතින ස්වභාවයන් සඳහා වූ මධ්‍යස්ථ ආකාර උපෙක්ඛා සම්බොජ්ඣංගය යයි කියනු ලැබේ. මෙපමණකින් කුමක් කියන ලද්දේ වේද? පෙරපසු නොවී එක් සිත් කෙණෙහි නානා රස ලක්‍ෂණ විපස්සනා බොජ්ඣංගය කියන ලදී.

## පළමුවන නයයි.

දැන් යම් ධර්ම පරියායකින් බොජ්ඣංග සත තුදුසක් වේද? එය ප්‍රකාශ කිරීම සඳහා දෙවන නය දක්වන්නේ නැවත **සත්ත බොජ්ඣංග** යනාදිය කීහ. මේ එය අනුපූර්ව පද වර්ණනාවයි. **අජ්ඣත්ත ධම්මෙසු සති** අජ්ඣත්තික සංස්කාර විමසන්නාට උපදින සිහිය. **යදපි යමක්ද** තදපී එයද අභිඤ්ඤාය අවබෝධ කළයුතු ධර්ම දැනගැනීම සඳහා. සම්බොධාය සම්බෝධිය කියනු ලැබේ. මාර්ගය මාර්ග අර්ථය සඳහා යන අර්ථයයි. **නිබ්බාණාය** වාන තෘෂ්ණාව කියනු ලැබේ. එය එහි නැතැයි නිබ්බාණ වේ. ඒ අර්ථය සඳහා අසංඛත වූ අමෘත ධාතුව සාක්‍ෂාත් කිරීම සඳහා පවතී යන අර්ථයකි. ධම්මවිචය සම්බොජ්ඣංගයෙහිද වීර්යයයි. **චෙතසිකං** යනු ආශ්‍රවයන්ගෙන් සිත මිදෙනතුරු මෙම ආසනයෙන් නොනැගිටිමියි ශරීර ක්‍රියාවක් නැතිව උපදින වීර්යයයි. **කාය පස්සද්ධි** ස්කන්ධ තුනේ දාහයෙන් සංසිඳීම. **චිත්ත පස්සද්ධි** විඤ්ඤාණ ස්කන්ධයේ දැවීමෙන් සංසිඳීම. උපෙක්ඛා සම්බොජ්ඣංගයෙහිද සති සම්බොජ්ඣංගය සමානව විනිස වේ.

මේ නයෙහි බොජ්ඣංග සත ලෞකික ලෝකෝත්තර මිශ්‍රව කියන ලදී. පුරාණ තෙරුන් වහන්සේලා වනාහි මෙපමණකින් ප්‍රකට නොවේයයි බෙදා දැක්වූහ. මේවායේ අධ්‍යාත්ම ධර්මවල සති, විචය, උපෙක්ඛා යන මේ තුන තමාගේ ස්කන්ධ අරමුණු කරන ලද බැවින් ලෞකික වේ. එසේම මාර්ගයට නොපැමිණි කායික වීර්යද ලෞකිකය. අවිතක්ක අවිචාර පීති සමාධි ලෝකෝත්තර වේ. සෙස්ස ලෞකික ලෝකෝත්තර මිශ්‍ර වේ. එහි අජ්ඣත්ත පළමුවෙන් සති විචය උපෙක්ඛා අධ්‍යාත්ම අරමුණුය. ලෝකෝත්තර මිශ්‍ර වේ. එහි අජ්ඣත්ත පළමුවෙන් සති විචය උපෙක්ඛා අධ්‍යාත්ම අරමුණුය. ලෝකෝත්තර වනාහි බාහිර අරමුණුය. ඒවායේ ලෝකෝත්තර භාවය නොයොදනු. සක්මන් ප්‍රයෝගයෙන් උපන් වීර්යද

ලෞකිකය. කියන්නේ වෙහෙස නොවෙයි. අවිතක්ක අවිචාර පීති සමාධි වනාහි ලෝකෝත්තරම වේ. කාමාවචරයෙහි පීති සම්බොජ්ඣංගය ලබයි. අවිතක්ක අවිචාර පීති නොලබයි. රූපාවචරයෙහි අවිතක්ක අවිචාර පීති ලබයි. පීති සම්බොජ්ඣංගය නොලබයි. අරූපාවචරයෙහි කිසිවකින් කිසිවක් නොලබයි. මෙහි වනාහි නොලැබෙන දේ ගෙන ලැබෙන දේද ප්‍රතික්ෂේප කරන ලදී. මෙසේ මේ අවිතක්ක අවිචාර පීති සම්බොජ්ඣංගය කාමාවචරයෙන්ද නික්මුනේ රූපාවචරයෙන්ද අරූපාවචරයෙන්දැයි උපන් ලෝකෝත්තරයෙහිම කියන ලදී. එසේම කාමාවචරයෙහි සමාධි සම්බොජ්ඣංගය ලබයි. අවිතක්ක විචාර සමාධිය නොලබයි. රූපාවචර අරූපාවචරවල අවිතක්ක විචාර සමාධිය ලබයි. සමාධි බොජ්ඣංගය නොලබයි. මෙහි වනාහි නොලබන දේ ගෙන ලබන දේද ප්‍රතික්ෂේප කරන ලදී. මෙසේ මේ අවිතක්ක විචාර සමාධි කාමාවචරයෙන්ද නික්මුනේ රූපාවචරයෙන්ද අරූපාවචරයෙන් නිපන් ලෝකෝත්තරම යයි කියන ලදී. තවද ලෞකිකය ගෙන ලෝකෝත්තරය කළයුතුය. ලෝකෝත්තරය ගෙන ලෞකිකය කළයුතුය. අධ්‍යාත්ම ධර්මවල සති විචය උපෙක්ඛාවල ලෝකෝත්තර භාවනා කාලයක්ද ඇත. එහි සූත්‍රය මේ. ඇවැත්නි, ආධ්‍යාත්ම විමෝක්ෂය සියළු උපාදාන ක්‍ෂය යයි කියයි. මෙසේ ඔහුගේ මේ ආශ්‍රවයෝ අනුසය නොවෙති. මේ සූත්‍රාන්තයේ ලෝකෝත්තරය වේ. සක්මන් ප්‍රයෝගයෙන් උපන් වීර්ය නොසන්සිඳුනේ විපස්සනා මාර්ගය සමග ගැටේ. එවිට එය ලෝකෝත්තර වේ. යම් තෙරුන් වහන්සේලා කසිණ ආනාපාන බ්‍රහ්මවිහාර ධ්‍යානවලද බොජ්ඣංග උදුරන්නේ නොවැළැක්විය යුතුයයි කියති. ඔවුන්ගේ වාදයෙහි අවිතක්ක අවිචාර පීති සමාධි සම්බොජ්ඣංග ලෞකික වේ.

## දුතිය නයයි.

දැන් බොජ්ඣංගවල භාවනා වශයෙන් පවත්වන තුන්වන නය දක්වන්නේ නැවත **සත්ත බොජ්ඣංග** යනාදිය කීහ. එහිද මේ අනුපූර්ව පද වර්ණනාවයි. **භාවෙති** වඩයි. තම සන්තානයෙහි නැවත නැවත උපදවයි. නැවත උපදවයි. **විවෙක නිස්සිත** විවේකය ආශ්‍රිත වූ. විවෙකො වෙන්වන ලද බව. එයද මේ තදංග විවේකය වික්ඛම්භන සමුච්ඡේද පටිප්පස්සද්ධි නිස්සරණ විවේකයයි පංචවිධ වේ. එහි තදංග විවේකය නම් විපස්සනාවයි. වික්ඛම්භ විවේක නම් අෂ්ට සමාපත්ති වේ. සමුච්චේද විවේකය නම් සෝවාන් ආදි මාර්ගයයි. පටිප්පස්සද්ධි විවේක නම්

සෝවාන් ආදි ඵලය. නිස්සරණ විවේකය නම් සියළු නිමිති අත්හළ නිවනයි. මෙසේ මේ පස්විධ විවේකයෙහි නිශ්‍රිතවීම විවේක නිස්සිත වේ. තදංගවිවේක නිස්සිතය සමුච්ඡේද විවේක නිස්සිතය නිස්සරණ විවේක නිස්සිතයද සති සම්බොජ්ඣංගය වඩයි යන මේ අර්ථය දතයුතුය. එසේම මේ සති සම්බොජ්ඣංග භාවනානුයෝගයෙන් යුක්ත වූ යෝගියා විපස්සනා ක්‍ෂණයෙහි කෘත්‍ය වශයෙන් තදංග විවේකය ආශ්‍රිත වූ අදහස්වලින්ද නිස්සරණ විවේකය ආශ්‍රිත මාර්ග කාලයෙහි වනාහි කෘත්‍ය වශයෙන් ද සමුච්ඡේද විවේක ආශ්‍රිත වූ අරමුණුවලින් ද නිස්සරණ විවේක නිශ්‍රිත වූ සතිසම්බොජ්ඣංගය වඩයි. පංචවිධ විවේක නිශ්‍රිතවම යයිද කෙනෙක් කියති. ඔවුහු බලවත් විපස්සනා මාර්ගඵල ලක්‍ෂණවලම බොජ්ඣංග පමණක් නොඋදුරති. විපස්සනා පාදක කසිණ ධ්‍යාන ආනාපාන බ්‍රහ්මවිහාර ධ්‍යානවලද උදුරති. අර්ථකථාචාර්යවරුන් විසින් නැවත සිදු නොකරති. (අට්ඨකථාචරියෙහි නච පටිසිද්ධා) එහෙයින් ඔවුන්ගේ මතයෙන් මේ ධ්‍යාන පවතින ක්‍ෂණයෙහි කෘත්‍ය වශයෙන්ම වික්ඛම්භන විවේක නිශ්‍රිත වේ. විපස්සනා ක්‍ෂණයෙහි අදහස් වශයෙන් නිස්සරණ විවේක නිශ්‍රිත යයි කියන ලදී. මෙසේ පටිප්පස්සද්ධි විවේක නිශ්‍රිතයද වැඩිය යුතුයයි කියන්ට වටී. මේ නය විරාග නිශ්‍රිතාදියෙහි වේ. විවේක අර්ථයම විරාගාදිය වේ. මෙහි හුදෙක් අත්හැරීම දෙයාකාරය. පරිච්චාග පක්ඛන්දන වශයෙන්. පරිත්‍යාග අත්හැරීම විපස්සනා ක්‍ෂණයෙහිද තදංග වශයෙන් මාර්ග ක්‍ෂණයෙහි ද සමුච්ඡෙද වශයෙන් කෙලෙස් ප්‍රහානයේද පකඛන්‍දන වොසසගග යනු විපස්සනා ක්‍ෂණයෙහි ඊට නැමුණු බැවින්ද මාර්ග ක්‍ෂණයෙහි වනාහි අරමුණු කිරීමෙන් නිවනට පැනීමය. ඒ දෙකම මේ ලෞකික ලෝකෝත්තර මිශ්‍රයෙහි අර්ථ වර්ණනා නය වටී. එසේම මේ සති සම්බොජ්ඣංගය කියන ලද ආකාරයෙන් කෙලෙස් අත්හරියි. නිවනටද පනියි. **වොස්සග්ග පරිනාමිං** මේ සියළු වචනයෙන් අත්හැරීම් අර්ථය මුහුකරන්නේ මුහුකුරා ගියේද පැසෙන්නේ පැසුණේද හෝ වෙයි. මෙය කියන ලදී. මේ බොජ්ඣංග භාවනාවෙන් යුක්ත වූ භික්‍ෂුව සති සම්බොජ්ඣංගය කෙලෙස් අත්හැරීම් වොත්ථපන අර්ථයද නිවනට පැනීමෙහි වොස්සග්ග අර්ථයද පැසවයි. මුහුකුරයි යි සේයි. යම්සේ පැසෙන්නේද එසේ එය වඩයි. සෙසු බොජ්ඣංගවලද මෙම නයයි. මේ නයෙහි ලෞකික ලෝකෝත්තර බොජ්ඣංග කියන ලදී.

**සූත්‍රාන්ත භාජනියයි.**

අභිධර්ම භජනියෙහි සත්ත බොජ්ඣංග එකට ප්‍රශ්නකොට විසඳීමද වෙන වෙනම ප්‍රශ්නකොට විසඳීමද වශයෙන් නය දෙකකි. ඒවායෙහි අර්ථ වර්ණනාව යට කියන ලද නයින්ම දතයුතුය. උපෙක්ඛා සම්බොජ්ඣංග නිර්දේශයෙහි වනාහි මධ්‍යස්ථ වීම් වශයෙන් උපෙක්ඛා වේ. උපේක්ෂණා ආකාරය උපෙක්ඛනා වේ. උපේක්ෂා විය යුත්තෙහි පවතින ධර්ම කැමති වේ චෝදනා නොකෙරේ යනු උපෙක්ඛා වේ. පුද්ගලයා උපේක්ෂා කරවයි යනු උපෙක්ඛනා වේ. බොජ්ඣංග වැඩීමට පැමිණීමෙන් ලෞකික උපේක්ෂාවට වැඩි උපෙක්ඛනාව අජ්ඣුපෙක්ඛනා වේ. ව්‍යාපාරයකට නොපැමිණීමෙන් වන මධ්‍යස්ථභාවය මජ්ඣත්තතා වේ. එය වනාහි සිතේ ගමන්කිරීමක් නැතැයි දැක්වීමට මජ්ඣත්තතා මිත්තස්ස යයි කියති. මේ අනුපූර්ව පද වර්ණනාවයි. මෙහි නය ගිණිය යුතුය. බොජ්ඣංග සත එකට ප්‍රශ්නකොට විසඳීමෙහි එක එක මාර්ගයෙහි නය දහස බැගින් නය හාරදහසක් බෙදන ලදී. වෙන වෙනම විචාරා විසඳීමෙහි එක එක බොජ්ඣංග වශයෙන් සතර බැගින් හත්වරක් සතරෙහි විසිඅටක් වේ. ඒවා පෙර සතර සමග තිස් දෙකක් යයි සියළු අභිධර්ම භාජනියෙහි නය තිස් දෙදහසක් කුසලම බෙදන ලදී. යම්හෙයකින් ඵල ක්‍ෂණයෙහිද බොජ්ඣංග ලැබේ. සාමඤ්ඤ (මහණ) ඵල කුසලහේතුකද වේ. එහෙයින් ඒවායෙහිද බොජ්ඣංග දැක්වීමට කුසල නිර්දේශය පෙරටුවම පෙලෙහි විපාක නය අරඹන ලදී. එයද එකට විචාරා විසඳීමද වෙනම විචාරා විසඳීමද වශයෙන් දෙයාකාර වේ. මෙහි සෙස්ස කියන ලද නයින් දතයුතුය. විපාකයෙහි කුසල වශයෙන් නය තුන්ගුණයක් කළයුතුය.

## අභිධම්ම භාජනියයි.

ප්‍රශ්න විචාරීමෙහි පෙල ඇසුරෙන්ම බොජ්ඣංගවල කුසලාදි භාවය දතයුතුය. ආරම්මණ ත්‍රිකයෙහි මේ සියල්ලද අප්‍රමාණ වූ නිවන අරබයා පවතින අප්‍රමාණ අරමුණමය. මාර්ග අරමුණ නොවේ. සහජාත හේතු වශයෙන් මෙහි කුසල මග්ග හේතු වේ. විරිය හෝ වීමංසය හෝ දෙටුකොට මාර්ග භාවනා කාලයෙහි මාර්ග අධිපති වේ. ඡන්‍ද චිත්ත දෙටු වූ විට මාර්ග භාවනාවෙන් නොකිව යුතුය. මග්ගාධිපතියයි ඵල කාලයෙහි ද නොකිව යුතුමය. අතීතාදියෙහි එක් අරමුණ කැපද නොකිව යුතුය. නිවන වනාහි බාහිර ධර්මතා බැවින් බාහිර අරමුණක් වේ. මෙසේ ප්‍රශ්න විචාරයෙහිද ඉපදුණු ලෝකෝත්තරයට බොජ්ඣංග යයි කියන ලදී.

සම්මා සම්බුද්ධයන් වහන්සේ විසින් සුත්තනිපාත භාජනියෙහිම පළමුවන නයෙහි ලෞකිකයද දෙවන තුන්වන නයවල ලෞකික ලෝකෝත්තර මිශ්‍රවද බොජ්ඣංග කියන ලදී. අභිධර්ම භාජනියෙහි නය සතරෙහි ද මේ ප්‍රශ්න විචාරයෙහිද ලෝකෝත්තරයයි කියන ලදී. මෙසේ මේ බොජ්ඣංගයෙහිද තිපරිවෘත්තය ගෙනහැර දක්වාම බෙදා දක්වන ලදී.

**සම්මෝහ විනෝදනී නම් විභංග අර්ථ වර්ණනාවේ**
**දසවන බොජ්ඣංග විභංග නිර්දේශයයි.**

# 11.
# මග්ග විභංගය

දැන් ඊට අනතුරුව මාර්ග විභංගයෙහි **අරියො අට්ඨංගිකො මග්ගො** යනාදි සියල්ල සච්ච විභංගයෙහි දුක්ඛ නිරෝධ ගාමිනී පටිපදා නිද්දේසයෙහි කියන ලද නයින්ම දතයුතුය. භාවනා වශයෙන් වෙනම දක්වන ලද දෙවන නයෙහිද **සම්මා දිට්ඨිං භාවෙති විවේක නිස්සිතං** ආදි සියල්ල බොජ්ඣංග විභංගයෙහි කියනලද නයින්ම දතයුතුය. මෙසේ මෙය නය දෙකේම වශයෙන් සුත්තනත්ත භාජනියෙහි ලෞකික ලෝකෝත්තර මිශ්‍රව කියන ලදී. අභිධම්ම භාජනියෙහි අරියො යයි නොකියා අට්ඨංගිකො මග්ගො යයි කියන ලදී. එසේ නොකියන ලද වුවද මෙය ආර්යම වේ. යම්සේ අභිෂේක කළ රජතුමාගේ අභිෂේක කළ දේවියගේ කුසින් බිහිවූ පුතා රජ පුතා යයි නොකියන ලද නමුත් රජපුතාම වේ. එසේ මෙයද නොකියන ලද නමුත් ආර්යම වේයයි දතයුතුය. මෙහි සෙස්ස සච්ච විභංගයෙහි කියනලද නයින්ම දතයුතුය. පංචංගික වාරයෙහිද අට්ඨංගිකා යයි නොකියන ලද නමුත් අට්ඨංගික යයි දතයුතු. ලෝකෝත්තර මාර්ගයෙහි පංචංගික නම් නැත. මෙහි මේ ආචාර්යවරයන්ගේ විතණ්ඩාදි සමාන අර්ථකථාවය. විතණ්ඩවාදීහු කීහ. "ලෝකෝත්තර මාර්ගයෙහි අට්ඨංගිකයෙක් නම් නැත. පංචංගිකයක්ම ඇත." සූත්‍රය ගෙනහැර දක්වයි කියන ලද්දේ අනිකක් නොදත්තේ මහා සළායතනයෙන් සූත්‍ර ප්‍රදේශයක් ගෙනහැර දක්වන්නේය. යම් එබඳු වූ දෘෂ්ටියක්? මොහුට සම්මා දිට්ඨිය වේ. යමක් එබඳු වූ සංකප්ප වායාම සති යමෙක් එබඳු වූ සමාධිය?

මොහුට සමාධිය ඇත. මොහුට මුලින් කාය කර්ම වචී කර්ම මගින් ආජීවය පිරිසිදු වේ. ඉන්පසුව සූත්‍රපදය ගෙන එවයි කිවයුතුය. ඉදින් ගෙන එන්නේ නම් එය යහපති. නොගෙනෙන්නේ නම් තමන් ගෙනහැර මේ ආර්ය අෂ්ඨාංගික මාර්ගය භාවනාවෙන් සම්පූර්ණ වන බවද මෙයින් ඔබ ශාස්තෘ ශාසනයෙන් වාද්‍ය බිඳුනේය. ලෝකෝත්තර මාර්ගයෙහි පංචංගිකයත් නම් නැත. අෂ්ඨාංගිකයත් වේ යයි කිවයුතුය.

මේ අංග තුන මුලින් පිරිසිදුව පවතී. ලෝකෝත්තර මාර්ග ක්‍ෂණයෙහි ඉතාමත් පිරිසිදු වේ. පංචංගික මාර්ගය යයි මෙය කුමන අර්ථයක් සඳහා ගන්නා ලද්දේද? අතිරේක කෘත්‍ය දැක්වීම සඳහාය. යම් සමයක වැරදි වචන දුරුකරයි. හරි වචන කථාකරයි. එසමයෙහි සම්මා කම්මන්ත සම්මා ආජීව නැත. මේ පස්ආකාර අංගයෙන්ම වැරදි වචන දුරුකරයි. සම්මා වාචා තමාම විරති වශයෙන් සම්පූර්ණ කරයි. යම් සමයක වැරදි කර්මාන්ත දුරුකරයි. එසමයෙහි නිවැරදි කර්මාන්ත කරයි. එසමයෙහි සම්මා වාචා සම්මා ආජීව නැත. මේ පංච ආකාර අංගයෙන්ම වැරදි කම්මන්ත දුරුකරයි. සම්මා කම්මන්ත තමා විරති වශයෙන් පුරයි. යම් සමයක වැරදි ආජීවය දුරුකරයි. නිවැරදි ආජීවය පුරයි. එසමයෙහි සම්මා වාචා සම්මා කම්මන්ත නැත. මේ පස්ආකාර අංගයෙන්ම වැරදි ආජීවය දුරුකරයි. සම්මා ආජීවය තමා විරති වශයෙන් පුරවයි. මේ පංචාකාර අංග අතිරේක කෘත්‍ය වශයෙන් දැක්වීමට පඤ්චංගිකො මග්ගො යයි ගන්නා ලදී. ලෝකෝත්තර මාර්ගය වනාහි අට්ඨංගිකව වේ. පංචංගිකයත් නම් නැත. ඉතින් නිවැරදි වචන ආදිය සමග අට්ඨංගික සය කියව්ද? සම්මා වාචා චේතනා සතර සම්මා කම්මන්ත චේතනා තුන සම්මා ආජීව චේතනා සත යයි මේ වේ බොහෝ චේතනා කෙසේ මුදන්නහුද? එහෙයින් ලෝකෝත්තර මාර්ගය පංචංගිකයයි කියවු. ඔබ මහා චත්තාරීසක භාණක වූයේද නැද්දැයි ඇසිය යුතුය. නොවූයෙම් කියයිද නොදන්නෙහි යයි කිවයුතුය. භාණක වූයෙමියි කියයිද සූත්‍රය ගෙනහැර දක්වන්නැයි කිවයුතුය. සූත්‍රය ගෙනහැර දැක්වුවහොත් යෙහෙකි. ගෙනහැර නොදැක්වුවහොත් තමා උපරි පණ්ණාසකය ගෙන දැක්විය යුතුය.

මහණෙනි, සම්මා වාචා කුමක්ද? මහණෙනි, නිවැරදි වචන දෙකක් මම කියමි. මහණෙනි, ආශ්‍රව සහිත වූ පිනට අයත් වූ උපධි විපාක ඇති නිවැරදි වචනයක් ඇත. මහණෙනි, ආර්ය වූ අනාශ්‍රව වූ ලෝකෝත්තර

මාර්ගාංගයක් වූ නිවැරදි වචනයක් ඇත. මහණෙනි, ආශ්‍රව සහිත වූ පිනට අයත් වූ උපධි විපාක සහිත වූ නිවැරදි වචනය කුමක්ද? මුසාවාදයෙන් වෙන්වීම කේලාම් කීමෙන් වෙන්වීම පරුෂ වචනයෙන් වෙන්වීම හිස් වචනයෙන් වෙන්වීම මහණෙනි, මෙය ආශ්‍රව සහිත වූ පිනට අයත් වූ උපධි විපාක සහිතව සම්මා වාචාවය. මහණෙනි, ආර්ය වූ අනාශ්‍රව වූ ලෝකෝත්තර මාර්ග අංගයක් වූ සම්මා වාචා කුමක්ද? මහණෙනි, ආර්ය සිතේ අනාශ්‍රව සිතේ ආර්ය මාර්ගයෙන් යුක්ත වූ ආර්ය මාර්ගය වඩන්නා වූ වචී දුෂ්චරිත හතර දුරුවේද නොඇලේද විරතිය වේද වෙන්වේද (ආරති විරති පටිවිරති වේරමණී) මහණෙනි, මේ සම්මා වාචා ආර්ය වූ අනාශ්‍රව වූ ලෝකෝත්තර මාර්ගාංගය වේ. මහණෙනි, සම්මා කම්මන්තය කවරේද? මහණෙනි, සම්මා කම්මන්ත දෙකක් කියමි. මහණෙනි, ආශ්‍රව සහිත වූ පිනට අයත් වූ උපධි විපාක ඇති සම්මා කම්මන්තයක් ඇත. මහණෙනි, ආර්ය වූ අනාශ්‍රව වූ ලෝකෝත්තර මාර්ගාංගයක් වූ සම්මා කම්මන්තයක් ඇත. මහණෙනි, ආශ්‍රව සහිත වූ පිනට අයත් වූ උපධිවිපාක ඇති සම්මා කම්මන්තය කුමක්ද? ප්‍රාණඝාතයෙන් වෙන්වීම, අදත්තාදානයෙන් වෙන්වීම කාම මිථ්‍යාචාරයෙන් වෙන්වීම. මහණෙනි, මෙය ආශ්‍රව සහිතව පිනට අයත්වූ උපධි විපාක ඇති සම්මා කම්මන්තයයි. මහණෙනි, ආර්ය වූ අනාශ්‍රව වූ ලෝකෝත්තර මාර්ගාංගයන් වූ සම්මා කම්මන්තය කවරේද? මහණෙනි, ආර්ය සිතේ අනාශ්‍රව සිතේ ආර්ය මාර්ගයෙන් යුක්තවූ ආර්ය මාර්ගය වඩන්නා වූ කාය දුෂ්චරිත තුනෙන් දුරුවේද නොඇලේද විරතිය වේද වෙන්වේද මේ සම්මා කම්මන්තය ආර්ය වූ අනාශ්‍රව වූ ලෝකෝත්තර මාර්ගය වේ.

මහණෙනි, සම්මා ආජීවය කුමක්ද? මහණෙනි, සම්මා ආජීව දෙකක් කියයි. මහණෙනි, ආශ්‍රව සහිත වූ පිනට අයත් වූ උපධි විපාක සහිත සම්මා ආජීවයක් ඇත. මහණෙනි, ආර්ය වූ අනාශ්‍රව වූ ලෝකෝත්තර මාර්ගාංගයක් වූ සම්මා ආජීවයක් ඇත. මහණෙනි, ආශ්‍රව සහිත වූ පිනට අයත් වූ උපධි විපාක සහිත වූ සම්මා ආජීවය කවරේද? වැරදි ආජීවයෙන් වෙන්වී ජීවත් වේද මහණෙනි, මෙය ආශ්‍රව සහිත වූ පෙ- සම්මා ආජීවය වේ. මහණෙනි, ආර්ය වූ අනාශ්‍රව වූ මාර්ගාංග වූ සම්මා ආජීවය කවරේද? මහණෙනි, ආර්ය සිතේ අනාශ්‍රව සිතේ ආර්ය මාර්ගයෙන් යුක්ත වූ ආර්ය මාර්ගය වැඩීමෙන් වැරදි ආජීවයෙන් දුරුවේද නොඇලේද විරතිය වේද වෙන්වේද මහණෙනි, මෙය ආර්ය වූ අනාශ්‍රව වූ ලෝකෝත්තර

මාර්ගාංගය කියයි. මෙසේ මෙහි වාග් දුශ්චරිත සතරෙන් කාය දුශ්චරිත තුනෙන් මිච්ඡා ආජීවයෙන් යයි එක එකින් විරතිය අනාශ්‍රව වූ ලෝකෝත්තර මාර්ගංගයයි කියන ලදී. මෙහි චේතනා බහුත්වයක් කොයින්ද? පඤ්චංගික මාර්ගයක් කොයින්ද? මේ සූත්‍රය ඔබට අකමැති වුවත් ලෝකෝත්තර මාර්ගය අට්ඨංගිකයයි දක්වයි. ඉදින් මෙපමණකින් සලකයිද එසේනම් එය යහපත් වේ. නොසලකා නම් අනිත් කරුණුද ගෙනහැර දක්වා දැන්විය යුතුය.

භාග්‍යවතුන් වහන්සේ විසින් මෙය කියන ලදී. සුභද්ද, යම් ශාසනයක ආර්ය අෂ්ටාංගික මාර්ගය නොලැබේද? ශ්‍රමණයෙක් එතැන නොලැබේ. පෙ. සුභද්ද මේ ධර්ම විනයෙහි ආර්ය අෂ්ඨාංගික මාර්ගය ලැබෙයි. සුභද්ද මෙහිම ශ්‍රමණයෝ ලැබෙත්. අන්‍ය පරවාද ශ්‍රමණයන්ගෙන් ශුන්‍ය වේ. අන්‍ය නොයෙක් සූත්‍ර සියගණන්වල අට්ඨංගික මාර්ගයම ආයේය. කථාවත්ථුප්පකරණයෙහි කියන ලදී.

**මග අතර අටගය - සස'තර සෙටය සිව්පද**
**දහමින් විරාගය - බුදුහිමි දෙපාවන'තර**

සූත්‍රයක් තිබේද? එසේය, එසේ නම් අට්ඨංගික මාර්ගය මයි. ඉදින් මෙපමණකිනුත් දැනගැනීමට නොපැමිණේද? යන්න, විහාරයට ගිහිල්ල කැඳ බොන්න යයි පිටත් කළයුතුය. ඉදිරියටත් කරුණු කීම නොසිදුවේ. මෙහි සෙස්ස නොගැඹුරුය. මෙහි නය ගණනය කළ යුතුය. අට්ඨංගික මාර්ගයෙහි එකට විචාරා එකට විසඳීමේ මාර්ග සතරෙහි නය හාරදහසක් බෙදන ලදී. පඤ්චංගික මාර්ගයෙහි එකට විචාරා එකට විසඳීමෙහි සතරක්ද වෙන වෙනම විචාරා වෙන වෙනම විසඳීමෙහි සතර බැගින් අංග පසෙහි විස්සකි. මෙසේ පෙර අට මේ විස්ස යයි සියල්ල මාර්ග විභංගයෙහි නය විසිඅට දහසක් බෙදන ලදී. එයින් නිපන් ලෝකෝත්තර කුසලම වේ. විපාකයෙහි වනාහි කුසලයෙන් නය තුන්ගුණ කළයුතුය.

**අභිධම්ම භාජනියයි.**

ප්‍රශ්න විචාරකයෙහි පෙල ඇසුරෙන්ම මාර්ගාංගවල කුසලාදිභාවය දතයුතුය. ආරම්මණ ප්‍රත්‍යයෙහි වනාහි මේ සියළු අප්පමාණ නිවන

අරබයා පැවතීමෙන් අප්පමාණ ආරම්මණ වේමය. මග්ගාරම්මණ නොවේ. මාර්ගඵල මාර්ගය අරමුණු නොකෙරේ. සහජාත හේතු වශයෙන් කුසල මාර්ග හේතු වේ. විරිය හෝ වීමංසය හෝ දෙටුකොට මාර්ග භාවනා කාලයෙහි මාර්ග අධිපති වේ. ඡන්‍ද චිත්ත දෙටුකොට මාර්ග භාවනාවෙන් මාර්ග අධිපති යයි නොකිව යුතුය. ඵල කාලයෙහිද නොකිව යුතුය. අතීතාදියෙහි එක අරමුණක් වන බැවින්ද නොකිව යුතුය. නිවණේ වනාහි බාහිර ධර්මතා හෙයින් බාහිර අරමුණු වේ. මෙසේ මෙහි ප්‍රශ්න විචාරකයෙහි ලෝකෝත්තරයට නිපන් බැවින් මාර්ග අංග කියන ලදී. සම්මා සම්බුද්ධයන් වහන්සේ විසින් සූත්‍රාන්ත භාජනියෙහිම ලෞකික ලෝකෝත්තර මාර්ගාංග කියන ලදී. මෙසේ මේ මාර්ගයද තිපරි වෘත්තය ගෙනහැර දක්වා බෙදා දක්වන ලදී.

**සම්මෝහ විනෝදනී නම් විභංග අර්ථ වර්ණනාවේ එකොලොස්වන මග්ග විභංග නිර්දේශයයි.**

# 12.
# ඣාන විභංගය

ඊට අනතුරුව දැන් ධ්‍යාන විභංගයෙහි මේ සියල්ල සූත්‍රාන්ත බෙදීමෙහි පළමුවන මාතෘකා තබන ලදී. එහි **ඉධ** යන වචනය පූර්වභාග කළයුතු සම්ප්‍රදාය සම්පන්න වූ සියළු ආකාර ධ්‍යාන උපදවන පුද්ගලයාට නිශ්‍රය වූ සාධනය දැක්වීම අන්‍ය ශාසනවල එසේ ඇති බව ප්‍රතික්ෂේප කිරීම මෙය කියන ලදී. "මහණෙනි, මෙහිම ශ්‍රමණයෝ වෙති. පෙ. අන්‍ය පරවාදවල ශ්‍රමණයෝ නොවෙති." **භික්ඛු** යනු ඒ ධ්‍යාන නිපදවන පුද්ගලයින් දැක්වීම. **පාතිමොක්ඛ සංවර සංවුතො** මෙය ඔහුගේ ප්‍රාතිමෝක්ෂ සංවරයෙහි පිහිටි බව දැක්වීම. **විහරති** මෙය ඔහුගේ ඊට අනුරූපව වාසය කිරීමෙන් යුක්ත බව දැක්වීම. **ආචාරගෝචර සම්පන්නො** මෙය ඔහුගේ යට ප්‍රාතිමෝක්ෂ සංවරයෙන් ඉහළ ධ්‍යානානුයෝගයට උපකාර වන ධර්ම දැක්වීම. **අනුමත්තෙසු වජ්ජෙසු භයදස්සවී** මෙය ඔහුගේ

ප්‍රාතිමෝක්ෂයෙන් නොකියන ලද කරුණු දැක්වීම. **සමාදාය** මෙය ඔහුගේ ශික්ෂාපදවලින් අඩුවක් නැතිව ගැනීම දැක්වීම. **සික්ඛති** මෙය ඔහුගේ ශික්ෂාවෙන් යුක්ත බව දැක්වීම. **සික්ඛා පදෙසු** මෙය ඔහුගේ හික්මිය යුතු ධර්ම දැක්වීමය. **ඉන්ද්‍රියෙසු** මෙය ඔහුගේ රක්නාලද දොරටු දැක්වීම. ආරක්ෂා කළයුතු අවකාශ දැක්වීම යයිද කියත්මය. **ගුත්තද්වාර** මෙය ඔහුගේ දොරටු සයේ සංවිධානය කරන ලද ආරක්ෂාව දැක්වීමය. **භොජනෙ මත්තඤ්ඤු** මෙය ඔහුගේ සන්තෝෂ ආදි ගුණ දැක්වීමය. **පුබ්බරත්තාපර රත්තං ජාගරියානුයොගමනුයුත්තො** මෙය ඔහුගේ හේතුභාවය දැක්වීමය. **සාතච්චං නෙපක්කං** මෙය ඔහුගේ ප්‍රඥා විමංශයෙන් යුත් වීර්යයෙන් නිතර පුරුදු කිරීම දැක්වීමය. **බෝධිපක්ඛිකානං ධම්මානං භාවනානුයෝග මනුයුත්තො** මෙය ඔහුගේ ප්‍රතිපත්තියෙන් තියුණු අවබෝධය දැක්වීමය. **සො අභික්කන්තෙ පෙ. තුණ්හීභාවෙ සම්පජානකාරී හොති** මෙය ඔහුගේ සියළු ස්ථානයෙහි සිහිනුවණින් සමන්විත බව දැක්වීමය. **සො විවිත්තං සෙනාසනං භජති** මෙය ඔහුගේ භාවනාවට අනුරූප වූ සේනාසන පිළිගැනීම දැක්වීමය. **අරඤ්ඤං...........පටිසල්ලාන සාරුප්පං** මෙය ඔහුගේ සේනාසන ප්‍රභේද සහ ආදීනව ආනිශංස දැක්වීමය. **සො අරඤ්ඤගතොවා** මෙය ඔහුගේ කියන ලද ආකාර සේනාසනයෙන් යුක්ත බව දැක්වීමය. **නිසීදති** මෙය ඔහුගේ භාවනාවට අනුරූප ඉරියව්ව දැක්වීමය. **පරිමුඛං සතිං උපට්ඨපෙත්වා** මෙය ඔහුගේ යෝග ආරම්මනය දැක්වීමය. **සො අභිජ්ඣං ලොකෙ විහරති** ආදිය ඔහුගේ කමටහන අනුව භාවනා කිරීමෙන් නීවරණ ප්‍රහානය දැක්වීමය. මෙසේ ඔහුගේ නීවරණ ප්‍රහීණ වේ. **විවිච්චෙව කාමෙහි** ආදිය පිළිවෙළින් ධ්‍යාන ඉපදවීම දැක්වීමය. තවද **ඉධ භික්ඛු** යනු මෙම ශාසනයෙහි ධ්‍යාන උපදවන භික්ෂුවය. දැන් ධ්‍යාන උපදවන භික්ෂුව විසින් චතුපාරිශුද්ධි ශීලය යම්හෙයකින් පිරිසිදු කළයුතුද එහෙයින් ඔහුගේ **පාතිමොක්ඛ සංවර සංයුතො** යන මෙයින් ප්‍රාතිමොක්ෂ සංවර ශීල විසුද්ධිය පෙන්වයි. **ආචාර ගෝචර සම්පන්නො** ආදියෙන් ආජීව පාරිශුද්ධි ශීලයද **සමුදාය සික්ඛති සික්ඛා පදෙසු** මෙයින් ඒ සිල් දෙකේ ඉතිරියක් නැතිව ගැනීමය. **ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරො** මෙයින් ඉන්ද්‍රිය සංවර ශීලයද **භොජනෙමත්තඤ්ඤු** එයින් ප්‍රත්‍ය සන්නිශ්‍රිත ශීලයද පෙන්වයි. **පුබ්බරත්තාපර රත්තං** ආදියෙන් සීලයෙහි පිහිටි ඔහුගේ ධ්‍යාන භාවනාවට උපකාර වූ ධර්මයන් දක්වයි. **සො අභික්කන්තෙ** ආදියෙන් ඒ ධර්මයන්ගේ නොපිරිහීම් පිණිස කමටහනේ නුමුළාවීම පිණිස සිහිනුවණින් යෙදී සිටීම. **සො විවිත්තං** ආදියෙන් භාවනාවට අනුරූප සේනාසන ලබාගැනීම **සො අරඤ්ඤගතොවා** යනාදියෙන් ඒ සේනාසනයට පැමිණි

ඔහුගේ ධ්‍යානානුරූප ඉරියව්ද ධ්‍යාන භාවනා ආරම්භයද දක්වයි. සො අභිජ්ඣං ආදියෙන් ධ්‍යාන භාවනා ආරම්භයෙන් ධ්‍යානයට පටහැනි ධර්ම ප්‍රහාණය පෙන්වයි. **සො ඉමෙ පඤ්චනීවරණෙ පහාය** ආදියෙන් මෙසේ ප්‍රහීන වූ ධ්‍යාන පටහැනි ධර්මයන්ගෙන් සියළු ධ්‍යානවල ඉපදවීම් ක්‍රමය පෙන්වයි.

## මාතෘකා වර්ණනාවය.

දැන් තබන ලද මාතෘකා පිළිවෙළින් බෙදා දැක්වීමට ඉධ යන ඉමිස්සා දිට්ඨියා ආදිය අරඹන ලදී. එහි ඉමිස්සා දිට්ඨියා යනාදි පද දහයකින් ශික්ෂාත්‍රය සංඛ්‍යාත සර්වඥ බුද්ධශාසනයම කියන ලදී. එහි භගවත් වූ බුදුන්වහන්සේ විසින් දක්නා ලද හෙයින් **දිට්ඨි** යයි කියනු ලැබේ. ඔහුගේම ඉවසීම් වශයෙන් **ඛන්ති** වේ. රුචිවීම් වශයෙන් **රුචි** වේ. ගැනීම් වශයෙන් **ආදායො** වේ. ස්වභාවය යන අර්ථයෙන් **ධම්මො** වේ. හික්මිය යුතු අර්ථයෙන් **විනයො.** ඒ දෙකන්ම **ධම්මවිනයො.** ප්‍රකාශ කිරීම් වශයෙන් **පාවචනං.** ශ්‍රේෂ්ඨ හැසිරීම් අර්ථයෙන් **බ්‍රහ්මචරියං** අනුශාසනා දීම් වශයෙන් **සත්‍ථු සාසනං** යයි කියනු ලැබේ. එහෙයින් **ඉමිස්සා දිට්ඨියා** යන ආදියෙහි මේ බුද්ධ දෘෂ්ටිය, මේ බුද්ධ ඉවසීම, මේ බුද්ධරූපය, මෙහි බුද්ධ ගැනීමෙහි. මෙහි බුද්ධ ධර්මයෙහි, මේ බුද්ධ විනයෙහි, "ගෝතමී ඔබ ධර්මය දන්නෙහිද? මේ ධර්ම රාග සහිතවීම පිණිස පවතී. විරාගය පිණිස නොවේ. සංයෝගය පිණිස පවතී. විසංයෝගය පිණිස නොවේ. රැස්කිරීම පිණිස පවතී. රැස් නොකිරීම පිණිස නොවේ. අත්හැරීම පිණිස නොව අල්ලාගැනීම පිණිස පවතී. ආශාව පිණිස පවතී. අපිස්බව පිණිස නොවේ. අසන්තෝෂය පිණිස පවතී. සන්තෝෂය පිණිස නොවේ. අවිවේකය පිණිස පවතී. විවේකය පිණිස නොවේ. කුසීතකම පිණිස පවතී. විරිය පිණිස නොවේ. දුෂ්පෝෂණය පිණිස පවතී. සුපෝෂණය පිණිස නොවේ. ගෝතමිය එක් අංශයකින් දරන්නෙහි, මෙය ධර්මය නොවේ. මෙය විනය නොවේ. මෙය ශාස්තෘ අනුශාසනය නොවේ. ගෝතමිය, ඔබ ධර්මය දන්නෙහි නම් මේ ධර්මය විරාගය පිණිස පවතී. සරාගය පිණිස නොවේ. මේ ධර්ම සුභරතාව පිණිස පවතී. දුභරතාව පිණිස නොවේ. ගෝතමිය, ඒකාන්තයෙන් මෙය ධර්මය වේ. මෙය විනය වේ. මෙය ශාස්තෘන් අනුශාසනය වේයයි දරන්න. මෙසේ කියන ලද කල්හි මෙම බුද්ධ ධර්ම විනයෙහි මෙම බුද්ධ ප්‍රවචනයෙහි මෙම බුද්ධ බ්‍රහ්ම චරියාවෙහි මෙම ශාස්තෘ අනුශාසනයෙහි මෙසේ අර්ථ

දතයුතුය. තවද මේ ශික්‍ෂා ත්‍රය සංඛ්‍යාත සියළු ශාසනය භාග්‍යවතුන් වහන්සේ විසින් දක්නා ලද හෙයින් දැකීම සම්මා දිට්ඨියට හේතුවන ලද්දේය. සම්මා දිට්ඨිය පෙරටුවන ලද්දේය. භාග්‍යවතුන් වහන්සේට ඉවසීම ඛන්ති, කැමතිවීම් වශයෙන් රුචි ගැනීම් වශයෙන් ආදාය වේ. තමාගේ කරන්නා අපායෙහි නොහෙලමින් ධරානුයි ධම්මො වේ. එයම කිලිටි දුරුකරන නිසා විනය වේ. ධර්මය ද විනයද ධර්මවිනය වේ. කුසල ධර්මයෙන් හෝ අකුසල ධර්මයන්ගේ මේ විනොදනය යයි ධම්මවිනය වේ. එහෙයින්ම කියන ලදී. "ගෝතමී ඔබ ධර්මය දන්නෙහි මේ ධර්ම විරාගය පිණිස පවතී. සරාගය පිණිස නොවේ. ගෝතමිය, මේ ධර්මයයි මේ විනය යයි මෙය ශාස්තෲ අනුශාසන යයි ඒකාන්තයෙන් දරන්නෙහි" ධර්මයෙන් හික්මීම වේ. දඬු ආදියෙන් ධර්ම විනය නොවේ.

කෙනෙක් කස මුගුරෙන් - දමනය කෙරෙත් අකුසෙන්
දඬු සැත් නැතිව මුනි - දමනය කරති සැඬැතැන්

එසේම ධර්මයෙන් මෙහෙයවනු ලබන්නන්ගේ කුමන ඊර්ෂ්‍යාවදැයි දනියිද ධර්මයෙන් කරනු ලබන හික්මීම ධර්මවිනයයි. මේ විනය අනවද්‍ය ධර්මාර්ථය පිණිසයි. භවබෝග ආමිසය සඳහා නොවේ. එයින් කීහ. භගවත්හු "මහණෙනි, මේ බ්‍රහ්ම චර්යාව ජන කුහකකම සඳහා නොවේ." පුරාණ තෙරහුද විස්තර කීහ. "ඇවැත්නි, භාග්‍යවතුන් වහන්සේ බඹසර වසනු ලැබුවේ අනුපාදාය පරිනිර්වාණය සඳහා" වේ. විශිෂ්ඨයේ මෙහෙයවීම විනයයි. ධර්මයෙන්-මෙහෙයවීම ධර්ම විනයයි. සංසාර සඳහම් ධර්මයෙන් හා සෝකාදි ධර්මයෙන් මෙය විශිෂ්ට නිවනට පමුණුවයි. ධර්මයේ වූ විනය ආගමක් නොසාදයි යන්න ධම්ම විනයයි. ධර්මභූත වූ භාග්‍යවතුන් වහන්සේ උන්වහන්සේගේම විනයයි. ධර්මයෙන්ම දතයුතුය. විශේෂයෙන් දැනගත යුතුය. ප්‍රහාණය කළයුතුය. වැඩිය යුතුය. සාක්‍ෂාත් කළයුතුය. එහෙයින් මේ ධර්මයෙහි සත්වයන් නැත ජීවීන් නැතැයි ධම්මවිනය වේ. අර්ථ සහිත ව්‍යඤ්ජන සහිත අන්‍ය වචනවලින් ප්‍රධාන වචනය යයි පවචනං ද පවචම පාවචන වේ. සියළු චර්යාවලින් විශිෂ්ට චර්යාව බැවින් බ්‍රහ්මචරිය වේ. දෙව්මිනිසුන්ට ශාස්තෘ වූ භාග්‍යවතුන් වහන්සේගේ ශාසනය සත්‍ථු ශාසනය වේ. ශාස්තෘන් ප්‍රධාන වූ ශාසනයද සත්‍ථුශාසන වේ. "එයම මගේ ඇවෑමෙන් ශාස්තෘන්" යයි ධර්ම විනයද ශාස්තෘ යයි කියන ලදී. මෙසේ මේ පදවල අර්ථය දතයුතුය. යම්හෙයකින් මේ ශාසනයෙහිම සියළු ආකාර ධ්‍යාන උපදවන භික්‍ෂූන් පෙනේ. අන්තැන්වල

එසේ නැත. එහෙයින් එය මෙහිම යයි නියම කරන ලදැයි දතයුතුය. මේ මෙහි මාතෘකා පද විස්තරයෙහ අර්ථ වේ.

භික්ෂු නිර්දේශයෙහි **සමඤ්ඤාය** යනු ප්‍රඥප්තියෙන්-ව්‍යවහාරයෙන් යයි අර්ථ වේ. ව්‍යවහාරයෙන්ම සමහරු භික්ෂූන් යයි හඳුන්වති. එසේම ආරාධනාදියෙන් ගණනය කරනුයේ සාමණේරයන්ද ගෙන භික්ෂු සියයක් භික්ෂු දහසක් යයි කියති. **පටිඤ්ඤාය** යනු තමාගේ දැනීමෙන්, දැනීමෙන්ද සමහරු භික්ෂූන් යයි හඳුන්වති. ඔහුට "මෙහි කවරෙක්දැයි" ඇසූවිට "ඇවැත්නි, මම භික්ෂු"යයි සම්භවය දතයුතුය. මෙය වනාහි ආනන්ද ස්ථවිරයන් කියන ලද නිසා ධාර්මික දැනීමකි. රාත්‍රී භාගයෙක දුස්සීලයෝද මාර්ගයට එන්නේ "මෙහි කවරෙක්දැ"යි කී කල්හි අධාර්මික වූ දැනීමෙන් අභූතය පිණිස "අපි භික්ෂු"යයි කියති. **භික්ඛති** යන ඉල්ලයි. යම් කිසිවෙක් භික්ෂාව සිඟයි සොයයි සොයා යයි හේ ලබාවා හෝ නොලබාවා. ඉක්බිති භික්ඛතීති භික්ඛු, භික්ඛකොති ව්‍යඤ්ජනයෙන් පදය වඩන ලදී. සිඟන ස්වභාවයෙන් භික්ඛු යන අර්ථයයි. **භික්ඛාචරියං අජ්ඣූපගතො** බුද්ධාදීන් විසින් පනවන ලද පිඬුසිඟා යෑම පැමිණි බැවින්ද භික්ඛා චර්යාවට පැමිණියේ නම් වේ. යමෙක් අල්ප හෝ මහත් හෝ භෝග සම්පත් අත්හැර ගිහිගෙයින් නික්මී අනගාරි පැවිද්ද ලැබ කෘෂි ගවපාලනාදියෙන් ජීවිකාව ගෙනයෑම හැර ස්වරූපය පිළිගැනීමෙන්ම භික්ෂා චර්යාවට පැමිණියේ භික්ඛු වේ. අනුන් සම්බන්ධ ජීවිකාව බැවින් හෝ වෙහෙර මැද කැඳබත් බුදින්නේද භික්ෂා චර්යාවට පැමිණියේ යයි භික්ඛු වේ. අගනා ස්පර්ශ වර්ණ බිඳීමෙන් බිඳුණු වස්ත්‍රයක් දරන්නේ **භින්න පටධර** වේ. එහි කතුරු ආදියෙන් කපන ලද බැවින් වටිනාකම අඩුවේයයි දතයුතුය. දහසක් වටනා වස්ත්‍රයක්ද සත්‍රයෙක් කැබලිවලට කපන ලද්දේ අගය අඩුවේ. පෙර අගයෙන් අඩක්වත් නොඅගී. නූල්වලින් මැසීමෙන් ස්පර්ශ බේදය දතයුතුය. සැප ස්පර්ශ ඇති වස්ත්‍රය නූල්වලින් මැසීමෙන් ස්පර්ශය බිඳේ. රළු ස්පර්ශයට පැමිණේ. ඉඳිකටු මල ආදියෙන් වර්ණ භේදය දතයුතුය. ඉතා පිරිසිදු වස්ත්‍රය ඉඳිකටුවෙන් මැහීමේ සිට ඉඳිකටු මලෙන් අතේ දාඩිය මල කුණු තට්ටුවලින් අවසානයෙහි රඳන් කිරීමෙන්ද වර්ණභේදය වේ. ප්‍රකෘති වර්ණය අත්හරියි. මෙසේ තුන් ආකාරයකින් බිඳුණු වස්ත්‍ර දැරීමෙන් භින්නපටධර භික්ඛු වේ. ගිහිවස්ත්‍රවලට විසභාගවූ (වෙනස් වූ) කසාවත් දරණ බැවින්ද භින්නපටධර භික්ඛු වේ. පාපක වූ අකුසල් දහම් බිඳින්නේද භික්ඛු වේ. සෝවාන් මගින් කෙලෙස් පසක් බිඳින්නේ භික්ඛු වේ. සකෘදාගාමි මගින් හතරක්ද අනාගාමි මගින් හතරක්ද අරහත් මගින් අටක්දැයි කෙලෙසුන් බිඳින්නේ භික්ඛු වේ.

මෙපමණකින් මාර්ග අර්ථ හතර දක්වන ලදී. භින්නත්තා යන මේ ඵල සතරය. සෝවාන් වූ තැනැත්තා සෝවාන් මගින් කෙලෙස් පහක් බිඳ සිටී. සකෘදාගාමියා සකාදාගාමි මගින් සතරක්ද අනාගාමියා අනාගාමි මගින් හතරක්ද අරහන්ත ලාභියා රහත් මගින් කෙලෙස් අටක් බිඳ සිටී. මෙසේ මේ චතුර්විධ ඵලයට පත්තා පාප අකුසල දහම් බිඳන ලද බැවින් භික්ඛු නම් වේ. ඔධිසො කිලෙසානං පහාණා යනු මෙහි මග්ග ඔධි කිලෙස ඔධි යයි ඔධි දෙකකි. ඔධි නම් සීමාවය. එහි සෝවාන් තැනැත්තා මාර්ග සීමාවෙන් කෙලෙස් ප්‍රහාණය භික්ඛු වේ. ඔහුගේ මාර්ග සතරෙහි එකිනෙකේ සීමාවෙන් කෙලෙස් ප්‍රහාණ වේ. සියළු මාර්ග සතරෙන්ම නොවේ. සකදාගාමී අනාගාමි දෙකෙහිද මෙම නයයි. සෝතාපන්නයාද කෙලෙස් සීමාවෙන්ද කෙලෙසුන්ගේ ප්‍රමාණ වශයෙන් ප්‍රහාණය භික්ඛු වේ. ඔහුගේ ප්‍රහාණය කළයුතු කෙලෙස්වල කෙලෙස් සීමාවෙන් ප්‍රහීණය. සියල්ලෙන් සියල්ල නෙමේ. රහතන් වහන්සේ වනාහි සීමාරහිතව කෙලෙසුන් ප්‍රහාණ කළේ භික්ඛු වේ. උන්වහන්සේගේ මාර්ග සතරින් සීමාරහිතව කෙලෙස් ප්‍රහාණ විය. එක මාර්ග සීමාවකින් නොවේ. ප්‍රහීණ කළයුතු කෙලෙස්වලද අප්‍රමාණ වශයෙන් කෙලෙස් ප්‍රහීණ විය. එක් කෙලෙස් සීමාවක් සිටියේ නොවේ. මෙසේ උන්වහන්සේ දෙවිධියෙන්ම අනොධිසො කිලෙසානං පහාණා භික්ඛු වේ. සෙක්ඛො යනු පෘථග්ජන කල්‍යාණ මිත්‍රයා සමග සප්ත ආර්යයෝ ත්‍රිවිධ ශික්ෂාවෙහි හික්මෙන්නෝ යයි සෙක්ඛ වේ. ඔවුනතරෙහි යම්කිසිවෙක් සේක භික්ෂුව යයි දත යුතුය. නොහික්මේ යයි අසෙක්ඛ වේ. හික්මීම් සීමාව ඉක්මවා අග්‍ර ඵලයෙහි සිටි එයින් මත්තෙහි හික්මිය යුත්තක් නොමැති බැවින් ක්ෂීණාශ්‍රවයන් වහන්සේ අසෙක්ඛො යයි කියනු ලැබේ. අවසේස පෘථග්ජන භික්ෂූහු ත්‍රිවිධ ශික්ෂාවල නොහික්මෙති. නොහික්මී සිටියේ නෙවසෙක්ඛනාසෙක්ඛ යයි දතයුතු. සීල අග්‍ර සමාධි අග්‍ර පඤ්ඤා අග්‍ර විමුත්ති අග්‍රයයි මේ අග්‍රබවට පැමිණ සිටි බැවින් අග්ගො භික්ඛු නම් වේ. භද්‍රො යනු පව්වූ නොවන කල්‍යාණ පෘථග්ජනයා පටන් රහතන් වහන්සේ දක්වා භද්‍ර වූ සීලයෙන් සමාධියෙන් ප්‍රඥාවෙන් විමුක්තියෙන් විමුත්ති ඤාණ දර්ශනයෙන් සමන්නාගත වූ බැවින් භද්‍ර භික්ඛු සංඛ්‍යාවට පැමිණෙති. මණ්ඩො භික්ඛු යනු ප්‍රසන්න වූ භික්ෂුව. ගිතෙල් මෙන් නොකැළඹී ප්‍රසන්නය යන අර්ථයයි. සාරො යනු සීල සාරාදියෙන් යුක්ත වූයේ, නිලෙන් යුක්ත වූයේ නිල් වස්ත්‍රයක් මෙන් සාර භික්ෂුව යයි දතයුතුය. පහවූ කෙලෙස් ඇති ඵෙග්ගු භාවයෙන් යුක්ත ක්ෂීණාශ්‍රවයන් වහන්සේම සාරයයි දතයුතුය. එහිද පාප අකුසල් දහම් බිඳීය යනුද භික්ඛු, ප්‍රමාණ වශයෙන් කෙලෙස් ප්‍රහීණ

කරන්නේ භික්ඛු, සේක භික්ඛු මේ ස්ථාන තුනේ සප්තවිධ ශෛක්‍ෂයන් කියන ලදී. පාප අකුසල දහම් බිඳින ලද බැවින් භික්ඛු, අප්‍රමාණ වශයෙන් කෙලෙසුන් ප්‍රහීන කිරීමෙන් භික්ඛු, අසේක භික්ඛු, අග්ග භික්ඛු, මණ්ඩ භික්ඛු යන මේ ස්ථාන පහේ ක්‍ෂීණාශ්‍රවයන් වහන්සේම කියන ලදී. නේවසෙක්ඛානාසෙක්ඛා යන මෙහි පෘථග්ජනයාම කියන ලදී. සෙසු ස්ථානවල පෘථග්ජන කල්‍යාණයද සත් සේක ඛීණාසව යන මේ සියළුදෙනා කියන ලදී.

මෙසේ ව්‍යවහාරාදි වශයෙන් භික්‍ෂුව හඳුන්වා දැන් උපසම්පදා වශයෙන් දැක්වීමට සමග්ගෙන සංඝෙනාති ආදිය කීහ. **සමග්ගෙන සංඝෙන** යනු අඩු වශයෙන් පඤ්චවග්ග කරණීය කර්මය, කර්මයට පැමිණි භික්‍ෂූන් ආ බැවින් ඡන්දය දීමට සුදුසු භික්‍ෂූන්ගේ ඡන්දය ගෙන ආ බැවින් පැමිණ සිටින භික්‍ෂූන්ගේ විරුද්ධත්වයක් නොමැති බැවින් එක කර්මයක සමගි බව පැමිණි හෙයින් - **ඤත්ති චතුත්‍ථෙන** තුන්වරක් ඇස්සවීමෙන් එක් ඤත්තියක් (ප්‍රකාශයක්) කළයුතු බැවින් **කම්මෙන** ධාර්මික විනය කර්මයෙන් **අකුප්පෙන** වස්තු, ඤත්ති අනුසාවන සීමා පරිස සම්පත්ති සම්පූර්ණ බැවින් මෙය වෙනස් නොකළ යුතු බැවින් විරුද්ධ නොවිය යුත්ත පැමිණි හෙයින්. **ඨානාරහෙන** කරුණු සුදුසු වීමෙන් ශාස්තෘ ශාසනයට ගැලපීමෙන් **උපසම්පන්නො** නම් උපරිභාවයට පැමිණියේය යන අර්ථයි. භික්‍ෂු භාවයෙහි උපරිභාවයයි. එයද කියන ලද ක්‍රියාපිළිවෙළ අනුව පැමිනි නිසා උපසම්පන්න යයි කියනු ලැබේ. මේ එයින් එහි භික්ඛු උපසම්පදා, සරණාගමන උපසම්පදා, ඔවාද පටිග්ගහණ උපසම්පදා, අට්ඨවාචික උපසම්පදා, ගරුධම්ම පටිග්ගහණ උපසම්පදා, දූතෙන උපසම්පදා, පඤ්ඤාබ්‍යාකරණ උපසම්පදා, ඤත්ති චතුක්ථ කම්ම උපසම්පදා යයි උපසම්පදා විධි අටක් කියන ලදී. ඒවායින් ඤත්ති චතුත්‍ථ කම්ම උපසම්පදා දූතෙන උපසම්පදා අට්ඨවාචික උපසම්පදා යන මේතුනම ස්ථාවරය. සෙසු ඒවා බුදුරදුන් ජීවමාන කාලයෙහි විය. ඒ උපසම්පදා අතරෙන් මේ ස්ථානයෙහි මේ ඤත්ති චතුත්‍ථකම්ම උපසම්පදාව අදහස් කරන ලදී.

පාතිමොක්ඛ සංවර නිද්දේසයෙහි **පාතිමොක්ඛං** යන සික්ඛාපද සීලයයි. එය යමෙක් රකිත්ද ඔහු අපාය ආදි දුක්වලින් මුදවයි. එහෙයින් පාතිමොක්ඛ යයි කියන ලදී. **සීලං පතිට්ඨා** ආදිය එහිම සමාන වචන වේ. එහි සීලං කැමතිවන මෙය ක්‍රියා වචන අවසාන වීමෙන් (කය වචන හික්මීම) ප්‍රාතිමෝක්‍ෂය සමෘද්ධවීමට පර්යාය වචනයකි. මෙසේ ස්වභාව

වශයෙන් පවතින මෙය සීලනම්. ප්‍රාණඝාතාදියෙන් වෙන්වන්නාගේ වත් පිළිවෙත් පුරන්නාගේ චේතනාදි ධර්මයයි දතයුතුය. පටිසම්භිදාවෙහි මෙය කියන ලදී. "සීලය යනු කිම? චේතනා සීලය, චෛතසික සීලය, සංවර සීලය, අවීතික්කම සීලය යනු වේ. එහි චේතනා සීලය නම් පාණාතිපාතාදියෙන් වෙන්වන්නාගේ හෝ වත්පිළිවෙත් පුරන්නාගේ හෝ චේතනාය. චේතසික සීලය නම් පාණාතිපාතාදියෙන් වෙන්වන්නාගේ විරති චෛතසිකයයි. තවද චේතනා සීලය නම් අභිද්‍යාව දුරුකොට වෙන්වූ අභිද්‍යාවෙන් වාසය කිරීම ආදි නයින් සංයුත්ත මහා වග්ගයෙහි කියන ලදී. අනභිද්‍යාව අව්‍යාපාදය සම්මාදිට්ඨි ධර්මයෝය. සංවර සීලයයි මෙහි පඤ්චවිධ සංවර සීලය දතයුතුය. පාතිමොක්ඛ සංවර, ඤාණ සංවර, ඛන්ති සංවර, විරිය සංවර, සති සංවර යන පසය. අවීතික්කම සීලය යන මෙය නිප්පරියාය සීලයම වේ. චේතනා සීල චේතසික සීල සමාන සීල යයි දතයුතුය. ප්‍රාතිමොක්ෂ සංවරයෙන් යුත් භික්ෂුව ශාසනයෙහි පිහිටයි. එහෙයින් එය පිහිටයි කියන ලදී. භික්ෂුව මෙහි පිහිටයි හෝ කුසලධර්ම හෝ මෙහි පිහිටා යයි පතිට්ඨා වේ. මේ අර්ථය "සීලෙ පතිට්ඨාය නරො සපඤ්ඤො" ප්‍රඥාවන්ත මිනිසා සීලයෙහි පිහිටයි යන මෙහිද මහරජ, සියළු කුසලධර්ම සීලයෙහි පිහිටයි. මහරජ, සීලයෙහි පිහිටි සියළු කුසලධර්ම නොපිරිහෙයි. ආදි සූත්‍ර වශයෙන දතයුතුය.

මෙය පූර්ව උත්පත්ති අර්ථයෙන් ආදි වේ. මෙය කියන ලදී. ඒ නිසා ඔබ උත්තිය, මුලින්ම කුසල ධර්මවලින් පිරිසිදු වෙන්න. කුසල ධර්මවල සීලයද පිරිසිදුය. දෘෂ්ටියද ඍජුවීම ගැන කියනුම කවරේද? යම්සේ නගර ශිල්පියා (වඩුවා) නගරයක් නිර්මාණය කරනු කැමති වන්නේ පළමුව නගරය පිහිටුවන තැන පිරිසිදු කරයි. ඉන්පසුව වීථි හතර සතරමං සන්ධි ආදිය වෙන්කරමින් බෙදා නගරය නිර්මාණය කරයි. එසේම යෝගාවචරයා මුලින්ම සීලය පිරිසිදු කරයි. ඉන්පසු සමථ විපස්සනා මාර්ගඵල නිවන් අවබෝධ කරයි. යම්සේ රජකයෙක් පළමුව ක්ෂාර තුනෙන් වස්ත්‍ර පිරිසිදු කර පිරිසිදු වූ වස්ත්‍රයෙහි කැමති සායම් වර්ගයක් පමුණුවයි. යම්සේ දක්ෂ චිත්‍රශිල්පියෙක් රූප ඇඳීමට කැමැත්තේ මුලින්ම බිත්ති පිරිසිදු කරයි. (පිරියම් කරයි.) ඉන්පසුව රූප අඳියි. එසේම යෝගාවචරයා මුලින්ම සීලය පිරිසිදුකොට පසුව සමථ විපස්සනාදී ධර්ම අවබෝධ කරයි. එනිසා සීලය ආදි යයි කියන ලදී. මෙය පාදයට සමාන නිසා චරණං වේ. චරණා යයි පාද කියනු ලැබේ. යම්සේ කැඩුණු පාද ඇති පුඟුලා ගමනාගමනයක් නොවේ. සම්පූර්ණ පා ඇත්තාටම එය සිදුවේ. එසේම යමෙකුගේ සීලය බිඳුනේ වේද කඩවූ සම්පූර්ණ නොවූ

ඔහුට නිවන් ගමනට ඥාණ ගමනක් සම්පූර්ණ නොවේ. යමෙකුට නොබිඳුණේද නොකැඩුනේද සම්පූර්ණ වූයේද ඔහුට නිවන් පිණිස ඥාණ ගමන සම්පූර්ණ වේ. එනිසා සීලය චරණ යයි කියන ලදී. මෙය සංයමන වශයෙන් **සංයමො** වේ. සංවරණය වශයෙන් **සංවරො** වේ. දෙවිධියෙන්ම සීල සංයමයද සීල සංවරයද කියන ලදී. මෙහි වචනාර්ථය වනාහි සංයමයයි විතක්ක විප්පන්දන පුද්ගලයා සංයමය කරයි. ව්‍යතික්‍රම වශයෙන් ඔහුට කම්පාවීමක් නොදේ යනු සංයමයයි. ව්‍යතික්‍රමණය වන දොරටු සංවරණය කරයි. වසයි යනු සංවරයයි. **මොක්ඛං** යනු උතුම්ය. මුඛය වූ හෝ. යම්සේ සත්වයින් සතරවිධ වූ ආහාරය මුඛයෙන් පිවිස අංගයක් පාසා පැතිරේ. එසේම යෝගියාගේද චතුභූමක කුසලය සීල මුඛයෙන් පිවිස අර්ථ සිද්ධිය සම්පාදනය කරයි. එසේහෙයින් කියන ලදී. **මොක්ඛං** යනු ප්‍රමුඛයෙන් මැනවැයි යනු **පාමොක්ඛං** පෙරටුකොට, ශ්‍රේෂ්ඨ, ප්‍රධාන යන අර්ථ වේ. **කුසලානං ධම්මානං සමාපත්තියා** යනු චතුභූමක කුසලයන්ගේ ලැබීම පිණිස පාමොක්ඛය පෙරටුවේ ශ්‍රේෂ්ඨ වේ. ප්‍රධාන වේ යයි දතයුතුය. **කායිකො අවීතික්කමො** යනු ත්‍රිවිධ කාය සුචරිතයයි. **වාචසිකො** යනු චතුර්විධ වචී සුචරිතයයි. **කායික වාචසිකො** ඒ දෙකම. මේ ආජීවාෂ්ටමක සීලය හාත්පසින් ගෙන දක්වයි. **සංවුතො** යනු වසන ලදී. **සංවුතින්‍ද්‍රිය** යනු වසන ලද ඉන්‍ද්‍රිය යන අර්ථයයි. වසන ලද දොරවල් ඇති ගෙය වසන ලද ගෙය යයි කියනු ලැබේ. එසේම මෙහි වසන ලද ඉඳුරන් සංවුත යයි කියන ලදී. **පාතිමොක්ඛ සංවරෙන** යනු ප්‍රාතිමෝක්ෂයෙන්ද සංවරයෙන්ද ප්‍රාතිමෝක්ෂ සංඛ්‍යාත සංවරයෙන්. **උපෙතො** ආදිය කියන ලදමය. **ඉරියතී** යනාදි පද හතකින් ප්‍රාතිමෝක්ෂ සංවරයෙහි සිටි භික්ෂුවගේ ඉරියව් විහරණය කියන ලදී.

ආචාර ගෝචර නිද්දේසයෙහි ශ්‍රමණ චාරණ සහ ශ්‍රමණ ගෝචර කියනු කැමති බුදුහිමි **ආචාරගෝචර සම්පන්නො ති අත්‍ථි ආචාර අත්‍ථි අනාචාරො** යන පද උදුරා දැක්වූහ. යම්සේ මාර්ග දක්ෂ වූ පුරුෂයෙක් මාර්ගය කියන්නේ වම හැර දකුණ ගන්න යයි පළමුව අත්හළ යුතු භය සහිත මාර්ගය වැරදි මාර්ගය කියයි. පසුව ගතයුතු නිර්භය මාර්ගය නිවැරදි මාර්ගය කියයි. එසේම මාර්ග දක්ෂ පුරුෂයා මෙනි ධර්මරාජයන් වහන්සේ පළමුව අත්හළ යුතු ලාමක වූ අනාචාර්ය කියා පසුව ගතයුතු ආචාර්ය කියනු කැමතිව **තත්‍ථ කතමා අනාචාරො** යනාදිය කීහ. මිනිසා විසින් කියන ලද මාර්ගයට පිවිසෙන්නේ හෝ නොවන්නේ හෝ වේ. තථාගතයන් විසින් කියන ලද සත්‍ය මාර්ගය ඉන්‍ද්‍රයා විසින් මුදාහරින ලද

වජ්‍රායුධය මෙන් විරාගියා නිවන් පුරයටම යවයි. එයින් කියන ලදී. "තිස්සය, මාර්ග කුසල පුරුෂයා වනාහි තථාගතයන් වහන්සේටම සමාන වචනයකි." යම්හෙයකින් හිස සහිත නෑමෙන් දාඩිය මල කුණු තට්ටු ප්‍රහීන වූ පුරුෂයාගේ මල් ගඳ විලවුන් ආදියෙන් අලංකාරයක් මෙන් පාපයන් ප්‍රහීණ වූ පුද්ගලයා කලණ දහමින් යුක්තව රූපසම්පන්න වේ. එහෙයින් දහඩිය මල කුණු තට්ටු මෙන් පහකළ යුතු අනාචාරය පළමුව කියා පසුව ආචාර්ය කීමට කැමති වන්නේ තත්‍ථ කතමො අනාචාරො ආදිය කීහ. එහි කායිකා වීතික්කමො ත්‍රිවිධ වූ කාය දුෂ්චරිතයයි. වාචසිකො විතික්කමො චතුර්විධ වචී දුෂ්චරිතයයි. කායික වාචසිකො වීතික්කමො ඒ දෙකම. මෙසේ ආජීවාෂ්ටමක සීලයේම ව්‍යතික්‍රමණය දැක්වීය. යම්හෙයකින් කය වචනයෙන් පමණක්ම අනාචාරයෙහි නොහැසිරේ. සිතෙන්ද හැසිරේමය. එනිසා එය දැක්වීමට සබ්බම්පි දුස්සීල්‍යං අනාචාරො යයි කියන ලදී.

එහි ඇතමෙක් අනාචාරය බෙදා දක්වන්නේ ඉධෙකච්චො වෙළුදානෙන යනාදිය කීහ. එහි වෙළුදානෙන යනු ප්‍රත්‍යය (සම්ඵස්ස) හේතුවෙන් බටගස් දීම. විහාරයේ පැනනැංගා වූ හෝ වනයෙන් ගෙනවුත් රක්‍ෂාවරණ ගෝපනය කළ බට (උණගස් ආදිය) මට ප්‍රත්‍ය දෙන්නැයි උපස්ථායකයන්ට දීම නොවටී. මෙසේ ජීවිතය ගෙවන්නෝ අනෙසන (නොසෙවිය යුතු) මිථ්‍යා ජීවයෙන් ජීවත් වෙති. හේ මෙලොවදීම ගර්හාවට භාජනය වේ. පරලොවද අපාය පුරවන්නේ වේ. තමාගේ පුද්ගලික බට කුල සංග්‍රහය සඳහා දෙන්නේ කුලදූසක දුෂ්කටාපත්තියට පැමිණේ. අනුන්ගේ ඒවා සොර සිතින් දෙන්නේ භාණ්ඩය අගය කළයුතුය. සංඝිකයෙහිද මෙම නයයි.

ඉදින් එය පොහොසතෙකුට දෙයිද ගරු භාණ්ඩ විසඳුමට පැමිණිය යුතුය. බට කෙසේ නම් ගරු භාණ්ඩයක් වේද? කෙසේ නොවේද? රෝපනය නොකොට ඉබේ හටගත්තේ සංඝ සන්තකයේ නම් ගරු භාණ්ඩයක් වේ. එහි නොවේ නම් ගරු භාණ්ඩයක් නොවේ. රෝපනය කළ සියල්ල ගරු භාණ්ඩ වේ. එය ප්‍රමාණයෙන් පිරිසිඳ ඇත. තෙල් බම්බුවක ප්‍රමාණය හා ඊට අඩු ඒවා ගරු භාණ්ඩ නොවේ. යම් භික්‍ෂු නමකට තෙල් නලයක් හෝ සැරයටියක් අවශ්‍ය වේනම් (හුවමාරු එාති කර්මය) කොට ගතයුතුය. එාති කර්මය එහි වටිනාකම හෝ අතිරේකයක් හෝ වේ. අඩුවෙන් නොවටී. අත්වැඩද ජලය ගෙනෙන පමණක් හෝ

උදලුගෑම් පමණ හෝ නොවටී. එය තහවුරු කිරීම වටී. එහෙයින් පොකුණෙන් හෝ පස්ගෙන සෝපානයෙහි හෝ අතර විසම තැන් සමකොට ගැනීමට වටී. එාති කර්ම නොකොට ගන්නා ලද්දේ එහි වෙසද්දීම පරිභෝග කළයුතුය. එයින් පිටත්වන්නේ සංඝික කොට තබා යායුතුය. අසිහියෙන් ගෙන ගියේනම් මතක් වූ විට අත්හළ යුතුය. අන්තරා භයක් ඇත්නම් ලඟ විහාරයෙහි තබා යා යුතුය. මිනිස්සු වෙහෙරට ගොස් උණගස් ඉල්ලති. භික්ෂුව සංඝික යයි දීමට නොහැකි වේ. මිනිස්සු නැවත නැවත ඉල්ලන නිසා තර්ජනය හෝ කරති. භික්ෂුව විසින් දණ්ඩකර්ම කොට ගනිව් යයි කීම වටී. උණගස් දීම නම් නොවේ. ඉදින් ඔව්හු දණ්ඩකර්ම සඳහා වෑ පොරෝ හෝ කන බොන දේ හෝ දෙති. ගැනීමට නොවටී. විනය අටුවාවේ "දැවෙන ගෙයකින් ගෙන යන මිනිස්සු නොවැලැක්විය යුතුය කියන ලදී. සංඝයාගේ උණ පඳුරෙහි උණවලට උවදුරක් ඇත්නම් එය ඉවත්කිරීම සුද්ධ කරනවිට උණ ගස්වලට හානි සිදුවේනම් කුමක් කළයුතුද? පිඩු සිඟා යනවිට මිනිසුන්ට කිවයුතුය. සුද්ධ කිරීමට අකමැති නම් භාගයක් ගන්න යයි කිවයුතුය. ඊට කැමති නොවේ නම් තුනෙන් දෙකක් ගන්න යයි කිවයුතුය. ඊටත් අකමැති නම් විනාශවීමෙන් ප්‍රයෝජනයක් නැත. ඔබලාට අවශ්‍ය වේනම් දණ්ඩ කර්මය කළයුතුය. කොට ගනිව් යයි කිවයුතුය. උණගස් දීම නම් නොවේ. උණපඳුර අගින් නැංගාවූද ජලයෙන් යටවන උණගස්වලද මෙම ක්‍රමයම වේ.

ගස්වලට මේ කථා මාර්ගය. ගස් වනාහි ඉදිකටුවක් වැනි ප්‍රමාණයකින්ද ගරු භාණ්ඩයක් වේ. සංඝික යයි ගස් කපා සංඝයාට නොදන්වා සංඝික ආවාසයක් කිරීමට ලැබේ. වචන පඨ බිඳීම සඳහා ආසම කළයුතුය. පුද්ගලිකව කිරීමට ලැබේද? නොලැබේද? නොලැබේ. අත්වැඩ කිරීමෙන් එක ගෙයක ඇඳ තබන ස්ථාන ප්‍රමාණයක් ලබයි. ගෙවල් තුනකින් එක් ගෙයක් ලබයි. සංඝික ගසක් සංඝික ආවාසයට බාදා කරන්නේ නම් සංඝයාගෙන් නොඅසා ඉවත්කිරීම වටීද? නොවටීද? වටී. වචනය බිඳීම් අසාම ඉවත්කළ යුතුය. ගස නිසා සංඝයාට මහත් ලාභයක් ලැබේනම් ඉවත් නොකළ යුතුය. පුද්ගලික ගසක් සංඝික ආවාසයට බාධා කරන්නේ නම් ගස අයිතිකරුට කිවයුතුය. ඉවත්කිරීම කැමති නොවේ නම් කප්පවා ඉවත් කරවිය යුතුය. ගස මට දෙවයි චෝදනා කරනවිට ගස අගය කරවා මුදල දිය යුතුය. සංඝික ගසක් පුද්ගලික ගෙයකටද පුද්ගලික ගසක් පුද්ගලික ගෙයකටද බාධා වනවිට

මෙම නයමැයි. වැල් පිළිබඳවද මෙම කථා මගමය. වැල් වනාහි විකිණිය හැකි දුර්ලභ වේ. එහි ගරු භාණ්ඩ මෙසේය. බාහුවෙන් අඩක් පමණකින් පහතට වැල් කැබැල්ල ගරු භාණ්ඩයක් නොවේ.

පත්‍ර දීමාදියෙහි පත්තදානෙන ප්‍රත්‍යය හේතුවෙන් පත්‍රදීම ආදි සියල්ල උණගස් දීමේ කියන ලද නයින්ම දැනගත යුතුය. මෙහි ගරු භණ්ඩතා පිළිබඳ මේ විනිශ්චයයි. පත්‍රද යම්තැනක විකුණයි. සුවඳපත්‍ර සුවඳ බෙදීම් ආදියට ගන්ධය. එබඳු දුර්ලභ ස්ථානයෙහි ගරුභාණ්ඩ වේ. එරබදු කණේ පළඳින කොල තල්කොල විනිසය. තල්කොලද මේ අවස්ථාවේ කිවයුතුය. සංඝයා විසින් සීමාකළ තල්වනයෙහි ඉබේ හටගත් තල්කොලද ගරුභාණ්ඩ වේ. සීමා නොකළ කොටස නොවේ. රෝපනය කරන තල්වල සියල්ල ගරුභාණ්ඩ වේ. එපා ප්‍රමාණය අවම වශයෙන් අඟල් අටකි. හිස් පොතක ප්‍රමාණය. තෘණද මෙහි බහා කතා කළ යුතුය. යම්තැනක තෘණ නැත්නම් එහි මුඤ්ජ තෘණ පිදුරු පොල් අතු ආදියෙන් වසති. ඒ නිසා ඒවායේ තෘණ වශයෙන් ගන්නා ලදී. මෙය මුඤ්ජ පිදුරු ආදියෙන් යම්කිසි මිටක් වර්ණ තෘණ පොල්අතු ආදියෙහි එක අත්තක් ද සංඝයාට දෙනලද හෝ එහි හටගත් හෝ පිටත ආරාමයක සංඝයාගේ තෘණ ව්‍යාකුල හටගත් තෘණ හෝ රක්ෂිත ගෝපිත තෘණ හෝ ගරු භාණ්ඩ වේ. එය සංඝ කටයුතු සහ චෛත්‍ය කටයුතුවලින් පසු අතිරේක ඒවා පුද්ගලික කටයුතුවලට දීමට වටී. සෙසු ඒවා උණගස් සම්බන්ධ කී විස්තරයට සමානය.

මල් දීමේ - මෙපමණ ගස්වල මල් විකුණා කැඳබත් පිළිගන්වන්න. මෙපමණ සෙනසුන් ප්‍රතිසංස්කරණයෙන් යොදවන්න මෙසේ නියමිත ස්ථානයෙහි මල් ගරු භාණ්ඩ වේ. පරතීරයෙහි සාමණේරයෝ මල් නෙලා රැස් කරති. පංචංග යුක්ත මල් බෙදන්නා භික්ඛු සංඝයා ගණනය කර කොටස් කරයි. හේ පැමිණි පිරිසට සංඝයාගෙන් නොඅසා දෙන්නාට ගැතිවේ. සම්මත නොවේ නම් අසාම දිය යුතුය. දිය යුතු භික්‍ෂුව කවරෙකුට මල් දීමට ලබයිද? කාට නොලබයිද? මාපියන්ගේ ගෙට ගෙන යෑමටද ගෙයින් කැඳවා වත්‍ථුපූජාව කරන්නැයි දීමට ලබයි. පැළදීම සඳහා දීමට නොලබයි. සෙසු නෑයින්ට ගෙනගොස් නොදිය යුතුය. කැඳවා පූජා කරන්නැයි දිය යුතුය. සෙසු අයට පූජාවක් පැමිණි කල ප්‍රත්‍ය බලාපොරොත්තු නැතිව දිය යුතුය. මල් දානයක් නම් නැත.

විහාරයේ බොහෝ මල් පිපේ. පිඬු පිණිස යන භික්ෂුව මිනිසුන් දැක විහාරයේ බොහෝ මල් පිපී ඇත. පූජා කරන්න යයි කිවයුතුය. වචන මාත්‍රයේ දෝෂයක් නැත. මිනිස්සු කනබොන දේ අරගෙන එත් යයි යන සිතින් නොකිව යුතුය. කියයි නම් කනබොන දේ නොවැළඳිය යුතුය. මිනිස්සු තමන්ගේ ස්වභාවයෙන් විහාරයේ මල් ඇතැයි අසා අසවල් දිනයේ විහාරයට එමු. සාමණේරවරුන්ට මල් නෙලන්න දෙන්න එපා යයි කියති. භික්ෂූහු සාමණේරවරුන්ට කියන්ට මතක නැතිව සාමණේරවරු මල් නෙලා තැබූහ. මිනිස්සු භික්ෂූහු වෙත පැමිණ, ස්වාමීණි අපි ඔබවහන්සේට අසවල් දිනයෙහි දැන්වූයෙමු. සාමණේරවරුන්ට මල් නෙලන්න දෙන්න එපා යයි. ඇයි නොවැලැක්වූයේ. මට මතක නැතිවුනා. මල් නෙලුවා විතරයි. තවම පූජා කළේ නැතැයි කිවයුතුය. අරගන්න පූජා කරන්න යයි නොකිව යුතුය. එසේ කියයි නම් ආමිස නොවැළඳිය යුතුය. වෙනත් භික්ෂුවක් සාමණේරයන්ට කියයි. අසවල් ගමේ අය මල් නෙලන්න එපා යයි කීහ. මනුෂ්‍යයෝ ආමිස ගෙන දන්දී කියති. අපේ අය අඩුයි. සාමණේරයන්ට අප සමග මල් නෙලන්න එන්න කියා අණ කරන්න. භික්ෂු ලද සාමණේරයන් ඔවුන්ම දනිතියි උපාසකවරුනි කිවයුතුය. මෙපමණකින් නය ලැබ සාමණේරයන් පුතුන් හෝ සහෝදරයින් කොට මල් නෙලුවාට දෝසයක් නැත. මල්දීමක් නම් නැත.

පළතුරු දීමේ පළතුරුද මල් මෙන් නියමිත බැවින් ගරුභාණ්ඩ වේ. විහාරයේ බොහෝ පලාපල ඇති කල්හි අපහසු මිනිස්සු ඇවිත් ඉල්ලති. භික්ෂූහු සංඝිකයයි දීමට උත්සාහ නොකරති. මිනිස්සු නරක සිතින් අක්‍රොස කරති. අපහාස කරති. එහි කුමක් කටයුතුද? ගෙඩියෙහි හෝ ගසේ පිරිසිඳ කතිකා කළයුතුය. අසවල් අසවල් ගස්වල මෙපමණ ගෙඩි ගන්නේ මෙපමණ ගස්වල ගෙඩි ගන්නේ යයි නොවැලැක්විය යුතුය. සොරු හෝ අධිපතියන් හෝ බලහත්කාරයෙන් ගන්නා කල නොවැලැක්විය යුතුය. කිපී ඔවුන් පසුව විහාරයම විනාශ කරන්නාහුය. ආදීනව කිවයුතුය.

නාන උපකරණ දීමෙහි කුඩුකරන ලද නානා කුඩ ගරුභාණ්ඩ නොවේ. කුඩු නොකරන ලද ගස් පොතු ගරු භාණ්ඩ වේ. සුණු අගිලන් වූවහුට සායම් කිරීම වටී. ගිලනාට ඒ හැම ගුණයක් වටී. මැටිද මෙහි බහා කිවයුතුය. දුර්ලභ මැටි ගරුභාණ්ඩ වේ. එය යටත් පිරිසෙයින් එය පලම් තිහක ගුලපිඬු ප්‍රමාණයක්. එයින් අඩු ගරු භාණ්ඩ නොවේ.

දැහැටි දඬු දීමේදී නොකැපූ දැහැටිම ගරුභාණ්ඩ වේ. සංඝයාගේ සාමණේරයන් දැහැටිවාරය පැමිණේ. ඔවුහු තම තමන්ගේ ආචාර්ය උපජ්ඣායන්ට වෙන වෙනම දීම නොලබති. යමෙක් මෙපමණ දැහැටි ගෙන ආ යුතුයයි. සීමා කොට වාරය ගත්තේ නම් ඔවුහු අතිරේක දැහැටි ඇදුරු උවදැවරුන්ට දීමට හැකි වෙති. එක භික්ෂුවක් දැහැටිදඬු මාලකයෙන් බොහෝ දැහැටි නොගත යුතුය. දිනපතා එක එක ගතයුතුය. වෙනම වසන්නා භික්ෂු සංඝයා ගැන තමා පැමිණෙන තැන් අනුව ගෙන යා යුතුය. අතරමග ආගන්තුකයකු පැමිණිවිට හැරී අවුත් ගත්තාහුම තැබිය යුතුය.

**චාටුකම්‍යතායාති** ආදියෙහි චාටුකම්‍යතා කියනු ලැබේ. තමා දාසයකු කොට පහත් තැන තබා අනිකාගේ වැරදුණු වචනද තදා ප්‍රිය කැමැත්තෙන් උත්සාහවත් වචන. **මුග්ගසූප්පතා** මුං සූපයක් මෙන් ඇත්ත බොරුව දෙකින් ජීවිත ගෙවන්නාට එය නාමයකි. මුග්ගසූපය පැසෙනවිට බොහෝ මුංඇට ඉදෙයි. ටිකක් නොඉදෙයි. එසේම සත්‍ය තේරුමෙන් ජීවත් වන්නාගේ බොරු වැඩිය. සත්‍ය අල්පය. මුග්ග සූපයෙහි නොපිවිසෙන තැනක් නම් නැත. එසේම සත්ත බොරු වුත්ති පුද්ගලයාගේ වචන නොපිවිසෙන තැනක් නැත. මංසන්ධියක් මෙන් කැමති කැමති පැත්තකට බරවෙයි. එහෙයින් ඔහුගේ මුසාවාද බව මුග්ග සූපයකැයි කියන ලදී. **පාරිභට්ටතා** පරිභට්ටකම්ම බවයි. දරුවන් සුරතල් කරන්නාගේ ක්‍රියාව පාරිභට්ට වේ. සැරසීම් ආදියෙන් දරුවන් ක්‍රීඩා කරවන්නාට නමකි. **ජංඝපෙසනික** ගමින් ගමට දේසයෙන් දේසයට ඒ ඒ ගිහියන්ගේ පණිවිඩ උත්තර ගෙනයෑම. තමාගේ මව්පියන්ට උපස්ථාන කරන්නන්ගේ පණිවිඩ ගෙනයෑම වටී. සැපේ හෝ සැප නිසා හෝ තමාගේ හෝ වැඩ කරන්නාගේ වඩුවන්ගේද පණිවිඩ ගෙනයෑම වටී. මිනිස්සු දන් දෙමු. පූජා කරමු. භික්ෂු සංඝයාට කියන්නැයි කියති. අසවල් තෙරුන් වහන්සේට දෙන්න යයි පිණ්ඩපාතය හෝ බෙහෙත් හෝ සිවුරු හෝ දෙති. විහාරයේ පූජාකරන්න යයි මල්ගඳ විලවුන් ආදිය හෝ ධජ පතාකාදිය පවරාදෙති. සියල්ල ගෙනයෑමට වටී. ජංඝපෙසනිකය නම් නොවේ. ඔවුන්ගේ සසුන් ගෙන යන්නාට සියවරක් පාසා දොස් ඇති වේ. **අඤ්ඤතරඤ්ඤතරෙන** මේවා හෝ උණගස් දීම් ආදි අනිත් අනිත් එකකින් වෙදකම, භාණ්ඩාගාරිකකම ගත් පිඩු වෙනුවට පෙරලා ආහාර දීම, සංඝුප්පාද චේතියුප්පාද, උපස්ථාන කම්ම යන මෙබඳු වූ මිච්ඡාජීවයෙන් ජීවිත ගෙවන යම් කිසිවෙක් **අයං වුච්චති** මේ සියල්ල අනාචාරය කියනු ලැබේ.

ආචාර විස්තරයෙහි කියන ලද්දට ප්‍රතිපක්ෂ වශයෙන්ම දතයුතුය. ගෝචර විස්තරයෙහිද අගෝචර වචනයේ කරුණු යට කියන ලද නයින්ම දතයුතුය. මෙහිද **ගොචරො** යන පිණ්ඩපාතාදිය සඳහා පැමිණීමට සුදුසු ඨාන. ගෝචරයට නුසුදුසු තැන් **අගෝචරා** වේ. වෙසඟනන්ට ගෝචර ස්ථාන වෙයි. **වෙසියගොචරො** වේ. මිත්‍ර සන්ථව වශයෙන් පැමිණිය යුතු ස්ථාන යන අර්ථයි. එහි වේසිය නම් රූපයෙන් ජීවත් වන්නේය. කිසියම් විදියකින් සුලභ හැසිරීම් මිතුරු ඇසුර සෙනහසින් එළඹෙන්නේ වෙසිය ගෝචර නම් වේ. එහෙයින් මෙසේ එළඹීමට නොවටී. කරුණු කිම? ආරක්ෂා විපත්තිය නිසාය. මෙසේ එළඹෙන්නාගේ බොහෝ කලක් ආරක්ෂා ගෝපනය කළ මහණදම් කීපදිනකින්ම විනාශ වේ. විනාශ නොවුනත් ගැරහීම් ලබයි. දක්ෂිණා වශයෙන් (දානය සඳහා) එළඹෙන විට සිහි උපදවා එළඹිය යුතුය. විධවා ස්වාමියා මළ හෝ වෙන්ව ඇති ගැහැණිය. **ථුල්ල කුමාරියො** - මහළු, විවාහයට ඇතුළත් නොවූ කුමරියෝ. **පණ්ඩකා** ලෝක ආමිශ නිශ්‍රිත කථා බහුල කෙලෙස් උස්සන්න වූ දාහය නොසංසිඳුණු නපුංශකයෝ. ඔවුන් සියල්ලන් වෙත එළඹීමෙන් වන ආදීනව කියන ලද නයින් දැනගත යුතුය. භික්ෂුණීන් කෙරෙහිද මෙම නයමය. තවද භික්ඛු නම් උසස් බ්‍රහ්මචරියා ඇත්තෝ වෙති. භික්ෂුණීහුද එසේය. ඔව්හු ඔවුනොවුන් ඇසුරෙන් කීප දිනකින්ම රක්ෂා කරන ලද ගෝපනය කරන ලද මහණදම් විනාශකර ගනිති. ගිලන් වූ ඇසූ කෙනෙකු යාම වටී. භික්ෂූහු මල් ලැබ පූජා කිරීමද අවවාද දීමටද යන්නට වටීමය. **පානාගාර** - සුරාසැල්. එය බ්‍රහ්මචර්යාවට අනතුරු කරන සුරාසොඬුන්ගෙන් අවිවේක වේ. එහි ඔවුන් සමග සහ සොඬ වශයෙන් පැමිණීමට නොවටී. බ්‍රහ්ම චර්යාවට අන්තරාව වේ. **සංසට්ඨො විහරති රාජූහි** ආදියෙහි අභිසේක කළ හෝ නොකළ රාජ්‍ය අනුශාසනා කරන්නේ රජවරුය. **රාජමහාමත්තා** රජවරුන්ගේ ඓශ්වර්ය සමාන මහත් ඉසුරෙන් යුත් ඇමතිවරු. **තිත්ථියා** විපරීත දර්ශන ඇති බාහිර පරිබ්‍රාජකයෝ. **තිත්ථිය සාවකා** සත්ති වශයෙන් ඔවුන්ගේ ප්‍රත්‍ය දායකයෝ, ඔවුන් සමග ආශ්‍රයට පැමිණියේ යන අර්ථයයි. **අනනුලෝමිකෙන සංසග්ගො** එය නම් ශික්ෂාපද තිහට පටහැනි, විරුද්ධ ආශ්‍රය. එයින් බ්‍රහ්මචර්යාවට අනතුරු වේ. පැනවීම් ව්‍යතික්‍රමණය වේ. කෙලෙස් නැති කිරීමේ හානියටද පැමිණේ. කෙසේද? රාජරාජ මහාමාත්‍යයන් සමග එකට සෝකවීම් එකට සතුටුවීම් සමාන සුවදුක් පැමිණි කල්හි කටයුතු වශයෙන් තමාගේ යෝගයට පැමිණීම. **තිත්ථිය** ශ්‍රාවකයන් සමග එක අදහස් රුචි පැවතුම් ඇති බව හෝ සමාන අදහස් රුචි පුරුදු ඇතිකර ගැනීමෙන් සෙනෙහසින් බුහුමනින් ඇසුර, රාජරාජ

මහාමාත්‍යවරුන් සම ඇසුරෙන් බ්‍රහ්මචරිය අන්තරාය වේ. අනිත් තීර්ථක ශ්‍රාවකයින්ගේ ඇසරෙන් ඔවුන්ගේ ලබ්ධිය ගැනීම වේ. ඔවුන්ගේ වාද බිඳ තමාගේ ලබ්ධිය ගැන්වීමට සමර්ථ කෙනෙකු එළඹීමට වටී.

දැන් වෙනත් පර්යායකින් අගෝචරය දැක්වීමට **යානි වා පන තන්ති කුලන්ති** යනාදිය අරඹන ලදී. එහි **අස්සද්ධනී** යනු බුද්ධාදීන් කෙරෙහි ශ්‍රද්ධාව නැති. බුදුහු සර්වඥ ධර්මය නෛර්යානිකය. සංඝයා සුපටිපන්නයයි විශ්වාස නොකරති. **අප්පසන්නානි** සිත ප්‍රසන්න වූ නොකැළඹුණු බවට පත්කිරීමට නොහැකි වෙති. **අක්කොසපරිභාසිතානි** ආක්‍රොශද පරිභවද සොරෙකි බාලයෙකි මෝඩයෙකි. ඔටුවෙකි. ගොනෙකි. කොටලුවෙකි. අවයව ගතියෙන් නිරයෙහි සිටින්නෙකි. තිරිසන් බවට ගියෙහි තට සුගතියක් නැත. දුගතියට කැමති වෙයි. යම්සේ දස ආක්‍රොශ වස්තුවලින් ආක්‍රොශ කරති. දැන් තව පහරදෙමි. බඳිමු වධයට පමුණුවමු යයි මෙසේ භය දැක්වීමෙන් පරිභව කරති යන අර්ථ වේ. **අනත්ථකාමානි** දියුණු කැමති නොවෙති. අනර්ථයම කැමති වෙති. **අහිතකාමානි** අහිතම කැමති වෙති. සිත (දියුණුව) කැමති නොවෙති. **අඵාසුකකාමානි** පහසුව කැමති නොවෙති. අපහසුවම කැමති වෙති. අනර්ථයම කැමති වේ. **තථාරූපානි කුලානි** එබඳු වූ ක්ෂත්‍රිය ආදි කුල සෙවති නිසා ජීවත් වේ. **භජති** ලඟට පැමිණේ. **පයිරුපාසති** නැවත නැවත වෙත පැමිණේ. **අයං වුච්චති** මේ වේසියාදි ගෝචරයෙහි වෙසියාදිහු රාජාදි ඇසුරෙන් රාජාදීහුද අස්සද්ධකුල සේවනයේ අස්සද්ධ කුලද යන තුන්ප්‍රකාර අයුතු ගෝචරය අගෝචරයයි දතයුතුය. එහි මේ ආකාරයෙන් අගෝචරය දැනගත යුතුය. වෙසියාදීහු පඤ්චකාම ගුණ නිශ්‍රය වශයෙන් අගෝචරයයි දතයුතුය. යම්සේ කීහ. "මහණෙනි, භික්ෂුව හෝ අගෝචර පරවිසය කුමක්ද? ඒ මේ පඤ්චකාම ගුණයයි." රාජාදීහු ධ්‍යානානුයෝගියාට උපනිශ්‍රය නොවන හෙයින් ලාභ සත්කාරය වූ සේනාසන දාන නිපදවන බැවින්ද දිට්ඨි විපත්ති හේතුවෙන් අස්සද්ධ කුලාදී ශ්‍රද්ධා හානියයි සිත් සන්තෝෂ ඇතිකරන බැවින් අගෝචර වේ.

ගෝචර විස්තරයෙහි **න වෙසිය ගෝචරො** යන ආදිය යට කියන ලදම ප්‍රතිපක්ෂ වශයෙන් දතයුතුය. **ඔපානභූතානි** ආදියෙහි වනාහි **ඔපානභූතානි** යනු උපාදාන භූත වූ. භික්ඛු සංඝයාට සතරමං සන්ධියක හාරන ලද පොකුණක් මෙන් සැපසේ බැසගැනීමට චිත්ත මහා මාත්‍යයාගේ ගෙදර හා සමානය. ඒ ගෙදර වනාහි කාල ස්ථම්භයකින් (ඔරලෝසු කනුවක්) යුක්තය. ගෙයි දොරටුවට පැමිණි භික්ෂූන් වහන්සේට

ප්‍රත්‍ය පිළිබඳ කාලය ගැන විපිළිසර බවක් නැත. එක් දිනකට බෙහෙත් සඳහා පමණක් කහවනු හැටක් නිකුත් කරති. **කාසාව පජ්ජොතානී භික්‍ෂු** භික්‍ෂුණී හදනා පොරෝනා කාෂාය වස්ත්‍ර හැර එකපාටින් යුත් භූතපාල සිටුකුලය සමානව **ඉසිවාත පටිවාතානි** ගෙට පිවිසෙන්නවුන්ගේද පිටවන්නන්ගේද භික්‍ෂු භික්‍ෂුණී සංඛ්‍යාත ඍෂීන්ගේ සිවුරු සුළඟින්ද හකුළුන දිගහරින සරීර වාතයෙන්ද පටිවාත හැමීමෙන් නැගුණු වැරදි හෝ.

සුළු වරදෙහිද බිය දක්නාසුළු විස්තරයෙහි **අනුමත්තා** යනු අණු ප්‍රමාණ. **වජ්ජා** යනු දොස්ය. **යානි තානි වජ්ජානි** යම් ඒ ගැරහිය යුතු අර්ථයෙන් වරද. **අප්පමත්තකානි** කුඩා ප්‍රමාණ. **ඔරමත්තකානි** කුඩා ප්‍රමාණයෙන් අඩු ප්‍රමාණයක් බැවින් අඩු ප්‍රමාණයක් වූ. **ලහුසානි**. ලුහු. **ලහු සම්මතානි** ලුහු යයි සම්මත **සංයමකරණීයානි** සංයමයෙන් කළයුතු ප්‍රතිකර්ම. **චිත්තුප්පාදකරණීයානි** සිත උපන් කෙණෙහි කළයුතු ප්‍රතිකර්ම. **මනසිකාර පටිබද්ධානි** මනසින් ආවර්ජනා කළ කෙණෙහි කළයුතු ප්‍රතිකර්ම. ඒවා මොනවාද? දිවා විහාරවාසී සුම්ම තෙරුන් "අනාපත්තියයි යායුතු සිත උපන් කෙනෙහි නැවත මෙබඳු වූ යමක් නොකරන්නෙමියි ආවර්ජනා මාත්‍රයෙන් පිරිසිදු වේ." මෙය අධිමාන ආවීකම්ම නම් වේයයි කියන ලදී. උන්වහන්සේගේ අන්තේවාසික ත්‍රිපිටකාචාර්ය චූලනාග තෙරුන් වහන්සේ කීහ. මෙය ප්‍රාතිමෝක්‍ෂ සංවර සීලයේම බෙදිය යුතුය. එහෙයින් සියළු ලුහු දුකකට දුබ්භාසිත මෙහි අත්හළැයි දතයුතුය. මෙය වුට්ඨාන ආවීකම්ම නම් යයි කියන ලදී. **ඉති ඉමෙසු** මේ ආකාරයෙහි **වජ්ජ දස්සාමි** චතුර්විධ බයට කරුණු වූ බැවින්, බියෙන් දක්නා සුළු වූයේ. **ආදීනව දස්සාවි** මෙහි නින්දාව ඇතිවන බැවින් ඉදිරියේ දුක් විපාකයෙන් මතු ගුණවලට අනතුරු කරන බැවින් විපිළිසර ඉපදවීමෙන්ද එයින් නොයෙක් ආකාරයෙන් ආදීනවවලින් දකිනසුළු වූයේ. **නිස්සරණ දස්සාවි** එහි යමක් නිදහස්ද එය දක්නාසුළු වූයේ. මෙහි නිස්සරණ යනු කුමක්ද? ආචරිය වාදයෙහි අනාපත්තියය යායුතු හෙයින් අධිෂ්ඨානය පහළකර ගැනීම නිස්සරණ යයි කියන ලදී. අන්තේවාසික පෙර වාදයෙහි ආපත්ති යයි යායුතු කල්හි නැඟීසිටීම පහළකර ගැනීම නිස්සරණයයි කියන ලදී.

එහි එබඳු වූ භික්‍ෂූහු අණු මාත්‍ර වූ වරද වරද වශයෙන් බිය වශයෙන් බලයි. එය දැක්වීමට මේ නය කියන ලදී. පරමාණු අණු වේ. තජ්ජාරි, රථරේණු, ලික්ඛා, උකා, ධඤ්ඤමාස අඟල, වියත, රියන, යෂ්ටිය, උසභ, ගව්ව, යොදුන නම් වේ. එහි පරමාණු නම් ආකාශ කොට්ඨාශයකි.

මසැසට නොපෙනේ. දිවැසට පෙනේ. අණු නම් බිත්ති සිදුරු තල් සිදුරුවලින් පිවිසි හිරුරැස්වල වටවූ වට්ටියක්ව කැරකෙනවා පෙනේ. තජ්ජාරි නම් ගව පාර මනුස්ස පාර කරත්ත පාර යන මෙසේ දැදුරු වී පසු පසුත් නැගී සිටී. රථ රේණු නම් එහිම ඇලේ. ලික්ඛාදිය ප්‍රකටය. මේවායෙහි පරමාණු තිස්හයක් එක් අණුවකි. අණු තිස්හයක් තජ්ජාරි එකකි. තජ්ජාරි තිස්හයක් රථරේණු එකකි. රථරේණු තිස්හයක් ලික්ඛා එකකි. ලික්ඛා හතක් ඌකා එකකි. ඌකා හතක් ධඤ්ඤමාස එකකි. ධඤ්ඤමාස හතක් අඟල් එකකි. අඟල් දොලහක් වියත් එකකි. වියත් දෙකක් රියන් එකකි. රියන් හතක් යෂ්ටි එකකි. යෂ්ටි විස්සක් උසභ එකකි. උසභ අසූවක් ගවු එකකි. ගවු හතරක් යොදුන් එකකි. එම යොදුනෙන් යොදුන් හැටඅට ලක්‍ෂයක් මහාමේරු පර්වත රාජයා උසය. යම් භික්‍ෂුවක් අණු ප්‍රමාණ වූ වරදක් යොදුන් හැටඅට ලක්ෂයක් උස මහාමේරු පර්වතයට සමානකොට දැකීමට හැකිවේ නම් මේ භික්‍ෂුව අණු මාත්‍ර වරද බියෙන් දකී නම් වේ. යම් භික්‍ෂුවක් සියළු ලුහු දුක්කට දුබ්භාසිත ප්‍රමාණය පළමු පාරාජික සමානකොට දැකීමට හැකිවේනම් මෙය අණු මාත්‍ර වේ. වරද වරද වශයෙන් බිය හේතුවෙන් දකියි යනු දතයුතුය.

**සමාදාය සික්ඛති සික්ඛාපදෙසු** යන පද නිද්දේසයෙහි **භික්ඛු සික්ඛාති** භික්‍ෂූන් විසින් හික්මිය යුතු ශික්‍ෂාපදය. එය භික්‍ෂුණීන්ටද සාධාරණය වූද අසාධාරණ වූ භික්‍ෂු ශික්‍ෂාව වේ. **භික්ඛුනී සික්ඛා** භික්‍ෂුණීන් විසින් හික්මිය යුතු නිසා එය භික්‍ෂූන්ට සාධාරණ වූද අසාධාරණ වූද භික්ෂු ශික්‍ෂා නම් වේ. සාමණේර සිකඛමානා සාමණේරි සික්ඛාපද මෙහි ඇතුළත්ය. **උපසාක සික්ඛා** උපාසකයන් විසින්. **උපාසිකා සික්ඛා** උපාසිකා. එහිද පංචසීල දසසීල වශයෙන් වටී. මෙහි භික්ඛු භික්ඛුණී සික්ඛා රහත්මග දක්වා වටී. උපාසක උපාසිකා සික්ඛා අනාගාමි මග දක්වා වටී. එය භික්ඛු තමා හික්මිය යුතු සික්ඛාපදවල පමණක් හික්මේ. සෙසු සික්ඛා අර්ථ දැක්වීම සඳහා කියන ලදී. **ඉති ඉමාසු සික්ඛාසු.** මේ ආකාර ශික්‍ෂා පදවල. **සබ්බෙන සබ්බං** සියළු ශික්‍ෂාපද සමාදානයෙන් සියළු සික්ඛා. **සබ්බථා සබ්බං** සියල්ලෙන් හික්මිය යුතු ආකාරයෙන් සියළු ශික්‍ෂා. **අසෙසං නිසෙසතං** සේස අභාවයෙන් අසේස. සිහිමුළාවෙන් බිඳුන ශික්‍ෂාපදවල නැවත ප්‍රකෘතිමත් කිරීමෙන් නිස්සේස වේ. **සමාදය වත්තති.** සමාදන් වීගෙන පවතී. **තෙන වුච්චති** යම් කාරණයකින් මේ සියළු ශික්‍ෂාපද සියල්ල හික්මිය යුතු ආකාරයෙන් සමාදන් වී හික්මෙයි. පුරයි යන තේරුමෙන් **සමාදාය සික්ඛති සික්ඛාපදෙසු.**

**ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරො භොජනෙ මත්තඤ්ඤූ** දෙපදය විස්තරයෙහි කළ පක්‍ෂයෙහි පළමු වචනයෙහි ප්‍රයෝජන ආචාර නිද්දේසයෙහි කියන ලද නයින් දතයුතුය. තත්‍ථ කතමා ඉන්ද්‍රියෙසු අගුත්තද්වාරතා? යනාදියෙහි යමක් කිවයුතුද ඒ සියල්ල නික්ෂේප කාණ්ඩ වර්ණනාවෙහි කියන ලදමය.

ජාගරියානු නිද්දේසයෙහි **පුබ්බරත්තාපරරත්තං** මෙහි අඩරැයක් සංඛ්‍යාත රාත්‍රියෙන් පෙර පුබ්බරත්ත වේ. මෙයින් පළමුවන යාමයද පසුබතද ගනියි. රාත්‍රියෙන් පසු අපර රත්ත වේ. මෙයින් පැසුළුයමද පෙරබතද ගනී. මධ්‍යම යාමය වනාහි භික්‍ෂුව හෝ නින්ද ක්ලාන්තය දුරුකර ගැනීමේ අවකාශයයි. **අනුයුත්තො හොති** එය අනුව යෙදීම් සංඛ්‍යාත යෝගය කිරීම වැඩීම අනුයුක්ත වූයේ ප්‍රයුක්ත වූයේ වෙයි. නිද්දේසයෙහි **ඉධ භික්ඛු දිවසං** පූර්වාහ්නය මධ්‍යාහ්නය සායණ්හ යන තුන දවසේ කොටස්යයි ගන්නා ලදී. **චංඛමනෙ නිසජ්ජාය** සියළු දවස මේ ඉරියව් දෙකින් වාසය කරන්නේ සිත ආවරණ වශයෙන් **ආවරණියෙහි** ධම්මෙහි නීවරණ පහෙන්, සියළු අකුසල ධර්මවලින් හෝ. **චිත්තං පරිසොධෙති** ඒ ධර්මවලින් පිරිසිදු කරයි. මුදවයි. මෙහි ස්ථාන වශයෙන් කිසිවක් නොගන්නා ලදී. සක්මන හිඳීම ඇසුරුකර ගතයුතුමය. **පඨම යාමං** පළමුවන යාමය මුළුල්ලේම. **මජ්ඣිමයාමං** රෑ දවල් කොටස් හයේ මධ්‍යම යාමයෙහි **සීහසෙය්‍යං** මෙහි කාමභෝගී සයනය, ජේත සයනය, සීහ සයනය, තථාගත සයනය යයි සයන හතරක් ඇත. එහි "මහණෙනි, කාමභෝගී සත්වයෝ බොහෝසෙයින් වමැලයෙන් සයනය කරති." මෙය කාමභෝගී සේවියා ඔවුන් කෙරෙහි බොහෝසෙයින් දකුණැලයෙන් සයනයක් නැත. "මහණෙනි, ප්‍රේතයෝ බොහෝසෙයින් උඩුබැල්ලෙන් හොවිත්. මස් ලේ අඩු නිසා ඇටකූඩුව ගැටෙන නිසා පැත්තකට ඇලවී සයන නොකළ හැකිය. එසේ සයනය කරති. මෙය ජේත සයනය. "මහණෙනි, මෘගරාජ සිංහයා දකුණැලයෙන් හොවයි..... සතුටුවිය. මේ සිංහ සෙය්‍යාවය. තේජස් වැඩිහෙයින් සිංහයා පෙර පා දෙක එකතැනක පසු පා දෙක එකතැනක තබා වලිගය දෙකකුල් අතර රුවා පෙර පා හා පසු පා වලිගය තැබීමට අවකාශ සලකා පෙරපා දෙක මත හිස තබා සයනය කරයි. දවසම නිදා පිබිදෙන්නේ තැති ගැනීමෙන් නොනැගිටියි. හිස ඔසවා පෙර පා ආදියේ පිහිටි අවකාශය සලකයි. කිසිතැනක අඩුවක් පැවතියේ නම් මෙය ඔබ වැනි සූර ජාතිකයෙකුට අනුරූප නොවන්නේ යයි නොසතුටුව එහිම නිදයි. ගොදුරු පිණිස නොයේ. අඩුවක් නැතිව පැවතියේ නම් ඔබ වැනි සූර ජාතිකයෙකුට සුදුසු යයි සතුටුවී නැගිට

කිළිපොළා කෙසරු සලා තෙවරක් සිංහනාද කොට ගොදුරු පිණිස යයි. චතුර්ථ ධ්‍යාන සෙය්‍යාව තථාගත සෙය්‍යා යයි කියනු ලැබේ. ඒවා මෙහි සීහ සෙය්‍යාවේ ආවේය. මෙය තේජස් වැඩි සෙය්‍යාව නිසා උත්තම සෙය්‍යාව වේ. **පාදෙපාදං** දකුණුපයේ වම්පය. **අච්චාදාය** අතිආදාය මඳක් ඈද තබා ගොප් ඇටයෙන් ඇස් වට දණහිසෙන් දණහිස ගැටෙන්නේ නිතර වේදනා ඉපදේ. සිත එකඟ නොවේ. සයනය අපහසු වේ. නොගැටෙන සේ මෙසේ ඈද තබනවිට වේදනා නොඉපදේ. සිත එකඟ වේ. සයනය පහසු වේ. පාදෙන පාදං අච්චාදාය යයි ඒ නිසා කියන ලදී.

**සතො සම්පජානො** සිහියෙන්ද දැනීමෙන්ද යුක්තව. මෙය මනාසේ ගන්නා ලද සතිසම්බොජ්ඣංගය යයි කියන ලදී. **උට්ඨාන සඤ්ඤං මනසි කරිත්වා** අසවල් වේලාවේ නැගිටිමි. නැගිටින වේලාව නියම කිරීම, නැගිටින වේලාව සිතේ නම් මෙසේ කොට තිපන්නහු නියම කරගත් කාලයෙහිම නැගිටියි. **සාතච්චං නෙපක්කං** නිතරම පැවැත්වීම් වශයෙන් සාතච්ච සංඛ්‍යාත වීර්යද පැසුණු බවට ගිය නෙපක්ක සංඛ්‍යාත ප්‍රඥාවද යුක්ත වූ අනුයුක්තව පවත්වන්නේ ජාගරියානු යෝගයෙන් අනුයුක්තව වාසය කරන්නේය යන අර්ථය වේ. ප්‍රඥාවද වීර්යගතික වේ. වීර්ය ලෝකයෙහි ලෞකික ලෝකෝත්තර අතරෙහි ලෝකෝත්තරය යන අර්ථයයි. **බොධිපක්ඛියානං ධම්මානං** චතුරාර්ය සත්‍ය බෝධිසංඛ්‍යාත වූ මාර්ග ඤාණ පක්ෂයෙහි වඩන්නා වූ ධර්මයන්ගේ. මෙතෙකින් සියළු සත් තිස් බෝධි පාක්ෂික ධර්ම සමූහ වශයෙන් ගෙනා ලෞකික භාවනාවෙහිද එක අරමුණෙහි පවත්වන සමර්ථ බෝධි අංගයෙහිම දක්වන්නේ **සත්තබොජ්ඣංගා** යනාදිය කීහ. ඒවා ලෞකික ලෝකෝත්තර මිශ්‍රව කියන ලදයි දතයුතුය. මෙහි සෙස්ස යට කියන ලද නයින් පැහැදිලිය.

අභික්කන්තෙ ආදි නිද්දේසයෙහි **අභික්කන්තෙ පටික්කන්තෙ** යන මෙහි පළමුව අභික්කන්ත කියනු ලැබේ. පෙරට ගමන් පටික්කන්ත පසුගමන නැවතීම දෙකම සතර ඉරියව්වෙහි ලැබේ. ගමනයෙහි කය පෙරට යවන්නේ අභික්කමති නම්. ආපසු හැරෙන්නේ පටික්කමති නම්. ස්ථානයේ සිටියේම කය පෙරම නමන්නේ අභික්කමති නම්. පහතට නමන්නේ පටික්කමති නම්. පසු අග පෙදෙස පසුපසට හරවන්නේ පටික්කමති නම්. හිඳීමෙහිද මෙම නයයි. **සම්පජානකාරීහොති** මනා දැනීමෙන් සියළු කටයුතු කරන්නේ හෝ මනා දැනීමේම කටයුතු. හේ ඉදිරියට යෑම් ආදියෙහි දැනීමෙන්ම කරන්නේ කිසිනක දැනීමෙන් වෙන්

නොවේ. එය මනා දැනීමයි. එය සිහියෙන් යුක්ත වන්නේමය. එහෙයින් මේ නිර්දේශයෙහි සිහියෙන් හා දැනීමෙන් යුක්ත වූයේ ඉදිරියට යයි. සිහියෙන් හා දැනීමෙන් යුක්ත වූයේ ආපසු යයි කියන ලදී. මේ ඉදිරියට යන්නේ ආපසු යන්නේ නුමුළා සිහියෙන් දැනීමෙන් වේ. සිහියෙන් හා ප්‍රඥාවෙන් යුක්ත දැනීමෙන්ම ඉදිරියට යැමද ආපසු යැමද සියළු ඉදිරියට යැම් ආදියෙහි සිව්වැදෑරුම් දැනීමෙන්ම කරයි.

චතුර්විධ සම්පජඤ්ඤය නම් සාත්ථක සම්පජඤ්ඤ සප්පාය සම්පජඤ්ඤ ගෝචර සම්පජඤ්ඤ අසම්මෝහ සම්පජඤ්ඤ වේ. එහි ඉදිරියට යන සිත උපන්කල්හි සිත වශයෙන්ම පැමිණ එහි යැමෙන් මට කුමන ප්‍රයෝජනයක් ඇත්ද? නැද්දැයි අර්ථ අනර්ථ විමසා ප්‍රයෝජන විමසීම සාර්ථක සම්පජඤ්ඤ වේ. එහිද අර්ථය යයි සෑය දැකීම, බෝධිය දැකීම, සංඝයා දැකීම ස්ථවිරයන් දැකීම අසුභ දර්ශන වශයෙන් ධර්මය වැඩේ. සෑය හෝ බෝධිය හෝ දැක බුද්ධාලම්බන ප්‍රීතියද සංඝ දර්ශනයෙන් සංඝාරම්මණ ප්‍රීතියද උපදවා එවේලාවේම ක්‍ෂය වශයෙන් මෙනෙහි කරන්නේ රහත්බවට පැමිණේ. තෙරුන් දැක උන්වහන්සේලාගේ අවවාදයෙහි පිහිටා අසුභ දැක එහි ප්‍රථම ධ්‍යානය උපදවා එවේලාවේම ක්‍ෂය වශයෙන් මෙනෙහි කර රහත් බවට පැමිණේ. එනිසා මේ දැකීම් සාර්ථකය. කිසිවෙක් ආමිස වශයෙන් වැඩේ යන අර්ථයම ගනී. එනිසා බ්‍රහ්මචරිය අනුග්‍රහය පිණිස පිළිපන්නේ යයි කියති. ඒ ගමනෙහි සප්පාය අසප්පාය විමසා සප්පාය ගැනීම සප්පාය සම්පජඤ්ඤ වේ. කෙසේද? පළමුව චෛතිය දර්ශනය අර්ථ සම්මත බව. චෛතිය මහත් වේනම් පූජාව පිණිස දසදොලොස් යොදුනක් අතර පිරිස රැස්වෙති. තමාගේ සම්පත් අනුව ස්ත්‍රීහුද පුරුෂයෝද අලංකාරයෙන් සැරසුනේ සිතුවම් රූමෙන් හැසිරෙති. එහිද ඉෂ්ටාරම්මණයෙහි ලෝභයද අනිෂ්ටාරම්මණයෙහි දෝෂයද ස්ථාන සතු නැතැයි බැලීමෙන් මෝහයද උපදී. කාය සංසර්ග ආපත්තියටද පැමිණේ. ජීවිත බ්‍රහ්මචර්යාවටද හානි පැමිණේ. මෙසේ එතැන අසප්පාය වේ. කියන ලද ආකාර අන්තරාය නැති තැන සප්පාය වේ. බෝධි දර්ශනයෙහිද මෙම නයයි. සංඝ දර්ශනය සාර්ථක වන්නේ. ගම ඇතුළෙහි මහා මණ්ඩපයක් කරවා රාත්‍රිය මුළුල්ලේ ධර්මශ්‍රවණය කරන මිනිසුන් කෙරෙහිද කියන ලද ආකාරයෙන්ම ජන සන්නිපාතයක්ද අන්තරායද වේ. එසේ එම ස්ථානය අසප්පාය වේ. මහ පිරිස් පිරිවැරූ ථෙර දර්ශනයද මෙම නයයි. අසුභ දර්ශනය සාර්ථක වන්නේ එම අර්ථය දැක්වීම සඳහා මෙය කථා වස්තුවකි. එක් දහර භික්‍ෂුවක් සාමණේරයකු

ගෙන දැහැටි දඬු සඳහා ගියේය. සාමණේර තෙම මාර්ගයෙන් ඉවත්වී ඉදිරියෙන් යන්නේ අසුභයක් දැක ප්‍රථමධ්‍යානය උපදවා එයම පාදක කොටගෙන සංස්කාරයන් සම්මර්ශනය කරන්නේ ත්‍රිවිධ ඵල සාක්‍ෂාත්කර උපරි මාර්ගය සඳහා කමටහන් මෙනෙහි කරමින් සිටියේය. දහර භික්‍ෂු ඔහු නොදක්නේ සාමණේර යයි කැඳවීය. හෙතෙම මම පැවිදි වූදා පටන් භික්‍ෂූන් සමග හැසිරෙන්නේ දෙවරක් කතා කරනතුරු නොසිටියෙමි. වෙනත් දවසක මත්තෙහි විශේෂයක් උපදවන්නෙමියි සිතා, කිම ස්වාමීනියි පිළිවදන් දුන්නේය. එන්න යයි කියන ලද කල්හි එක් වචනයෙන්ම අවුත් ස්වාමීනි, මෙයින් පළමු මගින් ගොස් මා සිටින ස්ථානයෙහි පෙර දිසාවට අභිමුඛව සිට බලන්නැයි කීවේය. හේ එසේ කොට ඔහු විසින් පැමිණෙන ලද විසයටම පැමිණියේය. මෙසේ එක් අසුභයක් දෙදෙනෙකුට ප්‍රයෝජනවත් විය. මෙසේ මෙය සාර්ථක වූ පුරුෂයාට ස්ත්‍රී අසුභය අසප්පාය වේ. ස්ත්‍රියටද පුරුෂ අසුභය අසප්පාය වේ. සභාග අසුභයම සප්පාය වේ. මෙසේ සප්පාය විමසීම සප්පාය සම්පජඤ්ඤ වේ.

මෙසේ විමසන ලද සාර්ථ සප්පායේ අටතිස් කමටහන් අතුරෙන් තම සිතට රුචි කමටහන් සංඛ්‍යාත ගෝචරය ඉගෙන භික්‍ෂාචාරයෙහි එය රැගෙන ගමන ගෝචර සම්පජඤ්ඤ වේ. එය විස්තර කිරීම සඳහා මේ චතුෂ්කය දැනගත යුතුය. මෙහි සමහර භික්‍ෂු කෙනෙක් ගෙනයයි. ආපසු ගෙන නොඑයි. සමහර කෙනෙක් ගෙන නොයති. ආපසු ගෙන එති. කෙනෙක් ගෙන නොයති. ආපසු ගෙන නොඑති. කෙනෙක් ගෙන යති. ආපසු ගෙන එති. එහි භික්ෂු නමක් දිවා කාලයෙහි සක්මනේ හිඳ ආවරණී ධර්මවලින් සිත පිරිසිදුකොට එසේම රාත්‍රියේ පළමුවන දෙවන යාමවල නිදාගෙන පැසුළු යාමයෙහිද සිත සක්මනෙහි කාලය ගතකොට උදේම සැමලු බෝමලු වතාවත්කොට බෝගසට ජලය ඉස පානීය පරිභෝජනීය ජලය ගෙනවුත් තම ආචරිය උපජ්ඣාය වත්තාදි සියළු ඛන්ධක වත් සමාදන්ව පවතී. හේ සිරුරු කිසකොට සේනාසනයට පිවිස දෙතුන් වරක් පලගෙහි උණුසුම ගන්වන්නේ කමටහනෙහි යෙදී පිඬු සිඟන වේලාවෙහි නික්මී කමටහණ සිහිකරමින් සැමලුමට ගොස් බුද්ධානුස්සති කමටහණ වේනම් එය අත්නොහැරම සැමලුවට පිවිසෙයි. වෙනත් කමටහණක් වේනම් පඩිපෙල මුල සිට අතින් ගත් භාණ්ඩයක් මෙන් එය තමා බුද්ධාලම්භණ ප්‍රීතිය ගෙන සැමලුවට නැගී මහසෑයක් නම් තුන්වරක් පැදකුණු කොට ස්ථාන හතරක වැඳිය යුතුය. කුඩා සෑයක් නම් එසේම පැදකුණු කොට ස්ථාන අටක වැඳිය යුතුය. සෑය වැඳ

බෝමලුවට පැමිණෙන්නේද භාග්‍යවත් බුදුන්වහන්සේ ඉදිරියෙහි මෙන් නිහතමානීකම දක්වා බෝධිය වැඳිය යුතුය. හේ මෙසේ සැයද බෝධියද වැඳ තැන්පත් ස්ථානයකට ගොස් තැන්පත් කළ භාණ්ඩයක් අතින් ගන්නාක් මෙන් බහා තැබූ කමටහණ ගෙන ගම සමීපයෙහි කමටහන් හිසින්ම සිවුරු පොරවා ගමට පිඬු පිණිස පිවිසෙයි. ඉක්බිති මිනිස්සු ඔහු දැක අපගේ ආර්යන් වහන්සේ වැඩියේයයි පෙරගමන් කොට පාත්‍රය ගෙන ආසන සාලාවෙහි හෝ ගෙදර හෝ වඩා හිඳුවා කැඳ පිළිගන්වා බත ඉදී නැත්නම් පාදොවා තෙල් ගල්වා පිරිමැද ඉදිරියෙහි හිඳ ප්‍රශ්න හෝ අසති. ධර්මය හෝ අසන්නට කැමති වෙති. කථා නොකෙරෙත් නම් ජන සංග්‍රහය සඳහා ධර්ම කථා නම් කළයුතුමයයි අටුවා ආචාරීහු කියති. ධර්ම කථාවන්හි කමටහණින් වෙන්වීමක් නම් නැත. එහෙයින් කමටහන් හිසින්ම ආහාර වළඳා අනුමෝදනා වදාරා නවතින මිනිසුන් අනුවම ගමින් නික්මී එහි ඔවුන් නවත්වා මග අසයි. ඉක්බිති ඔහුට පෙර නික්මී ගමෙන් පිටකරන ලද බත්කිස ඇත්තේ සාමණේර ද භික්ෂු දැක පෙරගමන්කොට ඔහුගේ පාසිවුරු ගනිති. පුරාණ භික්ෂූහු අපගේ උපධ්‍යායන් අපගේ ආචාර්යයන් වහන්සේ යයි මුහුණ නොබලා වතාවත් කරති. පැමිණි නියමයෙන්ම කරති. ඔවුහු ඔහු විචාරති. ස්වාමීනි, මේ මිනිස්සු ඔබවහන්සේ කවුරුන් වෙත්ද? සම්බන්ධය මව් පක්ෂයෙන්ද? පිය පක්ෂයෙන්ද? කුමක් දැක විචාරවුද? ඔබවහන්සේ කෙරෙහි මොවුන්ගේ ප්‍රේමය බලවත්ය. ඇවැත්නි, මව්පියන්ට දුෂ්කර වූ දෙයක් මොවුහු අපට කරති. අපගේ පාසිවුරුද ඔවුන් සන්තකය. මොවුන්ගේ ආනුභාවයෙන් බියෙහි බියක් නැත. බඩගින්නෙහි බඩගින්නක් නොදනිමු. මොවුන් හා සමාන අපට උපකාර වන්නෝ නැත්තාහ යයි ඔවුන්ගේ ගුණ කියන්නේ යයි මෙය හරති න පච්චාහරති යයි කියනු ලැබේ.

යමෙකුට වනාහි කියන ලද ආකාර වත් පිළිවෙත් කරන්නේ කර්මජ තේජෝ ධාතුව දැල්වෙයි. ගත යුතු දේ මුදා නොගත යුතු දේ ගනියි. ශරීරයෙන් ඩා වැගිරේ. කමටහණ මාර්ගයට නොපැමිණෙයි. හේ උදෑසන පාසිවුරු ගෙන වේගයෙන් සෑය වැඳ ගෙරි සරක් නික්මෙන වේලාවෙහිම කැඳ පිණිස ගමට පිවිස කැඳ ලබා ආසන සාලාවට ගොස් වළඳයි. දෙතුන් වරක් ගිලෙනවිටම කර්මජ තේජෝ ධාතුව නොගත යුතු දේ මුදා ගතයුතු දේ ගනියි. කල සියයකින් නානවා මෙන් තේජෝ ධාතු ගින්න නිවී කමටහන් හිසින් කැඳ වළඳා පාත්‍රයද මුවද දොවා උදේ දවල් ආහාර අතර කමටහණ මෙනෙහිකොට පිඬු පිණිස කමටහන් හිසින් ආහාර

වළඳා එතැන් පටන් එළඹ සිටි කමටහණ ගෙනම එයි. මෙය **න හරති පච්චාහරති** යයි කියනු ලැබේ.

එබඳු වූම භික්ෂුවක් කැඳ බී විදර්ශනාව අරඹා බුදු සසුනෙහි රහත්බවට පැමිණි අය ගණන් කරන්ට නොහැකිය. සිංහල ද්වීපයෙහි ඒ ඒ ගම්වල ආසන සාලාවල අසුන්වල කැඳ වළඳා රහත්බවට නොපැමිණ ආසනයක් නම් නැතැයි හේ ප්‍රමාදව වාසය කරයි. වීර්ය හැර සියළු වත් බිඳ බල පංචවිධ සිතින් බැඳුණු ඇලීම් ඇතිව වෙසෙන්නේ කමටහණක් ඇතැයි යන සංඥාවක්වත් නොකොට ගමට පිඩු සඳහා පිවිස අනුලොම් නොවූ ගිහි සංසර්ගයෙන් හැසිර වළඳා හිස්ව නික්මෙයි. මෙය **නෙව හරති නා පච්චාහරති** යයි කියනු ලැබේ.

යමෙක් වනාහි **හරති ච පච්චා හරති ච** යයි කියන ලද්දේ හෙතෙම ගිය ආපසු එන (ගත පච්චාගතික) වත් වශයෙන් දතයුතුය. දියුණුව කැමති කුලපුත්‍රයෝ ශාසනයෙහි පැවිදිව දහයක්ද පණසක්ද තිහක්ද හතලිසක්ද පනහක්ද සියයක්ද එකට වසන්නේ කතික වත්කොට වාසය කරති. ඇවැත්නි, ඔබලා ණයගැතිව නොව බියට නොව ජීවත්විය නොහැකිව නොව පැවිදි වූයේ දුකින් මිදෙනු කැමතිවය. එහෙයින් ගමන් කරනවිට ඇතිවන කෙලෙස් ගමනේදීම නිග්‍රහ කරව. සිටිනවිට-හිඳිනවිට-නිදනවිට උපන් කෙලෙස් ඒ ඒ අවස්ථාවේදීම නිග්‍රහ කරමු යයි ඔවුහු මෙසේ කතිකාවත් කොට පිඩු පිණිස හැසිරෙන්නේ අඩ උසභයක් උසභයක් අඩ ගව්වක් ගව් අතර පාසාණ (ගල්) වේ. ඒවායේ සංඥාවෙන් කමටහණ මෙනෙහි කරමින්ම යති. ගමනේදී කිසිවෙකුගේ කෙලෙස් උපදීද එහිම ඒවා නිගනිති. එසේ කළ නොහැක්කෝ සිටිති. ඔහුට පසුපසින් එන්නෝද සිටිති. හේ මේ භික්ෂුව ඔබට උපන් විතර්කය දනියි. ඔබට එය සුදුසු නොවේයයි තමාට චෝදනා කොට විපස්සනාව වඩා ආර්ය භූමියට පැමිණේ. එසේ නොහැකි වන්නා හිඳගනියි. ඔහු පසුපසින් ආ භික්ෂුවද හිඳගනියි. හේ එහෙයින් ආර්ය භූමියට පැමිණීමට නොහැකි වන්නේ ඒ කෙලෙස් යටපත් කොට කමටහණ මෙනෙහි කරමින් යයි. කමටහණ නැති සිතින් පය නොඔසවයි. එසවුවත් නැවතී පෙරසිටි තැනට එයි. ආලින්දක වාසී මහාඵුස්සදේව තෙරුන් මෙන්,

උන්වහන්සේ වනාහි එකුන්විසි වසක් ගතපච්ඡාගත (ගිය ආ) වත් පුරමින්ම වාසය කළහ. අතරමග මිනිස්සු කුඹුරු සාමින්ද වපුරමින්ද කොල මඩිමින්ද කටයුතු කරන්නේ එසේ යන තෙරුන් දැක, මේ

තෙරුන්වහන්සේ නැවත නැවත නැවතී යයි කිම අසිහියෙන් පාර වැරදිලාද? නැත්නම් අමතක වෙලාද? කතා කරති. උන්වහන්සේ එය ගණන් නොගෙන කමටහණ යුත් සිතින්ම මහණදම් කරමින් විසිවස තුළදී රහත්බවට පැමිණියහ. රහත්බවට පැමිණි දවසෙහි උන්වහන්සේගේ සක්මන කෙළවර අධිගෘහිත දෙවියා ඇඟිලිවලින් පහන දල්වා සිටියේය. සතරවරම් දෙවියෝද දෙවියන්ට අධිපති වූ සක්‍ර දෙවියාද සහම්පති බ්‍රහ්මයාද උපස්ථානයට පැමිණියහ. ඒ එලිය දුටු වනවාසී තිස්ස තෙර දෙවන දවසෙහි ඔහුගෙන් ඇසීය. රාත්‍රී භාගයෙහි ආයුෂ්මතුන් සමීපයෙහි එළියක් විය. ඒ එළිය කුමක්ද? ස්ථවිර තෙමේ අවුල් කරමින් එලිය නම් පහන් එළියම වේ. මැණික් එළියද වේයයි කීය. එයින් ඔබවහන්සේ සඟවනවා නේද? ඔව් යයි දැන දැන්වීය.

කලුවැල් මණ්ඩපවාසී මහානාග තෙරුන් මෙන්ද උන්වහන්සේද ගතපච්ඡාගත වතාවත පුරන්නේ පළමුව මහා වීර්යයෙන් භාග්‍යවතුන් වහන්සේ පුදමියි සත්වසක් සක්මනට අධිෂ්ඨාන කළහ. දහසය වසක් ගතපච්ඡාගත වත් සම්පූර්ණකොට රහත්බවට පැමිණියහ. උන්වහන්සේ කමටහණින් යුත් සිතින්ම පා ඔසවයි. කමටහන් නැති සිතින් පා එසවුවහොත් නැවතී ගම්සීමාවට ගොස් දෙනක්ද පැවිද්දෙක්ද සැක කරන ප්‍රදේශයෙහි සිවුරු පොරවා කරඬුවෙන් ජලය ගෙන පාත්‍රය සෝදා උදක ගණ්ඩූස්ස (දිය උගුරක්) කරයි. කුමන කරුණකටද? මට භික්ෂාව දීම හෝ වැඳීමට පැමිණි මිනිසුන්ට දීඝායු වේවායි වචන මාත්‍රයකින්වත් කමටහණට බාධාවක් නොවේයයි යන ස්වාමීන් වහන්ස අද දවස මොකක්දැයි දවස හෝ භික්ෂු ගණන හෝ ප්‍රශ්නයක් හෝ අසනවිට දියඋගුර ගිල දන්වයි. දවස ආදිය විචාරන්නකු නැතිනම් නික්මෙන වේලාවේ ගම්දොර කෙළගසා යයි.

ගලම්බුතිත්ථ විහාරයෙහි වස් එළඹි භික්ෂූන් වහන්සේලා පනස්දෙනා මෙන්ද උන්වහන්සේලා වනාහි ඇසළ පුණු පොහෝදින කතිකාවතක් කළහ. රහත්බවට නොපැමිණ ඔවුනොවුන් කථා නොකළ යුතුයයි. ගමට පිඬු පිණිස වඩින්නේ දිය උගුරක් ගෙන පිවිසුණහ. දවස ආදිය පිළිවිසි කල්හි කියන ලද ක්‍රමයෙන් පිළිපැද්දහ. එහි මිනිස්සු කෙළ ගසන තැන දැක අද එක්කෙනෙක් ආවේය. අද දෙන්නෙක් ආහ. මුන්වහන්සේලා අප සමග කතා නොකරන්නේ කුමක් නිසාදැයි සිතුහ. නැතහොත් උන්වහන්සේලා අතරද කතා නැත්තේ විවාදයක් නිසාද. එන්න ඔවුනොවුන්

කථා කරවන්නෙමුයි සියල්ලෝ විහාරයට ගොස් භික්ෂූන් පනස්දෙනාගෙන් එක්කෙනෙක්වත් එකම අසුනකවත් නොදැක්කහ. ඔවුන් කෙරෙන් ප්‍රඥාවන්ත පුරුෂයෙක් මෙසේ කීවේය. පින්වත්නි, කලහකරුවන් වසන තැනක් මේ විදියට නොපවතී. සැමලු බෝමලු මනාසේ ඇමද ඇත. පානීය පරිභෝජනිය පැන් සකසා ඇත. ඔවුහු එසේම නැවතුනහ. ඒ භික්ෂූහු මාස තුන ඇතුළතදීම රහත්බවට පැමිණ මහා පවාරණය සඳහා විසුද්ධි පවාරණයෙන් පැවරූහ. මෙසේ කාලවල්ලි මණ්ඩපවාසි මහානාග තෙරුන් මෙන් ගලම්බුතිත්‍ථ විහාරයෙහි වස් එළඹි භික්ෂූන් මෙන්ද කමටහණ යුතු සිතින්ම පා ඔසවන්නේ ගම් සීමාව ගොස් ජල ගණ්ඩූසය කොට මාර්ගය සලකා යම්තැනක සුරාසොඬ ධූර්ත ආදීහුද කලහකරුවෝ සැඬ ඇත් අස් ආදීන් හෝ නැත්ද එබඳු මාර්ගයට පිළිපන්නේය. එහි පිඬු පිණිස හැසිරෙන්නේ වහ වහා වේගයෙන් නොවඩියි. ජවන පිණ්ඩපාතික ධූතංගයක් නම් නැත. විසම භූමි භාගයකට පැමිණ දිය කරත්තයක් මෙන් නිශ්චලව යයි. ගෙපිළිවෙළින් දෙනු කැමති හෝ නොදෙනු කැමති හෝ බව සැලකීමට ඊට අනුරූප කාලයක් සිට භික්ෂාව ගෙන පහසු අවකාස තැනක හිඳ කමටහණ මෙනෙහි කරමින් ආහාරයෙහි පිළිකුල් සංඥාව උපදවා අකුර ගැල්වීම වණාලේපන පුත්තමංස උපමා වශයෙන් ප්‍රත්‍යවේක්ෂා කරන්නේ අටඟින් යුත් අහර බුදියි. ජවයට මදයට මණ්ඩනයට විභූසනයට නොව..........පහසු විහාරවාසයට යයි අනුභව කොට ජලකිස කොට මොහොතක් බත්මතය සන්සිඳුවා පෙර බතෙහි මෙන් පසුබතෙහි පෙරයමද පැසුළුයමද කමටහණම සිහිකරයි. මෙය හරති ච පච්ඡාහරති ච යයි කියනු ලැබේ.

මෙය වනාහි හරණ පච්චාහරණ සංඛ්‍යාත ගත පච්ඡාගත වත පුරන්නේ උපනිස්සය සම්පත් වේ නම් පළමු වයසෙහිම අරහත් බවට පැමිණේ. පළමු වයසෙහි නොපැමිණියහොත් මධ්‍යම වයසෙහි පැමිණේ. මධ්‍යම වයසෙහි නොපැමිණියහොත් පශ්චිම වයසෙහි පැමිණේ. පශ්චිම වයසෙහි නොපැමිණියහොත් මරණ සමයෙහි පැමිණේ. මරණ සමයෙහි නොවූහොත් ඉක්බිති දෙව් පුතෙක්ව පැමිණේ. දෙව්පුතෙක්ව නොපැමිණිය හොත් බුදුන් නූපන් කාලයක ඉපදුණහොත් පසේබුදුව සාක්ෂාත් කරයි. පසේ බුදුබව සාක්ෂාත් නොකළහොත් බුදුවරුන් හමුවෙහි බාහිය දාරුචීරිය තෙරුන් මෙන් ඛිප්පාභිඤ්ඤා වේ. මහා ප්‍රාඥ වූ සැරියුත් මහරහතන් වහන්සේ මෙන්ද මහත් ඍද්ධි ඇති මුගලන් මහරහතන් වහන්සේ මෙන්ද ධූතංගධර මහා කාශ්‍යප දිවැස ඇති අනුරුද්ධ මහාතෙරුන් සේද විනයධර

උපාලි ථෙර, ධර්මකථික පුණ්ණ මන්තානි පුත්ත ථෙර ආරඤ්ඤක රේවත ථෙර බහුස්සුත ආනන්ද ථෙර ශික්ෂාකාමී රාහුල ථෙර සේද මෙසේ වේ චතුෂ්කයෙහි යමෙක් හරතිද පච්ඡාහරතිද හේ ගෝචර සම්පජඤ්ඤද මනාසේ ගෝචර දැනීමද ශික්ෂාවට පැමිණියේද වේ.

ඉදිරියට යෑම් ආදියෙහි නුමුළාවීම අසම්මෝහ සම්පජඤ්ඤ වේ. එය මෙසේ දතයුතුය. මෙහි භික්ෂුව ඉදිරියට යන්නේ හෝ ආපසු යන්නේ අඳබාල පෘථග්ජනයා සේ ඉදිරියට යෑම් ආදියෙහි තමා ඉක්මවයි. තමා විසින් ඉදිරියට යෑම ඇතිකළා යයි හෝ මම ඉදිරියට යමි. අප විසින් අභික්කමය ඇතිකරන ලදැයි මුළාවෙති. එසේම මුළා නොවන්නේ ඉදිරියට යමුයි සිත් උපන්කල්හි ඒ සිතින්ම සිත උපදවන වායෝධාතුව විඥප්තිය උපදවමින් උපදී. මෙසේ සිත ඇතිකරන වායෝධාතු පැතිරීම් වශයෙන් මේ කාය සම්මත ඇට සමූහය ඉදිරියට යයි. ඔහු එසේ ඉදිරියට යන්නේ එක් එක් පා එසවීමේදී පඨවි ආපෝ ධාතු යයි ධාතු දෙක මඳ ප්‍රමාණ වේ. ඉතිරි දෙක අධිප්‍රමාණ වේ. බලවත් වේ. ගමන් පියවර මාරුකර තැබීමේදී එසේය. අත්හැරීමෙහි තේජෝ ධාතු වායෝ ධාතු දෙක මඳප්‍රමාණ වේ. ඉතිරි දෙක අධිප්‍රමාණ හා බලවත් වේ. දැමීම් නැවැත්වීම් ආදියෙහිද එසේය. එසවීමේ පවතින රූපරූප ගමනට නොපැමිණේ. ගමනේ පවතින පියවර මාරු කිරීමද පියවර මාරුවෙහි එසවීමද එසවීමේ පවතින පියවර තැබීමද පියවර තැබීමෙහි පවතින නැවතීමද නොපැමිණේ. එහි එහිම කොටස් කොටස් සන්ධි සන්ධි සීමා සීමාව රත්වූ කබලක බහාලන තල මෙන් තට තටව බිඳේ. එහි ඉදිරියට යන්නේ කවරෙක්ද? කවර එකෙකුගේ ඉදිරියට යෑමක්ද? පරමාර්ථ වශයෙන් ධාතුන්ගේම ගමන ධාතුන්ගේ සිටීමකි. ධාතුන්ගේ හිඳීමකි. ධාතුන්ගේ සයනයකි. ඒ ඒ කොටස් සිය රූපයෙනි.

නැසෙන උපදින සිත් - වෙන වෙන අයගෙ වන්නේ
රළ'තර සබඳ නැති - ගඟ දිය සෙ පවතින්නේ

මෙසේ ඉදිරියට යෑම් ආදියෙහි නුමුළාවීම අසම්මෝහ සම්පජඤ්ඤ වේ. අභික්කනෙත පටික්කන්තෙ සම්පජානකාරී හොති පදයේ අර්ථය අවසානය.

ආලොකිතෙ විලොකිතෙ යන මෙහි ආලොකිත නම් ඉදිරියට බැලීමයි. විලොකිත අනුදිසා බැලීමයි. වෙනත් විදියකින් යට උඩ පසුපස

බැලීම් වශයෙන් ඔලොකිත අපලොකිත නම් වේ. එය මෙහි නොගැනේ. සරූප් වශයෙන් මේ දෙක පමණක් ගන්නා ලදී. මෙයින් ඒ සියල්ලම ගන්නා ලද්දේමය. එහි බලන්නෙමි යයි සිත උපන්කල්හි සිත වශයෙන් නොබලා අර්ථ විමසීම සාත්‍ථක සම්පජඤ්ඤ වේ. එය ආයුෂ්මත් නන්ද කායසාක්ෂි කොට දතයුතුය. භගවත්හු විසින් කියන ලදී. 'මහණෙනි, නන්දට පෙරදිග බැලිය යුතු වේද? සියළු සිත් එකඟකොට නන්ද පෙරදිග බලයි. මෙසේ පෙරදිග බලන්නේ අභිද්‍යා දොම්නස් පාප අකුසල ධර්ම ඔහු වෙත නොපැමිණේ. යස මෙය සාත්‍ථක සම්පජානය වේ. 'මහණෙනි, නන්දට බටහිර දිග උතුරු දිග දකුණු දිග උඩ යට අනුදිසා බැලිය යුතු වේද? සියළු සිත් එකඟකොට නන්ද අනුදිසා බලයි, මෙසේ අනුදිසා බලන්නේ..........සම්පජානය වේ.

තවද මෙහි පෙර කියන ලද චේතිය දර්ශන වශයෙන්ම සාර්ථක බවද සංවාස බවද දතයුතුය. කමටහණ අත්නොහැරීමම ගෝචර සම්පජඤ්ඤ වේ. එහෙයින් ඛන්ධ ධාතු ආයතන කමටහන්වලින් හෝ කසිණාදි කටමහණකින් හෝ තමාගේ කමටහණ වශයෙන්ම ගෙන බැලීම් කළ යුතුය. අභ්‍යන්තරයෙහි බලන්නෙක් නැත. බලන්නෙමියි යන සිත උපන්කල්හි ඒ සිත සමග සිත උපදවන වායෝ ධාතුව විඤප්තිය උපදවමින් උපදී. මෙසේ චිත්තකිරිය වායෝ ධාතු පැතිරීම් වශයෙන් යට ඇස්පිහාටු යට ගිලෙයි. උඩ ඇස්පිහාටු උඩ ඇලේ. කිසිවෙක් යන්ත්‍රයකින් විවර කිරීමක් නැත. ඉන්පසු චක්ඛු විඤ්ඤාණය දර්ශන කෘත්‍ය සිදුකරමින් උපදී. මෙසේ මෙහි දැනීම අසම්මෝහ සම්පජඤ්ඤ නම් වේ.

තවද මුල් දැනීම ආගන්තුක තාවකාලික භාව වශයෙන් මෙහි අසම්මෝහ සම්පජඤ්ඤය දතයුතුය. මූල පරිඤ්ඤා වශයෙන් :-

**බවඟ අවජනය ද - දසුන ද පිළිගැනුම යන**<br>
**තීරණ විනිස සිත් - ජවනය සමග සත් වේ.**

එහි භවාංගය උත්පත්ති භවයේ අංග කෘත්‍යයන් සිදුකරමින් පවතී. එය පෙරළා කිරිය මනෝධාතු සිත ආවර්ජනා කිස සිදුකරමින් එය නිරුද්ධ කර චක්ඛු විඤ්ඤාණ සිත දැකීම් කිස සිදුකරමින්, එය නිරුද්ධ කර විපාක මනෝධාතු සිත පිළිගැනීම් කිස සිදුකරමින්, එය නිරුද්ධ කර විපාක මනෝධාතු සිත සන්තීරණ කෘත්‍ය සිදුකරමින්, එය නිරුද්ධ කර

කිරිය මනෝධාතු සිත වොඪපන කෘත්‍යය සිද්‍ධකරමින්, එය නිරුද්ධ කර ජවන සිත සත්වරක් දුවයි. එහි පළමු ජවනයෙහි මේ ස්ත්‍රියක් මේ පුරුෂයෙක් යයි ඇලෙන ගැටෙන මුළාවන වශයෙන් ආලෝකිත විලෝකිත නොවේ. දෙවන ජවනයෙහි..........සත්වන ජවනයෙහි, මොවුන් කෙරෙහි වනාහි යුද්ධ මණ්ඩලයෙහි යෝධයන් කෙරෙහි මෙන් උඩ යට වශයෙන් බිඳී බිඳවැටුණුවිට මේ ස්ත්‍රියක් මේ පිරිමියෙක් යයි ඇලීම් ආදී වශයෙන් ආලෝකිත විලෝකිත වේ. මෙසේ මෙහි මූලික දැකීම් වශයෙන් අසම්මෝහ සම්පජඤ්ඤය දතයුතුය.

චක්ඛු ද්වාරයෙහි රූපය ආපාථගතවූ විට භවංගය චලනයෙන් පසු තම තමාගේ කෘත්‍ය නිෂ්පාදන වශයෙන් ආවර්ජනාදිය ඉපදී නිරුද්ධ වීමෙන් අවසානයෙහි ජවන උපදී. එය පෙර උපන් ආවර්ජනාදීන්ගේ ගෙයි චක්ඛුද්වාරයෙහි ආගන්තුක පුරුෂයෙකු මෙන් වේ. ඔහුට අනුන්ගේ ගෙදරට යමක් ඉල්ලීමට ගිය ආගන්තුක පුරුෂයෙකුට ගෙහිමියන් නිශ්ශබ්දව සිටීමෙන් අණකිරීම් යුතු නැත. මෙසේ ආවර්ජනාදීන්ගේ ගෙය වන චක්ඛු ද්වාරයෙහි ආවර්ජනාදියෙහිද නොඇලෙන කල නොගැටෙන කල මුළා නොවන කළ ඇලීම ගැටීම මුළාව අයුතු යයි මෙසේ ආගන්තුක භාව වශයෙන් අසම්මෝහ සම්පජඤ්ඤය දතයුතුය.

මේ චක්ඛු ද්වාරයෙහි වොඪපන අවසානයෙහි යම් සිත් උපදී. එසිත් සමග යුත් සම්ප්‍රයුක්ත ධර්මවලින් එහි එහිම බිඳෙයි. ඔවුනොවුන් නොදකී. අනිත් ඒවා තාවකාලික වේ. එහි යම් ගෙයක මිනිසුන් සියළු දෙන මළ කල්හි අවසේස අයට එකෙණෙහිම මරණ ධර්මය නොයුතු යයි නච්චගීතාදියෙහි ඇලීම නම් මෙසේ එක්දොරැ සම්ප්‍රයුක්ත ආවර්ජනාලියෙහි එහි එහිම මළ කල්හි අවසේස ඒවා එකිණෙහිම ඇලීම් ගැටීම් මුළාවීම් වශයෙන් අභිරතිය අයුතුයයි ජවනයේ මරණයද මේමය. මෙසේ තාවකාලික භාව වශයෙන් අසම්මෝහ සම්පජඤ්ඤය දතයුතුය.

තවද ඛන්ධ ආයතන ධාතු පච්චය ප්‍රත්‍යවේක්ෂා කිරීම් වශයෙන් මෙය දතයුතුය. මෙහි චක්ඛුවද රූපයද රූපස්කන්ධ වේ. දර්ශනය විඤ්ඤාණ ස්කන්ධය වේ. එය සම්ප්‍රයුක්ත වේදනා වේදනා ස්කන්ධය සඤ්ඤා සංඥා ස්කන්ධය ඵස්සාදි සංස්කාර ස්කන්ධ වේ. මෙසේ මේ පඤ්ච ස්කන්ධයන්ගේ එකතුවීමෙන් ආලෝකන විලෝකන පෙනේ. එහි කවරෙක් ආලෝකනය කෙරේද? කවරෙක් විලෝකනය කෙරේද? එසේම

චක්ඛු චක්ඛායතන වේ. රූප රූපායතන වේ. දස්සන මනායතන වේ. වේදනාදිය ඒ හා සම්ප්‍රයුක්ත ධම්ම ධම්මායතන වේ. මෙසේ මේ ආයතන හතර එක්වීමෙන් ආලෝකන විලෝකන පෙනේ. එහි බලන්නා කවුද? විලෝකනය කරන්නා කවුද? එසේම චක්ඛු ධාතු රූප ධාතු දස්සන චක්ඛු විඤ්ඤාණ ධාතු ඒ හා සම්ප්‍රයුක්ත වේදනාදි ධම්ම ධම්මධාතු වේ. මෙසේ මේ සතර ධාතුන්ගේ එකතුවීමෙන් ආලෝකන විලෝකන පෙනේ. බලන්නා කවුද? විලෝකනය කරන්නා කවුද? එසේම චක්ඛු නිස්සය පච්චය හෝ රූප ආරම්මණ පච්චයෙන් ආවර්ජන අනන්තර සමනන්තර උපනිස්සය නත්ථි විගත පච්චයවලින් ආලෝකයද උපනිස්සය පච්චයෙහි වේදනාදිය ද සහජපතාදි පච්චය වේ. මෙසේ වේ පච්චයන්ගේ එක්වීමෙන් ආලෝකන විලෝකන පෙනේ. කවරෙක් බලාද? කවරෙක් විලෝකනය කෙරේද? යන මෙසේ මෙහි ඛන්ධ ආයතන ධාතු පච්චය ප්‍රත්‍යවේක්ෂා වශයෙන්ද අසම්මෝහ සම්පජඤ්ඤය දතයුතුය.

**සම්මිඤ්ජිතෙ පසාරිතෙ** යන කොටසේ හකුලන දිගහරින. එහි සිත් වශයෙන් හැකිලීත් දිගහැරීමේ නොකර අත්පා හැකිලීම් දිගහැරීම් ප්‍රත්‍යයෙන් අර්ථ අනර්ථ විමසා එහි අර්ථ විමසීම සාත්‍ථක සම්පජඤ්ඤ වේ. එහි බොහෝ වේලාවක් අත්පා හකුලා හෝ දිගහැර සිටින්නාට ඇසිල්ලක් පාසා වේදනා උපදී. සිත එකඟ නොවේ. කමටහන එහෙ මෙහෙ දුවයි. විශේෂයකට පැමිණේ යයි මෙසේ අර්ථ අනර්ථ විමසීම දතයුතුය. අර්ථයක් ඇතිකල්හි සප්පාය අසප්පාය විමසා සප්පාය විමසීම සප්පාය සම්පජඤ්ඤයයි.

මේ එහි නයයි. මහසෑමලුවේ දහර භික්ෂූහු ඉගෙන ගනිති. ඔවුන්ගේ පිටුපස දහර භික්ෂුණියෝ ධර්මය අසති. එහි එක් දහරයෙක් අත දිග හරින්නේ කාය සංසර්ගයට පැමිණ එම කාරණයෙන්ම ගිහිවිය. වෙනත් භික්ෂුවක් පා දිගහරින්නේ ගින්නෙහි වැටුණේය. ඇට දක්වා පය දැවුණේය. තවත් භික්ෂුවක් හුඹසකට පය දැම්මේය. එහි සිටි විස සර්පයෙක් දෂ්ට කළේය. එහෙයින් මෙබඳු වූ අසප්පායෙහි දිගුනොකර සප්පායෙහි දිගු කළයුතුය. මෙය මෙහි සප්පාය සම්පජඤ්ඤයයි.

ගෝචර සම්පජඤ්ඤය වනාහි මහථෙර වස්තුවෙන් දැක්විය යුතුය. මහතෙරුන් වහන්සේ වනාහි දිවා ස්ථානයේ සිටින්නේ අන්තේවාසිකයන් සමග කතා කරමින් වහා අත හකුළුවා නැවත යවා ස්ථානයේ තබා

සෙමින් හැකිලීය. එය අතවැසියෝ ඇසූහ. ස්වාමීන් වහන්ස, ඉක්මණින් අත හකුලා නැවත අත තිබූ තැනම තියා සෙමින් හැකුලුවේ ඇයි? ඇවැත්නි, මම කමටහනක් මෙනෙහි කිරීමට පටන් ගත්තෙමි. කමටහන නොමුදා අත හැකිලවීමක් පෙර නොවීය. දැන් ඔබලා සමග කතා කරමින් කමටහන මුදා අත හකුලුවෙමි. එහෙයින් නැවත යථා ස්ථානය තබා හැකුළුවෙමි. සාධු ස්වාමීන් වහන්ස, භික්ෂුවක් නම් මෙසේ විය යුතුය. මෙසේ මෙහි කමටහන නොහැරීම ගෝචර සම්පජඤ්ඤය යයි දතයුතුය.

අභ්‍යන්තරයෙහි ආත්මය නම් කිසිවෙක් හකුලන්නේ හෝ දිගහරින්නේ නැත. කියන ලද ආකාර චිත්තකිරිය ධාතු පැතිරීමෙන් වනාහි දාරු යන්ත්‍රයක නූල ඇදීමක් සේ අත්පා චලනය වේ. හැකිලීම් දිගහැරීම් වේගය දැනීම මෙහි අසම්මෝහ සම්පජඤ්ඤ යයි දතයුතුය.

සංඝාටි පත්තචීවර ධාරණෙ මෙහි දෙපට සිවුර සිවුරු හඳින පෙරවීම් වශයෙන් ද පාත්‍රය භික්ෂාව පිළිගැනීම් ආදී වශයෙන් පරිභෝග කිරීම දැරීම නම් වේ. එහි සංඝාටි චීවර දැරීමෙහි හැඳ පොරවා පිඬු පිණිස හැසිරීමෙන් ආමිස ලාභයද සීතල වැළැක්වීම් ආදියෙන් භගවත්හු විසින් කියන ලද ආකාරයෙන්ම අර්ථය නම් වේ. ඒ අනුව සාත්ථක සම්පජඤ්ඤය දතයුතුය.

උෂ්ණ ප්‍රකෘතිය ඇති දුබලයාටද සියුම් සිවුරු සප්පාය වේ. සීත බහුලයාට සීත වූ දෙපටක් ඇති සිවුරද සප්පාය වේ. වෙනස් වූ සිවුරු අසප්පාය වේ. දිරුණු සිවුරු අසප්පාය වේ. අගුල් ආදිය ඇදීමෙන් පලිබෝධ ඇතිවේ. පත්තුණ්ණ දුකූල (සියුම් වස්ත්‍ර) ආදි සොරුන්ට ලෝභ ඇතිකරන සිවුරු අසප්පාය වේ. එබඳු සිවුරු වනයෙහි එකලාව සිටින්නාට හැඳීම් අනතුර මෙන්ම ජීවිතයටද අනතුරු ඇතිවේ. වෙනස්කළ නොහැකි නිමිති කීම ආදි වැරදි ජීවිකාවෙන් උපන්නේ නම්? එය සේවනය කිරීමෙන් අකුසල් දහම් වැඩේද? කුසල් දහම් පිරිහේද? එය අසප්පාය වේ. ඊට වෙනස්වූයේ සප්පාය වේ. ඒ අනුව සප්පාය සම්පජඤ්ඤ වේ. කමටහන අත්නොහැරීම් වශයෙන් ගෝචර සම්පජඤ්ඤය දතයුතුය.

අභ්‍යන්තරයෙහි ආත්මයයි කෙනෙක් සිවුරු පොරවන්නේ නැත. කියන ලද ආකාර චිත්තකිරිය වායොධාතු පැතිරීමෙන් සිවුරු පෙරවීම

වේ. එහි සිවුරුද අචේතනය කයද අචේතනය. මම කයට සිවුර පෙරවූයෙමියි සිවුරු නොදනී. මම සිවුරෙන් පොරවනු ලැබීමි යයි කය නොදනී. ධාතුව ධාතු සමූහයක් වසයි. පට රෙදිකඩකින් පූස්තක රූප වසනවා මෙනි. එහෙයින් සුන්දර සිවුරක් ලැබ සොම්නස් නොවිය යුතුය. අසුන්දර සිවුරක් ලැබ දොම්නස් නොවිය යුතුය. නාග තුඹස චෛතිය ගස් ආදියෙහිද කිසිවෙක් මල් සුවඳ පහන් වස්ත්‍රාදියෙන් සත්කාර කරයි. කිසිවෙක් අසූචි මුත්‍ර මඩ දඬු ශාස්ත්‍රවලින් පහරදීම් ආදියෙන් අසත්කාර කරයි. එයින් තුඹස් ගස් ආදිය සොම්නස් හෝ දොම්නස් නොකරයි. එසේම සුන්දර සිවුරක් ලැබ සොම්නස් නොකළ යුතුය. අසුන්දර සිවුරක් ලැබ දොම්නස් නොකළ යුතුය. මෙසේ පවත් සිහිකිරීම් වශයෙන් මෙහි අසම්මෝහ සම්පජඤ්ඤය දතයුතුය.

පාත්‍ර දැරීමෙහිද පාත්‍රය වහාම නොගෙන මෙය රැගෙන පිඬු සඳහා හැසිරෙන්නේ භික්‍ෂාව ලබන්නෙමියි මෙසේ පාත්‍රය ගැනීමෙන් ප්‍රත්‍යය ලැබිය යුතුය යන අර්ථ වශයෙන් සාත්‍ථක සම්පජඤ්ඤ දතයුතුය. කෙට්ටු දුබල ශරීරයට වනාහි බර පාත්‍රය අසප්පාය වේ. කිසියම් හතර පස්වරක් පිළියම් කළ පිරිසිදු කළ නොහැකි පාත්‍ර අසප්පාය වේ. හරියට නොසේදූ පාත්‍රය නොවටී. එය සෝදන්නාට පලිබෝධ වේ. මැණික් වර්ණ පාත්‍රය ලෝබනීය නිසා සිවුරේ කියූ පරිදි අසප්පාය වේ. නිමිති කීම් ආදියෙන් ලද පාත්‍රා අකුසල වැඩෙන කුසල පිරිහෙන පාත්‍රා ඒකාන්තයෙන් අසප්පාය වේ. ඊට වෙනස්වූයේ සප්පාය වේ. ඒ අනුව සම්පජඤ්ඤ දතයුතුය. කමටහන අත්නොහැරීම් වශයෙන් ගෝචර සම්පජඤ්ඤය දතයුතුය.

අභ්‍යන්තරයෙහි ආත්මය නම් කිසිවෙක් පාත්‍රය ගැනීමට නැත. කියන ලද ආකාර චිත්තකිරිය වායෝ ධාතුව පැතිරීම් වශයෙන් පාත්‍රය ගැනීම නම් වේ. එහි පාත්‍රයද අචේතනය. අතද අචේතනය. අතින් මා ගන්නා ලදැයි පාත්‍රය නොදනී. පාත්‍රය මවිසින් ගන්නා ලදැයි අත නොදනී. ධාතුව ධාතු සමූහයක් ගනී. අඬුවෙන් ගින්නේ පාත්‍රය ගන්නා මෙනි. මෙසේ පවතින සිහිකිරීම් වශයෙන් මෙහි අසම්මෝහ සම්පජඤ්ඤය දතයුතුය.

තවද යම්සේ කැඩුණ අත්පා තුවාලවලින් වැගිරෙන සැරව ලේ පණුවන් නිල මැස්සන් පිරුණු අනාථ සාලාවක මිනිසුන් දැක දයාවන්ත

පුරුෂයෙක් ඒ තුවාල වෙළුම් පටිවලින් ඔතා කෂායාදියෙන් බෙහෙත් කරති. එහි රෙදි සමහර ඒවා සිනිඳුය. සමහර ඒවා ගොරෝසුය. බෙහෙත් කපාල ආදිය සමහර ඒවාට මනා සටහන් ඇත. සමහර ඒවා දුස්සටහන්ය. එහි ඔවුහු සතුටු හෝ නොසතුටු හෝ නොවෙති. වණ වෙළීමට පමණක් වස්ත්‍රවලින් ද බෙහෙත් ගැනීමට පමණක් කපල්වලින්ද ඔවුන්ට ප්‍රයෝජනවත් වේ. එසේම භික්ෂුව තුවාල රෙදිකඩ මෙන් සිවුරද බෙහෙත් කබල මෙන් පාත්‍රයද කපාල බෙහෙත් මෙන් භික්ෂුවද සලකයි. මෙය සංඝාටිපාත්‍ර චීවර දැරීමෙහි අසම්මෝහ සම්පජඤ්ඤයෙන් උතුම් දැනීම යයි දතයුතුය.

අසිතාදියෙහි අසිතෙ පිණ්ඩපාත භෝජනයෙහි පීතෙ කැඳ ආදී පානය කිරීමෙහි. ඛායිතෙ පිටිවලින් කැඳ කැවිලි අනුභවයෙහි සායිතෙ මීපැණි ආදි රස දැනීමෙහි. එහි නෙව දවාය ආදි නයින් කියන ලද අෂ්ටවිධ අර්ථය අර්ථනම්. ඒ අනුව සාත්‍ථක සම්පජඤ්ඤ දතයුතුය. රළු ප්‍රණීත තිත්ත මිහිරි ආදියෙහි වනාහි යම් භෝජනයකින් යමෙකුට අපහසු වේනම් එය ඔහුට අසප්පාය වේ. යමක් නිමිති කීම් ආදියෙන් ලැබුනේද යමක් වැළඳීමෙන් අකුසල දහම් වැඩේද කුසලදහම් පිරිහේද එය ඒකාන්තයෙන්ම අසප්පාය වේමය. ඊට විපරීත වූයේ සප්පාය වේ. ඒ අනුව මෙහි සප්පාය සම්පජඤ්ඤය කමටහන අත්නොහැරීම් වසයෙන් ගෝචර සම්පජඤ්ඤ නය දතයුතුය.

අභ්‍යන්තරයෙහි ආත්මය නම් කිසිවෙක් වළඳවන්නෙක් නැත. කියන ලද ආකාර චිත්ත කිරිය වායෝ ධාතුව පැතිරීමෙන්ම පාත්‍ර පිළිගැනීම නම් වේ. චිත්තකිරිය වායෝධාතු පැතිරීමෙන්ම අතේ පාත්‍රය පිහිටීය. එයින් ගුලිකිරීම පැලි එසවීම කට ඇරීම වේ. කිසිවෙක් යතුරකින් හනු ඇට විවර නොකරයි. බත්පිඩ මුවේ තැබීමද උඩ දත්වලින් මොහොල් කිසද යට දත්වලින් වංගෙඩි කිසද දිවෙන් අතේ කිසද කරන්නේ පෙර කී චිත්තකිරිය ධාතුවය. මෙසේ එය එහි දිව අග තුනී කෙල දිව මුල ඝණ වූ කෙල ආලේප කරයි. යට දත් වංගෙඩියෙන් දිව අතින් පෙරලන ලද එහි කෙල දියෙන් තෙමමින් උඩ දත් මොහොලින් සුණු කරන ලදී. කිසිවෙක් කුඩා හැන්දෙන් හෝ මහ හැන්දෙන් හෝ ඇතුළට ප්‍රවේශ කරන්නේ නැත. වායෝ ධාතුවෙන් පිවිසවයි. පිවිසි ඒවා තලපයක් කොට දරන්නෙක් නැත. වායෝ ධාතු වශයෙන් සිටියි. සිටි ඒවා උදුන සකසා ගිනිදල්වා පිසන්නෙක් නැත. තේජෝ ධාතුවෙන් පිසයි. පිසුණු දඬුවකින් හෝ යෂ්ටියකින් ඇතුළට ගෙනයන කෙනෙක් නැත. වායෝ ධාතුවම

ගෙන යයි. මෙසේ වායෝ ධාතුව එහාට මෙහා කර දරයි. පෙරළයි. කුඩු කරයි. වියලයි. බැහැර කරයි. ආපෝ ධාතු සිනිඳු කරයි. තෙත්කරයි. පාලනය කරයි. තේජෝ ධාතු ඇතුළට පිවිසි විට පැසවයි. ආකාශ ධාතු මාර්ගය දක්වයි. විඤ්ඤාණ ධාතු ඒ ඒ තැන ප්‍රයෝග දක්වා බැඳගනී. මෙසේ පවතින සිහිකිරීම් වශයෙන් මෙහි අසම්මෝහ සම්පජඤ්ඤය දතයුතුය.

තවද ගමන වශයෙන් පරියේසන සෙවීම් වශයෙන් පරිභෝග වශයෙන් ආශ්‍රය වශයෙන් හේතු වශයෙන් නොපැසීම් වශයෙන් පැසීම් වශයෙන් ඵල වශයෙන් ගැලීම් වශයෙන් තැවරීම් වශයෙන් යයි දසආකාර ප්‍රත්‍යවේක්ෂා කිරීම් වශයෙන් මෙහි අසම්මෝහ සම්පජඤ්ඤය දතයුතුය. මෙහි විස්තර කථා වනාහි විසුද්ධි මාර්ගයේ ආහාර පටික්කුල සඤ්ඤා නිද්දේසයෙන් ගතයුතුය.

**උපචාර පස්සාව** කම්මෙ මල ද මූත්‍රද කිරීමෙනි. එහි පැසුණු කාලයෙහි මලමූ පහ නොකරන්නාගේ සියළු සිරුරෙන් දහඩිය ගලයි. ඇස් කැරකේ. සිත එකඟ නොවේ. වෙනත් රෝගද ඇතිවේ. කරන්නාට ඒ සියල්ල නැත. මෙය අර්ථ වේ. ඒ අනුව සාත්ථක සම්පජඤ්ඤය දතයුතුය.

අස්ථානයෙහි මලමූ පහකරන්නාට ඇවැත් වේ. අපකීර්තිය වැඩේ. ජීවිත අන්තරාය වේ. සුදුසු තැන කරන්නාට ඒවා නැත. මෙහි සප්පායයි. ඒ අනුව සප්පාය සම්පජඤ්ඤය දතයුතුය. කමටහන අත්නොහැරීම් වශයෙන්ම ගෝචර සම්පජඤ්ඤය දතයුතුය.

අභ්‍යන්තරයෙහි ආත්මය යයි කිසිවෙක් මලමූ ක්‍රියාව කරන්නෙක් නැත. චිත්තකිරිය වායෝධාතුව පැතිරීමෙන්ම මලමූ ක්‍රියාව සිදුවේ. යම්සේ වනාහි පැසුණු ගෙඩියක ගඩුව බිඳීමෙන් සැරව ලේ ඉතිරී වැගිරේ. දැරිය නොහැකි සේ පිරුණු දියබඳුනේ ජලය අකමැත්තෙන්ම නික්මේ. මෙසේ ජරාවාසය මුත්‍ර වස්තියෙහි රැස්වූ මල මූ වායු වේගයෙන් පෙළුණේ අකමැත්තෙන්ම නික්මෙයි. මෙසේ නික්මුණු මල මූ ඒ භික්ෂුවගේ නොවේය. අනිකකුගේ නොවේය. හුදෙක් ශරීරයෙන් ගලායෑමකි. කුමක් මෙන්ද? දිය කලයකින් පැරණි ජලය විසුකරන්නාට එය තමාගේ නොවේ. අනුන්ගේද නොවේ. හුදෙක් පිළිදැගුම් පමණකි. (පටිග්ගහණ - ප්‍රකෘති

කිරීම, පිරිසිඳු කිරීම.) මෙසේ පවතින සිහිකිරීම් වශයෙන් මෙහි අසම්මෝහ සම්පජඤ්ඤය දතයුතුය.

ගතාදිසු ගතෙ ගමනෙහි ඨිතෙ ස්ථානයෙහි නිසින්නෙ හිඳීමෙහි සුත්තෙ නිදීමෙහි එහි ඉදිරියට යෑම් ආදියෙහි කියන ලද නයින්ම සම්පජානකාරී බව දතයුතුය. මෙය එහි වෙනත් ක්‍රමයකි. එක් භික්‍ෂුවක් යන්නේ අනිකක් සිතමින් අනිකක් ගැන විතර්ක කරමින් යයි. එක්කෙනෙක් කමටහන අත්නොහැරම යයි. එසේ එක් භික්‍ෂුවක් සිටින්නේ හිඳින්නේ නිදන්නේ අනිකක් සිතමින් අනිකක් ගැන විතර්ක කරමින් නිදයි. එක්කෙනෙක් කමටහන නොහැරම නිදයි. මෙපමණකින් ප්‍රකට නොවේය සක්මනින් දැක්වූහ. යම් භික්‍ෂුවක් සක්මනින් බැස සක්මන කෙළවර සිට විමසයි. පෙරදිග සක්මන කෙළවර රූප අරූප ධර්ම පැසුළු සක්මන කෙළවරට නොපැමිණ එහිම නිරුද්ධ විය. සක්මනේ මැද පැවති රූපාරූප ධර්ම දෙකෙළවරට නොපැමිණ එහිම නිරුද්ධ විය. සක්මනේ පවත්නා රූපාරූප ධර්ම ස්ථානයකට නොබැස එහිම නිරුද්ධ විය. ස්ථානයේ පවත්නා නිසජ්ජං....නිසජ්ජාය පවත්තා සයනයට නොපැමිණ එහිම නිරුද්ධ වීයයි මෙසේ විමසති. විමසත්ම සිත භවංග ගතවිය. නැගිටින්නේ කමටහන රැගෙනම නැගිටියි. මේ භික්‍ෂුව ගතාදියෙහි සම්පජානකාරී වේ. මෙසේ සූත්‍රයෙන් කමටහන ප්‍රකට නොවීය. කමටහන අප්‍රකට නම් නොකළ යුතුය. එහෙයින් යම් භික්‍ෂුවක් හැකිතාක් සක්මන්කොට සිටගෙන හිඳගෙන නිදමින් මෙසේ විමසා මම ඇඳේ නිදමියි ඇඳ නොදනී. මා කෙරෙහි නිදාගත්තේ යයි අචේතන කය අචේතන ඇඳේ නිදන ලදීයයි මෙසේ විමසනවිට සිත භවංගයේ බැස ගනී. පිබිදෙන විට කමටහන ගෙන පිබිදෙයි. මෙය සූත්‍රයෙහි සම්පජානකාරී නම් වේ.

ජාගරිතෙ නිදිවැරීමෙහි කටයුතුවල යෙදී අත්හල විට ජාගරික නොවේ. ක්‍රියාවක යෙදී දිගටම පවත්වාගෙන යනවිට ජාගරිය වේයයි විමසමින් සිටින භික්‍ෂුව ජාගරිකෙ සම්පජානකාරී වේ. තවද රෑ දහවල් කොටස් හයකට බෙදා කොටස් පහක් ක්‍රියාත්මක වේනම් ජාගරිතෙ සම්පජානකාරී වේ. භාසිතෙ කථනයෙහි එහි උපාදාය රූපය ශබ්දායතනයේ නොපවතිනවිට කථනයක් නම් නැත. එය පවතිනවිට විමසන භික්‍ෂුව කථනයෙහි සම්පජානකාරී නම් වේ. ආයතනවලින් මිදී ධර්ම දේශනා කරනවිටද තිරච්ඡාන කථා දෙතිස හැර දසක කතා වස්තු නිශ්‍රිත කථා කරන්නාද කථනයෙහි සම්පජානකාරී නම් වේ. තුණ්හීභාවෙ

කථා නොකිරීමෙහි. එහි උපාදාය රූප ශබ්දායතනයේ පවතිනවිට තුණ්හී භවයක් නැත. නොපවතී යයි මෙනෙහි කරන භික්ෂුව තුණ්හී භවයෙහි සම්පජානකාරී නම් වේ. අටතිස් අරමුණුවල සිත රුචි කමටහනක් ගෙන සිටින්නාද දුතිය ධ්‍යානය සමවැදී සිටින්නාද කතා නොකිරීමෙහි සම්පජානකාරී නම් වේ. මෙහිද එක් ඉරියව්වක් ස්ථාන දෙකක ආවේය. එය අභික්කන්තෙ පටික්කන්තෙ යන මෙහි පිඬු සිඟන ගමට යන්නේද එන්නේද මාර්ග ගමන වශයෙන් යට කියන ලදී. **ගතෙ ඨිතෙ නිසින්නෙ** මෙහි විහාරයෙහි චුණ්ණිකපාද උද්ධාර ඉරියව් වශයෙන් කියන ලදැයි දතයුතුය. **තත්ථ කතමා සති** ආදි සියල්ල අරුත් පැහැදිළිය.

**සො විවිත්තන්ති** මෙයින් කුමක් දැක්වේද? මෙය භික්ෂුවගේ එළඹෙන භාවනා මාර්ගයට සප්පාය සෙනසුනක් දක්වයි. යමෙකුගේ අභ්‍යන්තරයෙහි මෙපමණ ගුණ තිබේනම් ඔහු අරණ්‍යවාසයට සුදුසුය. යමෙකුට මේවා නැත්නම් ඔහු නුසුදුසු වේ. මෙබඳු වූ අරණ්‍යවාසයෙහි කලු වඳුරු වලස් කලුහිස් වලස් දිවි මෘග ආදීන්ගේ වන වාසය සමාන වේ. කුමක් හෙයින්ද? කැමැත්තෙන් සිට පිවිසුණු බැවිනි. ඔහුට අරණ්‍යවාස මූලකයෙන් කිසි අර්ථයක් නැත. අරණ්‍ය වාසය සේම අරණ්‍යයේ සිටින්නන්ද දූෂණය කරයි. සාසනයට අප්‍රසාදයක් උපදවයි. යමෙකුගේ අභ්‍යන්තරයෙහි මෙපමණ ගුණ ඇත්නම් ඔහු සුදුසු වේ. හේ අරණ්‍යවාසය නිසා විදර්ශනාව පිහිටුවා රහත්බවට පැමිණ පිරිනිවන් පාන්නේය. සියළු අරණයවාසය සොභාවත් කරයි. අරණ්‍යාවසීන්ගේ හිස් සෝදයි. සියළු ශාසනය පතුරුවයි. එහෙයින් ශාස්තෘන් වහන්සේ මෙබඳු රූප වූ භික්ෂුව ගේ උපාසනයට භාවනා මාර්ගය සඳහා සප්පාය සෙනසුනක් දක්වන්නේ **සො විවිත්ත සෙනාසනං භජති** ආදිය කීහ.

එහි **විවිත්තං** යන ශූන්‍ය වූ අල්ප ශබ්ද ඇති මහා ශබ්ද අඩු යන මෙය මෙහි අර්ථය දැක්වීමට **තඤ්ච අනාකිණ්ණං** යනාදිය කියන ලදී. එහි **අනාකිණ්ණං** යනු සංකීර්ණ නොවූ සම්බාධ නැති. එහි සේනාසනය වටේට ගව්වක් (කිලෝමීටර 5ක් බර) අඩ යොදුනක් (කි.මී. 10ක් පමණ) පර්වතවලින් වනයෙන් ගංගාවලින් ගහණය. අවේලාවේ කිසිවකට පැමිණිය හැකි නොවේ. මෙය සමීපයෙහිද ආකීර්ණ නොවේ. යම් සෙනසුනක් අඩ යොදුනක් හෝ යොදුනක් හෝ වේද එය දුරබැවින් අනාකීර්ණ නම් වේ. මෙහි නිදයිද හිඳගනියිද යන අර්ථයෙන් (සෙතිච ආසති ධ) **සෙනාසනං** වේ. එහි ප්‍රභේද දැක්වීමට **මඤ්චො පීඨං** යනාදිය කියන ලදී. එහි

මණ්ඩ්වො ඇඳන් සතරකි. මසාරක - කුලීරක - සත්ව රූප යෙදූ ඇඳ ආහච්ච - විට්ටම හාරා පා වැද්දූ ඇඳ - බුන්දිකාබද්ධ - විට්ටම හා පා ඒකාබද්ධ කොට ඇති ඇඳ.

පීඨ, භිසි - බුදිරිය, මෙට්ටය, භිසි පහකි. උණ්ණා - බැටළු ලොම්වලින් කළ, චොළ - රෙදිවලින් කළ,වාක - ගස් පොතුවලින් කළ, තිණ - තෘණවලින් කළ, පණ්ණ - කොළවලින් කළ.

බිම්බොහනං - හිස තබන කොට්ටය, පළල වියතය, අගල් හතරයි. දිග ඇඳේ පළල.

විහාරො - වටේට පරිහාර පථ - පාර. රාත්‍රී දිවා ස්ථාන ඇතුළේ ඇති සෙනසුන.

අඩ්ඪයොග - ගුරුළු වක් ගෙය - පියඹන ගුරුළාගේ හැඩය ඇති ගෙය.

පාසාදො - මුදුන්කොත් දෙකක් පිහිටුවා කළ ගෙය දිග්ගෙයකි.

අට්ටො - විරුද්ධ රජුන් වැළැක්වීමට ගඩොලින් කළ ඝන භිත්ති ඇති තට්ටු හතරක් පහක් ඇති.

මාළො - භොජනා ශාලාවලට සමාන, මණ්ඩල මාළො - විනය අටුවාවෙහි එක් කොතක් ඇති සිව්රැස් ප්‍රාසාදයකැයි කියන ලදී.

ලෙණ - පර්වතය හාරා හෝ පර්වත ගුහාවක කළ සෙනසුන

ගුහා - බිම්ගෙයක් හෝ රැදවල් පහන් තැබිය හැකි පර්වත ගුහාවක් හෝ බිම්ගෙයක් හෝ.

රුක්ඛමූලං - ගස යට, වටකරන ලද හෝ නැතිව.

වෙළුගුබ්බො - උණපඳුර

**යත්ථ වා පන භික්ඛූ, පටික්කමන්ති** - යට කී සියල්ල හැර භික්ෂූන් වහන්සේ රැස්වන ස්ථානය, රැස්වීමට සුදුසු සෑම ස්ථානයක්ම සේනාසනයකි.

**භජති** - එළඹෙයි.

**සම්භජති** - එහි ඇලුම් වශයෙන් නොකලකිරීමෙන් පහසුවෙන් පැමිණෙයි.

**සෙවති** - නිවාසය වශයෙන් සේවනය කරයි.

**නිසෙවති** - නොකලකිරෙමින් ඇසුරු කරමින් සේවනය කරයි.

**සංසෙවති** - සෙනසුන් වත් සපයමින් හොඳින් සේවනය කරයි.

දැන් විවේකය කියන ලදී. එහි ප්‍රභේද දැක්වීමට අරඤ්ඤං රුක්ඛමූලං ආදිය අරඹන ලදී. එහි **අරඤ්ඤං** විනය අනුව ගමද මේ සීමාවද හැර අවසේස කොටස අරඤ්ඤ නය ආවේය. සූත්‍රාන්ත පරියායෙන් ආරණ්‍යක භික්ෂූන් සඳහා ආරඤ්ඤක නම් සෙනසුන ගමේ සිට දුනු පන්සියයක් පසුකොට ඇතැයි එන ලද්දේය. විනය සූත්‍රාන්ත දෙකම පරියාය දේශනා වේ. අභිධර්මය නිප්පරියාය දේශනා යයි අභිධර්ම පරියායෙන් අරඤ්ඤය දැක්වීමට **නික්ඛමිත්වා බහි ඉන්‍දඛීලං** යයි කියන ලදී. ඉන්‍දඛීලයෙන් පිටත නික්මී යන අර්ථයයි. (ඉන්‍දඛීල ගම්සීමාව දැක්වීමට) සිත් ඇතිකිරීම. රුක්මුල් ආදිය ප්‍රකෘතියෙන් පහසුවෙන් දැනගතහැකි හෙයින් රුක්ඛමූලං යෙව රුක්ඛමූලං ආදිය කියන ලදී. මෙහි රුක්මුල නම් පැතුරුණු ඡායාවක් සහිත විවේකය ඇති යම්කිසි රුක්මුලකි. **පබ්බතං** ගල් පව්වකි. එහි ගල් කෙම්වල (ගල්පොකුණ) ජලකිස කොට සිහිල් රුක් රූ සෙවනේ සිටින්නහුගේ නොයෙක් දිසා සියළුම සිහිල් පවන් සලන සිත එකඟ වේ. **කන්දරං** කං යනු ජලයයි. එයින් හැරුණු ජලයෙන් බිඳුණු පර්වත ප්‍රදේශයක්. **නිතුම්බ, නදීකුඤ්ජ** යයිද කියති. එහි රිදීවන් වැලිතලාය මුදුනේ මණි වියනක් බඳු වනගහණය. මැණික් සේ පැහැදිලි දිය ගලායයි. මෙබඳු වූ කන්දරයකට බැස පැන්බී ගත සිහිල්කොට වැලිගොඩ ගසා පසුල් සිවුර එලා හිඳ මහණදම් පුරණවිට සිත එකඟ වේ. **ගිරිගුහං** පර්වත දෙකක් අතර එක් ස්ථානයක හෝ උමගක් සමග මහා විවරය. **සුසානං** මෙහි ලක්ෂණ විසුද්ධි මග්ගයෙහි කියන ලදී. **වනපත්ථ** ගම් කෙළවර ඉක්මවා

මිනිසුන් නොහැසිරෙන සීසෑම් වැපිරීම් නැති තැන එයම නිද්දේසයෙහි - **වනපත්ථන්ති දූරානමෙතං සේනාසනං අධිවචනං** ආදිය කියන ලදී. රුක්මුල් ආදිය මෙහිම එකට බෙදා දක්වන ලදී. එහෙයින් එහි ප්‍රතික්‍ෂේප කරන පිළිවෙළින් විස්තර නොකොට සියළු දේට පසුව නිර්දේශය කරන ලදැයි දතයුතුය. **අබ්භොකාස** නොවැසුණු. මෙහි කැමති කෙනෙක් සිවුරුවලින් කුටියක් කොට වසයි. **පලාලපුඤ්ජං** - පිදුරු රාශියක් මහපිදුරු ගොඩකින් පිදුරු ඇද පබ්භාර ලෙණ සමාන ස්ථානයක් කෙරෙති. ගස් නොවූ ආදියෙහිද මත්තෙහි පිදුරු දමා යටසිට මහණදම් කෙරෙති. ඒ සඳහා මෙය කියන ලදී.

වනපත්‍ථ නිද්දේසයෙහි **සලොමහංසානං** යම්තැනකට පිවිසිකළ රෝමෝද්ගමය වේ. මෙබඳු වූ හිංසා සෙනසුන. **පරියන්තානං** දුර බැවින් කෙළවර පිහිටි. **න මනුස්සූපචාරානං** සාන වපුරන වශයෙන් මිනිසුන් හැසිරෙන වන කෙළවර ඉක්මවා සිටි. **දුරභි සම්භවානං** ලැබූ විවේකය පිළිගැනීම මැඩ විසීමට නොහැකි සෙනසුන.

අප්පසද්දාදිහි නිද්දේසයෙහි **අප්පසද්දං** වචනවල ශබ්දය නැති **අප්පනිග්ඝොසං** නගරයෙහි නිකුත්වන මහා ශබ්ද නැති. මේ ස්ථාන දෙකම ශබ්ද අර්ථයෙන් එකමය. ඒ නිසා නිර්දේශයෙහි - **යදෙව තං අප්ප සද්දං කදෙව තං අප්පනිග්ඝොසං** (අප්ප ශබ්ද ඇති තුනම අප්පනිග්ඝොස යයි) කියන ලදී. **විජනවාත** සංචාරය කරන්නන්ගේ ශරීරයෙන් නිකුත්වන වාතය නැති. විජංවාදං යනුද පාඨයකි. ජනවාදයෙන් විරහිතය යන අර්ථයයි. යම්තැනක අභිනිඝොසාස නම් එතන ජන සංචාරයෙන් හා ජනවාදයෙන් නිදහස්ය. ඒ නිසා නිද්දේසයෙහි **යදෙව තං අප්පගිග්ඝොසං තදෙව තං විජනවාතං** යයි කියන ලදී. **මනුස්සරාහසෙය්‍යකං** මිනිසුන්ගේ රහස් ක්‍රියාවට ස්ථාන වූ. ජන සංචාරය නොමැතිකනම් නිද්දේසයෙහි **යදෙව තං විජතවාතං තදෙව තං මනුස්සරාහ සෙය්‍යකං** යයි කියන ලදී. **පටිසල්ලාන සාරුප්පං** විවේකයට අනුරූප වූ. එය නියමයෙන්ම මිනිසුන්ගේ රහස් ක්‍රියාවට ස්ථාන වේ. ඒ නිසා නිද්දේසයෙහි **යදෙව තං මනුස්සරාහසෙය්‍යකං තදෙවතං පටිසල්ලානා සාරුප්පං** යයි කියන ලදී.

අරඤ්ඤගතාදි නිද්දේසයෙහි **අරඤ්ඤං** කියන ලදමය. **රුක්ඛමූල** එසේය. සෙසු සියල්ල සේනාසනද **සුඤ්ඤාගාරයෙන්** සංග්‍රහ කරන ලදී. **පල්ලංකං ආභුජිත්වා** හාත්පසින්ම ඌරු බද්ධාසනය බැඳ - **උජුංකායං පණිධාය** ශරීරය ඍජුව තබා දහඅටක් වූ කොඳුඇට පෙලේ කෙළවරින්

කෙළවර එකට සිටින සේ සකසාගෙන. මෙසේ හිඳින්නාගේ සම් මස් නහර නොනැමේ. එස් නැමුනොත් සැරෙන් සැරේ වේදනා ඇතිවේ. ඒවා නූපදී. වේදනා නැතිකල්හි සිත එකඟ වේ. කමටහන බිඳ නොවැටේ. වැඩිදියුණු වේ. **උජුකො හොති කායො ඨිතො පණිහිතො** මෙයද මේ අර්ථය සඳහා කියන ලදී.

**පරිමුඛං සතිං උපට්ඨපෙත්වා** කමටහන අභිමුඛයෙහි සිහිය තබාගෙන. මුහුණ සමීපයේ තබා යන අර්ථයයි. එසේහෙයින් කියන ලදී. **අයං සති උපට්ඨිතා හොති සුපට්ඨිතා නාසිකග්ගෙවා මුඛ නිමිත්තෙවා, මුඛනිමිත්තං** ඉහළ සිට මැද දැකිය යුතුය. නාසයේ වායුව වැදෙන ස්ථානයයි. එසේ නැතහොත් **පරී** ලබාගත යුතුය. **මුඛං** පැමිණවීම් අර්ථය. **සතී** උපස්ථාන අර්ථය **පරිමුඛං** සති යයි එබැවින් කියනු ලැබේ. මෙසේ පටිසම්භිදාවෙහි කියන ලද නයින් මෙහි අර්ථය දතයුතුය.

**අභිජ්ඣා** නිද්දේසය පැහැදිලිය. මෙය මෙහි කෙටි වර්ණනාවකි. **අභිජ්ඣං ලොකෙ** පහාය කැඩෙන විනාශවෙන අර්ථයෙන් **පඤ්චූපාදානක්ඛන්ධ ලොකො.** එනිසා පඤ්ච උපාදානස්කන්ධයන් කෙරෙහි රාගය දුරුකර කාමච්ඡන්දය යටපත් කොටයයි මෙහි අර්ථය වේ. **විගතාභිජ්ඣානං** විෂ්කම්භන වශයෙන් ප්‍රහීන කරන ලද බැවින්, චක්ඛු විඤ්ඤාණ හා සමාන නොවේය යන අර්ථයයි. **අභිජ්ඣාය චිත්තං පරිසොධෙති** අභිද්‍යාවෙන් සිත පිරිසිදු කරයි. එයින් සිත මුදවයි. මුදවා නැවත නොයතියි යන අර්ථ වේ. එය සේවනය කරයි යනු නිද්දේසයෙහි එයි. **සොධෙති** වඩයි. **විසොධෙති** බහුල කරයි. **පරිසොධෙති** එම අර්ථයම දතයුතුය. **මොචෙති** ආදියෙහිද මෙම නයයි.

**ව්‍යාපාද දොසං පහාය** ආදියෙහිද මේ නයින්ම අර්ථ දතයුතුය. ව්‍යාපාදයෙන් මේ සිත පිළුණු බතක් මෙන් ප්‍රකෘති ස්වභාවය අත්හරියි. **බ්‍යාපාදො** විකාරයට පැමිණීමෙන් දූෂණය වේ. අනුන් දූෂණයකරයි. විනාශ කරයි. **පදොසො** මේ දෙකම ක්‍රෝධයට වෙනින් නමකි. එහෙයින් කියන ලදී. **සො බ්‍යාපාදො සො පදොසො යො පදොසො සො බ්‍යාපාදො** යන මෙය සියල්ල සංග්‍රහ කිරීම් වශයෙන් දක්වන ලදී. එහෙයින් සියළු **ප්‍රාණීන්ට හිතානුකම්පී** යයි නොකියා **අබ්‍යාපන්න චිත්තො** යයි **මෙපමණක්ම** කියන ලදී.

**ථීනං** - සිතේ ගිලන් බව, **මිද්ධං** - චෛතසිකවල ගිලන් බව ථීනයද

මිද්ධයද **ථීනමිද්ධං. සන්තා හොන්ති** මේ ධර්ම දෙකම නිරෝධයෙන් සාන්ත වන නිසා. මේ සඳහා වචන බෙදීම කරන ලදී. **ආලොක සඤ්ඤී** රාත්‍රියේද දවල්ද දකින ලද ආලෝකය දැනගැනීමේ සමත්කමින් නීවරණ දුරුකිරීමේ සහ පිරිසිදුවීමේ සංඥාවෙන් යුක්ත වූ. **සතො සම්පජානො-** සිහියෙන් නුවණින්ද සමන්විත වූයේ මේ දෙක ආලෝක සංඥාවට උපකාර බැවින් කියන ලදී. ථීන මිද්ධ දුරුවීම ආලෝක සංඥාව යන නිද්දේසයෙහි **චත්තත්තා** ආදිය අන්‍යොන්‍ය සමාන වචන වේ. එහි **චත්තත්තා** යනු අත්හැරිය කරුණය. සෙසු පදවලද මෙම නයයි. **චත්තත්තා** යන මෙහි ස්වකීය ස්වභාවය අත්හැරීම වශයෙන් කියන ලදී. **වන්තත්තතා** මෙය නැවත නොගැනීම් ස්වභාවය දැක්වීම් වශයෙන්. **මුත්තත්තා** යන මෙය සන්තතියෙන් නිදහස් කිරීම වශයෙන්. **පහීනත්තා** මිදුණු ස්ථානය අභාව වශයෙන් **පටිනිස්සට්ඨත්තා** මෙය පෙර ගන්නා ලද්ද අත්හැරීම දැක්වීම් වශයෙන්. මිදීම් වශයෙන් හෝ අත්හරින ලද බැවින් භාවනා බලයෙන් මැඩ අත්හරින ලද ය අර්ථය. **පහීන නිස්සට්ඨත්තා** විෂ්කම්භ වශයෙන්ම ප්‍රහීණ වේ. නැවත නැවත සන්තතිය නොහැඟේද එසේ අත්හරින ලදී. **ආලෝකං හොති** - එළිය සහිත වේ. ආවරණය නොවූ යන අර්ථයෙන් විවටාය. කෙලෙස් රහිත යන අර්ථයෙන් **පරිසුද්ධ** වේ. ප්‍රභාස්වර යන අර්ථයෙන් **පරියොදාතා**.

**උද්ධච්ච කුක්කුච්චං** යන මෙහි නොසන්සුන් ආකාරය උද්ධච්ච වේ. නිශ්චයක් නැති නිසා (රත්නත්‍රය ඉවතලා) හැසිරීම **කුක්කුච්චය සත්තායෙන්ති** පෙර නයින්ම වචනභේදය දතයුතුය. **තිණ්ණ විචිකිච්ඡො** විචිකිච්ඡාව තරණය කොට ඉක්මවා සිටියේ. නිද්දේසයෙහි **තිණ්ණො** යනු අතිමුග්ග (නොගැලුණු) බව දැක්වීම් වශයෙන් කියන ලදී. **උත්තිණ්ණො** මෙය එයින් අතික්‍රමණය දැක්වීම් වශයෙන්. **පාරං ගතො** විචිකිච්ඡා නැත්තේය යන විචිකිච්ඡාවෙන් එතෙරට ගියේ. **පාරමනුප්පත්තො** ඒ එතෙරට භාවනාවේ යෙදීමෙන් පැමිණෙන ලද. මෙසේ මෙහි ප්‍රතිපත්තියේ සඵලතාව දක්වයි. **අකථංකථී** මේ කතාව මේ කතාව නය මෙසේ පවතින කතාවලින් විරහිත. **කුසලෙසු ධම්මෙසු** අනවද්‍ය ධර්මයන්හි. **න කංඛති** මෙය කුසලයක්දැයි සැක නොඋපදවයි. **න විචිකිච්ඡති** ඒ ධර්මවල ස්වභාවය විනිශ්චය කිරීමට දුෂ්කර නොවේ. ක්ලාන්ත නොවේ. **අකතංඛථී හොති** මේ කුසලය කෙසේදැයි කථා රහිතව, **නික්කථංකථො විගතකථංකථො** ඊටම සමාන වචන වේ. **උපක්කිලෙසෙ** උපක්කිලෙසයෙන් යුත් ඒවා සිතට පැමිණ කිලිටි කරයි. එහෙයින් උපක්කිලෙස යයි කියති. **පඤ්ඤාය දුබ්බලි කරණෙ** යම් හෙයකින් මේ නීවරණ ඉපදෙමින් නූපන්

ලෞකික ලෝකෝත්තර ප්‍රඥාව ඉපදීම ඉඩ නොදේ. ඉපදුනා වූ අෂ්ට සමාපත්ති පඤ්ච අභිඥා හෝ බිඳ හෙළයි. එනිසා ප්‍රඥාව දුර්වල කෙරේයයි කියනු ලැබේ. නූපන් ප්‍රඥාව නොඋපදී. උපන් ප්‍රඥාව නිරුද්ධ වේ යන මෙයද මේ අර්ථය සඳහා කියන ලදී. මෙහි සෙස්ස යට ඒ ඒ තැන්වල ප්‍රකාශ කරන ලද හෙයින් පැහැදිලිය.

**විවිච්චෙව කාමෙහි** ආදියෙහිද විස්තරයෙහි යමක් කිවයුතු නම් යට චිත්තුප්පාද කාණ්ඩයෙහි රූපාවචර නිද්දේසයෙහි ද මෙහි ඒ ඒ තැන්වලද කියන ලද්දේමය. හුදෙක් දෙවන තුන්වන සතරවන ධ්‍යාන නිද්දේසයෙහිද ඒ ධ්‍යාන යට තිවංගික ධ්‍යාන වේ. දුවංගික ධ්‍යාන වේයයි කියන ලදී. මෙසේ නොකියා **අජ්ඣත්තං සම්පසාදනං** ආදි වචනවලින් පැහැදීම් ආදිය සමග ඒ අංග ගෙන ධ්‍යානය (ප්‍රසාදය) ප්‍රීති සුඛ සිතේ එකඟකම ආදි නයින් ඒ ඒ ධ්‍යාන දක්වන ලදී. මෙය මෙහි විශේෂයකි. **යං තං අරියා ආචික්ඛන්ති** පද නිද්දේසයෙහි කිසිවක් කියති. දෙසති යනාදි සියල්ල අන්‍යොන්‍ය සමාන වචන වේ. මෙසේ ඇතිකල්හිද **උපෙක්ඛකො සතිමා සුඛ විහාරි** යනාදි උද්දේස වශයෙන් කියති. නිද්දේස වශයෙන් දේශනා කරති. පටිනිද්දේස වශයෙන් පනවති. ඒ ඒ ආකාරයෙන් අර්ථ තබා පිහිටුවති. ඒ ඒ අර්ථවල කරුණු දක්වන්නේ විවරණය කරති. අක්ෂර විභාගය දක්වන්නේ බෙදති. සැඟවුණු බවද ගැඹුරු බවද ගෙනහැර දක්වා හෝ අසන්නන්ගේ නුවණ පිහිටුවන්නේ ප්‍රකට කරත්. මේ සියළු ආකාරයෙන්ද ශ්‍රාවකයින්ගේ අඥතා අන්ධකාරය විනාශකොට ප්‍රකාශ කරති යන මේ අර්ථය දතයුතුය. සමතික්‍රමණ නිද්දේසයෙහිද ඒ ඒ තැන්වල ඒ ඒ ධර්මයන්ගෙන් පිබිදුණු බැවින් **අතික්කන්තො** උපරි භූමියට පැමිණීමෙන් **වීතික්කන්තො** එයින් අපරිහානි භාවයෙන් **සමතික්කන්තො** යයි මෙසේ මෙහි අර්ථ දතයුතුය.

**සුත්තන්ත භාජනියයි.**

අභිධර්ම භාජනියෙහි යට චිත්තුප්පාද කාණ්ඩයෙහි ආවා වූ නයින්ම පෙල තබන ලදී. එහෙයින් එහි සියළුම කුසලවිපාක කිරිය වශයෙන් දක්නා ලද ධ්‍යානවල එහි කියන ලද නයින්ම අර්ථය දතයුතුය. සුද්ධි නවක ආදි භේද සියල්ලද එය කියන ලද්දට සමාන වේමය.

**අභිධම්ම භාජනියයි.**

ප්‍රශ්න විචාරකයෙහි පෙල අනුසාරයෙන්ම ධ්‍යානවල කුසලාදිභවය දතයුතුය. ආරම්මණ ත්‍රිකයෙහි වනාහි ධ්‍යාන තුනේ නිමිති අරමුණු වන බැවින් පරිත්ත අරමුණු භාවයෙන් නොකිය යුතු බව දතයුතුය. මෙහි ලෝකෝත්තරය වනාහි මාර්ග කාලයෙහි ඵල කාලයෙහි හෝ අප්‍රමාණ අරමුණු වන්නේය. **චතුත්ථජ්ඣානං සියා පරිත්තාරම්මණං** මෙහි කුසල වශයෙන් දහතුන සතරවන ධ්‍යාන සැමතැන පාදක චතුර්ථ වේ. ඉද්ධිවිධ චතුර්ථය දිබ්බසෝත චතුර්ථය, චෙතොපරිය ඤාණ චතුර්ථය පුබ්බෙනිවාස ඤාණ චතුර්ථය දිබ්බචක්ඛු ඤාණ චතුර්ථය යථා කම්මූපග ඤාණ චතුර්ථය අනාගත සඤ්ඤා චතුර්ථය, ආකාසානඤ්චායතන චතුර්ථය, ලොකුත්තර චතුර්ථයයි එහි සියළුතැන පාදක චතුර්ථ වේ. නොකිය යුතු අරමුණුම වේ. ඉද්ධිවිධ චතුර්ථය කාය මේරීමෙන් නොපෙනෙන කාය ප්‍රාතිහාර්යයෙන් කය අරමුණුවන බැවින් පරිත්තාරම්මණය කය වශයෙන් සිත මේරුවහුගේ පෙනෙන කයින් ප්‍රාතිහාර්ය නොව බඹලොවට යන්නහුගේ සමාපත්ති සිත් අරමුණ බැවින් මහග්ගත අරමුණ වේ. දිව කන් නුවණ චතුර්ථය, ශබ්දාරමුණු බැවින් කුඩා අරමුණය. චේතොපරිය නුවණ චතුර්ථය කාමාවචර සිත් දැනීම ඇතිවිට සුළු අරමුණය. ලෝකෝත්තර සිත් දැනීම ඇතිවිට අප්පමාණ අරමුණුය. රූපාවචර අරූපාවචර සිත් දැනෙනවිට මහග්ගත අරමුණය. චේතෝපරිය නුවණ ලැබූ පෘථග්ජනයා පෘථග්ජන සිතින්ම දනී. ආර්ය සිතින් නොවේ. සෝවාන් පුද්ගලයා ද පෘථග්ජනයා ගේද සකෘදාගාමි පුද්ගලයාගේද යට දෙදෙනාගේ, අනාගාමි පුද්ගලයාගේද යට තිදෙනාගේ. ඛීණාසව පුද්ගලයා සියල්ල දනී. පුබ්බේනිවාසානුස්සති චතුර්ථය කාමාවචර ස්කන්ධ සිහිකරන විට සුළු අරමුණකි. රූපාරූපාවචර ස්කන්ධ සිහිකරන විට මහග්ගත අරමුණකි. අතීත බුදු පසේ බුදු රහත්හු මගවැඩූහ. ඵල සාක්‍ෂාත් කළහැකි සිහිකරනවිට අප්පමාණ අරමුණකි. නම්ගොත් සිහිකරනවිට අරමුණ නොකිව යුතුය. දිව ඇස් නුවණ චතුර්ථය වර්ණය අරමුණු කරන බැවින් සුළු අරමුණකි. යථාකම්මූපග ඤාණ චතුර්ථය කාමාවචර කර්ම සිහිකරනවිට සුළු අරමුණකි. රූපාරූපාවචර කර්ම සිහිකරනවිට මහග්ගත අරමුණකි. අනාගතංස ඤාණ චතුර්ථය අනාගතයෙහි කාමධාතුවේ ඉපදීම දන්නා විට සුළු අරමුණකි. රූපාරූප භවවල ඉපදීම දන්නාවිට මහග්ගත අරමුණකි. අනාගතයෙහි බුදු පසේබුදු රහත්හු මාර්ගය වඩන්නෝය ඵලය සාක්‍ෂාත් කරන්නෝය යයි දන්නාවිට අප්පමාණ අරමුණය. අනාගතයෙහි සංඛ නම් රජෙක් වන්නේයයි නම්ගොත් සිහිකරනවිට නොකිවහැකි අරමුණකි. ආකාසානඤ්චායතන ආකිඤ්චඤ්ඤායතන චතුර්ථය නොකිවහැකි

අරමුණකි. විඤ්ඤාණඤ්චායතන නේවසඤ්ඤානාසඤ්ඤා චතුර්ථය මහග්ගත අරමුණකි. ලෝකොත්තර චතුර්ථය අප්පමාණ අරමුණය. ක්‍රියා වශයෙන්ද ඒ දොලොස් ධ්‍යානවල මෙම අරමුණු විධානයම වේ.

ධ්‍යාන තුන මාර්ග අරමුණු යයි යම් ප්‍රත්‍යවේක්ෂා ඥාණය හෝ චේතෝපරිය ඥාණය හෝ මාර්ගය අරමුණු නොකරන්නේය. ධ්‍යාන තුන එසේ නොපැවතීමෙන් මාර්ගය අරමුණු නොවේ. සහජාත හේතු වශයෙන් මාර්ග හේතුක වන්නේය. වීර්ය හෝ වීමංසය හෝ දෙටුවීමෙන් මාර්ග භාවනාවෙන් මාර්ග අධිපති වේ.

ඡන්‍ද චිත්ත දෙටු කාලයෙහි ඵල කලයෙහිද නොකිවයුතුය. චතුර්ථ ධ්‍යානය යයි මෙහි කුසල වශයෙන් චතුර්ථධ්‍යාන දහතුනෙහි සියළු තැන පාදක ඉද්ධිවිධ දිබ්බසෝත දිබ්බචක්ඛු යථාකම්මූපග ඥාණ චතුර්ථයද චතුර්විධ ආරප්ප චතුර්ථයද මාර්ගාදි අරමුණු භවයෙන් නොකිව හැකිය. චේතෝපරිය පුබ්බේනිවාස අනාගතංස ඥාණ චතුර්ථය මග්ගාරම්මණ වේ. මාර්ගහේතුක මාර්ගාධිපති හෝ නොකිව හැකිය. ලෝකෝත්තර චතුර්ථය මාර්ගාරම්මණ නොවේ. මාර්ග කාලයෙහි වනාහි සහජාත හේතු වශයෙන් මග්ගහේතුක වේ. විරිය වීමංස දෙටුවීමෙන්ද මාර්ග භාවනාවේ මග්ගාධිපති වේ. ඡන්‍දචිත්ත දෙටුවීමෙන්ද මගග භාවනාවේ ඵල කාලයද කිවහැකි නොවේ. කිරිය වශයෙන් ධ්‍යාන දොලොසෙහි මෙම නයම **තීණි ඣානානි නවත්තබ්බා** යන අතීතාදියෙහි එක ධර්මයක්වත් අරබයා නොපැවතීමෙන් කිවහැකි නොවේ යයි දතයුතුය. **චතුත්ථජ්ඣානං** කුසල වශයෙන් ධ්‍යාන දහතුනෙහි සබ්බත්‍ථපාදක චතුර්ථය නොකිවහැකි අරමුණුම වේ. ඉද්ධිවිධ චතුර්ථය කාය වශයෙන් චිත්ත පරිණාමයෙන් සමාපත්ති සිත අරමුණු බැවින් අතීතාරම්මණය. අනාගතයෙහි මේ මල් නොමැලවේවා. පහන් නොනිවේවා. පර්වතයෙන් එක් ගිනිකඳක් වේවා යයි අධිෂ්ඨාන කරනවිට අනාගත අරමුණ චිත්ත පරිනාම වශයෙන් කය මෝරණ කාලයෙහි කායාරම්මණ බැවින් වර්තමාන අරමුණ වේ. දිබ්බසෝත ඥාණ චතුර්ථය ශබ්දාරම්මණ බැවින් වර්තමාන අරමුණය. චේතොපරිය ඥාණ චතුර්ථය අතීතයෙහි දවස් හතක් ඇතුළත ඉපදී නිරුද්ධ වූ සිත දැනෙනවිට අතීත අරමුණ වේ. අනාගතයෙහි දවස් හතක් ඇතුළත උපදින සිත දන්නා කාලයෙහි අනාගත අරමුණ වේ. "යම්සේ මනෝ සංඛාර පිහිටුවන ලදද එසේ මේ සිත පසුව මේ සිත කල්පනා කරන්නේ යයි හේ බොහෝසෙයින් ප්‍රකාශ කරයි. එසේම එය

වේ. වෙනත් විධියකින් නොවේ." මේ සූත්‍රයෙන් චේතෝපරිය ඥාණයේ තත්වය ප්‍රකාශ කෙළේය. මාර්ග වර්තමාන සත්තය වර්තමාන වශයෙන් වර්තමානය අරබයා පවතින කාලයෙහි වර්තමාන අරමුණ වේ. විස්තර කථාව යට අට්ඨකථා කාණ්ඩ වර්ණනාවෙහි දතයුතුය. පුබ්බෙනිවාස ඥාණ චතුර්ථය අතීත ස්කන්ධ සිහිකරනවිට අතීත අරමුණු වේ. නම්ගොත් සිහිකරනවිට අරමුණු කිවහැකි නොවේ. දිබ්බචක්ඛු චතුර්ථය මගගය අරමුණු කරන බැවින් වර්තමාන අරමුණු වේ. යථාකම්පූපහ ඥාණ චතුර්ථය අතීත කම්ම අරමුණු කරන බැවින් අතීත අරමුණය. අනාගතංස ඥාණ චතුර්ථය නම්ගොත් සිහිකරනවිට අරමුණු කිවහැකි නොවේ. අනාගත ස්කන්ධ සිහිකරනවිට අනාගත අරමුණු වේ. ආකාසානඤ්චායතන ආකිඤ්චඤ්ඤායතන චතුර්ථ අරමුණු කිවහැකි නොවේ. විඤ්ඤාණඤ්චායතන නේවසඤ්ඤානාසඤ්ඤායතන අතීත අරමුණුම වේ. ලෝකෝත්තර චතුර්ථය අරමුණු කිවහැකි නොවේ. කිරිය වශයෙන් චතුර්ථධ්‍යාන දොළොසෙහිද මෙම නයයි.

**තීණි ඣානානි බහිද්ධාරම්මණානි** යනු අධ්‍යාත්මයෙන් බාහිර වූ නිමිත්ත අරබයා පවතින බැවින් බාහිර අරමුණු වේ. **චතුත්ථජ්ඣානං** යන මෙහිද කුසල වශයෙන් චතුර්ථධ්‍යාන දහතුනෙහි සැමතැන පාදක චතුර්ථය බාහිර අරමුණුම වේ. ඉද්ධිවිධ චතුර්ථය කාය වශයෙන් චිත්ත පරිණාමයෙහිද චිත්ත වශයෙන් කාය පරිණාමයෙහිද තමාගේම කාය චිත්ත අරමුණු බැවින් අධ්‍යාත්ම අරමුණුය. බාහිර ඇතුළු දකියි ආදි නයින් පවතින කාලයෙහි බාහිර අරමුණු වේ. දිබ්බසෝත ඥාණ චතුර්ථය තමාගේ කුසෙහි ශබ්ද අරමුණු කරන කාලයෙහි අධ්‍යාත්ම අරමුණු වේ. අනුන්ගේ ශබ්ද අරමුණු කරන කාලයෙහි බාහිර අරමුණු වේ. උභය වශයෙන් අධ්‍යාත්ම බාහිර අරමුණු වේ. චෙතොපරිය ඥාණ චතුර්ථය බාහිර අරමුණුම වේ. පුබ්බේනිවාස ඥාණ චතුර්ථය තමාගේ ස්කන්ධ සිහිකරන කාලයෙහි අධ්‍යාත්ම අරමුණු වේ. අනුන්ගේ ස්කන්ධ ද නම්ගොත්ද සිහිකරන කාලයෙහි බාහිර අරමුණු වේ. දිබ්බචක්ඛු ඥාණ චතුර්ථය තමාගේ රූප අරමුණු කරන කාලයෙහි අධ්‍යාත්ම අරමුණු වේ. අනුන්ගේ රූප අරමුණු කරන කාලයෙහි බාහිර අරමුණු වේ. උභය වශයෙන් අධ්‍යාත්ම බාහිර අරමුණු වේ. යථා කම්මූපග ඥාණ චතුර්ථය තමාගේ කර්ම දැනගැනීම අතිවන කාලයෙහි අධ්‍යාත්ම අරමුණු වේ. අනුන්ගේ කර්ම දන්නා කාලයේ බාහිර අරමුණු වේ. උභය වශයෙන් අධ්‍යාත්ම බාහිර අරමුණු වේ. අනාගතයේ ඥාණ චතුර්ථය තමාගේ

අනාගතයෙහි උපත් දන්නා කාලයෙහි අධ්‍යාත්ම අරමුණු වේ. අනුන්ගේ ස්කන්ධ සිහිකරන කාලයෙහිද නම්ගොත් සිහිකරන කාලයෙහිද බාහිර අරමුණු වේ. උභය වශයෙන් අධ්‍යාත්ම බාහිර වේ. ආකාසානඤ්චායතන චතුර්ථය බාහිර අරමුණු වේ. ආකිඤ්චායතන චතුර්ථය කිව නොහැකි අරමුණු වේ. විඤ්ඤාණඤ්චායතන නේවසඤ්ඤානාසඤ්ඤායතන චතුර්ථය අධ්‍යාත්ම අරමුණු වේ. ලෝකෝත්තර චතුර්ථය බාහිර අරමුණුම වේ. කිරිය වශයෙන් ධ්‍යාන දොලොසෙහිද මෙම නයයි.

**පඤ්හ පුච්ඡකය.**

මෙම ධ්‍යාන විභංගයෙහි වනාහි සම්මා සම්බුද්ධයන් වහන්සේ විසින් සූත්‍රාන්ත භාජනියෙහි ලෞකික ලෝකෝත්තර මිශ්‍ර වශයෙන් ධ්‍යාන කියන ලදී. අභිධර්ම භාජනියෙහිද ප්‍රශ්න විචාරකයෙහිද මේ තුන් නයෙන් ත්‍රෛභූමික මිශ්‍ර බැවින් එක් කොටසක්මය. ධ්‍යාන විභංගයෙහිද තිපරිවෘත්තය ගෙනහැර බෙදා දක්වන ලදී.

**සම්මෝහ විනෝදනී නම් විභංග අර්ථ වර්ණනාවේ දොලොස්වැනි ඣාන විභංග නිද්දේසයයි.**

# 13.
# අප්පමඤ්ඤා විභංගය

ඊට අනතුරුව දැන් අප්පමඤ්ඤා විභංගයෙහි **චතස්සො** යනු ගණන නියම කිරීමය. **අප්පමඤ්ඤායො** අප්‍රමාණ වශයෙන් පැතිරීමය. මෛත්‍රායෙහි අරමුණු වශයෙන් අප්‍රමාණ සත්වයන් කෙරෙහි පතුරුවන නිසා හෝ එක් සත්වයකු කෙරෙහි නොඅඩුව සම්පූර්ණයෙන් පතුරුවන නිසා හෝ අප්‍රමාණ වශයෙන් පැතිරවීම අප්පමඤ්ඤා වේයයි කියනු ලැබේ. **ඉධ භික්ඛු** යන මෙම ශාසනයෙහි භික්ෂුව, **මෙත්තාසහගතෙන** යනු මෛත්‍රියෙන් සමන්නාගත වූ **චෙතසා** සිතින් **එකංදිසං** එක් දිසාවක. පළමුවෙන් අරමුණු කරන ලද සත්වයා අරබයා එක් දිසාවක් ඇතුළත

පැතිරවීම් වශයෙන් කියන ලදී. **එරිත්වා** ස්පර්ශ කොට අරමුණු කර. **විහරති** බ්‍රහ්මවිහාරය අධිෂ්ඨාන කරන ලද ඉරියව් විහරණය පවත්වයි. **තථා දුතියං** පෙරදිග ආදියෙහි එක්දිසාව පතුරුවා වාසය කරයි. ඊටපසුව එසේම දෙවන තුන්වන සතරවන යන අර්ථයි. **ඉති උද්ධං** මේ නයින්ම උඩ දිසාව කියන ලද්දේ වේ. **අධෝ තිරියං** යට දිසාවද හරස් දිසාවද එසේමය. මෙහි **අධො** යනු යටය. **තිරියං** යනු අනුදිසාය. මෙසේ සියළු දිසාවන්හි ස්තාලයෙහි අසකු මෙන් මෛත්‍රී සහගත සිත යවයි. නැවත යවයි යන මෙපමණකින් එක් එක් දිසාව ගෙන සීමා වශයෙන් මෛත්‍රිය පැතිරවීම දක්වන ලදී. **සබ්බධී** යනු සියළු තන්හි. **සබ්බත්තාය** හීන මධ්‍යම උත්කෘෂ්ඨ මිතුරු සතුරු මැදහත් ආදි බෙදීම් ඇති සියළුදෙනා කෙරෙහි තමා සේ සිතා මෙය පර සත්‍වය යයි බෙදීමක් නොකොට තමා ස්ථානකර ඇතැයි කියන ලදී. නොහොත් **සබ්බත්තතාය** සියළු චිත්ත භාවයෙන් ටිකක්වත් පිටත නොවිසිරෙන නය කියන ලදී. **සබ්බවන්තං** සියළු සතුන් ඇතුළත්. සියළු සතුන්ගෙන් යුක්තය යන අර්ථයය. **ලොකං** සත්වලෝකය. විපුලෙන මේ ආදි ක්‍රම දැක්වීමෙන් නැවත මෛත්‍රී සහගත සිතෙන් යයි කියන ලදී. මෙහි සීමා සහිත පැතිරවීමෙහි මෙන් නැති **ඉති** ශබ්දය හා තථා ශබ්දය නොකියන ලදී. ඒ නිසා නැවත **මෙත්තා සහගතෙන චේතසා** යයි කියන ලදී. නිගමන වශයෙන් හෝ මෙය කියන ලදී. විපුලෙන යන මෙහිද පැතිරවීම් වශයෙන් මහත්බව දතයුතුය. එය භූමි වශයෙන් **මහග්ගතං** මහග්ගත වේ. ප්‍රගුණ වශයෙන් **අප්පමාණං** අප්‍රමාණ වේ. සත්වයින් අරමුණු කිරීම් වශයෙන්ද **අප්පමාණ** වේ. ව්‍යාපාද සංඛ්‍යාත විරුද්ධ ධර්ම ප්‍රහාණයෙන් **අවෙරං** වේ. දොම්නස් ප්‍රහාණය කරන බැවින් **අබ්‍යාපජ්ඣ** වේ. දුකක් නැතැයි කියන ලද්දේ වේ. මෙය මෙත්තා සහගතෙන චෙතසාති ආදි නයින් තබන ලද මාතෘකාවේ අර්ථය.

දැන් මෙය කථඤ්ච භික්ඛවෙ, මෙත්තා සහගතෙන චෙතසා යනාදි නයින් කියන ලද පද භාජනිය වේ. එහි යම් හෙයකින් මෙම කමටහන දෝස චරිතයාට සප්පාය වේ. එහෙයින් යම්බඳු වූ මේ පුද්ගලයා මෛත්‍රී අර්පණාවට පැමිණේ. මෛත්‍රියට වස්තු වූ ඒ පුද්ගලයා දැක්වීමට **සෙය්‍යථාපි නාමං ඒකං පුග්ගලං** ආදිය කියන ලදී. එහි **සෙය්‍යථාපි නාම** යනු උපමා අර්ථයෙහි නිපාතයකි. එක් පුද්ගලයෙක් යන අර්ථයයි. **පියං පේමනීය** වූ **මනාපං** හෘදය වර්ධනය කරන. පෙර එක්ව විසීමෙන් වර්තමාන දියුණුව කැමතියෙන් පියො නම් වේ. සීලාදි ගුණ ඇතිවීමෙන් මනාප නම් වේ. දානමානාදි ආත්මය හෝ ප්‍රියභාවය ප්‍රිය වචන අර්ථ චර්යාවලින් මනාප

බව දතයුතුය. ප්‍රියභාවයෙන් මේ ව්‍යාපාදයාගේ ප්‍රහාණය වේ. එනිසා මෛත්‍රිය සැප පතුරයි. මනාප භාවයෙන් උදාසීන භාවය නොපිහිටයි. ලජ්ජා භයද එළඹෙයි. එයින් ලජ්ජා භය පාලනය වූ මෛත්‍රිය නොපිරිහෙයි. එනිසා එය උපමාකොට මෙය කියන ලදී. **පියං මනාපං** යන්න. **මෙත්තෙය්‍යා** මෛත්‍රියෙන් පතුරුවන්නේය. ඒ පුද්ගලයන් කෙරෙහි මෛත්‍රිය කරන්නේ පවත්වන්නේය යන අර්ථයයි. **එවමෙව සබ්බෙ සත්තා** යම්සේ ප්‍රිය පුද්ගලයෙකුට මෛත්‍රිය කරන්නේද මෙසේ ඒ පුද්ගලයන් කෙරෙහි අප්‍රමාණයට පැමිණ වසීභවයට උපගත මෛත්‍රියෙන් මැදහත් වෛරී සංඛ්‍යාත සියළු සතුන් කෙරෙහි අනුක්‍රමයෙන් සිත පතුරුවයි යන අර්ථයයි. **මෙත්ති මෙත්තායනා** යනාදිය පැහැදිලිමය. **විදිසංච** යන පදය හරහා හෝ යන අර්ථ දැක්වීම සඳහා කියන ලදී. **එරිත්‍වා** අරමුණු කිරීම් වශයෙන් ස්පර්ශකොට **අධිමුඤ්චිත්‍වා** අධික බැවින් මුදා යන අර්ථයයි. මුදන ලද මනාව මුදන ලද යවන ලද පළල් කරන ලද එසේ මුදා යන අර්ථය.

සබ්බධි ආදි නිද්දේසයෙහි මේ තුන් පද සර්ව සංග්‍රාහික වේ. එහෙයින් ඒවායේ එකතුවෙන් අර්ථ දැක්වීමට **සබ්බෙන සබ්බං** ආදිය කියන ලදී. එහි අර්ථය යට කියන ලද්දේමය.

විපුලාදි නිද්දේසයෙහි යමකින් **යං** අර්පණාවට පැමිණ අනත්ත සත්‍වයින් කෙරෙහි පැතිරවීම් වශයෙන් **විපුලං තං** වන්නේය. නියම වූ භූමි වශයෙන් මහග්ගත වේ. යමක් ද **මහග්ගතං තං** මහග්ගත වූයේ එය **අප්පමාණං** අප්‍රමාණ වේ. **යං අප්පමාණං** සතුරා විනාශ කිරීම් වශයෙන් **වෙරං** වේ. **යඤ්ච අවෙරංතං**. යමෙක් අවෛර වූයේද එය පහවූ ව්‍යාපාද ඇති බැවින් **අබ්‍යාපජ්ඣං** වේ. එහෙයින් **යං විපුලං තං මහග්ගතං** යනාදිය කියන ලදී. **අවෙරො අබ්‍යාපජ්ඣෙති** මෙහි ලිංග විපර්යාසයෙන් කියන ලදී. මනස සමග හෝ යෙදීම කළයුතුය. අප්‍රමාණ වූ යම් සිතක් **සො අවෙරො** එය අවෛරී මනසයි. **යො අවෙරො සො අබ්‍යාපජ්ඣො** අවෛරී වූ යමක් වේනම් එය අව්‍යාපාදයයි. මෙහි යට පද උපරි වශයෙන් හා උපරියද යට වශයෙන් අර්ථ දතයුතුය. **සෙය්‍යථාපි නාම එකං පුග්ගලං දුග්ගතං දුරූපෙතං** යන මෙයද කරුණාවට වස්තු වූ පුද්ගලයා දැක්වීමට කියන ලදී. මෙබඳු වූ පුද්ගලයින් කෙරෙහි බලවත් කාරුණිකභාවයක් උපදී. එහි **දුග්ගතං** යනු දුක සමග එක්වීමට ගිය. **දුරූපෙතං** කාය දුෂ්චරිතාදියෙන් යුක්ත වූ. ගති කුල භෝග වශයෙන් හෝ එය අභාවයෙන්

සිටි පුද්ගලයා දුග්ගත වේ. කාය දුෂ්චරිතාදියෙන් යුක්ත වූ බැවින්ද එය පරායනය කොට සිටියේ දුරුපේත යයි මෙසේ මෙහි අර්ථය දතයුතුය.

**එකං පුග්ගලං පියං මනාපං** යන මෙහිද මුදිතාවට වස්තු වූ පුද්ගලයා දැක්වීමට කියන ලදි. එහි ගති කුල භෝග ආදි වශයෙන් දීප්තිභාවයෙහි සිටියේ ප්‍රිය වේ. කාය සුචරිතාදියෙන් යුක්ත දීප්තිමත්භාවය පරායනය කොට සිටියේ මනාප යයි දතයුතුය. **නෙවමනාපං නඅමනාපං** යන මෙයද උපේක්‍ෂාවට වස්තුවූ පුද්ගලයා දැක්වීමට කියන ලදී. එහි මිත්‍රභාවයට නොපැමිණි බැවින් මනාප නැත. අමිත්‍රභාවයට නොපැමිණි බැවින් අමනාප නොවේයයි දතයුතුය. මෙහි යමක් කිවයුතු වන්නේ නම් ඒ සියල්ල චිත්තුප්පාද කාණ්ඩයෙහි කියන ලද්දේමය. භාවනා විධිවූද මේ කමටහන් විසුද්ධි මාර්ගයෙහි විස්තර වශයෙන් කියන ලදී.

## සුත්තන්ත භාජනිය.

අභිධර්ම භජනියෙහි කුසල වශයෙන්ද විපාක වශයෙන්ද කිරිය වශයෙන්ද යට චිත්තුප්පාද කාණ්ඩයෙහි බෙදන ලද නයින්ම බෙදන ලදී. මෙහි අර්ථය එහි කියන ලද නයින්ම දතයුතුය. ප්‍රශ්න විචාරකයෙහි පෙල අනුසාරයෙන්ම මෙත්තාදියෙහි කුසලාදිභාවය දතයුතුය. අරමුණු ත්‍රිකයෙහි වනාහි සියළු තුන් තිකයෙහිද කිව නොහැකි අරමුණු වේමය. අධ්‍යාත්ම අරමුණු ත්‍රිකයෙහි බාහිර අරමුණු වේ.

## පඤ්හ පුච්ඡකය

මේ අප්පමඤ්ඤා විභංගයෙහි සම්බුන් විසින් සූත්‍රාන්ත භාජනයෙහිද ලෞකික වශයෙන්ම අප්පමඤ්ඤා කියන ලදී. අභිධර්ම භාජනියෙහිද ප්‍රශ්න විචාරකයෙහිද තුනෙහි මේ නයින් ලෞකික එක් කොටසකද මෙසේ අප්පමඤ්ඤා විභංගයද තිපරිවට්ට ගෙනහැර දක්වා බෙදා දක්වන ලදී.

**සම්මෝහ විනෝදනී නම් විභංග අර්ථ වර්ණනාවේ දහතුන්වන අප්පමඤ්ඤා විභංග නිද්දේසයයි.**

# 14.
# සික්ඛාපද විභංගය

ඉන් අනතුරුව දැන් ශික්ෂාපද විභංගයෙහි **පඤ්ච** යනු ගණන පිරිසිඳීමයි. **සික්ඛාපදන්ති** හික්මිය යුතු පද. ශික්ෂා කොටස යන අර්ථයයි. තවද මතු එන්නා වූ සියළු කුසල ධර්ම හික්මිය යුතු ශික්ෂා වේ. පඤ්චශීල අංගයෙහි යම්කිසි අංගයයක් ඒ ශික්ෂාවල පිහිටීම් අර්ථයෙන් පද වේ. ශික්ෂාවන්ගේ පද බැවින් සිකබාපදානි. **පාණාතිපාතා** යනු ප්‍රාණයේ හෙළීමයි. ඝාතනය මරණය යන අර්ථයය. **වේරමණී** යනු විරතියයි. වෙන්වීමයි. **අදින්නාදානා** නුදුන්නහුගේ ගැනීම. අනුන්ගේ අයිතිය ගෙන ඒවා යන අර්ථයයි. **කාමෙසු** වනු වස්තු කාමයෙහි. **මිච්ඡාචාරා** ක්ලේශකාම වශයෙන් ලාමක හැසිරීමයි. **මුසාවාදා** නොවූ දේ කීමෙන්. **සුරාමේරය මජ්ජපමාදට්ඨානා** මෙහි සුරා යනු පිටිසුරා කැවිලි සුරා, බත් සුරා යන සුරා සෑදීමට ගන්නා බහන ලද ද්‍රව්‍ය රාශියෙන් යුත් පඤ්ච සුරා. මෙරයං යනු පැසෙමින් තිබෙන මල් ගෙඩි හකුරු පැණි සම්භාරයෙන් යුක්ත මද්‍ය පහ, ඒ දෙකම මත්වන අර්ථයෙන් මජ්ජ වේ. යම් චේතනාවක් ඒවා බීම ප්‍රමාද කරන බැවින් **පමාදට්ඨානං** වේ. එහෙයින් සුරා මේරය මජ්ජ පමාදට්ඨානාය. මෙය මාතෘකා තැබීම වන්නේය.

පද භාජනයෙහි **යස්මිං සමයෙ කාමාවචරං** යන ආදි සියල්ල යට කියන ලද නයින් පැහැදිලි වන්නේමය. ශික්ෂාපද පමණක් විරති නොවේ. චේතනාවද ශික්ෂාපදම වේ. එහෙයින් එය දැක්වීමට දෙවන නයක් දක්වන ලදී. මේ ධර්ම දෙක හුදෙක් ශික්ෂාපද නොවේ. චේතනා සම්ප්‍රයුක්ත අපර පණස් ධර්මද හික්මිය යුතු කොටස් වශයෙන් ශික්ෂාපද වේ. එහෙයින් තුන්වන නයක්ද දක්වන ලදී. එහි පරියාය සික්ඛාපද නිප්පරියාය සික්ඛා පදයයි. ශික්ෂාපද ද්විධය. එහි විරති නිප්පරියාය ශික්ෂාපද වේ. ඒවා පාණාතිපාතා වේරමණී යයි පෙලෙහි ආවේ චේතනා රහිතවය. වෙන්වන්නේ ඒවායින්ම එයින් චේතනා නැතිව වෙන්වීම, චේතනා ගෙනහැර දැක්විය. චේතනා සම්ප්‍රයුක්ත සෙසු ධර්මවලද එසේය. ව්‍යතික්‍රමණ කාලයෙහි විරුද්ධ චේතනාව දුශ්ශීල බව නම් වේ. එහෙයින් එය විරති කාලයෙහි සිල්වත් බව වශයෙන් කියන ලදී. ස්පර්ශ ආදිය ඊට සම්ප්‍රයුක්ත වන බැවින් ගන්නා ලදී.

දැන් මෙම ශික්ෂා පදවල ඥාණය උත්තේජනය කිරීම සඳහා මේ ප්‍රාණඝාතාදීන්ගේ ධර්ම වශයෙන් කොටස් වශයෙන් අරමුණු වශයෙන් වේදනා වශයෙන් මූල වශයෙන් කර්ම වශයෙන් සාවද්‍ය වශයෙන් ප්‍රයෝග වශයෙන්ද විනිස දතයුතුය. එහි ධර්ම වශයෙන් යන මේ ප්‍රාණාතිපාතාදි පහේම චේතනාව ධර්මය වේ. කොටස් වශයෙන් පහම කර්ම පථ වේ. අරමුණු වශයෙන් පාණාතිපාතය ජීවිතින්ද්‍රිය අරමුණ වේ. අදින්නාදානය සතුන් අරමුණු වේ. සංස්කාර හෝ වේ. වැරදි හැසිරීම ස්ත්‍රී පුරුෂයින් අරමුණු වේ. මුසාවාදය සතුන් හෝ සංස්කාර හෝ අරමුණු වේ. සුරාපානය සංඛාර අරමුණු වේ. වේදනා වශයෙන් පාණාතිපාතා දුක් වේදනාය. අදින්නාදාන වේදනා තුනම එහි සතුටින් නුදුන් දෙය ගැන්මෙන් සැප වේදනා වේ. බිය ඇතිකල දුක් වේදනාව මධ්‍යස්ථව ගැනීමෙන් අදුක්ඛමසුඛ වේදනාව මිච්ඡාචාරය. සැප වේදනාව හෝ අදුක්ඛමසුඛ වේදනාව හෝ වේ. මුසාවාදය අදින්නාදානය මෙන් වේදනා තුනම. සුරාපානය සැප මධ්‍යස්ථ වේදනා වේ. මූල වශයෙන් පාණාතිපාතය දෝසමූලය. අදින්නාදානය කලක ලෝභමූල කලක දෝසමූල වේ. මිච්ඡාචාරය ලෝභ මූල වේ. මුසාවාදය කිසිකලක ලෝභමූල කිසිකලක දෝස මෝහ මූල වේ. සුරාපානය ලෝභමූල වේ. කර්ම වශයෙන් මෙහි මුසාවාදය වචී කර්ම වේ. සෙස්ස කායකර්ම වේ. සාවද්‍ය වශයෙන් පාණාතිපාතය අල්ප සාවද්‍ය මහා සාවද්‍ය දෙකම ඇත. අදින්නාදානාදියද එසේය. ඒවායේ නානා කරණය යට දක්වන ලදී.

මෙය වෙන නයකි. කුසින් නැසීම අල්ප සාවද්‍ය වේ. එයින් මහත් වූවන් නැසීම මහා සාවද්‍ය වේ. ඔවුන්ද අල්ප සාවද්‍යය ඊට වඩා මහත් වූ කුරුල්ලන් නැසීම මහා සාවද්‍ය වේ. ඊට වඩා ගොයින්, ඊට වඩා සාවුන්, ඊට වඩා මුවන්, ඊට වඩා ගවයින්, ඊට වඩා අශ්වයින්, ඊට වඩා ඇතුන්, නැසීම මහා සාවද්‍ය වේ. ඔවුන්ගෙන් දුසිල් මිනිසුන් ඊට වඩා ගොසීලාදී යුත් මිනිසුන් ඊට වඩා තිසරණ ගත ඊට වඩා පන්සිල් රකින ඊටවඩා සාමණේර, ඊට වඩා පෘථග්ජන භික්ෂු ඊට වඩා සෝවාන් ඊට වඩා සකදාගාමී ඊට වඩා අනාගාමී මහා සාවද්‍ය වේ. ඊට වඩා ඛීණාශ්‍රවයන් සතු ප්‍රාණය අතිමහා සාවද්‍ය වේමය. මිච්ඡාචාරයද දුසිල් ස්ත්‍රීන් ඉක්මවීමෙහි අල්ප සාවද්‍ය වේ. ඊට වඩා ගොසීලාදිය රකින මහාසාවද්‍ය වේ. ඊට වඩා සරණාගත, පඤ්චසික්ඛා පිළිපදින, සාමණේරී-පුථුජ්ජන භික්ඛුනී, සෝතාපන්නය, සකදාගාමිනියා ඊට වඩා අනාගාමි නිසා ඉක්මවීමෙහි මහා සාවද්‍ය හෝ ඛීණාසව භික්ඛුනිය ඒකාන්ත මහා සාවජ්ජ

වේ. මුසාවාදයෙහි තුට්ටුවක ප්‍රයෝජනය සඳහා බොරුකීම අල්පසාවද්‍ය වේ. ඊට වඩා අඩ මසුවක් ඊට වඩා මාසකයක් (මසුරම) ඊට පස් මස්සක් ඊට වඩා අඩ කහවණුවක් ඊට වඩා කහවනුවල ඊට වඩා අගනා භාණ්ඩයක් ප්‍රයෝජනයට බොරුකීම මහාසාවද්‍ය වේ. බොරු කියා සංඝයා භේද කරන්නා ඒකාන්ත මහා සාවද්‍ය වේ. සුරාවෙහි පතක් පමණ බොනවිට අල්ප සාවද්‍ය වේ. දෝතක් බොනවිට මහා සාවද්‍ය වේ. කය සෙලවීම සමත් බොහෝ බී ගම් නැසීම, නිගම නැසීම කරන්නාට ඒකාන්තයෙන්ම මහා සාවද්‍ය වේ. පාණාතිපාතයට පැමිණ ඛීණාසව වධය මහා සාවද්‍ය වේ. අදින්නාදානයට පැමිණ ඛීණාසව සන්තකය හැර ගැනීම, මිච්ඡාචාරයට පැමිණ ඛීණාසව භික්ඛුනිය ව්‍යතික්‍රමණය, මුසාවාදයට පැමිණ මුසාවාදයෙන් සංඝ භේදය සුරාපානයට පැමිණ කය සෙලවීමට සමත් බොහෝ බී ගම් නියම්ගම් වැනසීම මහා සාවද්‍ය වේ. මේ සියල්ලටම වඩා මුසාවාදයෙන් සංඝ භේදය කිරීම මහා සාවද්‍ය වේ. එය නිරයේ කල්පයක් පැසීමට සමත් දරුණු ක්‍රියාවකි. ප්‍රයෝග වශයෙන් ප්‍රාණඝාතය සියතින් හා ඇණවීමෙන්, අදින්නාදානයද එසේය. මිච්ඡාචාර මුසාවාද සුරාපානය සාහත්ථිකම (සියතින්) වේ.

මෙසේ මෙහි පාණාතිපාතාදියේ ධර්මාදි වශයෙන් විනිස ඇත. පාණාතිපාතා වේරමණී ආදියෙහිද ධර්ම වශයෙන් කොටස් වශයෙන් අරමුණු වශයෙන් වේදනා වශයෙන් මූල වශයෙන් කර්ම වශයෙන් ඛණ්ඩ වශයෙන් සමාදාන වශයෙන් ප්‍රයෝග වශයෙන්ද විනිස දතයුතුය. එහි ධර්ම වශයෙන් යනු පරියාය සීල වශයෙන් පිළිවෙළින් පංච චේතනාය. කොටස් වශයෙන් කර්මපථ පහ අරමුණු වශයෙන් අන්‍යයාගේ ජීවිතින්ද්‍රිය අරමුණුකොට තමාගේ වෛර චේතනාවෙන් වෙන්කිරීම සෙස්සෙහිද මෙම නයයි. මේ සියළු ව්‍යතික්‍රමණය කළයුතු වස්තු අරමුණු කොට වෛර චේතනාවෙන්ම වෙන්කිරීම වේදනා වශයෙන් යනු සියළු සැපවේදනා හෝ මැදිහත් වේදනා හෝ වේ. මූල වශයෙන් යනු ඥාණ සම්ප්‍රයුක්ත සිතින් පවත්වන්නාට අලෝභ අදෝස අමෝහ මුල් වේ. ඥාණ විප්‍රයුක්ත සිතින් වෙන්වන්නාට අලෝභ අදෝස මුල් වේ. කර්ම වශයෙන් මුසාවාදය වචී කම්ම වේ. සෙසු ඒවා කාය කම්ම වේ. ඛණ්ඩ වශයෙන් යනු ගිහියෝ යමක් ව්‍යතික්‍රමණ කරත්ද එය එකෙණෙහි කඩ වේ. බිඳේ. අවසේස ඒවා නොබිඳේ. කුමක් හෙයින්ද? ගිහියන්ගේ සම්බන්ධ නැති සිල් වේ. යමක් හැකිවේ නම් එයම රකී. සාමණේරයින් ගේ වනාහි එකක් ව්‍යතික්‍රමණය වූ විට සියල්ලම බිඳේ. හුදකලා එකක් නොවේ.

සෙසු සිල්ද බිඳේ. නැවත මෙසේ නොකරමියි දඬුවම් කළවිට සීලය පරිපූර්ණ වේ. සමාදාන වශයෙන් යනු තමාම පන්සිල් සමාදන් වෙමියි අධිෂ්ඨාන කරන්නාද වෙන වෙනම සමාදන් වන්නාද සමාදන් වූවා වේ. අනිත් කෙනෙකුගේ සමීපයෙහි හිඳගෙන පන්සිල් සමාදන් වෙමියි සමාදන් වන්නා විසින්ද වෙන වෙනම සමාදන් වන්නා විසින්ද සමාදන් වූවා නොවේ. පයෝග වශයෙන් වන සියල්ල සාගත්‍රීක පයෝගයෙන් දතයුතුය.

දැන් යම් ශික්ෂාපදයන්ගේ කොටස් භාවයෙන් මේ පඤ්ච ශික්ෂාපදයෝ කියන ලදද ඒවා දැක්වීමට **කතමෙ ධම්ම සික්ඛා** යන මේ ශික්ෂා වාරය අරඹන ලදි. එහි සියළු චතුභූමික කුසල දහම් හික්මිය යුතු බැවින් ශික්ෂා වේ. එහෙයින් ඒවා දැක්වීමට **යස්මිං සමයෙ කාමාවචරං** යනාදිය කියන ලදී. එහි යට චිත්තුප්පාද කාණ්ඩයෙහි කියන ලද නයින්ම පෙල විස්තර කොට අර්ථය දතයුතුය. මෙහි වනාහි මාතෘකාව පමණක් කියන ලදී.

## අභිධම්ම භාජනිය

ප්‍රශ්න විචාරකයෙහි පෙල අනුසාරයෙන්ම ශික්ෂා පදවල කුසලාදි- භාවය දතයුතුය. ආරම්මණ ත්‍රිකයෙහි වනාහි මෙහි යම් ශික්ෂාපද සතුන් අරමුණු කෙරේයයි කියන ලද ඒවා සතුන් යයි සංඛ්‍යාවෙන්ම ගිය සංඛාරම අරමුණු කරයි. යම්හෙයකින් මේ සියල්ල සම්පත්ත විරති වශයෙන්ම දක්වන ලදද එහෙයින් සුළු අරමුණුද වර්තමාන අරමුණුද කියන ලදී. යමකින් වෙන්වේද ඒ වස්තුවේ අත්‍යන්ත බාහිර බවින් හා සියළුම බාහිර අරමුණ බව දතයුතුය.

## පඤ්හ පුච්ඡකං

මේ ශික්ෂාවල විභංගයෙහි සම්බුදුන් විසින් අභිධර්ම භාජනියෙහි ප්‍රශ්න විචාරයෙහිද ලෞකික ශික්ෂාපද කියන ලදී. මේ නය දෙකම ලෞකික බැවින් එක් කොටසක්මය. මෙසේ මේ ශික්ෂාපද විභංගයෙහි දෙපරිවෘත්තය ගෙනහැර බෙදා දක්නා ලදී.

**සම්මෝහ විනෝදනී නම් විභංග අර්ථ වර්ණනාවේ තුදුස්වන ශික්ඛාපද විභංග නිද්දේසයයි.**

# 15.
# පටිසම්භිදා විභංගය

ඊට අනතුරුව දැන් පටිසම්භිදා විභංගයෙහි **චතස්සො** යනු වෙන්කිරීමය. **පටිසම්භිදා** යනු ප්‍රභේද යනුයි. යම්හෙයකින් අන්‍ය වශයෙන් **අත්ථෙ ඤාණං අත්ථපටිසම්භිදා** යනාදිය කීහ. එහෙයින් අනිකක් නොවේ. කිසියම් ප්‍රභේදයක් ඤාණයේම ප්‍රභේදයකැයි දතයුතුය. මෙසේ චතස්සො පටිසම්භිදා යන පදයෙන් ඤාණ ප්‍රභේද සතරත් යයි මේ අර්ථය සංග්‍රහ කරන ලදී. **අත්ථ පටිසම්භිදා** යන අර්ථයෙන් පටිසම්භිදා අර්ථ ප්‍රභේදවලින් යන ලක්‍ෂණ පැහැදිලි කරන විමසීම් කරණයෙහි සමත් අර්ථයෙන් ප්‍රභේදගත ඤාණය යන අර්ථයය. සෙසු පදවලද මෙම නයයි. ධර්මප්‍රභේද වූ ලක්‍ෂණ පැහැදිලි කරන විමසීම් කරණයෙහි සමත් ධර්මයෙහි ප්‍රභේදගත වූ ඤාණය **ධම්මපටිසම්භිදා** නම් වේ. නිරුක්ති ප්‍රභේදවල ලක්‍ෂණ පැහැදිලි කරන විමසීම් කරණයෙහි සමත් නිරුක්ති කීමෙහි ප්‍රභේදගත වූ ඤාණය **නිරුත්ති පටිසම්භිදා** නම් වේ. පටිභාන ප්‍රභේදවල ලක්‍ෂණ පැහැදිලි කරන විමසීම් කරණයෙහි සමත් වූ ප්‍රතිභානයෙහි ප්‍රභේදගත වූ ඤාණය **පටිභාන පටිසම්භිදා** නම් වේ.

දැන් යම්සේ පටිසම්භිදාව බෙදා දක්වන්නේ **අත්ථෙ ඤාණං පටිසම්භිදා** යනාදිය කීහ. එහි **අත්ථො** යනු සංක්‍ෂේපයෙන් හේතුඵලය. එයද හේතු වශයෙන් උත්සාහ වියයුතුය, යායුතු පැමිණිය යුතු එහෙයින් අර්ථයයි කියනු ලැබේ. ප්‍රභේද වශයෙන් ප්‍රතයයෙන් උපන් යම් කිසිවක් නිර්වානය, කියන ලද අර්ථය, විපාකය කිරිය යන මේ පඤ්ච ධර්මය අර්ථ නය දතයුතුය. ඒ අර්ථයෙහි ප්‍රභේදගත වූ ඤාණය **අත්ථපටිසම්භිදා** වේ. **ධම්මො** යනු සංක්‍ෂේපයෙන් ප්‍රත්‍යයය. එයින් ඒ ඒ දෙය විධාන කෙරේ පවත්වයි පමුණුවයිද එසේ හෙයින් ධර්ම යයි කියනු ලැබේ. ප්‍රභේද වශයෙන් වනාහි ඵල නිපදවන කිසි හේතුවක්, ආර්ය මාර්ගය, භාසිතය, කුසලය, අකුසලය යන මේ පඤ්ච ධර්ම ධර්මය යයි දතයුතුය. ඒ ධර්මය ප්‍රත්‍යවේක්‍ෂා කරන්නාට ඒ ධර්මයෙහි ප්‍රභේද ගතවූ ඤාණය ධම්මපටිසම්භිදා නම් වේ. එහි **ධම්ම නිරුත්තාභිලාපෙ ඤාණං** යන එම අර්ථයෙහිද ධර්මයෙහිද යම් ස්වභාව නිරුක්තියක් වේද එය කීමෙහි ඒ ස්වභාව නිරුක්ති ශබ්දය අරමුණු කොට ප්‍රත්‍යවේක්‍ෂා කරන්නාට ඒ ස්වභාව නිරුක්ති කීමෙහි ප්‍රභේද ගතවූ ඤාණය **නිරුත්ති පටිසම්භිදා**

නම් වේ. මෙසේ නිරුත්ති පටිසම්භිදාව ශබ්දය අරමුණුකොට හටගත්තේය. ප්‍රඥප්තිය අරමුණුකොට නොවේ. කුමක් හෙයින්ද? ශබ්දය අසා මෙය ස්වභාව නිරුක්ති යයිද මෙය ස්වභාව නිරුක්තිය නොවේ යයිද දැනගනිති. පටිසම්භිදාවට පැමිණි තැනැත්තා 'ඵස්ස' යයි කී කල්හි මෙය ස්වභාව නිරුත්තියයි දැනගනී. ඵස්සාති හෝ ඵස්සන්ති හෝ කී කල මෙය ස්වභාව නිරුක්ති නොවේ යයි දැනගනී. වේදනාදියෙහිද මෙම නයමයි. අන්‍ය වූ නාම ආඛ්‍යාත උපසර්ග ව්‍යඤ්ජන ශබ්ද මේ තෙමේ දනීද නොදනීද? යමකින් ශබ්දය අසා මෙය ස්වභාව නිරුක්තිය මෙය ස්වභාව නිරුක්තිය නොවේ යයි දනීද එයින් එයද දන්නේය. මේ පටිසම්භිදා කිස බහා තබා මේ වස්තුව කියන ලදී.

තිස්සදත්ත තෙරුන් වහන්සේ වනාහි බෝධි මණ්ඩලයේ දී රන් සලාක ගෙන භාෂා දහඅට අතුරෙන් කවර භාෂාවකින් කියම්ද? යයි පැවරීය. එය වනාහි උන්වහන්සේ විසින් ඉගෙනගෙන සිට කරන ලද පැවරීමකි. පටිසම්භිදාවට පැමිණ කරන ලද්දක් නෙමේ. උන්වහන්සේ මහා ප්‍රඥාවන්ත බැවින් ඒ ඒ භාෂා කතාකොට උගත්හ. (සිහි නොවේද? භදන්ත සෝරත, අනඳමෙත්, රාහුල, ගුණසිරි හිමිවරුන් හා මලලසේකර ආදීහු) එසේ ඉගෙනීමේ සිට මෙසේ පැවරීය. භාෂාව නම් සත්වයා ඉගෙන ගනිති. යයි කියා මෙහි වෙයි කියන ලදී. මව්පියෝ ළමයා කුඩා කල ඇඳෙහි හෝ පුටුවෙහි හෝ හොවා ඒ ඒ දේවල් කියමින් ඒ ඒ වැඩ කරති. දරුවෝ ඒ ඒ භාෂා උගනිති. මෙයින් මෙය කියන ලදැයි කල් ගතවනවිට භාෂාවේ සියල්ලම දනිති. මව දෙමළ නම් පියා ආන්ද්‍රයකු නම් දරුවා පළමුව මවගේ කථා අසයි නම් දෙමළ භාෂාව කතා කරන්නේය. පියාගේ කතාව පළමුව අසන්නේ නම් ආන්ද්‍රා භාෂාව කතා කරන්නේය. දෙදෙනාගේම කථා නොඅසන්නේ නම් මාගධ භාෂාව කතා කරන්නේය. යමෙක ගමක් නොවන මහ වනයෙහි උපන්නේ නම් එහි කතාකරන කිසිවෙක් නැත්තේ නම් හේ ද තමාගේ ධර්මතාවෙන් වචන උපදවමින් මාගධ භාෂාව කතා කරන්නේය. නිරය, තිරිසන් යෝනිය, ප්‍රේත විෂය, මනුෂ්‍ය ලෝකය, දිව්‍ය ලෝකය යන සැමතැනම මාගධ භාෂාව ඉතා බහුලය. සෙසු ඔට්ට, කිරාත, අන්ධක, යෝනක දමිළ භාෂාදි භාෂා දහඅටක් පවතී. බ්‍රහ්ම ව්‍යාවහාර ආර්ය ව්‍යවහාර සංඛ්‍යාත වූ මේ එකම මාගධ භාෂාව නොපෙරළේ. වෙනස් නොවේ. සම්බුදුන් වහන්සේද ත්‍රිපිටක බුද්ධ වචනය භාෂාවකට නගන්නේ මාගධ භාෂාවටම නැගූහ. කවර හෙයින්ද? මෙසේ අර්ථය ගෙනහැර දැක්වීමට පහසු වේ. මගධ

භාෂාවට නැගූ බුද්ධ වචනයේ පටිසම්භිදාවට පැමිණි අයගේ සෝතපථ ගමනම පමා විය. සෝතයෙහි ගැටණු පමණින්ම සියක් නයින් දහසක් නයින් අර්ථය වැටහේ. වෙනත් භාෂාවකට බුද්ධ වචනය නැගුනේ නම් පෙළ පෙළා ඉගෙනගත යුතු වේ. බොහෝ ඉගෙණ ගත් පෘථග්ජනයාගේ පටිසම්භිදාවට පැමිණීමක් නම් නැත්තේය. ආර්ය ශ්‍රාවකයකු නොවන පටිසම්භිදා ලාභියෙක් නැත්තේය.

ඤාණෙසු ඤාණං සියළු ඤාණය අරමුණු කර ඤාණය ප්‍රත්‍යවේක්ෂා කරන්නාට ප්‍රභේදගත ඤාණය පටිභාන සම්පදා වේ. මේ සතර පටිසම්භිදාව ස්ථාන දෙකක ප්‍රභේදය යයි. කරුණු පහකින් පැහැදිලි වන්නේ යයි දතයුතුය. කුමන දෙකකද? සේක භූමියද අසේක භූමියද එහි සැරියුත් මහමුගලන් මහකසුප් මහා කාත්‍යායන, මහාකොට්ඨිත යන අසූමහා ස්ථවිරයන්ගේ පටිසම්භිදාව අසේඛ භූමි ප්‍රභේදයයි. අනඳ තෙරුන් චිත්ත ගහපති ධම්මික උපාසක උපාලි ගහපති ඛුජ්ජුත්තරා උපාසිකා මේ ආදීන්ගේ පටිසම්භිදාව සේඛභූමි ප්‍රභේදයයි.

කරුණු පසකින් පටිසම්භිදාව පැහැදිලි වන්නේ කෙසේද? අධිගමයෙන් පරියත්තියෙන් ශ්‍රවණයෙන් ප්‍රශ්න කිරීමෙන් පූර්වයෝගයෙන් යනුවෙනි. එහි අධිගමය නම් රහත් බවයි. ඊට පැමිණියහුට පටිසම්භිදා පැහැදිලි වෙයි. පරියත්තිය නම් බුද්ධ වචනයයි. එය ඉගෙන ගන්නාට පටිසම්භිදා පැහැදිලි වේ. ධම්ම සවණ නම් සකස්ව දහම් අසන්නාට පටිසම්භිදාව පැහැදිලි වෙයි. පරිපුච්ඡා නම් අට්ඨ කථාවෝය. ඉගෙන ගත් පෙලෙහි අර්ථය කියන්නාට පටිසම්භිදා පැහැදිලි වේ. පුබ්බයෝග නම් පෙර යෝගාවචර භාවය. අතීත භවයෙහි හරණ පච්චාහරණ (ගෙනයන ආපසු ගෙනෙන) කමටහන් ඇති බව. පුබ්බ යෝගාවචරයා පටිසම්භිදා පැහැදිලි වේ. එහි රහත්භාවයට පැමිණීමෙහි පුනබ්බසු කුටුම්බික ප්‍රත්‍යයයි නිස්සන්‍දෝරස්ස පටිසම්භිදාව පැහැදිලි වූහ.

උන්වහන්සේ වනාහි දඹදිව දී බුද්ධ වචනය ඉගෙන පරතෙරට ගොස් යෝනක ධම්මරක්ඛිත තෙරුන් සමීපයේ බුද්ධ වචනය ඉගෙනගෙන එන්නේ නැවට නැගෙන තොටුපලේ එක පදයක උපන් සැකය නිසා යොදුන් සිය ගණනක් පැමිණි මාර්ගය තබා ආපසු හැරී ආචාර්යයන් වහන්සේ වෙත යන්නේ එක් කෙළෙඹියෙකුගේ ප්‍රශ්නයක් විසඳීය. හෙතෙම පැහැදී ලක්ෂයක් අගනා කම්බිලියක් (වටිනා වස්ත්‍රය) දුන්නේය.

උන්වහන්සේද එය රැගෙන ගොස් ඇදුරු තෙරුන්ට දුන්නේය. තෙරුන් වහන්සේ කම්බිලිය වෑයෙන් කපා හිඳින තැන බිම ඇතිරියක් කළහ. කුමක් සඳහාද? පශ්චිම ජනයාගේ අනුග්‍රහය පිණිසය. උන්වහන්සේට මෙබඳු සිතක් විය. අප විසින් යන ලද මාර්ගය ආවර්ජනා කොට අනාගතයෙහි සබ්‍රහ්මචාරීහු ප්‍රතිපත්ති පිරිය යුතුයයි හඟින්නේ යයි. තිස්ස තෙරහුද ආචාර්යවරයා සමීපයෙහි සැක හැර දඹකොල පටුනේ බැස සැමලුව අමදින වෙලාවට වාලුකා විහාරයට පැමිණ හැමදූහ. උන්වහන්සේ ඇමදි තැන් බලා වීතරාගී භික්ෂුවකගේ හැමදීම යයි. තෙරුන් විමසීම් පිණිස ප්‍රශ්නයක් ඇසූහ. තෙරුන් වහන්සේ පටිසම්භිදාවට පැමිණ ඇති හෙයින් අසන අසන ප්‍රශ්නය විසඳූහ. බුද්ධ වචනයෙහි වනාහි තිස්සදත්ත තෙරුන්වද නාගසේන තෙරුන්වද පටිසම්භිදා පැහැදිලි විය.

තිස්දත් තෙරහු වනාහි තලවෙහෙරවාසී ධම්මදින්න තෙරුන්ගේ බෑණා කෙනෙකි. බුරගින් රහත්බවට පැමිණියහ. මාම තෙරුන්ගේ ධර්ම විනිශ්චය ස්ථානයෙහි හිඳ අසන්නේ තුන් පිටකයම ප්‍රගුණ කළහ. ඉගෙන ගත් වෙලේ අර්ථය කියන තිස්සදත්ත තෙරුන්ට පටිසම්භිදා පැහැදිලි විය. ගතපච්චාගත වත් සපුරා අනුලෝම කමටහන දක්වා උත්සාහවත් කරවා පැමිණි අය පටිසම්භිදාව පැහැදිලි පුබ්බ යෝගාවචරයන්ගේ ඇතුළත නැත. මේ කරුණු අතර පරියත්ති සවණ පරිපුච්ඡා යන කරුණු තුන ප්‍රභේද අනුව බලවත් වේ. පුබ්බයෝග අධිගමය බලවත් ප්‍රත්‍යයකි. එහි ප්‍රභේද වේද නොවේද? වේ. එය ඔබේ නොවේ. පරියත්ති ආදි තුණ පෙර විය යුතුද නැද්ද? පුබ්බයෝගයෙන් පෙර හෝ දැන් හෝ සංඛාර සම්මර්ශනය නැතිව පටිසම්භිදාවක් නැත. මේ දෙකම එකතුව පටිසම්භිදාවට උපස්ථම්භක වී පැහැදිලි කෙරෙති.

## සංගහ වාර වර්ණනාවය.

දැන් සංග්‍රහ වාරයෙහි අර්ථ පසද ධර්මයද සංග්‍රහ කරන ලදී. ජවනය ප්‍රභේද දක්වන නයින් පටිසම්භිදාව බෙදීමට නැවත චතස්සො ආදි නයින් ප්‍රභේද වාරය අරඹන ලදී. එය සච්චවාර හේතුවාර ධම්මවාර පච්චයාකාර වාර පරියත්තිවාර වශයෙන් පඤ්චවිධය. එහි ප්‍රත්‍යයෙන් උපන් දුක්ඛ සත්‍යයේද ප්‍රත්‍යයෙන් පැමිණිය යුතු නිර්වාණයේද හේතු භාවයෙන් ඵල නිපදවන සමුදයේද නිර්වාණයට පමුණුවන ආර්ය මාර්ගයේද ධර්මත්‍රය දැක්වීමට සච්චවාරය කියන ලදී. හේතුඵලවලින්

නිපන් යම්කිසිවක හේතුවේ ධර්මභාවයද ඵලයේ අර්ථ භාවයද දැක්වීමට හේතුවාරය කියන ලදී. එහිද හේතුඵල ක්‍රම වශයෙන් පිළිවෙළින් පළමුව ධම්ම පටිසම්භිදාව දක්වන ලදී. රූපාරූප භේදයෙන් යුත් ධර්ම හේතුවෙන් හටගත්තේය. ඒවායේ අර්ථ භාවයද ඒ ඒ රූපාරූප ධර්මප්‍රභේද හේතු වේ. ස්වභාවය දැක්වීම ධම්මවාරය කියන ලදී. ජරාමරණාදියේ අර්ථභාවය ජරාමරණ ද සමුදය සංඛ්‍යාත ජාති ආදියේ ස්වභාවය දැක්වීම පච්චයාකාරය කියන ලදී. පරියත්ති සංඛ්‍යාත ඒ ඒ භාෂිතවල ස්වභාවය භාෂිත සංඛ්‍යාත ප්‍රත්‍යයෙන් පැමිණිය යුතු භාෂිතයේ අර්ථ භාවයද දැක්වීමට පරියත්තිවාරය කියන ලදී. එහිද යමකින් භාෂිතය දැන එහි අර්ථය දනී. එහෙයින් භාෂිතය භාෂිත ක්‍රමයෙන් උපිළිවෙලින් පළමුව ධර්ම පටිසම්භිදාව දක්වන ලදී. පරියත්ති ධර්මයේ ප්‍රභේද දැක්වීම සඳහා එහි ධර්ම පටිසම්භිදාව කවරේදැයි ප්‍රශ්න කිරීම් පෙරටුව පටිනිද්දේසවාරය කියන ලදී. එහි යුක්තත්ති ආදි අංග නවයකින් අවශේෂ දෙයක් නැතිව පෙළ ගන්නා ලදි. මේ එම භාෂිතයේ අර්ථයයි. මේ ස්ථානයේ භාෂිත වශයෙන් සියළුම පෙළ පෙන්නන ලදී.

### සුත්තන්ත භාජනීය.

එහි පටිසම්භිදා තුනක් ලෞකිකය. අර්ථ පටිසම්භිදාව ලෞකික ලෝකෝත්තර මිශ්‍රය. එයද නිවන් අරමුණ මග්ගඵල ඥාණ වශයෙන් ලෝකෝත්තර වේ. අභිධර්ම භාජනියෙහි කුසල අකුසල විපාක කිරිය වශයෙන් වාර හතරකින් බෙදන ලදී. එහි යට චිත්තුප්පාද කාණ්ඩයෙහි යම් පමණ කුසල චිත්ත බෙදන ලද්ද ඒවායේ සියල්ලම වශයෙන් එකිනෙකේ බෙදන නිද්දේසයෙහි සතර බැගින් පටිසම්භිදා බෙදන ලදැයි දතයුතුය. අකුසල සිත්වලද මෙම නයය. විපාක කිරිය වාරයෙහි විපාක කිරියවල අර්ථයෙන් සංග්‍රහ කරන ලද බැවින් ධර්ම පටිසම්භිදාව හැර විපාක සිත් එක එකද කිරිය සිත්වලද තුන බැගින් පටිසම්භිදා බෙදන ලදී. පෙළ වනාහි නය මාතෘකා පමණක් දක්වා සංක්ෂේප කරන ලදී. එය යට ආවා වූ විස්තර වශයෙන් දැනගත යුතුය. කුසලාකුසල වාරයෙහි ඒවායේ විපාක ඥාණය අර්ථපටිසම්භිදායයි කුමක් හෙයින් කියන ලදද? මෙසේ මෙහි යම් ධර්මයන්ගේ මේ විපාකය ඒවායේ ඥාණය ධම්ම පටිසම්භිදායයි මෙසේ නොකියන ලද්දේ කුමක් හෙයින්ද? යට කියන ලද බැවිනි. මෙසේ ඒවායේ විපාක ඥාණය අර්ථ පටිසම්භිදා යයි යට කියන ලද බැවින් මේ අර්ථපටිසම්භිදාවද මෙහි නොකිය යුතු වන්නේද? නොකිවයුතු

නොවන්නේය. කුමක් නිසාද? යට විපාක කිරිය චිත්තුප්පාද වශයෙන් නොකියන ලද බැවිනි. කිරිය වාරයෙහිද යම් ධර්මයන්ගේ මේ කිරිය යයි වචනයම නොයෙදී යයි. මේ වාර දෙකෙහි තුන බැගින් පටිසම්භිදාව බෙදන ලදී. එහි **යාය නිරුත්තියා තෙසං ධම්මානං පඤ්ඤත්ති හොති** යම් නිරුක්තියකින් ඒවායේ ස්පර්ශය වේ යයි ආදි නයින් කියන ලද ධර්මයන්ගේ මේ ස්පර්ශය මේ වේදනාව යයි මෙසේ පැනවීම් වේ. එහි **ධම්ම නිරුත්තාභිලාපෙ** ඒ අර්ථයෙහි ධර්මයෙහි පවත්වන ඒ ධර්ම නිරුක්තියේ ස්වභාව පැණවීමෙන් කීමෙහි ඤාණය, කියන ශබ්දය අරමුණු කොට උපන් ඤාණයම මෙහිද කියන ලදී. **යෙන ඤාණෙන** යම් ප්‍රතිභාන පටිසම්භිදා නුවණින්. **තාණි ඤාණානි ජානාති** ඉතිරි පටිසම්භිදා ඤාණ තුන දනියි.

දැන් යම් ඤාණයක් වේ නම් එය දනී. එසේම එහි සෙසු පවත් දැක්වීමට **ඉමානි ඤාණානි ඉදමත්ථ ජොතකානි** යයි කියන ලදී. එහි **ඉදමත්ථ ජොතකානි** යන මේ අර්ථයේ ප්‍රකාශ කිරීම මේ නම් අර්ථය ප්‍රකාශ කෙරෙති. පිරිසිඳති යන අර්ථයයි. **ඉති ඤාණෙසු ඤාණං** මේ ආකාරයෙන් පවතින ඤාණ තුනෙහි ඤාණය පටිභාන සම්භිදා නම් වේ. එහි කිසිවක් මේ පටිභාන සම්භිදා එය මේ කිස එහි මේ කිස යයි ඉතිරි පටිසම්භිදාවල කිස දනී. තමාට ඒවායේ කෘත්‍ය කිරීමට හැකි නොවේ. අල්පශ්‍රැත ධර්ම කථිකයෙකුට බහුස්සුත ධර්මකථිකයෙකු මෙනි.

භික්ෂු දෙනමක් වූහ. එක්කෙනෙක් බහුස්සුත විය. එක්කෙනෙක් අප්පස්සුත විය. එකටම එකම ධර්මකථා මාර්ගය උගත්හ. එහි අප්පසුත තෙමේ ස්වර (හඬ) සම්පන්න විය. අනිත් භික්ෂුව මද හඬ ඇත්තේ විය. ඔවුනතුරෙහි අප්පස්සුත භික්ෂුව ගිය ගිය තැන තමාගේ ස්වර සම්පත්තියෙන් සියළු පිරිස් කළඹා ධර්මය දෙසීය. ධර්මය අසන්නෝ තුටුපහටු වූ සිතින් යුක්තව උන්වහන්සේ බණ කියන හැටියට එක් ත්‍රිපිටක ධරයෙක් වන්නේ යයි කථාවෙති. බහුස්සුත භික්ෂුව වනාහි මුන්වහන්සේ ත්‍රිපිටක ධරයෙක්ද නැද්ද යන්න ධර්මශ්‍රවණයෙන් දැනගන්න යයි කීවේය. හේ මෙසේ කිසිවක් කීවේය. යම්සේ සියළු පිරිස කළඹා දහම් දෙසීමට හැකිය. මෙසේ කීමේ සමත්කමක් අපට නැත. එහි කිසියම් පටිභාන සම්පත්තියක් බහුස්සුතයට ඇත. ඒ නිසා අප්පස්සුතයාව වඩා කෘත්‍යයක් දනී. තෙමේ වනාහි ඒ කිස කිරීමට නොහැකි වේයයි දතයුතුය. සෙස්ස පැහැදිලිය.

මෙසේ කුසල් සිත ඉපදීම් ආදි වශයෙන් පටිසම්භිදාව බෙදා දැන් ඒවායේ උත්පත්ති ස්ථාන වූ ක්ෂේත්‍ර දැක්වීමට නැවත **චතස්සො පටිසම්භිදා** යනාදිය කීහ. එහි **තිස්සො පටිසම්භිදා** කාමාවචර **කුසලතො චතුසු ඤාණ සම්පයුත්ත චිත්තෙසු** යන මෙය සේඛයන්ගේ වශයෙන් කීහ. ඔවුන් ධර්මය ප්‍රත්‍යවේක්ෂා කරන කාලයෙහි යට කියන ආකාර අරමුණු කර ඤාණ සම්පයුත්ත කුසල් සිත් සතරෙහි ධම්ම පටිසම්භිදාව උපදී. එසේ නිරුක්තිය ප්‍රත්‍යවේක්ෂා කරන කාලයෙහි ශබ්දය අරමුණුකර නිරුත්ති පටිසම්භිදාවද උපදී. සියළු තන්හි ඤාණය අරමුණුකොට පටිභාන සම්භිදාවද **කිරියතො චතුසු** යන මෙය වනාහි අසේඛයින්ගේ වශයෙන් කියන ලදී. ඔවුන් ප්‍රත්‍යවේක්ෂා කරන කාලයෙහි යටකියන ලද පස්ආකාර ධර්මය අරමුණු කර ඤාණ සම්ප්‍රයුක්ත කිරිය සිත් සතරෙහි ධම්ම පටිසම්භිදාව උපදී. එසේම නිරුක්තිය ප්‍රත්‍යවේක්ෂා කරන කාලයෙහි ශබ්දය අරමුණුකර නිරුත්ති පටිසම්භිදාව උපදී. ඤාණය ප්‍රත්‍යවේක්ෂා කරන කාලයෙහි සියළු තැන ඤාණය අරමුණුකර පටිභාන පටිසම්භිදාව උපදී. **අත්‍ථපටිසම්භිදා - එතෙසු චෙව උප්පජ්ජති** මෙය වනාහි සේඛාසේඛ වශයෙන් කියන ලදී. එසේම සේඛයින් අත්‍ථ ප්‍රත්‍යවේක්ෂා කරන කාලයෙහි යට කියන ලද අර්ථභේද අරමුණුකොට ඤාණ සම්ප්‍රයුක්ත කුසල් සිත් සතරෙහි මෙය උපදී. මාර්ගඵල කාලයෙහිද මාර්ග ඵලවලද අසේඛයට අත්‍ථ ප්‍රත්‍යවේක්ෂා කරන කාලයෙහි යට කියන ලද භේද සහිත අර්ථය අරමුණුකොට ඤාණ සම්ප්‍රයුක්ත කිරිය සිත් සතරෙහි උපදී. ඵල කාලයෙහිද ඉහළම සාමඤ්ඤ ඵලයෙහි යන මෙසේ මෙය සේක අසේකයින්ට ඉපදෙමින් මේ භූමිවල උපදී. මේ නය භූමි දැක්වීම සඳහා දක්වන ලදී.

## අභිධම්ම භාජනිය

ප්‍රශ්න විචාරකයෙහි පෙල ඇසුරෙන්ම පටිසම්භිදා සතරේ කුසලාදි භාවය දතයුතුය. ආරම්මණ ත්‍රිකයෙහි නිරුක්ති පටිසම්භිදාව ශබ්දයම අරමුණු කරයි. එය පරිත්තාරම්මණයකි. අත්‍ථපටිසම්භිදාව කාමාවචර විපාක කිරියද ප්‍රත්‍ය සමුත්පන්නයද ප්‍රත්‍යවේක්ෂා කරන්නාට පරිත්තා- රම්මණයකි. කියන ලද ප්‍රභේදයම රූපාවචර අරූපාවචර අත්‍ථ ප්‍රත්‍යවේක්ෂා කරන්නාට පරිත්තාරම්මණයකි. කියන ලද ප්‍රභේදයම රූපාවචර අරූපාවචර අත්‍ථ ප්‍රත්‍යවේක්ෂා කරන්නාට මහග්ගත අරමුණු වේ. ලෝකෝත්තර විපාකාර්ථයද පරමාර්ථයද නිවන ප්‍රත්‍යවේක්ෂා කරන්නාට අප්පමාණ අරමුණ වේ. ධම්ම පටිසම්භිදාව කාමාවචර කුසල දහම් අකුසල දහම් පච්චයද ප්‍රත්‍යවේක්ෂා කරන්නාට පරිත්තාරම්මණ වේ. රූපාවචර

අරූපාවචර කුසලදහම් පච්චය ප්‍රත්‍යවේක්‍ෂා කරන්නාට මහග්ගත අරමුණ වේ. ලෝකෝත්තර කුසලදහම් පච්චය දහම් ප්‍රත්‍යවේක්‍ෂා කරන්නාට අපප්මාණ අරමුණ වේ. පටිභාන පටිසම්භිදාව කාමාවචර කුසල විපාක කිරිය ඥාණ ප්‍රත්‍යවේක්‍ෂා කරන්නාට පරිත්තාරම්මණය වේ. රූපාවචර අරූපාවචර කුසල විපාක කිරිය ඥාණ ප්‍රත්‍යවේක්‍ෂා කරන්නාට ඒ අරමුණු දැනගන්නාටද මහග්ගත අරමුණු වේ. අත්‍ථපටිසම්භිදාව සහජාත හේතු වශයෙන් මාර්ගහේතුක වන්නේය. විරිය දෙටු මාර්ග භාවනාවෙන් මාර්ගාධිපති වන්නේය. ඡන්‍ද චිත්ත දෙටුවීමෙන් නොකිව හැකිය. ඵල කාලයෙහිද නොකිව හැකිය. ධම්මපටිසම්භිදාව මාර්ගය ප්‍රත්‍යවේක්‍ෂා කරන කාලයෙහි මාර්ගය අරමුණු වේ. මාර්ගය ගරුකොට ප්‍රත්‍යවේක්‍ෂා කරන්නාට මාර්ගාධිපති අරමුණු වේ. සෙසු ඥාණ ප්‍රත්‍යවේක්‍ෂා කරන කාලයෙහි නොකිව හැකි අරමුණකි. නිරුක්ති පටිසම්භිදාව වර්තමාන ශබ්දයම අරමුණු කරයි. එය වර්තමාන අරමුණකි. අත්‍ථ පටිසම්භිදාව අතීත විපාකාර්ථ කිරිය අර්ථ ප්‍රතයය සමුත්පන්න අර්ථයද ප්‍රත්‍යවේක්‍ෂා කරන්නාට අතීත අරමුණු වේ. අනාගතය ප්‍රත්‍යවේක්‍ෂා කරන්නාට අනාගත අරමුණ වේ. වර්තමානය ප්‍රත්‍යවේක්‍ෂා කරන්නාට වර්තමාන අරමුණ වේ. ලෝකෝත්තර පරමාර්ථය ප්‍රත්‍යවේක්‍ෂා කරන්නාට අරමුණ කිවහැකි නොවේ. ධම්මපටිසම්භිදා අතීත කුසල අකුසල පච්චය දහම් ප්‍රත්‍යවේක්‍ෂා කරන්නාට අතීත අරමුණ වේ. අනාගතය ප්‍රත්‍යවේක්‍ෂා කරන්නාට අනාගත අරමුණ වේ. වර්තමානය ප්‍රත්‍යවේක්‍ෂා කරන්නාට වර්තමාන අරමුණ වේ. පටිභාන පටිසම්භිදා අතීත කුසල විපාක කිරිය ඥාණ ප්‍රත්‍යවේක්‍ෂා කරන්නාට අතීත අරමුණ මේ අනාගතය ප්‍රත්‍යවේක්‍ෂා කරන්නාට අනාගත අරමුණ වේ. වර්තමානයේ ප්‍රත්‍යවේක්‍ෂා කරන්නාට වර්තමාන අරමුණ වේ. නිරුත්ති පටිසම්භිදාව ශබ්දාරම්මණ බැවින් බාහිර අරමුණ වේ. ඉතිරි තුන අත්‍ථ පටිසම්භිදාව අජ්ඣධ විපාක කිරියඅර්ථ පච්චය සමුත්පන්නයද ප්‍රත්‍යවේක්‍ෂා කරන්නාට අධ්‍යාත්ම අරමුණ වේ. බාහිර ප්‍රත්‍යවේක්‍ෂා කරන්නාට බාහිර අරමුණ වේ. අජ්ඣත්ත බහිද්ධ ප්‍රත්‍යවේක්‍ෂා කරන්නාට අධ්‍යාත්ම බාහිර අරමුණ වේ. පරමාර්ථ ප්‍රත්‍යවේක්‍ෂා කරන්නාට බාහිර අරමුණ වේ.

ධම්ම පටිසම්භිදා අජ්ඣත්ත කුසල් අකුසල ප්‍රත්‍ය ධර්ම ප්‍රත්‍යවේක්‍ෂා කරන කලයෙහි අධ්‍යාත්ම අරමුණ වේ. බාහිර කුසල් අකුසල් ප්‍රත්‍යධර්ම ප්‍රත්‍යවේක්‍ෂා කරන කාලයෙහි බාහිර අරමුණ වේ. අජ්ඣත්තා බහිද්ධා කුසල අකුසල පච්චය ධම්ම ප්‍රත්‍යවේක්‍ෂා කරන කාලයෙහි අජ්ඣත්ත

බහිද්ධ අරමුණ වේ. පටිභාන පටිසම්භිදා අජ්ඣත්ත කුසල විපාක කිරිය ඤාණ ප්‍රත්‍යවෙක්ෂා කරන කාලයෙහි අධ්‍යාත්ම අරමුණ වේ. බාහිර කුසල විපාක කිරිය ඤාණ ප්‍රත්‍යවේක්ෂා කරන කාලයෙහි බාහිර අරමුණ වේ. අජ්ඣත්ත බහිද්ධ කුසල විපාක කිරිය ඤාණ ප්‍රත්‍යවේක්ෂා කරන කාලයෙහි අධ්‍යාත්ම බාහිර අරමුණ වේ.

**පඤ්හ පුච්ඡකය.**

මෙහි පටිසම්භිදා තුන ලෞකිකය. අර්ථ පටිසම්භිදාව ලෞකික ලෝකෝත්තර දෙකම මිශ්‍රය. මේ පටිසම්භිදා විභංගයෙහි සම්මා සම්බුදුන් විසින් නය තුනද ලෞකික ලෝකෝත්තර මිශ්‍ර බැවින් එක් කොටසකින්ම කියන ලදී. මේ පටිසම්භිදා තුන ලෞකිකය. අර්ථ පටිසම්භිදාව ලෞකික ලෝකෝත්තරය. මෙසේ මේ පටිසම්භිදා විභංගයෙහිද තිපරි වෘත්තය ගෙනහැර බෙදා දක්වන ලදී.

**සම්මෝහ විනෝදනී නම් විභංග අර්ථ වර්ණනාවේ පහලොස්වන පටිසම්භිදා විභංග නිද්දේසයයි.**

# 16.
# ඤාණ විභංගය

ඉත් අනතුරුව දැන් ඤාණ විභංගයෙහි **එකවිධෙන ඤාණවත්ථු** යනාදි නයින් පළමුව ඒකවිධාදියෙන් දසවිධ අවසානයෙන් පරිච්ඡේද දහයකින් මාතෘකා තබා තබනු ලැබූ පද පිළිවෙල අනුව විස්තර කරන ලදී. එහි **එකවිධෙන** යනු එක් ආකාරයකින්, එක් කොටසකින් හෝ. **ඤාණවත්ථු** යන මෙහි ඤාණයද වසතුවද - ඤාණවත්ථු නොයෙක් ආකාරයේ සම්පත් ඤාණවත්ථු වේ. ඤාණයට අවකාශ අර්ථයෙන් වූ වත්ථු ඤාණ වත්ථු වේ. මෙහි වනාහි පළමු අර්ථයෙන්ම ඤාණවත්ථු දතයුතුය. එයින්ම එකවිධ පරිච්ඡේද අවසානයෙහි සත්‍ය වූ වස්තු වැඩීම ප්‍රඥාවයි. මෙසේ ඒකවිධ වූ ඤාණවත්ථු යයි කියන ලදී. **පඤ්ච විඤ්ඤාණ** යනු චක්ඛු විඤ්ඤාණාදි පහයි. **න හෙතු** යනාදිය යට ධර්මසංග්‍රහ අර්ථ

කථාවෙහි කියන ලද නයින්ම දතයුතුය. සංක්‍ෂෙපයෙන් වනාහි මෙහි කිවයුතු දේ නිද්දේස වාරයෙහි එන්නේය. යම්සේ මෙහි දුක මාතෘකා පදවලද කිවයුතු දේ එහිම එන්නේය. බහා තබන කොටස පමණක් මෙහි මෙසේ දතයුතුය. මෙහි න හෙතු අහේතුක යනාදියෙන් පළමුකොට ධම්මසංගහ මාතෘකා වශයෙන් අනිච්ච ජරාභිභූත යනාදියෙන් මාතෘකා නැතිව සේනා යනු සංක්‍ෂේපයෙන් ප්‍රභේද වශයෙන් දෙයාකාරයකින් පද හැත්තෑ අටකින් එක් මාතෘකාවක් තබන ලදී. දුක අනුරූපයෙන් දුක තිස්පහකින් දුක මාතෘකා තබන ලදී. තික අනුරූපවලින් වින්‍යාසය පඤ්ඤා යනාදි සතරෙන් බාහිර තිකයෙහි, විපාක පඤ්ඤා යනාදියෙන් අනියමිත පඤ්ඤා වශයෙන් කියන ලද තික මාතෘකා දාහතරකින්, විතක්ක තිකයෙහි පළමු පදයෙන් නියමිත පඤ්ඤා නයෙන් කියන ලද දහතුනෙන්, දෙවන පදයෙන් නියමිත පඤ්ඤා වශයෙන් කියන ලද සතෙන් තුන්වන පදයෙන් නියමිත පඤ්ඤා වශයෙන් කියන ලද දොළොසෙන්, පීති තිකයෙහි පළමු පදයෙන් නියමිත පඤ්ඤා වශයෙන් කියන ලද දහතුනෙන්, දෙවන පදයෙන්ද එසේය. තුන්වන පදයෙන් නියමිත පඤ්ඤා වශයෙන් කියන ලද දොළොස යයි තික අසූඅටකින් තික මාතෘකා තබන ලදී. සතරවන මාතෘකා වනාහි කම්මස්සකත ඤාණය යනාදියෙන් එක්විසි චතුක්කයෙහි, පඤ්ච මාතෘකා පහේ (පඤ්චත්ථක) දෙකින් ඡක්ක මාතෘකා සයේ එකකින් සත් මාතෘකා ඤාණවස්තු හැත්තෑහත යන්න මෙසේ සංක්‍ෂේපයෙන් කීමෙන් සතත එකොළහකින් අට මාතෘකා එක අටකින්, නව මාතෘකා එක නවයකින් දස මාතෘකා තථාගතයන්ගේ තථාගත දසබල යනාදියෙන් දශක එකකින් තබන ලදී.

එහි දස යනු දැක්වීමය. තථාගතස්ස යන යම්සේ විශේෂ ආදි පෙර බුදුවරු ආවාහු එසේ ආවා වූ, යම්සේ ගියාහුද එසේම යන නිසා තථාගතස්ස යනු වේ. තථාගත බල යනු අන්‍යයන්ට අසාධාරණ තථාගතයන් වහන්සේගේම බල. පෙර බුදුවරුන්ගේ බල මෙන් පුඤ්ඤ උපනිස්සය සම්පත්තියෙන් එසේ ආවා වූ ආගත බලයයිද අර්ථ වේ. කාය බල ඤාණ බල වශයෙන් තථාගතයන් වහන්සේගේ බල දෙකකි. ඒ දෙකින් කාය බලය ඇත් කුල අනුසාරයෙන්ම දතයුතුය. පුරාණයන් විසින් එනිසා කියන ලදී.

**කලුවක් ගහෙහි වන - පඬර තඹපිඟුවන් යන**
**ගඳමඟල හෙමියුත් - පොහොතය සදත් දස ගජ**

**කාලාවකඤ්ච ගංගෙය්‍යං පණ්ඩරං තම්බපිංගලං**
**ගන්ධ මංගල හෙමඤ්ච උපොසථ ඡද්දන්තිමෙ දස**

මේ ඇත්කුල දහයයි. එහි කාලාවක ප්‍රකෘති ඇත් කුලයයි දතයුතුය. මිනිසුන් දසදෙනෙකුගේ කාය බලය කාලාවක එක ඇතෙකි. කාලාවක ඇතුන් දහයක කාය බලය ගංගෙය්‍ය එක ඇතෙකි. ගංගෙය්‍ය ඇතුන් දහයක බලය පණ්ඩර එක ඇතෙකි. පණ්ඩර ඇතුන් දහයක බලය තම්බපිංගල එක ඇතෙකි. තම්බපිංගල ඇතුන් දහයක බලය ගන්ධ එක ඇතෙකි. ගන්ධ ඇතුන් දහයක බල මංගල එක ඇතෙකි. මංගල ඇතුන් දහයක බලය හේමවත එක ඇතෙකි. හේමවත ඇතුන් දහයක බලය උපොසථ එක අැතෙකි. උපොසථ ඇතුන් දහයක බලය ඡද්දන්ත එක ඇතෙකි. ඡද්දන්ත ඇතුන් දහයක බලය එක් තථාගතයන් වහන්සේට ඇත. නාරායන බලය යයි මීටම කියනු ලැබේ. ඒ බලය ප්‍රකෘති ඇතුන්ගේ ගණනින් කෝටිදාහකි. මිනිසුන්ගේ ගණනින් එය දසකෝටි දහසකි. මෙය තථාගතයන් වහන්සේගේ කාය බලයයි.

මෙහි ඤාණ බලය පෙලෙහි එන ලද්දේම වේ. දසබල ඤාණය මහා සීහනාද සූත්‍රයෙනි. දසබල ඤාණය, චතුවෙසාරජ්ජ ඤාණය, අට්ඨසු පරිසාසු අකම්පන ඤාණය, චතුයොනි පරිච්ඡේදක ඤාණය පඤ්චගති පරිච්ඡේදක ඤාණය. සංයුත්තකයේ ආවා වූ තෙසත්තති ඤාණගති සත්ත සත්තති ඤාණගති මෙසේ අන්‍ය වූද අනෙක ඤාණ සහස්සාති මෙය ඤාණබල නම් වේ. මෙහිද ඤාණබලම අදහස් කරයි. කම්පා නොවන අර්ථයෙන් ඤාණයද උපකාර කරන අර්ථයෙන් බලය ද කියන ලදී. **යෙහි බලෙහි සමන්නාගතො** යම් ඤාණබල දහයකින් යුක්ත වූයේ. **ආසභට්ඨාණං** ශ්‍රේෂ්ඨ ස්ථානය. උත්තම ස්ථානය ආසභා යනු පූර්ව බුදුවරයෝය. උන්වහන්සේලාගේ සමානය යන අර්ථයයි. තවද ගවයින් සියයකට නායක වූයේ උසභ වේ. ගවයින් දහසකට ජ්‍යෙෂ්ඨ වූයේ වසභො වේ. වජ් සත ගවගාල් සියයකට දෙටු වූයේ උසභද ගාල් දහසකට දෙටු වූයේ වසභද වේ. සියළු ගවයින්ට ශ්‍රේෂ්ඨ වූ සියළු උවදුරු ඉවසන සුලු පහදවන මහත් බර උසුලන අකුණු සිය ගණන් ශබ්දවලිනුත් කම්පා නොවන්නේ නිසභ වේ. මෙහි උසභ අදහස් කරයි. මෙයද ඔහුගේ පර්යාය වචනයකි. උසභගේ වේය යනු ආසභ වේ. ඨානං සතර පයින් පොළොව පෙළා නොසෙල්වෙන සිටීම. මෙය වනාහි ආසභ මෙන් ආසභය. "නිසභ සංඛ්‍යාත උසභය. උසභ බලයෙන් යුත් සතර පයින්

පොළොව පෙළා නොසෙල්වෙන තැන සිටය. මෙසේ තථාගතයන් වහන්සේද තථාගත බල දහයෙන් යුක්තව සතර වෙසරද පයින් අටපිරිස් පොළොව කළඹා දෙවියන් සහිත ලෝකයෙහි සතුරකු විසින් පසමිතුරකු විසින් කම්පාකළ නොහැකි නොසෙල්වෙන ස්ථානයෙහි වැඩසිටිති. මෙසේ වැඩසිටින්නේ ඒ ආසභ ස්ථානය දනිති. එළඹෙති. අත් නොහරිති. තමා කෙරෙහි ආරෝපනය කරගනිති. එහෙයින් කියන ලදී. **ආසභණ්ඨානං පටිජානාති.**

පරිසාසු යනු අට පිරිසයි. **සීහනාදං නදති** - ශ්‍රේෂ්ඨ නාදය. අභීත නාදය නාද කරති. සිංහනාදය සමාන නාදය නාදකරති. මේ අර්ථය සීහනාද සූත්‍රයෙන් දැක්විය යුතුය. සිංහයා ඉවසීමෙන්ද නැසීමෙන්ද සිංහයයි කියනු ලැබේ. (මෙසේ කියන සිංහයාගේ නාදය සිංහ නාදයයි.) මෙසේ තථාගතයන් වහන්සේ ලෝක ධර්මයක් ඉවසන හෙයින් පරවාද නසන හෙයින් සිංහ යයි කියනු ලැබේ. එහි සිංහයා සිංහ බලයෙන් යුක්තව සැමතැනම විසාරදව ලෝමහංස දුරුකොට සිංහනාද කරයි. මෙසේ තථාගත සිංහයාද තථාගත බලයෙන් යුක්තව අටපිරිස්හි විසාරදව බිය නැතිව ඉති රූපං ආදි නයින් නා නා විධ දේශනා විලාශයෙන් යුක්තව සිංහනාද කරති. එහෙයින් කියන ලදී. **පරිසාසු සීහ නාදං නදති, බ්‍රහ්මචකතං පවත්තෙති** මෙහි බ්‍රහ්ම යනු ශ්‍රේෂ්ඨ උත්තම විසුද්ධි යන තේරුම් ඇත. චක්ක ශබ්දය වනාහි

**සම්පත ලකුණෙහි ද - රිය අඟෙහි ඉරියව්වේ**
**දීම ද රුවන දම් - උරසක්හිද පෙනී යයි**
**මෙහි දම්සක කැමති - එය දෙපරිදිව දක්වනු**

"මහණෙනි, මේ සක් සතරකි. එයින් යුත් දෙව් මිනිසුන්" ආදියෙහි සම්පත්තිය පෙනේ. "යටිපා තලෙහි සක් ඉපදිණි" මෙහි ලකුණය. "සක මෙන් උසුලන්නේ පා" මෙහි රථ අංගය. "සිව්සක් ගවදොර" මෙහි ඉරියව්වය. "දෙව වළඳව පමා නොවෙව. සියළු සත්නට සක් පවතී" මෙහි දානය. "දිව්‍ය සක්රුවන පහළවිය" මෙහි රුවන්, "මවිසින් පැවැත්වූ දම් සකෙහි" මෙහි දම්සකය. "කැමති යුත් පුරුෂයාගේ මුදුනැ සක ඔබයි" මෙහි උරසක්හි (උරචක්‍ර මාලාව) "ඛුර පිරියත්හිද සකින්" මෙහි පහර දීමෙහි "අසනි සක්" මෙහි අසනි මණ්ඩලයෙහි. මෙහි වනාහි දම්සකම අදහස් කරයි.

පිළිවිදු නුවණ දෙසුම් නුවණ යයි ඒ දම්සක දෙපරිදිය. එහි ප්‍රඥාවෙන් බබළන තමාගේ අරියපල ගෙනදෙන්නේ පිළිවිදු නුවණය. (ප්‍රතිවේධ නුවණය) කරුණායෙන් බබළයි. සච්චන්ගේ අරියපල ගෙන දෙන්නේ දෙසුම් නුවණයි. එහි පිළිවිදු නුවණ අවස්ථා දෙකකදී උපදී. අබිනික්මනේ සිට රහත්මග තෙක් උපදින සහ රහත්ඵල ක්‍ෂණයෙහි උපදින යනුවෙනි. තුසිත භවනයේ සිට හෝ මහබෝ පලඟ රහත්මග තෙක් හා රහත් ඵලයෙහි වශයෙන්ද දීපංකර විවරවන සිට රහත්මග තෙක් හා රහත්ඵල කෙණෙහි උපන් නුවණ. දෙසුම් නැණද දෙපරිදිය. අඤ්ඤා කොණ්ඩඤ්ඤ හිමිගේ මග දක්වා ඇති දේසනා ඥාණය හා සෝවාන්ඵල ක්‍ෂණයෙහි පවතින දේශනා ඥාණය වශයෙනි. එහි පටිවෙධ ඥාණය ලෝකෝත්තරය. දෙසනා ඥාණය ලෞකිකය. උභය ඥාණයම අන්‍යයන්ට අසාධාරණය. බුදුවරුන්ගේම ඖරස ඥාණයකි.

දැන් දස බලයකින් යුත් තථාගතයන් වහන්සේ ආසභ ස්ථානය දනිති. මුලදීම **දස තථාගතස්ස තථාගත බලානි** යයි තබන ලද්ද විස්තර වශයෙන් දැක්වීමට **කතමානි දස? ඉධ තථාගතො ඨානඤ්ච ඨානතොච** ආදිය කීහ.

එහි **ඨානඤ්ච ඨානතො** කරුණාද කරුණාවත්, කාරණයෙහි එහි ඵලයක් සිටියි. ඊට අයත් වත්තතිය බැවින් උපදියි. එසේම පවතියි. එනිසා ස්ථානයයි කියනු ලැබේ. එය භාග්‍යවතුන් වහන්සේ යම් යම් ධර්ම ඒ ඒ ධර්මයන්ගේ හේතුඵල ගෙන සිටීයයි යම් යම් ධර්ම ඒ ඒ ධර්මයන්ගේ හේතුඵල ගෙන නොසිටී යයිද දන්නේ, **ඨානඤ්ච ඨානතො අට්ඨානඤ්ච අට්ඨනතො යථාභූතං පජානාති,** යම්පී යම් ඥාණයකින් **ඉදම්පි තථාගතස්ස** මේ ඨාන අට්ඨාන ඥාණයද තථාගතයන් වහන්සේගේ **තථාගත බලං** නම් වේයයි අර්ථය වේ. මෙසේ සියළු පදවල යෙදීම දතයුතුය. **කම්ම සමාදානං** සමාදන් වී කරන ලද කුසලාකුසල ධර්මයන්ගේ, කර්මයම හෝ **කම්ම සමාදානං ඨානසො හෙතුසො** ප්‍රත්‍යයෙන්ද හේතුවෙන්ද එහි ගති උපධි කාල පයෝග විපාකයට ස්ථාන වේ. කර්ම හේතුව. **සබ්බත්‍ථ ගාමිනිං** සියළු ගති අගතිවල යන **පටිපදං** මාර්ගය **යථාභූතං පජානාති** බොහෝ මිනිසුන් එකම සතෙකු ඝාතනයෙහි ද මේ චේතනාව නිරයගාමී වන්නේය. මේ තිරිසන් යෝනියට යෑම යන මෙම නයින් එක වස්තුවකද කුසලාකුසල චේතනා සංඛ්‍යාත පිළිවෙත වෙනස් නොවීමෙන් ස්වභාවය දනිති.

**අනෙකධාතුං** චක්ඛු ධාතු ආදියෙන් හෝ කාමධාතු ආදීන්ගේ බොහෝ ධාතුවලින් **නා නා ධාතුං** ඡ ධාතුන්ගේම වෙනස් වූ නොයෙක් ආකාර ධාතු. **ලොකං** ස්කන්ධ ආයතන ධාතු ලෝකය. **යථාභූතං පජානාති** ඒ ඒ ධාතුන්ගේ සත්‍ය ස්වභාවය අවබෝධ කරගනී. **නානාධිමුත්තිකතං** හීනාදි අධිමුක්තිවලින් නොයෙක් අධි මුක්තිභාවය. **පරසත්තානං** ප්‍රධාන සතුන්ගේ. **පරපුග්ගලානං** එයින් අන්‍ය වූ හීන සත්වයින්ගේ මේ පද දෙක එකාර්ථ වුවත් අවබෝධ වන්නන්ගේ වශයෙන් දෙවිධියකට කියන ලදී. **ඉන්‍ද්‍රියපරොපරියත්ති** ශ්‍රද්ධාදී ඉන්‍ද්‍රියයන්ගේ පරභවයද අපරභවයද වෘද්ධියද හානියද යන අර්ථය වේ. ඣාන **විමොක්ඛ සමාධි සමාපත්තීනං** යනු පළමුවන ආදි ධ්‍යාන සතරේ රූපීව රූප දකියි යන ආදි අෂ්ට විමොක්‍ෂයන්ගේ සවිත්තක සවිචාරාදී සමාධි තුනෙන් ප්‍රථම ධ්‍යාන සමාපත්ති ආදියේද නවයක් වූ අනුපූර්ව සමාපත්තිවල. **සංකිලෙසං** යනු පිරිහෙන දහම්ය. වොදානය විසේස භාගිය දහම්. **වුට්ඨානං** ධ්‍යානවලින් නැගිටින කරුණ **පුබ්බෙනිවාසානුස්සති** පෙර විසූ ස්කන්ධ සිහිකිරීම. **චූතුපපාතං** චුතියද ඉපදීමද **ආසාවාණං ඛයං** කාමාසවාදීන්ගේ ඛය සංඛ්‍යාත ආශ්‍රව නිරුද්ධවීම - නිවන. **ඉමානි** යට තථාගතයන්ගේ බල දහයක් කීවේය. මේ ඒවා අර්පණා කිරීමයි. මෙසේ මෙහි පද වර්ණනාව අනුපූර්ව වශයෙන් දැන තථාගතයන් වහන්සේ පළමුව ඨානා ඨාන නුවණින් වෙනෙය්‍ය සතුන්ගේ නිවන අවබෝධ කිරීමට හා අවබෝධ නොකිරීමට ඨානා ඨානභූත වූ කෙලෙස් ආවරණභාවය බලති. ලෞකික සම්මාදිට්ඨි ස්ථාන දැකීමෙන් නියත මිච්ඡාදිට්ඨි ඨාන අභාවය දැකීමෙන්ද ඉක්බිති ඔවුන්ගේ කර්ම විපාක ඤාණයෙන් විපාකාවරණ භාවය බලයි. ත්‍රිහේතුක ප්‍රතිසන්ධි දැකීමෙන් සබ්බත්‍ථගාමිනී පටිපදා ඤාණයෙන් කම්මාවරණ භවය බලයි. ආනන්තරිය කම්ම අභාවය දැකීමෙන් මෙසේ අනාවරණ වූ අනෙකධාතු නානාධාතු ඤාණයෙන් අනුකූල ධර්ම දේශනාව සඳහා චර්යා විශේෂය බලති. ධාතු වෙනස දැකීමෙන් ඉක්බිති නානාධිමුත්තිකතා ඤාණයෙන් ඔවුන්ගේ අධිමුක්තිය බලති. ප්‍රයෝගය නොගෙනම අධිමුක්ති වශයෙන් දහම් දෙසීම ඉක්බිති මෙසේ දිට්ඨාධිමුක්තින්ගේ යථා බලය දහම් දෙසීමට ඉන්‍ද්‍රියපරොපරියත්ති ඤාණයෙන් ඉන්‍ද්‍රිය පරොපරියත්තිය බලති. ශ්‍රද්ධාදීන්ගේ තියුණු මුදු භාවය දැකීමෙන් මෙසේ පරිඤ්ඤාතින්‍ද්‍රිය-පරොපරියත්තාපි එය දුර වෙයි මේ ඉක්බිති ධ්‍යානාදීන්ගේ පරිඤ්ඤාණ-යෙන් ධ්‍යානාදියෙන් වසීභූත වූ ඉද්ධි විශේෂයකින් වහා පැමිණේ. පැමිණද පුබ්බේනිවාසානුස්සති ඤාණයෙන් ඔවුන්ගේ පෙරජාති බව දිව ඇස් ආනුභාවයෙන් පැමිණෙමින් චේතෝපරිය ඤාණයෙන් සම්පත් විශේෂයක්

දකින්නේ ආසවක්ඛය ඤාණය ආනුභාවයෙන් ආසවක්ඛය යයි ප්‍රතිපදාවකින් දුරුකරන ලද මෝහයෙන් නිවන පිණිස ධර්මය දේශනා කරති. එහෙයින් මේ අනුක්‍රමයෙන් මේ දසබල කියන ලදැයි දතයුතුය.

## මාතෘකාවේ අර්ථ වර්ණනාව.

දැන් තබන ලද මාතෘකාවෙන් **පඤ්චවිඤ්ඤාණා න හෙතු මෙව** ආදි නයින් අරඹන ලද නිද්දේසවාරයෙහි නහෙතුමෙව යන සාධාරණ හේතු ප්‍රතික්ෂේප නිර්දේශයෙහි එහි හේතු හේතු පච්චය හේතු උත්තම හේතු සාධාරණ හේතු යන චතුර්විධ හේතු ආදි නයින් කිවයුතු සියල්ල රූප කාණ්ඩයෙහි "සච්චං රූපං මා හෙතුමෙව" යනාදියේ අර්ථවර්ණනාවේ කියන ලද්දේමය. **අහෙතුකමෙව** යනාදියෙහි ව්‍යඤ්ජන සන්ධි වශයෙන් ම කාරය දතයුතුය. අහේතුක යන අර්ථනය සෙසු පදවලද මෙම නයයි. තවද "හෙතු ධම්මා න හෙතු ධම්මා" යනාදි ධර්ම කොටස්වල පඤ්ච විඤ්ඤාණ හේතු ධම්ම හෝ සහේතුක හේතුධම්ම හෝ නොවේ. ඒකාන්තයෙන් හේතු නොවේමය. අහේතුකමයයි මෙනයින් මේ සියළු පදවල අර්ථය දතයුතුය. **අබ්‍යාකත** මෙව යන පදය විපාක අබ්‍යාකත වශයෙන් කියන ලදී. **සාරම්මණාමෙව** එල්බ ගත් අරමුණු වශයෙන් පච්චය ආරම්මණ ඕලුබ්භ ආරම්මණ යයි අරමුණු දෙපරිදිය. මෙම ස්ථානයෙහි ඕලුබ්භ (එල්බ) අරමුණම උසුලයි. පච්චය අරමුණද ලැබේ. **අචෙතසිකමෙව** යන පදය චිත්ත රූප නිබ්බාණ යන අචේතනික තුන. මෙහි සිතම සඳහා කියන ලදී. **නො අපරියාපන්න** මෙව ගති චුති සංසාර වට්ටභව ඇතුළත් භාවයෙන් පරියාපන්න වේ. ඇතුළත් නොවේ. ලෝකයෙන් (සසරින්) නොපමුණුවයි. **අනියාානික උපපන්නං මනොවිඤ්ඤාණං විඤ්ඤෙය්‍යමෙව** රූප කාණ්ඩයෙහි චක්ඛු විඤ්ඤාණා දීන්ගේ වර්තමාන රූපාදිය අරබයා පැවතීමෙන් අතීතාදි විෂය මනෝ විඤ්ඤාණයෙහි ද පඤ්චවිඤ්ඤාණ ස්‍රොතයට පතිතකොට උපන් විඤ්ඤාණ හයම දන්නා ලදැයි කියන ලදී. පඤ්ච විඤ්ඤාණවල වර්තමාන චක්ඛු විඤ්ඤාණාදියේ අරමුණු නොවේද මනෝ විඤ්ඤාණයෙහිම වේ. එහෙයින් **මනෝවිඤ්ඤාණ විඤ්ඤෙය්‍යමෙව** යයි කියන ලදී. **අනිච්චමෙව** ඇතිවී නැතිව යන අර්ථයෙන් අනිච්ච වේ. **ජරාභිභූතමෙව** ජරාවෙන් මඩනා ලද බැවින්. **උප්පන්න වත්‍ථුකා උප්පන්නාරම්මණා** අනාගතය ප්‍රතික්ෂේපය. ඒවා අනාගතයෙහි වස්තු අරමුණුකොට නූපදී. **පුරෙජාත වත්‍ථුකා පුරෙජාතාරම්මණා** උත්පත්තිය සමග ප්‍රතික්ෂේප කිරීම. ඒවා සමග උපන් වස්තු

හෝ අරමුණු හෝ නිසා නූපදී. තමා පසුව ඉපිද පෙර උපන් වස්තු අරමුණුවල උපදී. **අජ්ඣත්තික වත්‍ථුකා** අධ්‍යාත්ම වශයෙන් කියන ලදී. ඒවා අජ්ඣත්තික පඤ්ච ප්‍රසාද වස්තුකොට උපදී. **බාහිරා රම්මණා.** බාහිර රූපාදි අරමුණු. එහි චතුෂ්කයක් දතයුතුය. පඤ්ච විඤ්ඤාණවල ප්‍රසාද වස්තුක බැවින් අජ්ඣත්තිකය අජ්ඣත්තතික වස්තුකය, මනෝ විඤ්ඤාණය හෘදය රූපය වස්තුකො උපදින කාලයෙහි අජ්ඣත්තිකය බාහිර වස්තුකය. පඤ්ච විඤ්ඤාණ සම්ප්‍රයුක්ත ස්කන්ධ තුන හෘදය රූපය වස්තුකොට උපදින කාලයෙහි බාහිර ඒවා බාහිර වස්තුක වේ. **අසම්භින්න වත්‍ථුකා** නිරුද්ධ නොවන වස්තු ඒවා නිරුද්ධ නොවූ අතීත වස්තු නිසා උපදී. අසම්භින්න අරමුණුවලද මෙම නයයි.

**අඤ්ඤං චක්ඛු විඤ්ඤාණස්ස වත්‍ථුච ආරම්මණඤ්ච** ආදියෙහි චක්ඛු විඤ්ඤාණයේ අන්‍ය වස්තුවකි. අන්‍ය අරමුණකි. සෝත විඤ්ඤාණාදියේ අනිකකි. චක්ඛු විඤ්ඤාණ සෝතප්පසාදියෙහි අන්‍යතර වස්තු වේ. සද්දාදියෙහි හෝ අන්‍යතර අරමුණක් කොට කල්පයකින් කපක් ගියත් නූපදී. චක්ඛු ප්‍රසාදයම වස්තුකොට රූපයද අරමුණුකොට උපදී. මෙසේ එහි වස්තුවද ද්වාරයද අරමුණද නිතර බැඳී ඇත. අන්‍ය වස්තු හෝ ද්වාර හෝ අරමුණ හෝ සංක්‍රමණය නොවේ. නිබද්ධ වස්තු ද්වාර අරමුණු ඇතිව උපදී. සෝතවිඤ්ඤාණාදියෙහිද මේ නයයි.

**න අඤ්ඤමඤ්ඤස්ස ගෝචරවිසයං පච්චානුභොන්ති** මෙහි අඤ්ඤ-මඤ්ඤස්ස අනිකක් අනිකක් යනු ඇස කනට කන ඇසට යන මෙසේ එකක එකකට ගෝචර විසයවීම අනුභව නොකෙරේ යන අර්ථයයි. නීලාදි භේද වූ රූපාරම්මණය එකතුකොට සෝත ඉන්‍ද්‍රියට පමුණුවන්නේය. හා එය විමසව විස්තර කරනු මේ අරමුණ කුමක්ද? චක්ඛු විඤ්ඤාණය හැර තම මුවින් ධර්මතා බැවින් මෙසේ කියන්නේය. මෝඩය, අන්ධ බාලය, වස් සියයක් වස් දහසක්ද දුවන්නේ මවිසින් මොහුගේ ඉපදීම ලබන්නෙහිද? ඔහු හෙතෙම චක්ඛු ප්‍රසාදයෙහි පමුණුව. මම මේ අරමුණ දන්නෙමි. නිල් හෝ කහ හෝ මෙය කාටවත් විසය නොවේ. මටම විසය වේ. සෙසු විඤ්ඤාණවලද මෙම නයයි. මෙසේ අනිකක් අනිකකට ගෝචර විෂය ආනුභාව නැත.

**සමන්නාහරන්තස්ස** ආවර්ජනයෙන්ම කල්පනා කරන්නාගේ **මනසිකරොන්තස්ස** ආවර්ජනයෙන්ම මෙනෙහි කරන්නාගේ. මේ සිත්

ආවර්ජනයෙන් කල්පනා කරන කාලයේ මෙනෙහි කරන කාලයේම උපදී. **න අබ්බොකිණ්ණා** යනු අනුන්ගේ විඤ්ඤාණයකින් ගැවසීගත් නිතර නූපදී. මෙයින් ඒවායේ අතරක් නැති ප්‍රතික්ෂේප කරන ලදී න **අඤ්ඤමඤ්ඤස්ස සමනන්තරා** මෙයින් ඊට අනතුරුව යන බව ප්‍රතික්ෂේප කරන ලදී. **න අපුබ්බං අචරිමං** මෙයින් සියළුම සහ උත්පත්ති ප්‍රතික්ෂේප කරන ලදී. **ආවට්ටන වා** යනාදිය ආවර්ජන සතරට නම්. එහි භවංගය ආවර්ජනයෙන් **ආවට්ටනා** එහිම පසුබැසීමෙන් **ආභොගො** රූපාදියේ කල්පනා කිරීමෙන් **සමන්නාහාරො** ඒවාගේම මෙනෙහි කිරීමෙන්. **මනසිකාරො** යයි කියනු ලැබේ. මෙසේ මෙහි සංක්ෂේපයෙන් පස් විඤ්ඤාණයන්ගේ ආවර්ජනා ස්ථානයෙහි සිට ආවට්ටනාදි කෘත්‍ය කිරීමට සමර්ථභාවය ප්‍රතික්ෂේප කරන ලදී. **න කිඤ්චි ධම්මං පටිවිජානාති** ධර්මයේ (චෛතසික) සිත පෙරටු කොට ඇත්තාහ. මෙසේ කියනවිට එක කුසලයක් හෝ අකුසලයක් හෝ දැන නොගනී. **අඤ්ඤත්‍ර අභිනිපාතමත්තා** රූපාදිය හැර පහතට හෙළීම් පමණය. මෙය කියන ලද්දේ වේ. සුපණ්ඩිත පුරුෂයාද ආපාථගතය හැර රූපාදි අන්‍ය කුසලාකුසල එක් ධර්මයක්වත් පස් විඤ්ඤාණයෙන් දැන නොගනී. සෝත විඤ්ඤාණාදිය සවණ සායන සායන ඵුසන මත්තමෙව. ඇසීම් ගඳ සුවඳ දැනීම් රස දැනීම් ස්පර්ශ දැනීම මාත්‍රය පමණය. දර්ශනාදි මාත්‍රයෙන් මිදුණේය. අනිකෙක් මේ කුසලාදි දැනගැනීමක් නැත. **මනෝධාතුයයි** පිළිගන්නා මනෝධාතු 'පි' සම්පිණ්ඩනයයි. එහෙයින් මනෝ ධාතුවෙන්ද එයින් පසු මනෝ විඤ්ඤාණ ධාතුද සියල්ල පඤ්චද්වාරික විඤ්ඤාණවලින්ම කුසලාකුසල ධර්ම කිසිවක් දැන නොගනී යයි මෙසේ මෙහි අර්ථය දතයුතුය.

**කිඤ්චි ඉරියපථං කප්පෙති** යනාදියෙහිද මෙම නයමය. පඤ්චද්වාරික විඤ්ඤාණවලින් ගමනාදි කිසි ඉරියව්වක් නොපවත්වයි. කාය කර්මයක් වචී කර්මයක් නොපිහිටුවයි. කුසලාකුසල ධර්ම සමාදන් නොවේ. සමාධියට සම නොවැදේ. ලෞකික හෝ ලෝකෝත්තර සමාධිවලින් නොනැගිටියි. භවයෙන් චුත නොවෙයි. භවන්තරයක නොඋපදියි. මේ සියළු කුසලාකුසල ධම්ම දැනගැනීම ආදි වචන අවසාන කෘත්‍ය මනෝද්වාරික සිතින්ම වේ. පඤ්චද්වාරිකයෙන් නොවේ. මේ සියළු කෘත්‍යයන් කිරීම් සහ ජවන වීථි සිත් ප්‍රතික්ෂේප කරන ලදී. මේ කෘත්‍යවලට සිතක් නැතිද මෙසේ නියාම පැමිණීම් ආදියෙහිද පඤ්චද්වාරික ජවනයෙන් කැමති නියාම නොපැමිණේ. සම්මත නියාමද නොවේ. මේ ජවන නම්ගොත් අරබයා නොදුවති. ඛණිකාදි පැණවීම්වලද නැත. ලක්ෂණ ආරම්මණ විපස්සනා

වශයෙන් නොපවතී. වුට්ඨානගාමිනී බලවත් විපස්සනා වශයෙන් නැත. රූපාරූප ධර්මයන් අරබයා නොදුවති. නිවණද නැත. චේතනා සහිත පටිසම්භිදා නොඋපදිති. අභිඤ්ඤාණ නොවේ. සාවක පාරමී ඤාණය නොවේ. පසේබුදු නුවණ නොවේ. සබ්බඤ්ඤුත ඤාණය නොවේ. මේ සියළු ප්‍රභේද මනෝද්වාරික ජවනයෙහිම ලැබේ.

**න සුපති න පටිබුජ්ඣති න සුපිනං පස්සති** පඤ්චද්වාරික සිතින් නින්දට නොබැස ගනී. නොනිදයි. නො අවදි වෙයි. කිසි සිහිනයක් නොබලයි. මේ ස්ථාන තුනේ ජවනය සමග වීථි හිත ප්‍රතික්ෂේප කරන ලදී. නිදියන්නාට මහවැටියක් දල්වා පහන ඇස සමීපයේ තැබූවිට පළමුව චක්ඛුද්වාරික ආවර්ජනය භවංගය නොපෙරළයි. මනෝද්වාරිකයම පෙරළයි. ඉන්පසු ජවන් දුවා භවංගය බැසගනී. දෙවනුව චක්ඛුද්වාරිකය ආවර්ජනා කර භවංගයට පෙරළේ. ඉන්පසු චක්ඛු විඤ්ඤාණාදිය ජවන අවසානයේ පවත්වයි. ඉන්පසු භවංගය පවතී. තුන්වන වර මනෝද්වාරික ආවජ්ජනයෙන් භවංගය වැටුණු පසු මනෝද්වාරික ජවන දුවයි. එම සිතින් දැන කිම මේ ස්ථානයේ ආලෝකයක් යයි දැනගනී. එසේම නිදන්නාගේ කන සමීපයේ තූර්ය නාදකළවිට නහය සමීපයෙහි සුවඳ දුගඳ මල් තැබූවිට මුඛයෙහි ගිතෙල් හෝ පැණි දැමූවිට පිටට අතින් පහරක් ගැසූවිට පළමුව සෝත ද්වාරිකාදිය භවංගයට නොවැටේ. මනෝ ද්වාරයට වැටේ. ඉන්පසු ජවන් දුව භවංගයට බැසගනී. දෙවන වර සෝත ද්වාරිකාදිය ආවර්ජනය කොට භවංගයට වැටේ. පසු ඝාන ජිව්හා කාය විඤ්ඤාණාදිය ජවන අවසානයෙහි පවත්වයි. ඉන් අනතුරුව භවංගය පවතී. තුන්වන වර මනෝද්වාරික ආවර්ජනයෙන් භවංගයට වැටුණු කල්හි මනෝද්වාරික ජවන දුවයි. ඒ සිතින් දැන මේ කිම මේ ස්ථානයේ ශබ්දයක් බෙර ශබ්දයක්? දැන් මේ ස්ථානයේ ගන්ධය මූලගන්ධ හෝ සාර ගන්ධය වේදැයි හෝ මගේ කටේ දැම්මේ මොනවාද? දැමූ රසය ගිතෙල් හෝ පැණි හෝ කවුද මගේ පිටට ගැසුවේ? පහර දැඩියි හෝ මෙසේ මනෝ ද්වාරයෙන්ම දැනගනී. පඤ්චද්වාරිකයෙන් නොවේ. සිහිනද එයින්ම බලයි. පඤ්චද්වාරිකයෙන් නොවේ.

එහිද හීන දකින්නා කරුණු සතරකින් හීන දකියි. ධාතු කැළඹීමෙන් හෝ පෙර අත්දැකීමක් (අනුභවයක්) දේව මෙහෙයවීමක් හෝ පෙර නිමිත්තක් හෝ එහි පිත් ආදීන්ගේ කළඹවන ධාතූන්ගේ යෙදීමෙන් එයින් නානාවිධ හීන දකියි. පර්වතයෙන් වැටෙන්නාක් මෙන් අහසින්

යන්නාක් මෙන් ව්‍යාල මෘග සේරාදීන් ලුහුබඳින්නාක් මෙන්, පෙර අනුභව කළ අරමුණක් නැවත දනියි. දෙවියෝ අර්ථය කැමතිව අනර්ථය කැමතිව දියුණුව සඳහා පිරිහීම් සඳහා නානා විධ අරමුණු (ගෙනහැර දක්වති.) පමුණුවති. හේ ඒ දෙවියන්ගේ ආනුභාවයෙන් ඒ අරමුණු බලයි. පෙරනිමිති වශයෙන් පින්පව් වශයෙන් ඇතිවිය යුතු දියුණුව හෝ පිරිහීම පෙරනිමිති හේතුවෙන් සිහින බලයි. බෝසත් මව මෙනි. පුත්ත ප්‍රතිලාභය බෝධිසත්වයා මෙනි. මහා සුපිනයෙහි කොසොල් රජු මෙනි. ධාතු කැළඹීමෙන් හෝ අනුභූතයෙන් දකින හීන සත්‍ය නොවේ. දෙවියන් එලවන නිමිතිද සත්‍ය හෝ අසත්‍ය විය හැකිය. තියුණු දෙවියා උපායෙන් විනාශ කරනු කැමතිව විපරීත දේවල් දක්වයි. මේ ඒ සඳහා කථා වස්තුවකි.

රෝහණයෙහි නාගවන විහාරයෙහි මහතෙරුන් වහන්සේ භික්‍ෂු සංඝයාගෙන් අවසර නොගෙන එක් නාගසක් කැප්පවූහ. ඒ වෘක්‍ෂයෙහි අධිගෘහිත දෙවියා තෙරුන්වහන්සේට කිපී පළමුව ඔහු පොළඹවා පසුව මෙයින් සත්වන දවස ඇතුළත උපස්ථායකයෙක් රජ මරන්නේ යයි සිහිනෙන් දැන්වීය. ථෙරො ඒ කථාව රජුගේ අන්තඃපුරයට කීවේය. ඔව්හු එකවිටම මහා ශබ්දයක් කළහ. රජ එය කුමක්දැයි විචාළේය. ඔව්හු එය තෙරුන් කී බව දැන්වූහ. රජ දවස් ගණන්කොට සත්දින ගතවූ පසු තෙරුන්ගේ අත් පා සිඳෙව්වේය. යමක් පෙර නිමිති සේ දකියිද එය ඒකාන්තයෙන් සත්‍ය වේ. මේ කරුණු සතර මිශ්‍රවීමෙන්ද සිහින භේද ඇතිවේ. ඒ සිහින සතරම සේඛ පෘථග්ජනයෝම දකිති. හේතුව ප්‍රහීණ නොවූ විපිළිසර බව ඇති නිසාය. ප්‍රහීණ විපර්යාස ඇති නිසා අසේකයෝ හීන නොදකිති. හීන දකින්නේ නිදාසිටින විටද? පිබිදී සිටිනවිද? නැතහොත් නිදානොගෙන නොපිබිදී සිටින විටද? නිදාගෙන සිටිනවිට දකිනවා කිවහොත් අභිධර්ම විරෝධී වේ. භවංග සිතින් නිදති. එහි රූප නිමිති ආදී අරමුණු නැත. රාගාදිය සම්ප්‍රයුක්ත වූවක්ද නැත. සිහින දකින්නාටම මෙබඳු සිත් උපදී. ඇහැරගෙන සිටිනවිට දකිනවා කිවහොත් විනය විරෝධී වේ. පිබිදී සිටිනවිට දකීනම් එය ව්‍යවහාරික සිතින්ම දකින්නකි. සබ්බොහාරික සිතින් කළ ව්‍යතික්‍රමණය වූ විට අනාපත්ති නැත. සිහින දකිනවිට කරන ලද ව්‍යතික්‍රමණ ඒකාන්තයෙන් අනාපත්ති වේ. මෙසේ වනවිට සිහින අභාවයට (නැතිබවට) යයි. එය එසේ නොවේ. කුමක් හෙයින්ද? වඳුරු නින්දේ යෙදුනවිට බලයි. එය කියන ලදී. "මහරජ, වඳුරු නින්ද පරෙත වූවිට සිහින බලයි." කපමිද්ධපරෙතො යනු වඳුරු නින්දෙන් යුක්තය. වඳුරාගේ නින්ද ඉක්මණින් පෙරලේ. එය පවතිනවිට නැවත

නැවත භවංගයෙන් එතරවීම සිදුවේ. එයින් යුතුව සිහින දකියි. එහෙයින් මේ සිහිනය කුසල්ද අකුසල්ද අව්‍යාකෘතද වේ. එහි සිහිනයෙන් චෛතිය වන්දනා ධම්ම සවණ කුසල් වේ. පාණාතිපාතාදිය කරන්නට අකුසල් වේ. අන්ත දෙකින් මිදී ආවර්ජන තදාරම්මණ කෙරෙහි අව්‍යාකෘත යයි දතයුතුය. මං හීනෙන් වාගෙ දැක්ක, ඇසුව කියනවිට අව්‍යාකෘත වේ. සිහිනෙන් කළ කුසලාකුසල විපාකය සවිපාකද? අවිපාකද? සවිපාක දුබල බැවින් ප්‍රතිසන්ධියක් ඇදගැනීමට නොහැකි වේ. අතිත් කර්මයක් විපාක දෙනවිට වේදනා වේ. මෙසේ සත්‍ය වූ වස්තු විවරණය කිරීම ප්‍රඥාවයි. පස් විඤ්ඤාණ හෙතවර්ථ නොවේ. යාථාවත් නොවේ. (සත්‍ය) එය සත්‍ය වස්තු ප්‍රකාශ කෙරේනුයි යාථාවකවත්‍ථු විභාවනා වේ. මෙසේ යට යාථාවක වත්‍ථු විභාවනා පඤ්ඤා යයි දතයුතුය. එය මේ වශයෙන් එවං එකවිධෙන ඤාණවත්‍ථු මෙසේ එක එක කොට්ඨාශයෙන් ඤාණ ගණන එක ආකාරයකින් හෝ ඤාණ කොටස වේ.

## ඒකකය.

දුවිධෙන ඤාණවත්‍ථු නිද්දේසයෙහි චතූසු භූමිසු කුසලෙ යන සේඛ පුහුදුන්නේ සිව්භූමික කුසල ප්‍රඥාව. පටිසම්භිදා විභංගයෙහි කියන ලද පස් අර්ථවල තම තමාගේ භූමියට ඇතුළත් විපාක සංඛ්‍යාත අර්ථය උපදවයි. පවත්වයි යන අත්‍ථජාපිකා, අරහතො අභිඥා ඉපදවීමට සමාපත්ති ඉපදවීමට සුදුසුය. කිරිය අබ්‍යාකත අභිඤ්ඤා සමාපත්ති පරිකර්ම කාලයෙහි කිරිය ප්‍රඥාව කාමාවචරය. එයද අභිඤ්ඤා සමාපත්ති ප්‍රභේද කිරිය සංඛ්‍යාත අර්ථය උපදවයි. පවත්වයි යන අත්‍ථජාපිකා පඤ්ඤා යයි කියන ලදී.

මෙය වනාහි පෙලෙහි නැති තවත් අට්ඨකථා නයකි. පෙර යම් කාමාවචර කිරිය පසු කාමාවචර කිරියාවෙන් අනන්තරා ආදි වශයෙන් ප්‍රත්‍ය වේ. එයද ඒ කිරියාව උපදවයි. අත්‍ථ ජාතිකා පඤ්ඤා එය අර්ථය උපදවන ප්‍රඥා නම් වේ. රූපාවචර අරූපාවචරවලද මෙසේය. දුතිය නිද්දේසයෙහි චතූසු භූමිසු විපාකෙ යනු කාමාවචර විපාකයෙහි ප්‍රඥාව සහජාතාදි ප්‍රත්‍යය වශයෙන් කාමාවචර විපාක අර්ථය උපදවා සිටියේයයි ජාපිතත්‍ථා වේ. රූපාවචරාදි විපාක ප්‍රඥාවද මෙම නයයි. මෙය තම තමාගේ සියළු කරුණුවලදී උපදවන ලද පවත්වන ලද තමන්ම අර්ථ වූද ජාපිතත්‍ථා වේ. අරහතො උප්පන්නාභාය අභිඤ්ඤාය උප්පන්නාය සමාපත්තියා යයි කියන ලද කිරිය පඤ්ඤාවේ ද මෙම නයයි.

මෙයද පාලිමුත්තක අටුවා නයකි. කාමාවචර කිරිය ප්‍රඥාවද සහජාතාදි වශයෙන් කාමාවචර කිරිය සංඛ්‍යාත අර්ථය උපදවා සිටියේ යයි ජාපිතත්‍ථා රූපාවචර අරූපාවචර කිරිය ප්‍රඥාවලද මෙම නයයි. මෙය තම තමාගේ සියළු කරුණු උපදවන ලද පවත්වන ලද තමා ද අර්ථ වීයයි ජාපිතත්‍ථා මෙහි සෙසු සියල්ල ධම්මසංගහ අට්ඨකථාවේ කියන ලද බැවින් ප්‍රකට වේ.

## දුකය.

ත්‍රිවිධ වූ ඤාණවත්‍ථු නිද්දේසයෙහි යොග විහිතෙසු යෝගය ප්‍රඥාව කියයි. පඤ්ඤා විහිතෙසු ප්‍රඥා පරිණාමිත යෙන යන අර්ථයයි. කම්මායතනෙසු මෙහි කර්මයම කම්මායතනයයි. නොහොත් කර්මයද ඒ ආයතනද ජීවිකාව ගෙනයෑමද කම්මායතන වේ. සිප්පායතනෙසු මෙහිද එම නයයි. හීන උත්කෘෂ්ට වශයෙන් කර්මය දෙපරිදිය. එහි හීන නම් වඩු කර්මය, මල බැහැරලීම් ආදියයි. උත්කෘෂ්ට කෘෂි වණික් ගවපාලනය ආදියයි. ශිල්පයද හීන උත්කෘෂ්ට වශයෙන් ද්විධය. එහි හීන සිල්ප නම් නළකාර ශිල්ප පේෂකාර ශිල්පය කුම්භකාර චම්මකාර කරණවෑම් ආදියයි. උත්කෘෂ්ට ශිල්ප නම් මුද්‍රණ, ගණක, ලේඛක ආදියයි. විද්‍යාවම විජ්ජාට්ඨාන වේ. එය ධාර්මික වශයෙන්ම ගන්නා ලදී. නා මඬල පිරිත සමාන සර්ප දමන මන්ත්‍රයක් වැනි සැත්කටු වෙදකම ශල්‍ය වෛද්‍ය විධි ආදිය වෛද්‍ය ශාස්ත්‍ර, ආචාර්යන් වහන්ස ශිල්ප ඉගෙනීමට කැමති වෙතියි ශිල්පායතනයට ඇතුල් වූවහු නොගන්නා ලදී. එහි එක් පණ්ඩිතයෙක් මිනිසුන්ගේ පහසු වාසය සඳහා තමාගේද ධර්මතා වශයෙන් ගෙවල් ප්‍රාසාද යාන නැව් ආදිය උපදවයි. මේ මිනිස්සු විසීමට තැනක් නැතිව දුකට පැමිණියෝ යයි හිතවත්කමින් සිට දීඝ චතුරස්ස ආදි භේදයෙන් යුත් ගෙයක් හදයි. සීත උෂ්ණ වැලැක්වීමට එක් බුමු දෙබුමු භේදයෙන් යුත් ප්‍රාසාද කරයි. යානයක් නැතිව සංචාරය කිරීම දුකය. දඟ වෙහෙස දුරුකිරීමට දෝලා කරත්ත (ගමනාන්තය) සන්දමානික (අසුන් යොදන රථය) ආදිය නිර්මාණය කරයි. නැව් නැති කල්හි මුහුදු ගමන් නැතැයි නානාප්‍රකාර වූ නැව් නිපදවයි. ඔහු මේ සියල්ල කරන්නේ කවරුවත් කරන දිහා බලාගෙන සිට නොවේ. කාගේවත් ඉගැන්වීමකින්ද නොවේ. තමාගේ ධර්මතාවෙන් චින්තනයෙන් කරයි. ප්‍රඥාවන්ත වූ තමාගේ ධර්මතාවෙන් කළත් අන්‍යයන් ගෙන් ඉගෙණ කළාක් මෙන් වේ. මෙය හීන කර්ම නයයි.

උත්කෘෂ්ට කර්මයෙහිද කෘෂිකර්මය නොමැතිවිට මිනිසුන්ගේ ජීවිතය නොපවතී යයි සිතූ එක් පණ්ඩිතයෙක් මිනිසුන්ට පහසුවෙන් විසීමට නගුල් වියගස් ආදි කෘෂි උපකරණ උපදවයි. එසේම නානා ප්‍රකාර වණික් කර්ම ගවපාලන උපකරණද නිපදවයි. මේ සියල්ල ඔහු තමාගේ චින්තනයෙන් පරිකල්පනයෙන්ම කරයි. වෙන කෙනෙකුගෙන් ඉගෙන කලා මෙන් පවතී. මෙය උත්කෘෂ්ට කර්ම නයයි.

ද්විධ වූ ශිල්පායතනයෙහි එක් පණ්ඩිතයෙක් මිනිසුන්ගේ පහසු විහරණය පිණිස නළකාර ශිල්පාදි හීන ශිල්පාදි හස්තමුද්‍රා ගණන සංඛ්‍යාත මුද්‍රා අච්ඡින්න සංඛ්‍යාත ගණන මාතෘකා ප්‍රභේද වූ ලේඛන උපදවයි. මේවා තමාගේම චින්තනයෙන් උපදවයි. වෙන කෙනෙකුගෙන් ඉගෙන කළා සේම වෙයි. මෙය ශිල්පායතන නයයි. ඇතැම් පණ්ඩිතයෙක් අමනුස්ස සර්ප ආදීන්ගෙන් මිනිසුන්ට වන උපද්‍රවවලින් බේරීම සඳහා පිළියම් පිණිස නාගමණ්ඩල මන්ත්‍රාදි විජ්ජාථාන උපදවයි. ඒවා තමාගේ චින්තනයෙන්ම උපදවයි. **කම්මස්ස කතං** වා මේ කර්මය සත්වයන්ගේ ස්වකීය වේ. මෙය ස්වකීය නොවේ යයි දැකීම් නුවණ **සච්චානුලෝමිකං** වා විපස්සනා ඥාණය එය සතර සත්‍යවලට අනුලෝම වන බැවින් සච්චානුලෝමික යයි කියනු ලැබේ.

දැන් ඒවායෙහි පවත්නා ආකාරය දැක්වීමට රූපං **අනිච්චන්ති** වා යනාදිය කියන ලදී. මෙහිද අනිත්‍ය ලක්‍ෂණම ආවේය. දුක්ඛ ලක්‍ෂණ අනාත්ම ලක්‍ෂණ නොවේ. අර්ථ වශයෙන් ආ ඒවායි දතයුතුය. යමක් අනිත්‍යද දක්වන ලද අනුලෝමික ස්වභාවය **ඛන්ති** ආදි සියල්ල ප්‍රඥාවේ සමාන වචනම වේ. එය යට කියන ලද කම්මායතනාදි කරුණු පහේ විරුද්ධ නොවනු දැකීමෙන් **අනුලෝමිකා** එසේම සත්වයින්ගේ හිත පිණිස හැසිරීමෙන් පිළිවෙළ යයි මාර්ග සත්‍යයේ අනුලෝම වෙයි. පරමාර්ථ සත්‍ය වූ නිර්වාණයේ පිළියෙළ වීමෙන් අනුලෝමෙති යනුද අනුලොමිකා නම් වේ. මේ සියළු කරුණු ක්‍ෂමා කරයි. ඉවසයි. දැකීමට හැකිවෙයි යනු **ඛන්ති** වේ. බලයි යනු **දිට්ඨි** වේ. රුචිකරයි යනු **රුචි** **මිදේ** යනු **මුති** **මුදයි** යනු මුදි යනුද පාඨයකි. බලයි යනු **පෙක්ඛා** ඒ කර්මායතනාදි සියළු දහම් මෙනෙහි කරමින් ඉවසයි. විශේෂයෙන් පඤ්චස්කන්ධ සංඛ්‍යාත ධර්ම අනිත්‍ය දුක්ඛ අනාත්ම වශයෙන් නැවත නැවත මෙනෙහි කරන්නේ ඉවසයි යනු **ධම්ම නිජ්ඣානක්ඛන්ති. පරතො අසුත්වා පටිලභති** අන්‍යයකුගේ උපදේශ වචන නොඅසා තමාම සිතමින් ලබයි. **අයං වුච්චති** මෙය චින්තාමය ප්‍රඥාව යයි කියනු ලැබේ. එය වනාහි හැමදෙනාටම උපදින්නේ

නැත. මනාසේ දත්තා වූ මහා සත්වයන්ටම උපදී. එහිද සත්තානුලෝමික ඥාණය බෝධි සත්වයන්ට දෙගුණව උපදී. සෙසු ප්‍රඥා (පුරන ලද පාරමිතා ඇති) සියළු දෙනාටමද මනා ප්‍රඥාවන්තයන්ට ම උපදීයයි දතයුතුය.

**පරතො සුත්වා පටිලභති** යන මෙහි කර්මායතනාදි අන්‍යයන් විසින් කරනු ලබන හෝ කියනු ලබන හෝ දේ දැකීමෙන් අන්‍යයන් කියනු ලබන දේ ඇසීමෙන් ගුරුවරයෙකු ලඟ ඉගෙනීමෙන් ලබන ලද සියල්ල අනුන්ගෙන් අසාම ලබාගන්නා ලදැයි දතයුතුය. **සමාපන්නස්ස** සමාපත්තියෙන් යුක්ත වූ තැනැත්තාගේ ඇතුළ සමාපත්තියෙහි පවත්නා ප්‍රඥාව භාවනාමය නම් යයි අර්ථය. **දානය ආරබ්භ** යනු දානය නිසා දාන චේතනාවට ප්‍රත්‍ය වීමෙන් යන අර්ථයය. **යා උප්පජ්ජති** මෙසේ මේ දාන චේතනාවකින් යුක්ත වූ ප්‍රඥාව උපදී. මෙය දානමය ප්‍රඥා වේ. එය වනාහි දානයක් දෙන්නෙමියි සිතන්නාටද දානය දෙන්නාටද දාන දී එය සිහි කරන්නාටද පූර්ව චේතනා මුඤ්චන චේතනා අපර චේතනා යයි තුන් අවස්ථාවක උපදී. **දානාධිගච්ඡා** දානය පැමිණෙන්නාට. **සීලං ආරබ්භ සීලාධිගච්ඡ** මෙහිද සීල චේතනා සම්ප්‍රයුක්ත වූ සීලමය ප්‍රඥාවයයි අදහස් කරන ලදී. මෙයද සීලය පුරමියි සිතන්නට සීලය පුරන්නාට පසුව සිහි කරන්නාට පුබ්බ මුඤ්චන අපර චේතනා යයි ත්‍රිවිධ චේතනා උපදී. භාවනාමය යට කියන ලදී.

**අධිසීල පඤ්ඤා** ආදියෙහි සීලාදිය දෙයාකාරයකින් දතයුතුය. සීල අධි සීල චිත්ත අධි චිත්ත පඤ්ඤා අධිපඤ්ඤා වශයෙනි. එහි "උප්පාදා වා තථාගතානං අනුප්පාදා වා තථාගතානං ඨිතාව සා ධාතු ධම්මට්ඨිතිකා ධම්මනියාමිතා" යන මේ පෙළෙන් සංගෘහිත වශයෙන් පන්සිල්ද දසසිල්ද සිල් නම් වේ. එය තථාගතයන් වහන්සේ උපන් කල්හිද නැති කල්හිද වේ. නූපන් කල්හි පෙන්වන්නේ කවුද? තාපස පරිබ්බාජකා සර්වඥ බෝධි සත්වයෝද චක්කවත්ති රජතුමාද පෙන්වති. උපන් කල්හි භික්ඛු භික්ඛුණී සංඝයාද උපාසක උපාසිකාවෝද පෙන්වති. පාතිමොක්ඛ සංවර ශීලය සියල්ලටම අධිකය. තථාගතයන් වහන්සේ උපන් කල්හිම ඇති වේ. නූපන්කල්හි නොවේ. සර්වඥ සම්බුද්ධයන් වහන්සේම එය පෙන්වති. මේ වස්තුවල ව්‍යතික්‍රමයෙහි දී මෙය වේයයි පැනවීමට අනෙකෙකුට අවිෂය වේ. බුදුවරුන්ටම එය විෂය වේ. බුදුවරුන්ගේම බලය වේ. මෙසේ යමකින් ප්‍රාතිමෝක්ෂ සංවර සීලය අධිසීල වේ නම් එය අධිසීල පඤ්ඤා යයි දැක්වීමට **පාතිමොක්ඛ සංවරං**

**සංවරන්තස්ස** යනාදිය කියන ලදී. යට කියන ලද පරිදිම පෙලෙහි සංග්‍රහ කිරීම් වශයෙන් වට්ටපාදක අට්ඨ සමාපත්ති සිත නම් වේ. එය තථාගතයන් වහන්සේ උපන්නත් නැතත් ඇතිවේ. තථාගතයන් නැති කාලයේ එය උපදවන්නේ කවුද? තවුස්, පිරිවැජියෝද සර්වඥ බෝසත්ද සක්විති රජද වෙති. භගවත්හු උපන් කල විශේෂ ශක්ති ඇති භික්ෂු ආදීහු උපදවත්මය. විපස්සනා පාදක අට්ඨ සමාපත්තිය සියළු සිත්වලට වඩා අධිකය. තථාගතයන් වහන්සේ උපන් කාලයේම උපදවති. නූපන් කාලයෙහි නොවේ. සර්වඥ බුදුවරයෝම පනවති. මෙසේ අට්ඨ සමාපත්ති අධිචිත්ත වේ. එහෙයින් අධිසිත් ඇති ප්‍රඥාව දැක්වීම. **රූපාවචරාරූපාවර සමාපත්ති සමාපජ්ජන්තස්ස** යනාදිය කියන ලදී. යට කියන ලද පෙලෙහි සංගෘහිත වශයෙන් කම්මස්සකත ඥාණය ප්‍රඥාව නම්. එය තථාගතයන් වහන්සේ උපන්නත් නැතත් ඇතිවේ. නූපන් කාලයේ වේලාම දානය වෙස්සන්තර දානය ආදි වශයෙන් උපදී. තථාගතයන් උපන් කාලයේ ඒ නුවණින් මහාදාන පවත්වන්නන්ගේ ප්‍රමාණවත් නැත. මග්ගඵල ප්‍රඥාව වනාහි සියළු ප්‍රඥාවලින් අධික වේ. තථාගතයන් උපන් කාලයේම විස්තර කරන්නක්ව පවත්වයි. නූපන් කාලයේ නොවේ.

මෙසේ මග්ග ඵල පඤ්ඤා අධි පඤ්ඤා නිසා අධි ප්‍රඥාවෙන් ප්‍රඥාව දැක්වීමට **චතුසුමග්ගෙසු** ආදිය කියන ලදී. එහි සීල අධි සීල චිත්ත අධිචිත්ත පඤ්ඤා අධි පඤ්ඤා වන්නේය. මේ කොටස් හයෙහි විපස්සනා ප්‍රඥාව කුමන කොටසක පිහිටියේද? අධි ප්‍රඥාවේය. එහෙයින් අඩු කුමන ප්‍රමාණයේ වුවත් ඡත්‍රයක් හෝ කොඩියක් හෝ ගෙන සසඳා අති ප්‍රමාණ වූ අති ඡත්තං අතිධජ යයි කියනු ලැබේ. එසේම පඤ්ච සීලය දසසීලය ගෙන සසඳා ප්‍රාතිමෝක්ෂ සංවර සීලය අධිසීල වේ. සසරට පාදක වූ අෂ්ට සමාපත්තිය හා සසඳා විපස්සනා පාදක අෂ්ට සමාපත්තිය අධිචිත්ත නම් වේ. කම්මස්සකත ප්‍රඥාව ගෙන විපස්සනා ප්‍රඥාවද මාර්ග ප්‍රඥාවද ඵල ප්‍රඥාවද අධි ප්‍රඥා නම් යයි දතයුතුය. ආයකොසල්ල නිද්දේසයෙහි **ආයො** යනු වෘද්ධියයි. එය අනර්ථයට හානි කරන සහ අර්ථ උත්පත්ති වශයෙන්ද දෙයාකාරය. **අපායො** අවෘද්ධියයි. එය අර්ථ හානි සහ අනර්ථ ඇතිකිරීම් වශයෙන් දෙයාකාරය. එහෙයින් එය දැක්වීමට **ඉමෙ ධම්මා මනසිකරොතො** යනාදිය කියන ලදී. **ඉදං වුච්චති** මේ අකුසල ධර්මයන්ගේ ඉපදීම ප්‍රහාණය කිරීමෙහි සහ කුසල ධර්මයගේ ඉපදවීමෙහි ප්‍රඥාව මේ ආය කෝසල්ල යයි කියනු ලැබේ. කුසල ධර්මයන්ගේ ඉපදීම වැලැක්වීමෙහි සහ අකුසල ධර්මයන්ගේ

ඉපදවීමෙහි ප්‍රඥාව අපාය කොසල්ල නම් යයි කියනු ලැබේ. ආය කොසල්ල පඤ්ඤා වේ. අපාය කොසල්ලයට පඤ්ඤා නාමය කෙසේ ඇතිවේද? මාගේ පඥාව යයි මෙනෙහි කරන්නාට නූපන් කුසල් නූපදී. උපන් කුසල් නැති වේ. නූපන් අකුසල් ඉපදේ. උපන් අකුසල් වැඩේ යයි දකී. හෙතෙම මෙසේ දැන නූපන් අකුසල් ඉපදීමට නොදේ. උපන් අකුසල් දුරුකරයි. නූපන් කුසල උපදවයි. උපන් කුසල් භාවනා වශයෙන් සම්පූර්ණ කරයි. මෙසේ අපාය කෝසල්ලයද ප්‍රඥාවම යයි දතයුතුය. එහි උපාය සියළු ප්‍රඥාවද උපාය කෝසල්ල වේ. මෙය වනාහි වහා කටයුතු කෘත්‍යයෙහි හෝ බියෙහි හෝ උපන් කල ඊට වහා ප්‍රතිකාර කිරීම ස්ථානෝත්පත්ති කරුණු දැනගැනීම් වශයෙන්ම දැනගත යුතුය. සෙසු සියල්ල ප්‍රකටය.

### තිකය.

සතරාකාරයෙන් ඤාණ වස්තු නිර්දේශයෙහි අත්‍ථිදින්නං යනාදියෙහි දෙන ලද හෙයින් ඵලය ඇතැයි මේ උපායෙන් අර්ථය දතයුතුය. ඉදං වුච්චති යම් ඤාණයක් මේ ක්‍රියාව තමාගේද අනුන්ගේදැයි දනී. මෙය කම්මස්සකත ඤාණයයි කියනු ලැබේය යන අර්ථයය. එය කාය දුෂ්චරිත ත්‍රිවිධය. වචී දුෂ්චරිත චතුර්විධය. මනෝ දුෂ්චරිත ත්‍රිවිධය. මෙය ස්වකීය කර්ම නොවේ. තුන්දොරෙහි දසවිධ සුචරිතය ස්වකීය කර්ම නම් වේ. තමාගේ හෝ වේවා අනුන්ගේ හෝ සියළු අකුසල ස්වකීය කර්ම නොවේ. කුමක් නිසාද? අර්ථය බිඳින නිසාද අනර්ථය උපදවන නිසාද වේ. තමාගේ හෝ අනුන්ගේ හෝ වේවා සියළු කුසලය ස්වකීය කර්ම වේ. කුමක් හෙයින්ද? අනර්ථය බිඳින නිසාත් අර්ථය උපදවන නිසාත්ය. මෙසේ දැනගැනීම සමත් මේ කම්මස්සකත ඤාණයෙහි සිට බොහෝ දන් දී සිල් පුරා පෙහෙවස් සමාදන්ව සැපයෙන් සැපයට සම්පත්තියෙන් සම්පත්තියට පැමිණීමෙන් අනුභව කොට නිවනට පැමිණි ගණන් සීමාවක් නැත. යම්සේ ධනවත් පුරුෂයෙක් ගැල් පන්සියයක ගිතෙල් පැණි ආදියද ලුනු තල සහල් ආදියද පුරවා කාන්තාර මාර්ගයට පිළිපන්නේ කිසියම් කරුණකින් ධනය ලැබුණු කල්හි සියළු උපකරණ ගන්නා ලද්දේ. සිතිවිල්ලක නැති ගැනීමකට නොපැමිණ සැපයෙන් ක්ෂේම ස්ථානයට පැමිණෙයි. එසේම මෙම කම්මස්සකත ඤාණයෙහි සිට බොහෝ දන් දී........ නිවනට පැමිණිය අයගේ ගණන් සීමාවක් නැත. ඨපෙත්වා සච්චානු ලොමිකං ඤාණං මාර්ග සත්‍යයේද පරමාර්ථ සත්‍යයේද අනුලෝම වශයෙන් සත්‍යානුලෝමක නය ලද නම් ඇති විපස්සනා ඤාණය හැර අවසේස සියළු ආශ්‍රව සහිත කුසල ප්‍රඥා කම්මස්ස කත ඤාණයම යයි අර්ථයයි.

**මග්ගසමංගිස්ස ඤාණං දුක්ඛෙපෙතං ඤාණං** මෙහි එකම මග්ග ඤාණය චතුස්සත්‍යයෙහි එකම ප්‍රතිවේධය වශයෙන් ස්ථාන සතරක සංග්‍රහ විය. **ධම්මෙ ඤාණං** මෙහි මාර්ග ඤාණය චතුස්සත්‍යවල එකම ප්‍රතිවේධය වශයෙන් ධර්මයෙහි ඤාණය නම් වේ. හේතුඵල ප්‍රඥාව කෙසේ ධර්මයෙහි ඤාණය වේද? නිරෝධ සත්‍ය වශයෙනි. මේ ප්‍රඥාව දෙයාකාරය. අපර ප්‍රත්‍යයෙහි ධර්මය ප්‍රත්‍යක්‍ෂ කිරීමෙහි ද ආර්ය සත්‍ය ධර්මයෙහි කෘත්‍ය වශයෙන්ද අරමුණු වශයෙන් ද පවත්වන ලද ධර්මයෙහි ඤාණයයි දතයුතුය. **සො ඉමිනා ධම්මෙන** මෙහි මාර්ග ඤාණය ධර්මයට ගෝචරවන බැවින් ගෝචර ව්‍යවහාරයෙන් ධර්මය යයි කියන ලදී. උපයෝග අර්ථයෙහි හෝ කරණ වචනයයි. මේ ධර්මය දැනගන්නා විසින් යන අර්ථයයි. චතුසත්‍ය දැන සිටින්නා විසින් මාර්ග ඤාණයෙන් යයි කියන ලද්දේ වේ. දිට්ඨෙන දැකීමෙන්, ධර්ම දැක සිටින්නා විසින් යන අර්ථයයි. **පත්තෙන** චතුරාර්ය සත්‍යයට පැමිණ සිටි බව. ධර්මයට පැමිණි තැනැත්තා විසින්. **විදිතෙන** මාර්ග ඤාණයෙන් ආර්ය සත්‍ය දැනගන්නා ලද්ද ප්‍රකට කරන ලදී. එහෙයින් එය ධර්ම විදිත නම් වේ. එම දැනගන්නා ලද ධර්මයෙන්. **පරියොගාළ්හෙන** චතුසත්‍ය ධර්මය සම්පූර්ණයෙන් අවබෝධ කොට සපයනු පෙනේ. **නයං හොති** අතීතයෙහිද අනාගතයෙහිද නය පමුණුවයි ගෙනයයි යවයි. මෙය වනාහි මාර්ග ඤාණයේ කෘත්‍ය නොවේ. ප්‍රත්‍යවේක්‍ෂා ඤාණයේ කෘත්‍යයයි. ශාස්තෘන් වහන්සේ විසින් මාර්ග ඤාණය අතීත අනාගතයෙහි නය ඇස් හා සමාන කරන ලදී. කුමක් හෙයින්ද? මාර්ගය මූලික බැවිනි. භාවිත මාර්ගය ප්‍රත්‍යවේක්‍ෂාව මෙනි. එහෙයින් ශාස්තෘන්වහන්සේ මග්ග ඤාණයව ඇස් හා සමාන කළහ. තවද මේ අර්ථය මෙසේ දතයුතුය. චතුසත්‍ය ගෝචර වේ. අවබෝධ කළ මාර්ග ඤාණය ඒ ඤාණයෙන් අතීත අනාගතයෙහි ප්‍රත්‍යවේක්‍ෂා සංඛ්‍යාත නය පමුණුවයි.

දැන් එයින් යම්සේ නය පමුණුවයිද ඒ ආකාරය දැක්වීමට **යෙහි කෙචි අතීත මද්ධානං** යනාදිය කීහ. එහි **අබ්භඤ්ඤංසු** යනු දැනගත්හ. අවබෝධ කළහ. **ඉමඤ්ඤෙවා** යම් දෙයක් අතීතයෙහි දැනගත්හ. අනාගතයෙහි දැනගන්නේය. එයම දැන් නැත. සමාන අර්ථයෙන් මෙසේ කියන ලදී. අතීතයෙහිද තණ්හාව හැර ත්‍රෛභූමික ස්කන්ධයෙහිම දුක්ඛ සත්‍යය අවබෝධ කළහ. තණ්හාව සමුදය සත්‍යයේ නිබ්බාණය නිරෝධ සත්‍යයයි. ආර්ය මාර්ගයම මාර්ග සත්‍යයය අවබෝධ කළහ. අනාගතයෙහිද මෙසේම අවබෝධ කරන්නෝය. දැන්ද මෙසේම අවබෝධ

කරති. සමාන අර්ථයෙන් ඉමඤ්ඤො යයි කියන ලදී. ඉදං වුච්චති අන්වයෙ ඤාණං මේ අනුගමන ඤාණය, නයන ඤාණය කරණ ඤාණ යයි කියනු ලැබේ. පරිච්ඡේද ඤාණං සිතේ පරිච්ඡේද ඤාණයයි. පරසත්තානං තමා හැර සෙසු සත්වයන්ගේ අනික ඊටම සමාන වචනයකි. චෙතසා චෙතො පරිච්ච පජානාති තමාගේ සිතින් ඔවුන්ගේ සිත සරාගාදි වශයෙන් පිරිසිඳ නොයෙක් ආකාරයෙන් දනී. සරාගංවා යනාදියෙහි කිවයුතු දේ සතිපට්ඨාන විභංගයෙහි කියන ලදී. මෙය විශේෂයකි. මෙහි අනුත්තරං වා චිත්තං විමුත්තං වා චිත්තං මෙහි ලෝකෝත්තරයද ලබයි. විපස්සනාවට නොපැමිණද පරසිත් දැනගැනීම ඤාණයේ විෂය වේමය.

අවසේසා පඤ්ඤා යනු ඤාණාදික වූ පඤ්ඤා තුන හැර සෙසු සියළු ප්‍රඥා ඤාණයය. සම්මත හෙයින් සම්මත ඤාණ නම් වේ. මෙහි වචනාර්ථය වනාහි සම්මතයෙහි ඤාණය සම්මති ඤාණය වේ. කාමාවචර කුසලෙ පඤ්ඤා මෙය ඒකාන්තයෙන් සසරෙහි චුති පටිසන්ධි රැස්කරයි. එහෙයින් ආචයාය නො අපචයාය යයි කියන ලදී. ලෝකෝත්තර මාර්ග ප්‍රඥාව වනාහි චුති පටිසන්ධි යම්සෙයකින් රැස්කරයිද එහෙයින් අපචයාය හෝ ආචයාය යයි කියන ලදී. රූපාවචර අරූපාවචර ප්‍රඥාව චුති පටිසන්ධි රැස්කරයි. විෂ්කම්භන වශයෙන් කෙලෙස්ද කෙලෙස් මූලයද ධර්මයෙහි රැස්කරයි. එහෙයින් ආචයාය චෙව අපචයාච යයි කියන ලදී. සෙස්ස චුති පටිසන්ධි රැස් නොකරත්මය. විනාශ නොකරයි. එහෙයින් නෙව ආචයාය නො අපචයාය යයි කියන ලදී. න ච අභිඤ්ඤා යො පටිවිජ්ඣති යන මෙය ප්‍රථම ධ්‍යාන සංඥාව සඳහා කියන ලදී. එය කාම විවේකයෙන් පැමිණිය යුතු බැවින් කෙලෙසුන් ගැන කලකිරීම පිණිස පවතී. එයද මේ කාමයන්හි වීතරාග වේ. අභිඤ්ඤාපාද භවයට නොපැමිණි හෙයින් පඤ්චාභිඥා අවබෝධ නොකරයි. නිමිති අරමුණු බැවින් සත්‍ය අවබෝධ නොකරයි. මෙසේ මේ ප්‍රඥාව කළකිරීම පිණිස වේ. ප්‍රතිවේධය පිණිස නොවේ. ස්වෙචා යන ප්‍රථම ධ්‍යානයට පැමිණ සිටියේ කාමෙසු වීතරාගො සමානො එසේ විෂ්කම්භිත කාම වශයෙන්ම වීතරාග වේ. අභිඤ්ඤායො පටිවිජ්ජති අභිඥා පහ අවබෝධ කරයි. මෙය චතුර්ථ ධ්‍යාන ප්‍රඥාව අරබයා කියන ලදී. චතුර්ථධ්‍යාන ප්‍රඥාව අභිඥාපාදක භවයෙන් පඤ්ච අභිඤ්ඤා අවබෝධ කරයි. අභිඥාභාවයට පිවිසීමද අවබෝධ කරයි. එහෙයින් එය ප්‍රතිවේධය පිණිස පවතී.

පඨමස්ස ඣානස්ස ලාභී යනාදියෙහි යමෙක් අල්පගුණ ඇති මේ

ප්‍රථමධ්‍යාන ලාභීව ඔහු එයින් නැගිට අරමුණු වශයෙන් කාම සහගතව සංඥා මෙනෙහි කරමින් හැසිරේ. **චෝදනා** කරයි. පෙළයි. ඔහුගේ කමටහන් ලුහුබඳින්නේ සංඥා මනසිකාර වශයෙන් ප්‍රථම ධ්‍යාන ප්‍රඥාව පිරිහෙයි. එහෙයින් **හානභාගිනී** යයි කියන ලදී. **තදනුධම්මා** යනු ඊට අනුරූප ස්වභාවයයි. **සති සත්තිට්ඨති** යන මෙය මිච්ඡා සති සඳහා කියන ලදී. සම්මා සති සඳහා නොවේ. යමෙකුට ප්‍රථමධ්‍යාන අනුරූප ස්වභාවය ප්‍රථම ධ්‍යානය සාන්ත වශයෙන් ප්‍රණීත වශයෙන් දැක ආශ්වාදනය කරමින් සතුටුවෙමින් ලෝභය උපදී. ඔහුට ලෝභ වශයෙන් ඒ ප්‍රථම ධ්‍යාන ප්‍රඥාව නොපිරිහේ. නොවැඩේ. සිටි තැනම වෙයි. එහෙයින් **ඨිති භාගිනී පඤ්ඤා** යයි කියන ලදී. **අවිතක්ක සහගතා** යනු අවිතක්ක වූ දුතිය ධ්‍යාන සාන්ත වශයෙන් ප්‍රණීත වශයෙන් මෙනෙහි කරන්නේ අරමුණු වශයෙන්. අවිතක්ක සහගතය. **සමුදා චරන්ති** ප්‍රගුණ වශයෙන් ප්‍රථමධ්‍යානයෙන් නැගිට දුතිය ධ්‍යානය අවබෝධ කරනු පිණිස පෙළයි. චෝදනා කරයි. ඔහුට ඉහළ දෙවන ධ්‍යානයට පැන යන්නේ **සඤ්ඤා** මෙනෙහි කිරීම් වශයෙන් ඒ ප්‍රථම ධ්‍යාන ප්‍රඥාව විශේෂ වූ දෙවන ධ්‍යානයේ උපතට ස්ථාන වශයෙන් **විසේසභාගිනී** යයි කියන ලදී. **නිබ්බිදා සහගතා** යනු ඒ ප්‍රථම ධ්‍යානලාභී ධ්‍යානයෙන් නැගිට නිබ්බිදා සංඛ්‍යාත විපස්සනා ඥාණයෙන් යුක්ත වූයේ විපස්සනා ඥාණය ධ්‍යානාංග භේද පවතිනවිට කළකිරෙයි. උකටලී වෙයි. එනිසා නිබ්බිදා යයි කියනු ලැබේ. සමුදා චරන්ති නිර්වාණය සාක්‍ෂාත් කිරීම පිණිස චෝදනා කරයි. පෙළයි. **විරාගුපසඤ්ඤතා** විරාග සංඛ්‍යාත නිවනෙන් යුක්ත. මේ මගින් විරාග වූ නිවන අවබෝධ කරගැනීමට විපස්සනා ඥාණයට හැකි වේ. එසේ පැවතීම විරාගුප සහිත යයි කියනු ලැබේ. ඒ සම්ප්‍රයුක්ත සංඥා මෙනෙහි කිරීම්ද විරාගයෙන් යුක්ත වේමය. ඔහුගේ ඒ සංඥා මෙනෙහි කිරීම් වශයෙන් ඒ ප්‍රථම ධ්‍යාන ප්‍රඥාව ආර්ය මාර්ගය ප්‍රතිවේධයට (අවබෝධයට) පාදක බැවින් **නිබ්බෙධභාගිනී** යයි කියන ලදී. මෙසේ ස්ථාන සතරෙහිම ප්‍රථමධ්‍යාන ප්‍රඥාව කියන ලදී. දුතිය ධ්‍යාන ප්‍රඥා ආදියෙහිද මෙම නයින් අර්ථය දැනගත යුතුය.

**කිච්ඡෙන කසිරෙන සමධිං උප්පාදෙන්තස්සා** යනු ලෝකෝත්තර සමාධිය උපදවන්නේ මුල් අවස්ථාවේ අපහසුවෙන් දුකෙන් ප්‍රයෝගයෙන් ක්ලාන්ත වන්නේ කෙලෙසුන් විෂ්කම්භනය කොට පැමිණියහුගේ **දන්ධං තණ්ඨානං අභිජානන්තස්ස** කෙලෙස් විෂ්කම්භනය කළ කල්හි විපස්සනාවෙහි කලක් පරිවාසයෙන් වැසි ඒ ලෝකෝත්තර සමාධි සංඛ්‍යාත ස්ථානයට

දන්‍ධව සෙමින් දැනගන්නේ අවබෝධ කරන්නේ පැමිණෙන්නේය යන අර්ථයයි. **අයං වුච්චති** එය එසේ උපදී. මේ කෙලෙස් විෂ්කම්භන ප්‍රතිපදාව දුක් බැවින් විපස්සනා පරිවාස ප්‍රඥාවද දන්‍ධ බැවින් මාර්ග කාලයෙහි ඒක චිත්තක්‍ෂණයෙහි උපන් ප්‍රඥාවද පැමිණීම් වශයෙන් **දුක්ඛා පටිපදා දන්ධාභිඤ්ඤා** නාම යයි කියනු ලැබේ. මතු පද තුනෙහිද මෙනයින් අර්ථය දතයුතුය. **සමාධිස්ස න නිකාමලාභිස්ස** යමෙක් සමාධියට කැමති නොවේද හේ ඊට කැමති ලාභියෙක් නොවේ. යමෙකුට සමාධිය මතුමත්තෙහි සමවැදීමට උත්සාහවත් කරන ප්‍රත්‍ය නොවේද. ඔහු අල්පගුණ ධ්‍යානලාභි යන අර්ථයය.

**ආරම්මණං ථොකං ඵරන්තස්ස** අඩු කුල්ලක් ගෙන සරාවක් පමණ අරමුණෙහි පරිකර්ම කොට එහිම අර්පණාවට පැමිණ එය නොවඩන ලද කුඩා අරමුණක් පතුරුවනවා යන අර්ථයයි. සෙසු පදවලද මෙම නයයි. නිකාමලාභීන්ට ප්‍රතිපක්‍ෂ නොවන ප්‍රගුණ ධ්‍යානලාභීන් මෙහි නිකාමලාභී යයි කියන ලදී. නොවඩන ලද අරමුණු ඇති ප්‍රතිපක්‍ෂයන්ට වඩන ලද අරමුණ **විපුලං** යයි කියන ලදී. සෙස්ස එබඳුමය. **ජරාමරණපෙතං ඤාණං** නිවනම අරමුණුකොට චතුස්සත්‍යයන්ගේ එක් ප්‍රතිවේධයක් වශයෙන් මෙය කියන ලදී. **ජරාමරණ ආරම්භ** යනාදිය වනාහි එක එක වස්තුව අරබයා පවතින පෙර කාලයෙහි සත්‍ය මෙනෙහි කිරීම වශයෙන් කියන ලදී. සෙසු සියළු තැන ප්‍රකටය.

## චතුක්කං

පස් ආකාරයකින් ඤාණවස්තු නිද්දේසයෙහි **පීතඵරණතා** ආදියෙහි ප්‍රීතිය පතුරුවමින් උපදිපි යන ධ්‍යාන දෙකෙහි ප්‍රඥාව **පීතිඵරණතා** නම් වේ. සැපය පතුරවමින් උපදියි යන ධ්‍යාන තුනෙහි ප්‍රඥාව **සුඛඵරණතා** නම් වේ. අන්‍යයන්ගේ සිත පතුරවමින් උපදියි යන චෙතොපරිය ප්‍රඥාව **චෙතො ඵරණතා** නම් වේ. ආලෝකය පතුරවමින් උපදියි යන දිබ්බචක්ඛු ප්‍රඥාව **ආලොක ඵරණතා** නම් වේ. ප්‍රත්‍යවේක්‍ෂණ ඤාණය **පච්චවෙක්ඛණා නිමිත්තං** නම් වේ. එහෙයින්ම කියන ලදී. **ද්වීසු ඤාණෙසු පඤ්ඤා පීති ඵරණතා** යනාදිය. එහි ප්‍රීති පැතිරවී සැපය පැතිරවීම පා දෙක මෙනි. සිත පැතිරවීම ආලෝකය පැතිරවීම දෑත මෙනි. අභිඥාපාදක ධ්‍යානය මධ්‍යම කය මෙනි. ප්‍රත්‍යවේක්‍ෂා නිමිත්ත හිස මෙනි. මෙසේ භාග්‍යවතුන් වහන්සේ අංගපසකින් යුත් සම්මා සමාධිය අඞ්ගපසඟින් යුත් පුරුෂයකු

කොට දැක්වූහ. **අයං පඤ්චංගිකො සම්මා සමාධි** යයි මෙය අත් පා හිස යන අංග පසකින් යුත් සමාධිය යයි පාදක ධ්‍යානය කීහ. **අයං සමාධි පච්චුප්පන්න සුඛොචෙව** යනාදියෙහි අරහත්ත ඵල සමාධිය අභිප්‍රේතය. එය වනාහි අර්පිත අර්පිත ක්‍ෂණයෙහි සැප ඇතිවේ. **පච්චුප්පන්න සුඛො** පෙර ඒවා පසු සමාධි සැපයට ප්‍රත්‍ය වේ. **ආයතිං සුඛ විපාකො** සාන්ත වූ සියුම් වූ ඵල හිත ප්‍රණීත වූ මිහිරි රූ උපදවයි. ඵල සමාපත්තියෙන් නැගිටීමෙන් සියළු ශරීරය අනුගත වූ සැප ස්පර්ශය පොට්ඨබ්බය නිසා සුඛ සහගත කාය විඤ්ඤාණය උපදවයි. මේ ආකාරයෙන් **ආයතිං සුඛ විපාකො** කෙලෙසුන්ගෙන් දුරු බැවින් **අරියො**. කාම ආමිස සසර ආමිස ලෝක ආමිසවලින් අභාවය නිසා **නිරාමිසො**. බුද්ධාදි මහා පුරුෂයින් සේවනා ලද බැවින් **මහා පුරිස සෙවිතො**. අංග සාන්ත බැවින්, අරමුණු සන්ත බැවින් සියළු කෙලේ දැවිලි සාන්ත කළ බැවින් **සන්තො**. තෘප්තිමත් නොව අර්ථයෙන් **පණීත** කෙලෙස්වලින් සංසිඳීමක් ලත් බැවින් කෙලෙස් සංසිඳීම් ස්වභාවය හෝ ලත් බැවින් **පටිප්පස්සද්ධි ලද්ධො** පටිපස්සද්ධං පටිප්පසද්ධි යන මෙය අර්ථ වශයෙන් එකය. සංසිඳුණු කෙලෙසුන්ගෙන් හෝ අරහත්බව ලැබීම වූ **පටිප්පස්සද්ධි ලද්ධා** වේ. එකග බවෙන් අවබෝධ කළ එකඟබවම හෝ අවබෝධ කළ **එකොදිභාවාධිගත** වේ. අල්ප ගුණ ආසව සහිත සමාධි මෙන් සසංඛාරයෙන් ප්‍රයෝග සහිත සිතින් විරුද්ධ දහම් නිග්‍රහකොට කෙලෙස් වලකා අවබෝධ නොකළ නිසා **න සසංඛාර නිග්ගයහ වාරිතගතො** වේ. ඒ සමාධියට සමවදින්නේ එයින් නැගී සිටින්නේ සිහිය මහත්බවට පැමිණ ඇති බැවින් සිහියෙන්ම සමවදියි. සිහියෙන්ම නැගී සිටියි. නියමකරගත් කාල වශයෙන් හෝ සිහියෙන් සමවදියි. සිහියෙන් නැගිටියි. එහෙයින් මෙහි මේ සමාධිය වර්තමාන සැපයද පසුව සැපවිපාකදැයි මෙසේ ප්‍රත්‍යවේක්‍ෂා කරන්නාට තමාටම අපර ප්‍රත්‍ය වූ ඤාණය උපදී. එය එක් අංගයකි. සෙස්සෙහි ද මෙම නයයි. මෙසේ මේ ප්‍රත්‍යවේක්‍ෂා ඤාණ පහෙන් මේ සමාධිය පඤ්ච ඤාණික සම්මා සමාධි නමැයි කියන ලදී.

## පඤ්චකං

සයාකාරයකින් වස්තු නිර්දේශයෙහි **ඉද්ධිවිධෙ ඤාණං** එකෙක් වී බොහෝ වේයයි ආදි නය පවතින ඉද්ධිවිධ ඤාණයෙහි **මේ අවිතක්ක** අවිචාර උපෙක්ඛා සහගත රූපාවචර බොහෝ ආකාර භවාදිය සාදන ඒක චිත්තක්‍ෂණික ආදි බේදවලින් යුත් ශබ්ද අරමුණුවල දිවඇස් ඇති

ධාතුවේ ඥාණයයි. මෙයද අවිතක්ක අවිචාර උපෙක්ඛා සහගත රූපාවචර ප්‍රකෘති කනේ විෂය ඉක්මවා ගිය ශබ්ද අරමුණු ඇති ඒක චිත්තක්‍ෂණික අර්පණා ප්‍රඥාව යයි කියන ලදී. **පරචිත්තෙ ඤාණං** අන්‍ය සත්වයන්ගේ සිත පිරිසිඳ දන්නා ඥාණයයි. මෙයද කලින් කී ආකාර අනුන්ගේ රාග සහිත සිතේ අරමුණු දන්නා ඒක චිත්තක්‍ෂණික අර්පණා ප්‍රඥාව යයි කියන ලදී. **පුබ්බෙනිවාසානුස්සති ඤාණං** පෙර විසීම සිහිකිරීමෙන් යුත් ඥාණයයි. මෙයද කලින් කී ආකාර පෙර විසූ ස්කන්ධ සිහිකරන සිහියෙන් යුත් ඒක චිත්තක්‍ෂණික අර්පණා ප්‍රඥාව යයි කියන ලදී. **සත්තානං චූතුපපාතෙ ඤාණං** සත්වයින්ගේ චුතියද උත්පත්තියේද ඥාණයයි. මෙයද කලින් කී පරිදි චුතවන උපදින සත්වයින්ගේ වර්ණධාතු අරමුණු ඒක චිත්තක්‍ෂණික අර්පණා ප්‍රඥාව කියන ලදී. **ආසවානං ඛයෙ ඤාණං** සත්‍ය පිරිසිඳ දන්නා ඥාණය. මෙය ලෝකෝත්තරය. සෙසු ඒවා ලෞකිකය.

## ඡක්කය

සත් ආකාරයකින් ඥාණවත්‍ථු නිද්දේසයෙහි **ජාති පච්චයා ජරාමරණං** යනාදි නයින් පැවතීම් නැවතීම් වශයෙන් එකොලොසක් වූ පටිච්ච සමුප්පාද අංගවල එක එකක කාලත්‍රයෙන් යුක්ත වූ ප්‍රත්‍යවේක්‍ෂා ඥාණය කියා නැවත ධර්ම ස්ථිති ඥාණය සංක්ෂේපයෙන් ක්‍ෂය ධර්මතා ආකාරයෙන් කියන ලදී.

එහි **ජාති පච්චයා ජරාමරණං අසති ජාතියා නත්‍ථි ජරාමරණං** යයි ඥාණ දෙකක් වර්තමාන කාල වශයෙන් කියන ලදී. **අතීතම්පි අද්ධානං අනාගතම්පි අද්ධානං** යයි මෙසේ අතීතයෙහි ඥාණ දෙකක් අනාගතයෙහි ඥාණ දෙකක්යැයි සිය ධර්ම ස්ථිති ඥාණය සමග සතකි. එහි **ධම්මට්ඨිති ඤාණං** යනු ප්‍රත්‍ය ආකාර ඥාණයයි. ප්‍රතයාකාරව ධර්මයන්ගේ පැවතී සිටීමට කරුණුවන බැවින් ධම්මට්ඨිති යයි කියනු ලැබේ. එහි ඥාණය ධම්මට්ඨිති ඥාණයයි. මෙයම සයාකාර වූ ඥාණයට අධිවචනයකි. මෙසේ එක එක අංගයෙහි මේවා සත බැගින් අංග එකොලහේ සත් සැත්තෑවක් වේ. එහි **ඛය ධම්මං** යනු ක්‍ෂයවන ස්වභාවයයි. **වය ධම්මං** වැයවන ස්වභාවයයි. **විරාග ධම්මං** යනු නොඇලෙන ස්වභාවයයි. **නිරොධ ධම්මං** යනු නිරුද්ධවන ස්වභාවයයි. මෙයින් කුමක් කියන ලදද? පසු විදර්ශනායෙන් පෙර විදර්ශනා සිහිකිරීම කියන ලදී. එයින් කුමක් කියන ලදද? සත්වරක් විපස්සනා පටිවිපස්සන කියන ලදී. පළමුවන ඥාණයෙන්

සියළු සංස්කාරයන් අනිත්‍ය දුක්ඛ අනාත්ම යයි දැක ඒ ඤාණය දෙවැනි නුවණින් දැකීමට වටී. දෙක තුන්වැනි ඤාණයේ තුන සතරවැනි ඤාණයෙන් සතර පස්වැනි ඤාණයෙන් පහ සවැනි ඤාණයෙන් සය සත්වැනි ඤාණයෙන් මෙසේ සත් විපස්සනා පටිවිපස්සනා කියන ලද්දේ වේ.

### සත්තකං

අට ආකාරයකින් ඤාණවත්‍ථු නිද්දේසයෙහි **සෝතාපත්ති මග්ගෙ පඤ්ඤා** යනු සෝවාන් මාර්ගයෙහි ප්‍රඥාවයි. එයින් යුත් ප්‍රඥාවම කියන ලදී. සෙසු පදවලද මෙම නයයි.

### අට්ඨකං

නව ආකාර ඤාණවත්‍ථු නිද්දේසයෙහි **අනුපුබ්බ විහාර සමාපත්තිසු** අනුපූර්ව විහරණ සමාපත්තිවල. ඒවායේ පිළිවෙළින් අනුපිළිවෙළින් විහරණය කළයුතු තැන පිළිවෙළින් වසන බව. සමවදින තැනින් සමාපත්ති බව දතයුතුය. **කතං පඨමජ්ඣාන සමාපත්තියා පඤ්ඤං** යනාදිය සම්ප්‍රයුක්ත ප්‍රඥා අට දැනගත යුතුය. නවවැනි ප්‍රත්‍යවේක්‍ෂා ප්‍රඥාව. එය නිරෝධ සමාපත්තිය සාන්ත වශයෙන් ප්‍රණීත වශයෙන් ප්‍රත්‍යවේක්‍ෂා කරන්නාට පවතී. එයින් කියන ලදී. **සඤ්ඤා වෙදයිත නිරොධ සමාපත්තියා වුට්ඨිතස්ස පච්චවෙක්ඛණ ඤාණං** සඤ්ඤා වේදයිත නිරෝධ සමාපත්තියෙන් නැගිටි තැනැත්තාගේ ප්‍රත්‍යවේක්‍ෂා ඤාණය.

### නවකං

දස ආකාරයකින් ඤාණවත්‍ථු නිද්දේසයෙහි **අට්ඨානං** හේතු ප්‍රතික්‍ෂේපය. **අනවකාසො** යනු ප්‍රත්‍ය ප්‍රතික්‍ෂේපයයි. දෙකින්ම හේතුව ප්‍රතික්‍ෂේප කරයි. හේතුවෙහි ඊට අයත් පැවතුම් ඇති බැවින් තමාගේ ඵලයට හේතුව යයිද ප්‍රත්‍යයයිද කියනු ලැබේ. **යං** යම් කරුණකින්. **දිට්ඨි සම්පන්නො** යනු මාර්ගය දැකීමෙන් යුත් සෝවාන් ආර්ය ශ්‍රාවකයා. **කිඤ්ච සංඛාරං** චතුභූමිවල සංඛත සංස්කාරයන් අතරෙහි කිසියම් එක් සංස්කාරයක් ද. **නිච්චතො උපගච්ඡෙය්‍ය** නිත්‍ය වශයෙන් ගන්නේය. **නෙතං ඨානං විජ්ජති** මේ කරුණ නැත. නොලැබේ. **යං පුථුජ්ජනො** යම්

කරුණකින් පෘථග්ජන වූ. ඨානමෙතං **විජ්ජති** මේ කරුණ ඇත. සාස්වත දෘෂ්ටියෙන් හෝ ත්‍රෛභූමික සංස්කාරවල කිසියම් සංස්කාරයක් නිත්‍ය වශයෙන් ගන්නේය යන අර්ථයයි. චතුභූමික සංස්කාර තේජෝ ධාතුව අධික බැවින් දවස තැවුණේ යකඩ ගුලියක් මෙන් මැස්සෙකුගේ දැකීම හෝ අන්‍ය වූ හෝ අකුසලයන්ගේ අරමුණක් නොවේ. මෙම නයින් **කිඤ්චි සංඛාරං සුඛතො** ආදියෙහි අර්ථය දතයුතුය. **සුඛතො උපගච්ඡෙය්‍ය** මරණයෙන් පසුද ආත්මය ඒකාන්තයෙන් සුවපත් වේ. අරෝග වේ. මෙසේ ආත්ම දෘෂ්ටි වශයෙන් සැප වශයෙන් ගැනීම සඳහා මෙය කියන ලදී. ආර්ය ශ්‍රාවකයා දෘෂ්ටි විප්‍රයුක්ත සිතින් දැවීමෙන් මඩනා ලද්දේ දැවීම සංසිඳවීමේ සමත් මත් ඇතුන්ගෙන් ත්‍රාසයට පත්වූවා මෙන් පිරිසිදු කැමති පොක්ඛර බ්‍රාහ්මණයා අසූචිය මෙන් කිසියම් සංස්කාරයක් සැප වශයෙන් ගනියි. ආත්ම වාදයෙහි කසිණාදි පැණවීම් සංග්‍රහයක් සංස්කාර යයි නොකියා **කිඤ්චි ධම්මං** යයි කියන ලදී. මෙහි ආර්ය ශ්‍රාවකයාගේ චතුභූමක වශයෙන් සීමාව දතයුතුය. පෘථග්ජනයා ත්‍රෛභූමික වශයෙන් සියළු වාරයන්හි හෝ ආර්ය ශ්‍රාවකයාටද ත්‍රෛභූමික වශයෙන්ම සීමාව වටී. **යඤ්හි** යම් පෘථග්ජනයෙක් ගනී. එයින් ආර්ය ශ්‍රාවකයා ගැනීම බැදුමෙන් ඉවත් කරයි. පෘථග්ජනයා යමෙක් නිත්‍ය සුඛ ආත්ම වශයෙන් ගනී. ආර්ය ශ්‍රාවකයා එය අනිත්‍ය දුක්ඛ අනාත්ම වශයෙන් ගනිමින් ග්‍රහණ වෙළුම් අත්හරියි.

**මාතරං** යනාදියෙහි මව ජනිකාය. පියා ජනනේය. මනුෂ්‍ය වූ ඛීණාසව රහතන් වහන්සේ අදහස් කරන ලදී. ආර්ය ශ්‍රාවකයා අන්‍යයාගේ ජීවිතය හානි කරන්නේද? මෙය නොවේ. භවන්තරගතවූ තමාගේ ආර්ය ශ්‍රාවක බව නොදැනද කිසිවෙක් මෙසේ කිපෙන්නේය. මේ කුහුඹුවා මරා සියළු සක්වල ගැබෙහි චක්‍රවර්ති රාජ්‍යය පිළිගනුවයි කී කල්හිත් හේ ඌ නොමරන්නේය. එසේ නැතහොත් ඔහුට මෙසේ කියන්නේය. මූ මැරුවේ නැත්නම් ඔබේ හිස කපාදමමියි එසේ හිස කපන්නේ නමුත් හේ සතා නොමරන්නේය. පෘථග්ජන භාවයේ මහා සාවද්‍ය බව පෙන්වීම සඳහාද ආර්ය ශ්‍රාවකයාගේ බලය දැක්වීම සඳහාද මෙය කියන ලදී. මෙහි අදහස මෙසේය. සාවද්‍ය වූ පෘථග්ජනභාවය යම්තැනක පෘථග්ජනයා මව මැරීම ආදි අනන්තරිය කර්ම කරන්නේය. මහා බලවත් වූද ආර්ය ශ්‍රාවකයා එවැනි කර්ම නොකරයි. **දුට්ඨෙන චිත්තෙන** දොසින් යුත් වධක හිතින්. **ලොහිතං උප්පාදෙය්‍ය** ජීවමාන ශරීරයෙහි කුඩා මැස්සකු බොන පමණ ලෙසත් සොලවයිද උපදවයි. **සංඝං භින්දෙය්‍ය** සමාන සංවාසක සමාන

සීමාවෙහි සිටිය සංඝයා කරුණු පසකින් බිඳුවන්නේ : මෙය කියන ලදී. "පඤ්චහි උපාලි ආකාරෙහි සංඝසා භිජ්ජති කම්මෙන උද්දෙසෙන වොහරන්තො අනුසාසනෙන සලාකග්ගාහෙන"

එහි කම්මෙන යනු අපලෝකනාදි සිව්වැදෑරුම් කර්ම අතුරෙන් එක්තරා කර්මයකින්. උද්දෙසෙන යනු පස්වැදෑරුම් ප්‍රාතිමෝක්ෂ උද්දේස අතරෙන් එක්තරා උද්දේසයකින් වොහරන්තො යනු කියමින් ඒ ඒ උපතින් අධර්මය ධර්ම යයි ආදි අට භේදකර වස්තු දක්වන්නේ, අනුසාවනෙන ඔබලා දන්නෙ නැද්ද මා උසස් කුලයෙන් පැවිදි වූ බව මාගේ බහුශ්‍රැත භාවය. මා වැනි කෙනෙකු ධර්මය අධර්මය විනය අවිනය කොට ශාස්තෘ ශාසනය ගන්නේද? එවැනි සිතකුදු ඉපදවීම ඔබලා යුතු නැතැයි ඇයි මට අවීචිය තිලුපුල් වනයක් මෙන් සීතලද? ඇයි මම අපායට බය නැද්ද? ආදි අයුරින් කන ලඟ වචන භේද කොට වෙනස් නොවන ලෙස කොට මේ සලාක ගනුවයි සලාක ගන්වාගෙන.

මෙහිද කර්මයම උද්දේසයට ප්‍රමාණවත්ය. කතා කිරීමෙන් සලාක ගැන්වීම පූර්ව භාගය - අටලොස් වස්තු දැක්වීම් වශයෙන් කතා කරන්නා විසින් එහි රුචිය දැනවීම සඳහා අස්සවා සලාක ගැන්වීමෙන් ද සංඝයා නොබිඳුනේමය. මෙසේ සතරකින් හෝ අතිරේකයකින් හෝ සලාක ගන්වා ආවේණික කර්මය හෝ උද්දේස කර්මයක් හෝ කරති. එකල සංඝයා බිඳුනේ වේ.

මෙසේ දිට්ඨි සම්පන්න පුද්ගලයෙක් සංඝයා භේද කරන්නේය යන මෙය සිදු නොවේ. මෙපමණකින් මව මැරීම ආදී පඤ්චානන්තරීය කර්ම දක්වන ලදී. පෘථග්ජනයෙක් යමක් කරයිද එය ආර්ය ශ්‍රාවකයා නොකරයි. එය ප්‍රකට කිරීම් වශයෙන්

කැමින් දොරකින් වන - කප් සිටින නියමෙක එන
විවා යුතු සේ ලන - දැනගනු මැනවි විනිසය

එහි පළමුව කම්මතො මෙහි මිනිසෙක්ම මිනිසකු වන ලිඟු පෙරළියක් නැති මව හෝ පියා හෝ ජීවිතයෙන් තොරකරන කර්මය ආනන්තරිය වේ. එහි විපාකයෙන් වැළකෙම්යි සියළු සක්වල මහසෑ පමණකින් රන්සෑවලින් පුරවන්නේද සියළු සක්වල පුරා වැඩහිඳිනා භික්ෂු

සංඝයාට මහා දානයක් දෙන්නේද භගවත් බුදුන් වහන්සේගේ සිවුරු කොන අල්ලාගෙන හැසුරුණත් මැරී නිරයේම උපදී. තමා මිනිසෙක්ව තිරිසන් වූ මව හෝ පියා හෝ, තමා තිරිසන්ව මිනිස් මව හෝ පියා හෝ තමා තිරිසන් වූයේ තිරිසන් වූ මාපියන් ජීවිතයෙන් තොර කෙරේද? ඔහුගේ කර්මය ආනන්තරිය නොවේ. කර්මය බැරෑරුම්ය. ආනන්තරියේ හැපී සිටියි. මනුෂ්‍ය ජාතිකයන්ගේ වශයෙන් මේ ප්‍රශ්නය කියන ලදී. මෙහි එළ චතුෂ්කය, සංගාම චතුෂ්කය, චොර චතුෂ්කයද කිවයුතුය. එළුවකු මරමියි අදහසින් ඒලක ස්ථානයෙහි සිටි මනුෂ්‍ය මව හෝ පියා හෝ මරන්නේ ආනන්තරිය කර්මය සිදුවේ. එළුවා මරමි යන අදහස් මව පියා මරමියි අදහසින් හෝ එළුවකු මරන්නේ ආනන්තරිය කර්මය නොවේ. මව්පියන් යන අදහසින් මව්පියන් මරන්නේ ආනන්තරිය කර්මය සිදුවේ. ඉතිරි චතුෂ්ක දෙකේද මෙම නයමයි.

මව්පියන් හෝ රහතුන් ගැන මේ චතුෂ්ක දතයුතුය. මනුස්ස රහතන් කෙනෙක් මැරීමෙන් ආනන්තරිය සිදුවේ. යක්ෂ භූතයින් නිසා නොවේ. කර්මය බැරෑරුම්ය. ආනන්තරියට සමානය. මනුස්ස වූ රහතන් වහන්සේට පෘථග්ජන කාලයේ ආයුධ පහරක් හෝ විසක් දී හෝ රහත් බවට පැමිණ එයින් මිය යන්නේ නම් අරහන්ත ඝාතනය වේ. පෘථග්ජන කාලයේ දුන් දනක් රහත් වී වැළඳුවොත් එය පෘථග්ජනයෙකුටම දුන්නා වේ. සෙසු ආර්ය පුද්ගලයන් මරන්නාට ආනන්තරිය සිදු නොවේ. කර්මය වනාහි ආනන්තරිය සමානව බරපතල වේ.

තථාගතයන් වහන්සේගේ ලේ සෙලවීමෙහි නොබිඳෙන කාය බව නිසා පරෝප ක්‍රමයකින් සම සිදුරුකොට ලේ වැගිරීමක් නම් නැත. ශරීරය ඇතළතම එක් ස්ථානයක ලේ එකතු වේ. දෙව්දත් විසින් පෙරළූ ගලෙන් බිඳීගිය ගල් පතුරක් තථාගතයන්ගේ පාදයෙහි වැදුනේය. පොරොවෙන් කෙටුවා සේ පස් ඇතුළෙහි ලේ විය. එසේ කරන්නාට ආනන්තරිය වේ. ජීවක වෛද්‍යවරයා තථාගතයන්ගේ කැමැත්තෙන් සැතකින් සම සිදුරුකර එතැනින් නරක් වූ ලේ බැහැර කර පහසුව ඇති කළේය. එසේ කරන්නාට පින් කිරීමම වේ.

තවද යමෙක් බුදුරදුන් පිරිනිවි කල්හි චෛත්‍යයක් බිඳියිද බෝධිය සිඳියිද ධාතුවලට පහර දෙයිද ඔවුන්ට කුමක් වේද? ආනන්තරිය පව සමාන බරපතල කර්මයක් සිදුවේ. සධාතුක ථූපයට හෝ ප්‍රතිමාවලට

බාධා පමුණුවයි නම් බෝධි ශාඛා කැපීම වටී. එහි සැඟවුණු පක්ෂීහු සෑයට වර්චස් කරති නම් කැපිය යුතුමය. පරිභෝග චෛතියට වඩා ශාරීරික චෛතිය වඩා පූජාර්හ වේ. චෛතිය වස්තුව බිඳිමින් දුවන බෝමුල් සිඳදැමීම වටී. බෝධි ශාඛාවක් බෝධිඝරයට බාධා කරයි නම් ඒ ගෙය ආරක්ෂා කිරීමට කැපීමට අවසර නැත. බෝධිය සඳහා ගෙය මිය ගෙය සඳහා බෝධිය නොවේ. ආසන ඝරයෙහිද මෙම නයයි. යම් ආසන ඝරයක ධාතු නිදන්කර ඇත්නම් එය රැකීමට බෝඅතු කැපීම වටී. බෝධිය රැකීමට යුෂය ගෙනයන ශාඛා හෝ නරක් වූ තැන් හෝ සිඳීමට වටී. සිරුර පිළිදැගුමෙහි මෙන් පිනක්ද වේ.

සංඝ භේදයෙහි සීමසථ සංඝයා රැස් නොවූ කල්හි වෙන වෙන පිරිස් ගෙන කරන ලද කතා අනුසාවන සලාක ගැන්වීම් අනුව කර්ම කරන්නහුට උද්දේස හෝ උදෙසන්නන්ට සංඝභේදයද ආනන්තරිය කර්මයද වේ. සමගි සංඥාවෙන් නම් වටී. සමගි සඤ්ඤාවෙන් කරන්නාට බේදය හෝ ආනන්තරිය කර්මය හෝ නොවේ. නවයකින් අඩු පිරිසට නොවේ. අඩු තරමින් නවයකින් යුත් පිරිසකින් සංඝයා බිඳියිද ඔහුට ආනන්තරිය කර්මය වේ. අනුවත්තක අධම්මවාදීන්ට කර්මය මහා සාවද්‍ය වේ. ධර්මවාදීහු අනවජ්ජයහ. එහි සංඝ භේදයෙහි නවයක්ම යන බවට මේ සූත්‍රයයි.

"උපාලි සතර දෙනෙක් එකතු වෙති. සතර දෙනෙක් එකතුව නවවැන්නෙක් අස්වයි. සලාක ගැන්වෙයි. මේ ධර්මය මේ විනය මෙය ශාස්තෘ ශාසනයයි. මෙය ගන්න මෙය රුචි කරන්න යයි. උපාලි, මෙසේ ඇති කල්හි සංඝ පංතියක් මෙන්ම සංඝ භේදයද වේ. උපාලි, නවයක් හෝ අතිරේක නවයක් හෝ සංඝරාජි මෙන්ම සංඝ භේදයද වේ." මේ පසද සංඝභේදය වේ. වචී කර්මය සෙසු ඒවා කාය කර්මය. මෙසේ කර්ම වශයෙන් විනිශ්චය දතයුතුය. ද්වාරතො යනු සියළු සිත් කායද්වාරයෙන්ද වචී ද්වාරයෙන්ද හටගනිති. මෙහි මුලින් වනාහි ආණත්තික සතර විජ්ජාමය ප්‍රයෝග වශයෙන් වචී ද්වාරයෙන් හටගෙනද කාය ද්වාරයම පුරවයි. සංඝ භේදය හස්ත මුද්‍රාවෙන් කරන්නාට කාය ද්වාරයෙන් හටගෙන වචී ද්වාරය පුරවයි. මෙසේ මෙහි ද්වාර වශයෙන්ද විනිශ්චය දතයුතුය.

කප්පට්ඨීතියතො යනු මෙහි සංඝභේදයම කල්පයක් සිටී. නැවත හටගන්නා කල්පයෙහි කල්පය මැද හෝ සංඝභේද කොට කල්ප

විනාශයෙහි මිදේ. අද සංඝභේදය කොට හෙට කල්පය විනාශ වේ නම් හෙටම මිදේ. එක දවසක්ම නිරයෙහි පැසේ. මෙසේ වීමක් නොවේ. සෙසු කර්ම සතර ආනන්තරියම වේ. කප්පට්ඨිතිය නොවේ. මෙසේ මෙහි කල්ප ස්ථිති වශයෙන්ද විනිශ්චය දතයුතුය. විපාක වශයෙන් යමෙක් මේ කර්ම පහ කරන ලද්දේද? ඔහුට සංඝභේදයම පටිසන්ධි වශයෙන් විපාක දේ. සෙසු ඒවා අහෝසි කර්මද කර්ම විපාක නොවේදැයි සැකයට පැමිණෙති. සංඝ භේදය නැතිවිට ලෝහිතුප්පාදය ද එය නැතිවිට අරහන්ත ඝාතයද එහි නැතිවිට වඩා සිල්වත් මව හෝ පියා පටිසන්ධි වශයෙන් පැසෙති. දෙදෙනාම සිල් සමාන නම් මාතු ඝාතනය බලවත් වේ. මව දුක් උසුලන්නීය. පුතාට බහුපකාරය. මෙසේ මෙහි විපාක වශයෙන් ද විනිශ්චය දතයුතුය. සාධාරණාදියෙහි මුල් හතර සියළුම ගිහි පැවිද්දන්ට සාධාරණය. සංඝභේදය වනාහි "උපාලි භික්ඛුණී සංඝයා නොබිඳයි. සික්ඛමානා නොවේ. සාමණේර සාමණේරි උපාසක උපාසිකා නොවේ. උපාලි භික්‍ෂුවම සංඝයා බිඳියි. ප්‍රකෘති වූ සමාන සංවාසක වූ සමාන සීමායෙහි සිටියේ භික්‍ෂුව සංඝයා බිඳියි." ඒ වචන අනුව සංඝ භේදයට භික්‍ෂුවක් වේ. එහෙයින් අනිත් කෙනෙකුට අසාධාරණය. ආදි ශබ්දයෙන් මේ සියළු දුක්ඛ වේදනා සහගත දොම්නසින් යුතු යයි මෙසේ මෙහි සාධාරණාදියෙහි ද විනිශ්චය දතයුතුය.

**අඤ්ඤං සත්ථාරං** මගේ මේ ශාස්තෘන් වහන්සේ ශාස්තෘ කෘත්‍ය කිරීමට සමර්ථයයි භවාන්තරයෙහි ද අන්‍ය තීර්ථංකරයකු මේ මගේ ශාස්තෘවරයා යයි මෙසේ ගන්නේය යන මෙය නොවේය යන අර්ථයයි. **අට්ඨමං භවං නිබ්බත්තෙය්‍ය** සියළු මඳ ප්‍රඥාවන්තයාද සත්වන භවය ඉක්මවා අටවන භවයෙහි උපදින්නේය. මෙය සිදු නොවේ. ඉහළම කෙළවරින් සත්වන භවය සඳහා මෙය නියමය වේ. නියතයෙන්ම සම්බෝධි පරායන වේයයි කියන ලදී. කුමක්ද ඒ නියමය? කිම පෙර හේතු නියාම? ලැබූ මාර්ගයද නැතහොත් ඉතිරි මාර්ග තුනද? සම්මා සම්බුදුන් ගන්නා ලද නාම මාත්‍රයකි මෙය. පුද්ගලයාට නියත නාමයක් නැත. පෙර හේතු නියාමයයි කී කල්හි ඉහළ මාර්ග තුන උපනිශ්‍රය වේයයි කියන ලදී. පළමුවන මාර්ගයට උපනිශ්‍රයක් නැතිව පැමිණෙයි. මෙසේ ඔහු අහේතු අප්පච්චයව ඉපදීමට පැමිණේ. ලැබූ මාර්ගය නියාමයයි කී කල්හි උපරි තුන් මාර්ගය අකිච්චක වේ. පළමුවන මාර්ගයම සකිච්චක වේ. පළමු මගින්ම කෙලෙසුන් ක්‍ෂයකොට පිරිනිවිය යුතුය. උපරි තුන් මාර්ගය නියාමයයි කීකල්හි පළමු මාර්ගය අකිච්චක වේ. උපරි මාර්ග

තුනම සකිච්චක වේ. පළමු මග නොඉපදවා උපරි මාර්ග තුන ඉපදවිය යුතු වේ. පළමු මගින් නූපදවාම කෙලෙසුන් ක්‍ෂය කළ යුතුය. එහෙයින් අන්කිසි නියාමයක් නොව උපරි තුන් මාර්ගයේ විපස්සනාව නියමයෙනි. ඒ විපස්සනා තී ක්‍ෂණ වේද සූරවේද එක් භවයක් උපදවා රහත් බවට පැමිණ පිරිනිවීයයි. ඊට අඩු ප්‍රඥාවක් ඇත්තේ නම් දෙවන තුන්වෙනි සතරවෙනි පස්වෙනි භවවල රහත්බවට පමුණුවා පිරිනිවීයයි. සියල්ලෙන් මඳ ප්‍රඥාවන්තයා සත්වන භවයෙහි ඉපිද රහත්බවට පැමිණේ. අටවන භවයෙහි පටිසන්ධියක් නැත. මෙසේ සම්බුදුන් විනිස ගන්නා ලද නාමමාත්‍රයකි. මෙය, ශාස්තෘන් වහන්සේ බුද්ධ සමාන භවයේ ස්ථානකොට සර්වඥ ඥානයෙන් පිරිසිඳ මේ පුද්ගලයා සියල්ලෙන් මහාප්‍රාඥ වේ. තියුණු විපස්සිකයෙකි. එක භාවයක්ම ඉපිද රහත්බව ගන්නේ යයි ඒකබීජී යයි නමක් කළහ. මේ පුද්ගලයා දෙවන තෙවන සතරවන පස්වන සවන භවයෙහි ඉපිද රහත්බව ගන්නේ යයි කොලං කොල යයි නමක් කළහ. මේ පුද්ගලයා සත්වන භාවයෙහි ඉපිද රහත්බව ගන්නේ යයි සත්තක්ඛත්තු පරම යයි නමක් කළහ. කිසි පුද්ගලයෙකුට සත්වන භවය නියත නැත. ආර්ය ශ්‍රාවකයා වනාහි යම් ආකාරයකින් මන්ද ප්‍රාඥයෙකු වුවත් අටවන භවයට නොපැමිණ අන්තරෙහිම පිරිනිවී යයි. චක්‍රයක් මෙන් පෙරළෙනුයේ සත්වන භවයටම යයි. සත්වන භාවයෙහි සියළු ආකාරයෙන් පමාද විහාරිකයාගේද විපස්සනා ඥාණය පරිපාකයට යයි අප්‍රමාදව අරමුණෙහි කලකිරී නිවීමට පැමිණෙයි. යම් හෙයකින් ඔහුගේ හත්වන භවයෙහි නිදාසිටින විට හෝ යනවිට පිටුපසින් පැමිණ තියුණු කඩුවකින් හිස කපා දමයිද දියේ ගිල්වයිද අකුණක් හෝ හිසේ කඩාවැටේද මෙබඳු කාලයෙහිද පටිසන්ධිය සහිත කාලක්‍රියාවක් නම් නැත. රහත්බවට පැමිණීම පිරිනිවන් පායි. එයින් කියන ලදී. "අට්ඨමං භවං උප්පජ්ජති නෙතං ඨානං විජ්ජති" අටවන භවයක උපදී යන මෙය සිදු නොවේ.

එකිස්සා ලෝකධාතුයා යනු දසදහසක් ලෝකධාතුවල. ජාති ආණා විසය වශයෙන් ක්‍ෂේත්‍ර තුනකි. එහි ජාති ක්‍ෂේත්‍ර නම් දසදහසක් ලෝකධාතු එදවනාහි තථාගතයන් වහන්සේ මව්කුසට පිවිසෙන කාලයෙහි කුසින් නික්මෙන කාලයෙහි බුද්ධත්වය ලබන කාලයෙහි දම්සක් පවත්වන අවස්ථාවේ ආයු සංඛාරය අත්හරින අවස්ථාවේ පරිනිර්වාණය සිදුවන අවස්ථාවේද කම්පා වෙයි. කෙළ ලක්ෂයක් සක්වල වනාහි ආණා ක්‍ෂේත්‍රයයි. ආටානාටිය මොර පිරිත ධජග්ග රතන පිරිත් ආදියෙහි අණ මෙහි පවතී. විෂය ක්‍ෂේත්‍රයෙහි පරිමාණයක් (ප්‍රමාණයක්) නැත.

බුදුවරුන්ගේ ඤාණය යම් ප්‍රමාණයක්ද එපමණ ඤෙය්‍යා (ඥෙය වස්තුව දතයුත්ත) වේ. ඥෙය වස්තුව යම්පමණ වේද එපමණම බුද්ධඤාණය වේ. ඤාණ කෙළවර ඥෙය්‍යා වේ. ඤෙය්‍යා කෙළවර කොට ඤාණයේ වේ. වචන බැවින් අවිසයක් නම් නැත. මේ ක්ෂේත්‍ර තුනෙහි මේ සක්වල හැර අනිත් සක්වලක බුදුවරයෝ උපදිති යයි සූත්‍රයක් නැත. නො උපදිති යයි ඇත. විනය සූත්‍ර අභිධර්ම පිටක තුනකි. සංගීති තුනෙකි. මහාකාශ්‍යප මහාථෙර සංගීති, යසථෙර සංගීති, මොග්ගලිපුත්තතිස්ස ථෙර සංගීති වේ. මේ සංගීති තුන ආරූඪ කළ ත්‍රිපිටක බුද්ධවචනයෙහි මේ සක්වල හැර අන්තැනක බුදුවරයෝ උපදිති යයි සූත්‍රයක් නැත. න උප්පජ්ජන්ති ති පන අත්‍ථි. නො උපදී යයි ඇත.

**අපුබ්බං අචරිමං** පෙර පසු නොවී එකතුව නූපදී. පෙර හෝ පසුව හෝ උපදිති යයි කියන ලද්දේ වේ. එහි බෝ පලඟෙහි බෝධියට නොපැමිණ නො නැගිටිමියයි හිඳි කාලයේ සිට මව්කුස පිළිසිඳ ගැනීම දක්වා පෙරයයි දතයුතුය. බෝසතුන්ගේ ප්‍රතිසන්ධි ග්‍රහණයෙහි දස දහසක් සක්වල කම්පනයෙන්ම ජාති ක්ෂේත්‍රය නියම කිරීම කරන ලදී. අනිත් බුදුවරයෙකුගේ ඉපදීම වලක්වන ලද්දේ වේ. පිරිනිවන් පෑමේ සිට අබලුවක් පමණ ධාතු තිබෙනතුරු ඒ තාක් පසු යයි දතයුතුය. ධාතු සිටියහොත් බුදුහු සිටියාහුමය. එහෙයින් මේ අතරෙහි අනිත් බුදුවරයෙකුගේ උත්පත්තිය වලක්වන ලද්දේ වෙයි. ධාතු පිරිනිවීම වූ කල්හි අනිත් බුදුවරයෙකුගේ ඉපදීම වළක්වන ලද්දේ නොවේ.

අතුරුදහන්වීම් තුනකි. පරියත්ති අන්තරධානය පටිවේධ අන්තරධානය පටිපත්ති අන්තරධානය යනුවෙනි. එහි පරියත්ති යනු තුන් පිටකය. පටිවේධ යනු සත්‍ය අවබෝධය පටිපත්ති යනු පිළිවෙත්ය. එහි පටිවේධයද පටිපත්තියද වේද නොවේද? එක් කලෙක ප්‍රතිවේධ කළ භික්ෂූහු බොහෝ වෙති. මේ භික්ෂූහු පෘථග්ජනයයි ඇඟිල්ල දිගුකර දැක්විය යුතු වේ. මේ ද්වීපයෙහිම එක් වාරයක පෘථග්ජන භික්ෂුවක් නම් නොවීය. පිළිවෙත් පුරන්නෝද කලෙක බොහෝ වෙති. කලෙක අඩු වෙති. මෙසේ පටිවේධයද පටිපත්තියද තිබුණත් නැතත් ශාසනස්ථිතියට පරියත්තිය ප්‍රමාණ වේ. පණ්ඩිතයා ත්‍රිපිටකය අසා දෙවනුව පුරයි. අපගේ බෝධිසත්වයෝ ආළාර සමීපයේ පඤ්චාභිඥා සහ සත් සමාපත්ති උපදවා නේවසඤ්ඤානාසඤ්ඤා සමාපත්තියට පරිකර්ම විචාළේය. හෙතෙම නොදනමියි කීහ. ඉන්පසු උද්‍රක රාමපුත් වෙත ගොස් අවබෝධ කළ

විශේෂ සසඳා නේවසඤ්ඤා නාසඤ්ඤායතනයට පරිකර්ම විචාළේය. හෙතෙම කීවේය. ඔහු කියන අතරෙහිම බෝධිසත්වයෝ එය සම්පාදනය කළහ. එසේම ප්‍රඥාවන්ත භික්‍ෂූහු පරියත්තිය අසා දෙකම සම්පූර්ණ කරති. එහෙයින් පරියත්තිය සිටිකලම ශාසනය පවතියි. යම්කලක එය (පරියත්තිය) අතුරුදහන් වේනම් එකල පළමුව අභිධර්ම පිටකය විනාශ වෙයි. එහි පට්ඨානය සියල්ලටම පළමුවෙන් අතුරුදන් වේ. අනුක්‍රමයෙන් පසුව ධම්මසංගහ එය අතුරුදහන් වූ පසු ඉතිරි පිටක දෙක පැවති කල්හි ශාසනය පවතී. එහි සූත්‍රාන්ත පිටකය අතුරුදහන් වන කාලයේ පළමුව අංගුත්තර නිකාය, ඒකාදසකයේ පටන් ඒකකය දක්වා අතුරුදන් වේ. ඉන් අනතුරුව සංයුත්ත නිකායට චක්ක පෙය්‍යාලයෙහි පටන් ඔඝතරණය දක්වා අතුරුදහන් වේ. අනතුරුව මජ්ඣිම නිකාය ඉන්ද්‍රිය භාවනාවේ සිට මූලපරියාය සූත්‍රය දක්වා අතුරුදහන් වේ. අනතුරුව දීඝනිකාය දසුත්තරයේ සිට බ්‍රහ්මජාලය දක්වා අතුරුදහන් වේ. ගාථා එකක් දෙකක් අසා මාර්ගයට යයි. ශාසනය දැරීමට හැකි නොවේ. සභිය පුච්ඡා ආලවක පුච්ඡ මෙන් කාශ්‍යප බුදුරදුන්ගේ කාලයේ ශාසනය දැරීමට නොහැකි වූහ. පිටක දෙකක් අතුරුදහන් වූ කල්හිද විනය පිටකය පවතිනවිට ශාසනය පවතී. උභතෝ විභංගයද අතුරුදන්ව මාතිකා තිබෙනවිට පවතීමය. මාතිකාවද අතුරුදන්ව පාතිමොක්ඛ පබ්බජ්ජා උපසම්පදා තිබෙනවිට ශාසනය පවතී. ලිංගය පාරට යයි. සුදුවත් ශ්‍රමණ වංශයෙ කාශ්‍යප බුදුන්ගේ කාලයේ සිට ශාසනය දැරීමට නොහැකි විය. පසුව සච්ච පටිවේධයෙන් පසුව සීල භේද සිට ශාසනය අවසන් වෙයි. එතැන් පටන් අනිත් බුදු කෙනෙකුන්ගේ උත්පත්තිය නොවැලැක්වේ.

පිරිනිවීම් තුනකි. කිලෙස පරිනිබ්බාණ ඛන්ධ පරිනිබ්බාණ ධාතු පරිනිබ්බාණ එහි කෙලෙස් පිරිනිවීම බෝපලඟෙහි සිදුවිය. ස්කන්ධ පරිනිර්වාණය කුසිනාරා නුවරදී සිදුවිය. ධාතු පිරිනිවීම අනාගතයෙහි වන්නේය. සාසනය අවසන් වන කාලයේ මේ තම්බපණ්ණි දීපයෙහි ධාතු රැස්වී මහසෑය ලඟට යන්නේය. මහා චේතියේ සිට නාගදීපයේ රාජායතන චේතිය ලඟටද එතැනින් මහා බෝධි පල්ලංකයට යන්නේය. නාග භවනයෙන්ද දිව්‍ය ලෝකයෙන්ද බ්‍රහ්ම ලෝකයෙන්ද ධාතු මහබෝ පලඟටම යන්නේය. අබඇට තරම් ධාතුද අතරමග නොනසී. සියළු ධාතු මහබෝ පලඟේ රැස්ව රන්කඳක් මෙන් එකඝනව සවනක් රස් විහිදුවයි. ඒවා දස දහසක් ලෝකධාතුවේ පැතිරෙන්නේය. ඉන්පසු දස දහසක් සක්වල දෙවියෝ රැස්වී ශාස්තෲන් වහන්සේ අද පිරිනිවන් පානා සේක.

අද ශාසනය අවසන් වේ. අවසාන දර්ශනය දැන් මේ අපගේ දශබලයන්ගේ පිරිනිවන් දවසෙන් මහත් වූ කරුණාව දක්වන්නේය. අනාගාමී ඛීණාශ්‍රවයින් හැර අවසෙස්සෝ ස්වකීය ස්වභාවයෙන් සිටීමට නොහැකි වෙත්. ධාතුවල තේජෝධාතු නැගී සිට බඹලොව දක්වා උඩට යයි. අබඇට සා ධාතු ඇතිකල්හි එකම ජාලාවක් වන්නේය. ධාතු අවසානයට ගියපසු සි... යන්නේය. මෙසේ මහා අනුභාවයක් දක්වා ධාතු අතුරුදහන් වූ පසු ශාසනය අතුරුදහන් වූවා නම් වේ. යම්තාක් මෙසේ අතුරුදහන් නොවේද ඒ තාක් අචරිමං නාම වේ. මෙසේ අපුබ්බං අචරිමං උප්පජ්ජෙය්‍යුං නෙතං ඨානං විජ්ජති. කුමක් හෙයින් පෙර පසු නොඋපදීද? ආශ්චර්යයක් නැති බැවිනි. බුදුවරයෝ නම් ආශ්චර්ය මනුෂ්‍යයෝය. යම්සේ කීහ. "මහණෙනි, එක් පුද්ගලයෙක් ලෝකයේ උපදියි. ආශ්චර්ය මනුෂ්‍යයෙක් කවර නම් එක් පුද්ගලයෙක්ද? මහණෙනි, තථාගත වූ අරහත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේය"යයි යම් හෙයකින් දෙදෙනෙක් හෝ සතර දෙනෙක් හෝ අටක් දහයක් හෝ එකට උපන්නාහු නම් ආශ්චර්ය නොවන්නාහුය. එක විහාරයක චෛත්‍ය දෙකක් නම් ලාභ සත්කාර උදාර නොවන්නේය. භික්ෂූන්ද බහුල වූවිට ආශ්චර්ය නොවන්නේය. මෙසේ බුදුවරයෝද වන්නාහ. එනිසා නූපදිති. සතිපට්ඨානාදි ධර්ම දේසනා එක් කෙනෙක් කරනවා නම් විශේෂයක් වේ. එක් ස්ථානයක ධර්මදේශනා කරනවා නම් ආශ්චර්ය වන්නේය. විවාදයටද භාජනය වන්නේය. බොහෝ බුදුවරුන් උපන් කල්හි බොහෝ ආචාර්යවරුන්ගේ අතවැසියන් මෙන් අපගේ බුදුරදුන් ප්‍රසාදිකය. අපගේ බුදුන් මධුරයෝය. ලැබෙනසුළුය. පින් ඇතියේ යයි විවාද කරන්නාහුයයි එනිසාද මෙසේ නූපදිති.

තවද මේ කාරණය මිලිඳු රජු විසින් විචාරන ලද්දේ නාගසේන හිමියන් විසින් විස්තර කරන ලදී. එහි කියන ලදී. ස්වාමීන් වහන්ස, නාගසේන, භාග්‍යවතුන් විසින් මෙය කියන ලදී. මහණෙනි, එක ලෝක ධාතුවක් පෙර පසු නොවී බුදුවරු දෙදෙනෙක් උපදින්නාහුය. මෙය සිදු නොවේ. ස්වාමීන් වහන්ස, නාගසේන සියළු තථාගතවරු සත්තිස් බෝධි පාක්ෂික ධර්ම දේශනා කරති. චතුරාර්ය සත්‍ය දෙසති. ත්‍රිවිධ ශික්ෂාවෙහි හික්මවති. අප්‍රමාද ප්‍රතිපත්තියෙන් අනුශාසනා කරති. ස්වාමීන් නාගසේන සියළු තථාගතයන්ගේ උද්දේස එකමය. කථා එකමය. සික්ඛා එකමය. අනුශාසනා එකමය. කුමන කරුණකින් තථාගත දෙදෙනෙක් එක කාලයේ පහළ නොවෙත්ද? එක බුදුවරයෙකුගෙන් මෙලොව ආලෝකයක් ඇතිවිය. බුදුවරු දෙදෙනෙක් උපදින්නාහු නම් ආලෝක දෙකක් ඇතිවී මේ ලෝකය

බොහෝසෙයින් එළිය වැටෙන්නේය. බුදුවරු දෙදෙනෙකුට අවවාද දීමද පහසු වන්නේය. අනුශාසනාවද සැපසේ කරන්නේය. එහි මට කරුණු දක්වන්න. මට සැක නැති කරගැනීම පිණිස.

මහරජතුමනි, මේ දසදහසක් සක්වල එකම බුදුවරයෙකු පමණක් දරන්නේය. එක බුදුවරයෙකුගේ ගුණ පමණක් දරන්නේය. බුදුවරු දෙදෙනෙක් උපදින්නේ නම් මේ දසදහසක් සක්වලට දැරීමට නොහැකි වන්නේය. සැලෙන්නේය. කම්පා වන්නේය. නැමෙන්නේය. පහත් වන්නේය. විශේෂයෙන් නැමෙන්නේය. විසිරෙන්නේය. විනාශ වන්නේය. කැඩීබිඳී යන්නේය. ස්ථානගත නොවන්නේය. මහරජ, නැවක් එක් පුරුෂයකු පමණක් එගොඩ කිරීමට සමත් වන්නේය. එක් පුරුෂයකු පමණක් නැගුණුවිට ඒ නැව තිසල වන්නේය. තව පුරුෂයෙක් එන්නේය. ඔහුද වර්ණ හෝ ආයුෂ හෝ වයසින් ප්‍රමාණයෙන් කෙට්ටු ස්ථූල යෙන් සියළු අඟපසඟවලින් පෙර පුරුෂයා මෙනි. හේ ඒ නැවට නැගෙන්නේය. මහරජ, ඒ නැව දෙන්නම දරන්නේද? නැත ස්වාමීනි. දරන්නේ නම් සැලෙන්නේය. කම්පා වන්නේය. පහත් වන්නේය. නැමෙන්නේය. විශේෂයෙන් සැලෙන්නේය. විසිරෙන්නේය. විනාශ වන්නේය. කැඩෙන්නේය ස්ථානගත නොවන්නේය. එසේම මහරජ, එක බුදුවරයකු දරන මේ දස දහසක් ලෝකධාතුව එකම තථාගතයකුගේ ගුණ දරන්නේය. දෙවන බුදුවරයකු උපදින්නේ නම් මේ දස දහසක් ලෝකධාතුව නොදරන්නේය. සැලෙන්නේය...........ස්ථානය නොපෙනෙන්නේය. මහරජ, යම් පුරුෂයෙක් ඇති තරම් භෝජන අනුභව කරන්නේය. උගුර ලඟට එනතෙක් අනුභව කරන්නේය. හේ එමෙන් පණවන ලද්දේ පිරුනේ නිතර නිදිමත වූයේ නොනැමුණු දණ්ඩක් සේ කෙලින් සිටියේය. මහරජ, එපමණ භෝජන ගෙන අනුභව කොට මහරජ, ඒ පුරුෂයා සුවසේ සිටීද? නැත ස්වාමීනි, තවත් අනුභව කළොත් මැරෙන්නේයි. එසේම මහරජ, මේ දස දහසක් ලෝකධාතුව එකම බුදුවරයෙක් දරන්නේය...... (ස්ථානය) යන්නේය. ස්වාමීන් වහන්සේ, නාගසේන, අතිධර්ම භාරයෙන් පොළොව සැලේද? මහරජ, මෙහ රුවන් පිරවූ කරත්ත දෙකක් ඇත්නම් කොතගසා පුරවා ඇති රුවන් එක කරත්තයකින් ගෙන අනිත් කරත්තයේ පැටෙව්වොත් මහරජ, ඒ කරත්තය කරත්ත දෙකේම බර දරයිද? නැත ස්වාමීනි, එහි නාභිය සැලෙන්නේය. එහි ගරාදි කැඩෙන්නේය, එහි නේමිය පහළ වැටෙන්නේය. එහි අකුරද බිඳෙන්නේය. කිම මහරජ, අධික රුවන් පිරවූ කරත්තය බිඳෙන්නේද? එසේය ස්වාමීන් වහන්ස, එසේම මහරජ, අධික

ධර්ම භාරයෙන් පොළොව සැලෙයි. තවද මහරජ, මෙය බුද්ධබලය විස්තර කළ ඊට අනුරූප තවත් කරුණකි. එය අසන්න. බුදුවරු දෙදෙනෙක් එක කාලයෙහි නූපදින්නාහ. මහරජ, ඉපදෙන්නාහු නම් පිරිස අතර විවාද ඉපදෙන්නේය. ඔබලාගේ බුද්ධ අපගේ බුද්ධ කියා විවාද ඇතිවේ. පක්ෂ දෙකක් වන්නේය. මහරජ, යම්සේ බලවත් ඇමතිවරයෙකුගේ පිරිස අතර ඔබලාගේ ඇමති අපගේ ඇමති යයි විවාද ඇතිවී පක්ෂ දෙකක් වන්නේය. එසේම මහරජ බුදුවරු දෙදෙනෙක් එක කාලය ඉපදුනොත් පිරිස අතර ඔබගේ බුදුන් අපගේ බුදුන් යයි විවාද ඇතිවී දෙකට බෙදෙන්නේය. මේ පළමු කාරණය අසන්න. බුදුවරු දෙදෙනෙක් එක් කාලයක නූපදින තවද කරුණක් අසන්න. බුදුවරු දෙනමක් එකවර නූපදින කරුණ නම් එකවර ඉපදුනොත් අග්ගො බුද්ධො යන වචනය බොරු වන්නේය. ජෙට්ඨො සෙට්ඨො බුද්ධො යන වචන බොරු වන්නේය. ජෙට්ඨො බුද්ධො සෙට්ඨො බුද්ධො විසිට්ඨො බුද්ධො උත්තමො පවරො අසමො අසමසමො අප්පටිසමො අප්පටිභාගො අප්පටි පුග්ගලො බුද්ධො යන වචන බොරු වන්නේය.

මේ කරුණද මහරජ, බුදුවරු දෙදෙනෙක් එකවර නූපදීමට හේතු වේ. මහරජ, එක් බුදුවරයකු පමණක් එකවර පහළ වීම බුදුවරුන්ගේ ස්වභාව ප්‍රකෘතියක්මය. කවර හෙයින්ද? සර්වඥ ගුණ කරුණ මහත් නිසා තවද මහරජ, යමක් මහත්වයට පැමිණ ඇතිනම් ඒ එකක්මය. මහරජ, පොළොව මහත් තත්වයට පැමිණ ඇත. ඒ එකක්මය. සාගරය, මහාමේරුව, ආකාශය මහත්වයට පැමිණ ඇත. ඒ එකක එකක්ම වේ. ශක්‍රයා මහත්වයට පැමිණ සිටී. එක්කෙනෙක්මය. බ්‍රහ්මයා මහත්වයට පැමිණ ඇත. එක්කෙනෙකි. එසේම තථාගත අර්හත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ මහත්වයට පැමිණ සිටිති. එක්කෙනෙක්මය. යම්තැනක උපදී නම් එහි තවත් කෙනෙකුට අවකාස නැත. එනිසා තථාගත අර්හත් සම්මා සම්බුද්ධයන් වහන්සේ එක් කෙනෙක්ම ලෝකයේ උපදිති. ස්වාමීන් වහන්ස නාගසේන ප්‍රශ්න උපමා කරුණුවලින් හොඳින් කියන ලදී.

**එකිස්සා ලෝකධාතුයා** යනු එක් සක්වලක යට මේ පදයෙන්ම දස දහසක් සක්වල ගන්නා ලදී. ඒවාද එක සක්වලකින් පිරිසිඳින්නට නොවටී. බුදුවරු මේ සක්වලෙහිම උපදිති. ඉපදීම වලක්වන ලද නමුත් මෙයින් අන්‍ය වූ සක්වලක නූපදිති. **අපුබ්බං අචරිමං** මෙහි සත්රුවන පහළ වීමෙන් පෙර පුබ්බ වේ. එහිම අතුරුදහන් වීමෙන් පසු චරිම වේ. එහි

සත්රුවන දෙපරිද්දකින් අතුරුදහන් වන්නේය. සක්විති රජුගේ කාලක්‍රියාවෙන් හෝ පැවිදිවීමේ හෝ යන දෙකින් එය අතුරුදහන් වන්නේද කළුරිය කිරීමෙන් හෝ පැවිදි වීමෙන් හෝ සත්වන දිනයේය. ඉන්පසු සක්විතිවරුන්ගේ පහළවීම අවාරිතය. එක් සක්වලක් සක්විති රජවරුන් දෙදෙනෙකු නූපදින්නේ ඇයි? විවාදයට හේතුවන නිසාය. ආශ්චර්ය නොවන නිසාය. සත්රුවනේ මහානුභාව නිසායි. දෙදෙනෙකු උපන් කල්හි අපගේ රජ මහත්ය. අපගේ රජ මහත් යයි විවාද උපදින්නේය.

යං ඉත්ථි අරහං අස්ස සම්මා සම්බුද්ධො සර්වඥ ගුණ උපදවා ලෝකයා එතෙර කිරීමට සමත් බුද්ධානුභාවය තිබියේවා. ප්‍රාර්ථනාවටද ස්ත්‍රිය නොපැමිණේ.

මිනිස් ලිඟු සම්පත - හේතු ද බුදුන් දැකුමද
පැවිදි ගුණයුත් බව - දුරයද කැමතිවීමද
යන කරුණු අටඟින් - "අභිනීහාර" සපිරේ

මෙම ප්‍රාණිධානසම්පත්ති කරුණු වේ. ප්‍රණිධානයද සම්පාදනය කිරීමට අසමත් ස්ත්‍රියට බුදුබවක් කොයින්ද, "මහණෙනි, යම් ස්ත්‍රියක් රහත්ව සම්මා සම්බුද්ධවීම යන මේ කරුණට අවකාස නැත්තේය. මෙය සිදු නොවේ"යයි කියන ලදි. සියළු ආකාරයෙන් සම්පූර්ණව හෝ පින් ඉතිරීමෙන් සම්පූර්ණ වූම හෝ ආත්ම භවයක් ඇතිවී පුරුෂයාම රහත්ව සම්මා සම්බුද්ධ වේ. ස්ත්‍රිය නොවේ. "යම් ස්ත්‍රියක් සක්විති රජ වන්නේය ආදියෙහි ස්ත්‍රියට කොසොහිත වත්ථගුය්හ ආදියේ නොවීමෙන් ලක්ෂණ සම්පූර්ණ නොවේ. ස්ත්‍රීරතන අභාවයෙන් සත් රතන සම්පූර්ණ නොවේ. සියළු මිනිසුන්ට වඩා අධික වූ ආත්මයක් නැත. එහෙයින් "යම් ස්ත්‍රියක් සක්විති රජ වන්නේය යන මෙය නොවේ, අවකාශ රහිතය" යයි කියන ලදී ශක්‍රභාවාදි තුන උතුම්ය. ස්ත්‍රීලිංගය හීනය. එහෙයින් ඒ ශක්‍ර භවාදිය සිදු නොවේ. බ්‍රහ්ම ලෝකයෙහි ස්ත්‍රී ලිංගය මෙන් පුරුෂ ලිංගයද නැත. එහෙයින් යම් පුරුෂයෙක් බ්‍රහ්මත්තය සිදු කරන්නේය යන මෙය තිබේ යයිද නොකිවයුතු වන්නේද? නැත නොකිවයුතු වන්නේය. කුමක් නිසාද? මෙහි පුරුෂයෙකුට එහි ඉපදෙන බවෙන් බ්‍රහ්මත්ත යයි මහා බ්‍රහ්ම බව අදහස් කරයි. ස්ත්‍රියද මෙහි ධ්‍යාන වඩා කලුරිය කොට බ්‍රහ්ම පාරිසජ්ජයේ සහවාසයේ උපදියි. මහා බ්‍රහ්මභාවයෙහි නොවේ. පුරුෂයෙක් එහි උපදින්නේ නැතැයි නොකිව යුතුය. මෙහි දෙදෙනාම සමානය. ඒ ලිංග

අභාවයෙහි පුරිස් ලකුණු හෝ ඉතිරි ලකුණු බ්‍රහ්ම ලෝකයේ නැත. එහෙයින් මෙය මනාසේ කියන ලදී.

**කාය දුච්චරිතස්ස** - යනාදියෙහි යම්සේ කොසඹ බීජ කරවිල බීජාදිය මිහිරි ඵල නො උපදවයි. අමිහිරි අමධුරම උපදවයි. එසේම කාය දුශ්චරිත ආදිය මිහිරි විපාක නො උපදවයි. අමිහිරම උපදවයි. උක් බීජ හාල් බීජාදිය මිහිරි වූ මිහිරි රසැති ඵලම උපදවයි. අමිහිරි කටුක නූපදවයි. එසේම කාය සුචරිතාදිය මිහිරි විපාකම උපදවයි. අමධුර නූපදවයි.

වපුරන විලස බිජු - පල ලැබුමද එලෙසමය
කළණාට යහපත - පවිටාට අයහපත වේ

එහෙයින් අට්ඨානමෙතං අනවකාසො යං කාය දුච්චරිතස්ස ආදිය කියන ලදී. කාය දුච්චරිත සමංගි යනාදියෙහි සමංගි යනු පඤ්චවිධ යුක්ත වීමය. ආයුහන, චේතනා, කම්ම, විපාක, උපට්ඨාන යනුවෙනි. එහි කුසල අකුසල කර්ම රැස්කරන ක්ෂණයෙහි ආයුහනයෙන් යුක්ත වේ. චේතනාවෙන් යුක්ත වීමද එසේය. රහත් බවට පැමිණෙනතුරු සියළු සත්වයන් පෙර රැස්කළ විපාකවලට සුදුසු කර්ම සඳහා කම්මා යූහන යයි කියනු ලැබේ. මෙය කම්ම සමංගිතාව වේ. විපාක සමංගිතාව විපාක ක්ෂණයෙහිම දතයුතුය. යම්තාක් සත්වයා රහත් බවට නොපැමිණේද ඒ තාක් ඔවුන් එයින් චුතවී නිරයෙහි උපදින්නේ ගිනිදැල් ලොහොකුඩු ආදියෙන් වැටහෙන ආකාරයෙන් නිරයෙහිය. ගැබ් පිළිසිඳ ගැනීමට පැමිණෙන්නේ මව්කුස දේවයෝනිවල උපදින්නේ කල්පවෘක්ෂ විමානාදියෙන් වැටහෙන ආකාරය අනුව දෙව්ලොව යයි මෙසේ උපත් නිමිති වැටහේ. මේ නිමිති ඉපදීමෙන් නොමිදෙන නිසා උපට්ඨාන සමංගිතා වේ.

ඒ සඳහා මේ වස්තුවයි. සෝණ ගිරිපාදයෙහි පිප්ඵලි විහාරයෙහි සෝණ ථෙර නම් එක් ධර්ම කථික හිමිනමක් විය. උන්වහන්සේගේ පියා සුනඛවාජික නම් වැද්දෙක් විය. ස්ථවිරයෝ ඔහු වලක්වන්නේ සංවරයෙහි තැබීමට නොහැකි වන්නේ වරාකය නොනැසේවයි මහළු කාලයෙහි පැවිදි කළේය. ඔහුට ගිලන්ව වැදහොත් කාලයේ නිරය වැටහුනේය. සෝණගිරි පාදයෙන් මහා සුනඛයෝ පැමිණ ඔහු කනු කැමතිව මෙන් වටකළහ. හේ මහත් බියට පැමිණ දරුව, සෝණ වලක්වන්න යයි කීය.

මහතෙර කුමක්ද? නොපෙනේ, පියාණෙනි. ඒ පුවත කීවේය. සොණ තෙර මා බඳුවූවකුගේ පියා කෙසේ නම් නිරයේ උපදින්නේ යයි මොහුට පිහිට වුව මැනවැයි සාමණේරවරුන් ලවා නොයෙක් මල් ගෙන්වාගෙන සැමලු බෝමලුවල මල්මාලා පූජාද ආසන පූජාද කරවා පියා ඇඳෙන් සැමලුවට පමුණුවා ඇඳෙහි හොවා මේ මහා ස්ථවිරයන් ඔබේ ප්‍රයෝජනය සඳහා පූජා කරන ලදී. මේ මගේ භාග්‍යවතුන් වහන්ස, දූප්ත් පඬුරුයි, කියා භාග්‍යවතුන් වහන්සේ වැඳ හිත පහදවා ගන්න යයි කීහ. හේ මහතෙර පූජා දැක එසේ කරන්නේ සිත පැහැදවීය. එකෙණෙහි ඔහුට දෙව්ලොව වැටහුණේය. නන්‍දන වනය චිත්‍රලතා වනය මිස්සක වන ඵාරුසක වන විමානද දෙව් නිළියන් පිරිවරා සිටිනවා මෙන් විය. හේ පහවෙව සෝණ, පහවෙව සෝණ කීය. කුමක්දැයි මහතෙර ඇසීය. මේ ඔබේ මව්වරු එතියි තෙර ස්වර්ග වැටහේ යයි සිතීය. උපට්ඨාන සමංගිතා සැලේ යයි දතයුතුය.

## පඨම බල නිද්දේසයයි.

දෙවන බල නිද්දේසයෙහි **ගතිසම්පත්ති පටිබාල්හානි** ගති සම්පත්තිය පිළිබැහී, වැලැක්වීය. සෙසු පදවලද මෙම නයයි. මෙහිද **ගති සම්පත්ති** ගති සම්පත්ති නම් දෙව්ලොව ද මිනිස් ලොවද වේ. **ගතිවිපත්ති** සදොස් ගති නම් සතර අපායයි. **උපධි සම්පත්ති** ආත්මභාවය සම්පූර්ණ වීම **උපධිවිපත්ති** හීන ආත්මභාව **කාල සම්පත්ති** යහපත් පාලකයින් මිනිසුන් ඇති කාලය යනුයි **කාලවිපත්ති** දුෂ්ට පාලකයින් මිනිසුන් සිටින කාලය. **පයෝග සම්පත්ති** සම්‍යක් ප්‍රයෝග. **පයෝග විපත්ති** වැරදි ප්‍රයෝග.

එහි සමහරකට බොහෝ පව්කම් ඇත. ඒවා උපධි විපත්තියෙන් ඔබ පැසෙන්නේය. හේ වනාහි එකම යහපත් ක්‍රියාවකින් ගති සමාපත්තිය ලැබ දෙව්ලොව හෝ මිනිස්ලොව උපන්නේය. එබඳු ස්ථානයෙහි අකුසලය වැලැක්වීමක් නැත. ඒකාන්තයෙන් කුසලය වලක්වයි. එබඳු කර්ම මේවාය. ප්‍රබල ගති සම්පත්වලට විරුද්ධ වන්නේ නැතැයි දතයුතුය.

අනෙකෙකුටද බොහෝ පව්කම් ඇත. ඒවා උපධි විපත්තියට හේතුවී පැසෙන්නේය. හේ වනාහි එකම යහපත් ක්‍රියාවකින් උපධි සම්පත්තියෙහි සිටියේ මනාව පිහිටි අඟපසඟ මනාරූ දර්ශනීය බ්‍රහ්ම පුත්‍රයකු මෙනි. එසේ වුවත් දාසියකගේ කුසෙහි දාස පුත්‍රයෙක් වේ. මෙබඳු වූ ආත්ම

භාවය කිලිටි කරවීම සුදුසු නොවේයයි ඇත් පල් අසුන් බැඳීම් ගවපල් ආදි කර්මාන්ත නොකරයි. සියුම් වත් හැඳ පෙරවා භාණ්ඩාගාරික ස්ථානාදියෙහි තබයි. ස්ත්‍රියක් නම් බත්පිසීම් ආදිය නොකරවති. අලංකාර වස්ත්‍ර ආදිය දී නිදන ගේ පාලිකා හෝ කරති. සෝමා දේවිය මෙන් ස්වාමි ස්ථානයෙහි හෝ තබයි.

භාතික රජතුමාගේ කාලයෙහි ගවමස් කන බොහෝ දෙනා ගෙන රජතුමාට පෙන්වූහ. ඔව්හු දඬුවම් දීමට හැකි වුවදැයි විචාරන ලදුව නොහැකි වෙමුයි කීවාහුය. ඉක්බිති ඔවුන් රාජංගනය සුද්ධ කිරීමෙහි කළහ. ඔවුන්ගේ එක් දුවක් අභිරූපය. දැකුම්කළුය. පැහැපත්ය. රජ ඇය දැක අන්තඃපුරයට පමුණුවා වල්ලභ ස්ථානයෙහි තැබීය. ඇගේ ආනුභාවයෙන් සෙසු නෑයෝද සැපසේ ජීවත් වූහ. එබඳු වූ ආත්ම භාවවලද පාපකර්ම විපාක දීමට නොහැකි වේ. මෙසේ උපධි සම්පත්ති වැලැක්වුවත් විපාක නොදේයැයි දැනගනී.

ඇතමෙකුට බොහෝ පව්කම් ඇත. ඒවා කාල විපත්තිය පැමිණවිට විපාක දෙයි. ඒවා එකම යහපත් ක්‍රියාවකින් පළමු කල්පයෙහි හෝ සක්විති රජුගේ හෝ බුදුරදුන්ගේ හෝ උත්පත්ති කාලයේ හෝ යහපත් රජුන් මිනිසුන් ඇති කාලයේ හෝ උපදී. එබඳු කාලයේ උපන්නහුට අකුසල විපාක දීමට අවකාසයක් නැත. ඒකාන්තයෙන් කුසලයට අවකාශ ඇත. මෙසේ කාල සම්පත්තිය වැලැක්වුවත් විපාක නොදේ යයි දැන ගනී.

තව එකෙකුට මෙයින් පව්කම් ඇත. ඒවා පයෝග විපත්ති කාලයෙහි විපාක දේ. එය එක කලන ක්‍රියාවකින් ප්‍රයෝග සම්පත්තියේ පිහිටියේ පාණාතිපාතාදියෙන් වෙන් වූයේ කාය වචී මනෝ සුචරිත පුරති. එබඳු ස්ථානයෙහි අකුසලයට විපාක දීමට අවකාස නැත. ඒකාන්තයෙන් කුසලයම අවකාශ ඇත. මෙසේ ප්‍රයෝග සම්පත්තියට බාධා ඇතිවුවත් විපාක නොදේයයි දැනගනී.

තව කෙනෙකුට බොහෝ පව්කම් ඇත. ඒවා ගති සම්පත්තිය පැවති කල විපාක නොදෙයි. එය එක පව්කමකින් ගති විපත්තිය උපන්නේය. එහි ඒ පව්කම පැමිණ වරින්වර විපාක දෙයි. කාලයක් නිරයේ උපදවයි. කලක තිරිසන් යෝනියෙහි කලෙක ප්‍රේත විෂයෙහි

කලෙක අසුරකයෙහි බොහෝ කාලයක් අපායෙන් හිස එසවීමට නොදේ. මෙසේ ගති සම්පත් වැලැක්වූ බැවින් විපාක දීමට නොහැක්කේ ගති විපත් පැමිණ විපාක දේයයි දැනගනී.

තව කෙනෙකුට පව්කම් බොහෝ ඇත. ඒවා උපධි සම්පත්ති කාලයෙහි විපාක නොදේ. හේ එක පව්කමකින් උපධි විපත්තියෙහි සිටියේ දුර්වණ අවලස්සන පිළිකුල් පිසාචයකු සමානය. හේ දාසිකුසක දාසයෙක්ව ඉපිද මේ නුසුදුසු සියල්ල ඔහු කිලිටි කම් කරවයි. යටත් පිරිසෙයින් මල බැහැර කිරීම් ආදිය කරවයි. ස්ත්‍රියක නම් මේ නුසුදුසු සියළු ඇත්බත් පිසීම් ආදි කිලිටි කර්ම කරවයි. කුලගෙයක ඉපදුනත් බලි සාදමින් රජපුරුෂයෝ ගෙදර දාසි යයි සංඥාකොට බැඳ යති. කොතලවාසී ගම මහ කෙළෙඹියාගේ ගෘහණිය මෙනි. මෙසේ උපධි සම්පත් වැලැක්වූ බැවින් විපාක දීමට නොහැකි විය. උපධි විපත් පැමිණ විපාක දුන්නේ යයි දැනගනී.

තව කෙනෙකුට බොහෝ පව්කම් ඇත. ඒවා කාල සම්පත්තිය පැමිණිවිට විපාක නොදෙයි. හේ එක් පව්කමකින් කාල විපත්ති කාලයේ දෘෂ්ටි පාලකයින් මිනිසුන් සිටින කාලයේ නිසරු ඕජස් නැති දසවස් ආයු කාලයෙහි උපදී. පස්ගෝරස විනාශ වේ. කුරහන් අගබොජුන වේ. මිනිස්ලොව කිසිවෙක් ඉපදුනොත් මෘග ගව සමාන ජීවිත වේ. මෙබඳු කාලයක කුසලයට විපාක දීමට අවකාශ නැත. ඒකාන්තයෙන් අකුසලයට විපාකාදීමට අවකාශ ඇත. මෙසේ කාල සම්පත්තිය වැලැක්වූ බැවින් විපාක දීමට නොහැකිව කාල විපත්තිය පැමිණ විපාක දේයයි දැනගනී.

තව කෙනෙකුට බොහෝ පව්කම් ඇත. ප්‍රයෝග සම්පත්තිය පැමිණි කාලයේ විපාක නොදෙයි. හේ ප්‍රයෝග සම්පත්තියේ සිට පාණාතිපාතාදි දස කුසල පව්කම් කරයි. ඔහු සොරබඩු සමග අල්ලාගෙන රජුට දක්වති. රජ බොහෝ වධදී මැරවීය. මෙසේ ප්‍රයෝග සම්පත් වැලැක්වූ හෙයින් ප්‍රයෝග විපත් පැමිණ විපාක දේයයි දැන ගනී. මෙසේ සතර සම්පත්වලින් වැලැක්වූ පව්කම් විපාක නොදී සතර විපත් පැමිණ දෙයි.

යම්සේ කිසියම් පුරුෂයෙක් කිසියම් ක්‍රියාවකින් රජු සතුටු කරන්නේය. ඉක්බිති රජ ඔහුට තනතුරක් දී ගම්වරයක් දෙන්නේය. හේ එය හොඳින් පරිභෝජනය කිරීමට නොහැකි වන්නේ වදුරකු ගත් බත්

පිඬක් මෙන් බිඳගන්නේය. යමෙකුගේ යම් යානාවක් හෝ වාහනයක් හෝ දාසයකු හෝ දාසියක හෝ උයනක් හෝ වස්තුවක් හෝ ලස්සන යයි බලන හැමදෙයක්ම බලහත්කාරයෙන් ගන්නේය. මිනිස්සු රාජ විශ්වාසය ඇත්තෙකැයි කිසිවක් කීමට නොහැකි වන්නාහ. හේ රජුගේ වඩාත් විශ්වාසය දිනාගත් ඇමතිවරයෙකුට විරුද්ධ වන්නේය. හෙතෙම ඔහු අල්වා තළා පෙළා බිමදිගට ඇදගෙන රජු වෙත එළඹ දේවයන් වහන්ස, අසවල් ජනපදයේ විනාශ කරන නිසා අල්ලා ගත්තේය. රජ බන්ධනාගාරයෙහි බඳවා අසවලාගෙන් කාට කුමන අපහසුවක් වීදැයි නගරයෙහි අණ බෙර හැසිරවී. මිනිස්සු පැමිණ මගේ මේක ගත්තේය. මගේ මෙය ගත්තේ යයි හඬ දහසක් නැගුහ. රජ බොහෝසෙයින් කිපී බන්ධනාගාරයේ ඔහු නොයෙක් ආකාරයෙන් වෙහෙස කරවා ඝාතනය කරවා ඔහු සුසානයෙහි දමා මාංචු ගෙනෙවයි කියන්නේය. මෙසේ සම්බන්ධය දතයුතුය.

කිසියම් ක්‍රියාවකින් රජ පහදවා ඒ පුරුෂයාගේ තනතුර ලැබූ කාලය මෙන් කිසියම් පිනකින් දෙව්ලොව උපන් කාලය. ඒ ජනපදය බිඳ මිනිසුන්ගේ වස්තුව පැහැරගන්නා විට කිසිවකුටත් එය කීමට නොහැකි කාලය මෙන් මේ දෙව්ලොව උපන් කල්හි අකුසලයට විපාක නොදිය හැකි කාලය. එක්දිනක් ඔහු රජුගේ විශ්වාසය වැඩියෙන් ලබාගත් ඇමතියාට විරුද්ධ වී ඔහු විසින් කෝපයෙන් ඔහුට තළාපෙළා රජු ඉදිරියට පමුණුවා බන්ධනාගාරයෙහි බැඳවූ කාලය මෙන් මොහු දෙව්ලොවින් චුතව නිරයෙහි උපන් කාලය මිනිසුන් මගින් මෙය ගත්තේයයි කෑගසන කාලය මෙන් ඔහු නිරයේ උපන් කල සියළු අකුසල කර්ම එක්රැස් වී තිබෙන කාලය සුසානයෙහි හැරදමා මාංචු ගෙනඑන කාලය මෙන් එක එක කර්මය ගෙවී ඉතිරි ඒවායේ විපාකයෙන් නිරයටම ගියේ වැටී සියළු කාලයේම නිරයෙහි විපාක දෙන කාලය, කල්පයක් සිටින කර්ම කොට එක් කල්පයක් නිරයෙහි විපාක විඳින සත්වයෝ එකෙක් දෙන්නෙක් සීයක් දහසක් නොව මෙසේ විපාක ලබන සතුන්ගේ ගණන සීමාවක් නැත.

**අත්ථෙකච්චානි කල්‍යාණානි කම්ම සමාදානානි ගති විපත්ති පටිබාළහානි න විපච්චන්ති**

යනාදියෙහි ද මෙසේ දතයුතුය. මෙහි ඇතමෙකුට බොහෝ කලණ කර්ම ඇත. ඒවා ගති සම්පත්ති කාලයේ විපාක දෙයි. හේ එක් පව්කමකින් ගති විපත්තියට පැමිණ නිරයේ හෝ අසුරකායේ හෝ උපදී. එබඳු

ස්ථානයෙහි කුසල විපාක දීමට නොහැකිය. ඒකාන්තයෙන් අකුසලවලට හැකි වේ. මෙසේ ඔහුට ඒ කර්ම ගති විපත් විසින් වලකාලන නිසා විපාක දීමට නොහැකි වේයයි දැනගනී.

තව කෙනෙකුට බොහෝ කල්‍යාණ කර්ම ඇත. ඒවා උපධි සම්පත්ති කාලයේ විපාක දෙයි. හේ එක් පව්කමකින් උපධි විපත්තියේ පිහිටියේ දුර්වර්ණ වේ. පිසාචයකු වෙයි. හේ රාජකුලයෙහි උපන්නේ නම් පියා ඇවෑමෙන් කිම වේ නිශ්‍රීක රාජ්‍යයෙන් යයි රාජ්‍යය නොලබයි. සෙනවි ගෙවල්වල උපන්නේ නම් සෙනෙවි තනතුරු සිටු තනතුරු නොලබයි.

මේ අර්ථය ප්‍රකට කිරීම සඳහා දීපරාජ වස්තුව කිවයුතුය. රජතුමා පුතුන් ලැබූ කල පැහැදී දේවියට වරයක් දුන්නේය. මේ වරය ගෙන තැබුවාය. කුමරා සත අට වයස් කාලයෙහි රජ අංගනයෙහි කුකුලන් කෙටවීය. එක් කුකුළෙක් උඩ පැන කුමරාගේ ඇස් බින්දේය. කුමරාගේ මව පුතාට පහලව දහසය වයස් කාලයෙහි රජය ඉල්ලන්නෙමියි රජු ලඟට පැමිණ කීවාය. දේවයන් වහන්ස! ඔබතුමා විසින් කුමාරයා ඉපදුණු වෙලාවෙහි වරයක් දෙන ලදී. මවිසින් එය ගෙන තබන ලදී. දැන් එය ගනිමි. හොඳයි දේවිය, ගන්න. දේවයන් වහන්ස, ම විසින් ඔබවහන්සේගෙන් නොලැබූ දෙයක් නම් නැත. දැන් වනාහි මගේ පුතාට රජය ඉල්ලමි. දේවිය, ඔබේ පුතා අංගවිකලය. ඔහුට රජය දීමට හැකි නොවේ. මට රුචි වරයක් දිය නොහැකිනම් වරයක් දුන්නේ ඇයි? රජු අතිශයින් වෙහෙසට පත්වන්නේ සියළු ලංකාදීපයෙහි රාජ්‍යය ඔබේ පුතාට දියහැකි නොවේ. නාගදීපයෙහි සත් ඔසවා වසවයි නාගදීපයට යැවීය. හේ දීපරජ යයි වීය. ඇස් විකල නොවූයේ නම් යොදුන් තුන්සියයක් වූ සියළු තම්බපණ්ණි දීපයෙහි සියළු සම්පත් පිරිවරා රාජ්‍යය ලබන්නේය. මෙසේ උපධි විපත් බාධක වී විපාක නොදේ යයි දැන ගනී.

තව කෙනෙකුට බොහෝ කලණ කම් ඇත. ඒවා කල සම්පත්තියේදී විපාක දෙන්නේය. හේ වනාහි එක් පවුකමකින් කාල විපත්තිය වී දුෂ්ටරාජ දුෂ්ට මිනිසුන් ඇති කාලයෙහි ඉපිද නිසරු ඕජස් රහිත අල්පායුෂ ඇති ගති කෙළවර උපන්නේය. එබඳු කාලයෙහි කල්‍යාණ කර්ම විපාක දීමට නොහැකි වේ. කාල විපත්තියෙන් වලක්වන නිසා විපාක නොදේ යයි දැනගනී.

තව කෙනෙකුට බොහෝ කල්‍යාණ කර්ම තිබේ. ඒවා ප්‍රයෝග සම්පත්තියේදී විපාක දෙයි. මේ තැනැත්තා ප්‍රයෝග සම්පත්තියෙහි සිටියේ සතුන් මරයි. සියළු අකුසල් කරයි. ඔහු සමග සමාන ජාතියේ සිටි අයද ආවාහ විවාහ නොකරති. ස්ත්‍රී ධූර්තය සූදුවෙහි ඇළුනේය. සුරාවෙහි ධූර්තය මේ තෙමේ පව්කාරයෙකැයි දුරින්ම දුරුකරති. ඔහුට කල්‍යාණ කර්ම විපාක දීමට නොහැකි වේ. මෙසේ ප්‍රයෝග විපත් බාධා කරන නිසා විපාක නොදේ යයි දැනගනී. මෙසේ සතර සම්පත් පැමිණ විපාක දායක වූ කල්‍යාණ කර්ම සතර විපත්වලින් බැහැර කරන ලද හෙයින් විපාක නොදේ.

තව කෙනෙකුට බොහෝ කල්‍යාණ කර්ම ඇත. ඒවා ගති විපත්තියෙහි සිටින්නාට විපාක නොදේ. හේ වනාහි එක් කල්‍යාණ කර්මයකින් ගති සම්පත්තියෙහි උපන්නේ එහි ඔහුට ඒ කර්ම පැමිණ වරින්වර විපාක දේ. කලෙක මිනිස් ලොවද කලෙක දෙව් ලොවද උපදවයි. මෙසේ ගති විපත්ති වලකන ලද හෙයින් විපාක දීමට නොහැකි වේ. ගති සම්පත්තිය පැමිණ විපාක දේ යයි දැනගනී.

තව කෙනෙකුට බොහෝ කල්‍යාණ කර්ම ඇත. ඒවා උපධි විපත්තියෙහි සිටියහුට විපාක නොදේ. හේ එක් කල්‍යාණ කර්මයකින් උපධි සම්පත්තියෙහිම පිහිටියේ අභිරූප දර්ශනීයය. පැහැපත්ය. බ්‍රහ්ම පුත්‍රයකු සමානය. ඔහු උපධි සම්පත්තියෙහි සිටින ලද බැවින් කල්‍යාණ කර්ම විපාක දෙයි. රජ කුලයෙහි උපන්නේ නම් අනිත් දෙටු සොයුරන් සිටියත් මොහුගේ ආත්මභාවය සමෘද්ධය. මොහුට සත්ලැගු කල ලෝකයාට පහසුවක් වන්නේ යයි ඔහුම රජයෙහි අභිෂේක කරවති. උපරාජ ගෙවල්වල ඉපදුනේ නම් පියා ඇවෑමෙන් උප රජකමෙහි සෙන්පති තනතුර භාණ්ඩාගාරික තනතුර සිටු තනතුර ලබයි. මෙසේ උපධි විපත්තිය පිළිබැඳු නිසා විපාක දීමට නොහැකි වේ. උපධි සම්පත්තිය පැමිණ විපාක දෙන්නේ යයි දැනගනී.

තව කෙනෙකුට බොහෝ කලණ කම් ඇත. ඒවා කාලවිපත්තියේ සිටින්නාට විපාක නොදේ. හේ එක් කලණ කර්මයකින් කාල සම්පත්තියේ උපන්නේ යහපත් රජුන් මිනිසුන් සිටින කාලයකය. එබඳු කාල සමෘද්ධියෙන් උපන්නාට කල්‍යාණ කර්ම විපාක දෙයි.

මෙහි මහාසෝණ තෙරුන්ගේ කථාව කිවයුතුය. බ්‍රාහ්මණතිස්ස භය පැවති කාලයේ සිතුල්පව්වේ දොලොස් දහසක් භික්ෂූන් වහන්සේලා වැඩසිටිති. එබඳුස භික්ෂූන් වහන්සේලා පිරිසක් තිස්ස මහා විහාරයෙහිද සිටිති. විහාර දෙකේම තුන් වර්ෂයකින් සෑහුණු ධාන්‍ය මහා මීයෝ පැමිණ එක් රැයකින්ම කා පොතු පමණක් ඉතිරි කළහ. සිතුල්පව්වේ භික්ෂූහු තිස්ස මහා විහාරයෙහි ධාන්‍ය ඇතැයි එහි ගොස් වසමු යයි විහාරයෙන් නික්මුණහ. තිස්ස මහා විහාරයෙහි භික්ෂූහුද සිතුල්පව්වේ ධාන්‍ය ඇතැයි එහි ගොස් වසමු යයි විහාරයෙන් නික්මුණහ. දෙගොල්ලන්ම එක් ගැඹුරු නදී තීරයකට පැමිණියාහුය. විචාරා ධාන්‍ය ක්ෂීණ බව දැන එහි ගොස් කුමක් කරමුදැයි භික්ෂූන් විසිහතර දහසම ගැඹුරු කන්දර වනයට වැඩ හිඳගෙන හිඳිමින් ආහාර නැතුවම අනුපාදිසේස පරිනිර්වාණයෙන් පිරිනිවන් පෑහ.

බිය නැතිවූ කල්හි භික්ෂු සංඝයා වහන්සේ ශක්‍ර දිව්රාජයා ගෙන ධාතු එක්තැන් කොට චෛත්‍යයක් කළහ. බ්‍රහ්මණතිස්ස සොරාද ජනපදය විනාශ කෙළේය. සංඝයා රැස්වී කතාකර සොරා පළවා හරින්නැයි ශක්‍රයා සමීපයට තෙරුන් අටනමක් යැවූහ. සක්දෙව් රජ ස්වාමීන් වහන්ස, උපන් සොරා මට වැලැක්විය නොහැක. සංඝයා පාර සමුද්දයට වඩිනු මැනවි. මම මුහුදු ආරක්ෂාව කරමි. සංඝයා සියළු දිසාවලින් නාගදීපයට වැඩ දඹකොළ පටුනෙහි මහල් තුනක් ඇති මහා පහුරක් බැන්දවූහ. එක් මහලක් ජලයේ ගිලුනේය. එක් මහලක සංඝයා සිටියහ. එක් මහලක පාත්‍ර සිවුරු තැබ්බවූහ. සංයුත්ත භාණක චූලසීව තෙර ඉසිදත්ත තෙර මහාසෝණ තෙර යයි තෙරුන් තිදෙනා ඒ පිරිසේ ප්‍රධාන වූහ. ඔවුනතුරෙන් තෙරුන් දෙනමක් මහාසෝණ තෙරුන්ට කීහ. ඇවැත්නි, මහාසෝණ මහා පහුරට නැගෙන්න, ස්වාමීණි ඔබවහන්සේලා, ඇවැත්නි දියේ මරණයත් ගොඩ මරණයත් එකමය. අපි නොයන්නෙමු. ඔබ නිසා අනාගතයෙහි සාසක ප්‍රවේණිය සිටින්නේය. ඇවැත්නි, ඔබ යන්න. ස්වාමීනි ඔබවහන්සේලා නොයනවා නම් මම නොයමි. තුන්වර දක්වා කියාත් තෙරුන් නැංවීමට නොහැකිව නැවතුනහ.

ඉක්බිතිව චූලසීව හිමි ඉසිදත්ත තෙරුන්ට කීය. ඇවැත්නි, ඉසිදත්ත අනාගතයෙහි මහාසෝණ තෙරුන් නිසා සාසන ප්‍රවේණිය සිටින්නේය. උන්වහන්සේ අතින් අතහැරෙන්න දෙන්න එපා. ස්වාමීන් වහන්ස, ඔබවහන්සේ, මම මහසෑය වඳින්න යමි. තෙරුන් දෙදෙනාට අනුශාසනා

කොට පිළිවෙළින් චාරිකාවේ හැසිරෙන්නේ මහා විහාරයට පැමිණියේය. එසමයෙහි මහවෙහෙර ශූන්‍ය විය. සෑමලුවෙහි එරඬු ගස් පැලවී ඇත. සෑය ගස්වලින් වටකරන ලද්දේ දියසෙවලවලින් පිරී ඇත. තෙරුන් ජීවමාන බුදුන් ඉදිරියෙහි වැඳවැටෙන ආකාරයෙන් මෙන් මහාසෑය වැඳ පැසුළු රැයෙහි සෑ මලුවට පිවිස බලන්නේ මෙබඳු වූ ලාභ කීර්තියෙන් අග පැමිණි ශරීර ධාතු සෑය තබන තැන අනාථභාවයට පැමිණෙන්නේ යයි සිතමින් වැඩඋන්නේය.

තුඩුරු ගසෙහි අධිගෘහිත දෙවියා මගියෙකුගේ වේශයෙන් හාල් නැලියක්ද හකුරු මුලක්ද ගෙන තෙරුන් සමීපයට ගොස් ස්වාමීන් වහන්ස, කොහාටද වඩින්නේ? උපාසකය, දකුණු දිසාවටය. මමත් එහාට යනවා. ස්වාමීනි එකට යමු. මම දුර්වලයි. ඔබේ වේගයෙන් යන්න අමාරුයි. උපාසකය, ඔබ ඉස්සරවෙලා යන්න. මමත් ඔබේ ගමනෙන් එන්නෙමැයි තෙරුන් වහන්සේගේ පාත්‍රා සිවුරු ගත්තේය. තිසාවැව බැම්මට නැගුණු වේලාවෙහි පාත්‍රය ගෙන පානයක් සකස්කොට පිළිගැන්වීය. තෙරුන් වහන්සේට එය පානය කළ සැනින් බලමාත්‍රයක් ඇතිවිය. දේවතාවා පොළොව හකුළුවා වේණු නදිය සමීපයෙහි අත්හැර දැමූ විහාරයකට පැමිණ තෙරුන් වහන්සේට වසන තැනක් පිළියෙළ කර දුන්නේය. දෙවන දිනයෙහි තෙරුන් මුව දෙවූ කෙණෙහි කැඳ පිස දුන්නේය. කැඳ වැළඳූ පසු බත් පිස පිළිගැන්වීය. තෙර උපාසකය, ඔබට තබා ගන්නැයි අතින් පාත්‍රය වැසූහ. මම දුර නොයමියි දෙවියා තෙරුන් වහන්සේගේම පාත්‍රයෙහි බත් බහා කරන ලද බත්කිස ඇති තෙරුන්ගේ පා සිවුරු ගෙන ගමන්මගට පිවිසියේ පොළොව හකුළුවා දැදුරුඔය සමීපයට පමුණුවා ස්වාමීන් වහන්ස, මෙය කොළකා මිනිසුන් වසන තැනක් යයි දුමෙන් පෙනේ. මම ඉස්සරවෙලා යන්නම් කියා තෙරුන් වැඳ තමාගේ භවනයටම ගියේය. තෙරුන් වහන්සේ සියළුම බිය කාලය කොළ කා මිනිසුන් නිසා විසූහ.

ඉසිදත්ත තෙරුන් වහන්සේද පිළිවෙළින් චාරිකාවෙහි යෙදෙන්නේ අළ ජනපදයට පැමිණියහ. එහි මිනිස්සු නොපැසුණු මීඵල බිඳ ඇට ගෙන ලෙලි දමා ගියහ. තෙර ඇවැත්නි, මහාසෝණ, භික්ෂාහාරයක් පෙනේයයි කියා පාසිවුරු ගෙන්වා සිවුර පොරවා පාත්‍රය ගෙන සිටියේය. තරුණ ළමයි තෙරුන් සිටි බව දැක මෙයින් කිසියම් අර්ථයක් වන්නේ යයි වැලි පිස මී ලෙලි පාත්‍රයෙහි බහා දුන්හ. තෙර වැළඳූහ. සත්දවසක්

ඒ ආහාරය පමණක් විය. පිළිවෙළින් චොරිය විල ළඟට පැමිණියහ. මිනිස්සු නෙලුම් ගෙන නෙලුම්දඬු දමා ගියහ. තෙර ඇවැත්නි, මහාසෝණ, භික්‍ෂාහාරයක් පෙනේ යයි කියා පාසිවුරු ගෙන්වාගෙන සිවුර පොරවා පාත්‍රය ගෙන සිටියහ. ගම්දරුවෝ නෙලුම්දඬු සෝදා පාත්‍රයෙහි බහා දුන්හ. තෙර වැළඳූහ. ඒ ආහාරය සත්දවසකට සෑහුනේය. පිළිවෙළින් යන්නේ කොළ කන මිනිසුන් වසන එක් ගම්දොරකට වැඩියහ. එහි එක් දැරියකගේ මාපියෝ වනයට යන්නේ කවුරුහරි ස්වාමීන් වහන්සේ කෙනෙක් වැඩියොත් කොහෙවත් වඩින්න දෙන්න එපා. ආර්යන් වහන්සේට වසන තැනක් කියන්න, දරුව යයි කීහ. ඕ තෙරවරුන් දැක පාත්‍රය ගෙන වඩා හිඳුවීය. ගෙයි ධාන්‍ය ජාති නැත. වැය ගෙන හුනිද මද රුක් පොතුද හුනිද වැල්කොළ සමග එකට කොටා පිඬු තුනක් කොට එකක් ඉසිදත්ත තෙරුන්ටද එකක් මහාසෝණ තෙරුන්ගේ පාත්‍රයෙහි තබා ඉතිරි පිඩ ඉසිදත්ත තෙරුන්ගේ පාත්‍රයෙහි තබමියි අත දිග හැරියේය. අත පෙරලී මහාසෝණ තෙරුන් වහන්සේගේ පාත්‍රයෙහි සිටියේය. ඉසිදත්ත තෙරුහු බ්‍රාහ්මණ තිස්ස භයෙහි හුනිද මද පිඬු විපාක දායක කර්මය දෙස කාල සම්ප්‍රදාය කොපමණ විපාක පෙන්වත්දැයි කීය. ඔව්හු එය වළඳා වසන තැනට වැඩියහ. ඕ ද වනයෙන් ආ මව්පියන්ට තෙරුන් දෙනමක් වැඩි බවත් උන්වහන්සේලා වසන තැන කී බවත් දැන්වීය. ඒ දෙදෙනාම තෙරුන් සමීපයට ගොස් වැඳ ස්වාමීන් වහන්ස, අපට ලැබෙන දෙයකින් ඔබවහන්සේලා පිළිදැගුම් කරමු. මෙහිම වසනු මැනවැයි පිළිණ ගත්හ. තෙරුන් වහන්සේලා ද සියළු බිය කාලය ඔවුන් නිසා විසූහ.

බමුණු තිස් සොරා මළ කල්හි පිතුමහ රජ සත් නැගීය. බිය සංසිඳිනි. ජනපදය සම්පූර්ණ වීයයි අසා පර සමුද්‍රයෙන් භික්ඛු සංඝයා වහන්සේ නැවකින් පැමිණ මාතොට පටුනෙහි ගොඩබැස මහාසෝණ තෙරුන් කොහි වැඩසිටිනවා දැයි විචාරා තෙරුන් වහන්සේ වෙත පැමිණියහ. තෙරුන් වහන්සේ පන්සියයක් භික්‍ෂූන් පිරිවරා කළුගමුවේ මණ්ඩලාරාම විහාරයට වැඩියහ. ඒ කාලයේ කලුගමුවේ පවුල් හත්සියයක් පමණ වාසය කළහ. රාත්‍රී භාගයෙහි දෙවියෝ ඇවිද, මහාසෝණ තෙරුන් වහන්සේ පන්සියයක් භික්‍ෂූන් පිරිවරා මණ්ඩලාරාම විහාරයට පැමිණ සිටිති. එක් එක් නමට නවරියන් වස්ත්‍රයක් සමග එක් එක් කහවනුවක් වටනා පිණ්ඩපාතය පිළිගන්වන්නැයි මිනිසුන්ට කීහ. දෙවන දිනයෙහි තෙරුන් වහන්සේ කලුගමුවට පිඬු පිණිස වැඩියහ. මිනිස්සු තෙරුන් වඩා හිඳුවා කැඳ පිළිගැන්වූහ. මණ්ඩාලාරාමවාසී තිස්සභූති තෙරුන්

වහන්සේ සංඝනායක ස්ථවිරයන් වහන්සේ ලෙස වැඩසිටියහ. එක් උපාසකයෙක් උන්වහන්සේට වැඳ ස්වාමීන් වහන්ස, මහාසෝණ ස්වාමීන් වහන්සේ කවුදැයි ඇසීය. ඒ කාලයේ තෙරුන් වහන්සේ නවකයෙකි. ඒ නිසා කෙළවර වැඩසිටියහ. තෙරුන් වහන්සේ අත දිගුකර මහාසෝණ නම් මෙන්න මෙයා උපාසක උන්නැහේ යයි කීහ. උපාසකතුමා උන්වහන්සේට වැඳ පාත්‍රය ගත්තේය. ස්ථවිරයෝ නොදෙති. තිස්සභූති ථෙරෝ ඇවැත්නි, සෝණ ඔබ යම්සේ දනී නම් අපිත් එසේම දනිමු. පින්වතුන් දෙවියෝ අභිවෘද්ධියට පමුණුවති. පාත්‍රය මුදව. සබ්‍රහ්මචාරීන්ට සංග්‍රහ කරන්නැයි කීහ. තෙරහු පාත්‍රය දුන්හ. මහා උපාසකතුමා පාත්‍රය ගෙන ගොස් කහවනුවක් අගනා පිණ්ඩපාතය පුරවා නවරියන් වස්ත්‍රය ආධාරකය කොට ගෙනවුත් තෙරුන් වහන්සේගේ අතෙහි තැබීය. අනිත් උපාසකවරුද සත්සියයක් වස්ත්‍ර සමග සත්සියක් පිණ්ඩපාත දානය තෙරුන්වහන්සේටම පිළිගැන්වූහ. තෙරුන් වහන්සේ භික්ඛු සංඝයා සමග බෙදාගෙන පිළිවෙළින් මහා විහාරයට පැමිණ මුව සෝදා මහබෝ මහසෑ වැඳ ථූපාරාමයෙහි සිට සිවුරු පොරවා භික්ඛු සංඝයා පිරිවරා දකුණු දොරටුවෙන් නගරයට පිවිස දොරටුවේ සිට වළඳන සාලාව දක්වා අතරෙහි කහවනු සැටක් අගනා පිණ්ඩපාතය ලැබූහ. එතැන්සිට සත්කාරවල ප්‍රමාණයක් නොවීය.

මෙසේ කාල විපත්තියෙහි මී ලෙලි නෙළුම්දඬු පවා දුර්ලභ විය. කාල සම්පත්තියේදී මෙබඳු වූ මහාලාභ පහළ විය. සාමණේරයන් වහන්සේ නමක්ද උන්වහන්සේගේ උපාධ්‍යායන් වහන්සේද පරතීරයට නොවැඩියහ. කොළ කා ජීවත්වන මිනිසුන් ඇසුරුකොට වාසය කරන්නෙමු යයි ප්‍රත්‍යන්තය බලා වැඩියහ. සාමණේරයන් වහන්සේ සත්දිනක් අනාහාරව සිට එක් ගමක තල්ගසක තල්ගෙඩි දැක උපාධ්‍යායන් වහන්සේට කීහ. "ස්වාමීන් වහන්ස, ටිකක් මෙහාට වඩින්න. තල්ගෙඩි කඩමි"යි සාමණේරය, ඔබ දුර්වලයි. නගින්න එපා. ස්වාමීණි නගිමියි කුඩා වැයක් ගෙන තල්ගසට නැග තල්පිඩු සිඳීමට ඇරඹීය. වැතලය තික්මී බිම වැටුණේය. මෙයා ක්ලාන්තයෙන්ම ගසට නැගුනේය. දැන් කුමක් කරන්නේ දැයි මහතෙර සිතීය. සාමණේරයෝ තල්පත්‍රයක් ඉරා වැ මිටෙහි බැඳ ගැටෙමින් පොළවට පාත්කොට ස්වාමීන් වහන්ස, වැ තලය මෙහි ප්‍රවේශ කෙරුවොත් හොඳයයි කීහ. සාමණේරයන් උපාය සම්පන්න යයි වැතලය ප්‍රවේශකර දුන්හ. හේ වැය ඔසවා තල්ගෙඩි හෙළීය. තෙරුන් වහන්සේ වැය බාවාගෙන පෙරළී ගිය තල්ගෙඩි සිඳ සාමණේරයන් බැස්සවිට සාමණේරය ඔබ දුර්වලය.

මෙය කන්න කීහ. ස්වාමීන් වහන්ස, ඔබවහන්සේ නොවළඳා මම නොකමියි වැය ගෙන තල්ගෙඩි බිඳ පාත්‍රය ගෙන තල්මද බහා තෙරුන්වහන්සේට දී තමාද අනුභව කෙළේය. තල්ගෙඩි තිබෙනතුරු එහිම වැඩසිට තල්ගෙඩි ඉවරවූ පසු කොළකා ජීවත්වන මිනිසුන් වසන තැන අත්හැර දමන ලද එක් විහාරයකට පිවිසුනහ.

සාමණේරයන් වහන්සේ වැඩසිටීමට තැනක් පිළියෙළ කළහ. තෙරුන් වහන්සේ සාමණේරයන්ට අවවාද දී විහාරයට පිවිසියහ. සාමණේරයන් අස්ථානයේ නටුවා වූ ආත්මභාවවල ප්‍රමාණයක් නැත. බුදුන්ට උපස්ථාන කරමියි සැමලුවට ගොස් තණ උදලු ගායි. සත්දිනක් පමණ නිරාහාර නිසා වෙවුලමින් වැටී හොත්තේම තණ උගුල්ලයි. ඇතැම් මිනිස්සු වනයේ හැසිරෙමින් පැණි ලැබ දරද අතුකොළද ගෙන තෘණ සෙලවෙන සංඥාවෙන් මේ මුවෙකැයි සාමණේරයන් ලඟට පැමිණ සාමණේරයන් වහන්ස, කුමක් කරන්නේදැයි ඇසූහ. උපාසකවරුනි, තණකොල ගැට ගනිමි. ස්වාමීන් වහන්ස, තව කවුරුහරි ඉන්නවද? ඔව් උපාසකවරුනි, මගේ උපාධ්‍යායන් වහන්සේ ඇතුළු ගැබෙහි. මහතෙරුන් වහන්සේට දී වළඳනු මැනවැයි කියා මීපැණි පිළිගන්වා ඔවුන් වසන ස්ථානය කියා අපි කොළ අතු කඩ කඩා යන්නෙමු. ආර්යෙනි, ඒ ලකුණෙන් මහතෙරුන් සමග එනු මැනවැයි කියා ගියහ. සාමණේර තෙමේ මීපැණි ගෙන තෙරුන් සමීපයට පැමිණ පිටත සිට ස්වාමීන් වහන්සේ වඳිමියි කීය. තෙරහු සාමණේර තෙමේ බඩගින්නෙන් දැවෙමින් ආවේ යයි සිතා නිශ්ශබ්ද විය. හේ නැවත ස්වාමීණි වැඩෙයි කීය. සාමණේරය දුර්වල භික්ෂූන්ට සුවසේ නිදාගන්ට නොදෙන්නේද? ස්වාමීණි දොර අරින්න සුදුසු දෙයකැයි කීය. තෙරහු නැගිට දොරහැර සාමණේර ඔබ කුමක් ලැබුවේද? මිනිසුන් මීපැණි දුන්නා කෑමට ස්වාමීණි. සුදුසුයි ස්වාමීණි. සාමණේරය, එසේ කෑමෙන් ක්ලාන්ත වෙයි. පානයක් හදාගෙන බොමු. සාමණේර පානයක් කොට පිළිගැන්වූ. ඉක්බිති සාමණේර මිනිසුන් සිටින තැන ඇසුවෙහිද? ස්වාමීණී ඔවුන්මයි කිව්වේ. සාමණේර පාන්දරම යෑමෙන් ක්ලාන්ත වේ. අදම යමුයි පාසිවුරු ගෙන්වාගෙන නික්මුණහ. ඔව්හු ගොස් මිනිසුන් වසන තැනට නුදුරෙහි නිදාගත්හ. මම පැවිදි වූදා පටන් ගම් කෙළවරක අරුණ නොනැගුවෙමි යයි සාමණේරයෝ සිතූහ. හේ පාත්‍රය ගෙන අරුණ නැගීමට වනයට පිවිසියේය. මහ තෙර සාමණේරයන් හොත් තැන නොදැක මිනිසුන් කන්නන් ගන්නා ලදැයි සිතූහ. සාමණේරයෝ වනයෙහි අරුණ නගා පාත්‍රයෙන් ජලයද දැහැටිද

ගෙන පැමිණියහ. සාමණේරය, කොහෙද ගියේ? ඔබ මහළු භික්ෂූන්ට විතර්ක ඉපදවීය. දඬුවම් අරගන්න. ස්වාමීණි, ගන්නෙමි. තෙරහු මුව දොවා සිවුර පෙරවූහ. දෙදෙනාම මිනිසුන් වඩින තැනට පැමිණියහ. මිනිස්සුද තමන් අනුභව කරන කඳ මුල් ගෙඩි කොළ පිළිගැන්වූහ. ථෙරහුද වළඳා විහාරයට ගියහ. සාමණේර ජලය ගෙන ස්වාමීණි පා දෝවනය කරමියි කීය. සාමණේර රෑ ඔබ කොහෙද ගියේ. අපට විතර්ක ඉපදවීය. ස්වාමීණී, ගම් කෙළවර මම අරුණ නොනැගුවිරීමි. අරුණ නැගීමට වනයට ගියෙමි. සාමණේර ඔබට දඬුවම සුදුසු නොවේ. මටයි සුදුසු කියා තෙර ඒ ස්ථානයේම විසූහ. මහතෙර මම මහළුයි. මොනව වෙනවද කියා සිතාගන්ට බැහැ යයි ඔබ රැකෙන්නේ යයි සාමණේරයන්ට ඉඟි කළහ. තෙර අනාගාමීය. පසුකලක මිනිසුන් කන්නෝ කෑහ. සාමණේර තෙමේ තමා රැක භය සංසිඳුණු පසු එබඳු තැන උපාධ්‍යායන් ගෙන උපසම්පන්නව බුද්ධ වචනය ඉගෙන ත්‍රිපිටක ධර්ම වත්තබ්බක නිග්‍රෝධ තෙර නම් විය. පිතු මහරජ රජයට පැමිණියේය. පිටරටින් පැමිණි භික්ෂූහු වත්තබ්බක නිග්‍රොධ තෙරුන් කොහිදැයි විචාරා උන්වහන්සේ සමීපයට පැමිණියහ. මහා භික්ෂු සංඝයා තෙරුන් පිරිවැරූහ. උන්වහන්සේ මහබික් සඟන පිරිවරන ලද්දේ පිළිවෙළින් මහා විහාරයට පැමිණ මහා බෝධිය මහසෑය ථූපාරාමය වැඳ නගරයට පිවිසියහ. දකුණු දොරටුව වෙත යන්නේ තුන්සිවුරු ලැබුණේය. ඇතුළු නුවරට පිවිසි තැන් පටන් බොහෝ සත්කාර ලැබුණේය.

මෙසේ කාල විපත්තියෙහි තල්ගෙඩි කඳ මුල් කොළද දුර්ලභය. කාල සම්පත්තියෙහි මෙබඳු වූ මහාලාභ උපන්නේ යයි මෙසේ කාල විපත්ති වලකන ලද බැවින් විපාක දීමට නොහැකි යයි කාල සම්පත්තිය පැමිණ විපාක දෙන්නේ යයි දැනගනී.

තව අයට බොහෝ කල්‍යාණ කර්ම ඇත. ඒවා ප්‍රයෝග විපත්තියේ සිටින්නාට විපාක නොදේ. හේ එක් කල්‍යාණ කර්මයකින් සම්‍යක් ප්‍රයෝගයෙහි පිහිටියේ ත්‍රිවිධ සුචරිත පුරයි. පන්සිල් දසසිල් රකියි. කාල සම්පත්තියෙහි උපදින්නාට රජවරු සියළු අලංකාරයෙන් සැරහූ රාජ කන්‍යාවන් මොහුට සුදුසු යයි එවති. යාන වාහන මැණික් රුවන් රිදී ආදි රත්න මොහුට සුදුසුයි පඬුරු එවති. පැවිදි වූ විට මහා යසස් මහානුභාව වේ. ඒ සඳහා මේ කථා වස්තුවයි.

කුටකණ්ණ රජුට ගිරිගාමකණ්ණ වාසී චූළ සුධම්ම තෙර ප්‍රිය වේ. හෙතෙම උපුල් වැවේ වසන්නේ තෙරුන් කැඳවීය. තෙරහු පැමිණ පුෂ්පාරාම විහාරයෙහි වසති. රජ තෙරුන්ගේ මව ඇසීය. තෙර කිම කැමති වේද? මහරජ, කඳ යයි. රජ කඳ ගෙන්වාගෙන විහාරයට ගොස් තෙරුන්ට දෙන්නේ මුහුණ බැලීමට නොහැකි විය. හේ නික්මී පිරිවෙණ පිට සිටි දේවියගෙන් ඇසීය. තෙරුන් කෙබඳුද? ඔබ පිරිමියෙක්ව බැලීමට නොහැකි වූයෙහිද? මම කොහොම හැකිවෙම්ද? කොහොමද කියා මම දන්නෙ නැහැ. මගේ රටේ බලිකාරයගේ පුතා බැලීමට නොහැකි වෙයි. බුදුසසුන් මහත්යස අපොලාපීය. ත්‍රිපිටක චූලනාග තෙරුන්ටද ප්‍රිය කරයි. උන්වහන්සේගේ ඇඟිල්ලෙහි එක් පිළාවක් නැගුනේය. රජ තෙරුන් බලම්යි විහාරයට ගොස් බලවත් ප්‍රේමයෙන් ඇඟිල්ල මුවෙන් ගත්තේය. මුවෙහිම පිළාව බිඳුණේය. සැරව ලේ කාරා නොදමා තෙරුන් කෙරේ ස්නේහයෙන් ගිල්ලේය. ඒ තෙරුන් වහන්සේම පසුකාලයේ මරන මංචකයෙහි හොත්තාහ. රජ ගොස් අසූචි කබල හිසේ තබා ධර්ම චක්‍රයේ අක්ෂය(අකුර) බිඳුනේය. ධර්ම චක්‍රයේ අක්ෂය බිඳුනේ යයි වැළපෙමින් හැසුරුණේය. පෘථිවීශ්වරයා අසූචි කබල හිසේ තබාගෙන හැසිරීම නම් කවරෙකුගේ මාර්ගයක්ද? සම්‍යක් ප්‍රයෝගයෙන් ගත් මාර්ගය යයි මෙසේ ප්‍රයෝග විපත් වලකන ලද හෙයින් විපාක දීමට නොහැකි වේය. ප්‍රයෝග සම්පත් පැමිණ විපාක දෙන්නේ යයි දැනගනී.

මෙසේ විපත් වලකන ලද කල්‍යාණ කර්ම විපාක නොදී සතර සම්පත් පැමිණ විපාක දෙයි. මෙය විය හැකි සේ කොට උපමාවකි.

එක් මහරජ කෙනෙක් එක් ඇමතියකු කෙරෙහි බලවත් සේ කිපී ඔහු දඟ ගෙයි ලා බැන්දවීය. ඔහුගේ ඥාතීහු රජ කිපිබව දැන කිසිවක් නොකියා සැඩ කෝපය පහවූ විට රජුට ඔහුගේ නිදොස්බව දැන්වූහ. රජු ඔහු නිදහස්කොට තනතුරේ නැවත පිහිටුවීය. ඉක්බිති ඔහුට ඒ ඒ පැතිවලින් පැමිණි පඬුරුවල ප්‍රමාණයක් නොවීය. මිනිස්සු ඒවා පිළිගැනීමට නොහැකි වූහ.

එහි රජ බොහෝසෙයින් කිපී ඔහු බන්ධනාගාරයෙහි බැන්දවූ කාලය මෙන් පෘථග්ජනයා නිරයේ උපන් කාලය. ඉක්බිති ඔහුගේ නෑයින් රජුට කරුණු කියා තනතුර ප්‍රකෘතිමත් කරන කාලය මෙන් ඔහු දෙව්ලොව උපන් කාලය පඬුරු පිළිගැනමට අසමත් වූ කාලය මෙන් සිව් සම්පත් පැමිණ කල්‍යාණ කර්ම හේතුවෙන් දෙව්ලොවින් මිනිස් ලොවට මිනිස්

ලොවින් දෙව්ලොවට යයි මෙසේ සැපතින් සැපතටම පමුණුවා කල්ප ලක්ෂයක් සැප විපාක දී නිවනට පැමිණවීම දතයුතුය.

මෙසේ පෙල වශයෙන් දෙවන බලය දක්වා නැවත අහෝසි කර්ම හා අහෝසි කර්ම විපාක යන මේ පටිසම්භිදානයෙන්ම දැක්විය යුතුය. එය අහෝසි කම්ම යනු අතීතයෙහි රැස්කරන ලද කර්මයයි. අතීතයෙහිම විය. යමකින් අතීතයෙහි විපාක දෙන ලද නම් එය උදෙසා අහෝසි කම්ම විපාකයයි කියන ලදී. දිට්ඨධම්ම වේදනාදියෙහි වනාහි බොහෝසෙයින් රැස්කරන ලද්දෙහි එකක් දිට්ඨධම්ම වේදනීය වශයෙන් විපාක දෙයි. සෙසු ඒවා අවිපාකය. එකක් උපපජ්ජවේදනීය වශයෙන් අදියි. සෙස්ස අවිපාකය. එකකින් ආනන්තරිය නිරයේ උපදියි. සෙස්ස අවිපාකය. මේ සඳහා කම්ම විපාක නොවේ යයි කියන ලදී. යමෙක් බොහෝ කුසලාකුසල කර්මකොට කල්‍යාණ මිත්‍රයකු නිසා අරහත් බවට පැමිණේද? මොහුට කර්ම විපාක නොවිය නම් වේ. අතීතයෙහි යමක් රැස්කරන ලද නම් දැන් විපාක දෙයි. ඒ අහෝසි කර්මයට විපාක ඇත. යමක් පෙර නයින්ම අවිපාක බවට පැමිණේද එය අහෝසි කර්මයකි. කර්ම විපාක නැත. යමක් අතීතයෙහි රැස්කොට අනාගතයෙහි විපාක දක්වන්නේද එය අහෝසිකම්ම අනාගතයේ කම්මවිපාක නම් වන්නේය. යමක් පෙර නයින්ම අවිපාක බවට පැමිණෙන්නේද ඒ අහෝසි කර්මය අනාගතයෙහි කර්ම විපාක නොවන්නේය. යමක් දැන් රැස්කොට දැන් විපාක දේද එය අත්‍ථිකම්ම නම් වේ. අත්‍ථිකම්ම විපාක නම් වේ. යමක් පෙර නයින්ම අවිපාක බවට පැමිණේද? එය අත්‍ථි කර්මයකි. විපාක නැති නම් වේ. යමක් දැන් රැස්කොට අනාගතයෙහි විපාක දේද එය අත්‍ථිකම්ම වේ. කම්ම විපාක වන්නේය. යමක් පෙර මෙන් අවිපාක බවට පැමිණෙන්නේද එය අත්‍ථි කම්මයක් අනාගත කම්මවිපාක නැත. යමක් කම්ම අනාගත විපාක එය අනාගත කර්මයකි. අනාගත කම්ම විපාක වන්නේය. යමක් තමා පෙර පරිදි වන්නේය. අවිපාක බවට පැමිණේය එය අනාගත කර්මයකි. අනාගත කම්ම විපාක නොවේ. මෙය තථාගතයන් වහන්සේගේ මේ සියළු ආකාරයෙන් කම්මන්තර විපාකය දැනීම් නුවණ අකම්පිය අර්ථයෙන් දෙවන බලය දැනගත යුතුය.

### ද්‍රුතිය බල නිද්දේසය.

තෘතීය බල නිර්දේශයෙහි මාර්ගයයි හෝ පිළිවෙත යයි හෝ මෙය කර්මයට නමකි. නිරයගාමිනී ආදියෙහි ආශ්වාද රහිත අර්ථයෙන්

නොඇලීම් අර්ථයෙන් නිරය වේ. ඉහළට නොගොස් හරහට අදින ලද්දේ තිරිසන්ය. තිරිසන්ම තිරිසන්යෝනි වේ. පෙත්තාය පෙත්ති. මෙයින් පරලොව ගිය බවය යන අර්ථයයි. මනස උසස් බැවින් මනුස්ස වේ. මනුෂ්‍යයාම මනුස්සලෝක වේ. පස් කාම ගුණයේ ක්‍රීඩා කරනවා යනු අධික වූ සමාන සම්පත්තිය හෝ දේව වේ. දේවාම දේව ලෝකයයි. වාණ යනු තෘෂ්ණාවයි. එය එහි නැත යන නිබ්බාණ වේ. නිරයට යෑම නිරයගාමී වේ. මෙය මාර්ගය සඳහා කියන ලදී. පටිපදා යනුද නිරයගාමිනී වේ. සෙසු පදවලද මෙම නයයි.

මේ සියළුම පිළිවෙත් තථාගත දනී. කෙසේද? සියළු ගම්වැසියෝ එකතුව ඌරකු හෝ මුවකු හෝ දිවි තොරකර කල්හි සියළු දෙනාගේම චේතනා අනිකකුගේ ජීවිතේන්ද්‍රිය අරමුණුකොට ඇත්තේ වේ. එම කර්මය ඔවුන්ගේ රැස්කරන වේලාවෙහි විවිධ වේ. එකෙක් එම කරවයි. අනුන්ගේ මෙහෙයවීමෙන් කරයි. එකෙක් සමාන කැමැත්තෙන් මෙන් අයින් නොවී හැසිරේ. එකෙක් එම කර්මයෙන් නිරයේ උපදියි. එකෙක් තිරිසන් යෝනියෙහි එකෙක් ප්‍රේත විෂයෙහි උපදියි. තථාගතයන් වහන්සේ එය රැස්කරන අවස්ථාවෙහිම මේ ආකාරයෙන්ම රැස්කළ බැවින් මොහු නිරයේ උපදින්නේය. මොහු තිරිසන් යෝනි යෝනියෙහි උපදින්නේය. මොහු ජේත විෂයෙහි උපදින්නේ යයි දැනගනී. නිරයේ උපදින්නේ ද මොහු අටමහ නිරයෙහි උපදින්නේය. මොහු සොළොස් උස්සද නිරයේ උපදින්නේය යයි දැනගනී. තිරිසන් යෝනියෙහි උපදින්නේද මොහු අපාදක වන්නේය. මොහු ද්විපාදක වන්නේය. මොහු චතුප්පාද වන්නේය. මොහු බහුප්පාද වන්නේ යයි දැනගනී. ප්‍රේත විෂයේ උපදිනු ලබන්නේද මොහු නිජ්ඣාමතණ්හිකයෙහි වන්නේය. මොහු ඛුප්පිපාසික වන්නේය. මොහු පරදත්තූපජීවී වන්නේ යයි දැනගනී. සෙසු කර්මද මේ කර්මය ප්‍රතිසන්ධිය ඇදගැනීමට නොහැකි වන්නේය. දුබලව දෙන ලද ප්‍රතිසන්ධිය උපධි යයි මේරීම වන්නේයයි දැනගනී.

එසේම සියළු ගාමවාසීහු පිණ්ඩපාතය දෙන්නාහු සියළු දෙනාගේම චේතනා පිණ්ඩපාත අරමුණෙහි වේ. ඒ කර්මය ඔවුන්ගේ රැස්කිරීම් කෙරෙහි පෙර මෙන්ම විවිධ වේ. ඔවුනතුරෙන් සමහරෙක් දෙව්ලොව උපදින්නෝය. සමහරෙක් මනුෂ්‍ය ලෝකයෙහි උපදින්නෝය. මේ ආකාරයෙන් රැස්කරන ලද බැවින් මොහු මනුෂ්‍ය ලෝකයෙහි උපදින්නේය. මොහු දේව ලෝකයෙහි උපදින්නේ යයි දැනගනී. දෙව්ලොව උපදින්නන්ද

මොහු පරනිම්මිතව සම්පත්තියෙහි නිම්මාන රතියෙහි තුසිතයෙහි යාමයෙහි තාවතිංසයෙහි චාතුම්මහාරාජිකයෙහි මොහු භුම්මාදේවේසු මොහු දෙවු දෙව්රජව උපදින්නේය. මොහු මොහුට දුතියයි තතිය තනතුරු දරන්නෙක්ව උපදින්නේ යයි දැනගනී. මනුෂ්‍යයන් අතර උපදින්නේද මොහු ක්‍ෂත්‍රිය කුලයෙහි මොහු බ්‍රාහ්මණ කුලයෙහි මොහු වෛශ්‍ය කුලයෙහි මොහු ක්‍ෂුද්‍ර කුලයෙහි උපදින්නේය. මොහු මිනිසුන්ගේ රජවී උපදින්නේය. මොහු ඔහුගේ දෙවෙනි හෝ තුන්වෙනි හෝ තනතුරු දරණ පරිවාරකයෙක්ව උපදින්නේ යයි දැනගනී. සෙසු කර්ම අතර මේ කර්මය ප්‍රතිසන්ධිය ඇදගැනීමට සමත් නොවේ. දුබලව දුන් ප්‍රතිසන්ධිය උපධි මේරීමට වන්නේ යයි දැනගනී.

එසේම විපස්සනා පටන් ගන්නාවිටම යම් ආකාරයකින් විපස්සනාව ආරම්භ කරන ලදද මොහු රහත්බවට පැමිණෙන්නේය. මොහුට රහත්වීමට හැකි නොවන්නේය. මොහු අනාගාමී පමණක් වන්නේය. මොහු සකෘදාගාමී වන්නේය. මොහු සෝවාන් වන්නේය. මොහු මාර්ගයක් හෝ ඵලයක් හෝ සාක්‍ෂාත් කිරීමට හැකි නොවන්නේය. ලකුණු අරමුණු විපස්සනාවෙහි සිටින්නේය. මොහු ප්‍රත්‍ය විමසීමෙහි සිටින්නේය. මොහු නාමරූප විමසීමෙහි සිටින්නේය. මොහු අරූප විමසීමෙහි සිටින්නේය. මොහු රූප විමසීමෙහි සිටින්නේය. මොහු මහාභූත පමණක් විමසයි. මොහු කිසිවක් සැලකීමට නොහැකි වේයයි දැනගනී.

කසිණ පරිකර්ම කරන්නෝද මොහුට පරිකර්මය පමණක් වන්නේය. නිමිත්ත ඉපදීමට නොහැකි වන්නේය. මොහුට නිමිති ඉපදවීමට හැකි වන්නේය. අර්පණාවට පැමිණීමට නොහැකි වන්නේය. මොහු අර්පණාවට පැමිණ ධ්‍යාන පාදක කොට විපස්සනාව පටන්ගෙන රහත්භාවය ගන්නේ යයි දැනගනී.

## තතිය බල නිද්දේසයයි.

සතරවන බල නිද්දේසයෙහි ඛන්ධනානත්තං යනු මේ රූපස්කන්ධය.... මේ විඤ්ඤාණ ස්කන්ධය නම් වේ. මෙසේ ස්කන්ධ පහේ නානා කරණය දැනගනී. ඒවා අතර ඒකවිධ වූ රූපස්කන්ධය.......එකොලොස්විධ වූ රූප ස්කන්ධය ඒකවිධ වූ වේදනා ස්කන්ධය....... බොහෝ ආකාරයෙන් වේදනා ස්කන්ධය. ඒකවිධ වූ සංඥා ස්කන්ධය........ ඒකවිධ වූ සංඛාර ස්කන්ධය....

ඒකවිධ වූ විඤ්ඤාණ ස්කන්ධය.........බහුවිධයෙන් විඤ්ඤාණ ස්කන්ධය, මෙසේ එක එක ස්කන්ධයාගේ නානත්තය දැනගනී. **ආයතන නානත්තං** යනු මෙය චක්ඛායතන නම්. මෙය ධම්මායතන නම්. එහි ආයතන දහයක් කාමාවචර, දෙකක් චතුභූමික යයි මෙසේ ආයතන නානත්වය දැනගනී. **ධාතුනානත්තං** මේ චක්ඛු ධාතු...........මේ මනෝවිඤ්ඤාණ ධාතු නම්. එහි ධාතු සොළසක් කාමාවචර වේ. දෙකක් චතුභූමික වේ. මෙසේ ධාතු නානත්ය දැනගනී. නැවත **අනෙක ධාතු නානාධාතු ලෝකය** මෙය කේවල නොවූ සංස්කාර ලෝකයයි ගන්නා ලද නානත්වය තථාගතයෝ දැනගනිති. නොගන්නා ලද සංඛාර ලෝකයෙහි නානත්වයද දැනගනිති.

පසේ බුදුවරුද අගසව් දෙනමද ගන්නා ලද සංඛාර ලෝකයෙහි ඒක දේශයක් දැනගනිති. අනුපාදින්න ලෝකයෙහි නානත්තය නොදනිති. බුදුන්වහන්සේ වනාහි මේ නාමධාතුව උස්සන්න නියම නම් හිස් කඳ සුදුසු වේ. වේගයෙන් කළු වේ. මේ ගසේ මටය, මෙහි පොත්ත ඝනකම්ය. මෙය තුනීය. මෙනම් ධාතුවේ උස්සන් බැවින් මේ ගසේ කොළ වර්ණ සටහන් වශයෙන් මෙබඳු රූපය. මේ ධාතුවේ උස්සන්න බැවින් මේ ගසේ මල් නිල්පාටය. කහපාටය. ලේ පාටය. සුදුපාටය. සුවඳය, දුගඳය වේ. මේ නම් ධාතුවේ උස්සන්න බැවින් ගෙඩි කුඩා වේ. මහත් වේ. දික් වේ. කෙටි වේ. වට වේ. මනා සටහන් වේ. නොමනා සටහන් වේ. සිනිඳු වේ. රළු වේ. සුවඳ දුගඳ මිහිරි තිත්ත ඇඹුල් කටුක (කුළු) කසට රස වේ. මේ නම් ධාතුවේ උස්සන්න බැවින් මේ ගසේ කටු තියුණුය. තියුණු නොවේය. ඍජුය. වකුටුය. තඹවන්ය. කළුය. නීලය. සුදු වේ යයි මෙසේ නොගන්නා ලද සංඛාර ලෝකයේ නානත්වය දැනගනිති. සර්වඥ බුදුවරුන්ගේම මේ බලය අනෙකෙකුට නැත.

## සතරවන බල නිද්දේසය

පස්වන බල නිද්දේසයෙහි **හීනාධිමුත්තිකා** යනු හීන වූ අදහසින් **පණීතාධිමුත්තිකා** කලණ වූ අදහසින් **සෙවන්ති** ආශ්‍රය කරති. ඇලෙති. **භජන්ති** ලඟට පැමිණෙති. **පයිරුපාසන්ති** නැවත නැවත ලඟට පැමිණෙති. ආචාර්ය උපාධ්‍යාය සිල්වත් නොවේ නම් සද්ධි විහාරිකයෝ සිල්වත් වෙති. ඔව්හු තමන්ගේ ආචාර්ය උපාධ්‍යායන් වෙත නොඑළඹෙති. තමා සමාන සරූප භික්ෂූන් වෙතම පැමිණෙති. ආචාර්ය උපාධ්‍යාය හා අනිත් භික්ෂූන් අසාරුප්ප නම් ඔව්හු ආචාර්ය උපාධ්‍යායන් වෙත නොපැමිණෙති.

තමා සමාන හීනාධිමුක්තිකයන් වෙත එළඹෙති. මෙසේ එළඹීම දැන් පමණක් නොව අතීත අනාගත දැක්වීමට අතීතම්පි අද්ධානං යනාදිය කීහ. එය ප්‍රකටය.

මෙය වනාහි දුස්සීලයන්ගේ දුස්සීල සේවනයමය. සිල්වතුන්ගේ සිල්වත් සේවනයම වේ. මෝඩයින්ගේ මෝඩයින් සමාන සේවනය ප්‍රඥාවන්තයන් ප්‍රඥාවන්තයන් සමග සේවනය. මෙහි නියාමය කුමක්ද? අදහස් නියාමයයි. බොහෝ භික්ෂූහු එක ගමකට සමූහව පිඬු පිණිස හැසිරෙති. මිනිස්සු බොහෝ බත් ගෙනවුත් පාත්‍ර පුරවා ඔබවහන්සේලා සුදුසු ලෙස කොටස් කරගෙන වළඳනු මැනවැයි දී පිටත් කළහ. භික්ෂූන් වහන්සේලාද ඇවැත්නි, මිනිස්සු ධාතු යුක්තවම යොදතිදැයි ඇසූහ. ත්‍රිපිටක චූලාභය ථෙරො ද නාගදීපයෙහි චෛතිය වැඳීමට පන්සියයක් භික්ෂූන් සමග වඩින්නේ එක් ගමක මිනිසුන් විසින් ආරාධනා කරනු ලැබීය. තෙරුන් සමග එක් අසාරුප්ප භික්ෂුවක් ඇත. භික්ෂූන් දෙනමක් ගමට වඩින්නේ ඒ දෙදෙනාම කිසි ආගන්තුකයෙකුවිසින් නේවාසිකයෙක්ද නේවාසිකයකු විසින් ආගන්තුකයෙක්ද නුදුටුවිරූය. මෙසේ ඇතිකල්හි එක්ව සිනාසී කථාකරමින් එක්තැනක සිටියහ. තෙරුන්වහන්සේ දැක සම්මා සම්බුද්ධයන් විසින් දැන ධාතු සංයුත්තය කියන ලදැයි කීහ. මෙබඳු අදහස ධාතු නියාමය යයි කියා ධාතු සංයුත්තයෙන් මේ අර්ථයම දැක්විය යුතුය. ගිජ්ඣකූට පර්වතයෙහි ගිලන් සයනයෙන් වැදහොත් භාග්‍යවතුන් වහන්සේට ආරක්ෂාව පිණිස පිරිවරා සිටින සැරියුත් මුගලන් දෙනම කෙරෙහි තම තමාගේ පිරිස සමග සක්මන් කරන්නන් බලා භික්ෂූන් ඇමතූහ. මහණෙනි, බලන්න. සැරියුත් බොහෝ භික්ෂූන් සමග සක්මන් කරති. එසේය ස්වාමීනි. මහණෙනි, මේ සියළු භික්ෂූහු ප්‍රඥාවන්ත යයි සියල්ල විස්තර කළයුතු.

## පස්වන බල නිද්දේසයයි.

සවන බල නිද්දේසයෙහි ආසයං යම්තැනක සත්වයා ආශ්‍රය කරත්ද වසත්ද එය ඔවුන්ගේ නිවස්නය දෘෂ්ටිගතවූ හෝ යථාර්ථ ඥාණයෙන් හෝ ඥාණංව. අනුසයං යනු අප්‍රහීණ වූ තිදිගත් කෙලෙස්. චරිතං කායාදියෙන් රැස්කරන ලද කුසල අකුසල්. අධිමුත්තං. අදහස. අප්පරජක්ඛෙ ආදියෙහි ප්‍රඥාමය ඇසෙහි අල්ප වූ රා දොස් මෝහ දූවිලි. එහිම මහත්බව මහා රජක්ඛ වේ. දෙකෙන්ම මද කෙලෙස් ඇති වන මහ කෙලෙස් ඇති

සත්වයන් දක්වයි. යමෙකුගේ ශ්‍රද්ධාදි ඉන්ද්‍රියයන් තියුණු වේ නම් තික්ඛින්ද්‍රිය වේ. ඒවා මෘදු වේ නම් මුදුන්ද්‍රිය වේ. යමෙකුගේ ආශ්වාදි කොටස් සුන්දර නම් ස්වාකාර වේ. විපරීත නම් ද්වාකාර වේ. යමෙක් කියන ලද කරුණ සලකත්ද, පහසුවෙන් දැනගැනීමට හැකිවේද ඒවා සුවිඤ්ඤෙය්‍යා වේ. විපරීත නම් දුවිඤ්ඤෙය්‍ය වේ. යමක් ආර්ය මාර්ගයට ගැලපෙන උපනිශ්‍රය සම්පන්න වේද එම භබ්බ වේ. විපරීත ඒවා අභබ්බ වේ.

මෙසේ සවන බලයේ මාතෘකා තබා දැන් පිළිවෙලින් බෙදන්නේ **කතමො ච සත්තානං ආසයො?** යනාදිය කීහ. එහි **සස්සතො ලොකො** යනාදියේ අර්ථය යට නික්ඛෙප කාණ්ඩ වර්ණනාවේ කියන ලදී. මෙසේ **භවදිට්ඨි සන්නිස්සිතා** යනු මෙසේ ශාස්වත දෘෂ්ටියෙන් හෝ යුක්ත වූ. ශාස්වත දෘෂ්ටිය මෙහි භව දෘෂ්ටිය යයි කියන ලදී. උච්ඡේද දෘෂ්ටියද විභව දෘෂ්ටියද සියළු දෘෂ්ටි ශාස්වත උච්ඡේද දෘෂ්ටිවල සංග්‍රහ කරන ලද බැවින් මේ සියළු දෘෂ්ටිගතික සත්වයෝ මේ දෘෂ්ටි දෙක ඇසුරු කරන ලද්දෝ වෙති. මෙය කියන ලදී. "කච්චානය ඇතැයි ද නැතැයි ද ලෝකයා දෙකක් ඇසුරු කොටම සලකත්. ඇත යනු ශාස්වතය, නැත යනු උච්ඡේදයයි. මෙය සසර නිශ්‍රිත පෘථග්ජන සත්වයන්ගේ ආසයයි."

දැන් සසර ඇසුරුකරන සුද්ධ සත්වයන්ගේ ආසය දැක්වීමට **එතෙ වා පන උභො අන්තෙ අනුපගම්ම** ආදිය කියන ලදී. එහි **එතෙ පනාති** ඒවාම. **උභො අන්තෙ** සස්සත උච්ඡේද සංඛ්‍යාත අන්ත දෙකෙහි **අනුපගම්ම** - නොඇලී. **ඉදප්පච්චයතා පටිච්ච සමුප්පන්න ධම්මේසු** මේ ප්‍රත්‍යයෙහි ද පටිච්ච සමුප්පන්න ධර්මයෙහිද **අනුලොමිකා ඛන්ති** විපස්සනා ඤාණය **යථාභූතවො ඤාණ** මාර්ග ඤාණය. මෙය කියන ලදී. "පටිච්ච සමුප්පාදයෙහි ද පටිච්ච සමුප්පන්න ධර්මයෙහිද මේ ශාස්වත උච්ඡේද අන්ත දෙකෙහි නොඇලී විපස්සනාව අවබෝධ කෙරේද එයින් මත්තෙහි මාර්ග ඤාණය. මෙය සත්වයන්ගේ ආසය වේ. සසර ආශ්‍රියන් ද නිවන ආශ්‍රියන් ද සියලු සත්වයන්ගේ ආසය වේ. මෙය වසන තැන යයි මේ ආචාර්යන්ගේ සමානාර්ථ කථාවයි. විතණ්ඩවාදීහු කීහ. මාර්ගය නම් වාසය විනාශ කරමින් යයි. ඔබ මාර්ගය වාසය යයි නොකීවෙහිද? හේ කිවයුතුයි. ඔබ අරියවාස භාණකයෙක් වෙහිද? නොවෙහිද? ඉදින් වෙමියි කියයි. අභාණක බව නොදන්නෙහි යයි කිවයුතුය. ඉදින් භාණක වෙමියි කියයි නම් සූත්‍රය හැර දක්වයි කිවයුතුය. ඉදින් ගෙනහැර දක්වා නම් යෙහෙකි. නොදක්වන්නේ නම් තමා ගෙනහැර දැක්විය යුතුය. "දස

ඉමෙ භික්ඛවෙ අරියවාසා යදරියා ආවසිංසු වා ආවසන්ති වා ආවසිස්සන්ති වා" මහණෙනි, ආර්යවාස දසයකි. යම්තැනක ආර්යයෝ විසූහුද වසතිද වසන්නෝ වෙත්ද මේ සූත්‍රය මාර්ගයේ හෝ ස්වභාවය දක්වයි. එහෙයින් මෙය මනාව කියන ලද්දේමය.

මෙය වනාහි භාග්‍යවතුන් වහන්සේ සත්වයින්ගේ ආසය දන්නේ මේ දෘෂ්ටිගතිකයන්ගේ විපස්සනා ඤාණ මග්ග ඤාණ නොපැවති ක්ෂණයද දනිති. එය කියන ලදී. "මේ පුද්ගලයා කාමගරුකය. කාම ආශ්‍රය. කාම අදහසින් යුතුය. නෙක්ඛම්ම සේවනය කරන්නෝද දනිති. මේ පුද්ගලයා නෙක්ඛම්ම ගරුකය. නෙක්ඛම්ම අදහසින් යුක්තය. ව්‍යාපාදං.....අව්‍යාපාදං... ථිනමිද්ධං......අලෝකසඤ්ඤං සේවනය කරන්නාද දනිති. මේ පුද්ගලයා ආලෝකසංඥා ගරුකය. ආලෝක සංඥා ආශය. ආලෝක සංඥා අදහසින් යුක්තය.

අනුසය නිද්දේසයෙහි කාමරාගයද එය අප්‍රහීණ වූ අර්ථයෙන් අනුසයද කාමරාගා අනුසය සෙසු පදවලද මෙම නයයි. යං ලොකෙ පියරූපං මේ ලෝකයෙහි ප්‍රියජාතික වූ. සාතරූපං සැප ජාතික වූ. ආශ්වාදයට පදනම් වූ ඉෂ්ට අරමුණයි. එත්ථ සත්තපනං රාගානුසයො අනුසෙන්ති මේ ඉෂ්ට අරමුණෙහි සත්වයින්ගේ ප්‍රහීණ නොවූ රාග අනුසය නිදයි. දියේ ගිලුනහුගේ යටද උඩ සියළු කොටස්ද ජලයෙහිම වේ. එසේම ඉටු අරමුණෙහි රාගය ඇතිවීම නම් සත්වයින්ගේ (කාලයක් තිස්සේ පවතින්නකි) පුරුදු කරන ලද්දකි. එසේම අනිටු අරමුණෙහි පටිසය ඉපදීම. ඉති ඉමේසු ද්වීසු. ධම්මේසු. මෙස් මේ කාමරාග පටිස නම් ඉටු අනිටු අරමුණු ධර්මවල. අවිජ්ජානුපතිතා කාමරාග පටිස දෙකින් යුක්ත අරමුණු කිරීම් මානයෙන් අවිජ්ජාව ඇතිවීම. තදෙකට්ඨො ඒ අවිද්‍යාව යුක්ත අර්ථයෙන් මානො ච දිට්ඨි ච විචිකිච්ඡා ච මානය නවවිධය. දිට්ඨිය දොලොස් වැදුරුමය. විචිකිච්ඡාව වස්තු අටක පවතී. භවරාගානුසයද මෙහි කාමරාග අනුසයේම ඇතුළත් කරන ලදැයි දතයුතුය.

චරිත නිද්දේසයෙහි පුඤ්ඤාභිසංඛාර චේතනා දහතුනය. අපුඤ්ඤාභි සංඛාර චේතනා දොලහය. අනෙඤ්ජාභි සංඛාර චේතනා හතරය. එහි කාමාවචර කුඩා භූමිකය. ඉතුරු ඒවා මහාභූමිකය. මේ තුනෙහි යම්කිසිවක අල්ප විපාක පරිත්ත භූමිකයෙහිය. බහු විපාක මහා

භූමිකයෙහි යයි දතයුතුය. අධිමුත්ති නිද්දේසය යට ප්‍රකාශ කරන ලද පරිදිය. යටකියන ලද අධිමුත්ති නැවත ගත්තේ කුමක් නිසාද? මෙය යට වෙන වෙනම බල දැක්වීම වශයෙන් ගන්නා ලදී. මෙහි සත්වයන්ගේ තියුණු මුදු ඉන්ද්‍රිය දැක්වීම සඳහාය. මහා රජක්ඛ නිද්දේසයෙහි **උස්සද** ගතානි මහත්බවට ගිය. පහානක්‍රම වශයෙන් මෙය අපිළිවෙළට නිද්දේසය කරන ලදී. **අනුස්සදගතානී** මහත්බවට නොගිය **තික්ඛින්ද්‍රිය මුදින්ද්‍රිය** නිද්දේසයෙහි උපනිශ්‍රය ඉන්ද්‍රිය කියන ලදී. මෙහි උප්පටිපාටියා නිද්දේසයෙහි ප්‍රයෝජන යට කියන ලද නයින්ම දතයුතුය. **ද්වාකාර** නිද්දේසාදියේද එසේය. **පාපාසය** යනු අකුසල ආසය වේ. **පාපචරිතා** යනු අපුඤ්ඤාභිසංඛාර සම්පූර්ණ කළ අය. **පාපාධිමුත්තිකා** ස්වකීය කයෙහි ඇලුම් ඇති. සසර අදහසින්. ස්වාකාර නිද්දේසයෙහි **කල්‍යාණ** නම් අනුසයක් නැත්ද එහෙයින් කල්‍යාණ අනුසය යයි නොකියන ලදී. සෙස්ස කියන ලද විපරියාසයෙන් දතයුතු.

භබ්බාභබ්බ නිද්දේසයෙහි **කම්මාවරණෙන** පඤ්චවිධ ආනන්තරිය කර්මයෙන්. **කිලෙසාවරණෙන** නියති මිථ්‍යාදෘෂ්ටියෙන් **විපාකාවරණෙන** අහේතුක ප්‍රතිසන්ධියෙන් අහේතුකයන් ආර්ය මාර්ග ප්‍රතිවේධයක් නැත. එනිසා දුහේතුක ප්‍රතිසන්ධියද විපාකාවරණය යයි දතයුතුය. **අස්සද්ධා** බුද්ධාදීන් කෙරෙහි ශ්‍රද්ධාව නැති බව **අච්ඡන්දිකා** කරනු කැමති කුසලයෙහි කැමැත්ත නැති. උතුරුකුරු මිනිස්සු අච්ඡින්දික නම් පව්වෝය. **දුප්පඤ්ඤා** භවංග ප්‍රඥාවෙන් හීන වූ. භවංග ප්‍රඥාව නම් භවංගය සම්පූර්ණ වුවත් ලෝකෝත්තරයට පාදක නොවේ නම් එය දුප්පඤ්ඤාය. **අභබ්බා නියාමං ඔක්කමිතුං කුසලෙසු ධම්මෙසු සම්මත්තං** කුසල ධර්මවල සම්මත නියාම සංඛ්‍යාත මාර්ගයට බැසගැනීමට යෝග්‍ය නැති. **න කම්මාවරණො** යනාදී කියන ලද දෙයම විපරීත වශයෙන් දතයුතුය. මෙය ඤාණ දෙකකට භාජනය වේ. ඉන්ද්‍රියපරොපරියත්ති ඤාණයද ආසායානුසය ඤාණයද මෙහි ආසයානුසය ඤාණයෙන් ඉන්ද්‍රියපරෝපරියත්ති ඤාණය බෙදන ලදී. මෙසේ මේ ඤාණ දෙක එකතුවී ඒකබල ඤාණයක් ඇතිවිය.

ෂට්ඨබල නිද්දේසය.

සත්වන බල නිද්දේසයෙහි දවන්නා යනු ඣායී වේ. චත්තාරො ඣායී දවන සතර ජනයා යයි කියනු ලැබේ. එහි පළමුවන චතුෂ්කයෙහි පළමුවන සමාපත්ති ලාභියා වෙනම නොලාභිය කෙරෙහිද කමටහන සමානව කමටහන නැතැයි ද සංඥා ඇත්තා වේ. මෙය අල්පගුණ ධ්‍යානලාභියා යයි දතයුතුය. දෙවන සමාපත්ති අලාභියා මෙන්ම ලාභියා කෙරෙහිද කමටහනේ නැතිබව මෙන්ම කමටහනේ ඇති බව සංඥා ඇත්තා වේ. මොහු නිද්‍රා ධ්‍යායී නම් වේ. නිදාසිටි පිබිදෙන්නා මෙසේ සිතයි. තුන්වන සමාපත්ති ලාභියා සංඥාව සමාපත්ති ලාභියා කෙරෙහිද කමටහන මෙන්ම කමටහන් සංඥාවද වේ ප්‍රගුණ ධ්‍යානලාභියා යයි දතයුතුය. සතරවන අලාභියා මෙන්ම නොලැබීම් කෙරෙහිද කමටහනේ නොවේ මෙන්ම කමටහන වේ යයි සංඥා ඇත්තා වේ. මෙසේ මෙහි දෙදෙනෙක් ධ්‍යාන නොමැතිව ධ්‍යායීන් ඇතුළෙහි පිවිසුණු හෙයින් ධ්‍යායී යයි කියන ලදී. දෙවන චතුෂ්කයෙහි සසංකාරයෙන් සප්‍රයෝගයෙන් සමාධිය සමග බැඳීම් සහිත ධර්මයන් (නීවරණ) විෂ්කම්භනය කරන්නේ දන්ධව සමවදී නම්. එකක් දෙකක් සිත් වාරවල සිට වහා නැගී සිටින්නේ වහා නැගී සිටී නම්. සමාධිය සමග බැඳි ධර්මයන් පහසුවෙන් පිරිසිදු කරන්නේ වහා සමවදී නම්. නියම කරගත් කාලයෙන් නොනැගිට කාලය ඉක්මවා නැගී සිටින්නේ දන්ධව නැගිටී නම්. අනිත් දෙදෙනාද මේ නයින්ම දතයුතුය. මේ සතරදෙනාම සමාපත්ති ලාභීන්ම වෙති. තුන්වන චතුෂ්කයෙහි මේ ධ්‍යානය අංග පසක් ඇත. මේ ධ්‍යානය අංග සතරක් ඇත යයි මෙසේ අංග මෙනෙහි කිරීමේ දක්‍ෂයා සමාධියෙහි සමාධි කුසලයා නම් වේ. නීවරණ විෂ්කම්භනය කොට සිත් පෙට්ටියෙහි සිත තැබීමට අදක්‍ෂයා සමාධියෙහි සමාපත්ති කුසලයෙක් නොවේ. ඉතිරි තුන්දෙනාද මෙනයින් දතයුතුය. මේ සතරදෙනා සමාපත්ති ලාභීහුමය.

දැන් යම් ධ්‍යාන නිසා මේ පුද්ගලයෝ ධ්‍යායී නම් වේද ඒවා දැක්වීමට චත්තාරො ඣානානි ආදිය කීහ. එහි ධ්‍යාන සතරද විමෝක්‍ෂ තුනද යන මේවායේ අර්ථ යට ධම්මසංගහ අර්ථ කථාවෙහි ප්‍රකාශ කරන ලදී. සෙස්සේද විමොක්‍ෂ අර්ථය කියන ලද පරිදිම දතයුතුය. තවද මෙහි පිළිවෙළින් සත අර්පණා වූ කෙණෙහි සතුරු ධර්මයන්ගෙන් මිදෙන නිසා විමොක්ඛ නම් වේ. අටවැන්නෙහි සියළුම සංඥා දැනීම්වලින් මිදුණු බැවින් අපගත වූ (බැහැර කළ) විමොක්ඛ නම් වේ.

සමාධිවල චතුක්ක පඤ්චක නයවල ප්‍රථමධ්‍යාන සමාධි සවිතක්ක

සවිචාර නම් වේ. දෙවන ධ්‍යාන සමාධිය අවිතක්ක විචාරමත්ත සමාධිය නම්. චතුක්ක නයෙහිද පඤ්චක නයෙහිද මතු තුන් ධ්‍යානවල සමාපත්තිවල සමාධිය යයිද සමාපත්ති යයි නම් වේ. කුමක් හෙයින්ද? සිතේ එකඟකමේ ස්වභාවය හෙයිනි. නිරෝධ සමාපත්තියේ එය නොමැති හෙයින් සමාධි නම නොයෙදේ. **හානභාගියො ධම්මො** යනු අල්ප ගුණයෙන් ප්‍රථම ධ්‍යානාදියෙන් නැගී සිටියහුගේ සංඥා මනසිකාරවල කාමාදිය ලුහුබැඳීම. **විසෙසභාගියො ධම්මො** ප්‍රගුණ වීමෙන් ප්‍රථම ධ්‍යාන ආදියෙන් නැගී සිටින්නාගේ සංඥා මනසිකාර ද්‍රිතිය ධ්‍යානාදිය ලුහුබැඳීමය. **වොදානම්පි වුට්ඨානං** මේ ප්‍රගුණ වෝදනාය වුට්ඨාන නම් වේ. යට යට ප්‍රගුණ ධ්‍යාන උඩ උඩ ධ්‍යානවලට පාදක වේ. එනිසා වෝදානය වුට්ඨාන යයි කියන ලදී. **තම්හා තම්හා සමාධිම්හා වුට්ඨානම්පි වුට්ඨානං** මෙයින් භවංග නැගිටීම කියන ලදී. භවංගයෙන්ම සියළු ධ්‍යානවලින් නැගිටීම සිදුවේ. නිරෝධයෙන් වනාහි ඵල සමාපත්තියෙන්ම නැගී සිටී. මෙය පෙල රහිත නැගිටීම නම්.

## සත්තබල නිද්දේසය

අටවන බල නිද්දේසයෙහි **අනෙක විහිතං පුබ්බෙනිවාසං** ආදි සියල්ල විසුද්ධි මාර්ගයෙහි විස්තර කරන ලද්දේමය.

## අට්ඨබල නිද්දේසයයි

නවබල නිද්දේසයෙහි ද **දිබ්බෙන චක්ඛුනා** ආදි සියල්ල එහිම විස්තර කරන ලදී.

දසබල නිද්දේසයෙහි **චෙතො විමුත්තිං** ඵල සමාධිය. **පඤ්ඤා විමුත්තිං** ඵල ඥාණය. සෙසු සියල්ල ප්‍රකටය. මෙය ආචාර්යවරුන්ගේ සමාන අර්ථකථාවයි. පරවාදීහු කීහ. දසබල ඥාණය වෙන වෙනම නැත. මෙය සබ්බඤ්ඤුත ඥාණයේම ප්‍රභේදයකි. එය එසේ නොදත යුතුය. දසබල ඥාණ අනිකකි. සබ්බඤ්ඤුත ඥාණය අනිකකි. දසබල ඥාණය ස්වකීය ස්වකීය කෘත්‍යය දනී. සබ්බඤ්ඤුත ඥාණය එයද එයින් අවසේසයද දනී. දසබල ඥාණයෙහි පළමුවැන්න හේතු පමණක් දනී. දෙවැන්න කම්මන්තර හා විපාකන්තර තෙවැන්න. කර්ම පිරිසිඳීමද සතරවැන්න ධාතු නානත්වයද පස්වැන්න. සත්වයින්ගේ අදහස් සය.

ඉන්ද්‍රියවල තියුණු මුදුබව හත අට. පෙර විසූ ස්කන්ධ පරම්පරාව ධ්‍යානාදිය සමග ඒවායේ කිලිටි පිරිසිදු බව නවය. චුති පටිසන්ධි දහය. සත්‍ය පිරිසිඳීම. සබ්බඤ්ඤුත ඤාණය මේවායේ දැනුමද ඒවාට ඉහළින් ඇති දේද දනී. මේවායේ කෘත්‍ය සියල්ලම නොකරයි. එහි ධ්‍යානයට පැමිණ අර්පණා කළ නොහැකිය. ඍද්ධිය වී මවාපෑම කළ නොහැකිය. මාර්ගය වී කෙලෙස් ක්ෂය කළ නොහැකිය. තවද පරවාදීන්ගෙන් මෙසේ විචාල යුතුය. "දසබල ඤාණය නම් මේ සවිතක්ක සවිචාර, අවිතක්ක විචාරමත්ත අවිතක්ක අවිචාර, කාමාවචර, රූපාවචර, අරූපාවචර, ලෞකික, ලෝකෝත්තර"යයි දන්නා පිළිවෙළින් ඤාණ හත සවිතක්ක සවිචාරයයි කියයි. ඉන්පසුව එන ඤාණ දෙක අවිතක්ක අවිචාර යයි කියයි. ආසවක්ඛය ඤාණය සවිතක්ක සවිචාරද අවිතක්ක විචාර මත්තද අවිතක්ක අවිචාරද කියයි. එසේම පිළිවෙළින් කාමාවචර හත රූපාවචර දෙක අවසානයෙහි ලෝකෝත්තර එකක් යයි කියයි. සබ්බඤ්ඤුත ඤාණය සවිතක්ක සවිචාරමයද ලෞකික මය යයිද කියයි. මෙසේ දසබල ඤාණය අනිකකි. සබ්බඤ්ඤුත ඤාණය අනිකකි.

**සම්මෝහ විනෝදනී නම් විභංග අර්ථ වර්ණනාවේ**
**දහසය වන ඤාණ විභංග නිද්දේසයයි.**

# 17.
# ඛුද්දක වත්ථු විභංගය

ඉන් අනතුරුව දැන් ඛුද්දක වත්ථු විභංගයෙහි පළමුවන මාතෘකාව තබා තබන ලද පද පිළිවෙළින් නිර්දේශය කරන ලදී. මේ නික්ෂේප පරිච්ඡේදයේ මුලින්ම ජාතිමදො එක එක හැත්තෑතුනක් තබන ලදී. එයින් කොධො ච උපනාහො ච යන අකුසල මූලාදි අටළොස් දුකය, ආසව චතුක්කාදි පන්තිස් තිකයද ඔරංභාගිය සංයෝජනාදි තුදුස්දස චතුක්කය විවාද මූලාදි පසළොස් පංචකය අනුසයාදි තුදුස් දස සය කිලේස වත්ථු ආදි සප්ත සත ආඝාත වත්ථු ආදි අටෙහි අට කිලේස වත්ථු ආදි නවයෙහි නවකය අජ්ඣත්ති උපාදාය ආදි සතහෙි දසකය. අට්ඨාරස

**තණ්හා විචරිතානි** ආදිය අටළොස් හය යයි සියල්ල කෙලෙස් එකසිය අටක් තබන ලද යයි දතයුතුය. මෙය නික්ඛෙප පරිච්ඡේදයයි.

දැන් තබන ලද මාතෘකා පිළිවෙළින් කථා කතමො ජාතිමදො යනාදි නයින් අරඹන නිද්දේස වාරයෙහි **ජාතිං පටිච්චා** යනු ජාතිය නිසා මෙහි ද පටිච්ච නවය කියන ලදී. එහෙයින් ජාතිය පවතින කල්හි යනු මෙහි අර්ථයයි. **ගොත්තං පටිච්චා** ආදියෙහි ද මෙම නයයි. රාගය වශයෙන් මදො වේ. මත්වීම් ආකාරය **මජ්ජනා** වේ. මත්වීම් භාවය **මජ්ජිතත්තං** වේ. මානො මඤ්ඤනා යනාදිය යට ධම්ම සංගහට්ඨ කථාවෙහි කියන ලද පරිදිය. **අයං වුච්චති** මේ ජාතියම ඇතිකල්හි ඒ ජාතිය නිසා උපන් මත්වීම් ආකාරයෙන් පවතින මානය ජාති මදයයි කියනු ලැබේ. මෙය ක්‍ෂත්‍රිය ආදි වර්ණ සතරෙහිම උපදී. ජාති සම්පන්න ක්‍ෂත්‍රියෙක් මා හා සමාන අනිකෙක් නැත. අවසේස අය අතරකදී නැඟී සිටි ක්‍ෂත්‍රියයෝ වූහ. මා වනාහි වංසාගත ක්‍ෂත්‍රියයෙකියි මානය කරයි. බ්‍රාහ්මණාදියෙහිද මෙම නයයි. ගොත්ත මද නිද්දේසාදියෙහිද මේ උපායෙන් අර්ථය දතයුතුය. ක්‍ෂත්‍රියයෝද මම කොණ්ඩඤ්ඤ ගෝත්‍රයෙහිද මම ආදිච්ච ගෝත්‍රයෙහිද මානය කරයි. කාශ්‍යප ගෝත්‍රය භාරද්වාජ ගෝත්‍රය යයි මැනීම කරයි. වෛශ්‍ය ශුද්‍රයෝද තම තමන්ගේ කුලගොත් නිසා මැනීම කරයි. අටළොස් ශ්‍රේණියද එක් එක් ශ්‍රේණියක් මානය කරයි.

ආරෝග්‍යමද ආදියෙහි මම අරෝග වෙමි. සෙස්සෝ රෝග බහුලය. කුඩා ක්‍ෂණයකද රෝගයක් මට නැතැයි මද වශයෙන් උපන් මානය ආරෝග්‍ය මදයයි. මම තරුණය. අනිත් අයගේ ජීවිත ප්‍රපාතයක ඇති ගස් වගේය. මම පළමු වයසෙහි සිටිමි යයි මත්වීම් වශයෙන් උපන් මානය **සොබ්බන මදො** නම් වේ. මම බොහෝකල් ජීවත්වූයේ බොහෝ කල් ජීවත්වෙමි. සුවසේ ජීවත් වූයේ සුවසේ ජීවත්වෙමි යයි මත්වීම් වශයෙන් මානය **ජීවිතමදො** නම් වේ. මම ලාභියෙකි. අවසේස අය අඩු ලාභ ඇත්තේය. මට ලැබෙන ලාභවල ප්‍රමාණයක් නැතැයි මත්වීම් වශයෙන් උපදින මානය **ලාභමදො** නම් වේ. අවසේස අය එහෙන් මෙහෙන් ලබති. මම වනාහි මනාව කළ ප්‍රණීත සිවුරු ආදි ප්‍රත්‍ය ලාභය යයි මත්වීම් වශයෙන් උපදිනා මානය **සක්කාරමදො** නම් වේ. අවසේස භික්‍ෂූන්ගේ පා පිටද මැඩගෙන යන මිනිස්සු මේ ශ්‍රමණයෙකැයි නොවඳිති. මා දැකම වඳිති. ගල් කුඩයක් මෙන් ගරුකොට ගිනි කන්දක් මෙන් ඇත්ව සිටීමට සිතති යයි මත්වීම් වශයෙන් මැනීම **ගරුකාරමදො** නම් වේ.

ඇතිවන ප්‍රශ්න මගේ මුවින්ම විසඳමි. පිඬු පිණිස යන්නේද මාම පෙරටුකොට යති යයි මත්වීම් වශයෙන් උපදිනා මානය **පුරෙක්ඛාර මදො** නම් වේ. ගිහියෙක් වූ මම මිනිසුන් සියයක් මිනිසුන් දහසක් පිරිවරන ලද්දේ වෙමි. අනගාරික වූ විටද ශ්‍රමණයින් සියක් දාහක් පිරිවරති. සෙස්සෝ අඩු පිරිවර ඇත්තෝය. මම මහ පිරිවර හොඳ පිරිවර ඇත්තේ වෙමි යයි මත්වීම් වශයෙන් උපන් මානය **පරිවාර මදො** නම් වේ. අවසේස අය තමන්ගේ පරිභෝග පමණක්වත් නොලබති. මට නිදන්ගත ධනයේද ප්‍රමාණයක් නැතැයි මත්වීම් වශයෙන් උපන් මානය **භොගමදො** නම් වේ.

**වණ්ණං පටිච්ච** යනු ශරීර වර්ණයද ගුණ වර්ණයද නිසා. අවසේස අය දුර්වර්ණය. අවලස්සනය. මම අභිරූපය. පැහැපත්ය. අවසේස අයට ගුණ නැත. මගේ කීර්තිය දෙව්මිනිසුන් අතර ප්‍රකටය. ස්ථවිර බහුස්සුතය. සිල්වත්ය. ධාතු ගුණවලින් යුක්ත යයි මත්වීම් වශයෙන් උපන් මානය **වණ්ණ මදො** නමි. අවසේස අය අල්පශ්‍රැතය. මම බහුස්සුත යයි මත්වීම් වශයෙන් උපන් මානය **සුතමදො** නම් වේ. අවසේස අය අඩු වැටහීම් ඇත්තෝය. මගේ වැටහීම් සීමාවක් නැතැයි මත්වීම් වශයෙන් උපදින මානය **පටිභානමදො** නමි. මම රත්තඤ්ඤූ වෙමි. අසවල් බුද්ධ වංශය, රාජ වංශය, ජනපද වංශය, ගව වංශය රෑ දවල් පිරිසිඳීම නැකැත් මුහුර්ත යෝග දනිමියි මත්වීම් වශයෙන් උපන් මානය **රත්තඤ්ඤූමදො** නම් වේ. අවසේස භික්ෂූන්ට අතරෙහි පිණ්ඩපාතය ලැබෙයි. මට ජාති පිණ්ඩපාතය ලැබෙයයි මත්වීම් වශයෙන් උපන් මානය **පිණ්ඩපාත මදො** නමි. අවසේස සත්වයින්ට අවමාන කෙරේ. මට එසේ නොකොට මත්වීම් වශයෙන් උපන් මානය **අනවඤ්ඤත්ති මදො** නමි. අන් අයගේ ඉරියව් නොපැහැපත්ය. මගේ පාසාදිකය මත්වී උපන් මානය **ඉරියාපථමදො** නමි. අවසේස අය තටු සිඳුණු කවුඩන් මෙනි. මම මහා ඍද්ධි ඇති අනුසස් ඇත්තෙමැයි මත්වී උපන් මානය **ඉද්ධිමදො** නම් වේ. යට පිරිවර ගැනීමෙන් යසස ගන්නා ලදී. මෙහි **උපධාන** මදය ගන්නා ලදී. එය අගාරික අනගාරික වශයෙන් දැක්විය යුතුය. අගාරිකයෙහි කෙනෙක් අටළොස් ශ්‍රේණිවල එකෙක් දෙටු වේ. ඔහුගේ අවසේස අය මම විස්තර කරමි. මම විචාරමි යයිද අනගාරිකයෙහි ඇතමෙකුගෙන් කෙනෙක් දෙටුවේ. ඔහුගේ අවසේස භික්ෂූහු මගේ අවවාදයෙහි සිටිති. මම දෙටුවෙමිය මත්වීම් වශයෙන් උපන් මානය **යසමදො** නම් වේ. අවසේස අය දුස්සීලය. මම සිල්වත් වෙමි යයි මත්වීම් වශයෙන් උපන් මානය **සීලමදො** නම් වේ. අවසේස අය කුකුලෙක් දිය බොන කාලයකද සිතේ

එකඟකමක් නැත. මම උපචාර අර්පණාලාභී වෙමි යයි මත්වීම් වශයෙන් උපන් මානය **ඣානමදො** නම් වේ. අවසේස අයට ශිල්ප නැත. මට ශිල්ප ඇතැයි මත්වීම් වශයෙන් උපන් මානය **සිප්පමදො** නම් වේ. අවසේස අය මිටිය. මම උසයයි මත්වීම් වශයෙන් උපන් මානය **ආරෝහමදො** නමි. අවසේස අයගේ ශරීර පිහිටීම විරූපය. පිළිකුල්ය. මගේ ශරීරය මනාපය. පැහැපත්ය යයි මත්වීම් වශයෙන් උපදින මානය **සණ්ඨාන මදො** නම් වේ. අවසේස අයගේ ශරීර මිටි හෝ උස හෝ වේ. මගේ ශරීරය නිග්‍රෝධ පරිමණ්ඩල වේ යයි මත්වීම් වශයෙන් උපන් මානය **පරිනාහමදො** නමි. අවසේසයන් ශරීර බොහෝ දෝෂ ඇත. මගේ ශරීරයේ කෙසඟක් පමණවත් දොසක් නැතැයි මත්වීම් වශයෙන් උපන් මානය **පාරිපූරිමදො** නමි.

මෙයින් මෙපමණකින් සවත්‍ථුක මානය කියා දැන් අවත්‍ථුකව නිපන් මානය දැක්වීමට **තත්‍ථ කතමො මදො?** යනාදිය කීහ. එය ප්‍රකටය. පමාද නිද්දේසයෙහි **චිත්තස්ස වොස්සග්ගො** යන මෙපමණ ස්ථානයෙහි සිහියෙන් නිග්‍රහ නොකොට සිතේ හැරීම. සිහිය නැත යන අර්ථයයි. **වොස්සග්ගානුප්පදානං** වොස්සග්ගයේ අනුප්පදානය, නැවත නැවත විසඳීම යන අර්ථයයි. **අසක්කච්ච කිරියතා** මේ දානාදි කුසල ධර්මයන්ගේ වැඩීමෙන් පුද්ගලයාගේ හෝ දේය ධර්මයේ සකස් නොකිරීම් වශයෙන්. නිතරම ඇති **සාතච්චං** නිතරම නැති බව **අසාතච්චං.** නිතර නැති කිරියා ඇති බව **අසාතච්ච කිරියතා.** නිතරම නොකිරීම **අනට්ඨිත කිරියතා.** කටුස්සා ටිකක් ගොස් ටිකක් නවතී. නිතරම නොයයි. එසේම යම් පුද්ගලයෙක් එක දවසක් දානයක් හෝ දී පූජාවක් හෝ කොට ධර්මය හෝ අසා මහණකමක් කර නැවත බොහෝ කලකින් කරයි. නිතරම නොපවත්වයි. ඔහුගේ ඒ ක්‍රියාව අනට්ඨිත කිරියා යයි කියනු ලැබේ. **ඔලීනවුත්තිතා** නිතරම කිරීම් සංඛ්‍යාත පැතිරීම අභාවයෙන් සැඟවුණු ස්වභාවය. **නික්ඛිත්ත ඡන්‍දතා** කුසල ක්‍රියාවෙහි වීර්ය හා කැමැත්ත අතහැරීම. **නික්ඛිත්ත ධුරතා** අධික වීර්ය අතහැරීම. පසුබසින ලද සිත් ඇති බව **අනධිට්ඨාන** කුසල ක්‍රියාවෙහි පිහිටීමක් නැති. **අනනුයොගො** යෙදීමක් නැති. **පමාදො** ප්‍රමාදය. **යො එවරූපො පමාදො** අර්ථ ආකාර සහ ව්‍යඤ්ජන ආකාර කෙළවරක් නැති ආකාර දැක්වීම. මෙය කියන ලදී. යමෙක් මුල පටන් ප්‍රමාදය දක්වන ලදී. යම් අන්‍යයෙක්ද එබඳු ආකාර එබඳු ජාතික **පමාදො** පමාවන ආකාර වශයෙන් **පමජ්ජනා** පමා වූ බැවි. **පමජ්ජිතං** ඒ සංඛ්‍යාවට ගිය. **අයං වුච්චති පමාදො** ලක්ෂණ

වශයෙන් පඤ්ච කාම ගුණයෙහි සිහිය අත්හරින ලක්‍ෂණය. එහිම සිහිය අත්හල ආකාරය දතයුතුය.

ථම්භ නිද්දේසයෙහි තද අර්ථයෙන් ථම්භ බලියෙන් (කිලුටෙන්) බැඳුණු වස්ත්‍රයේ මෙන් සිතේ තදබව මෙහි කියන ලදී. තද බවේ ආකාරය **ථම්භනා** නම්. තද බවේ සවභාවය **ථම්භිතත්තං** වේ. රළු මිනිසාගේ භාවය **කක්ඛලියං**. එරුෂ පුද්ගලයාගේ භාවය **ඵාරුසියං** වේ. අභිවාදන සාමීචිවලට සුදුසු වූ ඔහුගේ සාමීචි නොකිරීම් වශයෙන් ඍජුවම තැබූ සිතේ භාවය **උජුචිත්තතා** වේ. තද බැවින් මෘදු නොවූ බව අමුදුත්ත වේ. **අයං වුච්චති** මේ ථම්භ යයි කියනු ලැබේ. යමකින් සමන්විත වූ පුද්ගලයා නගුල් හිස් ගිලින ලද පිඹුරකු මෙන් වාත හරිත හස්ත්‍රාවක් මෙන් සැයක් හෝ වැඩිමලෙක් හෝ දැක නැමෙන්නට නොහැකිය. කෙළවරින් නොයයි. මේ සිතේ ඉදිමුණු ලකුණු යයි දතයුතුය.

සාරම්භ නිද්දේසයෙහි එකට එක කිරීම් වශයෙන් සාරම්භො නැවත පැතිරවීම **පටිසාරම්භො** වේ. සාරම්භන ආකාරය **සාරම්භනා** වේ. පටිපථරින් සාරම්භන **පටිසාරම්භන** වේ. පටිසාරම්භිතයාගේ භාවය **පටිසාරම්භිතත්තං** වේ. **අයං වුච්චති** මෙය සාරම්භයයි කියනු ලැබේ. මෙහි ලක්‍ෂණ වශයෙන් එකට එක කිරීමේ ලක්‍ෂණයයි කියනු ලැබේ. මෙයින් යුක්ත වූ පුද්ගලයා එය දෙගුණකොට තුන්ගුණ කොට කරයි. ගිහියෝ එක එක ගෙවල් සැරසූ විට තව එකෙක් වස්තු දෙකක් හදයි. තව එකෙක් හතරක් තව එකෙක් අටක් දහසයක් ආදි වශයෙනි. අනගාරියෙහිද එකෙක් එක නිකායක් ගත්විට මම ඔහුට යට නොවෙමිය අනෙක් නිකාය දෙකක් ගනී. ආකාර තුනක් හතරක් පහක් වශයෙනි. සාරම්භ වශයෙන් ගැනීම නොවටී. අකුසල පක්‍ෂයෙහි මෙය නිරයගාමී මාර්ගයකි. කුසල පක්‍ෂය වශයෙන් එක් ස්ථානයක එක් සලාක බතක් දෙන කල්හි දෙකක් දෙන්ට දෙකක් දෙන කල්හි සතරක් දෙන්ට වටී. භික්‍ෂුව විසින්ද අන්‍යයෙක් එක් නිකායක් ගත්කල්හි නිකාය (ග්‍රන්ථ) දෙකක් ගෙන සජ්ඣායනය මට පහසු වේයයි විවට්ට පක්‍ෂයෙහි සිට ඊට වැඩියක් ගැනීම වටී.

අත්‍රිච්ඡතා නිද්දේසයෙහි යම්සේ ආර්යවංශ සූත්‍රයෙහි ලාමක අතික් අතික් අර්ථ මෙසේ නොගෙන සිවුරු ආදියෙහි යමක් යමක් ලැබීද එයින් අසන්තෝෂ වූ, ගිහියෝ හෝ රූප ශබ්දාදිය ලැබ එයින් අසන්තෝෂ වූයේ **භීයොභාෝ කම්‍යතා** යනු විසේස කැමැත්ත. කැමතිවීම් වශයෙන්

**ඉච්ඡා** ඉච්ඡාව. **ඉච්ඡාගතං** කැමතිවන ආකාරය හෝ. තමාගේ ලාභය ඉක්මවා කැමතිවන බව **අතිච්ඡතා** වේ. **රාගො** යනාදිය යට කියන ලද අර්ථය වේ. **අයං වුච්චති** මේ අත්‍රිච්ඡතා නම් යයි කියනු ලැබේ. ලක්‍ෂණ වශයෙන් වනාහි ස්වකීය ලාභයෙහි අසන්තෝෂය අනුන්ගේ ලාභය ප්‍රාර්ථනා කිරීම. මෙය අත්‍රිච්ඡ ලක්‍ෂණයයි. අත්‍රිච්ඡ පුද්ගලයාට තමා ලද ප්‍රණීතයද ලාමක මෙන් දැනේ. අනුන් ලත් ලාමක දේද ප්‍රණීත ලෙස හැඟේ. එක භාජනයෙහි පිසූ කැඳ හෝ බත් හෝ කැවුම් හෝ තමාගේ පාත්‍රයට දැමූවිට ලාමක මෙන් අනුන්ගේ පාත්‍රයෙහි ප්‍රණීත මෙන් හැඟේ. මේ වනාහි අත්‍රිච්ඡතාව. පැවිද්දන්ගේද ගිහියන්ගේද තිරිසනුන්ගේද ඇත.

මේ එහි වස්තුවකි. එක කෙළෙඹියෙක් භික්‍ෂුණීන් තිහකට ආරාධනා කොට පූ සහිත බත් පිළිගැන්වීය. සංඝථෙරී භික්‍ෂුණිය සියළු භික්‍ෂුනීන්ගේ පාත්‍රවල කැවුම් මාරුකරවා පසුව තමා ලද දේ අනුභව කළාය. බරණැස් රජතුමාද අඟුරුවල පැලහූ මස් කන්නෙමියි වනයට පිවිස එක් කිඳුරියක දැක දේවිය හැර ඇගේ පස්සේ ගියේය. දේවිය නැවතී ආශ්‍රමයට ගොස් කසිණ පරිකර්ම කොට අෂ්ට සමාපත්ති හා පඤ්ච අභිඤ්ඤා උපදවා සිටියාය. රජු එනු දැක අහසට නැගී ගියේය. වෘක්‍ෂයෙහි අධිගෘහිත දෙවියා මේ ගීය කීවේය.

අසතුටු දැඩි ලොබින් - දැඩි ලෝබ මදයෙන් යුත්  
පිරිහේ අත්බවෙන් - සඳවැනි අසිතාබුගෙන්

සඳකිඳුරිය පතමින් අසිතාබු රාජ දියණිගෙන් පැරදී හීනව පිරිහුනේ මෙසේ අත්‍රිච්ඡතා වෙති. අති ලෝභයෙන් පිරිහුණේය. පැරදුනේ යයි දෙවියා රජුට කවටකම් කෙළේය. කාශ්‍යප බුදුරදුන්ගේ කාලයෙහි මිත්ත වින්දක නම් සිටු පුත්‍රයෙක් විය. හේ ශ්‍රද්ධා නැත්තේය. අප්‍රසන්නය. මව පුතා අද පන්සලට ගොස් සිල් සමාදන් වී මුළු රාත්‍රියේම බණ ඇසුවොත් දහසක් දෙමියි කීවාය. හේ ධන ලෝභයෙන් සිල් සමාදන්ව විහාරයට ගොස් ධර්මාසනය යට බිය නැතැයි සලකා එහි මුළු රෑ නිදාසිට ගෙදර පැමිණියේය. මව පාන්දරම කැඳ හදා දුන්නීය. හේ දහස රැගෙනම කැඳ බීවේය. ඉක්බිති ඔහුට මෙබඳු අදහසෙක් විය. ධනය සොයමි නැවකින් සයුර තරණය කරමි. මෙය මව දැනගත්විට පුතේ, මේ පවුලේ හතලිස් කෝටියක් ධනය තිබෙනවා. ඔය ගමනෙන් වැඩක් නැතැයි වැළකුවාය. හේ ඇගේ වචනය නොගෙන යන්නේ විය. ඕ පෙරටුව සිටියාය. හේ කිපී

මවගේ පාදයට ගසා පෙරළා ගියේය. මව නැගිට මෙබඳු වැඩක් කර ගියත් ඔහු ගියතැන සැපයක් වෙන්න මෙබඳු දෙයක් නොකරවයි කීය. නැව් නැගී ගියත් සත්වන දිනයෙහි නැව නැවතුනේය. එවිට එහි මිනිස්සු ඒකාන්තයෙන් මෙහි පවිටෙක් ඇත. සලාක දෙවයි කීහ. සලාක දෙනවිට තුන්වරක්ම ඔහුට සලාකය පැමිණියේය. ඔවුහු ඔහුට පහුරක් දී මුහුදේ දැම්මාහ. හේ එක් දිවයිනකට ගොස් විමාන ප්‍රේතීන් සමග සම්පත් අනුභව කරන්නේ ඔවුන් විසින් ඉදිරියට යන්ට එපා කියත්දීත් දෙගුණයක් සම්පත් බලන්නේ අනුක්‍රමයෙන් උරසක් මාලාවක් දරන පුරුෂයකු දැක්කේය. ඔහුගේ ඒ චක්‍රය පිසුමක් මෙන් වැටහුනේය. හේ ඔහුට කී. පින්වත ඔබ පැළඳි මේ පියුම මට දෙන්න. සාමිනී මේ පියුමක් නොවේ. මෙය උරචක්‍රයකි. මා වංචා කරන්න එපා. මම පියුම් දැක නැතැයි සිතා, ඔබ රත්සඳුන් ආලේප කොට පළඳනා නෙළුම්මල මට දෙනු කැමතිද? හෙතෙම සිතීය. මේ තෙමේ ද මා කළ කර්මයට සමාන කර්මයක් කොට එහි පලය අනුභව කරනු කැමතිය. ඉක්බිති ඔහුට අඬගසා ඔහුගේ මුදුනෙහි චක්‍රය බහා පලා ගියේය. මෙහි අර්ථය දැන ශාස්තෘන් වහන්සේ මේ ගාථාව කීහ.

හතර අටවීමෙන් - අටෙන් දහසය වන්නේ
දහසය දෙතිස වී - නොසතුට සක වෙතම යයි
කැමති හළ මිනිසා - මත්තෙහි සක බමන්නේ

අත්‍රිච්ඡ වූ එක්තරා ඇමතිවරයෙක් සිය විෂය ඉක්මවා පර විෂයකට පැමිණියේය. එහිදී තළා පෙළන ලද්දේ පලාගොස් එක් තවුස් අසපුවකට පැමිණ පෙහෙවස් ඉටා වැද හොත්තේය. ඔබ කුමක් කෙළේදැයි තවුසා ඔහුගෙන් විචාළේය. හේ මේ ගී කීවේය.

තම විසයට නිගා - කරමින් අත්රිච්චයෙන්
දුරු රට ගොසින් එහි - මිනිසුන් අතින් බැට කා

හේ බිඳුණු සිරසින් - ලෙහෙ වැකුණු අඟපසඟින්
පැමිණි සිය ගමටම - රකිමි සිල් යළි නොඑනුව
අත්‍රිච්ඡ නම් නපුරා - යළි මා ගමට එච්චේ

මහිච්ඡතා නිද්දේසයෙහි, මහත් වූ වස්තු කැමති වේ. ඔහුගේ ආශාව මහත් නිසා මහිච්ඡ වේ. එහි භාවය මහිච්ඡතා වේ. ලක්ෂණ

වශයෙන් අශාන්ත ගුණයට බර වේ. පිළිගැනීමෙහි සහ පරිභෝගයෙහි ප්‍රමාණයක් නැත. මහිච්ඡ පුද්ගලයා කච්ඡපුට වෙළෙන්දා පළඳින භාණ්ඩ අතින් ගෙන කිහිල්ලේ තබාගත යුතු දේ කිහිලි ගන්නා මහජනයා දකින විට අම්ම අසවල් දේ ගන්න අසවල් දේ ගන්න කියා මුවින් කෑගසයි. එසේම තමාගේ සීලයක් හෝ ශ්‍රැත පාඩමක් හෝ ධූත ගුණයක් හෝ අල්ප මාත්‍රයක්වත් නැතිව මහජනයාට ඇඟවීමට කැමති වේ. ඇඟවීමෙන් යනු කරත්ත ගණන් ප්‍රත්‍යය පිළිගැන්වුවත් ඇතියි නොකියා ගනී. තුන් දෙනෙකු පිරවිය නොහැක.

ගිනිකඳ සමුදුර ද - මහරුචි පුඟුලාද යන
බොහෝ පස දීමෙන් - මෙතුන්දෙන නොපිරේමය

මහිච්ඡ පුද්ගලයා වැදූ මවගේ සිත ගැනීමට ද නොහැක්කෙකි. උප ස්ථායකයින් ගැන කියනුම කවරේද?

ඊට කථාවස්තු මෙසේය. එක් තරුණ භික්ෂුවක් පිටි කැවුම්වලට ප්‍රිය කරයි. ඉක්බිති ඔහුගේ මව පිළිවෙත් විමසනු ලබන්නේ මගේ පුතා පිළිගැනීමේ පමණ දනීනම් තුන්මාසයම පිටි කැවුම්වලින් උපස්ථාන කරමියි වස් එළඹෙන දිනයෙහි විමසන පිණිස පළමුව එක කැවුමක් පිළිගැන්වීය. එය අවසන් වූ පසු දෙවැන්නක්ද ඉන්පසු තුන්වැන්නක්ද තරුණයා ඇතැයි නොකියා අනුභව කෙළේය. මව ඔහුගේ ආහාරයෙහි පමණ නොදන්නා බව දැන අදම මගේ පුතා විසින් තුන් මාසයේම කැවුම් කන ලදැයි දෙවන දිනයේ පටන් එක කැවුමකුදු නුදුන්නාය.

තිස්ස මහරජතුමාද සෑගිරියෙහි (මිහින්තලේ) භික්ෂූන් වහන්සේට දිනපතා දන් දෙයි. මහරජතුමනි, එක තැනක්ම ඇසුරු කරන්නේ ඇයි? වෙනත් තැනකට දන් දෙන්ට නොවටීදැයි ජානපදිකයෝ ඇසූහ. දෙවන දිනයෙහි අනුරාධපුරයෙහි මහා දානයක් දෙවීය. එක භික්ෂුවක් වත් පිළිගැනීමේ මාත්‍රයක්වත් නොදනී. එක එක්කෙනා පිළිගන්නා ලද භෝජන වලින් දෙතුන් දෙනෙක් දොස් කීහ. රජතුමා දෙවන දිනයෙහි සෑගිරියේ භික්ෂූන්ට රජමාලිගයේ දානයට ආරාධනා කෙළේය. භික්ෂූන් දානයට මාලිගාවට වැඩිය පසු පාත්‍රය දෙනු මැනවැයි ඉල්ලීය. මහරජ, අවශ්‍ය නැත. තමාගේ ප්‍රමාණයෙන් භික්ෂුව ගන්නී යයි එක් භික්ෂු නමකුදු පාත්‍රය නුදුන්නේය. සියළු දෙනාම ප්‍රමාණයෙන් යුතුවම පිළිගත්හ. ඉක්බිති රජතුමා

බලන්න ඔබලාගේ හාමුදුරුවන් එක්කෙනෙක්වත් පමණ නොදනී. ඊයේ මොකවත් ඉතිරිවුනේ නැත. අද ගන්නා ලද්දේ ස්වල්පයකි. බොහෝ ඉතිරි විය. උන්වහන්සේලාගේ පමණ දැනීම ගැන සතුටු වූ අතර අනිත් පමණ නොදන්නන් ගැන අසතුටු විය.

පාපිච්ඡතා නිද්දේසයෙහි අශ්‍රද්ධාවන්තයා මා ශ්‍රද්ධාවන්තයකු සේ ජනයා දැනගනිත්වා යයි මෙසේ සිතන්නේ කුමක් කෙරේද? අශ්‍රද්ධාවන්තයා ශ්‍රද්ධාව ඇත්තෙකැයි දක්වයි. දුස්සීලයෝ සීලවන්ත ආකාරයක් පෙන්වති. කෙසේද? අශ්‍රද්ධාවන්තයා උත්සව පවත්වන දිනයේ මිනිසුන් විහාරයට එන වෙලාවේ මුසුන ගෙන විහාරය අමදියි. කසල බැහැර කරයි. මිනිසුන් දුටු බව දැක සෑමළුවට යයි. එයද හැමද රොඩු අරන් දමයි. වැලි සමතලා කරයි. මල් ආසන සෝදයි. බෝධියට ජලය ඉසියි. ඒවා මිනිස්සු දැක විහාර වතාවත් කරන වෙන කෙනෙක් නැතිව ඇතැයි සිතා ශ්‍රද්ධාවන්ත භික්ෂු නමක් යයි සලකා යන වෙලාවේ ආරාධනා කොට යති. දුස්සීලයාද උපස්ථායකයින් ඉදිරියේ විනයධර භික්ෂූන් වෙත පැමිණ විචාරති. මා යනවිට ගොනා තැතිගෙන දුවන්නේ තණකොළ සිඳිනු ලැබීය. මා අමදිනවිටද තණකොළ බිඳුනේය. සක්මන් කරනවිටද ක්ෂුද්‍ර ප්‍රාණීහු මිය යති. කොළ ගසනවිටද තණකොළ මත වැටේ. ඒ ඒ අවස්ථාවල මොකද වෙන්නෙ? ඇවැත්නි, නොදැන අසිහියෙන් නොදන්නේ අනාපත්ති වේ. ස්වාමීන් වහන්ස, මට ගරුකයක් මෙන් වැටහේ. වහා විමසවයි කියයි. එය අසා මිනිස්සු අපගේ ආර්යයන් වහන්සේ මෙපමණකින්ද සැක කරන්නේය. අනිත් ඕලාරික දේවල් ගැන මොනවා නොකරන්නේ මෙවැනි සීලවන්තයෙක් යයි ප්‍රසන්නව සත්කාර කරති.

අල්පශ්‍රැතයාද උපස්ථායකයන් මැද හිඳින්නේ අසවල් නිකාය හතරක් දරන්නා අසවල් ත්‍රිපිටකධරයා මගේ අතවැසියෝය. මා ලඟ ඔවුන් ධර්මය ඉගෙන ගන්නා ලදැයි කියයි. මිනිස්සු අපගේ ආර්යයන් සමාන බහුස්සුතයෙක් නැත. මුන්වහන්සේ සමීපයේ අසවල් අය විසින් ධර්මය ඉගෙන ගන්නා ලද යයි ප්‍රසන්නව සත්කාර කරති. ගණ සංගණිකාරාමයෙහි (බොහෝ පිරිස් ඇතිව සිටීම) සිටි කෙනෙක්ද උත්සව පූජා දිනයෙහි දික් පුටුවක්ද හේත්තුවන ලෑල්ලද ගෙන්වාගෙන විහාරයේ පසෙක ගසක් මුල දිවා විවේකයෙහි හිඳියි. මිනිස්සු ඇවිත් තෙරුන් කොහේදැයි අසති. හුදකලාව වසන්නෝ හුදකලාවම සිටිති. එහෙයින් තෙරුන් මේ වෙලාවේ මෙහි නොහිඳිති. විහාරයේ පසෙක දිවා ස්ථානයේ

දික් සක්මනේ වෙසෙතියි කියති. හේ ද දිවස භාගය ගෙවා නලලෙහි මකුළු දැලක් අලවා පුටුව ගෙන්වාගෙන පැමිණ පිරිවෙන් දොර අසල හිඳියි. මිනිස්සු ස්වාමීන් වහන්සේ කොහේ ගිහින්ද ආවේ නොදුටුවෙමුයි කියති. උපාසකවරුනි, ඇතුළු විහාරය, ආකීර්ණය දහර සාමණේරයින් හැසිරෙන තැනක එයි. සැටරියන් සක්මනෙහි දිවා විහරණයෙන් හුන්නේ යයි තමාගේ විවේකීභාවය දැනවීය.

කුසීතයාද උපස්ථායකයින් මැද සිටින්නේ උපාසකවරුනි, ඔබලා උල්කාපාත වේලෙහි දකිනලදැයි කියයි. ස්වාමීනි, නොදැක්කෙමු. කුමන වේලාවේදැයි අසන ලද්දේ අපගේ සක්මන් වේලාවේ යයි කියා පොළව කම්පාවෙන ශබ්දය නොඇසුණේදැයි විචාළේය. නොඇසුවෙමුයි ස්වාමීනි, කුමන වේලාවේදැයි අසන ලද්දේ මධ්‍යම යාමයෙහි අපගේ එල්බෙන පලක ලැල්ලෙහි හේත්තුවී සිටිනවිට යයි කියා මහා එලියක් ඇතිවුණා දැක්කෙ නැද්දැයි ඇසීය. ස්වාමීනි කොයි වෙලාවෙදැයි ඇසූවිට මම සක්මනින් බසින වෙලාවෙ යයි කියයි. මිනිස්සු අපගේ තෙරුන් වහන්සේ තුන් යාමයෙහිම සක්මනේම සිටිති. ආර්යන් වහන්සේ සමාන වීර්ය ඇති කෙනෙක් නැතැයි පැහැදී සත්කාර කරති.

සිහිමුළා වූවහුද උපස්ථායකයින් මැද සිටින්නේ අසවල් කාලයෙහි මම දීඝනිකාය ඉගෙන ගත්තෙ, අසවල් කාලයේ මජ්ඣිම නිකාය, සංයුත්තකය අංගුත්තරය යයි අතරතුර බැලීමක් නැත. හිතුණු හිතුණු වෙලාවේ පෙල කටට නැගෙයි. අනිත් ස්වාමීන් වහන්සේලා එළුවෝ මෙන් කට සොලවා වාසය කරතියි කියයි. මිනිස්සු ආර්යන් වහන්සේ සමාන එළඹ සිටි සිහි ඇති කෙනෙක් නැතැයි පැහැදී සත්කාර කරති.

සන්සුන් නොවූ තැනැත්තාද උපස්ථායකයින් ඉදිරියේ අටුවා ඇදුරන්ගෙන් ප්‍රශ්න අසයි. කසිණය වඩන්නේ කෙසේද? කොපමණකින් නිමිති උපදීද? කොපමණකින් උපචාර වේද? කොපමණකින් අර්පණා වේද? ප්‍රථම ධ්‍යානයේ අංග කීයද? දෙවන-තුන්වන-සතරවෙනි ධ්‍යානවල අංග කීයදැයි විචාරයි. උන්වහන්සේලා විසින් තමන්ගේ ඉගෙනගත් පරිද්දෙන් කියන ලද කල සිනාසී ඇවත්ති, මෙසේ නොවේදැයි කී කල්හි ස්වාමීනි වටී යයි තමා සමාපත්ති ලාභියකු යයි අඟවයි. මිනිස්සු ආර්යන් වහන්සේ සමාපත්ති ලාභියෙකු යයි පැහැදී සත්කාර කරති. දුෂ්ප්‍රාඥ තෙමේද උපස්ථායකයින් මැද හුන්නේ, මජ්ඣිමනිකායේ පපඤ්ච තුන

බලමින් සිටිනවිට සෘද්ධිය සමග මාර්ගය පැමිණුනේය. පරියත්තිය (බුද්ධ වචනය) මට අමාරු නොවේ. පරියත්තියේ යෙදුනාට දුකින් නොමිදේ යයි පරියත්තිය අත්හැරියෙමියි ආදිය කියන්නේ තමාගේ මහා ප්‍රාඥකම දක්වයි. මෙසේ කියමින් ශාසනයට පහරදෙයි. මොහු හා සමාන මහ සොරෙක් නැත. පරියත්තිය නැත්තෙක් දුකින් නොමිදේ.

රහත් නොවූවෙක්ද ගම්දරුවන් දැක ඔබලාගේ මව්පියෝ අප ගැන කුමක් කියත්ද ස්වාමීනි රහත් යයි කියති. තමා රහත් යයි ද කළ ගෘහපතියන් රැවටිය නොහැක. අනිකුදු හැලි රහත් පාරෝහ (අරළු) රහත් ආදීන් දතයුතුය. එකෙක් වනාහි කුහකයෙකි. ඇතුළුගැබ හැලියක් වළලා මිනිසුන් එන වෙලාවට හැලියට බසී. මිනිස්සු තෙරුන් කොහෙදැයි අසති. ඇතුළු ගැබේ යයි කී කල්හි පිවිස සොයන්නේ නොදැක නික්මී තෙරුන් එහි නැතැයි කියති. තෙරුන් ඇතුළු ගැබ්ම යයි කීවිට නැවත පිවිසෙති. හේ සැලියෙන් නික්මී පුටුවේ හිඳ සිටී. එයින් ඔවුන් ස්වාමීනි අපි කලින් නොදැක ගියෙමු. ඔබවහන්සේ වැඩියේ කොහේදැයි ඇසූවිට ශ්‍රමණයින් තමන් කැමති කැමති තැනකට යති'යි වචනයෙන් තමන් රහත් බව අඟවයි.

තවද කුහකයෙක් එක් පර්වතයක පන්සලක වසයි. පන්සල පිටුපසින් ප්‍රපාත ස්ථානයක එක් තුගගසක් ඇත. එයින් අරළු ඇදී බිමට පාත්වී ඇත. මිනිස්සු මාර්ගයෙන් ඇවිත් ආරාධනා කරති. හේ පාසිවුරු ගෙන අරළුවලින් බැස ගම්දොර තමන් දක්වයි. එයින් මිනිසුන්ට පසුව ඇවිත් කුමන මගකින් ආවේදැයි අසන ලද්දේ ශ්‍රමණයින් ආ මග ඇසීම සුදුසු නැතැයිද තමන් කැමති කැමති තැනකින්ම එත් යයි වචනයෙන් රහත්බව දක්වති. ඒ කුහකයා එක් විදූකණෙක් දැන ඔහු පරීක්‍ෂා කරමියි එක් දිනක් අරළුවෙන් බස්නා ඔහු දැක පසුපසින් සිඳ ටිකක් ඉතිරි කෙළේය. හේ අරළුවෙන් බසිමියි පොළොවේ වැටී මැටිපාත්‍රය බිඳුනේය. හේ දැනගත්තේ යයි දැන පලා ගියේය.

පවිටාගේ භාවය **පාපිච්ඡතා** වේ. ලක්‍ෂණ වශයෙන් නැති ගුණ පෙන්වීම් ස්වභාවයෙන් යුක්තවීම. පිළිගැනීමේද පමණ නොදනී. මේ පාපිච්ඡතා ලක්‍ෂණයයි දතයුතුය.

සිංග නිද්දේසයෙහි විදීම් අර්ථයෙන් සිංග නම් වේ. නාගරික භව සංඛ්‍යාත කෙලෙස් සිංගය වේ. තියුණු කෙලෙස් ඇත්තාගේ ස්වභාවය

**සිංගාරතා** වේ. ශෘංගාරය ඇතිකරන ආකාරය හෝ සිංගාරතා වේ. චතුරභාවය **චතුරතා** වේ. එසේම **චාතුරියං** වේ. පරීක්‍ෂා කරන්නේ භාවය **පරික්ඛත්තතා** වේ. සාරා තබන ලද දැඩි ශෘංගාර භාවයට මෙය නමකි. ඉතිරි ඒවා එහිම සමාන වචන වේ. මෙසේ සියළු පදවලින්ම කෙලෙස් සිංගාරතාවම කියන ලදී.

තින්තිණ නිද්දේසයෙහි **තින්තිණ** යනු දොස් නැති බවයි. දොස් නගන ආකාරය **තින්තිණායතා** නම් වේ. දොස් නැගීමෙන් යුක්ත භාවය **තින්තිණායිතත්තං** වේ. අදික තෘෂ්ණා ඇත්තාගේ භාවය **ලොලුප්පං** වේ. **පුච්ඡංඛිකතා** යනු ලබන නොලබන තැන්වල වේදනාව කම්පාව පහත් පැවතුම් ඇති බව. **සාධුකම්පිතා** යනු ප්‍රණීත ප්‍රණීත වූ ප්‍රාර්ථනා. මෙසේ සියළු පදවලින් බලු ඔරුවක කැඳ බොන සුනඛයෙක් වෙනත් සුනඛයෙකු දැක බුරනවා මෙන් ඔබ සතුය මා සතුයයි කෙලෙස් වශයෙන් දොස් නගන ආකාරය කියන ලදී.

චාපල්‍ය නිද්දේසයෙහි - මදින ලද නැවත නැවත මැදීම් ස්වභාවයෙන් සිවුර සැරසීම **චීවර මණ්ඩනා** වේ. මැණික් වර්ණ සිවිය ඇතිකිරීම් ආදියෙන් පාත්‍රය සැරසීම **පත්තමණ්ඩනා** වේ. චිත්‍රකර්ම ආදියෙන් පෞද්ගලික සෙනසුන සැරසීම **සෙනාසනමණ්ඩනා** වේ. **ඉමස්ස වා පූතිකායස්සා** යනු මේ මනුෂ්‍ය ශරීරයේ, එවෙලේම උපන් සිවලාද ජරසිගාලම වේ. කලවා ප්‍රමාණ රසකිඳ වැලද කණවැල සංඛ්‍යාවට යයි. මෙසේ රන්වන් වූ මිනිස් සිරුර කුණු ශරීර යයි කියනු ලැබේ. එය කලින් කල රතුපාට කහපාට ආදි හඳින පෙරවන වස්ත්‍රාදියෙන් සැදීම **මණ්ඩනා** නම් වේ. **බාහිරානංවා පරික්ඛාරානං** පාසිවුරු හැර සෙසු පිරිකර. එසේ නැතහොත් මේ සිවුරු සැරසීම් පාත්‍ර සැරසීම් යයි කියන ලදී. ඒ පිරිකරවලින් හෝ සිරුර සැරසීම ඒ බාහිර පිරිකර සරසා තැබීම් වශයෙන් සැරසීම යයි මෙසේ මෙහි අර්ථය දතයුතුය. **මණ්ඩනා විභූසනා** යනු මෙහි අඩුතැන් පිරවීම් වශයෙන් **මණ්ඩනා** ද සමේ ආලේප වශයෙන් **විභූසන** යයිද දතයුතුය. **කෙළනා** යනු ක්‍රීඩාවයි. **පරිකෙළනා** යනු ක්‍රීඩාවමය. **ගිද්ධිකතා** යනු තෘෂ්ණාවෙන් යුක්ත බව. **ගිද්ධිකත්ත** ඊටම වචනයකි. චපල බව **චපලතා** වේ. එසේම **චාපල්‍යං ඉදං වුච්චතී** මෙය චාපල්‍ය යයි කියනු ලැබේ. මෙයින් සමන්විත පුද්ගලයා වස් සියයක් ගියද එදා උපන් දරුවකුට සමාන වේ.

අසභාග වුත්ති නිද්දේසයෙහි **විප්පටිකූලගාහිතා** යනු අනුලෝම නොවන ගැනීමය. **විපච්චනීකසාතතා** යනු ප්‍රතිවිරුද්ධ කරුණකින් සුව මග. අනාදරභාවය **අනාදරියං** වේ. එසේම **අනාදරියතා** වේ. අගෞරව බව **අගාරවතා** වේ. දෙටුබව නොකිරීම **අප්පටිස්සවතා** වේ. **අයං වුච්චති** මේ අසභාග වුත්තිය නම් වේ. විසභාග ජීවිත යන අර්ථයයි. මේ ලක්‍ෂණයෙන් යුත් පුද්ගලයා මව හෝ පියා හෝ ගිලනකු දෙස හැරීවත් නොබලයි. පියා සතු දේ ගැන මව සමගද මව සතු දේ ගැන පියා සමගද කලහ කරයි. විසභාග ජීවිත ගතකරයි. මව්පියන් සතු දේ ගැන දෙටු හෝ කනිටු සොයුරන් සමග කලහ කරයි. ලජ්ජා නැති වචන කියයි. ආචාර්ය වරයාගේ හෝ උපාධ්‍යායයාගේ වත්පිළිවෙත් නොකරයි. ගිලනුන්ට උවටැන් නොකරයි. සෑයට නුදුරෙහි මල මූ පහකරයි. කෙල සොටු දමයි. වහන් නැගී යයි. බුද්ධ ශ්‍රාවකයන් කෙරෙහි ලජ්ජා නොවෙයි. සංඝයාට ගරු නොකරයි. මවගේ මව පියාගේ මව ආදී ගරු කළයුත්තන් කෙරෙහි ලැජ්ජා බය නැතිව හැසිරෙයි. මෙසේ ඔහු පවත්වන සියළු කිරිය මාපිය වත්වලින් අසභාග වෘත්ති නම් වේ.

අරති නිද්දේසයෙහි **පන්තෙසු** දුර වූ විවේකයෙහි. **අධිකුසලෙසු** සමථ විපස්සනා ධර්මවල. **අරති** ඇලීම දුරුකළා වූ **අරතිතා** ඇලීම් නොවන ආකාරය. **අනභිරති** නොඇලෙන බව. **අනභිරමතා** අභිරමනය නොවන ආකාරය. **උක්කණ්ඨිතා** උකටලී වන ආකාරය. **පරිතස්සිතා** කලකිරීම් වශයෙන් ආශාවෙන් පීඩිතවීම.

තන්දි නිද්දේසයෙහි **තන්දි** යනු ජාති අලසබවය. **තන්දියතා** අලසවන ආකාරය. **තන්දිමනතා** අලසබවින් මැඩගත් සිත. අලසයාගේ ස්වභාවය **ආලස්සං** වේ. අලස වන ආකාරය **ආලස්සයනා** වේ. අලයගේ භාවය **ආලස්සායිතත්තං** වේ. මෙසේ මේ සියළු පදවලින් කෙලෙස් වසයෙන් කයේ අලසබව කියන ලදී.

විජම්භිතා නිද්දේසයෙහි **ජම්භනා** යනු සැලීමයි. නැවත නැවත සැලීම **විජම්භනා** වේ. **ආනමනා** යනු ඉදිරියෙන් නැමීමයි. **පනාමනා** යනු තුල් යන්ත්‍රයෙන් නැගිටි පෙහෙකරුවා කිසියම් දෙයක් ගෙන ශරීරය ඔසවයි. මෙසේ කය කෙලින්කොට තැබීම. **බ්‍යාධියකං** උපන් ව්‍යාධි ඇති බව. මෙසේ මේ සියළු පදවලින් කෙලෙස් වශයෙන් ශරීර ස්පන්දනය කියන ලදී.

භත්ත සම්මද නිද්දේසයෙහි **භුත්තාවිස්සා** අනුභව කිරීමෙන්. **භත්තමුච්ඡා** බත් ගිලන්බව. බත් වැඩිවීමෙන් සිහිනැතිවීම මෙන් වේ. **භත්තකිලමතො** බතින් ක්ලාන්ත වීම, **භත්තපරිළාහො** බත් නිසා ඇතිවන පීඩාව එවේලෙහි දැවිල්ලෙන් හටගත් වෙහෙසෙන ඉන්ද්‍රියන් ඇතිවේ. කය දිරයි. **කායදුට්ඨුල්ලා** යනු බත නිසා කයේ ඇතිවන අකර්මන්‍ය බව. සිතේ ලීනකම දක්වන ලීනත්ත නිද්දේසය යට ධම්ම සංගහට්ඨ කථාවේ කියන ලද අර්ථයම වේ. මෙම සියළු පදවලින් කෙලෙස් වශයෙන් සිතෙහි ගිලන් ආකාරය කියන ලදැයි දතයුතුය.

කුහනා නිද්දේසයෙහි **ලාභ සත්කාර සිලොක සන්නිස්සිතස්සා** යනු ලාභය ද සත්කාරය ද කීර්ති ශබ්දයද ඇසුරු කළ ප්‍රාර්ථනා කරන්නේ යන අර්ථයයි. **පාපිච්ඡස්සා** තමන් ලඟ නොමැති ගුණ දැක්වීමට කැමති තැනින් තැනින් **ඉච්ඡාපකතස්සා** කැමැත්ත නැතිවීමක් වූවහුගේ, උපද්‍රවයට පත් තැනැත්තෝ මෙයින් පසු ප්‍රත්‍ය සේවනයෙන්, සාමන්ත ජප්පන, ඉරියාපථ සනනිසසිත වශයෙන් මහා නිද්දේසයෙහි ත්‍රිවිධ වූ කුහන වස්තු දක්වා ඇත. එනිසා ඒවා දැක්වීමට **පච්චය පටිසේවන සංඛාතෙන වා** යන මේ ආදිය අරඹන ලදී. එහි සිවුරු ආදිය නිමන්ත්‍රණය කළවිට එය ඕනෑකම ඇතිව සිහියෙන් පාපිච්ඡතාව නිසා ප්‍රතික්ෂේප කිරීම මෙන් ඒ ගෘහපතියන් තමා කෙරෙහි පිහිටි ශ්‍රද්ධාව ඇති බව දැන නැවත ඔවුන්ට පුදුමය අපේ ආර්යන් වහන්සේ කිසිවක් පිළිගැනීමට කැමති නොවේ. අපෙන් මොනවාහරි ටිකක් පිළිගත්තොත් අපට මහත් ලාභයකැයි සිතා නා නා විධ උපායෙන් ප්‍රණීත සිවුරු ආදිය පිළිගන්වන්නේ ඊට අනුග්‍රහ වශයෙන් පිළිගනී. එතැන් පටන් කරත්ත අසූවකින් ගෙනවිත් දෙන්නේ යයි විශ්මය දනවන පච්චය පටිසේවන සංඛ්‍යාත කුහන වස්තුව දතයුතුය.

මහා නිද්දේසයෙහි මෙය කියන ලදී. පච්චය පටිසේවන සංඛ්‍යාත කුහන වස්තුව කෙසේද? මෙහි ගෘහපතියෝ භික්‍ෂුවට ආරාධනා කරති. සිවුරු පිණ්ඩපාත සෙනසුන් ගිලන්පස බෙහෙත් පිරිකරවලින් පාපිච්ඡ තැනැත්තා කැමති නැති බවක් පෙන්වා බොහෝ ගනු කැමතිව සිවුරු පිණ්ඩපාත සේනාසන ගිලන්පස බෙහෙත් පිරිකර එපා කියයි. හේ මෙසේ කියයි. ශ්‍රමණයන්ට අගනා සිවුරුවලින් කිම? ශ්‍රමණයාට සරුප් වූ සොහොනෙන් හෝ කසලගොඩෙන් හෝ අවුණෙන් හෝ රෙදි කැබලි එකතුකොට සිවුරක් කොට දරන්නේය. කිම ශ්‍රමණයන්ට අගනා පිණ්ඩපාතයෙන්? ශ්‍රමණයන් සාරුප්ප වන්නේ පිඩු සිඟා යැමෙන් පිඬ

පිඬ ලබාගත් ආහාරයෙන් ජීවිත ගෙවන්නේය. කිම මහණුන්ට අගනා සෙනසුන්? ශ්‍රමණයන්ට කැපවන්නේ ගස්මුල හෝ අභ්‍යවකාශයයි. කිම මහණුන්ට අගනා ගිලන්පස ආදිය? ශ්‍රමණයෝ කැපවන්නේ පූතිමුත්ත හෝ අරළු කැබැල්ලකින් හෝ ඖෂධ කරන්නේය. ඒ අනුව රළු සිවුරු දරයි. රළු පිණ්ඩපාතය වළඳයි. රළු සෙනසුන් පරිහරණය කරයි. රළු ගිලන්පස බෙහෙත් පිරිකර සේවනය කරයි. ඒ ගෘහපතියෝ මෙසේ දනිති. මේ ශ්‍රමණයා අපිස්ය. සතොස්ය. විවේකීය. මිශ්‍ර නැත. වීර්යවන්තය. ධුතවාදීය. බොහෝසෙයින් සිවුරු ආදියෙන් ආරාධනා කරති. හේ මෙසේ කියයි. කරුණු තුනක් එකතුවීමෙන් ශ්‍රද්ධාවන්ත කුලපුත්‍රයා බොහෝ පින් කරති. පරිත්‍යාග කරන වස්තුව ශ්‍රද්ධාව ප්‍රතිග්‍රාහක ඔබලාට ශ්‍රද්ධාව ඇත. දාන වස්තුව ඇත. මම ප්‍රතිග්‍රාහක වෙමි. මම මෙය පිළිනොගත්තොත් ඔබලාට පින් නැතිව යයි. මට මෙයින් ප්‍රයෝජනයක් නැත. නමුත් ඔබලාට අනුකම්පා පිණිස පිළිගනිමි. ඒ උපායෙන් බොහෝ සිවුරු පිළිගනියි. බොහෝ පිණ්ඩපාත..........බෙහෙත් පිරිකර පිළිගනියි. මෙබඳු වූ භාකුටිකා භාකුටියට කුහනා කුහායනා කුහිතත්ත යනාදි මෙය පච්චය පටිසේවන සංඛ්‍යාත කුහන වස්තුවයි.

නැති ගුණ දැක්වීමේ පවිටු අදහස් ඇත්තාගේම දැනුමැතිව උතුරු මිනිස්දම් අධිගම දක්වන වචන හෝ ඒ ඒ විශ්මය දනවන සාමන්ත ජප්පන සංඛ්‍යාත කුහන වස්තුව දතයුතුය. යම්සේ කීහ. සාමන්ත ජප්පන සංඛ්‍යාත කුහන වස්තුව කෙසේද? මෙහි ඉච්ඡාපකත පාපිච්ඡ වූ ගෞරව ලබාගැනීමේ අදහසින් යුත් ඇතමෙක් "ජනය මට මෙසේ ගෞරව කෙරේ යයි ආර්ය ධර්ම නිශ්‍රිත වූ වචන කියයි. යමෙක් එබඳු වූ සිවුරක් දරන්නේ තමා ඒ ශ්‍රමණ තෙමේ මහේසාක්‍ය වේයයි කියයි. යමෙක් එබඳු වූ පාත්‍රයක් ලෝහ තලියක් කෙණ්ඩියක් පෙරහන්කඩක් යතුරක් කහබහනක් වහන් යුවලක් ධරයි ද ඒ ශ්‍රමණයන් වහන්සේ මහේසාක්‍ය කියයි. යමෙකුට මෙබඳු වූ උපාධ්‍යායන් වහන්සේ කෙනෙක් ආචාර්ය වරයෙක් සමාන උපජ්ඣාය සමානාචරියක මිත්‍රයෙක් සන්දිට්ඨී සම්භත්තයෙක් යාළුවෙක් සිටීද යමෙක් මෙබඳු වූ විහාරයක වසයිද අඩඪ පාසාද හම්මිය ගුහා ලෙන කුටාගාරයේ අටෙට (මැස්සක) මාළෙ (වටකුරු සාලාව) උද්දොසිකෙ (ගරාජය) උද්දභණ්ඩ (පැලක්) උපස්ථාන ශාලාවේ මණ්ඩපයෙහි රුක්මුල වසයිද ඒ ශ්‍රමණයා මහේශාක්‍ය වන්නේය. නැතහොත් චංචලවිය හැකි බැම හකුළුවන පුදුම වෙමින් කථා කරමින් මුඛෙ සම්භාධකයෙන් මේ ශ්‍රමණයන් වහන්සේ එබඳු වූ සාන්ත වූ විහාර

සම්පත්තියක ලාභියෙකැයි එබඳු වූ ගැඹුරු සැඟවුණු තියුණු වූ වැසුණු ලෝකෝත්තර වූ ශූන්‍ය පටිසංයුක්ත වූ කථා කථාකරයි. එබඳු වූ බැම හැකිලීම් විශ්මය පළකිරීම් යන මෙය සාමන්ත ජප්පක සංඛ්‍යාත කොහොන් වතයි.

නැතිගුණ දැක්වීමේ පවිටු අදහස ඇත්තාගේ දැනුමැතිව ගෞරව ලැබීමේ අදහසින් ඉරියව්වලින් විශ්මය පළකිරීම ඉරියාපථ ආශ්‍රිත වූ කුහන වත්‍ථුවයයි දතයුතුය. ඉරියාපථ සංඛ්‍යාත කුහන වස්තුව කෙසේද? මෙහි ගෞරවයට කැමති වූ නැතිගුණ දක්වන ඇතැම් පවිටෙක් කැමතිවීමෙන් ජනයා මෙසේ සම්භවනා කෙරේවා යයි ගමන මනාසේ පිහිටුවයි. සයනය මනාසේ තබයි ප්‍රාර්ථනාවෙන් යයි, සිටියි. හිඳියි. නිදයි. සමාධියෙන් මෙන් යයි. සිටියි. හිඳියි. නිදයි. ධ්‍යාන ලද්දකු මෙන් වේ. යම් ඉරියව් තබන මනාසේ තබන බැම හැකිලීම, විශ්මය වීම් යන මේවා ඉරියාපථ සංඛ්‍යාත කොහොන්වත් යයි කියනු ලැබේ.

එහි **පච්චය පටිසේවන සංඛතො** යනු ප්‍රත්‍ය සේවනයෙන් **සාමන්ත ජප්පිතෙන** සමීපයෙහි සිට කතා කරන්නා විසින් **ඉරියාපථස්ස** සිව් ඉරියව් ඇත්තාගේ **අට්ඨපනා** ආදී තැබීම, ආදරයෙන් හෝ තැබීම. **ඨපනා** තබන ආකාරය. **සණ්ඨපනා** අභිසංස්කරණය, පැහැදවීම් කරන ස්වභාව යයි කියන ලද්දේ වේ. **භාකුටිතා** පෙරට සිටි ස්වභාවය දැක්වීමෙන් බැම හැකිලීම. මුඛය හැකිලීම යයිද කියන ලද්දේ වේ. බැම හැකිලීම ඔහුගේ ස්වභාවයයි යනු **භාකුටිතා** වේ. භාකුටිභාවය **භාකුටියං කුහනා** යනු විශ්මය දැක්වීමය. විශ්මයේ මග **කුහායනා** වේ. කුහිතයාගේ භාවය **කුහිතං** වේ.

ලප නිද්දේසයෙහි **ආලපනා** යනු විහාරයට පැමිණි මිනිසුන් දැක පින්වතුන් පැමිණියේ කුමකටද? කිම භික්‍ෂූන්ට ආරාධනා කිරීමටද? එහෙම නම් යන්න. මම භික්‍ෂූන් වහන්සේලා රැගෙන පසුව එන්නෙමි යයි මෙසේ මුලින්ම කතාකිරීම නැතහොත් තමා දක්වා මම තිස්ස වෙමි. රජ මා කෙරෙහි පැහැදී සිටී. අසවල් අසවල් රාජමහාමාත්‍යවරු පැහැදී සිටිති යයි මෙසේ තමා ප්‍රධානකොට කථාකිරීම ආලපනා වේ. **ලපනා** අසන දෙයට සිහියෙන් කියන ලද ආකාරයේ කථා කිරීම. **සල්ලපනා** ගෘහපතීන්ට කලකිරී බියට අවකාශ දී මනාකොට කථා කිරීම. **උල්ලපනා** මහකෙළඹියා මහා භවිකයා, මහා දානපතිය මෙසේ උසස්කොට කතා

කිරීමයි. සමුල්ලපනා හැම අංශයෙන්ම උසස්කොට කතාකිරීම උන්නහනා උපාසකවරු එබඳු කාලයෙහි දන් දුන්නා. දැන් ඇයි නොදෙන්නෙ? මෙසේ දෙනවා කියනතුරු උඩට ඔසවා කතාකිරීම උඩට බැඳීම.

එසේ නැතහොත් අතේ උක් දණ්ඩක් දැක උපාසකය, කොහි සිට එන්නේදැයි අසයි. ස්වාමීනි, උක් කෙතේ සිට. එහි උක් පැණිරසද? ස්වාමීණි වළඳාම බලන්න යයි භික්ෂුවට උක් දෙන්නේ යයි කීමට වටී. මෙබඳු වූ පෙලන්නා වූ කථා උන්නහනා යයිද හැම අතින්ම නැවත නැවත වෙළීම සමුන්නහනා ද වේ. උක්කාචනා යනු මේ පවුල මං ගැන පමණ දන්නෙ, ඒ පවුලෙ මොනවා හෝ දෙන දෙයක් ඇතිවුනොත් මටමයි දෙන්නෙ යයි ඔසවා කීමයි. උද්දීපනය කිරීම යයි කියන ලදී. භික්ෂු දෙනමක් එක ගමකට පිවිස ආසන සාලාවේ හිඳ එක් කුමරියක දැක කැඳවූහ. ඇය පැමිණි පසු, ස්වාමීණි මේ කාගේ දුවක්ද? මේ අපේ උපස්ථායිකා තෙලකන්දරිකාගේ දුව. ඇවැත්නි, ඇගේ මව මා ගෙට ගියවිට ගිතෙල් දෙන්නේ කලයෙන්මය. මැයද මව මෙන් කලෙන්ම දෙන්නී යයි උස්කොට කියයි.

හැම අතින්ම නැවත නැවත උක්කාචනා කිරීම සමුක්කාචනා වේ. **අනුප්පියභාණිතා** යනු සත්‍යයට අනුරූපස හෝ ධර්මයට අනුරූපද හෝ නොබලා නැවත නැවත පියවීමට කතාකිරීම. **චාටුකම්පතා** යනු පහත් පැවැත්මයි. තමා පහත් තැන තබා පැවතීමයි. **මුග්ග සූප්පතා** මුං ව්‍යංජනය සමානය. සමහර මුංඇට නොතැම්බේ. මෙසේ සමහර පුද්ගලයෙකුගේ වචනවල සත්‍ය ටිකක් ඇත. අනිත් සේරම බොරුය. මේ පුද්ගලයා මුග්ගසූප්ප යයි කියනු ලැබේ. ඔහුගේ ස්වභාවය මුග්ගසූප්පතා වේ. **පාරිභට්ටතා** යනු පාරිභට්ටනයයි. යමෙක් කිරිමවක් මෙන් කුලදරුවන් ඇකයේ හෝ ශරීරයේ හෝ වඩාගෙන සුරතල් කරයි. ධරයි යන අර්ථයයි. ඒ පරිභවයාගේ ක්‍රියාව හෝ පාරිභට්ට වේ. පාරිභට්ටයාගේ ස්වභාවය පාරිභට්ටතා වේ.

නෙමිත්ත කතා නිද්දේසයෙහි **නිමිත්තං** යනු කිසියම් කෙනෙකුගේ දන්දීම සඳහා කයින් සහ වචනයෙන් කෙරෙන ඇඟවීමයි. **නිමිත්ත කම්මං** නිමිති ඇතිකරන දක්‍ෂතාවයි. ඊට කථා වස්තුවක් - එක් පිණ්ඩපාතික ස්වාමීන් වහන්සේ නමක් උපස්ථායක කම්මල්කරුවකුගේ ගෙදරට ගොස් ඇයි ස්වාමීණි අසනු ලැබූ කල්හි සිවුර ඇතුලෙන් අත බැහැරකොට කුඩා

පිහියකින් කපන ආකාරය පෙන්වීය. ස්වාමීන් වහන්සේ මට දන්නැව්වේ පිහියක් යයි සිතා පිහියක් හදා දුන්නේය. **ඔභාසො** යනු ප්‍රත්‍ය සම්බන්ධ කථාය. **ඔභාසකම්මං** යනු ගව පාලකයන් දැක මේ හරක් කිරිහරක්ද? මෝරු හරක්දැයි අසා කිරිහරක් යයි කීකල්හි කිරිහරක් වෙන්න බෑ. කිරිහරක් නම් භික්ෂූන් වහන්සේටත් කිරි ලැබෙන්නේය. මේ ආදි නයින් ඔවුන්ගේ දෙමාපියන් නිවේදනය කරවා කිරි ලබාගැනීම ඔභාස කරණ යයි. **සාමන්තජප්ප** සමීප කොට කතා කිරීමයි.

ජාතක භාණක වස්තුව මෙහිදී කිවයුතුය. එක් ජාතක භාණක තෙරනමක් වළඳනු කැමතිව උපස්ථායිකාවගේ ගෙදරට ගොස් හුන්නේය. ඕ තොමෝ නොදෙනු කැමැත්තී ස්වාමීනි හාල් නැතැයි හාල් ගෙනෙනු කැමතිව මෙන් අල්ලපු ගෙදරට ගියාය. භික්ෂුව ඇතුළු ගැබට පිවිස බලන්නේ ජනෙල් කෙළවර උක් භාජනයෙහි හකුරු මුලක් පැසෙහි ලුනුමාළු පලුවක් හැලියෙහි හාල් කලයේ ගිතෙල් දැක නික්මී හුන්නේය. ගැහැණිය හාල් නැතැයි ආවාය. තෙර උපාසිකාවෙනි, අද මට භික්ෂාව සම්පාදනය නොවන්නේ යයි කල් ඇතිව නිමිත්තක් දැක්කෙමියි කීහ. මොකක්ද ස්වාමීන් වහන්ස, ජනෙල් කෙළවර තබා ඇති උක්දඬුව වගේ නාගයෙක් දැක්කෙමි. ඌට පහර දෙන්නෙමියි බලන්නේ භාජනයෙහි තබන ලද හකුරු ගුල් මෙන් ගල්කැටවලින් ගසන ලද නයා පැසෙහි තබන ලද ලුනුමාලු පලුව මෙන් පෙණය ඌ ඒ ගල්කැටය දෂ්ට කරනු කැමති වූ හැලියේ හාල් මෙන් උගේ දත් කිපියා වූ උගේ කලයේ බහා ඇති ගිතෙල් මෙන් කටින් පිටවූ විසමිශ්‍ර කෙළෙ යයි. ඕ තොමෝ මුණ්ඩකයින් රැවටීමට නොහැකි යයි උක් පිළිගන්වා බත්පිස ගිතෙල් සකුරු මාලු සමගින් දුන්නාය. මෙසේ සමීපකොට ජප්පනය සාමන්ත ජපන්නයෙහි දතයුතුය. **පරිකථා** යනු ලැබෙන තුරු පෙරළ පෙරළා කරන කථාවයි.

නිප්පෙයිකතා නිද්දේසයෙහි **අක්කොසනා** යනු දශ ආක්‍රෝෂ වස්තුවලින් ආක්‍රෝශ කිරීමයි. **වම්භනා** යනු පරිභවකොට කතා කිරීමයි. **ගරහනා** යනු ශ්‍රද්ධාව නැත්තේය. ප්‍රසන්න නොවේය ආදි ආකාරයෙන් දෝෂාරෝපණය කිරීමයි. **උක්ඛෙපනා** යනු ඒව මෙහෙ කියන්ඩ එපා යයි වචනයෙන් නිශ්ශබ්ද කිරීමය. වස්තු සහිතව හේතු සහිතව හැම අංශයකින්ම උක්ඛෙපනය **සමුක්ඛෙපනා** නම් වේ.

එසේ නැතහොත් නොදෙන්නෙකුට අහෝ දානපති යයි මෙසේ උක්ඛෙපනය **උක්ඛෙපනා** වේ. මහා දානපති යයි මෙසේ මනා ලෙස උක්ඛෙපනය සමුක්ඛෙපනා වේ. **ඛිපනා** යනු මේ ජීවිතයෙන් පලේ මොකක්ද ධාන්‍ය බෝජනය මෙසේ දෙකටම නැති කතාය. **සක්ඛිපනා** මේ ආදායකගෙන් ඇති වැඩේ කුමක්දැයි කියයි. හේ හැම කාලයේම හැමදෙනාට නැත යන වචනය පමණක් දෙයි. මෙසේ උප්පණ්ඩනය කිරීම. **පාපනා** නම් නොදෙන්නාගේ නුගුණය පැමිණවීම පාපනා වන අතර හැම අතින්ම පැමිණවීම **සම්පාපනා** නම් වේ. **අවණ්ණහාරිකා** ගෙයින් ගෙට ගමින් ගමට අවණ්ණය ගෙන යන්නා. **අවණ්ණ හාරිකා** වේ. **පරපිට්ඨිමංසිකා** ඉදිරියේ මිහිරි කොට කියා අනභිමුඛයෙහි අවණ්නය කිරීම, මේ තෙමේ අභිමුඛයෙහි බැලීමට නොහැකිව පරමුඛයෙහි පිට මස් කනවා මෙන් වේ. අයං වුච්චති **නිප්පෙසිකතා** උණපතුරු මෙන් අනුන්ගේ ගුණ පිසදමයි. සුවඳ ජාති පිස සුවඳ සොයනවා මෙන් අන්‍යයන්ගේ ගුණ සුණුකොට මෙය ලාබ සෙවීමය.

ලාභෙන ලාභං නිජිගිංසනතා නිද්දේසයෙහි **නිජිගිංසනතා** යනු සෙවීමය. **ඉතොලද්ධං** මේ ගෙදරින් ලද. **අමුත්‍ර** යනු මේ ගෙහි. **එට්ඨී** යනු කැමැත්තයි. ගවෙට්ඨී යනු සෙවීමයි. **පරියෙට්ඨී** යනු නැවත නැවත සෙවීම. මුලපටන් ලැබුණු ලැබුණු භික්‍ෂාව ඒ ඒ කුලදරුවන්ට දී අවසානයේ කිරි හා කැඳ ලැබී ගිය භික්‍ෂු වස්තුව මෙහි කිවයුතුය. **එසනා** එට්ඨී යනාදියෙහි සමාන වචනය. එහෙයින් එට්ඨී යන එසනාය. පරියෙට්ඨී - පරියේසනාය. මෙසේ යෙදිය යුතුය.

සෙය්‍යමාන නිද්දේසයෙහි **ජාතියා** යනු ක්‍ෂත්‍රියභාවාදී ජාති සම්පත්තියයි. **ගොත්තෙන** යනු ගෞතම ගෝත්‍ර ආදියෙන් උත්කෘෂ්ට ගෝත්‍රයෙන් **කොල පුත්තියෙන** මහකුල බැවින් **වණ්ණ** පොක්ඛරතාය වර්ණ සම්පන්න ශරීරයෙන් ශරීරයෙහි සෝභනත්වය යයි කියනු ලැබේ. ඔහුගේ වර්ණ සම්පත්තියෙන් අභිරූප භවයෙන් යන අර්ථයයි. ධනෙන යනාදිය ප්‍රකටය. **මානං ජප්පෙති** යන මේ ආදියෙහි කිසියම් වස්තුවකින් යෙහෙකැයි මානය පවත්වයි කරයි.

සදිස මාන නිද්දේසයෙහි **මාන ජප්පෙති** යන මේවායෙහි යම්කිසි වස්තුවකින් සමාන වෙමියි මානය පවත්වයි. මෙහි අර්ථ වශයෙන් විශේෂත්වය මෙයයි. පෙලෙහි නානා කරණය නැත.

හීනමාන නිද්දේසයෙහි **ඔමානං ජප්පෙති** යනු යට කියන මානය පවත්වයි. ඔමානො ලාමක පහත් මානයයි. **ඔමඤ්ඤනා ඔමඤ්ඤිතත්තං** යනු ආකාර ස්වභාව නිර්දේශයයි. **හීළනා** ජාති ආදියෙන් ආත්ම පිළිකුල් කිරීමෙන් **ඔහීළනා** යනු අතිරේක වශයෙන් හීලන කිරීමයි. **ඔහීළතත්තං** එහිම භාවය දැක්වීමය. **අත්තඤ්ඤා** තමා හීනකොට තැකීම. **අත්තාවඤ්ඤ** තමා අවඥා කොට සිතීම **අත්තපරිභවො** ජාති ආදි සම්පත්ති නවයම ලැබුවේ යයි තමාට පරිභවකොට සිතීම. මෙසේ මේ මාන තුන පුද්ගලයකු නිසා නොව ජාති ආදි වස්තු වශයෙන් කියන ලදී. ඒවායේ එකිනෙකෙහි සෙය්‍ය සදිස හීන උපදී. එහි සෙය්‍ය වශයෙන් මානය තමා උසස් වශයෙන් ඇති මානය. සදිස මානය තමා සමාන වශයෙන් සිතෙහි ඇතිවන මානය, හීනමානය තමා හීනයයි සිතින් ඇතිවන මානය.

එහි කතමො **සෙය්‍යස්ස සෙය්‍යොහමස්මි** යනාදිය නව මාන පුද්ගලයන් නිසා කියන ලදී. ඒවායේ එක එකක තුන බැගින් උපදී. එහි දහති යන තබයි. **තං** නිස්සාය එය උසස් වශයෙන් තැබීම නිසා.

මෙහි **සෙය්‍යස්ස සෙය්‍යොහමස්මි** යනු මානය රජවරුන්ටද පැවිද්දන්ටද උපදී. රජ රටෙන් ධනයෙන් වාහනවලින් මා හා සමාන කෙනෙක් කොහෙ සිටීද? යන මේ මානය ඇතිවේ. පැවිද්දාටද සීල ධුතංගාදියෙන් මා හා සමාන කෙනෙක් ඇත්දැයි මේ මානය ඇතිවේ. සෙය්‍යස්ස සමාන මානයද මෙසේම උපදී. රජ රටින් ධනයෙන් වාහනවලින් අනිත් රජුන් සමග කිම වෙනසක් වේද?යි මේ මානය ඇතිවේ. පැවිද්දාටද සීල ධුතංගාදියෙන් අන්‍ය භික්ෂුවක් සමග මගේ ඇති වෙනස්කම කුමක්ද?යි මේ මානය ඇතිවේ. සෙය්‍යස්ස හීනවෙමි යන මානයද මෙසේම උපදී. රජතුමාට රට හෝ ධනය හෝ වාහනාදිය හෝ සම්පන්න නොවේ. ඒ බව රජ යන ව්‍යවහාර පහසුව සඳහා පමණය. මම මොන රජෙක්දැයි මේ මානය උපදී. පැවිද්දාටද අල්පලාභ සත්කාර ඇති මම ධර්මකථික බහුස්සුත මහාථෙර යනු කතාවට පමණකි. මොන ධර්ම කථිකයෙක්ද මම? මොන බහුස්සුතයෙක්ද මොන මහතෙර නමක්ද මම යයි යමෙකුට ලාභ සක්කාර නැතැයි මේ මානය ඇතිවේ.

සදිස්සස සෙය්‍යොහමස්මි යන මානාදිය ඇමති ආදීන්ටද උපදී. ඇමතියා වනාහි රට ඇත්තෙකි හෝ භෝග යාන වාහනාදියෙන් මා හා සමාන වෙන කවරෙක් ඇද්දැයි හෝ අන් අය හා සමග මට මොනවා

අඩුදැයි නා නා කාරණ වශයෙන් හෝ මට නම් ඇමති නාමය පමණක් යයි කැම ඇඳීම් පමණක්වත් මට නැත. කිම මම ඇමතියෙක් වෙම්දැයි මේ මානය උපදී.

හීනස්ස සෙය්‍යොහමස්මි යන දාසාදීන්ටද උපදී. දාසයා මව පැත්තෙන් හෝ පියා පැත්තෙන් හෝ මා හා සමාන වෙනත් දාසයෙක් සිටිනවාද? අනිත් අය ජීවත්විය නොහැකිව බඩ නිසා දාස නම් විය. මම වනාහි ප්‍රවේණියෙන් පැමිණි නිසා උසස් වෙමියි හෝ ප්‍රවේණියෙන් ආ හෙයින් උභතෝ සුද්ධ දාසභවයෙන් අසවල් දාසයා සමග මගේ අඩුව කුමක්දැයි හෝ බඩ නිසා මම දාස භවයට පැමිණියෙමි. මා පිය කෙළවරින් මට දාස භාවයක් නැත. කිම මම දාසයෙක්ද? හෝ මොවුන්ට මානය උපදී. දාසයන් මෙන් පුක්කුස චණ්ඩාල ආදීහුද යන මොවුන්ටද මානය ඇති වේ.

මෙහිද ශ්‍රේෂ්ඨයාට ශ්‍රේෂ්ඨ වෙමියි උපදින මානයම ඇති සැටියෙන් ඇති මානයයි. ඉතිරි දෙක ඇති සැටියෙන් වූ මාන නොවේ. එසේම සමානයාට සමාන වෙමියි යන මානයද හීනයාට හීනවෙමියි උපන් මානයද යාථාව මානය වේ. ඉතිරි දෙක අයාථාව මානය. යාථාව මානය අරහත් මාර්ගය අත්හැරය. අයාථාව මානය සෝවාන් මාර්ගය අත්හැරය. මෙසේ වස්තු සහිත මානය කියා දැන් අවත්‍ථුක මානය උපන් මානයමයයි දැක්වීමට **තත්‍ථ කතමො මානො** යනාදිය කියන ලදී.

අතිමාන නිද්දේසයෙහි පුද්ගලයන් නොගෙන ජාති ආදියේ වස්තු වශයෙන්ම දක්වන ලදී. එහි **අතිමඤ්ඤති** යනු ජාති ආදියෙන් මා හා සමානයෙක් නැතැයි ඉක්මවා සිතයි. මානතිමාන නිද්දේසයෙහි **සො එවරූපො** යනු මේ යමෙක් පෙර මා හා සමානව දැන් මම ශ්‍රේෂ්ඨ වෙමි. මේ අය හීනතරයයි උපන් මානය මෙය බරෙනුත් ඉතා බරයයි මෙන් පෙර සමාන මානය ගෙන මාණාති මාන යයි දැක්වීමට මෙසේ කීහ. ඔමාන නිද්දේසය හීන මාන නිද්දේසය හා සමානය. වෙනෙය්‍ය වශයෙන් එය හීනයයි මනී. මෙය ඕමාන නම් වේ. තවද මෙහි ඔබ ජාතිමත් කවුඩකු මෙන් ඔබත් ඒ ජාතියේය. ගෝත්‍රයෙන් චණ්ඩාල ගෝත්‍රය මෙනි. ඔබේ හඬ කාක් හඬක් මෙන් මෙසේ තමා පහත්කොට පැවතීම වශයෙන් මෙය ඕමාන යයි දතයුතුය.

අධිමාන නිද්දේසයෙහි **අප්පත්තෙ පත්ත සඤ්ඤිනා** යනු චතුසත්‍යාවබෝධයට නොපැමිණ, පැමිණි සංඥා ඇති බව. **අකතෙ** යනු සතර මගින් කළයුතු කිස නොකළ කල්හිම. **අනධිගතෙ** චතුසත්‍ය ධර්ම අවබෝධ නොවූ කල්හි **අසච්ඡිකතෙ** සාක්‍ෂාත් නොකළ කල්හි **අයං වුච්චති අධිමානො** මෙ අවබෝධ කළැයි යන මානය යයි කියනු ලැබේ. මෙය කාට උපදීද? නූපදින්නෙ කාටද? ආර්ය ශ්‍රාවකයන් වහන්සේට නූපදී. උන්වහන්සේට මාර්ගඵල නිර්වාණ ඇති ප්‍රහීණ කෙලෙස් සහ ඉතිරි කෙලෙස් ප්‍රත්‍යවේක්‍ෂාවෙන්ම හටගත් සොම්නස් ඇත්තේ ආර්යගුණ ප්‍රතිවේදයෙන් සැක නැත්තේය. එසේ හෙයින් සෝවාන් වූවන්ට සකෘදාගාමි යයි ආදි වශයෙන් මානය නූපදී. දුස්සීලයාට ද නූපදී. හේ ආර්යගුණාදියෙහි ආශා නැත්තේය. කමටහන් අත්හළ නින්දෙහි ඇලීම් ආදියෙන් යුත් සිල්වතාටද නූපදී. කමටහනෙහි අප්‍රමාද වූ නාමරූප මෙනෙහි කිරීම් ඇති ප්‍රත්‍ය විමසීමෙන් යුත් දුරුකළ සැක ඇති ත්‍රිලක්‍ෂණයට නගා සංස්කාරයන් සම්මර්ශනය කරන වීර්යයෙන් යුත් විදර්ශනාව ඇති පිරිසිදු සීලවන්තයාට උපදී. සුද්ධ සමථලාභියාට හෝ සුද්ධ විදර්ශනා ලාභියාට උපන් කල්හිද අනතුර තිබේ. හේ දස වසක් විසිතිස් වසක් කෙලෙස් හැසිරීම නොදක්නේ මම සෝවාන් වූයෙමි හෝ සකදාගාමි වෙමි හෝ අනාගාමී වෙමි හෝ යයි සිතයි. සමථ විපස්සනා ලාභියා රහත්වීමියි සිතයි. ඔහුගේ සමාධි බලයෙන් කෙලෙස් විෂ්කම්භනය කොට විදර්ශනා බලයෙන් සංස්කාර මනාව ගන්නා ලදී. එනිසා හැටවසක් අසූවසක් වර්ෂ සීයකිනුදු කෙලෙස් නොහැසිරේ. රහතන් වහන්සේටම චිත්තාචාරය වේ.

හේ මෙසේ බොහෝ කාලයක් කෙලෙස් හැසිරීමක් නොදක්නේ අතර නොසිට මම රහත්වී යයි සිතයි. උඩමළුව වාසී මහානාග තෙරුන් මෙන් හංකතකවාසී මහාදත්ත තෙරුන් මෙන් සිතුල්පව්වේ 'නිංකපොණ්ණක' පියන්ගලු වැසි චුල්ල සුම්ම තෙරුන් මෙන්ද, ඒවායින් එක් කතා වස්තුවක් දැක්වීම. මාලිකවාසී ධම්මදින්න තෙරුන් වහන්සේ වනාහි පටිසම්භිදා සහිත රහත් වූ මහා ක්‍ෂීණාශ්‍රවයන් වහන්සේ නමකි. භික්‍ෂු සංඝයා මහත් පිරිසකට අවවාද දෙන්නෙක්ව වැඩ විසූහ. උන්වහන්සේ එක දවසක් තමන් වහන්සේගේ දිවා ස්ථානයේ හිඳ උඩමළුව වාසී මහානාග නම් සිය ආචාර්යවරයාගේ මහණදම් කෙසේදැයි ආවර්ජනා කරන්නේ පෘථග්ජන භාවයෙහිම සිටි බව දැන මා නොගියොත් පෘථග්ජනවම අපවත් වන්නේ යයි සිතා අහසට නැගී දිවා ස්ථානයෙහි සිටි තෙරුන් ලඟ බැස වැඳ වත් දක්වා එකත්පසක සිටියහ. ඇවැත්නි,

ධම්මදින්න කිම අකාලයේ පැමිණියේ? ස්වාමීන් වහන්ස, ප්‍රශ්නයක් අහගන්ටයි ආවේ. අසන්න, දන්නවා නම් කියන්නෙමි යයි කී කල්හි ප්‍රශ්න දහසක් විචාළහ. ඇසූ ඇසූ ප්‍රශ්නවලට කිසි සූදානමක් නැතිව පිළිතුරු දුන්හ. ඉක්බිති ස්වාමීන් වහන්සේ නුවණ ඉතා සියුම්ය. ඔබවහන්සේ මේ ධර්මය අවබෝධ කෙළේ කවදාද? ඇවැත්නි, මෙයින් අවුරුදු හැටකට පෙරාතුවය. ස්වාමීනි, සමාධි පුහුණුවීද? ඇවත්නි, එය බැරෑරුම් නොවේ. එසේනම් ස්වාමීන් වහන්ස, එක ඇතෙක් මවන්න. තෙරුන් වහන්සේ සුදු ඇතෙක් මැවූහ. දැන් ස්වාමීනි මේ ඇතා කන් ඔසවාගෙන වලිගය දිගහැර හොඬ මුඛයෙහි තබා බියජනක කුඤ්චනාද කරන්නේ ඔබවහන්සේ අභිමුවට එන ආකාරයට කරන්න. තෙරුන් වහන්සේ එසේ කොට වේගයෙන් එන ඇතාගේ බියජනක ආකාරය දැක නැගිට පලායාමට සැරසුනේය. රහතන් වහන්සේ අත දිගුකොට සිවුරු කොනෙන් අල්ලා ස්වාමීණී, ඛීණාශ්‍රවයන්ට ඇලීම් නම් වේදැයි කීහ. එවේලේ තමන්ගේ පෘථග්ජනකම දැක ඇවැත්නි, ධම්මදින්න, මට උදව්වන්නැයි කියා පාමුල උක්කුටිකව උන්හ. ස්වාමීනි, ඔබවහන්සේට උදව්වීමට මා පැමිණියේ නොසිතනු මැනවැයි කියා කමටහන් කීහ. තෙරුන් වහන්සේ කමටහන් ගෙන සක්මනට නැගී තුන්වන පියවරේදී අග්‍රඵලය වූ රහත්බවට පැමිණියහ. තෙරුන් වහන්සේ වනාහී දෝස චරිතයකු වූහ.

අස්මිමාන නිද්දේසයෙහි, රූපං අස්මීති මානො රූපය යයි උපන් මානය ඡන්දො මාන අනුගත වූ ඡන්දය අනුසයද එසේය. වේදනාදියෙහි ද මෙම නයයි.

මිච්ඡා මාන නිද්දේසයෙහි පාපකෙන වා කම්මායතනෙන යනාදියෙහි පාප කර්මායතන නම් කෙවුළු මසුන් මරණ වැදි ආදීන්ගේ කර්මයයි. පාප සිල්පායතන නම් මසුන්ට දැල් දමන කෙමන් ඇටවීමෙහිද මලපුඩු එලන උල් සිටුවන ආදියෙහිද දක්‍ෂ බව පාප විද්‍යාස්ථාන නම් යමින් අනුන් නසන විද්‍යා පාප ඇසීම් භාරත යුද්ධ පාණ්ඩව ආදි, ජානකී හරණාදියෙන් යුක්ත වූ ඇසීම්. පාප ප්‍රතිභාන නම් දුර්භාෂිත වූ කාව්‍ය නාටක වැලපීම් ආදි පටිභානය. පාපසීල නම් එළුසිල් ගව සිල් පාප වත් අජවත් ගොවත් පාපදිට්ඨී නම් දෙසැට දෘෂ්ටිවලය අයත් කිසියම් දෘෂ්ටියක්.

ඥාති විතක්ක නිද්දේසාදියෙහි මගේ නෑයෝ සැපසේ ජීවත් වෙති. සම්පත් ඇත්තෝය. මෙසේ පස්කම් ගුණ යුක්ත වූ ගෙදරට ඇති ප්‍රේමයෙන්

නැයින් අරබයා උපන් සිතුවිලිම ඤාති විතක්ක නම් වේ. ක්‍ෂය වූ ව්‍යය වූ ශ්‍රද්ධා ප්‍රසන්න යයි මෙසේ පවතිනා ඤාති විතක්ක නම් නැත. අපගේ ජනපදය සුභික්‍ෂය. සස්‍ය සම්පන්න යයි සතුටුවන සිතට ගෙහසිත ප්‍රේම වශයෙන්ම උපන් විතර්ක ජනපද විතක්ක නම් වේ. අපේ ජනපදයේ මිනිස්සු ශ්‍රද්ධාවන්තය. ප්‍රසන්නය. බය ගත වයගත යයි මෙසේ පවතින ජනපද විතර්කයක් නම් නැත. අමරවීම සඳහා ඇතිවන සිතිවිලි අමර විතක්ක නම් වේ. එහි උක්කුටිකයෙන් සිටීමේ වීර්යාදියෙන් දුකෙහි නිර්ජීර්ණයෙන් ආත්මයට සැප වේයයි අමර යයි දුෂ්කර කාර්ය කරන්නාට ඒ දුෂ්කර කාර්යයෙන් යුක්ත වූ විතර්කය අමර පිණිස විතර්කය නම් වේ. දෘෂ්ටිගතිකයා වනාහි ශාස්වතය. නියතවාදදැයි ආදිය විචාළවිට මෙසේද නොවේ. එසේද නොවේ. වෙනත් අයුරකින්ද නොවේ. නැත්තේ නොවේ. නැත්තේ නොවන්නේ ද නොවේ. නැතැයි වික්ෂේපයට පැමිණේ. හේ ඒ දෘෂ්ටියෙන් යුක්ත වූයේ විතර්ක කරන්නේ අමර නම් මත්සයා ජලයෙන් මැරීමට නොහැකිය. එහාට මෙහාට දුවයි. ගැනීමට නොඑයි. එසේම එක ස්ථාවරයක නොසිටින බැවින් නොමැරිය හැකියයි අමර නම් වේ. ඒ දෙකම එකක් කොට අයං වුච්චති අමර විතක්කො යයි කියන ලදී.

පරානුද්දයතා පටිසංයුත්තො යනු දයාව ප්‍රතිරූපයෙන් ගෙහසිත ප්‍රේමයෙන් යුක්තව. සහ නන්දී යනාදියෙහි උපස්ථායකයින් සතුටුවන කල්හි සෝකවන කල ඔවුන් සමග දෙගුණයක් සතුටු වේ. දෙගුණයක් සෝක වේ. ඔවුන් සැපවත් වන කල්හි දෙගුණයක් සැපවත් වේ. දුක්වන කල්හි දෙගුණයක් දුක් වේ. උප්පන්නෙසු කිච්ච කරණීයෙසු ඔවුන්ට මහත් වූ හෝ කුඩා වූ හෝ කටයුතු පැමිණි කල්හි. අත්තනා වා යොගං ආපජ්ජති ඒ ඒ කෘත්‍ය කරන්නේ පැණවීම් ඉක්මවයි. කෙලෙස් කෝප කරවයි. යො තත්‍ථ යමෙක් ඒ හා බැඳුණු වාසයෙහි හෝ ඒ කාර්යයෙහිදී ගෙදර සම්බන්ධ විතර්කය. මෙය පරානුද්දයතා පටිසංයුත්ත විතර්කය නම් වේ.

ලාභ සත්කාර සිලොක පටිසංයුත්තො යනු චීවාරාදී ලාභයෙන්ද සත්කාරයෙන්ද කීර්තියෙන්ද අරමුණු වශයෙන් යුක්ත. අනවඤ්ඤත්ති පටිසංයුත්තො යනු අන්‍යයෝ මා අවමන් නොකරන්නේ නම් තළා පෙළා කථා නොකරන්නේ නම් කොයිතරම් හොඳදැයි මෙසේ අපැහැදිලි බවින් පැතීම් සහිත උපන් සිතිවිලි. යොතත්‍ථ ගෙහසිතො යමෙක් ඒ අවස්ථාවේ අන්‍යයෝ මා අවමන් නොකළහයි උපන් සිතේ පඤ්චකාම

ගුණ සංඛ්‍යාත ගෙහ සිතින් යුතුව උපන් විතර්කය. සෙසු සියල්ල ප්‍රකටය.

ඒකක නිද්දේසයයි.

දෙවන කොටසෙහි ක්‍රෝධ නිද්දේසාදිය යට කියන ලද ආකාරයෙන් දතයුතුය. පසුගිය අනාගත උපනාහ විස්තරයෙහි ක්‍රෝධයේ මුල් අවස්ථාව **උපනය්හති** වේ. පසු අවස්ථාව **උපනාහ** නම්. උපනය්හනාකාර පමුණුවන ආකාරය **උපනය්හනා** වේ. පැමිණවූ ආකාරයේ භාවය **උපනය්හිතත්තං** වේ. **අට්ඨපනා** යනු පළමු උපන් දේ අනතුරුව තැබීම. සීමා වේ. අවසානය දක්වා තැබීම. **ඨපනා** ප්‍රකෘති තැබීම. **සණ්ඨපනා** හැම අංශයකින්ම ආඝාතය තැබීම. **අනුසංසන්දනා** පළමුව උපන් ක්‍රෝධය සමග අතරක් නොදක්වා තබාගැනීම **අනුප්පබන්ධතා** පෙර හා පසු සම්බන්ධ කිරීම. **දළ්හී කම්මං** ස්ථිර කිරීම. **අයං වුච්චති** මේ වෙළන ලද ලක්‍ෂණය වූ වෛරය අත්නොහරින කෘත්‍ය ඇත්තේ උපනාහයයි කියනු ලැබේ. එයින් යුක්ත පුද්ගලයාට වෛරය අත්හැරීමට නොහැකි වේ. මෙබඳු වූ මට මෙසේ කියන්ට නොසුදුසු යයි නැවත නැවත ලුහුබඳියි. ඇවිලගත් ගිනි පෙනෙල්ලක් මෙන් දැල්වේමය. සෝදනු ලබන වලස් සමක් මෙන් වුරුණු තෙලෙහි බහන ලද රෙදිකැබැල්ලක් මෙන්ද පිරිසිදු නොවේ.

මැකීම් වශයෙන් **මක්ඛො** අනුන් ගුණ මැකීමෙන් පවත්වන්නා වූද තමාගේ ඇඟේ අසූචියෙන් පහරදෙන්නා සේ අසූචිය මෙන් පළමුවම ගෑවේය යන අර්ථයයි. ඉන්පසු ආකාරයන් දෙකකින් යුත් විස්තරය කර්කශභාවය **නිට්ඨුරියං** වේ. ඔහු නිසා මෙපමණවත් නැතැයි කෙල ගසයි යනු අර්ථයයි. **නිට්ඨුරිය කම්මං** කර්කශ වීම ගිහියෙක් ගිහියෙකු භික්‍ෂු නමක් භික්‍ෂු නමක් නිසා වසන්නේ අප්‍රමාණව කිපී ඔහු නිසා මෙපමණවත් නැතැයි කියා කෙලගසා පයින් මඩින්නාක් (පාගන්නාක්) මෙන් කර්කශ භාවයෙන් යුක්ත වේ. ඔහුගේ ඒ කර්මය නිට්ඨුරිය කර්මයයි කියනු ලැබේ. මෙහි ලක්‍ෂණ වශයෙන් අනුන්ගේ ගුණ මැකීමය. ඒවා විනාශ කිරීම කෘත්‍යයයි. අනුන් විසින් කරන ලද යහපත් ක්‍රියා වැසීම වැටහෙන ආකාරයයි අනුන්ගේ දොස් කියනුයි **විලාසා** අනුන්ගේ ගුණය දක්වා තමාගේ ගුණවලින් සමාන කෙරේ යන අර්ථයයි. පලාසයගේ ආයනම (පැමිණවීම) **පලාසායනා** වේ. පලාසය ද තමාගේ ජය ගෙන

ඒමෙන් ආහාරය **පලාසාහාරො** වේ. **විවදට්ඨානං** විවාද කරුණ. **යුගග්ගාහො** යනු සමසේ කරගැසීම **අප්පටිනිස්සග්ගො** යනු තමා ගන්නා ලද දේ අත් නොහැරීමය. ලක්ෂණ වශයෙන් තරඟ කිරීමය. රස වශයෙන් අනුන්ගේ ගුණයෙන් තමාගේ ගුණ සමකිරීමය. අන්‍යයන්ගේ ගුණ ප්‍රමාණයෙන් වැටහෙන ආකාරය සහ පදස්ථානය වේ. පලාසී පුද්ගලයා දෙවැන්නාට අවස්ථාවක් නොදෙයි. සමානව දිගහැර සිටියි. සාකච්ඡා මණ්ඩලයෙහි අනිත් භික්ෂුවක් බොහෝ සූත්‍රවලින් කරුණු ඉදිරිපත් කළත් ඔබේ සහ මගේ වාදයෙහි මොකක්ද ඇති වෙනස? මැදින් බිඳුණු රන් බඳුනක් මෙන් අපගේ වචන එක සමාන නොවේදැයි කියයි. **ඉස්සා මච්ඡරිය** නිද්දේස කියන ලද අර්ථ ඇත්තේම වේ.

මායා නිද්දේසයෙහි **වාචං භාසති** යනු පැණවීම දැනගෙනම ව්‍යතික්‍රමණය කරන භික්ෂුව බැරෑරුම් කාරියක් කරයි. අපගේ ව්‍යතික්‍රමණය වූ තැනක් නැතැයි උපශාන්තයකු මෙන් කියයි. **කායෙන පරක්කමති** යනු මවිසින් කළ පාපකර්මය කිසිවෙක් නොදනිත්වායි කයින් වත් කෙරෙයි. විද්‍යමාන දොස් වැසීමෙන් ඇස රවට්ටන මායාවක් මෙන් යයි **මායා** වේ. මායාවගේ භාවය **මායාවිතා** වේ. පව කොට නැවත වැසීමෙන් ඉකුත් වූ ඇස රාත්‍රී **අච්චාසරා** වේ. කාය වාක් ක්‍රියාවලින් අන්‍යාකාරයකින් දැක්වීමෙන් වංචා කෙරේ යයි **වඤ්චනා** නම් වේ. මෙයින් ජනයින් වංචා කෙරේනුයි **නිකති** නම් වේ. මිථ්‍යාවක් කෙරේ යන අර්ථයයි.

මා මෙසේ නොකරමියි පව් විසුරුවීම **විකිරණ** නම් වේ. මම මෙසේ නොකරමියි වර්ජනය කිරීම **පරිහරණා** නම් වේ. කායාදි සංවරයෙන් ගුහනා වේ. සෑම අංශයකින්ම ගුහනය වීම **පරිගුහනා** වේ. තෘණපත්‍ර ආදියෙන් අසූචිය මෙන් කාය වචී කර්මවල පාපය වැසීම **ඡාදනා** වේ. සියළුම අංශවලින් වැසීම **පටිච්ඡාදනා** නම් වේ. මතුකොට නොදක්වයි යනු **අනුත්තානි කම්මං** වේ. ප්‍රකට කොට නොදක්වයි යනු **අනාවීකම්මං** වේ. මනාව වැසීම **වොච්ඡාදනා** නම් වේ. කරන ලද වැසීම් වශයෙන් නැවත පාප කිරීමෙන් **පාපකිරියා** යනු වේ. **අයං වුච්චති** මේ කරන ලද වැසීම් ඇති මායාව නමැයි කියනු ලැබේ. මෙයින් සමන්විත පුද්ගලයා අළුයට ගිනිඅඟුරු මෙන් ජලයෙන් වැසී ඇති හුල් මෙන් රෙදිවලින් වෙළූ ආයුධයක් මෙන් වේ.

**සාඨෙය්‍ය** නිද්දේසයෙහි **සඨො** අසත් ගුණ දැක්වීමෙන් මනාව

කතා නොකරන්නෙකි. සියළු අංශවලින් සඨ වූයේ **පරිසඨො** නම් වේ. **යං තජ්ජා** යනු ඒ පුද්ගලයා කෙරෙහි. **සඨං** යනු නැති ගුණ දක්වන කෛරාටිකය **සඨතා** යනු සඨ ආකාරය. (නැති ගුණ දක්වන අයුරු) **කක්ඛරතා** අතගෑමට නොහැකි පියුම් නාලයක් මෙන් රළු පරුෂභාවය. **කක්ඛරියං** යනු එයටම පරියාය වචනයකි **පරික්ඛත්තතා**. **පාරික්ඛත්තියං** යන පද දෙකින් හාරා තබන ලද මෙන් දැඩි කෛරාටිකකම් කියන ලදී. **ඉදං වුච්චති** මේ තමාගේ අවිද්‍යමාන ගුණ ප්‍රකාශ කරන ලක්‍ෂණය සාඨෙය්‍ය නම් යයි කියනු ලැබේ. මෙයින් සමන්විත පුද්ගලයාගේ බඩ හෝ පිට හෝ දැනගැනීමට හැකි නොවේ.

**වමෙන් වෙයි සූකර - දකුණෙන් එළු මුවෝ වෙත්**
**හඬින් එළුවෙක් වේ - අඟින් ගවයෙකි මහළු**

වංක නිර්දේශයෙහි **අනජ්ජවො** යනු ඍජු නොවන ආකාරයයි. **අනජ්ජව** භවය **අනජ්ජවතා** වේ. **ජිම්හතා** යනු සඳ වක් බව මෙනි. **වංකතා** යනු ගෝ මූත්‍ර ඇදය මෙනි. (ගමන් කරන ගොනාගේ මූත්‍ර පාර) **කුටිලතා** යනු නගුලිස කෙළවර ඇදය මෙනි. මේ සියළු පදවලින් කාය වචී චිත්ත වංකතාව කියන ලදී.

මෘදු නොවන නිර්දේශයෙහි මෘදුභාවයක් නැති **අමුදුතා** වේ. මෘදු නොවන ආකාරය **අමද්දවතා** වේ. කැකුළු බව **කක්ඛළියං** වේ. මෘදු කරන සෙනහස නැති ඵරුස බව ඵාරුසියං වේ. පහත් පැවැත්මෙන් ඍජුව සිටි සිතේ ස්වභාවය **උජුචිත්තතා** වේ. එහි විශේෂණය සඳහා නැවත අමුදුතාව ගැසීම අමුදුතා සංඛ්‍යාත උජුචිත්ත භවය අජ්ජව සංඛ්‍යාත උජු චිත්තය නොවේ. අක්ඛන්ති නිද්දේසය ඛන්ති නිද්දේසයට ප්‍රතිපක්‍ෂ වශයෙන් දතයුතුය.

සංයෝජන නිද්දේසයෙහි **අජ්ඣත්තං** යනු කාමභවය. **බහිද්ධා** යනු රූපාරූප භව වේ. කිසියම් සත්වයෙක් කාම භවයෙහි ස්වල්ප කාලයක් ජීවත් වේ. එසේ වුවත් කාම භවයෙහි චුති පටිසන්ධි බොහෝ වෙති. රූපාරූප භවවල අල්පය. රූපාරූප භවවල බොහෝ කාලයක් වසති. යම්තැනක කල්පයකින් හතරෙන් කොටසක් ඉතිරි තුන් කොටසෙහි කාමභවය ශූන්‍ය වේ. හිස්ය. යම්තැනක චුති පටිසන්ධි බොහෝ වෙත්ද එහි ආලයද ප්‍රාර්ථනාද අභිලාෂද බොහෝ වේ. යම්තැනක අල්ප නම්

එතැන අල්පය. එනිසා කාමභවය අජ්ඣත්ත නම් විය. රූපාරූප භව බහිද්ධ වේ. මෙසේ අජ්ඣත්ත භවයෙහි බැඳීම් අජ්ඣත්ත සංයෝජන වේ. බහිද්ධ සංඛ්‍යාත රූපාරූප භවවල බැඳීම් බහිද්ධා සංයෝජන නම් වේ. එහි එක එකක් පහ බැගින් වේ. පඤ්ච ඔරම්භාගිය පඤ්ච උද්ධම්භාගිය වශයෙනි ඔරං යනු කාමධාතුව යයි කියනු ලැබේ. එහි උත්පත්ති නිපදවීම් වශයෙන් කාමධාතු ඇසුරු කරයි යනු ඔරම්භාගිය වේ. උද්ධං යනු රූපාරූප ධාතුව යයි කියනු ලැබේ. එහි ඉපදවීම් සිදුකරන බැවින් උද්ධම්භාගිය වේ.

## දුක නිද්දේසයයි.

තික නිද්දේසයෙහි අකුසල් මුල් තුනෙන් සංසාරයෙහි හැසිරේ යයි කියන ලදී. අකුසල විතක්කාදියෙහි විතර්ක වශයෙන් **විතක්කො** හැඳිනීම් වශයෙන් **සඤ්ඤා** ස්වභාව අර්ථයෙන් ධාතු යයි දතයුතුය. දුච්චරිත නිර්දේශයෙහි ප්‍රථම නය කම්මපථ වශයෙන් බෙදන ලදී. දෙවැන්න සර්ව සංග්‍රාහික කර්ම වශයෙන්ද තුන්වැන්න, නිපදවන චේතනා වශයෙන්ම බෙදන ලදී. ආසව නිර්දේශයෙහි සංක්ෂේපයෙන් **තත්‍ථ කතමා කාමෙසනා** යනාදි නයින් කියන ලද කාම සොයා යන රාගයයි. **කාමෙසනා යො භාවෙසු භවච්ඡන්දො** ආදි නයින් කියන ලදී. භව ගවේෂණ රාගය **භවෙසනා** වේ. **සස්සතො ලොකො** ආදි නයින් කියන ලද දෘෂ්ටිගතික සම්මතයයි. බ්‍රහ්ම චරිය ගවේෂණ දෘෂ්ටිය **බ්‍රහ්මචරියෙසනා** යයි දතයුතුය. රාග දෘෂ්ටිය පමණක් සෙවීම නොව කර්මයද එසනාවකි. (සෙවීමකි.) එනිසා එය දැක්වීමට දෙවන නය බෙදන ලදී. එහි **තදෙකට්ඨං** යනු සම්ප්‍රයුක්ත අර්ථය යයි දතයුතුය. එහි කාමරාග ඒකාර්ථය කාමාවචර සත්වයෝම පවත්වති. භවරාග ඒකාර්ථය මහා බ්‍රහ්මයින්ගේ සමාපත්තියෙන් නැගිට සක්මන් කරමින් ධ්‍යානාංග ආශ්වාදනය කරන වෙලාවෙහි අකුසල කාය කර්මයක් වේ. අහෝ සැපයි අහෝ සැපයි කයා ආශ්වාදනය කරන කාලයෙහි වචී කර්මයද කාය අංග වචී අංග නොසොලවා මනසින්ම ආශ්වාදනය කරන වේලාවේ මනෝ කර්මයද වේ. අන්තර්ග්‍රහණ දෘෂ්ටි වශයෙන් සියළු දෘෂ්ටි ගතිකයන්ට සක්මන් කිරීම් වශයෙන් ඒවා සිදුවේ.

විධා නිර්දේශයෙහි සීලවන්තයන් කියන්නේ කුමන විධියකින්ද? ප්‍රඥාවන්තයන් කියන්නේ කුමන විධියකින්ද? යනාදියෙහි ආකාර සටහන් විධි නම් වේ. 'එකවිධෙන ඤාණවත්‍ථු' යනාදියෙහි කොටස් විධි වශයෙනි.

එය වනාහි සෙය්‍යාදි වශයෙන් දැක්වීම නිසා විධා යයි කියනු ලැබේ. තබන අර්ථයෙන් හෝ විධා වේ. එහෙයින් සුදුසු මමයයි උපන් මානවිධ මාන ඨපනය **සෙය්‍යොහමස්මීති** විධා යයි දතයුතුය. සෙසු පද දෙකේද මේ ක්‍රමයමයි.

භය නිද්දේසයෙහි **ජාති පටිච්ච භයං** ජාතිය නිසා උපන් බිය. **භයානකං** යනු ආකාර විස්තරයයි. **ඡම්භිතත්තං** යනු බිය වශයෙන් ගත සැලීමයි. **ලොමහංසො** යනු ලෝමවල හංසනයයි. ලොම් අග උඩට සිටීමයි. මේ පද දෙකින් කෘත්‍ය වශයෙන් බිය දක්වා **චෙතසො උත්‍රාසො** ස්වභාව වශයෙන් දක්වන ලදී.

තප නිද්දේසයෙහි විචිකිච්ඡා හිසින් අවිජ්ජාව කියන ලදී. "ඒ අඳුර මුළාවයි. අවිජ්ජා ගඟ මහා බියයි" යන වචනවලින් අවිජ්ජාව **තමො** නම් වේ. අද්ධ තුනක් වශයෙන් දේශනා පහසුව සඳහා විචිකිච්ඡා හිසින් දේශනා කරන ලදී. එහි කුමක් නිසා මම අතීතයෙහි ක්‍ෂත්‍රියෙක් වීම්ද? නැතහොත් බ්‍රාහ්මණයෙක්, වෛශ්‍යයෙක් ශුද්‍රයෙක් කල්ලෙක් සුද්දෙක් මිට්ටෙක් උසයෙක් වීම්ද? සැක කරන්නේ අතීත කාලය අරබයා සැක කරයි. **අතීතං අද්ධානං ආරබ්භ කංඛති** කුමක් හෙයින් මම අනාගතයෙහි ක්‍ෂත්‍රියෙක් වන්නෙම්ද නැතහොත් බ්‍රාහ්මණයෙක්..........උස අයෙක් සැක කරන්නේ **අනාගතං අද්ධානං ආරබ්භ කංඛති.** කුමක් හෙයින් මම දැන් ක්‍ෂත්‍රියෙක් නැතහොත් බ්‍රාහ්මණයෙක් වෛශ්‍යයෙක් ශුද්‍රයෙක් වීම්ද? මම කුමක්ද? රූපයද? නැතහොත් වේදනා සඤ්ඤා සංඛාර විඤ්ඤාණද? සැක කරන්නේ **පච්චුප්පන්නං අද්ධානං ආරම්භ කංඛති.** එහි කිසිවෙක් ක්‍ෂත්‍රිය හෝ තමාගේ ක්‍ෂත්‍රියභාවය බ්‍රාහ්මණ හෝ බ්‍රාහ්මණභාවය වෛශ්‍ය හෝ වෛශ්‍යභාවය ශුද්‍ර හෝ ශුද්‍ර භාවය නොදන්නෙක් නම් නැත. ජීවය ලත් සත්වයෙක් ක්‍ෂත්‍රිය ජීවාදීන්ගේ වර්ණාදි භේදය අසා අපගේ අභ්‍යන්තර ජීවය කෙබඳු වේද? කිම නිල්වේද? නැතහොත් කහ? රතු? සුදු? සතරාකාර? සයාකාර? අටආකාර? යයි සැක කරන්නේ මේ සැක නම් වේ.

**තිත්ථායතනානි** යනු තීර්ථකයින්ගේ ආයතනය. එහි **තිත්ථ** නම් දෙසැටක් දෘෂ්ටිය. **තිත්ථිය** නම් ඒ දෘෂ්ටි කැමතිවන ඒවා ඉවසන අයයි. සියළුම දෘෂ්ටිගතිකයෝ මේ ස්ථාන තුනේම උපදිති. මෙහි හැසිරෙති. රැස්වෙති. දෘෂ්ටි ගතිකයන්ගේ දෘෂ්ටිභාවයෙන් මේ කරුණුය. එහෙයින් තීර්ථකයෝ එහිම හටගත්තේය ආදි අර්ථයෙන් ආයතනයන්ද **තිත්ථායතන**

වේ. **පුරිසපුග්ගලො** යනු සත්වයෙකි. කාමයද පුරුෂයෙකැයි පුද්ගලයෙකැයි කී කල සත්වයෙක්ම කියන ලද්දේ වේ. මේවා සම්මත කතා වේ. යමෙක් දන්නා ලෙස කියන ලද ඒවාය. **පටිසංවෙදෙති** යනු තමාගේ සන්තානයෙහි උපන් දේ දැනීමේ සංවේදීතාවය, කිරීම, ආනුභාවය හෝ **පුබ්බෙ කත හේතු** පෙර කරන ලද කරුණු. පෙර කරන ලද කර්ම ප්‍රත්‍යයෙන්ම දැනගනී යන අර්ථයයි.

**මේ නිගණ්ඨ සමයයි.**

මෙසේ මේ වාදීහු කර්ම වේදනාවද කිරිය වේදනාවද ප්‍රතික්ෂේප කොට විපාක වේදනාව පමණක් පිළිගනිති. පිත්ත සමුට්ඨාන තාදි අට ආබාධයෙහි හතක් ප්‍රතික්ෂේප කොට අටවැන්න භාරගනිති. දිට්ඨධම්ම වේදනාදි කර්ම තුනෙහි දෙකක් ප්‍රතික්ෂේප කොට එකම අපරාපරිය වේදනාව පමණක් පිළිගනිති. කුසල අකුසල විපාක කිරිය ආදියෙහිද චේතනා සතරින් විපාක චේතනාව පමණක් පිළිගනී.

**ඉස්සර නිම්මාණ හේතු** ඊශ්වර නිර්මාණ කරණය. බ්‍රහ්මයා හෝ ප්‍රජාපතී හෝ ඊශ්වරයා විසින් නිර්මාණය කරන ලද බව දනී යයි යන අර්ථයයි.

**මේ බ්‍රාහ්මණ සමයයි.**

මෙය ඔවුන් අභිප්‍රායයි. මේ තුන් වේදනා වර්තමානයේ තමා කරන ලද මූලයකින් හෝ පණවන ලද මූලයකින් හෝ පෙර කරන ලද්දකින් හෝ අහේතු අප්‍රත්‍යයෙන් හෝ දැනගැනීමට නොහැකිය. මෙය දැනගත හැකිවන්නේ ඊශ්වර නිර්මාණ කාර්යයෙන් මය. මේ වාදීහු යට කියන ලද ආබාධ අටෙන් එකකුදු නොපිළිගෙන සියල්ලම ප්‍රතික්ෂේප කරති. එසේම දිට්ඨධම්ම වේදනාදියෙහි සියළුම කොටස්වල එකකුදු නොපිළිගෙන බැහැර කරති. **අහේතු අප්පච්චයා** යනු හේතුවද ප්‍රත්‍යයද හැර ඉබේම දැනගනී යන අර්ථය වේ.

**අයං ආජීවක සමයො.**

මේ වාදීහු යට කියන ලද ව්‍යාධි ආදි කරුණුවල එකක්වත් නොපිළිගෙන සියල්ලම බැහැර කරති.

**කිඤ්චනා** යනු බාධකය. **රාගො කිඤ්චනං** රාගය උපදිමින් සත්වයා බඳියි. බාධා කරයි. ඒ නිසා කිඤ්චනයකැයි කියනු ලැබේ. දෝස මෝහවලද මෙම නයයි. **අංගණානි** 'උද්ධංගණෙ තත්‍ථ පපං අවිත්‍ථුං' ආ තැන භූමි ප්‍රදේශය අංගනයකි. "තස්සෙව රජස්ස වා අංගණස්ස" ආ තැන කිසියම් තෘණ හෝ මඩය. "සාංගණොව සමානො" ආ තැන නොයෙක් ආකාර දැඩි කෙලෙස්ය. මෙහිද එලෙසම කෙලෙස් අදහස් කරයි. එහෙයින්ම **රාගො අංගණං** යනාදිය කීය.

**මලානී** යනු කිලිටි බව ඇති කිරීමය. **රාගො මලං** යනු රාගය උපදිමින් සිත කිලිටි කරයි. මල ගන්වයි. එනිසා මල යයි කියනු ලැබේ. ඉතිරි දෙකේද මෙම නයයි.

විසම නිද්දේසයෙහි රාගාදියෙහි මෙන්ම කාය දුෂ්චරිතාදියෙහි සත්වයෝ පැකිළෙති. පැකිලුණු තැනැත්තෝ සාසනයෙන්ද සුගතියෙන්ද වැටෙති. එහෙයින් පැකිළෙන වැටෙන හේතුවෙන් රාගො විසමං යනාදිය කියන ලදී. අග්ගි යනු දහනය කරන අර්ථයෙන් අග්ගි වේ. රාගග්ගි යනු රාගය උපදින සත්වයන් දවයි අලුකරයි. එනිසා අග්ගි යයි කියනු ලැබේ. දෝස මෝහවලද මෙම නයයි.

ඒ සම්බන්ධ කථාවකි.

එක් දහර භික්ෂුණියක් සිතුල්පව් වෙහෙරෙහි උපෝෂථාගාරයට ගොස් දොරටුපාල රූප බලමින් සිටියාය. ඉක්බිති ඇගේ ඇතුළත රාගය උපන්නේය. ඕ තොමෝ එයින් දැවී කළුරිය කළාය. භික්ෂුණීහු ගමින් මේ දහර භික්ෂුණිය කැඳවන්නැයි කීහ. එක් භික්ෂුනියක් ගොස් කුමක් නිසා සිටින්නේදැයි අත ගත්තාය. අතින් ඇල්ලූ පමණින් පෙරළී වැටුණාය. මෙය රාගයෙන් දවන ලද වස්තුවකි. දෝසයෙන් දවන ලද බවට නිදසුන් මනෝපදෝසික දෙවියන්ගෙන් දතයුතුය. මෝහයෙන් දවන ලද බවට ඛිඩ්ඩාපදෝසික දෙවියන් පිළිබඳ දතයුතුය. මුළාවීම් වශයෙන් ඔවුන්ගේ සිහිය මුළා වේ. එහෙයින් ක්‍රීඩා වශයෙන් ආහාර වෙලාව ඉක්මවා කළුරිය කරති.

කසාව කසටය. ඕජස නැත. රාගාදියෙහිද කාය දුශ්චරිතාදියෙහිද එකම ප්‍රණීත ඕජයක්වත් නැත. එහෙයින් **රාගො කසාවො** යනාදිය කියන ලදී. **අස්සාදදිට්ඨී** ආශ්වාද සම්ප්‍රයුක්ත දෘෂ්ටියයි. **නත්ථි කාමෙසු දොසෝ** කෙලෙස් කාමයෙන් වස්තුකාම සේවනයේ දොස් නැතැයි කියයි.

**පාතබ්‍යතං** බියයුතු බව, පරිභෝගය, ගිලීම. මේ වාදීහු වස්තු කාමවල කෙලෙස් කාමය බොන්නවුන් මෙන් ගිලින්න වුන් මෙන් පරිභෝග කරති. **අත්තානු දිට්ඨී** යනු තමන් අනුගමනය කරන දෘෂ්ටිය. **මිච්ඡා දිට්ඨී** යනු ලාමක දෘෂ්ටිය. දැන් මෙහි කුමක් හෙයින් පළමුව ශාස්වත දෘෂ්ටියද දෙවනුව සක්කාය දෘෂ්ටියද තෙවනුව උච්ඡේද දෘෂ්ටියද දැක්වූවාද යන්න දැක්වීමට **සස්සත දිට්ඨී අස්සාදදිට්ඨී** යනාදිය කීහ. අරති නිද්දේසයද විහෙසා නිද්දේසය කියන ලද අර්ථ ඇත්තේය.

අධමයාගේ හැසිරීම **අධම්ම චරියා** වේ. අධර්මය කිරීමයි යන අර්ථයයි. විසම ලෙස හැසිරීම **විසම චරියා** වේ. විසම කර්ම කිරීම විසමචරියා වේ. දොවචස්සතා පාපමිත්තතා නිද්දේසවල අර්ථ කියන ලද්දේය. වෙන්වූ නිමිති අරමුණුවල පවතින විවිධ සංඥා **නානත්ත සඤ්ඤාය.** අතිකෙක් කාම සඤ්ඤා අතිකෙක් ව්‍යාපාද සංඥා එහෙයින් නානත්ත සඤ්ඤාද **නානත්ත සඤ්ඤා** වේ. කොසජ්ජ පමාද නිද්දේසවල පංචකාම ගුණයෙහි මුදාහළ සිතේ කුසලධම්ම භාවනා අනුසෝන නොවීම් වශයෙන් සැඟවුණු ගති **කොසජ්ජං.** ප්‍රමාදවීම් වශයෙන් පටුවන බව. පමාදො වේයයි දතයුතුය. අසන්තුට්ඨිතා ආදි නිද්දේස කියන ලද අර්ථ වේ.

අනාදරිය නිද්දේසයෙහි අවවාදය නොගැනීම් වශයෙන් අනාදර භාවය **අනාදරියං** වේ. අනාදරය ඇතිකරන ආකාරය **අනාදරතා** වේ. ගිහිගෙයි විසීම අවසන් කිරීම් අර්ථයෙන් අගාරබව **අගාරවතා** වේ. දෙටු වාසයෙහි නොවසන අර්ථයෙන් **අප්පතිස්සවතා** වේ. අන් දෑ නොගෙන්මය. අනද්දායතා - අනාදි සහ ආකාරය. අනද්දාය ආයිතස්ස භාවො **අනද්දායි තත්තං** වේ. අසීලයාගේ ස්වභාවය **අසීල්‍යං** වේ. අචිත්තිකාරො යනු ගරු බුහුමන් නොකිරීම. අශ්‍රද්ධාභාවය **අස්සද්ධිං** වේ. නොඇදහීම් ආකාරය අසද්දහාන වේ. වැරදියට අදනා පිරිස් නොගැනීම **අනොකප්පනා** වේ. අප්‍රසාදය ඇතිවන අර්ථයෙන් **අනභිප්පසාද** වේ. අවදඤ්ඤුතා යනු තද මසුරු වශයෙන් දෙව කරව යන වචනවල තේරුම ගෙනුත් **බුද්ධා ච සාවකා ච** මෙහි බුද්ධ ගැනීමෙන් පසේබුදුන්ද ගත්තා වේ.

**අසමෙතුකාමතා** යනු ඔවුන්ගේ සමීපයට නොයනු කැමැත්ත. **සද්ධම්මං අසොතු කාමතා** සත්තිස් බෝධිපාක්‍ෂික ධර්ම සද්ධම්ම වේ. එය ඇසීමට අකමැති බව **අනග්ගහභේතුකාමතා** "ඉගෙණීමට කැමැත්තක් නැති බව **උපාරම්භචිත්තතා** යනු දොස් පැවරීමේ සිතේ ස්වභාවය. යම් අර්ථයකින් දොස් පවරන්නේද එය දැක්වීමට. **තත්‍ථ කතමො උපාරම්භො?** ආදිය කියන ලදී. **අනුපාරම්භ** දොස් දක්වන ආකාරය **උපාරම්භනා** වේ. නැවත නැවත උපාරම්භනය **අනුපාරම්භනා** වේ. අනුපාරමභනයාගේ ස්වභාවය **අනුපාරම්භතත්තං** වේ. **උඤ්ඤා** යනු යට නොදැනීම. **අවඤ්ඤා** යනු නොදැනීම. පරිභව කිරීම **පරිභවො** වේ. සිදුරු සොයන බව **රංධගවෙසිතා** වේ. **අයං වුච්චති** මේ අනුන්ගේ වරද දකින ලක්‍ෂණය **උපාරම්භ** යයි කියනු ලැබ්. මේ ආකාරයෙන් යුත් පුද්ගලයා පෙහෙරෙක් රෙද්ද පසාකර සිදුර දකිනවා සේ අන්‍යයාගේ සියළු ගුණ මකා අගුණයෙහිම සිටියි.

**අයොනිසො මනසිකාරෙන** උපාය රහිතව මෙනෙහි කිරීම. **අනිච්චෙ නිච්චං** අනිත්‍ය වස්තුවෙහි නිත්‍ය යයි මෙසේ පැවතීම. **දුක්ඛෙ සුඛං** යනාදියෙහිද එම නයයි. **සච්ච විප්පටිකුලෙනවා** චතුරාර්ය සත්‍යයේ අනුලෝම නොවන ආකාරයෙන් **චිත්තස්ස** ආවට්ටනා ආදි සියල්ල ආවජ්ජනයේ සමාන වචනය. ආවජ්ජනායෙහි භවංග සිත ආවජ්ජනා කිරීම **චිත්තස්ස ආවට්ටනා** වේ. අනුම ආවර්ජනය **අනාවට්ටනා** වේ. උෟරුබද්ධාසනයෙන් සිටීම **ආභොගා** වේ. භවංග අරමුණින් වෙනත් අරමුණකට හැරවීම **සමන්නාහරො** වේ. එම අරමුණම තමා ලුහුබැඳ එන බව මෙනෙහි කරන්නේ **මනසිකාරො** වේ. **කරොති** යනු තබයි. **අයං වුච්චති** මේ අනුපාය මානසික උප්පථමනසිකාර ලක්‍ෂණය. **අයොනිසො මනසිකාරයයි** කියනු ලැබේ. ඒ නිසා පුද්ගලයෙකුට දුක්ඛාදි සත්‍ය යථා පරිදි ආවර්ජනා කිරීමට හැකි නොවේ. **කුම්මග්ග** සෙවනාදි නිද්දේසයෙහි යම් වැරදි මගක් සේවනයෙන් සේවනය කිරීම **කුම්මග්ග සෙවනා** වේ යයි කියනු ලැබේ. එය දැක්වීමට **තත්‍ථ කතමො කුම්මග්ගො.** දෙවන **පුච්ඡා** කතාය සෙසු සියල්ල ප්‍රකටය.

## තික නිද්දේසය.

**චතුක්ක නිද්දේසයෙහි තෘෂ්ණා** ඉපදීමෙහි **චීවර හේතු** එහි මනාප සිවුරක් ලබම්යි සිවුරු කරුණු උපදී. **ඉති භවා භව හෙතු** මෙහි **ඉති** යනු නිදර්ශනාර්ථයෙහි නිපාතයකි. චීවර හේතුවෙන්ම භවාභව හේතුද යන

අර්ථයයි. **භවාභවො** යන මෙහි ප්‍රණීත ප්‍රණීතතර තෙල් මීපැණි ආදිය අදහස් කෙරේ. මේ තණ්හා උපාදාන සතර ප්‍රහාණය පිණිස පිළිවෙළින්ම චතුරාර්යවංශය දේශනා කරන ලදැයි දතයුතුය.

අගති ගමනයෙහි **ඡන්දාගති ගච්ඡති** ඡන්දයෙන් ප්‍රේමයෙන් අගතියට යයි. නොකළයුතු දෙයක් කරයි. අනිත් පදවලද මෙම නයයි. එහි යමෙක් මේ තෙමේ මගේ මිත්‍රයෙක් දුටු මිත්‍රයෙක් දැඩි මිත්‍රයෙක් නෑයෙක් හෝ අල්ලස් හෝ මට දේ යයි. අස්වාමිකයෙක් ස්වාමියෙක් කරයි. මෙය ඡන්දා ගතියයි. යමෙක් මේ මගේ වෛරක්කාරයෙකුයි ප්‍රකෘති වෛර වශයෙන් හෝ ඒ අවස්ථාවේ උපන් ක්‍රෝධ වශයෙන් හිමියෙකු අහිමියෙක් කරයි. මෙය දෝෂා ගතියයි. යමෙක් මෝඩබව මුළා බැවින් මොනව හෝ කියා අහිමියෙක් හිමියකු කරයි. මෙය මෝහා ගතියයි. යමෙක් මේ රාජ විශ්වාසය දිනුවේ හෝ විසම පුද්ගලයෙක් නිසා හෝ මට අනර්ථයක් කෙරේයයි බියෙන් අහිමියෙක් හිමියකු කරයි මෙය භයෙන් අගතියට යෑමකි. යමෙක් යමක් බෙදන අවස්ථාවේ කිසියම් දෙයක් බෙදන්නේ මේ මගේ මිත්‍රයෙක් යහළුවෙක් කියා ප්‍රේම වශයෙන් අතිරේකයක් දෙයි. මේ මගේ වෛර කරුවෙකු දෝෂ වශයෙන් අඩුවෙන් දෙයි. මෝමූහයෙන් දෙන නොදෙන හැටි නොදන්නේ කිසිවකුට අඩුවෙන් කිසිවෙකුට වැඩියෙන් දෙයි. මොහුට තුටුන්නොත් මට අනර්ථයක් කරන්නේ යයි බියවී කිසිවෙකුට අතිරේකයක් දෙයි. ඒ සතර දෙනාම අනුක්‍රමයෙන් ඡන්දාදි සතර අගතියට යයි. ආර්යයා මේ අගතිවලට නොයයි. අනාර්යා මේ අගතිවලට යයි. **අගතිගමනං** මේ දෙක සතරදෙනාටම සාධාරණ වශයෙන් කියන ලදී. ඡන්දයෙන් යෑම **ඡන්දගමනං** වේ. මෙය දෝසාදීන්ට අසාධාරණ වශයෙන් කියන ලදී. සමපක්ෂයන්ට ප්‍රේමයෙන් ද විපක්ෂයන්ට දෝෂයෙන් ද නොමාර්ග වශයෙන් ගමන **වග්ගගමනං** මෙය ඡන්ද දෝෂ දෙකම සාධාරණ වශයෙන් කියන ලදී. ජලය මෙන් පහත් තැනට ගමන **වාරිගමනං** වේ. මෙය සතරදෙනාටම සාධාරණ වශයෙන් කියන ලදී. වීර්යයෙන් සෙවීමෙහි අතිච්ඡාදි වස්තු නිච්ච භය ආදි නයින් විපරීත වශයෙන් සොයන්නේ **විපරියෙසා** වේ. සංඥාවෙන් විපරියෙසා **සඤ්ඤා විපරියෙසා** වේ. ඉතිරි දෙකෙහිද මෙම නයයි. මෙසේ මේ සතර වස්තු වශයෙන් මේ සතර වස්තුවෙහි සංඥාදීන් වශයෙන් දොලහක් වේ. සෙසු අට සෝතාපත්ති මාර්ගයෙන් ප්‍රහීණ වේ. අසුභයෙහි සුභයයි චිත්ත විපර්යාසය සකෘදාගාමී මගින් තුනී වෙයි. අනාගාමී මාර්ගයෙන් ප්‍රහීණ වේ. දුකෙහි සැපයයි සංඥාව අරහත් මගින් ප්‍රහීණ වේයයි දතයුතුය.

අනාර්ය ව්‍යවහාරයෙහි **අනරිය වොහාරා** යනු අනාරිය වූ ලාමකයින් ව්‍යවහාරයි. **දිට්ඨවාදිකා** යනු මා විසින් දකින ලදැයි මෙසේ කියන බව. මෙහි ඒ ඒ හටගත් චේතනා වශයෙන් අර්ථය දතයුතුය. සහ බේදයෙන් චේතනා කියන ලදී. දෙවන චතුක්කයෙහිද මෙම නයයි. ආර්යයා නොදැක හෝ මවිසින් දකින ලදැයි දැක හෝ මවිසින් නොදක්නා ලද්දේ යයි කියන ලද්දේ නම් නොවේ. අනාර්යාම මෙසේ කියයි. එහෙයින් මෙසේ කියන්නාගේ සහ ශබ්දයෙන් මේ චේතනා අට අනාර්ය ව්‍යවහාරයයි දතයුතුය.

දුශ්චරිතවල පළමු චතුක්කය චේතනා වශයෙන් කියන ලදී. දෙක වචී දුශ්චරිත වශයෙන් කියන ලදී. බියෙන් පළමු චතුක්කයෙහි ජාතිය නිසා උපන් බිය **ජාති භයං** වේ. සෙස්සෙහිද මෙම නයයි. දෙවන චතුක්කයෙහි රජුගෙන් උපන් බිය **රාජභයං** වේ. සෙස්සෙහි මෙම නයයි. තුන්වන චතුක්කයෙහි **චත්තාරි භයානි** යනු මහා සමුද්‍රයෙහි ජලයට බසින්නයි කියන ලද බියයි. මහා සමුද්‍රයෙහි වනාහි මහින්ද රැල්ල නම් හැටයොදුනක් උඩට නැගෙයි. ගංගා රැල්ල පනස් යොනක්ද රෝහණ රැල්ල හතලිස් යොදුනක්ද උඩ නැගේ. මෙබඳු වූ දියරැලි නිසා උපන් බිය **ඌම්භයං** නම් වේ. කිඹුලු බියෙන් උපන් බිය **කුම්භීල භයං** නම් වේ. දියසුලිවලින් උපන් බිය **ආවට්ටභයං**. **සුසුකා** යනු චණ්ඩ මත්ස්‍යකැයි කියනු ලැබේ. උගෙන් වන බිය **සුසුකාභයං** සතරවන චතුක්කයෙහි **අත්තවාදානුභයං** යනු පව්කම් කරන්නාට තමන්ට තමන්ම කියා ගැනීමේ උපදින බිය අත්තානුවාද බිය වේ. **පරානුවාදභයං** යනු අනුන්ගේ කීමෙන් උපදින වේයයි. **දණ්ඩභයං** යනු ගිහියාට රජු විසින් පවත්වන දඬුවම පැවිද්දාට විනය දඬුවම් නිසා උපදින බිය. **දුග්ගති භයං** සතර අපායන් නිසා උපදින බිය. මෙසේ මේ චතුක්ක සතරින් සොළොස්මහා භය කියන ලදී.

දිට්ඨී චතුක්කයෙහි තිම්බරූසක දිට්ඨීය කියන ලදී. එහි **සයං කතං සුඛ දුක්ඛං** යනු වේදනාව ආත්ම වශයෙන් බලමින් වේදනාව විසින්ම වේදනාව කරන ලදැයි උපන් දෘෂ්ටියයි. මෙසේ ඇතිකල්හි වේදනාව පෙරත් පැවතුනේ යයි පැමිණීම යන මෙය ශාස්වත දෘෂ්ටි නම් වේ. **සච්චතො ථෙතතො** යනු සත්‍ය වශයෙන් ස්ථිර වශයෙන්. **පරං කතං** වර්තමාන වේදනා වශයෙන් අන්‍ය වේදනා කරණයක් වේදනාව ආත්මය වශයෙන් බලමින් වෙනත් වේදනාවක් විසින් මේ වේදනය කරන ලදැයි

උපන් දෘෂ්ටිය. මෙසේ ඇතිකල්හි පෙර කරන වේදනාව උච්ඡේදයට පැමිණේයයි මෙය උච්ඡේද දෘෂ්ටි නම් වේ. **සයං කතංච පරංකතංචාති** යනු කියන ලද අර්ථයෙන්ම අඩක් තමා විසින් කරන ලදැයි අඩක් අන්‍යයා විසින් කරන ලදැයි ගැනීමෙන් උපන් දෘෂ්ටිය. මෙය ශාස්වත උච්ඡේද දෘෂ්ටි නම් වේ. සතරවැන්න හේතුවක් නැතිවම සැපදුක් ඇතිවේයයි ගැනීමෙන් උපන් දෘෂ්ටියය. මෙසේ ඇතිකල්හි මෙය අහේතුක දෘෂ්ටි නම් වේ. මෙහි සෙස්ස යට කියන ලද නයින් ප්‍රකට අර්ථ ඇත්තේය.

## චතුක්ක නිද්දේසයයි.

පඤ්චක නිද්දේසයෙහි යමෙකුට සක්කාය දිට්ඨි ආදිය අප්‍රහීන නම් ඔව්හු භවාග්‍රයෙහි උපන්නත් මේවායින් ඇද කාමභවයෙහිම හෙලයි. එහෙයින් **ඔරම්භාගියානි සංයෝජනානි** යයි කියන ලදී. මේ පස යන්නා නොවලක්වයි. ගිය තැනැත්තා කැඳවයි. රූපරාගාදි පසද යන්නා නොවළක්වයි. පැමිණීමට නොදෙයි. රාගාදි පහ ලගින අර්ථයෙන් **සංගා** නම් වේ. අනු ප්‍රවේශවීම් අර්ථයෙන් සල්ලා යයි කියනු ලැබේ.

චෙතොඛිලා යනු සිතේ තදබව, කසලබව, කණුබව. **සත්ථරි කංඛෙති** ශාස්තෘ ශරීරයෙහි හෝ ගුණයෙහි හෝ සැක කරයි. ශරීරයේ සැක කරන්නේ උතුම් වූ දෙතිස් ලක්ෂණවලින් යුත් ශරීරයක් නම් ඇතිවිය හැකිද? නැතැයි සැක කරති. ගුණයෙහි සැක කරන්නේ කාලත්‍රය දැනීමෙහි සමත් සර්වඥතා ඥාණයක් ඇත්ද නැත්දැයි සැක කරයි. **විචිකිච්ඡති** සොයන්නේ දුකට පත්වෙයි විනිශ්චය කිරීමට නොහැකි වේ. ධම්මෙ යනු පරියත්ති ධර්මයෙහිද ප්‍රතිවේධ ධර්මයෙහිද සැක කරයි. පරියත්ති ධර්මයෙහි සැක කරන්නේ ත්‍රිපිටක බුද්ධ වචනය සුවාසු දහසක් ධර්ම ස්කන්ධය ඇතිද නැතිදැයි සැක කරයි. ප්‍රතිවේධ ධර්මයෙහි සැක කරන්නේ විපස්සනාවෙන් මාර්ගය මාර්ගයෙන් ඵලය සියළු සංඛාර අත්හැරීම නිර්වාණය නම් ඇත්ද නැත්දැයි සැක කරයි. **සංඝෙ කංඛති** උජුපටිපන්න තාදි පද වශයෙන් මෙබඳු වූ ප්‍රතිපදාවකට පිළිපන් සතරමග සතරඵලයට යන අට පුද්ගලයන්ගේ සමූහයක් වූ සංඝයා ඇත්ද නැත්දැයි සැක කරයි. භික්ෂාවෙහි සැක කරන්නේ අධිසීල භික්ඛා අධිචිත්ත භික්ඛා අධිපඤ්ඤා සික්ඛා යයි කියති. එය ඇත්ද නැද්දැයි සැක කරයි.

**චෙතසො විනිබන්ධා** සිත බැඳ මිටියක් කොට මෙන් ගන්නේය

යනු චෙතසො විනිබන්ධ වේ. **කාමෙ** යනු වස්තුකාම ක්ලේශකාම දෙකේ **කායෙ** තම ශරීරයෙහි. **රූපෙ** බාහිර රූපයෙහි. **යාවදත්ථ** යම් පමණ කැමති වේද එපමණ. **උදරාව දෙහකං** යනු උදරය පුරවා. එහි උදරය අවදේහක වශයෙන් උදරාවදේහක යයි කියනු ලැබේ. **සෙය්‍යසුඛෙ** ඇඳ පුටු සුවය ඍතු සුවය හෝ. **එස්ස සුඛං** පෙරලී නිදන්නාට දකුණු පැත්තේ වම්පැත්ත් ඇති සුවය වේ. මෙසේ උපන් සුවය. **මිද්ධ සුඛං** යනු නිදිසුවය **අනුයුත්තො** යුත්ත ප්‍රයුක්තව වාසය කරයි. **පණිධාය** ප්‍රාර්ථනා කොට සීලෙනා ආදියෙහි **සීලං** යනු චතුපාරිසුද්ධි සීලයයි. **වතං** යනු වත් සමාදන්වීම **තපො** යනු තපස් හැසිරීමය. **බ්‍රහ්මචරියං** මෛථුනයෙන් වෙන්වීම. **දෙවො වා භවිස්සාමි** මහේශාක්‍ය දෙවියෙක් හෝ වන්නෙමි. **දෙවඤ්ඤතරොවා** අල්පේශාක්‍ය දෙවියෙකු හෝ වන්නෙමි.

කුසල ධර්මයන් ආවරණය කරයි. වළක්වයි. **නීවරණානි** වේ. **මාතා ජීවිතා වොරොපිතා හොති** මිනිසෙක්ම සිය ජනනී මිනිස් මව ජීවිතයෙන් තොරකරන ලද්දේ වේ. **පිතා** ද මනුස්ස පියා අරහා මනුස්ස රහතන් වහන්සේ **දුට්ඨෙන චිත්තෙන** වධක සිතින්. **සඤ්ඤී** සංඥාවෙන් යුත්. **අරෝගා** නිත්‍ය. **ඉත්‍යෙක අභිවදන්ති** මෙසේ ඇතමෙක් කියති. මෙසේ ඔව්හු කියති යන අර්ථය. මෙපමණක් සඤ්ඤීවාද සොළොස කියන ලදී. තුන්වන පදයෙන් නේවසඤ්ඤී නාසඤ්ඤී වාද කියන ලදී. **සතොවා** පන **සත්තස්සාති** යනු නොගොස් විද්‍යමාන සත්වයාගේ **උච්ඡේදං** සිඳී අවසන්වීම. **විනාසං** නොපෙනීම. **විභවං** භවය පහව යෑම. මේ සියල්ල අන්‍යොන්‍ය සමාන වචන වේ. එහි දෙදෙනෙක් උච්ඡේද දෘෂ්ටිය ගනිති. ලාභී සහ අලාභී. එහි ලාභී දිවසින් බැලීමට හැකි චුතිය දැක උපත නොදක්නේ යමෙකුගේ චුතිය පමණක් දැකීමට හැකිවේ. උප්පත්තිය දැකිය නොහැකි හේ උච්ඡේද දෘෂ්ටිය ගනී. අලාභී කවරෙක් පරලොව දනීද කාමසැප ගිජු බැවින් හෝ ගස්වල වැටුණු කොල නැවත පැල නොවේ. ඒවා සත්වයින් යයි ආදි විතර්කයෙන් උච්ඡේදය ගනියි. මෙහි වනාහි තෘෂ්ණා දෘෂ්ටි වශයෙන් එසේද වෙනස්වද විකල්පනය කොට උපන් උච්ඡේද වාද සත කියන ලදී. මෙය ඒවායේ සංග්‍රහ වචනයයි. **දිට්ඨධම්ම නිබ්බානං වා පනෙතෙ.** මෙහි දිට්ඨ ධම්ම යයි ප්‍රත්‍යක්ෂ ධර්මය කියනු ලැබේ. ඒ ඒ ලැබූ ආත්මභවයට මෙය වෙනත් වචනයකි. දිට්ඨ ධර්මයෙහි නිර්වාණ **දිට්ඨධම්ම නිබ්බාණං** මේ ආත්මයෙහිම දුක් සංසිඳීම යන අර්ථයයි. මෙය දිට්ඨධම්ම නිබ්බාණවාද පහ ඇතුළත් කරන ලද වචනයයි.

වෙරා යනු වෛර චේතනාවයි. **බ්‍යසනා** යනු විනාශයයි. **අක්ඛන්තියා** යනු නොඉවසීමයි. **අප්පියො** දැකීම ඇසීම පිළිකුල් ප්‍රිය නොකළ යුතුය. සිතන්වද පිළිකුල් බැවින් සිත එය කෙරෙහි නොපැමිණේය යනු **අමනාප** නම් වේ. **වෙරබහුලො** යනු බොහෝ වෛර ඇති. **වජ්ජ බහුලො** වැරදි බහුල වූ බොහෝ දොස් ඇති. **ආජීවක භයං** ජීවිත පැවැත්ම පිළිබඳ උපන් බිය. එය ගිහි පැවිදි දෙපසටම ඇති වේ. එහි ගිහියා විසින් ජීවත්වීමේ හේතුවෙන් බොහෝ අකුසල් කරන ලද්දේ වේ. ඉක්බිති ඔහුගේ මරණ සමයෙහි නිරය වැටහෙන්නේ බිය උපදී. පැවිද්දා විසින්ද බොහෝ අනෙසන කරන ලදී. ඉක්බිති ඔහු මරණාසන්න කාලයේ නිරය වැටහෙන විට බිය උපදී. මෙය ආජීවක බිය නම් වේ. **අසිලොක භයං** යනු ගරහයි යන බියයි. **පරිසසාරජ්ජ භයං** කරන ලද පව් ඇත්තාට පිරිසක් වෙත යැමට සාරජ්ජ සංඛ්‍යාත බිය උපදී. මෙය පරිස සාරජ්ජ බිය නම් වේ. ඉතිරි දෙක ප්‍රකටය.

දිට්ඨධම්ම නිබ්බාණ වාදයෙහි **පඤ්චහි කාම ගුණෙහි** යනු මනාප වූ රූපාදි පස් කාම භූමියෙහි බැඳීමෙන්. **සමප්පිතො** මනා වූ අර්පිත වූ, ප්‍රකටව. **සමංගිභූතො** සමන්නාගත වූ **පරිචාරෙති** යනු ඒ කාම ගුණයන්හි කැමති පරිදි ඉන්ද්‍රියන් සැරිසරවයි. සංචාරණය කරවයි. එහෙ මෙහි එලවයි. නොහොත් නලවයි. අලවයි. ක්‍රීඩාකරයි. මෙහි මිනිස් හා දිව්‍ය යයි කාමගුණ දෙපරිදිය. මහා මන්ධාතු කාමගුණ සමානව මානුසක කාම ගුණ දතයුතුය. පරනිම්මිත වසවත්ති දෙව් රජුගේ කාමගුණ සමානව දිව්‍ය කාමගුණ දතයුතුය. මෙබඳු වූ කාමයෙහි එළඹි විට පරම වූ දිට්ඨධම්ම නිබ්බාණයට පැමිණියේ යයි ඔව්හු කියති.

එහි පරම දිට්ඨධම්ම **නිබ්බාණං** යනු (කෙළවර වූ පංචකාමයන් අනුභවය උතුම් වූ දිට්ඨ බවට නිබ්බාණය) දෙවන වර වී අභාව අර්ථයෙන් **අනිච්චා** වේ. නැවත පෙළීම් අර්ථයෙන් **දුක්ඛ** වේ. ප්‍රකෘතිය වෙනස් කරන අර්ථයෙන් **විපරිණාම ධම්මො** වේ. **තෙසං විපරිණාමඤ්ඤථාභාවා** ඒ කාමයන්ගේ වෙනස්වීම් සංඛ්‍යාත අන්‍ය අවස්ථාවකට පත්වීම. යමක් මට වූයේ නම් එය මං නැතැයි කියන ලද ක්‍රමයෙන් සෝක පරිදේව දුක් දොම්නස් ඉපදේ. එහි ඇතුළත දවන ලක්ෂණය **සොකො** වේ. එය නිශ්‍රිතව වැලපෙන ලක්ෂණය **පරිදෙවො** වේ. කය පෙළන ලක්ෂණය **දුක්ඛං** වේ. මනසෙහි කරදර ඇතිකරන ලක්ෂණය **දෝමනස්සං** වේ. ඛේදයට පැමිණෙන ලක්ෂණය **උපායාසො** වේ. **විතක්කිතං** යනු සිතට නැගීම් වශයෙන් පවතින

සිතිවිලි. **විචාරිතං** (අතගෑම්) පිරිමැදීම් වශයෙන් පවතින විචාරය. **එතෙන එතං** මේ විතක්කයෙන් විචාරයෙන් මේ ප්‍රථමධ්‍යානය ඖලාරික හා කටු සහිත මෙන් හැඟේ. **පීතිගතං** ප්‍රීතියම. **චෙතසො උප්පිලාවිත** **චිත්තස්ස** උප්ඵලභාව කරණං. සිතේ ඉල්පවීම ඇතිකරන **චෙතසො ආභොගො** ධ්‍යානයෙන් නැගිට ඒ සැපයෙහි සිත නැවත නැවත ආභොගය මෙනෙහි කිරීම (ආභොග! පරිභෝග වැළඳීම) සෙසු සියල්ල ප්‍රකටය.

## පඤ්චක නිද්දේසය

ඡක්ක නිද්දේසයෙහි යමකින් කිපී හෝ ක්‍රෝධ වශයෙන් ස්වකීය ලබ්ධිය හෝ ස්ථිරව ගැනීමෙන් කලහ කෝලාහල විවාදවලට පැමිණේ. එනිසා ක්‍රෝධ ආදිය **විවාද මූල** යයි කියන ලදී. ඡන්දරාග නිර්දේශයෙහි ගෙහසිත කාමය ඇති බැවින් **ඡන්දරාගා ගෙහසිතා ධම්මා** යයි සංග්‍රහකොට කියා නැවත ප්‍රභේද දැක්වීමට **මනාපියෙසු** රූපෙසු යනාදිය කියන ලදී. එහි **මනාපියෙසු** සිත වැඩීමෙනි. තමාට ඉටු දෙයෙහි විරුද්ධ වූ විරොධ **වත්‍ථුනි** වේ. **අමනාපියෙසු** අනිටු දෙයෙහි. අගෞරවයෙහි **අගාරවො** ගෞරව විරහිත **අප්පතිස්සො** පහත් නොවන පැවැත්ම. මෙහි ශාස්තෘන් ජීවමාන කාලයෙහි යම් භික්ෂුවක් තුන්කාලයෙහි උපස්ථානයට නොයාද ශාස්තෘන් උපාහන නැතිව සක්මන් කරනවිට උපාහන ඇතිව සක්මන් කරයිද පහළ සක්මනෙහි සක්මන් කරද්දී ඉහළ සක්මනෙහි සක්මන් කරයිද පහළ සිටිනවිට උඩ සිටියිද ශාස්තෘන් දකින තැන උභයාංශ කරයිද කුඩය ඉහලා සිටියිද වහන් පයලා සිටීද ස්නානය කරයිද මලමූ කරයිද පිරිනිවන්පෑ කල්හි හෝ සෑය වඳින්ට නොයයි සෑය පෙනෙන තැන ශාස්තෘ දකින තැන කී සියල්ල කරයිද මෙය ශාස්තෘන් කෙරෙහි අගෞරවය වේ. ධර්ම ශ්‍රවණයට නාද සංඥා කළ කල්හි යමෙක් සකස්ව නොයයිද සකස්ව ධර්මය නොඅසයිද කතා කරමින් සිටියිද සකසා නොගනීද සංවරයෙන් කතා නොකරයිද මෙය **ධම්මෙ අගාරවො** නම් වේ. වැඩිමල් භික්ෂූන්ගෙන් අවසර නොගෙන යමෙක් බණ කියයිද ප්‍රශ්න කතා කරයිද වැඩිමල් භික්ෂූන්ගේ ඇඟේ හැපෙමින් යයිද සිටියිද හිඳියිද වාඩිවී සිවුර හෝ දෑත හෝ ගොතා ගනීද සඟ මැද උභයාංශ කර හිඳීද කුඩ උපාහන දරයිද මෙය **සංඝෙ අගාරවො** නම් වේ. එක භික්ෂු තමකට කරන අගෞරවය මුළු සංඝයාටම කරන අගෞරවයකි. ත්‍රිවිධ ශික්ෂා නොපිරීමම **සික්ඛාය අගාරවො** නම් වේ. අප්‍රමාද ලක්ෂණය නොවඩන්නේ **අප්පමාදෙ අගාරවො** නම් වේ. ද්විධ පිළිසඳර නොකරන්නේ **පටිසන්‍ථාරෙ-අගාරවො** නම් වේ.

**පරිහානියා ධම්මා** යනු පරිහානිකර දහම්ය. **කම්මාරාමතා** යනු නව කර්මයන්හි හෝ සිවුරු පිළියෙල කරන කර්මාන්තයෙහි කැමැත්තෙන් ඇලීම සිටීම. **භස්සාරාමතා** තිරිසන් කතා වශයෙන් බිණීමෙහි යෙදී සිටීම. **නිද්දාරාමතා** නිදීමෙහි ඇලීම. **සංගනිකාරාමතා** පිරිසක් සමග ඇලී වාසය. **සංසග්ගරාමතා** යනු ඇසීම දොඩමලු වීම පරිභෝග කිරීම කයෙහි ගැටීම යන පස්ආකාර සංසර්ගය ඇති බව. **පපංචාරාමතා** යනු තෘෂ්ණා මාන දෘෂ්ටි ප්‍රමාදවීමෙහි යෙදුණු බව.

සොමනස්සුපවිචාරාදියෙහි සොම්නස සමග හැසිරේය යනු **සොමනස්සුපවිචාරා** නම් වේ. **චක්ඛුනා රූපං දිස්වා** යනු චක්ඛු විඤ්ඤාණයෙන් රූපයක් බලා. **සොමනස්සට්ඨානීයං** සොම්නසට අරමුණු වශයෙන් හේතුවූ. **උපවිචරති** එහි හැසිරීම පැවැත්වීම. විතර්කය වනාහි එයින් යුක්ත යයි යන නයින් ඡක්ක තුනෙහිම අර්ථය දතයුතුය. **ගෙහසිතානි** කාමගුණ නිශ්‍රිත වූ. **සොමනස්සානි** චෛතසික සැප. **දොමනස්සානි** චෛතසික දුක්. **උපෙක්ඛා** නුවණින් යුක්ත නොවීම (අඤ්ඤාණ සම්ප්‍රයුක්ත) අඤ්ඤානුපෙක්ඛා එයටම නමකි. **අත්ථීමෙ අත්තානි** වා සියළු පදවල වා ශබ්දය විකල්පාර්ථ වේ. **එවං වා දිට්ඨී උපපජ්ජති** කියන ලද්දේ වේ. **අත්ථී මෙ අත්තා** යන මෙහි සාස්වත දෘෂ්ටියයි. සියළු කාලයෙහි තමාගේ ඇති බව ගනී. **සච්චතො ථෙතතො** ඇතැයිද ස්ථිරයයි ද මෙය සත්‍යයයි තද දැඩි භාවයෙන් කියන ලද්දේ වේ. **නත්ථි මෙ අත්තා** මෙය වනාහි උච්ඡේද දෘෂ්ටියයි. ඇති සත්වයාගේ ඒ ඒ නොපැවැත්ම ගැනීමයි. එසේ නැතහොත් පෙර තුන් කාලයම ඇතැයි ගැනීම් වශයෙන් සාස්වත දෘෂ්ටියද වර්තමානය පමණක් ඇතැයි ගැනීම උච්ඡේද දෘෂ්ටිය වේ. පශ්චිමයෝද අතීත අනාගත නැතැයි ගැනීමෙන් අලු අවසන් කොට වේයයි ගන්නා ලද දෘෂ්ටියක් මෙන් උච්ඡේද දෘෂ්ටි වේ. අතීතය පමණක් නැතැයි ගන්න අධිච්ච සමුප්පත්තිකයන් සාස්වත දෘෂ්ටිය වේ. **අත්තනං වා අත්තානං සංජානාමි** සඤ්ඤක්ඛන්ධ හිසින් ස්කන්ධයෙහි ආත්මයයි ගන්නා සංඥාවෙන් අවසේස ස්කන්ධයන්හි දැනීම් වශයෙන් මෙයින් තමා විසින් මේ ආත්ම දනිමියි මෙසේ වේ. **අත්තනා වා අනත්තානං** සංඥා ස්කන්ධම ආත්මයයි ගෙන ඉතිරි ස්කන්ධ සතරෙහි අනාත්මයයි ගෙන සංඥාවෙන් ඒවා දනිමියයි මෙසේ වේ. **අනත්තන වා අත්තානං** සංඥා ස්කන්ධය අනාත්මයයිද ඉතිරි ස්කන්ධ හතර ආත්මයයිද ගෙන සංඥාවේ ඒවා දැනීම මෙසේ වේ. සාස්වත උච්ඡේද සියළු දෘෂ්ටි **වදො වෙදෙය්‍ය** යනාදිය සාස්වත දෘෂ්ටියේ සිට ඇතුළත් වන ආකාරයයි. එහි වදතීති

වදො යනු වචනය කියන්නා යයි කියන ලදී. දැන් හේ යමක් දන්නේද එය දැක්වීමට **තත්‍ර තත්‍ර දීඝරත්තං කල්‍යාණ පාපකානං** ආදිය කියන ලදී. **තත්‍ර තත්‍රා** යනු ඒ ඒ යෝනි ගති ඨිති නිවාස නිකායවල අරමුණුවල හෝ **දීඝරත්තං** බොහෝ කාලයක් **පච්චනුභොති** දැනගනී. **න සො ජාතො නාහොසි** ආත්මය නොඉපදෙයි. ධර්ම වශයෙන් නොඉපදේ. සැමදා විද්‍යමානය යන අර්ථයයි. එහෙයින්ම අතීතයෙහි නොවීය. අනාගතයෙහි නොවන්නේය. යමෙක් ඉපදුනේ නම් හේ වීය. යමෙක් උපදියි නම් හේ වන්නේය. නොහොත් ආත්මය නොඉපදෙයි. නොවීයයි එය සදාකාලිකව ඇති බැවින් අතීතයෙහි ද නොඉපදී නොවීය. අනාගතයෙහිද නොඉපදෙන්නේය. නොවන්නේය. **නිච්චා** යනු ඉපදීම් නැතිවීම් නැතිව. **ධුවො** ස්ථිර, සාර වූ **සස්සතො** සර්වකාලික වූ **අවිපරිණාම ධම්මො** තමාගේ ප්‍රකෘති ස්වභාවය අත්නොහරින දහම් කටුස්සා මෙන් නොයෙක් ආකාරවලට නොපෙරළේ. මෙසේ මේ සියළු සාස්වත දෘෂ්ටිය කියන ලදී. සෙසු සියල්ල ප්‍රකටය.

## ඡක්ක නිද්දේසය

සත්තක නිද්දේසයෙහි ස්ථිර වූ අර්ථයෙන් අප්‍රහීණ වූ අර්ථයෙන්ද සයනය කෙරේ යයි **අනුසයා** වේ. සසරෙහි සතුන් බඳියි. නටයි යනු **සංයෝජනානි** වේ. හැසිරීම් වශයෙන් නැගී සිටී යනු **පරියුට්ඨානානි** වේ. කාමරාගයම නැගිටීම කාමරාග **පරියුට්ඨානං** වේ. සෙස්සෙහිද මෙම නයයි. අසත්‍ය ධර්ම ලාමක අර්ථයෙන් හෝ අශාන්ත වූ දර්මයයි **අසද්ධම්මා** වේ. රාගාදි දොස්වලින් දූෂිත වූ චරිත යයි **දුච්චරිතානි** වේ. එයින් ඒ ආකාරයෙන් සිතානුයි **මානා** නම් වේ.

දිට්ඨි නිද්දේසයෙහි **රූපී** යනු රූපය ඇත්තෙක් **චාතුම්මහා භූතිකො** යනු සතරමහා භූතමය. මව්පියන්ගේ මෙය මාතාපොසකං වේ. එය කාම ශුක්‍ර ශෝනිතද මාතා පෙත්තිකයෙහි හටගත්තේය. උපන්නේය යනු **මාතා පෙත්තික සම්භවො** වේ. මෙහි රූප කය හිසින් මනුසත්තභාවය අත්තා යයි කියයි. දෙවනුව එය අතහැර දිව්‍යාත්මභාවයයි කියයි. **දිබ්බො** යන දිව්‍යලෝකයෙහි හටගත්. **කාමාවචරො** යනු කාමාවචර සදෙව්ලොවට ඇතුළත් කැබලි ආහාර බුදීනුයි **කබළිංකාර භක්ඛො** වේ. **මනෝමයා** යනු ධ්‍යාන මනසින් ඉපදුණු **සබ්බංග පච්චංගී** සියළු අඟපසඟ යුත්. **අහිනින්ද්‍රියො** පරිපූර්ණ ඉන්ද්‍රිය. බ්‍රහ්ම ලෝකයේ ඇති ඔවුන්ගේ වශයෙන් අන් අයගේද

සටහන් වශයෙන් මෙය කියන ලදී. **ආකාසානඤ්චායතනූපගො** ආකාසානඤ්චායතන භාවයට පැමිණි. ඉතිරි ඒවායෙහිද මෙම නයයි. සෙසු සියල්ල ප්‍රකටය.

## සත්තක නිද්දේසය

අට්ඨක නිද්දේසයෙහි කෙලෙස්ම **කිලෙසවත්‍ථුති** වේ. **කුසීත වත්‍ථුති** යනු කුසීතයාගේ අලසයාගේ වස්තු පිහිටීම. කුසීතවීමට හේතු යන අර්ථයයි. **කම්මං කත්තබ්බං හොති** යනු චීවර පිළියෙළ කිරීම් ආදි කර්මාන්ත කළයුතු වේ. **න විරියං ආරභති** දෙයාකාර වීර්යම ආරම්භ නොකරයි. **අප්පත්තස්සා** යනු විපස්සනා මග්ග ඵල ධර්මවලට නොපැමිණි පැමිණි පිණිස **අනධිගතස්ස** එම අනධිගමයේ අධිගමය පිණිස. **අසච්ඡිකතස්ස** එහිම සාක්ෂාත් නොකළ දේ සාක්ෂාත් කරනු පිණිස. **ඉදං පඨමං** දැන් බැහැ මම නිදාගනිමි යයි මෙසේ පසුබැසීම පළමු කුසීත වස්තුවයි. මෙයින් සියළු තන්හි අර්ථය දතයුතුය. **මාසාචිතං මඤ්ඤෙ** යනු මෙහි මාසාචිත නම් තෙත මාසයයි. යම්සේ තෙත මාසය ගරුක වේද මෙසේ ගරුක වේ යන අදහසයි. **ගිලානාවුට්ඨිතො හොති** ගිලන්ව සිට පසුව නැගිටීම වේ. **අට්ඨසු ලෝකධම්මෙසු** මෙහි ලෝකයේ ධර්ම **ලොකධම්මො** මෙයින් මිදුනෙක් නම් නැත. බුදුවරුන්ටද වේ. එහෙයින් ලෝක ධර්ම යයි කියනු ලබත්. **පටිඝාතො** යනු නසන ආකාරයයි. **ලාභෙ සාරාගො** මම ලාබ ලබමියි මෙසේ ගෙහසිත සොම්නස් වශයෙන් උපන් රාගය. එය සිත නසයි. **අලාභෙන පටි විරොධො** මම ලාභ නොලබමියි දොම්නස් වශයෙන් උපන් විරෝධය. එයද සිත නසයි. එනිසා **පටිඝාතො** යයි කියන ලදී. යස ආදියෙහිද මම බොහෝ පිරිවර මම අඩු පිරිවර මම ප්‍රශංසාවට පැමිණ මම නින්දාවට පැමිණ මම සැපයට පැමිණ මම දුකට පැමිණ මෙසේ මේවායෙහි ඉපදීම දතයුතුය. **අනරියවොහාරා** අනාර්යයන්ගේ ව්‍යවහාරයයි.

**පුරිසදොසා** යනු පුරුෂයින්ගේ දොස් **න සරාමි** මම මොහු කළ දේ සිහි නොකරමි. නොසලකමි. මෙසේ නොමැතිවීමෙන් නොවෙළයි. මුදවයි. **චොදකං යෙව පටිප්ඵරති** විරුද්ධව සිට පතුරුවයි. නැවත කතා කිරීමෙන් සිටියි. **කින්නුඛො තුය්හං** යනු ඔබ වගේ බාලයකුගේ අව්‍යක්තයකුගේ බිණීමෙන් කිම? ඔබ ඇවතට නොපැමිණි චෝදනාව නොදන්නේදැයි දක්වයි. ඔබ කිසිවක් නොදන්නේ කිවයුතුද සිතන්නේ

යයි මඩියි. **පච්චාරොපෙති** ඔබද කවුදැයි ආදිය කියන්නේ නැවත ආරෝපණය කරයි. **පටිකරොහි** දේසනාගාමිනිය දෙසන්න. වුට්ඨාන ගාමිනියෙන් නැගී සිටින්න. එයින් ඔබ සැපසේ පිහිටියේ අතිකක් චෝදනා කරන්න යයි දක්වයි. **අඤ්ඤෙනඤ්ඤං** පටිචරති යනු අනිත් හේතුවකින් වචනයෙන් අනිත් හේතුවක් වචනයක් වසයි. ඇවතට පැමිණියෙහිදැයි කී කල්හි කවුද පැමිණියේ? කුමකටද පැමිණියේ? කෙසේද පැමිණියේ? කොහේදිද පැමිණියේ? කුමක්ද කියන්නෙ? යයි කියයි. මෙබඳු වූ යමක් ඔබ දකිනා ලද්දෙහිද කීමෙන් ඇසුනෙමි. කතා නොකරයි. **බහිද්ධ කථං අපනාමෙති** මෙබඳු නම් ඇවතට පැමිණියෙහිද විචාල කල පැලලුප් නුවර ගියෙමියි කියා නැවත ඔබේ පැලලුප් නුවර ගමන නොවිචාලෙමුයි කී කල්හි එයින් රජගහ ගියෙමියි රාජගහට හෝ යව, බ්‍රාහ්මණ ගෙයක හෝ ඇවතට පැමිණියෙහිද එහි මට ඌරුමස් ලැබුනේය ආදිය කියමින් කතාව බැහැරට විසුරුවයි. **කොපං** කිපි බව. **දොසං** දූෂිත බව මේ දෙකම ක්‍රෝධයට නම් වේ. **අප්පච්චයං** අසන්තෝෂ ආකාරය. මෙය දොම්නස වේ. **පාතුකරොති** දක්වයි. ප්‍රකාශ කරයි. **බාහා වික්ඛෙපකං භණති** අත් විසුකරමින් ලැජ්ජ නැති වචන කතාකරයි. **විහෙසෙති** වෙළයි. බාධා කරයි. **අනාදියිත්වා** ගෞරවයෙන් නොගෙන අවමන් කොට අනාදර කොට යන අර්ථයය. **අතිබාළ්හං** ඉතා දැඩි, ප්‍රමාණයට වැඩි. **මයිව්‍යාවටා** මා කෙරෙහි ව්‍යාපාරයට පැමිණියා. **හීනායාවත්තිත්වා** හීන වූ ගිහිභාවය පිණිස පැමිණ ගිහියෙක් වී යන අර්ථයයි. **අත්තමනා හොථා** තුටු සිත් වන්න. මවිසින් ලැබිය යුතු දේ ලබව්. මවිසින් විසිය යුතු ස්ථානයෙහි වසවු. මා විසින් පහසු විහරණය කරන ලදැයි යන අදහසින් කියයි.

අසඤ්ඤී යයි පවතින වාදය අසඤ්ඤවාද වේ. එය ඔවුන්ට ඇත්තේය යන අර්ථයෙන් **අසඤ්ඤීවාදා** නම් වේ. රූපී අත්තා ආදියෙහි ලබන්නා කසිණ රූපය ආත්මයයි ගෙන **රූපී** යයි දෘෂ්ටි උපදවයි. අලාබියා තර්කය පමණකින්ම ආජීවකයින් මෙන් ලාබියාද අරූප සමාපත්ති නිමිත්තම ආත්ම යයි ගෙන **අරූපී** යයි දෘෂ්ටි උපදවයි. අලාභියා තර්කය පමණකින් නිගණ්ඨයන් මෙන් අසඤ්ඤී භවයෙහි වනාහි මෙහි ඒකාන්ත හේතුව යයි නොසෙවිය යුතුය. දෘෂ්ටිගතිකයා පිස්සකු මෙන් මොනවාහරි ගනියි. **රූපී ච අරූපී වා** යනු රූපාරූප මිශ්‍රභාවයෙන් කියන ලදී. මේ දෘෂ්ටිය රූපාවචර අරූපාවචර සමාපත්ති ලාභීහුද තාර්කිකයෝද උපදවති. **නෙවරූපී නාරූපී** යන ඒකාන්ත තර්ක දෘෂ්ටියකි. **අත්තවා** යන පරිත්ත කසිණය ආත්ම වශයෙන් ගන්නාගේ දෘෂ්ටියයි. අනන්තවා යනු අප්‍රමාණ

කසිණයයි. අත්තවා ච අනන්තවා ච උඩ යට වටේ හරහ අපරියන්ත වූ කසිණය ආත්මයයි ගෙන උපන් දෘෂ්ටිය නෙවත්තවානානත්තවා යනු තාර්කික දෘෂ්ටියක්මය. සෙසු සියල්ල ප්‍රකටය.

## අට්ඨක නිද්දේසයයි.

නවක නිද්දේසයෙහි නව ආඝාත වත්‍ථූනි සත්වයන් කෙරෙහි උත්පත්ති වශයෙන් කියන ලදී. පුරුෂයින්ගේ මල පුරිස මලානි වේ. නවවිධානි කොටස් නවය, ප්‍රභේද නවය. තණ්හං පටිච්ච යනු තෘෂ්ණාව නිසා. පරියෙසනා යනු රූපාදී අරමුණු සෙවීම. එය තෘෂ්නාව ඇතිකල්හි වේ. ලාභො යනු රූපාදි අරමුණු ලැබීමය. එය සෙවීම ඇතිකල්හි වේ.

විනිශ්චය ඤාණ තණ්හා දිට්ඨි විතක්ක වශයෙන් සතරාකාරය. එහි "සුව විනිස දැනීම සුව විනිස දැන අධ්‍යාත්මයට සුව එලවා ගන්නේය"යි මෙය ඤාණ විනිසයි. විනිච්ඡයො තෘෂ්ණා දෘෂ්ටියයි. විනිශ්චය දෙකකි. මෙසේ ආවා වූ එකසිය අටක් තෘෂ්ණාවෙහි හැසිරීම තෘෂ්ණා විනිශ්චයයි. දෙසැට දිටු දිටු විනිසයි. ඡන්‍දො ඛො දෙවානමින්‍ද විතක්කනිදානො මේ සූත්‍රයෙහි මෙහි විනිශ්චය යයි කියන ලද විතක්කයම ආවේය.

ලාබ ලැබ ඉටු අනිටු සුන්දර අසුන්දර ද යනු විතර්කයෙන්ම විනිසති. මෙපමණක් මගේ රූප අරමුණ පිණිස වන්නේය. මෙපමණක් ශබ්ද අරමුණ පිණිස වන්නේය. මෙපමණක් මට වන්නේය. මෙපමණක් අනුන්ට වන්නේය. මෙපමණක් පරිභෝග කරමි. මෙපමණක් නිදන් කරමි. ලාභං පටිච්ච විනිච්ඡයො යයි එහෙයින් කියන ලදී.

ඡන්‍දරාගො මෙසේ අකුසල විතර්කයෙන් විතර්කනය කළ වස්තුවෙහි දුබල රාගයද බලවත් රාගයද උපදී. මෙහි ඡන්‍දය යනු දුබල රාගයට වෙනත් වචනයකි. අජ්ඣොසානං යනු මම මගේ යයි බලවත් නිගමනයයි. පරිග්ගහො තෘෂ්ණා දෘෂ්ටි වශයෙන් අයිතිකර ගැනීමයි. මච්ඡරියං අනුන් විසින් ලබාගන්නා සාධාරණ භාවය නොඉවසීමයි. එහෙයින්ම පුරාණයෝ මෙසේ වචනාර්ථයක් කියති. "මෙය ආශ්චර්ය වේ. මටම වේවා, අනිකකුට නොවේවා" යනුවෙන් පැවතීම මච්ඡරිය යයි කියනු ලැබේ. ආරක්ඛො යනු දොර වසන පෙට්ටි රැකීම් වශයෙන් මනාව රැකීමයි. පාලනය කෙරේනුයි අධිකරණං හේතුවට මේ අධිවචනයකි. ආරක්ඛාධිකරණං භාව නපුංශකය. ආරක්ෂා හේතු යන අර්ථයයි.

දණ්ඩාදානාදියෙහි අනුන් වැළැක්වීම සඳහා දඬුවම් ගැනීම **දණ්ඩාදාන** වේ. එක් මුවහත ඇති ශාස්ත්‍රයක් ගැනීම **සත්ථාදාන** වේ. **කලහො** කාය වාචා දෙකකි. මුලින් විරෝධය **විග්ගහො** පසුවය. විග්ගහා වේ. පසුව **විවාදො** වේ. තුවං තුවං අගෞරව වචන ත්වං යන අර්ථයි.

**ඉඤ්ජිතානි** සෙලවීම්. **අස්මීති ඉඤ්ජිතමෙතං** ආදි සියළු පදවලින් මානය කියන ලදී. **අහං** පවතින මානයේ සෙලවීමකි. **අයමහං** පැවතේ. **නෙවසඤ්ඤීනාසඤ්ඤී භවිස්සති** පවත්නේද සෙසු නවයෙන්ම මානයම කියන ලදී. මානය සෙලවීමෙන් සෙලවෙන ලදී. හැඟීමෙන් නැඟෙන ලදී. සැලීමෙන් සැලෙන ලදී. ප්‍රමාදයෙන් ප්‍රමාදවන ලදී. ඒ ඒ කාරණයේ සංඛත බැවින් සංඛත යයි කියන ලදී. සෙසු සියල්ල ප්‍රකටය.

## නවක නිද්දේසය

දසක නිද්දේසයෙහි කෙලෙස්ම **කිලෙස වත්ථූනි** වේ. මෙහි ආඝාත වස්තු වනාහි **අනත්ථං මෙ අචරි** යනාදි වශයෙන් කෝප නොවිය යුත්තෙහි කනු කටු ආදි අස්ථානයෙහි උපන් ආඝාතය සමානයි කියන ලදී. මිථ්‍යා ආත්මයෙහි **මිච්ඡා ඤාණං** යන පාප ක්‍රියාවල උපාය චින්තා වශයෙන් පව්කොට යහපත් දෙයක් කරන ලදැයි ප්‍රත්‍යවේක්ෂා කරන ආකාරයෙන් උපන් මෝහ යයි. **මිච්ඡා විමුත්ති** යනු අවිමුක්තවම සිටියේ විමුක්ති සංඥාව සෙසු සියල්ල ප්‍රකටය.

## දසක නිද්දේසය

තණ්හා විචරිත නිද්දේසයෙහි **තණ්හා විචරිතානි** යන තණ්හා හැසිරීම්, තෘෂ්ණා පැවැත්වීම. **අජ්ඣත්තිකස්ස උපාදායා** යනු අධ්‍යාත්මික ස්කන්ධ පංචකය අල්වාගෙන. මෙහි තෘතීයා වේ ෂෂ්ටි වචනයකි. **අස්මීති හොති** මේ අධ්‍යාත්ම ස්කන්ධ පංචකය අල්ලාගෙන තෘෂ්ණා දෘෂ්ටි මාන වශයෙන් සමූහ වශයෙන් ගනිමින් වෙමි යයි සිතයි. එසේ ඇති කල්හි යන අර්ථයයි. **ඉත්ථස්මීති හොතී** යනාදියෙහි මෙසේ සමූහ වශයෙන් මම යයි ගැනීම ඇතිකල්හි හේතුවකින් නැතුවද හේතුවකින් ඇතැයි දෙගුණ කොට ගනී. එහි හේතුවකින් නැතැයි අතිත් ආකාරයකට පැමිණ ස්වකීය භවයම අරමුණුකොට මෙසේ වෙමියි සිතයි. **ක්ෂත්‍රියාදීන්** කෙරෙහි මේ ආකාරය මම යයි මෙසේ තෘෂ්ණා මාන දෘෂ්ටි වශයෙන් වේ යයි යන

අර්ථයයි. මෙය හේතුවකින් තොර ගැනීමය. හේතුවකින් ගැනීම වනාහි සමත අසමත වශයෙන් දෙයාකාරය. එය දැක්වීමට **එවස්මීතිච අඤ්ඤථාස්මීතිච** කියන ලදී. එහි **එවස්මීති** මෙය සමාන වශයෙන් හේතුවකින් ගැනීමය. මේ ක්ෂත්‍රියෙකි. මේ බ්‍රාහ්මණයෙකි. මෙසේ මමද අර්ථ වේ. **අඤ්ඤථාස්මීති** මෙය අසමාන වශයෙන් ගැනීමයි මේ ක්ෂත්‍රියා මේ බ්‍රාහ්මණයා මම එයින් වෙනත්ය හීන හෝ අධි හෝ යයි අර්ථ වේ. මේ වර්තමාන වශයෙන් තණ්හා සතරේ හැසිරීමයි. **භවිස්සන්ති** ආදිය සතර වනාහි අනාගත වශයෙන් කියන ලදී. ඒවා පෙර චතුක්කයෙහි කියන ලද නයින් අර්ථය දතයුතුය.

**අස්මී** ශාස්වත වශයෙන් වෙමි. **සාතස්මී** අසාස්වත වශයෙන් වෙමි. සතස්මී හෝ පාඨයකි. එහි ඇත යන විය. නිත්‍ය යන්නට අධි වචනයකි. ගිලෙයි යනු සතංවේ අනිත්‍යයට අධි වචනයෙකි. මෙසේ මේ දෙක සාස්වත උච්ඡේද වශයෙන් කියන ලදැයි දතයුතුය. මෙයින් පසුව **සියං** යනාදි සතර සංසය පරිවිතක්ක වශයෙන් කියන ලදී. ඒවා පෙර චතුක්කයෙහි කියන ලද අයුරින්ම අර්ථ වශයෙන් දැනගත යුතුය. **අපාහං සියං** යනාදි සතර මම වන්නෙමියි මෙසේ ප්‍රාර්ථනා කල්පනා වශයෙන් කියන ලදී. ඒවා පෙර චතුක්කයෙහි කියන ලද පරිද්දෙන් දැනගත යුතුය.

**දිටු හිස් දෙකෙක් වේ - සතරකි මුල් පිරිසිදු**
**තුණ තුණය මේවා - අටලොසයයි දැක්විණි**

මේවායෙහි සාස්වත උච්ඡේද වශයෙන් කියන ලදී. දිට්ඨීසීස නම් දෙකකි. **අස්මී** යන්න වන්නේය. වූයේය මම වෙමිද වන්නෙමි. මේ සතරය. සුද්ධ සීසමය. **ඉත්‍ථස්මි** ආදිය තුන තුන යයි දොළසකි. සීස මූලකය නම්ය. මෙසේ මේ දිට්ඨී සීස දෙක සුද්ධ සීස හතර සීසමූල දොලහ යයි දහඅට තෘෂ්ණාව හැසිරෙන ධර්මයයි දතයුතුය.

දැන් පිළිවෙළ ඒ ධර්ම බෙදා දැක්වීමට **කථඤ්ච අස්මීති හොති** යනාදිය අරඹන ලදී. එහි **කිඤ්චි ධම්මං අනත්‍ථකාරිං කරිත්වා** රූප වේදනාදියෙහි කිසි එක් ධර්මයකුදු අවිනිබ්භාග කොට එක එකින් ගෙන සමූහ වශයෙන් ගත්තේය යන අර්ථයය. **අස්මීති ඡන්දං පටිලභති** යනු පංචස්කන්ධයන් නිරවශේෂයෙන් ගෙන (අහං) මම යයි තෘෂ්ණාව ලබයි. මනා දිට්ඨීවලද මෙම නයයි. එහි මේ තෘෂ්ණාව හැසිරෙන නිර්දේශය

මාන දිට්ඨි හැර තෘෂ්ණාව. එහෙයින් තදේකාර්ථ වශයෙන් මෙහි කියන ලදී. තෘෂ්ණා සීර්සයෙන් හෝ පපඤ්ච තුනද දක්වන ලදී. එය උද්දේසනම් අනුරූපයෙන්ම විස්තර කරන්නට මාන දිට්ඨි ගන්නා ලදී. තෘෂ්ණාව ප්‍රපඤ්චයක් වශයෙන් දක්වමින් එය සමග සෙසු ප්‍රපංච දැක්වීමට මෙසේ කීහ. **තස්මිං සති ඉමානි පපඤ්චිතානි** එහි **අස්මීති ඡන්දං** ලබයි ආදි නයින් කියන ලද්දේ ප්‍රපංච තුන ඇතිකල්හි නැවත මේ ඉත්‍ථස්මි යනාදිය ප්‍රපංච වේ යන අර්ථයයි.

**ඛත්තියොස්මි** යනාදියෙහි අභිසේක සේනා අමාත්‍යාදියෝ මේ **ක්‍ෂත්‍රියෙකි මම.** මන්ත්‍ර අධ්‍යයන කරන පුරෝහිතාදියෙන් බ්‍රාහ්මණයෙකි **මම.** කෘෂි ගවපාලන ආදියෙන් වෛශ්‍යයකි මම ගිහි ලක්‍ෂණවලින් ගෘහපතියෙකි මම. මේ නයින් අර්ථ දතයුතුය. මෙසේ **ඉත්‍ථස්මීති** හොති මෙසේ **ක්‍ෂත්‍රියාදියෙහි** ක්‍ෂත්‍රියාදි ආකාර තමා කෙරෙහි උපදවා මේ ආකාර මම වේ. **යථා සො ඛත්තියො** යනාදියෙහි හේ අභිසේක සේනා අමාත්‍යාදියෝ ක්‍ෂත්‍රිය වේ. එසේ මමද **ක්‍ෂත්‍රියෙකැයි** මේ නයින් අර්ථ දතයුතුය. දෙවන තියෙහි යම්සේ හේ අභිෂේක සේනා අමාත්‍යාදියෙන් ක්‍ෂත්‍රිය වේ. එසේ මම ක්‍ෂත්‍රියකු නොවේ. මම වනාහි එයින් හීනය. උසස්ය හෝ මේ නයින් අර්ථය දතයුතුය. **භවිස්සන්ති** ආදි නිර්දේශවලද මෙම නයයි.

මෙසේ අධ්‍යාත්මිකයාගේ අල්ලා ගැනීමෙන් තෘෂ්ණාව හැසිරෙන හැටි බෙදා දැන් බාහිරව ගෙන තෘෂ්ණාව හැසිරෙන ආකාරය බෙදීමට **තත්‍ථ කතමානි** යයි යනාදිය කීහ. එහි **බාහිරස්ස උපාදාය** යන බාහිර ස්කන්ධ පංචකය ගෙන මෙතැනද තෘතීයාර්ථයෙහි ෂෂ්ඨී වචනයි. **ඉමිනා** මේ රූපයෙන් හෝ.........විඤ්ඤාණයෙන් හෝ අවසේසය උද්දේස වාරයෙහි කියන ලද නයින්ම දතයුතුය. නිද්දේස වාරයෙහි අවකාරිං කරිත්වා විනිබ්භෝග (වෙන්කර) කර **ඉමිනා අස්මීති ඡන්දං පටිලභති** ආදියෙහි මේ රූපයෙන් හෝ..........විඤ්ඤාණයෙන් හෝ මෙසේ පඤ්චස්කන්ධයෙහි ඒක දේශයක් ගෙන මෙයින් මම ඡන්දාදිය ලබමි යයි මේ අර්ථය දතයුතුය.

**ඉමිනා ඛත්තියොස්මීති** ආදියෙහි මේ ඡත්‍රයෙන් හෝ කඩුවෙන් හෝ අභිසේක සේනා අමාත්‍යාදියෙන් හෝ මම ක්‍ෂත්‍රියෙක් වෙමිය යන පෙර නයින්ම අර්ථය දතයුතුය. **ඉමිනා** යන පදය පමණක් මෙහි විශේෂයයි. **යථා සො ඛත්තියො** ආදියෙහිද **ඉමිනා** යයි කියන ලද පදයම විශේෂයි.

එහෙයින් ඒ ආකාරයෙන් **ක්ෂත්‍රියෙක් වේද** මෙසේ මමද කඩුවෙන් හෝ ඡත්‍රයෙන් හෝ අභිසේක සේනා අමාත්‍යාදියෙන් හෝ ක්ෂත්‍රියෙකැයි මෙසේ යොදා සියළු පදවල අර්ථ දතයුතුය. **ඉමිනා නිච්චොස්මි** පංච ස්කන්ධයෙන් වෙන්කොට රූපාදියෙහි එකම ධර්මයක් මම යයි ගෙන මේ කඩුවෙන් හෝ ඡත්‍රයෙන් හෝ මම නිත්‍යයයි ස්ථිර යයි හඟී. උච්ඡේද දෘෂ්ටියෙහි මෙම නයයි. සෙසු සියල්ල කියන ලද ආකාරයෙන්ම දතයුතුය.

**ඉති එවරූපවති අතීතානි ඡත්තිංසො** එක් එක් පුද්ගලයාගේ අතීතයෙහි තිස්හය **අනාගතානි ඡත්තිංසා** එක එක පුද්ගලයාගේ අනාගතයේ තිස්හය **පච්චුප්පනෙ ඡත්තිංසා** එක එක පුද්ගලයාගේ යථාලාභ වශයෙන් බොහෝ හෝ වර්තමානයෙහි තිස්හය සියළු සත්වයින්ට වනාහි ඒකාන්තයෙන්ම අතීතයෙහි තිස්හය අනාගතයෙහි තිස්හය වර්තමානයෙහි තිස්හය යයි දතයුතුය. තෘෂ්ණා මාන දෘෂ්ටි අසදෘෂය අත්‍යන්ත ප්‍රභේද සත්වයෝ ඇත. **අට්ඨ තණ්හා විචරිතසතං හොති** මෙහි වනාහි එකසිය අටක් තෘෂ්ණාව හැසිරෙන ලද වේයයි දතයුතුය. සෙසු සියල්ල ප්‍රකට අර්ථ ඇත්තේය.

දිට්ඨි යන නිද්දේසයෙහි **බ්‍රහ්මජාල වෙය්‍යාකරණෙ** යන බ්‍රහ්මජාල නම් ප්‍රකාශ කිරීමෙහි දීඝනිකායේ පළමුවන සූත්‍රාන්තයෙහි **වුත්තානිභගවතා** ශාස්තෘවරයා විසින් තමාම ගැටී වදාරන ලදී. **චත්තාරො සස්සත වාදා** යනාදියෙහි පින්වත් ශ්‍රමණ බ්‍රාහ්මණයෝ කුමකට පැමිණ කුමක් අරබයා සාස්වතවාදය සාස්වතයද ආත්මයද ලෝකයද පණවත්. සතර වස්තුවලින් යයි ආදියෙන් බ්‍රහ්මජාලයෙහි කියන ලද නයින්ම ප්‍රභේදද අර්ථයද දතයුතුය.

**සම්මෝහ විනෝදනී නම් විභංග අර්ථ වර්ණනාවේ**
**දාහත්වන ඛුද්දක වස්තු විභංග නිද්දේසයයි.**

# 18.
# ධම්මහදය විභංගය

ඉක්බිතිව දැන් ධම්මහදය විභංගයේ පෙළ පළමුව මෙසේ දතයුතුය. මෙහි මුලින්ම ස්කන්ධාදීන්ගේ දොලොස් කොටස් වශයෙන් සර්ව සංග්‍රාහික නම් වාරයක් කියන ලදී. දෙවනුව ඒ ධර්මයන්ගේම කාමධාතු ආදියෙහි උත්පත්ති අනුප්පත්ති දස්සන වාරය නම් වේ. තුන්වෙනුව එහිම පරියාපන්න අපරියාපන්න දස්සන වාරය නම් වේ. සතරවනුව භූමිතුනේ උත්පත්ති ක්‍ෂණයෙහි විද්‍යමාන අවිද්‍යමාන ධම්ම දස්සන වාර නම් වේ. පස්වෙනුව ඒ ධර්මයන්ගේ භූමිඅන්තර වශයෙන් දස්සන වාර නම් වේ. සවෙනුව ගතිවල උපදින කර්ම ආයු ප්‍රමාණය දක්වන වාර නම් වේ. සත්වෙනුව අසඞ්ඛෙය්‍යාදි වාර නම් වේ. අටවෙනුව සාරම්මණ ආරම්මණ වාර නම් වේ. නවවෙනුව ඒ ස්කන්ධාදි ධර්මයන්ගේ දිට්ඨි සූත්‍රාදි වශයෙන් සංග්‍රහ කළ දස්සන වාර නම් නම් වේ. දසවෙනුව කුසලත්‍රිකාදි වශයෙන් සංග්‍රහ කළ දස්සන වාර නම් වේ. මෙසේ දස වාරයකින් පිරිසිඳ පෙලෙහි පළමු සර්ව සංග්‍රාහික වාරයෙහි අවීචියේ පටන් භවාග්‍රය දක්වා අතරෙහි ස්කන්ධ කීයදැයි විචාල කල්හි එකක් යයි හෝ............සතරක් යයි හෝ නොකියා සයකදැයි නොකියා පසක් යයි කීමට අනිත් සමර්ථයෙක් නැති බැවින් තමන්ගේ ඤාණ බලය දක්වන්නේ පඤ්චක්ඛන්ධා යයි ඇසූ දෙයට අනුරූපව විසඳුම කීහ. ප්‍රශ්න විසඳීමෙහි සර්වඥ ව්‍යාකරණ නම් යයි කියනු ලැබේ. ද්වාදසායතනානි යනාදියෙහිද මෙම නයමැයි. රූපස්කන්ධාදීන්ගේ ප්‍රභේදය ඛන්ධ විභංගාදියෙහි කියන ලද නයින්ම දතයුතුය.

දෙවන වාරයෙහි කාම භවයෙහි යම් ධර්මයක් කාම ධාතුවෙන් හටගත් සත්වයන්ගේ උත්පත්තිය කාමධාතුවට ඇතුළත් හෝ ඇතුළත් නොවන හෝ ඒ සියල්ල සංග්‍රහකොට කාමධාතුයා පඤ්චක්ඛන්ධා යනාදිය කියන ලදී. රූපධාතු ආදියෙහිද මෙම නයයි. යම්හෙයකින් රූප ධාතුවට ඇතුළත් සත්වයින්ගේ ඝානයතනාදීන්ගේ අභාවයෙන් ගන්ධායතනාදිය ආයතන කෘත්‍යය නොකරයි. එහෙයින් රූපධාතුයා ඡ ආයතනානි නව ධාතුයො යනාදිය කියන ලදී. යම්හෙයකින් අවකාශ වශයෙන් හෝ සත්වෝත්පත්ති වශයෙන් හෝ ඇතුළත් නොවන ධාතු නම් නැත. එහෙයින් අපරියාපන්න

ධාතුයා යයි නොකියා ඒ ඒ අපරියාපන්න ඒ ඒ අවස්ථාවේ දැක්වීම සඳහා **අපරියාපන්නෙ කති ඛන්ධා?** යයි කියන ලදී.

තුන්වන වාරයෙහි **කාමධාතු පරියාපන්නා** යයි කාම ධාතුව භජනය කරන අර්ථයෙන් පරියාපන්න වේ. එය නිශ්‍රිතව ඊට ඇතුළත්ව කාමධාතු සංඛ්‍යාවටම යන ලද යන අර්ථයයි. සෙසු පදවලද මෙම නයයි. **පරියාපන්නා** යනු භව වශයෙන් හා අවකාශ වශයෙන්ද සීමා කරන ලදී. **අපරියාපන්නා** යනු එසේ සීමා නැත.

සතරවන වාරයෙහි **එකාදසායතනානි** සද්දායතනය හැර එහි ඒකාන්තයෙන් ප්‍රතිසන්ධියක් නොඋපදී. මේ නයින් සියළු අර්ථය දතයුතු. සතුන් කෙරෙහි දෙවියන් ගේ අසුරයින් ගේ ගති වශයෙන් නොකියා විශේෂයක් නැතිව ගබ්භසෙය්‍යක යයි කියන ලදී. යම්හෙයකින් යම්තැන්වල ගබ්භසෙය්‍යකයන් පහළවෙත්ද ඒ තැන්වල ඔවුන්ගේ සත්වායතනයන් දැනගත යුතුය. ධාතුද එසේය. සෙසු අර්ථ ප්‍රකට අර්ථ වේ.

පස්වන වාරයෙහි කියයුතු යමක් වේනම් ඒ සියල්ල ධම්මසංගහ අටුවාවේ කියන ලදමය. සයවන වාරයෙහි කාමගුණ පහේ නොයෙක් ආකාරයෙන් හෝ ඍද්ධි විශේෂයෙන් හෝ ක්‍රීඩා කෙරේනුයි දේවා නම් වේ. **සම්මති දෙවා** යනු දෙවියා දේවිය මෙසේ ලෝක සම්මුති දෙවියෝ. **උප්පත්ති දෙවා** යන දෙව්ලොව උපන් හෙයින් උත්පත්ති දෙවියෝය. **විසුද්ධි දෙවා** යනු සියළු දෙවියන්ගේ පූජාවට සුදුසු වූ සියළු කෙලෙස්වලින් විසුද්ධ වූ දෙවියෝය. **රාජානො** යනු මුදුනෙහි අභිසේක කළ ක්‍ෂත්‍රියාය. **දෙවියො** යනු ඔවුන්ගේ මෙහෙසියෝය. **කුමාරා** යනු අභිසේක රජවරුන්ගේ අභිසේක කළ දේවියගේ කුසයෙහි උපන් කුමාරයා. **උපොසථ කම්මං කරිත්‍වා** යනු තුදුස්වකාදියෙහි අටඟින් සමන්විත උපොසථය සමාදන්ව. දැන් කුඩා දානාදි පුණ්‍යකර්ම මිනිස් සුභගභාවය පිණිස ප්‍රත්‍ය ප්‍රමාණ වශයෙන් කරන ලදී. මිනිස් සුභගභාවය පිණිස අධි ප්‍රමාණයක්, අධිප්‍රමාණ භාවයෙහිද නානාප්‍රකාර භේදයෙන් යුත් නානාප්‍රකාර ක්‍ෂත්‍රිය මහාසාරාදි භාවයට ප්‍රත්‍ය වේ. එහෙයින් ඒ අනුව උත්පත්ති භේද දක්වමින් **අප්පෙකච්චෙ ගහපති මහාසාළානං** යනාදිය කීහ. එහි මහාසාර මොවුන්ටය මහාසාරා නම් වේ. රකාරයට ළ කාරය කොට මහාසාළා යයි කියන ලදී. ගෘහපතීහු ද මහාසාළ වෙති. ගහපති මහාසාළ යනු ඔව්හුය.

යමෙකුගේ ගෙයි අඩු තරමින් සතළිස් කෝටියක ධනයක් නිධානගතව ඇත. කහවනු අමුණු පහක් දවසේ වියදම වේ. මේ ගහපති මහාසාළ නම් වේ. යමෙකුගේ ගෙයි අඩු තරමින් අසූකෝටියක ධනය නිධන්ගතව ඇත. දස අමුණක කහවනු දවසේ වියදම වේ. මේ බ්‍රාහ්මණ මහාසාළ නම් වේ. යමෙකුගේ ගෙයි කෝටි සියයක ධනයක් නිධන්ගතව ඇත. විසි අමුණක කහවනු දවසේ වියදම වේ. මේ ක්‍ෂත්‍රිය මහසාළ නම් වේ. **සහබ්‍යතං** යනු සහභාවයයි. සභාගව උපදියි යන අර්ථයයි. **චාතුම්මහා රාජිකානං** යනාදියෙහි චතුම්මහාරාජික නම් මහාමේරු පර්වතයෙහි මැද වෙයි. ඒවා අතර පර්වත ස්ථාන ආකාශයෙහි ද ඇත. ඒවායේ පරම්පරා සක්වලගලට පැමිණ ඇත. ඛිඩ්ඩා පදොසිකා මනොපදොසිකා සීත වලාහකා උෂ්ණ වලාහකා චන්දිමා දේවපුත්ත සුරිය දේවපුත්ත මේ සියල්ලෝම චාතුම්මහාරාජික දේවලෝකවාසීහු වෙති. තිස්තුන් දෙනෙක් ජනයා එහි උපන් නිසා **තාවතිංසා** වේ. තවද තාවතිංස යනු ඒ දෙවියන්ගේ නාමයම යයි කියන ලදී. ඔව්හු පර්වතවල ආකාශයේ වෙති. ඔවුන්ගේ පරම්පරාද සක්වලගල දක්වා ඇත. යමාදීන්ද එසේය. එකම දිව්‍ය ලෝකය තවත් දෙවියන්ගේ පරම්පරා සක්වල පව්වට නොපැමිණ නැත. එහි දිවසැප හෝ අයිති වූ නිසා **යාමා** වේ. තුටුපහටු වන නිසා **තුසිතා** වේ. ප්‍රකෘතියෙන් පිළියෙල කළ අරමුණින් අතිරේකව කාම රමණයෙහි කැමති භොගයන් මවා රමණය කෙරේනුයි **නිම්මාණාරති** වේ. සිතේ හැසිරීම දැන අනුන් නිර්මාණය කළ භොගවල බලය පතුරවන නිසා **පරනිම්මිත වසවත්ති.**

**අප්පංවා භීයෙය්‍යාවා** යනු දෙවන වර්ෂ සියයට නොපැමිණ විස්සකින් හෝ තිහකින් හෝ හතලිහකින් හෝ පනහකින් හෝ හැටකින් හෝ වර්ෂවලින් අධික වර්ෂ සියයක් යන අර්ථයයි දෙවන වස් සියයට නොපත්බව අප්පං යයි කියන ලදී.

බ්‍රහ්ම පාරිසජ්ජාදියෙහි මහා බ්‍රහ්මයින්ගේ පිරිස් පිරිවර **බ්‍රහ්ම පාරිසජ්ජා** ඔවුන්ගේ පුරෝහිත තනතුරේ සිටියෝ **බ්‍රහ්ම පුරෝහිතයෝය.** වර්ණයෙන් ද දීර්ඝායුෂ්කයෙන් ද මහත් බ්‍රහ්ම මහාබ්‍රහ්මා වේ. ඔවුන්ගේ මහා බ්‍රහ්මයින්ගේ. මේ තුන්දෙනා ප්‍රථමධ්‍යාන භූමියේ එකම තලයක වසති. ආයුෂ අනතරය විවිධය. පරිතත (ටිකක්) ආභා නිසා **පරිත්තාභ** ය. අප්පමාණ ආභා නිසා **අප්පමාණාභා** ය. ගිනි සුලක ගිනි දැල් මෙන් එළිය ඔවුන්ගේ ශරීරයෙන් බිඳි බිඳී වැටෙන්නාක් මෙන් පැතිරේ. (සරති විසරති) යයි **ආභස්සරා** ය. මේ තුන්දෙනා දෙවන ධ්‍යාන භූමියේ එක්තලයක

වසති. ඔවුන්ගේ ආයු අන්තරය විවිධය. **පරිත්ත සුභ අප්පමාණ සුභ සුභකිණ්ණ** මේ තුන්දෙන තුන්වන ධ්‍යාන භූමියේ එක් තලයක වසති. ආයුෂය විවිධය.

**ආරම්මණ නානත්තා** අරමුණේ විවිධත්වය. **මනසිකාර නානත්තා** මෙනෙහි කිරීමේ විවිධත්වය. මෙහි එක්කෙනෙකුට පඨවි කසිණය අරමුණු වේ. එක්කෙනෙකුට ඕදාත කසිණය අරමුණු වේ. මේ අරමුණු නානත්තය. කෙනෙක් පඨවි කසිණය මෙනෙහි කරති. කෙනෙක් ඕදාත කසිණය මෙනෙහි කරති. මෙය මනසිකාර නානත්තවයයි. කෙනෙකුට පඨවි කසිණයෙහි කැමැත්ත වේ. කෙනෙකුට ඕදාත කසිණයේ යයි මෙය පණිධි නානත්තයයි. කෙනෙක් පඨවි කසින වශයෙන් මිදෙති. කෙනෙක් ඕදාත කසිණ වශයෙන් යයි මෙය අධිමොක්ඛ නානත්තයයි. කෙනෙක් පඨවි කසිණ වශයෙන් සිත ඉදිරියට ගෙනේ. කෙනෙක් ඕදාත කසිණ වශයෙනි. මෙය අභිනීහාර නානත්තයයි. කෙනෙකුට පඨවි කසිණ පිරිසිඳින ප්‍රඥාව වේ. කෙනෙකුට ඕදාත කසිණ පිරිසිඳිනා ප්‍රඥාව වේ. මෙය පඤ්ඤා නානත්තයයි.

එහි ආරම්මණ මනසිකාර මුලින් කියන ලදී. ඡන්ද පණිධි අධිමොක්ඛ අභිනීහාර අප්පණාවෙහි ද උපචාරයෙහිද පවතී. පඤ්ඤා වනාහි ලෞකික ලෝකෝත්තර මිශ්‍රව කියන ලදී.

**අසඤ්ඤ සත්තානං** සංඥා නැති. සත්වයින්ගේ කෙනෙක් තීර්ථායතනයෙහි පැවිදිව සිත නිසා ඇලීම් දූෂ්‍යවීම් මුළාවීම් වෙයි යයි සිතෙහි දොස් දැක සිත නැතිකම සෝභනයයි දිට්ඨධම්ම නිබ්බාණ මෙය යයි සංඥා විරාගය උපදවා ඊට අදාල සමාපත්ති වඩා එහි උපදිති. හිටගෙන ඉපදුනහොත් හිටගෙනම සිටිති. හිඳගෙන නම් හිඳගෙනම සිටිති. වැදහෙව නම් එසේම සිටිති. චිත්‍රකර්ම රූප සමානව කල්ප පන්සියයක් සිටිති. එහි අවසානයෙහි ඔවුන්ගේ රූපකාය අතුරුදහන් වේ. කාමාවචර සංඥා ඉපදුනහොත් ඒ දෙවියා ඒ කයින් චුත වේයයි පෙනේ. විපුල වූ ඵල මොවුන්ටනුයි **වෙහප්ඵලා** වේ. තමාගේ සම්පත් නොපිරිහේ යයි **අවිහා** වේ. කිසිකෙනෙකු නොතැවේ යනු **අතප්පා** වේ. සුන්දර දර්ශන අභිරූප පාසාදික නිසා **සුදස්සා** වේ. මනාව දකී සුන්දර මොවුන්ට අප ඒවා දකියි හෝ **සුදස්සී** වේ. සියළු ගුණවලින් භව සම්පත්තියේ ද දෙටු වූයේ මෙහි කනිෂ්ඨයෝ නැත්හුයයි **අකනිට්ඨා** වේ.

ආකාසානඤ්චායතනයට පැමිණියා යනු ආකාසානඤ්චායතනූපගා වේ. ඉතිරි ඒවාද මේවායින්ම වේ.

මෙසේ දෙව්ලෝ (කාමාවචර) සය බඹලෝ නවය සුද්ධාවාස පහ අරූප හතර අසඤ්ඤසත්ත වෙහප්ඵලය සමග විසිහයක් දෙව්ලෝ සහ මිනිස්ලොව සමග විසිහතක් වේ. එහි මිනිසුන්ගේ ද දෙවියන්ගේ ද ආයුෂ බුදුන් වහන්සේ විසින් පිරිසිඳ දක්වන ලදී. සතර අපායෙහි. භූමි දෙවියන්ගේ ආයුෂ පිරිසිඳ නොදක්වන ලදී. එය කුමක් නිසාද? නිරයෙහි ප්‍රමාණය කර්මයමයි. කර්මය ක්ෂය වනතුරු චුත නොවෙති. සෙසු අපායවලද එසේය. භූමි දෙව්වරුන්ටද කර්මයම ප්‍රමාණ වේ. එහි උපන් සමහරෙක් සත් දවසක් පමණ සිටිති. සමහරු අඩමසක් කාලයක් සිටින්නෝද වෙති. එහි ගිහි භාවයෙහි සිටි මනුෂ්‍යයන් මෙන් සෝවාන් වූවෝද වෙති. සකෘදාගාමි අනාගාමි අරහත් ඵලවලටද පැමිණෙති. ඔවුනතුරෙන් සෝවාන් වූවා දිවිතෙක් සිටිති. ඛීණාසවයන් පිරිනිවන්පාති. නැතහොත් පැවිදි වෙති. කවර හෙයින්ද? අරහත්බව ශ්‍රේෂ්ඨවූ ගුණයකි. ගිහිවේෂය හීනය. එය හීන නිසා උතුම් ගුණ දැරීමට නොහැකි වේ. එහෙයින් ඔව්හු පිරිනිවන් පෑමට හෝ පැවිදිවීමට කැමති වෙති. භූමි දෙවියෝ රහත්ව ද යාවජීවව සිටිති. සදෙව්ලොව, සෝවාන් සකෘදාගාමී යාවජීව සිටිති. අනාගාමි රූප භවයට යන්ට වටී. ක්ෂීණ භවයේ පිරිනිවන් පාති ඇයි? සැඟව සිටීමට අවකාශ නැති හෙයින්. රූපාවචර අරූපාවචරවල සියළු දෙනාම යාව ජීවව සිටිති. එහි රූපාවචරයෙහි උපන් සෝවාන් සකෘදාගාමීන් යළි මෙහි නොඑති. එහිම පිරිනිවන් පාති. මෙහි ධ්‍යානලාභීහු අනාගාමි වෙති. අෂ්ට සමාපත්තිලාභීන්ගේ නියමය කුමක්ද? ප්‍රගුණ වූ තත්වය වෙනස් නොවේ. සියල්ල ප්‍රගුණ වූවන්ගේ නියමය කෙසේද? ප්‍රාර්ථනාව යම්තැනක උපතටද එය සිදුවේ. ප්‍රාර්ථනාවක් නැත්නම්? මරණ සමයේ සමවැදුණු සමාපත්ති. ඒවා නොමැති නම් නේවසඤ්ඤා නාසඤ්ඤා සමාපත්ති. ඒකාන්තයෙන් ඔහු එහි උපදිති. බ්‍රහ්ම ලෝක නවයේ උපන්නේ එහි උපදිති. උඩ සිට යටට නොව යට සිට උඩටය. පෘථග්ජනයෝ උඩ යට මාරුවී උපදිති. සුද්ධාවාසවල අරූපතලවල එහිම හෝ ඉහළ තලවල උපදිති. ප්‍රථමධ්‍යාන භූමියේ උපන් අනාගාමි ඉහළ ඉහළ ඉපදී ඉහළම තලයේ සිටියේ පිරිනිවන්පායි. වෙහප්ඵල අකිනිට්ඨ අසංඥ තලවල උපන් අනාගාමියා උඩ යට නොගොස් උපන් තලයේම පිරිනිවෙන්නේය.

මේ ප්‍රකීර්ණකය.

සත්ත කාමාවචරවල ලක්‍ෂණ සහිත විමසීමෙන් අභිඤ්ඤා වශයෙන් අභිඤ්ඤෙය්‍යතා දතයුතුය. ඤාත තීරණ පහාණ පරිඥා වශයෙන් පරිඤ්ඤෙය්‍යතා එයද රූපස්කන්ධය අභිඤ්ඤෙය්‍ය පරිඤ්ඤෙය්‍ය න පහාතබ්බ යනාදියෙහි ඤාත තීරණ පරිඤ්ඤා වශයෙන්ම දතයුතුය. සමුදය සත්‍යය අභිඤ්ඤෙය පරිඤ්ඤෙය්‍ය පහාතබ්බ ආදියෙහි ප්‍රහාණ පරිඤ්ඤා වශයෙන්.

අටවන වාරයෙහි රූපාදි අරමුණුවල චක්ඛු විඤ්ඤාණාදීන්ගේ වශයෙන් අනාරම්මණ ආරම්මණ ස්වභාවය වශයෙන් දතයුතුය. නවවන වාරය ප්‍රකටය. දසවන වාරයෙහිද කිවයුතු දේ ඒ ඒ තැන ප්‍රශ්න ඇසූ වාරයෙහි කියන ලද්දේමය.

**සම්මෝහ විනෝදනී නම් විභංග අර්ථ වර්ණනාවේ**
**අටළොස්වන ධම්මහදය විභංග නිද්දේසයයි.**

# මෙපමණකින්

බිදම් දෙසමින් දම් - ගරුදම් ගරු යුතු නිසා
දෙව්පුරෙහි දෙව්දුන් - දහසක් පිරිවරණ ලද

ලොවැ උතුම් මුනිසඳු- දෙසූ විබඟ නම් පකරණ
අටළොස් විබඟකින් - සැරසූ සැරසිය යුතු

අරුත් පවසනු වස් - ඇරයුම් ලදිමි ගුණපිරි
යති අදඳ ගති ඇති - බුදුගොස් පැණසරු වෙතින්

සපිරි නිපුණ'රුතින් - රැසයුම් ඇරඹි අටුවා
මුළා විනොයනු වස් - "සම්මෝහවිනෝදනී"

ගෙන නිමාවිය මෙය - පොරණ අටුවා සාරය
අනතුරකින් තොරව - පෙලෙහි සතලිස් බණවර

එකකින් සමන්විත - සව් සතුනගෙ පිරිසිදු
සිතරුසි නිමාවට - එලෙසටම පැමිණේවා

යම් මේ සියළු පිණ - මවිසින් එයින් රැසයු
සදහම් පැවතුම ද - වේවා ලොවට සහ දෙව්

සදහම් දිනේවා - ලෙව් දම් රසය වේවා
බියනැති නිති සුබික් - සම්පත් දනව් වේවා.

උතුම් පිරිසිදු ශ්‍රද්ධා බුද්ධි වීර්යයෙන් ප්‍රතිමණ්ඩිත වූ සිල්වත් ඍජු මෘදු ආදි ගුණයෙන් මූර්තිමත් වූ ස්වකීය සමය සමයාන්තර ග්‍රහණ අධ්‍යයන සමර්ථ වූ ප්‍රඥා ව්‍යක්තභාවයෙන් සමන්නාගත වූ අර්ථකථා සහිත ත්‍රිපිටක පර්යාප්ති ප්‍රභේද ශාස්තෘ ශාසනයෙහි අප්‍රතිහත ඥාන ප්‍රභාවයෙන් මහා ව්‍යාකරණඥව හේතු සම්පත්තියෙන් ජනිත වූ සැප ඇත්තා වූ නිර්දෝෂ වර්ණයෙන් යුත් මිහිරි උදාර වදනින් පෝසත් වූ කිවයුත්ත නිසිලෙස කීමෙහි වාදීවර මහා පඬිවර වූ අර්ථාදි ප්‍රභේදගත වූ

පිළිසුඹුයෙහි පිරිවර වූ ෂඩභිඥාදි ගුණ ප්‍රතිමණ්ඩිත වූ උතුරු මිනිස් දම්හි සුප්‍රතිෂ්ඨිත බුද්ධියෙන් ස්ථවිර වංශයට ප්‍රදීපායමාන මහාවිහාර වාසීන්ගේ වංශයට අලංකාරයක් වූ මහත් වූ විශුද්ධ බුද්ධියෙන් බුද්ධඝෝෂ නම් වූ ගුරුවරුන් විසින් දෙනලද නාමයෙන් ප්‍රසිද්ධ වූ මහා ස්ථවිරපාදයන් වහන්සේ විසින් මේ සම්මෝහ විනෝදනී නම් විභංග අර්ථකථා වර්ණනාව කරන ලදී.

ලොවැ දෙටු මහරිසී - 'බුදු' නම පවතින තුරු
ලොව තරණය සොයන - කුල පුතුනට පිරිසිදු

එපමණ කල් ලොවේ - පෙන්වමින් සිත් ඇත්නට
විසුදු පැණ නය මෙම - පවතීවා එළිය දී

මහතෙරිඳු බුදුගොස් - කළ පෙළබසින් අටුවා
විබඟයට අබිදම් - 'සම්මෝහ විනෝදනී'

බාලසූරිය විසින් - කළ සිහළ පෙරළිය දැන්
නිමාවිය මෙහි පින් - සව් සතුනටම වේවා!

# සූචිය


| | |
|---|---|
| අටුවා | v |
| අටුවා ඇදුරෝ | xix |
| අත්ගල | 196 |
| අනාත්ම | 34, 35, 390 |
| අනුරුද්ධ | 291 |
| අබය තෙරුන් | 227 |
| අබතුර | 144 |
| අභිධර්ම | 4 |
| අමෘතය | 8 |
| අරණ විභංග සූත්‍රය | iv |
| අරමුණු | 32 |
| අරියවංස භාණක | 382 |
| අරුත් | 404 |
| අල්ලසක් | 41 |
| අවිතථ | 35 |
| අසාධාරණ | 382 |
| අසුර සිත් | 4 |
| අසංඛත | 22 |
| අළජනපදය | 371 |
| ආත්ම | 23, 24, 34 |
| ආතුරයා | 63 |
| ආනන්ද | 292 |
| ආපාථගත | 29 |
| ආයතන | 32 |
| ආයුෂ්මත් | 293 |
| ආර්යශ්‍රාවක | 321 |
| ආලින්දවාසී | 289 |
| ආසීවිසෝපම සූත්‍රය | 26 |
| ආශ්‍රව | 12 |
| ආශ්වාදන | 32 |
| ඉඟිනි ඇට | 197 |
| ඉඳුරන් | 102 |
| ඉසිදත්ත | 320, 371 |
| ඊය | 63 |
| ඊශ්වරායතන | 36, 321 |
| උක්හකුරු | 199 |
| උඩමළුවාසී | 24 |
| උණගස් | 185, 276 |
| උපචාරය | 10 |
| උපාය | 5 |
| උපාදාන ස්කන්ධ | 24 |
| උපාලි | 226, 291 |
| උපාලි ගහපති | 34 |
| එරඬු ගස් | 371 |
| ඔර්ලෝසු කණුව | 284 |
| ඔරුව | 50 |
| ඕජාව | 20 |
| ඕපපාතික | 17 |
| ඕලාරික රූපය | 10 |
| කටුස්සා | 390, 427 |
| කච්ඡපුට | 394 |
| කඳල මල් | 196 |
| කඳල | 376 |
| කඳු | 26 |
| කමටහන් | 31, 40 |
| කම්පුජේලන්දගම | 242 |
| කරත්ත | 339 |
| කර්මස්ථාන | 39, 46 |
| කර්මජ රූප | 22 |
| කබලිංකාර ආහාර | 10 |

| | |
|---|---|
| කලල | 7 |
| කළුවැල් මණ්ඩපවාසී | 290 |
| කල්ප කෝටි | 21 |
| කාමච්ඡන්ද | 40, 44 |
| කාමරය | 10 |
| කාය දසක | 18 |
| කාලකංජික | 4 |
| කාව්‍ය | 409 |
| කාශ්‍යප | 392 |
| කැඳ | 4, 282 |
| කැවුම | 34, 52, 199 |
| කිණිහිරි මල් | 89 |
| කැකුළින් | 368 |
| කුටකණ්ණ රජ | 376 |
| කුණ්ඩලාභරණ | 192 |
| කුම්භකාර | 339 |
| කුටෙලිතිස්ස විහාරය | 242 |
| කුඹුරු | 211 |
| කුරවි | 89 |
| කුරුම්බැට්ටි | 43, 53 |
| කුසල් | 12, 14, 31 |
| කුසලතා | 40 |
| කෘෂි | 339 |
| කුළුගෙඩි | 197 |
| කුඩැල්ලා | 213 |
| කෙමන් | 409 |
| කෙලෙස් | 30 |
| කෙළෙඹියා | 8 |
| කොතලගම | 365 |
| කොවුලා | 40, 44 |
| කොසඹ | 120 |
| කොස්ඇට | 197 |
| ගංගා නදිය | 2 |
| ගඟ | 4 |
| ගණක | 329 |
| ගම | 11 |
| ගම්මුළාදෑණි | 9 |
| ගලවළුව | 50 |
| ගල්වංගෙඩි | 40 |
| ගවපාලනය | 339 |
| ගවරවල | 32 |
| ගස්වැල් | 277 |
| ගැඩවිලා | 8 |
| ගිජ්ඣකූට පර්වතය | 381 |
| ගිරිගාම කණ්ණවාසී | 376 |
| ගිලන්හල | 25 |
| ග්‍රීවාභරණ | 192 |
| ගුරුළු | 9 |
| ගෙරිසරක් | 288 |
| ගොනැස් | 27 |
| චක්කවත්ති | 10 |
| චම්මකාර | 339 |
| චරණ | 81 |
| චිත්ත ගහපති | 321 |
| චිත්ත මහාමාත්‍ය | 281 |
| චිත්‍රකර්ම රූප | 438 |
| චිත්‍ර ශිල්පියෙක් | 273 |
| චූල්ල සුමම තෙර | 408 |
| චූලනාග තෙර | 282 |
| චූල සෝතාපන්න | 210 |
| චූලසීව තෙර | 310 |
| චූල සුධම්ම තෙර | 376 |
| ජාති | 64 |
| තලතෙල් | 18 |
| තලගුලි | 196 |
| තලවෙහෙර | 322 |

| | |
|---|---|
| තල්ඇට | 52 |
| තල්වනය | 190 |
| ත්‍රස්තයන් | 90 |
| තාවතිංස | 10 |
| තිපිටක චූලනාග | 13, 336 |
| තිපිටක චූලාභය | 13, 321 |
| තිස්සදත්ත තෙර | 320 |
| තිස්ස තෙර | 321 |
| තිස්සමහා විහාරය | 370 |
| තිස්සභූති තෙර | 372 |
| තිස්ස රජ | 394 |
| තිසාවැව | 371 |
| තුන් සිවුරෙන් | 31 |
| තේලකන්දරිකා | 403 |
| දඟගෙයි | 376 |
| දරකැබලි | 209 |
| දමිල | 6 |
| දඹකොල පටුන | 322, 370 |
| දහර භික්ෂු | 18 |
| දාරු යන්ත්‍රය | 296 |
| දැදුරු ඔය | 409 |
| දැලිපිහි | 197 |
| දැල්සැට්ටය | 196 |
| දිය කරත්තයක් | 291 |
| දියබුබුල | 25 |
| දීකිරි | 54 |
| දීපරාජ | 368 |
| දුක් | 12, 68 |
| දොරටුපාල රූප | 417 |
| ධර්ම | 1 |
| ධර්මාශෝක | 8 |
| නගර ශිල්පියා | 273 |
| නගුල් | 340 |
| නලකාර ශිල්පය | 329 |
| නවගුණවැලක් | 197 |
| නැගණිය | 16 |
| නැව් | 339 |
| නාගවිහාරය | 337 |
| නාගදීපය | 370, 381 |
| නාගසේන | 322 |
| නාටක | 409 |
| නාමඩල පිරිත | 339 |
| නාමරූප | 33 |
| නිදන ගේ | 365 |
| නියත | 16 |
| නිවන | 68 |
| නිංකපොණණක | 408 |
| නෙළුම් අල | 53 |
| නෙළුම් මල | 393 |
| පංචස්කන්ධය | 1 |
| පංචද්වාරික | 16 |
| පංච සුරා | 315 |
| පණාබෙර | 197 |
| පරමාදර්ශී | xxiv |
| පරිකර්ම | 10, 29, 31 |
| පස්ගෝරස | 366 |
| ප්‍රකීර්ණක | 17 |
| ප්‍රතිසන්ධි | 619 |
| ප්‍රභවය | 17 |
| ප්‍රයෝගය | 21 |
| පාපිස්න | 50 |
| පාර | 71 |
| පාළිභාෂාව | iii |
| පිණ්ඩපාතික | 191 |
| පිඩු සිඟමන් | 4 |
| පිතුමහ රජ | 372 |

පිප්ඵලී විහාරය 363
පිරිවෙණ 376
පීළනය 62
පුතා 5
පුණ්ණ මන්තාණිපුත්ත 292
පුෂ්පාරාම විහාරය 376
පෙරවරු 6
පේෂකාර 329
පෙට්ටි 185
ප්‍රේතලෝකය 4
බණ 6
බලිකාරයා 376
බාහිය දාරුචීරිය 291
බ්‍රාහමණ තිස්ස 370
බෝනික්කා 196
භවාංග 22
භාතික රජ 365
භාව දසක 18
භූමාටු 10
භූතපාල සිටුකුලය 284
මග 68
මගධයේ iii
මලපුඩු 408
මණ්ඩලාරාම විහාරය 372
මනෝද්වාරික 16
මහ කෙළෙඹි 366
මහ මුගලන් 232
මහසෑය 240, 370
මහාථෙර වස්තුව 295
මහාදත්ත තෙර 408
මහාදේව තෙර 187
මහානාග තෙර 408
මහා බෝධිය 240
මහාමිත්ත තෙර 230
මහා සමුද්‍රය 230
මහා සුදස්සන 8
මහාසෝණ තෙර 370
මාතොට පටුන 372
මායාව 26
මාලිකවාසී ධම්මදින්න තෙර 408
මැණික් 3
මිත්තවින්දක 392
මිරිඟුව 26
මිලක 62
මීඇට 47, 208
මීගෙඩි 3
මීලෙලි 371
මුද්‍රණ ශිල්පය 339
මුවකු 236
මෝසරාජ තෙර 252
මෝරණ්ඩ ඛේටක vi
මෝරු 404
යහළුවෝ 73
යළිත් 90
යෙති 121
යෝගාවචරයා 94
යෝනි 136
රට්ඨපාල 252
රතනායතන 36
රන්කරුවෙක් 92
රන්මාලා 192
රඹකඳ 26
රවන්කට්ට 54, 55
රහත්තෙර නමක් 240
රහත් බව 31
රාත්‍රිය 6

| | | | |
|---|---|---|---|
| රාසි | 2 | වීණාව | 41, 44 |
| රාහුල | 292 | වෙරසිඳී | xxvi |
| රිදී | 89 | වේවැල් | 41, 198 |
| රිදෙන | 18 | සක්වල | 2, 363 |
| රියනකින් | 10 | සක්විති රජ | 49 |
| රුඩී | 2 | සකදාගාමි | 20 |
| රූපස්කන්ධ | 2 | සත්තිස් බෝධිපාක්ෂික | 285 |
| රෝමයෙන් | 18 | සමතික්‍රමණ | 22 |
| රෝහණ | 337 | සංඝාරාමය | 10 |
| ලාස් | 1, 2 | සංඛත | 22 |
| ලුණුඇඹුල් | 64 | සංඛාරය | 2 |
| ලුණුවතුර | 3 | සජීවිව | xxi |
| ලෝකෝත්තර | 13, 96 | සමාධි | xxii |
| ලෞකික | 96 | සමාධිගත | 6 |
| වක්කලි | 228 | සම්භූත | 252 |
| වඩුවෙක් | 92 | සමාපත්තිලාභී | 240 |
| වණික් | 329, 339 | සංයුත්ත භාණක | 370 |
| වත්තබබක නිග්‍රොධක | 375 | සල්ගසක් | 73, 89 |
| වත්‍ථු දසක | 18 | සවුපාදිසේස | 73 |
| වරිච්චිය | 41 | සහජාත | 13 |
| වාතරෝග | 5 | සාටකය | 5 |
| වාලුකා විහාරය | 322 | සැත්කටු | 339 |
| වාසුදේවායතන | 32, 86 | සැප | 12 |
| වැටකොලු කොපුව | 52 | සැරියුත් | 232 |
| වැද්දෙක් | 190 | සිටුවරු | 8 |
| වැවක් | 27 | සිතුවම් රූමෙන් | 286 |
| විජ්ජා | 81 | සිතුල්පව්ව | 218, 370, 417 |
| විජ්ජාකාරයකු | 162 | සිව්පිළිසිඹියා | 39 |
| විතණ්ඩවාදීහු | 8, 41, 382 | සිංහල උදැල්ල | 197 |
| විභංගප්පකරණ | 1 | සීමැදුරු | 89 |
| වියගස | 340 | සුචරිත | 70 |
| වියතුන් | 55 | සුනඛවාජික | 363 |
| විසුද්ධි මාර්ගය | 39 | සුන්සහල් | 8 |

| | |
|---|---|
| සුමම ථෙර | 282 |
| සූතිසරය | 200 |
| සූත්‍රාන්ත | 1, 6 |
| සෙබළුන් | 2 |
| සොම්මරු | 339 |
| සොරුවිල | 372 |
| සොරෙක් | 397 |
| සෝණගිරි පාදය | 363 |
| සෝණ ථෙර | 252 |
| සෝමාදේවි | 365 |
| හකුරු මුලක් | 371 |
| හක්ගෙඩි | 197 |
| හවඩි | 89 |
| හංකතවාසී | 408 |
| හාල් නැලියක් | 371 |
| හීන | 337 |
| හුඹස් මුදුන | 46, 47 |
| හෙළටුවා | iv |



THE BO-TREE AT ANARAJAPOORA.

ටෙනන්ට් 1859

භදන්ත බුද්ධඝොෂාචාර්යපාදයන් අනුරාධපුර
ශ්‍රී මහා බෝධිය අසල ප්‍රදේශයෙහි වැඩවසමින්
සිහළට්ඨකථා පාලියට පරිවර්තනය කළ බව
බොහෝදෙනාගේ විශ්වාසයයි

බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය
125, ඇන්ඩර්සන් පාර, නැදිමාල, දෙහිවල.
දුරකථන: 2734256, 2728468, 2726234
ෆැක්ස්: 2736737
විද්‍යුත් තැපැල: bcc456@sltnet.lk
www.buddhistcc.com

ISBN 978-955-1604-31-8